# ශුද්ධාත්ම පිය සටහන්

‘දහම් නවෝදය’
මෙම ප්‍රකාශන අධ්‍යයනයේ දී
අපගේ 4වන ප්‍රකාශනය,
‘ශුද්ධාත්ම පිය සටහන්’
අංක 12 සිට ප්‍රකාශනය අග දක්වා
අධ්‍යයනය කරමින්
ජේසු සමිඳුන්ගේ අනාවරණයන් හා
එතුමන්ගේ ක්‍රියාවන් අධ්‍යයනය සඳහා
**පළමු** තැන දෙන්න, ප්‍රමුඛතාවය දෙන්න.

“දෙවියන්ගේ දැති රෝදය සෙමෙන් කැරකුන ද එය අඹරන සියල්ල ම ඉතා සියුම් ව ඇඹරෙන්නේය. උන්වහන්සේ ඉවසිලිවන්තව බලා සිටිය ද නිවැරදිව නියත වශයෙන් ම සියල්ල ම ඇඹරෙන්නේය.” (වෝල්ට් විට්මන්)

“අයුක්තිය සුළඟක් සේ හැම තැන ම හැම විට ම වාගේ පැතිර සිටී. යුක්තිය වේදිකාවට එන්නේ පමා වී බර අඩි තබමිනි.” (බටහිර කවියකුගේ අදහසක් යැයි සිතමි)

යෙසායා දිවැසිවරයා මෙසේ පැවසිය. (ශුද්ධ බයිබලය)

“සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
මම අලුත් අහසක් ද අලුත් පොළොවක් ද මවමි.
ඇඬීමේ ශබ්දයක් වත් පීඩිත වේදනාවේ ශබ්දයක් වත්
එහි තවත් නො ඇසෙන්නේය.
වෘකයා ද බැටළු පැටවා ද එකට තණ බුදිති.
හරකා මෙන් සිංහයා පිදුරු කයි. (65:17,19,25)
කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේය.
සමිඳුන්ගේ තේජාලංකාරය ද එතුමන්ගේ මහා බලමහිමය ද
සියල්ලෝ දකින්නෝය. (35:1,2)
පොළොව පැළැටි උපදවන්නාක් මෙන් ද
උයන එහි වපුළ දේ ලියලවන්නාක් මෙන් ද
මහෝත්තමයාණෝ ධර්මිෂ්ඨකම සියලු ජාතීන් ඉදිරියෙහි
හටගන්වන සේක. (61:11)
තම කඩුවලින් නගුල්තල ද තම හෙල්ලවලින් දෑකැති ද
ඔවුහු සාදා ගන්නෝය. (2:4)
මුහුද ජලයෙන් පිරී තිබෙන්නාක් මෙන්
සමිඳාණන් වහන්සේ පිළිබඳ දැනගැන්මෙන්
පොළොව පිරී යන්නේය. (11:9)

# ශුද්ධාත්ම පිය සටහන්

**මෙය ලොව පුරා ප්‍රකාශ කිරීමට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙන ආදරයේ පණිවුඩයකි.**

"ලොව පුරා මාගේ නාමයට ඉතා ආදරයෙන් ක්‍රියා කරමින් සභාවේ ඉදිරි ගමන් මඟ දෙව් පියාට අවනත වීමට ඇති අවංක ආශාවෙන් ක්‍රියාත්මක වන්නා වූ සැම සංඝයකට ම නුඹලාගේ මෙම ප්‍රකාශන යොමු කරපන්න. ඔවුහු එය ලෝකයේ ගැළවීම සඳහා බෙදා හරින්නට මඟ බලා සිටින්නෝ වෙති. මන්ද, මාගේ වචනය මාගේ පණිවුඩය ඔවුහු සොයමින් ලත වන්නෝය. **මෙය මාගේ ශුද්ධාත්මානුභාවය තුළ ලියැවෙන්නා වූ ද ප්‍රකාශ වන්නා වූ ද දෙයක් බැවින් මේ කිසිවක් කිසි විටෙක අකුරකින් හෝ වචනයකින් හෝ වෙනස් කරන්නට ඉඩ නො තබන්න.** මාගේ අසරණ බැටළුවන් ආරක්ෂා කිරීම උදෙසා ඔබ එය ඉතා ලහිලහියේ සූදානම් කර බෙදා හැරපන්න." (1999.07.01)

**(එනිසා ඔබට අවසර ඇත, ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් උපදෙස් පිළිපදිමින් මෙය ලොව පුරා ඕනෑ ම භාෂාවකින් මුද්‍රණය කර බෙදා හරින්නට.)**

(මෙම ප්‍රකාශනය ඕනෑ ම ආගමක් අදහන හෝ කිසි ම ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන් උදෙසා ය. මෙය ලිය වී ඇත්තේ කිතු දහමට හුරු බසකිනි. සියලු බලැති දෙවියන් වහන්සේ හෙවත් මැවුම්කරුවාණෝ හෙවත් ධර්මයාණෝ ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙ ලොවට වැඩියහ. මුළු මිනිස් සංහතියේ පාපය තමන් කෙරෙහි ගෙන තම උත්තම පූජක දිවි පිදීමෙන් විමුක්තිය උදා කරමින් මරණය ජය ගෙන ප්‍රතාපවත් වූ ජේසු සමිඳාණෝ ජීවමානව සදාතනිකව වැඩවසති. දෙවියන් වහන්සේ, මැවුම්කරුවාණෝ, ධර්මයාණෝ, ධම්ම යන ඕනෑ ම ඇමතුමකින් ඔබ ඕනෑ ම කෙනකුට මෙම ප්‍රකාශනය හා එක් විය හැකිය.)

"ජේදුරු තුමාගේ මහා දේශනයේ ජොවෙල් දිවැසිවරයාගේ දිවැස් වැකිය ඉටු වන මොහොත දැන් පැමිණ ඇතැ"යි ජේසු සමිඳාණෝ ප්‍රකාශ කරති. "දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක. **අන්තිම දවස්වල දී සකල මනුෂ්‍යයන් හට මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි. එවිට ඔබේ දූ පුත්තු දිවැස් වැකි කියති. ඔබේ තරුණයෝ දර්ශන දකිති. ඔබේ මහල්ලෝ ද පැතුම් පතති. එපමණක් නො ව මාගේ දැසි දසුන්ට වුව ද මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරන්නෙමි. ඔවුහු ද දිවැස් වැකි පවසති. තවද, ඉහළ අහසේ අරුම පුදුම දේ ද පහත පොළොවේ ලකුණු ද දක්වා ලමි. ලේ ද ගිනි ද දුම් වලා පටල ද ඇති වේ.**"
**(ශුද්ධ බයිබලය - ක්‍රියා 2:17-19)**

ශුද්ධාත්මානුභාවය විසින් තෝරා ගෙන සකසා ගෙන පත් කර ගෙන ඇති මෙම සංඝය, "මාගේ උත්තරීතර සංඝය" යනුවෙන් අමතමින් එහි දාස දාසින් තුළින් ජේසු සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

**2001 ඔක්තෝබර් 27 වන දින**

"මා පුත්‍ර ඇන්තනි, මේ වසර අවසන් වීමත් සමග ඊ ළඟ ප්‍රකාශනය ආරම්භ කරපන්න."

**2001 නොවැම්බර් 21 වන දින**

"පුත්‍රය, මා ඔබට පැවරූ ප්‍රකාශනය පිළිබඳව මම ඔබට මෙසේ පවසමි. මෙතෙක් නුඹ දුටුවා වූ නුඹ ඇසුවා වූ සියල්ල ද, මාගේ පවිත්‍රකරණය ද එම ප්‍රකාශනයට නගාපන්න."

**1999 අගෝස්තු 08 වන දින**

(අපගේ පළමු ප්‍රකාශනය මුද්‍රණය කර එය බෙදා හරින්නට සූදානම් වන මොහොතේ ජේසු සමිඳුන් ප්‍රකාශ කළ වචන අදාල වන්නේ මෙම ප්‍රකාශනය පිළිබඳව ය.)

"මා මුල පුරමින් නිහඬව කළා වූ සියළු කාර්යයන් එළිදැක්වීමේ මොහොතට නුඹලා ආසන්න වන්නේය. එහි දී ඔවුහු සත්‍යය අවබෝධ කර ගනිති. මා නුඹලා තුළින් ක්‍රියා කරමින් මාගේ ශුද්ධ වූ සභාවට ද, මා පත් කළා වූ සුදතුම් එඬේරාට ද, පක්ෂපාතිව මේ ලෝකයේ මා හට අවනත භාවය දක්වන්නට මා හට ක්‍රියා කරන්නට මා විසින් සංඝයක් පිළියෙල කළ බව ඔවුන්ට පැහැදිළි වන්නේය. ඔවුන් එය පිළිගන්නට මොන ආකාරයෙන් අදි-මදි කරතත් ඔවුන් එය ප්‍රතික්ෂේප කරතත් එය සත්‍යය ප්‍රකාශනයකින් ලෝකයට ප්‍රකාශ වීම තුළ එය ඔවුන්ට පිළිගැනීමට අවස්ථාව ලැබෙන්නේය."

1996 ජුනි 27 වන දින (ජේසු සමිඳුන් ඉඟි කළේ මේ ප්‍රකාශනය ගැන යැයි සිතේ.)

"නුඹලා අතර මා කළ කී සියල්ල එක්තැන් කොට එය ශුද්ධාත්ම පිය සටහන් යනුවෙන් නම් කරන්න."

# ශුද්ධාත්ම පිය සටහන්

"දහම් නවෝදය" සංඝයේ එඬේරික වගකීම පැවරී ඇති ජී. ජේ. ඇන්තනි වන මම සමිඳුන් පවරන මෙම කාර්යය අපගේ හතර වන ප්‍රකාශනය වශයෙන් ඔබ හමුවේ තබමි. මෙම ප්‍රකාශනය මගින්,

1. මගේ ජීවිත ගමන් මඟ පිළිබඳ ශුද්ධාත්ම පිය සටහන් කීපයක් ද,
2. 'දහම් නවෝදය' සංඝයේ ගමන් මඟ පිළිබඳ ශුද්ධාත්ම පිය සටහන් කීපයක් ද,
3. 'දහම් නවෝදය' සංඝයේ ගමන් මඟ උදෙසා ජේසු සමිඳුන් විසින් තෝරාගෙන ඇති ප්‍රථම දාසිය, දාසයා හා ළබාල දාසිය පිළිබඳව ද,
4. ඔවුන් උපයෝගි කර ගනිමින් ජේසු සමිඳුන් ඉටු කළ දේ හා දානය කළ අනාවරණයන් ද කෙටියෙන් ඔබ හමුවේ තබන්නට අදහස් කරමි.

## මම, මට ඇවැසි මා නො ව මගේ මැවුම්කරුවාණන්ට ඇවැසි මා වෙමින් සිටීම මට ප්‍රීතියකි.

### 1

බාධක පීඩා, අගහිඟ මැද ජීවිත ගමන ඇරඹිණි. ගව මඩුවක උපත ලද කුරුසියක දිවි පිදූ ජේසු සමිඳුන් නිසා ඒ කිසිවක් අවාසනාවක් නො වේ යැයි ළමා වියේ සිට ම අවබෝධ විය. සොක්‍රටිස් ඇතන්ස් හි නැගූ හඬ ජීවිතයේ අරුත සොයන්නට මා මෙහෙය විය. ශ්‍රේෂ්ඨ පෞරුෂයක් යනු ශ්‍රේෂ්ඨ ආධ්‍යාත්මිකත්වයක් බව මහත්මා ගාන්ධි තුමාගෙන් උගතිමි. සාහිත්‍යය, විශේෂයෙන් කවි සංකල්පනා මගේ ජීවිතය මටසිලිටි කර වී. මෙ ලෙස සංවේදි බව ළමා වියේ සිට ම මගේ උරුමය විය.

මගේ මව දහමට නැඹුරු තැනැත්තියක් වුවාය. එනිසා මගේ ළමා විය ද එලෙස ම විය. එහෙත් වයසින් මුහුකුරා යත් ම ආගම ජීවිතය අරුත් ගන්වන දහම් පණිවුඩයක් වීමට වඩා එය මංගල්ල ශෝෂාවක් වීම මගේ කළකිරීමට හේතු විය. එය පොත-පත තුළින් අනෙකුත් ආගම් පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්නට මා පෙළඹ විය. ඒ සෙවීම කෙළවර "සේවය ලබන්නට නො ව සේවය කරන්නට, උපස්ථාන ලබන්නට නො ව උපස්ථාන කරන්නට" පැමිණි ජේසු සමිඳුන්ගේ සේවක ස්වරූපය මා එතුමන් වෙත ආකර්ශනය කර ගන්නට සමත් විය.

සිසු වියේ සිට ම ජීවිතය තුළ සපුරා ගත යුතු ප්‍රාර්ථනා දෙකක් විය. ගුරුවරයකු වීම ඉන් පළමු වැන්න යි. වයස 23දී සිංහල පුහුණු ගුරුවරයකු වීමෙන් පළමු පැතුම ඉටු විය. ජීවිතයේ අරුත සොයා ගැනීමත් එය අන් අය හා බෙදා ගැනීමත් ජීවිතයේ අනෙක් පැතුම විය. එය සපුරා ඉටු වනු සඳහා මෙතෙක් ද දිගු කටුක ගමනක නියැලෙන්නට සිදු ව ඇත.

පුහුණු ගුරුවරයකු හැටියට වසර පහක කාලයක් මම අම්පාර දිස්ත්‍රික්කයේ උදයපුර හා නාමල්තලාවේ සේවය කළෙමි. (1963-1967) ආලේලූයා සෙනසුරාදා සවස දිව්‍ය පූජාව සඳහා මම අම්පාර මණ්ඩල විහාරය අසලින් දෙව් මැදුර වෙත යමින් සිටියෙමි. (වසර හරිහැටි මට මතක නැත) පන්සලේ ධර්ම දේශනාව ඇරඹින. එය මට හුරු පුරුදු මා ලැදි කටහඬකි. (එකල මා ගුවන් විදුලියේ බෞද්ධ ධර්ම දේශනය ඇසූ නිසා) ඒ වජිරාරාමවාසී පූජ්‍ය පියදස්සි හාමුදුරුවන්ගේ කටහඬ යි. ධර්ම දේශනාවට සහභාගි වී ඉන්පසු දෙව් මැදුරට යන අදහසින් මම විහාර මළුවේ වාඩි වීමි. විශාල සෙනගක් තැන්පත් ව හසුරුවා ගනිමින් ධර්ම දේශනය පැවැත්වීමේ දී එතුමා තුළින් ඉස්මතු වූ ආධ්‍යාත්මිකත්වය මා සිත් ගත්තේය. එතුමෝ එදින ඉදිරිපත් කළ දහම් පණිවුඩය වඩාත් ඉස්මතු කරන්නට සොක්‍රටීස් තුමාගේ ජීවිතයෙන් පිටුවක් ගෙනහැර දැක්වූහ. එහි දී මෙ ලෙස කියවිණි. එක මනුෂ්‍යයෙක් වෙනස් වුණොත් මුළුමනින් පවිත්‍ර කරණයට ලක් වුණොත් මුළු ලොව වෙනස් වේ. මෙය සොක්‍රටීස් තුමාගේ දැක්ම යි. එක මිනිහෙක් වෙනස් වී ඇති පලය කුමක් ද? මුළු ලොව එක වර වෙනස් විය යුතු නො වේද ? එය සමකාලීන උගතුන් නැගූ පැනය යි. එම උගතුන් සොක්‍රටීස් තුමා හා එලෙස විවාද කරන මොහොතක එතුමා ලෝක සිතියමක් ගෙන ඔවුන් ඉදිරියේ ම කැබලිවලට ඉරා ලෝක සිතියම තිබුණාක් මෙන් නැවත සාදන ලෙස අභියෝග කළේය. කොපමණ වෙහෙසුනත් එය ඔවුන්ට අපහසු විය. ඒ අතර මිනිස් රුවක කොටස් ද දුටු ඔවුහු ලෝක සිතියම හැදිම පසෙක තබා මිනිස් රුව පහසුවෙන් සැකසූහ. එවිට ඔවුන් අමතා සොක්‍රටීස් තුමා මෙ ලෙස පැවසීය. ඔබ ලෝකය හදන්නට වෙහෙසුනත් එය ඔබට කළ නොහැකි විය. දැන් ඔබ එක මනුෂ්‍යයකු සාදා ඇත. බලන්න, දැන් ලෝකය සැදී ඇත. ධර්ම දේශනය තුළින් ඉදිරිපත් වූ මේ සම්‍යක් දෘෂ්ඨික දැක්ම අබියස මම මවිත වීමි. එසේ නම් මනුෂ්‍ය ජීවිතයක් කොපමණ අගනේ දැයි මට වැටහිණ. පුද්ගලයෙක් තුළ සිදු වන විශුද්ධි සමාජ විමුක්තිය සඳහා හේතු වේ. ලෝකය වෙනස් කිරීම සඳහා මම මා තුළට යි යා යුත්තේ. සමස්ත අරගලය මා තුළ ම යි සිදු විය යුත්තේ. මෙවැනි අදහස් මා තුළට ගලා එන්නට විය.

ආගම ගැන නොවිසඳුන ගැටළු රැසක් මා තුළ විය. ඒ ගැන තව දුරටත් නොවෙහෙසී "**දයා ප්‍රේමය ඇති තැන දෙවියෝ වැඩවසනු ඇත.**" යන්න මම මගේ ආගම කර ගතිමි. වෛරය ඇති තැනට ප්‍රේමය ගෙන යාම මම මගේ ආගම කර ගතිමි. ඒ සත්‍යය ක්‍රියාවට නගන හැම විට ම මම ධර්මයාණන්ගේ බලය අත්දුටිමි. මා ඒ පිළිබඳ ජයග්‍රහණයන් රැසක් ලැබූ බිම නාමල්තලාව යි.

මනුෂ්‍ය ප්‍රශ්නයට පිළිතුර මාක්ස්වාදය තුළ ඇතැ යි මා සිතූ වසර කීපයක් ද විය. සන්නද්ධ අරගලයක් තුළිණි, මාක්ස් දකින ජයග්‍රහණය කරා යා හැක්කේ. ආයුධයක් ගෙන කෙනකු මරන්නට මට හැකි දැයි මම මගෙන් ම විමසීමි. කිසිවකු මරන්නට මට නො හැකිය. කෙනකු අතින් මිය යන්නට නම් හැකි යැයි මම මට ම කියා ගතිමි. එම අවබෝධයෙන් පසු ව යි, කිතු දහමේ වඩා ගැඹුරට පිවිසීමේ යුගය මට උදා වූයේ. සැබෑ කිතු දහම තමාට මරණයක්, තම මමත්වයට මරණයක් සඳහා ඇරයුමකි.

## 2

ඒ 1974 වසර යි. මම ජිවිතයේ 35ස් වන වියට පා තබා සිටියෙමි. කතෝලික ශුද්ධාත්ම පිබිදීම (කිතු දන පුබුදුව) අප මීසමට ද පැමිණියේය. මම ද නිරීක්ෂකයකුගේ ස්වභාවයෙන් එයට සහභාගි වීමි. "**සැබෑ කිතුනුවෙක් යනු මරණය ජය ගෙන උත්ථාන වූ ජිවමාන ජේසුස් සමිඳුන් හමු වන එතුමන් ඇසුරු කරන අයෙකි.**" ඒ වදන් නික්මුනේ ගරු සිරි ඔස්කා අබයරත්න පිය තුමාගේ මුවිනි. ඒ සත්‍යය මා සසල කරන්නට සමත් විය. ඉන් පසු මම තව දුරටත් නිරීක්ෂකයකු නො ව සහභාගි වන්නෙක් වීමි.

දේශන අටකින් පසු පශ්චාත්තාප මෙහෙය, කැපවීමේ මෙහෙය හා ශුද්ධාත්ම මෙහෙය දිනය උදා විය. ඒ 1974 සැප්තැම්බර් 21 වන දිනය යි. උදේ 9.00ට ඇරඹී මුළු රාත්‍රිය පුරා පසු දින උදේ දක්වා එම මෙහෙය පැවැත්විණ. පාපය ඒක පුද්ගල දෙයක් නො ව එය දෙවියන් වහන්සේට හා සමාජයට දුක දීමක් බව දේශන තුළින් මට අවබෝධ විය. මා පාපිෂ්ඨ මනුෂ්‍යයකු බව මම හොඳින් දැන සිටියෙමි. පාපය ජය ගන්නට, විශේෂයෙන් මුල් අගුණ පාපය ජය ගන්නට ස්ව ශක්තියෙන් පමණක් නොහැකි බව මම අත්දැකීමෙන් ම දැන සිටියෙමි. මනුෂ්‍ය සංහතියේ පාපය තමන් කෙරෙහි ගෙන ජේසු සමිඳුන් අපගේ ගැළවීම උදෙසා කුරුසිය මත තම ජිවිතයෙන් ගෙවූ අමිල වූ මිලය ජිවිතයේ පළමු වරට මම එදින ගැඹුරින් අවබෝධ කර ගතිමි. "**කුරුසිය මත දිවි පිදූ ජේසු සමිඳුන් ඔබේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගන්න. එවිට ඔබ නිදහස් වනු ඇත.**" මෙය මට ප්‍රබල අනාවරණයක් විය.

ඉන් පසු හතර දෙනා බැගින් කණ්ඩායම් වී ජීවිත පාපොච්චාරණයක යෙදීමේ මොහොත උදා විය. **“නුඹලාගේ පව් එකිනෙකාට කියා දී සුව ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤා කරන්න.” (ජාකොබ් 5:16)** පාපය සමාජයට ද දුක දීමකි. එනිසා එය දෙවිඳුන්ට පමණක් නො ව සමාජයට ද හෙළි කළ යුතුය. (මුළු මිනිස් සංහතිය වෙනුවෙන් එක මනුෂ්‍යයකුට හෝ) දිව්‍ය ගුරුතුමාණන්ගේ සියුම් හඬ ජීවිතයේ පළමු වරට මා තුළ මෙ තරම් ප්‍රබල ව අත් දුටුවේ මේ අභ්‍යාසයට සූදානම් වන මොහොතේ දී ය. මගේ ජීවිතයේ සැඟවී ඇති සියල්ල ඔවුන් ඉදිරියේ මුළුමනින් විවෘත කරන ලෙස ඒ හඬ මට පැවසීය. ඒ සඳහා මා දිරි ගැන්වීය. ජීවිත බඳුනේ පරණ මිදි යුෂ හලා දමන තුරු එයට අලුත් මිදි යුෂ දැමීමෙන් පලක් නැති බව ඒ හඬ මට සිහිපත් කළේය. විවෘත නො වී අඳුරේ තබා ගෙන ඇති සියල්ල අන්ධකාරයේ අධිපතියාට අයිති බවත් එය ආලෝකයට ගැනීමෙන් සියල්ල මහෝත්තමයාණන්ගේ ආධිපත්‍යයට නතු වන බවත් ඒ හඬ මට සිහි ගැන්විය.

කණ්ඩායමේ සමහරුන් කිසිසේත් විවෘත නො වුනත් ඔවුන් ඉදිරියේ මගේ ජීවිතයේ සියලු වහල් බැමි (පාපය) විවෘත කරන්නට මට සමිඳුන්ගෙන් බලය ලැබිණි. එලෙස ඇතුලාන්ත සියුම් හඬට මම මුළුමනින් අවනත වීමි. ජීවිත බඳුන සොම්නසින් පිටාරා ගලන්නට විය. **“මනස්ස්ටාපනය වන්න, ස්වර්ග රාජ්‍යය සමීපය”** මම ඒ සත්‍යයේ ප්‍රබල සාක්ෂිකරුවෙක් වීමි. දේව රාජ්‍යය අප තුළ ම ඇත. එහෙත් අප එය අත්නොදකින්නේ ඇයි? ජීවිතය මරු කතරක් වී ඇත්තේ ඇයි? දේව රාජ්‍යය කාන්තාරය සරු ගැන්විය හැකි මහා දිය දහරකි. ඒ දිය දහර මමත්වය නමැති තද කළු ගල් තලාවෙන් වැසී ඇත. ඒ කළු ගල පුපුරා ගිය විට පමණි, දිය දහර ගලා එමින් කාන්තාරය සරු කරන්නේ. මනස්ස්ටාපනය වීම යනු ඒ කළු ගල පුපුරා යාම යි. එදින සවස 7-8 අතර පැය, දේව අනුග්‍රහය අත්දුටු විශ්වාසාලෝකය දැක ගත් ජීවිතයේ පළමු පැයයි. ඒ පැය මට උදා කරන්නට දෙවිඳුන් මා වෙනුවෙන් මෙවලමක් කර ගත් ඔස්කා පිය තුමාටත් පුබුදුවටත් මෙ ලොව දී පමණක් නො ව සදාතනයේ දී ද මම ණය ගැති වන්නෙමි.

ඉන් පසු ජේසු සමිඳුන්ට ජීවිතය කැප කිරීම හෙවත් එතුමාණන් තම ජීවිතයේ ස්වාමියාණන් ලෙස භාර ගැනීමේ මොහොත ආසන්න විය. “ජේසු ඔබේ ජීවිතයේ ස්වාමියාණන් වුනොත් උන්වහන්සේ කැමති මඟක ඔබ ගෙන යනු ඇත. ඒ මඟ කොතෙක් බිහිසුණු වුවත් ඔබ ඊට ඉඩ දිය යුතුය. එයට සූදානම් නැති නම් ඔබගේ ජීවිතය සමිඳුන්ට කැප කිරීමේ තේරුමක් නැත.” ඒ දේශකයාගේ වචන යි. (අද මා ආපසු හැරී බලන විට එය කොපමණ සත්‍යයක් ද? එහෙත් මෙ තරම් අසම්මත බිහිසුණු මඟක මා ගෙන යනු ඇතැ යි මම එදා නො සිතිමි.) ජේසු ඔබගේ ජීවිතයේ ස්වාමින් වහන්සේ වශයෙන් පිළිගන්නට සූදානම් දැයි කණ්ඩායම තුළ සාකච්ඡාවට අවස්ථාව ලැබිණි. මම සාකච්ඡාවට නොගොස් පසෙකට වී සිටියෙමි. ඒ ගැන ඔවුහු මගෙන් විමසූහ. “ඒ ගැන සාකච්ජා කරන්න දෙයක් මට නැහැ. මගේ ජීවිතය ජේසුට කැප කරන්න තීරණය අරගෙන ඉවරයි” මම එලෙස පිළිතුරු දුනිමි.

ඉන් පසු එළඹුනේ ශුද්ධාත්ම මෙහෙය යි. ඔබ යාච්ඤා කර ගැනීම සඳහා කණ්ඩායම වෙතට ගිය විට ඔබ දෙවිඳුන්ගෙන් ඉල්ලන්නේ කුමක් දැයි ඔවුන් අසනු ඇත. එවිට මුල් යුගයේ ශුද්ධාත්ම දීමනාවන්ට පමණක් සීමා නො වී මෙම යුගයට අවශ්‍ය යැයි ඔබට හැඟෙන ශුද්ධාත්ම දීමනා ද ඉල්ලන ලෙස පිය තුමා පැවසීය. දෙවියන් වහන්සේගේ ප්‍රඥාව ලෝකයට මෝඩකමක් නිසා එතුමන් කැඳවන ගමන් මඟ යන්නට නම් දේව ප්‍රඥාව අත්‍යවශ්‍ය යැයි මට හැඟිණ. ඔස්කා පිය තුමා ද එකිනෙකාගේ හිස මත අත තබා යාච්ඤා කරන්නට විය. කණ්ඩායම් කීපයක් ද යාච්ඤා කළහ. පිය තුමා දවස පුරා මහත් සේ වෙහෙස වී සිටී. මා ද එතුමා ළඟට ගොස් කරදර කළ යුතු නැතැ යි මට සිතුණේය. මම නැගිට අවට බැලීමි. මා යන්නේ කවර කණ්ඩායම වෙතට ද? සුදු ලෝගුව ඇඳගත්, කෙට්ටු උස තැනැත්තා සිටි කණ්ඩායම වෙතට යන්නට මට සිතිණි. එවිට එතුමා මගේ මුහුණට සිය දෑත තබා “පුතා, දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්නේ කුමක්දැයි” විමසීය. ප්‍රඥාව, සාමය, අන්‍යයන් වෙතට සැනසීම ගෙන යාමේ දීමනාව යැයි මම කීවෙමි. ඔවුහු මා වෙනුවෙන් යාච්ඤා කළහ. එය මා ශුද්ධාත්ම ගින්නෙන් ලැබූ බෞතිස්මයකි. මම පසෙකට වී මිනිත්තු දහයක් පමණ දණ ගසා සිටියෙමි. මට මහත් සැහැල්ලුවක් දැනිණි. සිතුවිලි ගලා ඒම පවා නැවති ඇත. එය පූර්ණ විවේකයකි. උදෑසන මා නිවසට පැමිණි විගස 1974 සැප්තැම්බර් 21 මගේ අලුත් උපන් දිනය ලෙස සටහන් කර ගතිමි. (මා හිස මත අත තබා යාච්ඤා කළේ ප්‍රැන්සිස්කන් නිකායේ ගරු පයස් සහෝදර තුමා බව පසු ව මම දැන ගතිමි.)

1974 සැප්තැම්බර් 21 මෙහෙයට මුල පිරූ බයිබල් පාඨය මගේ ජීවිතයට මහත් සේ බලපෑවේය. **“ශුද්ධාත්මයාණන් විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය.” (රෝම 8:14)** එයින් මට අවබෝධ වූයේ කුමක් ද? සැබෑ

කිතුනුවෙක් යනු තමා දෙවියන් වහන්සේගේ පුත්‍රයෙක් බව අත්දකින අයෙකි. දෙවියන් වහන්සේගේ පුත්‍රයෙක් බවට ඇති සහතිකය දේව ආත්මයාණන් විසින් මෙහෙය වනු ලැබීම, ගෙන යනු ලැබීම අත්දැකීම යි. මේ සත්‍යය මට මහත් සේ වැදගත් වූයේ ඇයි? ඊට පෙර ගෙවී ගිය තිස් පස් වසරක ජීවිතය පුරා, දෙවියන් වහන්සේ විශ්වාස නොකළ කාලවකවානුවල දී පවා යම් බලගතු හස්තයක් මා ගෙන යන බවට මා තුළ අත්දැකීමක් විය. ඒ හස්තයට මම දිගට ම ඉඩ දුන්නෙමි. දුෂ්කර පාසලකට මාරුවක් ලැබුණු විට පවා මා කීවේ මා එතැනට යවා ඇත්තේ මා එතැනට අවශ්‍ය නිසයි කියා ය.

මුළු දිවිය පුරා මා තුළ ක්‍රියාත්මක වූ ඒ කැරිස්මාව ජේසු සමිඳුන්ට කැප වීමෙන් පසු කීප ගුණයකින් මා තුළ ප්‍රබල අත්දැකීමක් විය. ජේසු සමිඳාණන් මගේ ජීවිතයේ එඬේරාණන් ලෙස පිළිගැනීමෙන් පසු ව මගේ ජීවිතයේ කිසි ම සිදු වීමක් අහම්බයක් නො වන බවත් සියලු සිදු වීම්වල රටාවක් ඇති බවත් ඒ සැම සිදු වීමක් තුළින් ම (සාර්ථක, අසාර්ථක, යහපත්, අයහපත්) මගේ එඬේරාණන් මට කතා කරන බව මට මඟ පෙන්වන බව මට අවබෝධ විය. එනිසා මාලිමාවේ කටුව උතුරට ම හැරෙන්නාක් මෙන් සැම සිදු වීමකට ම සංවේදී වීමෙන් සමිඳුන් දෙසට හැරීමේ එතුමන් තුළ ම රැඳීමේ දීමනාව මා සමඟ විය. ඒ තුළින් මා වෙත ගලා ආවේ දේව ප්‍රඥාව යි. දෙව් පියාණන්ගේ වචනයාණන් වන ජේසු සමිඳාණන් මගේ එඬේරාණන් වීම නිසා මගේ ජීවන ගීතයේ පබැඳුම එතුමන්ගෙන් ය. ජේසු සමිඳාණන් මගේ ජීවිතයේ එඬේරාණන් වීමෙන් පසු මගේ ජීවිතයේ සැම සිදු වීමක් ම ඒ ගීතයේ අකුරක්, වචනයක්, වැකියක් බව මට අවබෝධ විය. දෙව් පියාණන්ගේ ආත්මයාණන් ඒ ගීතයේ තනුව හා ගායනය බව අත්දැකීමෙන් ම මට පසක් විය. එවිට ජීවිත සිදු වීම් තුළින් එතුමන් මට පවසන දේ මට වැටහේ. මා තැබිය යුතු ඊ ළඟ පියවර මට වැටහේ. එය උතුම් දේව තිළිණයකි. එසේ ම එය ලොකු දඬුවමක් ද නො වේ දැයි මට විටෙක සිතිණි. මේ අත්දැකීම නිසා යම් මොහොතක දෙ දෙනෙක්ට (දේව තාත්තාට හා ඔස්කා පිය තුමාට) කීකරු වීමේ ගැටළුවකට මා මුහුණ දෙනු ඇත.

## 3

මා ලැබූ නව උපතත් සමග ම මගේ ඇඟේ හැපුන මුල් ම පොත් දෙක වූයේ **රෝයි හෙසියන්ගේ 'කුරුසියේ මාර්ගය'** හා **ප්‍රැන්සිස් සාලෙස් මුනි** තුමාගේ **'දේව භක්ති ප්‍රේමය' යි.** රෝයි හෙසියන් බැහැපත්කමේ ඒ නිවැරදි මඟ වෙතට ම අපට උපදෙස් දෙයි. ලෞකික තෘෂ්ණා මෙන් ම ආත්මීක තෘෂ්ණා මගින් ද නපුරාට ක්‍රියා කළ හැකි බව පවසන සාලෙස් මුනි තුමා එනිසා ආත්මික දීමනාවලට ද ආශා නො වන ලෙස උපදෙස් දෙයි. ආත්මීක දීමනාවක් යැයි ඔබට හැඟෙන දෙයක් ඔබට ලැබුනොත් එය දෙවියන්ගෙන් ද එය නපුරාගෙන් ද එය ඔබ තුළින් ම දැයි ඔබ නොදන්නා නිසා එය නැවත නැවත දෙවිඳුන්ගේ හස්තයට යට කරමින් යාච්ඤා කරන ලෙසත් ඉන් පසු ද එම දීමනාව ඉස්මතු වේ නම් පමණක් ඊට අවදිව සිටින ලෙසත් එතුමා උපදෙස් දෙයි. ජීවිත ගමන පුරා නොමඟ නොයන්නට එතුමන්ගේ අවවාදය මට මහෝපකාරී විය.

ජේසු සමිඳුන්ට ජීවිතය කැප කිරීමෙන් පසු මා අත්දුටු සාමය ප්‍රීතිය කෙමෙන් වියැකී යන විට මේ සියල්ල හැඟීමක් පමණක් දැයි මට විටෙක සිතිණි. 1974 දෙසැම්බර් මස පුබුදුව ශුද්ධ වූ බයිබලය මුල්කර ගෙන දින පහක ඥානකාන්තියක් පැවැත් විය. එහි දේශකයා වූයේ ඔස්කා පිය තුමා ය. කිතු දහම පිළිබඳව මා තුළ පැවති ගැටළු නිරාකරණය විය. මනුෂ්‍ය වර්ගයා පිළිබඳ දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ මහා දැක්ම මා මවිතයට පත් කළේය. ඥානකාන්තිය අවසන් වූ පසු මා සමඟ එහි සිටි මිතුරකුට මම මෙසේ කීවෙමි. “මේ දින පහ පුරා අප ඇසූ සියල්ල සත්‍යය යි. එසේ නම් අපි එය ක්‍රියාවට නගමු.” මෙ ලෙස හැඟීම් නො ව සත්‍යය මගේ ජීවිත දුම්රියේ ඇංජිම බවට පත් වීම මා ලැබූ භාග්‍යයකි.

මා විවාහ වෙනවා නම් එය සිදු වන්නේ අක්කගෙත් නංගිලා දෙන්නගෙත් විවාහයෙන් පසු ව යැයි මම සිතා ගතිමි. එවිට මගේ වයස අවුරුදු 35 පමණ වනු ඇතැ යි මම උපකල්පනය කළෙමි. මා විවාහ විය යුතු නම් ඊට නිසි තැනැත්තිය නිසි මොහොතේ මගේ ඇඟේ හැපෙනු ඇතැ යි ඒ ගැන විමසන්නන්ට මම කීවෙමි. එය එලෙස ම සිදු විය. ඇය ම මා විමසුවාය. අම්මගෙන් අසා පිළිතුරක් දෙන බව මම ඇයට පැවසුවෙමි. පුංචි දෙයත් අම්මාට කියනවා නම් ලොකු තීරණ ගන්නට පෙර අම්මාට කිව යුතු යැයි මා අදිටන් කර තිබිණි. “අම්මත් කැමතියි, මමත් කැමතියි.” මම ඇයට පැවසීමි. “අපි දෙ සතියකට වරක් වත් හමු වෙමු. මඟ-තොට නො වෙයි, ලියුම්වලින් නො වෙයි, සිනමා ශාලාවල නො වෙයි, අපේ අම්මා ගෙදර ඉන්න දිනයක අපේ ගෙදර දී” ඇය එලෙස පැවසුවාය. ඇය ධනවත් පවුලක, පුතුන් කීප දෙනකු සිටින පවුලක එක ම දියණිය නිසා ඇයගේ නිවසට පළමුවෙන් යන දිනයේ මට බියක් දැනිණ. මම ඇයට එය කීවෙමි. “අපේ දෙමව්පියන් ඒ අතින් හුඟක් වෙනස්. වයස 19 සම්පූර්ණ වෙද්දි අපට

සම්පූර්ණයෙන් නිදහස දෙනවා. දෙමව්පියන් මට කීවේ කවදා හෝ ඔබ ආදරය කරන්නේ හිඟන්නකුට නම් ඒ හිඟන්නට ගෙදර එන්න කියන්න, මඟ-තොට කතා කරමින් සිටින්න එපා කියලයි" ඇය එලෙස කීවාය. සරල බව වාම් බව ඇය තුළ කැපී පෙනෙන ගුණාංග විය.

දෙ සතියකට වරක් මම ඇය හමු වීම්, මාස 11ක් පමණ. මේ සම්බන්ධයට මුල පිරිමත් අප මීසමේ (පලඟතුරේ) පුබුදු දේශනා ඇරඹීමත් එක ම කාලයක සිදු විය. පුබුදු දේශන දීම ද දෙ සතියකට වරක් සිදු විය. ඇය හමු වූ විට පුබුදු දේශනයේ හරය මම ඇය හා බෙදා ගතිමි. ඇය එකල විද්‍යා ගණිත ගුරුවරියකි. දිනක් ඇය මෙසේ පැවසුවාය. "මම ටික කලක් පල්ලි ගියේ නැහැ. දැන් ඔබගේ දේශනා අහලා පල්ලි යනවා." අක්කර දෙකක් හා නිවසක් දෙන බව, ඒ නිවස අපි මෙ තැන හදමු ආදි වශයෙන් ද කතා කළ පසු ඇගේ දෙමාපියන්ට අපේ නිවසට ඒමට දිනයක් දන්වන ලෙස ඇය කීවාය. සතියක් තුළ එය ඉටු කරන බව මම ඇයට පැවසීමි.

එහෙත් ඒ සතිය තුළ නොසිතූ දේ සිදු විය. මම සිහිනයක් දිටිමි. සවස පංතියකට ඉගැන්වීම සඳහා මම පාසලේ නැවති සිටියෙමි. සිසුන් එතෙක් පැමිණ නැත. මම මේසය අසල වාඩි වී යමක් ලියමින් සිටියෙමි. හදිසියේ ම, අඩි හයක් පමණ උස, සුදු ජාතිකයකු මෙන් පෙනෙන ගරු පිය තුමෙක් ඉතා කඩිසර ව මා වෙත පැමිණියේය. "ආගම ඉගෙන ගන්න ළමයි 15ස් දෙනෙක් ඉන්නවා. මම හිතුවා ඇන්තනි උගන්වයි කියලා. බැරි නම් මම වෙන කෙනෙක් එවන්නම්" මා වචනයක් හෝ කියන්නට පෙර පිය තුමා විගස ආපසු හැරී යනු මම බලා සිටියෙමි. මම තිගැස්සී අවදි වීමි. ඊ ළඟ දින දෙක තුළ තවත් සිහින දෙකක් දුටිමි. මගේ කැඳවීම මට පැහැදිලි විය. ඔස්කා පිය තුමා හමු වී උපදෙසක් ලබාගත යුතු යැයි මම සිතා ගතිමි. "විවාහ නො වී මුළු ජීවිතය ම දෙවියන් උදෙසා කැප කරන්නට සූදානම් තරුණියන් කීප දෙනකු අපට සිටිනවා. එවැනි එක ම තරුණයෙක් වත් දැනට අපට නැහැ. ඇන්තනි, මෙය ඔබට ලැබී ඇති දේව කැඳවීමක්." ඒ ඔස්කා පිය තුමාගේ වචනයි. මේ සියලු සිදු වීම් අතර සති දෙකක් ම ගත වී ඇත. පසු දින ඇය හමු වී සියල්ල පවසන්නට මම අදහස් කළෙමි. එහෙත් මෙය මා ඇයට පවසන්නේ කෙසේද? ඇයට මෙය වැටහේද?

එදින රැය මම මෙ ලෙස යාච්ඤා කළෙමි. "සමිඳුනි, ඔබට හැකි නම් සිහිනයෙන් හෝ මට කතා කරන්නට ඔබට හැකියි, මේ රාත්‍රියේ සිහිනයකින් හෝ ඇයට කතා කරන්නට. මා වෙනුවෙන් එසේ කරන්නට ඔබට යුතුකමක් ද ඇත." පසු දින සවස මම ඇය හමු වන්නට ගියෙමි. ඇය ම කතාවට මුල පිරුවාය. "මම ඔයා ව කවදා වත් හීනෙන් දැකල තිබුණේ නැහැ. ඊයේ රෑ හීනෙන් මම ඔබ දුටුවා. ඔබ මේ පුටුවේ වාඩි වී සිටියා. ඔබ කුරුල්ලෙක් වාගේ සිංදු කියමින් සිටියා. කුරුල්ලෙක්ටත් වඩා වැඩි නිදහසක් ඔබට තිබුණා. මට බයත් හිතුණා." අද එවැනි දෙයක් කියන්නට තමයි මා ආවේ යනුවෙන් මුල පුරමින් මම ඇයට සියල්ල පැවසීමි. ඇය සියල්ල සාවධාන ව අසා සිටියාය. "ඔයාගේ ජීවිතේ මාස 11ක් මා නිසා අපතේ ගියා." මම කීවෙමි. "මේ තරම් දෙයක් මා මේ තරම් පහසුවෙන් අසා සිටියේ ඔබගේ ඇසුරෙන් ලැබූ ශක්තිය නිසයි. ඒ කාලය අපතේ ගියේ නැහැ." ඇය කීවාය.

එහෙත් ඉක්මනින් සියල්ල වෙනස් විය. ඇය ඔස්කා පිය තුමාට ලිපි කීපයක් ම යවා ඇත. ඒ ලිපිවල සඳහන් වැදගත් ම අදහස මෙය යි. "පුබුදුව කරගෙන යාමට තව ඕනෑ තරම් මනුෂ්‍යයෝ සිටිති. ඒත් මා දෙවියන් කරා යන ගමනට මට ඇන්තනි අවශ්‍ය යි." ඔස්කා පිය තුමා අප දෙදෙනා ම කැඳවිය. "මෙය ඇන්තනිට ලැබී ඇති දේව කැඳවීමක්. ඒ නිසා ඔහු ව නිදහස් කරන්නැ"යි පිය තුමා ඇයට පැවසීය. "ඔයාගේ ජීවිතය අසාර්ථක වන්නේ නැහැ"යි වෙන් ව යන විට මම ඇයට පැවසීමි. "ජේසු නම් මේ වාගේ වැඩ කරන්නේ නැහැ"යි ඇය පැවසුවාය. මේ විවාහය සිදු නො වන බව මම අම්මාට කීවෙමි. ඇත්තද? කියා ඇය ඇසුවා මිස, ඒ ඇයි? කියා ඇය ඇසුවේ නැත. අපි වෙන එකක් බලමු කියා ඇය ජීවත් වන තුරාවටත් නොකීවාය. අප පවුලේ අනෙකුත් සහෝදර සහෝදරියන් හතර දෙනා ගැන අම්මා එලෙස ක්‍රියා කර නැත. මගේ කැඳවීම පිළිබඳ ව අම්මා තුළ යම් ඉඟියක් හෝ තිබෙන්නට ඇතැයි මට සිතේ.

මේ සිදු වීම්වලින් සතියක් ඉක්මෙන්නටත් පෙර ගරු ලූෂන් ඩෙප් පිය තුමාගේ දේශනයකට සවන් දෙන්නට මට අවස්ථාව ලැබිණි. "අපගේ ප්‍රාර්ථනා කඩා වැටීම නිසා ඇති වන කළකිරීමෙන් ගන්නා තීරණ දේව කැඳවීමක් නො වන්න පුළුවන්. නියම දේව කැඳවීමක් නම් ජේදුරු තුමාගේ මෙන් විය යුතුයි. එය ඔහු මසුන්ගෙන් ඔරු දෙකක් ම පුරවා ගත් දිනය යි. ඔහුගේ ධීවර ජීවිතයේ සාර්ථක ම දිනය එය යි. ඒ මොහොතෙ යි, 'සියල්ල අත්හැර මා අනුව එන්නැ'යි ජේසු සමිඳුන් ඔහු කැඳවූයේ. එය රසමසවුලෙන් පිරි කෑම මේසයේ ඔබ වාඩි වන විට ඔබේ අතින් අල්ලා නැගිටින්න, අපි යමු කීම වාගේ දෙයක්." ඒ දේශනයට සවන් දෙන්නට ලැබීම ගැන මම සමිඳුන් පැසසීමි. එදා ඇය මගෙන් වෙන් වී යන විට ඇය පැවසූ දෙයට එය නිසි

පිළිතුර විය. වසර අග මට ද ඇයගෙන් ඇරයුම් පතක් ලැබිණි, ඇයගේ විවාහ මංගල දිව්‍ය පූජාවට සහභාගි වීම සඳහා. මම එදින ඇයගේ මුහුණ බලා "ජේසු පිහිටයි" කීවෙමි. ඒ මුහුණ මේ වන තුරු නැවත නො දිටිමි.

1975 දී පුබුදුව තුළ දස වසරක මගේ දහම් සේවාවට මුල පිරුණේ සිසු පිරිසකට පුබුදු දේශන දීමෙනි. මා ගමේ පාසලේ උගන්වන කාලයේ සුහද ව ඇසුරු කළ සිසුන් පනස් දෙනකුට ඒ සඳහා ඇරයුම් කළෙමි. පළමු දේශනයට තිස් දෙනෙක් පැමිණියහ. එහෙත් කැපවීමේ මෙහෙයට සහභාගි වූයේ 15ස් දෙනකු පමණි. එවිට අර සිහිනය මට නැවත සිහිපත් විය. එය පළමු පියවර පෙන්වීමක් නො වේද? වසරකට අඩු කාලයක් ඒ සිසු පිරිස හා දෙ සතියකට වරක් අපි එක්රැස් වූයෙමු. එම සිසුහු දේව රාජ්‍ය උදෙසා ක්‍රියා කරන කෙනකුට ඇවැසි ඉවසීම මට ඉගැන්වූහ. පුබුදුව සභාව කඩාගෙන යන පිරිසක් ලෙස කල්පනා කළ පිය තුමෙකි, ඒ කාලයේ අප මීසම භාරව සිටියේ. ඒ බලපෑම් නිසා සිසු එකතුව ඉක්මනින් අවසන් විය. එය අවසන් වූයේ ද මට ඇවැසිව තිබූ ඉතා ම වැදගත් පාඩම මට උගන්වමිනි. දේව රාජ්‍යය උදෙසා මට බොහෝ දේ කළ හැකි යැයි මම එකල සිතුවෙමි. සැබවින් ම මට ඒ සඳහා කිසිවක් කළ නොහැකි බව මට අවබෝධ විය. කිසිවකු හෝ වෙනස් කරන්නට මට නොහැකි බව මට අවබෝධ විය. එහෙත් දෙවියන් වහන්සේට සියල්ල පුළුවන. මා එතුමන් අත මෙවලමක් විය යුතුය. එවිට දෙවිඳුන් මා මෙවලමක් කරගෙන අති ප්‍රබල දෙයක් කළත් මා දෙවිඳුන්ගේ මහිමයෙන් බිඳක් හෝ සොරා ගන්නට ක්‍රියා නොකරනු ඇත.

## 4

ඒ 1978 වසර යි. ඉගැන්වීමේ කටයුතු හා පුබුදුවේ වැඩ කටයුතු නිසා මා අවිවේකි ව ඇත. දැන් මේ දෙකෙන් එකක් තෝරාගත යුතු මොහොත පැමිණ ඇත. ගුරුවරයකු වීම මගේ ජීවිත පැතුම නො වීද? ළමුන්ගෙන් තොර ජීවිතයක් මට ඇද්ද? එහෙත් දේව රාජ්‍යය උදෙසා පැවරෙන දූත මෙහෙය ඊට වඩා උතුම් නො වේද? මේ දෙක අතර මම මැදි වී සිටියෙමි. "ගුරු වෘත්තිය උතුම් දේව කැඳවීමකි. ජේසු ව අත්දකින අයකුගේ සෙවනැල්ල සිසුන් මත වැටීම මොන තරම් වටිනා දෙයක්ද?" එලෙස පවසමින් සමහර ගුරුවරු ගුරු වෘත්තියෙන් ඉවත් ව නොයන ලෙස මට උපදෙස් දුන්හ.

1977 වසරේ දි පළමු වරට පුබුදුවේ පස් දෙනකුට ඇමෙරිකා එක්සත් ජනපදයට යන්නට ජාත්‍යන්තර පුබුදුවෙන් ඇරයුම් ලැබී තිබිණි. ඒ සඳහා සහභාගි වන්නැ යි ඔස්කා පිය තුමා මට ද දැන්විය. අ. පො. ස. (සා. පෙළ) විභාගයට සූදානම් වන සිසුන් ගැන නොසලකා මාසයකට වැඩි කලක් මට විදේශ ගත විය හැකිද? එනිසා මට ලැබුණ ඒ අවස්ථාව මම අත්හළෙමි. 1978 වසරේ ද පස් දෙනකුට නැවත එම අවස්ථාව උදා විය. "මෙ වර නම් ඇන්තනි යා යුතුයි." ඔස්කා පිය තුමා පැවසීය. එහෙත් මෙ වර ඇත්තේ ද කලින් වසරේ පැවැති ගැටළුව ම ය. ගුරු වෘත්තියෙන් ඉවත් වීම හා ඇමෙරිකාවට යාම මා පිළිබඳ දේව සැලැස්ම විය. ඒ සඳහා අමුතු දෙයක් සිදු විය. අප විදුහලේ 11 වන වසර සිසුන් බාලිකා විදුහලට යවන ලෙස වසර මැද අධ්‍යාපන දෙපාර්තමේන්තුව දන්වා එවීය. හේතුව ඒ මොහොතේ විද්‍යා ගණිත ගුරුවරයකු අප පාසලේ නොසිටීම විය හැකි ය. කලකට විද්‍යා ගණිත ගුරුවරයකු සවසට ගෙන්වා හෝ ඒ විෂය ඉගැන් වූ බව දෙපාර්තමේන්තුව දනී. විභාගයට මාස කීපයක් තියෙද්දි වයස අවුරුදු 16ක සිසුන් පිරිසක් බාලිකා විදුහලට යැවීම අධ්‍යාපන මනෝ විද්‍යාවට එකඟද? අප කොපමණ උත්සාහ කළත් එම තීරණය වෙනස් කළ නොහැකි විය. එහි රහස මට අවබෝධ විය. "මෙය සිදු වන්නේ මා නිසයි. මා ගුරු වෘත්තියෙන් ඉවත් වීමත් මා ඇමෙරිකාවට යාමත් දේව සැලැස්මයි." මම විදුහල්පතිවරයාට එසේ කීවෙමි. ඔවුන්ගේ අධ්‍යාපනය අවසන් වුවත් බාලිකා විදුහලට යාමට සිසුහු එකඟ නො වූහ. එනිසා ඔවුන් නගරයේ විදුහල් දෙකකට ඇතුල් කර මම ද අගෝස්තු 15 සිට ගුරු වෘත්තියෙන් ඉල්ලා අස්වීමි.

මා ගුරු වෘත්තියෙන් ඉවත් වන්නට තීරණය කළ මොහොතේ කෙනකු ඇසූ ප්‍රශ්නයක් මගේ මතකයට නැගේ "ඔබ ගුරු වෘත්තියෙන් ඉල්ලා අස්වීමට යන්නේ ඔබට පුබුදුව විශ්වාසද? ඔස්කා පිය තුමා විශ්වාසද?" "ඒ කිසිවක් මට විශ්වාස නැහැ. ඒත් දෙවියන් වහන්සේ මෙ වැනි ජීවිතයකට මා කැඳවන බව මට විශ්වාසයි. මා කැඳවන තැනැන් වහන්සේ මට විශ්වාසයි" මම එලෙස පිළිතුරු දුනිමි. "එවැනි විශ්වාසයකින් නම් මේ තීරණය ගන්නේ අප ඔබට කිසිවක් කිව යුතු නැතැ"යි ඔහු පැවසීය.

අපගේ විදේශ ගමන 1978 අගෝස්තු 19 සිට ඔක්තෝබර් 03 අතර සිදු විය. එයින් වැඩි ම කාලයක් ඇමරිකා එක්සත් ජනපදයේ ඉන්දියානා, මිනොසාටා, හා මිචිගන් ප්‍රාන්තවල ගත විය.

දින 03ක් රෝමයේ ද දින 03ක් ලන්ඩන් නගරයේ ද ගත විය. ඇමරිකා එක්සත් ජනපදයේ ගත කළ අර්ථවත් ම දින 03 මිනියොපොලිස් නගරයේ, විවාහ නො වී තම ජීවිත ජේසු සමිඳුන් උදෙසා කැප කළ (Single for Lord) තරුණයන් දස දෙනා අතර ගත කළ කාලයයි. ඔවුන්ගේ නම් මට අදත් මතක ය. (ලෙරී, ගෙරී, ටිම්, ටොම්, කෙන්, කෙවින්, ජෙෆ්, ඩේවි, මාක්, පෝල්) විදේශ ගමන පිටත් වන විට මා තුළ අලුතින් මතු වූ එහෙත් නොවිසඳුන ප්‍රශ්නයක් විය. ඒ ප්‍රශ්නය මා තුළ පැනනැගෙන්නට හේතුව මෙයයි. ඒ දිනවල පුබුදුව වැඩි වශයෙන් ම කතා කළ වචනය වූයේ "ජේසු සමිඳාණෝ ඔබ තුළ වැඩ සිටිති" යන්න යි. මූලික එකතුවේ දී ඒ පිළිබඳ අත්දැකීම් විමසන අවස්ථා විය. එවිට සැම දෙනාගේ ම මුවින් නික්මුණේ ඉතා සාර්ථක අත්දැකීම්ය. මගේ අත්දැකීම් පමණක් අසාර්ථකය. ඒ ඇයි? ඇයි දෙවියන් වහන්සේ මට වෙනස්? ඒ ප්‍රශ්නයට මට පිළිතුරක් ලැබුණේ ඒ තරුණයන්ගේ නිවහනේ දී ය. එදින එහි ගතකළ අවසන් දිනය යි. එය සිකුරාදාවකි. ඔවුන් බ්‍රහස්පතින්දා රාත්‍රි ආහාරයෙන් පසු නැවත ආහාරයක් ගන්නේ සෙනසුරාදා උදෑසන ය. සිකුරාදා යාච්ඤාව හා දේව වචනය තුළ ගත වේ. එවැනි මොහොතක ඔවුන්ගේ පුස්තකාල කාමරයේ **'The Decision'** පත්තරය දුටුවෙමි. එහි පිටු පෙරලා බලන්නට මට සිත් විය. **'SomeTimes We Are Borken'** ලිපියට මගේ ඇස යොමු විය. එහි සඳහන් මෙම අදහස මගේ ප්‍රශ්නයට පිළිතුරක් විය. "ඔබ ජේසු සමිඳුන්ට ජීවිතය කැපකළ පසු ඔබගේ ජීවිත අත්දැකීම් අනෙක් අයගේ අත්දැකීම්වලට වඩා වෙනස්ද? අසාර්ථකද? එසේ නම් එය වඩා උතුම් කැඳවීමක් පිළිබඳ සළකුණකි."

මම විගස එම ලිපිය සටහන් කර ගතිමි, මට පැහැදිළිව වැටහෙන අදහස් සිංහලෙන් ද අනෙක් කොටස් ඉංග්‍රීසියෙන් ද. එය උපුටා දක්වන්නට මම කැමැත්තෙමි. "උතුම් දේව සේවකයින් බිහි වන්නේ රෝස මල් අතුල මාවත්වල ගමන් කරන අය තුළින් නො ව, දුක් වේදනා තුළ ද දෙවිඳුන්ගෙන් යැපෙන්නට ඉගෙන ගත් අයගෙනි. දුක් වේදනා මැද ද සමිඳුන් තුළ ප්‍රීතිමත් වෙමින් ගත කරන අයගේ දේශනා අප හදවත් අලුත් කරයි. "**හැරී නිශ්චලව සිටීම කරණකොට ගෙන නුඹලා ගැළවෙන්නහුය, නොකැළඹී විශ්වාස කිරීමෙන් නුඹලාට බලය ලැබෙන්නේය." (යෙසායා 30:15)**

බලාපොරොත්තු නො වූ යමක් ඔබ ජීවිතයේ සිදු වන විට, අසාර්ථකත්වයන් තුළින් ගමන් කරන්නට ඔබට සිදු වන විට ඔබ බොහෝ සෙයින් කලබල වන්නට පුළුවන. සියල්ල වැරදී ඇතැ යි ඔබට සිතෙන්නට පුළුවන. අවශ්‍ය වන්නේ සමිඳුන් දෙස බලා නොකැළඹී සිටින්නට ඉගෙන ගැනීමයි. අපගේ කලබල වීම යි, ස්වාමින් වහන්සේට අප්‍රසන්න වනුයේ. ඒ අසාර්ථකත්වයේ අත්දැකීම තුළින් ද සමිඳුන් ඔබට කථා කරන බව, සමිඳුන් ඔබ තුළ අලුත් යමක් කරන බව විශ්වාස කර නිශ්චල වන්නට ඉගෙන ගන්න. සමිඳුන් මඟින් අප වැදගත් ම ඉගෙනීම් ලබන්නේ දුක් වේදනා තුළ යි. දුක් වේදනා තුළින් ලැබෙන ඉගෙනීම් අප බැහැපත් කරයි. ස්වභාවයෙන් ම අහංකාරී වූ අපට එවැනි ඉගෙනීම් ලබා ගන්නට අමාරු ය. එවැනි ඉගෙනීම් අපගේ උඩඟු සිත නිසා දරා ගැනීමට අපහසුය. දුක් වේදනා තුළින් ලැබෙන ඉගෙනීම්වල දී ඔබ සතු දෙයින් යමක් සමිඳුන් අතට ගෙන, ඔබ නැති ව ක්‍රියා කරන්නට සමිඳුන්ට හැකි බව අවබෝධ කර දී ඔබගේ පූර්ණත්වය සඳහා සමිඳුන් තුළ යැපීම ඔබට ඉතා අවශ්‍ය බව වටහා දෙයි.

එනිසා ඔබ ගැටළු අවස්ථාවන්ට මුහුණ දෙන විට අධෛර්යය නො වන්න. ඔබට සියල්ල වැරදී ඇතැ යි නො සිතන්න. දෙවියන් වහන්සේ ඔබට ආදරය කරන තරමට, දේව රාජ්‍ය සඳහා සේවය කිරීමට දේව සේවකයකු වශයෙන් සමිඳුන් ඔබ ව පුහුණු කරන තරමට මෝසස් මුහුණ දුන් ඒ උදාර අත්දැකීම ඔබට ද උරුම වනු ඇත. ඔබගේ ඉදිරි ගමන රතු මුහුදෙන් හරස් වන විට, සතුරු සේනාව පසුපසින් ලුහුබඳින විට කාන්තාරයක් මැද බලාපොරොත්තු සහිත ව සමිඳුන් දෙස බලා සිටීමට ඔබට ද සිදු වනු ඇත.

**"භය නො වන්න, නිශ්චලව සිට ස්වාමීන් වහන්සේ අද නුඹලාට සිදුකර දෙන ගැළවීම බලා සිටින්න. ස්වාමීන් වහන්සේ නුඹලා උදෙසා සටන් කරන සේක. නුඹලා නිශ්චලව සිටිය යුතුයි." (නික්මයාම 14:13,14)**

ඒ තත්ත්වයට මුහුණ දීමට ලැබීම සමිඳුන්ගෙන් අපට ලැබෙන උතුම් ම ඉගෙනීමකි. අප මුහුණ දෙන ඒ තත්ත්වය අප වෙනුවෙන් ස්වකීය හස්තයට ගෙන අපේ හැකියාවන්ට වඩා, අපට සිතා ගත හැකි උසස් ම මට්ටමට වඩා ඉතා ම උසස් අන්දමින් විසඳන්නට දෙවියන් වහන්සේට පුළුවන. කිසිදු අස්වැන්නක් නොලැබෙන වැලි කන්දක් හාන්නට ගොවියා කාලය වැය නොකරන්නාක් මෙන් දෙවියන් වහන්සේ ද සිය මහන්සිය හා කාලය වැය කරන්නේ සරු අස්වැන්නක් ලබා ගැනීමට හැකි යැයි බලාපොරොත්තු වන තද පොළොවක් හාන්නටය. දෙවිඳුන් තුළ යන ගමනේ දී ගැටළු, වේදනා හා අසාර්ථකත්වයන් තුළින් අප ව සම්පූර්ණයෙන් තනි කරන අවස්ථා අප

ජීවිතයට නොඑළඹෙනවා නම් අපේ ජීවිතය වඳ බව, ඒ වැලි කන්දක් පමණක් බව අපට වැටහී යා යුතුයි. සැම විට ම හිරු එළිය ලැබේ නම්, එතැන කාන්තාරයක් වනු නියතය. හිරු එළිය මෙන් ම අඳුරු දවස්, වැසි දවස් සියල්ල අවශ්‍යයි, පොළොව සරුසාර වීමට නම්.

අපගේ ජීවිත භාර ගෙන එය අඹන කලාකරුවාණෝ අපට ඉතා ම හොඳ දේ කුමක් දැයි දනිති. තම ආදර්ශවත් පුතණුවන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ම රුව අප තුළ ඇඹීමට එතුමාණෝ නිරන්තරයෙන් ක්‍රියා කරති. **"උන්වහන්සේ මා ගෙන යන මාර්ගය දන්නා සේක." (ජෝබ් 23:10)** සමිඳු රුව මා තුළ මතු කරනු සඳහා මා ගෙන යන මාවත, මා ගෙන යා යුතු මාවත දෙවියන් වහන්සේ හොඳාකාරව දනිති. දෙවියන් වහන්සේ මා ගෙන යන මාවත පැහැදිළිව දැන ගන්නට මා තුළ කැමැත්තක් ඇත. දෙවියන් වහන්සේ අප ගෙන යන මාවත අපට පැහැදිළිව දැනගත හැකි නම්, විශ්වාසය සහ දෙවියන් වහන්සේගේ කැමැත්තට කීකරු වීම අපට අවශ්‍ය නො වනු ඇත. මහත් වේදනා මැද ජෝබ් සැනසුම ලැබුවේ තමා ව ගෙන යන මාවත සමිඳුන් දන්නා බවට ඔහු තුළ පැවති විශ්වාසය නිසාය. තමා මුහුණ දුන් සැම බාධකයක් ම තරණය කර ජය ගැනීමට ඒ විශ්වාසය සමත් විය.

යමෙකු රෝගී ව රෝහලක නැවතී ප්‍රතිකාර ලබන විට ඔහු බලන්නට එන අය අතර මිතුරන් දෙ කොටසක් දක්නට ලැබෙනු ඇත. එයින් සුළු කොටසක් ඒ රෝගියා මුහුණ දෙන අත්දැකීම ජීවිතයේ විඳ ඇති අය ය. ඔවුන්ගෙන් ලැබෙන එක වචනයක් හෝ රෝගියාට ශක්තියකි. බොහෝ දෙනෙක් එවැන්නක අත්දැකීමක් නැති ව උපදෙස් දීමට පමණක් උනන්දුව දක්වන අය වෙති. ජෝබ් එවැන්නන් හඳුන්වන්නේ "කාලකණ්ණි මිත්‍රයන්" වශයෙනි. සැබවින් ම දුක් වේදනා විඳීම තුළින් දයාව, අනුකම්පාව ඉගෙන ගන්නට ලැබීම කොපමණ උතුම් ද? එනිසා දෙවියන් වහන්සේගේ සේවකයා දුක් වේදනා විඳීම තුළින් දයාව අනුකම්පාව ඉගෙනගත් අයකු වීම සමිඳුන්ගේ කැමැත්තය. මිනිස් බව ගත් දෙවියන් වහන්සේ වන ජේසු සමිඳුන් ගැන සිතා බලන්න, උන්වහන්සේ අත්දැකීමෙන් ම දැන නොගත් කිසිදු වේදනාවක් අපේ ජීවිතවල ඇති විය නොහැකි නිසා අප දැන ගත යුතුයි, අපේ වේදනා තුළ අපට අනුකම්පා කරන්නට කෙනෙක් සිටින බව. අපට පසු කරන්නට සිදු වී ඇති හැම මිටියාවතක් ම උන්වහන්සේ අපට පෙර පසු කර ගොස් ඇත. දිළිඳුකම කුමක්ද? මිතුරන් විසින් තමා අත්හැර දැමීම තුළ අත්දකින තනි භාවය කුමක්ද? පිපාසය සහ වෙහෙස යනු කුමක්ද? එතුමාණෝ දුක් විඳීම තුළින් අවබෝධ කර ගත්හ. තමා නොපිළිගන්නා වූ අය වෙනුවෙන්, ඔවුන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් යාච්ඤාව තුළ පොර බැදූ නිසා සතුරන් හා පළිගැනීම යනු කුමක්ද? නිදිවරා ගෙන රැය ගතකිරීම කුමක් දැයි සමිඳාණෝ දැන සිටියහ. පරීක්ෂාව හා ඒ තුළ ලබන ජයග්‍රහණය කුමක් ද කියා එතුමෝ දැන සිටියහ. කල්වාරි කඳු මත, කෲර ඇණවලින් රුදුරු කුරුසියක් මත එල්ලා එතුමන්ගේ අනගි අත් පා සිදුරු කිරීම තුළින් දුක් විඳීම යනු කුමක්දැ යි ජේසු සමිඳාණෝ අවබෝධ කර ගත්හ. මරණ සෙවනේ මිටියාවත තුළ හැම මිනිසකුට ම අත්දැකීමට සිදු වන මරණයේ වේදනාව එතුමාණෝ අත්දුටහ.

සමිඳුන් වෙනුවෙන් යමක් කරන්නට අපගේ හදවත් තුළ මහත් පිපාසයක් ඇති වන විට එතුමන් වෙනුවෙන් ලෝකයට ගොස් ක්‍රියාශීලි ව සාක්ෂි දැරීමට මහත් ආශාවක් අප තුළ ඇති වන විට, දේව රාජ්‍යය වෙනුවෙන් වැදගත් යමක් කිරීමට අප පුලපුලා බලා සිටින විට, සමිඳාණෝ කිසිවක් කරගත නොහැකි තත්ත්වයක් තුළ නිශ්චලව බලා සිටීමේ මහඟු පාඩම අපට උගන්වති. මෙය ක්‍රිස්තියානි ජීවිතයෙහි ගැඹුරු ම පරීක්ෂණය යි. **"ඇදහිල්ල වනාහි බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකය යි. අදෘශමාන දේ පිළිබඳ පැහැදීම යි." (හෙබ්‍රෙව් 11:1)** ඒ නිසා දෙවියන් වහන්සේ අපගේ විශ්වාසය අභ්‍යාස කිරීමක යෙදෙති. අප විශ්වාසය අභ්‍යාස කරන්නේ බලගතු දෙවියන් වහන්සේගේ පොරොන්දු අප භාර ගන්නා තරමටය.

මා දුක් විඳින්නේ ඇයි? මටත් අන් අය වගේ වෙන්න බැරි ඇයි? ඔබගේ අදහස් ඔබගේ බලාපොරොත්තු හැම දෙයක් ම දෙදරා සුන්බුන් වී යන අවස්ථාවේ දී, මෙ ලොව කිසි දිනක තේරුම් ගෙන නිමාවට පත් නො වන දෙවිඳුන්ගේ පූර්ණ සැලැස්ම ඔබ යම් තරමකට දකිනු ඇත. සමිඳුන් වතට වත දී දකින දිනයේ දී එතුමන්ගේ පූර්ණ සැලැස්ම දැක ඔබ මවිත වනු ඇත. එදිනට ඔබගේ දෙ නෙත් කඳුළු බිඳුවලින් ඔබ නිදහස් වනු ඇත. අහෝ ! වෙහෙසට පත්ව දුක් විඳින දේව දරුව, අපේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙස බලා එතුමන්ගේ සැනසීම ලබන්න."

ඒ පළමු වන ජුවාම් පාවුලු පාප් තුමන්ගේ අභිෂේක දිනය යි. රූපවාහිනිය මඟින් එය නරඹන්නට අපට අවශ්‍ය විය. ජෙෆ් සොයුරා අපට ඒ සඳහා අවස්ථාව සලසා දුන්නේය. එම වැඩසටහන අවසන් වූ පසු අප කැඳවා ගෙන යන්නට ඔහු නැවත එන බව කියද්දී අප සමඟ

නැවතී එම වැඩ සටහන නරඹන ලෙස අපි ඔහුගෙන් ඉල්ලුවෙමු. එවිට ඔහු මෙසේ පැවසීය. "ඇමෙරිකන් ජනතාව රූපවාහිණිය ඉදිරියේ ගත කරන කාලය හොඳට ම වැඩි යි. ඒ පාපයට වන්දි ගෙවීමක් හැටියට අප දස දෙනා සමිඳුන්ගේ මඟ පෙන්වීම තුළ තීරණය කරලා තියෙනවා රූපවාහිණිය කොහෙත් ම නොබලන්නට." එම ගමනේ දී හමු වූ මෙම වැකිය ද මට අර්ථවත් විය. **After suffering and chastening come the wonders of God, not before for God can only reveal Himself to humble hearts"**

ඒ ගමනේ දී සිදු වූ තවත් වැදගත් සිද්ධියක් මට සිහිපත් වෙයි. 1978. 09. 23 වන දින ඈන් ආබර් නගරයේ පුබුදු නිවසේ අපි සිටියෙමු. එදින රැය, අපගේ පිරිසෙන් එහි සිටියේ ඔස්කා පිය තුමා හා මා පමණි. රාත්‍රි 9.00 ට පමණ ඇත. ඔස්කා පිය තුමා දිව්‍ය පූජාව පැවැත් විය. ඊට සහභාගි වූයේ මා පමණි. පූජය දිවරහස් කිරීමත් සමග පිය තුමාගේ මුහුණේ තිගැස්මක් මම දිටිමි. "ඇන්තනි, මට හැඟෙනවා දෙවියන් වහන්සේ අප දෙදෙනාගෙන් ඉල්ලනවා, මරණය දක්වා එකිනෙකාට පක්ෂපාත වන්නට ගිවිසුමකට ඇතුලත් වන ලෙස." ඒ මොහොතේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ අපි එවැනි ගිවිසුමක් දුන්නෙමු. දිව්‍ය පූජාවෙන් පසු පිය තුමා මෙසේ කීවේය. අපගේ ගිවිසුමේ ලකුණක් හැටියට දැන් අපි එකිනෙකාගේ ජීවිතයේ එක පිටුවක් බෙදා ගනිමු. මම මගේ ළමා විය ගැන කීවෙමි. පූජාත්වරය ලැබීමට ආසන්න වූ විට එතුමා මුහුණ දුන් අභියෝගයන් ගැන පිය තුමා මට පැවසීය. "අවස්ථාව ලැබෙන විට අපි දෙදෙනාගේ ජීවිත මුළුමනින් ම එකිනෙකා හා බෙදා ගනිමු." පිය තුමා එලෙස යෝජනා කළේය. එහෙත් ඉන් පසු මෙ තෙක් එවැන්නක් කිසිසේත් ම සිදු නො වීය.

සැප්තැම්බර් 26, 27, 28 අයිවෝ ඩෙනිස් සොයුරා ද මම ද රෝමයේ ගත කළෙමු. එදා පළමු වන ජුවාම් පාවුලු පාප් තුමා ජනතාව හමු වන දිනයයි. මහා ශාලාවක දී අපි එතුමන් දැක ගතිමු. එතුමන්ගේ කෙටි දේශනයට මම ඕනෑකමින් සවන් දුනිමි. මට ඉතා පැහැදිළි ව වැටහුණේ මේ වචන 4 පමණි. **(Christ,Cross,Crown,Sacrifice)** එය ම මහා දේශනයක් නො වේ දැයි මට සිතිණි. ඉන් පසු එතුමෝ ජනතාව ආසිරි ගැන්වූහ. ජේසු සමිඳුන්ගේ දෙ වන පැමිණීමට ලෝකය සූදානම් කිරීම සඳහා මට පැවරෙන යම් දූත මෙහෙයක් උදෙසා මා ආසිරි ගන්වන්නේ එතුමා ය, යන සිතුවිල්ල මා තුළ පතිත විය. මම දණ ගසා ඒ ආශීර්වාදය බාර ගතිමි. පසු දින එතුමා ස්වර්ගස්ථ වූ පුවත අසා අපි මවිත වීමු. මේ චාරිකාව මා වඩාත් මුහුකුරා යන්නට උපකාරී විය. මිනිසාගේ ලෞකික භෞතික තාක්ෂණික දියුණුව තව දුරටත් මා ආකර්ෂණය නොකරයි. පීඩිත ජනතාව ජීවිත සිරකුටි තුළ විඳවන අයුරු බලන විට ලෝකය දකින්නට මා තුළ කිසිදු ආශාවක් නැත.

## 5

විදේශ චාරිකාවෙන් පසු සාමාන්‍ය වැඩවල යෙදෙමින් නිවසේ ගත කළෙමි. ඔබ ගුරු වෘත්තියෙන් ඉවත් වූයේ මෙයට දැයි මා දකින්නෝ අසති. ගුරුවරයකු වශයෙන් මා තුළ දීප්තියක් විය. දැන් එය මුළුමනින් ම නිවී ගොස් ඇත. විවාහයෙන් හා රැකියාවෙන් තොර ජීවිතයකට දවසේ පැය 24 පලදායි කර ගන්නේ කෙසේද යන්න මහත් අභියෝගයකි. ජීවමාන ජේසු සමිඳුන් මගේ අත්දැකීමක් නො වූයේ නම් ඒ තත්ත්වයෙන් මා පලා යනු ඇත. 'නව මිනිසා' සඟරාව සංස්කරණය කරන ලෙස 1980 අගෝස්තු මස ඔස්කා පිය තුමා මට පැවසීය. ඉන් පසු මම තේවත්ත පුබුදු නිවෙසට ගියෙමි. සති අන්තයේ දේශන සඳහා ද අනෙක් දින පහ ලිවීමේ කටයුතුවල ද නිරත වීමි.

ඒ 1981 වසරයි. ශුද්ධාත්ම මංගල උත්සවය ජුනි 6 වන දිනට යෙදී ඇත. "**ඔබගේ නාමය ශුද්ධ වේවා!"** යන්න එහි තේමාව විය. එතෙක් ගෙවී ගිය සැම ශුද්ධාත්ම මංගල උත්සවයක ම තේමා දේශනය පැවැත් වූයේ ඔස්කා පිය තුමා ය. එහෙත් මෙවර තේමා දේශනය පිය තුමා විසින් මට පවරා ඇත. උළෙලට ආසන්න සති දෙකක පමණ කාලය දේව තිළිණයක් හැටියට සමිඳුන් අබිමුව ගෞරවයෙන් සිටින්නට මට හැකි විය. එය නිරන්තර දේව අනාවරණයෙන් පිරුණු තත්ත්වයකි. එහෙත් ඒ අනාවරණයන් කිසිවක් මනසේ තබා ගත නොහැකි තත්ත්වයකි. මම මෙ ලෙස යාච්ඤා කළෙමි "ජේසු, මට මොනවාහරි දේශනා කරන්නට පුළුවන්. එහෙත් මම එලෙස නොකරමි. ඒ සඳහා ඔබ ම මට දෙන විශේෂ යමක් පමණ යි මා දේශනා කරන්නේ."

ජුනි 6 සවස උළෙල ඇරඹිණි, ප්‍රශංසා මෙහෙයෙන්. තේමා දේශනය සඳහා කිසිදු අදහසක් මා තුළ නො වීය. දේශනය, මෙනෙහි කිරීම, හා යැදුම සඳහා පැය තුනක කාලයක් වෙන් කර ඇත. මම තිගැස්සී සිටියෙමි. දිගු වියළි කාලයක් අවසන් කරමින් තද කුණාටු මැද වැසි

ඇදහැලෙන්නට විය. මම සමිඳුන් වෙතට මගේ සිත එසවීමි. “ජේසු, ඔබ දන්නවා මේ උළෙලට එන සියළු දෙනා ම මෙ තැනින් අර්ථවත් යමක් රැගෙන යනවා දකින්න මා කැමතියි කියලා. මට අවශ්‍ය වුනේ නැහැ, ඒ දේශනය මා විසින් ම දෙන්නට. එහෙත් එය මට පැවරී තිබෙනවා. දේශනය සඳහා පැහැදිළි අදහසක් මෙ තෙක් ඔබ මට දුන්නේ නැහැ. ඔබට මගෙන් යමක් කර ගන්න ඇති. ඔබට අවශ්‍ය ඕනෑ ම දෙයක් මගෙන් කර ගන්න.” එය කිසිදු කොන්දේසියක් නැති ව මා දෙවිඳුන්ට ඉඩ දුන් පළමු අවස්ථාව යැයි සිතමි.

මගේ සියලු හැකියාවන්, මතකයන්, බලගතු හස්තයක් විසින් මගෙන් ඉවතට ගෙන ඇතිවාක් මෙනි. එහෙත් මා විසින් කළ යුතු ව තිබූ දේශනය ඇරඹිණි. එය මගේ කට හඬ මගේ ශෛලිය නො වේ. එය කෙඳිරීමක් ගොත ගැසීමක් වැනි ය. ක්ෂණයකින් මා කඩාවැටෙනු ඇතැ යි මට සිතිණි. තුවාල නො වනු සඳහා බිම වාඩි වන්නට උත්සාහ කළෙමි. (සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ සාදා තිබූ වේදිකාව මත) නැවත සිහිය ලැබෙද්දී 20,000ක් පමණ ජනතාවක් මා උදෙසා දෙවිඳුන්ට කරන යැදුම් හඬ ඇසිණි. ඕඩිකොලොන් සුවඳ තදින් දැනිණි. මගේ දෙ අත්ල, යටි පතුල්, හිස රත් වී ඇත, ඔවුන් තදින් ඒවා පිරිමදිමින් යාච්ඤා කරමින් සිටි නිසා. **“මෙය ජනතාවක් උදෙසා එක් කෙනෙක් ලබන ආලේපයකි.”** ඒ සිතුවිල්ල මා තුළට පතිත විය. තද අප්‍රාණික බවක් දැනිණි. රැය පහන් වන තුරු යහනක වැතිරී සිටියෙමි.

නව දිනක අරුණලු පැතිරෙන විට මේ සිද්ධිය ගැන එකිනෙකා කරන විවිධ විග්‍රහයන් මට ඇසෙන්නට විය. සමහරුන් මට ම පැවසූ දෙයින් මගේ අභ්‍යන්තරයේ කුණාටුවක් නිර්මාණය වන බව පෙනිණ. පසු දින රාත්‍රි ආහාරයෙන් පසු මට ඇවැසි විය, එදින මා වැටුණාට පසු ඔස්කා පිය තුමා කළ තේමා දේශනයට සවන් දෙන්නට. “ඇන්තනිට යක්ෂයා ගැහුවා වැටෙන්ඩ ම.” එය මා තුළ තදින් කා වැදිණි, දේශනයේ වෙන කිසිදු වචනයක් මා වෙතට පිවිසිය නොහැකි අයුරින්. මගේ කුඩා කුටියට පිවිස මම දොර වසා ගතිමි. නින්ද මා වෙත නො පැමිණියේය. මම මහා අරගලයක මැදි වී සිටියෙමි. එය දෙවිඳුන් හා පොර බැදීමකි. ඔබ දෑස ම නොපියා නොනිදා මා සුරකින මාගේ එඬේරාණන් ද? එසේ නැති නම් දේව රාජ්‍යය උදෙසා යම් කාර්යයක් ඔබ විසින් ම පවරා ඔබට ම යදිමින් ඔබෙන් ම යැපෙමින් ඒ කාර්යය ඉටු කරන විට වැටෙන්ඩ ම ගහන්නට යක්ෂයාට ඉඩ දී නිදා ගන්නා දෙවි කෙනෙක් ද, ඔබ? මේ දෙකෙන් එකක් ඉල්ලා අස්කර ගන්නා තුරු මම නැවත ඔබට යාච්ඤා නො කරමි. මෙය යි ඒ මහා පොරබැදීම. පසු දින උදෑසන දිවා ආහාරය සඳහා වත් කුටියෙන් පිටතට නො පැමිණියෙමි. “ඇන්තනි අයියේ, කාමරයේ දොර අරිනවාද, මම වහලෙන් කාමරේට බහින්නද?” සවස නොයෙල් ලලිත් සොයුරා මගෙන් ඇසීය. මම දොර ඇරියෙමි. මට තදින් උණ සෑදී ඇත. බෙහෙත් ගැනිම සඳහා ඔවුහු මා කැඳවා ගෙන ගියහ.

නින්ද මා වෙත නො පැමිණියේය. කෑමට රුචියක් නැත. තුන් වන දිනටත් මා ඒ පොරබැදීම තුළ සිටියෙමි. එදින මැදියම් රැයේ මගේ ජිවිත කතරට සිසිල් දිය දහර ගලා එන්නට විය. ජිවිත පස පෙඟී සශ්‍රීක වනු දැනිණි. එවිට මේ සිදු වීම් පිළිබඳ සියල්ල ආත්මය තුළ අනාවරණය විය. මහෝත්තමයාණන් මගෙන් යමක් විමසන බව මට වැටහිණි. (ඔබගේ දේශනවල දී ඔබ නිතර පවසනවා නේද, ජේසු කුරුසිය මරණය දක්වා කීකරු වූ බව? දැන් ඔබට වැටහෙනව ද, මට කීකරු වීමේ ඇති අපහසුව? මට අවශ්‍ය ඕනෑ ම දෙයක් ඔබගෙන් කර ගන්නැ යි ඔබ මට පැවසුවා නො වේද? මම මට ඇවැසි දෙය ඉටුකර ගතිමි, ඇයි ඔබට එය බාර ගන්නට නො හැකි? මහත් පිරිසක් ඉදිරියේ සිහි සුන් ව ඇද වැටෙන එක මදි-පුංචිකමක් කියල ඔබට හැඟෙනවා ඇති. එහෙත් එය මගේ කුරුසියේ මරණය ඉදිරියේ කොපමණ අල්ප දෙයක්ද?) මම සමිඳුන් අබියස වැඳ වැටුණෙමි. “ඔබවහන්සේ නිවැරදි යි, මා වැරදි යි, මට සමාවන්න. ඔබගේ සැලැස්ම අනුව මෙය මගේ මරණය සිදු වන තත්පරය නම් මම එයට සම්පූර්ණයෙන් අවනත වන්නෙමි.” යි පැවසීමි. (මා සිහිසුන් වූ මොහොතේ සිට සිහිය ලැබෙන තුරු මා ළඟ සිටි වෛද්‍යවරයා-පුබුදුවේ එදත් සිටි අදත් සිටින ඩෙල්රින් වනිගරත්න සොයුරා-ළඟ දී දිනෙක මහ මඟ දි මුණ ගැසිණි, එක මිනිත්තුවකට. මා කිසිවක් නොවිමසා ම මා නොදැන සිටි පුවතක් ඔහු මට පැවසීය. “ඇන්තනි එදා මිනිත්තු 24ක් සිහිසුන් ව සිටියා. නාඩි වැටීම, හදවතේ ගැස්ම පවා මුළුමනින් නැවතුණා. මා දන්නා වෛද්‍ය විද්‍යාව අනුව නම් ඇන්තනි එදා මැරුණා.”)

ඉහත මා විස්තර කළ සිදු වීම්වලින් සතියකට පසු, විවාහ නො වී ජිවිතය ජේසු සමිඳුන් උදෙසා කැප කළ තරුණ තරුණී එකතුව (සුබැඳි) පැවැත්විණි. එදින ඔස්කා පිය තුමා දුන් වචනය මගේ ජිවිත ගමනට මහත් සවියකි. “මිනිස් බව ගත් ජේසු සමිඳුන් දෙවි පියාණන්ගේ ශුද්ධ භාවය, වෙනස් භාවය මුළුමනින් ම අත්දුටුවේ කුරුසිය මත එල්ලී සිටිය දී ය. එය මුළුමනින් ම තම අයිතිවාසිකම්වලට මරණයකි. **(දුගී භාවය)** එය තම ආශාවන්ට මරණයකි **(වෘත ශුද්ධිය)** එය තම

කැමැත්තට මරණයකි. **(කීකරුකම)** එනිසා දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවය අත්දැකීම යනු ඒ ත්‍රිවිධ මරණයට පූර්ණ ව සහභාගී වීම යි. ශුද්ධ භාවය ඔස්සේ ගමනකට සමිඳුන් ඔබව කැඳවා ඇත. දැන් වැඩ ගොඩක් කරමින් සිටීම නො වෙයි, මේ අත්දැකීම ඔස්සේ ගැඹුරට යාම යි අවශ්‍ය වන්නේ. ඔබට වැඩ වැඩි නම් කියන්න, මා අඩු කර දෙන්නම්."

මා මවිතයට පත්කරමින් සමිඳාණෝ ම මට පැවරී තිබුණු වැඩ කටයුතු එකින් එක අඩු කරමින් මේ අත්දැකීම ඔස්සේ ම යන්නට මට මඟ හෙළි කළහ. **"ඔබගේ නාමය ශුද්ධ වේවා!"** තේමාව ඔස්සේ වසරක් පුරා ඔස්කා පිය තුමා සතිපතා දුන් දේශන සියල්ල එක්තැන් කොට **'නව මිනිසා'** සඟරාව සඳහා මම ලිපි පහක් සකස් කළෙමි. ඒ ලිපි මගේ ගමනට අදත් මහා සවියකි. 1982. 12. 18 සිට මගේ ජීවිත සිදු වීම් සටහන් කරන්නට ශුද්ධාත්මයාණෝ මා යොමු කළහ. මගේ ජීවිත ගමන දෙස ආපසු හැරී බලන්නට එය මට උපකාරයකි.

## 6

1983 වසරේ දී දේව ධර්ම ශාස්ත්‍රය ගිහියන්ට පවා සිංහලෙන් ඉගැන්වීමේ වැඩ පිළිවෙලක් කොළඹ අගරදගුරු පදවියෙන් ඇරඹිණ. ඔස්කා පිය තුමා ඒ සඳහා මා යොමු කළ නිසා මාස කීපයක් පමණක් මම එයට සහභාගි වීමි. මා ඒ පාඨමාලාවෙන් ඉවත් වීමට හේතුව මෙයයි. දෙවිඳුන් මා කැඳවා ඇත්තේ දේව ධර්ම ශාස්ත්‍රය මහිමයට පත් කරන්නට නො ව දෙවියන් වහන්සේ විශ්වාසයේ ජනතාවට දුන් මූලික පොරොන්දුව මගේ ජීවිත අත්දැකීම් තුළින් මහිමයට පත් කිරීම සඳහායි. ඒ පොරොන්දුව නම් **"මම ඔබ සමග වැඩසිටිමි, මම ඔබට ප්‍රේම කරමි, බිය නො වන්න."** මේ පොරොන්දුව විශ්වාස කරන්නෝ විශ්වාසයේ ජනතාවට අයත් වෙති.

අනවිම් හෙවත් දේව දිළින්දා ගැනත් දේව සේවකයා ගැනත් දේව ධර්ම ශාස්ත්‍රඥයින්ගේ පත-පොතින් වුව ද කරුණු සොයන්නට මම උනන්දු වූයෙමි. එය මගේ ජීවිත ගමන නිරූපණය කරන බැවිනි. ඒ සටහන් සමිඳුන් මා ගෙන යන ගමන සඳහා මා පණ ගන්වයි. "අනවිම් හෙවත් දේව දිළින්දා යන්නෙහි සාමාන්‍ය අරුත අවමන් කරනු ලැබූ තැනැත්තා, පහත් කළ තැනැත්තා යනු යි. ඔහු ඒ ඉරණමට මුහුණ දෙන්නේ මහෝත්තමයාණන් පෙන්වන මාවතේ පමණක් ම පියවරෙන් පියවර පා තබන බැවිනි. මිනිසාට මෙ ලොව ඇති කිසි ම බලවේගයක් මගින් දෙවිඳුන් වෙත ළඟා විය නො හැක. උන්වහන්සේ වෙතට සමීප වීමට මිනිසාට ඇති හොඳ ම මාර්ගය ආධ්‍යාත්මික දිළිඳුකම යි. මෙවන් දිළිඳු මිනිසා තමාගේ බලාපොරොත්තුව හා ශක්තිය දෙවියන් මත පිහිටන්නේය. මෙ ලොව ඇති සැම බලයකට ම වඩා උන්වහන්සේගේ බලය කෙරෙහි විශ්වාසය තබන්නේය. මේ ආකල්ප සමග ජීවත් වන මිනිසා දිනෙන් දින වඩවඩා දෙවිඳුන්ට සමීප වන්නේය. දිළිඳු සිත් ඇත්තන්ට හා පීඩා විඳින්නන්ට දෙවියන් වහන්සේ නිතර ම සවන් දෙන බව බයිබලය විස්තර කරයි. ඔවුන්ට ස්වාමින් වහන්සේ ප්‍රකාශ වූයේ කරුණාවේ, අනුකම්පාවේ ස්වාමින් වහන්සේ වශයෙනි.

බයිබලයේ විස්තර කරන දිළිඳුකමේ මූලික දැක්ම නම් මෙ ලොව තිබෙන සැම බලයකට වඩා දෙවියන් කෙරෙහි බලාපොරොත්තුව තැබීමය. ජෙරමියා දේව කැඳවීම පිළිගත් දිවැසිවරයකු ලෙස ක්‍රියා කිරීමට පටන් ගත් දා සිට ඔහුට ලෞකික වශයෙන් ආරක්ෂාවක් නොමැති බව හැඟිණි. මෙය ඔහුගේ මුළු ජීවිතය ම සසල කළ ඉතා ගැඹුරු පෞද්ගලික අත්දැකීමක් විය. ඔහු තමාගේ දිළිඳුකමට ශක්තිය දෙවියන් බව පිළිගනී. ජනතාවගෙන් ඔහුට කෙතරම් කරදර සිදු වුවත් දෙවිඳුන් තුළ තමා ජය ලබන බව ඔහුගේ එක ම විශ්වාසය විය. දෙවියන් වහන්සේ ඔහුගේ මහා යුද්ධ වීරයා විය. ආත්මය සසල කරවන මෙවන් දිළිඳු තත්ත්වයකට මුහුණ දීමට ජෙරමියා ශක්තිය ලබා ගත්තේ දෙවියන් වහන්සේට තම ජීවිතය සම්පූර්ණයෙන් අවනත කිරීමෙනි. මේ දිළිඳු බව ආධ්‍යාත්මික වශයෙන් දේව සේවයෙහි නිරත ව සිටීමට ඔහුට අවස්ථාව සලසා දුන්නේය. දුක් කරදර මධ්‍යයේ ඔහු දෙවිඳුන් කෙරෙහි තැබූ ගැඹුරු විශ්වාසය තුළ ප්‍රීති විය.

දෙවියන් වහන්සේගේ නාමයෙන් දේව දිළිඳුකම සැම අංශයකින් ම පිළිගන්නා තැනැත්තා දේව සේවකයා වේ. ඔහුගේ දේව දිළිඳුකම දෙවිඳුන් තුළ ඉතා බලසම්පන්න වන්නේය. ලෝකයාගෙන් නො ව දෙවියන් වහන්සේගෙන් ම තමාට යුක්තිය ඉටු වන බව ඔහු සම්පූර්ණයෙන් ම විශ්වාස කළේය. දේව සේවකයා සැම දෙයකට ම මැදහත් සිතින් මුහුණ දුන්නේත් සැම දෙයක් ම ඉවසුවේත් තම ජනතාව වෙනුවෙනි. ඔහු තම ජීවිතය ජනතාව වෙනුවෙන් පිදූ පාප පූජාවක් ලෙස සැලකීය. ඔහු මේ සැම දෙයක් ම පිළිගත්තේ සමිඳුන්ගේ කැමැත්ත ලෙස ය. දේව සේවකයාගේ දිළිඳුකමින් මහත් යැදුමක් ඔහු දෙවියන් ඉදිරියේ කරන්නේය. දේව දිළින්දා හා දේව සේවකයා පිළිබඳ සියලු ලක්ෂණ ජේසු සමිඳුන් තුළ පූර්ණත්වයට පත් විය. ශ්‍රාවකත්වයට කැඳවීම ලබන සැම කෙනෙකුට ම දේව දිළිඳුකම උපරිම ගුණාංගය වශයෙන් උන්වහන්සේ ඉදිරිපත් කළහ. තම සේවාව නිරර්ථක යැයි දේව සේවකයාට විටක හැඟෙන නමුත් ස්වාමින් වහන්සේ තුළ

විශ්වාසය තහවුරු කර ගනී. දේව සේවකයාගේ දුක් විඳීම අහම්බෙන් වන සිදු වීමක් වත් හුදෙක් මිනිසුන් විසින් ම කරන ලද්දක් වත් නො වේ. එය පාප පූජාවකි. දෙවියන් වහන්සේ තම රාජ්‍යය පිහිටුවනුයේ සේවකයාගේ දුක් විඳීම්වල මාර්ගයෙනි. එය සිය කැමැත්තෙන් ම ඔප්පු කරනු ලබන යාග පූජාවකි. දේව සේවකයා පරාජයේ මාර්ගයේ ගමන් කර ජයග්‍රහණය කරා පැමිණෙයි. ඔහුගේ පිළිවෙල සාමාන්‍ය පිළිවෙලට වෙනස් ය. **"විමුක්තියේ පිය සටහන්"** - ආචාර්ය ලෙස්ලි ප්‍රනාන්දු පිය තුමා)

දෙවියන් වහන්සේ පිතෘත්වයේ හා මාතෘත්වයේ උල්පත වන සේක. එනිසා 1983 පුබුදු ශුද්ධාත්ම මංගල උළෙලේ තේමාව වූයේ **"අබ්බා අම්මා"** යන්න ය. මංගල උළෙල දින උදෑසන පැවැත් වූ සූදානම් වීමේ යැදුමේ දී දිවැසි වැකියක් ලැබිණි. රටේ සිදු වන යුද්ධය නිසා දෙවියන් වහන්සේගේ මාතෘක හදවත වේදනා විඳින බවත් එනිසා ඒ තත්ත්වය අවසන් කරන්නට ශ්‍රී ලංකා රදගුරු මඬුල්ලට විශේෂයෙන් කැපවෙන ලෙසත් එයින් ප්‍රකාශ විය. එම දිවැස් වැකිය සැකසීම හා එය මංගල උළෙලේ දී ප්‍රකාශ කිරීම ඔස්කා පිය තුමා මට පැවරිය. පුබුදුව තුළ ජාතික මට්ටමින් මා කළ අවසන් කාර්යය එය යි.

ජාතිවාදී ගැටුම් උත්සන්න වෙමින් 1983 ජූලි ගින්න ඇවිලී ගියේ පුබුදුවට නව බෞතිස්මයක අවශ්‍යතාවය ඉඟි කරමිනි. ඒ සඳහා 1983 සැප්තැම්බර් 4 පැවැත් වූ සමුළුවට මම සහභාගි වීමි. සිය දේශනයේ දි ඔස්කා පිය තුමා ක්‍රිස්තියානි බෞතිස්මය ජලයේ, ගින්නේ හා රුධිරයේ බෞතිස්මයක් ලෙස විග්‍රහයක යෙදිණි. ජූලි ගින්න ගැන සිහිපත් කරමින් මෙය පුබුදුවට ශුද්ධාත්ම ගින්නේ බෞතිස්මයක මොහොත බව පැවසීය. ඒ අදහස මට ගැටළුවක් විය. මා කතෝලික මව් පියන්ට දාව උපත ලැබීම ජලයේ බෞතිස්මයකි. එය ප්‍රවාහය විසින් ම දෙවිඳුන් කරා මා ඇද ගැනීමකි. නව උපතේ අත්දැකීමට මා පිවිසීමේ දී මා ලැබුවේ ශුද්ධාත්ම ගින්නේ බෞතිස්මයයි. එසේ නම් මේ අවස්ථාව මට රුධිරයේ බෞතිස්ම මොහොත විය යුතුය. "සමිඳුනි මෙය පුබුදුවට ශුද්ධාත්ම ගින්නේ බෞතිස්මය වන්නට පුළුවන. මට මෙය රුධිරයේ බෞතිස්මයයි." යනුවෙන් පවසමින් එදින දිව්‍ය පූජාවේ දී බොරළු පොළොවේ දණින් වැටී රුධිරයේ බෞතිස්මය සඳහා මම සමිඳුන්ට ගිවිසුම් දුනිමි.

1982 දී කතෝලික බයිබලය සිංහල භාෂාවෙන් මුද්‍රණය විය. එතෙක් මා කියවා නොතිබූ පොත් (ද්විතීය සම්මත ග්‍රන්ථ) කියවන්නට මුල පිරිය යුතුය, යන පෙළඹවීම මා තුළ ඇති විය. **තෝබිත්** පොත කියවීමේ දී එහි එක් වැකියක් මා තුළ ඇවිලෙන්නට ශුද්ධාත්මයාණෝ සැලැස්වූහ. **"අපේ පුත්‍රයා යන විටත්, එන විටත් සියල්ල හොඳ අතට හැරෙනු ඇත. ඔහු නැවත ගෙදර එන දවසේ දී ඔහුට සියල්ල හොඳ අතට හැරී තිබෙන හැටි පෙනෙනු ඇත."** (5:21) මා එකල පුබුදුව තුළ අත්දුටු අරගල දෙස බලන විට මා සුළු කලකට හෝ පුබුදුවෙන් ගිලිහී යනු ඇතැ යි මට සිතිණි. එහෙත් සමිඳුන් මා ආපසු ගෙන එන මොහොතේ පුබුදුව සැබවින් ම පුබුදුවක් වනු ඇත. එනිසා දේව සැලැස්ම එය නම් මා කලකට හෝ පුබුදුවෙන් ගිලිහී යාමට සූදානම්ව සිටියෙමි.

'නව මිනිසා' සඟරාව සංස්කරණය මට භාර දුන් මොහොතේ සිට ඒ කාර්යය සඳහා සමිඳාණෝ මට මහත් සේ උපකාරී වූහ. එහෙත් 1983 දෙසැම්බර් කලාපය සඳහා සමිඳුන්ගේ කිසිදු ආශිර්වාදයක් නැතැ යි මට පෙනී ගියේය. මා කොපමණ උත්සාහ කළත් ඊ ළඟ සඟරාව සඳහා කිසිවක් නො විය. සමිඳුන් දෑත් බැඳ ගත්තාක් මෙනි. ඒ 1983 නොවැම්බර් 8 වන දිනයයි. මම ඔස්කා පිය තුමා හමු වී ඒ පිළිබඳ මගේ අත්දැකීම පැවසීමි. පිය තුමා මා හා එකඟ නො විය. "ඇන්තනි, සඟරාව දිගට ම කරගෙන යා යුතුයි." පිය තුමා පැවසීය. "මට උපකාරී වූ දෑත මුළුමනින් ම ඉවතට ගත්තට පස්සේ මට බෑ එය කරන්නට." මම පැවසීමි. "මෙහෙම හිතුවොත් ඇන්තනි නාස්ති වෙයි." ඒ පිය තුමාගේ වචන යි. මම පිය තුමාගේ අත ස්පර්ශ කරමින් මෙසේ කීවෙමි. "මම මේ අත් දෙකෙන් නම් නාස්ති වන්නේ නැහැ. මට නොපෙනී එහෙත් ඉතා සමීප ව මඟ පෙන්වන ඒ අත් දෙකෙන් නාස්ති වෙන්ඩ වුනත් මා සූදානම්."

එදින පූජා කියවීම් මට ඉතා වැදගත් විය. **(ප්‍රඥා)** 2 : 23 - 3 : 9, **ලූක්** 17 : 7-10) **"දෙවියන් වහන්සේ ඔවුන් උරගා බලා තමන් වහන්සේට ඔවුන් යෝග්‍ය බව දැනගත් සේක. උන්වහන්සේ කෝවෙහි රන මෙන් ඔවුන් පරීක්ෂා කර බැලූ සේකඃ සම්පූර්ණයෙන් දැවුණු යාගයක් මෙන් ඔවුන් පිළිගත් සේක. ඔවුහු ඉපනැල්ල අතරේ ගිනි පුපුරු මෙන් දුවන්නෝය." "සේවකයා තමාට නියම කර තිබුණු දේ කළ බැවින් ස්වාමියා ඔහුට ස්තුති කළ යුත්තේ ද? එසේ ම ඔබ ද ඔබට නියම කර තිබෙන දේ කළ පසු අපි නොවටිනා මෙහෙකරුවෝ වෙමු. අප විසින් කළ යුතු ව තිබුණු දේ කළෙමු යි කියන්න."**

යමෙක් මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා මහෝත්තමයාණන් සුරතේ සම්පූර්ණයෙන් දැවුණු යාගයක් වීම කොපමණ ආශිර්වාදයක් දැයි මට සිතිණි. සමාජය ම ඉපනැල්ලක් වී ඇත. සමිඳුන් සුරතේ සම්පූර්ණයෙන් දැවුණු ජීවිත ඉපනැල්ල මැද ගිනි පුපුරු වනු ඇත. එවිට ශුද්ධාත්ම ගින්න ඇවිලී යනු ඇත. මෙය නො වේද, සැබෑ විමුක්ති දහම? ඒ අනාවරණය අබියස ඕනෑ ම වේදනාත්මක පරිත්‍යාගයකට මම සූදානම් ව සිටියෙමි.

නොවැම්බර් 8 සිද්ධිය ගැන විවිධ විග්‍රහයන් මට ඇසිණි. සමහරු ඒ ගින්නට පිදුරු දමමින් සිටියහ. පුබුදුව තුළ මා කරමින් සිටි සියලු ම වැඩ මගෙන් ඉවත්ව ඇත. මම තව දුරටත් ද්විතිය සම්මත ග්‍රන්ථ කියවන්නට වීමි. මම **බාරුක්** පොත කියවන විට නොවැම්බර් 20 වන්නට ඇතැ යි සිතමි. **"යන්න ගිය පුත්‍රයා දැන් ගෙදර බලා එන රඟ නරඹන්න." (4:37)** ශුද්ධාත්මයාණෝ ඒ වැකිය මා තුළ දැවෙන්නට ඇවිලෙන්නට සැලැස්වූහ. යන්නට ගිය පුත්‍රයා ගොස් නැත. ඔහු ගෙදර බලා එන රඟ නරඹන්නැ යි පුබුදු ජනතාවට කියන්නාක් මෙනි. මම තිගැස්සී සිටියෙමි. මා කළ යුත්තේ කුමක් ද? "මගේ මුළු ජීවිත කාලය තුළ සිදු වූ යම් පලදායි දෙයක් ඇද්ද, එය මගේ තර්ක බුද්ධිය මෙහෙයවා කරන ලද්දක් නො වේ. එය මා තුළ ඇති දෙවියන් වහන්සේගේ සියුම් හඬ විසින් මා මෙහෙයවමින් කරන ලද්දකි. ඔබට ද ඒ සියුම් හඬ ඇසේ නම් ඒ හඬ ඔස්සේ ම යන්න. ඒ සියුම් හඬ ඔබට නො ඇසේ නම් නිවැරදි යැයි ඔබට හැඟෙන දේ කරන්න." **මහත්මා ගාන්ධි** තුමාගේ එම වදන් මට සිහිපත් විය. මට ඒ සියුම් හඬ ඇසේ. මම ඒ සියුම් හඬේ සිරකරුවෙක් වෙමි. මට එයින් පලා යා නොහැක. පලා ගියොත් මට මා නැති වේ. "දෙවිඳුන්ගේ සියුම් හඬ ඔස්සේ ක්‍රියා කරන්නකුට තරම් සමහර විට අඳුරේ අතපත ගාන්නට කිසිවකුට සිදු නො වනු ඇත." **මහත්මාගේ** ඒ වචන මා සනසන්නට විය. ශුද්ධ බයිබලයේ සඳහන් ජෙරමියා දිවැසිවරයාගේ විලාපය මට සිහිපත් විය. **"ස්වාමීන් වහන්සේ මා පෙළෙඹවූ සේක. මම ද පෙළඹුණෙමි. උන්වහන්සේ ජය ගත් සේක. මම සැමදා ම නින්දාවක් ව සිටිමි." (20:7)** මා ඔස්කා පිය තුමාගෙන් සමාව ඉල්ලිය යුතු යැයි ඒ සියුම් හඬ මට පවසන්නට විය.

එහි රහස මට වැටහිණ. මහෝත්තමයාණන් මා ගෙන යන ගමනේ දී මා පිළිබඳ මගේ ප්‍රතිරූපය ද මා පිළිබඳ සමාජයේ ඇති ප්‍රතිරූප ද මුළුමනින් බිඳ වැටිය යුතුය. එය අති බිහිසුණු ය. මා තුළ මා පිළිබඳ යම් අභිමානයක් තවත් ඉතිරි ව ඇත්නම් එය ද අවසන් විය යුතුය. දෙවිඳුන් හා යන ගමනේ දී මගේ අභිමානය මුළුමනින් සුං වීමෙන් පමණි, දේව අභිමානය මා තුළ පූර්ණ වන්නේ. නොවැම්බර් 22 උදා විය. ඔස්කා පිය තුමා මගේ දොරකඩ අසලට ම පැමිණ ඇත. (පුබුදු මුද්‍රණාලයට) මා එහි ගොස් දණින් වැටී පිය තුමාගේ දෙපා අල්ලා ගෙන "මට සමාවන්නැ" යි කීවෙමි. ඉන්පසු නොයෙල් ලලිත් සොයුරා මට කී දෙයින් මෙය මෙසේ සිදු වීමේ තවත් රහසක් අනාවරණය විය. "ඇන්තනි අයියා සමාව ඉල්ලපු එක හොඳයි" ඔහු මට කීවේය. "ඇයි ලලිත්, එහෙම කීවේ?" මම ඇසීමි. "මමත් පිය තුමාට කීවා ඇන්තනි අයියා හොඳට මෙනෙහි කරලා වරදක් වුණා නම් සමාව ඉල්ලයි නේද කියලා." එවිට පිය තුමා කීවා "ලලිත් හිතනව ද ඇන්තනි මගෙන් සමාව ඉල්ලයි කියලා. මම නම් කොහෙත් ම හිතන්නේ නෑ, එහෙම දෙයක් සිදු වෙයි කියලා."

මා සමග 'ආලෝකයේ නිවහනේ' එකට සිටි සොයුරන්ගේ පූර්ණ කාලීන කැපවීම 1983 නොවැම්බර් 20 යෙදී තිබිණි. මා ද ඔවුන් සමඟ ගිවිසුම් දෙන්නට සිටි අයෙකි. එහෙත් නොවැම්බර් 8 සිද්ධිය එය වෙනස් කර ඇත. ඔවුන් සුබැඳි (සියල්ලන් හා බැඳුණු) මා තනි ජීවිත ගත කරන යනුවෙන් විග්‍රහයට ලක් වී ඇත. ඒ පුවත කන වැකුණු මොහොතේ මම යැදුම් කුටියට ගොස් එදිනට නියමිත පූජා කියවීම් බැලීමි. එය **ජෝනා** දිවැසිවරයාගේ අත්දැකීම සම්බන්ධ වූවකි. එම ඡේදයට මාතෘකාවක් යොදා තිබිණි. "ඔබ පැලයක් ගැන තැවෙන්නෙහිය, මම ජනතාවක් ගැන තැවෙමි." සමිඳුන් වෙත මගේ සිත එසැවිණි. "සමිඳුනි, ඔවුන් හා එක් ව එකට ගිවිසුම් දීම නමැති ඒ පැලය ගැන තමා මා තැවෙමින් සිටියේ. ඔබ තුමන් ජනතාවක් ගැන තැවෙමින් සිටිනවා. ඒ ජනතාව උදෙසා මා ඔබ තුමන් සමඟ සිටීම ඇවැසි නම් මා ඒ පැලය පිළිබඳ අයිතියට මැරෙන්න සූදානම්."

ඉන් දින කීපයකට පසු **'වෘක්ෂයෝ දේවස්ථානයෝය'** යනුවෙන් **හර්මන් හෙසගේ** නිර්මාණයක් ඉරිදා පුවත්පතක දුටිමි. එය කියවන විට මට වැරදි නැතැ යි මට අවබෝධ විය. "වෘක්ෂයෝ හැම කල් හී මට අතිශයින් විනිවිද යන දේශකයෝ වූහ. ඔවුන් ගෝත්‍ර හා පවුල් වශයෙන් වනයෙහිත් උපවනයෙහිත් වෙසෙන කල මම ඔවුන්ට ගෞරව කරමි. ඔවුන් තනි තනි ව වෙසෙන විට වැඩි වැඩියෙන් ගෞරව කරමි. ඔවුහු හුදෙකලා පුද්ගලයන් වැනියහ. කිසියම් දුබල බවක් නිසා තනි ව සැඟ වී ආ බියසුල්ලන් මෙන් නො ව බීතෝවන්, නීට්ෂේ වැනි ඒකචාරී හුදෙකලා ශ්‍රේෂ්ඨයෝ වෙති. ඔවුන්ගේ මුදුන් ශාඛාවල ලෝකය සරසර හඬ නංවයි. ඔවුන්ගේ මූලයෝ අනන්තයේ රැඳී සිටිත්."

1983 දෙසැම්බර් 10, 11 **ගරු පියෝ මැස්කරෙන්ඤාස් පිය තුමාගේ** ඥානකාන්තියකට (Retreat) සහභාගි වීමට මට අවස්ථාව ලැබිණි.

- **එය මා පසු කළ ගමන් මඟ අනුමත කිරීමකි.**

"කිතු දහම ඉගැන්වීම් පදනම් වෙමින් ඉගැන්වීම් ඉක්මවා යන දෙයකි."
"කුරුසිය වේදනාවකට වඩා නින්දාවකි. තමාගේ තත්ත්වයෙන් හිස් වන නින්දාව, ලජ්ජාව තුළින් මිනිස් පවුලේ විමුක්තිය උදා වේ."
"දෙවිඳුන් ඔබ තුළ මහා සිහිනයක් තබනවා නම් ඒ සිහිනය සැබෑ කරන්නට උන්වහන්සේ ඔබගෙන් ද විශේෂ සහභාගිත්වයක් බලාපොරොත්තු වන බවට ගැළවීමේ ඉතිහාසය සාක්ෂි දරයි."

- **එය ඉදිරිය සඳහා මට මඟ පෙන්වීමකි.**

"විශ්වාසයේ ගමන් මඟ පියවර තුනකින් විස්තර කළ හැකිය."

1. **දේව වචනය මත ගොඩනැගෙන විශ්වාසය**
2. **දෙවි පියාණන්ට අවනත වීමේ විශ්වාසය.**
3. **බලාපොරොත්තුවේ විශ්වාසය.**

දේව වචනය ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ අප නිවැරදි ව වටහා ගන්නවා නම් එය දෙවි පියාණන්ට අවනත වීම දෙසට යි, අප යොමු කරන්නේ. අප තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ යි අපගේ මහිමයේ බලාපොරොත්තුව. ඒ බලාපොරොත්තුව අප තුළ තහවුරු කරන්නේ වේදනාව මඟින් ය. "**පීඩා විඳීමෙන් ඉවසීම ද ඉවසීමෙන් සහතිකකම ද සහතිකකමෙන් බලාපොරොත්තුව ද උපදින බව දැන අප විඳින පීඩාවල දිත් අපි ප්‍රීති වෙමු." (රෝම 5:3,4) "දෙවියන් වහන්සේ කලින් තෝරාගත් අය ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වන පිණිස කල් තියා වෙන් කර ගත් සේක. එසේ කළේ තමන් වහන්සේගේ පුත්‍රයාණන් බොහෝ සොහොයුරන් අතර කුළුඳුලාණන් වන පිණිස ය. එසේ කලින් තෝරාගත් අය උන්වහන්සේ කැඳවා ගත් සේක. කැඳවා ගත් අය උන්වහන්සේ ධර්මිෂ්ඨ කළ සේක. ධර්මිෂ්ඨ කළ අය උන්වහන්සේ මහිමයට පැමිණෙවූ සේක." (රෝම 8: 29,30)**

විශ්වාසයේ ගමන් මඟේ දි ජයග්‍රහණය හා වේදනාව අතර සමතුලිත බව තබා ගන්නට අප ඉගෙන ගත යුතුයි. විශ්වාසය ගමනේ 1 හා 2 පියවරේ දි අපගේ යාච්ඤාව වන්නේ "ස්වාමිනි, අපට පිහිට වුව මැනව" යන්න යි. එහි දි අපගේ සිත් යොමුව ඇත්තේ අපගේ ගැටළු හා ප්‍රශ්න වෙතටයි. බලාපොරොත්තුවේ විශ්වාසයේ දි අපගේ යාච්ඤාව වන්නේ "ස්වාමිනි, අපි ඔබට ප්‍රශංසා කරමු. මක්නිසාද, මහිමය ඔබගේ ය." එම පියවරේ දි අපගේ සිත යොමුව ඇත්තේ දෙවියන් වහන්සේගේ මහිමය වෙතට යි. ගරු පියෝ පිය තුමාගේ මෙම ඉගැන්වීම බලාපොරොත්තුවේ විශ්වාසය පියවර උදෙසා මට ලැබුණ ප්‍රබල මඟ පෙන්වීමකි. ---- **පසුව අවසානය පැමිණේ. එවිට උන්වහන්සේ සියලු අධිපතිකම් ද බලය ද පරාක්‍රමය ද අභිබවා උන්වහන්සේගේ රාජ්‍යය දෙවි පියාණන් වහන්සේට භාර දෙන සේක. (1 කොරින්ති 15:24)** රාජ්‍යය දෙවි පියාණන්ට භාර දීමක් ගැන එහි කියවෙනවා. කුමක් ද රාජ්‍යය? එය ඇත්තේ කොහි ද? දේව රාජ්‍යය ඇත්තේ අප තුළ ම යි. අප තුළ වැඩවසන ක්‍රිස්තුස් වහන්සේ අපගේ මහිමයේ බලාපොරොත්තුව යි. එය යි, දේව රාජ්‍යයේ මූලික ම සත්‍යතාවය. බොහෝ කිතුනු නිකායන් ක්‍රිස්තු දානය පිළිබඳ දැඩි අවධානයක් යොමු කරනවා. ඔවුන්ගෙන් බොහෝ අය දේව රාජ්‍යය පිටත තිබෙන දෙයක් ලෙස යි සලකන්නේ. ඔවුන්ගේ ජීවිත තුළ දේව රාජ්‍යයේ ක්‍රියාකාරීත්වය අඩු වෙලා. ඒ ඇයි? වේදනා විඳින ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපයට ඔවුන් ඇඹෙන්න සූදානම් නැති නිසා.

ක්‍රිස්තු ස්වරූපයට ඇඹෙන්නට අප තුළ ඇති වන්නා වූ පිපාසය ඉතා වැදගත්. එහෙත් එය අපගේ මනුෂ්‍ය ස්වභාවයට ඉතා ම භයානක යි. රෝගීන් සුව කරන්න, යකුන් දුරු කරන්න, බලගතු දිව්‍ය වාක්‍ය පවසන්න, ඒ අයුරින් ක්‍රිස්තුස් වහන්සේට සමාන වීමට බොහෝ දෙනා සතුටු යි. එවිට ඔබට පිටතට ගොස් අන් අයට ක්‍රිස්තු දානය කරන්න පුළුවන්. ස්වාමිනි, ඔබගේ නාමයෙන් මේ ප්‍රාතිහාර්යය සිදු කළා කියල කියන්න පහසු යි. එහෙත් ඔබ එකිනෙකාට සමාව දීම ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. සැම විට ම කවුද නායකයා විය යුත්තේ කියල තරඟකාරී ස්වභාවයකින් ජීවත් වන්න පුළුවන්. එවිට සමිඳුන් මෙසේ පවසනවා. "මම නුඹ නොහඳුනමි."

ජේසු සමිඳුන් දේව රාජ්‍යය භාර දෙන විට අප එකිනෙකා ව යි දේව තාත්තාට භාර දෙන්නේ. දේව රාජ්‍යය පිටත ප්‍රකාශ කිරීම හොඳයි. එහෙත් මිනිස් පවුලේ ගැළවීමේ කාර්යය වෙනුවෙන් දේව රාජ්‍යය අපගේ අභ්‍යාන්තරයේ ව්‍යාප්ත කිරීමට දෙවිඳුන්ට ඉඩ දීම අති වැදගත්. වේදනා විඳින්න අපට ලැබෙන සැම අවස්ථාවක් ම ක්‍රිස්තුස් වහන්සේ තුළ මුහුකුරා යාමට අපට ලැබෙන අවස්ථාවක් ලෙස හඳුන්වන්න පුළුවන්. එවිට යි, විශ්වාසය බලාපොරොත්තුව හා ප්‍රේමය නිසි ලෙස අප අභ්‍යාස කරන්නේ. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙස බලන විට කැපී පෙනෙන මූලික ලක්ෂණය කුමක් ද? එය වේදනාව ද? නින්දාව ද? සැබවින් ම කුරුසිය නින්දාවකි. වේදනාවෙන් පමණක් මිනිස් සංහතියට ගැළවීම උදා වන්නේ නැහැ. වේදනාව කුරුසියේ එක් අංගයක් පමණයි. එහෙත් එහි ප්‍රධාන අංගය නින්දාවයි. අපේ තත්ත්වය, මානය, හිස් වීම එහි ප්‍රධාන ලක්ෂණයයි. තමාගේ තත්ත්වයෙන් හිස් වන නින්දාව තුළින් පමණ යි මිනිස් පවුලේ විමුක්තිය උදා වන්නේ. **පිලිප්පි 2: 5-11** බලන්න. තමා හිස් කර ගත් තැනැත් වහන්සේ කුරුසියේ මරණය දක්වා කීකරු වූ ආකාරය එහි සඳහන් වෙනවා. ක්‍රිස්තුස් වහන්සේ විසින් කළ මූලික කාර්යය තමා විසින් තමා ව හිස්කර ගැනීමයි. පළමුව එතුමන් දෙවියන් වහන්සේ හැටියට තිබුණු අයිතිවාසිකම්වලින් හිස් වුණා. පසුව මනුෂ්‍යයෙක් හැටියට තිබුණු අයිතිවාසිකම්වලින් ද හිස් වුණා. එනිස යි, දෙවි පියාණන් විසින් එතුමන් උසස් කරනු ලැබුවේ.

ඔබට දරන්නට අමාරු හිසේ කැක්කුමක් ද, වචනයෙන් කරන පහර ගැසීමක් ද? හිසේ කැක්කුම ශාරීරික වේදනාවක්. වචනයෙන් පහර ගැසීම මානසික වේදනාවක්. ඒ ලජ්ජාව දරන්න අමාරු යි. අපට දැන ගන්න පහසු යි ක්‍රිස්තුස් වහන්සේ තත්ත්වයෙන් හිස් වූ බව. එහෙත් ඒ අත්දැකීම ඔස්සේ ගමන් කිරීම කොහෙත් ම පහසු නැහැ. මනුෂ්‍ය අයිතිවාසිකම් හිස් කිරීම පිළිබඳව ජේසු සමිඳුන් කුරුසියේ දී මුහුණ දුන් උපරිම අවස්ථාව කුමක් ද? එය අන්‍යයන්ට චෝදනා කිරීමට ඇති අයිතිය යි. මනුෂ්‍යයෙක් වශයෙන් එතුමන්ට මෙ ලෙස කීමට තිබුණා. “දැන් නුඹලාගේ අවස්ථාව යි. මගේ අවස්ථාව පසුව පැමිණේවි. ඒ අවස්ථාවේ දී මම කවුද කියල පෙන්වන්නම්. නුඹලා සියල්ලන්ට ම වන්දියක් ගෙවන්න සිදු වේවි.” එලෙස ඔවුන්ගේ වරදට චෝදනා කරන්නට තිබුණ අයිතිය ඒ මොහොතේ හිස් කර උන්වහන්සේ මෙ ලෙස පැවසුවා. **“පියාණෙනි, ඔවුන් කරන වරද නොදැන කරන නිසා කමා වුව මැනව.”**

සමාව දීම යනු තව කෙනකුට චෝදනා කරන්නට, පහර ගසන්නට තිබෙන අයිතිය හිස් කර ගැනීම යි. එනිසා කුරුසිය රැගෙන යාම යනු “හැත්තෑ වාර හතක් සමාව දීම යි.” මා ඔබට සමාව දීම යනු ඔබට චෝදනා කරන්නට මට තිබෙන අයිතිවාසිකම හිස් කර ගැනීම යි. එය යි, ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපය වීමට අපට ලැබෙන අවස්ථාව. අපගේ තත්ත්වයෙන් අප හිස් වීම ක්‍රියාවට නැගීමේ හොඳ ම ක්‍රමය සමාව ලැබීම හා සමාව දීම යි. “හැත්තෑ වාර හතක්” ඔබගේ ජීවිතයෙන් ප්‍රයෝජන ගන්නට අන් අයට ඉඩ දෙන්න. “හැතැප්ම එකක් යන්නට බල කළොත් හැතැප්ම දෙකක් ම යන්න.” මේ අයුරෙනු යි දේව රාජ්‍යය අප තුළ මුහුකුරා යන්නේ.

ශුද්ධවන්තයින් එම පදවිය දිනා ගත්තේ බාහිර ක්‍රිස්තු දාන කටයුතු නිසා ම නො වෙයි. ඔවුන් කුරුසියේ අභියෝගය භාර ගත්තා. ඔවුන් තුළ දේව රාජ්‍යය මුහුකුරා යන්නට ඉඩ දුන්නා. දෙවියන් වහන්සේ අපට බලය දෙන්නේ පිටතට ගොස් එය පාවිච්චි කරන්න පමණක් නො වෙයි. මේ බලය අපට දෙන්නේ පළමුවෙන් ම ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපයට පත් වන්න යි. විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය තුළ වර්ධනය වන්න යි. වේදනාව අප තුළ බලාපොරොත්තුව තහවුරු කරනවා. බලාපොරොත්තුව අප තුළ ප්‍රීතිය ජනිත කරනවා. අප කතා කරන්නේ ප්‍රීතිය නැති කරන වේදනාවක් ගැන නො වෙයි. අප කතා කරන්නේ වේදනාවේ අභිරහස පිළිබඳ ව යි. ලෝකය මේ අභිරහස දන්නේ නැහැ. අප එය ඉගෙන ගනිමින් සිටිනවා. වේදනාවේ අභිරහස තුළ අපි දෙවියන් වහන්සේගේ මහිමයෙහි ප්‍රීති වෙමු. ශුද්ධවන්තයින් කටුක වේදනා මැද පවා පරමානන්දය අත්දුටු අය යි. සමිඳුන් තුළ ප්‍රීතිය යි අපගේ ශක්තිය විය යුත්තේ.”

පුබුදුවේ ශුද්ධාත්ම මංගල උළෙල 1984 මැයි 25 සවස සිට පසු දින අලුයම දක්වා තේවත්ත බැසිලිකා දෙව් මැදුරු භූමියේ පැවැත්විණි. මම වේදිකාව මත නො ව වේදිකාව අසල සිට එයට සහභාගි වීමි. එදින මගේ යැදුමේ මූලික අදහස වූයේ මෙය යි. “සමිඳුනි ඔබ තුමන් අහස පලා ගෙන හෝ පැමිණිය යුතු මොහොත පැමිණ ඇත. හැම දෙයක් ම ගරා වැටෙමින් ඇත----” මහෝත්තමයාණන්ට ඇවැසි නම් ආශ්චර්යයක් තුළින් හෝ මා උපකරණයක් කර ගනිවි යැයි විශ්වාසයක් ඒ මොහොතේ මා තුළ විය. **අති ගරු ප්‍රැන්ක් මාකස් රදගුරු** තුමාගේ දේශනය දෙවිඳුන් ම මට කතා කළාක් මෙනි. එතුමා සිය දේශනය සඳහා **යෙසායා 64: 1-3** පදනම කර ගන්නා විට මම මවිත වීමි. “**ඔබ අහස පලා ගෙන නොබසින්නේ මන්ද? එවිට කඳු ඔබ තුමාණන් දැක බියෙන් කම්පා වනු ඇත. ලැව් ගින්න කැලෑව දල්වන්නාක් මෙන් ද ගින්න වතුර**

**උතුරුවන්නාක් මෙන් ද ඔබ ඉදිරියෙහි ජාතීන් කම්පා වන පිණිස ඔබේ බලය සතුරන්ට පෙන්වනු මැනව. අප බලාපොරොත්තු නො වූ භයානක දේ එක් කලෙක ඔබ කළ විට කඳු ඔබ ඉදිරියේ බියෙන් කම්පා වුණේය."**

(දෙවිඳුන් අහස පලාගෙන ඇවිත් හාස්කම් කරන්නට නො වෙයි, රිසි වන්නේ. එතුමන්ගේ ක්‍රියාකාරිත්වය ජීවිත වෙනස් කිරීම යි. දේව හස්තය මගින් පූර්ණ පවිත්‍ර කරණයකට ලක් කරන ජීවිත තුළිනු යි, එතුමන් අහස පලාගෙන ඇවිත් කරනවාට වඩා ප්‍රබල ක්‍රියා කරන්නට අදහස් කරන්නේ. හාස්කම් තාක්ෂණික යුගයක ප්‍රබල සාක්ෂි නො වන්න පුළුවන්. එහෙත් ප්‍රේමය හා පරිත්‍යාගය තාක්ෂණික යුගයක වඩා ප්‍රබල සාක්ෂි වනු ඇති.) රදගුරු තුමාගේ දේශනයේ එම අදහස් අන්තර්ගත විය. එය ආශ්චර්යයක් බලා සිටි මට තව දුරටත් මගේ ජීවිතය පවිත්‍රකරණයට ලක් වීමේ ඇවැසියාව පෙන්නුම් කළ කදිම දිනයක් විය.

## 7

ආධ්‍යාත්මික මුහුකුරා යාම සඳහා ගිවිසුම් සාංඝික ජීවිතයක අවශ්‍යතාවය පුබුදුව ඉස්මතු කර දැක්විය. මා තනි ජීවිතයක් ගත කරන්නකු ලෙස ඔවුහු දුටහ. යමෙක් මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා තමා කැප කර ගෙන සමිඳුන් කැඳවන ගමන අග දක්වා ම යන්නේ නම් ඔහු බාහිරව හුදෙකලාව සිටියත් ඔහු විශ්වය හා සාංඝික බව මම ඔවුන්ට පැවසීමි. **අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත** තුළ දිස් වන සියල්ල පොදුවේ තබා ගන්නා ගිවිසුම් සාංඝික ජීවිතය **(ක්‍රියා 2: 42-47, 4: 32-37)** නැවත ගොඩනගන්නට පුබුදුව ගන්නා උත්සාහයන් අසාර්ථක වන අයුරු මම දුටිමි. එදා එම සාංඝික ජීවිතය ගොඩනැගෙන්නට බලපෑ කරුණු 4ක් මට අවබෝධ විය. (ජේසු සමිඳුන්ගේ දෙ වන පැමිණීම තම ජීවිත කාලය තුළ සිදු වේ යැයි ඔවුහු අදහා ගත්හ. එය කිතුනුවන්ට පීඩන කාලයක් ද විය. ජේසු සමිඳුන්ගේ නාමයෙන් දිවි පුදන්නට සිදු වන බව දන්නා නිසා දේපළ පිළිබඳ ඇල්මක් ඔවුන් තුළ නො විය. එනිසා සියල්ල පොදුවේ තබා ගත හැකි විය. එවැනි පීඩන කාලයක පවුල් කිහිපයක් එක් ව එකට ජීවත් වීම ඔවුන්ට බලකොටුවක් වැනි ය. එය එක් ව යාච්ඤා කරන්නට එක් ව ජේසු සමිඳුන්ගේ නාමයෙන් දිවි පුදන්නට සවියකි.) ජේසු සමිඳුන්ගේ දෙ වන පැමිණීම සැබවින් ම ඉතා ආසන්න වන විට එය කිතුනුවන්ට (දහම් මඟ තෝරා ගන්නා සියල්ලන්ට) පීඩන කාලයක් ද වන විට එම ජීවන රටාව නැවත බිහි වනු ඇත.

1983 ජූලි මස ඇවිලී ගිය ජාතිවාදී ගින්න විග්‍රහ කරන පුවත්පත් ලිපියක ඒ තත්ත්වය උදා වූයේ අධිරාජ්‍යවාදීන් හා කිතුනුවන්ගේ බලපෑම් මත බෞද්ධ සාර ධර්ම ගරා වැටීම නිසා යැයි සඳහන් විය. එනිසා අපෙන් ගිලිහී යන වටිනා සාර ධර්ම එක්කොට එය ප්‍රඥාප්තියක් වශයෙන් සකසා එය සුරකින්නට පුබුදු පවුල් කණ්ඩායම් එක් ව ගිවිසුම් දීම සිදු විය. සාර ධර්ම සුරැකීම යහපත් ය. එහෙත් එය කිතුනු ගිවිසුම් සාංඝික ජීවිතය නො වේ. කිතුනු සාංඝික ජීවිතයේ අරමුණ විය යුත්තේ ජේසු සමිඳුන්ගේ දෙ වන පැමිණීම ඉක්මන් කිරීම සඳහා ක්‍රිස්තු ස්වරූපයට ඇබෙන ධර්මිෂ්ඨ ජීවිත ගොඩනැගීමයි. ඒ සඳහා සාංඝික ගිවිසුමක් අවශ්‍යයි. එය දෙවියන් වහන්සේ මට ප්‍රේම කරන ලෙස, මට පක්ෂපාත වන ලෙස සියල්ලන්ට ප්‍රේම කිරීමේ හා පක්ෂපාත වීමේ ගිවිසුමකි. ඒ ගිවිසුම ප්‍රායෝගික කළ හැක්කේ අඩු ගණනේ එක් කෙනකුට ජීවිතාන්තය දක්වා ප්‍රේම කරන බවට දෙන ගිවිසුමක් තුළිනි. සමිඳුන් එය කෙමෙන් පුළුල් කරනු ඇත. ඒ ගිවිසුම තුළින් ගමන් කළ තැනැත්තාට ගිවිසුම් ප්‍රේමයකින් සියල්ලන්ට ප්‍රේම කරන්නට බලය ලැබෙනු ඇත. දෙවිඳාණෝ එවැනි ගිවිසුම් සාංඝික ජීවිතයක් මා වෙනුවෙන් නිර්මාණය කළහ.

එය එක් අයකු සමඟ ගිවිසුම් සාංඝික ජීවිතයකි. දෙවිඳුන් විසින් ම ඒ සඳහා මට තෝරාදෙන තැනැත්තා හමු විය. ජීවිතාන්තය දක්වා මා ඔහුට ප්‍රේම කරන බවට ඔහුට පක්ෂපාත වන බවට මා සිත තුළ ගිවිසුමක් ඇති විය. ඒ ගිවිසුමට මා අද දක්වා ම පක්ෂපාත වී ඇත. ඒ ඔස්සේ මා ගෙන ආ ගමන් මඟ කොපමණ කටුක විද? මගේ මුළු ජීවිතය ම කෙනෙක් සමඟ මුළුමනින් විවෘත ව තබා ගත යුතු යැයි හැඟිණි. දේව මඟ පෙන්වීම අනුව ඒ සඳහා මා හා සහභාගි වූයේ ද එම චරිතය ම යි. 1984 පාස්කුවේ දී මගේ මුළු ජීවිතය ම මම ඔහු සමග බෙදා ගතිමි. පුබුදුව තුළ මට පසු කර යන්නට සිදු වූ කිසිදු පියවරක් මට එතරම් අපහසු නො වුනේ මෙම ගිවිසුම් ඇසුර තුළ එම සිදු වීම්වලට පෙරටුව ඒ විඳවීම පසු කර යන්නට මට පුහුණුව ලැබුණ බැවිනි. මේ ඇසුර මා වඩාත් පීඩනයට ලක් කළේ මා විදුහල්පතිවරයකුගේ වයසේ ද ඔහු තරුණ වයසේ ද වූ බැවිනි. එවැන්නකුගේ පාද සේදීම එවැන්නකුගේ දාසයා වීම කොපමණ දුෂ්කර ද? මේ ඇසුර විටෙක කුණාටුව විසින් උද්‍යානය ආලපාලු කර දමන්නාක් මෙනි, කුණාටුව විසින් ජීවිත වෘක්ෂයේ මුල් සොලවා කම්පනය කර දමන්නාක් මෙනි. මා ගිඹරයෙන්, මිටියාවතෙන් නෙලාගත් අයකු නො ව අගාධයෙන් ම අහුලා ගත්තෙකැ යි මට හැඟේ.

එවැන්නකුගේ පවිත්‍රකරණය අතිශයින් ම වේදනාත්මක විය යුතුය. අගාධයෙන් ගත් නිසා මෙම පවිත්‍රකරණයේ බලය අගාධය වෙතට ද නික්මෙනු ඇත. මෙම ගිවිසුම් සාංඝික ජීවිතය මගිනි, සම්බන්ධතා ජීවිතය පිළිබඳ අන්ධකාර රාත්‍රිය පසු කර යන්නට මා බලය ලැබුවේ.

මගේ මමත්වය සුන් වී මා භාග්‍ය අටට ඇඹෙනවා දැකීම යි, මේ ඇසුර තුළ මගේ එක ම පැතුම වුයේ. ඒ සඳහා දෙවිඳුන් මා වෙනුවෙන් උපයෝගි කර ගත් ජීවිතයට මම ගරු කරමි. ඔහු ද මා වෙනුවෙන් වේදනා විඳ ඇත. මෙම ඇසුරේ දී භාග්‍ය අටෙන් මට වඩාත් ප්‍රායෝගික වුයේ "මොලොක් ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය ----" යන්න යි. ප්‍රේම කරන්නට පමණක් අයිතියක් ඇති වෙන කිසිදු අයිතියක් නැති ඒ ගැන කනස්සල්ලක් ද නැති පුද්ගලයා තුළ පවතින ගුණය යි, මොළොක් ගුණය. එය පණුවෙක් වීම යි. පණුවෙක් වීම යනු අනුන්ගේ වැරදි දකින්නට ඇස් නැති අනුන්ගේ ඕපාදූප අසන්නට කන් නැති, අයිති කර ගන්නට අත් නැති, පැන දුවන්නට පාද නැති, පහර දෙන්නට දත්, දළ හෝ නිය නැති කෙනකුගේ පයට පෑගුනොත් මිය යන්නට සූදානම් තත්ත්වයකි. මෙම පියවර පසු කර යාම සඳහා පහත සඳහන් අදහස් කීපය ද මට උපකාරි විය. 1. "කිසිවකුට හෝ කිසිවකට නොහැකි යි, මා වියවුල් කරන්නට, මා තුළ තිබෙන තත්ත්වය ම යි මා වියවුල් කරන්නේ." 2. "මා දැන් මා වෙනුවෙන් ඒ කිසිවක් නොසොයන බැවින් සියලු යහපත් දේ මා වෙත පැමිණ ඇත." (**කුරුසියේ ජුවාම් මුනි තුමා**) 3. "**සහෝදර සහෝදරියන් අතරේ ඔබට උරුමයක් වත් කොටසක් වත් නැත. ඔබේ දෙවි වූ ස්වාමීන් වහන්සේ ඔබේ උරුමයත් කොටසත් වන සේක." (ද්විතිය 18:2)** 4. "**ඔබ සතු සියල්ල විකුණා ඒ මුතු ඇටය මිලට ගත යුතුය." (මතෙව් 13:45**) 5. "බලනු මැනව, ඔබ හදවත කඳුලින් සේදී සුසුමින් වියළී, පිවිතුරු වී, ඔබට නො දැනුවත් ව ගඳකිළියක් වී ඇත, ඒ දෙවියන් හට. ඔබ විඳි දුකට ඔබට මා දුන් තුටු පඬුර යි, එය." ( **'නොමියෙමි' - මහගම සේකර**)

මේ අත්දැකීම තුළ මා තනි භාවය ගැඹුරින් අත්දුටු අවස්ථා අපමණ ය. "මා සනසන්නකු සෙවූ නමුත් කිසිවෙක් මට හමු නො වීය." ජේසු සමිඳුන්ගේ එම මොරගැසීම එවිට මට සිහිපත් විය. එතුමාණෝ මිනිස් සංහතිය උදෙසා තම ප්‍රේමය උපරිම අයුරින් පුද කළහ. මිනිසා තුළින් ප්‍රති ප්‍රේමයේ බැල්ම නික්මෙන තුරු එතුමෝ බලා සිටිති. එහෙත් එවැන්නක් නො ලැබේ: ලැබෙන්නේ රිදවිලි පමණ ය. එතුමන්ගේ ඒ අත්දැකීමට යම් අයුරකින් හෝ මා එක් කර ගැනීම ගැන මම ප්‍රීති වීමි. එවිට **ක්‍රිෂ්ණ මූර්ති තුමාගේ** මෙම වදන් මට සිහිපත් විය. "මිනිසා පලා යන්නට උත්සාහ කරන තනි භාවය මුළුමනින් අත්දැක වටහා ගැනීමෙන් එය ඉක්ම වූ කල හුදෙකලා බව යනුවෙන් හැඳින්විය හැකි, ඒ ආශිර්වාදය පහළ වන්නේය."

මෙම පියවරේ දී පමණක් නො ව පුබුදුව තුළ ද ඉන් පසු ව හා මා ජීවත් වන තුරාවට මා අත්දකින සියලු වේදනා මදි-පුංචිකම් සියල්ල සාර්ථක ව පසු කර යන්නට මට බලය සපයන බලශක්ති උල්පත දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජේසු සමිඳුන්ගේ ජීවමාන වැඩසිටීම පිළිබඳ සත්‍යතාවයයි. ජේසු සමිඳාණෝ අපගේ පෝෂණය සඳහා අපගේ ආහාරය වෙති. එසේ නම් මා සියල්ලන්ගේ ආහාරය වන්නට රිසි විය යුතු නො වේද? මා අනුභව කර වැඩෙන්නට මා ඔවුන්ට ඉඩ දිය යුතු නො වේද? දුන්හිඳ දිය ඇල්ල නරඹා ආපසු එන විට ගෙන ආ සුදු හඳුන් පතුර මේසය මත තබා ගතිමි. එය මට ජේසු සමිඳුන්ගේ සංකේතය විය. එතුමෝ කපන, පලන, තලන, ඉරන, දවන තරමට සුවඳ නැංවූ සඳුන් අරටුව වුහ. ප්‍රේමයෙන් පිළිතුරු දෙන්නට මා අසමත් වන මොහොතේ සඳුන් අරටුව නිය'ගින් සූරා බලන්නට මම පුරුදු වී සිටියෙමි. සූරන විට ඉන් සුවඳ නික්මිණ. මා ද එලෙස වන්නට රිසි වීමි.

1983 දිනෙක 'After Winter' පොත් පිංචේ සඳහන් මේ වැකිය මට හමු විය. **'Let us launch out into the deep and go towards the sunset with joy and confidence. He waits for us.'** එය මට ඇරයුමක් කරන බව අවබෝධ විය. එය දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ සත්‍යතාවය ඔස්සේ තව දුරටත් වැඩෙන්නට කරන ඇරයුමකි. එය ආධ්‍යාත්මික ජීවිතයක හිරු බැස්මේ සිට මැදියම් රැය දෙසටත් නව දිනක උදාවේ සිට අරුණලු පැතිරීම දක්වාත් යන්නට කෙරෙන ඇරයුමකි. එය ප්‍රායෝගික කර ගන්නේ කෙසේ ද? **රයිල් බිෂොප් තුමාගේ, ජිම් එලියට් දේවගැති තුමාගේ, ටොම් ෆොරස්ට් පිය තුමාගේ, කතෝලික ශුද්ධ වන්තයකුගේ** යාච්ඤා 4 ඒ සඳහා උපකාරි විය. (අපගේ තුන් වන ප්‍රකාශනයේ '**පරම උල්පත හා මුදුන'** ඒ යාච්ඤා 4 සටහන් කර ඇත.)

මා එලෙස යාච්ඤා කරන විට සමිඳුන් මට කොපමණ සමීප දැයි මට අවබෝධ විය. එක් අයකු හෝ එලෙස යාච්ඤා කරනවා දැකීමට සමිඳාණෝ මහත් සේ රිසි වෙති. එම යැදුම මගේ ම ශුන්‍යතාවය කරා මා ගෙන යන බව පෙනිණි. එය අති බිහිසුණු වුව ද ඒ තුළ ඇති ශුභාරංචිය මට හමු විය. "මා මාගේ ශුන්‍යතාවයේ ගැඹුරට ම කිඳා බැසීමෙන් මා කොපමණ ඔසවනු ලැබී ද

යත් මම මාගේ අභිප්‍රාය වෙත පැමිණියෙමි.” (**කුරුසියේ ජුවාම් මුනි තුමා**) “මා වැනි දුර්වල අසම්පූර්ණ මැවීමක් ප්‍රේමය විසින් යාගයක් ලෙස තෝරාගෙන ඇත. මා තෝරාගනු ලැබීම ප්‍රේමයට යෝග්‍ය ද? එසේ ය. මක්නිසාදයත්, ප්‍රේමය පූර්ණ ව තෘප්තිමත් වන්නේ ශූන්‍යතාවයට කිඳා බැස ශූන්‍යතාවය ජීවමාන ප්‍රේමාග්නියක් බවට පත් කිරීමෙන් පමණි.” (**ලිසියහි සාන්ත තෙරේසා තුමිය.**) මෙම පියවරේ සියලු කැඩීම් ඇඹීම් මැද පහත සඳහන් වැකිය මා සැනසිය. **“මම ඔබට පිහිට වන්නෙමි යි කියමින් ඔබේ දකුණත අල්ලා ගෙන මම ඔබ ශක්තිමත් කරන්නෙමි. පණුවකු වැනි ඔබ කුඩා ව දුර්වල ව සිටියත් භය නො වන්න.” (යෙසායා 41:13 -14**)

## 8

1985 වසරේ දි පුබුදුව තුළ මා කළේ බයිබල් ඥානකාන්තිය පමණි. සති අන්ත දෙකකින් එය නිම කළෙමි. හැම සති අන්තයක් ම වාගේ ඒ සඳහා වැය විය. එහෙත් මගේ සති අන්ත සටහනේ නොවැම්බර් දෙසැම්බර් මාස මුළුමනින් හිස් ව මා දෙස බලා සිටින්නට විය. එය පළමු වන සංඥාව විය. **මාක් 12 : 41-44** නොවැම්බර් 10 වන ඉරුදිනට නියමිත දේව වචනය විය. “**ඇය තමා සතු ව ඇති එක ම කාසිය පිදුවාය.”** මා අත ඒ මොහොතේ ඇති එක ම කාසිය සති අන්ත බයිබල් ඥානකාන්තිය කිරීම පමණි. එයත් මගෙන් අවසන් වෙන්න ද යන්නේ? එය දෙ වන සංඥාව විය. එදින දිව්‍ය පූජාවේ දි මා අත ඇති එක ම කාසිය පුදන්නට මම සූදානම් බව සමිඳුන් හමුවේ පැවසිමි. පුබුදු ජාතික මූලික එකතුව නොවැම්බර් 12 වන දිනට යෙදී තිබිණ. එදින මා පිළිබඳ තීරණාත්මක යමක් සිදු වනු ඇතැයි හැඟිණි. එහි දි ගත යුතු මඟ කුමක් දැයි මම සමිඳුන් අබියස මෙනෙහි කළෙමි. මා ඉදිරියේ මාර්ග තුනක් විවෘත ව ඇති බව දිටිමි.

**1.** වෙනත් කිතුනු නිකායකට සම්බන්ධ වීම එක් මඟෙකි. ඒ මඟ මම කිසිසේත් තෝරා නො ගනිමි. කතෝලික සභාවෙන් ඉවත් ව වෙනත් කිතුනු නිකායන්ට එක් වූ අය මා සමග වාද කරද්දී මා ඔවුන්ට මෙ ලෙස කියා ඇත. “කතෝලික සභාවේ අඩුපාඩු තිබේ. එහෙත් මම ඔබ මෙන් සභාව අත්හැර නො යමි. සභාව තුළ ම සිටිමින් කවදා හෝ සභාව සකසා ගන්නෙමි.”

**2.** “මීට පස්සේ ඔබ කියන ඕනෑ ම දෙයක් මම දේශනා කරන්නම්” කියා ආත්මය සංවිධානයකට විකුණන්නට පුළුවන. මම ඒ මඟ තෝරා නො ගනිමි. ලෝකය ම මට දුන්නත් මගේ ඇතුලාන්තය විසින් අනුමත නොකරන දෙයක් මට දේශනා කළ නො හැකිය.

**3.** කලකට නිහඬ වන්නට තීරණයක් ගැනීම තුන් වන මඟ යි. මා ඉදිරියේ විවෘතව තිබුණේ ඒ මඟ පමණි. මා කියන දේ හරි නම් දෙවියන් වහන්සේ එය ඔප්පු කරන තුරු, ඔස්කා පිය තුමා කියන දේ හරි නම් දෙවියන් වහන්සේ එය ඔප්පු කරන තුරු කලක් නිහඬ වන්නට ශුද්ධාත්මයාණෝ මා මෙහෙය වන්නට වූහ. ඒ මඟ තෝරාගැනීම සඳහා මට **මහත්මා ගාන්ධි** තුමාගේ අදහසක් ද බලපෑවේය. යුද්ධයක් කර ජය ලබන්නට නම් විශාල හමුදාවක් විශාල ආයුධ තොගයක් අවශ්‍ය බවත් සත්‍යග්‍රහයක් කරන්නට එක් අයෙක් පමණක් හෝ ප්‍රමාණවත් බවත් ඔහු ජයග්‍රහණය කළොත් ඒ ජය සියල්ලන් සතු බවත් ඔහු පරාජය වුණොත් විනාශ වන්නේ ඔහු පමණක් බවත් එතුමා පවසා ඇත.

1985 නොවැම්බර් 12 වන දින පුබුදු ජාතික මූලික එකතුව ඇරඹෙන්නට පෙර මම දිව්‍ය පූජාවට සහභාගි වීමි. එදිනට යෙදී තිබුණේ 1983 නොවැම්බර් 8 '**නව මිනිසා'** මුල්කර ගත් ගැටළුවට මුල පිරූ දින දිව්‍ය පූජා කියවීම් ය. එය තුන් වන සංඥාව විය. එදින මා පිළිබඳ තීරණාත්මක යමක් සිදු වනු ඇතැ යි සිතිණි. එය එලෙස ම සිදු විය. ඔස්කා පිය තුමා මා විමසිය. “ඇන්තනිගේ දේශන හා පුබුදු ඉගැන්වීම් අතර වෙනසක් තිබෙනවා, මේක ලොකු වියවුලක්.” “මම නො වෙයි, වෙනස් වුනේ ඔබ යි.” මම කීවෙමි. පිය තුමා ඒ ගැන කිසිවක් නො කීවේය. මේ ගැටළුව සඳහා ගත යුතු මඟ කුමක්දැ යි පිය තුමා මගෙන් විමසිය. ඉහත විස්තර කළ තුන් වන මඟ මම කැමැත්තෙන් තෝරාගතිමි.

එකල මා පදිංචිව සිටි ගමේ නම වචනාර්ථයෙන් ම ඉංග්‍රිසියට පරිවර්තනය කළ විට ලැබෙන අර්ථවත් කිතුනු නමට මම ප්‍රිය කළෙමි. Shepherd’s Corner සිට මට මෙ වැන්නක් සිදු වුයේ ඇයි? ඒ තුළ මගේ දූත මෙහෙය කුමක් දැයි මෙනෙහි කළෙමි. මගේ දේශන නිසා පුබුදුව තුළ වියවුලක් ඇතැ යි චෝදනා ලැබීමි. එහෙත් දිගු කලක සිට 1985 නොවැම්බර් 12 දක්වා ම පුබුදු ඉගැන්වීම් සේවාව මට පැවරී තිබිණි. පුබුදු මූලික එකතුව ඇරඹීමේ සිට එදින දක්වා ම මම ද එහි සිටියෙමි. 'නව මිනිසා' සංස්කරණයේ දි මට ලැබුණේ පුදුමාකාර නිදහසකි. එය මුද්‍රණය කර බෙදා හරින තුරු එහි ඇත්තේ කුමක් දැයි පුබුදුවේ කිසිවෙක් නොදනිති, ඔස්කා පිය තුමා පවා නො දනි. මේ පරස්පරය දෙස බලා “පුදුමාකාර දේව අනුග්‍රහයක්, පුදුමාකාර

අරගලයක්" යැයි මම මට ම කියා ගතිමි. 1981 වසර නිම වන තුරු ද පුබුදුව තුළ අපි සැම එක් ව සුහද ව සිටියෙමු. එහෙත් 1985 වසර අග වන විට අපට එක් ව සිටින්නට නොහැකි තරමට මත ගැටුම් උග්‍ර වූයේ ඇයි? ඊට බලපෑ ප්‍රධාන කරුණු කීපයක් මට සිහිපත් විය. (එම කරුණු විස්තර කරන්නට මම මෙහි දී අදහස් නො කරමි.)

මට පැවරී තිබුණු සියලු වැඩ කටයුතු මගෙන් ඉවත් කර පූර්ණ නිහැඬියාවේ කාලයකට සමිඳුන් විසින් මා ගෙනැවිත් ඇත. මේ තුළ මට පැවරී ඇති දූත මෙහෙය මම මෙනෙහි කළෙමි. අප රට ශ්‍රේෂ්ඨ සංගීතවේදියාණන් වන **අමරදේවයන්ගේ** දිවියේ ගෙවී ගිය පස් වසරක නිහැඬියාවක් ගැන '**දෙසතිය'** සඟරාවේ පළ වූ වචන ස්වල්පයක් මට සිහිපත් විය. "---- හේමන්ත නිද්‍රාවේ (Hibernation) ගැලී හුන් අමරදේව වසන්ත සමයේ මල් පල පුබුදු කරන්නට ලක-ලැහැස්ති වන දැවැන්ත වෘක්ෂයක් වගේ. හේමන්ත නිද්‍රාවේ ඇලී-ගැලී හුන් කාලය තුළ පසක් කොට ගත් සත්‍යයෙන් මෙහෙයවනු ලැබූ කල්පනාවන් ඇති අමරදේව ----" මෙම නිහැඬියාව සදහම් වසන්තයක මල් පල පුබුදු වනු සඳහා සමිඳුන් විසින් ම මට උදා කළ හේමන්ත නිද්‍රාවක් ලෙස මම දුටුවෙමි. අද සභා සංවිධානය තුළ රදගුරු, පූජක, පැවදි සැමට ම පැවරී ඇති වැඩ කටයුතු රැසකි. සමිඳාණෝ සියලු වැඩ කටයුතුවලින් මා නිදහස් කර දවසේ පැය විසි හතර ම ආධ්‍යාත්මික ගවේෂණයක් සඳහා මා වෙන් කළහ. ඒ දූත මෙහෙය මා විසින් පිරිය යුතු ම ය. එය පූර්ණ නොකළොත් මහා ම වැරදිකරු මම වන්නෙමි.

මනුෂ්‍ය වර්ගයා මුහුණ දෙන සමස්ථ ගැටළුවට පූර්ණ උත්තරය ගැබ් වී ඇත්තේ දහම තුළ ය, ශුද්ධ බයිබලය තුළ ය. දහම තුළ ධර්මයාණන් විසින් තබා ඇති විභව ශක්තිය එක ජීවිතයක් මගින් හෝ මුළුමනින් ම චාලක ශක්තියක් බවට ප්‍රායෝගික කරගත යුතුය. මෙම නිහැඬියාව ඒ සඳහා මට ලැබී ඇති කදිම අවස්ථාවක් ලෙස දිටිමි. කිතු දහම ලොවේ අසාර්ථක වී නො තිබේ දැයි යුරෝපයේ වියත් ගත් කතුවරයකු හා දාර්ශනිකයකු වූ G.K **චෙස්ටර්ටන්ගෙන්** වරක් ප්‍රශ්න කළ විට "කිතු දහම අසාර්ථක වී ඇතිවා නො ව එය තව ම හරි හැටි අත්හදා බලා නැතැ" යි හේ පිළිතුරු දුන්නේය. මෙම නිහැඬියාව කිතු දහම හරි හැටි අත්හදා බලන්නට මට ලැබී ඇති කදිම අවස්ථාවක් ලෙස දිටිමි.

දෙවිඳුන්ගෙන් ලෞකික භෞතික දෙය ම පතමින් ඒවා ලැබුණේ යැයි උදම් අනමින් ඒ ගැන මහා හඬින් සමිඳුන් පසසන්නට රිසි වූවෝ ලොව බහුලව වෙසෙති. භාස්කම් සහිත සුව මෙහෙයන් කරන්නට රිසි වූවෝ ලොව බහුලව වෙසෙති. එහෙත් කුරුසිය මාර්ගයේ හෙවත් තම අයිතිවාසිකම්, තම ආශාවන් හා තම කැමැත්තට මරණයක් අත්දකිමින් ඒ ඔස්සේ කෙළවර දක්වා වැඩෙන්නට සූදානම් අය ලොව ඉතා දුලබයහ. අනව්ම් හෙවත් දේව දිළින්දාගේ, දුක් විඳින දේව සේවකයාගේ අත්දැකීම ඔස්සේ වැඩෙන්නට සූදානම් අය ලොව ඉතා දුලබයහ. මේ නිහැඬියාව ඒ අත්දැකීම් දෙසට වැඩෙන්නට මට ලැබී ඇති අවස්ථාවකැ යි සිතිණි. "තමා කැපවීම අනෙක් අය කැප කිරීමට වඩා ශ්‍රේෂ්ඨ ය." **මහත්මා ගාන්ධි තුමා** එසේ පවසා ඇත. මම ද දස වසරක් අනෙක් අය කැප කිරීමට වෙහෙසුණෙමි. මෙම නිහැඬියාව පූර්ණ කැපවීම උදෙසා මට ලැබී ඇති ඇරැයුමක් යැයි හැඟිණි. "**සත්‍යයෙහි ඔවුන් පවිත්‍ර වන පිණිස ඔවුන් උදෙසා මම කැප කර ගතිමි." (ජුවාම් 17: 19)** ජේසු සමිඳුන්ගේ ඒ මහා ආදර්ශය මා ඉදිරියේ තබා ගතිමි. අපගේ දෙ වන ප්‍රකාශනයේ සටහන්ව ඇති **ආචාර්ය අදිකාරම්** මහත්මාගේ වචන මේ ගමන පුරා මට මහත් සවියක් විය. මා රික්තයක් විය යුතුය, මා නියුට්‍රෝනයක් විය යුතුය.

**"දොරකඩින් බැටළු ගාලට ඇතුල් නො වී වෙන මඟකින් නැගී එන්නා සොරෙක් ද කොල්ලකන්නෙක් ද වේ. එහෙත් දොරකඩින් ඇතුල් වෙන්නා බැටළුවන්ගේ එඬේරා ය." (ජුවාම් 10:1,2)** ජේසු සමිඳාණෝ එසේ වදාළහ. ආගම් භේද අවුස්සමින් එමගින් ප්‍රේමයේ දහම තුවාල කිරීමත්, තෑගි බෝග මිල මුදල් දීමෙන් ආගමට හරවා ගැනීමත්, ආයුධ බලයෙන් ආගමට හරවා ගැනීමට කළ උත්සාහයත් මා දකින්නේ දොරටුවෙන් බැටළු ගාලට ඇතුළු නො වී වෙනත් මඟකින් පිවිසෙන්නට කළ උත්සාහයන් ලෙස යි. බැටළු ගාලට මා දොරටුවෙන් ඇතුල් විය යුතුය. දොරටුවෙන් ඇතුල් වීම යනු මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා දේව රාජ්‍යය මා තුළ ගැඹුරු කරන්නට සමිඳුන්ට ඉඩ හැරීමකි. ඒ පවිත්‍රකරණය කෙළවර මා තුළින් දේව රාජ්‍යය පිටාරා ගලනු ඇත. එවිට ප්‍රේමයේ දහම තුවාල නොකරමින් ලොව තුළ දේව රාජ්‍යය පුළුල් වේ. දෙවි පියාණන්ගේ මහිමය උදෙසා ලෝ වැසි සියල්ලන් ජේසුස් යන නාමය ඉදිරියේ දණ නමන පිණිසත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වාමින් වහන්සේ බව සැම දිවකින් ම උච්චාරණය කරන මොහොත උදා වීම සඳහාත් මා දොරටුවෙන් බැටළු ගාලට ඇතුල් වන්නට සූදානම් විය යුතුය. මෙය ඒ සඳහා වර්ධනය වීමට ලැබී ඇති අවස්ථාවක් ලෙස දිටිමි.

ඒ 1985 නොවැම්බර් 27 වන දිනය යි. නිහැඬියාව, හුදෙකලාව, පාලුව දැරිය නොහැකි තරම් ය. හැම දා ම මට මෙහෙම කට පියාගෙන ඉන්නට වුණොත්? ඒ සිතුවිල්ල මා පෙළන්නට විය. එදින පත්තරයේ **සුභාෂ් චන්ද්‍රබෝස්** තුමාගේ වටිනා අදහසක් පළ විය. එතුමා මෙසේ පවසයි. "දුක්ඛ වේදනා හා කැප කිරීම් නමැති පරීක්ෂණයට මුහුණ දීමෙන් මිස අන් කිසි ලෙසකින් කවර නම් හෝ වටිනා අදහසක් මෙ ලොව සාර්ථක වී නැත. එබැවින් දුක්ඛ වේදනා හා කැප කිරීම් නිසා කිසියම් පුද්ගලයෙක් පරාජය නො වන බව පැහැදිලි ය. මෙ ලොව වශයෙන් මෙ වැනි පුද්ගලයෙක් සැප-සම්පත් ධන සම්පත් ආදියට අහිමි වුව ද අමරණීය ජීවිතයකට හිමිකරු වීමෙන් එම තැනැත්තා මහත් ලාභයකට හිමිකරු වන්නේය." "කැපවීම් කිසි විටෙක නිෂ්පල නො වන්නේය. කැපවීම් කිසි විටෙක ක්ෂණික ප්‍රතිපල ද නො ගෙනෙන්නේය. යමෙක් යම් සත්‍යයක් උදෙසා කැප වී ඒ සත්‍යය පාවා නොදීම නිසා ඔහුට දුක් විඳිමට සිදු වේ නම්, සමහර විට මිය යන්නට සිදු වේ නම් ඒ සත්‍යය ඊ ළඟ පරපුරේ උරුමය බවට පත් වේ. විකාශයේ චක්‍රය යනු එය යි. විකාශයේ චක්‍රය ක්‍රියාවට නැගෙන්නේ කැප වීමෙන් හා දුක් විඳීමෙන් පමණි."

මා දුක් විඳින්නේ ශුද්ධ බයිබලයේ **රෝම 8 : 14** තුළින් ඉස්මතු කරන සත්‍යතාවයට කැප වීම නිසා නො වේද? **"ශුද්ධාත්මයාණන් විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය."** මම ඒ සත්‍යය අත්දකිමි. මම ඒ සත්‍යයේ සාක්ෂිකරුවෙක්මි. මෙ තෙක් මම ඒ සත්‍යය පාවා නො දුන්නෙමි. දිවි ඇති තාක් මම ඒ සත්‍යය පාවා නො දෙමි. ඒ නිසා බොහෝ දුක් විඳින්නට සිදු ව ඇත. ඒ නිසා ම ඒ සත්‍යය ඊ ළඟ පරපුරේ උරුමය බවට පත් වේ නම් මගේ මෙම නිහඬතාවය පල දරන නිහඬතාවයක් නො වේ දැයි හැඟිණි. මගේ ඉතිරි මුළු ජීවිතය ම එලෙස නිහැඬියාවෙන්, හුදෙකලාවෙන් ගෙවන්නට සිදු වුවත් මම ඊට මගේ කැමැත්ත සමිඳුන් අබිමුව ප්‍රකාශ කළෙමි.

ඒ 1986 ජනවාරි මාසය යි. මම පසුගිය 'නව මිනිසා' සඟරා සියල්ල කියවමින් සිටියෙමි. එහි මට මෙම අදහස හමු විය. **ගරු ටොම් ෆොරස්ට්** පිය තුමා මෙ ලෙස පවසයි. "මා කරන දේ නො ව දෙවියන් වහන්සේ මා තුළින් කර ගන්නා දේ සභාව, දේශය, ලෝකය වෙනස් කරයි, උසස් කරයි. මෙම සත්‍යය ක්‍රියා වාදයකට (වැඩ ගොඩකට) යට වී ඇති සභාව තුළ ආත්මගත කිරීම යි, පුබුදුවේ දූත මෙහෙය විය යුත්තේ." එනිසා මගේ නිර්මාතෘවරයාණන්ට මා තුළින් කර ගන්නට ඇවැසි දේ සඳහා මා දිගට ම ඉඩ දිය යුතු ම ය. "කිතුනු අප තෝරාගැනීමක් කළ යුතු වන්නේ හරි මාර්ගය, වැරදි මාර්ගය අතරින් පමණක් නො වේ. අපි හරි මාර්ගය හා වැරදි මාර්ගය අතර පමණක් තෝරාගැනීමක් කළහොත් අප ද සභාව මුහුණ දී ඇති එක් බරපතල ගැටළුවකට මැදි වෙනවා නිසැක යි. එය සැම කිතුනු පිබිදීමක් තුළ ම නැවත නැවත මුහුණ දෙන ගැටළුවක් ලෙස හඳුන්වන්න පුළුවන්. එනම්, ව්‍යවස්ථාවාදයේ ගැටළුව යි, සුචරිතවාදයේ ගැටළුව යි. සාමාන්‍යයෙන් මනුෂ්‍ය අප තුළ ව්‍යවස්ථාවාදයට බැඳෙන ස්වභාවයක් ඇත. ව්‍යවස්ථාවාදයට දෙවියන් වහන්සේගේ උත්තරය නම් එතුමන් විසින් පූර්ණ කරන ලද මහිමාන්විත සුවිශේෂක මාර්ගය හෙවත් ශුභාරංචි මාර්ගය යි." **(ගරු ලෙරී ක්‍රිස්ටෙන්සන් දේවගැති තුමා New Covenant 1981 ජනවාරි )** එනිසා මගේ ඉරණම කුමක් වුව ද මා සුවිශේෂක මාර්ගය ඔස්සේ ම යා යුතුය.

## 9

රාගම, දියගල පුබුදු වත්තේ, ශ්‍රී ප්‍රශංසාරාමයේ කොනක පිහිටි පුංචි නිවහනට පැමිණ පදිංචි වන ලෙස මම ඇරයුම් ලැබීමි. මම ඒ ඇරයුම භාර ගතිමි. මම එක ඉල්ලීමක් කළෙමි. මෙම නිහැඬියාව මට ලැබී ඇති දඬුවමක් නො ව දේව කැඳවීමක් ලෙස මා සලකන නිසා එහි ගත කරන කාලය තුළ ද මට එසේ පවතින්නට බාධා නො විය යුතු බව යි, ඒ ඉල්ලීම. පුබුදු ගිහි මූලික සොයුරාගෙන් එයට අවසර ලැබිණි. (මා එම නිහඬතාවයේ අත්දැකීමට කොතෙක් ගරු කළේ ද යත් දේශනයක් සඳහා දේවස්ථානයකින්, පාසැලකින් ලැබෙන ඇරයුමක් පවා ඒ කාලය තුළ භාර නො ගතිමි.) 1987 ජනවාරි 22 මම නව නිවහනට ගියෙමි. එය ලැලි ගැසූ ගොම මැටි ගෑ පොල් අතු සෙවිලි කළ පුංචි නිවහනකි. සර්පයකුට පහසුවෙන් නිවසට රිංගා ගත හැකිය. රැයෙක මට අනතුරක් වුණොත් මගේ උපරිම වෙර වීරිය යොදා කෑ-මොරගැසුවත් ඒ හඬ ඇසෙන තෙක් මානයක කිසිවකු හෝ නැත. රෑට වත්තේ බල්ලන් ලිහා දමන නිසා ද උන් මා නාඳුනන නිසා ද මට විපතක් වුව ද කිසිවකු හමු වන්නට මට යා නො හැකි ය. එය දේව සුරක්ෂිත භාවය තුළ ම රැඳී සිටිය යුතු තත්ත්වයකි. හැම දිනක ම වාගේ රාත්‍රි කාලයේ දෙ තුන් වරක් මුගටියෙක් නිවසට පැමිණ අස්සක් මුල්ලක් නැර පරීක්ෂා කර බලයි. දිනක් මුල්ලක සැඟ වී සිටි ගෝනුස්සකු මුගටියා විසින් අණ්ඩෙන් ඇදගෙන නිවෙසින් පිටතට ගෙන යන අයුරු මම බලා සිටියෙමි. මම ඒ මුගටියා දෙස ද ගෞරවයෙන් බලන්නට පුරුදු වීමි.

1987 මාර්තු 13 වන දින නෑ-මිතුරන් පිරිසක් සමඟ මම ශ්‍රී පාදයට ගියෙමි. එය සති අන්තයක මා එහි ගිය පළමු අවස්ථාව විය. ඔරොත්තු නොදෙන තරම් ජනතාවක් පැමිණ සිටියහ. අපට ඇවැසි ලෙස නො ව පොලිසියේ විධානයන් අනුව ගමනේ යෙදෙන්නට අපට සිදු විය. කන්දට නැගුණු සියල්ලන් පහළට බසින තුරු අහස්ගව්ව අසල පැයකටත් වැඩි කලක් පොලිසියේ විධානය අනුව නැවති සිටින්නට අපට සිදු විය. තෙරපෙමින් මහත් විඳවීම් මැද අපි එහි සිටියෙමු. ක්ලාන්ත ගතියක් දැනී මම බිම වාඩි වීමි. පුදුමාකාර අප්‍රාණික බවක් දැනිණි. අහස්ගව්ව නැඟීමේ දී එක පඩියක විනාඩි දෙක තුනක් නැවති සිටීමට සිදු විය. එසේ වූයේ ඉහළට නැඟි අය එක දිගට පහළට බස්සවමින් සිටි බැවිනි. ඉදිරියෙන් සිටින අය ඊ ළඟ පඩියට නගින විට පසු පසින් එන තල්ලුව මා නිරාසයෙන් ම ඉහළ පඩියට ඔසවා තබයි. මෙ ලෙස තල්ලු වෙමින් මහත් විඩාව මැද මාර්තු 14 වන දින ඉර සේවය සිදු වූ අලුයම 6.29ට මම කන්ද මුදුනට පියවර තැබීමි. එහි සිට එම මනස්කාන්ත දර්ශනය මම නැරඹීමි. එක විනාඩියක් ඉස්සර වුණා නම් පොලිස් විධානය අනුව පහළට බසින්නට සිදු වනු ඇත. එක විනාඩියක් පමා වුණා නම් මේ දර්ශනය මෙ ලෙස සංසුං ව නැරඹිය නො හැකිය. එදින පැවති ඒ රිද්මය මට ඉක්මන් කළ නො හැකිය, පමා කළ නො හැකි ය. එහෙත් ගමන අග පුදුමාකාර සාර්ථකත්වයක් අත්දිටිමි. විඩාව දුරු විය. මහත් සහනයක් සුවයක් දැනිණි. එදින ඒ ගමනේ පුදුමාකාර සාර්ථකත්වයක් අත්දුටුවේ දේව අනුග්‍රහයේ හා මනුෂ්‍ය ප්‍රවාහයේ ප්‍රතිපලයක් ලෙස බව මට අවබෝධ විය.

එයින් දින කිපයකට පසු **ආචාර්ය සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන්ගේ ‘Religion and Culture’** පොතෙන් උපුටා ගත් මෙම කොටස පත්තරයක පළ විය. “භෞතික සුරක්ෂිත භාවය පිණිස කරන අරගලයෙන් නිදහස් වූ කල මිනිසා කුඩා මැවුම්කරුවකු වනු ඇත. ලෝකය මෙසේ විය යුතු යැයි අප මැවූ සැම සිහිනයකට ම වඩා ලෝකය චමත්කාර ජනක බව පෙනී ගිය කල අවබෝධයේ නව බිම් වෙත අපට මඟ හෙළි වනු ඇති අතර ඉරණම ගැන යථාවබෝධයක් ලැබෙනු ඇත. මිනිසාට නව දැනුම අභියෝගයක් මෙන් ම අවස්ථාවක් ද වේ. ඔහු **<u>ඉක්මන් නො වී හා පමා නො වී</u>** මනුෂ්‍යත්වයේ උසස් බවට ළඟා වීමට පරිශ්‍රම ගත යුතුය. මනුෂ්‍ය වර්ගයා ආධ්‍යාත්මික අවබෝධය හා මානව දයාව පිළිබඳ නියමයන් වටහා ගත් විට සියලු කණ්ඩායම් ජය ගන්නා හා කිසිදු කණ්ඩායමක් පරාජය නො වන විශිෂ්ඨ සමගි සන්ධානය ලෝක ජනතාව අතර ඇති වනු ඇත.” සිරිපා ගමනේ අත්දැකීම හා මුසු වෙමින් “ඉක්මන් නො වී හා පමා නො වී” යන එම යෙදුම මගේ නිම්වළලු පුළුල් කරන්නට සමත් විය.

මා දැන් විස්තර කරන්නේ 1987 අගෝස්තු 27, 28, 29 සිදු වීමකි. මගේ මවගේ මරණයෙන් දින දහයකට පසු දියගල පුංචි නිවෙසට පැමිණියෙමි. ගේ ඇතුළත හා පිටත සියල්ල අවුල් වී කිළිටි වී තිබිණි. එහෙත් කිසිවක් කරන්නට නො සිතේ. රෝගී බවක් දැනෙන්නට විය. තනි මා වෙනුවෙන් ආහාර සකස් කරන්නට ද නො සිතිණි. එය මහත් කරදරයක් මෙනි. මහා පාළුවක් බියක් දැනිණ. පුංචි ශබ්දයක් ඇසෙන විට පවා විදුලි පන්දම දල්වා බැලුවෙමි. නින්ද මා වෙත නො පැමිණේ. විඩාවට පත් ව මොහොතක් ඇස පියවෙන විට මරණයක් පිළිබඳ බිහිසුණු සිහිනයකින් තිගැස්සී අවදි වූයෙමි. මහා රෑ ඇඳේ වැතිර සිටින මට මෙ ලෙස සිතිණි. අපේ නිවසේ ඉතා කෙටි කලක් තුළ දී මරණ තුනක් සිදු විය. ඒ මරණ සිදු වුණේ රාත්‍රි කාලයේ ය. එය දැන ගත්තේ නිවසේ තවත් අය සිටි නිසා ය. මට එවැන්නක් සිදු වුණොත්? දින දෙක තුනකට වරක් වත් මා සිටින නිවෙස පැත්තට කිසිවෙක් හෝ නො පැමිනෙති. එසේ නම් මා මැරිලා ගඳ ගහද්දි යි දැන ගන්නේ. මට එලෙස සිතිණි. එහි බිහිසුණුකමෙන් මම සන්ත්‍රාසයට පත් වීමි.

ශාරීරික තුල්‍යතාවය නැති වීමේ බිහිසුණුකම මම අත්දැක ඇත්තෙමි. මානසික තුල්‍යතාවය නැති වීම, මානසික කඩා වැටීම එහි බිහිසුණු අද්දරට මම පැමිණ සිටියෙමි. ඇඳේ වැතිර සිටින අතර ම දේව අනුග්‍රහය විසින් මා සනසමින් අහස්ගව්ව මට සිහිපත් කළේය. එය අනුග්‍රහය හා ප්‍රවාහය විසින් ගෙන ගිය ගමනකි. අවශ්‍ය ම තත්පරයේ මම කඳු මුදුනේ සිටියෙමි. ඊට පෙර හෝ ඊට පසු ව නො වේ. ඒ ගමන මා යමින් සිටින ආධ්‍යාත්මික ගමනේ සංකේතයක් වැනි යැයි සිතිණි. මා බිය විය යුතු නො වේ. එදා මා අහස් ගව්ව නැග්ගේ දුබලයෙක් ලෙස නො වේද? මා වැටෙනු ඇතැ යි සිතා අක්කා මගේ අතින් අල්ලා ගෙන ගිය හැටි සිහිපත් විය. මා යෙදී සිටින ආධ්‍යාත්මික ගමනත් එලෙස ම වනු ඇත. අනුග්‍රහයේ හා ප්‍රවාහයේ ප්‍රතිපලයක් ලෙස අවශ්‍ය ම තත්පරයේ මා අවශ්‍ය ම තැන සිටිනු ඇත. ගමන් මඟ සිදු වන ප්‍රමාදයන් විඩාවන් සියල්ල ද “පමා නො වී සහ ඉක්මන් නො වී” සිදු වන ඒ ජයග්‍රහණය සඳහා අත්‍යවශ්‍ය ය. ඒ අවබෝධය ගමන් මඟ සිදු වන ප්‍රමාදයන් විඩාවන් දෙස ද ගෞරවයෙන් බලන්නට මට උගන්වයි. මම සුවපත් ව අවදි වීමි.

1988 ජනවාරි 9 වන දින දියගල පුංචි නිවහනේ දි ලියුම් දෙකක් හා නව වසරට සුබ පැතුම් පතක් මා අතට පත් විය. එහෙත් ඒ සුබ පැතුම මා නමට එවූවක් නො වේ. එය වැරදීමකින් සුළු මොහොතකට හෝ මා අතට පත් වූයේ ඇයි දැයි සිතිමි. එය හොඳින් ඇලවී නැත. රන්වන් පාට යාච්ඤා කරන අත් දෙකක් පෙනේ. ඒ තුළ මට යම් පණිවුඩයක් ඇතැ යි මගේ ආත්මයට හැඟෙන්නට විය. ඒ මොහොත වන විට මා තුළ නොවිසඳුන ගැටළුවක් විය. එය නිහැඬියාවේ සමයේ මා මුහුණ දුන් අමාරු ම පරීක්ෂණය විය හැකිය. “දෙවිඳුන් ඔබට දේව රාජ්‍ය උදෙසා කොයි තරම් තලෙන්තු දී ලා තියෙනව ද? ඒ තලෙන්තු වළලා දමන එක පාපයක් නො වේද?” කීප දෙනකු ඒ පැනය මගෙන් විමසා තිබිණි. මට ද එලෙස සිතුන වාර අපමණ ය. සැබවින් ම ඒ සුබ පැතුම තුළ මට ඇවැසිව තිබූ පිළිතුර හමු විය. **“These hands so scarred and toilworn tell the story of a man who sacrificed his talent in accordance with God’s plan. For in God’s plan are many things man cannot understand.” (Helen Steiner Rice)** “නිතර දෙ වේලේ වැඩපල කිරීමෙන් රළු වූ කැළැල් වූ මේ අත් දෙවිඳුන්ගේ සැලැස්ම අනුව සිය තලෙන්තු පුද කළ මිනිසකුගේ කතාව කියයි. මක්නිසාදයත් මිනිසාට තේරුම් ගත නොහැකි බොහෝ දෑ දෙවිඳුන්ගේ සැලැස්මේ ඇත.”

සමිඳුන් පියවරෙන් පියවර කැඳවන ගමන් මඟ වඩාත් ඈතට යන විට සමිඳුන් දුන් තලෙන්තු සියල්ල නැවත සමිඳුන් සුරතේ තබා දෑතේ කරගැට එන තුරු සාමාන්‍ය කම්කරුවකු මෙන් වැඩපලවල යෙදෙන්නට කාලයක් පැමිණෙන බව මම එයින් අවබෝධ කර ගතිමි. ඒ අනාවරණය මහත් සතුටකින් යුතුව කය වෙහෙසා වැඩ කරන්නට මා මෙහෙය විය. 1988 අප්‍රේල් 1 මහා සිකුරාදා, මම තේවත්ත බැසිලිකාවේ මෙහෙයට සහභාගි වීමි. මහා සිකුරාදා පූජා කියවීම්වලට අදාල පිළිතුරු ගිය මගේ අවධානයට දැඩි ව ලක් වූයේ එදින යි. **(ගීතාවලිය 31: 11, 12, 14, 15) “මට සතුරුකම් කරන්නන් නිසා මම අසල්වැසියන් අතර නින්දාවක් ව සිටිමි. මගේ මිතුරන්ට මම භීතියක් ව සිටිමි. වීදියේ මා දක්නා අය මා වෙතින් පලා යන්නෝය. මා මතකයෙන් ඉවත ගිය මියගිය කෙනකු මෙන් වී සිටිමි. මා බිඳුණු බඳුනක් මෙන් පසෙක දමා ඇත. එහෙත් සමිඳුනි, මා විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහිය. මාගේ දෙවියෝ ඔබ යැයි කියමි. මාගේ කාලයන් ඔබ අතේ ය.”**

එය මා විඳිමින් සිටි අත්දැකීම කදිමට ප්‍රකාශ කරයි. මට කොහෙත් ම වැරදී නැතැ යි නියත ලෙස ම අවබෝධ වූ මොහොතකි, එය. ජේසු සමිඳුන්ගේ ඉරණමට සහභාගි වීම යනු මෙය නො වේ දැයි සිතිණි. (මගේ අත් දැකීමේ නිවැරදි භාවයට සාක්ෂි දැරීම නිසා 1987 අගෝස්තු මස ඇන්තනි මේරි සොයුරිය ද, 1988 අප්‍රේල් මස සම්පත් සොයුරා ද පුබුදුවෙන් ගිලිහී ගියහ. මා, සම්පත් හා ඇන්තනි මේරි ජේසු සමිඳුන් විසින් ම සකස් කළ සංඝයක් යැයි හැඟිණි. ඇගේ ගම්පියසේ දි -නුවරඑළිය- අපි තිදෙනා වසරකට වරක් හෝ එක් ව යාච්ඤා කර අත්දැකීම් බෙදා ගතිමු.)

අප තිදෙනා මුල්කර ගෙන පුබුදුව තුළ නොයෙක් මතවාදයන් නිර්මාණය වන අයුරු පෙනිණි. “ඔවුන් විශේෂ පුද්ගලයන් යැයි ඔවුහු සිතා සිටිති. ඔවුන්ගේ එම ස්ථාවරය ඔවුහු කිසිසේත් වෙනස් නො කරති. මෙය අශුද්ධ ආත්මයකි. එය අධි-ආධ්‍යාත්මික අශුද්ධාත්මය යි. ඒ අශුද්ධාත්මය දුරු කළ නො හැකි ය. ඔවුන් ඇසුරු කරන්නන්ට ද එය පැතිරේ.” මෙය අප පිළිබඳව නිර්මාණය වූ එක් ප්‍රබල මතයකි. ඒවා පුබුදුව සිසාරා පැතිර යන අතර 1988 ශුද්ධාත්ම මංගල උළෙල පළමු වරට දියගල ප්‍රශංසාරාමයේ පැවැත්වීම සඳහා ලහිලහියේ සූදානම් වන අයුරු පෙනිණ. මා පිළිබඳව ද අමුතු දෙයක් සිදු වෙමින් පවතින අයුරු දිටිමි. දිනපතා ම කිහිප දෙනෙක් හෝ මා හමු වීමට පැමිණියහ, මා හා කතා කරන්නට උත්සුක වූහ. එය මා පිළිබඳ තවත් අදියරකට මුල පිරීමක් බව මට පැහැදිලි විය. (මම කිසි විටෙක සිද්ධීන් මට ඇවැසි ලෙස නිර්මාණය කරන්නට හෝ පාලනය කරන්නට උත්සාහ නො කරමි. සිදු වීම් ප්‍රසන්න වුව ද කටුක වුව ද එලෙස ම භාර ගෙන ඒ තුළ දේව හස්තයේ ක්‍රියාකාරීත්වය දකින්නට පමණක් උත්සාහ කරමි.)

ඒ 1988 මැයි 11 වන දිනය යි. මා සිටි පුංචි නිවෙසට පුබුදු මූලික එකතුවේ සොයුරෝ කිහිප දෙනෙක් පැමිණියහ. ශුද්ධාත්ම මංගල උළෙලේ සූදානම සඳහා ක්‍රියා කරන තරුණයන්ට නැවතීම සඳහා මා සිටින නිවෙස ඇවැසි බවත් එනිසා ඒ උළෙල අවසන් වන තුරු ගෙදර ගොස් මැයි මස 24 වන දින ඔවුන් හමු වන්නට කොළඹ මූලස්ථානයට එන ලෙසත් ඔවුහු මට පැවසූහ. මම ඊට එකඟ වීමි. මම මැයි මස 24 වන දින එහි ගොස් ඔවුන් හමු වීමි. ඔවුන්ගෙන් කෙනකු මා ගැන කී දෙයින් මම විමතියට පත් වීමි. (එය ඔහු සමඟ මා සමීපයෙන් ඇසුරු කරන කාලයේ කී දෙයක් ලු. කලක් පුබුදුව තුළ ලොකු කැපවීමකින් වැඩ කරල යම් මොහොතක නිහඬ වන බව, එවිට යි ඇන්තනිගේ අගය පුබුදුවට වැටහෙන්නේ කියල මා කී බව.) එවැනි අදහසක් මගේ යටි

හිතේ වත් තිබුනේ නැත. කඳුලු බිඳුවකින් දෑස පෙඟී බොඳ ව පෙනෙන රූප රාමු අතරින් මට මෙ ලෙස සිතිණි. මා පිළිබඳ ව ඔවුන් ඔස්කා පිය තුමාට කියා ඇත්තේ මෙ වැනි දේ නම් එතුමා මට පිස්සු කියල හිතුවත් සාධාරණ යි. දැනට පවතින වාතාවරණය අනුව මා දියගල සිටීම සුදුසු දැයි මම ඔවුන්ගෙන් ඇසුවෙමි. මේ සියල්ල නිරාකරණය වන තුරු මා එහි සිටීම සුදුසු නැති බව ඔවුන්ගේ අදහස විය. එනිසා ආපසු මම ගෙදර පැමිණියෙමි.

## 10

මගේ අත්දැකීමේ නිවැරදි භාවය වෙනුවෙන් පෙනී සිටි තරුණ පිරිසක් මා වෙනුවෙන් උද්ඝෝෂණයක යෙදෙන්නට සූදානම් වන බවට පුවතක් මට ද අසන්නට ලැබිණි. එවැනි පසුබිමක පුබුදුවේ ගිහි මූලික සොයුරා හමු වූ විට මම ඔහුට මෙ ලෙස පැවසිමි. "මගේ අත්දැකීමේ නිවැරදි භාවය මා හා මගේ නිර්මාතෘවරයාණන් අතර ඇති අවබෝධයක් පමණි. ඒ වෙනුවෙන් අනෙක් අය උද්ඝෝෂණයක යෙදීම සුදුසු නැතැ"යි මම ඔහුට පැවසීමි. ඒ අදහස ඒ තරුණ පිරිසට මා විසින් කියනවා දකින්නට ඔහු ද රිසි විය. ඒ අනුව 1988 ජුනි 18 වන දින ඒ තරුණ පිරිස අමතා කතා කරන්නට මට සිදු විය. එය අවුරුදු දෙක යි මාස හතක නිහැඬියාවකින් පසු මා දුන් පළමු දේශනය යි. මගේ නිහඬතාවය යම් අයුරකින් හෝ අවසන් වූවා නො වේ දැයි මට හැඟිණි. එනිසා ඉන් පසු දේශනයක් සඳහා මට ඇරයුමක් ලැබුන විට මම එය භාර ගතිමි. (පුබුදුව තුළ නො වේ, එවැන්නක් සඳහා පුබුදුවෙන් මේ දක්වා ඇරයුමක් ලැබී නැත.) ජුනි 18 දේශනය ඔවුහු පටිගත කළහ. මෙම හඬ පටිය අතින් අතට යන්නට පුළුවනැ යි මට හැඟිණි. අතින් අතට යනවා නම් යා යුත්තේ මීට වඩා ක්‍රමානුකූල ව සකස් කළ පණිවුඩයකි. අප පිළිබඳ පැතිර යමින් තිබුණ දුර්මත නිසාත් එවැන්නක් සිදු වීමේ අවශ්‍යතාවයක් ද විය. එනිසා ඒ මොහොතේ මා විසින් කිව යුතු ව තිබුණු වචනය 1988 ජුනි 27 වන දින හඬ පටියකින් ප්‍රකාශ කළෙමි. එම තරුණ පිරිසට නායකත්වය දුන් ක්‍රිස්ටි මර්සලින් සොයුරා පුබුදුවේ හැම සංඝයකින් ම තෝරාගත් එක් තරුණයෙක් අතට මෙම හඬ පටිය ලැබෙන්නට සැලැස්විය. ඊ ළඟ දිනයේ දී මෙම හඬ පටියේ පිටපතක් පුබුදුවේ ගිහි මූලික සොයුරාට මම භාර දුනිමි.

1992 ජනවාරි 4 වන දින ඔස්කා පිය තුමාගෙන් මට ලිපියක් ලැබිණි. 1991 ඔක්තෝබර් 2 වන දින පිය තුමා හමු වූ මොහොතේ මා කළ කී දේ ද, පිය තුමාට මා ඔක්තෝබර් 4 හා නොවැම්බර් 11 යැවූ ලිපිවලට පිළිතුරු දීමක් ද ලෙසට යි, ඒ ලිපිය ලියා තිබුණේ. ඒ ලිපියේ මෙසේ ද සඳහන් විය. "ඔබ හුදෙකලා වෙමින් හුදෙකලා තීරණ ගනිමින් කරන මෙම ක්‍රියා 1. ඔබ ම පවසන පරිදි ශුද්ධාත්ම මෙහෙය වීමක් ද? 2. ශුද්ධාත්මයාණන් යැයි කියමින් දුෂ්ටාත්මයට යට වීමක් ද? 3. මානසික ඌනතාවයකින් මතු වන මානසික ව්‍යාධියකට පත් වීමක් ද? මට නම් හැඟෙන්නේ මින් තුන් වන කරුණ යි: මානසික ඌනතාවයක් නිසා මතු වන මානසික ව්‍යාධියකින් ඔබ පෙළෙන බව යි." (පුබුදුව මගින් ස්ව අනාවරණ සම්මේලනයක් පවත් වනු ලබන බවත් මෙම රෝගි තත්ත්වයෙන් සුව වීමට කැමති නම් ඒ බව පිය තුමාට දන්වන ලෙසත්, එවිට මට පෞද්ගලික ව ඒ ගැන අතදීමක් සඳහා කටයුතු කළ හැකි බවත් - පුබුදුවේ සිටින තුන් දෙනෙකුගේ නම් සඳහන් කරමින් - එයින් කෙනකු ළඟට ගොස් සුවය ලබන්නට අවස්ථාව දෙන්නට සූදානම් බවත්, මෙ වැන්නක් ලිවේ මා රිදවීමට නො ව මා ගැන ඇති ප්‍රේමය නිසා බවත් ඒ ලිපියේ පිය තුමා සටහන් කර ඇත.)

ඔස්කා පිය තුමා එවූ ඒ ලිපිය නිසා මම වේදනාවට, කලකිරීමට පත් නො වීමි. ඊට හේතුව මෙය යි. මගේ අනන්‍යතාවය කුමක් ද? මා අයිති වන්නේ කුමන කුලකයකට ද? යන්න මට ම ගැටළුවක් ව පැවති මොහොතක එය හැඳින ගන්නට මට උපකාරී වූයේ වසර දහයක් මා ඇසුරු කළ **සිරිල් බී. පෙරේරා** සොයුරා ය. ඔහු **කොලින් විල්සන්ගේ 'The Outsider'** පොත රැගෙන එහි සමහර වැකි කියවමින් මගේ අනන්‍යතාවය ඒ තුළ ඇති බව අවබෝධ කර ගන්නට මට උපකාරී විය. ඔහු පුවත්පත් සඳහා සපයන ලිපි ලේඛනවල දී The Outsider පොතෙන් උපුටා පළ කළ කොටස් මම එක්රැස් කළෙමි. ඔස්කා පිය තුමා මට එවූ ලිපියට පිළිතුර ඒ වැකි තුළ මට හමු විය.

"බැලූ බැල්මට පිටස්තරයා සමාජයීය ගැටළුවකි. ඔහු ඉදිරිපත් ව පෙරමුණට නොඑන මුළු ගැන්වුන චරිතයකි. ---- පිටස්තරයා වූ කලී විකෘති මනසක් ඇති පුද්ගලයෙක් නො ව සංවේදිතාවෙන් යුත් සකෘති මනසක් ඇති පුද්ගලයෙකි. ඔහු තුළ විද්‍යමාන වන අභ්‍යන්තර අසහනයක් ඇත. ඒවා විසඳන්නේ කෙසේ ද? අසහනයෙන් යුත් සකෘති පුද්ගලයකු මනෝ වෛද්‍යවරයකු වෙත යැවීමෙන් ප්‍රතිපලයක් වේ ද?" ---- "කොලින් විල්සන් කියන පරිදි පිළියම ඇත්තේ ආගමික විසඳුමක් මත ය. පිටස්තරයා පිළිබඳ ප්‍රශ්නය නිදහස පිළිබඳ ප්‍රශ්නයකි. එය හුදෙක් දේශපාලන විසඳුමක් නො ව ආධ්‍යාත්මික විසඳුමකි. සියලු ආගම් ධර්මවල පදනම නිදහස

යි. පිටස්තරයා අවසාන වශයෙන් ආගමික පදනමකට පිවිසෙන්නේ මෙන්න මේ කරුණ නිසා විය හැකියි. පිටස්තරයාට අවශ්‍ය වන්නේ නිදහස යි. ඔහු දකින ඊනියා සෞඛ්‍ය සම්පන්න මනස නිදහසෙන් තොර වුවකි.''

ඔස්කා පිය තුමාගේ ලිපිය ලැබී දින කිපයකට පසු මම එය ද රැගෙන සිරිල් බී. පෙරේරා සොයුරු හමු වන්නට ගියෙමි. ඔහු අසාධ්‍ය ව රෝහල්ගත ව සිටියේය. ඔහු මා හැඳින ගත්තා පමණි. ඔහු හා වචනයක් හෝ කතා කළ නොහැකි විය. ඔහු මිය යනු ඇතැ යි මට සිතිණි. එය එසේ ම විය. මට එසේ හිතෙන්නට හේතුව මෙය යි. එය මා ළඟින් ඇසුරු කළ ටික දෙනා ද මගෙන් වෙන් වන කාල වකවානුවක් වූ බැවිනි. සමහරු මිය ගියහ. තවත් සමහරු රැකියා සඳහා විදේශගත වූහ. තවත් අය මා යන මඟ ඔවුන්ට නොවැටහෙන නිසා මගෙන් දුරස් වූහ.

## 11

## 'දහම් නවෝදය' සංඝය උපත ලබයි.

ඔස්කා පිය තුමා එවූ ලිපිය මට ලැබුණු දින ම (1992 ජනවාරි 4) ක්‍රිස්ටි මර්සලින් සොයුරා හදිසියේ මා හමු වන්නට පැමිණියේය. ඔහු රැකියාවෙන් නිවාඩු ගෙන විභාගයකට සූදානම් වෙමින් සිටින බව කී නිසා එම ලිපිය ගැන ඒ මොහොතේ මම ඔහුට නො කීවෙමි. ඔහු මට මෙසේ පැවසීය. ''පුබුදුව තුළ අප අත්දකින ගැටළුව **මැල්කම් රංජිත් රදගුරු** තුමාට දන්වන එක හොඳයි කියල මට හැඟෙනවා. ඇන්තනි අයියා ඒ ගැන මොනවද කියන්නේ?'' මම ඔහුට මෙ ලෙස පිළිතුරු දුනිමි. ''රදගුරු තුමා මගේ ශක්තියත් ආලෝකයත් කියල මම කවදා වත් කියන්නේ නැහැ. ජේසු යි, මගේ ශක්තියත් ආලෝකයත්. අප මුහුණ දෙන ගැටළු සභා ශ්‍රේෂ්ඨයන්ට කියන එක වරදක් කියලා මා දකින්නේ නැහැ. ඔබට හැඟෙන දෙයක් කරන්න. ඒත් මා ගෘහ ශිල්පින් විසින් ඉවත ලූ ගලක් විය යුතුව තිබෙනවා කියලයි මට නම් හැඟෙන්නේ.'' ඔහු රදගුරු තුමා වෙත ලිපියක් යවා ඇත. ඔහු මඟින් රදගුරු තුමා මට දන්වා තිබිණි, මාර්තු 4 අඟ බදාදා සවස 4ට අගරදගුරු නිවෙසට පැමිණ එතුමා හමු වන ලෙස.

මා රදගුරු තුමා හමු වීමට යන්නට පෙර ඔස්කා පිය තුමාට එය දැන්වීමි. මගේ අත්දැකීම දෙවිඳුන්ගෙන් නම් රදගුරු තුමාට වත් එය හඳුනා ගන්නට ලැබෙන ලෙස මා වෙනුවෙන් යාච්ඤා කරන්නැ යි මම පිය තුමාගෙන් ඉල්ලා සිටියෙමි. ''මේ යුගයේ ගැටළුවලට පිළිතුර විශාල ආධ්‍යාත්මික ප්‍රබෝධයක් පමණ යි. පුබුදුවෙන් නෙරපුණු අය තුළ වත් නැද්ද, එකට එකතු කර ගන්න පුළුවන් ආධ්‍යාත්මිකත්වයක්.'' රදගුරු තුමා එලෙස මගෙන් විමසීය. ''එහෙම දෙයක් කරන්න පුළුවන් වෙයි. එහෙත් ඊට පෙර ඔබ තුමන් විසින් විසඳිය යුතු ගැටළුවක් තිබෙනවා. ඔස්කා පිය තුමා කියන්නේ මගේ අත්දැකීම කතෝලික දර්ශනයට පටහැනි බව යි. එහෙම නම් මට සම්බන්ධ අනෙක් අයගේ අත්දැකීමත් කතෝලික දර්ශනයට පටහැනි වෙන්න ඕනෑ.'' මම එලෙස පිළිතුරු දුනිමි. ''මා සමඟ කිව යුතු යි කියල ඔබට හැඟෙන ඕනෑ ම දෙයක් කියන්න.'' රදගුරු තුමා පැවසීය. දෙවිඳුන් මෙහෙය වන අයුරින් මම පැයක් පමණ කතා කළෙමි. එතුමා ඉතා හොඳින් සවන් දී සිටියේය.

අප අතර සිදු වෙමින් පැවති එම සිද්ධිය නොදැන තවත් දෙ දෙනෙක් මාර්තු 6 සහ 8 දෙ දින තුළ මට ලිපි මඟින් දන්වා එවා තිබිණි. ''බලා සිටියා දැන් ඇති, අපි එක් ව යමක් මුල පුරමු'' යන අදහස. එක ම අදහස තුන් පැත්තකින් එක්වර දියත් වෙද්දී එය මහෝත්තමයාණන්ගේ සැලැස්ම බව මට අවබෝධ විය. ඒ නිසා මාර්තු 18 වන දින පුංචි සංඝයක් ලෙස අපි දහ දෙනෙක් එක් වීමු. ඒ සඳහා මා ඇරයුම් කළේ පුබුදුවෙන් ආධ්‍යාත්මික පෝෂණය ලැබූ දැනට පුබුදුවට සහභාගි නො වන එහෙත් ඔස්කා පිය තුමා තම ආධ්‍යාත්මික ගුරුවරයකු මෙන් ගෞරවයෙන් සලකන පිරිසකි. 1992 මාර්තු 27 වන දින අගරදගුරු නිවසේ දී ඇන්තනි මේරි සොයුරියට අති ගරු මැල්කම් රංජිත් රදගුරු තුමා හමු වී ඇත. රදගුරු තුමා මෙ ලෙස පැවසූ බව ඇයගෙන් දැන ගතිමි. ''ඇන්තනිගේ අත්දැකීම කතෝලික දර්ශනයට පටහැනි නෑ කියල ඔහුට කියන්න. කෙනෙක් ජේසු පෙන්වන මාවතේ ම ගමන් කළොත් ජේසුට ලැබුණු චෝදනා දෙක ඔහුටත් ලැබෙන්න ඕනෑ, ඒ උන්මත්තකයකු බවත් යක්ෂාවේශ ව සිටින බවත්, ඇන්තනිටත් ඒ චෝදනා දෙක පුබුදුවෙන් ම ලැබී තිබෙනවා. ඔහුට කියන්න, වෙනත් නමක් දාලා යමක් පටන් ගන්න කියලා, දර්ශනය ලියල එවන්න කියල.''

1992 අප්‍රේල් 5 වන දින සංඝයක් ලෙස අප නැවත එක් වූ මොහොතේ මම යෝජනා කළෙමි, 'දහම් නවෝදය' අප සංඝයට සුදුසු නාමය ලෙස. ඛලිල් ජිබ්රාන් ආගම් සියල්ල ම දකින්නේ ධර්ම නමැති වෘක්ෂයේ අතු පතර හැටියට යි. අප සංඝයට නම යෙදීමේ දී මට අවශ්‍ය වුයේ ගසේ අත්තකට සම්බන්ධ කරනවාට වඩා කඳට සම්බන්ධ කරන්නට යි. ඒ සඳහා හේතු වූ සිද්ධියක් ඇත. 1988 අගෝස්තු 9 වන දින කුරණ, කැමිලස් පැමිණ “ඇන්තනි අයියේ, අපි දෙන්නා හෙට මහනුවර යමු ද?” යි විමසීය. ඔහු මා ළඟින් ඇසුරු කරන්නකු ද නො වේ. ඒ මොහොතේ කිසි ම මඟ සලකුණක් නොපෙනෙන වියළි තත්ත්වයක මා සිටි නිසා ඔහුගේ මේ යෝජනාව තුළ යමක් තිබෙන්නට පුළුවනැ යි මට සිතිණි. පසු දින ඔහු මා කැඳවාගෙන ගියේ මහනුවර, නිලම්බේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානයට යි. මගේ යාච්ඤාවේ දී සම්ප්‍රදායික භාවනා ක්‍රමවල ආහාෂය මම නො ලැබීමි. එහි ආහාෂය ලබන තරමට කිතුනු යැදුමේ අනන්‍යතාවය කෙළෙසන බව මම දකිමි. මහත්මා ගාන්ධි තුමා තුළින් නියම කිතුනු යැදුමේ එක් ප්‍රබල ලක්ෂණයක් මම දකිමි. මැවුම්කරුවාණන් වන එක ම දෙවිමහෝත්මයාණන් තම කුඹල්කරුවාණන් මෙන් පිළිගෙන එතුමන් සුරතේ මැටි පිඬක් මෙන් සිටිමින් එතුමන් රිසි ලෙස තමන් අඹන්නට ඉඩ දීමකි, එතුමාගේ යාච්ඤාව. එහි දී “හදවතක් නැති ව වචන ගොඩකට වඩා වචන කිසිවක් නැති ව හදවතක් වැදගත් යැ”යි එතුමෝ පැවසුහ. නිලම්බේ දී ද මා කළේ එවැනි යැදුමකි.

ඔවුන්ගේ දවසේ කාල සටහනේ අවසන් පියවර වුයේ එතැනට පැමිණ සිටින අය හා එක් ව ආධ්‍යාත්මිකත්වය ගැන සංවාදයක යෙදීම යි. එදින එහි පැමිණ සිටියේ අප දෙදෙනා පමණි. මැදියම් රැ වන තුරු ම සංවාදය සිදු විය. සංවාදය අවසන් කරමින් මූලිකත්වය ගත් සොයුරා (මා නම ඇසූ නිසයි කීවේ, කරුණාරත්න කියල) මගෙන් ඉල්ලීමක් කළේය. “ඔබ එක ආගමක් ගැන දේශනා කරනවාට වඩා ආධ්‍යාත්මිකත්වය ගැන කතා කරන්න. එවිට ඔබට පුළුවනි, මේ රටේ ආගම් හතර ම අමතන්නට.” එහි සත්‍යයක් ඇතැ යි මට ද වැටහිණ. ඉන් පසු විදුහලකට දේශනයක් සඳහා ඇරයුම් ලැබූ විට මා වඩාත් රිසි වුයේ සියලු ආගම්වල සිසුන්ට එක වර එක ම දේශනයකින් අමතන්නට ය.

1992 අප්‍රේල් 5න් පසු 'දහම් නවෝදයේ දැක්ම' සැකසීම සඳහා මම කාලය වැය කළෙමි. මැයි 25 වන දින මිහින්තලේ කණ්ඨකචේතිය පඩි පෙළ මත වාඩි වී අප සංඝයේ කීප දෙනකු ඉදිරියේ එය කියවීමි. (දේශීය ආධ්‍යාත්මිකත්වයේ නිකේතනයන්ට මා මහත් සේ ගරු කරන නිස යි, එය කියවීම සඳහා එතැනට ගියේ.) ජේසු සමිඳුන් අප තබන තැන සිටීමත් එතුමන් අපට කියන දේ නිසි මොහොතේ ඉටු කිරීමත් දහම් නවෝදය දැක්මේ එක් විශේෂ ලක්ෂණයකි. ඒ අනුව බලන විට ජේසු සමිඳුන් එක ම තැන අප ව වසර කීපයක් තැබුවත් අපි එතැන සිටිය යුතු වෙමු. මම ඔවුන්ට මෙය ද සිහිපත් කළෙමි. ජේසු සමිඳුන් පැවසුවාක් මෙන් යම් මොහොතක් උදා වන බව මහ මඟ හමු වන අයට සුබ පතන්නට පවා නවතින්නට අපට විරාමයක් නොලැබෙන. එලියා දිවැසිවරයා දවන පූජාවට අහසින් ගිනි ලබන්නට ජලය ම යෙදුවාක් මෙන් අපිදු දිගට ම ක්‍රියා කරන බව අපගේ දැක්මේ සඳහන් තවත් විශේෂ ලක්ෂණයකි. එදා ලියූ දැක්මේ සඳහන් සමහර අදහස් අද වන විට පැරණි වී ඇතැ යි මට සිතේ.

ජූලි 5 වන දින අපගේ එකතුවේ දී මම මෙ ලෙස පැවසීමි. “තව සති දෙකකින් ඔබ ආපසු මෙහි එන විට තීරණයක් ගෙන පැමිණෙන්න, ඔබ සූදානම් ද දහම් නවෝදය සංඝය තුළ ඉදිරියට ගමන් කරන්නට?” **1992 ජූලි 19 වන දින** සංඝය එක් වූ මොහොතේ මම පළමුවෙන් ඒ ප්‍රශ්නය විචාළෙමි. සියල්ලෝ ඒකමතික ව සිය කැමැත්ත ප්‍රකාශ කළහ. එවිට මම මහා හඬින් මෙසේ පැවසීමි. එසේ නම් අපි අද 'දහම් නවෝදය' සංඝය නිල වශයෙන් මුල පුරනවා. මහා හඬින් එය කියන්නට සිදු වුයේ ක්ෂණික මහා කුණාටුවක් හා වැස්සක් තුළ ඒ හඬ කපාගෙන කතා කරන්නට මට සිදු වූ බැවිනි. (1981 ජුනි 6 ශුද්ධාත්ම මංගල උළෙලේ දේශනය මැද මා වැටුණු මොහොතේ සිට මා සම්බන්ධ, සංඝය සම්බන්ධ වැදගත් සිදු වීම් මහෝත්තමයාණන්ගේ හස්තය විසින් බව තහවුරු කරන්නේ එදා එහි පැවති කුණාටුව හා වැස්ස ක්ෂණික ව එවීමෙනි. එය මට උතුම් සංකේතයකි.)

ජූලි 19 වන දින ඒ සංකේතයෙන් මහෝත්තමයාණන් ම සාක්ෂි නොදැරී නම් මා මෝඩකමක් කළා දැයි සිතා කඩා වැටෙන්නට සිදු වන අවස්ථා එළඹිණි. එදින 'දහම් නවෝදය' නිල වශයෙන් මුල පුරමින් පහත සඳහන් කරුණු තුන මම සංඝය හමුවේ තැබීමි. 1. මා සමග යන්නට සිදු වන ගමන කොහෙත් ම පහසු නො වනු ඇත. එනිසා අද මෙ තැන සිටින අයගෙන් කී දෙනෙක් ගමන නිම වන විට මා හා සිටී දැයි මම නො දනිමි. 2. යම් මොහොතක මට හැඟුණොත් මා වැරදි බව ඔබ සියලු දෙනා විරුද්ධ වුණත් මම ඔස්කා පිය තුමාගෙන් සමාව ඉල්ලමි. 3. යම් මොහොතක ඔබට හැඟේ නම් මට පිස්සු හැදිලා කියල මගෙන් වෙන් ව යාමට ඔබට අවසර ඇත, අපගේ හිතවත්කම රැක ගෙන. (දහම් නවෝදයේ දැක්ම අතිගරු අගරදගුරු

තුමා වෙත යැවූ පසු අගෝස්තු දෙ වන දින පදවි පරිපාලක ලේකම් පිය තුමා මෙසේ සුබ පතා තිබිණි. "ඔබගේ කාර්යයන් නිසියාකාර ව කර ගැනිමට දෙවි ආසිරි පතමි.")

'දහම් නවෝදය' සංඝය හා සභාව අතර සම්බන්ධිකරණ පිය තුමකු තෝරා ගන්නා ලෙස අති ගරු මැල්කම් රංජිත් රදගුරු තුමා අපට පැවසීය. 1993 ජුනි 29 වන දින අපි ඒ සඳහා ගරු බෙනඩික් සිල්වා පිය තුමා තෝරා ගතිමු. මාස දෙකකට වරක් පිය තුමා අපගේ එකතුවට පැමිණ දිව්‍ය පූජාව පවත්වමින් අප දිරි ගැන්විය. මාසයකට වරක් හෝ මම එතුමා හමු වී බොහෝ දේ කතා කළෙමි. එහි දි එතුමාගෙන් ගලා ආ අදහස් එතුමාගේ ව්‍යවහාර ඥානයට වඩා ශුද්ධාත්මයාණන් එතුමා තුළින් මට කතා කිරීමක් යැයි මට හැඟේ. මේ ඊට නිදසුනකි. "දෙවිඳුන් තම සභාව උසස් කරන්නේ පහළ ම තලයේ එතුමන් විසින් කරමින් සිටින දෙයක් කෙමෙන් ඉහළට එසවීමෙනි. දෙවිඳුන් තම සභාව උසස් කරන්නේ ලොකු ජන රැල්ලකින් නො ව දෙවිඳුන්ට අවනත වන පුංචි සංඝයක් තුළිනු යි." (පිය තුමා එසේ කියද්දී දහම් නවෝදය සංඝය මීට වඩා සකසා ගත යුතු නො වේ දැයි මට සිතිණි. එවිට පිය තුමා මෙසේ පැවසීය.) "මේ සියල්ල සිදු වන්නේ එක් කෙනෙක්ගේ අත්දැකීම නිසා, ගමන් මඟ නිසා වන්න පුළුවන්. ඇන්තනි සංඝය හදන්න දැනට වඩාත් වෙහෙසෙන්න එපා."

1994 ජුනි 1 වන විට ඔස්කා පිය තුමාට ලිපියක් යැවිය යුතු යැයි මා තුළ මෙහෙය වීමක් විය. ඒ සඳහා පහත සඳහන් අදහස ද බලපෑවේය. "පරස්පර විරෝධී අදහසක් සේ පෙනුනත් පුද්ගලයකු තුළ සම්පූර්ණත්වය ඇති වන්නේ ඔහු තව කෙනෙක් තුළ තමකම නැති කර ගැනීමෙනි." (ෂාර්ඩෑං) ඒ සඳහා ඊටත් වඩා මට බලපෑවේ ඒ මොහොතේ මැල්කම් රංජිත් රදගුරු තුමා මට පැවසූ දෙය යි. "මා තවමත් කැමති යි ඔස්කා පිය තුමා හා ඇන්තනි පුබුදුව තුළ එක් ව යනවා දකින්නට." අප නැවත එක් වීම නම් දේව සැලැස්ම, මා යවන්නට අදහස් කළ ලිපිය ඉතා පහසුවෙන් එයට අවස්ථාව ලබා දීමකි. ඒ ලිපියේ අඩංගු මූලික අදහස මෙය යි. "ඔබ තුමන් ඔබගේ ශ්‍රේෂ්ඨයාට කීකරු වන්නට සූදානම් නම් මම සූදානම් ඔබට කීකරු වන්නට. ඔබ තුමන් දිගට ම ඒ තත්ත්වය තුළ පවතින්නට සූදානම් නම් මමත් සූදානම් ඒ තත්ත්වය තුළ දිගට ම පවතින්නට." අප සංඝයේ වැඩි ම දෙනා මා මෙ වැනි ලිපියක් යැවීමට අදහස් කිරීම ගැන සිය විරෝධය ප්‍රකාශ කළහ. සංඝයේ වැඩි ම දෙනා ද විරුද්ධ නිසා මම මේ ගැන විමසන්නට බෙනඩික් සිල්වා පිය තුමා හමු වන්නට ගියෙමි. එහෙත් එතුමා හමු නො වීය. මම ජුනි 10 වන දින ඔස්කා පිය තුමා වෙත ලිපිය යැවීමි. ඒ ලිපිය ලැබුණු බව දන්වා එවීමක් පවා සිදු නො විය. මේ සිද්ධියෙන් පසු සමහරු මාස ගණනාවක් සංඝයේ එකතුවට සහභාගි නො වූහ.

1994 දෙසැම්බර් 3 ධර්ම දාන සමුළුව සඳහා සූදානම් වීමේ දේශනයකට සහභාගි වන ලෙස මැල්කම් රංජිත් රදගුරු තුමාගෙන් මට ද ඇරයුමක් ලැබිණි. එය "සංවාදශීලි සසුන් නවෝදයක් කරා" තේමාව ඔස්සේ ගරු ලියෝපෝල්ඩ් රත්නසේකර පිය තුමා පැවැත් වූ දේශනයකි. 1962 දී 6 වන පාවුලු පාප් තුමා ධර්මදානය ගැන පළ කළ අදහසක් එම දේශනයේ පදනම විය. සැබෑ ධර්මදානය නම් ක්‍රිස්තුස් වහන්සේ හා තමා අතර ඇති සංවාදය තුළින් රැස්කර ගන්නා ප්‍රඥාව තමා හා සභාව තුළ සංවාදයක්, තමා හා විවිධ කිතුනු නිකායන් අතර සංවාදයක්, තමා හා කිතුනු නො වන අනෙක් ආගම් හා සංවාදයක්, තමා හා ලෝකය (මැමෝනාට යට වූ) අතර සංවාදයක් දක්වා පුළුල් වීම යි. සැබවින් ම මට කරන්නට සිදු වන දූත මෙහෙය එවැන්නක් නො වේ දැයි මට හැඟිණි. එදා එකිනෙකාට අදහස් ප්‍රකාශ කරන්නට ලැබුණු මොහොතේ දී මම මෙ ලෙස පැවසීමි. සභාවේ දූත මෙහෙය වනුයේ ජීවමාන ජේසු සමිඳුන් හා සංවාදයක් ඇති ව ජීවත් වන ජනතාවක් ගොඩ නගන්නට අත දීම යි. එවිට ඉහත විස්තර කළ අනෙක් කරුණු නිරායාසයෙන් සිදු වනු ඇත.

1995 ජූලි 20 වන දින හදිසි කුණාටුවක් හා වැස්සක් මැද ගරු සුනන්ද වනසිංහ පිය තුමා පළමු වරට අප නිවෙසට පැමිණියේය. ඒ පැමිණීමේ අරමුණ වූයේ එතුමාගේ මීසමේ (සීදුව) යැදුම් එකතුවක් අරඹන ලෙස මගෙන් ඉල්ලා සිටීම යි. අපි සංඝයක් ලෙස ඊට මාසයකට පමණ පෙර කුඩා යැදුම් එකතු තුනක් ආරම්භ කළෙමු. පිය තුමා ඒ කිසිවක් නො දැන එම යැදුම් එකතු තුළින් අප බලාපොරොත්තු වූ අරමුණු තුන ම පිය තුමාගේ මුවින් නික්මෙන විට මම මවිත වීමි. එය මට තහවුරු කළේ සුනන්ද පිය තුමා හා මා හමු වීමේ යම් දේව සැලැස්මක් ඇති බව යි. මම මේ හමු වීම ගැන බෙනඩික් සිල්වා පියතුමාට කීවෙමි. එය මා පෞද්ගලික ව එතුමා හමු වූ අවසන් අවස්ථාව යි. එතුමා මට දුන් අවසන් අනුශාසනය මෙය යි. "මැමෝනා හෙවත් ධනය, බලය, ජනප්‍රියත්වය නමැති පරීක්ෂා තුනට ජේසු සමිඳුන් මොහොතක් හෝ යට වුනේ නැහැ. සභාව ඒ පරීක්ෂා තුනට යට වුණා. හැම ආගමක් ම ඒ පරීක්ෂා තුනට යට වෙලා. කලින් කලට එන පිබිදීම් පවා ඒ පරීක්ෂා තුනට යට වුණා. ඇන්තනි, දිගට ම දෙවිඳුන්ගේ අතේ මෙවලමක් වීමට නම් ධනයෙන් නො ව දුගී බවෙන්, බලයෙන් නො ව දුබලකමින්, ජනප්‍රියත්වයෙන් නො ව

මිනිසුන්ගෙන් ලැබෙන නින්දා අපහාසවලින් සන්නද්ධ වන්න." 1995 සැප්තැම්බර් 18 වන දින බෙනඩික් සිල්වා පිය තුමා වයස අවුරුදු 42දී සදහට ම අපගෙන් සමු ගත්තේය.

බෙනඩික් සිල්වා පිය තුමාගේ මරණයට පසු දින සීදුව යැදුම් එකතුවේ දී මට සුනන්ද පිය තුමා හමු විය. එතුමා එහි දී කී දෙයින් මම මවිත වීමි. සැප්තැම්බර් 11 වන දින අගරදගුරු නිවසේ දී සුනන්ද පිය තුමා හමු වූ විට බෙනඩික් සිල්වා පිය තුමා මෙසේ පවසා ඇත. "ඇන්තනි ව හමු වන්න ගියාට සතුටු යි. ඔබට හමු වෙලා තියෙන්නේ නියම කට්ටිය. ඔවුන් හා එක් වීමෙන් ඔබටත් කරදරවලට මුහුණ දෙන්නට සිදු වෙයි. ඒත් භය වෙන්න එපා." බෙනඩික් සිල්වා පිය තුමා දහම් නවෝදයේ සම්බන්ධීකරණ කාර්යය සුනන්ද පිය තුමාට පවරලා නේද මිය ගියේ කියලා මට හැඟිනි. ඒ සත්‍යය මත සුනන්ද පිය තුමා අපගේ සම්බන්ධීකරණ පිය තුමා වන්නට එකඟ විය.

සීදුවේ මුල පිරූ යැදුම් එකතුව ගැන මා වචනයක් කිව යුතුය. පළමු දිනයේ පල්ලිය පිරෙන්නට තරම් සෙනඟ පැමිණ සිටියහ. කෙමෙන් පැමිණීම අඩු වෙමින් මාස හතරකට පමණ පසු අම්මලා 15ක් දෙනෙක් පැමිණ සිටියහ. මම ඔවුන්ට මෙසේ පැවසීමි. "ඇයි මේ සතිපතා මෙ තැනට එන්නේ? පුරුෂයා සහ දරුවන් සමග ඉඳලා නම් ගැළවීමක් ලබන්ඩ බැහැ කියල හිතෙනව ද? පුරුෂයාට, දරුවන්ට ආහාර සකස් කරලා ඔබේ දවසේ වගකීම් ඉටු කරල ද මෙහි ආවේ? එසේ නො වේ නම් ඔබගේ මේ පැමිණීම පාපයක්. පුරුෂයා හා දරුවන් සමග සුහද ව ජීවත් වෙමින් ඔවුන්ගෙන් ලැබෙන සිත් වේදනා ඔවුන්ගේ ගැළවීම වෙනුවෙන් දෙවිඳුන්ට පුදන්න. ඒකයි, පවුල තුළ ඔබේ දූත මෙහෙය." ඊ ළඟ සතියේ මම යැදුම් එකතුවට ගියෙමි. එක් කෙනකු හෝ පැමිණ නැත. මම සුනන්ද පිය තුමාට මෙසේ කීවෙමි. "ඔබ දක්ෂ යි සෙනඟ වැඩි කරන්න, මම දක්ෂ යි සෙනඟ අඩු කරන්න."

1996 මැයි 25 වන දින රාත්‍රියේ ශුද්ධාත්ම මංගල යැදුම සඳහා දහම් නවෝදයේ සංඝයේ සියල්ලෝ එක්රැස් වූහ. එදින අපගේ තේමාව වූයේ මෙය යි. **"පියාණෙනි, දැන් පැය පැමිණ තිබේ. පුත්‍රයාණන් විසින් ඔබ මහිමයට පමුණුවනු ලබන පිණිස ඔබ ද පුත්‍රයාණන් මහිමයට පැමිණෙව්ව මැනව." (ජුවාම් 17:1)** එහි දී මා වෙනුවෙන් යාච්ඤා කරන්නැ යි පවසමින් මම දණ ගැසුවෙමි. සංඝයේ සියල්ලෝ මා හිස මත අත තබා යාච්ඤා කළහ.

එයින් දෙ දිනකට පසු (මැයි 27) සුනන්ද පිය තුමා මා හමුවන්නට පැමිණියේය. "මැයි 31 සිකුරාදා කොළඹ පදවියේ දහම් පාසල් ගුරුවරුන් සඳහා තේවත්ත බැසිලිකාවේ දී සර්ව රාත්‍රි යාච්ඤා මෙහෙයක් යොදා ගෙන තිබෙනවා. ඇන්තනිත් එදාට එන්න." මම ඒ ඇරැයුම භාර ගතිමි. එයින් දෙ දිනකට පසු (මැයි 29) සුනන්ද පිය තුමා නැවත ද අප නිවසට පැමිණියේය. මහත් කලබලකාරී බවක් එතුමා තුළ දිස් විය. පිය තුමා මෙසේ පැවසීය. "මම හුඟක් මෙනෙහි කරල යි, මේක කියන්නේ. මම සර්ව රාත්‍රි මෙහෙයට එන්නේ නැහැ. ඇන්තනි එදාට යමක් කරන්න. දෙවියන් වහන්සේ මොකක්දෝ කරන්න යනවා." මම මෙසේ ඇසුවෙමි. "ඔබගේ මූලිකත්වයෙන් සර්ව රාත්‍රි යැදුම් මෙහෙයක් පැවැත් වෙන බව ප්‍රචාරය කරලා ඔබ නොආවොත් හරි ද?" කවුරු බැන්නත් මම එන්නේ නැහැ" පිය තුමා තරයේ ම පැවසීය. "ඔබ ගියා නම් දෙන්නට අදහස් කළ පණිවුඩය කුමක් දැ යි" මම ඇසුවෙමි. "රට වසා ගෙන තිබෙන අඳුරත් නියඟයත් රට වසා ගෙන තිබෙන ආධ්‍යාත්මික අඳුරක හා ආධ්‍යාත්මික නියඟයක සංකේතයක් ලෙසට යි" එතුමා එලෙස පිළිතුරු දුන්නේය. "එසේ නම් ටෙරන්ස් පිය තුමාට කියන්න, ඒ ගැන මුලින් කතා කරන්න කියලා. මා කතා කරන්නම්, කිතුනු ජනතාව අඳුරට යට විය යුතු සෙනඟක් නො ව ආලෝකයේ ජනතාවක් විය යුතු බව." මම එලෙස පැවසීමි. "එදාට පැය දෙකකට වත් කලින් එහි ගොස් ටෙරන්ස් පිය තුමා හා ටෙරන්ස් සහෝදර තුමා සමග එක් ව යාච්ඤා කර සූදානම් වන්නැ"යි පිය තුමා මට පැවසීය.

1996 මැයි 31 සිකුරාදා යැදුම් මෙහෙය ඇරඹීමට පැය තුනකට පෙර මම එහි ගියෙමි. අනෙක් දෙදෙනා එහි පැමිණියේ එය ඇරඹීමට නියමිත මොහොතේ ය. එනිසා සුනන්ද පිය තුමා මා මත තැබූ බර තවත් වැඩි වී මට දැනිණ. අති ගරු නිකලස් මාකස් අගරදගුරු තුමා ද අනුනායක පිය තුමන්ලා ද එහි පැමිණ සිටියහ. පළමු වරට මගේ දේශනයක් අසන්නට අගරදගුරු තුමාට සිදු විය. දේශනය සඳහා මම නැගිට සිටියෙමි. දෙ පයින් සිට ගන්නට මට ඇති ශක්තිය මගෙන් ඉවතට ගෙන ඇතිවාක් මෙනි. වාක්‍යයකට වාක්‍යයක් ගළපන්නට මට ඇති හැකියාව සමිඳුන් අතට ගෙන ඇතැ යි මට සිතිණි. එය මා යටපත් කර සමිඳුන් විසින් මා මෙහෙය වීම පිළිබඳ උපරිම අවස්ථාවකි. මම මට ඇවැසි ලෙස කතා කළෙම් නම්, එදින මා මුවින් නික්මුණ සමහර අදහස් නොකියවෙන්නට ඉඩ තිබිණි.

**"මම කාන්තාරයේ දිය උල්පතක් මවන්නෙමි. එවිට එය ස්වාමින් වහන්සේ වන මා විසින් කළ බව සියල්ලෝ දැන ගන්නෝය."** යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් එම වැකිය යි, එදින මගේ දේශනයට පදනම වූයේ. දෙවිඳුන් දිය උල්පත මවන්නේ කාන්තාරයේ යි. එනිසා සියල්ල අද කාන්තාරයක් වෙමින් තිබීම විස්වාසාලෝකයෙන් බලන විට කළකිරීමට නො ව ප්‍රීතියට හේතුවකි. අද අපේ රට කාන්තාරයක් වෙමින් ඇත. කතෝලික සභාව, අනෙකුත් ආගම් පවා කාන්තාරයක් වෙමින් ඇත. මේ මොහොත වන විට ශ්‍රී ලංකාව වැඩියෙන් ම ලේ කඳුළු ගලා යන දේශය බවට පත් ව ඇත. එය සළකුණක් නො වේද, දෙවිඳුන් ඒ දිය උල්පත මේ දේශයෙන් ම මතු කරන බවට. එවිට දැහැමි යුගයක උදාව සිදු වනු ඇත. එදා මගේ දේශනයේ ඒ අදහස් අන්තර්ගත විය.

දේශනයෙන් පසු විවේක කාලයක් ලැබිණි. අගරදගුරු තුමා මා දෙසට එනු පෙනිණි. මම ද ඒ දෙසට පියවර කිපයක් තැබීමි. බැසිලිකාවේ මහා කුරුසිය යට දී අපි හමු වූයෙමු. එතුමා මෙ ලෙස පැවසීය, මෙ ලෙස මා විමසීය. "ඇන්තනි කියන්නේ කවුද කියලා මම හිතමින් උන්නේ. මා හිතුවා හරි. ඇන්තනි, ඔබට ළං වන සෙනඟ ඔබට කොටු කර ගෙන ඔවුන් ව සභාවෙන් ඈත් කරනවා ද?" මම මෙ ලෙස පැවසීමි. "පියාණෙනි, අපි සංවිධාන හදන්නේ නැහැ. අපි කාට හෝ දහම දුන්නොත් ඔවුන් ව කොටු කර ගන්නේ නැහැ. ඔවුන් ව නිදහස් කරනවා, අන් අය වෙත දහම ගෙන යන්නට."

එදින සම්බන්ධයෙන් සුනන්ද පිය තුමා දුටු සිහිනය මෙය දැයි මම නො දනිමි. ඉන් පසු හමු වූ කිසිම අවස්ථාවක පිය තුමා ඒ දිනය ගැන කතා නොකළ බැවිනි. දහම් නවෝදයේ සම්බන්ධිකරණ පිය තුමා ලෙස එතුමන්ට ලැබුණු කාලය දෙස ආපසු හැරී බලන විට ඉතා කෙටියෙන් මට කියන්නට ඇත්තේ මෙය යි. එතුමා අප හා එක් වීම නිසා කරදර නින්දා අපහාසවලට මුහුණ දීමට කොහෙත් ම රිසි නො වීය, මා ඇරැයුම් කළත් එතුමා අපගේ එකතුවකට කවදා වත් සහභාගි නො වීය, මා ඇරැයුම් කළත් සංඝය හා එක් ව එතුමා කවදා වත් දිව්‍ය පූජාව නො පැවැත් විය. එතුමාගෙන් සංඝයට ලැබුණු කිසිදු වටිනා අදහසක් ද නැත. එහෙත් සුනන්ද පිය තුමා උපයෝගි කර ගනිමින් සමිඳුන් අප සංඝය උදෙසා කළ ඉතා වැදගත් කාර්යයක් ඇත.

සුනන්ද පිය තුමා නිසා 1988 ජුනි 27 අප විසින් ප්‍රකාශ කළ අපගේ හඬ පටියට නැවත පණ ලැබුණාක් මෙන් විය. "කිසිම හඬ පටියක් වරකට දෙ වරකට වඩා අහල නැහැ. මේ හඬ පටිය මා දැන් විසි වරකටත් වැඩියෙන් ඇසුවා. ඒත් ඒ තුළ තව තවත් අනාවරණ තිබෙනවා." පිය තුමා මා සමග එසේ පැවසීය. අපගේ 'පල දරන ජීවිතයක් සඳහා' පොත ද එතුමාගේ ඇගැයීමට ලක් විය. "ඇන්තනි ඔබ දැල්වෙන පහනක්. ඒක පෙට්ටියකින් මෙහෙම වහල තියෙන එක පාපයක්. ඒක පහන් රුකක් මත තැබිය යුතුයි." එතුමා එය මා හා දෙ වරක් කියා ඇත. එවිට මම  මෙ ලෙස කීවෙමි. "මා පහනක් ද කියල දන්නේ ජේසු යි. එය දැල්විය යුත්තෙත් ජේසු යි. දැල් වූ විට එය පහන් රුකක් මත තැබිය යුත්තෙත් ජේසු යි. අපි ඕවා කරන්න ගිහිල්ලා පහන බිඳ ගන්නත් ඉඩ තිබෙනවා." 1996 මැයි 31 සර්ව රාත්‍රි මෙහෙය පිළිබඳව දෙවි සමිඳුන් සුනන්ද  පිය තුමා ව එලෙස මෙහෙය වූයේ එතුමා තුළ මා පිළිබඳ ව පැවති ඒ අවංක ඕනෑකම නිසා යැයි මට හැඟේ.

මා සමිඳුන් සුරතේ සියලු කැඩීම් හා ඇඹීම්වලට නතු වූයේ එතුමන්ගේ මෙහෙය වීමට මෙතෙක් ද අවනත වූයේ මගේ පෞද්ගලික විමුක්තිය සඳහා නො වේ, මගේ ආත්ම තෘප්තිය සඳහා ද නො වේ, මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා ය. ඒ සඳහා ජේසු සමිඳුන්ගේ දෙ වන පැමිණීම කඩිනම් කරනු සඳහා ය. පූර්ණ අර්බුදයකට මුහුණ දී සිටින මිනිස් සංහතියට සැනසීම උදා වන්නේ ජේසු සමිඳුන්ගේ දෙ වන පැමිණීමෙන් පමණි. සමිඳුන් පෙන්වන මාවතේ පියවරෙන් පියවර පැමිණ එනිසා ලොකු වියවුලක, ලොකු අගාධයක වැටුණොත් ඒ තුළ ද සමිඳාණන් වහන්සේට විශාල සැලැස්මක් ඇති බව තේරුම් ගෙන එතුමන්ට ඇවැසි මොහොතේ එතුමන් විසින් ම මා අගාධයෙන් ඔසවන්නට ඉඩ දී බලා සිටියොත් එතුමන්ට මා වෙනුවෙන් සුළැඟිල්ලක් හෝ සොලවන්නට සිදු වනු ඇත. එයින් ඇරඹෙන ක්‍රියාවලිය තුළින් විශ්වය ම සෙලවෙනු ඇත. මා සමිඳුන් අත ගත් ගමනක් පැමිණියේ ඒ සඳහා ය. ඊට අඩු දෙයක් සඳහා නො වේ. එය මහෝත්තමයාණන් මා තුළ තබා තිබෙන මහා සිහිනය යි. 1996 මැයි 31 දේව අනුග්‍රහය විසින් ඒ සඳහා මුල පිරූ මොහොත බව මම අවබෝධ කර ගතිමි. ඒ මොහොත උදා කිරීම සඳහා දෙවිඳාණෝ සුනන්ද පිය තුමා උපයෝගි කර ගත්හ. (1998 දෙසැම්බර් 26 වන දින හදිසි අනතුරකින්, වයස අවුරුදු 39 දී එතුමා සදහට ම අපගෙන් සමුගත්තේය.)

## 12

# 'දහම් නවෝදය' සංඝයේ ගමන් මඟ උදෙසා ජේසු සමිඳුන් විසින් තෝරා ගත් දාසිය, සුජීවා ජයලත් පෙරේරා.

ඒ 1996 ජුනි 6 වැනි දිනය යි. ප්‍රින්ස් නිහාල් සොයුරා මා හමු වන්නට පැමිණියේය. පුබුදුව තුළ ඔහු ද මම ද දිව්‍ය එඬේරාණන්ගේ සංඝයට අයත් වීමු. ඔහු තෝප්පුව මීසමේ මුරුතාන ගමේ පදිංචි ව සිටි අයෙකි. මා ඔහු දුටුවේ දිගු කලකට පසුව ය. ඊට හේතුව මෙය යි. 1985 දී මා පුබුදුවෙන් ගිලිහී යාම මා සැලකුවේ මා පසු කළ යුතු විප්‍රවාසයේ අත්දැකීමක් ලෙස යි. එ නිසා ඒ දිගු කාලය තුළ පුබුදුවට අයත් ව සිටින කිසිවකු හෝ හමු වන්නට මම නොගියෙමි. ඒ කෙනෙකු මා හමුවන්නට අප නිවසට පැමිණියොත් හෝ මඟ-තොට දී හමු වුණොත් මිස මට බොහෝ අය හමු නොවුහ. ප්‍රින්ස් නිහාල්ගේ වැඩුමහල් සොයුරාගේ දියණිය එදින වන විට හය වන දිනටත් මුළුමනින් ම නිරාහාරයෙන් සිටින බවත් ඇය මිය යාවි දැයි බියක් ඔවුන්ට ඇති බවත් එනිසා උයා ගන්නා දෙයක් කන්නට පවුලේ අයට අපහසු වී ඇති බවත් පැවසූ ඔහු එනිසා එම නිවසට පැමිණ මෙය දෙවියන්ගේ දෙයක් ද නපුරාගේ දෙයක් ද මනුෂ්‍ය දෙයක් දැයි වටහා ගන්නට උදව් වන ලෙස මගෙන් අයැදිය. ඒ පිළිබඳ පසුබිම් විස්තරයක් කෙටියෙන් හෝ මට පවසන ලෙස මම ඉල්ලා සිටියෙමි. ඔහු පැවසූ සියල්ල මම නැවත මෙ ලෙස මතකයට නගමි. පසු ව ඇයගෙන් අසා දැනගත් තොරතුරු ද මම මෙහි ඇතුළත් කරමි.

සුජීවා ජයලත් වන ඇය ඒ වන විට විසි හත් හැවිරිදි තරුණියකි. පවුලේ වැඩුමලා වන ඇයට මල්ලිලා දෙ දෙනෙක් සිටිති. ළමා වියේ සිට ම රාත්‍රි කාලයේ ඇස් පෙනීමේ දැඩි ඌණතාවයකින් ඇය පෙළී ඇත. කොතෙක් වෛද්‍ය ප්‍රතිකාර කළත් ඇයට සුවයක් ලැබී නැත. මේ රෝගී තත්ත්වය ඇය ව වඩාත් යැදුමෙන් දෙවියන් වෙත සමීප කරන්නට හේතු වී ඇත. නිවසේ අග-හිඟකම් දකින විට රැකියාවක් කිරීමේ අවශ්‍යතාවය ඇයට දැනී ඇත. එනිසා රාත්‍රි කාලයේ පෙනීම ලැබීම සඳහා ඇය දිගට ම වෛද්‍ය ප්‍රතිකාර ලබා ඇත. "ඔබ අදහන දෙවියන් විසින් සුව කළොත් හැර මෙය සුව කළ නො හැකි යැ"යි වෛද්‍යවරයා අවසානයේ ඇයට පවසා ඇත.

එය ගරු සුනන්ද වනසිංහ පියතුමා විසින් දුව දේවස්ථානයේ සතිපතා සුව මෙහෙය පැවැත් වූ කාලය යි. සති නවයක් නොකඩවා සුව මෙහෙයට ගොස් යාච්ඤා කරමු යැයි ඇගේ නැන්දා (ටෙක්ලා) ඇයට යෝජනා කර ඇත. එම සුව මෙහෙයේ දී (ඇය එයට සහභාගි වූ තෙ වන අවස්ථාවේ දී) "සියල්ලන් ජේසුට අඬ ගසන්න, ජේසුස් යන නාමය මහ හඬින් උච්චාරණය කරන්නැ"යි පියතුමා පූජාසනය අබියස සිට පවසන විට මුළු ජනතාව සමග එක් ව ඇය ද තම දෙ අත් තම දෑස් මත තබා "ජේසු, ජේසු" යනුවෙන් මොරගසා ඇත. එවිට තද ආලෝක ධාරාවක් ඇයගේ දෑස් මත පතිත වනු ඇයට දැනී ඇත. එවිට ඇය ක්ලාන්ත ගතියෙන් බිම වැතිරුණාය. ඒ සමග එතෙක් අත්නොදුටු සුවඳක් ඇය වටා දැවටී ඇත. ඒ සුවඳ ඇය නිවසට පැමිණ පැය කීපයක් යන තුරු ද පැවති බව ඔවුන්ගෙන් දැන ගතිමි. ඒ සුවඳ ජේසුගේ සුවඳ යනුවෙන් හඳුන්වන්නට ඇය හුරු වූවාය. මෙය සිදු වූයේ 1991 අගෝස්තු මාසයේ දී ය.

ඉහත විස්තර කළ සිද්ධියෙන් පසුව ද ඇයගේ ඇස් පෙනීමේ වෙනසක් නො වීය. එහෙත් 1993 දී ඇය වැලිහේන 'Samsun Lanka' ආයතනයේ රැකියාවට ගියාය. එම ආයතනයේ දී ඇයට හමු වූ මිතුරිය වන ලක්මිණී සමග සවස වැඩ නිම වී ඇය කොච්චිකඩේ නගරයට පැමිණේ. සුජීවාගේ මල්ලී ඇය කැඳවා ගෙන යාමට එහි පැමිණෙන තුරු ලක්මිණී ඇය සමග සිටී. කලින් නොදන්වා හදිසියේ ම දිනක් රාත්‍රි 9 දක්වා අතිකාල වැඩ කරන්න ඔවුන්ට සිදු වී ඇත. වැඩ නිම වීමෙන් පසු එම ආයතනය මගින් ඔවුන්ට කොච්චිකඩේ නගරය දක්වා ගමන් පහසුව සලසා ඇත. එදින පමාව නිසා ලක්මිණීගේ මව ද එහි පැමිණ සිටියාය. ඇයගේ බලපෑම නිසා සුජීවා නගරයේ තනි කර යන්නට ලක්මිණීට සිදු වී ඇත. (මුරුතාන ගමට පිවිසෙන අතුරු මඟ අසලින් මහ ඔය ගලා බසී.) සුජීවා වාහනවල ආලෝකයේ උපකාරයෙන් අතුරු මඟට පිවිසෙන තැනට පැමිණ ඇත. ඇගේ මල්ලී හෝ ඇය හඳුනන කිසිවෙක් හෝ එහි නො වීය. ඇය තුළ සියුම් හඬක් ඇයට පවසන්නට විය, "යන්න ඔබට පෙනෙනවා." එම අතුරු මඟ විදුලි ආලෝකය නො වීය. ඇතුලාන්ත සියුම් හඬට අවනත වෙමින් ඇය අඳුරේ ම නිවස බලා පියමන් කරන්නට වූවාය. ගස්වල අතුපතර ඇඟේ හැපෙනු ඇයට දැනිණි. පාර වැරදි ඇතැ යි ඇයට පැහැදිලි ය. ඇය ගඟේ වැටී මිය යනු ඇතැ යි ඇයට සිතිණි. එවිට එදා දුව දෙව් මැදුරේ දුටු ආලෝක ධාරාව ඇය අබියස බබලන්නට විය. ඒ සමග සුදු සළුවෙන් සැරසුණු ජේසු සමිඳුන්, ගං ඉවුර අසල ම ජලතලය මත ජීවිතයේ පළමු වරට එදා ඇය දුටුවාය. එවිට යි, ඇය දුටුවේ තව එක පියවරක් තැබුවා නම් ඇය ගඟට වැටෙන බව.

එම ආලෝක ධාරාව විදුලි පන්දමක එළියක් මෙන් මඟ දිගට විහිදී ඇතැ යි ඇයට සිතිණි. ඇය යුහුයුහුව නිවස බලා පියමන් කළාය. ඇය නිවෙසට පැමිණියේ මහත් සොම්නසින් සියල්ලන්ට හඬ නගා පවසමිනි, "දැන් මට පෙනෙනවා. ජේසු මට පෙනීම දුන්නා." මෙය සිදු වී ඇත්තේ 1993 ජූලි 02 සිකුරාදා ය. (එදා ඇය නිවෙසට පැමිණෙන විට ද ඇය සොයා රැකියා ආයතනයට ගිය ඇගේ මල්ලී නිවෙසට පැමිණ සිටියේ නැත.) 1995 දක්වා වසර හතරක පමණ කාලයක් අසිහියෙන් මෙන් ඇයගේ මුවින් නික්මී තිබුණේ කරුණු දෙකක් පිළිබඳ ව බව ප්‍රින්ස් නිහාල්ගෙන් දැන ගතිමි. 1. එම පවුල් හතරට සම්බන්ධ සියල්ලන් දිනපතා දෙවිඳුන් වෙනුවෙන් පිරිසිදු පැයක් වෙන් කරගෙන එක් ව යාච්ඤා කරන ලෙසත් 2. එම පවුල් අතර බෙදා-හදා ගැනීමේ එකමුතු ජීවිතයක් පවත්වා ගන්නා ලෙසත් ය.

එය දෙ වන ජුවාම් පාවුලු සුදු පියාණන් ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත දිනට පෙර දිනය විය. (1995 ජනවාරි 19) සුජීවා රැකියාව කළ ආයතනයේ දිවා ආහාරය සඳහා විවේක පැය උදා විය. ඇය ආපන ශාලාවේ බංකුවක් මත වාඩි වී සිටිය දී "ජේසුගේ සුවඳ ඈ වටා දැවටෙනු ඇයට දැනිණි. රතු සහ සුදු සළුවෙන් සැරසුණු ජේසු සමිඳුන් ඇය වෙතට පැමිණ ඇගේ හිසට අත තැබුවා ඇයට මතක ය. "පියාණන් පුත්‍රයාණන් ශුද්ධාත්මයාණන් වන මම මැය තුළින් පෙනී සිටිමි. ඔබට දෙන්නට පණිවුඩයක් මට ඇත." මහ හඬින් ඇයගේ මුවින් ඒ වදන් නික්මිණි. ඇය රෝගී වී ඇතැයි සිතා වගකිව යුත්තන් ඇය වහා ම නිවෙස බලා එවන්නට උත්සාහ කරද්දී "ඒ පණිවුඩය දැන ගන්නට අපට අවශ්‍යය"යි යනුවෙන් තරුණයන් පිරිසක් පවසා ඇත. "මගේ සහාවට මා පත්කළ මගේ පුත්‍රයා, මගේ ලෝක නායකයා මේ දේශයට එන දිනය හෙට යි. මෙම ආයතනයේ සේවය කරන දරුවන්ට ඒ සඳහා නිවාඩු ලැබී නැත. ඒ ගැන මම ප්‍රසන්න නො වෙමි." පණිවුඩය එය යි. "මේ පණිවුඩය ජේසුගෙන් බවට ඇති සාක්ෂිය කුමක්දැ"යි තරුණයන් විමසා ඇත. "දැන් අහස ගුගුරා වැස්සක් මේ අවටට පමණක් ඇද හැලෙනු ඇත." ඒ වැස්ස පවතිද්දී ම ආයතනයේ කළමණාකරු, සුජීවා නිවෙසට ගෙනවිත් බාර දී ඇත. නිවෙසට පැමිණියත් සුජීවා පියවි සිහියට පත් නො විය. එදින සවස ඇගේ බාප්පා වන ප්‍රින්ස් නිහාල්ට "මා පුත්‍ර නිහාල්" යනුවෙන් අමතා මෙ ලෙස පවසා ඇත. "මගේ පුත්‍රයාගේ පැමිණීම මුල්කර ගෙන එම ආයතනයට හෙට නිවාඩු දෙන්නට මම තීරණය කළෙමි."

පසු දින ආයතනයේ වැඩ කටයුතු සිදු වෙමින් පවතින අතර උදේ වරුවේ එම ආයතනයේ සිදු වූ හදිසි විදුලි ඇනහිටීමක් නිසා එහි ප්‍රතිසංස්කරණ කටයුතු නිම වන තුරු දින දෙකක් එම ආයතනය වසා දමන්නට සිදු ව ඇත. පාප් තුමා ලංකාවෙන් නික්ම යාම දක්වා පළමු වරට දින තුනක කාලයක් ඇය නිරාහාරයෙන් යුතු ව වැතිර සිට ඇත. සුදු පියාණන් ශ්‍රී ලංකාවට පැමිණීමේ සිට නික්මයාම දක්වා ඒ ඒ මොහොතේ සිදු වන දේ ජේසු සමිඳුන් ඇයගේ මුවින් ප්‍රකාශ කර තිබිණ. "මගේ සභාවට මා පත් කළ පුත්‍රයා මේ දේශයෙන් නික්ම ගිය බව" පවසමින් ඇය පියවි සිහියට පැමිණි බව ප්‍රින්ස් නිහාල් මට පැවසිය. මෙම සිද්ධියෙන් පසු ඇය මුල්කර ගෙන සිදු වෙමින් පවතින දේ ඔවුන් සිතනවාට වඩා බරපතල බව පවුලේ අයට හැඟී තිබිණ. ප්‍රින්ස් නිහාල් විසින් ඇය ව පූජාප්‍රසාදිවරුන් ති දෙනකු වෙත යොමු කර ඇත. ඇය හා බැඳුණ අත්දැකීම පිළිබඳව අධ්‍යයනයක යෙදුණු පිය තුමන්ලා එය නපුරාගේ ක්‍රියාවක් නො වන බවත් එහෙත් සභා ඉතිහාසයේ මෙ වැන්නක් සිදු වී ඇති බවට සාක්ෂි ඇද්දැ යි නො දන්නා බවත් කියා තිබිණ. ඇය එම ආයතනයේ නැවත රැකියාවට පැමිණෙනවා නම් එම ආයතනය විසින් වෛද්‍යවරුන් තිදෙනෙකුගේ නම් යෝජනා කරමින් එයින් එක් වෛද්‍යවරයකුගෙන් වෛද්‍ය වාර්තාවක් ඉදිරි පත් කරන ලෙස දන්වා ඇත. ඇය පරීක්ෂා කළ වෛද්‍යවරියගෙන් ඇය නිරෝගිමත් බවට වෛද්‍ය වාර්තාවක් ලැබී ඇත.

ජූනි 1 සිට ජූනි 6 දක්වා ඇය නිරාහාරයෙන් සිටි කාලය තුළ යම් යම් අය සාස්තර අසන්නට මෙන් පැමිණෙන විට "දරුවෙනි, මෙය සාස්තර මඩුවක් නො වේ. මා ඔබට යමක් කිව යුතු නම් මම ඔබේ නම කියා ඔබ මෙහි කැඳවා ගනිමි" යනුවෙන් ඇය මුවින් පැවසූ බව ද ප්‍රින්ස් නිහාල් මට කීවේය. ඉහත සඳහන් තොරතුරු සියල්ල ඔහු මට ප්‍රකාශ කළේ සිය දෙනෙතින් ගලන කඳුලින් යුතුව ය. මා එම නිවසට කැඳවා ගෙන යන්නට ඔහුට තදබල ලෙස අවශ්‍ය බව මට වැටහිණ. මම මෙසේ කීවෙමි. "ජේසු කියනවා පලවලින් ගහ හඳුනා ගන්න පුළුවන් කියලා. බැලූ බැල්මට නම් මේ පල නරක නැහැ. එනිසා ගහ නරක් වෙන්ට බැහැ." මගෙන් මෙ ලෙස ද කියවිණ. "මෙය දෙවියන්ගේ ක්‍රියාවක් නම් ඔය ළමයා මටත් එන්න කියාවි." මගේ එම පිළිතුරෙන් ඔහු සතුටට පත් වූ බවක් මට නො පෙනිණ. ඔහු යන්නට ගියේය. ප්‍රින්ස් නිහාල් අමතා මා කී එම අවසන් වැකිය මා හිතා-මතා කීවක් නො වේ.

පසු දින (1996 ජුනි 7 සිකුරාදා) මම දවසේ කළ යුතු ව තිබුණ වැඩවල යෙදුනෙමි. දවසේ වැඩ කටයුතු නිම වී ස්නානයෙන් පසු කාමරයේ වාඩි වී පත්තරය අතට ගත් විට වාහනයක් අප නිවස අසල නවත්වනු පෙනිණ. ප්‍රින්ස් නිහාල් ඉන් බැස එනු දුටුවෙමි. "ඒ ළමයා ඔයාට එන්න කිව්වා" ඔහු පැවසීය. "එහෙනම් අපි යමු" මම එසේ කියමින් එහි යන්නට සූදානම් වීමි. මුරුතානට යන අතරමඟ මට මෙසේ සිතිණි. මම මෙ වැනි දේ මෙතෙක් විශ්වාස නො කළෙමි. මා මෙ වැනි දේ පසුපස ගොස් නැත. මගේ දහම වූයේ කුරුසිය මඟ ඔස්සේ විහිදුන ගමන් මඟකි. එහෙත් මෙය මගේ ඇඟට ම ආ ආකාරය, එවිට මා නොසිතා ම මා මුවින් නික්මුණු වදන් මට සිහිපත් විය. දැන් ඒ ළමයා තුළින් මට එන්නට කියා ඇත. මා යා යුතුය. එදින සවස 5.55ට "නිහාල් පුත්‍රය" යනුවෙන් අමතා ඇයගේ මුවින් නික්මුණු වදන් ම ඔහු මට කිවේ නම් මෙය බැරෑරුම් බව මට වැටහෙන්නට ඉඩ තිබිණි. දින කීපයකට පසුව යි, එම වදන් මට ඔහුගෙන් දැන ගන්නට හැකි වූයේ. "ජීවිතය මා වෙනුවෙන් කැප කළ සියල්ල මා වෙනුවෙන් ත්‍යාජ කළ මා පුත්‍ර ඇන්තනි මෙහි කැඳවා ගෙන එන්න."

මම ප්‍රින්ස් නිහාල් සමග ඔහුගේ නිවසට ගියෙමි. නිවසේ ආලින්දයට පා තබත් ම මහත් හඬකින් මෙසේ කියනු මට ඇසුණේය. "මා පුත්‍ර ඇන්තනි මෙහි පැමිණ සිටී. මා පුත්‍රය, මා අසලට ම එන්න." (එම වචන නික්මෙන මොහොතේ මට ඇය ද ඇයට මා ද පෙනුනේ නැත.) මම ඇය අසලට ම ගියෙමි. ඇය මෙට්ටයක වැතිර සිටී. එවිට ඇය මුවින් මෙම වදන් නික්මිණ. "පියාණන් ද පුත්‍රයාණන් ද ශුද්ධාත්මයාණන් ද වන මම මැය තුළින් පෙනී සිටිමි. මේ මොහොත පැමිණෙන තුරු මම බලා සිටියෙමි. මම කලක් තිස්සේ මැය තුළින් පෙනී සිටිමින් ඒ සඳහා පසුබිම සකස් කර ගතිමි." තව දුරටත් ඇයගේ මුවින් මෙම වදන් ද නික්මිණ. "මම පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද වෙමි. මාගේ පුත්‍රය, ඔබ ජීවිතය පුරා ඉතා අපහසු ගමන් මඟක පැමිණියෙහිය. ඒ ගමනේ දී ඔබ මා පිළිබඳ විශ්වාසයෙහි රැඳී සිටියෙහිය. අද මා ඔබ කැඳවූ මොහොතෙහි ද ඔබ මහත් නිදහසකින් මෙහි පැමිණෙන අයුරු මම බලා සිටියෙමි." තව දුරටත් ඇයගේ මුවින් මෙම වදන් ද නික්මිණි. "මා ප්‍රේමවන්ත පුත්‍ර ඇන්තනි, මම ඔබ ගැන ප්‍රසන්න වෙමි. මාගේ පුත්‍රය, අද මා ඔබ මෙහි කැඳවීමට හේතුව දැන් මම ප්‍රකාශ කරමි. මාගේ පුත්‍රය, මට සවන් දෙන්න. මාගේ ජන දරුවෙනි, මා පුත්‍ර ඇන්තනි මා මෙහි කැඳවීමට හේතුව ඔබ ද තේරුම් ගන්න. මා පුත්‍ර ඇන්තනි, ඔබ මාගේ පෙර මඟ සකස් කරන්නා ලෙස මම තෝරා ගතිමි." (මෙතෙක් මෙට්ටයෙහි වැතිර සිටි ඇය වාඩි වන අයුරු මම බලා සිටියෙමි.) ඇය මුවින් මෙම වදන් ද නික්මිණ. "මාගේ පුත්‍රය, දැන් මා වෙත ඔබගේ දෑත් දිගු කරන්න." මම දෑත දිගු කළෙමි. මගේ ඇඟිලි තුඩු සිය දෑතින් ස්පර්ශ කරද්දී ඇය මුවින් මෙසේ නික්මිණ. "මා පුත්‍ර ඇන්තනි, මගේ පෙර මඟ සකස් කරන්නා ලෙස මම ඔබ පත් කරමි." (නැවත ඇය මෙට්ටයෙහි වැතිරෙනු දිටිමි.) ඇය මුවින් මෙම වදන් නික්මිණ. "මාගේ පුත්‍රය, මට සවන් දෙන්න. නපුරා අද ලොව තුළ සිය බලය පිළිබඳ බලගතු මවා පෑමක යෙදී සිටී. ආගමක් ලෙස හැඳින් විය නො හැකි දේ අද ලොව පුරා ආගම් ලෙස පැතිරෙමින් තිබේ. එය ද නපුරාගේ සියුම් සැලැස්මකි. අද ලොව සිදු වන දේ තුළ මම මහත් බරක් උසුලාගෙන සිටිමි. මාගේ පුත්‍රය, ඒ බර මම ඔබට බාර දෙමි. ඔබගේ දෝතින් ම එය බාර ගන්න. මාගේ පුත්‍රය, දිනපතා ලෝකය තුළ සිදු වන පාපය මා කල්වාරිය මත වැගුරුවා වූ මාගේ ශ්‍රී රුධිරයෙහි පොඟවා හරින්න. මාගේ පුත්‍රය, ඔබ දුක් විඳින්නන්ගේ වේදනා හඳුනන්නෙහිය. ලොව පුරා දුගී ජනතාවගේ අපමණ වේදනා මා කල්වාරිය මත වැගුරුවා වූ මාගේ ශ්‍රී රුධිරයෙහි දිනපතා පොඟවා හරින්න."

(නැවත ඇය වාඩි වන අයුරු මම දුටුවෙමි.) ඇය මුවින් මෙම වදන් නික්මිණ. "මම පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද වෙමි. මාගේ පුත්‍රය, මම ඔබ ආශිර්වාද කරමි. මාගේ ආශිර්වාදය ඔබගේ දෝතින් ම බාර ගන්න. මාගේ බලය මම ඔබට දෙමි. මාගේ පුත්‍රය, මාගේ බලය ඔබගේ දෝතින් ම බාර ගන්න." (නැවත ඇය මෙට්ටයෙහි වැතිරෙන අයුරු මම දුටුවෙමි.) ඇය මුවින් නැවත ද මෙම වදන් නික්මිණ. "මතුවට ද ඔබට බොහෝ බාධක අතරින් යන්නට සිදු වනු ඇත. බිය නො වන්න. මම ඔබ සමග සිටිමි. මම ඔබට පෙරටුවෙන් සිටිමි. මම ඔබට පසු පසින් සිටිමි. ඔබට විපතක් කරන්නට කිසිවකුට හෝ ඉඩ නො දෙමි. කිසිදු බලවේගයකට ඔබ පරාජය කළ නො හැකිය."

ඉන් පසු ඇය හඬ නැගෙන දිර්ඝ ආශ්වාසයක් තුළින් පියවි සිහියට පැමිණෙන අයුරු මම දිටිමි. මේ මොහොතේ විසි දෙනෙක් පමණ පිරිසක් එහි වූහ. ඇය මෙට්ටය මත ම සිට මෙසේ කියනු මට ඇසිණ. "බාප්පේ, මට හොඳට ම බඩගිනි යි, කන්න දෙයක් මෙ තැනට ම ගෙනෙන්න." ඉහත සඳහන් සිද්ධිය සිදු වූයේ දින හතක නිරාහාරයක අවසාන දිනයේ දී ය. ඇය ආහාර අනුභවයෙන් පසු ඇගේ බාප්පා වන ප්‍රින්ස් නිහාල් මා පෙන්වමින් "මෙයා ව හඳුනනවා දැ"යි ඇගෙන් විමසීය. ඇය මා දෙස ඉතා ඕනෑකමින් බලමින් "මම එයා ව කවදා වත් දැකලා නැහැ." යනුවෙන් පැවසුවාය. "අපි ඇන්තනි අයියා කියලා සමහර විට කතා වෙන්නේ

මෙයා ගැන යි." ඒ ප්‍රින්ස් නිහාල්ගේ වචන යි. "ඒ නම නම් මා තරමක් අහල තිබෙනවා." ඇය එසේ පැවසුවාය.

1996 ජුනි 7න් පසු මා ප්‍රින්ස් නිහාල්ගේ නිවෙසට නැවත ගියේ ජූලි 19 වන දින ය. එසේ ගියේ ද එහි එන ලෙස ජේසු සමිඳුන් ඇය මගින් දන්වා තිබූ බැවිනි. ඒ අතර කාලය තුළ සුජීවා ජයලත් සොයුරිය උපයෝගි කර ගනිමින් සමිඳුන්ගෙන් ලැබෙන අනාවරණ ඒ ඒ මොහොතේ ප්‍රින්ස් නිහාල් අප නිවෙසට පැමිණ මට පැවසිය.

**1996 ජුනි 19 වන දින සමිඳුන් මෙසේ පවසා තිබිණ.**

"නුදුරු දිනක දි පූජක පුත්‍ර ගොඩ්ෆ්‍රී, පූජක පුත්‍ර මැල්කම්, මා පුත්‍ර ඇන්තනි මම මෙහි කැඳවමි. පූජක පුතුන් දෙදෙනාට සුව කිරීමේ හා කොඩිවිණ දුරු කිරීමේ බලය දෙමි. මා පුත්‍ර ඇන්තනිගෙන් මා බලාපොරොත්තු වන්නේ ගම්, නගර ඇතුළු සියලු තැන්වල මාගේ සත්‍ය දහම ගෙන යමින් මාගේ පෙර මඟ සුදානම් කරන්නට ය."

**1996 ජුනි 27**

"ආදර දරුවෙනි, ඉදිරියේ දි නුඹලාට පැමිණෙන සියලු ම ප්‍රශ්න කරදර එදා මා කුරුස ගසේ දි වැගුරුවා වූ මාගේ ශ්‍රී රුධිරයෙන් පොඟවා සැනසීම ලබන්න."

**1996 ජුනි 29**

"මීළඟ මාගේ දිනයේ දි නො ව ඊට පසු ව එළඹෙන මාගේ දිනයේ දි (ජේසු සමිඳුන් මාගේ දිනය යනුවෙන් හඳුන් වන්නේ සිකුරාදා ය. මක්නිසාද, ජේසු සමිඳුන් මහා සිකුරාදා නපුරා පරාජය කළ බැවිනි.) මැය දින හතක නිරාහාරයට පිවිසෙනු ඇත. එහි අග දිනයේ දි මම මැයගෙන් නික්ම යන්නෙමි." (ගොඩ්ෆ්‍රී පිය තුමාත්, මැල්කම් පිය තුමාත්, මාත් එම නිවසට කැඳවන දිනය ජූලි 19 වන සිකුරාදා විය හැකි යැයි ඒ අනුව මට සිතිණි.)

**1996 ජුනි 30**

"නුඹලාගේ පාප මා කෙරෙහි ගෙන එදා කුරුස ගසේ දි මාගේ ප්‍රාණය පුදන මොහොතේ මම දැඩි ලෙස පිපාස වී දිය බිඳක් ඉල්ලූ විට මට දිය පොදක් දෙන්නට කිසිවකු නො විය. මා එදා මාගේ පියාණෙනි, මේ පාත්‍රය මාගෙන් ඉවත් කරන්නට ඔබට පුළුවන. එහෙත් මාගේ කැමැත්ත ලෙස නො ව ඔබගේ කැමැත්ත ලෙස වේවා" යි මා පැතූ මොහොතේ ම මා පියාණන්ගේ සැලැස්ම ඉටු වීමට තීරණය විය. මාගේ දරුවෙනි, මා ඔබට පෙන්වන ගමන කටුක ය, දුෂ්කර ය, අඳුරු ය. එහෙත් නුඹලා මා පසුපස ම එන්න. මම නුඹලා ඉදිරියෙන් ද නුඹලා පසුපසින් ද සිටිමින් නුඹලා සුරකින්නෙමි."

**1996 ජූලි 4**

"මාගේ දරුවෙනි, මම නුඹලාට යමක් පවසන්නෙමි. මම නොයෙක් වෙස් ගෙන නුඹලාගේ නිවෙස්වලට එමි. මම ධනවතකුගේ වෙස් ගෙන ධනවතුන්ගේ නිවෙස්වලට ගියෙමි. ඔවුහු මා මහත් හරසරින් පිළිගත්හ: මට බොහෝ සේ සංග්‍රහ කළහ. මම දුගියකුගේ වෙස් ගෙන ධනවතුන්ගේ නිවෙස්වලට ගියෙමි. ඔවුහු මා පිළිකුල් කොට මා එළවා දැමූහ. දරුවෙනි, මෙය ද ප්‍රේමයේ ජීවිතය? මෙය ද, බෙදා ගැනීමේ ජීවිතය? මම ධනවතකුගේ වෙස් ගෙන දුගීන්ගේ නිවෙස්වලට ගියෙමි. ඔවුහු මා සතුටින් පිළිගෙන ඔවුන්ට හැකි දෙයින් මට සංග්‍රහ කළහ. මම දුගියකුගේ වෙස් ගෙන දුගීන්ගේ නිවෙස්වලට ගියෙමි. ඔවුහු මා සතුටින් පිළිගෙන ඔවුන්ට හැකි දෙයින් මට සංග්‍රහ කළහ. දරුවෙනි, ධනවතා ද දුගියා ද මම වෙමි. අද සමාජය බිහිසුණු ලෙස මුදලට යට වී ඇත."

සමිඳුන් පැවසූ ලෙස ම සුජීවා ජයලත් සොයුරිය ජූලි 12ස් වන සිකුරාදා සිට දින හතක නිරාහාර කාලයකට මුල පිරූ බව මම ප්‍රින්ස් නිහාල්ගෙන් දැන ගතිමි. "ජූලි 19 වන දින මම මැයගෙන් නික්ම යන්නෙමි"යි එදින සමිඳුන් ප්‍රකාශ කර තිබිණ. එදිනට මා පුත්‍ර ඇන්තනි, පූජක පුත්‍ර ගොඩ්ෆ්‍රී, පූජක පුත්‍ර මැල්කම්, පූජක පුත්‍ර ලින්ටන්, පූජක පුත්‍ර ඩිලාන්, පූජක පුත්‍ර බෙනඩික්, පූජක පුත්‍ර සුනන්ද, පූජක පුත්‍ර ඔස්කා කැඳවන ලෙස දන්වා තිබිණ. පුබුදු සුබැඳි සංඝය කැඳවන ලෙස ද දන්වා තිබිණ. එසේ ම රෝගින්, විශේෂයෙන් පිළිකා, රෝගින් කැඳවන ලෙස ඇය තුළින් සමිඳුන් ප්‍රකාශ කළ බව ප්‍රින්ස් නිහාල් මට පැවසීය. රෝගින් කැඳවන්න යන ආරංචිය ලැබුණු විට එදින බොහෝ දෙනකු පැමිණෙනු ඇත.

ජූලි 12න් පසු මේ පිළිබඳ ආරංචිය බොහෝ දෙනකුට ලැබෙන්නට විය. එම දින හත පුරා ම ජනතාව කණ්ඩායම් වශයෙන් එම නිවෙසට පැමිණියහ. සමිඳාණෝ සුජීවා ජයලත් සොයුරිය

මගින් ඔවුන් ඇමතුහ. ඔවුන්ගේ රෝග පවා සුව කළහ. ජුලි 19ට පෙර ද එම නිවෙසට ගොස් මේ අවස්ථාව අධ්‍යයනය කරන ලෙස මම දහම් නවෝදය සංඝයේ අයගෙන් ඉල්ලා සිටියෙමි. ජුලි 19 වන දින සවස 4.30ට පමණ මම ප්‍රින්ස් නිහාල්ගේ නිවෙසට ගියෙමි. අප සංඝයේ සියල්ලෝ පැමිණ සිටියහ. මා යන විට ද විශාල සෙනගක් පැමිණ සිටියහ. එදින බොහෝ දෙනා පැමිණ සිටියේ තම රෝගයන්ගෙන් සුවය ලබන රිසියෙනි. බලගතු සුව වීම් කීපයක් ද වාර්තා විය. මා එහි යන විට ලින්ටන් පිය තුමා ද ඩිලාන් පිය තුමා ද පැමිණ සිටියහ. සමිඳුන් එහි එන ලෙස ඇරයුම් නොකළත් ප්‍රැන්සිස් පිය තුමා ද එහි පැමිණ සිටියේය. ඇරයුම් ලැබූ අනෙක් පිය තුමන්ලා පැමිණ නො සිටියහ. පැමිණි තිදෙනා ම හලාවත පදවියේ සේවය කරන පිය තුමන්ලා ය. සදාසරණ නිකායේ කන්‍යා සොයුරියෝ කීප දෙනෙක් ද පැමිණ සිටියහ. එලෙස ගිහි, පැවිදි, පූජක සංඝය ම එදින නියෝජනය විය.

"මා ඇරයුම් නොකළත් මෙහි පැමිණි පූජක පුත්‍රය" යනුවෙන් ප්‍රැන්සිස් පිය තුමා කැඳවා පැවසූ වචන මට හොඳින් මතක ය. "එදා ජනතාව මා සොයා පැමිණෙන තුරු මම බලා නො සිටියෙමි. ජනතාව සොයා මම ඔවුන් වෙතට ගියෙමි. ඔබ ද එලෙස සේවයට ඇප-කැප වන්න. ඒ සඳහා මම ඔබ ආසිරි ගන්වමි." එදින පැයකටත් වැඩි කාලයක් වැය වූයේ රෝගීන් ආසිරි ගැන්වීම සඳහා ය. එම කාලය තුළ ඇයගේ මුවින් නික්මුණ වදන් සමිඳුන්ගේ සුවය ලබා ගැනීමේ නිවැරදි කිතුනු මාර්ගය එහි පැමිණි ජනතාවගේ ආත්මගත කිරීමක් මෙනි. කෙනකුට මෙසේ පවසනු ඇසිණ. "ඔබේ ප්‍රශ්න ගැටළු ඔබේ සිත් හි තදින් ධාරණය කර ගන්න. ඒවා ඔබගේ දෝතට ගන්න. එදා මා වැගුරූ මාගේ ශ්‍රී රුධිරයෙන් පොඟවා හරින්න. මෙය දිනපතා කරන්න. එවිට නුඹට සුව සහනය ලැබෙන්නේය." තව කෙනකුට "ඔබගේ රෝගය ඔබගේ සිතෙහි ධාරණය කර ගන්න." යනුවෙන් ද, තවත් කෙනකුට "ඔබගේ පාපිෂ්ඨ භාවය ඔබේ සිතෙහි තදින් ධාරණය කර ගන්න." යනුවෙන් ද පවසමින් ඉහත සඳහන් අනෙකුත් වැකි එලෙස ම පුන පුනා පවසනු ඇසිණ. එම පැයේ දී පැමිණ සිටි පිය තුමන්ලා ද රෝගීන් හිස මත අත් තබා යාච්ඤා කළහ.

"සවස 6.30ට මම මැයගෙන් නික්ම යමි"යි ජේසු සමිඳුන් එදින සවස ප්‍රකාශ කර තිබිණ. සවස 6.25ට පමණ "මා පුත්‍ර ඇන්තනි, මෙහි පැමිණෙන්නැ"යි මහා හඬින් පවසනු සියල්ලන්ට ඇසිණි. මම එතැනට පැමිණියෙමි. ඇය මුවින් මෙම වදන් නික්මිණි. "මා පුත්‍ර ඇන්තනි, මාගේ පෙර මඟ සකස් කරන්නා ලෙස මම ඔබ පත් කළෙමි. එදා මම මෝසෙස් තෝරා ගත්තාක් මෙන් අද ඔබ තෝරා ගතිමි. ඔබගේ මෙ ලොව කාර්යය නිමාවට පත් වන විට මාගේ රාජ්‍යයේ දොරටු පියන් පත් ඔබට විවෘත ව තබමි." ඉන් පසු ඇය පියවි සිහියට පැමිණියාය. බොහෝ දෙනා සුවය පතා පැමිණ සිටි බැවින් ගරු ලින්ටන් පිය තුමා පොදුවේ සියල්ලන් ආසිරි ගැන්විය. එදින සිදු වූයේ 1996 ජුනි 7 සවස 6:45 - 7:00 අතර සිදු කළ දේ ගිහි, පැවිදි, පූජක සංඝයක් ඉදිරියේ ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීමයි. සාර්ථක පවුල් දිවියක් උදෙසා ඇය මගින් සමිඳුන් දුන් ඉතාමත් ම වැදගත් පණිවුඩය වන්නේ "සෑම පවුලක් ම සමිඳුන් වෙනුවෙන් දිනපතා පිරිසිදු පැයක් වෙන් කර ගන්න. පවුලේ සියලු ගැටළු, අසනීප, දරුවන්ගේ මුරණ්ඩුකම් ආදිය ඔබගේ සිත් හි තදින් ධාරණය කර ගන්න. ඒවා ඔබගේ දෝතට ගන්න. මාගේ රුධිරයෙන් එය පොඟවා හරින්න. දිනපතා යැදුම තුළ මෙය කරන්න. නුඹලාට සුව සහනය ලැබෙන්නේය."

ජුලි 19 වන දින මා මුරුතානට යන්නට පෙර මේ පිළිබඳව එවකට අප මීසම භාර පිය තුමා වන ගරු විල්ප්‍රඩ් පින්තු පිය තුමාට පැවසිය යුතු යැයි මට හැඟිණි. ජුලි 18 වන දින එතුමා හමුවන්නට මම ගියෙමි. පිය තුමා ම මුල පිරීම මට පහසුවක් විය. "මොනවද ඇන්තනි, ඔය මුරුතානේ වෙනවා කියන්නේ?" මම මෙම සිද්ධියෙන් ගෙන එන මූලික පණිවුඩය පිය තුමාට පැවසීමි. "දෙවියන් වහන්සේ ක්‍රියා කරන්නේ මේ මේ පුද්ගලයන් තුළින් පමණ යි, මේ මේ ක්‍රමවලින් පමණ යි කියල සීමාවන් පනවල නැහැ. මැවුම්කරුට හැකියි, ඕනෑ ම පුද්ගලයකු තුළින් ඕනෑ ම ක්‍රමයක් තුළින් ක්‍රියා කරන්නට. අප එතුමන්ගේ ක්‍රියාකාරීත්වයට විවෘත ව සිටිය යුතුයි." පිය තුමා එලෙස පැවසීය. ඒ වචන මට මහත් සවියක් විය.

## 13

# “නුඹලා මා හට ඔප්පු කරන පැය, පිරිසිදු ව නපුරාට යට නො වී පුදන්න.”

“මම මැයගෙන් නික්ම ගියත් මෙම නිවහනේ දිනපතා මා වෙනුවෙන් පිරිසිදු පැයක් වෙන් කර ගෙන කරන යැදුම නොකඩවා කරගෙන යන්නැ”යි 1996 වසරේ දී ජේසු සමිඳුන් සුජීවා සොයුරියගේ මුවින් ප්‍රකාශ කර තිබිණි. එනිසා ප්‍රින්ස් නිහාල්ගේ නිවසේ දිනපතා පැයක යැදුම නොකඩවා සිදු විය. 1997 මැයි මාසයේ ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්ලය හා දිව්‍ය සත්ප්‍රසාද මංගල්ලය අතර සතියේ දිනක (මැයි 30) යැදුම තුළ ඇය හදිසියේ ම අසිහියෙන් මෙන් ඇඟිල්ලෙන් බිම ලියන්නට වූවාය. ඒ දුටු ප්‍රින්ස් නිහාල් කොළයක් හා පෑනක් ඇය සුරතේ තැබූ විට “මම ජීවනයේ ස්වාමියාණෝ වෙමි. මාගේ වචන කිසි දින නිම නො වේ. දරුවෙනි, මම නුඹලාට ප්‍රේම කරමි.” යනුවෙන් ලියා ඇත. ඒ මොහොතේ සිට 1997 ජූලි 19 දක්වා ඇය උපයෝගි කරගෙන සටහන් තැබීමක් සිදු විය. ඒ මොහොතේ ඇයගේ මුවින් වචනයක් හෝ නො කියවිණ. සටහන් තැබීමක් පමණක් ම සිදු විය. ඒ කාලය තුළ ජේසු සමිඳුන් සිය දෙනෙත් පමණක් ඇයට පෙන්වමින් එම දෙ නෙතින් පවසන දේ ඇගේ සුරතින් සටහන් වීමකි සිදු වූයේ. එම සටහන්වලින් උපුටා ගත් කොටස් කීපයක් දැන් ඔබ හමුවේ තබමි. (එම සටහන් අතර අප නොදන්නා භාෂා කීපයකින් ද සටහන් තබා ඇත. එය දකුණේ සිට වමට ලිවීමකි. එම සටහන්වලින් උපුටා ගත් කොටස්වල ඡායා පිටපත් මෙම ප්‍රකාශනය අගට එක් කර ඇත.)

**1997 ජූනි 01**

“---- මම නුඹලාගේ පෙර මඟ සූදානම් කරන්නා තෝරා ඇත්තෙමි. මම නුඹලා ද මාගේ ජනතාව සකසන්නට සූදානම් කර ඇත.”

**1997 ජූනි 24**

“---- මැයට මගේ දෙ නෙත්වලින් කතා කොට නුඹලාට නොයෙක් ආකාරයෙන් මඟ පෙන්වමි. මා අදහන්නා භාග්‍යවන්ත ය. නුඹලා මා පසුපස ගමන් කරන්නහු නම් මම නුඹලා රැක ගන්නෙමි. ජල ධාරාවලින් ද මම නුඹලා ඔසොවා ගන්නෙමි. ගිනි කඳු පුපුරා ගියත් ඒ තුළින් ද මම නුඹලා බේරා ගන්නෙමි. මඳ ඇදහිල්ලෙන් නො සිටින්න. මා නුඹලා සමග යි. ---- නුඹලාගේ දරුවන් හට මා පසුපස එන මාර්ගය පෙන්වා දෙන්න. යහපත් වචන මුවින් පිට කර යහපත් ක්‍රියා අත්වලින් ද දෙ පයින් ද කරන අයුරු මොවුන්ට පහදා දෙන්න. ---- මා නොදැනුවත් ව කිසි දෙයක් නුඹලාට නො වන්නේය. නුඹලාට වේදනා ප්‍රශ්න කරදර මේ සියල්ලක් ලැබෙන්නට සලස්වන්නේ අන් අය තේරුම් ගැනීමට හා අන් අය ව හඳුනා ගනිමින් යහපත් ක්‍රියාවෙන් දිවි ගෙවන්නට යි.”

**1997 ජූනි 27**

“---- මා ප්‍රේමාන්විත මාගේ දරුවෙනි, පාපයේ ගැඹුර අති මහත් ය. මේ පුංචි දේශය නැති වන තරමට නපුරා වෙළා සිටී. එයට ඉඩ නොතබමින් මම එය රැක ගන්නෙමි. මේ පුංචි දේශය විනාශ වෙමින් සුළු පිරිසකි, ඉතිරි වන්නේ. ඒ සැම මට ප්‍රසන්න දරුවෝ වෙති. එනිස යි, මාගේ මාර්ගය පුංචි දරුවන්ට පෙන්වන්නට, ඔවුන්ට අත දෙන්නට මා නුඹලාට අණ කළේ. මහා ජල ගැල්මෙන් මම නෝවාගේ පරපුර බේරා ගත්තෙමි. දැන් ගිනිදැල්වලින් ලෝක විනාශය ආරම්භ වී ඇත. එයින් මිදෙන්නට මා පසුපස එන නුඹලා සමග මම වැඩසිටිමින් සාර කෙතක අස්වැන්න ලබා ගන්නාක් මෙන් මම නුඹලා සමග ජය ගනිමි.”

**1997 ජූනි 28**

“මාගේ ප්‍රේමවන්ත දරුවෙනි, මම මිනිසා ද සත්වයින් ද මවා වදාලෙමි. මිනිස් ප්‍රාණයත් සත්ව ප්‍රාණයත් මට අගනේ ය. මිනිසා මා විසින් මවන ලද දිළිඳු සතුන් විනාශ කරයි. මා ප්‍රේමාන්විත දරුවෙනි, අසරණ සත්වයා ප්‍රාණය බේරා ගන්නට වෙර දරයි. මඳකට හෝ සිතා බලන්න, නුඹලාගේ ප්‍රාණය විනාශ කරන්නට කිසියම් කෙනකු පැමිණෙන විට නුඹලා ප්‍රාණය බේරා ගන්නට වෙර දරන්නේ නැද්ද?”

**1997 ජූලි 1**

“----මා නුඹලා දෙස බලා සිට නුඹලා මවට පියාට සලකන ආකාරයට යි, මා නුඹලාගේ පවුල් ආශිර්වාද කරන්නේ.”

**1997 ජුලි 2**

"මම ජීවනයේ ස්වාමියාණෝ වෙමි. මා හැර නුඹලාට අධිපති කිසිවකු නො වන්නේ ය. මා ප්‍රේමාන්විත දරුවෙනි, මම නුඹලාට අධිපති ව නුඹලාගේ එඬේරා වන්නෙමි. නුඹලා සැවොම මා අබියස බැටළුවන් වන්නාහුය. මා ආදර දරුවෙනි, නුඹලාට ඉදිරියෙන් ද මා හට පසුපසින් ද නුඹලා රැගෙන මාගේ මාර්ගය සකසමින් ගමන් කරන්නට යම් පුත්‍රයකු ව මම තෝරා ඇත්තෙමි. මා පුත්‍ර ඇන්තනි, මා විසින් තෝරා ගත් නුඹට මම පණිවුඩයක් දෙන්නෙමි. මා පුත්‍රය, නුඹ මාගේ වචනවලට සවන් දෙමින් මාගේ මාර්ගයේ පැමිණෙන විට නුඹ ට නින්දා අපහාස බොහෝ සේ ලැබෙන්නේය. ඒ සියල්ලට ම මුහුණ දෙන්න, මා පුත්‍රය. නැණවතකු ලෙස ක්‍රියා කරන්න. උවමනා තැනට මා අමතා කතා කරන්න. එවිට මම නුඹට කතා කරමි. මෙන්න මා නුඹට කතා කරන ආකාරය **(උපදේශක 1:1-31, උපදේශක 2:1-16, උපදේශක 3:1-32)**

"මා ප්‍රේමවන්ත දරුවෙනි, නුඹලා මෙ ලොවට මවන්නට ප්‍රථම නුඹලාට අවශ්‍ය සියල්ල මවා වදාළෙමි. හිරු රැස් ද ජල දහරා ද සඳ හා තරු ද වලාකුළු ද අහස පොළොව ද මවා වදාළෙමි. මිනිසාට ප්‍රියමුසු ව සිටින්නට පක්ෂින් ද මුහුදේ වැලි ද මේ සියල්ල මවා වදාළෙමි. නුඹලා නුඹලා ගැන ම උදම් අනන්නහු ද? නුඹලා අතරින් මා පව් නො කළේ යැයි යමෙක් සිතන්නේ ද, අන්න එවිට යි නුඹලාගේ විනාශය ඇති වන්නේ. නුඹලා අතිශයින් කීකරුකමින් හා ඉවසීමෙන් යුතු ව මාගේ මාර්ගයේ පැමිණෙන්නේ ද අන්න එවිට යි, සැබෑ ජීවන මාර්ගය අත්දකින්නට පුළුවන් වන්නේ."

**1997 ජුලි 04**

"දරුවෙනි සත්‍යය උදෙසා සටන් කරමින් මා පසුපස ම එන්න. එවිට නුඹලාට ජය ලබන්නට පුළුවන. මා හට දෙන්නා වූ පිරිසිදු පැය අවදිව සිට ඔප්පු කළ මැනවි. හදවත් විවෘත ව පිරිසිදු ව තබා ගන්න. එවිට මා හට නුඹලාගේ හද පතුලට ඇතුළු වන්නට පුළුවන. මා ආදර දරුවෙනි, ධනයට බලයට වහල් නො වන්න. හදවත් පිරිසිදු වන්නේ නම් අන්න එය යි නුඹලාගේ ධනය. දිළිඳු නුඹලා සැම මාගේ දරුවෝ වන්නහුය."

**1997 ජුලි 05**

"මා ආදර දරුවෙනි, ලෝක පාපය නිසා එදා මම කුරුසිය මත දිවි පිදුවෙමි. මා සොයා එන නුඹලා සැම සියලු නපුරු කරදරවල දී මම රක්ෂා කරමි. මාගේ ගමන එන්නා වූ නුඹලාට අධික ලෙස නපුරාගේ බලපෑම් පැමිණෙන්නේය. ඒ සියල්ලට එඩිතර සිතින් මුහුණ දෙන්න. ---- මාගේ දරුවෙනි, නුඹලා පරීක්ෂාවට ලක් කිරීමට නපුරා මාන බලයි. මගේ ජයග්‍රහණය නපුරාගේ අධික වෛරය බවට හැරී ඇත. කල්පනාකාරී ව ඉදිරියට මුහුණ දෙන්න."

**1997 ජුලි 6**

"පුත්‍රය, මා තබන මේ සැම සටහනක් ම යම් දිනයක නුඹලාට ප්‍රයෝජනවත් ය. මේ මිහිමඬල, දූවිල්ලෙන් සැදූ සියල්ල දූවිල්ලට ම හැරී යන්නේය. එක්තරා දිනෙක ලෝකය අවසාන වන්නේය. එදින අල්ප දෙනෙකි, මා හමුවේ සිටින්නේ. මා ප්‍රේමවන්ත දරුවෙනි, එක්තරා දිනයක නුඹලා මහන්සියෙන් සැදූ සියල්ල අත්හැර මා පසුපස එන්නට මා හඬ ගසන විට නුඹලා ඒ සියල්ලට ම සූදානමින් සිටිය යුතුය."

"නුඹලා සැම මම නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් කරමි. නුඹලා කොතරම් දුරක් මගේ කටු සහිත පඳුරට පය තබමින් වේදනා විඳිමින් මාගේ ගමන් මඟ පියමං කරන්නහු දැයි මම බලා සිටිමි. ලෝක ස්වභාවය විනාඩියෙන්, තත්පරයෙන් වෙනස් වන මේ මොහොත වන විට ලෝක විනාශය කඩිනම් වෙමින් ඇත. මාගේ දරුවෙනි, නුඹලා මා ඉදිරියට පැමිණෙන විට නපුරා නුඹලාට පහර ගසමින් නුඹලාගේ ගමන් මඟ වළකයි. ඒ සියල්ලට නුඹලා සැම අවදි ව සිටින්න. මා ප්‍රේමවන්ත දරුවෙනි, ප්‍රේමයේ ජල ධාරා නුඹලා අතරින් පටන් ගෙන සියලු ජනතාව වෙත ගලා යමින් ඔවුන්ට මාර්ගය පෙන්නුම් කළ යුතුයි. නුඹලාට බොහෝ ගල් පහරවල් ලැබෙන්නට පුළුවන. මගේ ජයග්‍රහණය කරා යන විට නුඹලාගේ ජීවිත පවා පූජා කරන්නට සිදු වනු ඇත. ඒ සියල්ලට ම බිය නො වන්න. මාගේ රාජ්‍යයේ දොරටු නුඹලාට විවෘත ව තබන්නෙමි. ---- මා පුත්‍ර ඇන්තනි, සියළු නපුරු බලවේග බිඳ හෙළන්නට මොවුන්ට මාර්ගය පෙන්වන්නට මම නුඹ තෝරා ඇත්තෙමි. පුත්‍රය, මම නුඹ ව ආශිර්වාද කළෙමි. නැණ නුවණින් වැඩුණු මා පුත්‍රය, නුඹ නුවණින් ක්‍රියා කරන්න. ප්‍රඥාවන්ත වන්නා නිතර ජය ලබන්නේය. පුත්‍රය මම නුඹට සවි ශක්තිමත් කොඳු ඇට පෙළක් ද බුද්ධිමත් මනසක් ද දුනිමි. මාගේ ගමන් මාර්ගය සරසන්නට මේ කාලය තුළ මම නුඹ ව තෝරා ඇත්තෙමි. මෙන්න පුත්‍රය, නුඹට කාලය පැමිණ ඇත."

**1997 ජුලි 08**

"ප්‍රේමවන්ත මාගේ දරුවෙනි, මහලු වියේ සිටින්නන්ගේ ඔටුන්න වන්නේ දරුවන්ගේ දරුවන් ය. දරුවන්ගේ පාරට්ටුව වන්නේ තම මව් පියවරුන් ය. දරුවෙනි, නුඹලා මව් පියන්ට ගරු කළ යුතුය. ---- නුඹලා මා හට ඔප්පු කරන පැය පිරිසිදු ව නපුරාට යට නො වී පුදන්න. එවිට නුඹලාට විරුද්ධ ව කර තිබෙන වලලා තිබෙන සියලු කොඩිවිණ ගොඩට එන්නේය. මා හට පුදන පිරිසිදු පැය ඉදිරියේ නපුරාට මා විසින් මවන ලද පස යට සිටින්නට බැරි ය. එය ගොඩට එන්නේ ම ය. ----මාගේ මාර්ගයේ පැමිණෙන අයට ගල් පහරට කඩු පහරට මුහුණ දෙමින් හැලෙන ලේ දහර ඔස්සේ දවන යාග මෙන් ජීවිත පවා පූජා කරමින් ධර්මිෂ්ඨකමින් මගේ රාජ්‍යයට ඇතුලු වන්නට දොරටු නුඹලාට විවෘත ව ඇත."

**1997 ජුලි 11**

"මුළු මිනිස් සමාජයට දැන ගැනීම පිණිස මම මෙ වර සටහන් තබමි. ---- මේ මොහොතේ ද බොහෝ ස්ත්‍රීහු දරුවන් නොමැති ව වේදනාවෙන් මා හට මොර ගසති. දරු පල ඇති සමහර මව්වරු තම කුස තුළ ම දරුවන් විනාශ කරති. එය මහා පාපයකි. මහා මනස්ස්ථාපනයකින් ඔවුහු ද මා වෙත හැරී එත් වා! --- මා පුත්‍ර ඇන්තනි, මම නුඹට වගකීමක් පවරමි. එක්තරා දවසක මම මොවුන්ට මාර්ගයක් පෙන්නුම් කළෙමි. මොවුන් සමඟ ඒ ගමනට පුත්‍රය, නුඹ ද යා යුතුයි. නුඹලා මාගේ එම ගෘහයට ඇතුළු වන්නට පෙර ස්නානය කළ යුතුයි. මාගේ දරුවෙනි, මා මේ ගමන් මාර්ගය සූදානම් කරනු සඳහා මා පූජක පුත්‍ර මැල්කම් මට අවශ්‍ය තැනට ගෙන ගියෙමි. මාගේ දරුවෙනි, නුඹලා සැම ස්නානය කොට ඔහුට මා දී ඇති බලයෙන් ස්පර්ශ කර ගනිමින් එම බලය තුළින් නුඹලා සැම ආසිරි ගන්වා ගන්න.----මා ආදර දරුවෙනි, ලෝක විනාශය ආරම්භ වී හමාර ය. සැම තැනක ම මා මවන ලද මැවිල්ල විනාශ වෙමින් ඇත. ලෝක විනාශය අවසන් වන්නේ මෙ ලෙසිනි. ජනතාවගෙන් කොටසක් සාගින්න නිසා මිය යති. බලයට කෑදර වෙමින් යුද ගිනි දැල් මැද ජනතාව මිය යති. නොයෙක් වසංගත රෝග, භූමි කම්පා, මාර්ග අනතුරුවලින් ද ජනතාව මිය යති. ලෝක ජනතාවගෙන් ඉතිරි කොටස නැවත සාගින්නකට මුහුණ දෙමින් ලෝක විනාශය අවසන් වෙයි."

**1997 ජුලි 12**

" ----මගේ ජීවන මඟ කටු සහිත ය. උල් කටුවල යන්නා සේ ය. නුඹලාගේ සිත් තුළට ආත්මාර්ථයේ විෂ කටුව ඇතුළු නො වන්නට පරෙස්සම් වන්න. මේ කාලය තුළ බොහෝ සේ මිනිස් ජීවිත විනාශ වන්නේය.----කුරිරුකමින් වෙලෙන්නාගේ දෙ ඇස් වෛරයේ සංකේතය වැනි ය. කරුණාව, දයාව, ඉවසීම මොවුන් තුළින් පලා ගොස් වෛරය ඇතුළු වී ඇත. එමගින් ගලනා රුධිරය නදියක් සේ දිස් වේ. මම ප්‍රේමයේ උල්පත වන්නෙමි. නුඹලා නිසා මා වැගුරුවා වූ රුධිරය අද මුළු ලෝකයෙහි ම ගංඟාවක් බවට පත් ව ඇත. ---- මා පුත්‍ර ඇන්තනි, මම නුඹ ව කාලයක් ජනතාව අතර තබා නැවතත් නුඹ ව නිහඬ නිදහස් කාලයක් තුළ තැබුවෙමි. අවංක සේවයක් සඳහා මම නුඹ ව නිහඬ කර තැබුවෙමි. මාගේ පුතණුව, මම දැන් නුඹට යම් බැරෑරුම් වගකීමක් පවරා ඇත්තෙමි. නුඹට අවංක යැයි සිතෙන මා කෙරෙහි දැඩි විශ්වාසයෙන් පැමිණෙන අය ව පළමුව තෝරා ගන්න. මා නුඹ තෝරා ගත් ආකාරයට නුඹ ද ඔවුන් තෝරා ගෙන මා පෙන්වා දුන් මාර්ගය ආරම්භ කරන්න. එයට පළමුව නැවතත් නුඹ විසින් තෝරා ගත් අය ව මා පූජක පුත්‍ර මැල්කම් වෙත ගෙන ගොස් ස්නානය කර ඔහු ලවා ආසිරි ගන්වා ඉන් පසු අගරදගුරු හමු වී නුඹලාගේ ගමන් මාර්ගය ආසිරි ගන්වා ගෙන ජනතාවට පෙර මඟ සූදානම් කරන්න. කාලය පැමිණ ඇත පුත්‍රය, ඔබට නින්දා අපහාස පැමිණෙනු ඇත."

**1997 ජුලි 14**

"මා ප්‍රේමවන්ත දරුවෙනි, මාගේ හිස මත තැබූ කටු සහිත වළල්ල මාගේ ජීවිතයේ ඔටුන්න විය. මුළු ලෝකය වෙනුවෙන් මා ලැබූ උතුම් ත්‍යාගය මෙය යි. ලොව ගළවා ගන්නට මා ලැබූ උතුම් ම ඔටුන්න එය යි.--- මාගේ මාර්ගය ජනතාවට පෙන්නුම් කරගෙන ඉදිරියෙන් යන්නට මා පුත්‍ර ඇන්තනි ව මම තෝරා ඇත්තෙමි. මා ඔහු තෝරා ඇත්තේ මගේ පෙර මඟ සූදානම් කරන්නා ලෙස යි. තව ද මම නුඹලාට යමක් සටහන් තැබුවෙමි. නුඹලා සැම ස්නානය කරවන්නේ මා පූජක පුත්‍ර මැල්කම් ය. මා පුත්‍ර මැල්කම්, වගකීමක් මා නුඹට පවරා ඇත. නුඹට මා බලයක් දී ඇත. පුත්‍රය, එහි පැමිණෙන මොවුන් ඔබ විසින් ස්නානය කළ යුතුය. ඉන් පසු ඔවුන් ආසිරි ගැන්විය යුතුය. මා පැවසූ දෙයට ඉහළින් අණ දෙන්නට කිසිවකු නැත. මා ජේසුස්."

"මා ආදර දරුවෙනි, මම නුඹලාට මාර්ගය පෙන්නුම් කළෙමි. මා පුත්‍ර ඇන්තනි, මා නුඹ තෝරා ඇත්තේ මාගේ ජනතාවට මඟ පෙන්වමින් මාර්ගය සූදානම් කරන්නට ය. ජනතාවගේ එඩේරා මෙ තැන් පටන් මා පුත්‍ර ඇන්තනි වන්නේය. ප්‍රේමවන්ත පුත්‍රය, මම නුඹ ආසිරි ගන්වමින්

මගේ බලය නුඹ තුළ තබමි. මා නුඹට දෙන පණිවුඩය මෙය යි. **(මාක් 3:1-21, මාක් 6:1-30)** මාගේ මාර්ගය පෙන්නුම් කරමින් නුඹ මාගේ ජනතාව හා එක්ව ගමන් කරන විට නුඹට විඳවන්නට බැරි නින්දා අපහාස අවමන් මේ සියල්ලක් ම නොඅඩුව ලැබෙන්නේය. මා පුත්‍රය මේ සියල්ල පරාජය කරමින් කටු සහිත පඳුරු උඩින් එන්නට සිදු වන්නේය. ප්‍රේමවන්තය, ඔබට අවංක කොටස තෝරා ගෙන මාර්ගය සැලසුම් කරන්න."

**1997 ජුලි 15**

"පිරිසිදු සිතින් ජීවත් වන්න. එවිට නුඹලාට මා පෙන්වන්නා වූ මාර්ගයේ කටු, ගල්-මුල්, නින්දා, අවමන් අපහාස, රැවුම් ගෙරවුම් මේ සියල්ලක් ම ලැබෙන්නේය, මාගේ පා සටහන් තැබූ සෑම තැනකට ම ගමන් කරන්නට ද ලැබෙන්නේය."

**1997 ජුලි 16**

(මෙම සටහන් තුළ ජේසු සමිඳුන් අපට පවසා තිබූ ලෙස මම ඇතුලු දහම් නවෝදය සංඝයේ පිරිසක් වග මීසමේ වැලිකන්න දෙව් මැදුරට ගියෙමු. ඊට පෙර මැල්කම් පිය තුමා අතින් වක් ඔයේ දී ස්නානය ලැබීමු. දෙව් මැදුරේ දී එතුමා අප ආසිරි ගැන්විය. ඉන් පසු අපි එහි දී දිවා භෝජනයට සහභාගි වීමු.)

**1997 ජුලි 17**

"මාගේ වචනය මාගේ ක්‍රියාවන් දුගී පැල්පත්වලින්, බාලයන්ගෙන් අනාවරණය වන්නේය.--- ජීවනයේ සත්‍යයේ මාර්ගයට සුදුසු තැනැත්තේ මම තෝරා ගතිමි. මක්නිසාදයත්, මාගේ වචන ජනතාවගේ හදවතට දෙන්නට තරම් සුදුස්සා ඔහු ය."

**1997 ජුලි 19**

(එය ඇය මගින් සටහන් තැබූ අවසන් දිනය යි. රාත්‍රි 10ට පමණ එහි පැමිණ සිටි සියල්ලන් නිවෙස තුළට කැඳවමින් පහත සඳහන් සටහන ලියා එය මා අත තැබීය.) "මා ප්‍රේමවන්ත පුත්‍රය, මම ඔබට මෙහි සිටින දරුවන් භාර කරමි. මාගේ රාජ්‍ය සඳහා මොවුන්ට සත්‍යයේ මාර්ගය පෙන්වන්න. මම ඔබ සෑම ආසිරි ගන්වමි." (එදින රාත්‍රි 12ට පහත සඳහන් වචන ලියූ සටහන මා අත තබමින් මා ආසිරි ගන්වමින් සටහන් තැබීම අවසන් විය.) "මා ප්‍රේමාන්විත පුත්‍රය, මාගේ දරුවන් සියලු දෙනා ම ඔබට භාර යි. මාගේ ලෝක නායකයා ලෙස මා පුත්‍ර ඇන්තනි ව තෝරා හමාර ය. මම ඔහු ව ලොවට ප්‍රකාශ කරමි."

## 14

## "මාගේ ශ්‍රී රුධිරය තුළ ඇති අපරිමිත බලයෙහි රැඳී පවතින්න."

1997 සැප්තැම්බර් මාසයේ එක් දිනක මම ඇන්තනි මේරි සොයුරිය අමතා මෙසේ කීවෙමි. "පසුගිය වසරේ දී ජේසු සමිඳුන් පැවසුවා මාගේ පෙර මඟ සකස් කරන්නා කියල. මේ වසරේ ජුලි 12-19 අතර කාලය තුළ මුරුතානට පැමිණි අය අතරින් 20 දෙනකුට පමණ ජේසු සමිඳුන් ලිඛිත කැඳවීමක් දී තිබෙනවා, සුජීවාගේ අත් අකුරින්. එහි මෙසේ සටහන් ව තිබෙනවා. **මාගේ පුත්‍රය, මම ඔබ ද කැඳවා ඇත්තෙමි, මා පුත්‍ර ඇන්තනි සමග එක් ව මේ ගමන යන්නට.** සටහන් අතර ලියා තිබෙනවා, එවැනි නම් කීපයක් දුන්නේ මට යම් මුල පිරීමක් කිරීම සඳහා යි කියල. ඒත් තව ම කිසි දෙයක් කළේ නැහැ. එනිසා සැප්තැම්බර් අග අපි සුජීවාත් සමග ගිනිගත්හේනට යමු ද, දින තුනක යාච්ඤාවක් සඳහා?" මේ මොහොතේ එවැන්නක් වීම සුදුසු යැයි ඇය ද අනුමත කළාය. යැදුම සඳහා අපි සැප්තැම්බර් 24, 25, 26 දින තුන යොදා ගතිමු.

ගිනිගත්හේනට යන්නට මා යෝජනා කළේ ඇයි දැයි මා විස්තර කළ යුතුය. පුබුදුව තුළින් මා හඳුනා ගත් පවුලකි, ජෝර්ජ් පෙරේරා, ශීලා පෙරේරා, නිල්මිණී, අසංග, ප්‍රියන්ත. මට හිතන්නට යම් විවේකයක් අවශ්‍ය වූ විට මම ඔවුන් අතරට ගොස් දින කීපයක් ගත කරන්නට පුරුදු වී සිටියෙමි. ඔහු තේ කර්මාන්ත ශාලාවක කළමනාකරුවකු වශයෙන් සේවය කළේය. 1981 දී පළමු වරට මම ඔවුන් අතරට පැමිණියෙමි. එවිට ඔහු සේවය කළේ 'මේෆිල්ඩ්' වත්තේ ය. ඉන් පසු ඔහු 'ලකම්' වත්තේ හා 'ලොනැක්' වත්තේ සේවය කිරීමේ දී මා කීප වරක් ඔවුන් අතරට ගොස් ඇත. එම රැකියාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ව ඔහු ගිනිගත්හේන - නාවලපිටිය මාර්ගය අසල මිල දී ගත් නිවෙසට ද මම ගොස් ඇත්තෙමි. එනිසා යි මා යෝජනා කළේ අපි ගිනිගත්හේනට යමු ද කියලා.

සැප්තැම්බර් 24 වන දින සුජීවා ද ටෙක්ලා ද ඇන්තනි මේරි සහ මම ද ගිනිගත්හේන බලා බසයෙන් පිටත් වුයෙමු. අපි එදින දිව්‍ය පූජා කියවීම් මුල් කරගෙන යැදුමට මුල පිරුවෙමු. පසු දින අපි දවස පුරා යාච්ඤාවේ යෙදුනෙමු. සැප්තැම්බර් 26 සිකුරාදා අලුයම හයට පමණ සුජීවා ජේසු සමිඳුන් සමඟ සංවාදයක යෙදිණි. පෙර මඟ සකස් කරන්නා ලෙස ඇන්තනිට පැවරුණු දූත මෙහෙයේ මුල් කොටස මෙම නිවහන තුළ සිදු විය යුතු බවට එහි දී ජේසු සමිඳුන්ගෙන් අනාවරණයක් ලැබිණි. අපගේ රාත්‍රි යැදුම තුළ ජේසු සමිඳාණෝ අඳුරු බලවේග පලවා හරිමින් ඒ නිවහන දහම් සේවාව සඳහා පවිත්‍ර කළහ.

ජේසු සමිඳුන්ගෙන් ලැබුණු ඒ අනාවරණය ඔස්සේ මම සිතන්නට වීමි. පසුගිය වසර කිපය තුළ කිප දෙනකුට හෝ දහම දීමේ දි මා අත්දුටු ප්‍රධාන ගැටළුව එවිට මට සිහි විය. ජීවිත ගැටළු තුළ ජනතාව අවිවේකි ව සිටිති. එනිසා දහම දීමේ දි ඇති ප්‍රධාන ගැටළුවක් නම් මේ සතියේ දේශනයට සහභාගි වන අයගෙන් සෑහෙන කොටසක් ලබන සතියේ නොපැමිණීමත් අලුත් පිරිසක් ඒ වෙනුවට පැමිණීමත් ය. මෙය මහත් ගැටළුවකි. එනිසා මට සිහිපත් විය. මෙය නො වේද මේ කාලයේ දහම දීමට ඇති හොඳ ම ක්‍රමය කියා. මේ ක්‍රමය නම් පුංචි කණ්ඩායමක් තම සුපුරුදු පරිසරයෙන් ඉවත් ව මෙහි පැමිණ දින හතක් නේවාසික ව නැවති දහමෙන් පන්නරය ලබා ගෙන ආපසු නිවෙස් බලා යාමකි. එම නිවහනේ සියල්ලෝ ද සමිඳුන්ගේ මෙ වැනි සේවාවක් තම නිවසේ සිදු වීම ප්‍රීතියෙන් අනුමත කළහ. දෙවිඳුන්ගේ මහත් අනුග්‍රහය මෙම කාර්යය සමග පැවති නිසා අවස්ථා දෙකකින් එම නිවහන විසි පස් දෙනකුට පමණ නේවාසිකව නැවති ඥානකාන්තිය (ධර්ම විවේකය) කළ හැකි තත්ත්වයට සකස් විය.

1997 නොවැම්බර් 3-9 එහි පළමු ඥානකාන්තිය පැවැත්වීමට හැකි විය. පුබුදුව තුළින් මා ලැබූ පෝෂණය ද, සමිඳුන් අත්දැකීම තුළින් මා ලබා ගත් ප්‍රඥාව ද, ජීවිතය පුරා රැස්කර ගත් බොහෝ හරවත් දෑ ද එක් කර මෙම දින හතේ දේශන සකස් විය. සමිඳුන්ගේ අනුග්‍රහය තුළින් ඊට පන්නරය ලැබිණ. නේවාසික ව සිටින නිසා උදෑසන හා රාත්‍රියේ එක් ව යාච්ඤා කරන්නට ද අවස්ථාව ලැබේ. මෙම පළමු වැනි ඥානකාන්තියට සුජීවා ද සහභාගි වුවාය. නොවැම්බර් 7 වැනි සිකුරාදා අලුයම ඇය ජේසු සමිඳුන් හා සංවාදයක යෙදිණි. එහි දී මෙම අනාවරණය ලැබුණේය. "මා පෙන්වූ ස්ථානයේ මා බලාපොරොත්තු වූ කාර්යය මුල පිරීම ගැන මම ප්‍රසන්න වෙමි. ඇන්තනි තුළින් එන්නේ මාගේ ම වචනය යි."

පළමු වන ඥානකාන්තිය නිම වී සුජීවා තම නිවසේ දින කිපයක් ගත කරන විට ඇයගේ පියාගේ බීමත්කම නිසා ඇති වූ සිත් වේදනාව මුල්කර ගෙන ඇන්තනි මේරි නැවති සිටින පල්ලන්සේනේ 'බෙතෙල්' නිවහනට ඇය පැමිණියාය. ඒ පැමිණි දින ම ඇය හදිසියේ ම තම දෙ සවන් තදින් වසා ගත්තාය. ඉන් පසු තම දෙ අත් කෙමෙන් ලිහිල් කරමින් ජේසු සමිඳාණන් හා සංවාදයට පිවිසුණාය. ඇගේ මුවින් නික්මෙන වචන ඇන්තනි මේරි සොයුරිය සටහන් කර ගත්තාය. එම සටහන උපකාරී විය, ඇයට සමිඳුන්ගෙන් ලැබුණු අනාවරණය මතු කර ගැනීම සඳහා. සුජීවා තදින් කන වසා ගන්නේ ස්වර්ගීය ගී හඬ ඇගේ කනට ඔරොත්තු නොදෙන බැවිනි. පසු ව දෙ අත් ලිහිල් කරන්නේ සමිඳුන් ම ඒ හඬ අඩු කරන බැවිනි. ඉන් පසු සංවාදයට මුල පිරේ. 1997 නොවැම්බර් 17 සිට දෙසැම්බර් 8 දක්වා 'බෙතෙල්' නිවසේ දී ලැබුණු එම අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කිපයක් දැන් ඔබ හමුවේ තබමි.

**1997 නොවැම්බර් 17**

"චණ්ඩ මාරුතය හමාගෙන හමාගෙන එයි. එයට හසු නො වී මාගේ වචනය නමැති විලංගුවෙන් අත් පා විලංගු ලා ගෙන සිටින සේ මා තෝරා ගත් තැනැත්තා තුළින් එන වචනය හද පත්ලට ම තදින් ඇතුල් කර ගන්න. එලෙස විලංගු ලා ගන්නට මම ජනතාවක් තෝරා ගෙන ඇත්තෙමි. තව ද මම මේ කාලය තුළ මැය ව චණ්ඩ මාරුතයකට හසු කර ගෙන මේ ස්ථානය වෙත ගෙනාවෙමි. සති තුනක් මැය මෙහි නැවති සිටිය යුතුය. මැය තුළින් පණිවුඩයක් දෙන්නට මට ඇත." (දින හතේ පන්නරය තුළ මා ඉදිරිපත් කළ 'ගීතාංජලි' පොතේ තාගෝර් තුමාගේ අදහසක් මෙම අනාවරණයේ පදනම වී ඇතැ යි මට සිතේ. "දෙවිඳුනි, මිනිසා මා බඳින හැම බැම්මක් ම කඩා දමන්න. එහෙත් ඔබගේ ආදරයේ විලංගුව නො කඩන්න. එය කැඩුණොත් මට මා නැති වේ.")

**1997 නොවැම්බර් 23**

"මාගේ රුධිරයේ බලය ලොව පුරා පැතිර යන්නේය. එදා මෙන් අද මාගේ පණිවුඩය ප්‍රකාශ කරන්නට මම කෙනකු පත් කළෙමි. දැන් ඔහු එය ආරම්භ කර ඇත. ඔහුට මා දෙන නාමය මම දැන් ප්‍රකාශ කරමි. 'ජනතාවගේ එඬේරා.' නිසි මොහොතේ ජනතාව විසින් නො වේ, මා විසින් ම යි ඔහු ව උසස් කර පත් කරන්නේ. දැනටමත් මා ඔහු ව පත් කර හමාර ය. ඉදිරි කාලය තුළ දී මෙම ගමන යන විට මහත් බාධක පැමිණෙනු ඇත. එම බාධක බිඳගෙන ඉදිරියට ම ගමන් කරන්න. මාගේ දියණිය ඇන්තනි මේරි, ඉදිරි ගමන තුළ මා තෝරා පත් කොට ඇති ජනතාවගේ එඬේරා සමග අත්වැලක් වෙමින් ජනතාවට ආලෝකයක් වන්නට මම ඔබ ද තෝරා ඇත්තෙමි." (ඉන් පසු ජේසු සමිඳුන් ඇරමයික් බසින් ගීතයක් ගැයූ බවත් පසු ව එය සිංහලෙන් ගැයූ බවත් ඇයගෙන් දැන ගතිමි. ඉන් පසු එය අපට ඇසෙන්නට ඇය ලවා ගායනා කරවිය. එහි මෙම වචන ද අන්තර්ගත විය.)

"මහිමයේ මහිමයේ මහිමයේ බලයෙනි,<br>
ඉදිරි ගමන ගෙන එන්නට<br>
මගේ ජනතා ගෙන එන්නට<br>
එඬේරා ව මම දුන්නෙමි."

**1997 නොවැම්බර් 25**

"මා දියණිය, මම නුඹ තුළ පෙනී සිටින්න අවශ්‍ය කාලය තුළ පෙනී සිටිමින් වචනයෙන් පණිවුඩ දුන්නෙමි. නැවත ජනතාවට පණිවුඩ දෙන්නට මට අවශ්‍ය වූ මොහොතේ මා දෙ නෙත් නුඹ දෙ නෙත් ඉදිරියේ තබා මට උවමනා සටහන් තබා ඇත. මේ කාලය තුළ මගේ හඬ ශබ්දයෙන් පමණක් නුඹට කතා කරමි.---- ජුදාස් එදා මා පාවා දීම ගැන ජනතාව ඔහුට දොස් පවරති. එහෙත් එදා සමාජයටත් වඩා අද සමාජය කුරිරු ලෙසින් ය, මා පාවා දෙන්නේ. --- (ඉන් පසු ව ජේසු සමිඳුන් සුජීවාට අභ්‍යාසයක් පවරා ඇත.) "එකමුතුකමේ සංකේතය හැටියට අත මිට මොලවා ඔසවා තිබෙන ලෙස අඳින්න. එය වටා රවුමක් ඇඳ එයින් රැස් විහිදෙනවා අඳින්න. ඒ රවුම උඩ ශුද්ධාත්ම ලකුණ වන පරවියා අඳින්න. පරවි මුවේ සීනුව තබා ගෙන සිටිනවා චිත්‍රයට නඟන්න. එය වලාකුළු මත යි, ඇඳිය යුත්තේ. දෙපැත්තේ දොරටු දෙකක් අඳින්න. එය ඉදිරියට එඬේරා ගමන් කරන ආකාරය අඳින්න. ඊට පිටුපසින් දස දහස් ගණන් ජනතාව එනවා අඳින්න. එම චිත්‍රයෙහි ලියන්න, "**මම මෙහි වැඩ සිටිමි**" කියල."

"එක්තරා කාලයක පූජක ඔස්කා හා ඇන්තනි මගේ ජනතාව සමග සිටියහ. මට අවශ්‍ය විය, ඇන්තනි ව ජනතාවට පණිවුඩ දෙන්නා හැටියට පත් කරන්නට. ඊට අවශ්‍ය ප්‍රඥාව මම ඔහුට දුනිමි. ඔහු තුළින් සත්‍යයේ ප්‍රඥාව ප්‍රකාශ වෙද්දී පූජක පුත්‍ර ඔස්කා සැලකිලිමත් වූයේ තමාගේ තත්ත්වය රැක ගැනීම පිළිබඳව යි. එහි දී ඇන්තනි පීඩාවට පත් වන අයුරු මම බලා සිටියෙමි. මම පූජක ඔස්කා ව අවියක් කර ගෙන ඇන්තනි ව නිහඬ කළෙමි, මට අවශ්‍ය මොහොතේ මතු කර ගනු සඳහා. ඔහුට මාගේ ප්‍රඥාව හා බලය දී ජනතාවගේ එඬේරා ලෙස පත් කළෙමි. මාගේ වචනය ඔහු තුළින් ප්‍රකාශ වන්නේය. ඔහුගෙන් නික්මෙන වචන තුළ විලංගු ලා ගන්න. එය ආහාරයක් ලෙස ගෙන එයින් පෝෂණය වන්න. ඒ වචනය තුළ ජීවත් වන්නා සදාකල් නො මැරෙන්නේය."

**1997 නොවැම්බර් 26**

"වෙහෙසෙන, බර උසුලන සියල්ලෙනි මා වෙත එන්න. මා වෙතට එන්නට මා කෙරෙහි පිපාසයක් සැම දරුවෙක් තුළ ඇති වේවා ! මගේ ගැළවීමදායක ජීවන හුස්ම සදාකල්හි ම රඳා පවතින්නේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ ය. මා ප්‍රේමවන්ත දරුවෙනි, සැම එන්න මා වෙතට. මම දෑත දිගු කොට බලා සිටිමි. මම නපුරා පරාජය කළෙමි. මාගේ ශ්‍රී රුධිරය තුළ ඇති අපරිමිත බලයෙහි රැඳී පවතින්න. මම පරමෝත්තම, සුපරිශුද්ධ ශ්‍රී රුධිරය වෙමි."

**1997 දෙසැම්බර් 04**

"මම නුඹට භයානක රෝගයක් දුන්නොත් නුඹ එය බාර ගන්නවා දැයි මා ඇසූ විට නුඹ බියපත් වුවා නො වේ දැ"යි ජේසු සමිඳුන් ඇගෙන් විමසමින් ඉන් පසු මෙසේ ද පවසා ඇත. "බොහෝ අසනීපවලින් ලොව පුරා බොහෝ දෙනෙක් විඳවති. නුඹ ද ඒ හැම වෙනුවෙන් මා දෙන රෝග බාර ගැනීම අවශ්‍ය යි." යනුවෙන් පවසා ඇත. සුජීවා ඒ සඳහා තම කැමැත්ත ප්‍රකාශ කළාය.

## 15

# 'දහම් නවෝදය' සංඝයේ ගමන් මඟ උදෙසා ජේසු සමිඳුන් විසින් තෝරා ගත් දාසයා, ඩිල්ෂාන් කාරියකරවන.

පල්ලන්සේන මීසමේ ඩිල්ෂාන් කාරියකරවන ඒ වන විට විසි දෙ හැවිරිදි වියේ තරුණයෙකි. ඔහු එදින (1997. 12. 06) 'බෙතෙල්' නිවසට පැමිණියේය. සුජීවා එවිට එහි වූවාය. ඇය එහි සිටින බව ඔහුට කෙනකුගෙන් දැන ගන්නට ලැබී ඇත. 1996, 1997 වසරවල මුරුතානේ ඒ සිදු වීම් ගැන එකල ඔහු උනන්දුවක් නො දැක්විය. එහෙත් එදින ඔහු පැය කීපයක් 'බෙතෙල්' නිවසේ නැවතී සුජීවාගේ එම අත්දැකීම ගැන විමසන්නට උනන්දුවක් දැක්විය. ඔවුන් කතා කරමින් සිටිය දී ම සුජීවා මගින් එදින ජේසු සමිඳුන් දුන් පණිවුඩය මෙය යි.

"උගතුන් ද නැණවතුන් ද බලවතුන් ද ලජ්ජාවට පමුණුවනු පිණිස උගතුන්ගෙන් ද නැණවතුන්ගෙන් ද බලවතුන්ගෙන් ද සඟවා තිබූ රහස් මම බාලයන්ට අනාවරණය කරන්නෙමි." (එවිට සුජීවා ජේසු සමිඳුන්ගෙන් මෙ ලෙස විමසුවාය.) "මගේ වැරදි අඩුපාඩු ගොඩාක් තිබෙද්දි ඇයි පණිවුඩ දෙන්නට ජේසු මා තෝරා ගත්තේ?" එයට ලැබුණු පිළිතුර මෙය යි. "තමා දුබල පව්කාරයන් බව පිළිගන්නා අය තුළ යි, මා ක්‍රියා කරන්නේ. වසර ගණනාවක සිට නුඹ ව මාගේ වචනයේ උපකරණයක් කර ගෙන මගේ ජනතාවට පණිවුඩ දුන් ආකාරයට ම මම මාගේ පණිවුඩ දෙන්නට පුත්‍රයකු ද තෝරා ගතිමි. අද නුඹට ඔහු හමු වූ ආකාරය, නුඹලාගේ අත්දැකීම බෙදා ගත් ආකාරය දෙස මම බලා සිටියෙමි."

"දියණිය, මගේ ඉදිරි කාර්යය සඳහා මා තෝරා ගත් පුත්‍රයා මේ මොහොතේ මෙ තැන සිටී. මම ඔහු ස්පර්ශ කරමි. ඔහු මා පුත්‍ර ඩිල්ෂාන් ය. ---- දියණිය, ඔබ උපත ලැබුවේ අගෝස්තු 29 වන දින නො වේද? මිනිස් බව ගෙන මා මෙ ලොවට උපත ලැබුවේ අගෝස්තු 24 වන දින මැදියම් රැයේ දී ය. ---- මගේ පූජකවරයට ලෝගුව අවශ්‍ය නැත, නිලතල අවශ්‍ය නැත. සත්‍ය මාර්ගය, නිවැරදි දහම ජනතාවට පෙන්වමින් ඔවුන් සමග ඉදිරියට ගමන් කිරීම යි, සැබෑ පූජකවරය."

("මා අඳින්න කියපු චිත්‍රය දැන් ඇඳ අවසන්දැ" යි ජේසු සමිඳුන් ඇගෙන් විමසූ විට "ජේසු ඔබ කියපු විදියට ඇන්දා. එහි තේරුම කුමක්දැ"යි ඇය විමසා ඇත.) "මිට මොලවා ගෙන තිබෙන ඇඟිලි පහ එකමුතුකමේ සංකේතය යි. එම ඇඟිලි පහ ප්‍රේමය, කීකරුකම, බැහැපත්කම, විශ්වාසවන්තකම, හා පූජා වීම යි. සීනුව යනු ලොවට දෙන පණිවුඩය යි. රැස් විහිදීම ශුද්ධාත්ම ආලෝකය යි. මා පසුපසින් ගමන් කිරීම සුදතුම් ගමන යි. මා පසුපස ගමන් කරන ජනතාව පෙර මඟ ජනතාව යි. එම ජනතාවට ස්වර්ගයේ දොරටු විවෘත ව ඇත. ---- මා තෝරා ගත් එඬේරාට එන බාධකය තමයි, උසස් තැන් හී සිටින අය ඇතුළු විශාල පිරිසක් සමග සටනක යෙදෙමින් මා එදා ගිය ගමන එන්නට සිදු වීම."

(එදින සුජීවා 'බෙතෙල්' නිවසේ සිටින බව දැන ගෙන එහි එන්නට හේතුව ඩිල්ෂාන් ඇයට විස්තර කළේය. ඔහුට වැඩුමහල් සහෝදරයෝ දෙ දෙනෙක් ද වැඩුමහල් සහෝදරියෝ ති දෙනෙක් ද වූහ. ඔවුහු විවාහ වී සිටියහ. ඩිල්ෂාන් හා මව පමණ යි, එදින (1997-12-03) නිවසේ සිටියේ. වේලාව රාත්‍රි 10:30ට පමණ ඇත. නිදා ගැනීම සඳහා ඔහු ඇඳේ වැතිර සිටියේය. ඇස් පියවෙන්නට ළං වෙත් ම සුදු සළුවෙන් සැරසුණු කෙනකු ඇඳේ පසෙකින් වාඩි වනු ඔහු දැක ඇත. මුහුණ කෙළින් ම ඔහු දෙසට හරවා නැත. ඒ ජේසුස් යැයි ඔහුට හැඟී ඇත. "ඔබ පාපිෂ්ඨ මනුෂ්‍යයෙකි. එහෙත් මට ඔබ තුළින් ඉටු කර ගන්නට කාර්යයක් ඇත." එතුමන් ඒ වචන පවසනු ඔහුගේ කනට ඇසී ඇත. මෙය ඔහු තිගැස්මට පත් කළේය. නින්ද ඔහු වෙත නො පැමිණේ. ඒ නිසා තමා සමග නිදා සිටි මවට ඔහු එය පවසා ඇත. දෙසැම්බර් 6 වන දින සුජීවා 'බෙතෙල්' නිවසේ ඇතැ යි ඔහු දැනගෙන එහි පැමිණියේ තම අත්දැකීම ඇය සමග බෙදා ගනිමින් ඇයගේ අත්දැකීමට සවන් දීම සඳහා ය.

**1997 දෙසැම්බර් 07**

"මෙ තැන් පටන් මගේ ජනතාවට පණිවුඩ දෙන්නට මා පුත්‍ර ඩිල්ෂාන් මම තෝරා ඇත්තෙමි. මම ප්‍රබල ලෙස ඔහු තුළින් ක්‍රියා කරමි. ඔහුට ද බාධක නින්දා පැමිණෙනු ඇත." ("සටහන් තබා ඇති අනෙක් භාෂා මොනවා දැ"යි සුජීවා ජේසු සමිඳුන්ගෙන් විමසූ විට) "මගේ භාෂාවලින් එක් භාෂාවක් මා විසින් සඟවා ඇත. එහි රහස පසු ව හෙළි වනු ඇත." යනුවෙන් පවසා ඇත. (ඉන් පසු ජේසු සමිඳුන් දහම් නවෝදය සංඝයට තවත් පිරිසක් එක් කරමින්) "ඉදිරියේ දී මෙය දේව කම්ටුව බව සිහියට ගන්න. මෙම සංඝය තුළින් ජනතාවට

මාර්ගය පෙන්නුම් කරමින් යන ගමනක් සඳහා යි, මා නුඹලා ව තෝරා ඇත්තේ. පළමුවෙන් මා පුත්‍ර ඇන්තනි යනුවෙන් ද ඉන් පසු මගේ පෙර මඟ සූදානම් කරන්නා යනුවෙන් ද ඊටත් පසු මගේ ලෝක නායකයා වශයෙන් ද මම ඔහු හැඳින්වීමි. මේ සියල්ල එක් කොට ජනතාවගේ එඬේරා ලෙස ඔහු පත් කළෙමි."

"මේ මුළු මැවිල්ල මා විසින් මවනා ලද්දකි. එහි සැබෑ වෙනසක් කළ හැක්කේ ද මට පමණි. එනිසා මගේ වචනය කෙරෙහි සියල්ලන් තුළ ම පිපාසයක් ඇති වේවා ! මගේ වචනය කෙරෙහි දැඩි කුසගින්නක් ඇති වේවා ! මගේ පණිවුඩ දීම මැයගෙන් පසු මා පුත්‍ර ඩිල්ෂාන්ට පවරමි. මැය හිස් ව මට විවෘත ව සිටි අයුරින් ම ඔබත් හිස් ව මට විවෘත ව සිටින්න." මේ මොහොතේ දී (**1997 දෙසැම්බර් 07 සවස 7ට** පමණ) ජේසු සමිඳුන්ගෙන් අනාවරණයන් දීම ඩිල්ෂාන් මගින් මෙ ලෙස මුල පිරිණි. (ඒ මොහොතේ මම ද එතැන සිටියෙමි. මුළු කාමරය 'ජේසුගේ සුවඳින්' පිරී ගියේය.) "ජේසු මට ගොඩාක් සුවඳ දීලා තුන් වරක් තදින් ආශ්වාස කරන්න කියල කීවා. ඉන් පසු යහවේ කියලා කියන්න කීවා. ඉන් පසු අකුරු ගොඩාක් ඊ. සී. පී පටියක ලියවෙනවා මෙන් පෙනුනා. එහි අරුත මගේ ආත්මයට වැටහුනා. මම එය ශබ්ද නඟා උච්චාරණය කළා. මගේ පව් පිළිගෙන ජීවිත පාපොච්චාරණයකට සූදානම් වන්න කීවා. මෙම වැඩිහිටියන් සමග එකතු වෙන්න කියලා මට පැවසුවා. මට වචන කනට දීලා කතා කරනවා කීවා. පෙනෙන්නට සිටිමින් හිතට කතා කරනවා කීවා".

**1997 දෙසැම්බර් 08**

(සති තුනක අනාවරණයන් අවසන් කළේ මෙසේ ය.) "අද දිනය මගේ මෑණියන් පිළිබඳ මංගල දිනයකි. කන්‍යාවක් හෝ මවක් හැටියට පිරිසිදු මනසකින් යුතුව හිස්ව දෙවිඳුන්ට විවෘත වන හැම වනිතාවකට ම මාගේ මෑණියන්ගේ පසු පසින් එන්නට හැකි බව සිතට ගන්න. මේ ලොව සුපිපි කුසුම සේ මා පියාණන් දුටු මල මරියා ය. මා දුටු සුපිපි කුසුම ද මරියා ය. ඒ අනුව එන්නට හැම වනිතාවකට ම මම ඇරයුම් කරමි.--- වේදනාවෙන් මල පිපෙයි, වේදනාවෙන් සුවඳ හමයි, ඒ පිරිසිදු මල කිසි දින පර නො වී මගේ ඇකයේ හොවා ගන්නෙමි. නුඹලාට මා තුළ ඇති උරුමය එය යි." (සුජීවා 'ජේසුගේ සුවඳ' කියලා කියන්නේ කුමක්දැ යි ජේසු සමිඳුන් ඇයට අනාවරණය කළේ ඒ මොහොතේ දී ය.) "මා නුඹ අබියසට එන විට දැනෙන සුවඳ නම් ඕක් මලේ සුවඳ යි. මගේ කුරුසිය නමැති සිංහාසනය ඕක් ලී කඳකි. ඕක් මල වේදනාවෙන් පිපෙමින් වේදනාවෙන් සුවඳ හමයි. හැම පිරිසිදු නිර්මල හදවතකින් ම මා බලාපොරොත්තු වන්නේ එය යි. මා දියණිය, මගේ ඇකයේ නුඹ හොවා ගන්නට නුඹට මා පෙන්වන මාර්ගයේ ගමන් කරන්න. ---- මගේ ශ්‍රාවකයින්ට මෙසේ කියන්න. දැන් යටපත් වී ඇති මගේ දහම නැවත මතු කරමින් එය අත්දකින ජනතාව එක්රැස් වන මොහොතේ දී ආලෝකයට ඇස් වසාගෙන සිටින අයගේ ඇස් ඇරෙන්නේය."

(ඉන් පසු ජේසු සමිඳුන් සුජීවාට දර්ශනයක් පෙන්වා ඇත. ඊතල හතරක් හතර පැත්තෙන් පැමිණ ඒ මැදට බෝලයක් වගේ දෙයක් පැමිණ නතර වුනා. ඒ ඊතල හතර නතර වුනේ කුරුසිය හැඩයට. "ඒ බෝලය මැද නුඹ දකින්නේ කුමක්දැ"යි ජේසු මගෙන් විමසුවා. මා දැක්කා ලොකු රවුමක් තුළ අමු තුවාලයක් තියෙනවා. "අනේ ජේසු ඒක බලන්නත් බයයි" කියලා මා කීවා.) "එය මුළු ලෝකය වෙනුවෙන් වේදනා විඳින, ප්‍රේම කරන මාගේ දිව්‍ය හෘදය යි. ජනතාව කරන සැම පාපයකින් ම මගේ තුවාල පැරෙමින් මම මහත් වේදනා විඳිමි. ඔබට පෙරටුවෙන් මා තබන පා සටහන මත ඔබ ද පා තබමින් පෙරට ම එන්න. එය මගේ දිව්‍ය හෘදයට දෙන සැනසීමකි. නුඹලාගේ ඉදිරි ගමනේ දී නුඹලාට දෂ්ඨ කරන්නට සර්පයන් ද, විෂ සහිත කටු පඳුරු ද, හිස පොඩිවන තරමට ගල් පහරවල් ද, නින්දා අපහාසයෙන් පිරුණු කෙළ පහරවල් ද නුඹලාට ලැබෙනු ඇත. එහෙත් ප්‍රඥාවෙන් හා පිරිසිදු හදවතකින් යුතු ව ඉදිරියට ම යන්න."

1997 දෙසැම්බර් 12-18 දිනවල ගිනිගත්හේන නිවසේ දී අපගේ දෙ වන ඥානකාන්තිය පැවැත්විණ. එයට ඩිල්ෂාන්, සුජීවා ඇතුළු 13 දෙනෙක් සහභාගි වූහ. වාහනයෙන් බැස එම නිවසට පිවිසීම දක්වා ගමනේ දී ඔවුන් දෙ දෙනා මහත් අපහසුතාවයකට පත් වූහ. (අන් අයගේ ආධාරයෙන් ගමන් කරන තරමට) නිවසට පැමිණි විට ඩිල්ෂාන්ගේ මුවින් නික්මුණු ජේසු සමිඳුන්ගේ පණිවුඩය මෙය යි. "මෙම ස්ථානය ශුද්ධ යි. එය ප්‍රකාශ කරන්නට යි, මගේ දාසයා ද දාසිය ද අපහසු තත්ත්වයට මා විසින් පත් කළේ. මෙය මා සමග යන ගමන කටුක බව පෙන්වන දින හතකි."

ඩිල්ෂාන් 'දහම් නවෝදය' එකතුවට පළමුවෙන් සහභාගි වූයේ **1997 දෙසැම්බර් 21 වන දින** දි ය. එහි දි ඔහු මුවින් ජේසු සමිඳුන් දුන් පණිවුඩය මෙය යි. "නත්තලේ නාමයෙන් ජනතාව අද කරන බොහෝ දේ මාගේ තුවාල නැවත නැවත පැරීමකි. එනිසා කිසිවකුට සුබ නත්තලක්

වේවා! යි ඔබ නො පතන්න. යමෙක් ඔබට සුබ නත්තලක් වේවා! යි පැතුවොත් මනස්ස්ටාපනය වන්න, ජේසුගේ පැමිණීම ළඟ යැයි කියන්න."

(මෙම පණිවුඩය අති උතුම් නික්ලස් මාකස් අගරදගුරු තුමා වෙත මම දැන්වීමි. "ජේසු සමිඳුන් අපට දුන් පළමු වන අභ්‍යාසය ද අපහසු ය. එතුමන් මින් පසු අපට දෙන අභ්‍යාස එකින් එක මීට ද වඩා අපහසු වනු ඇත. එතුමන් අපට පවසන දේ කොතෙක් කටුක වුව ද, අසම්මත වුව ද අපි කරන්නෙමු." යනුවෙන් මම එතුමාට දැන්වීමි. 1996 අනාවරණයන් ජේසු සමිඳුන්ගෙන් බවට අපට අවබෝධ වූ විට මම ඒ ගැන ද එතුමාට මෙ ලෙස ලියා දැන්වීමි. "මෙය ඔබ තුමාට දන්වන්නේ ඔබ තුමා ලවා මෙය අනුමත කර ගැනීමට නො වේ. මෙය ජේසු සමිඳුන්ගෙන් බවට අපි අවබෝධ කර ගෙන සිටිමු. එවැන්නක් ඔබ තුමාට නොදැන්වීම අප විසින් කළ වරදක් බවට අනාගතයේ තීරණය වන්නට හැකි නිසා එම චෝදනාවෙන් මිදෙන පිණිස යි, ඔබ තුමාට මෙය දන්වන්නේ." 1997 සටහන් අතර අප නොදන්නා භාෂාවලින් තබා ඇති සටහන් කිපයක ඡායා පිටපත් ද එතුමා වෙත යැවීමි. මේ සිදු වීම් පිළිබඳ වීඩියෝ පටයක් ද හඬ පටයක් ද යැවීමි. ගිනිගත්හේන ඥානකාන්තිය ඇරඹීමට පෙර එය ද දැන්වීමි. එහෙත් ඒ කිසිවකට පිළිතුරක් නො ලැබිණි.)

**1998 වසරේ** 'දහම් නවෝදය' පළමු වන එකතුව **ජනවාරි 11** වන දින පැවැත්විණි. එහි දී ඩිල්ෂාන් මගින් ජේසු සමිඳුන් දුන් පණිවුඩය මෙය යි. "මම සියලු බාධක ජය ගතිමි. ඔබ මා තුළ සිටින තාක් ඔබ ද ජය ගනු ඇත. ඔබ සියලු දෙනා ම සැම දෙයක් ම සැම මොහොතක් ම උත්ථාන වූ ස්වාමින් වහන්සේට භාර කරන්න. ඔබ සැම දෙවිඳුන් යදින විට මා ඔබ සමග වැඩසිටිනවා යන ඇදහීමෙන් දෑත් දිගු කරන්න. ඔබ වටිනා පුද්ගලයන් බැවින් ඔබගේ වටිනා ජීවිතය දෙවිඳුන්ට භාර දෙන්න. ඔබ ඔබට ම අයිති නැත. මම වසර 33ක් පියාණන් බදා සිටියෙමි: එතුමන් තුළ රැඳී සිටියෙමි. කුරුස ගසේ දී පියාණන් මා අත්හල මොහොතේ යි, මාගේ මනු කය දුටුවේ. එවිට මම 'ඒලි' යි මොරගැසුවෙමි. ඔබ ද මොරගසන්න.---- ඔබගේ ජීවිත ගමනේ දී දේව අම්මා ව අනුගමනය කරන්න. එතුමිය ලැබූ වේදනා ඔබට ද හිමිවනු ඇත.--- ඔබගේ වේශ්‍යා ජීවිතය එකිනෙකට හෙළි කරන්න. එන්න, සදාතනික සුවඳ දුම් පූජාවට. දෙවිඳුන් අති මනහර ය, අති සුවිශුද්ධ ය. ඔබේ තෘෂ්ණාවේ දෑත් කුරුසියට දෙන්න. ඔබ මිට මොළවා ගෙන සිටින දෑත් ලිහිල් කරන්න. නව වසරේ දී ගන්න පියවර මනස්ස්ටාපනය තුළින් දේව රාජ්‍ය කරා." (ඒලි යන ඇරමයික් වචනයේ අරුත "මාගේ දෙවියනි")

## 16

## "ලෝකය කුමක් කිවත් මා නැවත වඩින බව ඊශ්‍රායල් දනිති."

ගිනිගත්හේන නිවසේ දී අපගේ තුන් වන ඥානකාන්තිය 1998 ජනවාරි 12-18 දිනවල පැවැත්විණ. එය ජේසු සමිඳුන්ගේ අනාවරණයන්ගෙන් හා එතුමන්ගේ ක්‍රියාකාරිත්වයෙන් පිරුණු දින හතක් විය. (දින හතේ පන්නරය තුළ ලැබෙන ඉගැන්වීම් ගැන ජේසු සමිඳාණන් මෙ ලෙස ප්‍රකාශ කරමින් ජනවාරි 12ස් වන දින අනාවරණ ඇරඹිණ.) "ඔබට දෙන වචනය ඔහු සිතන පතන දෑ නො ව ජීවමාන මාගේ ම වචනය බව දැන ගන්න. ඔහු මා වෙනුවෙන් පෙනී සිටින මගේ මෙවලමක් පමණි. කාලයාගේ ඇවෑමෙන් මාගේ ජනතාව එනම් ඊශ්‍රායෙල් අවදි වන මොහොතට ඔහු ඔබ සූදානම් කරන්නේය. මාගේ සැරයටිය හා කෙවිට ඔහු තුළ ය. ඔහු දෙසන්නේය ඔහු පහර ගසන්නේය. මෙය ලබන කිසිවෙක් කිසි කලෙක විනාශ නො වන්නේය. මන්ද, ඔහු අහන්නේ කියන්නේ මගේ වචන ය, මා ගැන ය.---- මේ ගමන ඉතා මනහර නැත. එය මනහර වන්නේ ඔබ මා තුළ සිටියොත් පමණි. පල දරන්න නම් ගස පොළොවට සම්බන්ධ ව ඇත්තා සේ ලෝ මැවිල්ලේ අධිපතියාණන් වන දෙවිඳුන්ගේ බැල්මට අවනත වන්න. එවිට සියල්ල සිදු වේ. ලෝකය කුමක් කිවත් මා නැවත වඩින බව ඊශ්‍රායල් දනිති.---- නුඹලා නුඹලාගේ දුක දකින්නාක් මෙන් මා වින්දා වූ, විඳින්නා වූ දුක ද දකින්න." (ශුද්ධ බයිබලයේ නව ගිවිසුමේ ඊශ්‍රායෙල් යනු ජේසු සමිඳුන් තම ගැළවුම්කරුවාණන් ලෙස පිළිගන්නා ලොව පුරා විසිරී සිටින ජනතාව යි. මෙම ප්‍රකාශනයේ ඊශ්‍රායෙල් යන වචනය යෙදෙන්නේ එම අරුතින් පමණි.)

**1998 ජනවාරි 13**

"ඔබ මොරගසා ඉල්ලන දේ ඔබට ලැබෙනු ඇත. ඔබ නොසිතන නොපතන මොහොතක එය ලැබෙන්නේය, වඳ ස්ත්‍රියට දරුවන් ලැබුණාක් මෙනි. ---- මාගේ ප්‍රඥාව ලබා ගන්නට වෙහෙසෙන්න. ඒ සඳහා ඔබ සතු දේ මට දෙන්න. ---- ප්‍රීති වන්නන් සමග ප්‍රීති වන්න, වැළපෙන්නන් සමග වැළපෙන්න. එතැන යි, මා ඇත්තේ. ---- එඬේරෙක් නම් බැටළුවන් පෝෂණය කරයි, රැක බලා ගනියි. එහි නොයෙදෙන්නා කෙසේ නම් එඬේරෙක් වන්නේ ද? ඔහුට කෙවිට ද නැත, සැරයටිය ද නැත. --- ශාරීරික ජීවිතය ලබා ඇතත් ආත්මික ජීවිතය ලබන්නට නම් මාගේ බල මහිමය හා දැක්ම තිබිය යුතුයි. මා එන්නේ මාගේ මැවිල්ල පරිපූර්ණත්වයට පත් කරන්න යි. මගේ සළුවේ වඩින්නට නම් ඔබ මට ප්‍රසන්න වන්න. ---- ජීවිත කාලය තුළ නුඹලා මොන තරම් මා ප්‍රතික්ෂේප කර ඇද්ද? ---- සොබා දහම ඔබ මා දකින ප්‍රධාන සලකුණ යිː මාගේ සොබා දහම තොප විනාශ කර ඇත. තෘෂ්ණාව, වෛරය මුලි"නුපුටා දමන්න. එය නුඹලා ව නාස්ති කරන්නේය."

(ඉන් පසු ඩිල්ෂාන්ට එලියා ද මෝසස් ද දාවිත් ද දකින්නට භාග්‍ය ලැබේ.) "එලියා දැකීමේ භාග්‍ය නුඹ ලබා ඇත. මා දැකීමට තව කාලයක් ඇත්තේය. දිව්‍ය රජාණන් දැකීමට මුරකාවල් රැසක් පසු කළ යුතු ව ඇත. ගලවන්න තෘෂ්ණාවේ පාවහන්. හිස් කරන්න, ඔබේ සිත. සත්‍ය දහම නම් පිරිසිදු චේතනාවත් ඒ සඳහා මොරගැසීමත් ය." ---- "නුඹලා ද ස්වර්ගයට එන්නට නම් අනුගමනය කරන්න කිතු සමිඳුන්ගේ ජීවිත දැක්ම. පෙළ ගැසෙන්න, අවදි වන්න." මේ එලියාගේ පණිවුඩය යි. "දැන් නුඹලාට එඬේරෙක් ඇත. බිය නො වන්න, එඬේරා ඔබ ව රතු මුහුද දෙබෑ කොට ගෙන යනු ඇත." මේ මෝසෙස්ගේ පණිවුඩය යි. "මහා යෝධයින් මැරීමට දෙවිඳුන්ගේ බලය ලැබුවෙමි. දෙවිඳුන්ට විශ්වාසවන්ත වන්න. එඬේරෙක් රජ විය. රජකුට එඬේරෙක් ලැබිණ. ඔබ අත ඇති දෙයින් දෙවිඳුන්ට කැප වන්න. දෙවිඳුන් අවශ්‍ය සුදනන්ට නො ව පාපි අපට ය." මෙය දාවිත්ගේ පණිවුඩය යි.

"නෙරපීම් තෙරපීම් ලබන්නා තුළ මම වැඩෙමි. නෙරපීම් තෙරපීම් කරන්නෝ මමත්වයෙන් වැඩෙති. ---- බිය නො වන්න. මාගේ සුර සේනා පැමිණෙති. ඔබ ළඟ සිට ඔවුහු ඔබ රැකවල් කරති. ඔබ සැමට රැකවරණය මාගේ දූතයින් ය. නුඹ ධර්මිෂ්ඨ වන්නට වන්නට සාතන්ට වේදනාව අධික වන්නේය. ---- හිරු එළිය, වාතය, නුඹලාට නොමිලේ ලැබෙන්නේය. මා ද නුඹලාට නොමිලේ ලැබේ. එනිසා මා නුඹලාට අගයක් නැත. නපුරා දෙන්නේ මුදලට ය. එනිසා ඔබට එය අගනේ ය. එහෙත් සැබවින් ම අගය වන්නේ මාගේ වචනය යි. ---- අති වේගය, අති ඉක්මන ඒ තත්ත්වයට ඔබ එනු ඇත. ගලා යන්නේ මා ය. සිදු විය යුතු තැන දී සියල්ල සිදු වේ.---- පුරාණයේ දකුණු ඉන්දියාවේ කොන වූ මේ ඉසව්ව දහමින් පෝෂණය විය. පසු ව ආක්‍රමණයන්ගෙන් විනාශ විය. මම විජාතීන්ට ද අන්‍ය ආගමිකයන්ට ද ආදරේ වෙමි. ඔවුන් තුළින් ඉටු වන්නේ ද මාගේ සැලැස්ම ය. ලොවේ භාෂා බොහෝ ඇතත් ඇත්තේ එක භාෂාවකි, ඒ ජේසුස් ය.---- දරුවෙනි, මරියාවන් භාර ගන්න ඔබගේ මව ලෙස. ඇය ඔබගේ සැපතේ විපතේ මව යි.---- ඔබ සැම දැන් ගොස් ඔබ ලබා ඇති බෞතිස්මය අලුත් වැඩියා කරපන්න. ඒ සඳහා මෙම වදන් පවසා දියේ ගිලී මා පසසන්න. මහිම ප්‍රතාපවත් අජබාලක රජාණෙනි, ඔබට මහිමය වේවා!"

(සුමිහිරි කුරුළු ගී හඬක් ඇසේ.) "මාගේ ඉතා කුඩා මැවීමක් මට දෙන පැසසුම ඔබ ද අසන්න." (එසේ පවසමින් ජේසු සමිඳාණෝ මොහොතක් නිහඬ වෙති.) "සුර ලොවේ සුර පියේ, අපි අහර ගතිමු, ඔබේ මහඟු ප්‍රේමය පසසා." (එය තාලයට ගයමින්) "මා ගැයුවේ අර පුංචි සතා නඟන ගීත රාවයේ ඇති පණිවුඩය යි. (ජේසු සමිඳාණෝ ඩිල්ෂාන්ගෙන් අසති.) "ඔබ විසි වසරකටත් වඩා ආහාර අනුභව කර ඇත. ඒ ගැන ඔබ මා පැසසුවා ද?" ---- "රෝගී ජනතාව වෙත ගොස් සුවය පතා යදින්න. ප්‍රසිද්ධියේ වත් ප්‍රචාරයට වත් එය නො කරන්න. රහසින් එය දකින පියාණන් වහන්සේ සුව කරන සේක. ---- ජීවිත කළුගල් තලාවේ හිසට ගලක් ද පයට කටු පඳුරක් ද ඇති ව දිවි ගෙවන්න. එවිට සොබා දහම ඔබට විරුද්ධ ව නො ගැටේ. ---- නව ජීවනයේ සමිඳාණන් වන මම ඔබගේ ආශ්වාසයත් සමග ඔබ තුළට සැම දා ඇතුළු වෙමි. සමහරු කැමැත්තෙන් තබා ගනිති. සමහරු අකමැත්තෙන් පිට කරති. ---- මගේ සිරුරේ වණ කැළැල් පන්දහස් පන්සියකට ද අධික විය. මා කුරුසිය මත නිර්වස්ත්‍ර ව එල්ලී සිටි ඒ මොහොත, දිවිය පුරා ම වසා ගත් මාගේ ගත විශාල ජනකායක් ඉදිරියේ නිරාවරණය වූ ඒ මොහොත, සොරකුටත් අන්තව මා ගණන් ගනු ලැබූ ඒ මොහොත, මා වේදනාවෙන් මොරගැසූ ඒ මොහොත. එන්න ඔබත් කල්වාරියට, ඔසවන්න ඔබ දෑත්. සිනායි කන්දට නො ව, එන්න කල්වාරි කඳු මතට. මාගේ පණත ප්‍රේමය යි."

"ඔබට පහර ගසන්නාට දෙ කම්මුල ම දෙන්න. ඔබගේ සතුරාට වැඳ නමස්කාර කරන්න. එය යි, උතුම් ප්‍රේමය. එවිට ඔහු ද ඔබ ද දෙ දෙනා ම මට එක හා සමාන ය. ජුදාස් මම ඔබ නමදිමි.---- මාගේ පියාණන්ගේ මහිමෝත්තම කාදෝෂ් හමුවේ අශුද්ධාත්මයෝ වියවුල් වෙති: බියෙන් පලා යති. ඔබගේ ස්වර්ගීය පියාණන්ට පියාණෙනි කියා අමතන්න. ඔබගේ මෙහෙකරු පියාණෝ ඔබට සවන් දී සිටිති. මා යෙදූ ඒ වචනය ගැන පුදුම නො වන්න. එය සත්‍යයකි." (කාදෝෂ් යනු ජේසු සමිඳුන් එදා කතා කළ ඇරමයික් බසින් ශුද්ධ භාවය යි.) "දකුණු ඉන්දියාවේ කල්කටාවේ ජනතාව දැන් තෙරේසා නැති බැවින් දෙවියන් අප ව අමතක කළේ ඇයි යනුවෙන් මොරගසති. අසරණයින්ගේ විලාපය දකිමින් තෙරේසා සග ලොව සිට ද වැළපෙයි. මළ කඳන් වැනි ජීවිත පවා ඇය අතින් පණ ලැබුවාය. නුඹලාගේ දියුණු යැයි කියා ගන්නා මොළයෙන් දුටුවාට වඩා ඇය මට සේවය කළාය. ඇය ජරාජීර්ණ මුඩුක්කුවට බැස්සාය. එම විය ගස ම නුඹලාත් කරට ගනිල්ලා. සාතන් නුඹලා ව වලක්වයි. ඒත් නොබිය ව ගන්න කුරුසිය."

(කුරුළු යුවලකගේ මිහිරි ගීත රාවය ඇසේ. ඩිල්ෂාන්ගේ මුවින් නික්මෙන සමිඳුන්ගේ හඬ මොහොතකට නවති. අපට ද කුරුළු ගීතය අසන්නට අවස්ථාව දෙන්නට මෙනි.) "කුඩා සත්ව යුවලක් මට කරන ප්‍රශංසාව ඔබට ඇසේ ද? ඔවුන්ට පුතෙක් ලැබී ඇත. ඒ ගැන ඔවුහු මා පසසති. '**සුර පියේ ඔබ පසසන්නෙමු, ඔබ අපට දුන් පුතු නිසා, ඔබ දුන් පුතු නැවත ඔබ සුරතට පවරමු. සුරකිනු මැන ඔහු සැමදා.**' නුඹලා කවදා එම පැසසුමට හවුල් වන්නහු ද? නුඹලාට මා දුන් දරුවන් නුඹලා එලෙස මට කවදා භාර දෙන්නහු ද? දරුවකු ලැබූ විට දෙ මව්පියෝ ඔවුන්ගේ නම් වාසගම් යොදා ගනිති. එහෙත් කුරුළු ලොව දෙස බලන්න. ඔවුන්ගේ මුළු රක්ෂණ සහයෝගය මාගෙන් ය. මුළු විශ්වය මොහොතින් මොහොතට මට පැසසුම් දෙයි. එහෙත් මාගේ අවයව වන ජනතාව මා නො හඳුනති. මනසක් බුද්ධියක් ඇති ඔබට තිරිසනුන්ටත් වඩා අන්ත විය හැකි ද? නුඹලාගේ ප්‍රති ප්‍රේමයේ බැල්ම මා වෙත එන තුරු මම පිපාසා වෙමි. සිරේනියේ සීමන් වෙන්න හැම දෙන, අනුන්ගේ කුරුසියට. ---- තව මොහොතකින් ස්වර්ගයෙන් හඬක් නික්මෙන්නේය. 'නිදහස් වෙන්න, ගැළවෙන්න, ජේසුස් යන නාමය කියන්න' මේ මොහොතේ සුර දූතයෝ දස දහස් ගණන් ආත්මයන් ස්වර්ගයට රැගෙන එති. නුඹලාගේ මිය ගිය නෑයන් හිත මිතුරන් සිහි කරමින් ඔවුන් වෙනුවෙන් මා ඉදිරියේ දැන් මධ්‍යස්ථ වන්න."

**1998 ජනවාරි 14**

"මාගෙන් වෙන් ව තනිව ම නුඹලාට කිසිවක් කළ නොහැකි බව, තරයේ සිතට ගන්න. එවිට නුඹලා තුළ ඇති වන්නා වූ පිපාසය සංසිඳුවන්නට මම එන්නෙමි. මේ මොහොතේ මුළු ලොව සිසාරා, මුළු මිනිස් සංහතියෙන් නැගෙන රාවයට වඩා සුර දූතයින්ගෙන්, මහා සයුරෙන්, වන මෘගයන්ගෙන්, මුළු මැවිල්ලෙන් මට දෙන උත්තරීතර නාමය යි, ජේසුස්. ඔවුන් විනාශ වුවත් මිය ගියත් ඔවුන්ට කම් නැත. ඔවුන්ගේ පැතුම අරමුණ ජේසුස්. 'සුවිශුද්ධ ය, මහෝත්තම අජබාලකයාණන්ට මහිමය වේවා! සුවිශුද්ධ ය', ස්වර්ගයේ ප්‍රීති නාදය මෙය යි. ---- නුඹලා සිතන පතන කියන කරන තීරණ ගන්න පිළිවෙල ස්වර්ගයේ බැටළු පෝතකයාණන්ට පෙනෙන බව සිතට ගන්න. නුඹගේ නිදහස් කැමැත්ත තුළ මම නුඹේ එඬේරා නම් මා සැරයටියෙන් ද, කෙවිටෙන් ද, පෝෂණය වන්න, පන්නරය ලබන්න. ---- මාගේ දරුවෙනි, මම නුඹලාට ප්‍රේම කරමි. නුඹලා මට ප්‍රේම කරන්නහු නම්, මම නුඹලාගේ ජීවිත ගෘහයට ඇතුළු වන්නෙමි. මට ඔබේ ඇතුලාන්ත සිතේ පුංචි ඉඩක් දෙන්න. මට ඔබ තුළ නිදන යහන් ඇවැසි නැත, කසී සළු ඇවැසි නැත. ඔබ ද නිතර මෙ ලෙස කියන්න. මහිම ප්‍රතාපවත් උත්තම දේව අජබාලකයාණෙනි, ඔබට මහිමය වේවා! පව්කාර මා ඔබ වෙත නගන්නා වූ මේ මොරගැසීම ඔබ දෙ සවනට යොමු වේවා! මාගේ පාපී දිවියෙන් ගැළවුම ලබන්නට ඔබ දුන් වරප්‍රසාදයට ඔබට නිති පැසසුම් වේවා!"

"මා සැරයටිය කෙවිට දුන්නේ නුඹලාගේ සුදු පියාට යි. මේ වන විට ඔහු මට මහත් සේ මොරගසන්නේය. 'ජේසු, ඔබ ම බැස වදාරන්න, මට නො හැකියි, දැන් කිසිවක් කරන්නට.' නුඹලාගේ සුදු පියා ඔහුගේ ජෙත්සමෙනියේ පැය ගෙවමින් සිටී. ඔහු වෙනුවෙන් යදින්න. ---- නුඹලා මුළු මැවිල්ල ම වසංගතයට ද විනාශයට ද නතු කර ඇත. මා නො වේ ලොවේ විනාශය ඇති කළේ, නුඹලා ය. නෝවාට මෙන් නුඹලාට මම නැවතත් අවස්ථාවක් දෙමි. ---- නුඹලාගේ සියලු වේදනාවන් හඳුනන්නා වූ ස්වාමීන් වහන්සේ මම වෙමි. වේදනා ලැබෙන විට බොහෝ අය මට මැසිවිලි නගමින් බොරු දෙවිවරුන් පස්සේ යති. එලෙස මෝඩකම් නො කරන්න. ---- (ඩිල්ෂාන්ගේ හඬින් ජේසු සමිඳාණෝ මෙම වදන් ගැයූහ.) 'සිතන පතන සිතුම් පැතුම් ජේසුට බාරයි, අදත් මතුත් මගේ දිවිය ම ජේසුට බාරයි.' ඔබගේ ජීවිතය තුළ මා ඉහත පැවසූ වදන් මෙනෙහි කරන්න. එවිට යි, මට ඔබ තුළට ඒමටත් ඔබ තුළ ක්‍රියා කිරීමටත් හැකි වන්නේ.---- ලොව බොහෝ භාෂා ඇතත් එකම භාෂාව ජේසුස් ය. නුඹ අන් භාෂා ගැන කරදර නො වන්න.---- බැහැපත් කමේ උතුම් ආදර්ශය මරියා ය. නුඹලාගේ මව මරියා ය. උත්කෘෂ්ඨ වූ ද අති සුගන්ධ

වත් වූ ද පුෂ්පය මරියා ය. ඇය අද මට මොරගසන්නීය. අනේ! පියාණෙනි, ඔවුන්ට කමා වන්න. එලෙස මොරගසමින් නුඹලාගේ පැවැත්ම උදෙසා ඇය වැළපෙන්නීය.''

(ඩිල්ෂාන්ගේ මුවින් ජේසු සමිඳාණෝ මෙසේ ගැයූහ.) "උත්තම බල මහිමය ජේසුස්, ඔබගේ සළු සෙවනේ සිටින්න මට හරි ආසයි ජේසු, මා හඳුනති සැම දා මගේ දරුවෝ, මගේ ලෙය හඳුනති, මගේ දරුවෝ, සුවඳ ය සැම දා මා හට මගේ දරුවෝ. ---- සියලු ව්‍යසනයන් මැද ඔබේ සිත තුළත් තොල මතත් ජේසුස් යන නාමය තබා ගන්න. මහා බැටළු පෝතකයාත් මහා බැටළු එඬේරාත් ජේසුස් ය. ---- නුඹලා ගොස් ඊශ්‍රායෙල්ට මාගේ පණිවුඩය දෙන්න. අන්නාස්, කයිපාස්ගේ, පිලාත්ගේ ඔටුනු සුණු විසුණු වනු ඇත. අන්නාස්, කයිපාස්ගේ, සීසර්ගේ කාසි විසිරී යනු ඇත. තව දින __ ලොවේ විනාශයේ අවි ආයුධ නුඹලාට ඉහළින් නැගෙන්නේය. ජනතාවගෙන් ---ක් මෙ ලොවට ආදරයෙන් පස බදා ගෙන පොළොවට ගිලා බසිති. මා තෝරා ගත් දැහැමි එඬේරා ඒ මොහොතේ මා අමතයි. 'පියාණෙනි, විශ්වය ම දෙදරයි.' එවිට ඔහු මා දකී: ඔහු මා නො දකී. මගේ ජල කඳ හා ගොඩ බිම එක් වන්නේය. එවිට නුඹලා මාගේ මුහුණ සොයනු ඇත. බොහෝ දෙනා නුඹලාට පරුෂ වචනයෙන් බැන වදින්නෝය: ගල්-මුල්වලින් පහර දෙන්නෝය. නුඹලාගේ දෑත් මාගේ වණ කැළලින් විවෘත වන්නේය. එය දකින්නෝ සුවය ලබන්නෝය. ග්‍රහයින් එකිනෙකා මත ගැටී විනාශ වී සුන්නද්දූලි වන්නේය. මෙය ඔබට අනාවැකියකි.'' ("ලෝක විනාශය පිළිබඳ මා පැවසූ, මාගේ මෑණියන් පැවසූ සියල්ල සිදු වන්නේය. එහෙත් දින වකවානු වෙනස් වන්නේය. එනිසා දින වකවානු හා සංඛ්‍යා ලේඛන සඳහන් නො කරන්නැ''යි ජේසු සමිඳුන් අපට පැවසූ නිසා ඉහත සඳහන් අනාවැකියේ ද දින වකවානු හා සංඛ්‍යා ලේඛන සඳහන් නො කළෙමි.)

(එදින **1998 ජනවාරි 14** වන බදාදා ප.ව. 2.50ට ඩිල්ෂාන්ගේ මුවින් ජේසු සමිඳුන්ගේ මෙම වදන් නික්මිණ. "දරුවෙනි මට තෙල් කුලාව දෙන්න.'' එවිට ශුද්ධ වූ තෛලය මිශ්‍ර ඔලිව් තෙල් බඳුන ඇන්තනි මේරි සොයුරිය ඩිල්ෂාන් අත තැබුවාය. මම පළමුවෙන් ඥානකාන්තියට පැමිණි සියල්ලන් ද ඉන් පසු එම නිවසේ අය ද එම ආලේපය සඳහා යොමු කළෙමි. ජේසු සමිඳාණෝ එකිනෙකාගේ නළල මත ශුද්ධ වූ තෛලය ආලේප කරමින් වචන කීපයකින් හෝ එකිනෙකා ඇමතූහ. අවසානයේ මම දණ ගැසුවෙමි. එවිට ඩිල්ෂාන්ගේ මුවින් මෙම වදන් නික්මිණ.) "මා පුත්‍රය, නුඹ ව ආලේප කරන්නේ මා පුත්‍ර ඩිල්ෂාන් නො ව ජීවමාන ජේසුස් වන මම ය.'' (ඉන් පසු එතුමාණෝ මහත් හඬින් මෙසේ පැවසූහ.) "දෙ වන සුදු සබය අවසන් වේ. තුන් වන සුදු සබය ඇරඹේ. ලෝක එඬේරාණන් ආලේප කරනු ලබයි. ස්වර්ගීය ජනතාව සිය අසුන්වලින් නැගී සිටිති. සුර දූතයෝ ප්‍රීති ඝෝෂා පවත්වති. දකුණු ඉන්දියාවේ දකුණු පුරුකේ වෙසෙන ලෝක එඬේරාණෙනි, මම ඔබ ආලේප කරමි.'' (එසේ පවසමින් මගේ නළල මත ශුද්ධ වූ තෛලයෙන් කුරුසියේ සලකුණ තබමින් එතුමාණෝ මා ආසිරි ගැන්වූහ. ඉන් පසු ඩිල්ෂාන් මා අබියස දණ ගසා "ලෝක එඬේරාණෙනි, මා ආලේප කළ මැනව.'' යනුවෙන් පැවසීය. මා ඔහුගේ නළලේ තෙල් බිඳක් තැවරුවා මට මතකය. මන්ද, සිදු වූ දෙයින් මම ද තිගැස්සී සිටියෙමි.)

**1998 ජනවාරි 15 සවස 4ට පමණ**

"නුඹලා මෙහි එක්රැස් වූයේ මා හැඳින ගන්නට ය. නුඹලා අති භාග්‍යවන්ත ය. මම නුඹලා තුළ වැජඹෙමි. අති බලසම්පන්න අවි ආයුධවලින් මම නුඹලා සරසමි. නුඹලාගේ දෑතේ පලිහ ද කඩුව ද ජේසුස් ය. සියලු දෙනා ම ජේසුස් යන නාමයෙන් මොරගසන්න. නුඹලා එකිනෙකාගේ දෙ කන්වලට ජේසුස් යන නාමයෙන් මොරගසන්න. ජේසුස් යන මාගේ උත්තම පූජක නාමය නුඹලා සුව කරනු ඇත: නුඹලා නිදහස් කරනු ඇත. ---- ඔබ සිරගත වූ විට ද සිඛරයෙන් ප්‍රපාතයට ඇද වැටෙන විට ද නුඹේ සිතේ ද නුඹේ තොල් මත ද තබා ගත යුතු නාමය ජේසුස්.---- නුඹලා මගේ ගෘහයට පැමිණෙන විට මට නමස්කාර කර මෙසේ පවසන්න. 'අනේ ස්වාමිනී, මාගේ තෘෂ්ණාවේ වහන් ගලවා දමන්න.'---- සබතේ යාගය ද ස්වර්ගයේ යාගය ම බැවින් එයට සහභාගි වන්න. ---- මා නුවන් නිරන්තරයෙන් නුඹලාට විවෘත ව ඇත. නුඹලාට උපරිමයෙන් ආදරය කළ හැක්කේ මට පමණි. ආදරයේ උපරිමය මම පමණක් ම වෙමි. ---- ලොවට රබ්බි ලෙසින් යා යුතු එඬේරා දැන් මා තුළ ඇත. ඔහු තුළ මම රබ්බී වෙමි. මීට වසර පනස් අටකට පෙර දකුණු ඉන්දියාවේ දකුණු පුරුකෙන් බිහි වූ මා ලෝක එඬේරා, රබ්බී ලෙසින් අභිෂේක වන්නේය. එහෙත්, මට හැර අන් කිසිවකුට රබ්බී යැයි නො කියන්න.'' (රබ්බි යනු ඇරමයික් බසින් ගුරුවරයා.)

"අග්‍ර පූජකයාණන් වන මා නැවත මෙ ලොවට වඩිනා බව දන්නා ඔබ ගොස් ඒ සඳහා ජනතාව සූදානම් කරන්න. ඒ සඳහා ඔබ මුවේ මී බිඳුවක් ලෙස තබා ගත යුතු නාමය ජේසුස් ය. ---- මුළු සොබා දහම මා නම පසසමින් උදම් අනයි. නිලඹරේ පක්ෂීහු ද සප්ත සයුරේ

මත්ස්‍යයෝ ද එකිනෙකා මුවෙන් මුව ගැටී ජේසුස් යන මාගේ නාමය කොඳුරති. කොටියා තුළ බැටළුවා ද බැටළුවා තුළ කොටියා ද වෙලෙන මොහොත උදා වෙමින් පවතී. ---- මරියාවන් සිය ඇතුලාන්ත සිතේ මා නිදන් කර ගත්තාක් මෙන් නුඹලාගේ ඇතුලාන්ත සිතේ මා නිදන් කර ගන්න."

"විශ්ව මැවුම්කරුවාණන් වන සැබෑ එක ම දෙවිඳාණෝ මම වෙමි. ආගමික ශාස්තෘවරුන් ලෙස මා මෙ ලොවට එවූ සියලු දෙනා ද මාගේ මැවීමක් පමණි. ඔවුහු මට පවසති, ඔවුන් දෙසූ දහම අද ලොවට ප්‍රමාණවත් නැති බව. ඔවුහු මගෙන් අයැදිති, අද ලොවට නැවත වඩිනා ලෙස. දරුවෙනි, මාගේ පැමිණීම ඉතා ආසන්න යි. සියලු අන්‍යාගමික දේව රූපවලින් මාගේ සියලු බැල්ම මා මේ මොහොතේ සිට මා වෙත යොමු කර ඇත්තේය. එනිසා නුඹලා වෙතට පැමිණෙන ජනතාව වැළඳ ගෙන ඔවුන් මාගේ ගැළවීම වෙත යොමු කරපන්න. මාගේ සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත පරිදි ඒ සියල්ල සිදු වන බව මම ප්‍රකාශ කරමි. විශ්ව නිර්මාතෘවරයාණන් වන සැබෑ එක ම දෙවිඳාණන් තම ප්‍රේමවන්ත පියාණන් ලෙස පිළිගනිමින් එතුමන් තුළ ප්‍රේමවන්ත පුත්‍ර භාවය අත්දකිමින් සියලු භේද දුරලා එකම මිනිස් පවුලක් මෙන් සැබෑ සහෝදරත්වයකින් බැඳෙන මාගේ කාදෝෂ් බයිබ්ලෝස් දහම් පණිවුඩය වෙත ජනතාව ඒකරාශි වන්නාහ. එය ඉදිරි යුගය පිළිබඳ මාගේ පියාණන්ගේ සැලැස්ම යි."

"ලොව මහා ජාතියක් නැත, මහා භාෂාවක් නැත. මහා ජාතියත් මහා භාෂාවත් Jesus ය. දිනෙක සිල්වත්තු වැළපෙති, අපේ ශීලයෙන් වූ පලය කුමක් ද කියා. ---- මම ධර්මිෂ්ඨයින් සියයක් රැස් වන තුරු බලා සිටිමි. ලෝක එඬේරාණෙනි, ඔබේ ධර්මිෂ්ඨ ගණයට ජනයා රැස් කරන්න. දැනටමත් එය සිදු වෙමින් පවතී. ---- ඔබ මේ පරිසරයෙන් වෙන් ව යන්නට මත්තෙන් සොබා දහම දෙස සාන්ත සිතින් සුළු මොහොතක් හෝ බලා ඔබ කෙලෙස මාගේ මැවීමේ වර්ධනයට හවුල් වී ද යන්න සිතා බලන්න. ---- නුඹ ගොස් ප්‍රීති වන්නන් සමග ප්‍රීති වන්න. ශෝක වන්නන් සමග ශෝක වන්න. ඒ තුළ මම ජීවමාන වෙමි. ---- ශාපලත් දේශපාලුවන් ඇනකොටා ගන්නේ තමන් රජ වෙන්නට ය. ඔවුන් මරා දමන්නේ වළලන්නේ මාගේ දරුවන් ය. මාගේ දරුවෝ කෑ මොර දෙති. ඔවුහු වෙඩි මුගුරු ඔවුන් වෙත විසි කරති. හිරේ විලංගුවේ ලැගිය යුතු බොහෝ දෙනා රටේ ඉහළ තානාන්තරවල වැජඹෙති. මගේ අහිංසක දරුවෝ හිර ගෙදර අපා දුක් විඳිති. දුක් විඳින්නන් තුළ මම සදාතනික වෙමි."

**1998 ජනවාරි 16**

"ඇතුලාන්ත හිස් භාවයෙන් යුතු ව විවෘත ව නුඹලා මට දෙන උදෑසන ද මොහොත ද මම අගය කරමි. අද ලෝ සිසාරා ජනතාව ඔවුනොවුන්ගේ ලෞකික දියුණුව තකා ම වැඩ කරති. --- නුඹලාට සහය පතා ලොව පුරා තවත් පිබිදීම් රැසක් ගොඩ නැගෙනු ඇත. එහෙත් නුඹලා ප්‍රබල යි, විශාල යි කියා නො සිතන්න. කුඩා දේ තුළ මා විශාල ය. ---- නපුරාගේ ක්‍රියාකාරීත්වය තුළින් පාපය අධික වන විට අනුග්‍රහය ඊටත් වඩා අධික වන මොහොත පැමිණෙනු ඇත. එනිසා අනුන් විනිශ්චයෙන් වළකින්න. ---- විෂ කටු ඇත්තේ නුඹේ මුඛයෙහි ය. කටු නැති දිව සිර කර ගන්න. ඔබේ ලොකු ම කුරුසිය කට ය. මා දේව පුත්‍රයා වුව ද මා ගමන් ගත් මඟ මගේ මරණය දක්වා ම නපුරා ද ගමන් කළේය. නපුරා දැන් සදාකාල පරාජිතයෙකි. මා විසින් පරාජය කළ නපුරා නුඹලා විසින් ද පරාජය කරමින් පෙරට ම යන්න. ---- දකුණු ඉන්දියාවේ දකුණු කෝරළේ සිටි එඬේරා, මා අභිෂේක ලත් පූජක පිය තෝමස් මා ශ්‍රී වත මඬල අබියස සිට රටට සාමය උදා කරන ලෙස ඉල්ලා මට මොරගසයි. ඔහුගේ ආධ්‍යාත්මිකත්වයට සම වුවෙක් දකුණු ආසියාවේ එඬේරික වගකීම පැවරුණු අය අතරින් ඉන් පසු බිහි නො විය." (ඒ අති උතුම් තෝමස් කුරේ කාදිනල් තුමා පිළිබඳව යි.)

"අද වනාහි මාගේ තවත් දිනයකි. මින් ඉදිරියට සෑම සිකුරාදාවක ම වේදනාවේ කොටස්කරුවෝ හැටියට වේදනා විඳිත් වා! අද දින රාත්‍රියේ ආහාර අනුභවයෙන් වැළකී සියලුම වැඩ කොටස් නිමා කර ලොව නිසසල මොහොතේ මා යදිනු මැනව. මා තිත්ත කාඩි පානය කළ බැවින් ලොවේ අග්‍රය වන නුඹලා සිකුරාදා රාත්‍රියේ පානීය සැලසුම් කරන්නේ නම් ජලයට ලුණු ස්වල්පයක් යොදා ගන්න. ඉන් පසු මනස්ස්ථාපනයේ විලාශයෙන් මා සමග එකතු වන්න. ජෙත්සමෙනි මල් උයන කරා මම ආත්මානුභාවයෙන් ඔබ ගෙන යන්නෙමි. ---- නුඹගේ පාපය ගැන මට මොරගසන්න. මම නුඹ මධ්‍යයේ වැඩසිටිමි. නුඹ මෙතෙක් කිසි විටෙකත් දීර්ඝ ව සුදුසු ව, නිවැරදි ව නුඹගේ නපුර ගැන මනස්ස්ථාපනය වී නැත. එවැන්නක් ඔබගෙන් සිදු විය යුතුය. ---- මා පූජක පුත්‍ර බෙනඩික් මා සග ලොව හිමිකරුවෙකි. ඔහුගේ දුක මට ද දුකක් වූ කල ඔහු ව මා තුරුළේ හොවා ගත්තෙමි. 'දහම් නවෝදය' නො මඟ නො යන බව ඔහු මට කීවේය. ඔහුගේ ගමන් මඟ අනුව යන්න. ඔහුට තිබූ දෑ මෙනෙහි කරන්න. ඔහු නිවැරදි මාගේ ගෝලයෙක් යැයි මම ප්‍රකාශ කරමි." (ඒ වචන දහම් නවෝදයේ පළමු වන සම්බන්ධීකරණ පිය තුමා ගැන යි.) "තෙ

වන සුදු සබය ඇරඹුන ලෝක එඬේරාණන් ආලේප කළ මෙම නිවහන මින් පසු ලොව උත්තරීතර නිවහන වන්නේය, මෙම ස්ථානය අනාගත ලෝකය විසින් නරඹනු ඇත. ---- මා තෝරා ගත් සංඝයේ ශ්‍රාවකයින් වන නුඹලා විසිරෙන විට මුළු පෘථිවි තලය ම කම්පා වේ. ඒ මොහොත ආසන්න බැවින් නුඹලා බිය නො වන්න. නුඹලා මට සුවඳ දුම් පුජා නොකළාට කම් නැත. ලොව සියලු ප්‍රශංසාවලට වඩා නුඹලාගේ ප්‍රශංසාව මම මහා ඉහළින් අගය කරමි.---- විනාශයේ දොරටුවට හිස යොමු කර සිටින සුදු සබය දෙදරයි, කඩා වැටෙයි. මාගේ ගෘහය වන තුන් වන සුදු සබය තැනීමට එයින් එක ගලක් වත් නො ගන්න. මාගේ සුදු සබය නාස්ති කරන්නට ඔවුන් ද දායක වූ බව පිළිගෙන සැබෑ මනස්ස්ථාපනයක් තුළින් ඔවුන්ට හැරී එන්නට හැකිය.” (ජේසු සමිඳුන්ගේ එදා ශ්‍රාවකයින්ගේ නම්වලින් ම අප සංඝයේ ශ්‍රාවකයින් නම් කළේ ද එදින යි. එහෙත් එලෙස ඇමතීමට බලය ඇත්තේ ජේසු සමිඳුන්ට පමණකි.)

“නුඹලාට මංගල බොජුනක් සාතන් සුදානම් කර ඇත. සාතන්ගේ බොජුන රසවත් ය. එහෙත් කිසිවකු එයින් කිසිවක් නො වළඳන්න. ---- නුඹලාට මෑතක දී මහා ආහාර හිඟයකට හා ජල හිඟයකට ද මුහුණ දෙන්නට සිදු වන්නේය. පසු කාලීන ව නුඹලා මාගේ නාමයෙන් පමණක් පෝෂණය වන්නාහුය. ---- ඔබ බාහිර ව ධර්මිෂ්ඨ යි කියා වත්, සද්ධන්ත යි කියා වත්, සමිඳුන් ලැබුවා යැයි කියා වත් පුරසාරමේ නො යෙදෙන්න. සමිඳුනි, මගේ දෑත් දෙපා ද මා මුව ද සියලු දෑ ද ආශිර්වාද කළ මැනව. පව්කාරයකු වූ මා අමතක නොකළ මැනව. ඔබ වහන්සේගේ අවයවයන් අපි නො වෙමු ද? මෙය ඔබගේ පැතුම විය යුතුය. ---- මා පැමිණියේ සුදනන් උදෙසා නො ව දුදනන් උදෙසා යඃ පාපීන් හා රෝගීන් උදෙසා ය. ---- නුඹලා ජාති භේද, ආගම් භේද, කුල භේද ඇතුළු සියළු භේදවලින් භේද භින්න ව සිටින්නහුය. මහා ජාතිය මහා ආගම කියමින් සුළු ජාතීන් හා අන්‍යාගමිකයන් පහත් කර හෙලා-තලා කතා කරන්නහුය. නුඹලා මහා විනාශයන්ට මුහුණ දෙනු ඇත.”

## 17

## “මම සමිඳු එඬේරා දූත මෙහෙය නමින් නවක පූජක පැලැන්තියක් අරඹමි.”

‘දහම් නවෝදය’ සංඝයේ විශේෂ එකතුවක් 1998 ජනවාරි 21 වන දින පැවැත්විණ. අපගේ තුන් වන ඥානකාන්තියේ දී ලැබුණු ජේසු සමිඳුන්ගේ අනාවරණයන් සංඝය හා බෙදා ගැනීම එදින එකතුවේ පරමාර්ථය විය. “මා පියාණන්ගේ කැමැත්ත ඉටු වීම උදෙසා කල්වාරි දිවි පිදීමෙන් උදා කළ ගැළවීම වෙත සියල්ලන් යොමු කරනු සඳහා මම නුඹලා තෝරා පත් කළෙමි. ---- මාගේ සියලු ප්‍රේමවන්ත ගෝලයිනි, මා කුරුස ගසේ වින්දා වූ දුක් වේදනාවලට ඉතා සමගාමී වේදනාවන් නුඹලාට පැවරෙතත් මා කැඳවන ගමන නුඹලා ඉතසිතින් භාර ගන්නහු ද?” (ශ්‍රාවකයන් ‘එසේය’ යනුවෙන් පිළිතුරු දුන් පසු ඔවුන් මධ්‍යයේ සිට ඩිල්ෂාන්ගේ මුවින් ජේසු සමිඳාණෝ මෙසේ යාච්ඤා කළහ.)

“මාගේ ශ්‍රාවකයින් වන ඔබ සැම දෙව් මහෝත්තමයාණන් අබියස වැඳ වැටී මෙසේ පවසත් වා! පියාණෙනි, මාගේ වරද ය, මාගේ මහත් වරද ය, ඔබවහන්සේගේ දයානුකම්පාව පව්කාර වූ අප දෙස මහත් දයාවෙන් පෙන්වා වදාළ මැනව. ස්වාමිනි, ඔබ වහන්සේගේ කැමැත්ත එය නම් එසේ සිද්ධ වේවා යි මොරගසමින් අපි ස්වාමින් වන දෙව් මහෝත්තමයාණන් වහන්සේට වැඳ නමස්කාර කරමු. ඔබගේ මහත් ආදරය නිසා මනුෂ්‍යත්වය දීමෙන් ද ලෞකික තෘෂ්ණාවේ පාපී මුලාවෙන් ද ඔබ වහන්සේ අප සුවපත් කළ සේක. මාගේ පියාණෙනි, ඔබ වහන්සේගේ අණට නතු වන්නටත් ඔබ වහන්සේගේ නාමය අප මුවගෙහි තබන්නටත් පව්කාර වූ අප තෝරා ගැනීම උදෙසා අබ්බා පියාණෙනි, ඔබට වැඳ නමස්කාර කර ස්තුති ප්‍රශංසා කරමු. ඔබ වහන්සේගේ කැමැත්තට නතු වන්නටත් ඔබ තුළ ම මොර ගසමින් පැමිණෙන සැම දුක් වේදනා උසුලන්නටත් දුබල පාපී ලෝකයෙන් උපත ලද මම ඔබ වහන්සේ මධ්‍යයෙහි මොරගසමි. දයාබර පියාණෙනි, ඔබගේ මහත් ආදරය උදෙසා ඔබ අප තෝරා පත් කළ සේක් ද ඔබ දුන් කැඳවීමට සුදානම් වන්නට ද වේදනාවේ කටුක මාවතේ විඳවීම් සියල්ල තුළ ම ඔබ වහන්සේ ජීවමාන බැවින් අබ්බා පියාණෙනි, ඔබට නතු වන්නට ද මම පොරොන්දු දෙමි. අප මධ්‍යයේ වැඩවසන අපගේ එඬේරාණන් වන අපගේ මාර්ග උපදේශකයාණන් වන අපගේ රබ්බී උතුමන්ට මහිමය සදාකාලයෙන් සදාකාලයට ම හෝසානා! අති ශුද්ධ වූ පියාණෙනි, ඔබට සදා මහිමය අත් වේවා!”

(ඒ අසල දේවස්ථානයක ශුද්ධ වූ සෙබස්තියන් මුනිඳුන්ගේ මංගල්ලය උත්සව ශ්‍රියෙන් පැවැත් විණ. ජේසු සමිඳාණෝ තම දාසයාගේ මුවින් මෙලෙස පැවසූහ)

"පෙරදින දෙක තුළ නුඹලාගේ බැතියෙන් පිදුම් ලද තැනැත්තා සග ලොව සිට කරන මොරගැසීම මම දැන් නුඹලාට මෙ ලෙස ඇසෙන්නට සලස්වමි." (යාච්ඤාවක ස්වරූපයෙන් තාලයට ගයමින්)

"මා දිවි ගමනේ දී වේදනාවෙන් ද ජීවිත පූජාවෙන් ද දෙවි සමිඳුනි, මම ඔබ වෙතට පැමිණියෙමි. මගේ තරුණ වියේ දී මගේ ජීවිත පූජාවෙන් මම ඔබ වැළඳ ගත්තෙමි. අනේ ! ජේසුනි, ඔබගේ නාමයට සාක්ෂි දරන්නට ගොස් මා මියැදුන විට ඔබ වහන්සේ ඔබගේ ශුද්ධ වූ බල හස්තයෙන් මා ඔබ වෙතට කැඳවා ගත් සේක. අන්‍ය ජාතිකයන් ද අන්‍ය ආගමිකයන් ද මධ්‍යයේ මම ඔබ වහන්සේගේ නාමය මහත් පුරසාරමින් අගයමින් ද ඔබගේ නාමයට සාක්ෂි දරමින් ද ඔබගේ නාමය මාගේ ස්වාමින් වහන්සේ ලෙස ප්‍රකාශ කරමින් ද අබ්බා, ඒලි යනුවෙන් මොරගසමින් ද මම මරණය වැළඳ ගත්තෙමි. මගේ ජීවිත පූජාව තුළින් ඔබ වහන්සේ මට දුන්නා වූ උතුම් ස්ථානයෙන් මා පහකර එම ස්ථානයට ශුද්ධ වූ පියාණෙනි, ඔබ වහන්සේ ම වැඩම කරන මෙන් මම බැගෑපත් ව අයැද සිටිමි. මගේ නම ද ගම ද කටුගා දමමින් මා අමතක කරමින් ඔබ තුළ මා සඟවා ගත මැනව. ඔබගේ මහිමාන්විත පැමිණීමේ දී මා පූර්ණත්වය ලබන බව සත්‍යයකි. එතෙක් මා අසම්පූර්ණ නිසා සුවඳ දුමින් මාගේ ප්‍රතිමා ආසිරි නොගන්වන ලෙස ඔබගේ පූජක පුතණුවන්ට අනාවරණය වුව මැනව. ඔවුන් කරන මෙම උපහාරයන් සුං කර අබ්බා පියාණෙනි, මා ද සුණු විසුණු කර මා නැවතත් ඔබ වහන්සේගේ පව්කාරයන්ගේ මධ්‍යයට ගෙන යන මෙන් මම ඔබ වහන්සේට මොරගසමි. ඔවුන් ඔබ වහන්සේ ඉදිරියෙහි ඔබගේ පා පිස්නක් වෙමින් ඔබ අබියස ඔවුන් වේදනාවෙන් තැවෙමින් පොඩිවෙමින් ඔවුන්ගේ ඕනෑ එපාකම් ඔබ වහන්සේගෙන් පමණක් ම ඉල්ලන්නට සැලැස්වුව මැනව. පියාණෙනි, ඔබගේ දූතයන්ගේ ශුද්ධ වූ ගීත රාවයෙන් ද මා නෙරපා දැමුව මැනව. අබ්බා පියාණෙනි, විශ්ව මැවීමේ අධිපතියාණෙනි, ඔබගේ වහන් පටි ලිහන්නට වත් නුසුදුසු මා ඔබ අබියස සිටින්නට වත් ඉඩ නොසැලසුව මැනව. මැවුම්කරුවාණන් වන ඔබ තුළින් ම විනා ඔබ මැවූ විශ්වයේ කිසිදු මැවීමක් තුළින් ඔවුන්ට කිසි රැකවරණයක් නොමැති බව ඔවුන්ට ඒත්තු ගැන්වුව මැනව."

(මෙම ප්‍රකාශනය ගැන නැවත අවධානය යොමු කළ මොහොතේ ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "ශුද්ධවන්තයාගේ මංගල්‍ය දවසේ සිදු වන දහම් විරෝධී පුහු මංගල ඝෝෂාව ඔහුට දකින්නට සලස්වමි. මගේ උත්ථානයේ මංගල දින ඇති උත්සව ශ්‍රියෙන් තොර ඇල්මැරුණු බව ද පෙන්වමි. එවිට ශුද්ධවන්තයෝ සග ලොව සිට මෙ ලෙස මොරගසති. එනිසා ඔවුහු මට අතිශයින් ප්‍රසන්න වෙති.)

**4 වන ඥානකාන්තියේ දී** ඩිල්ෂාන් මගින් ලැබුණු ජේසු සමිඳුන්ගේ අනාවරණයන් දැන් ඔබ ඉදිරියේ තබමි.

**1998 ජනවාරි 28**

"උදහස ද තරවටුව ද මාගේ ප්‍රේමයේ එක් පැතිකඩකි. මාගේ ප්‍රේමයේ ගැඹුර නුඹලා කවදා තේරුම් ගන්නහු ද? නුඹලාට මාගේ පැසසුම් හා සෝ සුසුම්. ---- ලොවේ විනාශය නුඹලා අවට දිස් වන බැවින් නුඹලාගේ එඬේරා වටා රොක් වන්න. මා තෝරා ගත් ගෝලයින්ට මම මාගේ සහෝදරයින් යැයි කියමි. එනිසා කිසිවකු අනෙකා විනිශ්චය කිරීමෙන් වලකින්න. නුඹ තුළ නුඹ විශාල වන තරමට මට නුඹ තුළ වැඩෙන්නට නො හැකිය. නුඹලා කුඩා වන තරමට මම නුඹලා තුළ විශාල වෙමි. මා ඔබ තුළ විශාල වන්නට නම් ඔබ ඔබ තුළ නැති විය යුතුය. ---- නුඹලාගේ ජීවිත කුරුසියට වඩා මා නුඹලාට ගැළවීම ගෙනා මාගේ කුරුසියේ වේදනාව නුඹලාට නො පෙනේ ද? එය නුඹලාට පෙනෙනවා නම් මෙ පමණ කාලයක් නුඹලා මා වෙනුවෙන් කුමක් කළාහු ද? ---- නුඹ අසරණයකු තලා-පෙලා හඬවන විට නුඹ මෙය දැන සිටියෙහි ද? සියල්ල කරන්නේ මා හට බැවින් පරිස්සම් වන්න. නුඹලා මට කැප වන්නහු නම් මාගේ නියමයන් නුඹලා තුළ ඉටු වනු ඇත.---- එකිනෙකාට ප්‍රේමයේ ගිවිසුම් තබා ගන්න. ඊශ්‍රායෙල්ගේ පාපය මා කෙරෙහි ගෙන මාගේ දිවි පිදීමෙන් මම මිලය ගෙවීමි. එහෙත් නුඹලාගේ පාපී ක්‍රියාවන් නිසා මා ළය අද ද වේදනා විඳී."

"ඔබ සැම දැන් ගොස් ඔබ ලබා ඇති බෞතිස්මය අලුත් කරපන්න. ඒ සඳහා මෙම වදන් පවසා දියේ ගිලී මා පසසන්න.--- ගැළවුම්කරුවාණන් වූ ද මා ජීවිතයේ එඬේරාණන් හා ස්වාමියාණන් ද වන අග්‍ර පූජක ජේසුස් ස්වාමින් වහන්ස, ලොවේ මහා පාපිෂ්ඨයකු ඇද්ද ඒ මා බව මා පිළිගන්නා බවත් මා මේ තාක් අනුන් විනිශ්චය කරමින් මා සුදනා යැයි කියමින් සිටි කාලය අදින් නිමා කරන බවත් මින් මත්තට මා ඔබගේ ම දෑතේ ආයුධයක් වී ඔබගේ ම කැමැත්ත අනුව ඇමෙන්නට සැලසුම් වන්නට සිතා අධිෂ්ඨානයෙන් ක්‍රියා කරන දරුවකු වීමට කැමැත්තෙමි. මාගේ පියාණෙනි, පාපිෂ්ඨ මා ඔබ වහන්සේ තුළට කැඳවා ගත මැනව. මා ඔබ වහන්සේගේ ධර්මිෂ්ඨකමට ඇතුල් කළ මැනව, ආමෙන්" (ඥානකාන්තියට සහභාගි වූ අය මේ

යැදුම සටහන් කර ගෙන මහවැලි ගඟේ කරවටක් බැස ගෞරවයෙන් මෙම යැදුම පවසා දියේ ගිලී ස්නානය කළහ. ඉන් පසු පැවැත් වූ බොහෝ ඥානකාන්තිවල දී බෞතිස්මය අලුත් කරනු සඳහා මා තෝරා ගත්තේ මෙම යැදුම යි. ජේසු සමිඳාණෝ තව දුරටත් මෙසේ පැවසූහ. "මාගේ ප්‍රමුඛ සභාව තුළ ළදරු වියේ සිදු වන බෞතිස්මය මට ප්‍රසන්න ය. එහෙත් වැඩිහිටියන් ලෙස, තම ජීවිතයේ ගැළවුම්කරුවාණන් ද එඬේරාණන් ද ස්වාමියාණන් ද ලෙස ඔබ මා පිළිගන්නා මොහොතේ බෞතිස්මය මෙ ලෙස අලුත් කරනවාට මම කැමැත්තෙමි.)

**1998 ජනවාරි 30 සිකුරාදා දින**

"සියල්ලෝ සියල්ල පොදුවේ තබා ගනිත් වා. මක්නිසාද, නුඹලා අතරින් මම 'සමිඳු එඬේරා දූත මෙහෙය' නමින් නවක පූජක පැලැන්තියක් අරඹමි. තාපස මෙන් ම අසරණ සරණයෙන් ද දුගී භාවයෙන් ද නුඹලාගේ සේවාවන් පවත්වා ගනින්න.---- ඔබ ගොස් දිළිඳුන් අතර වාසය කරමින් අන් අයට සේවය ද රෝගී අයට උපස්ථාන ද කරමින් මා දියණිය තෙරේසා මෙන් ගත කරන්න. ලොව අස්සක් මුල්ලක් නෑර මෙම සේවයෙහි යෙදෙන්න. යමක් ලැබුණොත් එයින් යම් සේවයක් කරන්න. නිතර ම මා තුළ යැපෙන්න. ---- මම  මෙ ලෙස අරඹමින් ලොව පුරා සමිඳු එඬේරා දූත මෙහෙය විහිදුවමි. ඒ සඳහා මාගේ ධර්මිෂ්ඨ එඬේරාගේ පන්නරය ලබන්න."

(ඉන් පසු ඩිල්ෂාන් තුළින් ජේසු සමිඳාණෝ යමක් ලියන්නට අවශ්‍ය බවට ඉඟියක් දුන්හ. කොළ හා පෑනක් සැපයූ පසු ජේසු සමිඳාණෝ මෙ ලෙස සටහන් තැබූහ. එය සිදු වූයේ රාත්‍රි යැදුම තුළ 10:30ට පමණ ය. එලෙස සටහන් තැබූ වචන දැන් මම ඔබ ඉදිරියේ තබමි.) "ක්‍රි.ව. 1998 ජනවාරි 30 'සමිඳු එඬේරා දූත මෙහෙවර' ආරම්භ කරන ලදි, මෙහි අරමුණ හා ආරම්භකයා ජේසුස්, නිහතමානී, එකමුතු, කීකරු, අවංක, දිළිඳු, පිරිසිදු, පරමාර්ථය වන්නේ දිළිඳුන්ට සේවය ඊශ්‍රායලය සූදානම් කිරීම ධර්මිෂ්ඨයන් ඇති කිරීම, කැමති අයුරින් සරල ඇඳුම් හා දිවි පෙවෙත ගත කරන්න, කැපී පෙනෙන මෙන් ම තද පාට නො ගන්න, මා තුළ ජීවත් වන්න. පසු ව සමිඳු එඬේරා දූත මෙහෙවරට අවශ්‍ය අය පත් කර ගැනීම එඬේරාට පවරමි. කුඩා කුරුසියක් අවශ්‍ය නම් පමණක් පාවිච්චි කරන්න, පිළිවෙල සඳහා." (මෙම ප්‍රකාශනය ජේසු සමිඳුන්ගේ අවධානයට නැවත යොමු වූ මොහොතේ එතුමෝ මෙ ලෙස පැවසූහ. "බාහිරව කුරුසයක් ප්‍රදර්ශනය කිරීම පවා මට අවශ්‍ය නො වේ. මට අවශ්‍ය වන්නේ මගේ කුරුසිය හෙවත් තම අයිතිවාසිකම්වලට, තම ආශාවන්ට, තම කැමැත්තට මරණයක් වන කුරුසියේ මාර්ගය ඔබගේ හදවත් සිංහාසනයේ ජයග්‍රාහී ලෙස තබා ගැනීම යි.")

"මාගේ ඊශ්‍රායලය ප්‍රමුදිත වනු ඇත. ඊශ්‍රායලයේ මිදීම උදෙසා එදා මා අවමන් විඳ දිවි පිදූ මොහොත ඔබට මතක ද? ---- සමිඳු එඬේරා දූත මෙහෙවරේ ධර්මිෂ්ඨ එඬේරාණෙනි, ඔබ නුදුරු අනාගතයේ දී මුළු විශ්වයේ මාගේ වචනයේ ද දූත මෙහෙවරේ ද මුළු සේවාවෙහි ද යෙදෙන බැවින් තම ස්වාමියාණන් හා ගැළවුම්කරුවාණන් ලෙස මා පිළිගන්නා දරු දැරියන් ඔබ ඉතා හොඳින් මෙනෙහි කර පූජක සහෝදර සහෝදරියන් ලෙස මාගේ සේවයෙහි යොදවන්න. මතු කල සියල්ල නිසි ලෙස සිදු වන බැවින් බිය නො වන්න. නුඹලා අත ඇති දෙයින් ද අන් අය දෙන දෙයින් ද යැපෙමින් දිළිඳුන් ද රෝගීන් ද රැක බලා ගන්න. නුඹලා අන් අය මෙන් අගනා වස්ත්‍රාභරණයන්ගෙන් නො සැරසෙන්න. මා තුළ යැපෙමින් දිළිඳුකමේ අවංකකමේ චේතනා තුළින් සරල ලෙස ජීවත් වෙයන්න. නුඹලාගේ සමිඳු එඬේරා දූත මෙහෙවර තුළ මාගේ මාතාවන් නියෝජනය වන ලෙස ඇයගේ ජීවිතාදර්ශය අනුව දිවි ගෙවාපන්න. නුඹලා යමකුට යමක් පවසන්න කලින් එහි ලා නුඹලා ම ජීවත් වෙයන්න. දෙව්පියාණන්ට කීකරු වන්නට අවනත වන්නට සියල්ලන්ට උගන් වන්න."

**1998 ජනවාරි 31**

"මගේ සමිඳු එඬේරා දූත මෙහෙය ක්‍රියාත්මක කිරීම සඳහාත් එහි දී මුහුණ පාන්නට සිදු වන සියලු ම ගැටළුවලට නොබිය ව මුහුණ දීම සඳහාත් අවශ්‍ය මාගේ පන්නරය ලබා ගනු පිණිස නුඹලාගේ ඇතුළු කුටියට වැදී මා සමග කන්නලව්වෙන් ජීවත් වෙයන්න. ඉන් පසු මා පූජක පිය නික්ලස් හමු වී ආසිරි ගන්වා ගන්න. එහි දී නුඹලා මට දිව්රුම් දී මා සමග සමිඳු එඬේරා දූත මෙහෙවර අරඹාපන්න. එය දිව්‍ය සත්ප්‍රසාදිය මෙහෙයක් තුළ නො ව බයිබලීය මෙහෙයක් තුළ සිදු කරපන්න. නුඹලාගේ දෙමාපිය නෑදෑයන්ගෙන් සමු ගෙන නුඹලා ඔවුන්ගෙන් කිසිවක් නොගෙන මා තුළ යැපෙන්නට යන බව ඔවුන්ට දන්වන්න. යමෙක් නුඹලාගෙන් මේ ගැන විමසුවොත් මා විසින් දෙන ලද නියමයන් අනුව දෙ වන පැමිණීමට මාගේ ජනතාව සූදානම් කරනු සඳහා මෙය අරඹන ලද බව පවසන්න. මා නුඹලාට පැවරූ සියල්ල කරගෙන යන්න. පරිසිවාදයේ මුහුන්වලින් ප්‍රවේශම් වන්න. නුඹලා අන් අය කෙරෙහි බැහැපත් වන්න.---- ඔබ සැම කා බී ප්‍රීති වන්න. මක්නිසාදයත්, මාගේ තෙ වන සුදු සබය ආරම්භ වී ඇති බැවින් තගේ ස්වාමියාට

ඔල්වරසන් දෙන්න. රොන් උරනු සඳහා සුවඳ මලට බඹරුන් රැස්වන්නාක් මෙන් මාගේ ජ්‍යශ්‍රායලය නුඹලා වටා රොක් වනු ඇත. මාගේ ධර්මිෂ්ඨයන් ලෙස නුඹලා මාගේ නව පූජක පැලැන්තිය අරඹන්න. ---- නුඹලාගේ වාසස්ථානයේ සදාකාලයට ම මාගේ සක්‍රමේන්තුව ස්ථාපිත කරපන්න. ඉදිරි කාලයේ දී මා සියල්ල කරන්නේ දිව්‍ය සත්ප්‍රසාදය මාර්ගයෙනි. මා දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන බැවින් නුඹලාගේ වාසස්ථානය තුළ මා ජීවමාන කරපන්න. නුඹලාගේ ජීවිතය අන් අයට ආදර්ශයක් වන අයුරින් මාගේ දැවෙන පහන් සේ නුඹලා ජීවිත සාක්ෂිය අරඹාපන්න."

"නුඹලාගේ පොරොන්දු ප්‍රකාශනය තුළ මෙ වැනි වදන් ඇතුළු විය යුතුය. අබ්බා පියාණෙනි, දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩසිටින දිව්‍ය එඬේරාණෙනි, ඔබ තුළ යැපෙමින් අන් අයගේ හිත සුව සඳහා කැප වෙන බවට සමිඳු එඬේරා පූජක සංඝය ඔබ මධ්‍යයේ පොරොන්දු දෙති. ඔබ තුළ කටයුතු කරමින් මෙම පුංචි සංඝය ලොව පුරා ව්‍යාප්ත වනු ඇත. ඔබ වහන්සේ බැහැපත්කමේ පරමාදර්ශය වුවාක් මෙන් බැහැපත්කමින් සැරසී ඔබගේ පූජකයන් ලෙස ඔබ ළයෙහි වෙසෙමින් පාපයෙන් ද සියලු රෝගයන්ගෙන් ද අබල-දුබල වූ සියල්ලන් අප ළයෙහි හොවා ගෙන සේවය කිරීමට අපි පොරොන්දු වන්නෙමු: ඔබ මාතාවන් වන නිර්මල මරිය තුමිය හා බැඳී කටයුතු කරන්නට ද පොරොන්දු වන්නෙමු. සියලු කටයුතුවල දී මරිය මාතාවන් සේ ඔබ තුළ පවතිමින් ඔබගෙන් ම යැපෙමින් ඔබ තුළ පමණක් ක්‍රියා කරන්නට අපි පොරොන්දු වන්නෙමු. අබ්බා පියාණෙනි, ඔබෙන් ගැලූ රුධිර බිඳුවක් සේ උණුසුම්ව ද ජ්වලිතව ද මෙම මෙහෙයෙහි නියැලෙන්නට පොරොන්දු වන්නෙමු. ත්‍රිත්වික පියාණෙනි, සදාකාලික රජාණෙනි, ඔබට කීකරු වන්නට මම පොරොන්දු වෙමි. කිසි දිනක මට ඔබගෙන් වෙන් වීමට ඉඩ නුදුන මැනව. මගේ සිත තුළ, හද තුළ, අත් බව තුළ ඔබ පමණක් ම සමිඳු දෙවිඳාණන් වන බැවින් ඔබට විවෘත වන්නට සැලැස්වුව මැනව. ඔබ වහන්සේ තුළ ම ජීවත් වී ඔබ වහන්සේ තුළ ම මිය යාමට මම පොරොන්දු වෙමි. ආමෙන්."

"සමිඳු එඬේරා සංඝයේ පූජක පුතුනි, පූජක දියණියනි, සැරයටිය ද කල්වාරි කුරුසිය ද නුඹලාගේ සංකේතය බව සිහි තබා ගන්න. ---- මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලා මවා ඇති-දැඩි කළ දිව්‍ය එඬේරා මම වෙමි. නුඹලාගේ ජීවිත සුරක්ෂිත භාවය මම වෙමි. මින් පසු නුඹලා හිතන, කියන, කරන සියලු දේ මා තුළ, මාගේ නාමය තුළ ම පවතිවා! නුඹලා සැම මාගේ සෝ සුසුම්වලින් සදාකාලික වන බැවින් ප්‍රීති වන්න."

## 18

## "නපුරාගේ මංගල බොජුනින් කිසිවක් නො වළඳන්න."

'දහම් නවෝදය' සංඝයේ එකතු කිපයක දී ඩිල්ෂාන් උපයෝගි කර ගනිමින් ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයකි, මේ.

**1998 පෙබරවාරි 08**

"---- ගල් පහරින් ද නින්දා අපහාසවලින් ද නුඹලා ව ආරක්ෂා කිරීමට නපුරා සැරසෙන්නේය. එයට හසු නො වන්න. නපුරාගේ මංගල බොජුනින් කිසිවක් නො වළඳන්න. මාගේ රුධිර පූජාසනය කඩා බිඳ දමා වෙනත් ආකාරයේ පූජාසනයන් ඉදි කරන්නට මේ මොහොතේ සැරසෙමින් නපුරා අද වෙහෙසට පත් වන්නේය. නපුරා ද යම් කලෙක ජීවමාන ස්වාමින් වහන්සේ අතන ය, ජීවමාන ස්වාමින් වහන්සේ මෙ තැන ය කියමින් ජනතාව රැස් කරන්නේය. නපුරා නුඹලා ඉදිරියෙන් යමින් ඔහුගේ නියම ස්වරූපයෙන් නො ව ආලෝකයේ දූතයෙක් මෙන් ව්‍යාජ රංගනයක යෙදෙමින් මඟ දිලෙන මුරටැඹක් මෙන් ද ආකාශයේ නොයෙක් ආකාරයේ ප්‍රදර්ශන දක්වමින් ද ලොව සිසාරා ගිනි ලන්නට ඔහු සැරසෙන්නේය. පරාජිත නපුරා දැන් වියරු වැටෙමින් ඔහුගේ වලිගයට ගිනි අවුලුවා ගනිමින් හිස් ලූ ලූ අත දුවන්නේය. නුඹලාගේ දිව්‍ය එඬේරාණන් ජීවමාන බව අමතක නො කරපන්න. එඬේරා ව වළ දැම්මේ පැය හැත්තෑ දෙකකට පමණි. මම මරණය ජය ගෙන උත්ථාන වුයෙමි. ---- නුඹලා පාපිෂ්ඨ යැයි කියා යමකු ඔබට චෝදනා කරන්නේ ද එවිට ඔබ ඔහුට කිව යුත්තේ මෙය යි. නුඹගේ පාපිෂ්ඨ භාවය නුඹ අවංක ව මනස්ස්ථාපනයෙන් මෙනෙහි කරපන්න. ගැළවීම එතැන ය, සමිඳාණන් වහන්සේ එතැන ය. ---- නුඹ නොබිය ව නුඹගේ ආලේප ලත් මුඛයේ ඇත්තා වූ මී බිඳුව වන ජේසුස් යන නාමය ප්‍රකාශයට පත් කරපන්න. ලෝ සිසාරා නුඹලා යම් කලෙක විසිරෙන විට ද මාගේ නාමය පමණක් ගෙන යන්න.--- මාගේ ශ්‍රාවකයින් වන නුඹලා රැස් වන විට නුඹලා අතරින් යමෙක් නෙරපෙන්නේ ද තැවෙන්නේ ද ඔහු තුළ නපුරා පුදුමාකාර බලවේග ආකාරයෙන් ක්‍රියා කරන්නේය."

**1998 පෙබරවාරි 11**

"මා පියාණන් මැවූ මුළු විශ්වය දෙදරා යාමේ මොහොත ගැන මා දින වකවානු කෙසේ ඔබට දුන්නත් ඒවා යම් කලෙක නිනිවේ මෙන් වන්නට පුළුවන. මන්දයත්, මා හැම දේ ම කියන්නේ නුඹලාට ඇති මාගේ ප්‍රේමයේ පැතිකඩයේ ක්‍රියාකාරිත්වය උදෙසා ය. එම පැතිකඩය නම් ඔබගේ අවංක මනස්ස්ථාපනය මගින් ඔබ මා වෙත දිනා ගැනීම ය. මා අසීමිත ප්‍රේමයේ දෙවිඳාණන් බැවින් ද ඔබගේ ආදරණීය මිතුරා බැවින් ද මට ළං වන්නට උත්සාහ කරපන්න. මම නුඹලා ව මොන යම් විදියකින් හෝ මාගේ ප්‍රේමයේ බැම්මට හසු කර ගැනීමේ චේතනාවෙන් පමණක් සියල්ල කියන කරන බව අමතක නො කරපන්න. එහෙත් කිසිවකු ඇදබැඳගෙන ද තද කර ගෙන ද ගැළවීම දෙන්නට මා සූදානම් නැත. නුඹ කෙලෙස මා හට ඉඩ දෙන්නේ ද මා නුඹ තුළ විශාල වන්නේ එවිට ය. ---- මා සක්‍රමේන්තු ආකාරයෙන් ජීවමාන ව වැඩසිටින සියලු සත්ප්‍රසාද මණ්ඩප තුළින් මම එහි නොයෙක් ආකාරයේ ක්‍රියාවන්වල යෙදෙමින් මනුෂ්‍යයා සූදානම් කිරීමේ කටයුතුවල යෙදෙන්නෙමි. ---- යම් තැනක් ගිනි ලන්නට තමා ජේසුස් යැයි කියමින් සාතන් මාගේ සළුපිළි පැළඳ ගෙන පැමිණෙන විට ඔහු සාතන් බව ඔබ නොබිය ව ප්‍රකාශ කරපන්න. --- නුඹලාට ගසන ගල් අහුලා නැවත ඔවුන්ට ම දෙන්න. ඒ ගල් අහුලා නුඹලා ඔවුන්ට දෙන විට ඔවුන් එයින් තමන්ට ම ගසා ගෙන ඔවුන්ගේ ඇතුලාන්ත තෘෂ්ණාවේ වේශ්‍යා ජීවිතය ඔවුන්ගේ ළය තලා ගනිමින් ද විලාප නගමින් ද නුඹලාට ප්‍රකාශ කරන විට නුඹලා ඔවුන් ව ප්‍රේමයෙන් වැළඳ ගෙන ඔවුන්ට වැඳ නමස්කාර කරපන්න. එවිට නුඹලා ද ඔවුන් ද මට එක සමාන බව මම නැවත නැවත ද කියමි.---- මේ වන විට මුළු විශ්වය තුළ මා මාතාවන් සැරිසරමින් ද මාගේ දර්ශනයන් එකිනෙකා දකිමින් ද එනිසා ජනතාව ඔවුන්ගේ ජීවිත ඇතුලාන්තය වෙනස් කර ගනිමින් ද පවතින්නේය."

**1998 පෙබරවාරි 15**

"එදා ඊශ්‍රායල් ජනතාව මා ප්‍රතික්ෂේප කළහ. මගේ ශ්‍රාවකයින් වන නුඹලාත් ප්‍රතික්ෂේපයේ ලකුණක් කොට හමාර ය. එහෙත් නොබියව නොසැලී ඔබගේ කටයුතු කරගෙන යන්න. මම නුඹ තුළ සදාතනික බැවින් නුඹ දැනට ඉතා කුඩා ලෙස ද අප්‍රසිද්ධියේ ද කටයුතු කරපන්න. මම නුඹව ප්‍රසිද්ධියට පත් කරන දිනය පසුව දැනුම් දෙන්නෙමි."

**1998 පෙබරවාරි 22**

"අනුන් විනිශ්චය නො කරන්න. මා විසින් නුඹලා ව තෝරා ගැනීමට නුඹලාගේ සුදුසුකම වූයේ නුඹලාගේ පාපිෂ්ඨ භාවය නුඹලා විසින් පිළිගැනීම යි. අන් සියලු සුදුසුකම් ඇත්තෝ නුඹලා ව විවේචනය කරති. නුඹ අනුන් විනිශ්චය කරන මිනුම් දඬුවෙන් ම මා නුඹ විනිශ්චය කරන බව අමතක නො කරපන්න. නුඹ අනුන් විනිශ්චය කළා වූ මිනුම් දඬුව නුඹ මා වෙතට රැගෙන එන්නෙහිය. නුඹ මා වෙතට රැගෙන එන්නේ නුඹගේ විනිශ්චයේ දණ්ඩනය ය. නුඹලාගේ විනිශ්චය උදෙසා නුඹලා මට හඬ ගසන්නේ නුඹලාට මා දුන් යැදුමෙන් ය. මා එය අති විශිෂ්ඨ ලෙස නුඹලාට සාදා දුන්නා වූ ද නුඹලා විසින් ඉතා ඕනෑකමින් උච්ඡාරණය කරන්නා වූ ද යැදුම යි."

"ඔබේ නිහඬ සේවාව දැන් නිම වී ඇත්තේය. මෙ තැන් පටන් නුඹ අපහාසයේ ගමනේ ද විප්‍රවාසයේ ගමනේ ද යෙදෙන්නෙහිය. ඔබ හනික ලොවේ ධර්මිෂ්ඨයින් ඇති කරන තෙක් මම බලා සිටිමි. සමිඳු එඬේරා දූත මෙහෙය, එම තාපස තත්ත්වය දිගට ම කර ගෙන යාම සඳහා නුඹලාට දොරගුලු ඇරලමින් මේ වන විට මම සූදානම් වන්නෙමි. මගේ කල්වාරි කුරුසියේ ගමන් මාර්ගයේ මාගේ ධර්මිෂ්ඨයා ඉතා උනන්දුවෙන් පියමං කරන බැවින් මම සතුටු වන්නෙමි. මාගේ පා සටහන් මත ධර්මිෂ්ඨ එඬේරා පා තබන බැවින් ඔබට ද සැහැල්ලුවෙන් ඒ මඟ යාමට හැකි බව මම ප්‍රකාශ කර සිටිමි. ඉහළ පැලැන්තියේ වැජඹෙන මාගේ නාම මාත්‍ර පූජකයන් තුළින් නො ව මේ ලෝකයේ පුංචි ම දෑ තුළින්, සමාජයේ තෙරපෙන පොඩිවෙන කිසිවකු විසින් ගණන් නොගන්නා දුවිල්ලට ද වඩා පහත් වූ ජීවිත තෝරා ගෙන ඔවුන්ට මාගේ පන්නරය දී ඔවුන් මාගේ ධර්මිෂ්ඨ භාවයට ඔසවමින් ඔවුන් තුළින් මම ඉදිරියට ද ක්‍රියා කරමි."

"මා ප්‍රිය ගෝලයිනී, මාගේ බර නුඹලා කර පිට පවරා ගන්නේ කෙසේ ද? නුඹලා ගෙවා ඇති දිවිය පුරා මා හට පැවරුවා වූ නුඹලාගේ පාපී ජීවිතයෙන් එතෙර වෙන මොහොත මෙය යැයි සිතමින් මා ඔබට දුන්නා වූ දුක් වේදනා මා නැවතත් මේ මොහොතේ සිට ඔබට නොදීමටත් අන් සැමගේ පාපය වෙනුවෙන්, දුක් කරදර වෙනුවෙන් මැදහත් වන්නටත් අවංක ව කැමති වීමෙන් පමණී, එලෙස දිවි ගෙවීමෙන් පමණී. නුඹ තෝරා පත් කළේ නුඹගේ ගැළවීම සඳහා පමණක් නො වන බව නුඹ දැන් සිතන්න. ලොවේ සියලු ම මාගේ රුව ගත් ආත්මානුභාවයේ මිනිසත් බව වෙනුවෙන් මනුෂ්‍යත්වය වෙනුවෙන් නුඹලා එහි යවන පිණිසත් ගැළවීමේ සුභාරංචිය ඔවුන් තුළ සදාතනික කරන පිණිසත් ය. නුඹ ධර්මිෂ්ඨ විය යුත්තේ මා පෙර පැවසූ අන්දමට ය. මාගේ පාපී දිවියෙහි නව පෙරළියක් තුළින් ඒ පව් බර නැවතත් මම ඔබට නොපවරන්නටත් අන් සැමගේ ම

පාපි ජීවිත වෙනුවෙන් මම මිලයක් වන්නටත් කැමැත්තෙමි. එලෙස ප්‍රකාශ කරමින් කල්වාරි කඳු මුදුනේ යාගයේ දී මා වින්දා වූ දැනුදු විඳින්නා වූ දුක් වේදනාවට ඔබ ද කොටස්කරුවන් වන්න."

"මුළු ලෝකයෙහි ම සමිඳු එඬේරා දූත මෙහෙවරෙහි අරමුණ ඔබගේ යැදුම් තුළ දී අන් සැම වෙනුවෙන් යදින බව ය, යැදිය යුතු බව ය. මන්දයත්, ඔබ සහෝදරයාට ප්‍රේම කරන්නේ නැත්නම් ඔබ මට ප්‍රේම කරන්නේ කෙසේ ද? ඔබ වෛර කරන්නා තුළ මා ජීවත් වන නිසා ඔබ ඔහුට ප්‍රේම කරන විට ඔබ නොදකින දෙවි පියාට ප්‍රේම කරන බව ඔබගේ ඇතුලු සිතට මේ තාක් දැනුම් දුන්නත් ඔබට එය නැසුනේ ඇයි? නුඹට වෛර කරන්නාට, නුඹට අයහපත කරන්නාට, නුඹට දෙස් තබන්නාට සෙත් පතමින් මා කල්වාරියේ වැගුරුවා වූ රුධිරයෙන් ඔවුන් ව සෝදා හරිමින් ඔවුන්ට සත්‍යය අවබෝධ කර දෙන ලෙස යදින්න. මගේ පියාණන්ගේ සැලසුම් සියල්ල ඉටු වීමේ මඟ මෙය යි. ---- මාගේ ගෝලයිනි, නුඹලා මනස්ස්ථාපනය වන විට අන් සැමට නොපෙනෙන ලෙස මනස්ස්ථාපනය විය යුතු බව මම මතක් කර සිටිමි. මා ජෙත්සමෙනියෙහි ගත්තා වූ වෑයම නුඹලා පැයකට සීමා නො කරන්න. ---- නුඹලාගේ ආදරය සැලකිල්ල ලබන, නුඹලා මාගෙන් ලද එහෙත් නුඹලාට අයිති නැති, මා නුඹලා නිර්මාණය කළ මුල් පසට අයිති නුඹලාගේ ශරීරයට මේ වකවානුව තුළ නොයෙක් රෝගාබාධ පැමිණෙමින් වේදනාවේ සක්‍රමේන්තුව තුළින් ගමන් කරන්නට සිදු ව ඇත. එහි දී මේ ලෝකයේ වැඩසිටින සුවිශාල ම ප්‍රතිකාරය වන, ජේසුස් යන මාගේ නාමයේ ප්‍රතිකාරය ලබන ලෙස, මාගේ ශ්‍රී රුධිරයේ ප්‍රතිකාරය ලබන ලෙස මම නුඹලාට පවසමි. මා නුඹලාට මාගේ නාමයෙහි ප්‍රතිකාරය, මාගේ රුධිරයේ ප්‍රතිකාරය දානය කරන්නට කැමැත්තෙමි."

## 19

# "මුළු විශ්වය ම මනස්ස්ථාපනය තුළ රැඳෙන කාලය උදා වී ඇත."

**පස් වන ඥානකාන්තිය 1998 පෙබරවාරි 23 සිට මාර්තු 1** දක්වා පැවැත්විණ. එහි දී ඩිල්ෂාන් මගින් ජේසු සමිඳුන්ගෙන් හා සුජීවා මගින් දේව මෑණියන්ගෙන් ලැබුණ අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කිපයක් ද සිදු වූ ප්‍රබල සිද්ධීන් ද මම ඔබ හමුවේ තබමි.

**1998 පෙබරවාරි 23**

"---- මාගේ ස්වරූපයට මැවුණු කිසිවකු මගේ සෝ සුසුම් තුළ යැපෙන කිසිවකු නිරපරාදේ අයාලේ අකාලේ මිලින වෙනවාට මම කිසිසේත් කැමැති නො වන බව ප්‍රකාශ කරමි. ---- ඔබ මා තුළ වැඩෙන බවත් ඔබ සුණු විසුණු වී කුඩා වී නැති වී යන විට මා ඔබ තුළ විශාල වන බවත් ඔබ විශ්වාස කරන්න. ---- ඔබ මා සොයන විට ඔබ සතු ව ඇති සියල්ල නැති වී ගියත් ඔබට මා ලැබේ නම් එයින් වන පලය අති මහත් බැවින් ඔබ ප්‍රීති වන්න. ---- ඔබ සැම මාගේ නාමය ප්‍රකාශ කිරීමට සුදුස්සන් වන්නේ නුඹලා සැම පව්කාරයන් බව පිළිගැනීම නිසා ය. මා තුළට ඒමට ඔබ තුළ තිබිය යුතු සුදුසුකම නම් සැබෑ මනස්ස්ථාපනය තුළින් තම පව්කාර භාවය පිළිගැනීමත්, එකිනෙකාට ප්‍රේම කිරීමට දක්වන ඕනෑකමත්, අන් අය විනිශ්චය නො කිරීමත් ය. ---- ඔබ මා හා ගමන් කරන්න. එහි දී ඔබ පය පැකිලී මහ මඟ වැටුණු පසු මා ඔබගෙන් දුරස්තර යැයි නො සිතන්න. මා ඔබෙන් දුරස්තර යැයි ඔබ සිතන විට නපුරා නුඹ තුළට ඒමට උත්සාහ දරයි. මට ප්‍රසිද්ධිය අවශ්‍ය නැත. මා ප්‍රසිද්ධ විය යුතු කාලය තුළ මම ප්‍රසිද්ධියට පත් වන්නෙමි. නුඹලා මා ප්‍රසිද්ධ කරන්නට නම් නුඹලාගේ ජීවිත ඇතුලාන්තය තුළ මා ජීවත් කරවන්න. ---- නුඹලා ගළවා ගැනීමේ මිලය වූ මාගේ රුධිරය නුඹලාගේ සර්වාංගය පුරා ගලා යමින්, මිනිස් වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාරයන් නොයන තැන්වලට පවා ගලා යමින් නුඹලා සුවපත් කරනු ඇත. එනිසා නිරන්තරයෙන් මාගේ රුධිරයේ ප්‍රතිකාරය ලබා ගන්න. ---- බොහෝ මනුෂ්‍යයෝ මා අමතක කර නපුරා සමග ප්‍රීති ඝෝෂා පවත්වමින් ඔවුන්ගේ ලෞකික තෘෂ්ණාවේ ජඩ හැඟීම් තුළ මෘගයන් ලෙස හැසිරෙති. මාගේ ඉවසීමේ කාල සීමා නිම වෙමින් පවති. මා මේ තාක් ඉවසුවේ මාගේ මෑණියන්ගේ මැදිහත් වීම උදෙසා ය."

**1998 පෙබරවාරි 25**

"---- විශ්වයේ රජාණන් වන මම නුඹලාගේ පාද සෝදා බැහැපත් වී, යටහත් පහත් වී, සේවකයා වී, අන්තිමයා වී සිටින බව අමතක නො කරන්න. කුරුසිය මත දෑත් දෙපා සිර කර

තගේ පාප උදෙසා බිලි පූජාවක් වූ තගේ ස්වාමියා වෙනුවෙන් කම්පාවෙන් තගේ ඇතුළු ගෙට වැදී මෙනෙහි කරපන්න. ඔබ කිසිවකු ලෞකිකත්වයේ තෘෂ්ණාවේ ගසා ගෙන යන්නා වූ ප්‍රවාහයට හසු නො වන්න. සැම විට ම මනස්ස්ථාපනය වන්න. ජේසුගේ පැමිණීමට සූදානම් වන්නැ යි සැමට පවසන්න. බාහිර වත්පිළිවෙත්වලින් නො ව ඇතුලාන්තයේ යටි හිත පිරිසිදු කර එය මාගේ සිංහාසනය ලෙස සැම විට එය මට විවෘත ව තබන්න. මාගේ මහිමාන්විත ආගමනය කොයි මොහොතේ සිදු වුව ද ඔබ ඊට සූදානම් ව සිටින්න. එය මගේ ස්වර්ගීය ස්ථම්භය ද කැළඹෙන මොහොතකි. පැරණි අහස ද පැරණි පොළොව ද පහ ව ගොස් නව අහස ද නව පොළොව ද උදා වනු සඳහා මා මෙහි වැඩමකරන්නේ ස්වර්ගය මෙ ලොව ස්ථාපනය කිරීම උදෙසා ය. මම නැවතත් කියමි, මාගේ පැමිණීම උදෙසා ජනතාව රැස් කරන්න. ආචාර-සමාචාර දැක්වීම සඳහා ද ඔබගේ කාලය වැය නොකර මනස්ස්ථාපනය උදෙසා ජනතාව සූදානම් කරන්න."

(දැන් මා ඔබ ඉදිරියේ තබන්නේ එදින දේව මෑණියන්ගෙන් ලැබුණ පණිවුඩයකි.) "නුඹලාගේ පියාණන් වහන්සේගේ දෙ වන පැමිණීම ඉතා ළං ව ඇත. මාගේ දරුවෙනි, මේ කාලය වන විට පියාණන් විසින් මවන ලද විශ්වයේ ම මිනිසා ඇතුළු සතා-සීපාවා, ගස්-වැල් පවා මහත් පීඩනයකට ලක් ව ඇත. පියාණන්ගේ දෙ වන පැමිණීම මොහොතේ දී ඉතා සුළු පිරිසකි, මිහිමත ඉතිරි වන්නේ. නුඹලාගේ පාපිෂ්ඨකම නිසා මම නිරන්තරයෙන් නුඹලා උදෙසා මධ්‍යස්ථ වෙමි. නුඹලා ප්‍රමාද නො වී දැන් දැන් ම සූදානම් වන්න, දෙ වන පැමිණීම සඳහා. නුඹලාගේ දරු පරපුර ද එයට සූදානම් කරන්න, කඩිනමින්, ඉතා කඩිනමින්. නැණ නුවණින් ක්‍රියා කරන්න. ප්‍රඥාවෙන් පිබිද සිටින්න. මම ද නුඹලා උදෙසා මොහොතින් මොහොත මධ්‍යස්ථ වෙමි."

**1998 පෙබරවාරි 26**

"---- නුඹලාගේ අද කාල මිමි හෝරාවන් අනුව ගණනය කරන විට මම ක්‍රි. පූ. 6 වන වසරේ දී මිනිසත් බව ගෙන මිහි මත උපත ලැබුවෙමි. ක්‍රි. ව. 27 අප්‍රේල් 14 වන දින සවස 3:32 ට මම කුරුසිය මත දිවි පිදිමි. ක්‍රි. ව. 27 අප්‍රේල් 16 මැදියම් රැය පසු වී 12:52ට (:එය අප්‍රේල් 17 අලුයම යි.) මරණය ජය ගෙන උත්ථාන වූයෙමි. මා නිසල සිරුරේ ස්පර්ශය ලද සළුව නුඹලාගේ විද්‍යුත් තරංග මාලා ඔස්සේ ළඟ දී ප්‍රදර්ශනය වුවා නො වේද? මග්දලාහි මරියාවන් දැමූ ඒ මල්වල සුවඳ අදත් එහි නොමැකී පවත්නේය. මාගේ ධර්මිෂ්ඨයින් තුළ අද ද මම සිංහාසනාරූඪ ව වැජඹෙන්නෙමි. මාගේ සහෝදරවරුනි, මා දුක් විඳින්නේ නුඹලා උදෙසා ය: මාගේ පියාණන්ගේ පූජා වීමේ කැමැත්ත උදෙසා ය. මාගේ මනුෂ්‍යත්වයේ උපරිමයෙන් මම මාගේ පියාණන්ගේ කැමැත්ත ඉටු කරමින් මාගේ පියාණන් සතුටු කළෙමි. ඔබ සැම උදෙසා මිලයක් වූ මාගේ රුධිරයේ නාමයෙන් මා නුඹලාට ප්‍රකාශ කරන්නේ මනස්ස්ථාපනය වන්න. සග ලොව සමිඳාණන්ගේ පැමිණීම ඉතා ආසන්න ය. ---- මුළු පොළෝ තලය පුරා කුසට අහරක් නැති ව, ගතට වස්ත්‍රයක් නැති ව, හිසට සෙවනක් නැති ව වේදනාවෙන් මිරිකෙන සකල ජනතාව ජේසුස් යන ශුද්ධ නාමයේ නව සැලසුම් මත ඔවුහු ශුද්ධවන්ත වන්නෝය. මාගේ පියාණෝ ඔවුන් ආශිර්වාද කරත් වා!"

(දැන් මා ඔබ ඉදිරියේ තබන්නේ එදින සුජීවා තුළින් දේව මෑණියන්ගෙන් ලැබුන පණිවුඩයකි.) "මාගේ දරුවෙනි, මුළු විශ්වය ම මනස්ස්ථාපනය නමැති වචනය තුළ රැඳෙන කාලය උදා වී ඇත. මා පුත්‍ර ධර්මිෂ්ඨ එඩ්බෝරාණෙනි, මම නුඹට අණ කරමි, පියාණන්ගේ දහම ප්‍රකාශ කරමින් කඩිනමින් ධර්මිෂ්ඨයින් ඇති කරන්න. නුඹ පියාණන්ගේ රුධිර කුසලාන උතුරා යන්නේය. නුඹ පියාණන්ගේ හස්තය දිගුකොට ඇත. ඊශ්‍රායලය, පිබිද සිටින්න. නුඹ පියාණන්ගේ පැමිණීමේ මොහොත ළං ව ඇත. ---- රුධිර ගංගා ගලා යමින් ඇත. නුඹ පියාණන්ගේ රුධිර කුසලාන ලොව නොයෙක් තැන්වලින් ගලා යන්නේය. නුඹලාගේ ගැළවුම්කරු තේජශ්‍රීයෙන් වඩින කාලය ආසන්න ව ඇත. මාගේ දරුවෙනි, ඉතා කෙටි කාලයක දී නුඹ පියාණන් විසින් මවන ලද මුළු විශ්වය ම රුධිර ගංගාවක් සේ ගලා යන්නේය. නියඟය, සාගතය උදා වන්නේය. එකල දෙවිපියාණන්ගේ ජීවනදායක රුධිරයෙන් දෙවි පියාණෝ තම ජනතාව පෝෂණය කරන්නාහ. මුළු ඊශ්‍රායලය ම පිබිද සිටින්නට අවශ්‍ය කාලය උදා වෙමින් ඇත. අහස් තලය දෙදරුම් කන්නේය, මුහුද ගොඩ ගලන්නේය. ඒ කාලය ළං ව ඇත. නුඹලාගේ සමිඳාණන් වහන්සේගේ දෙ වන පැමිණීම ඉතා ආසන්න වන විට මුළු විශ්වය ම අන්ධකාරයෙන් වැසී යන්නේය. එතුමාණන් තේජශ්‍රීයෙන් වඩින මොහොතේ දී මුළු විශ්වය ම ඒකාලෝක වනු ඇත. නව අහසත් නව පොළොවත් බිහි වන්නේය. මුළුමනින් හිස් වන්න, මරියාවන් වන මා නුඹලා සමග යි."

**1998 පෙබරවාරි 27 සිකුරාදා**

"ලොව විනාශය දකිමින් මිනිසුන් මනස්ස්ථාපනය වීමේ නැඹුරුවක් ඇති නිසා ඔබට ඒ කටයුතු කරගෙන යාමට පහසු වන්නේය. මන්ද, මනුෂ්‍යයාට මගේ යම් යම් ඉඟිවලින් ද යම් යම්

දර්ශන හා ස්වප්න නිසා ද දෙවියන් සෙවීමේ මෙහෙවරට ඔවුහු යොමු ව ඇත්තාහ. මහත් ජනකායකට ඔබ මාගේ වචනය දෙන්නේ නම් මෙසේ පවසන්න. මනස්ස්ටාපනය තුළින් ජේසුගේ නැවත පැමිණීමට සූදානම් වන්න.---- අද වැනි සිකුරාදාවක, ක්‍රි. ව. 27 අප්‍රේල් 14 සවස 3:32 මගේ පියාණන් මහත් සේ සතුටු වූ මොහොතකි. දෙවි පියාගේ ලොව මැවීමේ මූලාරම්භයේ සිදු වූ ප්‍රතික්ෂේපයේ අකීකරුකමේ මමත්වය නිසා හටගත් පාපයට වන්දි ගෙවූ මොහොත යි. මාගේ පියාණෝ නැවතත් මා මෙ ලොවට එවීමේ කාර්යය සඳහා ලහිලහියේ සූදානම් කරමින් සිටිති. ---- මම තෝරා නො ගත්තෙමි, සුදනන්. මා තෝරා ගත් සියල්ලෝ දුදනන්, පාපින් වෙති. දුදනන් තුළ මම මහා දුදනාණෝ වූයෙමි. මන්දයත්, මම මහා ම දුදනා යැයි කියා එදා කුරුසියේ නිරුවත් ව ගුටි කමින් තැලෙමින් පොඩි වෙමින් ගැළවීමේ මහඟු බැටළු වස්ත්‍රය ඇඟ ලා ගත්තෙමි. පූජා වූ බැටළුවාගේ ඒ කුළුඳුල් පූජාව මම ජීවමාන සදාතන යාගය කළෙමි. මෙ ලොව වසන සියලු ම ජනතාව උදෙසා, එනම් ඊශ්‍රායලයේ ජඩකම් උදෙසා මම හෝරා තුනක් අඩ හෝරාවක් හා මිනිත්තු දෙකක් කුරුසිය නමැති ඕක් සිංහාසනයේ සිටියෙමි. මා එලෙස කළේ මාගේ පියාණන්ගේ කැමැත්ත ඉටු වීම උදෙසා ය.”

“මෙම සුපුවත ඔබ අන් අයට ද පවසන්න. අපගේ ස්වාමියාණන් මිනිස් බව ගෙන මෙ ලොවට පැමිණියේ පාපි අප උදෙසා මිලයක් වී පාපි අප ගළවා ගැනීමේ මහඟු අරමුණින් ය. එම ගැළවීමේ ආලේපයෙන් ඔබ ද ආලේප කර හමාර ය. ---- මේ වන විට මගේ හස්තයට භාර ව මිය යන්නට පතන ජනතාව අති මහත් ය. මෙ ලොව පවතින්නා වූ විෂම ජීවිත රටාව තුළ අපට තව දුරටත් ඉඳින්නට වරම් නැත. ජීවමාන සමිඳුනි, ඔබ වෙත අප කැඳවා ගත මැනව යි ඔවුහු අයැදිති. ---- මාගේ සත්‍යය සොයා ගිය පුංචි සභාවන් තුළට ද ගමන් කරන්න. ඔවුන් මාගේ වචනයට මොන තරම් ආදරය කරන්නේ ද ඔවුන් මාගේ ආත්මයට මොන තරම් ආදරය කරන්නේ දැයි දකින්න. දුක සැප දෙ වේලේ මා තුළ ඔවුහු ජීවත් වී මට ප්‍රශංසා කරති. ඔවුන් කවුරු නෙරපුවත් කවුරු තෙරපුවත් මා ඔවුන් තුළ ද වැඩ සිටින වග මාගේ ධර්මිෂ්ඨයා දන්නේය. ඔවුන් ඇසුරු කරන්න. ඔවුන් සමග ආහාර වළඳින්න. ---- මා ස්ථාපිත කළා වූ මාගේ රුධිරය හා මාංශය වන දිව්‍ය සත්ප්‍රසාදය නොපිළිගන්නා සභාවන්වලට සංදේශයක් නිකුත් කරපන්න. මම දිව්‍ය සත්ප්‍රසාදය තුළ සැබවින් ම ජීවමාන ව වැඩසිටින බව ඔවුන්ට තරයේ පවසාපන්න.”

“මේ විශ්වයේ දෙවිවරුන් ලෙස හැඳින් වූ සියලු ම දෙවිවරුන්ට වඩා උත්තම අජබාලක වූ විශ්ව මැවුම්කරුවාණන් මා බැවින් මා හට වැඩම කළ හැකි එක ම ස්ථානය වූ නුඹලාගේ ඇතුලාන්තයට මම ඇතුළු වන්නට කැමැත්තෙමි. නුඹගේ මුළු දිවිය පුරා නුඹගේ ඇතුලාන්ත සිතේ ජේසුස් යන මාගේ නාමය තුළ නුඹ ජීවත් වන්නෙහි ද සියලු නපුරෝ ඔවුන්ගේ ඉදිරි සැලසුම් ද රැගෙන ගව් ගණන් පලා යන්නෝය. ඔවුහු මහා මුහුදේ මහා ජලස්කන්ධය තුළ පතිත වෙති. එහි දී ද ඔවුන්ට වැජඹෙන්නට නො හැකි වන්නේ මගේ පියාණන්ගේ මැවීමේ ඉතා කුඩා මැවීමක් වන මාගේ මත්ස්‍යයින් මාගේ නාමය කොඳුරමින් මාගේ නාමයට ප්‍රශංසා කරන බැවිනි. සියලු ගස්-වැල් හා සියලු සත්වයින් තුළ ද මාගේ නාමය උත්තරීතර බැවින් නපුරන්ට එතැන ද ඉඩක් නැත. නපුරාට ඉඩක් ලැබෙන්නේ නිදහස් කැමැත්ත ඇති මිනිසා තුළ පමණ ය. එනිසා නුඹගේ ජීවිතය වෙනස් වන්නට ද නුඹගේ පැරණි ජිවිතයේ අත්තිවාරම දෙදරන්නට ද ජේසුස් යන මාගේ නාමය භාර ගන්න. ---- මම මාගේ පියාණන්ගේ කැමැත්ත උදෙසා ජීවත් වූයෙමි. උන්වහන්සේගේ කැමැත්ත ඉටු වීම උදෙසා ම දිවි පිදුවෙමි. මාගේ පියාණන්ගේ උත්තම ගෞරවය සඳහා උත්ථාන වූයෙමි.”

“මාගේ ශුද්ධ වචනය වන මාගේ කාදෝෂ් බයිබ්ලෝස්, මාගේ පියාණන්ගේ ආත්මානුභාවයෙන් ප්‍රකාශ වූ ලියවිලි නොසැලකිලිමත් ලෙස තැන් තැන්වල නො තබන්න. මා වචනය තුළ ජීවමාන බැවින් එය ශුද්ධ ලෙස පරිහරණය කරන්න. එහි යම් කොටසක් ඔබ මෙනෙහි කරන්නේ ද ඉන් පසු එයට ගෞරව කර එය සුදුසු ස්ථානයක තබන්න. මම ශුද්ධ ලියවිල්ල තුළ ජීවමාන වන්නෙමි.” (ජේසු සමිඳුන් මෙ ලෙස පවසන්නට හේතු වූයේ එදින දේශනයෙන් පසු බයිබල් නොසැලකිලිමත් ලෙස තැනින් තැන තබා තිබීම නිසා ය. ඉන් පසු අපගේ එකතුවල දි බයිබලය අධ්‍යයනයෙන් පසු මේසයක් මත ගෞරවයෙන් තබන්නට පුරුදු වූයෙමු. ජේසු සමිඳුන් අප අතර ව්‍යවහාර කළේ මාගේ බයිබලය කියා නො ව මාගේ බයිබ්ලෝස් කියා ය. බයිබල් යන ග්‍රීක් වචනයේ අරුත පොත බව අපි දනිමු. ග්‍රීක් බසින් එයට මුල් වී ඇත්තේ බයිබ්ලෝස් ය. ලෝකයේ මුල් ම හෝඩිය සකස් කළෝ ෆිනීෂියන්වරු ය. එය ලේඛනගත කළේ ලෙබනනයේ බයිබ්ලෝස් නගරයේ දී ය.)

(පෙබරවාරි 27 වන සිකුරාදා ගත කිරීම පිළිබඳ ව ජේසු සමිඳාණෝ ඊට පෙර දින රාත්‍රියේ අපට උපදෙස් දුන්හ. “හෙට මාගේ තවත් දිනයක් බැවින්” යනුවෙන් මුල පුරමින් දුන්

උපදෙස් මෙසේ ය.) "දහම් නවෝදයට සම්බන්ධ එදින එහි සිටින සියල්ලන් මුළු දිනය පුරා නිරාහාර ව සිටිය යුතුය. දින හතේ පන්නරයට පැමිණි සියල්ලන් එදින රාත්‍රි ආහාරයෙන් වැළකිය යුතුය. එදින සවස හා රාත්‍රියේ පානය සඳහා යමක් අවශ්‍ය නම් ජලයට ලුණු ස්වල්පයක් එක් කර ගත යුතුය. එය පානය කරන විට ජේසු සමිඳුන් මහා සිකුරාදා පානය කළ තිත්ත කාඩි සිහිපත් කර ගත යුතුය. රාත්‍රි කාලයේ නින්දට පෙර සියල්ලන් එක් ව ජේසු සමිඳුන්ගේ ජෙත්සමෙනි යාච්ඤාවට පිවිසිය යුතුය." (ඒ උපදෙස් අනුව ක්‍රියා කළ අපි රාත්‍රි දහයට පමණ ජෙත්සමෙනි යාච්ඤාවට පිවිසුනෙමු. එදින සවස සිට ඕක් මල් සුවඳින් නිවෙස පිරී ඉතිරී තිබිණ. සමහරුන්ගේ සිරුරෙන්, ඇඳුමෙන් පවා ඕක් සුවඳ විහිදෙන්නට විය. ජෙත්සමෙනි යැදුමේ දී කුරුසිය මත ජේසු සමිඳුන්ගේ දුක් විඳීම පිළිබඳ ගීතිකාවක් ගයන අතර මහත් හැඬීමක ඉකි බිඳීමක හඬ පැතිරෙන්නට විය. තරුණයන් දෙ දෙනකුගේ වැළපීම විශේෂයෙන් කැපී පෙනෙන්නට විය. ඒ තුළ සියල්ලන්ගේ දෙ නෙත් ද කඳුලින් පෙඟෙන්නට විය. ඔවුන්ගේ වැළපීම තව තවත් වැඩි වන්නට විය. එනිසා රාත්‍රි 12ට පමණ යැදුම අවසන් කර ඔවුන්ගේ වැළපීම නිමා කරන්නට අපි උත්සාහ කළෙමු. ඒ තරුණයන් දෙ දෙනා අපගේ පා මුල වැටී අපගෙන් ද සමාව අයැදින්නට වූහ. ඔවුන්ගේ වැළපීමට හේතුව අප විමසුවත් ඔවුන්ගෙන් පිළිතුරක් නො ලැබිණි. එදින තරුණයෝ අට දෙනෙක් ද තරුණියෝ තුන් දෙනෙක් ද වැඩිහිටියෝ පස් දෙනෙක් ද එහි වූහ. එවැනි පිරිසක් මැද වයස විස්සක පමණ තරුණයින් මෙසේ හැඬ විය හැකි ද? "නැවත යාච්ඤා කරමින් අපි ජේසුගෙන් ම අහමු ඇයි මේ කියලා" මම එලෙස යෝජනා කළෙමි. අපි නැවත යාච්ඤාවට මුල පිරුවෙමු. එහි දී ජේසු සමිඳුන්ගෙන් ලැබුණ පණිවුඩය මෙය යි.)

"අද සවස් භාගයේ නුඹලා අත්දුටුවා වූ ඒ ඉසිලිය නො හැකි තරම් ඕක් සුවඳින් ඒ මොහොතේ සිට මේ මොහොත දක්වා ම මම නුඹලා මධ්‍යයේ මෙසේ ප්‍රකාශ වූයෙමි. නුඹලාගේ ජෙත්සමෙනි යැදුමේ දී මාගේ ආත්මානුභාවය විසින් නුඹලා මනස්ස්ථාපනයට පත් කරන මොහොතේ මා නුඹලා තුළට වැඩම කළේ මාගේ මිනිස් කයේ යම් යම් ඉරියව් ද රැගෙන ය. නුඹලාගේ සමහරු මාගේ ශ්‍රී වත මඬල දකින මොහොතේ ඒ ඇති වූ කම්පාව උසුලා ගත නොහැකි තත්ත්වයේ දැනුදු සිටිති. ඒ තුළ ඔබගේ පසු ගිය ජීවිතය දෙස නුඹලා නියම ආකාරයෙන් දකිමින් මේ මොහොතේ මහත් සේ මනස්ස්ථාපනය වෙමින් ඒ පාපිෂ්ඨ භාවය පිළිගන්නා මොහොතක් ය. බිය නො වන්න."

(ඉන් පසු අලුයම 1:00ට පමණ දේව මෑණියන් සුජීවා තුළින් දුන් පණිවුඩය මෙය යි.) "මාගේ දරුවෙනි, මම නුඹලා අතරට නැවත වැඩියෙමි. ප්‍රේමවන්ත වූ මාගේ දරුවෙනි, මේ මොහොත වන විට නුඹලාගේ පියාණෝ ද මම ද නුඹලා දෙස ප්‍රීතියෙන් බලා සිටිමු. නුඹලාගේ පියාණෝ කියා ගත නොහැකි ප්‍රීතියකින් නුඹලා දෙස බලා සිටිති. නුඹලාගේ මනස්ස්ථාපනය දුටු අපි නුඹලා කෙරෙහි අතිශයින් ප්‍රීති වන්නෙමු. මාගේ දරුවෙනි, මනස්ස්ථාපනය තුළින් නුඹලාගේ ගැළවීම නුඹලා ලබා ගත්තහුය. පව්කාර වූ දුදනෙනි, නුඹලාගේ පියාණෝ අඩ හෝරාවකින් නුඹලාගේ නිදන කුටියට පිවිසෙති. මුළුමනින් සූදානම් වන්න, පියාණන්ගේ ආශිර්වාදය ලබන්නට. මාගේ දරුවෙනි, නුඹ පියාණන්ගේ වචන අසන්නටත්, මරියාවන් වන මාගේ මධ්‍යස්ථකම තුළ මාගේ වචන අසන්නටත් නුඹලා භාග්‍යවන්තයෝ වන්නහුය. නුඹලා වෙනුවෙන් මැදිහත් වූ මාගේ මැදිහත් වීමේ ප්‍රතිපලය තුළ මම ප්‍රීති වන්නෙමි. මාගේ දරුවෙනි, ඉදිරි කාලයට සූදානම් වන්න. නුඹලා වැනි ළාබාල දරුවන් තුළින් ධර්මිෂ්ඨයෝ බිහි වන්නෝය. ලහිලහියේ ධර්මිෂ්ඨයින් බිහි වන කල පියාණන්ගේ අනාවරණයන් වෙනස් වන කාලය ළං ව තිබේ. මම ප්‍රීති වන්නෙමි. මම තවත් තැන්වල ක්‍රියා කරමින් ධර්මිෂ්ඨයින් බිහි කරමි."

(අලුයම 1.30ට ඩිල්ෂාන් මුවින් දෙවි පියාණෝ මෙ ලෙස අප ඇමතූහ. එවැන්නක් අප අතර සිදු වූ පළමු අවස්ථාව එය යි.) "මාගේ දරුවෙනි, මා මහත් සේ ප්‍රසන්න වන කාලය පැමිණ ඇත්තේය. මා මෙහි වැඩම කරන ලද්දේ නුඹලාගේ මනස්ස්ථාපනය ගැන සතුටු වූ මොහොතෙහි ය. මාගේ වචනය ඇසීම උදෙසා මහත් සේ නුඹලා ධර්මිෂ්ඨ වන්නහුය. මාගේ පුතණුවන්ගේ සැලසුම් සියල්ල මා එලෙස දන්නා බැවින් මා මෙ ලොවට රහසින් වැඩියේ මා නුඹලාට ඇති ප්‍රේමය ප්‍රකාශ කිරීම උදෙසා ය. මාගේ දහම් නවෝදය උදෙසා මාගේ රාජ්‍ය ශාලාවේ ස්ථාපිත වූ සියලු සිංහාසනවලට ධර්මිෂ්ඨයින් ලෙස නුඹලා පත් කරන්නෙමි. මාගේ මනස්ස්ථාපනය වූ පුතණුවනි, දියණියනි, මා ජීවමාන පියාණන් බව නුඹලා විශ්වාස කරන මොහොත තාක් මම බලා සිටියෙමි. මා මහත් සේ නුඹලාට මොරගසමින් කියන්නේ මා පෙර දැන්වූ සියලු ම අනාවරණයන් සැනෙකින් අහක් කර ගැනීමේ මොහොත උදෙසා ලොවේ ධර්මිෂ්ඨයින් සංඛ්‍යාව වැඩි වීම උදෙසා නුඹලා අද සිට ක්‍රියා කරපන්න. මා ධර්මිෂ්ඨ පූජක එඬේරා ඇන්තනි, නුඹලා සමිඳු එඬේරා දූත මෙහෙවර ස්ථාපිත කරපන්න: නිසි මොහොතේ එහි සේවාවන් අරඹන්න. නුඹ නෙරපූ මොහොතේ සිට මා නුඹ තුළ ජීවමාන වන බැවින් නුඹට මාගේ වචනය ඇසිය යුතු නැත. නුඹ ක්‍රියා කරන ලද්දේ මගේ සතුටටත් මගේ ප්‍රශංසනීයත්වයටත් ඉතා උචිත වන අන්දමට ය. මා පූජක පුත්‍ර

සම්පත්, නිරන්තරයෙන් මනස්ස්ථාපනයෙන් වැජඹෙමින් මගේ මනස්ස්ථාපනයේ සත්‍යතාවය ගොඩනැගීම උදෙසා, එය මුළු විශ්වයට ම හඬ නඟා ප්‍රකාශ කරන මොහොත උදෙසා ක්‍රියා කරපන්න. සමිඳු එඬේරා දූත මෙහෙවරේ මාතාව ලෙස මා තෝරා ගත් මා දියණිය ඇන්තනි මේරි, මගේ එඬේරිකත්වයේ සැරයටිය ද කෙවිට ද ගෙන යන්න. අනාථ වූ මගේ දරු දැරියන් උදෙසා නුඹගේ වෙහෙස මහන්සිය කැප කරපන්න. ත්‍රිත්වික දෙවිඳාණෝ නුඹලා මධ්‍යයේ වැඩසිටින බැවින් බිය නො වන්න. ධර්මිෂ්ඨ ලීලාවෙන් නුඹලා ජීවත් වන්නට උත්සාහ කරපන්න.---- නුඹලාගේ දකුණු පස මා වැඩසිටින බැවින් නුඹලා මා තුළට හැරී නුඹගේ ජීවිතයේ අවශ්‍යතාවය මා හට ප්‍රකාශ කරපන්න. මාගේ අපරිමිත මහිමයෙන් බිඳක් හෝ නුඹලාට දකින්නට සලස්වන්නට මම කැමැත්තෙමි. එහෙත් එය කිසිසේත් නුඹලාට දරාගත නොහැකි නිසා එය නුඹලාගෙන් සඟවමි. මම යන්නෙමි. මාගේ රුවාහ් නුඹලාට මම මහත් සේ මේ අවස්ථාවේ පතිත කරන්නෙමි.” (රුවාහ් යනු හීබෲ බසින් ශුද්ධාත්මයාණන් ය.)

**1998 පෙබරවාරි 28**

“මා ආවේ පාපීන් උදෙසා ය. පාපී ජනතාවට මගේ වෛද්‍ය ප්‍රතිකාරය අවශ්‍ය බැවින් පාපිෂ්ඨයා තුළ මම ක්‍රියා කරන්නෙමි. කිසි ම විටෙක එවැන්නන් ප්‍රතික්ෂේප කිරීමේ සැලැස්මක් මගේ පියාණන් තුළ නැත්තේය. ---- මා හට උවමනා නම් සිබරයකින් පවා, ගං ඉවුරකින් පවා මගේ සහෝදර ඊශ්‍රායලයට මාගේ දහම කියා දීමට මා හට හැකි බව මම නුඹලාට පවසමි. ---- බොහෝ රෝගීන් මනස්ස්ථාපනය නො වී ලෞකික සුවය පමණක් පතන බැවින් මම එයට එකඟ නො වෙමි. ඔබ ඔවුන්ට දිය යුතු පණිවුඩය නම්, මනස්ස්ථාපනයෙන් දෙවිඳුන් යදින්න. ---- මම මිලයක් වී නුඹලාගේ පාපී ජීවිතයෙන් නුඹලා ගළවා ගත්තෙමි. මා නුඹ එන තුරු, නුඹගේ ඇතුළු සිතේ මට ඉඩ දෙන තුරු නුඹ වටා දැවටෙමින් නුඹ තුළ මා රස්තියාදු වූ කාලය දැන් වත් නිමා කරපන්න. ඒ සඳහා ඔබ කිව යුත්තේ මා මෙතෙක් නොදැන සිටි සමිඳුන් මා ජීවිතයේ රජිඳුන් බවට මේ මොහොතේ සිට මා පිළිගන්නා බව ය. ---- ධර්මිෂ්ඨ එඬේරාණෙනි, විශ්වයේ අජබාලක රජාණන් වන ජීවමාන ජේසුස් ක්‍රිස්තුස් දෙ වන වරට ලොවට සම්ප්‍රාප්ත වීමේ මහා මඟුල නුදුරු දිනෙක පැවැත්වෙන බැවින් මාගේ නාමයෙන් ඔවුන්ට මෙම සුබ වදන දෙන්න. ලොවේ මිනිස් සංහතියේ, ඊශ්‍රායලයේ සියල්ලන් ගළවා ගැනීම මගේ අරමුණ බවත් මගේ පියාණන්ගෙන් නික්මුණු සැම මාගේ පියාණන් වෙත යාම එතුමන්ගේ පැතුම බවත් පියාණන්ගේ දයා කරුණාවේ දෑත් විවර වී ඇති බවත් එනිසා මනස්ස්ථාපනයෙන් යහ මඟට හැරී එන ලෙසත් ඔවුන්ට පවසන්න. ---- ඔබේ ජීවිතයේ මා රජාණන් නම් මෙ ලෙස තුති පුදන්න. මට මහත් දේ කළ සමිඳුන් තුළ මම ප්‍රීති සන්තෝෂ වන්නෙමි. මන්ද, මාගේ පාපිෂ්ඨ භාවය තුළ එතුමන්ගේ කරුණාව මම අත්දුටුවෙමි. මගේ දුබල බව තුළ එතුමන්ගේ ප්‍රබල බව අත්දුටුවෙමි. බිය නො වන්න. අපහාසයට ප්‍රතික්ෂේපයට ලක් වන්නා තුළ මම ප්‍රබල ව වැඩෙමි. ---- මා නැවත පැමිණෙන විට මගේ යැයි කියා ගත නොහැකි ව වෙසඟනක් වූ ඒ ඊශ්‍රායලයට ඔබ ගොස් හඬ නගා මෙසේ පවසන්න. ජේසුස් සමිඳාණන් සෙවීමේ කාලය පැමිණ ඇත. මනස්ස්ථාපනය වෙමු. ඔබ ද මා ද දෙවිඳුන්ගේ මැවිල්ලකි. ඔබ ද මා ද පැමිණෙන තුරු එතුමාණෝ බලා සිටිති.---- මාගේ මෑණියන් වෙත මාගේ පියාණන් වහන්සේ පැවරූ මුළු මිනිස් සංහතියේ මාතාවන් වීමේ ඒ භාරකාර ධුරය ඇය තවමත් උසුලන්නීය. ඇය මහත් සේ වේදනාවෙන් යුක්තව ස්වර්ගීය වේලාවන් තුළ ස්වර්ගීය යාගයන් තුළ එලෙස ම සිදු කරන්නීය. ඇගේ ඒ විඳ දරා ගැනීමේ අසිරුතාවය නිසා ඇය ලෝ සිසාරා ජනතාව සූදානම් කිරීමේ පණිවුඩ තුළින් දිස්වන්නීය. මාගේ මෑණියන් එලෙස ලොවට ප්‍රකාශ වන්නේ ධර්මිෂ්ඨයින් ඇති කිරීම උදෙසා ය.”

## 20

## “මාගේ නාමය තුළ නුඹලා ගැළවීම ලබන්නහුය.”

’දහම් නවෝදය’ සංඝයේ එකතු කීපයක දී ඩිල්ෂාන් උපයෝගි කර ගනිමින් ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයකි, මේ.

**1998 මාර්තු 03**

“ගෞතම බුදුන් ද මහම්මත් නබී ද ඇතුළු සියලු ම ආගමික ශාස්තෘන් ද මා විසින් මවන ලද විශ්වයේ සියලු ම දෙවි දේවතාවුන් ද මේ වන විට මාගේ ඉදිරි සැලසුම් මාගෙන් විමසමින් මාගේ කැමැත්තට ඔවුන්ගේ අනුමැතිය ද ගෞරවය ද පුද කර හමාර ය. කවුරු කෙසේ අනුමත කළත් නොකළත් මාගේ මැවිල්ලට මාගේ කැමැත්ත බව මම ප්‍රකාශ කරමි.” (“මා විසින් මවන ලද විශ්වයේ සියලු ම දෙවි දේවතාවුන්” එම අදහස අපට ද ප්‍රශ්නයක් වූ නිසා ජේසු සමිඳුන් මේ ප්‍රකාශනය ගැන නැවත අවධානය යොමු කළ මොහොතේ අපි ඒ ගැන

විමසුවෙමු. ජේසු සමිඳාණෝ එම අදහස නැවත ද අනුමත කරමින් ලුසිෆර් විසින් දෙවි දේවතාවුන් ලෙස සැකසූ පිරිසක් ද සිටින බව පැවසූහ.)

**1998 මාර්තු 08**

"---- මාගේ සභාව යැයි කියමින් දැන් ක්‍රියා කරන මාගේ ඊශ්‍රායලයෙහි ප්‍රමුඛ සභාව වන දෙ වන සුදු සබය කඩා වැටෙන මොහොත ආසන්න ය. නුඹලා තුළින් ප්‍රබල ක්‍රියා මාගේ නාමයෙන් සිදු වනු ඇත. නපුරාගේ ක්‍රියාදාමයන් දැන් වියරු වැටෙමින් පවතින්නේය. නුදුරු දිනෙක ඔවුන්ගේ එම සභා ශ්‍රේෂ්ඨත්වයට නපුරාගේ ආදර කරුණාවෙන් යුක්ත වූ ශ්‍රාවකයෝ බිහි වන්නෝය."

**1998 මාර්තු 09**

"මා මෙ ලොවට පැමිණියේ පාපිෂ්ඨයන් මුදනු සඳහා මිස ධර්මිෂ්ඨයින් උදෙසා නො වේ. තමන් ධර්මිෂ්ඨ යැයි කියා ගන්නෝ නුඹලා පසු පස සැරිසරමින් නුඹලා විනිශ්චය කරමින් නුඹලාට පහර දීමට සැරසෙති. ඔවුන්ගේ පාපිෂ්ඨ භාවය නොපිළිගැනීමේ මහා වරද නිසා ඔවුන් පාපිෂ්ඨයින් යැයි මම ප්‍රකාශ කරමි. ---- මා ලැගුම් ගන්නේ ද මා රජකම් කරන්නේ ද කිළිටි දුගීන් අසරණ පාපිෂ්ඨයින් තුළ ය. මා එදා සකේවුස්ගේ නිවසේ ආහාර වළඳින විට පරිසිවරුන් මා ප්‍රතික්ෂේප කළාක් මෙන් නුඹලා ව ද ප්‍රතික්ෂේප කරනු ඇත. බාහිර පෙනුමෙන් කිසිවකු මට සුදුසු නැත. ඇතුලාන්තිකරණයෙන් මා ඔවුන් තුළ රජකම් කරන්නට සැලසුම් කරන්නෙමි. ---- මා ඔබ තුළ ජීවත් වන්නට නම්, මාගේ රාජ්‍යයට ඇතුළු වන්නට නම් ඔබ කුඩා දරුවකු විය යුතුය. ඔහුගේ මනස පිරිසිදු යː ඔහුගේ ක්‍රියාදාමයන් පිරිසිදු ය. අන් අය සමග සිනාමුසුව ඔහුගේ ආදරය බෙදා ගැනීමේ චරිත ලක්ෂණ එහි ඇත්තේය. ---- මාගේ සහෝදරවරුනි, මාගේ ගමන හැකි නම් එකෙක් හෝ යේ වා! එවිට මම ඔහු තුළින් නව මිනිසියාව ගොඩනගා ඉහළින් වඩින සංඝය නම් මා විසින් තෝරා ගත් මෙම සංඝය බව ප්‍රකාශ කරමි."

**1998 මාර්තු 22**

"සැම විට ම මා නුඹලා සමග ජීවත් වන බැවින් බිය නො වන්න. මාගේ නාමය තුළ නුඹලා ගැළවීම ලබන්නාහුය. ලොවේ යම් යම් විපර්යාසයන් සිදු වන විට පවා මාගේ නාමය කියා අයදින යමෙක් වේ ද ඔහු මාගේ ගැළවීමට හවුල් වන බව ප්‍රකාශ කරමි. නුඹලා මගේ මේ ගමන තුළ කටුකත්වය අත්දකිමින් ගමනේ වේදනාවෙන් කෙඳිරිගාන මොහොතේ දී පවා මගේ දයා වතමඬල දෙස නුඹලා මහත් ආදර කරුණාවෙන් බලන්නාක් මෙන් නුඹලා මෙ ලොව ජීවත් වන තාක් කල් ද මාගේ පියාණන්ගේ භෝජන සංග්‍රහයට හවුල් වන තාක් කල් ද මගේ ධර්මිෂ්ඨයින් ගණයේ ලියවෙන ලෙස කැප වුන ජීවිත ගත කරන ලෙස මම ඔබගෙන් අයැද සිටිමි. ඔබ වෙත එන සැම ගැටළුවක දී ම සැම ප්‍රස්තාවක දී ම මගේ නාමය තුළ පෝෂණය ලබන්න. ඔබ අන් අයට ප්‍රකාශ කළ යුතු දෑ එවිට මම ඔබගේ ආත්මයට ප්‍රකාශ කරන්නෙමි."

(**භය වන ඥානකාන්තිය 1998 මාර්තු 23-29** දක්වා පැවැත්විණ. එහිදී ලැබුණු අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කිපයකි, මේ.)

"බාහිර වත්පිළිවෙත්වලින් නො ව නුඹ ඇතුළු සිතින් මා හට අමතන විට මා නුඹ තුළ ජීවමාන ව වැඩසිටිමින් ඔබගේ ඇතුළු සිතට අමතමින් ඔබ මෙහෙය වන බව අමතක නො කරන්න. ---- මගේ පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීම උදෙසා ම කැප වූ ජීවිතයක අවසන් අදියරේ මා මල් උයනට වැඩම කළ මොහොතට, ජෙත්සමෙනියෙහි මා අත්දුටු ඒ භයංකාර මොහොතට මා ඇළුම් කරන බැවින් මා එය ඉතා ආදරයෙන් සිප වැළඳ ගත් මරණයක් බැවින් නුඹලාගේ නව පාස්කුව තුළ මා නිසි ලෙස අත් දකින්නට සැරසෙන්න. බාහිර වත්පිළිවෙත්වලින් නො ව නුඹගේ ඇතුලාන්තයේ නව චින්තනය තුළින් මගේ පාස්කුව සිහි කරමින් නුඹගේ එතෙර වීමේ මහා මංගල්ලය, ගැළවීමේ ඒ මහා පිම්ම ඔබ තුළ සපල වේ වා! ඒ සඳහා මගේ කැමැත්ත පමණක් මඳ ය. නුඹගේ නිදහස් කැමැත්ත ද මා තුළ තැබිය යුත්තේය. ---- නව ජීවිතයට ඇතුළු වීම නම් නුඹේ මැවුම්කරුවාණන් ද මුළු මිනිස් වර්ගයා ද මා මැවූ සැම දෙය ද නුඹ සමග මිත්‍රත්වයෙහි ගිවිස ගැනීම බව සිහි තබා ගන්න. ---- අනෙකා දෙස රවමින් අනෙකාගේ දුවිල්ල සෙවීම උදෙසා ගන්නා වූ වෙහෙස දැන් වත් නිමා කරපන්න. නුඹ තුළ ඇත්තා වූ මමත්වයේ මහා දැවය ඉවත් කිරීම උදෙසා මේ මොහොතේ සිට වැය වී ක්‍රියා කරපන්න."

"සියල්ලන්ට සමාව දානය කරන්න. සමාව උත්සව ශ්‍රීයෙන් පවත්වන්න. නුඹලාගේ සතුරන්ට සිතින් සමාව දී ඔවුන් ව ආදරයෙන් සිප වැළඳ ගැනීමට සූදානම් වන්න. එලෙස මා නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹ එකිනෙකාට ප්‍රේම කරන්න. ---- මාගේ පියාණන්ගේ කැමැත්ත අනුව

සැනසිලිදායකයාණන් මෙන් ද නුඹලාගේ දාසයා, සේවකයා මෙන් ද නුඹලාගේ ජීවිතය පුරාවට මා නුඹලා වෙත පැමිණ හමාර ය. නුඹලා මින් පසු කරන කියන සැම දෙයක් තුළ ම මා නුඹලා සමග ජීවත් වන බව තරයේ විශ්වාසයට නගාපන්න. ---- මට ඇතුළු වීමට ද ඔබ හා කතා කිරීමට ද ඔබගේ ඇතුළු සිත මට විවෘත කළ මැනව. තෝරා ගත් පිරිසකට නො ව මුළු මිනිස් සංහතිය උදෙසා මාගේ ආත්මානුභාවයෙන් ප්‍රකාශ වූ අනාවරණයන් ලොව මුළුල්ලේ ව්‍යාප්ත වීම මගේ පියාණන්ගේ කැමැත්ත බව මම ප්‍රකාශ කරමි. එනිසා ශුද්ධාත්මයාණන්ගේ නව මඟ පෙන්වීම තුළ ඔබ සැමට විටෙක මාගේ අනාවරණයන් ලැබෙනු ඇත. ජේසු සමිඳුන්ගේ පැමිණීම ආසන්න ය. මනස්ස්ථාපනය වන්න. එම වදන් ඔබට ඇසෙන විට එය මගේ හඬ බව පිළිගන්නට සූදානම් වන්න."

("නික්ලස් පියාට සංදේශයක් නිකුත් කරපන්නැ"යි ජේසු සමිඳුන් පැවසූ නිසා අතිගරු නික්ලස් මාකස් අගරදගුරු තුමා වෙත මම ලිපියක් යැවීමි, අපට එතුමන් හමුවන්නට ඇවැසි බව දන්වා. සමිඳු එඬේරා පූජක සංඝය අගරදගුරු තුමා අතින් ආසිරි ගැන්වීම ජේසු සමිඳුන්ගේ කැමැත්ත විය. විටින් විට ලිපි තුනක් පමණ එතුමාට යැව්වත් ඒ කිසිදු ලිපියකට පිළිතුරක් නො ලැබිණි. අප සංඝයේ ජෙරාඩ් සොයුරා එකල බත්තලන්ගුංඩුවේ ධීවර කටයුතුවල යෙදී සිටියේය. "මා ඉතා ආදරය කරන ධීවර ජන කොටස වෙතට නුඹලා නොබෝ දිනකින් ගමන් අරඹන්නැ"යි ජේසු සමිඳුන් පැවසූ නිසා ඒ ගමනට අපි සූදානම් වීමු. අප සංඝයේ දොළොස් දෙනකු පමණ ඒ ගමන යන්නට අදහස් කළත් 1998 අප්‍රේල් පළමු වන දින ගමනට සහභාගි වීමට හැකි වූයේ 6 දෙනකුට පමණි. ගමන යන අතර මඟ දී ඩිල්ෂාන් මගින් ජේසු සමිඳුන්ගෙන් පණිවුඩයක් ලැබිණි. එයින් කියවුණේ ගමන යන්නට සූදානම් වූ අනෙක් අය නවත්වා සමිඳු එඬේරා පූජක සංඝය හැටියට එතුමන් විසින් කැඳවූ හය දෙනා පමණක් රැස්කර ගත්තේ බත්තලන්ගුංඩුව දේවස්ථානයේ දී ජේසු සමිඳුන් විසින් ම එයට මුල පිරීම සඳහා බව යි. එලෙස ම සිදු විය. එහි දී ජේසු සමිඳාණෝ ඩිල්ෂාන් උපයෝගි කර ගනිමින් සිදු කළ බයිබලිය මෙහෙයේ දී ශුද්ධ බයිබලයේ මතෙව් 10 වන පරිච්ඡේදය ඉදිරිපත් කරමින් එය හය දෙනාගේ ම සහභාගිත්වයෙන් කියවන්නට සැලැස්වූහ. අප්‍රේල් 3 අපි ආපසු පැමිණියෙමු. එය කල්පිටියේ සිට කිලෝ මීටර් 32ක් බෝට්ටුවෙන් යා යුතු ගමනකි. එහි දී ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයක් පහත පළ වේ.)

"සමිඳු එඬේරා පූජක සංඝයේ පුතුනි, දියණියනි, නුඹලා මෙ ලෙස මට ප්‍රතිඥා දෙන්න. සමිඳු එඬේරා දූත මෙහෙවරේ ආරම්භකයාණන් හා නිර්මාතෘවරයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුස් ස්වාමිනි, ඔබ වහන්සේගේ ශුද්ධ වූ ආරාධනයට පවිකාර වූ අපි අවංක ව නිහතමානි ව එකඟ වන්නෙමු. ඔබගේ සේවය අන් අයට ලබා දීම උදෙසා ඔබ මා ඔවුන් තුළ දාසයකු, දාසියක මෙන් යෙදවීමට ඔබ තුමන් ගත් තීරණය මම සතුටින් භාර ගනිමි. එමෙන් ම මා හට තිබෙන්නා වූ සැම දෙයක් ම ඔවුන් සමග ප්‍රේමයෙන් බෙදා ගෙන සාංඝික ව ජීවත් වීමට ද කිකරු, පිරිසිදු, දිළිඳු, අවංක, බැහැපත්, එකමුතු ජීවිතයක් ගතකිරීමට ද, මම ඔබ වහන්සේ මධ්‍යයෙහි පොරොන්දු දෙමි. මාගේ ගැළවුම්කරුවාණන් ද ස්වාමියාණන් ද වන අජබාලක අග්‍ර පූජක ක්‍රිස්තුවරයාණෙනි, මගේ ජීවිතය ඔබ කැමති ආකාරයට ඇඹීමටත් ඔබ කැමති ආකාරයට පල ප්‍රයෝජන ලබා ගැනීමටත් මම ඔබ වහන්සේ මධ්‍යයෙහි මාගේ එකඟතාවය ප්‍රකාශ කර සිටිමි. ඔබගේ කැමැත්තට මුළුමනින් නතු වන්නට ද ඔබගේ වචනයේ සුබ දහම ලොවට ප්‍රකාශ කරන්නට ද මම මහත් කැමැත්තෙන් සිටිමි. එමෙන් ම මා හට පැමිණෙන්නා වූ සියලු කරදර බාධක මධ්‍යයෙහි එක ම විසඳීම ද ගැළවීම ද ඔබ වහන්සේ පමණක් බව මා ඔබට ම කැප වෙන මේ මොහොතේ මම ස්ථිර අධිෂ්ඨානයෙන් යුතු ව ප්‍රකාශ කරමි."

(තව දුරටත් එතුමෝ මෙලෙස ද පැවසූහ.) "---- මගේ සමිඳු එඬේරා දූත මෙහෙවර තුළ දිළිඳුකම ප්‍රමුඛ ස්ථානයෙහි ලා පැවතිය යුතුය. ---- මා මිනිසකු ලෙස මෙ ලොව දිවි ගෙවූ කාලය තුළ මම ද නිස්කලංක වූ මෙ වැනි ධීවර ගම්මානයන් තුළ සැරිසැරූ බව නුඹලාට ප්‍රකාශ කිරීම සඳහා නුඹලා මෙහි කැඳවා ගතිමි. කිසි ම සැප පහසුවකින් තොරව මා ද හිසට ගලක් තබා නිදා ගත්තා වූ ඒ වැලිතලාව නුඹලා ද එය අත්දකිමින් එයට සමීප වූ ආකාරය මම සතුටින් බලා සිටියෙමි."

**හත් වන ඥානකාන්තිය 1998 අප්‍රේල් 13-19** පැවැත්විණ. එහි දී ඩිල්ෂාන් මුවින් ජේසු සමිඳුන්ගෙන් ලැබුණු පණිවුඩවලින් උපුටා ගත් කොටස් කීපයක් මම ඔබ ඉදිරියේ තබමි.

"මගේ පාස්කුව උදෙසා ජෙත්සෙමෙනි උයනේ ගතකළා වූ ඒ හෝරාවන් තුළ මගේ පාපිෂ්ඨකම උදෙසා නො ව මුළු මිනිස් සංහතියේ පාපිෂ්ඨකම උදෙසා ඒ දුක් පාත්‍රය පානය කරමින් දෙවි පියාණන් මහිමයට පමුණුවන්නට මා ගත් තීරණය ලෙස මහා සිකුරාදා දින මිනිස්

වර්ගයා වෙනුවෙන් මහා ජීවිත පූජාවක් කරමින් මුළු මිනිස් සංහතියට ගැළවීමේ දොර කවුළු විවර කළෙමි. ---- මා උත්ථාන වුවා යැයි කියා මා රජෙක් යැයි කියා මා රාජ සිංහාසනාරූඪ නැත. නුඹලා සමග තවමත් නුඹලාගේ ජීවිතයන් තුළ මමත් වැටෙමින් නුඹලා තුළ ම නැගිටිමින් නුඹලා ව කැඳවා ගෙන යන්නට මම නැවත පැමිණි බව ප්‍රකාශ කරමි. ---- මගේ දහම ගැනත් මා ගැනත් නුඹලා දැන ගත්තා වු ද දැන ගන්නා වු ද දෑ තුළින් නව මිනිසකු වෙමින් නොමඟ යන සියලු ජනතාව වෙත මගේ නාමයෙන් ඔබ සත්‍යයේ පණිවුඩය රැගෙන යන්න."

"නුඹලාගේ අද කාල මිම් අනුව ක්‍රි.ව 27 අප්‍රේල් 14 වන දින එනම් අද වැනි දිනක සවස් භාගයේ 3:32 පියාණන් වහන්සේට විරුද්ධ ව ආදි මව් පියන් තනා දුන්නා වූ ප්‍රාකාරයන් බිඳලෑමේ මහා සටනේ අවසානය දක්වා ම මා ජයග්‍රාහි ලෙස එතෙර වූ මොහොත යි. දරුවෙනි, නුඹලා ශෝක විය යුතු නැත. නුඹලා කා බී ප්‍රීති ප්‍රමුදිත වන්න. තගේ ස්වාමින් වහන්සේ තට වඩා බලවත් වු ද තා නොමඟ යවන්නා වූ ද නපුරා සදාකාලයට ම පරාජය කළ බැවිනි." (සිංහල අවුරුද්දේ රතිඤ්ඤා හඬ ගම් දනව් සිසාරා පැතිරෙන මොහොතේ යි, ඉහත සඳහන් එම වචන ප්‍රකාශ වුයේ.) "නුඹලා සැම ළදරුවන් මෙන් මා තුළ ජීවත් වන්නට උත්සාහ දරන්නේ ද මා මුළු විශ්වයේ පමණක් නො ව මාගේ පියාණන්ගේ අති විශිෂ්ඨ රහස් පවා නුඹලාට හෙළි කරන්නට මම කැමැත්තෙමි. නුඹලා වයසින් මුහුකුරා ගිය ද ළදරුවන් සේ හැසිරෙන්න. ---- මෙ ලොවට එන විට නුඹ ගෙන ආ කිසිවක් නැත. මෙ ලොවින් නුඹ යන විට ගෙන යන දෙයක් ඇත. ඒ නුඹ කළ යහපත සහ අයහපත යි."

(**අප්‍රේල් 14** වන දින දවල් 12:00-3:32 අතර කුරුසිය මත ජේසු සමිඳුන් ඇණ ගැසූ ඉරියව්වෙන් ඩිල්ෂාන් ඇඳක් මත පැය දෙකක් පමණ කාලයක් වැතිරී නොසැලී නිහැඬියාවෙන් සිටින්නට ජේසු සමිඳාණෝ සැලැස්වූහ. නිහැඬියාව බිඳිමින් විටින් විට මෙම වදන් නික්මිණි.)

- "නුඹලා දේව ද්‍රෝහියා ලෙස මා අමතමින් පියාණන්ගේ වචනයාණන් නිර්වස්ත්‍ර කළෙහුය. නුඹලා දාදු දමන්නා වූ මාගේ උතුරු සළුව නුඹලාට හිමි නැත. මා උදෙසා ද අන් අය උදෙසා ද තමන් කැප කර ගන්නා වූ පූජා වන්නා වූ කෙනෙක් වේ ද ඔහු මාගේ උතුරු සළුව ද හිමි කර ගත්තාදෙන්."

- "නො හඬන්න, නුඹගෙන් මා මිනිස් පුතෙක් වුයේ ද පියාණන්ගේ සැලැස්ම උදෙසා ය. මා නුඹගේ ගර්භයට ඇතුළු වූ මොහොතේ සිට මේ තාක් දුක අනුභව කළෙමි. මුළු මිනිසියාවේ ම මුල් ස්ත්‍රිය කළා වූ මහත් වූ පාපයට ස්ව කැමැත්තෙන් ම මාගේ කටයුතු කිරීම උදෙසා මා හට සහාය දැක්වූ මරියාවෙනි, නුඹ අතිශයින් භාග්‍යවන්ති ය."

- "ලොවට පාපය ඇතුල් කළේ ද, ලොවට ගැළවීමට මාර්ගයක් වුයේ ද, ලොවේ ගැළවීමේ සීනුව නාද කළේ ද ස්ත්‍රියක් බැවින් කිරි දුන් පියයුරු ද දරුවන් ලැබූ ගර්භයන් ද මතු කලට ප්‍රීති වන්නේය."

- "පාපය නිසා නුඹලා හා දෙවි පියාණන් අතර පැවති මහා පරතරය මගේ ජීවිත පූජාව නිසා අවසන් විය. ඒ නිසා මහෝත්තමයාණන්ට පියාණෙනි කියා ඇමතීමේ වරම නුඹලාට ලැබෙන්නේය."

- "නුඹලා වසර හාර දහසකට අධික කාලයක් පුරා බිළි පූජා තබමින් පාස්කුව සිදු කිරීම උදෙසා නුඹලාගේ මහත් වූ නික්මයාම සිහි වීම උදෙසා දිවි දුන් සියළුම සත්ව පූජාවන් මෙ තැනින් නිමා කරත්වා. දෙවිඳාණන්ගේ මහා බැටළු පෝතකයා වන මගේ ජීවිත පූජාව තුළින් ඒ සත්ව බිළි පූජාවන් සදහට ම නිමා වෙත් වා !"

- "නුඹලා බිළි පූජා කළා වූ බැටළුවාගේ රුධිරය නුඹලාගේ උළුවහු මත එදා තැවරුවාක් මෙන් නුඹලාගේ ජීවමාන නිවහන වන නුඹලාගේ ශරීරයේ මුඛය මත ද නුඹේ සිත තුළ ද ජේසුස් නමැති මගේ ජීවමාන නාමය තබා ගනිත් වා. එවිට පියාණන්ගේ උදහස නුඹලා කෙරෙහි නො ඇවිලෙන්නේය."

- "නුඹලා වයසින් මුහුකුරා ගිය ද වයෝවෘද්ධයන් වුව ද දෙවි පියාණන් අබියස ළදරුවන් වන්න. එවිට සියල්ල නුඹට නිරාකරණය කිරීම ද පැහැදිළි කිරීම ද පියාණන්ගේ දූතයන් ලවා සිදු වන බැවින් නුඹලා භාග්‍යවන්ත වන්නහුය."

- “මා පියාණන් මැවූ මුළු විශ්වය ම කැළඹෙන මොහොත උදා වන්නේය. සාතන් නුඹ මා පරීක්ෂා කිරීමෙන් නුඹට ජයග්‍රහණයක් නොමැති බැවින් නිරයට ම පලා යනු.”

- “අති උත්කෘෂ්ඨ වූ ගැළවීමේ කාර්යය සපුරාලනු සඳහා මහත් කුසලක් ලෙස නිර්මාණය වූවා වූ නුඹලා මට තෑගි කළා වූ මගේ කුරුසිය නම් ඕක් සිංහාසනයේ සුවඳ මම නුඹලා වෙත වගුරුවන්නෙමි.”

- “මගේ පියාණෙනි, ඔබවහන්සේගේ විශ්ව නිර්මාණයේ දෑතට මගේ විශ්වයීය හුස්ම පවරා දෙමි.”

(එදින, අප්‍රේල් 14 ජේසු සමිඳුන්ගේ කුරුසියේ සළකුණ ඉහළ අහසේ දර්ශනය වනු නැරඹීම සඳහා සූදානම් වන්නැ යි ජේසු සමිඳාණෝ පැවසූහ. අපි මිදුලට බැස ඉහළ අහස දෙස බලා සිටියෙමු. එවිට ඩිල්ෂාන් මුවින් ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) “නුඹලා විශාල වූ පෘථිවිය මත සිට මාගේ කුරුසියේ සළකුණ දර්ශනය වනු දැකීම සඳහා ඉහළ අහස දෙස බලා සිටියෙහුය. මා මවන ලද්දා වූ මහා කුරුසිය මෙම විශ්වය ම බව මම ප්‍රකාශ කරමි. නුඹලා මිහි මත ජීවත් වීම නුඹලා කුරුසියේ ඇණ ගසා තිබෙන්නා වූ ජීවිතය හා සමාන ය. නුඹලා ජීවත් වන්නේ ද නුඹලාගේ ජීවිතය පූජා කරන්නේ ද මේ විශ්වයීය කුරුසිය මත බව නුඹලාට තහවුරු කරනු සඳහා මේ අභ්‍යාසය මම නුඹලාට දුනිමි. කුරුසිය මත මා පියාණන් මහිමයට පත් කළාක් මෙන් නුඹලාත් පියාණන් මහිමයට පත් කරන්න. එවිට නුඹලාත් දෙව් පියාණන්ගේ ජීවිතයේ සදාකාලික හවුල්කරුවන් වන බව ප්‍රකාශ කරමි.”

“නුඹලා සැම විට ම මනස්ස්ථාපනයේ ජීවිතයක් තුළ උත්ථාන වූ ජීවමාන ස්වාමින් වහන්සේගේ ජේසුස් යන නාමය තුළ ජීවිතය ගත කරපන්න. මේ නාමය ඇසෙන තැන ද මේ නාමය කියවෙන විට ද නපුරා ගව් ගණන් පලා යන්නේය. නපුරා නුඹට තුරුළු වන්නට උත්සාහ දරන්නේ නුඹ මා අමතක කරන විට ද නුඹට මා එපා වන්නා වූ විට ද බැවින් සාර්ථක අසාර්ථක සැම විට මා තුළ ජීවත් වන්න. මා උත්ථාන වූ බව විශ්වාසයේ බලය තුළ ඔබ විසින් ලොවට හඬගා කීමේ කාලය උදා වී ඇත. නුඹලා ව ප්‍රතික්ෂේප කරන්නේ කවරෙක් ද වඩවඩාත් ඔහුට ප්‍රේම කරමින් මගේ නාමය ඔහු තුළ රජකම් කරන්නට සැලසුම් කරපන්න. ---- මනස්ස්ථාපනය නමැති ගිනි උදුනින් නුඹගේ සියලු පාපිෂ්ඨ භාවයන් දවා දමමින් සමිඳුන් වෙත හිස් බඳුනක් මෙන් පැමිණෙන විට සමිඳාණන් වහන්සේ එය පුරවා ලන බව විශ්වාස කරපන්න. ජේසුස් යන නාමය තුළ ශක්තිමත් වන්න. එවිට ජීවිතයේ පහසු බවත් පලබර බවත් නුඹට වැටහෙනු ඇත. මගේ නාමයට සියල්ල කළ හැකිය. නුඹගේ සරණය මාගේ නාමයෙහි ය යන ඒ වදන් තුළ නුඹ නිතර ම හැසිරෙන්න.”

“දරුවෙනි, මුළු මිනිස් සංහතිය වෙත ම සමාව දානය කරමින් නුඹලාට වෛර කරන්නන්ට මහත් සේ ප්‍රේම කරන්න. ඔබ සතුරා සමග මිත්‍ර වන විට මගේ ස්වර්ගයේ ප්‍රීතිය දෙ ගුණ තෙ ගුණ වන්නේය. නුඹ මා ලබා ගත්තේ නුඹ තුළ මා ජීවත් කරවීම උදෙසා බැවින් සාමයෙන් ජීවිතය ගෙන යන්න. ඔබට කෙතරම් වෛර කළත්, ඔබ විනාශ කරන්නට ඔබට හදි හූනියම් කළත් ඔබ ඔවුන්ට ප්‍රේම කරන්නඃ සමාව දෙන්න. මා කිසිදු වරදක් නොකර වින්දා වූ දුක් අපහාසයන් සාධාරණ නම් නුඹලාට විඳින්නට සිදු වන සියල්ල අසාධාරණ යැයි කියන්නේ කෙසේ ද? මිනිසුන් අතර දුර්වල මිනිසුන් නො වන්න. මිනිස් දුබලකම් තේරුම් ගනිමින් සමිඳුන්ගේ පූජා වීම නුඹලාගේ ජීවිත තුළත් ප්‍රායෝගික කරපන්න. ---- මා ප්‍රිය දරුවෙනි, එදා මා ඔවුන්ට ප්‍රශ්නයක් වූයේ නම් නුඹලා ඔවුන්ට ප්‍රශ්නයක් නො වන්නේ කෙසේද? අමු ගසට එදින ඒ දණ්ඩනයේ විමුක්තිය ලැබිණි නම් වියලි ගස් කෙලෙස ගින්නේ දවාලයි ද? එහෙත් මා ප්‍රතික්ෂේප නොකරන සංඝය මා මෙ ලොව ස්ථාපිත කර හමාර ය. මෙය කෙනකුගේ ගැළවීමට ද කෙනකුගේ පැකිලීමට ද හේතු වන බව මම ප්‍රකාශ කරමි.”

## 21

# “සැනසිලිදායකයාණන් නුඹලා තුළ රජකම් කෙරේ වා !”

’දහම් නවෝදය’ එකතු කිපයක දි ලැබුණු අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කිපයකි, මේ. මෙහි සඳහන් පණිවුඩ දෙකක් හැර අන් සියල්ල ඩිල්ෂාන්ගේ මුවින් නික්මුණ ජේසු සමිඳුන්ගේ වදන් ය.

**1998 මැයි 10**

“අප්‍රේල් 17 සිට මගේ උත්ථානයෙන් 50ස් වැනි දිනය තෝරා ගෙන මගේ සංඝය වන නුඹලා මෙ වර මාගේ රුවාහ්ණන්ගේ මංගල්ලය පවත්වාපන්න.” (රුවාහ් යනු හීබෘ බසින් ශුද්ධාත්මයාණන් ය.) “එයට සූදානම ලෙස දෙවි පියාණන් කෙරෙහි සා පිපාසාවක් ද මනස්ස්ථාපනයේ සිතක් ද දිළිඳුකමේ හදවතක් ද ඇති කර ගන්න. එවිට මා හට නුඹ තුළට ඇතුල් ව නුඹ ව වෙනස් කරන්නට ද නුඹ ව පුරවන්නට ද මට නුඹ තුළ වැඩෙන්නට ද ඉඩ ප්‍රස්ථාව ලැබෙනු ඇත. ---- මගේ පියාණන්ගෙන් ලද නිදහස අනුව ලූසිෆර් තව ම නුඹලාට ඉදිරියෙන් ඇත. නුඹලා විසින් මට නුඹලාගේ ජීවිතයට ඇතුළු වන්නට ඉඩ සලසන මොහොතේ පටන් ඔහු නුඹලා සමග වෛර බැඳගෙන නුඹලාගේ මිනිස් දුබලකම් තුළින් නැවතත් නුඹලා තුළට ඇතුලු වන්නට ක්‍රියා කරයි. පියාණන් මා හට දානය කළ ජේසුස් යන උත්තරීතර නාමය ඉදිරියේ නපුරා පලා යන බව නුඹලා දන්නහුය. නුඹ කළ යුත්තේ මගේ නාමය සැම විට ම නුඹගේ මුව’ග තබා ගැනීම ය. ඒ නාමය නොබිය ව ප්‍රකාශ කිරීම ය. එවිට පියාණන් වහන්සේ ඒ තුළ මහිමයට පැමිණෙති. ---- මා විසින් නුඹලා ගෙන යන මේ ගමනේ ජය ටැඹ කරා නුඹලා සැම සතුටු සිතින් පා නගන්න. ඒ ගමනේ නීරසය දක්වා නුඹලා සැම ගමන් කරන්නහු නම් එය පවා සමිඳාණන් වහන්සේ තුළ පැණි රසට හැරෙන බව දැන ගන්න. යමකුට පැකිලීමට ද යමකුට ගැළවීමට ද මා තෝරා ගත් සංඝය හේතු වන බව මම ප්‍රකාශ කරමි.”

(1998 ජුනි මුල සිට සුජීවා අත්දුටු තත්ත්වය 1997 දී සුජීවා මගින් ජේසු සමිඳුන් තැබූ සටහනක් අපට මතක් කර දීමක් විය. ලූසිෆර් ඇය කෙරෙහි බද්ධ වෛරයෙන් සිටින බවත්, එනිසා ජේසු සමිදුන් විසින් යම් මොහොතක නපුරාට පැය 24ක් දෙමින් ඒ කාලය තුළ හැකි නම් ඇය ව ගන්න යන අභියෝගය ඉදිරිපත් කරන බවත්, ජේසු සමිඳුන් ඇය සුරකින බවත්, ඇය ව ගන්නට නපුරාට අවසර ඇත්තේ ඇගේ ම අතින් ඇගේ බොටුව කැඩීමෙන් පමණක් බවත්, ඒ තුළ අප සංඝයට ද පැවරෙන කාර්යයක් ඇති බවත්, අපගේ කොටස පැහැර හැරියොත් නපුරා ඇය ව ගන්නට පෙර ජේසු සමිඳුන් ඇය සදහට ම කැඳවා ගන්නා බවත් එයින් කියවිණ. ජුනි 04, ඒ දිනය උදා විය. අපි යාච්ඤාවෙන් ඇය වටා සිටිමින් අපගේ කොටස ඉටු කළෙමු. ලූසිෆර්ට කොහෙත් ම ඉඩක් නොලැබෙන බව වටහා ගනිමින් ජුනි 04 රාත්‍රි 9:55ට ඇයගෙන් නික්ම යන විට ම ජේසු සමිඳාණෝ සුජීවාගේ මුවින් මෙ ලෙස පැවසූහ.) “මාගේ දරුවෙනී, මම මහත් සේ ප්‍රීති වන්නෙමි. මක්නිසාද නපුරා දෙ වන වරට ද පරාජය විය. නුඹලා මැය වෙනුවෙන් දැරූ වෙහෙස මහන්සිය ගැන මම තුති පුදමි. නුඹලා සැම දම්වැලක පුරුක් මෙන් එකට එකමුතු ව සිටින්නට වග බලා ගන්න.”

**1998 ජුනි 5 ශුද්ධාත්ම මංගල යැදුමට පෙර**

“මගේ සහෝදර සහෝදරියනී, දෙවි පියාණන් කෙරෙහි පිපාසයක් ද මනස්ස්ථාපනයේ සිතක් ද දිළිඳුකමේ හදවතක් ද ඇති කර ගන්න. එය ඉටු වූ විගස මගේ සැනසිලිදායකයාණන් වන මගේ ප්‍රති හුස්ම නුඹලා වෙත පතිත කරමින් එහි ගිල්වා ලන බව මම ඔබට පවසමි. ---- අනෙකා වෙනුවෙන් වැය වනු සඳහා ඔවුන්ට පෑගී පොඩි වෙන්නට තරම් බැහැපත් වන්න. එවිට ගලා යන්නා වූ නුඹගේ දහඩිය බිඳු හා රුධිරය ක්‍රිස්තුස් වන මගේ දහඩිය බිඳු හා රුධිරය බව වටහා ගන්න. ඔබ පූජක, දිව්‍යසියේ හා එඩේරික ජනතාවක් නම් එය ඔබ තුළ ඉටු විය යුතු ම ය. මහිම ප්‍රතාපවත් අජබාලකයන්ගේ රුධිරයේ ස්පර්ශය තුළ හිස් වන්නට ද බැහැපත් වන්නට ද මනස්ස්ථාපනය වන්නට ද මම ඇරයුම් කරමි. ---- ජෝනා මගේ වැඩය කළාක් මෙන් මගේ සංඝය වන නුඹලා ද මගේ වැඩය කරන බව මගේ සියලුම සහෝදර සහෝදරියන්ට මම දන්වා සිටිමි.”

**1998 ජුනි 5 ශුද්ධාත්ම මංගල යැදුමේ දි**

“මගේ දෙ වන පෙන්තකොස්තයේ දී මා නුඹලාට දෙන්නට පොරොන්දු වූ ඒ ශුද්ධාත්ම ගින්න මා නුඹලාගේ ඇතුලාන්ත සිතෙහි දල්වන මොහොත උදා වී ඇත්තේ ය. මුළු ලොව පුරා එදා ධර්ම ද්වීපය නමින් ද අද ශ්‍රී ලංකාව නමින් ද හැඳින්වෙන ඉන්දිය සයුරෙන් වට වී තිබෙන

මේ පුංචි දිවයිනේ බිහි වූ මගේ ධර්මිෂ්ඨ ලෝක එඬේරාණන් වන ජෝශප් ඇන්තනි මම මෙ ලෙස ලොවට ප්‍රකාශ කරමි. මගේ දෙ වන පෙන්තකොස්තය මුළු විශ්වය සිසාරා දිස්වන මොහොතේ දී ස්වර්ගය විවර කරමින් මම එය ලොවට හඬගා ප්‍රකාශ කරන්නෙමි. මා තෝරා ගත් සංඝය වන නුඹලාගේ එකමුතු වීම මගේ ශරීරය නිර්මාණය වීම බව නපුරා දන්නා බැවින් නුඹලා භේද භින්න කරන්නට ඔහු ක්‍රියා කරන්නේය. ඔබ මේ මොහොතේ පටන් නපුරා දෙ වන වරට ද පරාජය කරමින් රාජ සිංහාසනාරූඪ ව වැඩවසන ජේසුස් යන නාමය තුළ ශක්තිය ලබන්න.” (පෙන්තකෝස්ත යන්නෙහි තේරුම පනහ යන්න යි. නව ගිවිසුමේ දී මෙය ශුද්ධාත්ම මංගල්ලයය හඳුන්වන වචනයකි. ජේසු සමිඳුන්ගේ උත්ථානයෙන් 50ස් වැනි දිනයේ දි ය, ශුද්ධාත්මයාණන් දානය කළේ.)

**1998 ජුනි 21**

“මගේ ප්‍රිය සහෝදර සහෝදරියනි, නුඹලා මගේ දහම ලොව පුරා ගෙන යන දිවැසිවර, පූජක, රාජකීය ජනතාවක් බැවින් නුඹලා ප්‍රතික්ෂේප කරන අයට නුඹලාගේ වචනය විය යුත්තේ ජීවමාන ජේසුස් ක්‍රිස්තුස් අපගේ රජාණන් ය. එලෙස නුඹලා තුළ මා ජීවත් වන බව ක්‍රියාවෙන් ප්‍රකාශ වන්නට සලස්වන්න. නුඹලා නාමමාත්‍ර කිතුනුවන් නො ව ක්‍රියාවෙන් ම තැලෙන පොඩිවෙන බැට කන සැම දෙයින් ම ක්‍රිස්තුස් යන මාගේ නාමයට සාක්ෂි දරන සහෝදර පිරිසක් බව එවිට ඔවුන්ට අවබෝධ වනු ඇත. ඔබ යන එන සැම තැන සැම විට මගේ නාමය වෙතට එක් අයකු හෝ දිනා ගන්නෙහි ද ස්වර්ගය ප්‍රීති ප්‍රමුදිත වී ඔබට බලය ද ශක්තිය ද දානය කරනු ඇත.”

**1998 ජූලි 06-12 දක්වා (8 වන ඥානකාන්තියේ දී)**

“මා තුළ කුඩා වන්නාට මා තුළ සදාකාලයට ම වැජඹෙන්නට හැකිය. එවිට ය, මා ඔහු තුළ විශාල වෙමින් මගේ නාමයට ප්‍රබල ලෙස ඔහු තුළින් සාක්ෂි දරන්නේ. මා ලොවට පිළිකුල් වූවාක් මෙන් ද මා ලොවට ප්‍රතික්ෂේප වූවාක් මෙන් ද මගේ සංඝයේ සැම සහෝදර සහෝදරියක් ම ප්‍රතික්ෂේප විය යුතුය. නැතහොත් මගේ දහම ලොවට ප්‍රකාශ කිරීමට නොහැකි වන්නේය. නැති වූ බැටළුවා සොයා යන මගේ කාර්යය උදෙසා මම නුඹලා පත් කරන්නෙමි. නුඹලාගේ කිසි ම ධෛර්යයකින් වත් බලයකින් වත් ඒ කිසිවක් කළ නොහැකි බව සිතට ගනුව. නුඹලා ළඟ සිටිමින් මගේ හා නුඹලාගේ ඇතුලාන්ත සිත වෙන් කිරීමට උත්සාහ දරන මා විසින් පරාජය කරන ලද ලුසිෆර් තවමත්  ඔහුගේ ප්‍රයත්නය හමාර කර නොමැත. නුඹලා මගේ නාමයට උත්තරීතර මහිමය ප්‍රකාශ කරන විට එය කඩාකප්පල් කිරීමට ඔහු සැලසුම් කරන්නේය. හැම විට ම හැම තැන ම මගේ නාමය උදෙසා නුඹලා ක්‍රියා කරන්නහු නම් එයින් ගැළවීමට හැකි වන්නේය. පරවියකු මෙන් අහිංසක ව ද සර්පයකු මෙන් නුවණශීලි ව ද ජීවත් වන්න. මගේ නාමය උදෙසා නුඹලා ප්‍රතික්ෂේප වන්නහුය. බිය නො වන්න. මගේ නාමය උදෙසා යම් දිනෙක නුඹලා විපුල පල ලබා භාග්‍යවන්තයින් යැයි කියන ඒ ස්ථාවරයට මම නුඹලා ගෙන යනු ලබන්නෙමි. මෙ ලොව මිනිසුන් අතරින් නුඹ කොතෙකුත් ප්‍රතික්ෂේප වෙතත් ස්වර්ගීය පියාණන් වහන්සේ ප්‍රතික්ෂේප වන්නා තුළ ජීවත් වන බව අමතක නො කරපන්න. කසළ ගොඩේ සිට මම නුඹලා ඔසවා ගෙන මේ තාක් උසස් කළෙමි; ස්වර්ගය කරා මම නුඹලා ඔසවා ගෙන යන්නෙමි. එකිනෙකා හමු වන සැම විට ම මගේ නාමය අන් අයට කොඳුරා මා විගස පැමිණෙන බව ප්‍රකාශ කරපන්න. ---- ජීවිත ප්‍රශ්න තුළ තැලෙන පොඩිවෙන ඔබට මම මෙසේ කියමි. ජීවිතය ඔබට ප්‍රශ්නයක් ය. එහෙත් පිළිතුර මම ම වෙමි. නුඹලාගේ සෝ සුසුම් සමග මම ජීවත් වන්නෙමි. නැති වූ එකා සොයා යන මගේ ස්ථාවරය මා කිසි කලෙක වෙනස් කර නොමැත. රෝගීන්ට මගේ සුවය ද මගේ සාත්තුව ද නිරන්තරයෙන් ලැබෙන බව අමතක නො කරපන්න.”

**1998 අගෝස්තු 17-23 (9 වන ඥානකාන්තියේ දී)**

“සියල්ලෝ ස්වාමින් වහන්සේගේ ගැළවීමට ඇතුළු වෙත් වා! එය මගේ පියාණන් වහන්සේ මුළු මිනිස් සංහතිය වෙත දානය කරන අති උතුම් කැඳවීම යි. එයට පිළිතුරු දීම ඔබගේ නිදහස් කැමැත්ත තුළ සිදු විය යුතුය. කිසිවකු බලහත්කාරයෙන් ගැළවීම වෙත ඇදගත නො හැකිය.” (ඥානකාන්තියට සහභාගි වූ අතිශයින් පීඩාවට පත් මවක් අමතා) “ස්වාමින් වහන්සේ තුළ වැළපෙන ජීවිතයකි. සෝ සුසුම් කඳුළු මැද යන ගමන අති අභිරහස්මක ය. නුඹලාගේ දුක් බර උසුලන්නට ද එහි කෙඳිරීම්, මිමිනීම් භාර ගන්නට ද මා නිරන්තරයෙන් සිටින බව අමතක නො කරපන්න. නුඹලා තුළ සදාතනික ස්වාමින් වහන්සේ ජීවමාන බව විශ්වාස කරපන්න. සියලු නපුරු බලපෑම් පහකර ලීම උදෙසා එකම විශ්වාසයෙන් යුක්ත ව මගේ පියාණන්ට එක හඬින් මොරගසා එයින් නිවහල් වීමට සියල්ල සිදු කරපන්න. නුඹලාගේ දුකට සැපට වඩා ඉදිරියේ දී නුඹලා තුළින් මහත් දේ කර ගැනීමට මම ආශාවෙන් සිටිමි.”

**1998 සැප්තැම්බර් 02**

"දින හතලිහකට වරක් පැය හැත්තෑ දෙකක නිරාහාරශීලිත්වයෙන් මා තුළට නිරන්තරයෙන් සංඝය ඒකරාශි කරපන්න. නිරහාරශීලයෙන් හා දැඩි යාච්ඤාවෙන් යුතුව එය ගත කරපන්න. මෙ ලෙස නුඹලා එය ආරම්භ කිරීම ගැන මම මහත් සේ සතුටු වෙමි. මන්ද, ඉදිරියේ සියල්ල සතුටින් විඳිමින් අපහාසයේ මුදුන් මල්කඩ දක්වා ම ප්‍රතික්ෂේපයට, නුඹලා මරු මුවේ මරණයට ගණන් ගෙන සිටින බැටළුවන් මෙන් ගණිනු ලබන මොහොතට නුඹලා තෝරා ගෙන ඇත. නිරාහාරශීලිත්වය හා යැදුම අත්‍යවශ්‍ය කාලය දැන් පැමිණ ඇත. මන්ද, වසර දෙක හමාරක කාලයක මහා බිහිසුණු අත්දැකීමක ප්‍රබල පන්නරයකට නුඹලා මා තුළ ජීවත් වීම සඳහා එය කරපන්න. නුඹලා මගේ ගෝලයන් බැවින් මම ඉදිරි සියලුම සැලසුම් නුඹලාට ප්‍රකාශ කළෙමි. ඒ සියල්ල ඒ ආකාරයෙන් ම සිදු වන්නට පියාණන් වහන්සේ එය ඉතා ලහිලහියේ සූදානම් කරමින් ඇත්තේය. නපුරාට ඒ සියලුම ඔහුගේ වගකීම් කොටස් පියාණන් වහන්සේ විසින් භාර කර හමාර ය. වඩවඩාත් පියාණන්ගේ කැමැත්ත ඉටු වන්නටත් මේ වෙන්නට තිබෙන්නා වූ මහා බිහිසුණු කාලය තුළ යාච්ඤාවෙන් වඩවඩාත් පියාණන් වෙතට ජනතාව ඇද ගන්නට, ගැළවීම ලබන ඒ සංහතිය වැඩි කරලන්නට, කන්නලව් කිරීමට මම නුඹලා වෙත පැමිණියෙමි. එන්නට තිබෙන්නා වූ බිහිසුණු තත්ත්වය කටුක වෙන්නට වෙන්නට වඩවඩාත් මොරගැසීමට ද පියාණන්ගේ ශ්‍රීවතමඬල දැකීමට ද නුඹලා භාග්‍ය ලීලාවෙන් යාච්ඤා කරපන්න. ---- ව්‍යවස්ථාවන්ගෙන් ද සංස්ථාවන්ගෙන් ද සංයුක්ත වූ මෙම සුණු විසුණු වන්නා වූ සභාව ශුද්ධාත්මයාණන් විසින් මෙහෙය වන තත්ත්වයට මම ඔසවන්නෙමි."

(එදින දේව මෑණියෝ සුජිවාගේ මුවින් මෙ ලෙස ඇමතූහ.) "ප්‍රේමවන්ත දරුවෙනි, ගින්නක් ඇවිලේ. එය ශුද්ධ වූ ගින්න යි. ශුද්ධ වූ ගින්න ඇවිලේ. එය නිවී නො යයි. සියල්ල නුඹලාගේ ස්වාමින් වහන්සේ බලා සිටිති. ඉදිරියට තැබූ පය පස්සට නොගන්න. ඉදිරියට ම ගමන් කරන්න. පස්සට ගත් පය තුළ දුක වේදනාවේ ගින්න ඇවිලෙනු ඇතඃ එය නිවෙනු නොමැත. නුඹලාගේ පියාණන් වහන්සේ තබන පා සටහන තුළ ගමන් කරන්නට දරුවෙනි, පහසු නැත. වෙහෙසෙන්න, වෙහෙසෙන්න, වෙහෙසීම තුළ ඒ අඩිය සොයන්න. ඒ සඳහා යි නුඹලාට එඬේරකු පත් කළේ."

**1998 සැප්තැම්බර් 21-27 (10 වන ඥානකාන්තියේ දී)**

"අද නපුරාගේ ක්‍රියාකාරිත්වය තුළ ලොව සැම තැන ම විනාශ වෙමින් ජරා ජීර්ණ වෙමින් ඇත්තේය. ---- ලොව පුරා කොතෙකුත් දේව අනාවරණයන් වෙතත් මගේ ජනතාව තවමත් අන්ධකාරයේ දූතයා සමග පොර බදමින්, ඔහු සමග සතුටු සාමිචියෙහි ඉතා ප්‍රියංකර ව ජීවත් වෙති. එකකු දෙන්නකු නො ව මුළු විශ්වය ම විනාශ වීමෙන් ගළවා ගැනීම මගේ කුරුසපත් වීමේ අරමුණ බව ඔවුන්ට අමතක වී ඇත්තේය."

**1998 නොවැම්බර් 27**

"රැස්වෙන්නා වූ මාගේ නුවර වැසියෙනි, නුඹලා කන්දක් මුදුනේ ඇති නුවරක් වැනි ය. කිසිවකුට කිසි විටෙක එය සැඟවිය නොහැකි වන්නාක් මෙන් මගේ නාමය නිසා නුඹලා ලෝ පුරා ප්‍රසිද්ධියට ද අප්‍රසාදයට ද ලක් වන්නහුය. නුඹලාගේ ජීවිත කාලය තුළ උතුම් යැයි කියා නුඹලා ළං කර ගත් සැම දෙය ම මා නිසා නුඹලාට අහිමි වන ඒ සියල්ල දමා දුවවන කාලයකට නුඹලා දැන් පියවර තබමින් සිටින්නහුය. මුළු මිනිසියාවේ ම ආත්මය උදෙසා නුඹලාගේ ජීවිතය පූජා කිරීමට කාලය යොදවාපන්න. සැනසිලිදායකයාණන් නුඹලා තුළ රජකම් කෙරේවා !"

**1999 ජනවාරි 22**

"මා තෝරා පත්කළා වූ කිසිවෙක් කිසි විටෙක විනිශ්චය කිරීමෙන් වළකින්න. මගේ ළයෙහි නුඹලා වෙසෙමින් නුඹලා ළයෙහි ඔවුන් තබා ගන්නට මා හට ඔබ දුන් ගිවිසුම රැකගන්න. මා නුඹලා තෝරා පත් කරන ලද්දේ ද මා විසින් සංඝය නිර්මාණය කරන ලද්දේ ද ඉදිරි කාලයන් තුළ දී නුඹලාගේ ඒ කැප වීම තුළින් මා කරන්නට යන්නා වූ මහත් දේ ගැන සූදානම් වීමට ය. විශ්වයේ මොන තරම් බිහිසුණු කාලයන් උදා වෙතත් සියල්ල විනාශයේ අබිමුව තිබෙතත් මා නුඹලා සමග ජීවමාන බව අමතක නො කරපන්න. මා නුඹලා තුළට නො එන්නාක් මෙන් මුවා වෙමින් ද නුඹලාට මගේ අනාවරණයන් මඳ වෙමින් ද කාලයේ බිහිසුණුතාවයට මම නුඹලා හුරු කරන්නෙමි. සියල්ල සිදු වෙමින් පවතින බැවින් නුඹලා යුහුසුලු ව ප්‍රේමයට එකමුතුකමට සියල්ල ඒකරාශි කරපන්න. පෙර දා මා පැමිණි විටත් ජනතාව මා නො පිළිගත්හ, ප්‍රතික්ෂේප කළහ. එහි දී අමු ගසට එසේ නම් නුඹලා වැනි වියළි ගස්වලට කෙසේ සිදු වන්නේ ද? මා තුළට ම නුඹලාගේ ජීවිත වෘක්ෂයන් නෙරවන්නට සැලසුම් කරපන්න."

## 22

# "මගේ දහම නොමිලේ ලබන්න, නොමිලේ දෙන්න."

**(අපගේ 16 වන ඥානකාන්තිය 1999 අප්‍රේල් 12-18** පැවැත්විණ. එයට සූදානම් වීමේ සිට ම මහත් දේව අනුග්‍රහයක සළකුණු දිස්විය. එම නිවසේ අය ද ළමුන් ද ඇතුළු 75ක් පමණ ඊට සහභාගි වූහ. එය එම නිවසට ඔරොත්තු නොදෙන තරම් සෙනඟකි. එහෙත් සියල්ලෝ දින 7ක් එහි සතුටින් ගත කළහ. සමහර ඥානකාන්තිවලට දහ දෙනෙක් හෝ රැස්කර ගැනීමට මහත් ආයාසයක් දැරීමට සිදු විය. එහෙත් මෙ වර සියල්ල සිදු වූයේ නිරායාසයෙනි. අපගේ ඥානකාන්තිවලට සහභාගි වන්නන් සඳහා ප්‍රවාහන පහසුකම් ද ආහාර ඇතුළු අනෙකුත් පහසුකම් ද අපි සැපයීමු: ආපසු වාහනයකින් ඔවුන් නිවෙස් දක්වා ගෙන ගොස් ඇරලීමු. ඕනෑ ම කෙනකුට නොමිලේ ම හෝ ඊට සහභාගි වන්නට අවස්ථාව විය. හැකි අය ඔවුන්ට හැකි දෙයින් ඊට දායක වූහ. සංඝයේ ඔතු මුදල් අපි ඒ සඳහා යොදා ගතිමු. ඔතු මුදල් යනු තමා උපයන දෙයින් වෙන් කරන සියයට දහයක මුදල යි. 16 වන ඥානකාන්තියේ දී පමණක් ආහාර හා වාහන කුළි ඇතුළු මුළු වියදම ඊට සහභාගි වූවන්ගෙන් ම ලැබිණි. එම ඥානකාන්තියේ දී සුජීවා මගින් ලැබුණු ජේසු සමිඳුන්ගේ පණිවුඩයෙන් උපුටා ගත් කොටස් කීපයකි, මේ.)

"---- පුරුෂයින් හා ස්ත්‍රීන් ශරීරයේ අවයව අනුව වෙනස් වුව ද ආත්මය එක හා සමාන ය. කෙනකුගේ ආත්මය තුළ යි, මා ක්‍රියා කරන්නේ. ඒ තුළ ඇති නිර්මල භාවය තුළ යි, මා ක්‍රියා කරන්නේ. පාපිෂ්ඨයා පාපයෙන් සෝදා ඒ පාපය ඉවත් කොට නිර්මල සිත ඇති කර ඒ නිර්මලතාවය තුළ මම ක්‍රියා කරමි. එනිසා ඔබ සැම පවිත්‍ර නිර්මල සිතක් මට පුදන්නට සූදානම් වන්න. ---- නුඹලා තුළ තිබෙන පාපිෂ්ඨ භාවය දකින්න. නුඹලාගේ බැරි භාවය දකින්න. එයින් එතෙර වන්නට පිපාසයක් ඇති කර ගන්න. එවිට මම නුඹලාගේ මොරගැසීමට කන්නලව්වට සවන් දෙන්නෙමි. පව්කාරයින් පාපයෙන් මුදවා ගන්නට වැඩි ම පාප ය ඇති තැනැත්තා තුළින් මම ක්‍රියා කරමි. මුළු විශ්වය මවා වදාළ මහා කලාකරුවාණෝ මම වෙමි. නුඹලාගේ එක ම ගැළවුම්කරු මම වෙමි. මා හැර අන් ගැළවුම්කරුවෙක් නැත, ඉදිරියටත් නැත. ---- මගේ දාසිය තුළ, මගේ දාසයා තුළ මා ක්‍රියා කළත් මොහොතකින් මා මොවුන් තුළින් නික්ම ගිය පසු ඔවුන් සාමාන්‍ය මිනිසුන් පමණි. අහංකාර වන්නට කිසිවක් ඔවුන්ට නැත. ඔබගේ නිර්මල සිත මට පුදන්න."

(එම දින හතේ පන්නරය අවසන් වීමත් සමග ම අප්‍රේල් 19-25 ජේසු සමිඳාණෝ සුජීවා දින හතක නිරාහාරයක තබමින් ඇය තුළින් ක්‍රියා කළහ. එය සිදු වූයේ මුරුතානේ දී ය. එම දින හත අප සංඝය තුළ පැවති වියවුල් රැසක් ජේසු සමිඳුන් විසින් සුවපත් කළ කාලයක් විය. මාස කීපයක සිට අප සංඝය තුළ වියවුල් රැසක් මතු විය. එය මට ද ගැටළුවක් වූ මොහොතක සුජීවා තුළින් දේව මෑණියන් රහසින් මෙන් පැවසූ මේ වචන ස්වල්පය මට සවියක් විය. "පසු ව වියවුල් නො වන පිණිස නුඹලාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ දැන් සියල්ල වියවුල් කර ඇත." "ස්වාමින් වහන්සේ සියල්ල වියවුල් කරන සේක, නැවත සියල්ල සකසන සේක. ස්වාමින් වහන්සේ සියල්ල වලපල්ලට හෙලන සේක, පසු ව ඔසවා තබන සේක." මෙය දේව ජනතාවට මහත් පලදායි අත්දැකීමකි. එමගින් ඔවුහු උසස් වෙති, නිදහස් වෙති, පවිත්‍ර කරණයට ලක් වෙති. එම සතිය තුළ ජේසු සමිඳුන් නිරවුල් කළ පළමු වන වියවුල අප සංඝය විසින් වසරක පමණ කාලයක් ඩිල්ෂාන්ට මාස් පතා මුදලක් දීම යි. ඩිල්ෂාන් කරමින් සිටි රැකියාවට මින් පසු නො යන ලෙස ද සංඝය විසින් ඔහු බලා ගන්නා ලෙස ද තුන් වන ඥානකාන්තියේ දී ජේසු සමිඳුන් ඩිල්ෂාන්ගේ මුවින් පැවසූ බැවින් අපි මාසික ව ඔහුට රුපියල් තුන් දාහක් දුන්නෙමු. මෙය ජේසු සමිඳුන්ගේ වචනය මිල කිරීමක්, එතුමන්ගේ වචනය විකිණීමක් ලෙස එතුමෝ දුටහ. මෙය අප සංඝය තුළ නපුරාට ක්‍රියා කරන්නට ඉඩ සැලසෙන දූෂිත තත්ත්වයක් බව එතුමෝ පැවසූහ. "මෙ වැනි තීරණ ගත යුත්තේ කුසට අහරක් නො ගෙන යැදුමෙන් මෙනෙහි කිරීම තුළ යි." එතුමෝ එලෙස අපට උපදෙස් දුන්හ. ඩිල්ෂාන්ගේ මව රැක බලා ගැනීමට ඇයට තව දූ පුතුන් සිටින බව ද ඔහු නැවති සිටින්නේ සංඝයේ පියා ලෙස ජේසු සමිඳුන් හඳුන්වන සොයුරාගේ නිවසේ බව ද එතුමෝ සිහිපත් කළහ. එම සතිය තුළ සුජීවා උපයෝගි කරගනිමින් ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයක් මම ඔබ හමුවේ තබමි.)

**1999 අප්‍රේල් 19**

"දුවිල්ලෙන් තැනූ මිනිසා කසළගොඩින් ඔසවන කාලය පැමිණ ඇත. ගැඹුර ගැඹුරට හඬ ගා කියන්නේ ගැඹුර ගැඹුරින් අත්දකින්නට යි. මේ මහා සත්‍යතාවය අත් දකින්නට මම නුඹලා කැඳවමි. ගැඹුර ගැඹුරින් අත්දකින විට නුඹලාගේ සියළු අපවිත්‍රකම් නුඹලා දකිනු ඇත. ---- මාගේ දරුවෙනි, මාගේ සත්‍යයේ දෝංකාරය වන මාගේ ශුද්ධ වචනය විකුණනවාට හෝ මිල දී ගන්නවාට හෝ මම කිසිසේත් කැමති නො වෙමි. මගේ වචනය යම් කෙනෙක් තුළින් නික්මෙන්නේ

ද එය කිසිවකුට මිලයට නො දෙන්න. කිසිවෙක් හෝ එය මිලයට නො ගන්න. ඒ තුළ යි, මගේ වචනයේ බලය අත්දකින්නට නුඹලාට හැකි වන්නේ. කටුක අම්හිරි වේදනා මැද ජනතාවට සත්‍ය දේශනා කරන්නට, ජනතාවට සේවය කරන්නට මම කැපවීමි. අද ජනතාව යහ මඟට ගන්නට, ඔවුන්ට දේශනයක් දීම සඳහා පූජකයකු කැඳවා ගන්නට පවා මුදල් අවශ්‍ය යි. මේක ද, පූජකවරය? මේක ද, කැපවීම? එසේ නම් ගිහි ජීවිතය මීට වඩා හොබනේය. දරුවෙනි, මගේ දහම නොමිලේ ලබන්න, මගේ දහම නොමිලේ දෙන්න, මගේ දහම මිල කරන තැන්වලින් මගේ දහම නො ලබන්න. ---- මා පුත්‍ර ඇන්තනි, නුඹට යන්නට කටුක ගමනක් ඇත. කිසිවකු ඉදිරියේ නො සැලෙන්න, පර්වතයක් ලෙස සිටින්න. නුඹට ඉදිරියෙන් මම යන්නෙමි. නුඹට පිටුපසින් ජනතාව පැමිණෙති. ජනතාවට මඟ පෙන්වීම සඳහා මම නුඹ තෝරා පත් කළෙමි."

(සමිඳු එඬේරා පූජක සංඝයේ සොයුරියක් අමතා එතුමෝ මෙ ලෙස පැවසුහ.) "මම මගේ කාර්යයට නුඹලා කැඳවා ගත්තෙමි. පෙනෙන මව් පියන්ට ප්‍රේම නොකර නොපෙනෙන දෙවියන්ට ප්‍රේම කරන්නේ කෙසේ ද? අපමණ වේදනා දරා ගෙන ඔබගේ මව ඔබ මෙ ලොවට බිහි කළාය. මව් පිය සහෝදර සහෝදරියන්ගේ දුක සැප නුඹ බැලිය යුතුයි, නුඹ කොතැන සිටියත්. මෙය අද සභාව තුළ ද වරදවා ගෙන ඇති තැනකි. ඔවුන් කියන්නේ මා දැන් අයිති දෙවියන්ට පමණ යි, කිසිසේත් නුඹලාට අයිති නැහැ කියා ය. මෙය වැරදි යි. මව් පියන්ගේ දුක සැප බැලීමත් දේව කාර්යයක් බව සිතට ගන්න. ඔවුන්ගේ රෝගී තත්ත්වයේ දී ඔවුන්ට උපස්ථාන කිරීම දරුවන්ගේ යුතුකමකි. ඒ තුළ නුඹ මට යි, සේවය කරන්නේ.")

**1999 අප්‍රේල් 20**

"ශුද්ධ භූමි තුළින් නො වෙයි, තමන්ගේ පිවිතුරු ඇතුලාන්තය තුළිනු යි දෙවියන් දැකිය යුත්තේ. දෙවියන් දකින්නට නම් ඔබගේ ඇතුළාන්තය පවිත්‍ර විය යුතුයි. ඔබගේ ඇතුළු ගෙය පවිත්‍ර විය යුතුයි. එතැන යි, දෙවියන් වැඩ සිටින්නේ. ---- මා සමග ප්‍රේමයෙන් වෙලෙන්න, යාච්ඤාව යනු එය යි. යැදුම සඳහා නිර්මල සිතින් එකමුතු වන්න. ඔබ අඳුරු ආකල්ප තුළ සිටිමින් මට මොරනොගසන්න. ඔබගේ සියලු දුබලකම් දකිමින් මට මොරගසන්න. ---- නුඹලා ව වියවුල් කරමින් මම නුඹලා නිසි තැනට ගෙන යන්නෙමි. නුඹලාට පැටලිලි සහිත අවස්ථා එන විට ගැඹුරින් මෙනෙහි කරන්න, නිවැරදිතාවයට එන තෙක් මෙනෙහි කරන්න. ---- කිසි දින බිය නො වන්න, මා ඔබ කැඳවන ගමන යන්නට. නුඹලා මෙ ලොව හැර ගිය දිනට මගේ රාජ්‍යයට එනු ඇත. මගේ දරුවෙනි, ඔබ මියැදුන පසු ඔබගේ ආත්මය කතෝලික සභාව නමැති මේ ලේඛනයේ නො වෙයි තිබෙන්නේ: ඔබගේ ආත්මය පූජකවරුන් අතරට නො වෙයි යන්නේ. ඔබගේ සිරුර මහ මඟ කුණු වෙද්දෙන්, ඔබගේ ආත්මය මා තුරුලට එන්නේ නම් එය ඔබට සෑහේ. ---- මාගේ දරුවෙනි, මම නුඹලාට මඟ පෙන්වන්නට මුළු ලොවට ම ත්‍යාගයක් ලෙස කෙනකු දුන්නෙමි. එය මේ දේශයෙන් සිදු වූවකි. ඒ එඬේරාගේ උපදෙස් මත ජීවිතය ගෙන යන්න. ඔහුගෙන් ලැබෙන පිළිතුර නිවැරදි යි. මක්නිසාද ඔහු තුළින් මම ඒ පිළිතුර දෙමි."

"මම සිඟන වෙසින් ඔබ වෙත පැමිණෙමි, සා ගිනි වූවකු ලෙස පිපාසිතයකු ලෙස පැමිණෙමි, රෝගියකු ලෙස පැමිණෙමි, සිර ගෙයි සිටියත් නුඹලාගේ සැලකුම් දෙස මම බලා සිටිමි. සිර ගෙය නමැති ඒ මල් මාලය දිනෙක නුඹලාටත් ලැබෙනවා ම යි. ---- ලෝගු ලා ගත් පමණින් සියල්ලෝ පූජකයෝ නො වෙති. ඒ අය අතරින් මගේ නිවැරදි දහම දේශනා කරන්නෝ ස්වල්ප දෙනෙකි. දිව්‍ය සත්ප්‍රසාදය තුළ මම ජීවමාන වෙමි. දිව්‍ය පූජා පිළිවෙත් නිවැරදි යි, පූජකවරය අගනේය. එහෙත් අද බොහෝ පූජක ජීවිත කෙළෙසී ඇත. මා එදා කටුක පීඩා මැද ගෙවූ පූජකවරය නො වෙයි, දැන් බොහෝ පූජකයින් තුළ තිබෙන්නේ. සභාව තුළින් නියම මඟ පෙන්වීමක් ජනතාවට ලැබිණි නම් අද මව්වරු අනාථ වෙත් ද? අද දරුවෝ මව් පියන් නොසලකා සිටිත් ද? දෙමව්පියෝ දරුවන් නොහැඳින සිටිත් ද? සැමියා තම බිරිඳ අත්හැර යයි ද? අන්ත දුගිහු, යාචකයෝ මෙ පමණ බහුල වෙත් ද, ඒ පූජකයන් තුළින් නිවැරදි ධර්මය දේශනා වූයේ නම්? කොයි පූජකවරයා ද අද මංමාවත්වල අසරණ වී සිටින යාචකයන් සොයා යන්නේ? කොයි පූජකවරයා ද, තමා ලැබූ පන්නරය ඒ අසරණයන්ට දෙන්නට වෙහෙසෙන්නේ? යාචකයන්ට පවා තේරුම් ගන්නට බුද්ධියක් ඇත. මේ අඩුව පිරවීම සඳහා යි, මා නුඹලා ව පත් කරමින් සිටින්නේ."

"මා පත් කළ දහම් නවෝදයට අයත් මොවුහු මගේ ජනතාවට නිසි මඟ පෙන්වීම සඳහා ඔවුන් අත ඇති දෙය වැය කරමින් සිටිති. බැරි භාවය තුළ ඔවුහු ඒ ගමන යති. මෙය මා ආසිරි ගැන් වූ ගමනකි. මොවුහු කිසි දිනෙක මුදල් උපයන කණ්ඩායමක් නො වෙති. තමන්ට තිබෙන දේ කැප කර ගෙන යන්නට තෝරා ගත් සංඝයකි. ---- නිදොස් අවංක කෙනකුට අද මිහිමත තැනක් නැත. ධනය බලය හමුවේ ඔවුහු අසරණව සිටිති. මැරවරයෝ ඔවුන් තලා පෙලා මරා දමති. වැරදිකරුවෝ නිදැල්ලේ හැසිරෙති. අද සිරගෙවල්වල සිටින්නෝ බොහෝ දෙනෙක් මගේ නිවැරදි අහිංසක දරුවෝ ය, මෙය දේශය පාලනය කරන නායකයින් තම බුද්ධිය විකුණා කෑමේ පාපය යි.

නඩු තීන්දු දිනයක් එනු ඇත, මේ පාපයට වන්දි ගෙවන්නට. එදින ඔවුහු වැළපෙති. ---- අද මම අන්ත පව්කාරයින් තුළින් ක්‍රියා කරමි. පව්කාරයින් ව පාපයෙන් මුදවන්නට එදත් මා පව්කාරයාව ම යි තෝරා ගත්තේ. මෙය සත්‍යයකි."

**1999 අප්‍රේල් 22**

"මා පුත්‍ර ඇන්තනි, ඔබගේ කණ්ඩායමේ සිටින සියල්ලන් ඔබ අත්හැර ගියත් ඔබ ජනතාව රැගෙන ඉදිරියට එන්න. ඒ සඳහා මා ඔබ ආසිරි ගන්වා ඇත. ඔබට ඉදිරියෙන් මම ගමන් කරමි. මගේ දරුවෙනි, නිවැරදි අවබෝධයෙන් ඔහු සමග සම්බන්ධකම් ඇති කර ගන්න. ඔහු තුළින් නික්මෙන්නේ මගෙන් ලැබිය යුතු පිළිතුර යි. එය මගේ අනුග්‍රහය යි. පුත්‍රය, ඔබට කිසිවකුගේ ගෞරවය අවශ්‍ය නැත. ඔබට කිසිවකුගේ ගෞරවය නො ලැබේ. ඔබට කරන්නට සිදු වන මේ සේවයේ දී ඔබට ලැබෙන්නේ නින්දාව යි, පුත්‍රය. මෙය මා ගිය ගමන යි. මම වැරදි නොකර අපහාසයට පීඩාවට ලක් වීමි. ඒ සියල්ල ඔබට මුහුණ දෙන්නට සිදු වනු නියත යි. මගේ ජනතාවට ඔබ මඟ පෙන්වන්න, නිවැරදි දහම දෙන්න. මේ සඳහා ඔබට නොයෙකුත් භාෂා අවශ්‍ය නැත. ඔබ දන්නා භාෂාවෙන් ජනතාවට දේශනා කරන්න. ඔබ යන්න, මේ ගමන දීර්ඝව. ඔබට සහය වන අය සමග එකමුතු ව ඔබ යන්න. මගේ දෙ වන පැමිණීමට ජනතාව සූදානම් කරන්න."

(අප අතර සිදු වන දෙවිඳුන්ගේ ක්‍රියාවන් මුල්කර ගෙන පල්ලන්සේන මීසමේ තරුණ පිරිසක් අප හා සංවාදයක් ඉල්ලා සිටින බව මීසම භාර පිය තුමා අප හා පැවසීය. එවැනි සංවාදයකට අපි එකඟ වීමු. එය 1999. 05. 12 වන දින යෙදිණ. සංවාදයට පූජාප්‍රසාදිවරු 11 දෙනෙක් ද සහභාගි වූහ. එම සංවාදය මා නිමාවට පත් කළේ ශුද්ධ බයිබලයේ **ක්‍රියා 5:38, 39** සඳහන් **ගමාලියල්ගේ** මෙම වදන් සිහිපත් කරමිනි. "මේ සිද්ධිය ගැන මා ඔබට කියන්නේ මේ මිනිසුන්ගෙන් ඈත් වී සිටින්න කියාත්, තමන්ගේ පාඩුවේ ඉන්නට ඔවුන්ට ඉඩ හරින්න කියාත් ය. ඔවුන්ගේ මෙම ව්‍යාපාරය හෝ ක්‍රියා මාර්ගය හෝ මිනිසාගෙන් වන දෙයක් නම් එය කඩාකප්පල් වන්නේය. එහෙත් එය දෙවියන් වහන්සේගෙන් වන දෙයක් නම් ඔවුන් පරාජය කරන්නට ඔබට නො හැකිය. එපමණක් නො ව, ඔබ අදහස් කරන දේ දෙවියන් වහන්සේට විරුද්ධව සටන් කිරීමක් වීමට ඉඩ ඇත.")

(1999 මැයි 12ස් වන දින එම සංවාදයට මොහොතකට පෙර ජේසු සමිඳාණෝ ඩිල්ෂාන් මුවින් මෙ ලෙස පැවසූහ. "මා දියණිය ඇන්තනි මේරි, ඔවුන්ගේ දේපල ඔවුන්ට දී ඔබට ලැබී ඇති නව නිවහනට හෙට ම පදිංචියට යන්න. ---- මගේ සංඝය ලොවට ප්‍රකාශ වන මොහොතේ දී ජුසේ වාස්, ගොන්සාල්වෙස් පියවරුන්ගේ පා පහස ලැබූ ඒ පුණ්‍ය භූමියේ නුඹලා සිටිය යුතුය." මෙ ලෙස 'බෙතෙල්' නිවෙස පල්ලන්සේනෙන් වයික්කාලට සංක්‍රමණය විය. එය අපගේ ඥානකාන්තිවලට සහභාගි වූ ප්‍රියන්ති සොයුරියට අයත් නිවසකි. ඇය දැන් අප සංඝයේ සොයුරියකි. ඇය කුලියට දී තිබුණ නිවෙස නිදහස් වන නිසා අවශ්‍ය මොහොතක පදිංචිය සඳහා එන ලෙස ඇය ඇන්තනි මේරි සොයුරියට මෙම සිදු වීමට සතියකට පෙර පවසා තිබිණ.)

# 23

## "දෙවි පියාණන්ගේ කැමැත්තට අපි අවනත වෙමු"

දහම් නවෝදය සංඝයේ එකතු කීපයක දි ඩිල්ෂාන් මුවින් ජේසු සමිඳුන්ගෙන් ලැබුණු අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කීපයකි, මේ.

**1999 මැයි 15**

"නුඹලාට මා දුන් නව නිවහන තුළ නුඹලාගේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට ප්‍රථම සංඝයේ සියල්ලන් එක් ව දෙවි පියාණන්ට තුති පිදීමේ යැදුමක් සිදු කරන්න. මෙ තැන් පටන් නුඹලා එක්සත් ව එක්සිත් ව මාගේ ගෘහයේ නිරන්තරයෙන් සැරිසරන්න." (එදින සිට සෑම සඳුදා, බදාදා, සිකුරාදා සවස 7 සිට රාත්‍රි 9 දක්වා මිනිස් පවුලේ ගැළවීම උදෙසා යැදුමක් එහි ඇරඹිණ.)

**1999 ජුනි 04**

"පියාණන් වහන්සේ මේ මොහොතේ ඉතා ඕනෑකමින් බලා සිටිති, උන් වහන්සේගේ කැමැත්තට මුළුමනින් අවනත වන ජීවිත රැසක් උදෙසා. එනිසා නුඹලා හෙට පවත්වන්නට යෙදෙන්නා වූ ශුද්ධාත්ම මංගල මහා යැදුම **"දෙවි පියාණන්ගේ කැමැත්තට අපි අවනත වෙමු"** තේමාව මුල්කර ගෙන පවත්වාපන්න.---- නුඹලා තවත් සභාවක් ගොඩනැගීමේ අභිලාෂයෙන් ක්‍රියා කරන්නන් ලෙස සභාවේ එඬේරු හා පූජක පුත්තු දකිති. නුඹලා මෙ ලොවින් සමුගත් විට ඔවුන්ට වැටහෙනු ඇත, නුඹලා කළේ සභාවේ මහා කාර්යයක් බවත්, දෙවියන්ගේ සැලැස්මට අවනත වූ

පුංචි ජීවිත රැසක් පමණක් බවත්. ---- පියාණන් වහන්සේත් ජේසුස් වහන්සේත් ශුද්ධාත්මයාණන් නම් වූ ඒ සැනසිළිදායකයාණනුත් එක ම සංඝයක එක ම දෙවියන් බව විශ්වාස නොකරන සියලු ම සභාවලට එම සංඝය එක ම දේවෝත්තමයාණන් බව තරයේ ප්‍රකාශ කරපන්න."

"ලෝකයේ මහා වියවුල ද ලෝකයේ විනාශයේ සියල්ල ද ආරම්භ වෙමින් ඉතා සීඝ්‍ර ව නපුරාගේ කටයුතු සිදු වෙමින් යන්නේය. මේ වන විට ලෝකයේ සැම තැනක ම රටක් රටකටත්, රාජ්‍යයක් රාජ්‍යයකටත්, දරුවන් තම මවට පියාට විරුද්ධ වත්, පියා මව දරුවන්ට විරුද්ධ වත් නැගී සිටින ඒ කාලයට අත වනමින් නපුරා එය අවුළුවාලමින් ක්‍රියා කරන්නේය. එමෙන් ම ලෝකය පුරා මේ වන විට නපුරාගේ සලකුණ මනුෂ්‍යයාගේ ශරීරයේ ඇතුලත් කරමින් ක්‍රියා කරන්නේය. මගේ සියලු බැටළුවන්ට මෙය ප්‍රකාශ කරපන්න. ඔවුනොවුන් කිසි විටෙකත් තමාට දෙවි පියාණන් දුන් නිදහස යක්ෂයාට පාවා නො දෙනු, ඔබ ප්‍රතික්ෂේප කළා වූ යක්ෂයා නැවතත් ප්‍රතික්ෂේප කරනු. "යක්ෂයාගේ සියලු ම ක්‍රියාවන් අපි ප්‍රතික්ෂේප කරමු." ඒ මහා ප්‍රකාශය තුළ නපුරා නැවතත් නුඹලා තුළට ළං නො වන්නට නුඹලා ව පරීක්ෂාවට ලක් නොකරන්නට නපුරා හෙවත් පුරාතන සර්පයා ව ගැට ගසා දමන්න. ඔහුට කිසි විටෙකත් හිස ඔසවන්නට නුඹලාගේ කිසි ම මොහොතක ඉඩ නො තබන්න. නපුරා විද්‍යුතය මාර්ගයෙන් ද නවීන විද්‍යාවේ මාර්ගයෙන් ද මහා දියුණුවේ මාර්ගයෙන් ද සියල්ල වියවුලට පත් කරන කාලයට පැමිණ ඇත. එහෙත් නපුරාගේ සියලු මාර්ග අසාර්ථක වෙයි, විනාශ වෙයි. මාගේ නාමයෙන් තොරව ජේසුස් යන නාමයෙන් තොරව කිසිවෙක් කිසි විටෙක ක්‍රියා නො කරපන්න. ජේසුස් යන නාමය තුළ නිරන්තරයෙන් ජීවිතය අරඹාපන්න."

**1999 ජුනි 20**

('දහම් නවෝදය' පළමු වන ප්‍රකාශනය සැකසීමට බාර දුන් දිනයේ) "ලෝකයට නුඹලා ප්‍රකාශ වන්නා වූ මහා ප්‍රකාශනයක් නිකුත් කිරීම උදෙසා අද දින මම නුඹලා විශේෂයෙන් කැඳවා ගතිමි. මහා රාජධානිවල මුදල් මත සුවසේ වැතිර සිටින්නන් නො ව දුගියා දුවිල්ලෙන් නැගිටු වන දිළින්දා කසලගොඩින් ඔස වන මොහොත උදා වෙමින් ඇත. ---- නපුරා කෙතරම් සූක්ෂ්ම වුව ද ඔබගේ ස්වාමින් වහන්සේ අති සූක්ෂ්ම බව දැන ගනුව. නපුරාගේ අයහපත තුළින් මාගේ යහපත, මාගේ සැලැස්ම ඉටු වන බව මම පවසමි. පූජක, පැවිදි, ගිහි සියල්ලන් ඉතා අනතුරුදායක කාලයකට මුහුණ පා ඇති බව ප්‍රකාශ කිරීමට මම නුඹලා කැඳවූයෙමි. මගේ ජනතාවගේ එඬේරා ලෙස මා ප්‍රකාශ කළා වූ ඔහු (2 ජුවාම් පාවුලු පාප් තුමා) අද අසාධ්‍ය රෝගාතුර තත්ත්වයේ පසුවන්නේය. නුදුරේ දී ම ලෝකයේ ප්‍රබල නායකයෝ රැසක් ඝාතනය වෙති. තෙ වන ලෝක යුද්ධයේ මුල් අත්තිවාරම් දැන් දමමින් නිම වෙමින් පවතින්නේය. පුරාතන සර්පයා හෙවත් අද ඔබ සාතන්ගේ ලකුණ ලෙස හඳුන්වන්නා වූ ඒ සියල්ල ලෝකය පුරා නිරන්තරයෙන් දැන් මනුෂ්‍යත්වය විනාශ කරන්නට, මාගේ පියාණන් නුඹට දුන් නිදහස නැති කරන්නට කාලය යොදවා ඇත්තේය. එබැවින් ඔබ ඉතා ලහිලහියේ ම මෘගයාගේ ඒ සලකුණ වත් යක්ෂයාගේ කිසිම රැවටීමකට වත් නොරැවටෙන පිණිස නිරන්තරයෙන් යාච්ඤාවෙහි ද නිරන්තරයෙන් මාගේ නාමයෙහි ද ශක්ති සම්පන්න වන ලෙස ප්‍රකාශනයක් මුද්‍රණය කර ලෝකය පුරා සියළු භාෂාවලින් බෙදා හරින්න. මා මෙ ලෙස ඔබට කතා කරන ලද්දේ මගේ නාමයේ බලය ගැනත් යක්ෂයාගේ සියළුම ක්‍රියාවන් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ වත් කිසිත් නො දන්නා වූ මාගේ බැටළුවන්නට නුඹලා එඬේරුන් වන පිණිස ය. එබැවින් මෙම ප්‍රකාශනය නිරන්තරයෙන් මුද්‍රණය කර ලොව පුරා බෙදා හරින්න."

**1999 ජුනි 26**

(දහම් නවෝදය සංඝයේ එකතුවක දී අපගේ ශ්‍රාවකයෙක් මෙ වැනි ප්‍රශ්නයක් නැගීය.) "දෙවිඳුන් තෝරා ගත් සංඝය හැටියට දැනට අපගෙන් වන සේවය ප්‍රමාණවත් ද, තවත් විය යුත්තේ කුමක් ද?" ජුනි 26 අපගේ එකතුවේ දී මම, ලෝකය හිතන පතන ධර්මිෂ්ඨකම නො ව දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම ගැන ඉගැන්වීමක් දුනිමි. සංඝයේ සියල්ලන් එවැනි ධර්මිෂ්ඨ ජීවිතයක් කරා වැඩෙමින් දෙවිඳුන් තබන තැන සිටීමත්, එතුමන් පවසන දේ කිරීමත් පමණ වෙන උතුම් කාර්යයක් නැතැ යි මම පැවසීමි. ධර්මිෂ්ඨ ජීවිතය පිළිබඳ එම ඉගැන්වීම් එක්රැස් කර දෙ වන ප්‍රකාශනය කිරීමට ජේසු සමිඳුන් අපට පවරමින් එතුමෝ මෙ ලෙස පැවසූහ.)

"මාගේ දරුවෙනි, මම මහත් සේ සතුටට පත්වන්නෙමි. මක්නිසාදයත්, මගේ දියණියන් හා මගේ පුතණුවන් මගින් මා කළ ක්‍රියා ලෝකයට විහිළුවක් ලෙස පෙනුණත් එය මගේ ම හස්තය විසින් කළ දෙයක් බව දැන් ලෝකයට අවබෝධ වන මොහොත පැමිණ ඇති බැවිනි. මම මෙ ලෙස මගේ සංඝයේ වැඩ දැන් අරඹා ඇත්තෙමි. මා තෝරා පත්කර ගත් සංඝයේ නුඹලාට පැවරෙන දූත මෙහෙය තුළ නුඹලාගේ ගමනාන්තයේ අවසාන අදියරේ දී නුඹලා සිටිය යුතු ආකාරය ගැන ද නුඹලාගේ ජීවිත තිබිය යුතු ස්ථානයන් ගැන ද මම නුඹලා ව අද සවස්

භාගයේ දී ඉතා ප්‍රඥාවෙන් පූර්ණ කළෙමි. මා තෝරා ගත් තැනැත්තා තුළින් නික්මුණු ඒ ඉගැන්වීම ශුද්ධාත්මානුභාවයෙන් සිදු වූවක් බවට මම සහතික කරමි. මාගේ කැමැත්තට ඉඩ දෙන අවනත වන තවත් එකෙක් වේ ද ඔහුත් උදෙසා අද සවස ලැබුණ ඒ ඉගැන්වීම ඒකරාශි කර සම්පිණ්ඩනය කර ඒ සියල්ල ප්‍රකාශනයක් ලෙස ලෝකය පුරා බෙදා හැරීමට ඔබට මගෙන් අවසර ඇත්තේය."

"ලක් කිතුනු සභාවත් ලෝක ශුද්ධ වූ සභාවත් වසර 2000 ජයන්තිය සමරන්නට මාගේ උපන් දින ප්‍රීතියක් පවත්වන්නට වැරදි අඩිතාලමක වැරදි ගමන් මාර්ගයක යෙදෙන බව ඔවුන්ට වැටහෙන්නට මේ ප්‍රකාශනය නිසැකව ම ඔවුන්ට මගෙන් ම ලැබෙන මගේ ම පිළිතුර බව වැටහෙනු ඇත. කෑමෙන් බීමෙන් වල්මත් වෙමින් ව්‍යාජ ලෙස මාගේ නාමය පාවිච්චි කරමින් මාගේ නාමය විකුණාගෙන ජීවත් වන්නන්ට එය පවත්වන්නටත් එහි නියැලෙන්නටත් කිසි ම අවකාශයක් මා තුළ ඔවුන්ට ලැබී නොමැත. මගේ ජන්ම ජයන්තියේ දි 'මහා ආමෙන්' කියන්නට නම් මෙම ප්‍රකාශනය තුළින් පෙන්වන ජීවිත මඟට ඔබ ද පිවිසිය යුතුය. අද ඔබ මධ්‍යයේ ප්‍රකාශ වූ මෙම මහා ප්‍රකාශනය නිරන්තරයෙන් ලොව තුළ රැව් පිළිරැව් දීමේ කාලය පැමිණ ඇත."

"නුඹලා තුළ මා කෙරෙහි විශ්වාසයක් ඇද්ද මගේ ආත්මානුභාවය ඔබ තුළ ක්‍රියා කරයි ද ඔබ මගේ නාමයට අවනත ද යන පදනම තුළ නුඹලා ධර්මිෂ්ඨයන් බව ඔවුන්ට වැටහෙනු ඇත. එලෙස මා තෝරා ගත් සංඝය මගේ සභාව වියවුල් කරන්නට වත් සභාව විවේචනය කරන්නට වත් තවත් සභාවක් නිර්මාණය කරන්නට වත් ක්‍රියා කරන පිරිසක් නො ව ජේසුස් ක්‍රිස්තුස් වන මා දැමූ අත්තිවාරම ගොඩගන්නට පමණක් නුඹලා ක්‍රියා කරන බව සැමට වැටහෙනු ඇත. ඔබ මනුෂ්‍යයින් පමණක් බැවින් ඔබට නො හැකියි, මුළුමනින් ම මට අවනත වන්නට. එහෙත් ඔබ තුළ මා ජීවත් වන බැවින් ඒ සත්‍යය ඔබ අදහන බැවින් ඔබට එය ඉතා පහසු දෙයක් වනු ඇත. ---- යක්ෂයාගේ සියලු රැවටීම් ඔහුගේ සියලු ආකර්ෂණීය මවා පෑම් සියල්ල ද පරාජය වන බව පළමු ප්‍රකාශනයට ඇතුලත් කරපන්න. එමෙන් ම දිව්‍ය පූජා යාගයට සහභාගි නො වන දිව්‍ය යාගය තුළ මගේ ජීවමාන බව අත්නොදකින සියල්ලන්ට ද ඊට සහභාගි වීමේ වැදගත්කම පැහැදිළි කරපන්න. ---- පුරාණයේ ඔබගේ දේශයේ මගේ දහමේ සැබෑ පියවරුන් ලෙස ඔබ ගරු කරන ඔවුන්ගේ පා ගැටුන පුණ්‍ය භූමියේ ඔබ ගත් ගිවිසුම නැවත නැවතත් ඔබගේ ජීවිත තුළ අලුත් කරපන්න." ('දහම් නවෝදය' හැටියට අපට පැවරුන පළමු වන කාර්යය වන 1993 දි ගෝනාවිල දේවස්ථානයේ දි තරුණ පිරිසකට දේශනයක් දිමට පෙර අප සංඝයක් හැටියට බෝලවත්ත දේවස්ථානයට ගොස් ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පිය තුමා භූමදාන කළ ස්ථානයේ දණගසා දහම් නවෝදය ඉදිරි දූත මෙහෙය සමිඳුන් සුරතේ තැබුවෙමු.)

**1999 ජුලි 01**

"මා නුඹලාට පැවරූ මගේ වැඩය (**'නිතරම යාච්ඤාවෙන් අවදිව සිටින්න'** ප්‍රකාශනය ගැන යි.) මට ඉතා අවනත ව ඉටු කිරීම ගැන මම සතුටු වෙමි. වඩවඩාත් ගැළවීමේ මහා සංඛ්‍යාව වැඩි වර්ධනය කිරීම උදෙසා ඉතා ආදරයෙන් ඒ සියල්ල නුඹලාගේ සහෝදර ජනතාව වෙත නුඹලා යොමු කර ඇත්තෙහුය. මා දමා ඇති ඒ අත්තිවාරම උඩ මා පිහිටෙව්වා වූ මගේ සභාව තුළ හෙවත් මගේ ප්‍රමුඛ සභාව වන කතෝලික සභාව තුළ පමණක් රැඳී සිටින ලෙස ද මගේ නාමයෙන් ඇත් වන මගේ අනුභාවයෙන් ඈත් ව ඇති නොයෙක් ආකාරයේ ව්‍යාජ සභාවන් තුළ ගැළවීම සොයන්නට නොයන ලෙස ද මගේ අසරණ බැටළුවන්ට පවසන්න. ඒ බව විශේෂිත ව ඇතුළත් කරපන්න. සභා මාතාවගෙන් ඉවත් නො විය යුතු බවත් ඔබ ලබා ඇති ප්‍රසාද ස්නාපන බෞතිස්මය වඩවඩාත් කැපවීමෙන් යුක්ත ව ගත කළ යුතු බවත් එහි අවධාරණය කරපන්න. ලොව පුරා මේ වන විට පවත්නා, මා ප්‍රතික්ෂේප කර මාගේ පියාණන් ප්‍රතික්ෂේප කර මාගේ ආත්මානුභාවය ප්‍රතික්ෂේප කර දිව්‍ය පූජයේ මාගේ ජීවමාන වැඩසිටීම ප්‍රතික්ෂේප කරන සියලු සභාවන් දැනුවත් වීම සඳහා ඔවුන් වෙත ආදරයෙන් මගේ නාමය තුළ ඔවුන්ට සංදේශයක් නිකුත් කරපන්න. එය නුඹලාගේ තුන් වන ප්‍රකාශනය විය යුතුයි. මා නුඹලාට ප්‍රකාශ කළා වූ විනාශය පිළිබඳ දින වකවානු හා සංඛ්‍යා ලේඛන එහි ඇතුලත් නො කරන්න. මන්ද ඒවා නිනීවේ මෙන් විය හැකි බැවිනි."

"ලොව පුරා මගේ නාමයට ඉතා ආදරයෙන් ක්‍රියා කරමින් සභාවේ ඉදිරි ගමන් මඟ දෙව් පියාට අවනත වීමට ඇති අවංක ආශාවෙන් ක්‍රියාත්මක වන්නා වූ සැම සංඝයකට ම නුඹලාගේ මෙම ප්‍රකාශන යොමු කරපන්න. ඔවුහු එය වඩවඩාත් ලෝකයේ ගැළවීම සඳහා බෙදා හරින්නට මඟ බලා සිටින්නෝ වෙති. මන්ද, මාගේ වචනය මාගේ පණිවුඩය ඔවුහු සොයමින් ලත වන්නෝය. මෙය මාගේ ශුද්ධාත්මානුභාවය තුළ ලියවෙන්නා වූ ද ප්‍රකාශ වන්නා වූ ද දෙයක් බැවින් මේ කිසිවක් කිසි විටෙක අකුරකින් හෝ වචනයකින් හෝ වෙනස් කරන්නට ඉඩ නො තබන්න. මගේ අසරණ බැටළුවන් ආරක්ෂා කිරීම උදෙසා ඔබ එය ඉතා ලහිලහියේ සූදානම් කර බෙදා

හැරපන්න. එබැවින් ඔබ මෙහි නොවරදවා ම මෙය ලොව පුරා ප්‍රකාශ කිරීමට මා ඔබට දෙන ආදරයේ පණිවුඩයක් බව ප්‍රකාශ කරපන්න. මාගේ අසරණ බැටළුවන් ආරක්ෂා කිරීම උදෙසා ඔබ කරන මේ මහා මෙහෙවර දෙවි පියාණෝ නිරන්තරයෙන් ආශිර්වාද කරති."

**1999 ජුලි 18**

"නපුරා මේ වන විට ඔහුගේ සැලසුම් තුළ මතුපිටින් පෙනෙන්නට පමණක් ප්‍රේමය තවරමින් ඒ තුළ වෛරය ක්‍රියාත්මක කරන්නට, මා මවා වදාළා වූ ලෝකයේ සියලු ම මැව්ලි තුළිනුත් මගෙන් ලබා ගත් බුද්ධිය නැණ නුවණ තුළිනුත් මගේ ජනතාව නොමඟ යවන්නට ක්‍රියා කරන්නේය. එහෙත් ඔබ ඒ කිසිවකට හසු නොවන්නට ද ඒ සියල්ල පරාජය කරන්නට ද කාලය වැඩි වැඩියෙන් වැය කරපන්න. ලෞකික තෘෂ්ණාවන්ට ගිජු වීම තුළ නපුරාගේ ග්‍රහණයට හසු වූ නිල පූජකයන්ගෙන් සමහරකු දිව්‍ය සත්ප්‍රසාදයෙහි මාගේ ජීවමාන වැඩ සිටීමට අපහාස වන අයුරින් ඒ ඉදිරියෙහි කළු පූජා පවත්වමින් ද, මා ඔබට දුන්නා වූ මාගේ ශරීරය හා රුධිරය පාගා දමමින් ද, ඔවුනොවුන්ගේ අපිරිසිදු වූ රුධිරයෙන් ඒ සියල්ල අපහාසයට පත් කරමින් ද, මා ලෝකයේ ගැළවීම උදෙසා පූජා වූ මාගේ කුරුස සිංහාසනය කඩා බිඳ දමමින් ද ක්‍රියා කරන කාලය ඉතා ආසන්න බැවින් මගේ ජීවිතයට සැනසීම ගෙනෙන්නට මා කරන ඒ මහා ආරාධනයට නුඹලා අවනත වනු ඇතැ යි මම බලාපොරොත්තු වෙමි."

"පූජකයන්ගෙන් තව සමහරෙක් ඔවුන්ගේ පූජා වීම ඔවුන් කර ගත් මහා මෝඩකමක් ලෙස සිතමින් ලතැවෙති. ඔවුහු සිතන පතන, ආශා කරන දේ රහසින් හෝ ඉටු කර ගනිති. මා හට ඉතා අවංක ව කැප වූ මගේ සමහර පූජක පුත්තු හා දියණියෝ අන්ත අසරණතාවයෙන් මේ මොහොතේ පෙළෙති. ඔවුන් අත්දකින තත්ත්වය ඔවුන්ගේ ශ්‍රේෂ්ඨයන්ට කියන්නට හෝ ගිහියන්ට කියන්නට හෝ ඔවුන්ට ශක්තියක් නැත. ඔවුන්ගේ ශ්‍රේෂ්ඨයෝ ඔවුන් හා සමග සිටින්නෝ නො වන බැවිනි. ඉතා බිහිසුණු කාලය ළං ව ඇති බැවින් මාගේ අසරණ බැටළුවන් උදෙසා නුඹලාගේ නිරන්තර යැදුම තුළ නුඹලා මා තුළට ම ඇතුළු වන්නට උනන්දුවෙන් ක්‍රියා කරපන්න. ලෝකයේ ගැළවීම උදෙසා මොරගසමින් මා හට සැනසීම දෙන්නට මිහිතලයේ අතලොස්සක් හෝ සිටින බැවින් මම මහත් සේ සතුටට පත් වන්නෙමි. ඔබ දැන් විඳින්නා වූ ද, ඉදිරියේ ඔබ විඳවන්නා වූ ද මේ මහා ප්‍රසව වේදනාව තුළ ලෝකයේ එකකු හෝ සුව වන බව අමතක නො කරපන්න."

**1999 ජුලි 21**

"අද ලොව සියල්ලන් මනස්ස්ථාපනයෙන් මා වෙත හැරී ඒම මගේ පැතුම වන්නේය. ඔබ විඳින සියලු වේදනාවන් තුළ ද ඔබ පුදන යැදුමේ, මොරගැසීමේ ප්‍රතිපලය ඔවුන් වෙත ගලා යන්නේය. යහපත අයහපත කරන සැම දෙනාට ම තව නිදහස් කාලයක් දී ඇත. එහි දී ඔවුන් යහපත තෝරා ගනිමින් ධර්මිෂ්ඨ භාවය අත්පත් කර නොගතහොත් ඔවුන් ශුද්ධ වූ ගින්නේ පිළිස්සීමේ කාලය ඉතා සූදානම් ව ඇත්තේය. සභා මාතාවගෙන් ඉවත් නො විය යුතු බවත්, ඔබ ලබා ඇති ප්‍රසාද ස්නාපන බෞතිස්මය වඩවඩාත් කැපවීමෙන් යුක්ත ව ගත කළ යුතු බවත් අවධාරණය කරපන්න. මා නුඹට ප්‍රකාශ කළා වූ මාගේ ධර්මිෂ්ඨ භාවය සඳහා මා ක්‍රියා කරන්නා වූ, මා ස්ථාපිත කළා වූ මාගේ ශුද්ධ වූ සභාවේ සිටිමින් නිරන්තරයෙන් දේව තාත්තාට අවනත වන්නට ක්‍රියා කරන ලෙස මෙම ප්‍රකාශනයේ සඳහන් කරපන්න."

"නුඹලා මාගේ ගෘහයේ වෙසෙමින් මා සමග එක් ව ලෝකයේ විඳවීමට දායක වන්නට මම නුඹලාට ඇරයුම් කරමි. නිරන්තරයෙන් නුඹලා පසු කරන්නා වූ සැම හෝරාවක් ම යාච්ඤාවේ හෝරාවක් බවට පත්කර ගන්න. ඒ උදෙසා නුඹලාගේ ජීවිතයේ වැය වීම ඉතා අවශ්‍ය මොහොත පැමිණ ඇත. අද සිදු වන සියල්ල තුළ මම නැවත පිපාස වෙමි. ලෝකයේ අද පවතින මහා නග්න භාවය, කුසගින්න, දුක-වේදනාව, යුද ගිනි දැල්, අසාධාරණය, ගබ්සාව මේ සියල්ල තුළ ම මාගේ වේදනාත්මක මොරගැසීම නික්මෙන්නේය. එනම්, "මම පිපාස වෙමි, මා සනසන්නකු බලා සිටි නමුත් කිසිවකු හමු නො වීය." ඒ උදෙසා නුඹලාගේ ජීවිතය වඩවඩාත් වේදනාවේ ජීවිතයක්, යාච්ඤාවේ ජීවිතයක් කර ගන්න. ඔබ යහපත කරන්නට කරන්නට ඔබට අයහපත ලැබෙන්නේය. ඔබ යහපතේ ජීවත් වන්නට වන්නට ඔබට ගැරහුම් ලැබෙන්නේය. එය ඔබ මා පසුපස එන ගමනේ ස්ථිරතාවයත් නිවැරදිතාවයත් බැවින් ප්‍රීති වන්න. ඒ උදෙසා ම ඔබ තව තවත් ජීවිතය පූජා කරපන්න."

**1999 අගෝස්තු 02**

"ලෝකයේ සුවය උදෙසා ද ගැළවීම උදෙසා ද යක්ෂයාගේ සියලු ක්‍රියාවන් පරාජය කිරීම උදෙසා ද මාගේ පැමිණීමට එලෙස සියල්ලන් සූදානම් කිරීම උදෙසා ද ඔබට ශක්තිය පතා සඟ

වැසි සියල්ලන්ගේ නිරන්තර යාච්ඤාව ස්වර්ගයේ මොරගැසීමේ මහා යාගයක් බවට දැන් පත් ව ඇත. නුඹලාගේ දෙ වන ජුවාම් පාවුලු සුදු පියාට ඉතා කටුක කාලයක් උදා වී ඇත්තේය. මාගේ පූජකයින් යැයි කියමින් ඉහළ තානාන්තර දරමින් යක්ෂයාට කළු පූජා පවත්වන ඔවුහු නුඹලාගේ සුදු පියා කටුක ලෙස පීඩනයට ලක් කර ඇත්තාහ. එහෙත් යක්ෂයාගේ කිසි ක්‍රියාදාමයකට ඔහු අවනත නො වන බව නොබිය ව ප්‍රකාශ කරන බැවින් ඔහු මේ මොහොතෙත් මහත් තාඩන-පීඩනවලට ලක් වන්නේය. නොයෙක් වද හිංසාවලින් නුඹලා ද මිරිකෙන්නේය. ආත්මික ව, ශාරීරික ව මානසික ව නුඹලා විඳින්නා වූ දුක වේදනාව ඒ මහා විඳවීම, ගැළවීම උදෙසා අද ලෝකයේ අවශ්‍යතාවය බැවින් දුක් විඳින ඔබ සැම ඉතා භාග්‍යවන්ත ය. ---- මා පෙර දිනයේ දී ලොවට ප්‍රකාශ කළා වූ මා පුත්‍රයාගේ (නොස්ට්‍රාඩාමුස්) අනාවරණයන් නිසි පරිදි ඉටු නො වේ යැයි සිතමින් ලෝකය ඒ දෙස සැකයෙන් බලන්නේය. එය සැකයක් නො ව එය නිවැරදිතාවයෙන් යුක්ත වන්නේය. එය මේ වන විටත් සිදු වෙමින් පවතින්නේය. යක්ෂයාගේ ක්‍රියාවන් දැන් නියම ආකාරයෙන් ලෝකය පුරා දිස් වන්නේය. මාගේ බැටළු රැළ උදෙසා මා තව තවත් ඉවසන්නේ මාගේ කාරුණික භාවය ඉතා මහත් බැවිනි. එනිසා තව තවත් මගේ බැටළු රැළ වෙනුවෙන් මගේ අනුකම්පාවේ කාලය මම තබා ඇත්තෙමි.”

**1999 අගෝස්තු 07 (පළමු ප්‍රකාශනය දොරට වැඩීමේ දී)**

“මා මුල පුරමින් නිහඬ ව කළා වූ සියලු ම කාර්යයන් එළිදැක්වීමේ මොහොතට නුඹලා ආසන්න වන්නහුය. නුඹලා ක්‍රියා කළා වූ අන්දමත් නුඹලාගේ කැඳවීමත් නුඹලාගේ කැප වීමත් එය කියවන්නෝ මෙ තැන් පටන් නිසි ලෙස අවබෝධ කර ගනිති. මා නුඹලා තුළින් ක්‍රියා කරමින් මාගේ ශුද්ධ වූ සභාවට ද මා පත් කළා වූ සුදතුම් එඬේරාට ද පක්ෂපාති ව මේ ලෝකයේ මා හට අවනත භාවය දක්වන්නට මා හට ක්‍රියා කරන්නට සංඝයක් පිළියෙල කළ බව ඔවුන්ට පැහැදිළි වන්නේය. ඔවුන් එය පිළිගන්නට මොන ආකාරයෙන් අදි-මදි කරතත් ඔවුන් එය ප්‍රතික්ෂේප කරතත් එය සත්‍ය ප්‍රකාශනයකින් ලෝකයට ප්‍රකාශ වීම තුළ එය ඔවුන්ට පිළිගැනීමට අවස්ථාව ලැබෙන්නේය. මෙම ප්‍රකාශනය නිකුත් කිරීමේ සුබ හෝරාව නුඹලා සංඝයක් ලෙස එක් ව යාච්ඤාවෙන් මුල පිරීම ගැන මම ඉතා සතුටු වෙමි. නිවැරදි ආධ්‍යාත්මිකත්වයක් ඇති අයකුට මෙම ප්‍රකාශනය ඉතා පලදායි වන්නේය. එය ඉතා වටිනා පණ ඇති වචනයක්, බලයක් නික්මෙන වචනයක් බැවින් එය ලැබිය යුතු නොලැබිය යුතු අය ඉතා හොඳින් මෙනෙහි කර එය බෙදා හැරීමට කටයුතු කරපන්න. නිරපරාදේ විනාශ වන පිණිස ඌරන් ඉදිරියේ මෙ වැනි දේ ප්‍රකාශ කිරීමෙන් වළකින්න.” (එම ප්‍රකාශනයේ පිටපතක් අති ගරු නික්ලස් මාකස් ප්‍රනාන්දු කොළඹ අගරදගුරු තුමන් වෙත යැවීමි. 1999. 09. 15 වන දින එතුමා අප වෙත එවූ ලිපියේ මෙ ලෙස සඳහන් විය. “මෙම කෘතිය මගින් කිතුනුවන් දැනුවත් කර ඔවුන් යහ මඟ යැවීමට ඔබ උත්සුක වන බව පෙනේ. ඔබටත් ඔබගේ මෙම කෘතියටත් දෙවි මහෝත්තමයාණන්ගේ ආසිරි පතමි.”)

**1999 අගෝස්තු 29**

“මාගේ සංඝයේ ශ්‍රාවකයින් ලෙස මා නුඹලා තෝරා පත් කළේ මුළු ලෝකය උදෙසා ය; මුළු ලෝකයේ ගැළවීම උදෙසා ය. ඔබගෙන් මා පතන එක ම දෙය නම් ගැළවීම උදෙසා ජනතාව වෙනුවෙන් යාච්ඤා කිරීමත් සියල්ලන් උදෙසා ඔබේ ජීවිතය කැප කිරීමත් ය. ලෝකයට දෙන්නට රන්, රිදී, මුතු මැණික් නුඹලා කිසිවකු හෝ සතු ව නැත. ජීවමාන මා ඔබ ජීවිත තුළ අත්දකිමින් ඔබ ජීවිත තුළ මට ක්‍රියා කරන්නට ඉඩ දීමේ සැබෑ පොහොසත්කම පමණක් ඇති මුල් සභාවේ මාගේ අපෝස්තුළුවරුන් ලෙස කැඳවීම ලත් ජනතාවකි, නුඹලා. ඒ සාක්ෂිය දරන්නට මැලි වන්නෝ, ඒ සඳහා මඳ වශයෙන් පමණක් කටයුතු කරන්නෝ මහත් අභාග්‍යකට මුහුණ දෙති. සංඝයක් ලෙස නුඹලා මා තුළ ඒකරාශි වෙමින් නිරන්තරයෙන් යාච්ඤා ජීවිතය ගොඩනගාපන්න. සංඝය තුළ සියල්ලන් ඒකත්වයක් වීමට බාධා වන්නා වූ සියල්ල හිස් වෙමින් ඉදිරියේ දී ඔබ එක ම ශරීරයක අවයව බව ලොවට ප්‍රකාශ වීමේ මොහොතට සූදානම් වන්න. මා ඔබ සැම කැඳවා ඇත්තා වූ ඒ ගමන තුළ ශක්තිය ධෛර්යය නිරන්තරයෙන් මගෙන් ම ලබා ගෙන ඒ ගමන යන්නට විශ්වයට ම හොරණෑවක් වන්නට සැරසෙන්න. නුඹගේ සහෝදරයා අසල්වැසියා සමග එක්සත් ව එක්සිත් ව ප්‍රේමයේ නව දහම, විශ්වයේ පැරණි දහම, ඔබ ඔවුන් සමග ජීවත් වන බව, ඔබ සිතින් වචනයෙන් ක්‍රියාවෙන් ඔවුන්ට ප්‍රේම කරන බව, ඔබ ද ඔවුන් ද එක ම ශරීරයක අවයව බව, ඔවුන්ගේ දුක වේදනාව ඔබගේ දුක වේදනාව බව ප්‍රකාශ කරන්නට ඒ මහා ධර්මය ඔබ තුළ ජීවත් කරන්නට කාලය පැමිණ ඇත්තේය. ඔබ සූදානම් ව ලෝකය උදෙසා ධර්මයෙහි නියැලෙන්න. ---- තව තවත් මගේ බැටළු රැළ වෙනුවෙන් මගේ අනුකම්පාවේ කාලය මම තබා ඇත්තෙමි. යක්ෂයාගේ සියලු ක්‍රියාකාරකම්වලට ඇලුම් කරන්නෝ මේ වන විට ද නොයෙක් ආකාරයෙන් යුහුසුලු වෙති. විශ්වයට ම පණිවුඩය යන තාක් මේ සියල්ල සිදු වන බැවින් ඉතා නිහතමානි ව ඔබගේ ක්‍රියා කලාපයන් ඉදිරියට ගෙන යන්න.”

**1999 සැප්තැම්බර් 03**

"මගේ වචනය ලෙස ක්‍රියා කරන්නට ද මුළු මිනිස් සංහතිය මගේ ගැළවීමෙහි පොඟවන්නට ද එහි ජීවමාන සාධකයක් වන්නට ද මා ඔබ වෙනුවෙන් පත් කළා වූ මගේ එඬේරා තුළ ඔබ සැම පෝෂණය වන්න. ---- අද පවත්නා ලෝක ස්වභාවය තුළ පසුගිය දිනක මා පුත්‍රයා (නොස්ට්‍රාඩාමුස්) ප්‍රකාශ කළ අනාවරණයන් බොරුවක් බවට, ඒ සාවද්‍ය බවට, එය ඉතා විහිළුවක් බවට පත් විය. මගේ ශුද්ධ වූ වැඩ සිටීම ප්‍රතික්ෂේප කරන්නා වූ සියලු දෙනාට ම නුදුරු දිනයේ දී ඒවා නිසි ලෙස දැක ගැනීමටත් ඒ තුළ ක්‍රියා කිරීමටත් කාලය ලැබෙන්නේය. ලෝකය මොන තරම් විනාශ වෙතත් බිය නො වන්න. ඔබට පිළිතුරක් ඇත, ඒ ජේසුස් යන මාගේ නාමය යි. මගේ පූජා වීමේ මහා බලය තුළ සියල්ලෝ ශක්ති සම්පන්න වෙත් වා ! දැනටමත් ඇරඹෙමින් ඇති විශ්වයේ මහා කැළඹීම් තුළ අවදිව යාච්ඤා ජීවිතයට ඇතුලු වන්න."

"ඔබ සියල්ලන් දෙස නිවැරදි දෙ නෙතින් බලන්න. ඔවුනොවුන්ගේ කොතෙක් දුර්වලතාවයන් වෙතත් ඔවුන් උදෙසා අනුකම්පා ස්වභාවයෙන් ජීවත් වන්න. ඔබ මගේ ළයෙහි වෙසෙමින් ඔවුන් ව ඔබගේ ළයෙහි තබා ගෙන සහා මාතාව වෙනුවෙන් ඔබගේ යාච්ඤා ජීවිතය වර්ධනය කරපන්න. ලෝකය උදෙසා ඔබගේ වැය වීම අතිශයින් වැදගත් ය. මගේ සක්‍රමේන්තු ආකාරයේ වැඩසිටීම (දිව්‍ය සත්ප්‍රසාදය) තුළ ඔබගේ නිරන්තර යාච්ඤා ජීවිතය වර්ධනය කර ගන්නට ඔබ යුහුසුළු වන්න. ---- මා මැවූ විශ්වය විනාශයේ අබිමුව ඇතැ යි පෙනුනත්, එම විනාශය නපුරාගේ ජයග්‍රහණයක් බව ලෝකය සිසාරා රැව්පිළිරැව් දෙතත් ඒ සියල්ල තුළ නපුරා පරාජිත බව නොබිය ව ප්‍රකාශ කරපන්න. ඔබ ලබන්නා වූ ඔබ විඳින්නා වූ සියලු තාඩන පීඩනවල දී මාගේ නාමය තුළ ශක්ති සම්පන්න වන්න. මක්නිසාද, ලෝකයේ විනාශය කොතෙකුත් දැකගත හැකි වෙතත් මේ ලෝකය විනාශය පමණක් ම නො ව අධර්මිෂ්ඨ යුගය අවසන් කිරීමත් යක්ෂයාගේ ක්‍රියාකාරකම් සියල්ල විනාශ කිරීමත් සාමකාමී ධර්මිෂ්ඨ දහස් වසරක කාලයට මුල පිරීමත් ය. මෘගයාගේ සැලසුම් සියල්ල ප්‍රතික්ෂේප කරන්නෝ භාග්‍යවන්තයෝ ය."

## 24

## "මා ක්‍රියා කළා වූ ද මා ක්‍රියා කරන්නා වූ ද ජීවිත සියල්ලක් ම යාච්ඤාවේ ජීවිත විය යුතුය."

'දහම් නවෝදය' එකතු කිපයක දී ඩිල්ෂාන් මගින් ලැබුණු ජේසු සමිඳුන්ගේ අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කිපයකි, මේ.

**1999 සැප්තැම්බර් 08**

"විනෝදකාමී ලෞකික සල්ලාලකමේ ජීවිතය ආකර්ෂණීය නව මුහුණුවරකට පත් කරන්නට සාතන් ලහිලහියේ ක්‍රියා කරන්නේය. ඒ සියල්ල ඉදිරියෙහි ඔබ දෙවියන් විසින් තෝරා ගත් සංඝයක් බැවින් ඔවුන් උදෙසා යාච්ඤා කරපන්න. ඔබ ඔබගේ කාර්යය සත්‍ය ජය ගන්නා මොහොත තාක් නිහඬතාවයෙන් නිසි ලෙස කරගෙන යන්න. ඔබව විනාශ කරන්නට ඔවුන්ගේ සියලු උපායන් ඔබට විරුද්ධ ව සාතන් අවුළුවා ලන්නේය. යක්ෂයාගේ මහා ගිනි සිළුව දැල්වෙමින් පවතින්නේය. ලෝකයේ අති බිහිසුණු දුෂ්ට පාලනයට මුල පිරෙන මොහොත එලඹෙනු ඇත. මගේ අවසාන ශ්‍රේෂ්ඨ පත්වීමත් දෙදරුම් කෑමේ මොහොතට ළඟා වන්නේය. මා ගොඩනගා ගත්තා වූ ප්‍රේමයේ දහමේ මා සහා මාතාව විනාශ වීමේ මහා අභිමුඛයට සාතන් පෙරලන්නේය."

"මගේ පූජක පුතුන්, දියණියන් බොහෝ දෙනෙක් ඔවුනොවුන්ගේ ලෞකික ආශාවන් කෙරෙහි පොරබදමින් මගේ කැඳවීම ප්‍රතික්ෂේප කරන මොහොතට පිවිසෙති. ඔවුහු ලොවේ විද්‍යුත් මාධ්‍යයන් තුළින් ලෞකික පැති ඉතා ආශාවෙන් විමසමින් සිටිති. එහෙත් ඒ කිසිවකුගේ විනාශය මාගේ කැමැත්ත නො වේ. එනිසා මාගේ පූජක පුතුන්, පූජක දියණියන් මම මෙ ලෙස අමතමි. ඔබ ඔබගේ ඇතුලාන්ත සිතට පිවිස එහි ජේසුස් වන මට ක්‍රියා කරන්නට ඉඩ දෙන්න. එවිට මම ඔබ දැනුවත් කරමින් ඔබ සවිමත් කරමි. ඔබ ගත යුතු තීරණය මම ඔබට පවසමි. මාගේ ජනතාවට ද මම මෙ ලෙස පවසමි. මගේ පූජක පුතුන්ට, පූජක දියණියන්ට සාමය පතන්න. ඔවුන්ගෙන් ලැබෙන අනගි අදහස් අගයන්න. නුඹලා මාගේ ළයෙහි වෙසෙමින් ඔවුන් නුඹලාගේ ළයෙහි තබාගෙන ඔවුන් උදෙසා යාච්ඤාවෙන් මොරගසන්න. ඔවුන් තුළ වැළපෙන්න, වැළපෙමින් ගොඩනගන්න. එය යි, සහාව. මා එතැන යි. මා මැණියන් මෙ ලොව තුළ ක්‍රියා කරමින් දුන් සියලු අනාවරණයන් අසත්‍යය යි කියන්නට යමකු නැගී සිටින හෝරාව ආසන්න ය. බිය නො වන්න, සියල්ල තුළ ශක්තිමත් වන්න. යාච්ඤාවේ ජීවිතයෙන් තොර ව මා තුළ ක්‍රියා කරන්නට කිසිවකුට බැරි බව සියල්ලන්ට වටහා දෙන්න. ඔවුහු මගේ වචනය පිළිස්සීමට ද එහි සියලුම ප්‍රකාශ වීම් නවතා ලීමට ද කාලයෙහි විලංගුවට ඔබ හසු කරන්නට වෑයම් කරන්නේය. කාලයේ සිදු වීම් තුළ

මා පෙර ප්‍රකාශ කළ පරිදි මගේ පැමිණීමට පෙර සියලු ආකාර විනාශයන් නොයෙක් මාදිලියේ ක්‍රියාකාරකම් සිදු වන බව මම ප්‍රකාශ කළෙමි. බිය නො වන්න, මගේ පැමිණීම ආසන්න යි. සියල්ල තුළ සත්‍යය ජය ගැනීමටත් සියල්ල ජයග්‍රාහී ලීලාවෙන් දෙවියන් කැමති තැනට ගෙන යන්නටත් සියල්ල සූදානම් ව පවතින්නේය. ඔබ ඉතා එඩිතරව මගේ කැඳවීමට අනුව තව තවත් ක්‍රියා කරපන්න. දෙවියන් නැතැ යි කියන ලෝකයේ දෙවියන් ඇතැ යි කීමේ මහා ප්‍රකාශනයන් නිකුත් කිරීම නිසා නුඹලාගේ ගමන් මඟ ද කටුක වන්නේය.”

**1999 සැප්තැම්බර් 19**

“ඔබට ඇත්තා වූ එක ම වියගස මගේ කුරුසිය බව ඔබ නිසැක ව ම දැන ගත යුතුය. ඉදිරියේ දී මොන යම් බිහිසුණුතාවයකට මුළු විශ්වය නතු වුවත් ඔබ බිය නො වන්න. මා එදා මනු කය ගෙන ලොව උපත ලද ඒ හෝරාවේ ඔවුන්ගේ විනෝදකාමිත්වය ඔබ දන්නෙහිය. නොයෙක් ප්‍රකාශනයන් හා මාර්ගෝපදේශකයන් තුළින් මගේ දෙ වන පැමිණීම පිළිබඳ මම අදත් ලොවට ප්‍රකාශ කරන්නෙමි. ජනතාවගේ වගකීම නම් ඒ දෙස නෙත් යොමා ඔවුන්ගේ කාරුණික පියාණන් දෙස හැරී ඒමේ මොහොත ඔවුන් විසින් යුහුසුළු ව ක්‍රියාවට නැගීම ය. එදා මගේ ගෝලයන් මගේ දෙ වන පැමිණීමේ සළකුණු මගෙන් විමසූ විට විශ්වය නොයෙක් ආකාරයේ දෙදරීම්වලට ලක් වන බව මම ඔවුන්ට පැවසීමි. ඒ සියල්ල යටපත් කිරීමට අද කවුරු කෙසේ ක්‍රියා කරතත් මනස්ස්ථාපනය වන මගේ ජනතාව මනස්ස්ථාපනය වෙති, මා ප්‍රතික්ෂේප කරන ජනතාව මා ප්‍රතික්ෂේප කරති. ඔවුන් සියල්ලන් උදෙසා ඔබ දෙව් පියාණන්ට මුළුමනින් අවනත වෙමින් යාච්ඤාවෙහි නිරන්තර ව නියැලෙන්න. සියල්ල ඉදිරියේ ඔබ සැම නිර්භීත ව ක්‍රියා කරපන්න. මගේ එදා දිව් පිදීමේ නායක පූජකයෝ අදත් එලෙසින් ම ක්‍රියා කරති. ඔවුන්ගේ කිසි ම ක්‍රියාවකට මා එදා හිස නොනැමුවාක් මෙන් ඔබ ද නිරන්තරයෙන් ක්‍රියා කරපන්න. ----”

**1999 ඔක්තෝබර් 04**

“මගේ වචනය උදෙසා වෙහෙසෙන ඔබට මගේ සහෝදරයින් යැයි මම අමතමි. මා ඔබට නිරන්තරයෙන් මොරගසමින් කියන වචනය නම් දැඩි ලෙස මිනිසුන්ගෙන් ප්‍රවේසම් වන්න. මා ක්‍රියා කළා වූ ද මා ක්‍රියා කරන්නා වූ ද ජීවිත සියල්ලක් ම යාච්ඤාවේ ජීවිත විය යුතුය. ඔබ පිළිබඳ සියල්ල මා සුරතේ තබා, නිරන්තර යාච්ඤාවෙන් ජීවිත පහන දල්වා ගනිමින් ජීවිතාන්තය දක්වා යාච්ඤාවේ පවතින්න. කාලයේ බිහිසුණුතාවය ඔබට එයින් වැටහෙනු ඇත්තේය. විශ්වාසය පිළිබඳ හීනතාවයකට හෝ කලකිරීමකට යට වීමට හෝ නුසුදුසු කාලයකි, මෙය. එවිට නුඹලා අසල ම දැවටෙන නපුරා සූක්ෂ්ම ලෙස ඔබ තනි වූ බව ඔබ ප්‍රතික්ෂේප වූ බව වටහා දෙමින් ඔහු තුළ ඔබට වටිනාකමක් දෙන්නට පොරබදන හෝරාවක දැන් ඔබ ගමන් කරන්නෙහිය. ඔබගෙන් යම් කෙනෙක් යම් ආකාරයකින් දුර්වල වුවහොත් ඔහුගේ ජීවිතය දෙස ඔබගේ කාලය වැය කරන්න. ඒ පූජා වීම තුළ මගේ පූජා වීම ඔබ අත්දකින්නෙහිය. ඔබ ලොවට කුමක් කියන්නෙහි දැයි යමෙක් ඔබගෙන් විමසන විට මනස්ස්ථාපනයේ ජීවිතයත්, විශ්වාසයේ බලාපොරොත්තුවේ ප්‍රේමයේ ජීවිතයත්, ධර්මිෂ්ඨ භාවයේ ගුණාංගත්, ජේසුගේ ජීවමාන වැඩසිටීමට සාක්ෂි දැරීමත්, පූජා වීමත් කාලයේ අවශ්‍යතාවය බව පවසන්න.”

**1999 ඔක්තෝබර් 10**

( ’දහම් නවෝදය’ දෙ වන ප්‍රකාශනය ගැන සඳහන් කරමින්) “මගේ ධර්මිෂ්ඨයකු වීමට මගේ ගෝලයකු වීමට ලෝකයේ ජනතාව උදෙසා මා ඔබට පැවරූ මගේ වැඩය ඔබ දැන් නිම කරමින් ඇත්තෙහිය. මගේ අසරණ බැටළුවන් උදෙසා ඔබ මෙ ලෙස ඒකරාශි කළේ මගේ දහමත්, මා ඔබට දුන් ප්‍රකාශයනුත් ඔබ දන්නා ඔබ උගත් ඔබට වැටහෙන මගේ ආත්මානුභාවය තුළ ඔබ පිළියෙල කරගත් මේ ප්‍රකාශනය ඉතා නිවැරදිතාවයෙන් ධර්මිෂ්ඨයකුගේ ජීවිතයේ මුල සිට අග දක්වා විග්‍රහ කර ඇත්තේය. මෙය ලොව පුරා දහමේ නියැලෙන අයට අතිශයින් උචිත ය. මා මීට පෙර ඔබට ප්‍රකාශ කළ පරිදි අපේ ශීලයෙහි වටිනාකම කුමක් ද අප ව ගෞරවයට පත් කළා වූ අපේ කැප වීම් ජීවිතයේ වටිනාකම කුමක් ද යන්න මෙයින් ලෝකයට හොඳ හැටි පැහැදිළි වන්නේය. එබැවින් මෙය මගේ ආශිර්වාදයෙන් යුක්ත ව ලොව පුරා බෙදා හැරීමට මගේ ම ජීවමාන වචනයක් බවට මම පත් කරන්නෙමි.”

“ධර්මිෂ්ඨයෙක් වීමට මගේ මිතුරෙක් වීමට මගේ ගෝලයෙක් වීමට අවශ්‍ය කරුණු සියල්ල ගොනු කර ලෝකය පුරා ප්‍රකාශ කිරීමේ මොහොත දැන් පැමිණ ඇත. මක්නිසාද, එමගින් දැනට නිදිබර ව සිටින නිදා ගෙන සිටින නොසැලකිල්ලෙන් සිටින සියළුම සහාවන් ධර්මිෂ්ඨ භාවය ගැන සොයන්නටත් එහි ජීවත් වන්නටත් ඒ තුළ ක්‍රියාත්මක වන්නටත් කාලය පැමිණ ඇති බැවිනි. ඔබ ධර්මිෂ්ඨ භාවය තුළ වැඩෙන්නේ නම් එදා මා පැවසුවාක් මෙන් ඔබ මා කළ ක්‍රියා කරන්නෙහිය: මටත් වඩා ප්‍රබල ක්‍රියා ද ඔබ කරන්නෙහිය. ඒ ධර්මිෂ්ඨ භාවය පිළිබඳ විශේෂිත වූ ලක්ෂණයකි. ධර්මිෂ්ඨයෙක් යනු මගේ වචනයට කීකරු මා යවන තැන ජීවත් වන, මා තුළ විශ්වාසය ජීවත්

කරවන, සියල්ල උදෙසා පූජා වෙන, මාගේ පියාණන්ගේ කැමැත්තෙහි ඇඹෙන, මගේ පියාණන් තුළ නිරන්තරයෙන් යැපෙන ජීවිතයකි. එමෙන් ම සියලු අසාර්ථකත්වයන් තුළ පරුෂ ගැරහිම් හා විරෝධතාවයන් තුළ ද නොසැළී පෙරට ම යාම ද ධර්මිෂ්ඨ භාවයේ ලක්ෂණයකි. මනස්ස්ථාපනයේ ජීවිතයත්, ධර්මිෂ්ඨ භාවයේ ගුණාංගත්, මගේ ජීවමාන වැඩසිටීම පිළිබඳ සාක්ෂි දැරීමත්, ඒ සඳහා ඔබගේ පූජා වීමත් කාලයේ අවශ්‍යතාවය බව මම ඔබට ප්‍රකාශ කරමි.”

“මේ ගමන අති බිහිසුණු ය. මේ ගමන යන්නෝ සැම විට ම සැම තැන ම පුදුමාකාර වේදනා විඳින්නෝය. ඔබගේ කඳුළු පිස දමන්නට වත් ඔබගේ දුකට කන් දෙන්නට වත් ඔබගේ අසල්වැසියා ඉදිරිපත් නො වනු ඇත. ඔබගේ ජීවිත ගමන මහා විනාශයක් කරා යන බව කියමින් ඔවුහු ඔබ උපහාසයට ලක් කරන්නෝය. එහෙත් මා තුළින් නික්මුණු මගේ දහම අද ලෝකය තුළ ජීවමාන වන්නේ ද, අද ලෝකයට මහත් බලපෑමක් කරන්නේ ද එවැනි ධර්මිෂ්ඨ ජීවිත බිහි වීමෙන් පමණි. මම නැවත ද ඔබට කියමි. ධර්මිෂ්ඨ ජීවිතයක් කරා ඔබ වැඩෙන්නේ නම් මා කළාට ද වඩා ප්‍රබල ක්‍රියා ඔබ කරන්නෙහිය. මගේ දහම උදෙසා ඔබගේ වැය වීම ගැන මම අතිශයින් ප්‍රසන්න වෙමි.”

“මා පත් කළා වූ මගේ සභාවේ ශ්‍රේෂ්ඨ නායකත්වය අද එතැනින් පහකර දමන්නට එතැනින් විනාශ කර ලන්නට දරන ප්‍රයත්නයන් මොන තරම් ක්‍රියාත්මක වුවත් කිසි විටෙක කිසි තැනෙක මා පත් කළා වූ නායකයකු පහ කිරීමට ඔවුන්ට හැකි නො වන්නේය. ඔහුගේ ශරීරයේ තිබෙන්නා වූ ආබාධයන් ඔහුගේ වයස්ගත භාවය ඔප්පු කරමින් ඔහුගේ මතකය දුර්වල බව ද පෙන්වා දෙමින් ඔහු ව ප්‍රතික්ෂේප කරන්නට මගේ පූජකයෝ පවා සූදානම් වෙති. ඔවුන්ගේ ඒ ක්‍රියාත්මක වීම තුළින් සිදු වන්නේ ඔවුන් වෙත එළඹෙන්නා වූ ඔවුන්ගේ බිහිසුණු විනිශ්චයේ කාලය ඔවුන් ජය ශ්‍රීයෙන් භුක්ති විඳීම පමණි.”

**1999 ඔක්තෝබර් 22**

(ජේසු සමිඳුන් විසින් ම දෙන ලද ප්‍රකාශනයක් හා යාච්ඤාව සහිත පත්‍රිකාව මුද්‍රණය කරන්නට අප සංඝයට භාර දුන් දිනයේ එම යාච්ඤා පත්‍රිකාව ගැන සඳහන් කරමින්) “---- මෙය කුඩා වුවත් එයින් විශාල වෙනසකට, විශාල සොයා ගැනීමකට, මා සොයන්නට සියල්ලන් පෙළඹ වීමට හේතු වන්නේය. ---- මහා විනාශය ලෝකය අභිමුඛයෙහි ය, ස්වාමිවරුන් යැයි සිතා සිටින අයවළුන් රැසක් මාගේ නාමයෙන් ප්‍රකාශ වන්නට වෑයම් කරන කාලයේ දී මනුෂ්‍ය ස්වාමි ආධිපත්‍යය බිම දමන්නට, පරාජය කරන්නට නුඹලාගේ වචනය කඩුවක් සේ මුවහත් කර ගනුව.” (ජේසු සමිඳුන් විසින් දෙන ලද සියලු අදහස් අඩංගු කොට ප්‍රකාශනයක් හා යාච්ඤාව සහිත පත්‍රිකාව මෙලෙස සකස් කර බෙදා හැරියෙමු.)

**එළඹෙන තීරණාත්මක කාලයට සූදානම් වීම සඳහා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ම ලෝ වැසි සකල ජනතාවට දෙනු ලබන ප්‍රකාශනයක් හා යාච්ඥාවකි.**

"ධර්මයාණන් වන මැවුම්කරුවාණන් වන මම ජේසුස් ක්‍රිස්තුස් නමින් මිනිස් බව ගෙන මෙ ලොවට වැඩියෙමි. මුළු මිනිස් සංහතියේ පාපය මා කෙරෙහි ගෙන තම උත්තම පූජක දිවි පිදීම මගින් අධර්මයේ අධිපතියා වන යක්ෂයා අන්ත පරාජයට පත්කරමින් විමුක්තිය උදා කළෙමි: මරණය මරමින් ප්‍රතාපවත්ව උත්ථාන වූයෙමි. මම ඔබ සමග දැනුදු ජීවත් වන්නෙමි: මහිමාන්විතව නැවත මෙ ලොවට වඩින්නෙමි. ජේසුස් ක්‍රිස්තුස් වන මම මුළු මිනිස් සංහතියේ එක ම ස්වාමියාණන් ද එක ම ගැළවුම්කරුවාණන් ද එක ම එඬේරාණන් ද වන්නෙමි. මාගේ නාමය ප්‍රකාශ කරන්නන් තුළ, මාගේ නාමය ප්‍රකාශ කරන්නට උනන්දු වන්නන් තුළ ඇත්තා වූ ඒ මහා බීජය ඔබ තුළ ද රෝපණය වීමේ කාලය ලඟා වී ඇත්තේය: ඒ මහා බීජය නම් තමාගේ ජීවිතයෙන් තමාට කිසිවක් කරකියාගත නොහැකි බවත් තමා මේ ලෝකයේ පාපිෂ්ඨ ජීවිතයෙන් ජය ගන්නට වෙර දරමින් සිටින ජීවිතයක් පමණක් බවත් ය. මෙහි සඳහන් වී ඇති සත්‍යතාවයන් ප්‍රකාශ කරන්නා වූ ද මෙම සත්‍යතාවයන් මෙනෙහි කරන්නා වූ ද සියල්ලන් මනස්ස්ථාපනය වීමට කැමති ජනතාවක් ලෙස මම පිලිගන්නෙමි. මා තුළ ජීවත් වන්න. ජේසුස් යන මාගේ නාමයේ අභිෂේකයෙන් ඔබ සැම ආලේප වන්න. මේ වනාහී ජේසුස් ක්‍රිස්තුස් වන මාගේ වචනය යි." එහෙයින් මනස්ස්ථාපනය වන (දහම අසන්නන් පමණක් නො වී දහම පිළිපදින්නන් වෙමින් අදහම ප්‍රතික්ෂේප කරන) ජනතාවට ඔවුන් <u>**ළඟ තබා ගෙන මෙනෙහි කර පල දරනු සඳහා**</u> මෙම යාච්ඥාව උන්වහන්සේ විසින් ම මහත් ප්‍රේමයෙන් දානය කරති.

## <u>යාච්ඥාව</u>

"සමිඳුනි, ලෝකය ම පාපයේ ඇලීගැලී ඇති බව මම දකිමි. එහෙත් ඒ කිසිවෙක් විනිශ්චය කරන්නට මට කිසිසේත් නොහැකිය. මක්නිසාද, මම ද පව් කර ඇති බැවිනි. මම මහා පව්කාරයෙක් බව ඔබ ඉදිරියේ අවංක ව පිළිගෙන පසුතැවිලි වන්නෙමි. පාපිෂ්ඨ ජීවිතයෙන් ජය ගන්නට අවංක ව කැමති මා හට ඔබ තුමන් සහය වන බව මම දනිමි. මා එඬේරාණන් වූ ද ගැළවුම්කරුවාණන් වූ ද මාගේ ස්වාමියාණන් වූ ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් තොර මට ජීවයක් නොමැත: ගැළවීමක් නොමැත. මා ජීවත් වන්නේ ද මා විශ්වාස කරන්නේ ද මා බලාපොරොත්තු තබන්නේ ද විශ්වයේ උතුම් වූ නාමය වන ජේසුස් යන නාමය ජයශ්‍රීයෙන් ප්‍රකාශ කරන මොහොතේ <u>මහා ආමෙන්</u> කියන්නටය."

(මෙහි අරුත වචනයකින් හෝ වෙනස් නොකර ඕනෑ ම භාෂාවකින් මුද්‍රණය කර ලොව පුරා බෙදා හරින්න.)

**1999 ඔක්තෝබර් 31**

"මගේ මිත්‍රවරුනි, ඔබ මා හා එක් වන මෙවන් යාච්ඥාවල දී මම මහත් සේ සතුටට පත් වන්නෙමි. මක්නිසාද, ලෝකයේ මොන ආකාරයේ කැළඹිලි තිබෙතත් මේ සැම සිද්ධියක් තුළ ම ඔබ මා වෙතට නැඹුරු වන බැවින් මම මහත් සේ සතුටට පත් වන්නෙමි. ඉදිරියේ දී සිදු වන්නා වූ සැම සිදු වීමක් තුළ ම ඔබ නිරන්තරයෙන් මා තුළ යාච්ඥාවේ ජීවිතයකට ඇතුළු වන්න. සැම සිදු වීමක් තුළ ම සැම ක්‍රියාකාරීත්වයක් තුළ ම මා දෙසට පමණක් ජනතාව යොමු කරවන්නට, මනස්ස්ථාපනයෙන් යුත් ජනතාවක් බිහි කර ලන්නට දායක වන්න. ඔබ එකිනෙකා හමු වන විට යමකුට යමක් පවසන විට මාගේ නාමයෙන් තොර ව ඒ කිසිවක් නො කරපන්න. තෘෂ්ණාව බලලෝභිකම මුල් කරගෙන සත්‍යය වළලන්නට සැරසෙන යුගයක ඔබගේ මහා මෙහෙවර විය යුත්තේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වන මගේ නාමයෙන් තොර යහපත් කිසිවක් නොමැති බවත්, විශ්වයේ එක ම බලය, එක ම ආත්මික බලය මා බව ඔබ එඩිතර ව ලොවට ප්‍රකාශ කිරීම ය. ---- මගේ උපතේ 2000 වර්ෂය සම්පූර්ණ වී දැනට වසර කීපයක් පසු වී හමාරය. මගේ දෙ දාහේ ජන්ම ජයන්තිය යැයි කියමින් ජනතාව පෙළගැසෙන්නේ මේ උත්සවය ද කා බී වල්මත් වී ඔවුන්ගේ ප්‍රීතියේ සාදයක් බවට පත්කර ගන්නටත් එලෙස යක්ෂයාගේ ක්‍රියාකාරීත්වයට නතු වීමටත් ය."

**1999 නොවැම්බර් 21**

"මුළු මිනිස් සංහතියේ ම ආත්මයෙන් ආත්මය කොඳුරමින් මහා ගැඹුරක් සොයමින් ඔවුනොවුන්ගේ ආත්මය, ආත්මය සොයා යන්නේය. ඔබට මා පැවරූ ඒ සියල්ල තුළ ධර්මිෂ්ඨයකු වීම උදෙසා ආත්මයෙන් ආත්මය වෙලෙමින් ආගමික සංස්කෘතික සියලු සීමා බිඳ වැටෙමින් සියල්ලන් එක ම ජන සමාජයක් වෙමින් ධර්මිෂ්ඨ භාවයට වැඩෙන මාගේ ම බැටළු රැළක් ගොඩනැගීමට සියල්ල තුළ සියල්ලන් එකමුතු වන්නට ආත්මයෙන් ආත්මය වෙලෙමින් පවතින කාලය ආරම්භ වී ඇත්තේය. මා මවා වදාළා වූ මේ මුළු විශ්වය මා තුළ පවතින බව මා ලොවට ප්‍රකාශ කර හමාර ය. මා මිතුරනි, මා ඔබට පැවරූ වැඩය ඔබ නිම කළෙහිය. මා ඔබට පැවරූ ඒ තුන් වන ප්‍රකාශනයත් නිවැරදි ලෙස ක්‍රියාවට නගාපන්න. විශ්වයේ සියලු විඳවීම් හා දෙදරීම් පසු කර දැහැමි යුගයේ උදාව දක්වා මෙම ප්‍රකාශන තුන සෑහේ. මක්නිසාද, ඒ තුළ සියල්ල ගැබ් වී ඇත්තේය. ඒ තුළ ආත්මය, මාගේ ආත්මය සොයා ඒමේ මාර්ගය ඔවුන්ට හොඳ හැටි පහදා දී ඇත්තේය. සුබ විහරණය තුළ ඇලී-ගැලී ඇති සියල්ල නිම වන කාලය සියල්ලන් විඳවමින් දෙදරුම්කමින් ධනය, බලය, ජනප්‍රියත්වය පරාජිත වන කාලය ඉතා ආසන්න ය. විශ්වයේ විඳවීම මේ මහා දෙදරුම මේ සියල්ල කාලයෙහි ආත්මගත වන්නට සියල්ල මොරගසන්නේය. සියල්ලෝ මා ආත්මය සොයා සැරිසරන ආත්ම වන්නෝය. ඔබට එන්නා වූ සියළු ගැටළු, බාධක, තර්ජන, ගර්ජන තුළ ඔබ සමග මා සිටින්නා වූ ගිවිසුම ඔබගේ ජීවිතයේ විශ්වාසයෙන් යුතුව අත්දැකීමට මෙය කාලය යි."

**2000 පෙබරවාරි 18**

"මාගේ දරුවෙනි, චතාරිකයේ ඔබ ගත කරන්නා වූ විප්‍රවාසයේ දින හතලිහ තුළ ලෝකයේ ගැළවීම උදෙසා වන්දියක් ලෙස ඔබගේ ජීවිතය ලෝකය වෙනුවෙන් දෙවිඳුන්ට කැප කරමින් යාච්ඤාවෙහි නියැලෙන්න. ඔබ නිරාහාරයෙන් ගත කරන්නා වූ යාච්ඤාව තුළ මා එදා පාළුකරයේ විඳි ඒ අත්දැකීම ඔබ හා බෙදා ගන්නට මම සැලසුම් කරන්නෙමි. මා දින හතලිහ පාළුකරයේ විඳෙව්වාක් මෙන් ඔබත් විවිධාකාර අත්දැකීම් තුළ එයට ගොදුරු වන්නෙහිය. මා තෝරා ගත් ශ්‍රාවකයින් වන නුඹලා කිසිවකු නැති කුටියකට වී සිටියත් මෙ වැනි අත්දැකීමකට උරුම ලද්දෙහුය. ඔබට හමුවන්නා වූ සතා සීපාවාගෙන් පවා ඔබ ඒ අත්දැකීමට මම හුරු කරවන්නෙමි. ඔබ ගත කරන්නා වූ විප්‍රවාස කාලය තුළ නිරාහාරයෙහි වැදගත් භාවය ද, යාච්ඤාවෙහි උත්තම භාවය ද මම මොරගසා ඔබට ප්‍රකාශ කරමි."

**2000 මාර්තු 12**

"ප්‍රේමය නම් සත්‍යය කතා කිරීම ය. එය යමකුට වේදනාවක්, තවෙකකුට සතුට උපදවන්නක් විය හැකිය. මම ප්‍රේමයේ නාමයෙන් ඔබට සත්‍යය කතා කළෙමි. ඔබ විටෙක වෙවුලුම් කෑවෙහිය. විටක ඔබ මගෙන් විමසුවෙහිය. ප්‍රේමයේ විවිධ පැතිකඩ එලෙස මම ඔබට අවබෝධ කර දෙමින් ඔබ මුහුකුරා යන්නට සැලැස්වීමි. ---- ඔබ උගත් දෑ මුල්කර ගෙන, මා තුළින් ඔබ ලැබුවා වූ සියල්ල ඒකරාශි කරගෙන, ඔබ ලෝකය පුබුදු වන්නට අද ගින්නක් සේ ඇවිලෙන්නා වූ මාගේ වචනය ලොව අස්සක් මුල්ලක් නෑර යැවීමේ උත්තම කාර්යයට, ඔබ ප්‍රකාශන කීපයක් මගින් හවුල් වූයෙහිය. එබැවින් ඔබ ලෝකයට එඬේරෙක් වූයෙහි ය. ජනතාව පතන ධනය, බලය, ජනප්‍රියත්වය මම ඔබට කිසිසේත් ළඟා නො කළෙමි. එහි දී ඔබ වින්දා වූ දුක වේදනාව ප්‍රතික්ෂේපය ඔබගේ ජීවිතයේ මහත් සේ අර්ථාන්විත වී ඇත්තේය. ඔබ අද සැබවින් ම ජීවත් වන්නෙහිය. ඔබ අද ලෝකයට මාගේ වචනයේ සාක්ෂිකරුවකු වී ඇත්තෙහිය. මේ ප්‍රකාශනයන් කෙරෙහි ලෝකය ඉතා යුහුසුළු ව ඉතා ආකර්ෂණශීලි ව බලනු ඇත. ඔවුන්ගේ ජීවිතය තුළ ඔවුන් උගත් දෙයට වඩා මෙයින් යමක් උගත හැකි බව ඔවුහු ප්‍රකාශ කරන්නෝය. විටෙක ඔවුන් ඔබ ප්‍රතික්ෂේපයට ද විටෙක ඔවුන් ඔබ වැළඳ ගැනීමට ද මෙය මහෝපකාරී වන්නේය. ශුද්ධ භාවය නම් එය යි. ළඟා වීම හා දුරස් වීම ය. ළඟා වීමේ දී ඔබ දකින්නා වූ සමානාත්මතාවය දුරස් වීමේ දි ඔබ දකින්නා වූ ශුද්ධ භාවය නිරන්තරයෙන් අභිරහසක් වන්නේය. ශුද්ධ භාවයේ ගින්න තුළ ඔබ පන්නරය ලබමින් සක්‍රමේන්තු ජීවිතයෙහි ඔබ ශක්තිමත් වන්න."

"මාගේ සංඝයේ සියල්ලන් විඳවීම් තුළින් ම මම ගෙන යන්නෙමි. ලෙඩ රෝග ආදියෙන්, නොයෙක් ආකාරයේ වසංගත තුළින් මම ඔබට සමීප වූයෙමි. සමහරු මා හැඳින ගත්හ. සමහරු ඒ තුළ මා නො දුටහ. මම නැවත නැවතත් ඔබට මොරගා කියමි. විශ්වයේ උතුම් වූ නාමය ලෙස දෙවි පියාණන් දානය කළා වූ මාගේ ජේසුස් යන නාමය තුළ ජීවත් වන්න. ජේසුස් යන නාමය තුළ ඔබ ජීවිතයේ සැම මොහොත ම ක්‍රියාවට නගාපන්න. ඔබ මට කැප කළා වූ ජීවිතය ඔබගේ මෙ ලොව ජීවිතය නිමා වන තෙක් කැප වීමේ ජීවිතයක් කළ මැනවි. ඔබ නිරන්තරයෙන් යැදුමෙන් ගැයුමෙන් පිදුමෙන් කරන්නා වූ ප්‍රශංසාව ස්වර්ගීය මහා දුම් පූජාවට යොමු කරපන්න. ඒ මහිමාන්විත සුවඳ දුම් යාගය තුළ ලෝකයේ පාපය දැවෙමින් යන්නේය. ලෝකයේ පාපය උදෙසා

ඔබ විඳින්නා වූ දුක වෙහෙස මහන්සිය සියල්ල දෙවි මහෝත්තමයාණන් වහන්සේට පූජා කරපන්න.”

“ධර්මිෂ්ඨ යුගයෙහි දහමේ පැවැත්ම නම් ප්‍රේමය යි. සියලු ආකාර නීති ක්‍රමානුකූල ව ප්‍රේමය තුළ ගැබ් වන්නේය. ලොව පුරා තව තවත් සංඝයන් තුළ මම ක්‍රියා කරමි. යම් විටෙක ඔවුන් ඔබ ව දකින්නට, ඔබ අතර සිදු වන ක්‍රියාකාරකම් දැකීමට ඔවුහු භාග්‍ය ලබන්නෝය. ඔබ ද යම් විටෙක ඔවුන්ගේ සේවාවන් කෙරෙහි ඉතා දීප්තිමත් ඇසින් බලන්නෙහිය. ඔබ මේ ගමන, ඉදිරියේ පැමිණෙන්නා වූ මහත් බිහිසුණු තත්ත්වය තුළ මාගේ ජනතාව හා එක් ව ක්‍රියාවට නගන්නෙහිය. ඔබ මහත් සේ පීඩා විඳින්නෙහිය. ඒ සියල්ලෙහි දී ශක්ති සම්පන්න වන්න. ඔබ නිරන්තර ප්‍රශංසාවෙහි ද තුති ගී ගායනයෙහි ද යෙදෙන්න. කිසි විටෙක කළකිරීමකට හසු නො වන්න. ඔබ සැම නිරන්තරයෙන් ශුද්ධ භාවයේ ගින්න තුළ පන්නරය ද සක්‍රමේන්තු ජීවිතයෙහි ශක්තිය ද ලබන්න. ---- මාගේ මැණියන් ප්‍රතික්ෂේපයේ මුදුනට ම ගෙන එන්නට නපුරාගේ සැලසුම් යුහු ව ක්‍රියාත්මක වන්නේය. ඇය සහය මැදිහත්කාරිය ලෙස ක්‍රියා කරන්නා වූ දැක්ම විවේචනාත්මක ඇසින් දැක ඒ සියල්ල ප්‍රතික්ෂේප කරමින්, ඇය සාමාන්‍යත්වයට පත් කරමින් එපමණකින් නොනැවති ඇය අශීලාචාරත්වයට පත් කරමින්, ඇයගේ ජීවිතයේ විවිධ අවස්ථාවන් උපයෝගී කර ගෙන විනාශය කරා මුලාව කරා ගෙන යන්නට නපුරා කටයුතු කරන මොහොතේ දී ඔබට මා ප්‍රකාශ කළ පරිදි ඇයගේ ජීවිතයේ උත්තරීතර භාවය ඔබ ප්‍රකාශනයක් ලෙස ලොව හමුවේ තබන්න.”

**2000 ජුලි 26**

“දරුවෙනි, ප්‍රේමය ඝෝෂා කරන්නේ වත් තමා ගැන පාරට්ටු කරන්නේ වත් අනෙකාගේ වරද උලුප්පා පෙන්වන්නේ වත් නැත. ඒ සියල්ල මා ජීවත් වූ මා දෙසූ ප්‍රේමයට පටහැනි ය. ඔබ තුළින් මා දැකීමට ඉඩ සලසන ලෙස මම ඔබට ඇරයුම් කරමි. මා ළයෙහි ඔබ සිටිමින් දුබල දිළිඳු ජනතාව ඔබ ළයෙහි තබා ගන්නට ඔබ මා තුළ දුන් ගිවිසුම ඔබ ප්‍රේමය තුළ සපල වත් කළෙහි ද? මා නුඹලාට දුන් අනාවරණ ඇසුරෙන් ප්‍රේමයේ විවිධ පැතිකඩ දෙස ඔබ දිගු කලක් බලමින් ඔබ ජීවිතය පොහොණි කර ගත්තෙහිය. මා ඔබට දුන්නා වූ කැඳවීමට ඔබ පිළිතුරු දෙන විට ඔබට ගැටළු ප්‍රශ්න රැසක් ඇති වන්නේය. අති දරිද්‍රතාවයෙන් පෙලෙන්නා පව් කිළිටේ තැවරී සිටින්නා මාගේ මිතුරන් යැයි මම ඔබට ප්‍රකාශ කළෙමි. මාගේ වචනය ද මාගේ ක්‍රියාව ද ඔබට අවශ්‍ය වන්නේ ඔබ රෝගී නම් පමණි. ප්‍රතිකාරය නම් ප්‍රේමය ය. ප්‍රේමයෙන් තොර ගැළවීමක් නොමැත්තේය. මාගේ නාමය කීමට ඔබට මාගෙන් අවසර ඇත්තේ ප්‍රේමය කරණකොට ගෙන පමණ ය. ප්‍රේමයෙන් තොර ව ඔබ මාගේ නාමයෙන් කතා නො කරන්න. ප්‍රේමයෙන් තොර ව මාගේ නාමයෙන් ඔබ කිසිවක් නො ඉල්ලන්න. මේ විශ්වයේ මාගේ ඉදිරි සියලු සැලසුම් ද ඒ මහා ප්‍රේමය තුළ ගැබ් වන්නේය. ඔබ දකින්නා වූ ප්‍රේමය නමැති වචනය ඉතා සුළු ය. එහි බලය විශ්වයටත් වඩා විශාල ය. මේ මහා ප්‍රේමයේ බලය නුඹලා කවදා තේරුම් ගන්නෙහු ද?”

“ධනය, බලය, ඔබගේ තනතුරු මේ කිසිවක් මා හට විශේෂ නැත. කොන් වුවන් තුළ ප්‍රේමය මා දකිනා විට එය ඔසවා ගෙන යන්නට ස්වර්ගයේ මාගේ දූතයන්ගේ හොරණෑ හඬ රැව් පිළිරැව් දෙන ඒ හෝරාවේ ඔබගේ ඇස් විවරයෙන් කඳුළු ගලන්නේය. ඔබ අපට වචනය නුදුන්නෙහි ද? ඔබගේ ක්‍රියාකාරකම් අපි නො දැක්කෙමු ද? ඔබගේ නාමය නිසා අපි මහත් දේ නො කළෙමු ද? මම තොප නාඳුනමි යි එවිට මම පවසමි. මක්නිසාද, ඔබ තුළ ප්‍රේමය නැත. ---- යම් පවුලක් එකිනෙකා ප්‍රේමයෙන් වෙලෙන්නේ ද මම එහි ජීවමාන වන්නෙමි. එකමුතු වීමත් එක්සිත් වීමත් ප්‍රේමයේ උතුම් ලක්ෂණයකි. මම එතැන ජීවමාන වන්නෙමි. ප්‍රේමය තව තවත් ඔබගේ ජීවිතයේ විශේෂිත ස්ථානයක් විය යුතුය. ප්‍රේමය ඔබගේ ජීවිතයේ ස්වාමියාණන් කර ගන්න. නපුරාගේ වෛරයේ භේද කිරීමේ සියලු සැලසුම් විනාශ කිරීමට ඔබට ඇති එක ම අවියත් එක ම බලයත් ප්‍රේමය යි. ලොව සැබෑ එක ම ප්‍රේමයාණන් වන මාගේ නාමයෙන් තොරව ඔබට ජීවත් විය නො හැක. ප්‍රේමයේ ඉවසීමට සීමාවක් බලාපොරොත්තුවට නිමාවක් නොමැත්තේය. මම තවත් ඔබ දෙස දෙනෙත් අයා සිටිමි. විවිධාකාර ආගම් තුළ මෙය විවිධාකාර අන්දමින් විස්තර වන්නේය. එහෙත් ස්වර්ගීය පියාණන් ඔබට දැක්වූ ප්‍රේමය ඔබ අනෙකාට ද දැක් විය යුතුය.”

“ඔබගේ සිත් අමනාපකම්, අනෙකා නුරුස්සන ගතිය ඔබගේ ප්‍රේමයේ ආවරණය වී ඇති ඒ විෂ බීජය ඉවත් වන තැන ප්‍රේමය මුහුකුරා යයි. නැති වූ බැටළුවා සොයා යන්නට මම ඔබ කැඳවීමි. දිළින්දා දෙස නෙත් යොමන්නට මම ඔබ කැඳවීමි. එය ඉතා අසීරු ය. අසරණයාට ඔබගේ පිළිසරණය උදව් උපකාරය වැදගත් ය. එය විය යුතු ම ය. පවුල් ජීවිතයක් එක් සිත් කර වීම අතිශයින් යෝග්‍ය ය. ස්වාමියා සහ භාර්යාව එකට විසීම ප්‍රේමයේ මුදුන් මල්කඩ ය. කටු පඳුරු තුළත් මල් පිපෙන බැවින්, රළ පතර අතරත් වටිනා දේ තිබෙන බැවින්, ග්‍රීෂ්ම කාලයේ ද දළු මල් ලියලන බැවින් විවාහ ජීවිතයේ පොරොන්දු තුළ ප්‍රේමයේ ජීවත් වන්නට ඔවුන්ට මාර්ගය

සුදානම් කරපන්න. ඔවුන් ප්‍රේමයේ විවාහ ගිවිසුම දකින විට ඔහු තුළ ඇති වන්නා වූ තුවාලය, ඇය තුළ ඇති වන්නා වූ වේදනාව ප්‍රේමය තුළ නිමා කරන්නට හැකිය. ප්‍රේමයෙන් තොර ජීවිතයක් නොමැත. මා තුළ ලගින්නා මාගෙන් යැපෙන්නේය. මාගෙන් යැපෙන්නා ප්‍රේමය අන් අය සමග බෙදා ගන්නේය. ---- දෙවි පියාගේ මොහොත ආසන්න යි. ඒ සියල්ල තුළ යක්ෂයාගේ ක්‍රියාකාරකම් ප්‍රබල යි. ඔබ මාගේ නාමය නිසා සියල්ල විඳින්නටත් සියල්ලේ පොහොසත් වන්නටත් ප්‍රේමයෙන් මුසපත් වී ප්‍රේමයෙන් පිටාරා ගලන මොහොතේ ඔබගේ ජීවිතයේ ඇතුලාන්තයෙන් ම පිටාරා ගලන්නට මම ඔබට මඟ පෙන්වීමි. ඔබ ප්‍රේමය තුළ සවිමත් වන්න, එක්සිත් වන්න, ප්‍රේමයෙන් බැඳෙන්න, ප්‍රේමය ස්ථිර යි, ප්‍රේමය ඔබට නිවැරදි මඟ පෙන්වයි."

**2000 අගෝස්තු 02**

"මා තුළ ඔබ දුන් ගිවිසුමට, පූජා වීමේ ඇති වැදගත් මොහොතට දැන් ඔබ සියල්ලෝ ළඟා වෙමින් සිටිති. මක්නිසාද, මුළු විශ්වය ම මහා වේදනාවකට, කෙඳිරිගෑමකට, මනුෂ්‍ය මට්ටමින් ඉසිලිය නොහැකි මහා බරකට, ගිනි ජාලාවකට, මහා ප්‍රපාතයකට ඇදගෙන යාමේ කාලය සීඝ්‍රයෙන් සිදු වෙමින් පවතින්නේය. ඔබට දැන් ලොවේ බිහිසුණුතාවය දැනෙන්නෙහි ද? මෙය සීඝ්‍ර වර්ධනයකි. මෙය උච්චතම අවස්ථාවට පත් වන විට ඉර හඳ නොපෙනී යන්නට මම සැලසුම් කරන්නෙමි. ඔබට තවත් ආලෝකයෙහි විසීමට ඇති කාලය තුළ ආලෝකයේ ක්‍රියාවෙන් ම නපුරා පරාජය කරපන්න. ---- සාමයක් ඇතැයි කියන මේ ලොව තුළ විනාශය සීඝ්‍රයෙන් පැතිරී යන බව ඔවුහු සාමය නමැති වචනය තුළ මුවා කරමින් සිටිති. ධනය බලය ඉදිරියේ සාමය ආභරණයක් කර ගත් ලෝකයේ පාලකයන් දේශයේ පාලකයන් ඔවුන්ගේ බොරු ජාවාරම් ක්‍රියාකාරකම් තුළ ඔවුන් සත්‍යය දකින මොහොතේ ඔබගේ ප්‍රේමයේ වචනය ඔවුන්ට අවශ්‍ය වන්නේය."

"---- මාගේ සංඝයේ ශ්‍රාවකයින් ලෙස කැඳෙව්වා වූ එකකු හෝ විනාශ කිරීම නපුරාගේ එක ම අධිෂ්ඨානය යි. ඒ අභිබවා යන්නට නම් ඔබ සියල්ලන් එක්සත් ව එක්සිත් ව සේනාකුළු ශාලාවේ මාගේ දහම ක්‍රියාත්මක වූ අන්දමට විශ්වාසයේ, බලාපොරොත්තුවේ, යාච්ඤාවේ ජීවිත අරඹාපන්න. නපුරා විවිධ මාර්ගයන් තුළින් සියල්ල අගාධයට ඇදදැමීමට කටයුතු කරන්නේය. කිසිවකට බිය නො වන්න. සියල්ල තුළ අසාර්ථකත්වය අත්දකින මොහොතේ සාර්ථක වූ ජයග්‍රාහී ලීලාවෙන් මාගේ ප්‍රේමයේ දහම හෙවත් පුරාතන දහම ප්‍රකාශ කිරීමට කාලය එළඹෙන්නේය. ඔබ නිවැරදි ස්වාමිත්වය තුළ ජීවත් වෙමින් ඒ නිවැරදි ස්වාමිත්වය අන් අයට කියා දෙන්න. ඒ තුළ නපුරාගේ සියලු ක්‍රියාකාරකම් විනාශ කරන්නට හැකි වන්නේය. මේ සියල්ල තුළ මේ විශ්වයට නව අරුණළු උදා වීම සඳහා වන විඳවීමේ උච්චතම අවස්ථාව එළඹෙමින් ඇත්තේය. මා ඔබට ප්‍රකාශ කළ පරිදි විඳවීම, විඳවීම, විඳවීම, ප්‍රේමය තුළ විඳවීම මගින් සියල්ල ජය ගන්නා බව මම ඔබට පවසමි."

**2000 සැප්තැම්බර් 30**

"මාගේ දරුවෙනි, ඉදිරිය අති බිහිසුණු ය. මාගේ නම කියන, මාගේ නාමයට සාක්ෂි දරන ජනතාවට මාගේ නාමයෙන් තම ජීවිතය පූජා කරන්නට සිදු වන්නේය. එහෙත් කිසි තැනක කිසි විටෙක මාගේ දහම පරාජයට පත් නො වන්නේය. බාහිර ආටෝපයෙන් බාහිර ප්‍රකාශනවලින් ඔවුන් (නපුරා හා සම්බන්ධ බලවේග) ජය ලබා ඇතත් ඔවුන්ගේ කාලය සීඝ්‍රයෙන් නිමාවට පත් වන්නේය. ඔවුන් ඒ සියල්ල කෙටි කාලයක් තුළ සම්පූර්ණත්වයට පත් කරමින් විනාශ වී සදාකාලයට ම දෙවියන් විසින් මවන ලද විශ්වයෙන් සමු දෙන කාලය ආසන්න ය. එය අති බිහිසුණු ය. මාගේ ගෝලයන්ට ද මා තෝරා ගත්තා වූ මාගේ දැහැමි වූ ජීවිත පැවැත්ම දරන සියල්ලන්ට ද එය අති බිහිසුණු කාල පරිච්ඡේදයක් වන්නේ ම ය. බාහිර ව පෙනෙන්නට පමණක් සියල්ල සාමයෙන් හා ප්‍රේමයෙන් ආරම්භ කරමින් සියල්ල තුළ එක්සත් බව ඇති කරමින් ඔවුන් යන ගමන තුළ අභ්‍යන්තර දර්ශනය එය නො වන්නේය. ඔවුන් එක්සිත් වන්නේ ද එක්සත් වන්නේ ද නපුරාගේ ක්‍රියාකාරකම්වලට සියල්ල උරා දීමට ය. එබැවින් ඔබ කල්පනාකාරී ව මා ඔබට නිරන්තරයෙන් ප්‍රකාශ කරන පරිදි අහිංසක භාවයෙන් හා නුවණශීලි ව ක්‍රියා කිරීමට කාලය එළඹ ඇත්තේය. පිරිසිදු සත්‍යය ඇත්තා වූ සැම තැනකට ම නපුරාගේ ප්‍රහාරය ළහිලහියේ එල්ල වන්නේය. ඔබ බිය විය යුතු නැත. මාගේ වචනය ඔබ තුළ ඇත්තේය."

## 25
## “666, මකරා, මෘගයා මේ සියල්ල දැන් ඉදිරියට එමින් පවතින කාලය යි, බිහිසුණු කාලය යි.”

2001 ජනවාරි 12 වන දින සුජීවා ජයලත් සොයුරිය වේගයෙන් ධාවනය වෙමින් තිබුණු බසයක පා පුවරුවෙන් ඉවතට විසි වී තාර පාර මත හිස පිටුපස කොටස බිම ගැටෙන ලෙස වැටී මාරාන්තික අනතුරකට මුහුණ දුන්නාය. රෝහල්ගත ව සිටි ඇය දින කිපයකට පසු තරමක සුවය ලබා සම්පූර්ණ සුවය ලබන තුරු 'බෙතෙල්' නිවසේ ගත කළාය. ජනවාරි 26 සිකුරාදා 'බෙතෙල්' නිවසේ අපගේ යැදුමේ දී මෛත්‍රිය පිළිබඳ අපගේ අවධානය යොමු විය. ඊට හේතුව මෙය යි.

'දහම් නවෝදය' පළමු ප්‍රකාශනයේ 666, මකරා, මෘගයා, මුල්කර ගත් සටහන සකස් වූයේ අප සංඝයේ සුනිල් විජේතුංග සොයුරාගේ අතිනි. ජේසු සමිඳුන් එය සැකසීම භාර දුන්නේ ඔහුට ය. ඔහු ද ඔහුගේ සොයුරිය වන ප්‍රියන්ති ද වසර ගණනාවක සිට 'මරි මව්ගේ දරුවන්' හැටියට 'සේනාකුළු' යැදුමට සහභාගි වූහ. එහි දී ඔවුහු ලොව පුරා ජේසු සමිඳුන්ගේ හා දේව මෑණියන්ගේ අනාවරණයන් ගැන අධ්‍යයනය කළහ. එම අත්දැකීම එය සකසන්නට ඔහුට උපකාරී වන්නට ඇතැ යි මම සිතමි. එහි මෙසේ සඳහන් ව ඇත. “මොවුහු සභාවේ සත්‍ය විශ්වාසය හා ධර්මය ද ඉගැන්වීම් ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය සම්බන්ධය ද ව්‍යාකූල කරමින් ව්‍යාජ සභාවක්, ව්‍යාජ පාප්වරයකු සහ ව්‍යාජ ක්‍රිස්තුවරයකු (මෛත්‍රි නමින් ව්‍යාජ ගැළවුම්කරුවකු) ඉදිරිපත් කිරීමට ක්‍රියා කරති.” 'දහම් නවෝදය' තුන් වන ප්‍රකාශනය ද නිකුත් වීමෙන් පසුව යි, මෛත්‍රි යනු කවරෙක් දැයි හඳුන්වා දෙන වෙබ් අඩවියේ පිටු කිපයක් අප අතට පත් වූයේ. එහෙත් ඒ පිළිබඳ අපගේ නිසි අවධානය යොමු වූයේ 2001 ජනවාරි මාසයේ දී ය. සම්පත් සොයුරා ජනවාරි 24 බදාදා යැදුමට පැමිණි විට මෛත්‍රිය, මයිත්‍රෙආ නමින් උච්චාරණය කරන ලෙසට එහි උපදෙස් දී ඇති බව මගේ අවධානයට යොමු කරමින් “ඒකත් 666 ද දන්නේ නැහැ” යනුවෙන් පැවසීය. ජනවාරි 25 වන දින රාත්‍රියේ දී my-tray-ah එම අකුරු 8 ගණන් බැලීමට මට සිත් විය. එහි එකතුව 666 බව දැක මම මවිත වීමි. මේ සියලු අදහස් ජනවාරි 26 සිකුරාදා යැදුමේ දී අපගේ අවධානයට යොමු විය.

2001 ජනවාරි 28 වන දින සවස 3ට පමණ ඇත. හිසේ හා සිරුරේ තුවාලවල වේදනාවෙන් සුජීවා ඇඳේ වැතිරී සිටින විට රෝගී ඇය බලන්නට දේව මෑණියන් පැමිණ ඇයගේ ඇඳේ පසෙකින් වාඩි වනු ඇය දැක ඇත. දේව මෑණියන් එතුමියගේ සුරත සුජීවාගේ හිස මත තැබූ විගස ම හිසේ වේදනාව පහ ව යනු ඇයට දැණින. ඉන් පසු සුජීවා මුහුණ දුන් අනතුර ගැන ඇය හා සංවාදයකින් පසු ව ඇය තුළින් දේව මෑණියෝ මෙ ලෙස ප්‍රකාශ කළහ. “නුවණැත්තා ගණන් බලා දැන ගනිත් වා යි දේව වචනයේ සඳහන් ව තිබූ ප්‍රකාරයට පළමු නුවණැත්තා ගණන් බලා දැන ගත්තේය, 666 බව. ඔහු දෙවිඳුන් විසින් ඔබට දී තිබෙන එඬේරා ය. එය එසේ විය යුතු ව තිබිණි. එය එසේ ම සිදු විය. එය ගණන් බලා දැනගත් ආකාරය ඇතුළු ව අවශ්‍ය තොරතුරු දැනුවත් කිරීමේ පත්‍රිකාවක් මගින් ජනතාව වෙත නිකුත් කරන ලෙස එඬේරාට පවසන්න. ලෝක දර්ශන තලයේ (අන්තර් ජාලයේ) දැන් ලුසිෆර්ගේ අධර්මයේ වැඩසටහන ක්‍රියාත්මක යි. නුඹලාගේ පියාණන්ගේ ධර්මයේ වැඩසටහන ද දැන් ලෝක දර්ශන තලයට ඇතුළු විය යුතුයි. එය ධර්මය අධර්මය අතර යුද්ධයට මුල පිරීමකි. එනිසා මයිත්‍රෙආගේ වැඩපිළිවෙල ගැන ජනතාව දැනුවත් කරමින් ධර්මයේ වැඩ සටහන ලෝක දර්ශන තලයට ඇතුල් විය යුතු බව එඬේරාට දන්වන්න. ඒ සඳහා නුඹලාගේ පියාණන් වහන්සේ විසින් පුත්‍රයෙක් සූදානම් කර ඇත. ඔහු ගැන නුඹලා දන්නහුය. ඔහු මගින් එය ඉටු කරන්න. ඔබ එක්රැස් වී යැදුමෙන් කරන මොරගැසීම සමග ඉදිරියේ දී ජනතාව ද එක්රැස් වනු ඇත. එඬේරාගේ කැපවීම, පූජාවීම, දෙවි පියාණන්ට අවනත වීම වඩාත් පල දරන්නට පටන් ගන්නේ එවිට යි.
---- එඬේරා ව මෙම කාර්යය සඳහා අනාදියේ සිට ම නුඹලාගේ පියාණන් වහන්සේ විසින් ආසිරි ගන්වා ඇත. ඔහු සමග එක් වී ජනතාවට පෙරටුවෙන් යන්නට සුළු පිරිසක් ද අනාදියේ සිට ම නුඹලාගේ පියාණන් වහන්සේ විසින් ආසිරි ගන්වා තිබේ.”
(දැනුවත් කිරීමේ පත්‍රිකාව මෙලෙස සකස් කර එය බෙදා හැරියෙමු.)

## ඔබ දැනුවත් වෙමින් අන් අය ද දැනුවත් කරන්න.

'දහම් නවෝදය'. ප්‍රකාශන තුනක් දැනට ඔබ ඉදිරියේ තබා ඇත.

1 නිතර ම යාච්ඤාවෙන් අවදිව සිටින්න
2 නව ශාක අංකුර බිහි වී ලියලා වැඩේවා!
3 පරම උල්පත හා මුදුන

සමස්ත මනුෂ්‍ය වර්ගයා මුහුණ දිය යුතු ධර්මය හා අධර්මය අතර මහා යුද්ධයට ඔබ සූදානම් කරන්නට එමගින් උත්සාහ දරා ඇත. ඕනෑ ම ආගමක් අදහන හෝ කිසිදු ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන්ට අධර්මය ප්‍රතික්ෂේප කර ධර්ම මාර්ගය වැළඳ ගැනීමට එයින් ඇරයුම් කර ඇත. ඒ ප්‍රකාශන ගැඹුරින් මෙනෙහි කර සූදානම් ව සිටිය යුතු මොහොත මෙය යි. මක්නිසාද, අධර්ම බලවේගය දැනට ම කරළියට පැමිණෙමින් ඇති බැවිනි. අන්තර් ජාලයේ මෛත්‍රියගේ වෙබ් අඩවියට http://www.shareintl.org/maitreya/Ma_main.htm සම්බන්ධ වී එය අධ්‍යයනය කර දැනුවත් වීම හා අන් අය දැනුවත් කිරීම අධර්මයට එරෙහි ව ඔබගේ පරම යුතුකමක් හා වගකීමක් වන්නේය. "මොවුන් විසින් සභාවේ සත්‍යය විශ්වාසය හා ධර්මය ද ඉගැන්වීම් ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය සම්බන්ධය ද ව්‍යාකූල කරමින් ව්‍යාජ සභාවක්, ව්‍යාජ පාප්වරයකු, ව්‍යාජ ක්‍රිස්තුවරයකු (මෛත්‍රි නමින් ව්‍යාජ ගැළවුම්කරුවකු) ඉදිරිපත් කිරීමට ක්‍රියා කරනු ඇත." **(නිතර ම යාච්ඤාවෙන් අවදිව සිටින්න.)**

එහි (මෙම වෙබ් අඩවියේ සඳහන් වූ පළමු පිටපතට අනුව 1992-12-11) Maitreya යන නාමය Ma-tray-ah යනුවෙන් උච්චාරණය කරන ලෙස පවසයි. ඒ ඇයි? එහි ලොකු රහසක් ඇත. "සමහර ජාත්‍යන්තර මූල්‍ය සමාගම් එහි යම් යම් අවශ්‍යතා සඳහා සෑම ඉංග්‍රිසි අක්ෂරයකට ම යම් වටිනාකමක් ආරෝපණය" කර ඇත. එය මෙසේය. A=6, B=12, C=18, D=24 ආදි වශයෙන් ඊ ළඟ සෑම අකුරකට ම 6 බැගින් එකතු කර එය සකස් කර ඇත. මේ අනුව
my-tray-ah යන නාමයේ අංකය ඔබට ගණන් බලා දැනගත හැකිය.

M=78, Y=150, T=120, R=108, A=6, Y=150, A=6, H=48 = 666

**"නුවණැත්තා මෘගයාගේ අංකය ගණන් බලා දැන ගනිවා, මන්ද එය මනුෂ්‍යයකුගේ නාමය දක්වයි. ඒ ගණන හය සිය හැට හය යි." (ශුද්ධ බයිබලය - එළිදරව් 13:18)**

ජේසු සමිඳාණන් දෙවන වරට මහිමාන්විත ව මෙ ලොවට වඩින්නට පෙර ශුද්ධ ලියවිල්ල පවසන ආකාරයට ඇති වන්නේ සාමකාමී පරිසරයක් නො වේ. එය විවිධ විපත් ගහණ වූ කාලයකි. එහෙත් මේ විපත් විනාශයක පෙර නිමිත්තකට වඩා ගැළවීම ළං ළංව පැමිණෙන බව අපට පවසන සංකේතයක් වැන්න. මේ විපත් කියා පාන්නේ අන්ධකාරයේ දූතයාගේ හෝරාව පැමිණ ඇති බව ද? නැත, මේ විපත් ගැළවීමේ කාලය උදා වන බව අපට සිහි ගන්වන පෙර නිමිත්තකි. **"මේ දේ සිදු වන්නට පටන් ගන්නා කල ඔබේ විමුක්තිය ළං වේගන එන බැවින් නැගී සිට හිස ඔසවන්න."** (ශු. ලූක් 21:28) හෙම්බත් වී සිටින මනුෂ්‍ය සංහතියේ එක ම පැතුම මේ සියල්ල අවසන් වී විමුක්තිය උදා වන්නේ කවදා ද යන්න යි. මනුෂ්‍ය හස්තයෙන් කිසි දා උදා කරන්නට නොහැකි විමුක්තිය ගෙන එන්නට මහා දේව මැදිහත් වීමක් අනිවාර්යයෙන් ම සිදු වේ.

ගරු ෂාර්ඩැන් පිය තුමා මෙ ලෙස පවසයි. "මානව වර්ගයාගේ විමුක්තියත් පූර්ණත්වයත් නියත වශයෙන් ම රඳා පවතින්නේ වැඩි වැඩියෙන් එකමුතු වීම මත ය. මෙසේ එකමුතු විය යුත්තේ මිනිසාට ඔබින මානව පිළිවෙලකිනි. එනම් බාහිර වශයෙන් නො ව අභ්‍යාන්තරයෙන් ද ද්‍රව්‍යමය වශයෙන් නො ව ආධ්‍යාත්මික වශයෙන් ද බලහත්කාරයෙන් නො ව නිදහස් කැමැත්තෙන් ද විය යුතු වේ." දෙවි පියාණන්ගේ මහිමයේ ප්‍රශංසාව උදෙසා ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණෝ මුළු මැවිල්ල ඒකරාශි කරන්නාහ. අභ්‍යාන්තරයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද නිදහස් කැමැත්ත තුළ ද එතුමෝ එය පූර්ණ කරති. කරළියට පැමිණෙන දුෂ්ට බලවේග බාහිර වශයෙන් ද ද්‍රව්‍යමය වශයෙන් ද බලහත්කාරයෙන් ද එය ඉටු කිරීමට තැත් කරනු ඇත.

අති බිහිසුණු වසර තුනහමාරක් ගැන එළිදරව් පොත අපට පවසයි. මෙය මුළු මිනිස් සංහතියට පරීක්ෂණ කාලයකි. ජෝබ්ගේ විශ්වාසය ඇටසැකිල්ල දක්වා පරීක්ෂා කරන්නට දෙවියන් වහන්සේගෙන් ලුසිෆර්ට අවසර ලැබුණාක් මෙන් මුළු මනුෂ්‍ය සංහතිය ම පරීක්ෂා කරන්නට දෙවියන් වහන්සේගෙන් ලුසිෆර්ට අවසර ලැබී ඇති කාල වකවානුවකි, මෙය. ධර්මය තුළ ජීවත් වෙමින් ඒ නිසා ඔබට පැමිණෙන සියලු දුක් වේදනා මහත් ඉවසීමෙන් විඳ දරා ගනිමින් සදාතන

විමුක්තිය වැළඳ ගන්නවා ද? ආලෝකයේ දූතයෙක් මෙන් වෙස්වලා ගත් my-tray-ah හා ඔහුගේ සහචරයන්ගෙන් ලැබෙන ලෞකික ප්‍රතිලාභ වැළඳ ගන්නවා ද යන පරීක්ෂණයට සියල්ලෝ මුහුණ දිය යුත්තාහ. පරාජිත නපුරාගේ සියලු සැලසුම් පරාජය වන්නේය. **"ශරීරය නැසුවත් ආත්මය නසන්න නුපුළුවන් අයට බිය නො වන්න. එහෙත් ආත්මය නිරයෙහි හෙළා විනාශ කරන්න පුළුවන් තැනැන් වහන්සේට පමණක් බිය වන්න." (:ශුද්ධ බයිබලය - මතෙව් 10:28)** ධර්මය තුළ කෙළවර දක්වා ම ජීවත් වන්නා ධර්මය විසින් ම සුරකිනු ඇත.

**"මෙතෙක් සිදු වුනේ වත් මතු සිදු වන්නේ වත් නැති ආකාරයේ මහා විඳ විමකට"** මිනිස් සංහතිය මුහුණ දෙනු ඇත. මේ ගැළවීම සඳහා වන මහා විඳවීමේ ප්‍රසවය යි. කෙටි කලකට සීමා වන මේ මහා විඳ විමට බිය නොවන්න. මිනිසත් බව ගත් ධර්මයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණෝ අධර්මයේ අධිපතියා දහස් වසරකට බැඳ දමමින් ධර්මිෂ්ඨ දහස් වසර උදා කරනු සඳහා මිහිතලයට දෙ වන වරට මහිමාන්විතව වඩින්නාහ. ඔබ ද ධර්ම මාර්ගය වැළඳ ගනිමින් අධර්ම බලයට යට වී සිටින ජනතාවගේ විමුක්තිය උදෙසා නිරාහාරයෙන් හා කඳුළින් යුතුව ධර්මයාණන් පා මුල මොරගසත් වා! දැහැමි මඟ තෝරා ගැනීම නිසා ඔබට විඳින්නට සිදු වී ඇති සියලු විඳවීම් එතුමාණන් පා මුල මිනිස් සංහතියේ විමුක්ති වෙනුවෙන් පුදත් වා!

**"ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝය."**
**"ධර්මිෂ්ඨකම උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය."**

**2001 මාර්තු 06**

"ඉදිරියේ දී තෝරා ගත් ශ්‍රාවකයින්ගෙන් ඉතා සුළු පිරිසකි, ඔහු සමග ඉතිරි වන්නේ. එදා මෝසස් මෙන් ජනතාව රතු මුහුදෙන් එතෙර කරගෙන යන්නට ජනතාවගේ එඬේරා ලෙස ඔහු පත් කර ඇත. ඔහු සමග යන්නේ ඉතා සුළු පිරිසකි. ලෝක සම්මතය අනුව මේ සියල්ල අසම්මත යි. පියාණන් වහන්සේගේ මොහොත පැමිණෙන තෙක් එය සඟවා තිබේ. 666, මකරා, මෘගයා මේ සියල්ල දැන් ඉදිරියට එමින් පවතින කාලය යි: බිහිසුණු කාලය යි. ජනතාව මහා නින්දක, සම්මත සභාව අවදි විය යුතු කාලය යි."

**2001 මාර්තු 15**

(සුජීවා එදින මුරුතාන නිවසේ ගත කළාය. ඇය එහි දී කුඩා දරුවන් සමග සතුටින් සිටින අතර ප්‍රින්ස් නිහාල්ගේ බාල පුතු පෙම් තිළිණ සමනලයකු පසු පස හඹා යද්දී) "පුත්‍රය, ඔබ කුමක් ද, කරන්න ගියේ? නුඹලා සමග මෙ තෙක් ක්‍රීඩා කළේ මැය නො වේ, මරියාවන් වන මම යි. ඒ පුංචි සතුන්, ජේසු මැව්ව සතුන් ඔවුන් ව ආරක්ෂා කරන්න. පුත්‍රය, ඔවුන්ට දුක නො දෙන්න. ඔබ උතුම් තිළිණයකි, පුත්‍රය, දෙමව්පියන්ට පමණක් නො ව අන් අයටත්."

**2001 මාර්තු 16**

"මෙ ලොවට අසම්මත දේ පියාණන් වහන්සේට සම්මත යි. අසම්මත සභාව වන පියාණන් වහන්සේ පත් කළ සංඝය එතුමන්ගේ රාජ්‍යයේ අති ශ්‍රේෂ්ඨ ය. ලොව අසම්මත දේ නැවත සිදු වෙමින් ඇත. ---- දරුවෙනි, මම නුඹලාට අසීමිත ව ආදරේ වෙමි. දෙවි පියාණෝ තම කැමැත්ත පරිදි ලොවට ගැළවීමදායකයාණන් එවීමට මරියාවන් වන මා තෝරා ගත්හ. දරුවෙනි, මම දෙව්පියාණන්ගේ අණට කීකරු වුයෙමි: අසම්මතයට කීකරු වුයෙමි. මම නුඹලා වෙනුවෙන් මැදිහත්කාරියක් වී සිටිමි. මම නොයෙක් තැන්වල පෙනී සිටිමින් නුඹලාගේ පියාණන් වහන්සේගේ පණිවුඩය බෙදා හරින්නෙමි. නුඹලාට දී ඇති එඬේරා තුළින් සියලු පුහුණු වීම් නුඹලාට දී හමාර ය. තව ද ඔහු තුළින් දෙවි පියාණන්ට වැඩක් ඇත."

"සිත කතා කරයි. නුඹලා ම මෙනෙහි කරපන්න, මේ කාලයේ නුඹලාගේ සිත කතා කරන ආකාරය. මොහොතක් තනි වී නුඹලාගේ සිත කතා කරන දෙයට සවන් දෙන්න. ඒ සිත ම යහපතට කතා කරයි, ඒ සිත ම අයහපතට කතා කරයි. එසේ නම් ඒ දෙ සිත තුළ දෙ දෙනෙක් ක්‍රියා කරති. ඒ දෙවියන් වහන්සේ සහ නපුරා ය. මේ කාලයේ මෙනෙහි කරපන්න, නුඹලාට හැකි සැම තත්පරයක දී ම, නුඹලාගේ සිත කතා කරන ආකාරය. එවිට නුඹලා වැඩි වෙලාවක් ගත කර තිබෙන්නේ කා ළඟ ද, වැඩියෙන් ම ළං වී සිටින්නේ කාට ද, ඈත් වී තිබෙන්නේ කාගෙන් ද කියා නුඹලාගේ හෘදය සාක්ෂිය ම නුඹලාට පවසනු ඇත. ---- ඇත්තෙන් ම ඔබ දකින්නෙහි නම් ඔබ මහා පව්කාරයකු බව ඒ මොහොත තරම් උතුම් මොහොතක් තවත් නැත. එය යි, නුඹලා තුළ සිදු විය යුත්තේ."

**2001 මාර්තු 17**

(මඩු දේව මාතා ප්‍රතිමාව රැගත් පෙරහර වයික්කාල හරහා ගමන් කිරීමට නියමිත ව තිබුනේ එදින යි.) "මාගේ සම්මත සභාව මාගේ ප්‍රතිමාව රැගෙන පෙරහැර කරති. මාගේ අසම්මත සභාව මිනිස් පවුලේ ගැළවීම සඳහා පියාණන් ඉදිරියේ යැදුමෙන් මොරගසති. ඒ සැමට ම මම ආසිරි පතමි.--- "දරුවෙනි, මැයට පවසන්න, මැයගේ ජීවිතයේ ඉදිරි පියවර වන්නේ මැයට දෙවි පියාණන් විසින් ම සකසා ඇති විවාහ ජීවිතය තුළ ජීවත් වීම බව."

# 26

## "පුරාතන සර්පයා නෙරපා හරින්න."

සුජීවා ජයලත් සොයුරිය 2001 වසරේ වැඩි ම කාලයක් ගත කළේ 'බෙතෙල්' නිවසේ ය. එම වසරේ මැයි 8 සිට දෙසැම්බර් 3 දක්වා ඇය තුළින් ජේසු සමිඳුන්ගේ අනාවරණයන් සිදු විය. එම අනාවරණයන් තුළ ඇයගේ අසම්මත විවාහය, එකමුතුකමේ ගෘහය සැදීම, මුළු විශ්වය කෙරෙහි දෙවි පියාණන්ගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර පිළිබඳ කරුණු අන්තර්ගත විය. එම අනාවරණයන්ගෙන් උපුටා ගත් කොටස් කීපයක් 26 සිට 33 දක්වා අංක යටතේ මම ඔබ ඉදිරියේ තබමි. **මෙම අනාවරණයන් ඇසුරෙන් දෙවි පියාණන්ගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර ගැන ගැඹුරින් අධ්‍යයනය කරමින් ඒ සඳහා සූදානම් වන්න.**

**2001 මැයි 08**

(එදින සිට ජුනි 21 දක්වා අනාවරණයන් ලැබුණේ සුජීවා හා ජේසු සමිඳුන් අතර සංවාදයක ස්වරූපයෙනි.) "ඉදිරිය ධර්මය අධර්මය අතර යුද්ධය යි. ඔබ හැම කෙනෙක් ම මාගේ නාමයේ අවිය දරමින් ජයග්‍රහණය ලබන්න. දරුව, මම නුඹ තුළින් ක්‍රියා කරමින් පණිවුඩ දුන්නෙමි. දැන් ලොව පුරා ඒවා ප්‍රකාශ වන කාලය ළං ව ඇත. ---- මැයගේ ඉදිරි ජීවිතය මා විසින් ආශිර්වාද කර හමාර යි. මා හා ගමන් කරන කෙනකු මම ඇයට සහකරු ලෙස තෝරා දුනිමි. එයට මුහුණ දීමේ ශක්තිය මා විසින් මැයට දී ඇත." (ජේසු සමිඳුන්ගේ මෙම අනාවරණයන් හා ක්‍රියාකාරීත්වයන් ඔබ තව දුරටත් අධ්‍යයනය කරන විට ඔබ තුළ ගැටළුවක් පැන නගින්නට පුළුවන. දෙවිඳුන් විසින් මිනිසාට දුන් නිදහස් කැමැත්තට එතුමන් ගරු කරනවා නො වේද? විවාහයේ සහකරු, සහකාරිය තෝරා ගැනීමේ දී පවා අණ කරනවා නම් ඒ දෙවිඳුන් විය නොහැකි යැයි ඔබට හැඟෙනු ඇත. එහෙත් ඔබගේ මතිමතාන්තරවලට ම සීමා නො වී ඔබ මෙය තව දුරටත් අධ්‍යයනය කරන්නෙහි නම් දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියරේ දේව ක්‍රියාකාරීත්වයේ සුලක්ෂණ ඔබට අවබෝධ වනු ඇත.)

**2001 මැයි 09**

"දියණිය, ඔබ ඔහුට ආදරය කළ යුතුයි. ඔබ මාගේ අණට කීකරු විය යුතුයි. ධර්මිෂ්ඨ දරුවන් බිහි කිරීම සඳහා මම නුඹ කුස ආසිරි ගන්වමි." (ජේසු සමිඳාණෝ සුජීවාට අනාවරණය කළහ, ඇය ඇන්ටන් ප්‍රසන්න සමග විවාහ විය යුතු බව, ඒ අප සංඝයේ සම්පත්ගේ සොයුරු, සුරේන්ද්‍ර යි. ඇන්ටන් ප්‍රසන්න යනු සුරේන්ද්‍රගේ අනෙක් නම් ය. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 34කි. ඔහු ඊට වසර තුනකට පමණ පෙර විවාහ වූ අයෙකි. ඔහුට වයස අවුරුදු දෙකක පමණ දියණියක් වූවාය. විවාහ යෝජනාවක ප්‍රතිපලයක් ලෙස ඔහු විවාහ විය. විවාහ වී මාස කීපයකට පසුව යි ඔහු දැන ගත්තේ ඇය මානසික රෝගී තත්ත්වයක් නිසා වසර ගණනාවක සිට ම වෛද්‍ය ප්‍රතිකාර ලබන බව. එලෙස රෝගී වන්නට බලපෑ කරුණු ඇය ඔහුට පවසා තිබිණි. ප්‍රේමය තුළ ම ඇය සුවපත් කර ගන්නට ඔහු අදිටන් කර ගත්තේය. ඇයගේ මව් පියෝ සියල්ල වසන් කර ඔහුට ලොකු බරක් බාර දුන්නත් ඒ බර ඔසොවා ගෙන යන්නට අවශ්‍ය ම මොහොතේ සහාය නො වූහ. සිය දියණියගේ විවාහයෙන් මාස කීපයකට පසු පියා විදේශ රැකියාවක් සඳහා පිටත් විය. ඇයගේ නිවසේ සිටීම ගැටළු සහගත වන විට සුරේන්ද්‍ර ඇය තම මව හා සොයුරු සොයුරියන් සිටින නිවසට කැඳවා ගත්තේය. එහෙත් ඇයගේ හැසිරීම තම මව, සොයුරු සොයුරියන් බලවත් සේ මානසික පීඩනයට ලක් කරන විට ඔහු නැවත ඇගේ නිවසට ඇය සමග ගියේය. මේ අතර ඇය බෙහෙත් ගැනීම අතපසු කිරීම නිසා ඇයගේ රෝගී තත්ත්වය උත්සන්න විය. ඇයගේ මව ද කලකට එම නිවසින් බැහැර වූවාය. බිරිඳගේ රෝගී තත්ත්වය නිසා පුංචි දියණිය ඇය සමග තබා රැකියාවට යාමට ඔහුට නොහැකි විය. රැකියාවට නොගොස් ඔවුන්ට ජීවත් වීමට ද නො හැක. මේ පීඩනය තුළ විඳවන ඔහු දෙස මම ද අවධානය යොමු කළෙමි. මා මෙහි සටහන් කළේ ඔහු අත්දුටු තත්ත්වයෙන් බිඳක් පමණි.

ඔහු සියල්ල විඳ දරා ගත්තේ ක්‍රිස්තියානි ප්‍රේමයේ නාමයෙනි. ඔහුගේ ඒ පරිත්‍යාගය නෝංජල්කමක් සේ ඔවුහු දුටහ. වටිනා මනුෂ්‍යයකු නාස්ති වීමට කොහෙත් ම ඉඩදිය නො හැකිය. ඔහු මානසික කඩා වැටීමක අද්දරට ම ළං ව සිටින විට මම සම්පත්ට මෙසේ කීවෙමි. "සුරේන්ද්‍රට පිස්සු හැදෙන්න දෙන්න බැහැ. ඔහුට කියන්න, ඇය ව ඇයගේ මවට බාර දී පුංචි දියණිය ව දෙනවා නම් රැගෙන ගෙදර එන ලෙස. ඇයගේ පියා ආපසු පැමිණි විට කතා කර ගනිමු යි කියන්න." මා පැවසු ලෙස ම සුරේන්ද්‍ර කටයුතු කළේය. මගේ ජීවිත කාලය තුළ මා මෙ වැන්නක් වෙන කිසිවකුට හෝ කියා නැත. මා ඉහත සඳහන් වචන පැවසුවේ දෙවිඳුන් ඉදිරියේ ඒ පිළිබඳ වගකීම මා විසින් බාර ගනිමිනි. සුරේන්ද්‍ර තම නිවසට පැමිණ මාස කිපයක් ඉක්ම ගිය පසු ඇය විටින් විට එහි පැමිණ අසල් වැසියන්ට ද ඇසෙන පරිදි පරුෂ වචනයෙන් බැන වැදුණාය. ඒ තත්ත්වය උත්සන්න වෙත් ම ඇයගෙන් දික්කසාද විය යුතු යැයි සුරේන්ද්‍රට හැඟිණ. සුජීවා හා ඇන්ටන් ප්‍රසන්න විවාහය ජේසු සමිඳුන් අනාවරණය කළේ මෙ බඳු පසුබිමක දී ය. මෙය සුජීවාට පමණක් නො ව සුරේන්ද්‍රට ද ගැටළුවක් විය. ඔහු නැවත විවාහ වීමට කිසිසේත් අදහස් නො කළේය. ඔහුගේ එක ම පැතුම වූයේ තම දියණිය වෙනුවෙන් යුතුකම් කොටස ඉටු කිරීම පමණි.)

**2001 මැයි 11**

"මා නුඹට තෝරා දුන් ඇන්ටන් ප්‍රසන්න සමග ඔබ විවාහ විය යුතුයි. ඔබ මට අකීකරු වුණොත් ඔබ මහා විනාශයකට මුහුණ දෙනු ඇත." (එවිට සුජීවා මෙසේ පැවසුවාය. ඒ අයියා ගැන අනුකම්පාවක් මා තුළ තිබෙනවා.) "අනුකම්පාව නො වෙයි, අවශ්‍ය වන්නේ. ඔබ ඔහුට ප්‍රේම කළ යුතුයි. ප්‍රේමය තුළ දෙවියෝ වැඩසිටිති. දියණිය, ඔබ මට පොරොන්දු විය යුතුයි, ඔබ ජීවත් වන තුරාවට ඔහුට ප්‍රේම කරන බවට. ඔහුගේ දියණියට ද ඔබගේ දියණියකට මෙන් ප්‍රේම කරන බවට මට පොරොන්දු විය යුතුයි. දියණිය, ඔබ ඇන්ටන් ප්‍රසන්න 'බෙතෙල්' නිවසට කැඳවා ඔහුට පොරොන්දු විය යුතුයි, ඔබ ඔහුට ප්‍රේම කරන බවට. ඒ මොහොතේ මම බලා සිටිමි, නුඹ ඔහුට එය පවසන ආකාරය." (සුජීවා මෙසේ පැවසුවාය. ජේසු, මම කෙල්ලක්, මට පුළුවන් ද මේව කරන්න?) එවිට ජේසු සමිඳාණෝ සිය වණ කැළැල් පෙන්වමින් සුජීවාට මෙ ලෙස පැවසූහ. "ඇයි දියණිය, මගේ තුවාල පාරන්නේ?"

(එදින සිකුරාදාවක් නිසා මම යැදුම සඳහා සවස එහි ගියෙමි. එවිට ඇය වැළපෙමින් සිටියාය. එදින යැදුමේ දී ජේසු සමිඳුන් ම ඇයගේ මුවින් මේ සියල්ල පවසන බව ඇයට දන්වා තිබිණ. යැදුම් මෙහෙය තුළ එය සිදු විය. ජේසු සමිඳාණෝ ඇයගේ මුවින් ගෞරවාන්විත නිහඬතාවයකින් ඒ සියල්ල පැවසූහ. මම සවන් දී සිටියෙමි. "ඇය මට පැවසුවා, ඇයි ජේසු ඒ අයිය ව අසාර්ථක විවාහයකට යොමු කරලා දරුවෙක් ද ලබා දිලා ඒ අයියගේ ජීවිතය ලොකු අවුලක් කරල විවාහ වූ, දරුවෙක් ද ඉන්න ඒ අයිය සමග විවාහ වෙන්න කියලා මගේ ජීවිතයත් ලොකු අවුලක් නොකර ජේසු ඔයාට තිබුණා නේද, කලින් අපි දෙන්න ව එකතු කරන්න. එවිට මාගේ ශුද්ධ භාවයෙන් මම ඇය අබියස පෙනී සිටියෙමි. එයින් ඇති වූ කම්පනය නිසා ඇය තවමත් වැළපෙන්නීය. මම ඇයට පැවසීමි, මාගේ දාසියගෙන් මා ලොකු පරිත්‍යාගයක් බලාපොරොත්තු වන බව." සුජීවා පසු ව අපට මෙසේ පැවසුවාය. "ඒ ජේසු ව දැකල ජීවත් වෙලා වැඩක් නැහැ. මට බය යි, ආයේ ඒ ජේසු ව පෙනෙයි කියලා. ඇඟ පිත්තල පාට යි. ගිනි ඇවිලෙනවා. ඇස් ගිනි බෝල වාගේ, කටින් ගිනි සිළුවක් නික්මෙනවා." ජේසු සමිඳාණන් ශුද්ධ භාවයෙන් ඇයට පළමු වරට දර්ශනය වූයේ එදින යි.)

**2001 මැයි 14**

(මැයි 13 වන දින සුජීවා, ඇන්ටන් ප්‍රසන්න ව එහි කැඳවා තමා ඔහුට ජීවිතාන්තය දක්වා ප්‍රේම කරන බව පැවසුවාය.) "දියණිය, මා පවසන දේට සවන් දෙන්න. මා නුඹට තෝරා දුන් නුඹගේ සහකරු ඔහු යි. ඔහු මාගේ ප්‍රේමාන්විත පුත්‍රයෙකි. එය ධර්මිෂ්ඨ පවුලකි. ඒ පවුලේ සියල්ලෝ මට ඇහුම්කන් දෙන මට ඉඩ දෙන ජීවිත වෙති. ඒ මව මට ප්‍රසන්න දියණියකි. ඔහුගේ සොයුරා මා තෝරා ගත් සංඝයේ මාගේ ශ්‍රාවකයෙකි. නුඹට ඇති ආදරය නිසා එවැනි පවුලකින් ඉවසීම තුළ ගමන් කරන ඇන්ටන් ප්‍රසන්න මම නුඹට තිළිණ කළෙමි. නුඹ මට ක්‍රියා කරන්නට ඉඩ දුන් ජීවිතයක් බැවින් ඉදිරියේ දී ද නුඹට මාගේ නාමය තුළ ගමන් කරන්නට ඇවැසි පුද්ගලයා ඔහු යි. දියණිය, මා සමග ගමන් කරන, මට ප්‍රසන්න අයකු ඔබගේ පුරුෂයා වශයෙන් තෝරා දෙන ලෙස ඔබ මට මොරගැසුවා නො වේද? එනිසා මාගේ ප්‍රේමාන්විත පුත්‍ර ඇන්ටන් ප්‍රසන්න මම නුඹට තෝරා දුනිමි."

**2001 මැයි 16**

(අපි යැදුම සඳහා එක් ව සිටියෙමු. එහි දී සුජීවා වැළපෙන හඬ ඇසිණි.) “දියණිය, මාගේ ශුද්ධ භාවයෙන් දශමයක් පමණ යි, ඔබ දැන් අත්දකින්නේ.” (සුජීවා මෙසේ වැළපුනාය. “ඒ දශමයෙනුත් මාව පිච්චෙනවා ජේසු. මනුෂ්‍යයා ගැන ඔයාගේ හදවතේ ඇති පිපාසය දැන් මට ටිකක් වැටහෙනවා, ජේසු.” ඉන් පසු ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) “දශමයක් පමණ වන මාගේ ශුද්ධ භාවයේ ගින්න මේ දාසියට අපහසු නම් මාගේ ශ්‍රාවකයින්ට මුහුණ දෙන්නට සිදු වන මාගේ ශුද්ධ භාවයේ ගින්න කොපමණ අපහසු වනු ඇද්ද? ධර්මිෂ්ඨ යුගය ආරම්භ කරන්නට සියල්ල සූදානම් කරමින් මම බලා සිටිමි. සුළු පිරිසක් තෝරා ගෙන මම මාගේ ශුද්ධ භාවයේ ගින්න තුළ ඔවුන් සූදානම් කරමින් සිටිමි. මෙම පවිත්‍ර කරණයේ දී අධර්මයට යට වූ සුළු පිරිසක් ද නැවත ධර්මය හා එක් වනු ඇත.”

**2001 මැයි 21**

(සුජීවා වැළපෙමින් මෙසේ පවසනු ඇසිණි.) “ජේසු ඔබගේ ශුද්ධ භාවයෙන් ඔබ මා වෙතට එද්දි මට ඔරොත්තු දෙන්නේ නැහැ. මට සමාවන්න. ජේසු මම එහෙම හිතුවා තමයි. අනේ ! ඒ වාගේ දඬුවමක් නම් මට දෙන්න එපා.” (පසු ගිය දින කීපය තුළ සුජීවාට සුරේන්ද්‍රගේ බිරිඳ සිහියට නැගිණි. ඇය ගැන මහත් කරුණාවක්, අනුකම්පාවක් ඇය තුළ ඇති විය. ඇයට සිදු වූ දේ තමාට සිදු වුවා නම් යනුවෙන් සිතිණි. ඒ තුළ ඇය මහත් වේදනාවට පත් වූවාය. ඇය තමාට පහර දෙනු සුජීවා සිහිනෙන් දුටුවාය. ඇයට මහත් බියක් දැනිණ. ඇය තුළ ජනිත වූ කණස්සල්ල, බිය නපුරාට ඇය තුළ ක්‍රියා කරන්නට අවස්ථාවක් විය. සිය දිවි හානි කරගත්තා නම් මීට වඩා හොඳ යැයි සුජීවාට සිතිණි. ජේසු සමිඳාණෝ ඇයට මෙසේ පැවසූහ.) “දියණිය, නුඹ මාගේ වචනයට අකීකරු වුණොත් එදා මෙන් රාත්‍රි කාලයේ පමණක් නො ව දිවා රාත්‍රි දෙකේ ම ඔබ සදාකාලික අන්ධයකු වන්නට මම සලස්වමි. නුඹගේ කුසින් ධර්මිෂ්ඨ දරුවන් බිහි කිරීමේ මාගේ සැලැස්මට ඉඩ දෙන්න. ඒ සඳහා මා විසින් තෝරා ගත් පුත්‍රයා මම ඔබට දුන්නෙමි. ඔබ කුසින් ධර්මිෂ්ඨ දරුවන් බිහි කර මාගේ ධර්ම මාවතේ ඔවුන් ගෙන යන්න. ඔබ දෙ දෙනා විසින් මට දිය යුතු ත්‍යාගය එය යි. නුඹට මරියාවන් මෙන් වන්නට නො හැකිය. ඇගෙන් දශමයක් වන්නට උත්සාහ කරන්න. සියලු වේදනාවන් දරා ගෙන සිටින්න. මට අකීකරු නො වන්න. මාගේ දඬුවම මතකයට ගන්න. මෙය ඔබට අවසන් අවවාදය යි.”

(එදින ම දේව මෑණියෝ ඇයට මෙ ලෙස පැවසූහ.) “ආදර දියණිය, දෙව් පියාණන් ඔබ ව තෝරා ගෙන තිබෙන කාර්යයට අවනත වන්න. ඔබ ඔහුට ප්‍රේම කරන බව ජේසු ඉදිරියේ පොරොන්දු දුන්නත් නපුරා විසින් නුඹ ව පොළඹවන ආකාරය මම දකිමි. දියණිය, නපුරාට හසු නො වන්න. දේව කැමැත්තට හිස නමන්න. නුඹ සිටින අත් දැකිම මනුෂ්‍ය දුවකට දරා ගන්න අපහසු බව මම දනිමි. එහෙත් නුඹලා දෙ දෙනාට අත දෙන්නට, නුඹලා වෙනුවෙන් යැදුමෙන් මොරගසන්නට සංඝයක් ඇත. දියණිය, දෙවිඳුන් ඔබට දී තිබෙන පොරොන්දු තුළ ගමන් කරන්න. නුඹගේ දෙව් පියාණෝ නුඹ ගැන ප්‍රසන්න වෙති. මෙම යුගයේ දෙව් පියාණන්ට ඉඩ දෙන මෙ වැනි දියණියක් සොයා ගැනීමට අසීරු බව මම දනිමි. ලොවට අසම්මත වූ ශුද්ධ වූ තීරණවලට එකඟ වන්නට ඔබට ඉදිරියේ දී ද සිදු වනු ඇත. දියණිය, නුඹගේ ජීවිතය ලස්සණ වන්නේ ජේසුගේ පොරොන්දු තුළ ජේසුට කීකරු වන තරමට යි.”

**2001 මැයි 26**

“දියණිය, සංඝයේ එඬේරා, පියා සහ මව සමග ඔබගේ නිවහනට ගොස් ඔබේ පියා, මව, සහෝදරයා සහ ඥාතීන් අමතා මෙසේ කියන්න. ජේසු යි මගේ අයිතිකරු. තාත්ත යි අම්ම යි මගේ භාරකරුවන් පමණ යි. ජේසු මට කියන දෙයට මම කීකරු වූයෙමි. මාගේ සියලු බලාපොරොත්තු අත්හැර ජේසුගේ බලාපොරොත්තුවට මම ඉඩ දුන්නෙමි. දියණිය, ඉන් පසු ඇන්ටන් ප්‍රසන්නගේ නිවසට ගොස් ඔහුගේ මව සොයුරු සොයුරියන් අමතා පවසන්න, ඔබ ඇන්ටන් ප්‍රසන්න හා විවාහ වන බව: ජීවිතාන්තය දක්වා ඔහුට ප්‍රේම කරන බව. දියණිය, බිය නො වන්න. මම නුඹ මෙහෙයවමින් නුඹ තුළින් ඔවුන්ට කිව යුතු දේ ප්‍රකාශ කරමි. ඔබ දෙ දෙනාගේ විවාහය දැහැමි යුගයේ උදාවේ කාහල නාදය වන්නේය. මා ඔබ උපයෝගි කර ගනිමින් කළ සියල්ල දන්නා පූජක පුත්‍රයෙක් එම විවාහ දිව්‍ය පූජාවට කැඳවන්න. මා නුඹලා මගින් කළ කී සියල්ල ලෝකයට ප්‍රකාශ වීම හා මෙම විවාහය නිසා එඬේරා ඇතුළු සංඝයට බිහිසුණු අත්දැකීමකට මුහුණ දීමට සිදු වනු ඇත. මිනිස් අයිතිවාසිකම් හිස් කරමින් දේව අයිතිවාසිකම්වලට හිස නමමින් එඩිතරව ඉදිරියට යන්නැ යි ඔවුන්ට පවසන්න.”

**2001 ජුනි 02**

"දියණිය, මා ඔබට පැවරූ කාර්යය ඉටු කිරීම ගැන මම ප්‍රීති වෙමි. ඔබගේ පියා ද මව ද ඇන්ටන් ප්‍රසන්නගේ පවුලේ සියල්ලන් ද මාගේ සැලැස්ම භාර ගැනීම ගැන මම උදම් අනමි. නුඹලාට මා තෝරා දුන් එඩේරා මාගේ අතේ ඇඹුන චරිතයකි. මගේ අතින් ම ඇඹුන කෙනකු යට කරන්නට කිසිවකුට නො හැකිය." (ඉන් පසු ජේසු සමිඳාණෝ සිය සුරත දිගු කොට මහා ගිනි ජාලාවක් සුජීවා අබියස මවා පෙන්වූහ. අනෙක් පසින් තවත් ගිනි ජාලාවක් ඇය දුටුවාය.) "මෙය මාගේ ශුද්ධ භාවයේ ගින්න හා නපුරාගේ පාපධාරී ගින්න යි. මාගේ ශුද්ධ වූ ගින්නෙන් පවිත්‍ර වුවහොත් සදාතනික ප්‍රීතිය ඔබ අත්දකිනු ඇත. පාපධාරී ගින්නට ඇතුළු වන්නෝ විනාශ වෙති."

**2001 ජුනි 10**

"දියණිය, මම අධික ව පිපාස වෙමි. මා නුඹෙන් ඉල්ලන දේ ඉටු කරපන්න. නුඹලා දෙදෙනා ද මාගේ සංඝය ද මහත් නින්දා අවමාන්නයන්ට මුහුණ දිය යුතුයි. සංඝයේ සුළු පිරිසකි, ගමන කෙළවර දක්වා යන්නේ. ඒ සුළු පිරිස සමග නුඹලා දෙදෙනා ද ඉදිරියට ම යන්න."

**2001 ජුනි 12**

"සම්මත ලෝකයේ අසම්මත වූ ගමනාන්තය, ශුද්ධ වූ ගමනාන්තය. මේ තමා පෙරට ම එන ඉහළින් වඩින සංඝය. මහා පිපිරීමක් සමග මෙය ඉස්මතු වනු ඇත. නුඹලාට මා තෝරා දී තිබෙන එඩේරා මාගේ දේව ප්‍රඥාවෙන් පූර්ණ කර මාගේ නිවැරදි දහම මම ඔහු මගින් ලෝකයට දෙන්නෙමි.---- දියණිය, කුසට අහරක් නැති ව වේදනා විඳින ජීවිත උදෙසා නැවත දින හතක නිරාහාරයක් මම ඔබගෙන් ඉල්ලමි. ---- පුරාතන සර්පයා නෙරපා දමන්න. ඒ සඳහා මා තුළ විශ්වාසයෙන් රැඳෙන්න. ---- දියණිය, මම නැවත නුඹට කියමි, මා නුඹට දී තිබෙන පුත්‍රයාත් සමග ගිනි මැදින් හෝ අසම්මත ගමනාන්තය කරා පියමං කරන්න."

## 27

## "මෙය යි, අසම්මත වූ සංඝය, ඉහළින් වඩින සංඝය, ශුද්ධ වූ ගමනාන්තය"

**2001 ජුනි 19**

"පිබිදෙන්න, අවදි වන්න, ඉහළින් වඩින සංඝය ආරම්භ වී ඇත. අරඹව් ගමන සුදතුම්. භාග්‍යවන්තයිනි, මා පසු පස එව්; පැසසුම් කරව්. ශ්‍රාවකයිනි, මා පසු පස එව්; තුති ගොස නගව්. මෙය යි, පිබිද ඇත්තා වූ මහා සංඝය. මෙය යි, අසම්මත වූ සංඝය, ශුද්ධ වූ ගමනාන්තය. ඉදිරියට එව්, ගැටුම් මධ්‍යයේ. නුඹලා දැන් නිහඬ ව ගමන් කරන්නේ බිහිසුණු ගමනාන්තය දෙසට යි. එඩිතර ලීලාවෙන් තබව්, පියවර. දාස දාසියනි, එඩිතර වව්, පිබිදෙව්, ඉහළින් වඩින සංඝය පැමිණ ඇත. ශ්‍රාවකයිනි, පිබිදෙව්, මා හා ගමන් කරව්. පිබිදෙව් දරුවෙනි, විඩාව පසෙක තබා. නුඹලා දැන් අවදි ව සිටිය යුතු කාලය යි. මා හා ගමන් කරව්, එඩිතර ලීලාවෙන්. දරුවෙනි, දැන් බිහිසුණු ගමනාන්තය කරා යන ගමන ඇරඹී ඇත. එහි ආරම්භයත් අවසානයත් මම වන්නෙමි. ජල මැද, ගිනි මැද නුඹලා දැන් පියවර තබමින් යන්නහුය. මැලි නො වව්, එඩිතර වව්, සියල්ල සූදානම් ව ඇත."

"දියණිය සුජීවා, මා නුඹ ගෙන යන මේ ගමන මහත් තේරුමක් තිබෙන ගමනකි, ශුද්ධ වූ ගමනකි. මම නුඹ ව සුරක්ෂිත ව මෙතෙක් ගෙනාවෙමි. ඒ නිසා ඉදිරියට තබන පියවර විශ්වාසයෙන් තබන්න. මම සියල්ල මාගේ හස්තයේ තබාගෙන සිටිමි. එනිසා ඔබ දුක් නො වන්න. ඔබට ඇත්තේ මට කීකරු වීම පමණ යි. දියණිය, එඩේරාට පවසන්න, මාගේ වචනය අන්තර් ජාලයෙන් ලොවට හෙළි විය යුතු මොහොත අගෝස්තු මාසය බව. මාගේ දිනය වන සිකුරාදා (ජුනි 22) ඔබ දින හතක නිරාහාරයට ඇතුළු විය යුතුයි."

**2001 ජුනි 22 සිකුරාදා**

"මම මෙ දින දිව්‍ය සත්ප්‍රසාදය තුළින් නුඹ තුළට ආවෙමි. මාංශය ද ශ්‍රී රුධිරය ද වෙමින් මෙ තැන් සිට දින හත ම නුඹ එයින් පෝෂණය වන්නෙහිය. ශුද්ධාත්ම පරිණත භාවයෙන් මම නුඹ ආලේප කරමි. දරුවෙනි, අද දිනය මාගේ දිනය යි. ලෝ පාප මා හෘදයේ දරා ගනිමින් විඳවන්නෙමි; වේදනාවෙන් බලා සිටිමි. මාගේ පැමිණීමේ කාලය ළං වෙමින් ඇත. සියල්ල කඩා වැටීමේ කාලය ළං වෙමින් ඇත. මා හා ගමන් කරව්. යහපත් පල දැරූ සියල්ලන් මම සූදානම් කරමින් සිටිමි, මාගේ රාජ්‍යය ගොඩ නගන්නට. ඉහළින් වඩින සංඝය පිහිටා ඇත; රහසිගත ව එය පිහිටා ඇත. ලොව වැජඹෙන සියල්ල කඩා වැටෙන මොහොත ළංව ඇත. සියලු රාජ්‍යයන් බිඳ වැටෙමින් ඇත. ශ්‍රාවකයිනි, පිබිදෙව්. නුඹලා දැන් පියවර තබා ඇත්තේ ගිනි මැදින් යාමට ය.

ඒ කාලයේ දී නුඹලා දැවෙනු ඇත. එහෙත් ඒ තුළ ප්‍රීතියක් ඇත. නුඹලා මිනිසුන් ලෙසින් තැති ගන්න තැන් ඇත. එඩිතර වව්, බිය සැක දුරලව්, මෙය ශුද්ධ වු ගමන යි. මා හා ගමන් අරඹව්. මාගේ දරුවෙනි, සියල්ල බිඳ වැටෙන මොහොතේ ඉතා සුළු පිරිසකි, නව මැවුම තුළ ඉතිරි වන්නේ. දැහැමි යුගයක් එතැන් පටන් ඇරඹෙන්නේය. සිත් තුළ ශාන්තිය ඇතිකර ගන්න.”

“මාගේ දරුවෙනි, අධර්මයාණෝ, අධර්මය රජ කරන්නට සැරසෙමින් සිටින ඔහු දැන් පැමිණෙමින් සිටිති. ඒ සියල්ල වළක්වන්නට සිටින මාගේ දාසයා ව හෙවත් නුඹලාගේ සුදු පියා ව ඉවත් කරන තැනට පැමිණෙමින් ඇත. එහෙත් අධර්මය පරාජය කරමින් ධර්මය රජයන මොහොත ළංව ඇත. අධර්මාධිපතියා මාගේ නාමය දරමින් ඉදිරියට එන්නේය. ලෝ වැසි ජනතාවගෙන් විශාල කොටසක් ඔහුට රැවටෙති, මුලා වෙති. මේ සියල්ල දැන ගෙන එයින් ගැළවෙන්නෝ භාග්‍යවන්තයෝ ය. එම දාමරිකයා ඉදිරියට එමින් ඇත; බිහිසුණු තත්ත්වය ළංව ඇත. එයට මුහුණ දිමට යි, මා හා ගමන් කරන ඉහළින් වඩින සංඝය පිහිටුවන ලද්දේ. මාගේ මුඛයෙන් නික්මෙන හුස්ම තුළින් අධර්මය බිඳ වැටෙන්නේය. දරුවෙනි, නුඹලා කිසිවකු නුඹලාගේ මතිමතාන්තර තුළ, බලාපොරොත්තු තුළ ගමන් නො කරන්න. සියල්ල වෙනස් කරන දෙව් උතුමාණෝ මම වෙමි. නුඹලාගේ ජිවිතයේ මට ඉඩ දී ඇත්නම් සියල්ල වෙනස් කරන්නේ මා ය. මැයගේ ජිවිතයේ මට ඉඩ දිම තුළින් සියල්ල මට අවශ්‍ය ලෙස ඉටු කර ගත්තෙමි. ශුද්ධ වු ගමන ආරම්භ වී ඇත. දැන් පළමු පියවර තබා ඇත, ගිනි මැදින් යන්නට. නුඹලාගේ යටි පතුලේ සිට හිස් මුදුන දක්වා මුළු ඇතුලාන්තය ම දැවෙනු ඇත, බියෙන් තැති ගනු ඇත. එහෙත් එහි ගැඹුරක් ඇත. ඒ ගැඹුර නුඹලාට නො පෙනේ. තව ළංව යා යුතුයි, ඒ ගැඹුර දකින්නට.”

**2001 ජුනි 23**

“දාමරිකයා, ජේසුගේ නාමය දරමින් තැනින් තැන සැරිසරමින් ඉදිරියට එමින් ජනතාව මුලා කරමින් සිටී. ලහිලහියේ සියල්ල සිදු වෙමින් පවතී. එඬේරාට පවසන්න, **2 තෙසලෝනික 2 පරිච්ඡේදය** සංඝය හා එක්ව මෙනෙහි කරන ලෙස. මේ යුගය පිළිබඳ මාගේ අනාවැකි එහි සටහන් ව ඇත.” **(ශුද්ධ වු බයිබලයේ 2 තෙසලෝනික 2: 1, 3, 4, 6-12** වෙත දැන් ඔබගේ ද අවධානය යොමු කරන්නට මම අදහස් කරමි.)

**“සහෝදරවරුනි, අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආගමනය ගැන ද උන් වහන්සේ හමුවෙහි අප එක්රැස්වීම ගැන ද දැන් අප කතා කළ යුතුය. අවසාන මහා කැරැල්ල ඇතිවන තුරු ද නිරයට නියම වු මිනිස් වෙස් ගත් දාමරිකයා ප්‍රකාශ වන තුරු ද ඒ දවස නො පැමිණේ. ඔහු මිනිසුන් දෙවියන් කොට සලකන සියල්ලන්ට ද මිනිසුන් නමස්කාර කරන සියල්ලන්ට ද විරුද්ධ ව සිට ඒ හැමට වඩා තමා උසස් කර ගනිමින් දේව මාලිගාවෙහි වැඩහිඳ තමා දෙවියන් යැයි ප්‍රකාශ කරන්නේය. ඒ දාමරිකයා නියම කාලයේ දී ප්‍රකාශ වන පිණිස දැනට ඔහු වළක්වා ලන්නේ කිමෙක් දැයි ඔබ දන්නහුය. දාමරිකයා දැනුදු රහසිගත ව ක්‍රියා කරයි. එහෙත් වළක්වා ලන තැනැත්තා ඉවත් කරනු ලැබුවායින් පසු රහසිගත ව කිසිවක් නො පවතී. එවිට දාමරිකයා ප්‍රකාශයට පැමිණේ. ජේසුස් ස්වාමින් වහන්සේ ස්වකීය මුඛයේ හුස්මෙන් ඔහු නසා උන්වහන්සේගේ ආගමනයේ තේජශ්‍රීයෙන් ඔහු වනසා ලන සේක. දාමරිකයා සාතන්ගේ බලයෙන් යුක්ත ව පැමිණ සියලු ආකාර ප්‍රාතිහාර්ය ද අරුම පුදුම දේ ද ප්‍රබල ක්‍රියා ද කරන්නේය. විනාශය ට නියම වූ අය ගැළවීම අත්කර දෙන සත්‍යය ප්‍රේමයෙන් නොපිළිගත් බැවින් දුෂ්ඨ ලෙස රවටනු ලබන්නෝය. ඔවුන් අසත්‍ය දේ විශ්වාස කරන පිණිස ඔවුන් තුළ ක්‍රියා කිරීමට දෙවියන් වහන්සේ මුසාවේ බලය එවන සේක.”**

(මේ අනුව ජේසු සමිඳුන්ගේ මහිමාන්විත දෙ වන ආගමනයට පෙර කරුණු කීපයක් ඉටු විය යුතුය.

1. අධර්ම බලවේගය සිහසුනට පැමිණීම වලක්වා ලන තැනැත්තා ඉවත් කරනු ලැබිය යුතුය.
2. සාතන්ගේ බලයෙන් යුක්ත ව පැමිණෙන නිරයට නියම වූ මිනිස් වෙස් ගත් දාමරිකයා ප්‍රකාශ විය යුතුය.
3. ඔහු මිනිසුන් නමස්කාර කරන සියල්ලන්ට විරුද්ධ ව සිට ඒ හැමට වඩා තමා උසස් කර ගනිමින් දේව මාලිගාවේ වැඩහිඳ තමා දෙවියන් යැයි ප්‍රකාශ කළ යුතුය.
4. අවසාන මහා කැරැල්ල සිදු විය යුතුය.

ඒ සියල්ල අග ජේසු සමිඳුන්ගේ ආගමනයේ තේජශ්‍රීයෙන් අධර්මාධිපතියා වනසා දමා දැහැමි යුගයේ උදාව සිදු වේ.)

“දියණිය, නුඹ පිළිබඳ මාගේ අසම්මත ක්‍රියාවලිය මුල් කර ගනිමින් සංඝය අරඹා ඇති ගමන ගැඹුරු ම ගැඹුරු ශුද්ධ වු ගමනට පියවර තබා ඇත. එය ශුද්ධ වු ගින්න සමග ගමන්

කරන ගමනකි. ඔබ වැනි දියණියක් සියල්ල අත්හැර, සියලු ප්‍රාර්ථනා අත්හැර මාගේ වචනයට කීකරු වීම ගැන මම අතිශයින් ප්‍රසන්න වෙමි. ඇන්ටන් ප්‍රසන්න මාගේ වචනය තුළ ගමන් කරන ධර්මිෂ්ඨ ජීවිතයකි. එදා මා නින්දාව අපහාසය තුළ ගමන් කළාක් මෙන් මාගේ දරුවෙනි, සංඝය ඇතුළු නුඹලා දෙ දෙනා ද නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගනිමින් ඒ බිහිසුණු මොහොතට පියවර තබාපන්න. නුඹලා අතර සිදු වන මෙම අනාවරණයන්ගේ ආරම්භයේ සිට ම මේ ගමනේ තිබෙන ගැඹුරු භාවය, කටුක භාවය, ගල් මුල් අතර කටු මාවත්වල ගමන් කරන්නට සිදු වන බව මා නුඹලාට ප්‍රකාශ කළේ එබැවිනි. දරුවෙනි, දැන් පිබිදිය යුතු කාලය යි. පිබිදෙව්, තුති ගොස නගව්, මා හා ගමන් කරව්, සියල්ල අත්හැර මා හා ගමන් කරන්නට මා ඔබට අඬගසන විට ඊට සූදානම් වව්. ඉහළින් වඩින සංඝය මෙය යි, උත්තරීතර සංඝය මෙය යි, මා හා ගමන් කරන විට සැප සම්පත් නොමැත. කටු මාවත් ඇත, ගල් මුල් ඇත. අවසානයේ මල්දම් ලැබෙන්නේය. ඒ ස්වර්ගීය ප්‍රීතිය මොහොතේ දී ය."

"මම දැඩි ව පිපාසා වෙමි, මාගේ දරුවෙනි. කිසිවෙක් ඇද්ද, මට සැනසීම දෙන්නට. ශ්‍රාවකයිනි, දැන් සියල්ලන් එක්සිත් වීමේ කාලය යි, සියලු තෘෂ්ණාවන්ගෙන් මිදියල්ලා. පවුල් පිටින් මා හා ගමන් කරපල්ලා. ලෞකික සැප සම්පත් අත්හැරපල්ලා. ඇඳිවත සමග මා හා ගමන් කරපල්ලා. ඉදිරියේ දී සියල්ල අත්හරින මොහොතක් එනු ඇත. මාගේ දාසයා වන නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා නෙරපන්නට වෙර දරන දාමරිකයාගේ සියල්ල සූදානමින් ඇත. දරුවෙනි, සියල්ල වළකා ලන්නට සිටි දාසයා ඔහු යි. ඔහු ඉවත් කළ පසු අධර්මාධිපති මාගේ නාමය දරමින් ඉදිරියට එයි. මාගේ ශ්‍රාවක දරුවෙනි, මා නුඹලාට දී තිබෙන එඬේරා තුළින් අවශ්‍ය ඉගැන්වීම් මම නුඹලාට දුන්නෙමි. මේ කාලය තුළ නුඹලා වියවුල් වෙමින් ඒ කාලය තුළ දී වියවුල් නො වී සිටින්න. සියල්ල අත්හැර මා සමග එන්නට අනාදියේ පටන් මා විසින් තෝරා ගත් සංඝයකි, නුඹලා. කිසිවෙක් ගැටළු තුළ ප්‍රශ්න තුළ නොරැඳී ගමන් කරන්න. දේව රාජ්‍යයේ බලාපොරොත්තු තුළ පොරොන්දු තුළ ගමන් කරන්න. මාගේ දරුවෙනි, නුඹලාට දී තිබෙන එඬේරා විශ්වයීය සම්පතකි, විශ්වයීය ධර්ම ඥානයකි. විශ්වයීය දැක්මක් ඔහු සතු ව ඇත. දැනුම තුළ නො වෙයි, ධර්ම ඥානය තුළ ප්‍රඥාව තුළ ඔහු රඳවා ඇත. දැනුම් සම්භාරයක් අවශ්‍ය නැත, මා හා ගමන් කරන්නට."

### 2001 ජුනි 25

"මාගේ දාසයා වන නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා ඉවත් කරන කාලය ළං වෙමින් ඇත. ඒ එලෙස සිදු වන්නට නියමිත ව තිබෙන දෙයකි. එවිට දාමරිකයා මාගේ නාමය දරමින් ලෝ වැසි ජනතාව මුලා කරන මොහොත පැමිණෙන්නේය. දුක් විඳින ජනතාව ඔහු පෙන්වන සැප සම්පත තෝරා ගන්නට පෙළඹෙනු ඇත, එය විනාශකාරී ය. ස්වල්ප දෙනෙකි, මා හා රැඳී සිටින්නේ. ---- මා දියණිය සුජීවා, වැළපෙමින් හෝ මට ඉඩ දුන් ජීවිතයකි: තම මව්පියන්ට කීකරු වූ ජීවිතයකි. මැය ගැන මා අතිශයින් ප්‍රසන්න වන්නේ මැයගේ ජීවිතයේ වංචාව බොරුව නොමැති බැවිනි. මැය විවෘත යි, විටෙක කුඩා දරුවකු හා සමාන යි. ඔබ හැමත් එලෙස වෙනවා නම් මට සැනසීමකි. එය යි, මා ඔබගෙන් බලාපොරොත්තු වන සැනසීම. වෛරයෙන්, ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන්, තණ්හාවෙන් මිදී පුංචි දරුවකු මෙන් හැසිරෙන්න. එවිට සියල්ල යහපතට හැරෙනු ඇත."

### 2001 ජුනි 26

"දියණිය, නුඹ හා ඇන්ටන් ප්‍රසන්න මා විසින් එක් කිරීමට පෙර පුංචි ගෘහයක් තනා ඒ ගෘහයේ ඉදිරිපස මෙම වචන නොමැකෙන අකුරින් සඳහන් කරන්න. එය මෙසේ ය. **'දෙවි වූ ස්වාමින් වහන්සේ වන ගැළවුම්කාර වූ දිව්‍ය එඬේරාණන් මේ ගෘහයේ හිස ය, මුලසුන ය.'** මාගේ දරුවෙනි, එය මට බාර දෙන්නා වූ මා වැඩසිටින්නා වූ ගෘහයක් බව යි, ඒ වාක්‍යයෙන් කියවෙන්නේ. ---- සැබවක් සැබවක් මම නුඹලාට කියමි. මේ තමා ඉහළින් වඩින සංඝය. ලොව සියලු රාජ්‍යයන් කඩා වැටෙන මොහොත ළං ව ඇත. මාගේ දාසයා ඉවත් කරන මොහොත ළං වෙමින් ඇත. එතෙක් මම දැහැමි ජීවිත අඹන්නෙමි. මා පිපාසයෙන් මොරදෙන්නේ මාගේ ජනතාව වෙනුවෙනි. මාගේ ජනතාව වෙත මාගේ වචනය ප්‍රකාශයට පත් වන විට බොහෝ ජීවිත තුළ මා සෙවීමේ පිපාසයක් ඇති වන්නේය. ඔවුන් තුළින් දැහැමි ජීවිත බිහි වනු ඇත. බොහෝ දුර ගමනක් යා යුතු ව ඇත. එතෙක් මම නුඹලාට දීර්ඝායුෂ දෙන්නෙමි. මාගේ කාර්යය ආරම්භය පමණි, මේ. තව බොහෝ දුර යා යුතුයි. මාගේ දරුවෙනි, මේ කාලය තුළ පාපයෙන් ගැළ වී සිටින්නට සිතට ගන්න."

"මුළු විශ්වය දෙස මේ මොහොතේ බලා සිටින ශුද්ධාත්මයාණෝ මම වෙමි. මුළු ලෝකය ම අවුල් ජාලාවකි. අද ලෝකය ම පාප අඳුරකි. මට සැනසීම දෙන්නට සිටින්නේ සුළු පිරිසකි. මම පිපාසා වෙමි, මාගේ ජනතාව කෙරෙහි. ---- මා පුත්‍ර ඇන්තනි ව මම නුඹලාට එඬේරකු ලෙස

දුන්නෙමි. ඔහු යා යුතු මාවත බිහිසුණු වුවත් ඔහු එඩිතර ලීලාවෙන් ගමන් කරයි. ඔහු සියල්ල සිත් හී ධාරණය කර ගනිමින් මෙනෙහි කරමින් මා පසු පස පියමං කරන පුත්‍රයෙකි. එනිස යි, මා ඔහු තුළ මාගේ ධර්ම ඥානය රඳවා තිබෙන්නේ. ධර්ම ඥානය ඔහු සතු වුවත් ඔහු උඩගු නො වේ; නිරහංකාර ව ගමන් කරයි. ඇහුම්කන් දෙන ප්‍රඥාවක් ඔහු සතු ව ඇත. ඔහු මා දකින්නට අවශ්‍ය නැත. ඔහුගේ මුවින් නික්මෙන්නා වූ වදන් මාගේ වදන් ය. අති බිහිසුණු මාවතකට ඔහු දැන් පියවර තබමින් ඇත.”

**2001 ජුනි 28**

“මාගේ දරුවෙනි, ඉදිරි ජීවිතය ගෙවිය යුත්තේ නිහතමානි ව යහපත් ලෙසිනි. මක්නිසාද, අන්ධකාරයේ අධිපතියා රජයන මොහොත, බිහිසුණු මොහොත ළං ව ඇත. එහෙත් අවසාන මොහොතේ අධර්මය පරාජය කරමින් මාගේ නාමය තුළ මාගේ ජයග්‍රහණය මම තහවුරු කරමි. මුළු විශ්වය කම්පා වන්නේය. සුළු පිරිසකි, අවසානයේ ඉතිරි වන්නේ. ඔවුහු දැහැමි යුගයට සුදුසු වෙති. ධර්මිෂ්ඨ දහස් වසර ඇරඹෙන්නේය. අද ලෝකය සීඝ්‍රයෙන් විනාශය කරා ඇදෙමින් ඇත. ඔබගේ දේශයේ බොහෝ දෙනකු සාතන්ගේ රාජ්‍යයේ රජකම් කරන ආකාරය මම දකිමි. මාගේ දරුවෙනි, ලෞකික සැප සම්පත්වලින් මිදී දුක වේදනාව නින්දාව තුළ ගමන් කරන්න. එය යි, මා හා ගමන් කරන අයට නියමිත මාවත. මම එඩේරකු දුනිමි, නුඹලාට. ඔහු නුඹලා මෙන් මනුෂ්‍යයෙක් වන්නට පුළුවන. එහෙත් නුඹලා සිතන විදිහේ කෙනකු නො වේ, ඔහු. ඔහුට මම විචක්ෂණ ධර්ම ඥානය දී ඇත. තික්ෂණ ප්‍රඥාව දී ඇත. එය කිසිසේත් ඔහුගෙන් පහ ව නො යන්නේය. නුඹලාගේ දැක්ම තුළ නො වෙයි, ඔහු සිටින්නේ. ඔහු පුංචි දරුවකු සේ ජීවත් වෙයි. මේ තමා ඉහළින් වඩින සංඝය ගොඩ නගන්නට අවශ්‍ය මුලසුන.”

“දැන් දාමරිකයා සියල්ල කරමින් ඇත; නොයෙක් තැන්වල ජනතාව ඒකරාශි කරමින් ඔහුගේ දේශනා දෙමින් ඇත; ප්‍රාතිහාර්ය කරමින් ඇත. ජනතාව ඔහු වෙත ඇදී යනු පෙනේ. දාමරිකයා සියල්ල සූක්ෂ්ම ලෙස කරමින් යයි. සුව වීම් තුළ, සැප සම්පත් ලැබීම තුළ ජනතාව ඔහුට මුලා වී ඇත. නොයෙක් දේශවල දැන් සියල්ල ඇරඹෙමින් ඇත. රහසිගත ව සියල්ල ඇරඹෙමින් ඇත. ලෝකයා තව ම අවදි වී නොමැත. මේ සියල්ල ඉක්මනින් හෙළි වනු ඇත. මාගේ දරුවෙනි, ඉදිරිය බිහිසුණු යි, අති බිහිසුණු යි. මෙය නුඹලාගේ මනුෂ්‍ය ඥානයට නො වැටහේ. සියලු පුහු ආටෝප අත්හරින්න. ඉහළින් වඩින සංඝය සමග ගමන් කරන්න. පිබිදෙව් දරුවෙනි, අවදි වව් ශ්‍රාවකයිනි, එඩිතර වව්, ධර්ම වීර්යයෙන් ගමන් කරව්. බිය නො වව්, ගල් මුල් එයි, නින්දා අපහාස එයි. නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගනිව්. එය යි, ශුද්ධ භාවයේ සළුව. මාගේ දරුවෙනි, නුඹලා යා යුතු මාවත බොහෝ දුර ය, ගැඹුරු ය. මම පෙරටුවෙන් ගමන් කරමි. හෙට ගැන නො සිතව්, අද ගැන ම සිතව්. සියලු බලාපොරොත්තු වෙනස් කරන දෙවිඳාණෝ මම වෙමි. මේ මොහොතේ මුළු ලොව පුරා ම නොයෙක් තැන්වල විලාප කීම්, අඳෝනා, මිනිමරා ගැනීම් අධික වී ඇත; කලකෝලහාල අධික වී ඇත. මිනිසා ආත්මාර්ථකාමි යි. ඔවුන් වියවුල් කරන්නේ සාතන් ය. මාගේ දරුවෙනි, ඉදිරියේ තිබෙන්නා වූ බිහිසුණු තත්ත්වය ගැන මොහොතින් මොහොත මෙනෙහි කරව්. ---- මාගේ දරුවෙනි, මා විසින් එකිනෙකාගේ ආත්ම විමසන මොහොත ළං ව ඇත. මාගේ උත්තරීතර සංඝයේ සියලු ශ්‍රාවකයින් දෙස මා බලා සිටි කාලය දැන් නිමා කරමින් දැන් ඔවුන්ගේ ආත්ම විමසන මොහොත ළං ව ඇත. මෙය බිහිසුණු මොහොතක් වන්නට පුළුවන. නපුරා විසින් ග්‍රහණය කර ඇති සියල්ල බිඳ දමන මොහොත යි. මිල මුදල් ඇතුළු රැස්කර ගත් සියල්ල, ලෞකික බලාපොරොත්තු සියල්ල මා විසින් කඩා බිඳ දමන මොහොත යි. ඒ සියල්ල නිසා නුඹලාගේ කැඳවීම අමතක වී ඇත.”

**2001 ජුනි 29 සිකුරාදා**

“මාගේ දරුවෙනි, ඉහළින් වඩින සංඝය ආරම්භ කළා වූ ශුද්ධාත්මයාණෝ මම වෙමි. ලෝ සම්මත සියල්ල බිඳ හෙලමින් අසම්මත වූ මාගේ අභිරහස්මක වූ ඉහළින් වඩින සංඝය මම ආරම්භ කළෙමි. එයට පසුබිම සූදානම් කිරීම පිණිස මම වසර කීපයක සිට මැය තුළින් ක්‍රියා කළෙමි. ඒ සියලු මඟ පෙන්වීම් තුළින් අති ශුද්ධ වූ බිහිසුණු ගමනාන්තයට පියවර තබා ඇති ඉහළින් වඩින සංඝයේ සිටින මාගේ ශ්‍රාවකයෙනි, අවදි වව්, පිබිදෙව්, එඩිතර වව්. මම නුඹලාට ඉදිරියෙන් එන්නට නුඹලා ව රැගෙන යන්නට, නුඹලාට පන්නරය දෙන්නට ඇන්තනි නම් වූ පුත්‍රයා එඩේරකු ලෙස දුන්නෙමි; මාගේ පෙර මඟ සූදානම් කරන්නා ලෙස දුන්නෙමි. දැන් ඒ ගමනාන්තය කරා ආරම්භය යි. මහා ගිනි මැද ගමන් කරන මොහොත එළඹී ඇත. තව නොබෝ කලකින් සියලු රාජ්‍යයන්, සියලු බලාපොරොත්තු බිඳ වැටෙන කාලය ළං ව ඇත. ඒ මොහොත ඉතා ආසන්න ය. දේව රාජ්‍යයේ බලාපොරොත්තු තුළ ගොඩ නැගෙන්න. මාගේ දරුවෙනි, මාගේ සංඝයේ සියල්ලන් එක්සිත් විය යුතු මොහොත ළං ව ඇත; ලෞකික සියල්ල අත්හැර එකට එක් ව ගමන් කළ යුතු මොහොත ළං ව ඇත. මා එදා නුඹලාට පැවසුවේ දම්වැලක පුරුක් මෙන් එක් වන්නට ය. මාගේ ශ්‍රාවකයෙනි, දාස දාසියනි, මෙය සියලු දෙනා අවදි විය යුතු කාලය යි. මක්නිසාද, දාමරිකයා දැන්

පැමිණෙමින් ඇත. මාගේ දරුවන් රැවටීමේ කාලය, ඔහු වෙත ඇදගන්නා වූ කාලය ළං ව ඇත. ඒ සඳහා මම ඔහුට නිදහස දී ඇත්තෙමි. අවසානයේ මාගේ මුඛයෙන් නික්මෙන හුස්මෙන් මම ඔහු වනසා ලන්නෙමි.”

“මම ප්‍රේමයේ දෙවිඳාණෝ වෙමි. ප්‍රේමය මෙන් ම මාගේ උදහස ද එලෙස ම යි. මාගේ අණට පිටුපාන යම් කෙනකු ඇද්ද, මාගේ උදහස ඔහු ලුහුබඳී. මගේ අණට කීකරු වන යම් කෙනකු ඇද්ද, මාගේ ප්‍රේමය ඔහු ලුහුබඳී. මා පුත්‍ර ඇන්තනි ව ඔබට එඬේරෙක් ලෙස මම තෝරා පත් කොට දුන්නෙමි, ඔබට නිවැරදි මාවත පෙන්වන්නට. පුත්‍රය, කිසිවකුට නො හැකිය, ඔබව වියවුල් කරන්නට. මක්නිසාද, මාගේ ආශිර්වාද ලත් තැනැත්තෙකි, ඔබ. ඉහළින් වඩින සංඝයට මුලසුන ලෙස මා තිළිණ කළේ ඔබ ව යි. මා පුත්‍රය, මා ඔබ තුළ තැන්පත් කොට ඇති ධර්ම ඥානය පහ ව නො යන්නේය. මාගේ දරුවෙනි, ඔහු තුළින් ඔබට යම් මඟ පෙන්වීමක් ඇද්ද, ඔහු තුළින් නික්මෙන වදන් ධර්මයාණන් වන මාගේ වදන් බව සිත් හි ධාරණය කර ගන්න. මා පුත්‍රය, ඔබ පසු පස එන පිරිස සුළු පිරිසකි. මේ සුළු පිරිස තුළින් කර ගන්නට බොහෝ දේ මට ඇත. ඔබට ලෝ සම්මත දැනුම අවශ්‍ය නැත. ධර්ම ඥානය තුළ ම ගමන් කරන්න. ඔබට මා දැකිය නො හැකිය. එහෙත් ඔබගේ හද පත්ලට එන වදන් මාගෙන් බව සිහි තබා ගන්න. පුත්‍රය, ඉදිරි කාලයේ දී මම ඔබ නොයෙකුත් කටුක මාවත්වල ගෙන යන්නෙමි. නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගන්නට යැයි මා ඔබට අණ කළේ එබැවිනි. දැන් මැය හා ඇන්ටන් ප්‍රසන්න ඇතුළු ඔබ හැම කෙනෙක් ම මාගේ නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගත යුතු මොහොත යි. එඩිතර වන්න, මෙය ශුද්ධ වූ ගමන යිඃ ලොව අසම්මත දේ තුළ මාගේ අභිරහස්මක වූ ගමනාන්තය යිඃ ඉහළින් වඩින්නා වූ සංඝය යි. ලෝ වැජඹෙන සියල්ල කඩා වැටෙන මොහොත ළං ව ඇත. පුත්‍රය, යා යුතු මාවත ඔබ දන්නා බව මම දනිමි. තව බොහෝ දුර යි, ගැඹුරු යි මේ ගමන. ගමන් මඟ දී ඔබ සැම අඩපණ වනු ඇත. වැටෙන්නට ඉඩ නොදෙන දෙවිඳාණෝ මම වෙමි. ඔබට තවත් නොහැකි වන විට මම ඔසවා ගෙන යන්නෙමි, ඔබ සැම. දැන් දාමරිකයා නොයෙක් තැන්වල නොයෙක් දේ සිදු කරමින් යයි. මාගේ ශ්‍රාවක දරුවෙනි, මෙ තැන් පටන් එඬේරා සමග එක්සිත් විය යුතු කාලය යි, විවෘත විය යුතු කාලය යි. කිසිවකු මුසා බස් නොදෙඩිය යුතුයි. මාගේ දරුවෙනි, මෙ තැන් පටන් සියල්ලන් එඩිතරව යා යුතු බිහිසුණු ගිනි ජාලාවකට යි, මා පුත්‍ර ඇන්තනි ඔබ ශ්‍රාවක පිරිසත් සමග පියවර තබන්නේ. ඒ ගින්නේ ඇවිලෙන්නාක් මෙන් ම ඒ තුළ යම් ප්‍රිතියක් අත්වන්නේය. ඒ ප්‍රිතිය බොහෝ දුර ය. එතෙක් මෙයට මුහුණ දෙන්න, එඩිතර ලීලාවෙන්.---- සුජීවා හා ඇන්ටන් ප්‍රසන්න විවාහය ලඟිලඟියේ සිදු වන්නේය. ඔබ යුහුසුළුව ලෝ සම්මත නීතියෙන් ඇන්ටන් ප්‍රසන්නගේ ඒ සම්මත වූ විවාහය ඉවත් කිරීමේ කටයුතු අරඹාපන්න. මැයගේ දින හතේ නිරාහාරය මම මෙ තැනින් අවසන් කරමි.”

## 28

## “මම දැන් මා අතට හසු වූ ජනතාවට පළමු ව ප්‍රකාශ කළෙමි, මාගේ ශුද්ධ භාවය.”

(දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර එළඹි විට එතුමන් තමන් අතට කැමැත්තෙන් හසු වූ අයකුට මිනිස් සංහතියේ ගැළවීම උදෙසා යමක් කරන්නැ යි අණ කරන විට ඔහු ඊට කීකරු නො වන්නේ නම් එතුමන්ගේ උදහස ඔහු පසුපස ලුහුබඳිමින් ඇඳිවත පිටින් මඟ මඟ ට බසින්නට සලස්වා හෝ එතුමෝ තම කාර්යය ඉටුකර ගනිති. ඒ පිළිබඳ උදාහරණයක් සමිඳාණෝ අප අතර නිර්මාණය කළහ. **එය ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර සිය දාසිය හා සිය ශ්‍රාවකයින් කෙරෙහි කලින් උදා කරමින් සිදු කළ පෙරහුරුවකි.** එතුමාණෝ එසේ කළේ මුළු මිනිස් සංහතිය කෙරෙහි උදා වන දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියරේ දී එතුමන් අතට දැනටමත් හසු වී ඇති ජනතාව මිනිස් පවුලේ විමුක්තිය සඳහා එතුමාණන් විසින් උපයෝගි කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව අප විසින් සියල්ලන් දැනුවත් කරනු සඳහා යැයි මට සිතේ.)

(නෙවිල් දයාසිරි පුබුදුව මගින් ජේසු සමිඳුන් හඳුනා ගනිමින්, එතුමන්ට තම ජීවිතය කැප කරමින් දිගු ගමනක් ආ අයෙකි. ඔහු අද අප සංඝයේ ශ්‍රාවකයෙකි. ආර්ථික ව ඉතා දිළිඳු ඔහුට දියණියෝ හය දෙනෙක් ද පුතෙක් ද වූහ. ඔවුන්ගේ ගැටළු, දුක් වේදනා ඔරොත්තු නොදෙන තරම් වැඩි වන විට මම ද ඇන්තනි මේරි සොයුරිය ද සම්පත් සොයුරා ද ඔවුන් හා එක් ව සති දෙකකට වරක් හෝ යාච්ඤා කළෙමු. ඔවුන්ගේ ගැටළුවලට සවන් දෙමින් අප ද ආපසු නිවෙස් බලා ගියේ බර වූ හිසිනි. එසේ නම් එම තත්ත්වය එම නිවසේ වෙසෙන්නන්ට කෙතරම් ඔරොත්තු

නොදෙන පීඩනයක් විය හැකි දැයි මට සිතිණි. එනිසා එම නිවසේ පැවැත්වෙන යැදුමට පැමිණෙන ලෙස මා දිනෙක (1998 මාර්තු 16) ඩිල්ෂාන්ට ඇරයුම් කළේ ඔහු තුළින් ජේසු සමිඳුන් ඔවුන් ගැන පවසන වචනයට සවන් දෙනු සඳහා ය. "මා පුත්‍ර නෙවිල්, ඔබගේ එක ම පුත්‍රයා මාගේ දූත මෙහෙවර උදෙසා මට දෙන්නේ ද?" යනුවෙන් ජේසු සමිඳාණෝ විමසූහ. (නෙවිල්ගේ දෙනෙතින් කඳුළු ගලා යද්දී) "මම දනිමි පුත්‍රය, ඔබගේ එක ම පුත්‍රයා මට දෙන බව. ඒ ගැන මම ඔබට තුති පුදමි" යනුවෙන් ජේසු සමිඳාණෝ පැවසූහ. 2001 වසර වන විට ඔහුගේ පුත් ප්‍රභාත් සංජීව තමා වටා පැවති අසාධාරණය හා ගැටෙන්නට විය. එනිසා පවුලේ සැම මහත් වියවුලට පත් වූහ. මේ පසුබිම තුළ තමා කළ යුත්තේ කුමක් දැයි නෙවිල් මගෙන් විමසීය. ආබ්‍රහම් ඇදහිල්ලේ කඳුකරයේ විසීම ලොත්ගේ ගැළවීම සඳහා හේතු වූ බව මා පොතක කියවා තිබිණි. එනිසා මම නෙවිල්ට මෙසේ පැවසීමි. "දැන් ඔබ කියන දේ බිරිඳ වත් දරුවන් වත් අහන්නේ නැති නම් ඔබ කළ යුත්තේ හුදෙකලාව නිහඬ තැනකට ගොස් ඔවුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤා කිරීම යි." 2001 ජුනි 26 වන දින ප්‍රභාත් හැර නෙවිල්ගේ පවුලේ සැම ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමක් පතා බෙතෙල් නිවසට පැමිණි විට සුජීවා මගින් ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.)

"මා තෝරා ගත් එඬේරා තුළින් මම කතා කළෙමි, මා පුත්‍ර නෙවිල්ට. ඔහු තුළින් නික්මුණේ මාගේ වචනය යි. මා මේ කාලයේ වඩ වඩාත් ඉල්ලන්නේ සියල්ල අත්හැර මා පසුපස එන්නට යි. එසේ නම් මා පුත්‍රය, සියල්ල අත්හැර හුදෙකලා වන්නට නොහැකි ඇයි? ඔබ සියල්ල අත්හැර හුදෙකලා වී මොරගැසීමේ කාලය යි, මේ. ඔබ මාගේ විශ්වාසයේ දරුවකු නිසා මේ කාලයේ විප්‍රවාසයේ මොහොතක මම නුඹ ව රඳවා ඇත්තෙමි. පුත්‍රය, නුඹ දැන් හුදෙකලා වීමේ කාලය යි. සියල්ල වෙනසක් වන තෙක් නො පැමිණෙන්න. සියල්ලෙන් හිස් ව නිශ්චල ව නිහඬ තැනකට ගොස් මොරගැසීම අරඹන්න." (නෙවිල්ගේ බිරිඳ හා දියණියන් අමතා ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) "ස්ත්‍රිවරුනි, මේ ගෘහයේ වියවුල ඇති කරන්නේ නුඹලා යි. ඔබගේ පුත්‍රයාට මා ඉඩ තබා නැත, කිසිවකු ඝාතනය කරන්නට. මා කිසිවකුට ඉඩ තබා නැත, ඔබගේ පුත්‍රයා ඝාතනය කරන්නට. නුඹලා කලබල නො වී සිටින්න."

(එදින රාත්‍රියේ ගැටුම නැවත උත්සන්න විය. ප්‍රභාත් කඩුව රැගෙන යන්නට සූදානම් වෙද්දී ජේසු සමිඳුන් පැය කීපයකට පෙර ඔවුන්ට දුන් අවවාදය ඔවුහු මුළුමනින් අමතක කොට මහත් සේ වියවුලට පත් වූහ. එනිසා ම තවත් ගැටුමක් එදින සිදු විය. ජුනි 28 වන දින නැවත ඔවුන් බෙතෙල් නිවසට පැමිණි විට ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) "දැන් නුඹලාගේ ඒ ගෘහය අත්හැරිය යුතු මොහොත ළං ව ඇත. එය නුඹලාට සුදුසු නැත. සියලු ආශාවලින් බැඳීම්වලින් මිදියල්ලා. ඒ තුළ ගුලි ගැහුනොත් ජීවිත බොහෝ සේ විනාශ වන්නේය. මේ තමයි, විප්‍රවාසය. මෙය මෑත යුගයේ මා විසින් අරඹන සිද්ධියකි. එදා යුගයේ සිදු වූ ශුද්ධ වූ දේ නැවත සිදු වෙමින් ඇත. දැන් ඔබට කළ හැක්කේ නිදහස් තැනකට ගොස් මොරගැසීම පමණි. (ජේසු සමිඳුන් තමාට පැවරූ කාර්යය නෙවිල් අතපසු කරමින් හමු වන්නන්ගෙන් ගෙදර තොරතුරු විමසමින් කල් යැවීය. පවුලේ අනෙක් අය ද වියවුල තුළ ම සිටියහ. එහි ප්‍රතිපලය වූයේ ජූලි 8 වන දින සතුරන් විසින් මුළුමනින් ම නිවෙස ගිනිබත් කිරීම යි. ඇඳිවත පිටින් පාරට බසින්නට ඔවුන්ට සිදු විය. එහෙත් නෙවිල් පසු දින ගිනිගත්හේන නිවසේ පැවැත් වූ යැදුමට සහභාගි විය. එහි දී ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.)

**2001 ජූලි 09**

"මම මාගේ දරුවන්ට අසීමිත ව ප්‍රේම කරමි. මාගේ ප්‍රේමය ලුහුබඳින බව ද මාගේ උදහස ලුහුබඳින බව ද මම සඳහන් කළෙමි. සියල්ල අත්හැර එන්නට මා හඬ ගසන විට එයට කීකරු නො වන්නේ ද පැකිලෙන්නේ ද ඒ සියල්ල අත්හරින්නට මම සලස්වමි. මම දැන් මා අතට හසු වූ ජනතාවට පළමුව ප්‍රකාශ කළෙමි, මාගේ ශුද්ධ භාවය. යම් දෙයක් දමා එන්නට මැලි වන්නේ ද මාගේ උදහස ඒ පිට පැමිණේ. මා පුත්‍ර නෙවිල්, මම නුඹට සියල්ල අත්හැර එන්නට ඇරයුම් කළෙමි. නුඹ තවම හිස් නො වී සිටින බව මම දකිමි. නුඹ නො වෙයි, සියල්ල සැලසුම් කරන්නේ. සියල්ල සැලසුම් කරන්නා මම වෙමි. නුඹට සියල්ල නැවත ලැබෙනු ඇත. ඔබ හැම කෙනෙක් ම මෙ ලොවට බිහි වූයේ ඇඳිවත වත් නොමැතිව ය. දැන් ඇඳිවත පිටින් නුඹලා ගමන් කරමින් සිටින්නහුය. හිස් ව හුදෙකලා වන්න. මම සියල්ල සූදානම් කරන්නෙමි. නුඹගෙන් මා ගැන විමසන සියල්ලන්ට මම කව්දැ යි යම් දිනෙක ප්‍රකාශ කරන්නෙමි. ඒ මාගේ ශුද්ධ භාවය යි. මම මැයට පෙන්නුම් කළෙමි, නිරයේ ගින්නත් මාගේ ශුද්ධ භාවයේ ගින්නත්. මාගෙන් දුරස් වන විට මාගේ උදහස ඇවිලෙන්නේය. කිසිවක් ගැන සිතීම ඇය සතු නො වේ. ඒ සියළු සැලසුම් මා සතු ය. ඒ ජීවිතයෙන් පලා යන්නට මැයට නො හැකිය. පරිත්‍යාගී වීම මම මැයගෙන් බලාපොරොත්තු වෙමි. මට අවශ්‍ය වන්නේ මට සැනසීම දෙන ජීවිත යි. මේ නින්දාවෙන් පලා යා නො හැකිය, ඔබ කිසිවකුට. එයට මුහුණ දෙන්නට එඩිතර විය යුතුයි."

"ශ්‍රාවකයිනි, මෙන්න නුඹලා පය තබා තිබෙන බිහිසුණු මොහොත ආරම්භ විය. මා සුරතේ ඇඹුන ජීවිත මට අකීකරු වීමේ පල විපාක අත්විඳි. සම්පූර්ණයෙන් හිස් විය යුතුයි. මනස, සිතුවිලි, ආත්මය මුළුමනින් හිස් ව පවතින්න. එවිට නුඹට නව ජීවනයක් ලැබෙන්නේය, මා පුත්‍ර නෙවිල්. සියල්ල නිසි ලෙස සිදු වෙමින් ඇත. නුඹ තනි නො වන්නෙහිය. මක්නිසාද, මා සතු දරුවන් නුඹ සතු ය. මා සතු සියලු ශ්‍රාවකයෝ නුඹ තනි නො කරති. විශ්වාසය, බලාපොරොත්තුව තුළ හුදෙකලා වන්න. හුදෙකලා වීමේ මොරගැසීම මට අවශ්‍යව ඇත. ලෝ වැසි සියලු ජනතාව වෙනුවෙන් මොරගසන්න, ආත්මය, මනස මුළුමනින් හිස් කොට මට ඉඩ දෙන්න. සියල්ල මම සූදානම් කරමි. සියල්ල මම නිසි ලෙස සකසා ලන්නෙමි. ඇඳි වත පිටින් ගමන ආරම්භ විය. මා තවත් අයට එලෙස ප්‍රකාශ කරන මොහොත ළං ව ඇත. ඉදිරි කාලය බිහිසුණු යි, අති බිහිසුණු යි. දැන් ගිනි මැද ඇවිදිමේ කාලය එළඹෙමින් ඇත. මා සුරතට හසු වූ කිසිවකුට මාගෙන් පලා යා නො හැක. ලෝකයේ ගැළවීම පිණිස මොරගැසීම අවශ්‍යව ඇත. මම පිපාස වෙමි. මා ඔබට පවසන දේට ඇහුම්කන් දෙන්න, අවනත වන්න. ඔබ ව ඔබට අයිති නැත. ඔබ හැම කෙනකුගේ ම අයිතිකරු මම වන්නෙමි. ඔබ ව ඔබ මුළුමනින් අමතක කරන්න. මම යි, ඔබ ව මෙහෙයවනු ලබන්නේ. මම හැම කෙනකුගේ ම සිතුවිලි දකිනා ශුද්ධ භාවය වෙමි."

(මේ පණිවුඩයට සවන් දුන් අපි ජේසු සමිඳුන් ඔහුට පැවරූ කාර්යය ඉටු කිරීම සඳහා නෙවිල් සොයුරා ගිනිගත්හේන නිවසේ රඳවා ආවෙමු. අගෝස්තු 19 වන දින ඔහු බෙතෙල් නිවසට පැමිණි පසු ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) "මා පුත්‍ර නෙවිල්, මම අකාරුණික නො වෙමි. ඔබට අද සිට සති දෙකක කාලයක් දරුවන් හා පවුල හා එකතු වීමට මම නුඹට අවසර දෙමි. ඉන් පසු නැවත සති දෙකක කාලයක් නිදහස් තැනක් සොයා ඔබ ව හුදෙකලා කිරීම මම එඬේරාට පවරමි. සති දෙකක් නිවසේ දරුවන් බිරිඳ හා ගත කිරීම, සති දෙකක් මා හා හුදෙකලා වීම. මෙය මේ වර්ෂය අවසන් මස දක්වා කරපන්න. ඉන් පසු නුඹ නිදහස් වනු ඇත."

දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර මුළු ලෝක ජනතාව කෙරෙහි ප්‍රබල ව උදා වන විට දැනටමත් දෙවිඳුන් අතට හසු වූ ජනතාව කෙරෙහි එතුමන්ගේ ක්‍රියාකාරිත්වයේ සුලක්ෂණ ඔබට ඉහත සඳහන් නිදසුන් දෙක තුළින් (සුජීවා සහ නෙවිල් දයාසිරි) අවබෝධ වනු ඇත. දෙවිඳුන්ගේ අතට හසු වූ අයකුගෙන් එතුමන් යමක් ඉල්ලන්නේ ද වැළපෙමින් හෝ එයට මුළුමනින් කීකරු වන විට එතුමන්ගේ ප්‍රේමය ඔහු හෝ ඇය පසු පස ලුහු බඳිනු ඇත. දෙවිඳුන්ගේ අතට හසු වූ අයකුගෙන් එතුමන් යමක් ඉල්ලන්නේ ද එය නොසලකා හරිමින් එයට අකීකරු වන විට එතුමන්ගේ උදහස ඔහු හෝ ඇය පසු පස ලුහුබඳිනු ඇත. ඇඳිවත පිටින් මහා මඟට බසින්නට සලස්වා හෝ එතුමන් පැවරූ කාර්යය කෙසේ හෝ ඉටු කර ගනු ඇත. ඉන් පසු නැවත දෙවිඳුන්ගේ ප්‍රේමය ඔහු හෝ ඇය පසු පස ලුහුබඳිනු ඇත.

මහෝත්තමයාණන් එතුමන්ට අභියෝග කරන්නට පවා අධර්මාධිපතිට ඉඩ හැරියත් එතුමාණන් සර්වබලධාරී නිසා එතුමෝ අධර්මය සුන් කර ජය ගනිති. මිනිසා මැවීමත් සමග දෙවිඳුන් තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදා ගත් බව ද එතුමන් විසින් කළ තම බලය විමධ්‍යගත කිරීමට එතුමන් උපරිමයෙන් ගරු කරන බව ද එනිසා මිනිසාගේ සහභාගිත්වයෙන් තොර ව එතුමන් ක්‍රියා නොකරන බව ද දෙ වන ප්‍රකාශනයේ දී මම විස්තර කළෙමි. දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර සමස්ත විශ්වය කෙරෙහි උදා වන මොහොතේ සිට එතුමෝ තමන් අතට හසු වූ ජනතාවගේ උපරිම සහභාගිත්වය ලබා ගනිති. දෙවිඳුන් අතට හසු වූ ජනතාව යනු දෙවිඳුන්ට අවනත වන්නට කැමති ජනතාවකි. තම නිදහස, තම කැමැත්ත සමිඳුන් අතට පවරමින් "මාගේ කැමැත්ත ලෙස නො ව ඔබගේ කැමැත්ත ලෙස වේවා" යි කියන්නට කැමැත්තෙන් සිටින ජනතාව යිː හෙවත් තම කැමැත්තෙන් ම තම නිදහස් කැමැත්ත දෙවිඳුන් අතට පවරා දෙමින් තම කැමැත්තෙන් ම නිදහස් කැමැත්ත නැති කරගත් ජනතාවකි. එවැනි ජනතාවක් උපයෝගි කර ගෙන සමිඳුන් ඉටු කර ගන්නා එම කාර්යයේ නිදහස් කැමැත්ත ගැන ගැටළුවක් තිබිය නො හැකිය. එනිසා ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියරේ දී අධර්මය සුං කිරීම සඳහා එම ජනතාවගෙන් උපරිම පල නෙලා ගැනීම මහෝත්තමයාණන්ගේ සැලැස්ම යි. "මෙය මේ අදියර පිළිබඳ මාගේ පියාණන්ගේ ආඥාව යි. මාගේ පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීමට මම බැඳී සිටිමි. මාගේ කැමැත්ත ඉටු කිරීමට නුඹලා බැඳී සිටින්නහුය." යනුවෙන් ජේසු සමිඳුන් පවසන්නේ එබැවිනි.

මිනිස් බව ගෙන මෙ ලොවට වැඩිය මහෝත්තමයාණන් වන ජේසු සමිඳාණන් මිහිමත දේශනා කරමින් සැරිසැරූ වසර තුන තුළ එතුමාණන් මෙ ලෙස පැවසුවේ දේව සැලැස්මට අනුව උදා වන්නට නියමිත ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර ගැන නො වේ දැ යි ඔබ ම සිතා බලන්න. **"පොළොව මත ගිනි ලන්නට ආවෙමි. ගින්න දැනටමත් ඇවිල තිබේ නම් මම කොපමණ කැමති වෙමි ද? මට බෞතිස්මයක් ලබන්නට තිබේ. එය ඉටු වන තුරු කොපමණ ගාවිනාවෙන්**

**යුක්ත වෙමි ද? පොළවට සාමය දෙන පිණිස මම ආවෙමි යි නුඹලා සිතන්නහු ද? එසේ නො වේ. මා ආවේ භේද උපදවන පිණිස යැයි මම ඔබට පවසමි. මෙවක් පටන් එක ගෙදර වසන පස් දෙනෙකුගෙන් දෙදෙනෙක්ට විරුද්ධව තිදෙනෙක්ද, තිදෙනෙක්ට විරුද්ධව දෙදෙනෙක් ද භේද වන්නෝය. පියා පුතාටත්, පුතා පියාටත්, මව දුවටත්, දුව මවටත්, නැන්දම්මා ලේලියටත්, ලේලිය නැන්දම්මාටත් විරුද්ධ ව භේද වන්නෝය." (ශුද්ධ බයිබලය-ලූක් 12:49-53)**

දෙවි පියාණන්ගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර පොළව මත ගිනි ලෑම යි. එය ශුද්ධාත්ම ගින්න යි. එකිනෙකා අතර ප්‍රේමය නැති වීමෙන් භේද භින්න වූ ලෝකය පවිත්‍ර කරන මොහොත යි. එය මාතෘ ප්‍රේමය, පිතෘ ප්‍රේමය, දාරක ප්‍රේමය, යුවතිපති ප්‍රේමය, ජාති ප්‍රේමය, දේශ ප්‍රේමය, ආදිය තුළින් පටු වී කොටු වී ඇති මිනිස් වර්ගයා විශ්ව ප්‍රේමයට ඔසවන මොහොත යිඃ විශ්ව ප්‍රේමයෙන් ලොව ගිනි ලන මොහොත යි. විශ්ව ප්‍රේමය යනු තම පියාට, මවට දක්වන ආදරය තම දරුවන්ට දක්වන ආදරය මුළු මිනිස් වර්ගයා කෙරෙහි දැක්වීම යි. යමෙක් විශ්ව ප්‍රේමයට එසවෙන විට ප්‍රේමයේ ඊට අඩු මට්ටම් තුළ, ප්‍රේමයේ ඊට අඩු මට්ටම් අතර ගැටුම් ඇති වීම වැළැක්විය නො හැකිය. එහි දී භාරකරු (පියා, මව) ඉක්මවා අයිතිකරු හෙවත් මැවුම්කරුවාණන්ගේ කැමැත්තට නතු වන්නට සිදු වනු ඇත. නෙවිල් දයාසිරි පිළිබඳ ව මෙහි මා සඳහන් කළ සිදු වීම් ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් වචනය වටහා ගන්නට සුදුසු නිදසුනකි. 2001 ජුලි 8 වන දින ඔහුගේ නිවෙස මුළුමනින් ගින්නෙන් දැවී පවුලේ සියල්ලන් ඇඳි වතට සීමා වුවත් ඔහු පසු දින ගිනිගත්හේන නිවසේ යැදුමට අප හා එක් විය. ඔහු ගිනි ගත් තම නිවෙස බලන්නට හෝ ගියේ නැත. දෙවිඳුන් ඔහුට පැවරූ කාර්යය ඉටු කරනු සඳහා අපි ඔහු එම නිවසේ තබා ආවෙමු. ඔහු 2001. 08. 19 දින ආපසු පැමිණියේ තම බිරිඳ, දරුවන් අතරට නො ව 'බෙතෙල්' නිවෙසට ය. ඔහු එසේ කළේ ජේසු සමිඳුන් ඔහුට පවසන වචනයට සවන් දීමට ය. නෙවිල් මුහුණ දුන් මෙම අත්දැකීමේ දි ඔහුගේ අසල් වැසියන් පමණක් නො ව ඔහුගේ ඥාතීන් පවා ඔහු ගැන කුමක් කියන්නට ඇද්දැ යි ඔබට සිතා ගත හැකිය. සංඝයක් ලෙස අපි ඔවුන්ට කුළී නිවසක් සපයා දෙමින් එදිනෙදා ජීවිතය පවත්වා ගෙන යන්නට ඔවුන්ට අත්‍යවශ්‍ය දේ සපයා දුනිමු.

අප සංඝය හා බැඳුන ජේසු සමිඳුන්ගේ අනාවරණයන් තුළ දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර පිළිබඳ ලක්ෂණ දෙකක් දිස් වේ.

1. ජේසු සමිඳුන්ගේ අතට දැනටමත් කැමැත්තෙන් අයිති වී සිටින ජනතාව දෙවිඳුන්ගේ ශුද්ධ භාවයේ ගින්න තුළ දැඩි පවිත්‍ර කරණයට ලක් කොට අනෙක් අය වෙත දහම් පණිවුඩය ගෙන යාම වේගවත් කිරීම එහි එක් ලක්ෂණයකි. එය දෙවිඳුන්ගේ අතට හසු වූ ජනතාවගෙන් එතුමන් කර ගන්නා දිවැසිවර කාර්යයකි.

2. ලෝකයේ සියලුම රාජ්‍යයන් බිඳ වැටීම, ආර්ථිකය බිඳ වැටීම, උසස් තානාන්තර බිඳ වැටීම ශුද්ධ භාවයේ බිහිසුණු අදියර පිළිබඳ අනෙක් ලක්ෂණය යි. එය මුළු මිනිස් සංහතියට ම පවිත්‍ර කරණයකි. "අද මිනිසාට ප්‍රේම කරන්නට නො හැකි තත්ත්වයක් උදා වී තිබෙන බව මම දකිමි. අද ලෝකය එක ම ධාවනයක යි, යෙදී සිටින්නේ." සියල්ල කඩා වැටෙන විට ධනය, බලය, ජනප්‍රියත්වය පසුපස හඹා යන සියල්ලන්ට නැවතීමට සිදු වනු ඇත. එවිට හිතන්නට විවේකයක් ලැබේ. එය පවිත්‍ර කරණයකි.

එනිසා දැනටමත් දෙවිඳුන්ගේ සුරතට හසු වූ ලොව පුරා විසිරී සිටින ඊශ්‍රායෙල් ප්‍රීති වන්නැ යි සමිඳාණෝ පවසති. මක්නිසාද, අධර්මය සුණුවිසුණු වන මොහොත පැමිණෙමින් ඇතඃ දැහැමි යුගයේ උදාව ආසන්න ව ඇත. "මෙය මෑත යුගයේ මා විසින් අරඹන සිද්ධියකි. එදා යුගයේ සිදු වූ ශුද්ධ වූ දේ නැවත සිදු වෙමින් ඇත." ජේසු සමිඳුන්ගේ එම වචන දෙස බලන විට ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර එදා නික්මයාමේ ගමන මෙන් වනු ඇත. එදා නික්මයාමේ ගමනේ දි දෙවිඳාණෝ තමන් අතට සිය කැමැත්තෙන් නතු වූ ඊශ්‍රායල් ජනතාව දැඩි පවිත්‍ර කරණයට ලක් කළ අයුරු ඔබ ම ශුද්ධ බයිබලයේ 'නික්මයාම' පොත කියවා වටහා ගන්න. දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර ද එලෙස ම වනු ඇත. එදා දෙවිඳුන්ගේ ජනතාව පොරොන්දු දේශය කරා නික්මයාමේ ගමනක යෙදුනහ. ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියරේ දි දෙවිඳුන්ගේ ජනතාව දැහැමි යුගයේ උදාව කරා, නික්මයාමේ ගමනක යෙදිය යුත්තාහ. එදා නික්මයාම ගමනේ දි මෝසෙස් සමග ගමන් කළ දෙවියන් වහන්සේගේ සෙනඟ හා පාරාවෝගේ සෙනඟ වශයෙන් දෙකට බෙදුනාක් මෙන් මෙ වර ද සිදු වනු ඇත.

සන්නිවේදනය ලබා ඇති දියුණුව නිසා දැහැමි යුගය කරා වන නික්මයාමේ ගමනේ දි ලෝ වැසි සියල්ලන් මහෝත්තමයාණන්ගේ ක්‍රියා හා දාමරිකයාගේ ක්‍රියා නරඹනු ඇත.

මහෝත්තමයාණෝ ස්වකීය ජනතාව කෙරෙහි ඇති ඉමහත් ප්‍රේමය නිසා එතුමන්ගේ දිව්‍ය වැඩසිටීම හා එතුමන්ගේ බාහු බලය පෙන්වති. ඒ සියල්ල ප්‍රතික්ෂේප කරන්නෝ තම විනාශය සොයා ගනිති. දෙවිඳුන් තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදා ගත් නිසා දැනට මත් එතුමන් සුරතට හසු වූ ජනතාව එතුමෝ තම ක්‍රියාවලිය සඳහා සහභාගි කර ගනිති. මෙම නික්මයාමේ ගමන හෙවත් දෙවිඳුන්ගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියරේ දී එතුමන් තම ජනතාවගෙන් ඉල්ලන ප්‍රධාන කරුණු දෙකකි.

1. හිස් ව හුදෙකලා වෙමින් මුළු ලෝ වැසි ජනතාවගේ ගැළවීම උදෙසා යැදුමෙන් මොරගැසීම.

2. තමාට විඳින්නට සිදු වී ඇති මහා විඳවීම ජේසු සමිඳුන්ගේ කල්වාරි යාගය හා එක් කොට මිනිස් පවුලේ ගැළවීම සඳහා දෙවි පියාණන්ට දිනපතා පිදීම.

(පහත උපුටා දක්වන අප සංඝය හා බැඳුන ජේසු සමිඳුන්ගේ අනාවරණයන්ගෙන් ඔබට එය පැහැදිලි වනු ඇත.)

- "ඔබට දැරිය නොහැකි තරම් විඳවීම්වලින් හා ඉසිලිය නොහැකි තරම් ඕක් සුවඳින් ඔබ වසා ගන්නා විට දැන ගන්න, ඔබ ව ද ඒ සඳහා මා විසින් කැඳවන බව."

- "අද ලොව වසාගෙන ඇති රුදුරු පව් අඳුර උදෙසා මම නැවත ද කුරුසපත් වීමට කැමැත්තෙමි. එහෙත් එය මාගේ පියාණන්ගේ කැමැත්ත නො වේ. මාගේ පියාණන්ගේ කැමැත්ත නම් මාගේ ජනතාවගේ විඳවීම් මාගේ කල්වාරි යාගය හා එක් කොට මිනිස් පවුලේ ගැළවීම සඳහා දිනපතා පිදීමත් ආත්ම ගැළවීම උදෙසා යැදුමෙන් මොරගැසීමත් ය."

- "ඔබගේ ආත්මය උදෙසා ම නො ව මුළු මිනිසියාවේ ආත්මය උදෙසා මොරගසන්න. පැමිණෙන බිහිසුණු තත්ත්වය කටුක වෙන්නට වෙන්නට වඩවඩාත් යැදුමෙන් මොරගැසීමට ද මාගේ ශ්‍රී වත මඬල දැකීමට ද නුඹලා භාග්‍ය ලීලාවෙන් යාච්ඤා කරපන්න."

- "ඔබ නිරන්තරයෙන් යැදුමෙන් ගැයුමෙන් පිදුමෙන් කරන්නා වූ ප්‍රශංසාව ස්වර්ගීය මහා දුම් පූජාවට යොමු කරපන්න. ඒ මහිමාන්විත සුවඳ දුම් යාගය තුළ ලෝකයේ පාපය දැවෙමින් යන්නේය. ලෝකයේ පාපය උදෙසා ඔබ විඳින්නා වූ දුක වෙහෙස මහන්සිය සියල්ල දෙවි මහෝත්තමයාණන් වහන්සේට පූජා කරපන්න."

(අති බිහිසුණු සමයේ දී දාමරිකයාගේ ක්‍රියාකාරිත්වය තුළ ඔබ නොමඟ නොයනු සඳහා ජේසු සමිඳුන්ගේ මෙම උපදේශය ද මම ඔබ හමුවේ තැබිය යුතු යැයි සිතමි. "මාගේ මැවීම හෙවත් මාගේ ප්‍රතිමා" යනුවෙනි, ජේසු සමිඳුන් සැම ප්‍රතිමාවක් ම හඳුන්වන්නේ. ඊට හේතුව සියලු ප්‍රතිමා සාදා ඇත්තේ මැටි, දැව, ලෝහ ආදියෙන් නිසා ය. ඒ සියල්ල මැවීමට අයත් දේ ය. මැවුම්කරුවාණන් හැර මැවීමට අයත් ඕනෑ ම දෙයකින් මැවීම නොමඟ යවන්නට දෙවිඳුන් නපුරාට අවසර දී ඇති බව ජේසු සමිඳාණෝ පවසති. එනිසා ප්‍රතිමාවක නෙත්වලින් ලේ, කඳුළු ගලා යාම ආදි ප්‍රාතිහාර්යයන් කරන්නට නපුරාට හැකි බව එතුමෝ පවසති. එනිසා ජීවමාන දෙවිඳුන් ඔබගේ ඇතුළු සිතෙහි මවා ගෙන එතුමන්ට පමණක් නමස්කාර කරන ලෙස එතුමෝ පවසති. එහෙත් ඒ අවවාදය ඒ අති බිහිසුණු කාල සීමාව සඳහා පමණයි. පසු වූ දැනට පසු වන්නා වූ කාලය තුළ එවැනි දෙයින් ද ජනතාව මනස්ස්ථාපනයට යොමු කරන්නට සමිඳාණෝ ක්‍රියා කළ බව පවසති.)

## 29

# "සියලු රාජ්‍යයන් බිඳ වැටෙන මොහොත ආරම්භ වෙමින් ඇත."

**2001 ජුලි 18**

"මම මුළු මිනිස් සංහතියට ම ප්‍රේම කරමි. එයින් ස්වල්ප දෙනෙක් පමණි, මට ප්‍රේම කරන්නේ, මට කීකරු වන්නේ. මම ලුහුබඳින ප්‍රේමය ද ලුහුබඳින ශුද්ධ භාවය ද වෙමි. අද මිනිසාට ප්‍රේම කරන්නට නොහැකි තත්ත්වයක් උදා වී තිබෙන බව මම දකිමි. අද ලෝකය එක ම ධාවනයකයි, යෙදී සිටින්නේ. කිසිවකු හිස් වන්නට කැමති නො වන ලෝකයක් අද මම දකිමි. කිසිවකු නොසිතන මොහොතක මම ලෝකයට වඩින්නෙමි, ලොව ම නිහඬ වන මොහොතේ. ඊට පෙර මාගේ ජනතාවගෙන් මට ඉටු කර ගන්නට මහා කාර්යයක් තිබේ. දැන් එය සූදානම් වෙමින් ඇත. ---- මැය මා පැවසූ හැම දෙයක් ම එලෙසින් ම ඉටු කිරීම ගැන, මා යැවූ හැම තැනකට ම වැළපෙමින් හෝ යාම ගැන මම ප්‍රසන්න වෙමි. දැන් මම ඇන්ටන් ප්‍රසන්නට යමක් පවසමි. මැයට අවංක ව ප්‍රේම කරමින් මැය රැකබලා ගන්නා බව ඔහු සංඝයේ එඬේරා, පියා, මව ඉදිරියේ ප්‍රකාශ කළ යුතුයි. ඔහු පැකිලීමෙන් තොර ව එය පවසන්නේ ද කියා මම බලා සිටිමි. මෙය දෙවි වූ ස්වාමීන් වහන්සේ වන මාගේ ආඥාව යි. මාගේ දරුවෙනි, මම ශුද්ධ භාවය වෙමි. මා අතට හසු වූ කිසිවකුට මාගෙන් පලා යා නො හැක. මාගේ වැඩ බොහෝ ය. ඒ සියල්ල මම ඔවුන් ලවා ඉටු කරවන්නෙමි. මම ලුහුබඳින ප්‍රේමය වෙමි."

**2001 ජුලි 22**

"මාගේ දරුවෙනි, නුඹලා ගමන් කරන්නා වූ මාවත ශුද්ධ යි. ශුද්ධ භාවයේ අති බිහිසුණු ගමනාන්තය කරා නුඹලා ගමන් කරමින් සිටින්නහුය. සියලු රාජ්‍යයන් බිඳ වැටෙන මොහොත ආරම්භ වෙමින් ඇත. ---- මේ වර්ෂය අවසන් වන්නට පෙර මැය විවාහ විය යුතුයි. මොවුන් දෙ දෙනා එක්තැන් කිරීමේ වගකීම මම නුඹලාට පවරන්නෙමි. මා පුත්‍ර ඇන්ටන් ප්‍රසන්න ව පළමු විවාහය පිළිබඳ ලෝ සම්මත නීතියෙන් නිදහස් කරගත යුතුයි. එය ලහිලහියේ සිදු විය යුතුයි. ඒ සියල්ල මම බලා සිටිමි. මක්නිසාද, මාගේ කාර්යය සඳහා නිදහස් ව යා යුතුයි. මගේ දරුවෙනි, නුඹලා පය තබා තිබෙන මෙම ශුද්ධ වූ ගමන ලෝ සම්මත සියල්ල ඉදිරියේ අසම්මත වූ දූත මෙහෙවරකි. එය ලෝකයට මෝඩකමකි. එහෙත් එය මා ඉදිරියේ අති විශිෂ්ඨ යි, අති ශුද්ධ යි. මාගේ හස්තයට හසු වූ කිසිවකු විනාශ නො විය යුතුයි. මාගේ හස්තයට හසු වූ කිසිවෙක් හෝ මට පිටුපාන්නේ ද එවිට මාගේ උදහස ඔහු ලුහුබඳිනු ඇත. මම ලුහුබඳින ප්‍රේමය ද උදහස ද වන්නෙමි. මා මේ සියල්ල කරන්නේ මාගේ පියාණන්ගේ ආඥාව පරිදි ය. මා නුඹලා සමග පියාණන් ඉදිරියේ පෙනී සිටිය යුතු මොහොත එන තෙක් පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීම යි, මාගේ කැමැත්ත විය යුත්තේ; මාගේ කැමැත්ත ඉටු කිරීම යි, නුඹලාගේ කැමැත්ත විය යුත්තේ."

"නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා ඉවත් කළ පසු මුළු විශ්වය ම අති බිහිසුණු මොහොතට පැමිණේ. ධර්මය හා අධර්මය අතර අති බිහිසුණු සටන ඇරඹේ. අවසානයේ මාගේ මුඛයෙන් නික්මෙන්නා වූ හුස්මෙන් මම අධර්මය පරාජය කරමින් ජය ලබන්නෙමි. මෙ ලෙස මම සියල්ලන්ට මාගේ ශුද්ධ වූ ගමනේ බිහිසුණු අදියර සිහිපත් කළෙමි. මා පුත්‍ර ඇන්තනි, නුඹ මා නොදැක නමුත් මා කෙරෙහි විශ්වාසය තබා ගෙන මාගේ සියුම් හඬ ඔස්සේ ගමන් කිරීම ගැන මම නුඹ කෙරෙහි ප්‍රසන්න වෙමි. පුත්‍රය, මම ඔබට බැරෑරුම් වගකීමක් පැවරුවෙමි. ඒ වගකීම නම් විශ්වාසයේ ජනතාවත් සමග මා අනුව ගමන් කරන්නට, ධර්මිෂ්ඨ ජීවිත ගොඩනගන්නට, මාගේ දහමේ පන්නරය දෙන්නට හා මාගෙන් නික්මුණු වදන් ලොවට හෙළි කරන්නට ය. දැන් ඒ මොහොත පැමිණ ඇත. මෙම අගෝස්තු මස 15 වන දින එය අන්තර්ජාලය මගින් ලොවට විවෘත කළ යුතුයි." (ජේසු සමිඳුන්ගේ ඉල්ලීම පරිදි 2001 අගෝස්තු 15ස් වන දින අපගේ ප්‍රකාශන 1,2,3 අන්තර්ජාලය මගින් ලොවට විවෘත කළෙමු.)

**2001 ජුලි 24**

(එය කටුනායක ගුවන් තොටුපලට L.T.T.E ප්‍රහාරය එල්ල වූ දිනය යි. සුජීවා පැය කීපයක් වැළපෙමින් සිටියාය. එය ජේසු සමිඳුන් විසින් ඇය තබා තිබූ අත්දැකීමකි. ඇයගේ වැළපීම තුළ මෙ වැනි වදන් ඇසිණි. "අද නිරාහාරයෙන් මොරගැසිය යුතු දවසක්. අපි සේරම එක ම ලෙයින් මසින් හැදුන මිනිසුන්. කවුරු මැරුණත් මගේ ම පවුලේ කෙනෙක් මැරුණා වාගේ මට දැනෙන්න ඕනැ. කාට තුවාල වුණත් ඒ තුවාලය මගේ ම තුවාලයක් වාගේ මට රිදුම් දෙන්න ඕනැ." ඇගේ වැළපීම තුළ ම ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) "මාගේ දරුවෙනි, මෙන්න මාගේ ශුද්ධ භාවය. ලොව සියලු ම රාජ්‍යයන් බිඳ වැටෙන මොහොත ඇරඹිණි. මාගේ උදහස යි මේ,

මුළු විශ්වය ම කෙරෙහි ම. මාගේ දරුවෙනි, මම අනාදියේ සිට සියල්ල දෙස බලා සිටියෙමි. දැහැමි යුගය සෑදීම සඳහා සියල්ල පවිත්‍ර කරන්නට සැරසෙන මොහොත යි, මේ.

මේ මොහොතේ මම මැය ව තබා තිබෙන්නේ විශ්වයීය ප්‍රේමය තුළ යි. මෙය යි, මා මැවූ නියම මිනිසත් බව. ආත්මාර්ථය, ආශා, බලාපොරොත්තු සියල්ල අත්හැර එන්නට යැයි මා පවසන විට එයට කීකරු වෙමින් ඒ සියල්ල අත්හැර එන විට මරියාවන් වාගේ වන්නට නොහැකි වුව ද එයින් දශමයකට ඇය ව තබන මොහොත යි, මේ. සියලු වේදනා දැනෙන්නට සලස්වන මොහොත යි. එක ම ලෙයකට නෑකම් කියන මොහොත යි. ඔබ පවුලට සීමා නො වී විශ්වයීය පවුල හා එක් විය යුතු මොහොත යි. සියළු රාජ්‍යයන් බිඳ වැටෙමින් ඉහළින් වඩින සංඝය ගමන් ඇරඹිය යුතු මොහොත යි, මේ. මාගේ දරුවෙනි, මේ හැම කෙනෙක් ම ඇට, මස්, ලේ, නහරවලින් සැදුණු මිනිසුන් බව දැන් ඔබට වැටහිය යුතුයි. ඒ දුකට හවුල් විය යුතුයි, ඒ දුක බෙදා ගත යුතුයි. එය යි, ශුද්ධ වූ සංඝය තුළ තිබිය යුත්තේ. මිනිසා මිනිසා ම ඇනකොටා ගනිමින් සිටී. මේ තමා තෘෂ්ණාව, ආත්මාර්ථය, බල ලෝභිත්වය, බල තණ්හාව. මොවුන්ට වන විපතක මහත."

**2001 ජුලි 31**

"මාගේ දරුවෙනි, මාගේ දූත කාර්යය සඳහා ලහිලහියේ සූදානම් වන්න. මුළු විශ්වය ම පවිත්‍ර කිරීමේ මොහොත පැමිණ ඇත. මෙය යි, මාගේ ශුද්ධ භාවය. ඉදිරිය අති බිහිසුණු යි. ඒ සියල්ලට මුහුණ දීමේ ශුද්ධ වූ ශක්තිය ප්‍රබල ලෙස නුඹලාට ලැබෙන්නේය. ---- මාගේ දරුවෙනි, ගෘහය තැනිය යුත්තේ මෙ ලෙස යි. මා තෝරා ගත් සංඝයේ සියලු ශ්‍රාවක පිරිස ද මොවුන් හා සම්බන්ධ සියල්ලන් ද එකමුතු වී එකමුතුකමේ ගෘහය ලෙස එය ගොඩනැගිය යුතුයි. මේ ගෘහය තනා අවසන් වූ පසු මොවුන් එහි වාසය කරන්නට පළමුව මාගේ ශ්‍රාවක පිරිස ද ශ්‍රමයෙන් ඊට දායක වූ සියල්ලන් ද එක් ව ඒ ගෘහයේ භෝජන සංග්‍රහයක් සූදානම් කොට එකමුතු වෙමින් වළඳින්න. මේ සියල්ල ඉතා ලහිලහියේ සිදු විය යුතුයි. දෙවි වූ ස්වාමින් වහන්සේ වන මම සියල්ල ආශිර්වාද කරමි. ආරම්භ කරන්න, සියල්ල ලැබෙනු ඇත." (එම ගෘහය සෑදීම සඳහා අප සංඝය පෙරමුණ ගත යුතු බව අපට අවබෝධ වූයේ එදින යි.)

**2001 අගෝස්තු 08**

"මාගේ දරුවෙනි, අති බිහිසුණු කාල වකවානුව තුළ මාගේ කාර්යය කිරීම පිණිස මම මාගේ දාස දාසියන්, ශ්‍රාවකයින් තෝරා පත් කළෙමි. දැන් මාගේ වචනයට, අණ පනත්වලට ඇහුම්කන් දෙමින් ඒ ඉටු කරන ආකාරය දෙස මම බලා සිටිමි: මා තෝරා ගත් මාගේ ශ්‍රාවකයින් දෙස ඉතා සොම්නසින් ද ඉතා දොම්නසින් ද බලා සිටිමි. මම ප්‍රේමය ද වන්නෙමි, උදහස ද වන්නෙමි. මට කීකරු වන්නෝ භාග්‍යවන්තයෝ ය. මම දැන් මැයගේ විවාහය පිළිබඳ දිනය නියම කරන්නෙමි. මේ වර්ෂයේ අවසන් මස සවෙනි දින මෙය සිදු විය යුතුයි. මාගේ ශුද්ධ භාවයේ මුල් අඩියර මෙම විවාහය තුළින් ඇරඹේ. තමාගේ සිතැඟි තුළ මගෙන් ප්‍රශ්න නගන්නන්ට පිළිතුරු දීමට මම ඔවුන්ට බැඳී නො සිටිමි. මට කීකරු වන්නන් දෙස මම බලා සිටිමි. ඔවුන්ට මම පිළිතුරු දෙන්නෙමි. මම ශුද්ධ යි, දරුවෙනි, නින්දාව නමැති සළුව පැළඳ ගන්න. එදා මම ප්‍රසිද්ධියේ කුරුසපත් වෙමින් නින්දාවේ සළුව පැළඳ ගතිමි. නුඹලා ද බිය නො වී ඉදිරියට එන්න. මේ බිහිසුණු මොහොත යි."

**2001 අගෝස්තු 09**

"මුළු විශ්වය මවා වදාළා වූ එක ම මැවුම්කරු වන මම නුඹලා කෙරෙහි ඉමහත් සේ පිපාස වෙමි. ධර්මිෂ්ඨ වූ ලෝකයක් මවන්නට මා තුළ කෙතරම් පිපාසයක් ඇද්ද, දරුවෙනි? දැහැමි ව ජීවත් වන්න. එය යි මා නුඹලාගෙන් බලාපොරොත්තු වන්නේ. මාගේ දරුවෙනි, මම ලෝකය ම මාගේ ශුද්ධ භාවය තුළ පවිත්‍ර කිරීමේ කාලය අරඹමි. ඒ පවිත්‍ර කිරීම තුළත් මම ඉමහත් සේ වේදනා විඳිමි. මා මැවූ සුන්දර වූ පිවිතුරු වූ ලෝකය අද අපවිත්‍ර වී ඇත. අද තිබෙන කිතුනු සභාව බොහෝ අඳුරු තැන්වල සිර වී ඇත. ගිහියන් තුළ තිබෙන සරල බැහැපත් කිතුනුකම අද පැවදි, පූජක දරුවන් බොහෝමයක් තුළ නොමැත. මම ප්‍රේමය වෙමි. දැන් මා උදහසට පත් කරන්නන් දෙස මම ද උදහසින් ම බලා සිටිමි. මෙය දැවෙන්නා වූ ශුද්ධ භාවය තුළින් මා ප්‍රකාශ වන කාලය යි."

**2001 අගෝස්තු 13 (සුජීවාගේ නිවසේ දී)**

"මාගේ දරුවෙනි, මැය ව මෙ ලොවට බිහි කළා වූ මව් පියන් ගැන මම ප්‍රසන්න වෙමි. ඔවුහු භාග්‍යවන්තයෝ ය. සැප සම්පත් නොමැති කටුක මාවතක ගමන් කළා වූ දුගී දෙමව්පියන් දෙ දෙනෙකි, නුඹලා. මේ තමා මා නුඹලා තනා තිබෙන තැන. දුගී භාවය නමැති ධනයෙන් පිරී ඔබ හැම කෙනෙක් ම ප්‍රීති වෙත් වා ! මා කෙරෙහි තිබෙන්නා වූ විශ්වාසයේ ධනයෙන් පිරී ඉතිරේ වා ! මාගේ ශ්‍රාවකයෙනි, නුඹලා සැවොම සත්‍යතාවයේ මනුෂ්‍යත්වයේ ධනයෙන් පිරී ඉතිරේ වා ! මම මගේ කාර්යය ලෝ සම්මතය තුළ නො ව මුවා කොට ගෙන යන්නෙමි. මෙය අභිරහස්මක වූ

ගමනකි. මාගේ දාසියගේ විවාහය පවා එලෙස වනු ඇත. එහෙත් මැය සිටින මේ ග්‍රාමයේ ම ඒ ශුද්ධ වු භූමියේ ම ඇයගේ විවාහය සිදු වන්නේය. දුගී යාචකයාට පවා එයට ඇරයුම් කරන්න. මගේ දරුවෙනි, එම මංගලෝත්සව දිනයේ දී ප්‍රීති සන්තෝෂ වන්න. එනමුත් ප්‍රමාණය ඉක්මවා නො යන්න. එදා කානානිය මගුල් ගෙදර සිහියට නගන්න"

(එදිනම 'බෙතෙල්' නිවසේ දි ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) "ශුද්ධ වු ගින්න තුළ නුඹලා යා යුතු ගමන දැන් ඇරඹී ඇත. මේ ශුද්ධ වු ගින්න තුළ ප්‍රීති වන්න. මක්නිසාද, මේ පවිත්‍ර කිරීමේ ගින්න යි. මාගේ දරුවෙනි, නුඹලාට යෑමට ගැඹුරු ගමනක් ඇත. එය සටන් කරමින් යා යුතු ගමනකි. ජේසුස් යන නාමයේ අවිය දරා ගෙන ගමන් කරන්න. එය යි, නුඹලාගේ ශුද්ධ වු අවිය. මාගේ දරුවෙනි, නුඹලා වැනි ආත්ම ශරීරයක් තුළ මාගේ ශුද්ධාත්මානුභාවයෙන් නික්මුන වචනය විශ්වාස කරමින් ගමන් කරන්නා වු නුඹලා ගැන මම අතිශයින් ප්‍රසන්න වෙමි. මම මාගේ ශුද්ධ වු කාර්යය නුඹලා තුළින් කර ගන්නෙමි. දුගී භාවයෙන් නුඹලා පොහොසත් වී සිටින්නහුය. ---- මාගේ දරුවෙනි, මම මෙ ලෙස පවසමි. විවාහක යුවලක පුරුෂයා උන්මත්තයකු නම් බිරිඳට ඔහු සමග විසීමට නො හැක. බිරිඳ උන්මත්තක ද, දැඩි මානසික රෝගි භාවයෙන් පෙළෙන්නී ද සැමියාට එවැනි බිරිඳක් සමග ජීවත් විය නො හැක. සැමියකුට එවැනි බිරිඳක් සිටී නම් සැමියාට එයින් නිදහස් ව නැවත විවාහයක් කර ගත හැකිය. බිරිඳකට එවැනි සැමියෙක් සිටී නම් ඇයට ද ඒ නිදහස ඇත. මා පුත්‍ර ඇන්ටන් ප්‍රසන්නගේ විවාහය මම එනිසා අවලංගු කරන්නෙමි. තව ද මාගේ කාර්යය සඳහා, මට ඇවැසි ධර්ම බීජ වැපිරීම සඳහා මම ඔහුට මාගේ දාසිය ව බාර දෙමි. මේ කාර්යය සඳහා මා මැය ව ඔවුන් ඉදිරියට ගෙන යන්නෙමි. ඒ මොහොතේ මම මැය තුළින් සියල්ල ඔවුන් ඉදිරියේ ප්‍රකාශ කරමි. මේ සියල්ල ලෝකය තුළ විහිළුවකි, මෝඩකමකි, එහෙත් මා තුළ අති ශුද්ධ වු කාර්යයකි. දැන් මම නුඹලා ව වියවුල් කරමින් කළඹමින් පෙරට ම ගෙන යන්නෙමි. මාගේ දරුවෙනි, එඩිතර වන්න."

**2001 අගෝස්තු 19**

"මම මාගේ කාර්යය සඳහා මගේ පවිත්‍ර කිරීමේ ගින්න ඇරඹීමි. එය දැන් ලොව පුරා ළහිලහියේ ඇරඹෙමින් ඇත. සියලු රාජ්‍යයන් බිඳ වැටෙනු ඇත. මා නැවත ලොවට වඩින මොහොත ළංව ඇත. ඉදිරියේ දී හැම උසස් තානාන්තර කඩා බිඳ වැටෙන්නේය. මාගේ පියාණන්ගේ අණ පරිදි මම සියල්ල ඇරඹීමි, පවිත්‍ර කිරීමේ ගින්න තුළ සියල්ල පවිත්‍ර කිරීම පිණිස. ---- මැය ව මම යවන්නෙමි, ඇන්ටන් ප්‍රසන්න විවාහ වී සිටි ඒ භාර්යාවගේ නිවසට, සංඝයේ එඬේරා ද පියා ද මව ද සමග. එතැන දී මම මැය ව ශක්තිමත් කරන්නෙමි, යකඩ කුළුණක් හා සමානව. මාගේ කාර්යය සඳහා මා නුඹලාගෙන් ඉල්ලන්නා වු බොහෝ ඉල්ලීම් නුඹලාට කළ නොහැකි බැරි භාවයන් මම දකිමි. ඒ බැරි භාවයන් තුළ ඒවා ඉටු කිරීම යි, මට ප්‍රසන්න වන්නේ."

## 30

## "මාගේ ශ්‍රාවකයිනි, නුඹලා විශ්වාසයේ, බලාපොරොත්තුවේ ධනයෙන් පිරී ඉතිරේ වා !"

**2001 අගෝස්තු 20**

"මේ කාලය තුළ මාගේ ජනතාවගෙන් මා බලාපොරොත්තු වන්නේ ඔවුන්ගේ හදවත නමැති ගෘහය පවිත්‍ර ව තබා ගැනීම යි. මාගේ කාර්යය සඳහා මා තෝරා ගෙන තිබෙන මැය හා ඇන්ටන් ප්‍රසන්න දෙ දෙනා නිහඬ නිදහස් තැනකට ගොස් තම ජීවිතය අනෙකා සමග මුළුමනින් බෙදා ගනිමින් හිස් විය යුතුයි. ඉන් පසු දැහැමි සිතුවිලිවලින් නුඹලා පූර්ණ කරන්නෙමි. මාගේ දරුවෙනි, සියල්ල පවිත්‍ර කිරීමේ මොහොත ඇරඹෙමින් ඇත. සියල්ල කඩා වැටෙමින් ඇත. දෙවියන් කොහේ දැයි අසන අයට පිළිතුරු දිය යුත්තේ අන්න එලෙස යි. ඉදිරියේ දී සාගතය පැමිණෙන්නේය: වසංගත පිරී ඉතිරෙන්නේය. මාගේ දරුවෙනි, මා හා රැඳෙන්න. මා හා විශ්වාසයෙන් ගමන් කරන්න. මාගේ වචන අසා ඒ වචනය තුළ ජීවත් වන්නෝ රැකෙති: ඔවුන්ගේ දරුවෝ ද ගැළවෙති. දෙවි වු ස්වාමින් වහන්සේ මේ කාලයේ නුඹලාට ඉතාමත් ප්‍රේම කරන්නාක් මෙන් ම උදහස ද එතුමන් තුළ පවතින බව දැන ගන්න."

**2001 අගෝස්තු 21**

"සියල්ල මවා වදාළා වූ මුළු විශ්වයේ ම ගැළවීම දායකයාණෝ මම වෙමි. 24 වන සිකුරාදා සවස ඇය එහි යන තෙක් හෙට උදෑසන සිට මම මැය ව නිරාහාර ව තබන්නෙමි."

**2001 අගෝස්තු 23**

"මුළු විශ්වය පුරා මාගේ උදහස ඇවිළෙමින් ඇත. සියල්ල කඩා බිඳ දමමින් මුළු විශ්වය ම පවිත්‍ර කරමින් මා තනන, මා තබන ස්ථානයේ සිටින්නට කැමති වන තෙක් මම සියල්ලන් පවිත්‍ර කරන්නෙමි. මාගේ දරුවෙනි, මම නුඹලා අති බිහිසුණු මාවත්වල ගෙන යන්නෙමි. නුඹලාට පැවරෙන ඉදිරි දූත මෙහෙය උදෙසා මම නුඹලාට දෙන පන්නරය යි, ඒ. මැය හෙට දිනය තුළ සංඝයේ එඬේරා ද සංඝයේ පියා ද මව ද සමග ඒ ගෘහයට යා යුතුයි. මැය තුළ තිබෙන බැරි භාවය මම දකිමි. මම මැය කෙරෙහි ප්‍රසන්න වෙමි. මක්නිසාද, තමාගේ දුබල භාවය දකිමින් මට මොරගසමින් වැළපෙන ආකාරය මම දකිමි. ඒ තුළ මට ඉඩ දීම ගැන මම ප්‍රසන්න වෙමි. මම දැන් නුඹලා ව කළඹමින් වියවුල් කරමින් ශුද්ධ වූ මිටියාවත ඔස්සේ ගෙන යන්නෙමි. බොහෝ දෙනාට මාගේ මේ ක්‍රියාවලිය විහිළුවකි. සැබවින් ම මෙය ගැඹුරු අභිරහසකි. එහි ගැඹුරු පත්ලට ම මම නුඹලා ගෙන යන්නෙමි. මාගෙන් දුරස් ව සිටින ජීවිත පසුපස මම ලුහුබඳින ප්‍රේමයක් ලෙස ගමන් කරමි. එහෙත් ඔවුන් මාගෙන් තවත් දුරස් වන්නේ ද ඔවුන්ට වන විපතක මහත. ඒ මාගේ උදහස යි. මාගේ ජනතාව කෙරෙහි මම පිපාස වෙමි. මා සනසන්නකු මට හමු වන තෙක් මම පිපාසයෙන් බලා සිටිමි. ඒ සඳහා යි, ඉහළින් වඩින සංඝය මා තෝරා පත් කොට ඇත්තේ. මෙය මා විසින් ලොවට මුවා කරමින් ගෙන යන අභිරහස්මක ගමනකි."

**2001 අගෝස්තු 24**

(ඇන්ටන් ප්‍රසන්න විවාහ වී සිටි බිරිඳ හා ඇගේ මව අමතා සුජීවා තුළින් ජේසු සමිඳාණන් පැවසූ වදන්වලින් උපුටා ගත් වැකි කීපයකි, මේ.) "සියල්ල දන්නා දෙවිඳාණන් වන මම මාගේ කාර්යය සඳහා මැය තෝරා ගතිමි. මම මැය ව දිරි ගන්වමින් මෙහි ගෙනාවෙමි. මා ඇයට අණ කළ නිසා ඇය මරණය වැළඳ ගන්නට පවා සූදානම් ව මෙහි පැමිණ ඇත. ඇන්ටන් ප්‍රසන්න ව මා මැයට බාර දෙන මොහොතේ මැය වැළපුණාය. ඔබ ගැන ද මට පවසමින් මැය වැළපුණා, දියණිය. එහෙත් මාගේ ශුද්ධ භාවය ඉදිරියේ මැය අසරණ යි. මැය මාගේ කැමැත්ත ඉටු කරන්නට බැඳී සිටින්නිය. දියණිය, මට අවශ්‍ය කාර්යය කිරීමට ඉඩ දෙන්න. ඇන්ටන් ප්‍රසන්න ව ඔබ නිදහස් කරන්න. ඔබ තුළ දැවෙන වේදනා මම දකිමි. ඔබට ඔබගේ දියණිය අවශ්‍ය නම් ඔබ ළඟ තබා ගන්න. ඔබගේ දියණියට ඔබ ආදරය කරන තාක් ඇය ඔබට ලැබේවි." (ඇයගේ මව අමතා) "ඇන්ටන් ප්‍රසන්න ව මෙම බැඳීමෙන් නිදහස් කර ඔබගේ දියණිය ව ඔබ නැවත බාර ගන්න. මවක් හැටියට විඳින වේදනා මට පුද දෙන්න. මරියාවන් දෙස බලන්න. එදා ඇය විඳි අවමාන්නය ගැන සිතන්න. මාගේ දාසිය වන මැය මෙ තැන් පටන් ඒ නින්දාවේ මාවතට පිවිසෙන්නිය. ඒ මාගේ කාර්යයට ඇය ඉඩ දීම නිසා යි."

**2001 අගෝස්තු 30**

"දරුවෙනි, මේ ගමන ඉතා ගැඹුරු යි. පළමු ව මම මොවුන් දෙ දෙනා හිස් කරන්නෙමි. ඉන් පසු දැහැමි සිතිවිලිවලින් පූර්ණ කරන්නෙමි. එලෙස ම ඉහළින් වඩින සංඝයට අයත් ඔබ හැම කෙනෙක් ම ඉදිරි කාලය තුළ හිස් ව, විවෘත විය යුතුයි. ---- මැය ඇන්ටන් ප්‍රසන්න මුහුණ දෙන ගැටළු දැන් තේරුම් ගන්නා බව, ඔහුගේ ආදරය නොලැබුණත් ඔහුට ආදරය කරන බව, කිසි සැප සම්පතක් බලාපොරොත්තු නො වන වග, හැම දුකක් ම ප්‍රීතියෙන් දරා ගන්නා බව මා දියණිය සුජීවා ඇගේ යැදුම තුළ මට පැවසුවාය. මැයගේ ඒ වදන් අසා මම මහත් සේ ප්‍රීති වීමි. මෙය යි, හැම ජීවිතයකින් ම මට ලැබිය යුතු තිළිණය. ඒ සියල්ලෙන් හිස් ව දුක වේදනාව ප්‍රීතියෙන් වැළඳ ගැනීම යි."

**2001 සැප්තැම්බර් 05**

"මම ප්‍රේමයේ දෙවිඳාණන් නිසා අනාදියේ සිට සියල්ල බලා සිටියෙමි. සියල්ල ප්‍රේමයෙන් ඉවසිමි. දැන් මාගේ උදහස් වීමේ කාලය යි. දැන් මාගේ පියාණන්ගේ මුළු විශ්වය ම පවිත්‍ර කිරීමේ මොහොත යි. බාලයන්ගෙන් අනාවරණය වෙමින් සියල්ල ප්‍රකාශ කළේ විශ්වය ම පවිත්‍ර කිරීම පිණිස යි. ---- දැන් මාගේ දාසිය ඇන්ටන් ප්‍රසන්න සමග ජීවිතය මුළුමනින් බෙදා ගැනීම, හිස් වීම ගැන මම අතිශයින් ප්‍රසන්න වෙමි. මම දැන් මාගේ ශ්‍රාවකයින්ට තරයේ අණ කරමි, සංඝයේ සියල්ලන් හා ජීවිතය බෙදා ගන්නා ලෙස. සංඝයේ සැම එක ම මොහොතක එක්රැස් වී සියලු ශ්‍රාවකයින් ඉදිරියේ ජීවිතය බෙදාගත යුතු යි. එතැන මම ද වැඩසිටිමි. පළමුව එඬේරා ආරම්භ කළ යුතුයි, ජීවිතය ඔවුන් ඉදිරියේ බෙදා ගැනීමට. ඉන් පසු සංඝයේ එකිනෙකා, ශ්‍රාවකයින් සියලු දෙනා ඉදිරියේ විවෘත විය යුතුයි. එවිට එකිනෙකා පිළිබඳ සියලු අඳුරු ආකල්ප දුරු වන්නේය."

"තව ද මම අණ කරමි, ඒ සියල්ල එතැනින් හිස් කර ගත්තාට පසු කිසිවකු නැවත එය සිත් හි රඳවා ගැනීම මහා පාපයකි. හිස් වීම පිණිස යි ඒවා මෙ තැන හලන්නේ. කිසිවෙක් කිසිවක් එයින් අහුලා ගත යුතු නැත. ඒ සියල්ල පහව යන්නට හැරිය මැනව. මක්නිසාද, මම ශුද්ධ භාවයෙන් එතැන වැඩසිටිමි. ඒ මොහොතේ කිසිවෙක් තමාගේ කිසිම පාප කිළිටක් පවා නොසඟවා හෙළි කළ යුතුයි. එය සඟවා ගෙන එතැනින් ඉවත් ව යනවා කියන්නේ මාගේ ශුද්ධ භාවය ලුහුබඳින මොහොත යි. එයට හසු වුවහොත් අති භයානක යි. එතැන ම හලා එතැන ම අවසන් කළ යුතු මොහොත යි. මේ පවිත්‍ර කිරීම තුළ දී ඔවුන් අවංක ව හෙළි කරන්නා වූ සියල්ලෙන් කිසිවක් කිසිවකු හෝ ඇහිඳ තබා නොගත යුතුයි. එලෙස වුවහොත් මාගේ උදහස නුඹලා ද නුඹලාගේ දරුවන් පිට ද පැමිණෙන්නේය. මෙය සම්පූර්ණයෙන් හිස් ව නිදහස් විය යුතු මොහොත යි. මාගේ දරුවෙනි, මුළු ජීවිත රටාව ම විවෘත කොට දිග හැරීම යි නුඹලාගේ ජීවිතයේ අති වැදගත් මොහොත. මේ ශ්‍රාවක පිරිස ව පවිත්‍ර කිරීමට මුල පුරන මොහොත මෙය යි. සියලු ශ්‍රාවකයන් ඉදිරියේ තමා කළ පුංචි පාපය පවා බිය සැක, ලජ්ජාව දුරු කොට හෙළි කරන්න. ඉන් පසු නුඹලා තුළ සාමයේ ප්‍රීතියේ නිදහස් සිතුවිලි ඇති වන්නේය. එතැන් පටන් නුඹලා මුහුකුරා ගිය අන් සියලු දෙනාට ම ආදර්ශවත් ව ගමන් කරන එඩිතර ශ්‍රාවක පිරිසක් වනු ඇත. මෙය පවිත්‍ර කිරීමේ මොහොතකි: එකිනෙකා තේරුම් ගැනීමට සලස්වන මොහොතකි: එකිනෙකා හා සහෝදරත්වයෙන් බැඳෙන්නට සලස්වන මොහොතකි."

**2001 සැප්තැම්බර් 08**

"මම පවිත්‍ර කිරීමේ ප්‍රේමාන්විත වූ ශුද්ධ භාවය වෙමි. මම නුඹලාගෙන් ඉල්ලන්නේ දුගී භාවයේ ධනයෙන් පිරෙන්නට යි, ධන සම්භාරයෙන් නො පිරෙන්නට යි. මාගේ ශ්‍රාවකයිනි, නුඹලා විශ්වාසයේ බලාපොරොත්තුවේ ධනයෙන් පිරී ඉතිරේ වා ! මිල මුදල පිළිබඳ ධනයෙන් පිරෙන්නට මා හා ගමන් කරන ලෙස මම කිසිවකුට ඇරැයුම් නො කරමි. ඒ තුළ අධිපතියා සාතන් ය. මාගේ ශ්‍රාවකයින් වන නුඹලාගේ සියලු ආදායම් මාර්ග කඩා ඉහිරවමින් මම නුඹලා ව දිළිඳු භාවය කරා ගෙන යන්නෙමි. මා හා ගමන් කරන විට මිල මුදල් ලැබේ ය යන සිතුවිල්ල පවා මාගේ ශ්‍රාවකයෙක් තුළ නොතිබිය යුතුයි. මාගේ ශ්‍රාවකයින් පවිත්‍ර කරමින් නියම සත්‍යය කරා ගෙන යන්නෙමි."

**2001 සැප්තැම්බර් 13**

"මුළු ලෝකය පවිත්‍ර කිරීම ඇරඹෙමින් ඇත. බොහෝ ජීවිත මිහිතලයෙන් සමු ගනු ඇත, මාගේ පවිත්‍ර කිරීම තුළ. මට මොහොතකින් සියල්ල වෙනස් කළ හැකියි. ---- එඬේරා විවාහ මංගල්ලය පිළිබඳ සියලු කටයුතු සැලැසුම් කර ඔවුනොවුන් හා බෙදා ගත් ආකාරය ගැන මම සතුටු වෙමි. මම තව ද එක ඉල්ලීමක් කරමි. එදින ශුද්ධ වූ ගෘහය තුළ සිදු විය යුතු සියල්ල සිදු කොට නුඹලා සියල්ලන් එක් ව ඔබේ දෙවි වූ ස්වාමින් වහන්සේට තුති පිදීමේ මෙහෙයක් පැවැත්විය යුතුයි."

**2001 සැප්තැම්බර් 15**

"මම නුඹලාට පෙරටුව ගමන් කරමි. මාගේ සැලසුම් නුඹලාගේ සැලසුම් නො වෙයි, නුඹලාගේ සැලසුම් මාගේ සැලසුම් නො වෙයි. මාගේ උදහස මුළු ලෝකය පුරා ක්‍රියාත්මක ව පවතී. සියලු රාජ්‍යයන් බිඳ වැටෙමින් ඇත. සියල්ල පසුපස මම හඹාගෙන එමි. නුඹලා හෙට දිනයේ යොදා ගෙන තිබෙන්නා වූ පවිත්‍ර කිරීමේ මොහොතේ මම එතැන නුඹලා මැද වැඩසිටිමි. එහි දී යමෙක් විවෘත නො වුනොත්, යමෙක් අන් අයගේ වැරදි තම මනසේ රඳවා ගතහොත් මාගේ උදහස ඔවුනොවුන් පසුපස ලුහුබඳිනු ඇත. මේ තමා සැබෑ ශ්‍රාවකයින් තුළ තිබිය යුතු පවිත්‍ර වීම: ඉහළින් වඩින සංඝය පවිත්‍ර කිරීමේ මොහොත."

**2001 සැප්තැම්බර් 17**

"මාගේ දරුවෙනි, ගෙවී ගියා වූ ඊයේ මට අති වැදගත් දිනයකි. මාගේ ශ්‍රාවකයින්ගේ ජීවිත පාපොච්චාරණය දෙස මම සවන් යොමු කළෙමි. මා පුත්‍ර එඬේරා ඇතුළු පිරිස ගැන මම ප්‍රසන්න වෙමි. මා පැවරූ දූත කාර්යය සඳහා ඔබ ශ්‍රාවක පිරිස සමග එඩිතර ව ගමන් කරන ආකාරය මම බලා සිටියෙමි. මම ඔබ හැමට තිළිණයක් ලෙස මා පුත්‍ර ඇන්තනි ව මාගේ ප්‍රඥාවෙන් පූර්ණ කොට එඬේරකු ලෙස දුනිමි. ඔහු ප්‍රතික්ෂේප කරන්නා මා ප්‍රතික්ෂේප කරයි. ඔහුට ඇහුම්කන් දෙන්නා මට ඇහුම්කන් දෙයි, ඔහුට ආදරය කරන්නා මට ආදරය කරයි, මාගේ පියාණන්ට ද ආදරය කරයි. මෙය යි මා තෝරා දී තිබෙන තැනැත්තා තුළ තිබෙන්නා වූ විශේෂත්වය. ---- මොවුන්ගේ විවාහයේ දි එඬේරා විසින් තීරණය කළ සියල්ල එලෙස ම සිදු වන්නේය. මා යෝජනා කළ ප්‍රශංසා මෙහෙය නිසා තේ පැන් සංග්‍රහයට බාධා කර නො ගන්න. තේ පැන් සංග්‍රහය තිබිය යුතුය. එය ද එකමුතුකමකි. විනාඩි කීපයක ප්‍රශංසාවක් සෑහේ." (සැප්තැම්බර් 11 වන දින සුජීවාගේ නිවසේ දි ඇයගේ ඥාතින් සමග විවාහ මංගල දිනය පිළිබඳ කරුණු මම

සැලසුම් කළෙමි. එදින දිව්‍ය පූජාවෙන් පසු පැමිණි සියල්ලන්ට දේවස්ථාන භූමියේ ම තේ පැන් සංග්‍රහයක් පැවැත්වීමට මම යෝජනා කළෙමි. එවැන්නක් කිරීමේ අපහසුතා මට පසු ව අවබෝධ විය. එනිසා ජේසු සමිඳුන් ප්‍රශංසා මෙහෙයක් කරන්නැ යි පවසන විට මම සතුටු වීමි. එනිසා තේ පැන් සංග්‍රහය කපා හැරිය හැකි වෙතැ යි මට සිතිණි. එහෙත් ජේසු සමිඳුන්ගෙන් එයට ඉඩක් නො ලැබිණි.)

**2001 සැප්තැම්බර් 21**

"මාගේ දරුවෙනි, ඉදිරි කාලය අති බිහිසුණු ය. මේ ශුද්ධ භාවයේ පවිත්‍ර කිරීමේ මොහොත යි. මුළු ලෝකය ම මට එක දේශයකි. එහි අද විනාශ විය යුතු තැන් විනාශ වෙමින් ඇත. පෞරාණිකයාණන් වන මාගේ ශුද්ධ භාවයේ පවිත්‍ර කරණය තුළ ජනතාවගෙන් තුනෙන් දෙ කොටසක් මිය යනු ඇත. තුනෙන් එක කොටසකි, ඉතිරි වන්නේ. ඒ යහපත කරා ගමන් කරන ජනතාව ය. ඉතිරි වන ඒ කොටස මගේ ශුද්ධ භාවයේ ගින්නෙන් පවිත්‍ර කරමින් දැහැමි යුගය කරා ගෙන යන්නෙමි. මාගේ දරුවෙනි, ශුද්ධ ලියවිල්ලේ සඳහන් සියල්ල සත්‍යයි. දිවැසිවරුන් පැවසූ සියල්ල සිදු වනු ඇත. මාගේ දාසිය හා දාසයා තුළින් මා පැවසූ සියල්ල සත්‍යයි. අනාගතයේ මා විසින් එවන චරිතයක් විසින් මේ සියල්ල ශුද්ධ බයිබලයේ අග හිස් පිටුවේ සිට සටහන් කරනු ඇත."

**2001 සැප්තැම්බර් 25**

"මාගේ දරුවෙනි, වියළි බිම ජලයට පිපාස වන්නාක් මෙන් මම නුඹලා කෙරෙහි පිපාස වෙමි. පාපයෙන් පිරී ඉතිරී සිටින කෲර මිනිසුනි, මනස්ස්ථාපනය වන්න. නුඹලාගේ සිත් හැරී පාපයෙන් ගැළවීම මාගේ පිපාසය සංසිඳවීමකි. මා වෙතට එන්න, මාගේ දරුවෙනි. මිල මුදලට තිබෙන තෘෂ්ණාව, කාම තෘෂ්ණාව, බල ලෝභිත්වය මුළුමනින් ජය ගන්න, මාගේ දරුවෙනි. ඉදිරිය අති බිහිසුණු යි. විනාශය පිළිබඳ මා පැවසූ වදන් ඉටු වන තුරු බලා සිටින්නන්ට වන විපතක මහත. සියල්ලන් ගැළවීම පිණිස මම මෙ ලෙස මාගේ අනාවරණයන් අනාදියේ පටන් තෝරා ගත් මොවුන් මගින් ප්‍රකාශ කරමි. මම නුඹලා නිරන්තරයෙන් කළඹමින්, වියවුල් කරමින් මාගේ අභිරහස්මක ශුද්ධ වූ මාවතේ ජයග්‍රාහි ගමනාන්තය කරා නුඹලා ගෙන යමි. එකමුතුකමේ ගෘහය ගොඩනැගීම ඇරඹෙන්නා වූ හෙට දිනය ගැන මම ප්‍රීති වෙමි. ආරම්භ කරන්න, මම ආශිර්වාදය වෙමි. මහා ජල මැද වුවත් පිරී ඉතිරී යන්නා වූ ප්‍රේමයේ ආශිර්වාදය ඇත. මම නුඹලාගේ කැපවීම, එඩිතර භාවය නිරන්තරයෙන් පරීක්ෂණය කරමි. මා නුඹලාට දී තිබෙන එඬේරා මා හා තර්ක කරයි, වාද කරයි. මම බලා සිටිමි. පුත්‍රය, නුඹට මා දී ඇති ප්‍රඥාවෙන් ම ඔබ නිසි පිළිතුර සොයා ගත්තෙහිය. පුත්‍රය නො කැළඹෙන්න, ඔබ කැළඹෙනවා කියන්නේ සියල්ල වියවුල් කර ගැනීම යි."

(එකමුතුකමේ ගෘහය ගොඩනැඟීම පිළිබඳ වගකීම අප සංඝය මත පැවරී ඇති බව දුටු මොහොතේ ඉඩම මැන ඔප්පු සෑදීමෙන් ඊට මුල පිරුවෙමු. එහි මතුපිට පස නුසුදුසු තත්ත්වයක පැවති නිසා අඩි දෙකක් පමණ ගැඹුරට පස ඉවත් කළෙමු. නිවසේ සැලැස්ම අනුමත වී අත්තිවාරම දමන්නට අවසර ලැබුණේ සැප්තැම්බර් අග දී ය. ඒ මොහොත වන විට මාස කීපයක් දිවයින පුරා පැවති දැඩි නියඟය අවසන් කරමින් වැසි ලකුණු පහළ විය. මම මෙ ලෙස යාච්ඤා කළෙමි. "අත්තිවාරම දාන්න එක සතියක් ඇති, ජේසු. රටට ම වැස්සට කමක් නැහැ, මේ පැත්තට එක සතියක් වහින්න දෙන්න එපා." කෙමෙන් වැසි ඇද හැලෙන්නට විය. මහ වැසි මැද මා එහි යන විට එතැන පොකුණක් මෙනි. මැඩියෝ ගී ගයමින් සිටියහ. "ජේසු ඔයාට ඕනැ නැත්නම් ඔයා නිකම් ඉන්නැ" යි මම කීවෙමි. එවිට මට හැඟිණි, එකමුතුකමේ ගෘහය සාදන්නට පළමු අප ජීවිත නමැති ජීවමාන දේවස්ථාන නිසි ලෙස සාදන්නට ජේසු සමිඳුන්ට අවශ්‍ය වී ඇති බව; දෙවියන් වහන්සේට සියල්ල කළ හැකිය, යන සත්‍යය අපගේ ආත්මගත කරන්නට අවශ්‍ය වී ඇති බව. සුනිමල් ඉතා එඩිතර ලෙස සැප්තැම්බර් 26 වන දින ඒ ජල කඳ මත ගෘහය සඳහා ලණු ඇද ලකුණු කළේය. මෝටරයකින් ජලය ඉවත් කරමින් ඔක්තෝබර් 1 අත්තිවාරම දැමීම ඇරඹිණ. එය සාලයක්, කාමර තුනක, මුළුතැන් ගෙයක්, නාන කාමරයක් සහිත නිවසකි. එය මාස දෙකකින් සාදා නිම කරන්නේ කෙසේ ද? එය අපට ගැටළුවක් විය. අපගේ ගමන් මඟ මෝඩකමක්, පිස්සුවක් ලෙස සියල්ලෝ ම වාගේ දකිති. එනිසා කිසිවකුගේ උපකාරයක් අපට නැත. අපි රාජ්‍යය නො වන සංවිධාන කිසිවක් නො හඳුනමු, ඒවා හැඳින ගන්නට අපට අවශ්‍ය ද නැත. විදේශීය මිතුරන් ද අපට නැත. අප සංඝය ද දුගීන්ගේ එකතුවකි. ඒ මොහොතේ අපේ සංඝයේ ද නො වූ සොයුරෙක් තම රැකියාවෙන් අස් වූ විට ලැබුණු මුදලින් සියයට දහය වෙන් කර මා අත තැබිය. නිවෙසට අත්තිවාරම දැමීමේ දි රුපියල් හැට දහසක් පමණ වූ එම මුදල අපට සවියක් විය. ඔක්තෝබර් 1 සිට දිගට ම වැඩ කළොත් පමණි, ගෘහය නිමවා දෙසැම්බර් 2 භෝජන සංග්‍රහය පැවැත්විය හැකි වන්නේ. දිගට ම සති තුනක් පමණ වැඩ කරන විට එක් වූ සියලු මුදල් අවසන් විය. කලින් මුදල දුන් සොයුරා ම රුපියල් ලක්ෂයක් ණයට දෙන්නට කැමති විය. එය ඔහුගෙන් ඉල්ලා

ගන්නට මා යන විට ඔහු නිවසේ නො වීය. ඔහුගේ බිරිඳ මෙසේ පැවසුවාය. "අපි මුළු මුදල ස්ථාවර තැන්පතුවක යෙදුවා. අපට පුළුවන් එයින් සියයට අසූ පහක් ණයක් අරගෙන දෙන්නට." මට සිතිණි, මෙය නො වේද දේව සැලැස්ම. එයින් සියයට පනහක්, රුපියල් ලක්ෂ තුනක් ණයක් වශයෙන් ලබා දෙන ලෙස මම කීවෙමි. එය ඉටු විය. මාස දෙකකින් එකමුතුකමේ ගෘහය සාදා නිම වූයේ රුපියල් ලක්ෂ තුනක ණය මුදලක් සංඝයට ඉතිරි කරමිනි.)

## 31

## "මා හා ගමන් කරන විට නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගෙන යා යුතුයි."

**2001 සැප්තැම්බර් 28**

"විශ්වය ම කැළඹෙන මොහොත ළං ව ඇත. මිනිසුන් එකිනෙකා ඇණකොටා ගන්න මොහොත ළං ව ඇත. ඉදිරි කාලය අති බිහිසුණු ය. මාගේ දරුවෙනි, ඔබ හැම කෙනෙක් ම මාගේ නාමය තුළ රැඳෙන්න. මට ඉඩ දෙන්න, එවිට මම බොහෝ දේ කරන්නෙමි. ඔබ සිත තුළ මට ඉඩ දෙන්න, එවිට මම නුඹලා රකින්නෙමි."

**2001 ඔක්තෝබර් 02**

"දිනෙන් දින මොහොතින් මොහොත පාපයට ඇලුම් කරන ජීවිත වැඩි වන ආකාරය මම දකිමි. ඉදිරි කාලය අති බිහිසුණු යි. මනස්ස්ථාපනය වන්න මාගේ දරුවෙනි, ගැළවීම ලබා ගන්න. දැහැමි යුගය ආරම්භ කිරීම පිණිස මා හා ගමන් කරන්නට මම ජනතාවක් සූදානම් කරමින් සිටිමි. ඉහළින් වඩින සංඝය තෝරා ඇත. සමිඳු එඬේරා පූජක සංඝය අරඹා ඇත. මාගේ මුලසුන ආරම්භ කිරීම පිණිස එකමුතුකමේ ගෘහය ගොඩනැගෙමින් ඇත. ඉදිරියේ තව බොහෝ කාර්යයන් මට ඇත."

**2001 ඔක්තෝබර් 05**

"මාගේ දරුවෙනි, මම මහත් සේ පිපාස වෙමි. මට සැනසීම දෙන ජීවිත බවට පත් වන්න, මාගේ දරුවෙනි. මා හා ගමන් කරන හැම කෙනෙකුට ම දුක වේදනාව උරුම වනු ඇත. ඒ තුළ මහා ප්‍රීතියක් ඇත. එය ශුද්ධ වූ ප්‍රීතියකි. ---- අද ලෝ සම්මත කිතුනු සභාව තුළ අභිරහස්මක වූ වියවුලක් හට ගෙන ඇත. එය යම් දිනෙක හෙළි වෙනු ඇත. එය ද මාගේ ක්‍රියාවලිය මෙන්, මා නුඹලා මුවා කර ගනිමින් ගෙන යන්නාක් මෙන් ඔවුන්ගේ ලෝ සම්මත කිතුනු සභාව තුළ රහසිගත ව ඉදිරියට ගෙන යමින් ඇත. ඒවා හෙළි කරන මොහොත ළං ව ඇත. එය මහා වියවුලකි: මහා බල තණ්හාවකි. මහා කාරුණික දෙවිඳාණෝ මම වෙමි. ඉතාමත් උදහස් වන දෙවිඳාණෝ මම වෙමි. විශාල ජනකායකගෙන් මාගේ ශ්‍රාවකයින් වීමේ වරම් ලත් නුඹලා ඒ භාග්‍යවන්ත මොහොතින් ඈත් ව නො යන්න. මම නුඹලාගෙන් බොහෝ දේ ඉල්ලමි. එයට වන්දි ගෙවීම පිණිස මා නුඹලාට දෙ ගුණ තෙ ගුණ වන්නට ආශිර්වාද කරන මොහොතක් එනු ඇත. මාගේ දරුවෙනි, මා හා ගමන් කරන විට නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගෙන යා යුතුයි: එයට එඩිතර ව මුහුණ දිය යුතුයි. ---- කුරුසියේ එල්ලී සිටින මිනිසා දෙස බලන්න. මේ මොහොතේ ද මාගේ වණ කැළැල් බොහෝ සේ පැරෙමින් ඇත. මේ මොහොතේ ද ඉමහත් සේ පාපයට කාමයට ඇලී සිටින ජීවිත මම දකිමි. මම මහත් සේ වේදනා විඳිමි. ඔවුන් උදෙසා නුඹලා කැපවෙන මෙන් මම ඉල්ලා සිටිමි, කාරුණික ව. ඔවුන් උදෙසා කැපකර ගනිමින් නුඹලා කරන මොරගැසීම ගැන මම ප්‍රසන්න වෙමි. සියල්ල පුද දෙමින් මා හා ගමන් කිරීම ගැන මම ප්‍රසන්න වෙමි. ඔබ තුළ තිබෙන්නා වූ ශාරීරික මානසික ආත්මික සියලු රෝගී තත්ත්වයන් කල්වාරිය මත නුඹලා වෙනුවෙන් හෙලුවා වූ ශ්‍රී ලෙයට යට කරන්න. හිස සිට දෙ පතුළ දක්වා එය ගලා ගලා යන ආකාරය සිහි කරන්න."

**2001 ඔක්තෝබර් 11**

"අද මුළු කිතුනු සභාව ම සෙලවෙන සභාවක් වී ඇත: පූජක පුත්‍රයින් අතරින් මට කැප වූ අවංක සිත් ඇත්තෝ ස්වල්ප දෙනෙක් වෙති. යමෙක් මට සේවය කරන්නේ ද මම ඔහුට සේවය කරමි. අද ඉතා සුළු පිරිසකි, මට අවංක ව සේවය කරන පූජක දරුවන් සිටින්නේ. සියල්ල අත්හැර අවංක ව කැප වී මට සේවය කරන පූජක දරුවන් මම දකිමි. ඔවුන් මට සේවය කරන්නට කරන්නට ඔවුන්ට බාධක වැඩි යි, පරීක්ෂා වැඩි යි: ඔවුන් ව පොළඹවන්නට නොයෙක් පරීක්ෂා මේ කාලය තුළ ඔවුන් ඉදිරියට එමින් ඇත. මට සේවය කරන, මාගේ ජනතාවට මඟ පෙන්වන මාගේ පූජක දරුවෙනි, තව තවත් අවංක ව කැප වී සේවය කරන්න: නුඹලාගේ බැරි භාවයන් මට පුද දෙන්න. ඒ බැරි භාවයන් තුළ ද ඒවා බිඳ ගෙන යාම තම යි, නුඹලාගේ ශුද්ධවන්ත භාවය. අද බොහෝ පූජකවරු සභාව තුළ සෙලවෙමින් සිටිති. සභාව දෙදරීමේ කාලය

ළං ව ඇත. මට අවංක ව කැප වී සේවය කරන පහළ සිටින පූජක දරුවෙනි, උසස් තැන්වල සිටින්නන්ගෙන් නික්මෙන හැම වදනක් ගැන ම නුඹලා ප්‍රවේශම් වන්න, විශේෂයෙන් මේ කාලය තුළ. අවංක ව මට සේවය කරන පූජක දරුවෙනි, නුඹලාගේ මුළු ශරීරය පුරා මාගේ ජීව රුධිරය හෙලන්නෙමි. නුඹලා මාගේ ශුද්ධ වූ රුධිරයෙන් පවිත්‍ර ව සිටින්න. නුඹලාගේ ඇතුළු සිතෙහි නුඹලාගේ විශ්වාසයේ පියාණන්ට නමස්කාර කරන්න, නිරන්තරයෙන්. මම නුඹලා අනාථ නො කරමි. මට කැප වී අවංක ව මට සේවය කරන මාගේ පූජක දරුවෙනි, නුඹලාගේ පූජා වීමේ ඒ සක්‍රමේන්තුව තුළ විවාහ වීමට නුඹලාට මාගෙන් අවසරයක් නැත. එයට කාගෙන් අවසර ලැබුණත් එය මාගෙන් නො වන නිසා එයට හසු නො වන්න."

**2001 ඔක්තෝබර් 13**

"මාගේ දාසියගෙන් මා ඉල්ලූ දෙය ඉටු කිරීම සඳහා ඇය බොහෝ සේ මරණය අත්දකිමින් සිටින්නිය. ඇය පමණක් නො වෙයි, මාගේ පුත්‍ර දාසිය වන ඇන්ටන් ප්‍රසන්නගේ අත්දැකීම ද එය යි. ඔවුන් තම කැමැත්ත, තම ආශා ඉටු කර ගන්නට යන ගමනක් නො වන බව නුඹලාට වැටහිය යුතුයි. ඔවුහු මට ප්‍රසන්න මාගේ කිකරු දරුවෝ වෙති. ඔවුහු එකිනෙකා විරසක නො වෙති. මාගේ ආශිර්වාදය ඔවුන් පිට ඇත. මාගේ ඉල්ලීම තුළ මරණය අත්දකින්නා වූ මොවුන් දෙ දෙනාට මම අතිශයින් ආදරය කරමි. මිනිසුන්ට බිය නො වන්න, මාගේ ඉල්ලීම ඉටු කරන්න, මාගේ දරුවෙනි. ආශාවට, තම කැමැත්තට, අයිතිවාසිකම්වලට මරණය අත්දකිමින් ඉදිරියට යන්න. ඔබට රිදෙන තැන් ඇති. ඒ සියල්ල මට පුදන්න. ඒ රිදීම් සියල්ල පාපි ජනතාව වෙනුවෙන් මට පුද දෙන්න. ඒ සියලු නින්දාවන් එක්තරා මොහොතක නුඹලාට ප්‍රීතියක් වනු ඇත. මාගේ දාස දාසියනි, මාගේ ශ්‍රාවකයිනි, නොසෙල්වෙන පර්වතයක් සේ සිටින්න, ඔබ හැම කෙනෙක් ම. මම නුඹලාට පෙරටුව එමි. මට අවශ්‍ය සියල්ල මම නුඹලා තුළින් ඉටු කරමි, දැහැමි ලොව සැදීම පිණිස."

**2001 ඔක්තෝබර් 16**

"මාගේ උදහස ලොව හතර කොණින් ම ඇරඹී ඇත. එය සියල්ලන් පසුපස ලුහුබඳිනු ඇත. මාගේ දරුවෙනි, මගේ උදහසට ලක් නො වන්න. කඳු හෙල් කඩා වැටෙමින් මහා ඝෝෂා මැද සියල්ල පවිත්‍ර කරන මොහොත ඉතා ආසන්න ය."

**2001 ඔක්තෝබර් 25**

"වසරේ අවසන් මස සතර වන දිනට මම මේ විවාහයට දින යොදන්නෙමි. එනමුත් දෙ දෙනා එක ම මාංගයක් වීමේ දිනය සය වැනි දින වනු ඇත."

**2001 ඔක්තෝබර් 27**

"මා පුත්‍ර ඇන්තනි, මේ වසර අවසන් වීමත් සමග ඊ ළඟ ප්‍රකාශනය ආරම්භ කරපන්න.

---- අද බොහෝ කිතුනුවෝ කිතුනු නාමය පමණක් දරති. ඔවුන්ගේ හෘද සාක්ෂිය මුළුමනින් වැසී ඇත. ආත්මාර්ථයෙන් තෘෂ්ණාවෙන් පිරී ඉතිරී ඇත. ඔවුන්ගේ ආශා තුළ ඔවුහු ගුලි ගැසී සිටිති. ඔවුන්ගේ ඇතුලාන්තයේ මට ලැගුම් ගන්නට ඉඩක් නැත. ඇතුලාන්තය දුගඳ හමයි. ---- සමහර සභා ශ්‍රේෂ්ඨයන් දෙස මම වේදනාවෙන් බලා සිටිමි. ඔවුන්ගේ ගැළවීම පිණිස ඔවුන් උදෙසා කැප වෙමින් මොරගසන්න, මාගේ දරුවෙනි. පූජක දරුවන් අතරින් බොහෝ පූජකයෝ සිටිති, ඔවුනොවුන් කැපී පෙනෙන තැන්වල, එදා පරිසිවරුන් මෙන්. මාගේ මෙම ක්‍රියාකාරිත්වය ලෝගුව තුළින් සිදු වූයේ නම් අද එය ලහිලහියේ ලොව පුරා පැතිරෙන්නේය. උගත් බලවත් තැන්වලින් මාගේ ක්‍රියාකාරිත්වය සිදු වන විට සභා ශ්‍රේෂ්ඨයෝ පවා දණ නමති. එය උගතුන්ට බලවතුන්ට මුලසුන දීමකි. මෙය අසරණයන් බාලයන් තුළින් මාගේ අනාවරණයන් දිස්වන කාලය යි. දිළින්දන් දුබලයන් බාලයන් තුළින් මා ක්‍රියා කරන විට සියල්ලෝ ඒ දෙස නිච ලෙස බලතිඃ අවමන් කරති. මාගේ මෙම ක්‍රියාවලිය යම් දිනෙක සියල්ලට ද වඩා ලොවට ප්‍රකාශ වන්නේය. මාගේ දරුවෙනි, කිසිවකුට කිව හැකි ද, මා නුඹලා ගෙන යන ගමන ශුද්ධ වූ ගමනක් නො වේය කියා.? ඉදිරි කාලයේ දී මම මාගේ ප්‍රබල බාහු බලය පාමින් මම නුඹලා නොයෙක් තැන්වල රැගෙන යන්නෙමි. එවිට නුඹලාගේ දේශය කැළඹෙනු ඇත. සභා ශ්‍රේෂ්ඨයින් පවා ඒ කාලයේ දි මහත් සේ මනස්ස්ථාපනය අත්දකින මොහොතක් වනු ඇත. මාගේ දරුවෙනි, එකල මම මාගේ ප්‍රබල බාහු බලය පාන්නෙමි. තුන් වන ලෝක යුද්ධය ඇරඹෙනු ඇත. තුනෙන් දෙකේ විනාශයට ළඟා වනු ඇත. හැම කෙනෙක් වෙනුවෙන් ම මේ කාලයේ ඔබගේ පරිත්‍යාගය, කැපවීම, විය යුත්තේ ඔවුන්ගේ ගැළවීම පිණිස යැදුමෙන් මොරගැසීම යි. මනස්ස්ථාපනය අත්දකින තෙක් සියල්ල පවිත්‍ර කරන්නට මම මාගේ උදහස යවා ඇත්තෙමි. මැවුම්කරුවාණන් වන එක ම දෙවිඳුන් වෙත හැරෙන්නට මම නැවත නැවතත් මාගේ ජනතාවගෙන් ඉල්ලමි. නුඹලාගේ දෙවි වූ ස්වාමින් වහන්සේ වෙත හැරී එත් වා ! මාගේ මෙම ක්‍රියාවලිය තුළ නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගැනීමට මා සැලසුම් කළ මොහොතේ සිට බොහෝ අයට උවමනා කළ බීජය ලැබී ඇත. එනම්,

ඔබ හැම ද මාගේ මෙම ක්‍රියාවලිය ද මුළුමනින් විවේචනය කිරීමට හෙළා දැකීමට හේතුවක් සොයා ගැනීම යි. ඉදිරි කාලයේ දී දිනෙන් දින ගෙවෙන්නා වූ සැම දිනයක් තුළ දී ම දිගු කලක් පුරා නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගැනීමට නුඹලාට සිදු වනු ඇති. නොකැළඹී ගමන් කරන්න, ඒ නින්දාව තුළ ම. ඒ නින්දාව තුළ මහා ප්‍රීතියක් අත්වනු ඇත. එයින් පලා යාමට නො සිතන්න. නුඹලා එයින් පලා යන්නහු නම් නුඹලා මට සේවය කරන්නන් නො වනු ඇත."

**2001 ඔක්තෝබර් 31**

"මාගේ දරුවෙනි, මාගේ මහා කාර්යය ආරම්භ වීමේ මොහොත ළං ව ඇත. ධර්මිෂ්ඨ යුගයට අවශ්‍ය ධර්ම බීජ වැපිරීම සඳහා මම මොවුන් දෙපල තෝරා ඇත්තෙමි. මැයගේ විවාහය සිදු කළ යුත්තේ මැයගේ ම ග්‍රාමයේ ශුද්ධ වූ භූමිය තුළ යි. මෙය ප්‍රකාශ කිරීම පිණිස පූජක පුත්‍ර බොනී මෙහි කැඳවන්න. සමාජයට, ලොවට නුඹලා බිය විය යුතු නැත. නොපෙනෙන දෙවිඳාණන් ගේ අණට කීකරු විය යුතුයි." (එවිට ගරු බොනිපස් බැස්ටියන් පිය තුමා මුරුතාන ගම ද ඇතුලත් තෝප්පුව මීසම භාර පිය තුමා විය.) ---- "ඉදිරි කාලය බොහෝ බිහිසුණු ය. බොහෝ ජීවිත විනාශ වන ආකාරය මම දකිමි. කුරිරු නපුරා සියල්ල විනාශ කිරීමට වෙර දරයි. රටක් රටකටත් රාජ්‍යයක් රාජ්‍යයකටත් විරුද්ධ වන මොහොත ඇරඹෙනු ඇත. ඒ මොහොතේ ධර්ම අධර්ම යුද්ධය ද පැතිරෙනු ඇත. සියලු කිතුනු සභාවන් විසිරෙනු ඇත. උසස් තානාන්තර කඩා බිඳ වැටෙනු ඇත. මාගේ දරුවෙනි, නුඹලාගේ මොරගැසීම ඉතා ම අවශ්‍ය යි. සියල්ලන්ගේ මනස්ස්ථාපනය ඉතා ම අවශ්‍ය යි."

**2001 නොවැම්බර් 03**

"ලෙබනන් කන්ද මෙන් එය පියකරු වන්නේය. ශාරොන් කෙත මෙන් එය සාරවත් වන්නේය. සමිඳුන්ගේ තේජාලංකාරය ද එතුමන්ගේ මහා බල මහිමය ද සියල්ලෝ දකින්නෝය. බෙලහීන අත් බලවත් කර වෙවුලන දණහිස් ශක්තිමත් කරන දෙවිඳාණෝ මම වෙමි. බියසුළු සිත් ඇත්තන්ට මෙසේ කියන්න. බිය නො වී දිරි ගන්න. දෙවි සමිඳාණන් වහන්සේ ඔබ මුදන පිණිස වඩින සේක. මට ඇහුම්කන් දෙන්න. වනය ද වියළි දේශය ද ප්‍රීති වන්නේය. කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේය. මුළු විශ්වය ම ප්‍රීති ප්‍රමුදිත වන මොහොත එනු ඇත, බොහෝ ළඟ දී. මා කෙරෙහි විශ්වාසය තබන්න, මා තුළ ප්‍රීති වන්න, මා තුළ ශක්තිමත් වන්න. ---- මාගේ දරුවෙනි, ජරාවාස වූ අපවිත්‍ර වූ ලෝකය පවිත්‍ර කිරීමට මම මෙ ලෙස ක්‍රියා කරමි. මාගේ මුල් මැවීම මෙන් නැවත ලස්සණ ලොවක් මවන්නට මම සූදානම් ව සිටිමි. එවිට සියල්ලෝ ම ප්‍රීති ප්‍රමුදිත වන්නෝය. විශ්වයිය එක ම ගැළවුම්කරුවාණෝ මම වෙමි. ලෝකය පාපයෙන් ගළවන්නට මෙ ලොවට වැඩිය දෙවිඳාණෝ මම වෙමි. නැවත වඩින්නට සිටින දෙවිඳාණෝ මම වෙමි. මාගේ පවිත්‍ර කිරීම දැනටමත් මුළු විශ්වය පුරා පැතිර ඇත. මාගේ උදහසට හසු නො වන්න. උඩඟුකමේ පාපයෙන් ගොඩ නැගී ඇති සියල්ල බිඳ හෙලන මොහොත ළං ව ඇත. එතෙක් මම සියල්ල දෙස බලා සිටිමි. මාගේ පූජක දරුවෙනි, බෙලහීන නො වන්න. මා නුඹලාට දී තිබෙන ප්‍රඥාව මෙහෙයවා අද ලෝ සම්මත සභාව දෙස බලන්න. එය ඉක්මනින් කඩා වැටෙනු ඇත. නුඹලාට මඟ නවතින්නට සිදු වනු ඇත. එතැන දී ද අවංක ව මට කැප වී මට සේවය කරන පූජක දරුවෝ මා හා ඉදිරියට ම යන්නෝය. බැගෑ සිතින් යටහත් පහත් සිතින් දෙවි සරණ පතන්නන් මම දකිමි. ඔවුන් ස්වර්ග රාජ්‍යයෙහි වාසය කරන්නට සුදුසුකම් ලබනු ඇත."

## 32

## "මම සියලු කඳු හෙල් සමතලා කරමින් මාගේ ශ්‍රාවකයින්ට ඉදිරියට යෑමට මඟ සූදානම් කරමි."

**2001 නොවැම්බර් 07**

(ගරු බොනි පියතුමා බෙතෙල් නිවසට පැමිණි විට එතුමන් අමතා ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයකි, මේ.) මා ප්‍රේමවන්ත පූජක පුත්‍රය, ඔබ පැමිණෙන තෙක් මම බලා සිටියෙමි. ඔබ තුළ පිරිසිදු අවංක සිතක් ඇත. එනමුත් එඩිතර වන්න. පූජක පුත්‍රය, අද ලෝ සම්මත සභාව ගැන මම මෙසේ පවසමි. බොහෝ කෙටි දුරක දී මේ සභා ව්‍යුහය ම මුළුමනින් සෙළවෙනු ඇතඃ වතිකානය ම සෙළවෙනු ඇත. අද පූජක දිවිය තුළ අවංක ව මට සේවය කරන්නෝ සුළු පිරිසක් වෙති. උසස්කම් ලබන්නට වෙහෙසෙන බොහෝ පූජක දරුවන් මම දකිමි. පූජක පුත්‍රය, එදා මා ගියාක් මෙන් සැම දුගී පැල්පතක් කරා පැමිණෙන්න. ලෝගුව තුළ පමණක් නො ව ඇතුළු සිත තුළ මට මුලසුන දෙන්න. ජීවමාන දෙවිඳාණන් වන මම මෙසේ පවසමි. ඉතා කෙටි දුරක දී සභාව කඩා වැටෙනු ඇත. එයින් සුළු පිරිසක් ඉදිරියට ම යනු ඇත. මාගේ දාසයා වන නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා ඉවත් කරන මොහොත ළං ව තිබේ. ඉන් පසු මුළු විශ්වය ම සෙලවෙනු ඇත. ---- දැන් මම මෙයාකාරයෙන් නොයෙක් තැන්වල ක්‍රියා කරමි.

එලෙස මාගේ ජනතාව සූදානම් කරමි. ධර්ම බීජ වැපිරීම සඳහා මම මොවුන් දෙපල තෝරා ගතිමි: ඉහළින් වඩින සංඝය තෝරා ගතිමි: ශ්‍රාවකයින් තෝරා ගතිමි. පූජක පුත්‍රය, ඔබ මේ සියල්ල දැන් දැන ගෙන ඇත. මැයගේ ග්‍රාමයේ සිටින පූජක පුත්‍රයා ඔබ යි. මම මෙසේ අණ කරමි. සමාජයට බිය නො වන්න, සභාවට බිය නො වන්න, මාගේ අණට කීකරු වන්න. මැයගේ විවාහය මේ වසරේ අවසන් මස සතර වෙනි දින එම ශුද්ධ වූ ගෘහයේ ම සිදු වනු ඇත. බිය නො වන්න. මේ විවාහය අන් විවාහවලට වඩා බොහෝ සෙයින් වෙනස් ය. මම ශුද්ධ යි. ධර්ම බීජ වැපිරීම සඳහා ඔබ හැම කෙනෙක් ම නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගන්න. ---- මාගේ දරුවෙනි, මම කඳු හෙල් සමතලා කරමි: සියලු පවිටු ගොඩනැගිලි බිඳ හෙලමි. නැවත විශ්වය ම පළමු මැවිල්ල මෙන් ආලෝකවත් කරන මොහොත ළං ව ඇත. අපවිත්‍ර වූ සියල්ල පවිත්‍ර කිරීමට ඒ මොහොත එන තෙක් මම බලා සිටිමි. මාගේ දරුවෙනි, සමාජයට බිය නො වන්න. එදා මම සමාජයට බිය නො වීමි: මාගේ පියාණන්ගේ අණට කීකරු වූයෙමි. සියල්ලන් පාපයෙන් ගළවන්නට මම එදා නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගෙන කුරුසපත් වුනෙමි. එහෙත් මම නුඹලා අතර ජීවමාන වෙමි."

**2001 නොවැම්බර් 11**

දැන් මාගේ ශුද්ධ භාවය තුළ මුළු ලොව ම පවිත්‍ර කිරීමේ මොහොත යි. දැන් නුඹලාට තිබෙන්නේ නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගනිමින් එදා මා පියාණන්ගේ කැමැත්තට අවනත වූවාක් මෙන් ඔබ සැම මා ඔබට පෙන්වන මඟ ඔස්සේ ගමන් කිරීම යි. මාගේ එම නිවැරදි සත්‍යතාවය තුළ එදා මෙන් අදත් එය පිළිකුල් කරන ජනතාවක් මම දකිමි. ඔබ බිය නො වන්න, නො කැළඹෙන්න. මාගේ ගමන මිනිසාගෙන් ඔබට ප්‍රශංසා ලැබෙන ගමනක් නො වේ. එදා මා නින්දාව නමැති වස්ත්‍රය ඇඟ ලා ගෙන කුරුසපත් වූයේ සකල ජනතාවගේ ගැළවීම පිණිස යි. එසේ නම් බිය නො වී ඔබ ද ඉදිරියට ම යන්න. මුළු විශ්වය ම මම පවිත්‍ර කරමි. තුනෙන් දෙකේ විනාශය හා තුනෙන් එකේ පවිත්‍ර කිරීම ඇරඹෙමින් ඇත. ඒ මාගේ පියාණන්ගේ අණ යි. පියාණන්ගේ කැමැත්ත ඉටු වන මොහොත ළං ව තිබේ."

**2001 නොවැම්බර් 14**

"මම නුඹලා අතර වැඩසිටිමි. දුබලයන් අතර දුබලයකු ලෙස ද මෝඩයින් අතර මෝඩයකු ලෙස ද නුගතුන් අතර නුගතකු ලෙස ද මම වැඩසිටිමි. මා බොහෝ සේ වැඩවසන්නේ, ක්‍රියා කරන්නේ තමා මෝඩයන් යැයි තමා දුබලයන් යැයි දන්නා අය තුළ යි. තමා උගතුන් යැයි නැණවතුන් යැයි බලවතුන් යැයි සිතා සිටින බොහෝ දෙනා මා ඉදිරියේ දුබලයෝ මෝඩයෝ වෙති. තමා උගතුන් යැයි බලවතුන් යැයි ධනවතුන් යැයි සිතමින් අද ලොව බොහෝ අය උඩඟු වෙති. ඒ උඩඟුකමේ විපාකය මම ඒ අයට දැනෙන්නට සලස්වන්නෙමි. අන්තිමයා ප්‍රථමයා කොට සළකන්නෙමි: ප්‍රථමයා අන්තිමයා කොට සළකන්නෙමි. තමා නැණවත් යැයි බලවත් යැයි කිසිවෙක් කිසි ම මොහොතක නො සිතන්න. එය මහා උඩඟුකමකි. ළදරුවන් හා සමාන වන්න. ---- මාගේ ශ්‍රාවකයිනි, නුඹලාට යන්නට බොහෝ බිහිසුණු ගමනක් නුඹලා ඉදිරියෙහි ඇත. ඒ ගමන් මඟ ඔබ හැම යා යුතුයි. වසරේ අවසන් මස දෙ වැනි දින එකමුතුකමේ ගෘහය නිමවා එහි භෝජනය පැවැත් විය යුතුයි. ශ්‍රමයෙන් හා මුදලෙන් එයට දායක වූ සියල්ලන් එදින එයට කැඳවන්න. භෝජන සංග්‍රහය මොහොතේ දී ශ්‍රාවකයින්ට පමණක් එක ම මේසයක භෝජනය සකසන්න. එය මාගේ මුලසුන ගන්නා මොහොත යි, ඒ ගෘහයේ."

"එදින මේ දෙපල එඬේරා ඇතුළු සංඝයේ සියලු ශ්‍රාවකයින් ඉදිරියේ කිතුනු විවාහයට ඇතුළු වෙති, ඒ සඳහා ගිවිසුම් දෙති. ඉන් පසු ව යි, සතර වැනි දින එම ශුද්ධ වූ ගෘහයේ මෙම විවාහය සිදු වන්නේ. විවාහයෙන් පසු මාගේ දාසිය එහි පදිංචියට යා යුතු නිසා ඊට පෙර ඇන්ටන් ප්‍රසන්නගේ පවුලේ සියල්ලන්ට කතා කිරීමට මට අවශ්‍ය යි. ---- එකිනෙකාගේ ඇතුළු සිත මම දකිමි. කෙනකුගේ මතු පිටින් පෙනෙන රූපය බොහෝ සේ අලංකාර ව පෙනෙන්නට පුළුවන. එහෙත් ඇතුලතින් දුගඳ හමන බොහෝ අය මම දකිමි. ඇතුලත ලස්සන නම් ගෙවී යන්නා වූ මුළු ජීවිතය අලංකාර වන්නේය. මෙ ලොව දී කුණු වී යන ශරීරය දෙස නො බලන්න, කිසිවෙක්. ඇතුළු සිත විමසා බලන්න. අද මිනිසා අන්ධ වී ඇත. එනිසා පිටතින් අලංකාර ව පෙනෙන බොහෝ දේ පමණක් ඔහු තෝරා ගනී. ඒ අන්ධ භාවය තුළ ඇතුලත දකින්නට මනසක් ඔවුන්ට නැත. එනිස යි දරුවෙනි, අද පාපය මෙ තරම් වැඩි වී තිබෙන්නේ. ---- දුබලයන් අතර දුබලයෙක් ව මම සිටිමි. මෝඩයින් අතර මෝඩයකු ලෙස මම සිටිමි. තමා උගතුන්, ධනවතුන්, බලවතුන් ලෙස දකින්නෝ අද බහුල ව සිටිති. එනිසා උඩඟුකමේ පාපය ඉහළට ම නැඟ ඇත. මුළු ලොව ජරාවාස වී ඇත. තමා උගත් යැයි ධනවත් යැයි බලවත් යැයි සිතීම නිසා පාපයේ කඳු ගොඩනැගී ඇත. අද ඒ සියල්ල සමතලා කරමින් මාගේ ශ්‍රාවකයින්ට ඉදිරියට යාමට මඟ මම සූදානම් කරමින් සිටිමි. මාගේ ජනතාවට ඉදිරියට යාම සඳහා ඒ සියලු කඳු හෙල් සමතලා කරමින් පවිත්‍ර කරමින් ක්‍රියා කරන දෙවිඳාණෝ මම වෙමි. එනිසා කිසිවෙක් උඩඟු නො වන්න.

කිසිවෙක් තමා උගත් යැයි බලවත් යැයි නො සිතන්න. සියල්ලන් මා ඉදිරියේ තමන් මෝඩයන්, දුබලයන් පමණක් බව දකින්න."

**2001 නොවැම්බර් 16**

"මාගේ ජනතාව ඉදිරියට ගෙන යාම පිණිස මා පත් කොට තිබෙන මා පුත්‍ර ඇන්තනිට හා ශ්‍රාවක පිරිසට ඉදිරියට යාම සඳහා මම සියලු කඳු හෙල් සමතලා කරමින්, පවිත්‍ර කරමින් ක්‍රියා කරමි. එනිසා මාගේ දියණිය, මා ඔබට දෙන නින්දාවේ වස්ත්‍රය පැළඳ ගන්න. මාගේ ශ්‍රාවක දරුවෙනි, මා නුඹලාට දෙන්නා වූ නින්දාවේ වස්ත්‍රය පැළඳ ගන්න."

**2001 නොවැම්බර් 18**

(ඇන්ටන් ප්‍රසන්නගේ පවුලේ සියල්ලන් බෙතෙල් නිවසට පැමිණි පසු සුජීවා තුළින් ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයකි, මේ.) "මුළු ලෝක ජනතාව ම එදා මෙන් ම අදත් මාගේ තුවාල පාරමින් සිටිති. දිනෙන් දින පාපයට ඇලුම් කරන ජනතාව වර්ධනය වෙමින් ඇත. ඒ නිසා මෙම යුගයේ දී මාගේ ශුද්ධාත්මානුභාවයෙන් මනුෂ්‍යයා වෙළා ගෙන මම මෙ ලෙස ක්‍රියා කරමි. එසේ කරන්නේ ලෝකය පවිත්‍ර කරමින් දැහැමි යුගයට මාගේ දරුවන් සූදානම් කිරීම පිණිස ය. මේ මොහොතේ මැයගේ මුවින් පිටවෙන්නා වූ වදන් මාගේ ය. මැයගේ ආත්මය දෙවි පියාණන් සුරතේ තබා මාගේ ශුද්ධාත්මය මැය තුළට පිවිස දෙන අනාවරණයකි, මෙය. කවරකුට තේරුම් ගත හැකි ද, මාගේ මේ ක්‍රියාවලිය? මම වෙනස්, මම ශුද්ධ යි. මාගේ බාහු බලය පාමින් මම නොයෙක් තැන්වල ක්‍රියා කරමි."

"මෙහි පැමිණෙන ලෙස මා නුඹලාට ඇරයුම් කළේ මා ක්‍රියා කරන මාගේ ආදර දියණිය ව ඔබලාට භාර දීම පිණිස ය. ඔබ ජීවත් වන භූමියේ මා මුලසුන ගන්නා මොහොත ළං ව ඇත. ඉදිරි යුගයට නව මැවීමක් ඇති කරන පිණිස මම මාගේ මුලසුනේ සිට සියල්ල ආරම්භ කරන්නෙමි. මාගේ දරුවෙනි, ලෝ සම්මත සියල්ල සිදු නො වුනත් ලෝ අසම්මත සියල්ල සිදු වන්නේය. එදා ගල් ගසා මරන්නට අවසර තිබුණ සමාජයක මරියාවන්ගේ කුස තුළ මා මුලසුන ගත් මොහොත ගැන සිතන්න. නින්දාවේ වස්ත්‍රය ඇය පැළඳ ගන්නට කැමති වූවාය. දරුවෙනි, නුඹලාට ද නින්දාවේ වස්ත්‍රය පැළඳ ගන්නට සිදු වනු ඇත. කිසිවකුට බිය නො වන්න, ඉවසීමෙන් මෙනෙහි කිරීමෙන් ගමන් කරන්න. ඔබ උගතුන් යැයි නැණවතුන් යැයි නො සිතන්න. ඒ මහා උඩගුවෙන් මිදෙන්න. දුගී දුප්පත් සියල්ලන් සමග සමගියෙන් සිටින්න. අනෙකාගේ දුර්වලකම් නො දකින්න, තමා තමා ව ම දකින්න. මේ වසරේ අවසන් මස සතර වැනි දින මගේ මෙම පුෂ්පය මම නුඹලාට තිළිණ කරන්නෙමි. එතැන් පටන් නුඹලාගේ භූමියේ ඒ පුෂ්පය රඳවන්නෙමි. ඔබ හැම කෙනෙක් ම මැය ව රැක බලා ගත යුතුයි. මම බලා සිටිමි."

**2001 නොවැම්බර් 21**

"මා ප්‍රේමවන්ත මාගේ දියණිය, මාගේ දාසිය, මා හැදුවා වූ මගේ පුෂ්පය ඔබ යි. ඔබ නිරහංකාරය, පිරිසිදු ය. ඒ අනාදියේ පටන් මා විසින් නුඹ තැනූ ආකාරය යි. නුඹ ළදරු වියේ පටන් මා නුඹට දුන්නා වූ ඒ ගැඹුරු ගමනේ ඒ දුගී භාවය තුළ නුඹ සැදුණෙහිය. මාගේ දියණිය, එඩිතර වන්න. නින්දාව නමැති වස්ත්‍රයෙන් නුඹට පලා යා නො හැක. නුඹ තනි නො වන්නෙහිය. මා හා ගමන් කරන මාගේ දරුවෝ ඔබ තනි නො කරති. මාගේ මෙම ගැඹුරු ගමන කාට නම් තේරුම් ගත හැකි ද? මෙ ලොව කිසිම මනු සතකුට නම් තේරුම් ගත නො හැක, මා නුඹලා ව ගෙන යන ගමන. ---- ඔබ සැම දේව ගරු බිය ඇතිව ජීවත් වන්න. එවිට සමිඳාණන් වන මම නුඹලාට ගරු කරමි. ---- ලෝ සම්මත සභා තුළ පවා සිටිති, එන්නට සිටින සාතන්ගේ ඒ අඩවියට යට වන බොහෝ අය. මාගේ දරුවෙනි, මේ කාලයේ ඔබ හැම කෙනෙක් ම අන් අය ව දකින්නට පළමු තමා තමා ව දකින්න. තමා කොතෙක් දුර්වල දැයි දකින්න. තමා කොතෙක් පාපිෂ්ඨ දැයි දකින්න. ඉන් පසු නුඹලාගේ ස්වාමින් වන මට කතා කරන්න. ඔබට අත් හැරිය නො හැකි දුබලතාවයන්, ඔබගේ සියලු බැරි භාවයන් මට පුද දෙන්න. ---- මාගේ පූජක දරුවෙනි, ලෝ සම්මතය තුළ ම ඇලි-ගැලී නො සිටින්න. ලෝ සම්මත සියල්ල යම් දිනෙක කඩා වැටෙනු නියත යි. අතරමං නො වන්නට මම නුඹලාට මඟ පෙන්වීමි. මාගේ වචනයට සවන් දෙන්න. සියළු උඩඟුකමේ පාපයන් බිඳ හෙළන, සමතලා කරන දෙවිදාණෝ මම වෙමි. ---- මා පුත්‍රය, මා ඔබට පැවරූ ප්‍රකාශනය පිළිබඳ ව මම ඔබට මෙසේ පවසමි. මෙතෙක් ඔබ දුටුවා වූ ඔබ ඇසුවා වූ සියල්ල ද මාගේ පවිත්‍ර කරණය ද එම ප්‍රකාශනයට නගාපන්න.

**2001 නොවැම්බර් 23**

"පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද මම වෙමි. මාගේ දරුවෙනි, මම මෙසේ පවසමි. මේ පණිවුඩය රැගෙන යන්න. එය මෙසේ යි. පූජක පුත්‍ර බොනී, මම ඔබට උපරිමයේ ගරු කළෙමි. මාගේ අණ පරිදි මම නුඹට ප්‍රකාශ කළෙමි, ඒ ශුද්ධ වූ ගෘහයේ විවාහය සිදු වන්නට අවසර දෙන ලෙස. දැන් මම අවසර නො ඉල්ලමි. දැන් මම එය එලෙස ම සිදු කරන්නෙමි. ---- පූජක පුත්‍රය, ඔබ නිහඬ ව ම සිටින්න. එම ශුද්ධ වූ භූමියේ ම මෙම විවාහය සිදු වන්නේය. සියලු සැලසුම් මම ම සිදු කරන්නෙමි; පූජක පුත්‍ර ලින්ටන් ලවා එය සිදු කරන්නෙමි. මට කීකරු වන්න. කිසිවෙක් මට පිටු නො පාන්න. සමිඳාණන් වන මම මෙසේ අණ කරමි. මම ඔබ සැම දෙස බලා සිටිමි. අද සියල්ල අසත්‍යයට යට වී ඇත. සත්‍ය හෙළි කිරීම තුළ එයට ඉඩ නොදෙන ආකාරය මම දකිමි. ---- බිය නො වන්න. නුඹ නිහඬ ව ම සිටින්න. එම ශුද්ධ වූ භූමියේ විවාහය සිදු වීමට අවසරය මගෙනු යි ලැබෙන්නේ. නුඹ නිහඬ ව ම සිටින්න. නුඹට කිසි විපතක් නො වන්නේය. සමිඳාණන් වන මට අභියෝග නො කරන්න. මම සියල්ලේ මැවුම්කරු වෙමි. මම ශුද්ධ යි, අති සුවිශුද්ධ යි, මාගේ ශුද්ධ වූ කාර්යයට බාධා නො කරන්න. නුඹලාගේ පූජා වීම තුළ මිනිසුන් ඉදිරියේ පෙනී නොසිට මා ඉදිරියේ පෙනී සිටින්න; මා ඉදිරියේ උසස් වන්න. ---- මාගේ දරුවෙනි, ඒ විවාහය ඒ භූමියේ ම සිදු වන්නේය. එලෙස සූදානම් කරපන්න. බිය නො වන්න. මේ සමිඳුන් වන මාගේ අණ යි."

(දෙසැම්බර් 4 වන දින සුජීවා විවාහ විය යුතු බව ජේසු සමිඳුන් පැවසුවත් සියලු බාධක මැද අපි අවිනිශ්චිත ව බලා සිටියෙමු. නොවැම්බර් 16 වන දින අලුයම ජේසු සමිඳාණෝ මහත් උද්‍යහසින් මෙන් සුජීවා තුළින් මෙම වැකි තුන පැවසූහ. "මේ සියල්ලට කාලය බොහො ම ටික යි. ලහිලහියේ විය යුතුයි. මේ සමිඳුන් වන මාගේ අණ යි." ඒ නිසා අපි එදින ම බොනී පියතුමා හමු වීමු. පිය තුමා මෙම විවාහයට ඇති බාධක අපට පෙන්වා දුන්නේය. නොවැම්බර් 23 වන දින ජේසු සමිඳුන් දුන් පණිවුඩය ඇතුලත් ඒ හඬ පටිය අපි ගරු බොනී පිය තුමා අතට පත් කළෙමු. පිය තුමාට කළ හැකි එක ම දෙය නම් මේ හඬ පටිය දිසාව භාර පිය තුමා අතට පත් කිරීම බව එතුමා අපට පැවසීය. එය අනු නායක පිය තුමා අතට ද අගරදගුරු තුමා අතට ද පත් වනු ඇත. "මාගේ දරුවෙනි, ඒ විවාහය ඒ භූමියේ ම සිදු වන්නේය. එලෙස සූදානම් කරපන්න." ජේසු සමිඳුන් නොවැම්බර් 23 වන දින පණිවුඩයෙන් අපට එලෙස පැවසූ නිසා අපි විගස විවාහය පිළිබඳ සියලු කටයුතුවලට මුල පිරුවෙමු. 2001 දෙසැම්බර් 4 වන දින පෙරවරු 9:00 ට මුරුතාන සාන්ත අන්තෝනි දෙව් මැදුරේ දී සුජීවා ජයලත් හා ඇන්ටන් ප්‍රසන්න අති'නත ගන්නා දෙව් පුද මෙහෙයට සහභාගි වන ලෙස දන්වා අපි ඇරැයුම් පත් මුද්‍රණය කරන්නට භාර දුන්නෙමු. එදින මංගල දිව්‍ය පූජාව පවත්වන ලෙස අප ඇරැයුම් කර තිබුණේ ගරු නිහාල් ලින්ටන් පිය තුමාට යි. එනිසා අපි එතුමා හමු වන්නට නොවැම්බර් 30 වන දින සුජීවා හා ඇන්ටන් ප්‍රසන්න සමග කට්ටකඩුව දෙව් මැදුරට ගියෙමු. එහි දී ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් උපුටා ගත් කොටස් කීපයකි, මේ.)

"මම නැවත පළමු මැවිල්ල ම සකසන්නට නව මැවිල්ල අරඹන්නට ලෝකය පවිත්‍ර කරමින් සිටිමි. මම පියාණන්ගේ කැමැත්ත ඉටු කළෙමි. තුනෙන් දෙකේ විනාශය ආරම්භ කළෙමි. එය මාගේ පවිත්‍ර කිරීම යි. ඉන් තුනෙන් එකේ ඉතිරි වන ජනතාව මාගේ දරුවන් ව මගේ ශුද්ධ වූ ගින්නෙහි දවා පවිත්‍ර කරන්නෙමි. සියලු කඳු කඩා වට්ටමින් සියල්ල සමතලා කරමින් මම ඔබ සැමට යන්නට මාවත සලසන්නෙමි. මා ප්‍රේමවන්ත පූජක පුත්‍රය, මම ඔබට මෙසේ පවසමි. ඔබ දැන් මොවුන් හා සම්බන්ධ වන්න. ඔබගේ ශ්‍රද්ධාව කෙරෙහි මම බලා සිටිමි. මුළු විශ්වයිය පාපය කර දරා නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගෙන කුරුස පත් වීමි, නුඹලාට ගැළවීම ලබා දෙන පිණිස. නැවත ඒ නින්දාවට මුහුණ දෙන්නට මම ඔබට ඇරැයුම් කරමි. මෙය ශුද්ධාත්මයාණන්ගේ අණ යි, මා ප්‍රේමවන්ත පුත්‍රය, ඔබට දී තිබෙන ශුද්ධ වූ වරම තුළින් ඔබ ඉදිරියට ම පිය නගන්න. ඔබ මේ ගැන සොයන්න. මෙය තමා ඉහළින් වඩින මාගේ සංඝය. මා තෝරා තිබෙන මේ සංඝය දොරටු කඩා ගෙන ඉදිරියට ම යා යුතු මොහොත යි. ඔබ එදා ආමොස් මෙන් ඉදිරියට ම ගමන් කරන්න. සත්‍යයට මුහුණ දෙන්න, අසාධාරණය පරාජය කරන්න. පුත්‍රය, මම බලා සිටියෙමි, තව ද බලා සිටින්නෙමි. ඒ නින්දාවේ වස්ත්‍රය ඇඟ ලා ගන්නට මම මොවුන්ට ඇරැයුම් කරමි. මක්නිසාද, ඉදිරි කාලය අති බිහිසුණු යි, ඒ මාගේ පවිත්‍ර කිරීම යි. බෙලහීන අත් බලවත් කරන දෙවිඳාණෝ මම වෙමි. වෙවුලන දණ හිස් ශක්තිමත් කරන දෙවිඳාණෝ මම වෙමි. එඩිතර වන්න, සභාව මුළුමනින් අවදි කරන්න. ඔබ ද මා තෝරා ගත් මේ දාසියගේ ග්‍රාමයේ ම උපන් දුගී මව් පියවරුන්ගෙන් උපත ලැබූ පුත්‍රයෙකි. පුතණුවෙනි, බිය නො වන්න. ඔබ ආමොස් මෙන් ඉදිරියට ම ගමන් කරන්න. ඔබට පිළිගැනීම් අවශ්‍ය නැත. මේ මුළු මිහිමඬලේ ම ඔබට සැරිසරන්නට පුළුවන. මා දී තිබෙන පාද දෙකෙන් ගමන් කරන්න. දෙ අත්වලින් මා දෙන ක්‍රියා කරන්න. දුප්පත් පොහොසත් භේද, ජාති, කුළ, ආගම් භේද නො තකන්න. සියල්ලෝ මැවුම්කරුවාණන්ගේ එක ම දරුවෝ වෙති. මේ අපවිත්‍ර වී තිබෙන දේශය පවිත්‍ර කිරීමේ මොහොත යි. ලෝකය ම පවිත්‍ර

කිරීමේ මොහොත යි. මේ මාගේ ශුද්ධ භාවය යි, අති සුවිශුද්ධ භාවය යි, ඉදිරියට තිබෙන්නේ. පුත්‍ර ය, බිය නො වන්න. මම ඔබට ඇරයුම් කරමි. ඔබ ව මම ආමොස් මෙන් ශක්තිමත් කරමි. මම ඔබට නැවත නැවත ඇරයුම් කරමි. මේ විවාහය ආශිර්වාද කරන මොහොතේ ඔබ එහි සිටී; ඔබ ඔවුන් හා ගමන් කරයි. නුඹගේ ඔය සුදු වත (වස්ත්‍රය) නුඹගේ ඇතුළු සිත තුළ පවිත්‍ර ව තබා ගෙන ඔබගේ ජීවිතය ශුද්ධ වු ගෘහයක් මෙන් තබා ගන්න. දිනෙක මුළු සභා ව්‍යුහය ම කඩා වැටෙනු ඇත. එවිට මා හා ගමන් කරන මාගේ දාස දාසියන් ඉදිරියට ම ගෙන යන්නා වූ එක ම එඬේරාණෝ, එක ම දිව්‍ය ගැළවුම්කරුවාණෝ, මම වෙමි. එදිනට මෙම විවාහය සිදු වෙනවා ම යි. මක්නිසාදයත්, ධර්ම බීජ වැපිරීම සඳහා නව මැවීමක ආරම්භයට සියල්ල සූදානම් කරමින් යන මොහොත යි. ඔබට නැවත නැවත ඇරැයුම් කරමි. ඔබ සැම එදා ආමොස් ගියාක් මෙන් යන්නට මම ආසිරි ගන්වමි.”

(එදින ම 2001. 11. 30 අපගේ රාත්‍රි යැදුමේ දී) “එදා රතු මුහුදෙන් එතෙර වූවාක් මෙන් දැන් මා නුඹලා ව ගෙන යන මොහොත යි; සියල්ල පරාජය කරමින් සියලු නිරුවත, සියල්ලන්ගේ නිරුවත, සභා නිරුවත හෙළිදරව් කරමින් ඉදිරියට ම ගෙන යන මොහොත යි. මේ තමා නැවත නව මැවීමක ආරම්භය. මා සුරතට හසු වී සිටින ඔබ සැම නින්දාව නමැති ඒ වස්ත්‍රය ඇඟ ලා ගන්න, එය යම් මොහොතක ගැළවීමේ වස්ත්‍රයක් වනු ඇත. මැයගේ වැළපීම තුළ, සියල්ල අත්හැරීම තුළ, ඒ විඳවීම තුළ මැය කෙරෙහි ඔවුන් දෙපල කෙරෙහි මම අතිශයින් ප්‍රසන්න වෙමි. දැන් ඔබ සැම ගිනි උදුනක යි, මා තබා තිබෙන්නේ. ඔබ කිසිවකුට වැරදි නැත. නිවැරදි මාවතේ මම ඔබ ගෙන යන්නෙමි. මේ තමා මාගේ ශුද්ධ භාවය. ඔබ සැම සූදානම් වන්න, සතර වෙනි දිනට. ඒ මහා නින්දාවට වුවත් බිය නො වන්න. ඒ නින්දාවට මැය ව සූදානම් කරන්න. දියණිය, එඩිතර වන්න. දියණිය, සම්මත සියල්ල කඩා බිඳ දමන්නට ඔබ මා හා එක් ව එඩිතර ව සියල්ල අත්හැර සියලු බලාපොරොත්තු ආශා අත්හැර මා ඔබට දුන් තිළිණයත් සමග ඉදිරියට ම පියවර තබන්න. මාගේ දරුවෙනි, ඒ මහා නින්දාවක් වුවත්, ඒ මහා නින්දාව එඩිතර ව පැළඳ ගන්න.”

**2001 දෙසැම්බර් 02 ඉරිදා**

(එකමුතුකමේ ගෘහය සාදා නිම කොට එම නිවසේ පැවැත්වෙන දිවා භෝජනයට සූදානම් වන මොහොතේ) “මා ප්‍රේමවන්ත මාගේ දරුවෙනි, මම ද පියාණෝ ද ශුද්ධාත්මයාණෝ ද මේ මොහොතේ මේ ගෘහයේ මුලසුන ගන්නෙමු. මෙ තැන් පටන් මේ භූමිය ශුද්ධ භූමියක් වන්නේය. මට ක්‍රියා කරන්නට මුළුමනින් ඉඩ දුන්නා වූ මාගේ දියණිය ව, ඒ පුෂ්පය මේ භූමියේ රඳවන මොහොත ළඟ ය. ධර්ම බීජ වැපිරෙමින් නව මැවීමට සියල්ල සූදානම් කරන මොහොත ආරම්භ වෙමින් ඇත. ඉදිරි කාලය තුළ සියලු සත්‍යය කතා කිරීමට පූජකයන් ඉදිරියට ආමොස් ව, ආමොස්ගේ ඒ ආත්මානුභාවය එවන්නෙමි. දැන් බලන්න, මාගේ ආශිර්වාදය, එකමුතුකමේ ගෘහය සාදා නිම වී ඇත. මේ ගෘහය තැනුවා වූ ඒ දරුවන් ව මම ශක්ති සම්පන්න කළෙමි; එඩිතර කළෙමි; නිරෝගිමත් කළෙමි; අන් අය පුදුම කරවන මේසන්වරුන්, වඩුවන් කළෙමි. ඉදිරියට ද මම ඔවුන් ව ආශිර්වාද කරමි. ඔවුන්ගේ දරුවන් ද දරුවන්ගේ දරුවන් ද මම ආශිර්වාද කරමි. දැන් මාගේ ශ්‍රාවක පිරිස භෝජන සංග්‍රහයට සූදානම් වන්න. නුඹලාට නොපෙනෙන දෙවිඳාණන් වන මම නුඹලාගේ භෝජනයේ නුඹලා සමග අසුන් ගන්නෙමි.”

(අපි නිවසේ සාලය පුරා දිග මේසයක් සකසා ඒ මත ආහාර තැබීමු. එදින අප සංඝයේ විසි දෙ දෙනෙක් පැමිණ සිටියහ. ජේසු සමිඳුන්ට ප්‍රධාන අසුන වෙන් කර මේසය වටා පුටු 22ක් තැබිමු. ඊට වඩා තව එක පුටුවක් හෝ තබන්නට ඉඩක් නැත. මෙම නිවෙස පිළිබඳ සියලු සැලසුම් ජේසු සමිඳුන්ගේ ම යැයි එවිට මට හැඟිණි.)

33

# “මාගේ ශුද්ධ භාවයට ඇතුළු වීම යි, මා තුළ ප්‍රීති වීම.”

(විවාහයට දින දෙකකට පෙර ගරු ලින්ටන් පිය තුමාට මම ලිපියක් බාර දුනිමි. එහි පිටපතක් සමග තවත් අදහස් ස්වල්පයක් සටහන් කර මීසම භාර ගරු පිය තුමාට ද දුනිමි. එහි මෙ වැනි අදහස් ඇතුලත් කළෙමි. “මෙම විවාහ දිව්‍ය පූජාව සඳහා පැමිණෙන්නැ යි අපි ඔබ තුමාට කිසි ම බලපෑමක් නො කරමු: කෙසේ හෝ පැමිණෙන්නැ යි අපි ඔබට ආයාචනා නො කරමු: ජේසු සමිඳුන් ඔබට කියන දේ පමණක් කරන්නැ යි අපි ඉල්ලා සිටිමු. ---- සමහරුන් අප පිස්සන් ලෙස සලකා අපට ගල් ගැසුවත් අපි කිසිදු වියවුලක් නොකරන බවට පොරොන්දු වෙමු. ඔබ තුමා පල්ලියේ ගේට්ටුව අගුලු ලා වසා තැබුවොත් අපි ගේට්ටුව අසල සිට අප විසින් කළ යුතු දේ කරමු. ඔබ තුමා ගේට්ටුව හා දේවස්ථානයේ දොර ඇර තැබුවොත් දේවස්ථානයේ ඇතුලත සිට කළ යුතු දේ කරමු.” දෙසැම්බර් 3 වන දින සවස යැදුමට අප සංඝයේ බොහෝ දෙනා සහභාගි වූහ.)

**2001 දෙසැම්බර් 03 රාත්‍රි 8 : 00**

“කාලය අති බිහිසුණු යි. ඔබ සිතන විට ඔබ ක්‍රියා කරන විට ඔබ ගමන් කරන විට හැම මොහොතක ම මාගේ නාමයේ ම රැඳෙන්න. මක්නිසාද, සියල්ල විනාශය කරා ගෙන යන්නට සාතන් වෙර දරමින් ඇත. මාගේ ක්‍රියා කවරකුට තේරුම් ගත හැකි ද? කිසි මනුෂ්‍යයකුට නොතේරෙන මාවතක මම ඔබ ගෙන යන්නෙමි. මාගේ ක්‍රියා කෙතරම් උදාර ද යන්න යම් දිනෙක ඒ හැම කෙනකුට ම වැටහෙනු ඇත. මේ ශුද්ධ වූ මොහොත යි. සියල්ල පවිත්‍ර කරමින් නව මැවිල්ල පළමු මැවිල්ල ම ආරම්භ කිරීමට මම සියල්ල සූදානම් කරමි. සතර වැනි දින විවාහ වන්නටත් ස වෙනි දින එක මාංශයක් ලෙස එක් වන්නටත් කියමින් මම මොවුන්ට ද තහනමක් පැනවිමි. එය මා එදා ආදම් ඒවට දුන් තහනම වැනි ය. මාගේ නව මැවීමේ ආරම්භය වන තෙක් ඒ පරීක්ෂණය මම කරමි. ධර්ම බීජ වැපිරීම සඳහා නව මැවීමක් සූදානම් කිරීම යි, මාගේ කැමැත්ත. මා එදා ලෝකය මැවූ මොහොතේ එය කෙතරම් අලංකාර ව තිබිණි ද? වැලි කැටය පවා පිරිසිදු ව තිබිණි. අද එය ලෙයින් තෙත් වී ඇත. මාගේ දරුවෙනි, මෙය ද දහම? මාගේ දරුවෙනි, මාගේ ඉහළින් වඩින සංඝය ගිනි උදුනේ දැවෙන මොහොත ඇරඹිණ. මම ප්‍රීති වෙමි, අතිශයින් ප්‍රීති වෙමි. මාගේ ශ්‍රාවක පිරිස ද මා විසින් ඒකරාශි කර ගන්නා වූ ජනතාව ද මේ දෙපළ සමග ශුද්ධ වූ ගෘහයට පැමිණෙන දිනය හෙට යි. ඒ මොහොත පැමිණෙන තුරු මම බලා සිටිමි. එඩිතර ව නින්දාව නමැති වස්ත්‍රය පැළඳ ගන්න. මේ මොහොතේ ද මාගේ සුර සේනාව නුඹලා දෙස ප්‍රීතියෙන් බලා සිටිති. මා ඉහළින් වඩින සංඝය තෝරා ගත් මොහොතේ ද ඔවුහු මහත් සේ ප්‍රීති වූහ. එකමුතුකමේ ගෘහය ගොඩ නැගීම තුළ මම නුඹලාගේ විශ්වාසය ප්‍රබල කළෙමි. නොසැලෙන විශ්වාසයකින් යකඩ කුළුණක් මෙන් සවිමත් ව සියල්ලන් හෙට ශුද්ධ වූ ගෘහයට පැමිණෙන්න. ඒ මොහොත ශුද්ධ වූ මොහොත යි. වැජඹෙන්නා වූ සියලු සභා ශ්‍රේෂ්ඨයින් කඩා වට්ටන මොහොත එය වන්නේය. ඔබ හැම කෙනෙක් ම මා තබා තිබෙන, මා ඉල්ලන ඒ නින්දාවට මුහුණ දෙන්න. ඒ නින්දාවේ වස්ත්‍රය ගැළවීමේ වස්ත්‍රයක් වනු ඇත. මාගේ දරුවෙනි, ප්‍රඥාවන්තයෝ බොහෝ දිවැස් වැකි පළ කළහ. ඒවා ශුද්ධ බයිබලයේ සඳහන් ව ඇත. එහෙත් ශුද්ධ බයිබලය තුළ දැකිය නොහැකි අනාවරණ රටාවක් මේ යුගය තුළ සිදු වෙමින් ඇත. මාගේ ඉහළින් වඩින සංඝය තෝරා ගනිමින් මාගේ දාසිය හා දාසයා තෝරා ගනිමින් මම බොහෝ සේ ක්‍රියා කළෙමි. තමා තමාගේ වැරදි දකිමින් තමාගේ වැරදි සාදා ගැනීමට උනන්දු වන්න, මේ කාලය තුළ. වඩවඩාත් තමා තමා ව දැකීම මහා මනස්ස්ථාපනයකි. අද මධ්‍යම රාත්‍රිය වන තෙක් මම විටින් විට කතා කරමි. හෙට විවාහය සිදු වන මොහොතේ දී නින්දාවට මුහුණ දීමට සූදානම් ව පැමිණෙන්න, ඔබ සැම.”

**2001 දෙසැම්බර් 03 රාත්‍රි 10 : 00**

“නුඹලාගේ හදවත නමැති ගෘහය මට දෙන්න. මම එහි ලැගුම් ගන්නට සූදානමින් සිටිමි. මාගේ දරුවෙනි, කෙනෙක් පිපාසිත ව ජීවන ජලය සොයා එන තෙක් මම බලා සිටිමි. ජීවන ජලයෙන් පිපාසය නිවාගත් ඔවුන් නැවතත් පිපාස වන තෙක් මම බලා සිටිමි. මේ කාලයේ මම නොයෙක් වෙස් ගෙන හැම නිවෙසකට ම පැමිණෙන්නෙමි. විටෙක හිඟන්නකු ලෙසද විටෙක ධනපතියකු ලෙස ද වෙස් ගෙන මම නුඹලා පරීක්ෂා කරමි. නුඹලා ධනපතියාට දෙන භෝජනය දුගී යාචකයාට නොදෙන බව මම බොහෝ සේ දකිමි. ---- ඔබ නො කැළඹෙන්න. ගෙවී යන මේ මොහොත පසු කොට පැමිණෙන හෙට දිනය මාගේ සැලැස්ම ඉටු වන මොහොත යි. මා කෙරෙහි විශ්වාසයෙන් සිටින්න. මේ ගමන තුළ නුඹලාට නින්දා අපහාස මල් මාලාවක් මෙන් ලැබෙන්නේය.

මට ක්‍රියා කිරීමට ඉඩ දුන්නා වූ මාගේ දියණිය, මාගේ හැම ඉල්ලීමකට ම ආමෙන් කී ආකාරය මම දිටිමි. පුංචි දරුවන් රණ්ඩු වෙමින් නැවත යහළු වෙන්නාක් මෙන් ඇය මා හා ගත කරන්නිය; ඇය වැළපෙන්නිය; නැවත මට ඉඩ දෙන්නිය. මාගේ ක්‍රියා කිරීම තුළ ඇයගේ දෙ නෙතින් මොන තරම් කඳුළු ගලා යන්නට ඇද්ද? ඇයටත් මනුෂ්‍ය ආශා, මනුෂ්‍ය සිතුවිලි තිබේ. එහෙත් ඇය මට ගෞරවාන්විත ව ආදරය කරන්නිය; ඈ මට කීකරු වන්නිය. මා ඇයට දුන් එඩේරාට ද නිහතමානී ව කීකරු වන්නිය. මම බලා සිටිමි, ඇය විටෙක කුඩා දරුවකු මෙන් වැළපෙන ආකාරය. ඔබ හැම ද කුඩා දරුවන් මෙන් වන්න. එය යි, සැබෑ ජීවිතය."

"මා පුත්‍ර ඇන්තනි, ඔබට දී තිබෙන මාගේ කාර්යය ඉදිරි කාලයේ අති බිහිසුණු ය. වසර ගණනාවකට ඉහත දී මම නුඹ ව ශුද්ධ භාවයේ අත්දැකීමට තෝරා ගනිමින් සියලු බැමි කඩා වැටෙන්නාක් මෙන් මම එදින ඔබ ව කඩා වැටෙන්නට සැලැස්වීමි. ලැබෙන්නා වූ මේ නින්දා අපහාස මැද ගමන් කරන්නට යි, මා නුඹ ව ඒ මොහොතේ ඒ අත්දැකීමෙහි ම රැඳෙව්වේ. මම මට අවශ්‍ය තැනට ටිකින් ටික නුඹ ව හැඩ ගසමින් කඩමින් අඹමින් ගෙන ආවෙමි. ඒ තුළින් ඔබගෙන් බොහෝ වැඩක් කර ගන්නට මට ඇත. මාගේ දෙ වන පැමිණීමේ දී මාගේ පෙර මඟ සුදානම් කරන්නා ලෙස මම අනාදියේ පටන් නුඹ තෝරා ගතිමි. නුඹ එඬේරකු ලෙස දුනිමි, මාගේ ජනතාවට. පුත්‍රය, ඒ තුළ නුඹ උඩඟු නො වන්නෙහිය. පුත්‍රය, නුඹ ව පිළිගත් අය අද නුඹ ව කොන් කරන තැනට පැමිණ ඇත. ඒ නුඹ යන මේ ශුද්ධ භාවයේ අත්දැකීම නිසා යි. එදා මට මිනිසුන්ගෙන් ලැබුණු මල් මාලාව නම් නින්දා, කස පහර, කටු ඔටුණු මේ සියල්ල යි. එදා මා ගියාක් මෙන් ඔබත් නොකැළඹී ගමන් කරන්න. ඔබ හා යන ඔබගේ ශ්‍රාවකයින් ව දිරිමත් කරමින් ගෙන යන්නට පුළුවන් ඔබට යි. මේ වසර අවසන් මස සතර වැනි දිනය වන හෙට සුර සේනාව මෙම ශුද්ධ වූ මොහොත නරඹති. සුර දූතයෝ ප්‍රීති ගී ගයති. බිය නො වන්න, ලොවට හඬ ගා කියන්නට මහා අභියෝගාත්මක ගමනක මම නුඹලා ව හෙට දින රඳවන්නෙමි. මා ප්‍රේමවන්ත දියණිය සුජීවා, මම නුඹට අතිශයින් ප්‍රේම කරමි. නුඹ මට ක්‍රියා කිරීමට ඉඩ දුන් ජීවිතයකි. මාගේ සැලසුම් මම නුඹ තුළින් ඉටු කර ගතිමි. මාගේ දියණිය, ඔබගේ විවාහ දිවිය තුළ මට අවශ්‍ය ධර්ම බීජ වැපිරීමෙන් මට කීකරු වන්නන් සාදන්න. යහ මඟට සියල්ල යොමු කරපන්න. ඔබ සියල්ල සිත් හී ධාරණය කර ගෙන මෙනෙහි කරමින් ජීවිතය ගෙවන්න. ඉදිරියටත් සියල්ල සපයන දෙවිඳාණෝ මම වෙමි. දියණිය, මම නුඹට ස්තුති ප්‍රශංසා කරමි. හෙට හිරු උදාවත් සමග ඔබගේ ජීවිතය ස්වර්ගීය පියාණන් වහන්සේ වන මාගේ ආශිර්වාදයෙන් ම පිරේ වා !"

## 2001 දෙසැම්බර් 03 රාත්‍රි 11 : 50 - 12 : 00

"පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද මම වෙමි. මාගේ දරුවෙනි, මම නැවත නැවත ප්‍රකාශ කරමි, වියවුල් නො වන්න, එඩිතර වන්න. හෙට දින උදෑසන ඒ ශුද්ධ භූමියේ ඒ විවාහය සිදු වන්නේ ම ය. එදිනට නියමිත පූජා කියවීම් ඒ සියල්ල එලෙස ම නුඹලා ජනතාව ඉදිරියේ පවසන්න. ඔවුන් දෙපලගේ ආශිර්වාදය සඳහා මම දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන ව වැඩසිට බලා සිටිමි. අල්තාරය මත ඔවුන්ගේ ආශිර්වාද කර ගැනීමේ ඒ මුදු තබන්න. බිය නො වන්න, මම එහි ආශිර්වාදය වන්නෙමි. පූජා කියවීම් ආරම්භ කරමින් ගැයුම් වැයුම් මැද ඒ මහා යාගික දුම් පූජාවක් ලෙස පුදන්න. එය විශ්වයීය නව මැවීමේ විවාහයක් වනු ඇත. සියලු නින්දා මැද නුඹලාගේ ගැයුම් වැයුම් මැද එඩිතර කරමින් මම මැය ව ඒ මොහොතේ ස්පර්ශ කරමි. බිය නො වන්න, සියල්ල එලෙස ම සිදුකරපන්න. මැය වැළපෙන ආකාරය මම දකිමි; මනුෂ්‍ය දුවක් වැළපෙන ආකාරය මම දකිමි. බලන්න, මනුෂ්‍ය අයිතිවාසිකම් උදෙසා ඇය වැළපෙන්නිය. මාගේ දරුවෙනි, ඔබ හැම කෙනෙක් ම එලෙස යි. මාගේ පියාණන්ගේ ඒ අයිතිවාසිකම උදෙසා නුඹලාට දී තිබෙන නිදහස උදුරා නොගනිමින් නුඹලාගෙන් මම මෙය ඉල්ලමි. මම ඒ මොහොතේ ඇය ව ස්පර්ශ කරන්නෙමි. නුඹලා ද එඩිතර ව නුඹලාට මොන තරම් නින්දා අපහාස පැමිණුනත් ගමන් කරන්න. මම ප්‍රේමය වෙමි. ඒ මොහොතේ මාගේ ක්‍රියාකාරකම් පුදුමාකාර වන්නට පුළුවන. ඒ මොහොතේ මා පුත්‍ර ඩිල්ෂාන් තුළින් හෝ මම ඒ විවාහය එලෙස සිදු කරන්නෙමි. බිය නො වන්න, නො කැළඹෙන්න, ඒ තුළ ජනතාව පුදුම වනු ඇත. මාගේ ක්‍රියාකාරකම් කිසිවකුට තේරුම් ගත නො හැක."

"මා පුත්‍ර ඇන්තනි, එඬේරා ලෙස නුඹලාට ඉදිරියෙන් ගමන් කරයි. සියල්ලන් සිනාසුනත් ගල් ගැසුවත් බිය නො වන්න. මනුෂ්‍ය දුවක්, තරුණ දියණියක් විඳින වේදනාව වැළපීම මම දකිමි. ඒ වැළපීම තුළ තිබෙන්නා වූ කීකරු භාවය, නිරහංකාර භාවය මම දකිමි. ඉවසීමෙන් මෙනෙහි කිරීමට ඇතුළු වන්නට වෙර දරන ආකාරය මම දකිමි. මැය පුදුමාකාර වූ චරිතයකි. මේ දියණියගේ ජීවිතය පුදුමාකාර විදියට මම අඹා ඇත්තෙමි. ඇය ව ශක්තිමත් කරමින් එතැනට රැගෙන එන්න. ඈ මෙනෙහි කිරීමට උත්සාහ කරන්නිය, ඉවසීමට වෙර දරන්නිය. ඇය ව ශක්තිමත් කරපන්න. කිසිවකුගේ අවසර මට අවශ්‍ය නැත. මම පරමෝත්තම දෙවිඳාණෝ වෙමි.

මට ගෞරව කරන්නන්ට මම ගෞරව කරමි. මා ප්‍රේමවන්ත මාගේ දරුවෙනි, මම ඔබ සැමට ගෞරව කරමි. මැයගේ හද පත්ලේ මම ගින්නක් දවා මාගේ ක්‍රියාකාරකම් අවසන් කරන්නෙමි. ඒ ගිනි උදුනෙන් මා ඇය එතෙර කරන තෙක් ඇය වැළපෙන්නිය. ඒ මොහොතින් පසු ගෙවන හැම තත්පරයක් ම ඇය ප්‍රීති වන්නිය. ඔබ හැම කෙනකු ව ම කටුක ගමනක මම තබා ඇත්තෙමි. මම දකිමි, නුඹලාට සිනාසීමට සිටින අය. මේ තමා නින්දාවේ පළමු පියවර. ඔබට හැඟේ නම් මෙය ආරම්භයට පළමු ව ජනතාවට හෙළි කිරීමට එයට ද මම අවසර දෙමි. මාගේ ශුද්ධ භාවයට ඇතුළු වීම යි, මා තුළ ප්‍රීති වීම: නින්දාවට ඇතුළු වීම යි, මා තුළ ප්‍රීතිවීම. මාගේ දරුවෙනි, මම නුඹලාගෙන් කාරුණික ව ඉල්ලමි, මා හා ගමන් කරන ලෙස.”

(මැදියම් රැයේ දී මෙම අවසන් පණිවුඩයට සවන් දෙන විට අපට අවබෝධ විය, ලින්ටන් පිය තුමා විවාහ දිව්‍ය පූජාව සඳහා නොපැමිණෙන බව. අපි සුජීවාට ද එම පණිවුඩය අසන්නට සැලැස්වීමු. ඇය වැළපෙන්නට වූවාය. මෙම විවාහය පිළිබඳ ජේසු සමිඳුන්ගේ වචන අපට සිහිපත් විය.)

1. “මෙම විවාහය දැහැමි යුගයේ උදාවේ කාහල නාදය වන්නේය.”

2. “එය විශ්වයිය නව මැවීමේ විවාහයක් වනු ඇත.”

3. “මෙම දෙපල ද ඉහළින් වඩින සංඝය ද නින්දාවේ වස්ත්‍රය පැළඳ ගැනීමේ මොහොත මෙය වන්නේය.”

4. “ඉහළින් වඩින සංඝය දොරටු කඩා ගෙන ඉදිරියට ම යා යුතු මොහොත මෙය වන්නේය.”

5. “වැජඹෙන සභා ශ්‍රේෂ්ඨයන් කඩා වට්ටන මොහොත මෙය වන්නේය.”

6. “සභා නිරුවත හෙළි කිරීමේ මොහොත මෙය වන්නේය.”

7. “මම පරමෝත්තම දෙවිඳාණෝ වෙමි. කිසිවකුගේ අවසර මට අවශ්‍ය නැත.”

සිදු වන මෙම ක්‍රියාවලිය මහෝත්තමයාණන්ගේ හස්තය බව අපි දනිමු. ජේසු සමිඳුන් අපට පවසන දේ ඉටු කර මිය යාම පවා භාග්‍යයකි. එනිසා මෙම අභියෝගයට සංඝයක් ලෙස අපි මුහුණ දිය යුතු වෙමු. සමහරුන්ගේ පහරදීම්වලට පවා ලක් වන්නට පුළුවන. එනිසා මම අතිරේක ඇඳුමක් ද රැගෙන දෙව් මැදුර බලා පිටත් වීමි. සැම අඟහරුදාවක මෙන් එදින ද දෙව් මැඳුරේ ගේට්ටුව හා දොරටු විවර කර තිබිණ. උදේ 9:30ට පමණ සංඝයේ පියා ද සංඝයේ මව ද එක් ව දෙව් මැඳුරේ මහා දොර විවර කළහ. එය ඔවුන් හිතා මතා සැලසුම් කළ දෙයක් නො වේ. එහෙත් එය එසේ සිදු විය. කඳුකරයෙන් ලැබුණු මල්වලින් ඔවුහු අල්තාරය සැරසූහ. උදේ 9:45 - 10:45 හෝරාවේ දි මහත් වූ දේව අනුග්‍රහය මැද එම විවාහයේ කටයුතු දෙව් මැදුර තුළ සිදු විය. පමා වී ඇරඹුණ නිසා එයට සහභාගි වන සියල්ලෝ ආරම්භයේ දී ම පැමිණ සිටියහ. දෙ දෙනාගේ මංගල මුදු අල්තාරය මත තැබීමෙන් වැඩ කටයුතු ඇරඹිණ. එක ම ගිටාරයක හඬ හා මුසුව නැගුන ගීතිකා හඬින් දෙව් මැදුර ගිගුම් දෙන්නට විය. ජේසු සමිඳුන් පැවසූ ලෙස ම ආරම්භයේ දි ම මේ පිළිබඳ හැඳින්වීමක් කළ යුතු යැයි මට හැඟිණ. සියල්ලන්ට ම ඇසෙන පරිදි විනාඩි 15ක් පමණ මම මහා හඬින් කතා කළෙමි. එහි මෙම අදහස් ඇතුලත් විය.

“මුරුතාන ගමේ උපන් එහි හැදුන වැඩුන සුජීවා ජයලත්, 'ජේසු කතා කරන ළමයා' යනුවෙන් ඔබ ගෞරවයෙන් හෝ උපහාසයෙන් හඳුන්වන සුජීවා ජයලත් ඇගේ විවාහය සඳහා දැන් ගමේ දෙව් මැදුරට පැමිණ තිබෙනවා. ඇය මගින් ජේසු සමිඳුන් දුන් පණිවුඩ අන්තර් ජාලය හරහා ලෝකයට දැන් විවෘත වී තිබෙනවා. මේ විවාහය පිළිබඳ වගකීම ජේසු සමිඳුන්ගෙන් පැවරුන දහම් නවෝදය සංඝය හැටියට අප මෙහි පැමිණ තිබෙනවා. ජේසු තබන තැන සිටීමත් ජේසු කියන දේ කිරීමත් සඳහා අපි කැප වී සිටිනවා. අප දැන් මෙ තැනට පැමිණ තිබෙන්නේ ජේසු සමිඳුන් අපට කියන දේ කරන්නට යි. අද හැම දෙයක් ම, ආගම් පවා බිහිසුණු ලෙස ගරා වැටෙන ලෝකයක යි, අප ජීවත් වන්නේ. ඒ තත්ත්වය වෙනස් කරන්නට අද බොහෝ දෙනා බොහෝ දේ කරනවා. එහෙත් ඒ කිසිවක් පිළිතුර වෙලා නැහැ. වැරදි මඟ යන්නන් බොහෝ සිටිනවා. හරි මඟ යන හරි මඟ යන්නට උත්සාහ කරන අය බොහෝ සිටිනවා. එහෙත් ශුභාරංචි මඟ යන කෙනෙක් සොයා ගන්න අපහසු යි. ධර්මයාණන් තමාට පෙන්වන මාවත ඔස්සේ පියවරෙන් පියවර පා තැබීම යි, ශුභාරංචි මාවත. ජේසු සමිඳුන් මෙ ලොවට පැමිණ කළ එක ම

දෙය නම් දේව තාත්තාගේ මඟ පෙන්වීම හඳුනා ගනිමින් කුරුසියේ මරණය දක්වා දෙවි පියාණන්ට කීකරු වීම යි. එය යි, සුභාරංචි මාවත. දේව මෑණියන් අදත් ජේසු සමිඳුන් ව අපට පෙන්වමින් පවසන්නේ 'එතුමන් ඔබට කියන කොයි දෙයක් නමුත් කරන්න' කියන එක යි. අද අප මෙහි පැමිණ තිබෙන්නේ ජේසු සමිඳුන් අපට කියන දෙයට කීකරු වන්නට යි. එක් අයෙක් හෝ අඟ දක්වා ම ශුභාරංචි මාවත ඔස්සේ යනවා නම් යුගයක ගමන් මඟ වෙනස් කරන්නට තරම් සුවිශාල බලයක් එහි තිබෙනවා. එය අප දන්නා නිසා යි, ජේසු සමිඳුන් අපට පවසන දේ කොයි තරම් අසම්මත වුවත් එය ඉටු කරමින් ඉදිරියට ම යන්නේ. අප කරන දේ වැරදි යි කියල ඔබට හැඟෙනවා නම් අපට බනින්න, අපට ගහන්න. එය අප සතුටින් බාර ගන්න සූදානම්."

ඉන් පසු නැවත ගීතිකා හා ප්‍රශංසාව ඇරඹිණ: එදිනට නියමිත පූජා කියවීම් බෙදා ගතිමු. ජේසු සමිඳුන් විවාහය සඳහා ඩිල්ෂාන් ව උපයෝගි කර ගන්නට ඉඩ ඇතැ යි එතුමන් ම පැවසූ නිසා සුවිශේෂය කියවීම අපි ඔහුට පැවරුවෙමු. එහෙත් ඔහු තුළ එවැනි මෙහෙය වීමක් නො විය. ඉන් පසු ඇන්ටන් ප්‍රසන්න හා සුජීවා ජයලත් දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩසිටින ජේසු සමිඳුන් ඉදිරියේ හා සංඝය ඉදිරියේ එකිනෙකාට විවාහ ගිවිසුම් දුන්හ. ඉන් පසු පූජාසනය මත තබා තිබූ මුදු දෙක ගෙන සුජීවා ද ඇන්ටන් ප්‍රසන්න ද එය පැළඳ ගත්හ. එවිට සියල්ලෝ දණ ගසා ඔවුන්ගේ විවාහය ආසිරි ගැන්වීම ගැන දෙවි සමිඳුන් පැසසූහ. සැදැහැවතුන්ගේ යාච්ඤාවෙන් පසු ගීතිකා හා ප්‍රශංසා මැද මෙහෙය අවසන් කළෙමු. කිසිදු වත්පිළිවෙතක් හෝ ආසිරි පැන් පොදක් පවා අපි භාවිත නො කළෙමු. පැමිණි සියල්ලෝ ගෞරවයෙන් සහභාගි වනු පෙනිණ. ඔවුහු දෙවි මැදුරු භූමියේ ම කැවුම්, කොකිස්, කිරිබත් ආදිය කමින් තේ බොමින් නව යුවලට සුබ පැතූහ. කිසි ම කෙනකුගේ කිසි ම විරෝධයක් බාහිර ව ප්‍රකාශ නො විය.

ඉන් පසු මනාල මහත්මියගේ නිවසේ දිවා භෝජන සංග්‍රහයට අපි සහභාගි වීමු. එහි දී ජේසු සමිඳුන්ගේ මෙම වචන මට සිහිපත් විය. "මෙම දෙපළ ද ඉහළින් වඩින සංඝය ද නින්දාවේ වස්ත්‍රය පැළඳ ගැනීමේ මොහොත මෙය වන්නේය." එසේ නම් මේ සියල්ල මෙසේ සිදු විය යුතු ම ය. ලින්ටන් පිය තුමා පැමිණියේ නම් නින්දාවේ වස්ත්‍රය පැළඳ ගන්නේ එතුමා ය. ඩිල්ෂාන් තුළින් ජේසු සමිඳාණෝ බලගතු ක්‍රියා කළෝ නම් අප සංඝය නින්දාවේ වස්ත්‍රය පැළඳ නොගනු ඇත. 2001. 05. 02 සිට දෙසැම්බර් 04 උදෑසන 10:45 දක්වා අප විඳි අත්දැකීම අඟ අපට ද ජෙරමියා දිවැසිවරයා හා එක් ව මෙ ලෙස කියන්නට පුළුවනැ යි මට හැඟේ. "ස්වාමින් වහන්සේ අප පෙළඹූ වූ සේක. අපි ද පෙළඹුනෙමු. උන්වහන්සේ ජය ගත් සේක. අපි සැමදා ම නින්දාවක් ව සිටිමු. සියල්ලෝ ම අපට නින්දා කරති." (20:7)

## 34
## "ඔබ හැම කෙනෙක් ම මහෝත්තමයාණන් ඉදිරියේ අළු දූවිලි පමණි."

2002 අප්‍රේල් 12 වන දින සිකුරාදා රාත්‍රි සුජීවා ජයලත් සොයුරිය ඇය වටා දේව දූතයන් දොළොස් දෙනකු සිටිනු දුටුවාය. දේව දූතයන් හා සංවාදයකින් පසු ඇයගේ මුවින් මෙම වදන් නික්මිණ. ඇයගේ මුවින් කතා කළේ ගාබ්‍රියෙල් දූතයා ය. "සුජීවා, නුඹ ස්වාමින් වහන්සේගේ දාසිය යි. නුඹ ද නුඹ කුස සිටින දරුවා ද ආරක්ෂා කරන්නට ස්වාමින් වහන්සේ අප මෙහි එවූ සේක. අපි රැකවල් දූතයෝ වෙමු. මෙය පවසන මම ගාබ්‍රියෙල් වෙමි." 2002. 08. 29 සුජීවාගේ පුතුගේ උපත දක්වා මෙම අනාවරණයන් සිදු විය. මෙම පණිවුඩ ඇරඹුනේ මෙ ලෙස යි. "මම ස්වාමින් වහන්සේගේ පණිවුඩකරු ගාබ්‍රියෙල් වෙමි. නුඹලාගේ ස්වාමින් වහන්සේ විසින් නුඹලාට පණිවුඩයක් දී ඇත. එය මෙසේ ය." පණිවුඩ අවසන් කළේ මෙ ලෙස යි. "ස්වාමින් වහන්සේගේ පණිවුඩය ගෙනාවෙමි: පණිවුඩය දුන්නෙමි. මම ගාබ්‍රියෙල් වෙමි. නුඹලාට සුබ දිනක්." එම කාලය තුළ මිකායෙල් අග්‍ර දූතයා මගින් ද එක පණිවුඩයක් ලැබී ඇත.

මෙම අනාවරණයන් මගින් ස්වාමින් වහන්සේ සංඝය තුළ නැවත වියවුලක් ද ඇති කළහ, ශ්‍රාවකයින්ගේ පවිත්‍ර කරණය සඳහා. ඒ සඳහා එතුමන් මුලසුන ගත් ගෘහය ද ඒ සඳහා ගත් රුපියල් ලක්ෂ තුනක ණය මුදල ද එතුමෝ උපයෝගි කර ගත්හ. **ජුනි 7 වන දින** දුන් පණිවුඩයේ මෙම අදහස් ඇතුළත් විය. "මුලසුන ගත් ගෘහය තැනීම ස්වාමින් වහන්සේ විසින් ම කළ දෙයකි. ස්වාමින් වහන්සේ නුඹලාට දුන් එඬේරා මෙහෙයවමින් ලැඩීගේ බිරිඳගෙන් එම මුදල ඉල්ලා සිටියේ ස්වාමින් වහන්සේ ම බව එතුමෝ තරයේ ප්‍රකාශ කරති. එය දීමට ඇයගේ සිත පොළඹ වන ලද්දේ ද උන්වහන්සේ ම බව එතුමෝ ප්‍රකාශ කරති. එය නිදහස් කිරීම ස්වාමින් වහන්සේ ම සතු බව එතුමෝ පවසති. උන්වහන්සේ එම මුදල යම් මොහොතක දෙන බව තරයේ ප්‍රකාශ කරති. මුලසුන ගත් ගෘහය සඳහා ගත්තා වූ ඒ කාසිය මේ මොහොතේ ස්වාමින් වහන්සේ කෙනකු අත මිට මොළවා සිටිති. එයට හේතුව නියම ශ්‍රාවකයින් ව එකිනෙකාට දැන ගැනීම

පිණිස යි. එය මහා පරීක්ෂණයක් යැයි ස්වාමින් වහන්සේ ප්‍රකාශ කරති. මෙය එකිනෙකාගේ යටි හිත තුළ තිබෙන්නා වූ ආත්මාර්ථය, තෘෂ්ණාව පරීක්ෂණයට ලක් කරන මොහොත යි. එය මේ මුලසුනෙනු යි ආරම්භ වූයේ.'

**2002 අප්‍රේල් 27**

"ලොව පුරා බිහිසුණු මොහොත ඇරඹෙමින් ඇත. ස්වාමින් වහන්සේගේ විරුද්ධකාරයා දැන් ඔහුගේ වැඩය අරඹා ඇත. ඉදිරියේ දී නුඹලාගේ ස්වාමින් වහන්සේත් ඔහුත් අතර මහා සටනක් ඇත. ස්වාමින් වහන්සේගේ දූතයින් වන අපි ඔබගේ රැකවල් දූතයෝ වෙමු. කිසිවෙක් අහංකාර නො වන්න. එසේ වුවහොත් අපගේ දූතයින් අතරින් ලුසිෆර්ට සිදු වුණාක් මෙන් ඔවුන්ට ද නිරය උරුම වනු ඇත."

**2002 මැයි 02**

"දියණිය සුජීවා, දැන් නුඹලා දෙ දෙනා තුළ පවතින ප්‍රීතිය, සමගිය, සමාදානය දෙස නුඹලාගේ ස්වාමින් වහන්සේ මහත් ප්‍රීතියෙන් බලා සිටිති. ස්වාමින් වහන්සේට ළං වෙන, ඉඩ දෙන ජීවිත ඔවුන් නොදැනුවත් ව ම ස්වාමින් වහන්සේ පූජා වූ ඒ කුරුසිය ගමන යනු ඇත. ඒ ගමන තුළ නුඹලාගේ ස්වාමින් වහන්සේට දොස් නොපවරමින් ගමන් කිරීම නුඹලා ලබන ජයග්‍රහණය යි: නුඹලාට ගැළවීම ලබා දුන්නා වූ ස්වාමින් වහන්සේට දෙන සැනසීම යි. දරුවෙනි, ඉදිරිය හැම මොහොතක් ම බිහිසුණු යි."

**2002 මැයි 16**

"බිය නො වන්න, ස්වාමින් වහන්සේගේ කාර්යයට කිසිවකුට එරෙහි විය නො හැක. එරෙහි වුවත් ඒ සැලැස්ම එලෙස ම ඉටු වනු ඇත. නුඹලාට දී තිබෙන එඬේරා ඇතුළු නුඹලා සියල්ලන් වෙත ඉදිරියේ දී නින්දාව ලුහුබඳිමින් පහර දෙනු ඇත. නුඹලාගේ ස්වාමින් වහන්සේ තුළ ශක්තිමත් වන්න. එය යි, නුඹලාගේ ජයග්‍රාහී මොහොත."

**2002 මැයි 19**

"නුඹලාගේ ස්වාමින් වහන්සේ නුඹලාට මේ රහස හෙළි කරති. එනම්, අති බිහිසුණු සටනට සැරසෙන මොහොත ළං ව ඇත. නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා ඉවත් කරන මොහොත ළං ව ඇත. තව කෙටි කලකින් විශ්වය ම කැළඹෙමින් මහා සටනක් ලොව තුළ ඇරඹෙයි. එයට පළමුව යි, නුඹලාගේ ලෝක එඬේරා නෙරපමින් ඊ ළගට එන සතුරාගේ පියවර එළඹෙන්නේ."

**2002 මැයි 23**

"නුඹලාගේ ස්වාමින් වහන්සේ මුළු ලොව ජනතාව අමතමින් මෙසේ පවසති. මාගේ දාසයා වන නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා නෙරපන මොහොත ළං ව ඇත. ලෝ වැසි ජනතාවෙනි, නොකැළඹී ස්වාමින් වහන්සේගේ නාමය දරමින් මොරගසමින් විශ්වාසවන්ත ව සිටින්න. ඔහු ඉවත් කළ පසු ලෝකය මහත් ආන්දෝලනයකට ලක් වේ. එහෙත් නොකැළඹී සිටින්න. එය සිදු විය යුතු දෙයකි."

**2002 ජුනි 07**

"ස්වාමින් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටින විට සියලු සිතුවිලි ඉවත ලා ශාරීරික, මානසික, ආත්මික ගැටළුවලින් ඉවත් ව සම්පූර්ණ හිස් ව කිසි ම කිසිත් නැති කෙනෙක් ලෙස ස්වාමින් වහන්සේ ඉදිරියෙහි යටහත් පහත් ව ගෞරවාන්විත ව පෙනී සිටින්න. එවිට නුඹලාගේ සිත තුළ ස්වාමින් වහන්සේ සදාතනික ව වැජඹෙන සේක. සිතට සතුට සැනසුම සුවය ගැළවීම උන් වහන්සේ බවට විශ්වාසයෙන් සිටින්නට යැයි ස්වාමින් වහන්සේ නුඹලාගෙන් ඉල්ලා සිටිති."

**2002 ජුනි 13**

"මා පුත්‍ර ඇන්ටන් ප්‍රසන්න, ස්වාමින් වහන්සේ නුඹට දී ඇති සුජීවා නමැති ස්වාමින් වහන්සේගේ දාසිය සමග මහා ගැඹුරු වූ ද අභිරහස්මක වූ ද ගමනකට නුඹලා දෙපල තෝරා ගෙන ඇත. නුඹට දාව ඇගේ කුසෙහි පුත්‍රයෙක් පිළිසිඳ ගෙන ඇත. පුත්‍රය, ඉදිරි හැම මොහොතක් ම බිහිසුණු යි: නුඹලාට පීඩාකාරී යි. ඒ සියල්ල පරාජය කරන්නට නුඹලාගේ ස්වාමින් වහන්සේගේ යාගික වූ ලෙය සිහි ගන්වමින් නිරන්තරයෙන් නුඹලාගේ ස්වාමින් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් නොසැලී ඒ කටුක අම්හිරි ගමන එඩිතර ලීලාවෙන් ගමන් අරඹන්න."

**2002 ජුනි 21**

"ස්වාමින් වහන්සේගේ දාස දාසියනි, ශ්‍රාවකයිනි, ස්වාමින් වහන්සේ විසින් දුන් කාර්යය එලෙස ම එදා ස්වාමින් වහන්සේගේ දාසිය වන මරියාවන් විසින් ඉටු කළාක් මෙන් යටහත් පහත් ව කීකරු ව නිහතමානි ව අවනත ව පිරිසිදු සිතින් ඉටු කරන ලෙස නුඹලාගේ ස්වාමින් වහන්සේ ප්‍රකාශ කරති. නුඹලාගේ ස්වාමින් වහන්සේ යම් දෙයක් කරන සේක් ද ඒ ගැන ප්‍රශ්න කිරීමට ඔබ කිසිවකුට අවසර නැත. ස්වාමින් වහන්සේ කරන්නා වූ දෙය නිමා වන තුරු නුඹලා ස්වාමින් වහන්සේ තුළ කිසිම කිසිත් නැත්තන් පමණක් බව වටහා ගත යුතුයි. ඔබගේ මනස නිදහස් ව ජේසුස් යන නාමයේ ම පවතින්නට පමණක් තබා ගත යුතුය."

**2002 ජූලි 09**

"මම ස්වාමින් වහන්සේගේ පණිවුඩකරු ගාබ්‍රියෙල් වෙමි. නුඹලාගේ ස්වාමින් වහන්සේ විසින් මේ මොහොතේ පණිවුඩයක් දී ඇත. මුළු ලෝ වැසි ජනතාව ගෙන යාම සඳහා නුඹලාට දී ඇති එඬේරා ගැන නුඹලාගේ ස්වාමින් වහන්සේ මෙසේ පවසති: ඔහු උපන් මොහොතට සුබ වේවා ! යි පතති. ලොවට හඬඟා කියන්නට පණිවුඩයක් ගෙන යන්නට ජනතාව අවදි කරන්නට අනාදියේ පටන් ඒ සඳහා තෝරා දී තිබෙන නුඹලාගේ එඬේරා ගැන ස්වාමින් වහන්සේ ප්‍රීති වෙති: ප්‍රසන්න වෙති. ඔහු උපන් මොහොතට සුබ වේවා ! යි පතන්නෝ ස්වාමින් වහන්සේ යි. ඔහුට එය ප්‍රීතියක් නො වුව ද ස්වාමින් වහන්සේට එය මහා ප්‍රීතියකි. කොන්වීම් තුළ නින්දා අපහාස ලැබීම් තුළ ඔහුගේ ගමන ඉතා බිහිසුණු ගමනකි. මහා බිහිසුණු ගමනකට පියවර තබමින් සියල්ල අත්හැර තමා ව කැපකොට තම ස්වාමින් වහන්සේට සේවය කරන ඇන්තනි අප්පුහාමි ගැන නුඹලාගේ ස්වාමින් වහන්සේ අතිශයින් ප්‍රසන්න වෙති. සියල්ල ඔහු තුළින් ගිලිහී ගියත් ඔහු ස්වාමින් වහන්සේ ව අත්නොහරින බව නුඹලාගේ ස්වාමින් වහන්සේ ප්‍රකාශ කරති. මහා ශුද්ධ වූ ගින්නක් මේ මොහොතේ ඔහු තුළ දල්වමින් ඇත. ඒ ගින්න තුළ ඔහු තබා ඇත. ඒ තමයි දැහැමි වූ ද උදෙව්ගිමත් වූ ද යුග පුරුෂයා. මේ පණිවුඩය ගෙන ආ මම ගාබ්‍රියෙල් වෙමි."

**2002 ජූලි 19**

"සුජීවා සහ ඇන්ටන් ප්‍රසන්න නුඹලාගේ ස්වාමින් වහන්සේ විසින් සියලු දෙනා වෙනුවෙන් තම සිරකරුවන් කර ගෙන සිටිති. ලෞකික සමාජයේ රජයන පාපධාරී ගින්න දවාලන ශුද්ධ වූ ගින්න තුළ එතුමාණෝ ඔවුන් ව සිරකර ගෙන සිටිති: ස්වාමින් වහන්සේ මෙම සිරකරු යුවල උපයෝගී කරගෙන එඬේරා ඇතුළු ශ්‍රාවක පිරිස අතර මහා වියවුලක් අරඹා ඇත. නුඹලාගේ ස්වාමින් වහන්සේ ප්‍රේමය මෙන් ම උදහස් වීමේ මහා ගිනි ජාලාව යි. ස්වාමින් වහන්සේ වියවුල් කරන සේක: නැවත සමාදාන කරන සේක."

**2002 ජූලි 23**

"සාතන් පරාජය කරන මිකායෙල් අග්‍ර දූතයා මම වෙමි. ඒ සඳහා බලය දී තිබෙන්නේ නුඹලාගේ ස්වාමින් වහන්සේ යි. නුඹලාගේ ස්වාමින් වහන්සේ විසින් තෝරා තිබෙන සියලු දෙනා වෙත මහා ගින්නක් අවුළුවමින් ඇත, සාතන්. පවිත්‍ර කිරීමේ ශුද්ධ වූ ගින්නට පෙර සාතන්ගේ පාපධාරී ගින්න ඇවිලෙන්නට ඉඩ හැර සිටිති, නුඹලාගේ ස්වාමින් වහන්සේ. නුඹලාගේ ශ්‍රාවක පිරිස අතර මහා ගින්නක් ඇවිලෙයි. මහා පවිත්‍ර කරණයට පෙර ඇවිලෙන්නා වූ ඒ පාපධාරී ගින්න දවාලන ශුද්ධ වූ ගින්න බලා සිටී යි, ඒ පාපධාරී ගින්න දවාලන්නට. ඒ ශුද්ධ වූ ගින්නට හසු වීම බොහෝ ම භයානක යි."

**2002 ජූලි 25**

"සාතන් විසින් අවුළු වන පාපධාරී ගින්න දෙස ස්වාමින් වහන්සේ බලා සිටිති. එය මහා ගින්නකි. ඉන් පසු එන්නේ ඒ පාපධාරී ගින්න දවාලන ශුද්ධ වූ ගින්න යි. එනිසා ශ්‍රාවකයිනි, ස්වාමින් වහන්සේගේ දූතයන් වන අපි ඔබට මෙසේ පවසමු. අපි ස්වාමින් වහන්සේ අබිමුව ගෞරවාන්විත ව සිටින යටහත් දූතයෝ වෙමු. අපට ඇත්තේ කීකරු වීම පමණි: ඒ පෙන්වන මඟ ඔස්සේ ගමන් කිරීම පමණි. මහා බිහිසුණු වූ ද මහා ගැඹුරු වූ ද ගමනකට ස්වාමින් වහන්සේ නුඹලා කැඳවති. නුඹලාගේ ස්වාමින් වහන්සේ තෝරා ගත් ශ්‍රාවකයින්ට දැන් නපුරා මුළුමනින් පහර පිට පහර ගහන මොහොත යි: එකිනෙකා වියවුල් කරන මොහොත යි. නුඹලාගේ ස්වාමින් වහන්සේ ඊට ඉඩ දී බලා සිටිති. වියවුල් නො වන්න, මක්නිසාද නුඹලා දන්නහුය, මේ ගමන ගැඹුරු බව, ලොව නින්දාව අනිවාර්යෙන් ම පසුපස ලුහුබඳින බව. එයින් පලා යන්නට නො සිතන්න. නුඹලාගේ ස්වාමින් වහන්සේ කුරුසයේ ඇණ ගැසූ මොහොත සිහි කරමින් ඔබත් එයට සූදානම් වන්න. එය යි, නුඹලාගේ ජයග්‍රහණය. ---- දැන් නුඹලාගේ ස්වාමින් වහන්සේ තෝරා ගත් තම සංඝය තුළ අස්වැන්න නෙලන්නට ඒ අස්වැන්න කපා, කොටා, පොළා, හලා, තෝරා ගන්න මොහොතට ළං ව තිබේ. එය නුඹලාගේ ශ්‍රාවකයින් ව පරීක්ෂණයෙන් හළා වෙන් කොට තෝරා ගන්නා මොහොත යි."

**2002 ජූලි 27**

"නුඹලාගේ ස්වාමින් වහන්සේ මට දුන් පණිවුඩය මම ද එලෙස ම පවසමි. මා පුත්‍ර ඇන්තනි, නුඹගේ ජීවිත ගමන කඩුර වූ දුෂ්කර වූ නින්දිත වූ අපහාස ලබමින් ඒ මහා නින්දාව ඔබ මුළුමනින් ඇඟ ලා ගනිමින් ඔබගේ දෙවි ස්වාමින් වහන්සේට ඉඩ දුන් චරිතයකි. පුත්‍රය, ඔබ ගැන මම ප්‍රසන්න වෙමි යි ස්වාමින් වහන්සේ පවසති: ඉදිරිය බොහෝ බිහිසුණු යැයි ප්‍රකාශ කරති. නො කැළඹෙන්න. ඉදිරි කාලය තුළ සැම වදනක් ම නුඹගේ ඇතුළු සිතට දෙන්නේ නුඹගේ ස්වාමින් වහන්සේ බව මතක තබා ගන්න. නුඹගේ ස්වාමින් වහන්සේගේ ප්‍රඥාවෙන් එතුමාණෝ නුඹට මඟ පෙන්වති. නුඹ වැනි එඩිතර වූ ධර්මිෂ්ඨ වූ ජීවිතයක් ගැන නුඹගේ ස්වාමින් වහන්සේ ප්‍රසන්න වෙති. නුඹට තව තවත් නින්දා පැමිණෙන්නේය. සියල්ලන්ගේ නායකයකු ලෙස නුඹ තෝරා පත් කොට ඇතත් නුඹ තුළ උඩඟුකමක් නොමැත. නුඹ තුළ එයට ඉස්මතු වීමක් නොමැත. නුඹගේ බැහැපත්කම ම නුඹ ව උසස් කරනු ලබයි. තව ද නුඹගේ ස්වාමින් වහන්සේ මෙසේ පවසති. පුත්‍රය, නුඹ දැන් සකසමින් තිබෙන ප්‍රකාශනය නුඹ ව මා මෙහෙය වන ආකාරයට කරන්න. බිය නො වන්න. මාගේ සියලු සත්‍යය ලොවට හෙළි කරන්න."

**2002 අගෝස්තු 01**

"මාගේ ශ්‍රාවකයිනි, නුඹලා නො දන්නහුය, නුඹලා දැන් පියවර තබමින් ගමන් කරන්නේ මහා ගිනි උදුනකට බව, ඒ ශුද්ධ වු ගිනි උදුන යි. එය යි, ශුද්ධ වු ගමන. නුඹලා ඒ මහා ගිනි උදුනේ මාගේ සිරකරුවන් වෙමින් අන් අය උදෙසා පෙනී සිටින මාගේ ශ්‍රාවකයන් වන්නහුය. තමකම නසා ගෙන අන් අය උදෙසා කැප වෙන පූජා වන මාගේ ශ්‍රාවකයින් වන්න. මොවුන් දෙපල මෙන් ම ශ්‍රාවකයින් වන ඔබ හැම කෙනෙක් ම දැන් නුඹලාගේ ස්වාමින් වහන්සේගේ සිරකරුවන් වෙමින් සිටිති. හැම විඳ වීමක් ම පුද දෙන්න. එය පූජා වීමේ මහා ආශිර්වාදය යි. නපුරාට කිසි විටෙක නො හැකිය, නුඹලා පරාජය කරන්නට. මක්නිසාද, නුඹලා ස්වාමින් වහන්සේගේ දකුණු මහා බාහුවෙන් ආලේපය ලබා ඇත්තහුය.---- නුඹලාගේ ස්වාමින් වහන්සේ සුවිශාල යි. ඔබ හැම කෙනෙක් ම මහෝත්තමයාණන් ඉදිරියේ අළු දූවිලි පමණි."

## 35

## "දුගී භාවය නිසා නුඹලා මා තුළ උසස් වී ඇති බැවින් ප්‍රීති වන්න."

**2002 අගෝස්තු 06**

"මට කීකරු වන්නන් විනාශ වන්නට ඉඩ නොදෙන මැවුම්කරු මම වෙමි. මම නිරන්තරයෙන් නුඹලා සුරකිමි. නුඹලාගේ ජීවිත ගමන තුළ නුඹලා ජීවත් වන ලෝකය තුළ නුඹලාට පැමිණෙන බාධක කරදර අපමණ යි. මේ සියලු පීඩා ජය ගැනීම සඳහා මා තුළ ම විශ්වාසයෙන් රැඳෙන්න. විශ්වාසය අවංක භාවය නුඹලාගේ දෙවියන් බව සිතට ගන්න. නුඹලා කොතෙක් දුරට මා විශ්වාස කරන්නහු ද, මම නුඹලා අපමණ ප්‍රේමයකින් වැළඳ ගන්නෙමි. නුඹගේ අවංක භාවය, මා තුළ තැබූ විශ්වාසය නුඹ මෙ ලොව හැර යන තුරු තබා ගන්න. අවංක බව, විශ්වාසවන්ත බව, දැහැමි බව නුඹ මාගේ රාජ්‍යය කරා කැඳවනු ලබයි. නුඹලා මුහුණ දෙන සියලු ගැටළු සිහිකර ගන්න. එය මා ගිය කුරුසිය ගමන යි. එදිනෙදා මුහුණ දෙන ප්‍රශ්න ගැටළු තුළ නුඹලා ඒ කුරුසිය කර තබා ගෙන වැටි-වැටී නැගිට යන මාගේ ශ්‍රාවකයන් වන්නහුය. මාගේ ශ්‍රාවකයිනි, මා කැඳවන මේ ගමන බොහෝ ම ගැඹුරු යි, බොහෝ ම දුෂ්කර යි. නුඹලා දැන් ගිනි උදුනට පය තබා ඇත. නුඹලාගේ හදවත නමැති ගෘහය මාගේ සිංහාසනය කර ගන්නට මට ඉඩ දෙන්න, නිරන්තරයෙන්. එවිට නුඹලා තුළ තිබෙන ගැටළු මම විටින් විට විසඳන්නෙමි. ශ්‍රාවකත්වය වෙත මා කැඳවූ සියල්ලන් අතරින් මා කෙරෙහි විශ්වාසි ව ගමන් කරන්නේ සුළු පිරිසකි. මේ යන ගමන ගැන ශ්‍රාවකයින් අතර ම මත භේද හට ගනී: ගැටුම් ඇති වේ. එමගින් එකිනෙකා පවිත්‍ර වේ. ඒ තමයි මා හළා-පොළා වෙන් කර ගන්න පවිත්‍රතාවය. දිව්‍ය එඬේරාණන් වන මා ඉදිරියේ නුඹලා කිසි ම කිසිත් නැත්තන් ලෙස සිටින්න. තමා තමා ව නිරන්තරයෙන් නිවැරදි ව දකින විට සැබවින් ම ඒ තමා සැබෑ මිනිසා. එය යි, මා තුළ දාස භාවය, ශ්‍රාවක භාවය. මේ ගමන බොහෝ ගැඹුරු යි. තව බොහෝ දුර යන්නට ඇත. ලෝක අවමානයෙන් මිදීමට නො හැක."

(එදින ම නෙවිල් දයාසිරි අමතා) "මා ශ්‍රාවක පුත්‍රය, නුඹ පමණක් නො වෙයි, වියවුල් ව සිටින්නේ. අද මුළු ලෝකය ම මහා වියවුලකට මුහුණ දී ඇත. නුඹට සිතෙනු ඇත, නුඹ පමණයි, දරා ගත නො හැකි ප්‍රශ්නවල සිර වී සිටින්නේ කියා. නැත පුත්‍රය, නුඹට වඩා අසරණ බොහෝ දෙනෙක් අද ලොව පුරා දුක් විඳිති. ඒ අය මධ්‍යයට ගොස් බලන්න, එවිට නුඹට සිතෙනු ඇත, නුඹගේ ස්වාමින් වහන්සේ නුඹලාට මොන තරම් කාරුණික වී ඇද්ද කියා. මාගේ ප්‍රේමය නිසා නුඹලා මේ මොහොතේ ජීවත් වන්නහුය. දුගී භාවය නිසා නුඹලා මා තුළ උසස් වී ඇති බැවින් ප්‍රීති වන්න. කිසිවකු විනාශ වීම නො වෙයි, මාගේ පැතුම. එදා මෝසස් මාගේ ජනතාව ගෙන ගිය

ආකාරය මෙනෙහි කරන්න. ජනතාව මෝසස් ව හෙළා දකිමින් තම මැවුම්කරුවාණන් ප්‍රතික්ෂේප කළ ආකාරය ද, ඔවුන් ලැබූ දඬුවම් ද මෙනෙහි කරන්න. මේ තමයි, මාගේ ඉදිරි ගමන. පුත්‍රය, මා කෙරෙහි නොසැලෙන විශ්වාසය තෙක් වර්ධනය වන්න. මම කිසිවකු බොළඳ නො කරමි. හැම අත්දැකීමකින් ම නුඹලා ඉගෙන ගනිමින් නුඹලා උසස් වන තෙක් මම බලා සිටිමි. මම ශුද්ධ වූ ගිනි උදුනේ මාගේ ශ්‍රාවකයින් පවිත්‍ර කරමි. මාගේ මුලසුන කරගත් මෙම ගෘහය මගින් මම මාගේ ශ්‍රාවකයින් පරීක්ෂණයට ලක් කළෙමි. මේ ගෘහයේ සිටින මේ යුවල පිළිබඳ යථාර්ථය දකින්න. ඔවුන්ට නිවහනක් තනා දුන්නා යැයි ඔවුන් තුළ ප්‍රීතියක් නොමැත. මොවුන් ඒ තුළ සිටින්නේ මහා ගිනි උදුනක තබා තිබෙන සිරකරුවන් දෙ දෙනකු ලෙස යි. නපුරාගේ පාප ධාරී ගින්න දැන් ලොව පුරා ඇවිලෙමින් ඇත. පාපධාරී ගින්න දවාලන ශුද්ධ වූ ගින්න පැමිණෙනු ඇත. එය අති බිහිසුණු යි. දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ ගින්නට හසු වී පවිත්‍ර වන්නෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද, එවිට ඔවුන්ට ශුද්ධ වූ ගින්න විනාශයේ ගින්නක් නො වන බැවිනි.”

**2002 අගෝස්තු 08**

(කතෝලික සභාවෙන් ඉවත් ව වෙනත් කිතුනු නිකායකට සහභාගි වන සොයුරියක් අමතා)
“දියණිය, ඔබ එකිනෙක තැන්වල මා සොයා නො ඇවිදින්න. ඔබ කුඩා කල පටන් මුලසුන දී තිබුණු ඒ සභාව තුළ ම සිටින්න. නුඹේ මව්පියන් නුඹට පෙන් වූ ඒ දහම සත්‍යයේ දහම යි. මම සැබවින් ම දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන වෙමි. දිව්‍ය සත්ප්‍රසාදය ඔබට දිනපතා ලබා ගත හැකියි, දිව්‍ය පූජාව තුළ දී. මම ජීවමාන ව එහි වැඩ සිටිමි. නව ජීවිතයක් මුල පුරමින් දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන ස්වාමින් වහන්සේ සමග ජීවත් වන්න. නුඹ ගන්නා තීරණය දෙස ස්වාමින් වහන්සේ බලා සිටිති.”

**2002 අගෝස්තු 09**

“සියල්ලන්ගේ අයිතිකරු මම වෙමි. අන් හැම කෙනෙක් ම භාරකරුවන් පමණකි. මට යමෙකු ව අවශ්‍ය වුවහොත් මම ඒකාන්තයෙන් ම ගන්නෙමි. මම දෙවියන් බව මතක තබා ගන්න. කිසිවකුට නො හැකියි, මගෙන් ප්‍රශ්න කරන්නට. මම දුන්නෙමි, මම ගත්තෙමි, ඒ මාගේ කැමැත්ත යි, ඒ මාගේ පියාණන්ගේ කැමැත්ත යි. මම ප්‍රේමය වෙමි. මගේ උදහස නමැති ගිනි ජාලාවට හසු නො වන්න. ---- මම ලුසිෆර්ට බලය දී ඇත්තෙමි. මාගේ බලය එලෙස ම තබා ගනිමින් නුඹලා දෙන ප්‍රතිචාරය දෙස මම බලා සිටිමි. නුඹලා නොසැලෙන විශ්වාසයෙන් මා පසුපස එන්නේ ද කියා බලා සිටිමි. නුඹලා කෙතෙක් දුරට මට මුලසුන දෙන්නේ ද සාතන්ට මුලසුන දෙන්නේ ද කියා මම බලා සිටිමි. --- නුඹලාගේ භූමියේ නුඹලා එක් ව මා වෙනුවෙන් වෙන් කළ ඒ පිරිසිදු පැය, ඒ යාච්ඤාවේ පැය සිහිපත් කරන්න. එය යි, සාතන් පරාජය කළ හැකි නිර්මල පැය, බලගතු පැය. නුඹලා ඒ පැයෙන් ඉවත් වන විට ලුසිෆර්ට බලය තිබේ, නුඹලා වියවුල් කරන්නට. යාච්ඤාවේ ඒ පැය කිසි දින නැති කර නො ගන්න. පවුලේ සැම දිනපතා එක් ව යාච්ඤාවේ ඒ පැය පවත්වනවා නම් කොඩිවිණ පවා නුඹලාට බල නොපානු ඇත. නුඹලා කඩා වට්ටන්නට කිසිවකුට හෝ නො හැකි වනු ඇත. නුඹලා මා වෙනුවෙන් වෙන් කර ගත් පිරිසිදු පැයෙන් ඉවත් වන විට ඒ ගෘහයේ නපුරාට මුලසුන ලැබේ. නුඹලාගේ භූමිය නපුරාගේ රාජධානිය වනු ඇත. එවිට නුඹලාගේ භූමියේ කරදර ප්‍රශ්න ලෙඩ දුක් නිමක් නො වනු ඇත. මරණය දක්වා නපුරා සියල්ල ගෙන යනු ඇත. නපුරාට එයට ඉඩ නො දෙන්න. මා වෙනුවෙන් වෙන් කළ ඒ පිරිසිදු පැය, යාච්ඤාවේ පැය පවුලේ සියල්ලන් එක් ව නැවත අරඹන්න. ඒ සඳහා එක් වේලාවක් නියම කර ගන්න. එවිට කිසිවකුට ඉන් පලා යා නො හැකියි. නුඹලා නැවත යාච්ඤාවේ පැය අරඹන විට නපුරා වියරු වැටෙමින් මොහොතකට සියල්ල වියවුල් කරන්නට උත්සාහ කරනු ඇත. එහෙත් නපුරා විගස පසුබසිනු ඇත. මා වෙනුවෙන් දිනපතා නුඹලා වෙන්කර ගන්නා පිරිසිදු යාච්ඤාවේ පැය තුළ ඇති බලය නිසා නුඹලාගේ වැහැරුණු ගතිය, රෝගී භාවයන්, කරදර ප්‍රශ්න කෙමෙන් දුරු වෙමින් සතුට සුවය සැනසුම සමගිය නිරෝගී භාවය නුඹලාට ලැබෙන්නේය. මම නැවත නැවත ද ඔබට කියමි. යාච්ඤාවේ පිරිසිදු පැය ආරම්භ කළ යුතු කාලය යි, මෙය. ඉදිරි කාලය අති බිහිසුණු යි. ඒ සියල්ල පරාජය කළ හැක්කේ යාච්ඤාවේ පැය තුළිනි.”

**2002 අගෝස්තු 11**

“මම ස්වාමින් වහන්සේගේ පණිවුඩකරු ගාබ්‍රියෙල් වෙමි. ස්වාමින් වහන්සේගේ දාසිය වන සුජීවාගේ ආත්මය මේ මොහොතේ ස්වාමින් වහන්සේගේ හස්තයේ තබා මම මැය වෙත පැමිණියෙමි. ---- නුඹ වේදනා විඳින මවකි. ඒ සියල්ල තුළ නුඹ මට ආමෙන් කියන බව මම දකිමි. දියණිය, නුඹ විඳින වේදනා ගැන මෙසේ සිතන්න. ඒ තමයි, එදා මා ගෙන ගිය කුරුසිය අද නුඹ කර තබා ගෙන යන ආකාරය. ඒ කුරුසියේ ගමන යි, නුඹ යන්නේ. ---- කිසිවකුගේ ආදරයත් කරුණාවත් නොලබන නුඹලාට දෙවි වූ ස්වාමින් වහන්සේගේ ආදරය කරුණාව දයාව

ඇත. එනිසා කණස්සල්ල නමැති පාපයට යට නො වන්න. කුරුසියේ ගමනේ දී නුඹලාට පැසසුම් නො ලැබේ: කොන්චිම් වැඩි වේ. කොන්චිම් තුළ නුඹලා තවතවත් වර්ධනය වේ, මා තුළ."

**2002 අගෝස්තු 12**

"මම ස්වාමින් වහන්සේගේ පණිවුඩකරු වන ගාබ්‍රියෙල් නම් දූතයා වෙමි. ස්වාමින් වහන්සේගේ පණිවුඩය දීම සඳහා මැයගේ ශරීරය තුළට මාගේ ආත්මය ස්වාමින් වහන්සේ විසින් එවා ඇත. මොන තරම් කටුක බාධක නුඹලා මධ්‍යයට පැමුණුනත් නුඹලාගේ ප්‍රේමය තිර විය යුතුයි: විශ්වාසය වැඩි වර්ධනය විය යුතුයි. එය යි දරුවෙනි, පවුලක් ලෙස නුඹලාගේ දේව කැඳවීම. අන් අයට ආදර්ශවත් වන අයුරින් යාගික ප්‍රේමය තුළ පවුල් ජීවිතය ගොඩනගන්න. ලෝකයා දකින ලෞකික සැප සම්පත් තුළ නො ව දුක මුසු වූ ජීවිතය තුළ යි, සැබෑ සතුට රැඳී ඇත්තේ. ඒ මහා විඳවීම යි, මා හා ගමන් කරන දරුවන්ට ලැබී තිබෙන සම්පත. එය යි, කුරුසියේ ගමන. විඳවීම, දුක වේදනාව සැබෑ සත්‍යතාවයේ මාර්ගය යි. ලෞකික සැප සම්පත් සියල්ල මොහොතකින් විනාශ වී යන සුළු යි. නුඹලා විනාශ වීමට ඉඩ නොදෙන ප්‍රේමය මම වෙමි. මා අතට හසු වූ කිසිවකු විනාශ වීමට මම ඉඩ නො දෙන්නෙමි. මම ලුහුබඳින ප්‍රේමය වෙමි. මගෙන් ඈත් නො වන්න. මක්නිසාද, මම ප්‍රේමය මෙන් ම උදහස ද වෙමි. මා උදහස් වන්නේ නුඹලාට දක්වන ප්‍රේමය වැඩිකම නිසා ය. විටෙක මම මවක ලෙස නුඹලා තුරුල් කර ගනිමින් නුඹලා ළඟ සිටිමි. නුඹලා රෝගී වන විට මම නුඹලා සමග සිටිමි. නුඹලා ප්‍රශ්නවලට මැදි වී සිටින විට නුඹලා තනි වී ඇතැ යි නො සිතන්න. මක්නිසාද ඒ හැම මොහොතක ම මම නුඹලා සමග සිටිමි. නුඹලාට ඇහුම්කන් දෙන ප්‍රේමය මම වෙමි. ලෝකයා සොයන සැප සම්පත්වලින් මිදී හදවත නමැති සිංහාසනයේ මට ලැගුම් ගන්නට එය ශුද්ධස්ථානයක් ලෙස තබා ගන්නැ යි මම කාරුණික ව නුඹලාගෙන් ඉල්ලමි. ඔබගේ හදවත පවිත්‍ර කර ගනිමින් එය මට මුලසුන කර දෙන්න. ඔබගේ හදවත නුඹලාගේ දෙවියන් වැඩවසන ගෘහය ලෙස තබා ගන්න. පිටාතර පෙනුම කොතරම් දුගඳ හැමුවත් ඇතුලත පෙනුම ඒ පවිත්‍රතාවය අනගි සුවඳ විලවුන් මෙනි. ඒ මා අසුන් ගන්නා ස්ථානය යි. නිරන්තරයෙන් සත්‍යවාදි ව අවංක ව ඉදිරියට එන්න, දරුවෙනි."

"---- සැබවින්ම දුක් විඳින මවකි, නුඹ. වැළපෙන මවකි, නුඹ. එයම යි, මට ප්‍රසන්න වන්නේ. මක්නිසාද, එය මාගේ කුරුසිය කර තබා ගෙන යාම යි. මහා වණයක් නුඹගේ ඇතුලාන්තයේ රඳවා ගෙන වේදනා විඳියි. මේ සියල්ල තුළත් මම නුඹ සමග වැඩසිටිමි. පිපාසයෙන් මා සොයා එන දියණියකි, නුඹ. දියණිය, ඔබ සියල්ල සිතෙහි ධාරණය කරගෙන සිටීම මට ප්‍රසන්න යි. නිරන්තරයෙන් ඔබ මා තුළ ම වැඩෙන්න. මම නුඹලා අත් නොහැර නුඹලා සමග ම සිටිමි. නුඹලාට දිනෙක මහා සැනසීමක් ලැබෙනු ඇත. ඒ සදාතන සැනසීම ලබන්නට කැපවීම්, විඳවීම් අතරින් යා යුතු ව ඇත. ඒ කැපවීම ම මහා විඳවීමකි. මවක් තම දරුවන්ට දක්වන ආදරය තුළ මහා ගැඹුරක් ඇත. අද දරුවන් නොමඟ යවන්නට නපුරා ඉතා සූක්ෂ්ම ආකාරයෙන් ක්‍රියා කරමින් සිටී. එනිසා තම දරුවන් ගැන සොයා බලන්නට අද මව් පියන්ට විශාල වගකීමක් පැවරී ඇත. දියණිය, නො වැලපෙන්න. සියල්ල යහපතට විසඳන දෙවිඳාණෝ මම වෙමි. දියණිය, හදවත පැලෙන තරම් වේදනාවක් ඔබ තුළ තිබෙන බව මම දකිමි. එය යි, මවකගේ තිබෙන උතුරා යන සෙනෙහස. ඒ සෙනෙහස නොඅඩුව ම ඔබ තුළ තිබෙන බව මම දකිමි. දියණිය, මරියාවන් ගැන සිතන්න. ඇය සිතෙහි සියල්ල ධාරණය කරගෙන ඇගේ සිත ගලක් ලෙස එඩිතර ව තබා ගෙන මා කුරුසපත් වන තුරුත් ඇය පුදුමාකාර ලෙස මහා වේදනාව තුළ ලෝකයා ඉදිරියේ සිනා මුසුව මුහුණ දුන් ආකාරය දකින්න. ඔබත් එලෙස සිටින්නට තීරණය කරන්න. මොන බාධක ආවත් මා සොලවන්නට නො හැකි යැයි යන අධිෂ්ඨානයෙන් සිටින්න. ඔබ ව වියවුල් කරන්නේ ඔබ තුළ තිබෙන තත්ත්වය ම බව සිතන්න. නුඹට පිළිතුර මාගේ ශ්‍රී රුධිරයෙන් ම ලැබෙනු ඇත. මිදුම, සුවය, සැනසුම ඒ තුළ යි, දියණිය. එනිසා නිරන්තරයෙන් මාගේ රුධිර අභ්‍යාසයට යොමු වන්න."

**2002 අගෝස්තු 13**

"අද අභිරහස්මක ක්‍රියාවලියක් ලෝකයේ පුංචි දේශයක සිදු වෙමින් පවතී. ඒ දේශය මෙය යි. මේ දේශයෙන් මා සුළු පිරිසක් තෝරා ගෙන ලොවට අසම්මත ක්‍රියාවලියක් තුළ මම මාගේ සැලසුම් ඉටු කරමින් සිටිමි. ලොවට අසම්මත ක්‍රියාවලිය සම්මත වන මොහොත ළං ව ඇත. බලන්න, අද ලෝ පුරා ඇවිලෙන නපුරාගේ පාපධාරී ගින්න. මාගේ පවිත්‍ර කරණයේ ක්‍රියාවලිය ඇරඹී ඇත. තුනෙන් දෙකේ විනාශය ඇරඹී ඇත. ඉතිරි වන ජනතාව මාගේ ශුද්ධ වූ ගින්නේ දමා පුළුස්සා පවිත්‍ර කරන්නෙමි. සම්මත සභාව ඉක්මනින් කඩා වැටෙනු ඇත. මාගේ අසම්මත සභාව ගොඩනැගෙන මොහොතක් එනු ඇත. අද පවතින සභා ව්‍යුහය තුළ මාගේ ලෝක නායකයා ව ඉවත් කරන මොහොත ළං ව ඇත. දිනෙක ඔබට එය දැන ගන්නට ලැබෙනු ඇත. ඉන් පසු මහා වියවුල් සහගත කාලයක් උදා වේ. මාගේ පූජක පුත්‍රයින්ගෙන් සුළු පිරිසකි, ඔවුන් මට දී ඇති පොරොන්දුව අනුව කැප වී අද මට සේවය කරන්නේ. ඔවුන් ව ද යටපත් කරන්නට

ඉක්මනින් වෙනත් ලෝක නායකයකු පත් කිරීමට අද සියලු සැලසුම් සකස් වෙමින් ඇත. එය ශුද්ධ ලියවිල්ලේ ලියා ඇත. එය ඉටු විය යුතු ම ය. ඔබ හැම කෙනෙක් ම මේ කාලය තුළ ජේසුස් යන නාමයේ අවිය දරා ගමන් කරන්න. ඒ අවියෙන් ඔබ විසින් මහා සටනක් කළ යුතු ව ඇත. ඒ සටන ජය ගැනීම පිණිස ජේසුස් යන නාමය ම ඔබ තොල් මත තබා ගන්න, නිරන්තරයෙන්."

"---- ඔබ භාර්යාව හා දරුවන් සමග මා කැඳවන ප්‍රේමයේ මහා ගැඹුරු ගමන යන්නට සූදානම් වන්න. දරුවන්ට යහ මඟ පෙන්වමින් දුක වේදනාව ඔවුන්ට දැනෙන්නට ඉඩ හරින්න. මක්නිසාද, දුක වේදනාව හඳුනන දරුවෝ ඉදිරියේ දී බොහෝ යහපත් පල දරන්නෝය. ස්වර්ගීය සැප සම්පත් සේ මේ ලෝකයේ සැප සම්පත් දරුවන්ට දැනෙන්නට සැලැස්සුවොත් ඔවුන් දුක් විඳින මිනිසා කිසිසේත් නාඳුනන නොමඟට හැරෙන ජනතාවක් වනු ඇත. එනිසා දැහැමි යුගයට ඇවැසි අයුරින් දරුවන්ට ඒ පන්නරය දෙන්න. දරුවන්ට ආදරය කරන්න, තදින් සිටිය යුතු මොහොතේ තදින් සිටින්න. එවිට කෙවිට ගෙන ඔවුන්ට මඟ පෙන්වන්න. සියලු ආශාවන් මිට මොලවා ගෙන සිටින නුඹලාගේ දෙ අත් දිගහැර මා හා ගමන් කරන්න. එවිට මා සියල්ල සපයන දෙවිඳාණන් බව මතක තබා ගන්න. නොසැලෙන විශ්වාසය තුළ සියල්ල ඉටු වන බව මම පවසමි. මඳ ඇදහිල්ල තුළ කිසිවක් සපල නො වනු ඇත. අද මුළු මිනිස් සමාජය ම ඔවුනොවුන් මහිමයට පත්වන දේ සොයමින් ඔවුනොවුන්ගේ ඒ මහා ප්‍රාර්ථනා තුළ සිර වෙමින් සිටිති. එය නො වේ, සත්‍යයේ මාවත. දකින්න, එදා මා විඳි ලෝක නින්දාව, මිනිස් සංහතියට ගැළවීම උදා කරමින් දෙවි පියාණන් මහිමයට පත් කරනු සඳහා. එමගින් මම ද මහිමයට පැමිණියෙමි. ඔබගේ හදවත මුළුමනින් දෙවිඳුන්ට පුදන්න. එය යි, මහිමයට පත්වීමේ සැබෑ මාවත."

## 36

## "ප්‍රේම කළ නො හැකි මොහොතෙත් ප්‍රේම කිරීම තුළ යි, ඔබ තුළ දේව ගති පැවතුම් ඇති වන්නේ."

**2002 අගෝස්තු 14**

"දරුවෙනි, මාගේ පියාණන්ගේ කැමැත්තට සියල්ලන් නතු කිරීම යි, මාගේ පැතුම. ප්‍රේමය යි, සැබෑ දෙවියන්. ප්‍රේම කළ නොහැකි තත්ත්වය තුළත් ප්‍රේම කිරීම තරම් උතුම් ප්‍රේමයක් තවත් නැත. ප්‍රේම කරන්නට ඉගෙන ගන්න, හැම කෙනකුට ම, දුගී හිඟන්නාට පවා. කැමැත්තෙන් ම මා අතට නතු වූ නුඹලා මා රිසි ලෙස කඩමින් අඹනු ලබන බව ඔබ හැම කෙනෙක් ම වටහා ගත යුතුයි. මා කෙරෙහි නොසැලෙන විශ්වාසයෙන් ඔබ පැමිණෙන්නෙහි ද එවිට ඔබගේ පැතුම් මම ඉටු කරමි, ඒ යහපත් පැතුම් පමණි. ඔබ මා උදෙසා පූජා වන්නෙහි ද එවිට මම ද මාගේ පියාණෝ ද ඔබ වෙනුවෙන් පූජා වන්නෙමු. ඉවසීම වර්ධනය කර ගන්නඃ ඉවසීම යි, නුඹලා ව උසස් කරනු ලබන්නේඃ බැහැපත් කරනු ලබන්නේ. යමෙක් නුඹලාට බැන්නත් ගැහුවත් සියල්ලන්ට ආමෙන් කීම යි, නුඹලා තුළ තිබිය යුතු ප්‍රේමයේ ගුණාංග ය. මාගේ ශ්‍රාවකයින් වන නුඹලා මාගේ ශුද්ධ වූ ගිනි උදුන වෙත ගෙන යන්නෙමි. දැන් නුඹලා ඒ ගමනට පිවිස ඇත. මාගේ මෙම ශුද්ධ වූ ක්‍රියාවලිය මනුෂ්‍යයාට තේරුම් ගන්නට අපහසු ය. මෙය තේරුම් ගන්නට කල් ගත වනු ඇත. දැන් සියල්ල ටිකෙන් ටික වෙමින් පවතී. මිනිසා හිතන තරම් ඉක්මනින් සියල්ල එක මොහොතකින් විනාශ නො කරමි. නුඹලා සාතන් ගැන නිතරම හිතනවා නම් නුඹලා මට කරන මොරගැසීමෙන් පලක් නැත. ඔහුගේ නාමය පවා නිරන්තරයෙන් නුඹලාගේ තොල් මත නොතිබිය යුතුයි. මම ඔහුට බලය දුන්නෙමි. එහෙත් ඔහුට කිසිවක් කළ නො හැකිය. මා කුරුසිය මත ගෙවූ මිලය නිසා ඔහු අන්ත පරාජිතයකු බව නිතරම මතක තබා ගන්න. මාගේ යාගික රුධිරයෙන් පෙඟෙමින් ජේසුස් යන මාගේ නාමය තුළ ම ගමන් කරන්න. එතැන යි, මහා ශක්තිය. ---- අන් අයට ඔබ අවවාද කරනවා වගේ ම ඔබට කෙනකු අවවාද කරන විට ඉවසීමෙන් එය තෑග්ගක් ලෙස ලබා ගන්නට පුරුදු වන්න. ඒ මොහොතේ ඔබගේ හෘද ස්පන්දන වේගය වැඩි වෙනවා කියන්නේ නපුරාට මුලසුන දීම යි. දුගී භාවය තුළ නුඹලා මෙතෙක් පැමිණි ගමන මෙනෙහි කරන්න. ලෝක නින්දාව එදා මා සමග තිබිණි. මා එයට මුහුණ දුන් ආකාරය දකින්න. එය යි, උතුම් වූ ප්‍රේමය. මිනිසුන් ඔබට මොන තරම් නින්දා කළත් දෙවි වූ ස්වාමින් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් යුතු ව සිත එඩිතර ව තබා ගන්න. එවිට නුඹලා ව කොන් කරන නුඹලාට සමච්චල් කරන අය ම දිනෙක නුඹලා ව ආදර්ශයට ගනු ඇත."

**2002 අගෝස්තු 15**

"මම ස්වාමින් වහන්සේගේ පණිවුඩකරු ගාබ්‍රියෙල් වෙමි. එදා මරියාවන්ට පණිවුඩය ගෙනා මම දැන් ඔබ වෙත ද පණිවුඩ ගෙන එන්නට කැප වී සිටිමි. ලෝකයේ සැප සම්පත් නපුරාගේ මංදිරය යි. මාගේ කැඳවීම ඇත්තේ දුක වේදනාව තුළ යි. දුක වේදනාව තුළ යි, සැබෑ ප්‍රේමය, එකමුතුකම, සමගිය, සමාදානය ගොඩනැගෙනුයේ. ධනය ඇති මිනිසා ධනයට කෑදර ව නිරතුරු ව හිතියෙන් සිටී: නිරතුරු තෘෂ්ණාවෙන්, උඩඟුකමෙන්, මෝහයෙන්, කාමයෙන් දැවේ. ඒ සියල්ල නපුරාගේ රාජධානියට අයත් දේවල් ය. දුගී භාවය ඇතුලත තබා ගෙන ජීවත් වන ධනවත්තු ද සිටිති. දරුවෙනි, ඔබ ගෙවන ජිවිතය තුළ කටුක දුක වේදනා හැම මොහොතක ම ඔබ වටා තිබෙන විට මා ඔබ ළඟ ම සිටින බව නිරතුරු මතක තබා ගන්න. කුරුසිය කර තබා ගෙන යාම යනු එය යි. දරුවෙනි, ඔබ කුරුසියේ ගමනට උර දෙමින් ඒ කුරුසිය කර මත තබාගෙන යා යුතු කාලය යි, මේ. ලෞකික ලෝකයට හසු නො වන්න. ඔබගේ හදවත නමැති ගෘහය ස්වර්ගීය සිංහාසනය කරමින් නිරතුරු මට වැඩවසන්නට ඉඩ සලසන්න."

"මා නුඹලාට තෝරා දුන් එඬේරා මාගේ වචනයට ඇහුම්කන් දෙමින් මාගේ වචනයට කීකරු වන පරඬැලක් පමණි. ඔහු පනුවකු හා සමානය; සැබවින් ම කිසි ම කිසිත් නැත්තෙකි, ඔහු. ඔහු මාගේ වචනයට කීකරු වන මාගේ දාසයකු පමණි. මාගේ ශ්‍රාවක දරුවෙනි, එඬේරා සමග සම්බන්ධකම වර්ධනය කර ගන්න. නොසැලෙන විශ්වාසයෙන් ඔහු හා අත්වැල් බැඳ ගන්න. අන් අයගෙන් ලැබෙන අඳුරු සිතුවිලිවලින් මනස පුරවා නො ගන්න. එඬේරා තුළින් ලැබෙන සත්‍යය ඔබ ව උසස් කරනු ඇත. දැන් ශුද්ධ වු ගමනට ශ්‍රාවකයින් ඇතුළු වී හමාර යි. බොහෝ දුර ගමනක් යාමට ඇත. පීඩාකාරී භාවය දිනෙන් දින වැඩි වන්නේය. ඒ සියල්ල පරාජය කරන මාගේ ශ්‍රී රුධිරය  සිහි ගන්වමින් ශ්‍රාවකත්වය සඳහා පොරොන්දු දෙමින් එඬේරා හා එක් ව ගමන් කරන්නට තීරණය කරන්න. මම මාගේ පියාණන්ගේ කැමැත්ත ඉටු කළෙමි. දරුවෙනි, දැන් ඔබ මාගේ කැමැත්ත ඉටු කරන්න."

"මාගේ ශ්‍රාවකයිනි, ඔබ දැන් පියවර තබමින් ගමන් කරන්නේ මහා ගිනි උදුනක බව ඔබට තව ම නො වැටහෙයි. තව ම ඇතුල් වූවා පමණි, නුඹලා. ලෝක නින්දාව ඔබ හැම කෙනකු පසුපස යි. ඔබට එයින් පලා යා නො හැක. මක්නිසාද, මා ඒ නින්දාවට මුහුණ දෙමින් ඒ ගෙව්ව මිලය නුඹලා වෙනුවෙන් ගෙව්ව මිලය යි, දරුවෙනි. දැන් ඔබත් ඔබට දී තිබෙන එඬේරා සමග අත්වැල් බැඳගෙන ඔබ ඉදිරියට පැමිණෙන ඒ නින්දාවට මුහුණ දෙන්නට සැරසෙන්න. මාගේ මෙම අසම්මත ක්‍රියාවලිය සම්මත වන මොහොත ආසන්න ව ඇත. නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමන් නෙරපන මොහොත ළං ව තිබේ. ශුද්ධ ලියවිල්ලේ ලියා ඇති සත්‍යය ඒකාන්තයෙන් ම සිදු වන්නෙය. ඉදිරියට පැමිණීමට නියමිත ව සිටින ඒ මහා පාපධාරී ගින්නට සමවදින ඔවුහු මා පත් කළ ලෝක නායකයා ව නෙරපා දමති. මෙය සිදු විය යුතු ම ය. මක්නිසාද, මෙය තමා මාගේ ශුද්ධ වු ගින්න තුළ ලෝකය පවිත්‍ර කිරීමට අනාදියේ පටන් සූදානම් කර තිබෙන සත්‍යතාවය. ලෝ සම්මත සභාව කඩා වැටෙමින් ඉන් පසු පැමිණෙන සභාව බලන්න, නපුරාට ඉඩ දෙන. ඒ තමා මෘගයා ව ඉදිරියට ගෙන එන ඒ මහා විරුද්ධකරුගේ ක්‍රියාකාරීත්වය. ලෝක ජනතාව අඩකට වඩා එයට හසු වෙති. දැනටමත් මම ලෝකයට පණිවුඩ යවමින් මෙ ලෙස ප්‍රකාශ වන්නෙමි, මාගේ දරුවන් ගැළවීම පිණිස. ඒ මහා කාර්යය සඳහා යි, මා අසම්මත වූ සභාවක් පිහිටුවමින්, ශ්‍රාවකයින් තෝරා ගනිමින්, එඬේරකු දෙමින් මෙම අසම්මත ක්‍රියාවලිය ආරම්භ කළේ. එය දැන් ලෝකයට ප්‍රකාශ කරන කාලය ළං ව ඇත. වියවුල් නො වන්න, මාගේ නාමයේ අවිය දරා සිටින්න. ලෝකයේ තුනෙන් දෙකේ විනාශය ඇරඹී ඇත. පවිත්‍ර කිරීමේ ශුද්ධ වු ගින්න ඊ ළගට ඇවිලේ. එයින් පවිත්‍ර කිරීමේ මොහොත ළං ව ඇත. ලෝකයා දකින සුන්දරත්වයේ මහා මන්දිර කඩා වැටෙන කාලය බොහෝ ළං ව ඇත. මාගේ දරුවෙනි, තෘෂ්ණාවන් මිට මොලවා ගෙන තිබෙන දෑත් දිග හරින්න."

"මා මුලසුන ගත් මේ ගෘහය ඉදිරි යුගයට ඒකාන්තයෙන් ම අවශ්‍ය වන්නේය. එය මහා අභිරහසකි. ලෝකයා නොයෙක් වදන් පවසමින් නුඹලාට නින්දා කරනු ඇත. මා වෙනුවෙන් එය ඉවසන්න. ඉවසීම, බැහැපත්කම වර්ධනය කර ගන්න. මරියාවන් මෙන් සියල්ල සිත් හී ධාරණය කර ගෙන මෙනෙහි කරන්නට පුරුදු වන්න. ඔබ කිසි ම කිසිත් නැත්තන් සේ ජීවත් වන්න. මා තුළ ම රැඳී සිටින්න. මා ගෙන ගිය කුරුසය දැන් නුඹලා කරපිට යි, දරුවෙනි තබා තිබෙන්නේ. ලෝක ජනතාවගේ ම බර දැන් ඔබ කරපිට තබා ඇත. වැටිවැටී නැගිටිමින් ඉදිරියට ම එන්න. ඒ කුරුසියෙන් ඈත් නො වන්න. දරුවෙනි, ඔබ ව යට කරන ධනය නමැති රකුසාගෙන් මිදෙන්න. එය නපුරා සතු දෙයකි. ධනය ඇතත් යහපත කරා ම යොමු වන ධනවතුන් මම දකිමි. ධනය වර්ධනය වීම නිසා අයහපත කරා යොමු වන ජනතා ව මම දකිමි. දුගී භාවය නිසා යහපත කරා යොමු වෙමින් මට මොරගසන ජිවිත මම දකිමි. අන්ත දුගී භාවය නිසා නපුරාට ඉඩ දෙන ජිවිත

මම දකිමි. මෙ තැන් සිට ගෙවෙන හැම මොහොතක් තුළ ම ඔබ කුඩා වී මට ඔබ තුළ විශාල වීමට ඉඩ දෙන්න."

**2002 අගෝස්තු 16**

"මාගේ අසම්මත ක්‍රියාවලිය තුළ තෝරා ගත් ශ්‍රාවකයින් පවිත්‍ර කරමින් මම සභාව ගොඩනගමින් සිටිමි. එය මාගේ ශුද්ධ වු පවිත්‍රකරණය යි. ඔබ සියලු දෙනාට එඬේරකු ලෙස තෝරා ගෙන ඒ අසම්මත වු එඬේරිකත්වය සඳහා මම ඇන්තනි අප්පුහාමි පත් කළෙමි. ඔහු දේව ප්‍රඥාව තුළ හැම මනුෂ්‍යයකුට ම මඟ පෙන්විය හැකි අයෙකි. ඔබේ ජීවිතයට පලදායි මාවත ඔහු පෙන්වනු ඇත. අද කොන් වෙමින් නිව වෙමින් මිනිසුන් ඉදිරියේ එතරම් ම නිව පුද්ගලයකු බවට පත් වෙමින් අසරණ ව සිටින ඔහු දෙස බලන්න. එහෙත් ඔහු සැහැල්ලුවෙන් සිටින ආකාරය දකින්න. පුංචි දරුවකු ලෙස ජිවත් වන ආකාරය දකින්න. ශුද්ධ වු ලියවිල්ලේ ලියා ඇති සියල්ල සිදු වන්නේ ම ය. නුඹලාගේ ශුද්ධෝත්තම පාප් තුමා ඉවත් කරන මොහොත ළං ව ඇත. ඉන් පසු මහා බිහිසුණු මොහොතකට ඔබ හැම කෙනකුට ම මුහුණ පාන්නට සිදු වේ. ඔබ හැම ඒ මොහොතේ ජේසුස් යන නාමය තුළ ම රැඳෙන්න. මා ගෙවු මිලය වන මාගේ ශ්‍රි රුධිරයෙන් පෙඟෙමින් සිටින්න, හැම මොහොතක ම. ඔබට එයින් ගැළවීම ඇත. අද මෙයාකාරයෙන් නොයෙක් තැන්වල බාලයින් තුළින් මාගේ අනාවරණ දෙන කාලය යි, ලෝකය පවිත්‍ර කිරීම පිණිස. ඔබ මට ඇහුම්කන් දෙන්නෙහි ද එවිට මම ද මාගේ පියාණෝ ද ඔබට ඇහුම්කන් දෙමු."

"මාගේ දරුවෙනි, මාගේ මෙම ක්‍රියාවලිය අසම්මත වු ක්‍රියාවලියක් ලෙස ලෝ සම්මතය තුළ සිටින සියල්ලෝ දකිති. එහෙත් මෙම අසම්මත දෙය ලෝ සම්මත වන මොහොත ඉතා ආසන්න ය. මෙම ක්‍රියාවලිය ලෝ අසම්මත ව තබා ගෙන මාගේ දැඩි පවිත්‍රකරණයට ලක් කරමින් සිටිමි. ශුද්ධ වු ලියවිල්ලේ ලියා ඇති දේ සිදු වන මොහොත පැමිණෙමින් ඇත. එහෙත් මාගේ මෙම අභිරහස්මක ක්‍රියාවලිය ශුද්ධ ලියවිල්ලේ සඳහන් ව නොමැත. මේ පිළිබඳ දිවැසි වැකිය සටහන් කිරීමට සිටි ඔහු මම ඒ මොහොතේ වැළැක්විමි. මක්නිසාද, එය සඳහන් ව තිබුනේ නම් මාගේ මෙම ක්‍රියාවලිය බොහෝ ගරු බුහුමන් මැද ජනතාව විසින් පිළිගනු ඇත. මෙම අදියර නින්දා අපහාස වේදනා මැද ඉටු වීම යි, මාගේ පියාණන්ගේ සැලැස්ම. මාගේ දෙ වන පැමිණීමට ලෝකය සුදානම් කරන්නට මා මෙයාකාරයෙන් ක්‍රියා කරන බව ශුද්ධ ලියවිල්ලේ සඳහන් වී නොමැත. එහෙත් එයින් දගමයක් සඳහන් ව ඇත. එනම්, උගතුන්ගෙන් හා සමතුන්ගෙන් සඟවා බාලයන් තුළින් මාගේ අනාවරණයන් ප්‍රකාශ කරන බව ය. උගතුන් ද සමතුන් ද නැණවතුන් ද බලවතුන් ද ලජ්ජාවට පමුණුවන පිණිස මාගේ අනාවරණයන් බාලයන් තුළින් කරන බව ය. යම් දිනෙක නුඹලාට එඬේරා ලෙස දී තිබෙන 2වන ජුවාම් පාවුලු සුදු පියා ඉවත් කිරීම හා ඉන් පසු සිදු වන මහා අරගලය, 666, මෘගයා හා මකරා පිළිබඳ ශුද්ධ වු ලියවිල්ලේ සඳහන් කොට ඇත. එය සිදු වෙමින් ඇත. එයින් මාගේ දරුවන් ගළවා ගැනීම පිණිස මම මෙයාකාරයෙන් ක්‍රියා කරමි. මේ ක්‍රියාවලිය පිළිබඳ ලෝ සම්මත සභාව තුළින් තව ම මාගේ ජනතාවට කිසිදු මඟ පෙන්වීමක් ලැබී නැත. අද මේ මොහොතේ ද වතිකානයේ මහා කුමන්ත්‍රණයක් සිදු වෙමින් ඇත, ඔහු පහකර දමනු සඳහා. ශුද්ධ ලියවිල්ලේ සඳහන් පරිදි නුඹලාගේ සුදු පියා ඉවත් කිරීම සිදු වන්නේ ම ය. ඉන් පසු සිදු වන මහා අරගලයේ දී ගැළවීම ලබන්නේ මාගේ නාමය තුළ දිවි ගෙවන මාගේ දරුවන් හා මාගේ නාමය දරමින් දිවි පුදන මාගේ දරුවන් පමණි. මරණයට බිය නො වී මා අනුව ගමන් කරන නොසැඟවී ඉදිරියට එන මාගේ නාමයේ අවිය දරා ගමන් කරන අය පමණි. ඔබ ද නාස්ති නො වනු සඳහා ලෝක ප්‍රඥාව තුළ නො ව දේව ප්‍රඥාව තුළ ජිවත් වන්න. ලොව සම්මත සභාව කඩා වැටෙමින් ලොව අසම්මත සභාවක් යම් දිනෙක සම්මත වනු ඇත."

"ලෞකික ලෝකයට හසු නො වී ඇතුලාන්තයෙන් අවංක ව පවිත්‍ර ව හැම කෙනකුට ම ප්‍රේම කරන්න. ප්‍රේම කළ නොහැකි මොහොතෙත් ප්‍රේම කිරීම තුළ යි, ඔබ තුළ දේව ගති පැවතුම් ඇති වන්නේ. මා අතට හසු වී සිටින හැම කෙනකු ම මාගේ සිරකරුවන් ය. ලෝක නින්දාවෙන් නුඹලාට පලා යා නො හැකිය. කල්වාරි කඳු මුදුනේ කුරුසියක් මත පුංචි රෙදි කඩකින් නිරුවත වසා ගෙන සිටින ඒ මිනිසා දෙස බලන්න. ලෝක නින්දාවෙන් පලා යෑමට මට හැකියාව තිබිණි. එහෙත් මම මාගේ පියාණන්ගේ කැමැත්තට ආමෙන් කීවෙමි. දැන් එවැනි ම පවිත්‍ර කරණයක් ලෝ අසම්මත ක්‍රියාවලිය තුළ සිදු වෙමින් ඇත. ලෝකයාට නොදැනෙන නොපෙනෙන ලෙස සුළු පිරිසක් මේ අසම්මත ක්‍රියාවලියට ඇතුළු වෙමින් ඒ තුළ මහත් නින්දා අපහාස, කොන් වීම් මැද තමා මුළුමනින් අමතක කරමින්, තම කැමැත්ත තම ආශාවන් නසා ගනිමින් ගමන් කරන ආකාරය දකින්න. මෙය යි, සැබෑ දේව දරුකම. ලෝ අසම්මත ක්‍රියාවලියක නායකත්වයට පත් කරමින් නුඹලාට එඬේරකු ලෙස මම ඇන්තනි අප්පුහාමි ව දුනිමි. ඔහු සියල්ල නැති කර ගනිමින් මට ඉඩ දෙන චරිතයකි. අද ඔහු ඔහුගේ ම පවුලේ සහෝදර සහෝදරියන්ට පවා තේරුම් ගත නොහැකි තැනක යි සිටින්නේ. එහෙත් දිනක ලෝකය ම ඔහු පිළිගනු ඇත. තමා උසස් වන්නට දඟලන අය බොහෝ සිටිති. මා පතන පුද්ගලයා එවැන්නකු නො වේ. මා පතන පුද්ගලයා තමකම නසා

ගනිමින් මා අනුව ගමන් කරන තැනැත්තා ය. ඔබ හැම කෙනෙක් ම තමා තමා ව දකින්න. තමා මොන තරම් දුර්වලයෙක් ද කියා දකින්න. තමා මොන තරම් නීච පව්කාරයෙක් ද කියා දකින්න. අද බොහෝ අය කැමති නො වෙති, තමා පව්කාරයකු බව පිළිගන්නට. මා මොන තරම් නිර්දෝෂ ද, මා මොන පව් ද කරල තිබෙන්නේ, යනුවෙන් ඔවුහු පවසති. එවැනි සිතුවිලි තුළ සිටින පුද්ගලයා ම මහා පාපිෂ්ඨයෙකි. තමා පාපිෂ්ඨ බව අවංක ව පිළිගැනීම ම ඇති, මාගේ රාජ්‍යයට පැමිණීමට. තමා කරන පුංචි වරදක් පවා මහා පාපයක් ලෙස දකින්නා තුළ උතුම් දේව ගතියක් ඇත."

"ඇන්තනි අප්පුහාමිගේ පවුලේ අය ශුද්ධ වූ වචනය අබියසට දැන් පැමිණෙන්න. දරුවෙනි, මම නුඹලාට මෙසේ පවසමි. නුඹලා වැනි සහෝදරයන් සහෝදරියන් ලබන්නට ඔහු ද ඔහු වැනි සොහොයුරකු මෙ වැනි යුග පුරුෂයකු ලබන්නට නුඹලා ද වාසනාවන්ත වී ඇත. මක්නිසාද, ඔබ කිසිවකුට කළ නො හැකි දේ ඔහු තුළින් මම ඉටු කර ගන්නෙමි. එදා මා ජනතාවට කළ සේවය මා ඔහු තුළින් මෙදා ජනතාවට කරන්නට මම ඔහු තෝරා ගතිමි. ඒ තුළ නුඹලාගේ පවුලේ සියලු දෙනා ආශිර්වාද ලත් ජනතාවකි, ඔහු නිසා. ඔහු ව බිහි කළ මව අද ස්වර්ගයේ මා අබියස සිටී. ඇය පුදුමාකාර ප්‍රීතියකින් තම දූ පුතුන් දෙස බලා සිටින්නීය. බලන්න, ඒ දැහැමි වූ කාන්තාව, ඒ මව මට දී තිබෙන මිල කළ නොහැකි උතුම් තෑග්ග. නුඹලා වත් ඒ දැහැමිකම තුළ, ඒ නිහතමානී භාවය තුළ ගොඩනැගීම ගැන මම ප්‍රසන්න වෙමි. දැන් ඔබ සැබෑ තත්ත්වය දැන ගන්න. එදා ජනතාව මා නීච පව්කාරයකු ලෙස දුටහ. එනිසා මම මහත් නින්දා අපහාස වින්දෙමි. අද ඔබගේ සොහොයුරාත් මාගේ ඉරණමට දායක වෙමින් සිටී. අද ඔහු අවලංගු වූ, කොන් වූ අයකු ලෙස, පාපිෂ්ඨයකු ලෙස, පිස්සකු ලෙස සමහරු දකිති. ඒ සියල්ල ඔහු දනී. අද හොරකු ලෙස තක්කඩියකු ලෙස ද සමහරු ඔහු ව දකිති. දරුවෙනි, මේ තමා සැබෑ දේව කැඳවීම. ඒ තුළ නුඹලා අවුල් නො වන්න: කනස්සලු නො වන්න. නුඹලා මේ තුළ ප්‍රීති විය යුතු යි, දරුවෙනි. ඒ තමා සැබෑ ධර්මිෂ්ඨ වූ යුග පුරුෂයා. විටෙක දාසියක ලෙස ද විටෙක දාසයකු ලෙස ද ඔහු ඔබ හැමට ම සේවය කරයි. ඔහු මාගේ ප්‍රඥාවෙන් පූර්ණ ය. ඔබ අබියස පවා ඔහුට බැන වදින අය ඉදිරියේ දී සිටිනු ඇත. ඒ මොහොතේ දී සහෝදරයින් හැටියට නුඹලාට මහත් වේදනාවක් දැනෙනු ඇත. එය මට පුදන්න. මක්නිසාද, ඔහු බැනුම් අසන්නේ, නින්දා අපහාස ලබන්නේ මාගේ කැඳවීම නිසා බව මතක තබා ගන්න. නුඹලා එක ම පවුලක දම්වැල් පුරුක් ලෙස ඔහු හා අත්වැල් බැඳ ගන්න: දුක සැප බෙදා ගන්න. නුඹලා කෙරෙහි මම ප්‍රසන්න වෙමි. මේ සියල්ල නුඹලා දැන ගත යුතුය."

## 37
## "නිරන්තරයෙන් මා සිහි ගන්වන මාගේ රුධිර අභ්‍යාසයට යොමු වන්න."

**2002 අගෝස්තු 18**

"වෙහෙසෙන බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න යැයි මම මොරගසමි. නුඹලා දුක් විඳින විට නුඹලාගේ සිතුවිලි මම දකිමි. ඒ දුක් විඳීම ම මට මහා ප්‍රීතියකි. මාගේ දරුවෙනි, ඒ තමයි නුඹලා නොදැනුවත් ව මා ගෙන ගිය කුරුසිය නුඹලා කර තබා ගෙන යාම. නුඹලාගේ පවුල් දිවිය තුළ ඒ විඳවීම ඒ මහා කුරුසියේ විඳවීම ලෙස මෙ තැන් පටන් සිහියේ තබා ගන්න. දුගී භාවය නිසා නුඹලා විඳින දුක් ගැහැට තුළ කනස්සලු නො වන්න. නුඹලා විඳින කටුක වේදනා මැද මහා ප්‍රීතියක් ඇත. නපුරා විසින් නුඹලා ව කනස්සල්ලට වෛරයට ඇද දමන ආකාරය මම දකිමි. කිසි දින නපුරාට යට නො වන්න. ඇතුලත පෙනුම පවිත්‍ර ව තබා ගන්න. ඔබ සියල්ල අත් හැර එන මොහොතේ ඔබගේ ආත්මය මුළුමනින් පවිත්‍ර ව තබා ගත්තොත් ඔබ මා තුරුලට මම නෙලා ගන්නෙමි. සියලු නිරා දොරටු බිඳ දමමින් නුඹලා මා ළඟට ගන්නට මම බලා සිටිමි. බොහෝ ගිනි ජාලා පසු කරමින් එන්නට ඇත, ඒ ගමන තුළ. මෙහි තිබුණාට වඩා මොන තරම් භයානක ගින්නක් ද එහි තිබෙන්නේ කියා ඒ ගිනි ජාලාව තුළ දී යමකුට හැඟෙනු ඇත. ඒ ශුද්ධ වූ ගිනි ජාලාව තුළ මාගේ පවිත්‍ර කරණය සිදු වේ. බොහෝ දේ සිදු වීමට ඇත, මේ ලෝකය හැර යන දිනට. එනිසා ඔබ මේ ලෝකයේ ජීවත් වන විට නිරතුරු සැලකිලිමත් වන්න, ඔබේ ඇතුලත පවිත්‍ර ව තබා ගන්නට. එවිට මම මේ සියලු නිරා දොරටුවලින් ඔබ ගළවා ගෙන මා තුරුලට ගන්නට බලා සිටිමි."

"මාගේ දරුවෙනි, නුඹලාගේ හදවත නමැති ගෘහය පවිත්‍ර ව තබා ගන්නේ එකිනෙකාට ප්‍රේම කිරීමෙනි, බැහැපත් වීමෙනි, කෙනකු ඔබගේ කම්මුලට ගැසූ විට අනෙක් කම්මුල හරවන්නට තරම් නිහතමානී වීමෙනි, තව කෙනෙක් උසස් වී ඔබ පහත් වෙනවා දකින්නට අවංක ව කැමති වීමෙනි. එවැනි සිතුවිලිවලින් ඔබ පූර්ණ වන කල ඔබගේ හදවත නිර්මල යි, දරුවෙනි. කෙනෙක් උසස් වීම් ලබන විට ඔබ ප්‍රීති විය යුතුයි. මෙය යි, මාගේ ඉගැන්වීම. එසේ ප්‍රීති වන තැනැත්තා

ඒ මොහොතේ ම උසස් කරනු ලබයි. කෙනෙක් උසස් වී තමා පහත් වන කල ප්‍රීති වන තැනැත්තා ඒ මොහොතේ ම මා ඉදිරියේ උසස් කරනු ලබයි. ලෞකික සියල්ලෙන් හිස් ව ඔබගේ හදවත නමැති ඒ සිංහාසනය මට ලැගුම් ගැනීමට ඉඩ තබන්න. එවිට මම ඔබ තුළ වැඩසිටිමින් ඔබ ව පාලනය කරමි, කඩමින් අඹන්නෙමි, සුරකින්නෙමි, ගළවන්නෙමි. ඔබ මෙ ලොව හැර යන දිනට මීට වඩා නිරා දොරටු කීපයක් පසු කර යන්නට සිදු වේ. ඒ සියල්ලෙන් මිදී නුඹලා විගස මා තුරුලට නෙලා ගැනීම සඳහා ඔබගේ හදවත නිර්මල ව තබා ගන්න. මම ඒ සඳහා නුඹලාට මෙ ලෙස මඟ පෙන්වමි. මාගේ දරුවෙනි, දුගී භාවය තුළ, දුක වේදනාව තුළ ජීවත් වන්න. එය යි, මාගේ කුරුසියේ මඟ. ඔබ දූ පුතුනට ඒ දුක් විඳිමේ අගය කියා දෙන්න. ඔබ ඔබගේ දරුවන්ට නපුරාගේ මන්දිරය වන ලෞකික සියල්ල පරම සැපත ලෙස පෙන් වූ විට ඔවුහු විනාශ වෙති. දුක වේදනාව නොහඳුනන ඔවුහු සැප සතුට තුළ ම විනාශය කරා ඇදෙති. එනිසා දරුවෙනි, ඔබගේ දරුවන්ට පවා දුක වේදනාව දැනෙන්නට සලස්වන්න. දුක වේදනාව තුළ ඔවුන් පුහුණු කරන්න. ඒ සියල්ල දිනෙක ඔවුන් උසස් කරනු ඇත඼ ධර්මිෂ්ඨ කරනු ඇත. දැහැමි යුගයට අවශ්‍ය ආකාරයට දරුවන් හැඩ ගස්වන්න.”

“මාගේ දරුවෙනි, නුඹලා රෝගී වන්නේ නුඹලාගේ මනස බොහෝ විඩාවට පත් වන තුරු බොහෝ දුර ගෙන යාම නිස යි. නුඹලාට දී තිබෙන හැම අවයවයකට ම නුඹලා මොහොතින් මොහොත ගෞරව කළ යුතුයි. නව දිනක් උදා වන විට පළමු ව ඔබේ මැවුම්කරුවාණන්ට ඒ දිනය බාර කරමින් තුති පුදන්න඼ ඔබට දී තිබෙන දේ ගැන තුති පුදන්න. මට ප්‍රශංසා කරන්නට බොහෝ දේ ඔබට ඇත. ඔබට ලැබී ඇති ප්‍රඥාව ගැන බුද්ධිය ගැන ශාරීරික, මානසික, ආත්මික සියල්ල ගැන ඔබගේ මැවුම්කරුවාණන්ට ප්‍රශංසා කරන්න. ඔබගේ මනස වඩාත් වෙහෙසන්නට සිදු වන්නේ ද එවිට ඔබගේ මනස දෙවිඳුන්ට බාර කරන්න. ඔබගේ දෑත වෙහෙසන්නට සිදු වන විට එය එතුමන්ට බාර කරන්න, තුති පුදන්න. නුඹලාගේ ස්තුතිය මම බලාපොරොත්තු නො වෙමි. එහෙත් නුඹලා සුවපත් වීම සඳහා ඒ පැවැත්ම නුඹලා තුළ තිබිය යුතුයි. මම මාගේ පියාණන්ට නිරන්තරයෙන් තුති පුදමින් කීකරු වන්නෙමි. නුඹලා ද එසේ ම විය යුතුයි, මාගේ දරුවෙනි. ඔබ යම් දිනෙක මෙ ලොව හැර යනු ඇත. එවිට නුඹලාට පසු කිරීමට බොහෝ නිරා දොරටු ඇත. එය සත්‍යතාවයකි. එයින් පවිත්‍ර වී ඒ අවසානයේ මා වෙත නුඹලා කැඳවා ගන්නෙමි. ඒ නිරා දොරටුවලින් ගැළවී නුඹලා මා තුරුලට විගස නෙලා ගන්නට නම් ඒ ස්වර්ගය ඔබගේ හදවතේ දැන් ම සාදා ගන්න. සමාව දෙන දෙවිඳාණෝ මම වෙමි. නැවත නැවත ද වැරදි කරමින් මගෙන් සමාව අයදින විට මා සමාව දෙන බව සත්‍යයකි. එහෙත් විඳවීම් බොහෝ ය. පාපය අනුව මෙ ලොව දී ද විඳවීමට බොහෝ දේ ඇත. ---- නුඹලා ව කොන් කරන කවුරුන් හෝ වේවා නුඹලා ඔවුන්ට සමාව දී ඔවුන් ව වැළඳ ගත යුතුයි. දිනෙක ඔවුන් ආපසු ඔබ වෙත හැරී එනු ඇත. එය යි, සැබෑ ප්‍රේමය. මාගේ දරුවෙනි, ඔබ හැම කෙනකු ම තමා තමා ව දකින්නට සූදානම් වන්න. තමා මොන තරම් පව්කාරයෙක් ද කියා දකින්න. තමා තමාගේ පාපය දකින තරමට මා තුළ උසස් කරනු ලබයි. තව කෙනකුගේ වැරදි ගැන කතා කරන්නට පළමු ව තමා නිවැරදි ද කියා බලන්න. මිහි මත කිසිවෙක් නැහැ, නිර්දෝෂී මිනිසුන්.”

(එම කාල සීමාව තුළ ජේසු සමිඳුන්ගේ මුලසුනට පැමිණෙන සියල්ලන් අමතමින් ඔවුන්ගේ ආත්මගත කරන්නට සමිඳුන්ට ඇවැසි වූ කරුණු දෙකක් ඇත. පළමුවැන්න මෙය යි.) “ඔබගේ ඇතුළු සිත, හදවත, ආත්මය පවිත්‍ර ව තබා ගන්න. එය මට පුදන්න඼ එවිට මම එහි ලැගුම් ගන්නෙමි. එය යි, ඔබ තුළ තිබෙන ස්වර්ගය. එය යි, ස්වර්ගීය වූ තැනැන් වහන්සේට දිය යුතු මුලසුන. බොහෝ ලස්සණට පෙනෙන ලෞකික සියල්ල යක්ෂයාගේ මහා මන්දිරය යි. එනිසා ලෞකික සැප සම්පත් හා ධන සම්භාරයන්ට සුළුවෙන් හෝ ඇලුම් නො කරන්න. එදිනෙදා ලැබෙන දෙයින් ජීවත් වන්න. පිටාතර පෙනුම නො ව ඇතුලත පෙනුම ලස්සණ කර ගන්න. ඔබගේ හදවත ජීවමාන ස්වාමින් වහන්සේගේ ගෘහය කර ගන්න. සතුට, සැනසුම, සුවය, සහනය තිබෙන්නේ එතැන යි. ලස්සණට පෙනෙන සියල්ල මොහොතින් විනාශ වන සුළු යි. පිවිතුරු ව තබා ගන්නා ඔබගේ ආත්මය නමැති ගෘහය ස්වර්ගයෙහි රැඳෙනු ඇත. ඔබගේ ජීවමාන සිංහාසනය නපුරාට දුන්නොත් ඔබ ව මහා විනාශයක් කරා ගෙන යනු ඇත. ඔබගේ ඇතුළු සිත නරකාදියක් කර නො ගන්න. එය ඔබගේ ස්වර්ගය කර ගන්න. සියල්ලන් ප්‍රේමයෙන් දකින්න. සියල්ලන්ට ආදරය කරන්න. ඔබට වෛර කරන්නාට ද ප්‍රේම කරන්න. නුඹට බනින කෙනාට බනින්නට ඉඩ දෙන්න. නුඹට ගහන කෙනාට ගහන්නට ඉඩ දෙන්න. කිසි වදනක් ඔවුන්ට නො කියන්න. ඒ සියල්ල මට පුදන්න. ඔබගේ ඉවසීම දියුණු කර ගන්න.”

(එහි පැමිණි සියල්ලන්ගේ ආත්මගත කරන්නට සමිඳුන්ට ඇවැසි වූ අනෙක් කරුණ නම් ශ්‍රී රුධිරයේ අභ්‍යාසය යි. සමිඳාණෝ එහි පැමිණි සියල්ලන් ගාබ්‍රියල් දූතයා මගින් ඒ අභ්‍යාසයට යොමු කළහ. ශ්‍රී රුධිරයේ අභ්‍යාසය තුළින් ඔබ ද සුවපත් වනු සඳහා නිදසුනක් ලෙස ඉන් එක් අවස්ථාවක් මෙ ලෙස උපුටා දක්වමි.) “දැන් ඔබ සිහියට නගන්න, ඔබගේ හිසට කෙළින් කුරුසියේ

ඇණ ගසා එල්ලෙන දෙවි වූ ස්වාමින් වහන්සේ ව. ඒ කුරුසිය පාමුල දැන් ඔබ සිටින ආකාරය සිතින් දකින්න. බලන්න, දෑත්වලට ඇණ ගසා හිසට කටු ඔටුන්නක් තබා තිබෙන ආකාරය. ඒ ඔටුන්න තද වීම නිසා මගේ හිසෙන් ගලා එන ඒ අමු ලෙය සිහියට නගන්න. ඒ ලෙය මුහුණ දිගේ ගෙළ දිගේ ගලා ගලා චිත් ළයේ තිබෙන මහ වණයෙන් නික්මෙන ලේ හා මුසු වෙමින් සිරුර දිගේ පහලට ගලා එන ආකාරය සිතින් දකින්න. කුරුසියේ ඇණ ගැසූ දෙවි වූ ස්වාමින් වහන්සේගේ රුධිරය යි, ඒ. සුදු රෙදි කඩ තෙමී නැහැවී ඇත, ලෙයින්. ජනතාව ගැළවීම පිණිස මා හෙලූ රුධිරය යි, පුතණුව, මා ගෙවූ මිලය යි. මාගේ පා දෙක දිගේ ඒ අමු ලේ ගලා එන ආකාරය සිහි කරන්න. ඔබ දැන් ඔබගේ සියලු රෝගාබාධ, බැරි භාවයන්, ඔබ මුහුණ දෙන සියලු ගැටළු, ඔබගේ ප්‍රාර්ථනා සියල්ලෙන් මොහොතකට හිස් වී කිසි ම කිසිත් නැත්තකු සේ මා අබියස සිටිමින් මා වැගුරුවා වූ මා ගෙව්වා වූ මේ මිලය, මාගේ රුධිරය ඔබ අයිති කර ගන්න සූදානම් වන්න. පාද දෙක දිගේ ගලා එන ලෙය පාද දෙක ම එක ඇණයකින් එකට තද වෙන තැන දක්වා ගලා එනවා දකින්න. දැන් ඒ ලේ බිඳු ඔබගේ හිසට වැටෙන ආකාරය සිහියට නගා ගන්න. ඒ ලේ ඔබගේ හිසේ සිට සිරුර පුරා ගලා යනවා දකින්න. ලෙයට ලෙය එක් වෙමින් හැම අවයවයක් හැම ඉන්ද්‍රියක් ඇට මස් ලේ නහර ස්නායු පුරා දැන් ගලා ගලා යන ආකාරය සිතින් දකින්න. ඔබගේ රෝගි ස්ථානයේ ඒ ලෙය ස්පර්ශ වෙනවා දකින්න. එය යි, ස්වාමින් වහන්සේගේ ජීව ඖෂධ ය. දැන් ඔබගේ දෝත එක් තැන් කර ගන්න. මාගේ පාද දෙක දිගේ ගලා එන ලේ ඔබගේ දෝතට බිඳෙන් බිඳ වැටෙනවා ඔබගේ සිතේ මවා ගන්න. මා ගෙවූ මිලයෙන් ඔබගේ දෝත පිරී පිටාරා ගලනවා දකින්න. මොහොතකට පෙර ඔබ හිස් කළ සියල්ල ඒ දෝතට දමමින් මාගේ ලෙයින් පොඟවන්න. යහපත් සියල්ල ඉටු වනු ඇත. අයහපත් සියල්ල සුං වනු ඇත. ඔබ රෝගි වන විට ඔබගේ පවුලේ අයෙක්, මිතුරෙක්, අසල්වැසියෙක් රෝගි වන විට ඔබගේ ප්‍රශ්න කරදර වැඩි වන විට විශ්වාසයෙන් මේ අභ්‍යාසයට යොමු වන්න. සැබවින් ම සුවය, සැනසුම, ගැළවුම ඔබගේ විශ්වාසය තුළ ලැබෙනු ඇත. නිතර මාගේ රුධිරයෙන් ඔබ නැහැවෙන්න, ප්‍රශ්න කරදර මාගේ රුධිරයෙන් නහවන්න. නිෂ්පල දේ පසුපස නො යන්න. ඔබ විවේකි වන සැම මොහොතක ම මාගේ රුධිර අභ්‍යාසයේ යෙදෙන්න. නුඹලාගේ විශ්වාසය යි, නුඹලා සුවපත් කරන්නේ.''

(එම රුධිර අභ්‍යාසයන් රැසක් අතරින් උපුටා ගත් වැකි කීපයක් මම ඔබ හමුවේ තබන්නට කැමැත්තෙමි.)

- "---- ඔබගේ ද ඔබගේ දරුවන්ගේ ද දෑත් මාගේ යාගික රුධිරයෙන් පිරී තිබෙනවා දකින්න. ඔබගේ දරුවන්ගේ මල් වැනි සිතුවිලි මාගේ ලෙයට යට කරන්න. යහපත් සියල්ල ඉටු වනු ඇත. අයහපත සුං වනු ඇත. මෙ ලෙස ඔබගේ දරුවන් දැහැමි යුගයට සූදානම් කරන්න.''

- "ඔබ රෝගි වන විට ඔබගේ මනසේ මේ අභ්‍යාසය තිබිය යුතුයි. ඔබගේ දරුවන්ට පවා මේ අභ්‍යාසය කියා දෙන්න. මෙය ඔබ සැම ගළවන මාගේ රුධිරය යි. නිරන්තරයෙන් මා සිහි ගන්වන රුධිර අභ්‍යාසයට යොමු වන්න, දරුවෙනි. ඔබ රෝගි වන විට මෙය යි, ජීව ඖෂධ ය. රෝගි තත්ත්වය තුළ වෛද්‍යවරුන් වෙත ද යන්න. වෛද්‍යවරුන් මගින් ඒ ඖෂධ ද නුඹලාට අවශ්‍යයි. ඒ වෛද්‍යවරයා තුළ ජීව වෛද්‍යවරයා මා ලෙස දකින්න. එම ඖෂධ ක්‍රියා නොකරන, ගමන් නොකරන ස්ථාන කරා ද මාගේ ජීව රුධිරය ගමන් කරමින් සුව කරනු ඇත.''

- "සතුට, සැනසුම, සුවය, මිදුම මේ සියල්ල මා ගෙවූ මිලය තුළ යි ඇත්තේ. ඔබගේ දරුවන් ඔබගේ මව්පියන් කුරුසිය පා මුලට ගෙනෙන්න, සිතින්. ඒ අභ්‍යාසයට ඇතුල් වන්න, පවුල් පිටින්. දරුවන්ගේ, පුරුෂයාගේ හිසට කෙළින් එල්ලෙන මාගේ කුරුසිය සිතේ මවා ගන්න. රෝගි ව වේදනා විඳින සියල්ලන් මාගේ ලෙයට යට කරන්න. සැලෙන සිතින්, මඳ ඇදහිල්ලෙන් කළහොත් එයින් කිසි පලක් නො වන්නේය.''

- "ලෝ වැසි ජනතාවගේ පාප නිසා අදත් මාගේ තුවාල පෑරෙමින් රුධිරය ගලා යයි. කල්වාරිය මත වැගුරූ මාගේ රුධිරය යි, මේ මොහොතෙත් වැගිරෙන මාගේ රුධිරය යි, ගෙවනා මිලය යි, නුඹලාට මේ මොහොතෙත් මා අයිති කර දෙන්නේ.''

- (පුරුෂයා නිසා මහත් සේ වේදනා විඳින මවක් අමතා)

"----මාගේ ළයේ තිබෙන මහා වණයේ ඔබගේ පුරුෂයා ව තබන්න, සිතින්. මාගේ එම තුවාලය තුළ ඔහු තබමින්, මාගේ ලෙයින් ඔහු නහවන්න. ඔහු මොන තරම් නීච පව්කාරයකු වුනත් මාගේ ගැළවීම වෙතට ඔහු පමුණුවන්නට ඔබට හැකියි, මාගේ ලෙයින් ඔහු නහවන තරමට. ඔබගේ සැමියා මගේ කුරුස පාමුල සිටිනවා ඔබ සිතෙහි මවා ගන්න. ඔහුගේ දෝත මා වැගුරූ ලෙයින් පිරී තිබෙනවා දකින්න. ඔබ දැන් ඒ ලෙයට දමන්න, ඔහු දැන් සිටින තත්ත්වය. මා ගෙවූ මිලයේ බලය දකින්නට ඔබ නිරන්තරයෙන් මාගේ රුධිරයට ඔබ විඳින ප්‍රශ්න, කරදර, වේදනා යට කරන්න. ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, මාගේ රුධිර අභ්‍යාසය තුළ ඔබගේ සැමියා වෙනස් වනු ඇත. එය විශ්වාසයෙන් කරන්න."

- "නිරන්තරයෙන් මා සිහි ගන්වන රුධිර අභ්‍යාසයෙහි යෙදෙන්න. මුළු මිනිස් පවුල මාගේ රුධිරයෙහි පොඟවන්න. ලෝකය තුළ දිනපතා සිදු වන පාපය මාගේ රුධිරයෙන් පොඟවන්න, දුක් විඳින ජනතාවගේ අපමණ වේදනා මාගේ රුධිරයෙන් පොඟවන්න."

(2002 සැප්තැම්බර් 21 වන දින ජේසු සමිඳාණෝ සුජීවා ජයලත් සොයුරිය තුළින් නැවත පෙනී සිටිමින් පණිවුඩ දානය කළහ.) "---- මාගේ වණ කැළැල් පෑරෙමින් රුධිරය ගලා යයි. වැගිරෙන මාගේ රුධිරයේ ගිලෙමින් සුවපත් වන්න, දරුවෙනි. මා තුළ ජීවත් වෙමින් මා අනුභව කර වැඩෙන්න, දරුවෙනි. සැබවින් ම මම දිව්‍ය සත්ප්‍රසාදයේ ජීවමාන වෙමි. නුඹලා මා ලබා ගන්නා විට මුළුමනින් ම හිස් ව පවිත්‍ර ව ලබා ගන්න. එයින් නුඹලාට සැනසීම ගැළවීම ලැබෙන්නේය."

**2002 ඔක්තෝබර් 03**

"දරුවෙනි, බොහෝ බිහිසුණු කාලය පැමිණෙමින් ඇත. මරියාවන් මගින් කළ අනාවරණයන් ද මාගෙන් ප්‍රකාශ වූ අනාවරණයන් ද ඉටු වන මොහොත ළං ව ඇත. දැන් එයට කාලය යි. දැන් සියල්ලන්ට නිදහස දී හමාර යි. දැන් සියල්ලන් මනස්ස්ථාපනය අත්දැකිය යුතු මොහොත යි. මම ප්‍රේමයාණෝ වෙමි: මම උදහස් වූ තැනැන්වහන්සේ ද වෙමි. එනමුත් මා ප්‍රේමය යි, ප්‍රේමය යි, ප්‍රේමය යි, දරුවෙනි."

**2002 ඔක්තෝබර් 24**

"ජනතාවගේ එඬේරා ලෙස, ලෝක නායකයා ලෙස මා පත් කළ ඔහු ලෝකයෙන් ප්‍රසිද්ධ වන්නට කැමැත්තක් නැත. ලෝකයේ බුහුමන් ලබන්නට ඔහු තුළ ආශාවක් නැත. ලෝකයාට මඟ පෙන්විය හැකි මහා පුරුෂ භාවය ඇති නායකයෙක් විය හැක්කේ එවැන්නකුට ය. ඔටුණු පැළඳ සිංහාසන මත පහසුකම් මැද සිටින්නන්ට සැබෑ ලෝක නායකයකු විය නො හැක. දුගී භාවය තුළ, සරල භාවය තුළ, නිහතමානිකම තුළ ගෙවෙන ඔහුගේ ජීවිතය දෙස බලන්න. අද මාගේ වචන ලොවට හෙළි කරන්නට ඔහු කැප වී සිටී. අද ඔහු ජනතාවට අසම්මත ව සිටිමින් මට සේවය කරයි. දරුවෙනි, ඔහු හා ගමන් කරන්න."

**2002 ඔක්තෝබර් 25**

"මා ධර්මිෂ්ඨ යැයි හොඳ කල්ක්‍රියාවෙන් ජීවත් වන කෙනකු යැයි කිසි දින නො සිතන්න. දිනෙන් දින තමා පව්කාරයෙක් යැයි දකින මිනිසා ස්වර්ගයේ උසස් කරනු ලබයි. තමා කරන පුංචි පාපය පවා මහත් සේ දකින්නා මා තුළ උතුම් වන්නේය. මේ ලෝකයේ ගරු බුහුමන් ලබන්නට බලා සිටින්නා මා තුළ ගරු බුහුමන් නො ලබයි. මේ ලෝකයේ ගරු බුහුමන් නොලබන්නා නින්දා අපහාස මැද යන්නා මා තුළ ගරු බුහුමන් ලබන්නේය. මා හා ගමන් කරන්නාට දුක වේදනාව වැඩි යි, දරුවෙනි. ඒ තමා කුරුසියේ ගමන. මෙ ලොව හැර යන දිනට නුඹලා ගරු බුහුමන් ඇති ව පිළිගනු ලබන්නට මාගේ ස්වර්ගීය සේනාව සූදානම් ව සිටිති."

**2002 ඔක්තෝබර් 26**

"මාගේ දරුවෙනි, නුඹලා වසන ලෝකය තුළ මාගේ උත්තරීතර සංඝය සඳහා මා තෝරා ගත් මාගේ දරුවන්ගේ නාමයන් ලෝකයට ශාපයක් මෙන් පෙනෙන්නේය. මාගේ දරුවෙනි, මා තුළ යහපත් පල දරන නුඹලා ව මිරිකා පිවිතුරු රසැති මිදි යුෂ බඳුනක් මෙන් මම සාදා ගන්නෙමි."

**2002 ඔක්තෝබර් 27**

"සමිඳු එඬේරා පූජක සංඝයේ මෙහි සිටින සියල්ලන් දැන් මා ඉදිරියට පැමිණෙන්න. මම නුඹලා තෝරා පත් කළෙමි. පූජක සංඝය යනු පූජා වීමකි. ඔබ හැම කෙනකුගේ ම මාංශික, මානසික, ආත්මික ආශා සියල්ලෙන් හිස් වී ඇට මස් ලේ නහර තුළින් නුඹලා ව පාලනය කරන මේ සියල්ලෙන් ඒ සියලු බැරී භාවයන්ගෙන් මිදීම යි, මා නුඹලාගෙන් ඉල්ලන්නේ. ඔබට තිබෙන

බැරි භාවය ශරීරය යි. ශරීරයේ අවයවයන්වලින් නොයෙක් දේ කරන්නට නපුරා නුඹලා ව පොළඹ ව යි. නුඹලාට දී තිබෙන හැම අවයවයක් ම හැම දෙයක් ම මට පූජා කරන්න: ඒවා පිවිතුරු ව තබා ගන්න: ඒ කරණකොට ගෙන මා ඉදිරියට පැමිණෙන්න. නපුරාට හැකියි, ඒ හැම දෙයකින් ම ආශා උපදවන්න. ඒ හැම මොහොතක ම ජේසුස් යන මාගේ නාමය අමතමින් ඒ සියල්ලෙන් මිදෙන්න, දරුවෙනි. මුළු මිනිස් සංහතිය උදෙසා මම පූජා වුයෙමි. මට ද නොයෙක් පරීක්ෂා ගෙනාවේය, නපුරා. මම ඒ සියල්ලෙන් ජය ගෙන මාගේ පියාණන් මහිමයට පැමිණ වීමි. මිනිස් දුබලතා මම හඳුනමි, මිනිස් බව ගෙන මා නුඹලා අතරට පැමිණි නිසා.”

**2002 නොවැම්බර් 03**

“මා පුත්‍ර නෙවිල් දයාසිරි, නුඹ පවුල මම අනාදියේ සිට තෝරා ගතිමි. මාගේ මුළු සිරුර පුරා වැගිරෙන්නා වූ රුධිරයෙන් මම නුඹලා නහවමි. මම නුඹලාට ඉදිරියේ දී බොහෝ දේ ප්‍රකාශ කරමි. නුඹගේ භාර්යාව මාලනි, මාගේ ජනතාවට වහල් සේවය කරන ආකාරය දකිමි. ඇගේ ශරීරය දෑත් දෙපා නොයෙක් තැන්වල ගෙවෙන ආකාරය මට පෙනේ. සැබවින් ම මට ප්‍රසන්න යි. පුත්‍රය, මාගේ ශ්‍රාවකයින් තුළින් ම මම නුඹගේ නිවහන ගොඩනගමි, යම් දිනෙක. නුඹේ දෙවියන් කොහි දැයි ඇසූ අයට එය පිළිතුරක් වනු ඇත. නුඹගේ දියණියක් වෙත මාගේ සගයකු එවමින් මම නොයෙක් දේ ප්‍රකාශ කරමින් සිටිමි. එය සත්‍යයකි. එය ඉදිරියේ දී මහා පණිවුඩයක් වනු ඇත. බොහෝ රහස් හෙළි වනු ඇත. බිය නො වන්න.”

**2002 නොවැම්බර් 21**

“මාගේ දරුවෙනි, මාගේ උත්තරීතර සංඝය ලෙස මේ යන ගමන බිහිසුණු, කටුක ගමනකි. එකිනෙකාගේ ආත්මයට මා කතා කරන විට තමාගේ දුගඳ හමන දේ දකිමින් නිහතමානි ව එය බාර නොගන්නා විට ඔවුන් මාගේ ශ්‍රාවකත්වයෙන් පවා හැලෙනු ඇත. යම් ශ්‍රාවකයෙක් මා කියන දේ පිළිගෙන තමා තමා ව දකිමින් නිහතමානි ව එඬේරා සමග කතා කරන්නේ ද මා හා ගමන් කරන බව නියත ය. එකිනෙකා තමා තමා ව දකිමින් තමාට මා පෙන්වන වරද මෙනෙහි කරමින් නැවත නැවත මෙනෙහි කරමින් පවිත්‍ර වීම තුළ මහා ශුද්ධ භාවයක් අත්දකින්නේය. සැබවින් ම හදවත් පවිත්‍ර ව තබාගෙන ප්‍රශ්න ගැටළු ගොඩක සිටිමින් මාගේ හඬට කීකරු වන්නා වූ කොයි යම් අයකු වුව ද එඬේරා හා ගමන් කරනු ඇත. මා නුඹලා කැඳවන ගමන කටුක යි, අමිහිරි යි, තිත්ත යි. මේ තිත්ත බාර ගන්නට කැමති අය මා හා ගමන් කෙරේ වා ! නොකැමති අය අතරමඟ දී හැලේවි.”

**2002 දෙසැම්බර් 04**

“මම නුඹලාට එඬේරකු ලෙස ඇන්තනි අප්පුහාමි ව දුනිමි. මනුෂ්‍ය ලෝකයේ මිනිසුන් සිතන මහා බුද්ධියකින් නො වෙයි, මහා උගත්කමකින් නො වෙයි, මා ඔහු ව සාදා ඇත්තේ. මා ඔහු ව සාදා ඇත්තේ මට අවශ්‍ය ආකාරයට යි. අද සභාවේ සමහරු උසස් තානාන්තර දරමින් වැජඹෙති. එදා මා ගිය ගමන බලන්න. කොන් වීම් මැද නින්දා අපහාස මැද වේදනා විඳිමින් ගිය ගමනකි, එය. එය යි, සත්‍යය ගමන. අද ඒ ගමන ඔහු යමින් සිටී. මෙය යි, සැබෑ එඬේරකුගේ වගකීම. අද ලෝ සම්මත සභාව දෙස බලන්න. දුගී අසරණයන්ට අද එහි තැනක් නොමැත. එදා මා ගිය සභාව තුළ තිබුණේ දුක ම ය, වේදනාව ම ය, නින්දාව ම ය, පිළිනොගැනීම ම ය. මේ තුළ යි, නුඹලා ද ගමන් කළ යුත්තේ. මෙය යි, සත්‍ය දහම. ඒ පන්නරය නුඹලා ලබන්න, ඔහු තුළින්.”

**2002 දෙසැම්බර් 12**

“දරුවෙනි, පොළියට නො ගන්න. පොළියට නො දෙන්න. මෙය මහා පාපයකි. මෙ නිසා මනුෂ්‍යයෝ ගිනිජාලා තුළ විඳවති. මා තෝරා ගත් සංඝයේ වේවා නො වේවා සියල්ලන්ට යි මේ අණ. මා හා ගමන් කරන කිසිවකු පොළියට නො ගන්න පොළියට නො දෙන්න. දරුවෙනි, පොළියට ගැනීම නිසා මනුෂ්‍ය ජීවිත නූල් බෝලයක් මෙන් පැටලෙමින් ඇත. එයින් නිදහස් වන්නට නම් තමාට තිබෙන දෙයින් සතුටු වන්න. කුසට ආහාරයක් නැති විට මා මවා ඇති ජලය පානය කරන්න. ඔබ නො මැරෙන්නේය. ඒ තුළත් ජීවනය ඇත, ඒ තුළත් පෝෂණය ඇත. ---- ස්වාමිපුරුෂයා රැකියාව නිම කොට නිවසට පැමිණෙන විට සියලු කාර්යයන්ගෙන් හිස් ව භාර්යාව හා දරුවන් දැකීමේ, ඔවුන්ට ඇහුම්කන් දීමේ මහා ප්‍රේමයෙන් පිරී ඉතිරෙමින් පැමිනෙන්න. එවිට ඒ තුළ මහා සාමයක් ඇත. ---- අද ඔබ කියවන පුවත්පත් දේශය ගිනි අවුලන කේලම්, ඕපාදූප නො වේද? පුවත්පත් ලෙස ඔබ මිළ දී ගන්නේ දේශයේ කේලමකි. නුඹලා එයින් මනස පුරවා ගන්නහුය. එහි අර්ථවත් යමක් ඇත්නම් ඒ ඉතා ස්වල්පයකි. ඒ අර්ථවත් ස්වල්පය පමණක් අයිති කර ගන්න.”

**2003 ජනවාරි 04**

(ප්‍රභාත් සංජීවගේ භූමදාන දිනයේ දී) "නෙවිල් දයාසිරිට දාව දරුවෝ සත් දෙනෙක් උපන්නෝය. එක් පුරුෂයකු මම ඒ දරුවන් අතර තැබුවෙමි. මම ඔහු ව මාගේ තුරුළට නෙලා ගතිමි. මම දුන්නෙමි, මම ගත්තෙමි. ඔහුගේ අයිතිකරු මම යි. ඔබ භාරකරුවන් පමණි. නෙවිල් දයාසිරිට දාව උපන් දියණියක් උපයෝගි කරගෙන මම මාගේ ඊ ළඟ වැඩය ප්‍රබල ව ඉටු කර ගනිමි."

**2003 ජනවාරි 18**

"මා පුත්‍ර ඇන්තනි, නුඹගේ කාර්යය ගැඹුරු යි. මහා ගමනකට, ශුද්ධ වූ ගමනකට මම නුඹ තෝරා ගතිමි. පුත්‍රය, නුඹ යන්නේ මා ගිය ගමන යි. නුඹට ලෝගුව තුළ ජීවිතයක් නො තිබිණි. එනිසා යි, නුඹ ව ඊට ඇතුල් නො කළේ. ඊට වඩා කටුක ව පීඩා විඳිමින් සියල්ලෙන් හිස් වෙමින් මා ගිය සැබෑ ගමන අත්දකින ජීවිතයක් ලෙස මම නුඹ ඇඹුවෙමි. පුත්‍රය, නින්දා අපහාස ගල් මුල් මේ සියල්ල නුඹට එන්නේ ම ය. ඒ තුළත් නුඹ වියවුල් නො වී නොකැළඹී ඉදිරියට ඒම ගැන මට ප්‍රසන්න යි. මාගේ ප්‍රථම දාසියගේ විවාහය තුළින් මම නුඹ ව පරීක්ෂණය කළෙමි; මම නුඹට අභියෝග කළෙමි, මා කියන ඕනෑ ම දෙයක් ඔබ කරනවා දැයි බලන්නට. නුඹ එඩිතර ව මාගේ කාර්යය ඉටු කළෙහි ය. මා ඔබට පවරන ඉදිරි කාර්යයන් ද ඔබ එඩිතර ව ඉටු කරන බව මම දනිමි." (ප්‍රථම දාසියගේ විවාහය ජේසු සමිඳුන් විසින් අසම්මත අයුරින් සිදු කිරීමට බල පෑ හේතු හතක් කලින් සඳහන් ව ඇත. මෙහි සඳහන් වන්නේ අට වන හේතුව යි.)

**2003 ජනවාරි 26**

"මේ වසරේ ඇරඹුමත් සමග නුඹලාගේ මනස් කැළඹිලි සහිත ය. නුඹලා කළඹනු ලබන්නෝ මහෝත්තමයාණෝ ම ය. ශුද්ධ භාවයේ කැළඹීම පියාණන් විසින් පුත්‍රයාට භාර දෙයි. පුත්‍රයාණන් විසින් දැන් නුඹලා කළඹවනු ලබයි. කැළඹීම අවසන් වන්නේ මහා පවිත්‍රකරණයකට ය. ඉදිරියේ දී නුඹලා කැළඹෙන ආකාරය දකින නුඹලාගේ පියාණන් වහන්සේ දැන් නුඹලා ව කළඹති. එවිට ලෝකය ම කැළඹෙන මොහොතේ නුඹලා නොකැළඹී සිටින්නහුය. ළාබාල දාසියගෙන් මම කැළඹීම වර්ධනය කරමි. එය නිවැරදිතාවයට ගෙන ඒමට මම ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමි. මම ඒ තුළත් නැවත නුඹලා කළඹමි. විශ්වයිය ජනතාවගේ විමුක්තිය උදෙසා දිවි පුදමින් අපමණ වධ හිංසා ලබන මොහොතෙත් මම පියාණන් හා තර්කයට නො ගියෙමි. මගේ පියාණන්ට කීකරු වුයෙමි. මොන තරම් වධගාවිනාවලට මම ලක් වුයෙමි ද, දරුවෙනි ? නුඹලා සිතනවාට වඩා අපමණ වධගාවිනා මම වින්දෙමි. සංඝයට එඬේරා ලෙස මා විසින් තෝරා ගත් ඔහු මා හා තර්ක කරන අයුරු මම බලා සිටිමි. මා විසින් ඔහු කළඹනු ලබන්නේ ඔහු නොදැනුවත් ව තිබෙන ඔහුගේ ඇතුළත පෙන්වනු පිණිස යි."

**2003 ජනවාරි 30**

"මෙය මා නුඹලාට දෙන පුහුණුවකි, ඉදිරියේ දී නොකැළඹෙන පිණිස. මුළු විශ්වය කැළඹෙන මොහොතේ නුඹලා නොකැළඹිය යුතුයි. නුඹලා තුළ තිබෙන තත්ත්වය පෙන්වමින් වියවුල් කරමින් කළඹමින් නුඹලාව ඉදිරියට ගෙන යාමට මම මේ සියල්ල කරමි. දේශය ද ලෝකය ද කළඹන්නට පළමුව මාගේ ශ්‍රාවකයින් වන නුඹලා කළඹන්නට මට අවශ්‍ය යි. මක්නිසාද, නුඹලා තව ම ලෝකයට අයිති අය මෙන් සිටින ආකාරය මම දකිමි. ඇන්තනි, මම ඔබව වියවුල් කරමින් සිටිමි. එයට හේතුව මෙය යි. පුත්‍රය, මුළු විශ්වය ම කැළඹෙන මොහොතේ ඔබ නොකැළඹිය යුතුයි. මක්නිසාද, ලෝකයට මඟ පෙන්වන එඬේරකු ලෙස මම ඔබ තෝරා ගතිමි. එසේ නම් මුළු විශ්වයේ ම වේදනාව ඔබට දැනෙන්නට මා කියා දෙන පාඩම මෙය යි. ඔබ වටා සිටින අය පමණක් නො වෙයි, ඉදිරියේ දී ඔබට තිබෙන්නේ මුළු විශ්ව ජනතාවගේ එඬේරා ලෙස කටයුතු කරන්න යි. කිරුළු පැළඳ ගත් එඬේරකු ලෙස නො ව දුගී භාවය තුළ බැරි භාවය තුළ එදා මා ගිය එඬේරිකත්වයට යි, මා නුඹ අලේප කර තිබෙන්නේ. ඒ තුළ තිබෙන්නේ නින්දාව, ප්‍රතික්ෂේපය හා විඳවීම යි. ඒ තුළත් නොකැළඹී හැම කෙනකුගේ ම වේදනාව ගෙන එදා මා ගිය ගමන සිහි කරමින් එදිනට ප්‍රීතියෙන් පැමිණෙන්න, මා වෙතට. බලපරාක්‍රමයාණන්ගේ පුත්‍රයාණන් වන මම නුඹ සමග ම සිටින්නෙමි. විශ්ව ජනතාව ගැන ම ඉදිරියේ දී ඔබ වේදනා විඳින්න. ඒ සඳහා ඔබ විශ්වයිය ප්‍රේමයට සම්බන්ධ විය යුතුයි. ඒ සඳහා ඔබට ඇවැසි පන්නරය දෙමින් සියලු වියවුල් අතරින් ශුද්ධ භාවය කරා ගෙන යන ගමන යි, මේ. එයින් ඔබට පලා යන්නට නො හැකියි."

"මාගේ ශ්‍රාවකයිනි, තව තවත් මම නුඹලා කළඹන්නෙමි. මා තෝරා ගත් සමහර ශ්‍රාවකයෝ ඔවුන්ගේ මනස තුළම ක්‍රියා කරමින් මාගේ මෙම ක්‍රියා, මාගේ මෙම වියවුල තෝරා-බේරා ගත නොහැකි ව අද සංඝයෙන් ද ඈත්ව සිටිති. දරුවෙනි, ඉදිරි ගමන අති බිහිසුණු යි. ඉදිරියේ දී නුඹලාට සටන් වදින්නට වන්නේ අන්ත ක්‍රිස්තුගේ කාණ්ඩායම සමග යි. එවිට නුඹලා සමග එක් වෙමින් සටන් කරන්නට මම මගේ දූතයන් සූදානම් කරන්නෙමි. නුඹලාට ඔවුන්ගේ ශක්තිය

ලැබෙනවා ඇත. විශේෂයෙන් ම නපුරා පලවා හරින දූතයා වන අග්‍ර මිඛායෙල් නුඹලාට ඉදිරියෙන් ම ක්‍රියා කරනු ඇත. විශ්වය ම ගිනි ගන්නා මොහොත උදෙසා ඔවුහු දැනට ම සූදානම් ව සිටිති: අපවිත්‍ර වූ මුළු විශ්වය පවිත්‍ර කරන මොහොත උදෙසා සූදානම් ව සිටිති. ඉන් පසු නව මැවීම යි, දැහැමි දහස් වසරක උදාව යි එළඹෙන්නේ. ඒ කාලයේ දී සියල්ලෝ සහෝදරත්වයෙන් ජීවත් වෙති. ඒ මොහොත උදා වීම සඳහා මම සියල්ල සූදානම් කරමින් සිටිමි. දරුවෙනි, ඒ සඳහා ඉදිරියේ දී නුඹලාට මගෙන් පැවරෙන වැඩ කටයුතු රැසක් තිබේ. එකල මා නුඹලා නොයෙක් තැන්වල ගෙන යන්නට පුළුවන. එවිට හැම දෙයකින් ම හිස් ව සිටින්න. නුඹලාගේ අඹු දරුවන්ට පවා මාගේ බලගතු කාර්යය ගැන ප්‍රකාශ කර ඔවුනුත් නුඹලා සමග යන්නට සූදානම් කර ගන්න."

**2003 මාර්තු 13**

"සැබවින් ම මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් වන මට අවශ්‍ය වන්නේ මිනිස් අභිමානය අළු දූවිලි කරන්න යි. එසේ නො වේ නම් මා කැඳවන මේ ගමන යන්නට නොහැක. මිනිස් අභිමානය හිස් කොට මුළුමනින් එය අළු දූවිලි කොට පවිත්‍ර කිරීම තුළ දෙවිඳුන්ට හැකියි, ඔමෙගා මුදුන කරා ගෙන යන්නට. මා කියන දේ ප්‍රඥාවෙන් සවන් දෙන්න. සෑම වචනයක් ගැන ම අවදියෙන් සිටින්න. පරවියකු මෙන් අහිංසක ද සර්පයකු මෙන් නුවණශීලි ද වන්න. සංඝයක් ලෙස නුඹලා ක්‍රියා කළ යුත්තේ එලෙස යි.---- මගේ කාර්යය සඳහා පවුල දමා එන්නට මා තව ම නුඹලාට පවසා නැත. එනිසා මා එලෙස නුඹලාට හඬගසන මොහොත දක්වා භාර්යාව, දරුවන් හා ඥාතීන් සමග සිටින්න. මාගේ දිනයක් නුඹලාට බොහෝ කාලයක් ය. එනිසා නුඹලාගේ වැඩ කර ගන්නට තව කාලය තිබේ. ---- මා ප්‍රේමවන්ත පුත්‍ර ඇන්තනි, නුඹ මා සොයා ගත්තෙහිය: මා හා ගමන් කළෙහිය. නුඹ යන මේ ගමන පූජක ඔස්කා දකින නාස්තිය නම් නො වේ. නුඹ නාස්ති වී නොමැත, පුත්‍රය."

**2003 මාර්තු 16**

"මාගේ ප්‍රථම දාසිය වන සුජීවා උපයෝගි කර ගනිමින් මා ක්‍රියා කළ වසර 12ක නිමාව දැන් පැමිණ ඇත. මම මැය සමගින් නුඹලා අතර සිටියෙමි: නුඹලාට මඟ පෙන්වීමි. මම මින් පසු ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් ක්‍රියා කරමි. පියාණෙනි, වසර 12ක් මැය තුළ ක්‍රියා කරන්නට ඔබ තුමාණෝ මා එවූහ. ඔබගේ ඒ සැලැස්ම දැන් මැය තුළින් මම නිම කරමි. ළාබාල දාසිය තුළ ඔබට අවශ්‍ය පරිදි මම ක්‍රියා කරමි. ළාබාල දාසිය දැන් මා අබියසට පැමිණෙන්න. මගේ දෑත් මත ඔබගේ දෑත් තබන්න. නිසැකව ම මම මාගේ මහා ක්‍රියාවලිය නුඹ මගින් පෙන්නුම් කරමි. මිනිස් අභිමානය බිඳ දමමින් ඒ නින්දා අපහාස මැද යි, මේ ගමන තිබෙන්නේ. බොහෝ නින්දා අවමන් ඉදිරියේ දී නුඹලාට ලැබෙන්නේ ම ය. දියණිය, දැන් නුඹ මට විකුණනු ලැබූ කෙනෙකි. නුඹට නුඹ ගැන කතා කිරීමට අයිතියක් නැත. නුඹ දැන් මාගේ කාර්යය සඳහා ආලේප ලත් තැනැත්තියකි. මම දැන් මැය තුළ වසර 12ක ක්‍රියාකාරිත්වය නිම කරමි. මාගේ මහා බලයෙන් මගේ ළාබාල දාසිය සරසමි." (ජේසු සමිඳුන් විසින් සංඝයේ ශ්‍රාවකයින් කැඳවා ඔවුන් අබියස යි, මෙය සිදු වූයේ.)

## 38

## "දහම් නවෝදය සංඝයේ ඉදිරි ගමන් මඟ උදෙසා ජේසු සමිඳුන් විසින් තෝරා ගත් ළාබාල දාසිය, චම්පිකා දිල්රුක්ෂි ප්‍රනාන්දු."

ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳුන් දානය කළ අනාවරණයන් අංක 38-43 යටතේ මම ඔබ හමුවේ තබමි.

**2003 මාර්තු 02**

"මාගේ පැමිණීම ඉතා ළං ව ඇත. පියාණෝ රිසි නො වෙති, තවත් බලා සිටින්නට. කාලය ගෙවී යමින් ඇත. ජේසුස් නමැති නැවට නගින්න. ශුද්ධාත්ම ආගමනයෙන් පසු නැව දියත් කරමි. දූතයෝ දැනට ම සටන අරඹා ඇත්තාහ. අන්ත ක්‍රිස්තු හෙවත් ලුසිෆර් බොහෝ රටවල මාගේ නාමයෙන් විජ්ජා කරමින් සිටී. ජේසුස් නමැති කඩුව අතට ගන්න. මාගේ රුධිරයෙන් එය මුවහත් කර ගන්න. මා දැනුත් කුරුසිය මත සිට වගුරුවන රුධිරය දෙස බලා තමා පාපිෂ්ඨයකු බව අවංක ව පිළිගන්නේ කවරෙක් ද, ඔහු ගැළවීම ලබයි. ශුද්ධාත්ම ආගමනයෙන් පසු සංඝයේ සියලු ශ්‍රාවකයින් අමතන්නට මම බලාපොරොත්තු වෙමි. ඉන් පසු ධර්මය හා අධර්මය අතර මහා සටන ඇරඹේ. මංමාවත්වල අගුපිල්වල නිදා ගන්නට දැන් සිට ම පුරුදු වන්න. එදා පාවුලු මා අත්දැකීමත් සමග සියල්ල කුණු කසළ මෙන් ඔහුට දැනිණි. ඉදිරියේ දී නුඹලා මා නිසා සියල්ල අත්හරිනවා පමණක් නො ව ඒ සියල්ල අළු දූවිලි මෙන් පිළිගනු ඇත."

"මා ශ්‍රාවකයින් වශයෙන් විශේෂයෙන් කැඳවූ අයගෙන් සමහරකු ඉවත් ව සිටීම නැව දියත් කරන්නට බාධාවකි. ඒ සඳහා අනාදියේ සිට මා තෝරා ගත් අය නැවත හැරී එන තෙක් බලා සිටීම සාධාරණ නැද්ද? පියාණෝ අණ කරති, සැලැස්ම ඉක්මන් කරන ලෙස. තව නොබෝ දිනක් මම බලා සිටිමි. මම ප්‍රේමයෙන් කියන දේ නොඅසන්නේ නම් උදහසින් හෝ ඔවුන් නැවට ගෙන එමි. මෙය ඒ සඳහා නිදසුනකි. මේ ගමන එන්නට ළාබාල දාසිය කැමති වෙයි ද, මා වේදනාත්මක වියවුලක් ඇති නොකළේ නම්? ඇගේ පියා කැමති වෙයි ද, මිනිස් පවුලේ විමුක්තිය උදෙසා මොරගසන්නට, ඔවුන්ගේ නිවහන එලෙස ම තිබුණේ නම්? මා ප්‍රේමය නිසා යමෙක් නොඑන්නේ නම් මම බිහිසුණු ලෙස ඒ නෞකාවට කැඳවා ගනිමි. මම අකාරුණික නො වෙමි, ප්‍රේමය නිසයි උදහස. එදා පේදුරු, පාවුලු කළාක් මෙන් ඉදිරියේ සියල්ල නිසි ලෙස සිදු වේ, නුඹලාටත් සිතා ගැනීමට නොහැකි අයුරින්. මාගේ නැවත පැමිණීම උදෙසා සියල්ලෝ මිලයක් ගෙවිය යුත්තාහ. එදා මගේ උපතේ දී දහස් ගණනක් දරුවෝ මිලයක් වූහ. ලෝ වැසි සියල්ලන් වෙනුවෙන් පාප රහිත සමිඳාණෝ මිලයක් වූහ."

**2003 මාර්තු 05 අළු බදාදා**

"මේ වේදනාවේ කාලය යි. මා දිය වන කාලය යි. සැනසීම ලැබීමට බොහෝ ආශාවෙන් බලා සිටිමි. නිරතුරු ව යාච්ඤාවෙන් මොරගැසීම බොහෝ සේ මගේ වේදනාවට සැනසීමක් වන්නේය. ඉදිරියේ භාරදූර කාර්යයක් කිරීමට මට ඇත, මාගේ ළාබාල දාසිය උපයෝගි කර ගනිමින්. ඇය වැනි චරිතයක් මට අවශ්‍ය විය. මා සෙවූ චරිතය ඇය ම යි. සියලු රාජ්‍යයන් සියලු රැකියාවන් කඩා වැටෙන මොහොත ආසන්න යි. අද ලැබෙන දෙයින් සෑහීමට පත් වන්නඃ පක්ෂීන් මෙන් සිටින්න. මගේ එක් දිනයක් නුඹලාට බොහෝ කාලයක් ය. නුඹලාගේ බොහෝ කාලයක්, මට එක් දිනයකි, සමහර විට විනාඩියක් තත්පරයක් පමණි."

**2003 අප්‍රේල් 04**

"දැන් පටු මාවතේ ගැඹුරු අගාධයන් හරහා නුඹලා ගමන් කරමින් සිටින්නහුය. මගේ ගමන් මඟ සුමට නො වේ. ඔබ සැමට ම යම් වේදනාත්මක ගමනක් ඇත. ඒ මාගේ සැලැස්ම යි. මම නුඹලා මාගේ හිස මත තබා ගෙන යන්නෙමි. මෙය අති උතුම් වූ රැළකි, අනාදියේ සිට මා විසින් තෝරා ගත්. ඔබට නින්දා කරන විට ප්‍රීති වන්න, මා නිසා නින්දා විඳින කළ ප්‍රීති වන්න, එවිට පියාණන් වහන්සේ උද්දාමයට පත් වන සේක. නුඹලාට ඇතුලාන්ත ළදරු බව අවශ්‍ය යි. එහෙත් පිටතින් පර්වත මෙන් විය යුතුයි. තව තවත් එක්සිත් ව මට මොරගසන්න. ඔබගේ එකමුතුකම මට මහත් අවියක් වන්නේය. නින්දාව හරහා යන්න. නුඹලාගේ මේ විඳවීම ජනතාවගේ ගැළවීම සඳහා යි. දහම් නවෝදය සංඝය කඳු සිඛරයක් මත තබමි. සැනසීමක් නම් නො ලැබේඃ නින්දාව නම් ලැබෙනවා ම ය. එහෙත් ජීවනය ඇත්තේ මෙහි ය. මේ කැඳවීම ගැඹුරු යි, කැඳවීම අත් නො හරින්න, එය මහිමයට ම පත් කරන්න."

**2003 අප්‍රේල් 20**

"දරුවෙනි, ජොවෙල් දිවැසිවරයාගේ දිවැසි වැකිය ඉටු වන කාලය පැමිණ ඇත. දැන් වත නො ව සිත ඉරාගත යුතු කාලයක් ම ය. නුඹලාගේ ඇතුළු සිත යි, මට අවශ්‍ය වන්නේ. ඉරා ගත්තොත් නුඹලාගේ ඇතුළු සිත මම ලැගුම් ගනිමි, අසීමිත ලෙස. ශ්‍රාවකයිනි, මගේ විශේෂිත ආලේපයක් අවශ්‍ය යි, මා කැඳවන මේ ගමන යෑම සඳහා. ශුද්ධ බයිබලය කියවා බලන්න. එදා සිට ම මගේ දූ දරුවන් පැමිණ ඇත්තේ රෝස මල් අතුල මඟක නො වේ. එය කටුර වූ වේදනාවෙන් හා නින්දාවෙන් පිරුණු ගමනක් ම ය. නිමක් නොමැති සදා නො වෙනස් වන ආදරය ඇත්තේ මා තුළ පමණ යි. නුඹලා එය අත්දැක ඇත. ලුණු කැටය එලෙස ම තැබුවොත් හැකි ද, නුඹලාට අවශ්‍ය ලවණ රසය මතු කර ගැනීමට? මිහිතලයේ පාප උදෙසා, මගේ කාර්යය උදෙසා කැප වෙන්නට සූදානම් නම් දියවීම අවශ්‍ය නො වේද? තැලෙන යකඩය යි, පන්නරය ලබන්නේ. ඔබලාත් එසේ ම යි. දරුවෙනි, මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ මුළුමනින් දියවූහ, පාපි ජනතාව උදෙසා. නුඹලාගේ ගමන එය ම විය යුතු නො වේද? මම සැනසීම සොයන්නෙමි. නුඹලා මට සැනසීම දෙන්නේ ම ය. තව තවත් දෙන්න, මම බලා සිටිමි."

**2003 අප්‍රේල් 22**

"මගේ රැළ දැන් ප්‍රබල ව සිටී. ඉදිරී පරපුර ඊටත් වඩා ප්‍රබල වන්නේය, නුඹලා යන ගමන නිසා. නුඹලා පටු මාවතේ ගමන් කරන්නහුය. එනිසා ඒ පටු මාවත මොවුන්ට ගමන් කිරීමට පුළුල් මාවතක් වනු ඇත. අද බොහෝ දෙනා පැමිණෙති, මාගේ ගමනේ යාමට. එහෙත් වේදනාව, නින්දාව, ඒ බර වූ කුරුසිය මා දුන් විට ඔවුහු පලා යති, ගව් ගණන් දුර. නින්දාව පැළඳ ගැනීමට නම් කොහෙත් ම සූදානම් නැත. එදා මම මිහිතලයට පැමිණ සියල්ලන් උදෙසා දිය වුණෙමි. මැවුම්කරු දිය වුනේ මැවීම උදෙසා යි. නුඹලාගේ බොහෝ වචන මට අවශ්‍ය නො වේ. ඇතුලාන්තයෙන් දෙන්න එක් සුසුමක් ඔබගේ මැවුම්කරුට, එය බොහෝ වචනවලට වඩා මට

අගනේ ය. දරුවෙනි, මා කැඳවන මේ ගමන එන්නඃ ඒ සඳහා වඩවඩාත් ශක්තිය ඉල්ලා යදින්නඃ මාගේ මෑණියන්ගේ මැදහත් භාවය ලබා ගන්න, නිරතුරු ව ම. නුඹලා වෙනුවෙන් ඇය මොරගසන්නිය."

"ප්‍රේමාන්විත දරුවෙනි, නුඹලාගේ සියලු දුක් වේදනා මට දැනෙයි. මගේ උත්තරීතර සංඝය ලෙස නුඹලා මගේ මාර්ගයේ යාමට නම් ඒ සියල්ල එසේ සිදු විය යුතුයි. ලෞකික සැප සම්පත් මාගේ ගමන තුළ කිසි විටෙකත් නො වේ. වේදනා භරිත යි, කටුක යි, ඔසවා ගන්නට අමාරු යි, තේරුම් ගැනීමට අපහසු යි, එහෙත් ජීවනය ඇත්තේ මේ ගමන තුළ ම යි. මේ මිහිතලයෙන් නුඹලාට සැපවත් ජීවිත සුඛ විහරණය කිසි දා නො ලැබේවි. එසේ ලැබුනොත් නුඹලා ද මේ ගමන නොඑනු ඇත. මිල මුදල් යාන වාහන පමණටත් වඩා ලබා දෙන්නේ කවරෙක් ද, දරුවෙනි? ඒ ලුසිෆර් ම ය. එසේ නම් දුගී භාවය ගැන නුඹලා ප්‍රීති විය යුතු නැද්ද? දිළිඳු වූ සිත් තුළ මම වැඩසිටිමි. තමා දුබල බව, පාපිෂ්ඨ බව අවංක ව දකිමින් එයින් එතෙර වන්නට පිපාස වන ජීවිත යි, මට අවශ්‍ය වන්නේ. රෝගියෙක්ට මිස නිරෝගී අයකුට වෛද්‍යවරයාගෙන් වැඩක් ඇද්ද? මම ජීව වෛද්‍යවරයාණෝ වෙමි."

**එදින සුපිවා ජයලත් සොයුරිය අමතා**

"මුළු මිහිතලයෙන් ම මා මැවූ යමකු වෙළා ගනිමින් මම ක්‍රියා කළෙමි ද එවැන්නක් ප්‍රථම වරට සිදු වූයේ ඔබ මගිනි. එනිසා ඔබ මාගේ ප්‍රථම දාසිය යි. ඔබගේ රෝගී බව ඔබට ප්‍රශ්නයක් නො වේද? දියණිය, ඔබ තුළින් මගේ ක්‍රියාකාරීත්වය නිම කළත් මගේ වණ කැළැල් ඔබ සිරුරේ තබා ඇත. කුරුසිය ගෙන යාමෙන් මාගේ දකුණු උරහිසේ ඇති වූ මහා තුවාලය, ඔබ උරහිසේ මා විසින් තබා ඇත. එය ඔබට දැනෙනවා නො වේද? ඔබ වෛද්‍යවරුන්ගෙන් කෙසේ පිහිට පැතුවත් සුවයක් අත්විඳින්නේ නැත. දියණිය, ඒ මාගේ වණ කැළැල් ය. ඔබ ජීවත් වන තුරාවට ම එය තිබේවි. ඒ මහා විඳවීම මිනිස් පවුලේ ගැළවීම උදෙසා පුදන්න, දියණිය."

**2003 අප්‍රේල් 24**

"මාගේ කැඳවීම් නම් බොහෝ ය. එහෙත් කැඳවීම භාර ගන්නෝ ස්වල්ප දෙනෙක් ය. මන්ද, සුඛ විහරණය නො වේ මාගේ කැඳවීම, වේදනාවක් ම ය මාගේ කැඳවීම. සදාතනය හා සසඳන විට නුඹලා මෙ ලොව ගතකරන ජීවිතය මට ක්ෂණයක් තත්පරයක් පමණි. මේ ක්ෂණය, තත්පරය අධික විඳවීම් තුළ ම වරෙල්ලා, දරුවෙනි."

**2003 අප්‍රේල් 26**

"ඇන්තනි, අවසන් අදියර මම ඔබගෙන් ඉටු කරන්නට සූදානම්. මේ ඔමෙගා මුදුන ඔබ යා යුතු ම යි. පුත්‍රය, මේ මිහිතලයෙන් යම් කිසි මනුෂ්‍යයෙක් යම් කිසි රැළක් මේ ඔමෙගා මුදුන තරණය කරත් නම් ඒ ඔබ ඇතුළු ඔබගේ රැළ යි. මේ අනාදියේ සිට මාගේ සැලැස්ම යි, පුත්‍රය. ඔබ ආ ගමන සියල්ලන්ට අභියෝගයක්. බිය නො වන්න. එදා මිහිතලයට මා පැමිණි මොහොතේ දී කියෙන් කී දෙනා ද මා පිළිගත්තේ? ඔවුහු මා තුච්ඡ කළහ. පුත්‍රය, එහෙත් මගේ ගමන මම ගියෙමි. පියාණන් වහන්සේගේ සැලැස්ම වූයේ උන්වහන්සේගේ පුත්‍රයාණන් දියවීම නම්, එයට මම සපුරා ම කීකරු වූයෙමි."

**2003 අප්‍රේල් 27**

"ඇන්තනි, සංඝය තවත් පෝෂණය කරපන්න. ඉදිරියේ දී ඔබ හුදෙකලා විය යුතුයි, සංඝය අත්හැර සංඝය උදෙසා. සංඝය පෝෂණය විය යුතුයි. මන්ද, ඉදිරි යුගයේ ජනතාව මොවුන් හරහා යි, මාගේ ඉදිරි ගමන එන්නේ. ඉදිරියේ දී නුඹලා යන ගමන් මඟ තුළ බොහෝ ප්‍රශ්න පැනනගිනු ඇත. ජේසුස් යන මාගේ නාමය උච්චාරණය කර මාගේ අමිල වූ රුධිරය මතකයට නගා ගන්න. එවිට නිසි පිළිතුර ලැබේවි, හදවත තුළට ම. --- ඇන්තනි, මෙම ප්‍රකාශනය නිම කරන්න. එවිට මම එයට මුද්‍රාව තබමි. නුඹලා උච්චාරණය කරන සිංහල භාෂාව ඉදිරියේ දී ඉහළට ම නගින්නේය. නුඹලාගේ භාෂාව උපයෝගී කර ගනිමින් මම ලෝකයට ප්‍රකාශ වෙමි. එනිසා පළමු ව මේ ප්‍රකාශනය නුඹලාගේ හෙළ බසින් අවසන් කළ යුතුයි. මේ භාෂාවට මම බොහෝ සේ ඇලුම් කරමි. ඇන්තනි, හෙළ බස ඉතා හරවත් බසකි. එහෙත් වේදනාවක් ඇත, හෙළ බස අද කෙළෙසන අයුරු, දිය වී යන අයුරු, කඩාකප්පල් කරන අයුරු දකින විට. මගේ මෙම කාර්යයට හෙළ බස මට අවශ්‍ය විය. එනිස යි, එම බසේ ගුරුවරයෙක් ලෙස ඇන්තනි, මා ඔබ ව කැඳෙව්වේ. මෙම ප්‍රකාශනය නිම කළ පසු ඔබට මහත් තෘප්තියක් දැනෙනු ඇත.---- පුත්‍රය මගේ මාර්ගය කඳුළැල්ලක් ම යඃ එහෙත් ප්‍රීතිය ඇතඃ උතුරා යන ප්‍රීතිය ඇත. එනිසා බිය නො වන්න. ඉදිරියේ දී මාගේ පූජක පිරිසක් නුඹලා සමග එකතු වේවි. මේ සියල්ල මුළු මිහිතලයට ගෙන යාමට ඔවුහු ඔබට සහය වෙති. ඒ සහය ලබා ගන්න. එය මගේ ක්‍රියාවකි."

**2003 අප්‍රේල් 29 (මා ජීවත් වූ නිවෙසට ළාබාල දාසිය පැමිණි මොහොතේ)**

"මුළු මිහිතලයෙන් ම යම් කිසි මනුෂ්‍යයෙක් මා ඔහුගේ ගැළවුම්කාර දෙවිඳුන් බව පිළිගෙන තමා තුළ මුළුමනින් ක්‍රියා කරන්නට අග දක්වා ම මට ඉඩ දෙන්නේ ද ඒ මනුෂ්‍යයා නිසා ඒ ගමන නිසා මම සියල්ල වෙනස් කරමි. ඇන්තනි, ඒ මොහොත දැන් උදා වෙමින් ඇත. පුත්‍රය, අනාදියේ සිට ම මහා සැලැස්මකට යි, ඔබ වැනි චරිතයක් මා බිහි කළේ. තැලීම්, පොඩිවීම් මැද පන්නරය ලබමින් නියම තැනට ඔබ ගෙන ඒමට මට අවශ්‍ය විය. ඔබට යමක් තේරුම් යන වයසේ දී මම ඔබට මාගේ හස්තය පෙන්නුම් කළෙමි. පුත්‍රය, ජීවිතයේ වටිනා තීරණාත්මක අවස්ථාවල දී මම ඔබට මාගේ පණිවුඩ ගෙනාවෙමි. පුතණුව, ආධ්‍යාත්මික පෝෂණය අවශ්‍ය නිස යි, මා මගේ සේවකයා වන පූජක පුත්‍ර ඔස්කා වෙත ඔබ යැව්වේ. පුත්‍රය, ඔහු ඔබගේ ගුරු ය. එයින් ඔබ නව පුතණුවකු විය. මගේ ගමන යාමට ඔබ එතැන් සිට පටන් ගත්තේය. පුත්‍රය, හැරී බලන්න, පසු කළ අවදිය දෙස. ඔබට හැකි ද, ඔබගේ උත්සාහයෙන් පමණක් ම ඒමට?"

"මුළු මිහිතලයෙන් ම ඔමෙගා මුදුන තරණය කරන පළමු වන මනුෂ්‍යයා ඔබ යි. ඒ සමග ම ඔබ මෙතෙක්ආ පටු ගැඹුරු මාවත සියල්ලන්ට පුළුල් මාවතක් වනු ඇත. ඔබගේ රැළ එම පුළුල් මාවතේ ඔමෙගා මුදුන කරා පැමිණෙනු ඇත. ඔබටත් වඩා ප්‍රබල ව ඔවුහු ඒ ගමන යති. ඔබගේ කාර්යය ඔබ නවත්වන්නේ කොතැනින් ද පුත්‍රය, එතැන් සිට සියල්ලන්ට එය පුළුල් මාවතක් වන්නේය. අඩියෙන් අඩිය ඔබ පටු මාවතේ ගමන් කරයි. ඔබට දැන් කාලය පැමිණ ඇත, සියල්ල අත්හැර හුදෙකලා වීමට. පුත්‍රය, මුළු මිනිස් සංහතියේ ම පාපය උදෙසා මිලයක් වෙයන්. ඔබ අනාදියේ සිට සූදානම් වූයේ එයට නො වේද? එයට කාලය පැමිණ ඇත. මම බලා සිටිමි. මගේ සැලැස්ම ඔබ නියම මොහොතේ නිසි ලෙස ඉටු කළෙහිය."

"සග ලොව ශුද්ධවන්තයෝ මගෙන් අයැද සිටිති, නැවතත් මිහිතලයට ඔවුන් යවන ලෙසට, ජරාජීර්ණ වූ මිහිතලය ම සුවපත් කරන්නට. එහෙත් එය මගේ කැමැත්ත නො වේ. මගේ කැමැත්ත ඔබ හා ඔබගේ රැළ තුළින් එය ඉටු කිරීම යි. මෙය නික්මයාමේ ගමන යි, පුත්‍රය. ---- අද බොහෝ දෙනා බාහිර ව මා සොයති; මැටි රූපවලට පොරකති. මාගේ දුර්වල චරිත කුස ගින්නෙන් පෙලෙමින් ශරීරයට හරි හැටි වස්ත්‍රයක් නොමැති ව පැමිණෙති, නිවෙස් වෙත. එලෙස එන්නේ මා යි පුත්‍රය. ඔවුහු පන්නා දමති, ඔවුන් කුරිරු ලෙස; එහෙත් මැටි රූපවලට ලොල් ව පොරකති, බාහිර වත්පිළිවෙත් සිදු කරති. ඒවා මට සුදුසු නො වේ. මට සුදුසු වන්නේ ඇතුළු සිත පමණ යි. ඇතුළු සිතින් දෙන්නේ ද එක් සුසුමක් මා කෙරෙහි මම ඔහු සමග වෙමි. සුදු හුණු ගෑ සොහොන් කොත් මෙන් ඇතුළු සිත් මට අවශ්‍ය නො වේ. ශුද්ධ ලියවිල්ල කියවා බලන්න, මුල සිට අග දක්වා. මට ඉඩ දුන් චරිත පැමිණ ඇද්ද, සැපවත් ගමනක්? වේදනාව හරහා යි ඔවුන් පැමිණ ඇත්තේ. දරුවෙනි, සිතන්න තණ කොළ ගස් උසට වැඩුණොත් දෑ කැත්තට හසු වන්නේ ම ය; හසු වී විනාශ වන්නේය; සිවුපාවුන්ගේ මුවගට හසු වන්නේය. එහෙත් පෑගෙන තණ එසේ වෙයි ද? පෑගෙන්න පෑගෙන්න එය එසේ ම තිබේවි. පිනි මත තැවරෙමින් අලංකාර වනු ඇත. නුඹලා පෑගෙන තණ මෙන් ය, විනාශ නො වන්නේය, සදාකල් පවත්නේය. ලද-බොළඳ කරගෙන කිසිවකු මගේ ගමන ගෙන යාමට දැන් මට නො හැක. එයට කාලය ඉතිරි ව නැත. එනිසා රළු දෑතේ ම අඹමි. කාලය පැමිණ ඇත, සූදානම් වන්න. ස්වර්ග රාජ්‍යයේ දී මහත් පල විපාක ලබා ගන්නා පිණිස සූදානම් ව අවදි ව සිටින්න."

දරුවෙනි, ඔබලාගේ සොහොයුරා මගේ විශේෂ ආලේපය ලැබූ පුත්‍රයෙකි. පුත්‍රය, ඔබ මිය ගිය බව ඔබ දන්නෙහි ද? ඔබගේ ආත්මය මම ස්වර්ගයට ගෙන ගියෙමි. ඉදිරි කාර්යය නිසා යි, නැවත ප්‍රාණය ලබා දුන්නේ. වෛද්‍යවරයා එය පැවසුවේ නැද්ද, ඔබට? ඒ ආලේපය අපතේ යයි ද, ඇන්තනි? "

**2003 මැයි 01**

"සහා මාතාව මේ මාසය කැප කර ඇත්තේ මරියාවන්ගේ නාමයට නො වේද? මෙය නුඹලාට මල් මාසය නො වේද? ඉදිරියේ දී නුඹලාට ඇති බිහිසුණු සටනේ දී මරියාවන් නුඹලාට සහය වනු ඇත. ගෞතමගේ උතුම් වූ තෙ මඟුල සමරන්නේ මේ මාසය තුළ නො වේද? ඔහු ද මේ මොහොතේ සග ලොව සිට සියල්ල දෙස බලා සිටී. ගෞතමගේ දර්ශනයත් මාගේ ප්‍රේමයේ දහමත් අතර ගැටුමක් ඇති කරන්නට ලුසිෆර් ක්‍රියා කරමින් සිටී. ගෞතම ඒ ගැන තැවෙන්නේය. බිය නො වන්න, සග වැසි සියල්ලෝ නුඹලාගේ සහයට පැමිණෙති, නිරන්තරයෙන් ම. ප්‍රීති වන්න, ඔබගේ දෙවි වූ ස්වාමින් වහන්සේ මහිමාන්විත ව හැසිරෙන මොහොත ළං ව ඇත. නික්මයාමේ ගමන මෙන් මම නැවත ද මාගේ ප්‍රබල බාහු බලය පාන්නෙමි. එනිසා එය ඉතා බිහිසුණු වූ ද ඉතා වාසනාවන්ත වූ ද කාලයකි. මැවුම්කරුවාණන් වන මා හැර අන් දෙවි කෙනකු නොමැති බව ලෝ වැසි සියල්ලන්ට ම මම පෙන්වමි."

**2003 මැයි 03**

"මාගේ උත්තරීතර සංඝයේ ශ්‍රාවකයිනි, මා නුඹලා කැඳවන මේ ගමන යාමට නම් මා කියන දේ එලෙස ම ඒ මොහොතේ දී ම සිදුකළ යුතුයි. පූර්ණ අවනත භාවයක් තිබිය යුතුයි, තම මැවුම්කරුට, තම අයිතිකරුට. පියාණන් වහන්සේට මේ මොහොතේදීත් මා අවනත වන්නාක් මෙන් සියල්ලෝ ම මට අවනත විය යුත්තාහ. අද බොහෝ දෙනා මේ ගමනේ බාහිර ව යෙදෙති; ජෙරිකෝව වනසමින් ජෙරුසලම ගොඩනගන බව ගී ගයමින් මහා හඬින් ප්‍රකාශ කරති; එහෙත් ඇතුලතින් විනාශය කරා ගමන් කරන නිෂ්පල ජෙරිකෝව ම ගොඩනගති. නිදහස් නිවහල් සමිඳුන් කවරකු ද යන වග ඔවුහු නො හඳුනති. ඒකාන්තයෙන් ම කියමි. මනුෂ්‍යයා මේ මිහිතලයේ කෙලෙස හැසිරුණත් අවසාන විනිශ්චය සඳහා මා වෙත පැමිණිය යුතු ම ය. ධර්මාධිකරණය මම වෙමි. නිදහස් නිවහල් සමිඳුන් තුළ නුඹලාගේ ජීවිත සැලසුම් කරපන්න. මන්ද, ස්වර්ග රාජ්‍යයේ මාගේ පල විපාක අධික යි. දේව විනිශ්චයකරුවාණෝ මම වෙමි. සියල්ල මම දකිමි. කිසිවකුට බැහැ කිසිවක් මගෙන් වසන් කිරීමට. සියල්ල දකින සියලු සිතුවිලි පවා හඳුනන දේව විනිශ්චයකරුවාණෝ නියම තීන්දුව දෙති. යුක්තියට ගරු කරති; යුක්තියට වඩා ප්‍රේමයට මුල් තැන දෙති. මම ඉක්මනින් සියල්ල කළඹවමි; මිහිතලය පුරා කැළඹීම දෙ ගුණ තෙ ගුණ කරමි; කළඹනවා පමණක් නො ව පිළිතුරු ද දෙමි. දැන් පිළිතුරු අවශ්‍ය යි. විශ්ව මැවුම්කරුවාණන් වන දෙවිඳාණන් සැමකල් හී අවදිව යි සිටින්නේ. දැන් මම බිහිසුණු ලෙස අවදිව සිටිමි."

**2003 මැයි 06**

"දරුවෙනි, මා ප්‍රේමය නිසා කිසිවෙක් දැන් මා ගණන් නො ගනිති. මට ඒ ගැන වේදනාවක් ඇත. ප්‍රේමය දැන් සුලබ වී ඇත. මා ද දැන් එසේ ම යි. පියාණන් වහන්සේගේ රෞද්‍ර බැල්ම මටත් නො හැකියි, දැන් දරන්නට. එනිසා මගේ මැවීමේ මුදුන් මල්කඩ වන මනුෂ්‍යයා නැවත ගොඩනගමි. මම ප්‍රේමය නිසා අති බිහිසුණු ලෙස හෝ ගොඩනගමි. දැන් එය සිදු විය යුතු ම යි. දරුවෙනි, මාගේ ප්‍රේමයට කොන්දේසි නොමැත, මාගේ උදහසටත් කොන්දේසි නොමැත. සාතන්ගේ උදහසට කොන්දේසි ඇත. නුඹගේ දෙවි වූ ස්වාමින් වහන්සේට කොන්දේසි නොමැත."

**2003 මැයි 11**

"මෙතෙක් නුඹලා ආ මේ ගමන් මාර්ගය, කටුක වූ අත්දැකීම් තුළ වෙහෙස මහන්සි වී නුඹලා සොයා ගත්තා වූ මේ මාර්ගය, දිව්‍ය ගැළවුම්කරුවාණන්ගේ මාර්ගය, නිෂ්පල නොමැති බව නුඹලා ආ ගමන අති උත්තරීතර බව, සදාතනික ජීවනය ඇත්තේ ඒ තුළ බව මම නුඹලාට පෙන්වමි. ඉදිරියේ දී මාගේ ශ්‍රාවකයින් වන නුඹලාට වත් එකට එක් ව මොරගසන්නට නොහැකි වනු ඇත. එවිට ඔබ සිටින තැන ඇතුළු ගෙට වැදී අවට සිටින්නන් ද සහභාගි කරගෙන මොරගසාපල්ලා. නුඹලා යෙදී සිටින ගමන නිසා නුඹලා විහිළුවට ලක් කළ පාගා දැමූ සියල්ලන් ඉදිරියේ දී පැමිණේවි, මේ ගමන නුඹලා සමග එක් ව යෑමට. කරුණාවන්ත පියාණෝ තම නාස්තිකාර පුත්‍රයා භාර ගත්තාක් මෙන් ඔවුන් ද රැගෙන මේ ගමන එන්න, මම බලා සිටිමි."

**2003 මැයි 15**

"ජේසුස් වන මම සරල බවට බොහෝ සේ ගරු කරමි. උගතුන්ගෙන් සමතුන්ගෙන් සඟවා මෙ වැනි බාලයන්ට මා අනාවරණය කරන්නේ එබැවිනි. ලෝක මිම්මෙන් සුචරිත චරිත ගුණවත් නැණවත් චරිත මට අවශ්‍ය නො වේ. තමාගේ අල්ප බව දකින දුර්වල පාපි දුගී දුප්පත් අන්ත අසරණ සමාජයෙන් කොන් කළ පාගා දමන චරිත යි, මට අවශ්‍ය වන්නේ. ඔවුන්ගේ ඇතුළු සිත මම දකිමි. කාලය ළඟා වී ඇත, සූදානම් ව සිටින්න. ගැළවීම අපේක්ෂා කරන්නේ කවරෙක් ද ඔහු ගැළවීම ලබන්නේය. දරුවෙනි, නුඹලාගේ හදවතේ තෙරපී තිබෙන පාපිෂ්ඨ ආශාවන් වහල් බැමි සියල්ල මම දකිමි. මනුෂ්‍යයාට නො හැකියි, එයින් හිස් වන්නට. එය මනුෂ්‍ය ස්වභාවය යි. එහෙත් නුඹලාගේ දෙවි වූ ස්වාමින් වන මා හට හැකියි, ඒ සියල්ල වෙනස් කිරීමට. නුඹලාට කිරීමට ඇත්තේ ඉතා අල්ප දෙයකි. හිස් වීමට කැඩෙන්නට බිඳෙන්නට බැරි පාපිෂ්ඨ භාවයන් දුර්වලකම් සියල්ල හිස් කරන්නැ යි නුඹලාගේ දෙවි වූ ස්වාමින් වහන්සේට මොරගසා කියාපන්න. එවිට ඒවා හිස් කරන්නෙමි. ඔබ සුණු විසුණු කර අලුතින් සාදන්නැ යි අවංක ව ම මට ප්‍රකාශ කරපන්න. එවිට එය එලෙස ම කරන්නෙමි. නුඹලා එලෙස හිස් කරමින් මගෙන් පුරවමි. කිසිවකු තුළට බලෙන් නො එමි; නිදහස් කැමැත්තට ගරු කරමි. මිනිසා මැවූ මොහොතේ සිට ම නිදහස් කැමැත්ත දානය කළ නිසා යි සියල්ල විනාශ වුනේ. එහෙත් නිදහස් කැමැත්තට මම ගරු කරමි."

**2003 මැයි 21**

"ඉදිරියේ දී මේ මිහිතලය දෙදරා යන්නේය. අල්ප දෙය යි තවමත් මා පෙන්වන්නේ, මගේ පිපාසිත ජනතාවට. තවම බිහිසුණු අත්දැකීමට අත තබා නොමැත. ඉදිරියේ දී අත තබමි. මිහිතලය ම සොලවමි. මන්ද, ජනතාව තවමත් දෑස් වසාගෙන යි සිටින්නේ. මම අවබෝධ කර දෙමි, මැවුම්කරුවාණන් වහන්සේ කවරෙක් ද යන වග සකල ජනතාවට ම."

39

# “පියාණෙනි, ඔබ ව්‍යවස්ථාව නොව ප්‍රේමය  යි.”

ශුද්ධාත්ම මංගල යැදුම **ජුනි 4 වන දින** රාත්‍රියේ අපි යොදා ගතිමු. **“මෙය දෙ වන පෙන්තකෝස්තය යි”** යනුවෙන් ජේසු සමිඳුන් සිය ළාබාල දාසිය මගින් අපට පවසා තිබිණ. එම යැදුම සඳහා මුරුතාන ගම (සුජීවා ජීවත් වූ එම බිම ම) දේව මඟ පෙන්වීමෙන් අපි තෝරා ගතිමු. ජේසු සමිඳුන් සිය ළාබාල දාසිය තුළින් මැයි තෙ වන සතියේ සිට වැඩියෙන් ම ව්‍යවහාර කළ **“පියාණෙනි, ඔබ ව්‍යවස්ථාව නො ව ප්‍රේමය යි”** අපගේ යැදුමේ තේමාව කර ගතිමු. “මගේ අසම්මතය ඉටු කරමින් සිටින නුඹලා කියන කිසිවක් සම්මතය තුළ ජීවත් වන කිසිවෙක් දැන් නො පිළිගනිති. එනිසා ශුද්ධාත්ම මංගල යැදුම සඳහා පිපාසිත ජනතාවක් මම ම රැස් කර ගනිමි.” සමිඳාණෝ අපට එලෙස පැවසූහ. එතුමෝ ළාබාල දාසිය තුළින් මා අමතා “ඇන්තනි, ඔබ සමග විශාල සෙනගක් කිසි දා සිටියේ නැහැ නො වේද? මට ද විශාල ජන ගංගා අවශ්‍ය නැත, පිපාසිත සුළු පිරිසක් එදින කැඳවා ගනිමි” යනුවෙන් පැවසූහ.

ශුද්ධාත්ම මංගල දින යැදුම ඇරඹුවේ රාත්‍රි 8:30ට පමණ ය. ඊට පෙර විනාඩි 30ක් පමණ කාලයක් ඉතා සිහින් මඳ වැසි විටින් විට ඇති විය. එය ආසිරි පැන් ඉසීමක් බඳු විය. එදිනට නියමිත සුවිශේෂ පාඨයෙන් අපි යැදුම ඇරඹුවෙමු. **(ජුවාම් 17: 1-11) “පියාණෙනි, පැය පැමිණ තිබේ. පුත්‍රයාණන් විසින් ඔබ මහිමයට පමුණුවනු සඳහා ඔබ විසින් පුත්‍රයාණන් මහිමයට පැමිණෙව්ව මැනව.”** ඉන් පසු ගිතිකා ගයමින් අපි සමිඳුන් පැසසීමු. පැයකට පමණ පසු වම්පිකා වේදිකාවෙන් බැස නිවෙස තුළට යනු මම දිටිමි. ශුද්ධාත්මයාණෝ ඇය වෙලා ගනිමින් ක්‍රිස්ටෝපර් සොයුරා හා ශාන්ති සොයුරිය එතැනට කැඳවන ලෙස පැවසූහ. (මැයි තෙ වන සතියේ සිට ළාබාල දාසිය තුළින් සිදු වූ දේව ක්‍රියාකාරීත්වයේ දි ඇය තුළින් ජේසු සමිඳුන් දර්ශනය වන්නට සලස්වමින් ජේසු සමිඳාණෝ ඔවුන් තුළින් ද ක්‍රියා කළහ. එය ළාබාල දාසිය තුළ සිදු වන ක්‍රියාකාරීත්වය වැන්නක් නො වේ. ජොවෙල් දිවැසිවරයා සඳහන් කරන අයුරින් ස්වප්න හා දර්ශන දැකීමකි.) ඉන් පසු ජේසු සමිඳාණෝ ළාබාල දාසිය මගින් ඔවුන් දෙදෙනා ද කැඳවා ගෙන වේදිකාවට පැමිණියහ. එසේ පැමිණෙමින් 2003 **ජුනි 4 ශුද්ධාත්ම මංගල යැදුමේ දි** ජේසු සමිඳාණෝ ළාබාල දාසිය මගින් මෙ ලෙස පැවසූහ.

“පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද මම වෙමි. ප්‍රේමාන්විත මාගේ දරුවෙනි, අනාදියේ සිට මහා සැලැස්මකට ගොඩනැගූ ශුද්ධ වූ මොහොතකි, මෙය. බොහෝ ජනකායක් නරඹන්නට ආශාවෙන් සිටි ශුද්ධ වූ රාත්‍රියකි, මෙය. ස්වර්ග රාජ්‍යය ම දැන් විවර වී ඇත. ස්වර්ගයේ සියලු වැසියෝ දැන් අසුන්වලින් නැගිට නුඹලා දෙස බලා සිටින ශුද්ධ වූ මොහොතකි, මෙය. මේ ශුද්ධ වූ රාත්‍රියේ දි පියාණන් වහන්සේ ද පුත්‍රයාණන් වහන්සේ ද ශුද්ධාත්මයාණන් වහන්සේ ද ඒ තුන් දෙනා වහන්සේලා එක් කෙනෙක් ලෙස නුඹලා මධ්‍යයේ දැන් සැරිසරති.” (ක්‍රිස්ටෝපර් සොයුරා අමතමින්) “පුත්‍රය, ශුද්ධාත්මයාණන්ගේ ආලෝකය දැන් ඔබ දකින්නෙහි ද?” (“සැබැවින් ම දකිමි ස්වාමිනි” යනුවෙන් ඔහු පැවසීය.) “ඇන්තනි, එන්න මා අබියසට. ඉදිරි මහා සැලැස්ම තුළ මේ ජනතාව මාගේ ගමන කැඳවා ගෙන යන්නට මා තෝරා ඇති දාසයා ඔබ යි, මේ රැළට එඬේරකු ලෙස මා පත් කර ඇති මාගේ දාසයා ඔබ යි. පුත්‍රය, දැන් නරඹන්න, මාගේ රුවාහ්ණන්ගේ ඒ ගිනි සිළුව මොහුගේ හිස මත දැල්වෙන අයුරු.” (“දකිමි ස්වාමිනි” යනුවෙන් ක්‍රිස්ටෝපර් සොයුරා පැවසීය.)

“එසේ නම් විශ්වාස කරපන්න, දෙ වන පෙන්තකොස්තය මෙන්න දැන් ආරම්භ විය. අනාදියේ සැලැස්ම ලෙස යි පුත්‍රය, මෙසේ සිදු වූයේ. රුවාහ්ණන්ට ප්‍රශංසා කරපන්න. නුඹගේ රැළේ සියලු ශ්‍රාවකයින් දැන් මෙහි කැඳවාපන්න. රුවාහ්ණෝ කැමැත්තෙන් සිටිති, මොහුගේ මෙන් ම නුඹලාගේ හිස මත්තෙහි හැසිරෙන්නට. එදා මාගේ ශ්‍රාවක පිරිසට මෙන් මා දැන් මාගේ ස්පර්ශය තුළින් ම එකිනෙකාගේ හිස මත්තේ ගිනි දැල් තබමින් මට ඇවැසි නොයෙක් දීමනා දානය කරමි. එවිට නුඹලා ගොස් මාගේ ජනතාව පෝෂණය කරන්නට බලය ලබන්නහුය. පළමු ව මාගේ ශ්‍රාවක පිරිස එකිනෙකා එන්න මා අබියසට.” (ජේසු සමිඳාණෝ ළාබාල දාසිය මගින් ශ්‍රාවකයින් එකිනෙකාගේ හිස මත දෑත් තබා ආසිරි ගැන්වූහ.) “දකිමි, ඔබ එකිනෙකා මත ගිනි සිළුව දැල්වෙන ආකාරය. මෙහි සිටින නුඹලා සියල්ලන්ට ද මාගේ ආලෝකයේ ගිනි දැල්ල දානය කරමි. ඇතුලාන්තයෙන් ම ශුද්ධාත්මයාණන්ට මොරගසන්න. මෙය ශුද්ධ වූ මොහොතකි. මෙතැන් පටන් පුතණුව, නො බිය ව නො සැලී ඉදිරි ගමන සඳහා ක්‍රියා කරපන්න. පුත්‍රය, ජනතාව බලා සිටිති, සැනසීමක් පතා. මාගේ නාමයෙන් ගොස් ඔවුන් සනසවාපන්න. නුඹලා තුච්ඡ කළ අය යම් දිනෙක හඬා වැළපෙති. පුත්‍රය, ආදරයෙන් ම භාර ගන්න, ඔවුන් සැම. ඔවුන් සියල්ලන් ම

උපයෝගි වුයේ මාගේ සැලැස්ම ඉටු වීමට යි. පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද ඔබ සැම ආශිර්වාද කර නුඹලා සමග ම නිති හැසිරෙන සේක."

එදින ශුද්ධාත්ම මංගල යැදුම සඳහා අත දරුවන් හැර 130ක් පමණ සහභාගි වූහ. බොහෝ දෙනා දෙවියන් වහන්සේගේ ප්‍රබල සලකුණු සිය දෙනෙතින් දුටහ. ශ්‍රාවකයන් මත ශුද්ධාත්මයාණන් ගිනි සිළු මෙන් වඩිනු සමහරු දුටහ. එනිසා මහා හඬින් යුත් මහා ප්‍රශංසාවක් නිරායාසයෙන් ම පැන නැඟිනි. "පසු දින ඔබ එකිනෙකා කළ යුතු සියලු වැඩ කටයුතු එලෙස ම සිදු විය යුතු යැ"යි ජේසු සමිඳුන් පැවසු නිසා අලුයම 1:00ට පමණ අපි සියල්ල අවසන් කර සියල්ලන් නිවෙස් බලා යැවීමු.

**2003 ජුනි 09 වන දින** ජේසු සමිඳාණෝ සිය ළාබාල දාසිය මගින් අප සංඝය අමතා මෙ ලෙස පැවසූහ. "ප්‍රේමාන්විත දරුවෙනි, අනාදියේ සැලැස්ම අනුව යි සියල්ල සිදු වන්නේ. මේ මොහොත මේ තත්පරය පවා අනාදියේ ඒ සැලැස්ම අනුව යි සිදු වන්නේ. මේ මිහිතලයට දෙ වන වතාවටත් ශුද්ධාත්මයාණන් වඩින්නට මම සැලැස්වීමි. එය ස්වර්ගය විවර වු ශුද්ධ වු රාත්‍රියකි. එහි වැසියෝ බොහෝ කාලයක් බලා සිටි රාත්‍රියකි. එදින එකිනෙකාගේ හදවතට ම යි, මා පෙන්වුයේ. ඔවුන්ගේ හදවත් තුළ මා කළ දේ ඔවුන් ප්‍රකාශ කරාවි. බොහෝ ජනතාවක් මේ මොහොත බලා සිටියහ, උදා වන තෙක්. මෙන්න, නුඹලා දැන් එය උදා කරගෙන ඇත. ප්‍රසන්න යි, ප්‍රිති වෙමි. මගේ බලයෙන් අංශු මාත්‍රයක් මගේ දරුවන් වන නුඹලාට පෙන්වීමි. ඊ ළග මොහොතේ සියල්ලන්ට මම පෙන්වමි, මා කවරෙක් ද යන වග. සංනිවේදන මාධ්‍ය හරහා සියල්ල යාවි: සියල්ලන් කැළඹේවි."

"මාගේ උත්තරීතර සංඝය ලෙස මා නුඹලා කැඳවන මේ ගමන කිසිවකුට බැහැ නතර කිරීමට. මන්ද, නුඹලා ව මේ ගමන ගෙන යන්නෝ මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යි. ---- දැන් මම සියල්ල කළඹවමි. දෙ වන පෙන්තකොස්තය සඳහා මේ ස්ථානයට පැමිණි සියල්ලෝ රාත්‍රියේ සිහින මාර්ගයෙන් බොහෝ දේ දකිති. එවිට ඔවුන් හරහා මම දේශය කළඹවමි. මගේ සංඝය වන නුඹලා දැන් පවසන දේ පිළිගැනීමට බොහෝ අය උනන්දු නො වෙති. මන්ද, මා නුඹලා අසම්මතය තුළ තබා ඇති බැවිනි. එහෙත් සම්මතය තුළ සිර වී සිටින්නන් ම සියල්ල ප්‍රකාශ කරන කල පිළිගන්නට සිදු වනු ඇත. කළඹවන්නම් සියල්ල, බලා සිටින්න. දුර්වල චරිත රැගෙන මම බොහෝ දේ කරමි. මේ සම්මතය විනාශ විය යුතු ම ය. සම්මතය විනාශ කරන දෙවිඳාණෝ මම වෙමි. අද සියල්ල ව්‍යවස්ථාවට නැඹුරු වී ඇත. මම ව්‍යවස්ථාව නො ව ප්‍රේමය වෙමි. තැළුණු බට දණ්ඩ මම පාගා නො දමමි: දුම් ගසන පහන් තිරය නිවා නො දමමි, තෙල් දමා දල්වනවා මිස. කොන්දේසි විරහිත ප්‍රේමය මම වෙමි. අද ප්‍රේමයේ දහම දිය වෙමින් ඇත. මහත් සේ කණගාටුයි, වේදනා විඳිමි. ප්‍රේමය ඉස්මතු කරමින් මා ගොඩනැගු සභාව අද ව්‍යවස්ථාවට නැවත ගොස් ඇත: ප්‍රේමයට එහි ඉඩක් නැත. නුඹලා තුළ මා තැබු දෙ වන මුල් කිතුනු සභාව එසේ නො විය යුතුය, ව්‍යවස්ථාව නො ව ප්‍රේමය ම විය යුතුය. මේ පහන දැන් සිබරය මුදුනේ ම තබමි, දැල්වෙමින් ආලෝකය දෙන්නට. මාගේ ඉදිරි මහා ක්‍රියා නරඹන්න, දරුවෙනි. ගමන බිහිසුණු යි, එහෙත් එහි උත්තරීතර භාවය නුඹලා දකින්නහුය."

"මාගේ උත්තරීතර සංඝය වන නුඹලා ව මම එලෙස මාගේ සැලැස්ම කරා ගෙන යමි. ඒ සඳහා වන සියල්ල මම ම කරමි. මා නුඹලාට කියන දේ පමණක් නුඹලා කළ යුතු යි. මේ දේශයෙන් ලෝකයෙන් දහස් ගණනක් හෝ තෝරා ගෙන ඔවුන්ට මගේ දර්ශන දකින්නට සලස්වමින් ඔවුන් පූජකයන් වෙත යවමි. එමගින් සභාව වියවුල් කරමි: දේශය කළඹවමි: මගේ මෙම ක්‍රියාව මගේ දූතයන් මගින් ද එකිනෙකාට ප්‍රකාශ කරමි. මගේ හස්තය නැවැත්වීමට කිසිවකුට නො හැකිය. මන්ද, මම මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ වෙමි. ශුද්ධාත්මානුභාවයෙන් මගේ දර්ශන දකින්නන් කාට නම් හැකි ද, නැවැත් වීමට? මැවුම්කරුවාණන් වන මට හැකියි, පූජකයන්ට ද දර්ශන මගින් කතා කිරීමට. මම එය ද කරමි. එවිට මා කෙරෙහි පිපාසිත පූජක දරුවෝ සිය තනතුරු හැර දමා නුඹලා හා එක්වෙති."

(ජේසු සමිඳුන්ගේ මුලසුන ලෙස හැඳින් වු නිවහන සෑදීම අවසන් වුයේ රුපියල් ලක්ෂ තුනක ණයක් අපට ඉතිරි කරමිනි. ඒ ණය මුදල ලබා ගන්නට මා පෙළඹ වුයේ ද ඒ ණය මුදල දෙන්නට ඔවුන්ගේ සිත් පෙළඹ වුයේ ද ජේසු සමිඳුන් ම බව පවසමින් එනිසා එය එතුමන් විසින් ම ලබා ගත් ණය මුදලක් බවත් ඒ ණය මුදල ආපසු ගෙවන්නේ එතුමන් විසින් ම එතුමන් කැමති මොහොතේ බව ද පවසමින් එතෙක් ඒ මුදල කෙනකුගේ දෑතේ මිට මොළවා ගෙන සිටින්නේ එමගින් සංඝයේ ශ්‍රාවකයින්ගේ සිත් පරික්ෂා කිරීම සඳහා බව ද ජේසු සමිඳාණන් ප්‍රථම දාසිය මගින් පවසා තිබිණි. ඒ ණය මුදල ගෙවන්නට අප පමා වීම නිසා ඒ සොයුරා වරක් වියවුල් විය. මෙම මුදල මුල් කරගෙන ඔහු නැවත ද වියවුල් වන බව ජේසු සමිඳාණෝ පැවසූහ. ඒ මොහොත

උදා විය. මුළු මුදල එක වර ඉක්මණින් අවශ්‍ය බව ජුනි මස මුල දී ඔහු මට පැවසීය. ඔහු ඒ මුදල ඉල්ලා සිටියේ එය නැවත බැංකුවේ තැන්පත් කරනු සඳහා ය. බැංකුව ඒ මොහොතේ ඒ සඳහා ගෙවන පොලි අනුපාතයට වඩා වැඩි මුදලක් මාසික ව අපි ගෙවීමු. "ඒ ණය මුදල ගෙවනු සඳහා නුඹලා ද ක්‍රියා කරන්නැ"යි ජේසු සමිඳුන් මුල සිට ම සංඝයට ද පවසා තිබුණත් ඒ සඳහා ගත් කිසිදු ක්‍රියා මාර්ගයක් සාර්ථක නො විය.

මැයි තෙ වන සතියේ ජේසු සමිඳුන් සංඝයට එක් කළ නවක ශ්‍රාවකයෙක් ජුනි 21 වන දින මට පැවසූ දෙයින් මම මවිත වීමි. මෑතක දී ඔහු අතට ලැබුණ මුදලක් ඇති බවත් එය දෙන්නට සූදානම් බවත් ඔහු පැවසීය. ඔහු කළ විස්තරය අනුව එය රුපියල් ලක්ෂ දෙක හමාරක් පමණ වනු ඇතැ යි මට සිතිණි. ජේසු සමිඳාණෝ පසු දින ඔහු ඇමතූහ. ඔහු රුපියල් ලක්ෂ තුනහාමාරක මුදලක් මා අත තැබීය. එලෙස ලැබුණ සියල්ල යි ජේසු සමිඳුන් ඔහුගෙන් ඉල්ලන්නේ යනුවෙන් ඔහුට හැඟී ඇත. ඒ මුදල ආපසු එපා යැයි ඔහු මට පවසන විට මම මවිත වීමි. ඔහු ධනවතකු නො ව මාසික වැටුපෙන් ජීවත් වූ අයෙකි. අතට ලැබුන ඒ මුදල බිරිඳට ද නොදන්වා බැංකුවේ ද තැන්පත් නොකර නිවසේ ම තැබිය යුතු යැයි ද ඒ මුදලෙන් ජේසු සමිඳුන්ට වැඩක් ඇතැ යි ද ඔහුට හැඟී ඇත. ඒ ඇසූ මම මවිත වීමි.

මෙය අප ගත් ණය ගෙවා අවසන් කරන්නට ජේසු සමිඳුන් කෙනකු අත මිට මොළවා ගෙන සිටි මුදල බව මට පැහැදිළි ව දැනුනත් ඒ මුදල වැය කරන්නට ජේසු සමිඳාණෝ ළාබාල දාසිය මගින් වෙනත් සැලැස්මක් ඉදිරිපත් කළහ. ජෙරාඩ් අප සංඝයේ සිටින ධීවර සොයුරෙකි. දිගු කලක සිට ඔහුගේ ධීවර කටයුතුවල දැඩි අසාර්ථකත්වයක් විය. 2003. 06. 23 වන දින
ජේසු සමිඳාණෝ ළාබාල දාසිය මගින් ඔහු අමතමින් "පුත්‍රය රැකියාව කෙසේ ද, එය අඩපණ වී නැද්ද? සූදානම් කර ගන්න ඔබගේ යාත්‍රාව, මේ සතිය තුළ. මා ප්‍රකාශ වන පුතණුවා ව එවමි. ඔහු කැටුව යන්න, ඔහු පවසන සියල්ල කරපන්න. එදින මාගේ ශ්‍රාවකයන් ද යන්න, හැකි අය," යනුවෙන් පැවසූහ. ඒ දිනය ජුනි විසි නමයට යෙදිණ. සංඝයේ පිරිසක් ද මේ ගමන යාමට කැමැත්තක් දැක් වූ නිසා ජෙරාඩ් බෝට්ටු හතක් ම සූදානම් කර තිබිණ. බෝට්ටු දියත් කරන්නට පෙර වෙරළේ දී ළාබාල දාසිය මගින් ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "දරුවෙනි, මෙය මාගේ ශුද්ධ භාවයේ අති ගැඹුරු අත්දැකීමකි." ජේසු සමිඳාණෝ ක්‍රිස්ටෝපර් සොයුරා ආසිරි ගන්වමින් ඔවුන් සමග මුහුදු යන්නට සැලැස්වූහ.

එදින එක මාළුවකු හෝ හසු වූයේ නැත. ඒ පිළිබඳ ව ජේසු සමිඳාණෝ පසු දිනෙක මෙසේ පැවසූහ. "දරුවෙනි, මෙ පමණ දැල් රැසක් එලා එක මාළුවකු හෝ හසු නො වීම ද ප්‍රාතිහාර්යක් නො වේද?" අප ණය මුදල ලබා ගත් සොයුරා එදින මුහුදු වෙරළට පැමිණ සිටියේ දෙවිඳුන්ට කොන්දේසියක් ඉදිරිපත් කර බව අපි පසු ව දැන ගතිමු. ඒ කොන්දේසිය මෙය යි. "මාළු රැසක් හසු වුණොත් මෙය ජේසුගේ සංඝය යි." එක මාළුවකු හෝ හසු නො වූ බව දැනගත් ඔහු වියවුල වෙරළේ දී ම මුල පිරී ය. එහි ප්‍රතිපලයක් ලෙස ජුනි 30 උදෑසන ඔහුගේ බිරිඳ 'බෙතෙල්' නිවසට පැමිණ මට මෙසේ පැවසුවාය. මුළු මුදල එක වර ආපසු දෙන දිනය හරියට ම නොකිවොත් මුලසුනේ ම (සුජීවා ජීවත් වන නිවසේ ම) තම දරුවන් තිදෙනා සමග ගොස් පදිංචි වන බවට ඇය අනතුරු ඇඟවූවාය. මම සවස ඊට පිළිතුරක් දෙන බව ඇයට පවසා ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමක් පතා ළාබාල දාසිය වෙත ගියෙමි. "ඇන්තනි, නැවත වියවුලක් නො වේද? ඔබ අතට මා ලබා දුන් මුදල ගෙවා ණය අවසන් කර දමන්නැ'යි ජේසු සමිඳාණෝ පැවසූහ. ඔවුන් ද මවිතයට පත් කරමින් එදින රාත්‍රි අපි මුළු මුදල ගෙවා ණය අවසන් කළෙමු. මෙය අප සංඝයට ප්‍රබල අත්දැකීමකි.)

**2003 ජුලි 08**

"මම විශ්ව මැවුම්කරු වෙමි. නුඹලා සියල්ලන් මා ඉදිරියේ අළු දූවිලි ය. සියල්ල සිදු වන්නේ මාගේ අනුදැනුම උඩ යිඃ මගේ සැලැස්ම උදෙසා යි. ජේසුස් වන මා එදත් අසම්මත යිඃ අදත් එසේ ම යි. එනිසා කිසිවකුට බැහැ, මගේ සැලැස්ම කෙබඳු දැයි නිගමනය කිරීමට. සියල්ල මට අවශ්‍ය නිසයි, සිදු වන්නේ. දෑස් වසා ගෙන නො සිටිමි. දහවලේ දිත් රාත්‍රියේ දිත් අවදිව යි, සිටින්නේ. බිය නො වන්න, මෙය ගැළවීම කරා යන ගමන යි. විශ්ව මැවුම්කරුවාණන් වන සැබෑ එක ම දෙවියන් නැතැ යි කියන ලෝකයක් තුළ යි, නුඹලා අද ජීවත් වන්නේ. ඒ නිසා මැවුම්කරුවාණන් සොයා නුඹලා යන ගමන ලෝකයට විහිළුවක් ම ය, නින්දාවක් ම ය. එහෙත් දරුවෙනි, එය යි සදාකාලික උත්තරීතර ගමන. ශුද්ධ ලියවිල්ලේ මට ඉඩ දුන් චරිත පැමිණ ඇත්තේ මෙ වැනි ගමනක් හරහා යි. එය අනෙකාගේ ගැළවීම උදෙසා පල දැරීමේ ගමනක් ම ය. පාපයේ යදම්වලින් සිර වී සිටින මාගේ ජනතාව වෙනුවෙන් මාගේ පියාණන් වෙත මම තවමත් ඔසවන්නෙමි, මාගේ කඨුර වූ දුක්ප්‍රාප්තිය. මම තව තවත් දිය වෙමින් සිටිමි, අධික ප්‍රේමය නිසා."

**2003 ජුලි 14**

"ඉදිරියේ එළඹෙන බිහිසුණු යුගයට මුහුණ දෙන්නට නම් මගේ උත්තරීතර සංඝය වන නුඹලා මාගේ නාමය තුළ තව තවත් ශක්තිමත් විය යුතුයි. ඉදිරියේ දී නුඹලා සටන් වදින්නේ මනුෂ්‍යයන් සමග නො වෙයි, සාතන් සමග යි. ඔහු දැන් කරළියට පැමිණ ඇත. ඉදිරියේ දී මුහුණට මුහුණ ලා නුඹලාට ඔහු හමු වෙනවා ඇත. එනිස යි, තව තවත් ඇතුලාන්තයෙන් ම ජේසුස් වන මා ජීවිතයට අවියක් කර ගන්නැ යි මා නැවත නැවතත් ප්‍රකාශ කරන්නේ. ඉදිරියට යන්න, ප්‍රඥාවන්ත ව. මාගේ මෑණියන්ගේ මැදිහත් වීම ලබා ගන්න. එය ඉදිරියට අවශ්‍යයි."

**2003 ජුලි 21**

"ප්‍රේමාන්විත මාගේ දරුවෙනි, මෙන්න, නුඹලා වෙනුවෙන් මේ මොහොතේ දිත් අධික මිලයක් වන යාගයක් වන බැටළු පැටවාණෝ, නුඹලා සමග ම මේ මොහොතේ වැඩසිටිති. කාලය ආසන්න වී ඇත, තිරිඟු ද කිරිඳි ද මා වෙන් කර ගන්නා සමය යි. ඉඩ දුන්නෙමි, බොහෝ සේ දෙ වර්ගයට ම වැඩෙන්නට. මෙන්න, දැන් අස්වැන්න නෙලා ගන්නා සමය ආසන්න යි. මාගේ ශ්‍රාවකයෙනි, මා කැඳවන ගමන අමාරු යි. එදා මම ද කුරුසිය දරා ගෙන වැටෙමින් මේ ගමන ගියෙමි: මහත් වේදනා වින්දෙමි: තනි භාවය නින්දාව මට උරුම විය. මරණයේ වේදනාව එහි භයංකාරත්වය මම අත්දුටුවෙමි. ගමනේ කටුක භාවය පියවරෙන් පියවර නගින්නට නගින්නට මම අත්දුටුවෙමි. අද නුඹලාගේ ගමන ද එසේ ම යි. ලෝකයට ගැළවීම උදා කර දීම උදෙසා වූ නුඹලාගේ ගමන මට මහත් සැනසීමක් වන්නේ ය. එය යි, නුඹලා මා හට දෙන සැනසීම. තව තවත් මේ ගමන එමින් දුක් විඳින මැවුම්කරුට සැනසීම දෙන්න. දරුවෙනි, එය මම බලා සිටිමි. මාගේ ශ්‍රාවකයිනි, සැම මොහොතක් පාසා ම කඩුර වූ ගාවිනාව විඳිමින් නුඹලා මේ කඳු මුදුන තරණය කරන අයුරු මම බලා සිටිමි. නුඹලා හසු වී තිබෙන්නේ මැවුම්කරුවාණන්ගේ දෑතට යි. නුඹලා මේ පා තබා ඇත්තේ ගැළවීමේ දේශය මත යි. එනිසා මාගේ ප්‍රේමවන්ත දරුවෙනි, නුඹලාගේ දෙපා මුවහත් ව මේ දේශය තුළ තබමින් නැගිට සිටපල්ලා: නුඹලා පතන විමුක්තිය උදෙසා නැඟී සිටපල්ලා."

**2003 සැප්තැම්බර් 01**

"මේ අවදිය තරණය කරන්නට නම් බොහෝ දේ නො ව ප්‍රේමයේ දෙ නෙතක් ප්‍රේමාන්විත හදවතක් පමණ යි, අවශ්‍ය වන්නේ. බුද්ධිමතකුට කිසි දා නො හැකියි, මා කැඳවන මේ ගමන එන්නට. මන්ද, මේ ගමන ඔහුගේ මනසට ගෝචර නො වන්නේය. සරල සාමාන්‍ය අයකුට මේ ගමනේ අගය සැනෙකින් වැටහේ: එනිසා මේ ගමන යා හැකිය. මේ මිහිතලයට මිනිසකු ලෙස පැමිණ එකම පාපයක් හෝ දුර්වලකමක් හෝ සිදු නො කළ පළමුවැන්නාත් අවසාන මනුෂ්‍යයාත් මම වෙමි. ඊට හේතුව මම පියාණන් වහන්සේගෙන් නික්මුණු එතුමන්ගේ ඒක ජාතක පුත්‍රයාණන් නිසා යි. මාගේ ප්‍රේමාන්විත දරුවෙනි, නිතරම බලන්න තමන්ගේ ඇතුලාන්තයට එබී. තමා ව විවේචනය කර ගන්න: තමා ව ඉරා පොඩි කර ගන්න. එවිට අනෙක් තැනැත්තාගේ දුර්වලකම ප්‍රේමයෙන් පහදා දෙන්නට නුඹලාට හැකි වනු ඇත."

**2003 සැප්තැම්බර් 08**

"මාගේ දරුවෙනි, නුදුරේ දී මාගේ ශුද්ධ වූ ගින්න පැමිණීමට ප්‍රථම අශුද්ධ වූ ගින්න ඇවිලීමට දැන් මා ඉඩ දී ඇත. දෙවි වූ ස්වාමීන් වන මගේ අනුදැනුම උඩ සියල්ල සිදු වන නිසා බිය නො වන්න. ඉදිරියේ බිහිසුණු යුගයේ දී නුඹලා කඩා නොවැටී ශක්තිමත් විය යුතුයි. එනිසා යි, යාච්ඤා ජිවිතය හෙවත් මොරගැසීම අවශ්‍ය බව මා නිතර නිතර ප්‍රකාශ කරන්නේ. කාලය ආසන්න යි, දරුවෙනි. බොහෝ කාලයක් මේ සියල්ල සිදු වෙනවා යැයි කියමින් මේ වකවානුව මේ දිනය තුළ සිදු වෙනවා යැයි මා කියූ නමුත් එදිනට සියල්ල සිදු නොකරමින් තවත් බලා සිටියෙමි. තවත් බලා සිටින්නට මට නො හැක. සියල්ල නුඹලා නොසිතන ආකාරයෙන් සිදු වන්නට නියමිත යි. එනිසා සියල්ල තුළ සියල්ල නැති වී ගියත් දුක් නො වන්න. මන්ද, පළමු ව නුඹලාගේ අත ඇති දේ ද කෙමෙන් අහිමි කරමින් මා මෙතෙක් නුඹලා ගෙනාවෙමි. සියල්ලේ නිෂ්පලත්වය දැන් නුඹලා දකිමින් සිටින්නහුය. එවිට මා කැඳවන ගමන එන්නට පහසු යි. එහෙත් ජනතාව තවතවත් ලෞකික ධනය ම රැස් කරමින් සිටිති. එහෙත් ඒ තුළ ඔවුන් රැස්කර ගන්නේ පාපය යි. එනිසා ඒ සියල්ල ක්ෂණයකින් ඔවුන්ට අහිමි වන්නට මම සලස්වමි. විනාශයේ සුළි සුළඟ හමාගෙන එමින් ඇත. මා මැවූ දෙය ම මම උපයෝගි කර ගන්නෙමි, මැවීම විනාශ කර දමන්නට. සියල්ල සිදු වන කාලය ආසන්න යි. ඉහළ අහසේ අරුම පුදුම දේ ද පහළ පොළවේ ලකුණු ද තේරුම් ගන්න. ඉපැරණි ධර්ම ද්වීපය අද ලුසිෆර්ගේ දෑතට හසු වී ඇත. එනිසා සියල්ල වියවුල් ලෙස සිදු වනු ඇත. ලොව ප්‍රබල රාජ්‍යයන් ඇනකොටා ගන්නා කාලය ඉතා ආසන්න යි: සියල්ල කඩා වැටෙන කාලය යි: සියල්ල සිදු වන කාලය යි. මම ද වේදනාවෙන් සිටිමි, දරුවෙනි. එහෙත් එය එසේ සිදු විය යුතුයි, ඉදිරි සැලැස්ම උදෙසා."

**2003 සැප්තැම්බර් 15**

"ලෝ වැසි ජනතාව දැන් කමින් බොමින් ප්‍රීති වෙමින් තම මැවුම්කරුවාණන් තම නිර්මාතෘවරයාණන් අත්හරිමින් ලෞකික දෑ තුළ සිරගත වෙමින් තම දෑස් මගේ ප්‍රේමයෙන් ඉවත් කර ගනිමින් සිටිති. මගේ මුහුකුරා ගිය ප්‍රේමය දැන් ඉස්මතු වෙමින් ඇත. මන්ද, සියුමැලි දෑතින් අඹා බැලුවෙමි, කිසිවකු සෑදෙන්නේ නොමැත. දැන් ඒ යුගය නිමා කරමින් රළු මාවතට සියල්ලන් ව ම මම ඇදගන්නෙමි; රළු දෑතින් ම අඹමි. විනාශය නමැති සුළි සුළඟ හමා යන්නට මා අණ කර ඇත. මාගේ සැලැස්ම උදෙසා මට අවශ්‍ය චරිත පර්වත මෙන් පොළොවට බැඳ තබා ගනිමින් සියල්ල විනාශ කරමින් ඒ සුළි සුළඟ හමා යන්නට මා අණ කර ඇත. මාගේ ප්‍රේමාන්විත දරුවෙනි, මෙන්න මේ කාලය ගැන යි, ජෝවෙල් දිවැසිවරයා සඳහන් කර ඇත්තේ. මහෝත්තමයාණන් වන මම ඒ සඳහා ඔහු ව යොමු කළෙමි. එහෙත් ඉතා ස්වල්ප දෙය යි, ඔහුට පවසන්නට මා ඉඩ තැබුවේ. පැවසූ ස්වල්ප දේ තුළ සිදු වන බොහෝ දේ අන්තර්ගත වන්නට මම සැලැස්වීමි. දිවැසිවරයාණන් අතින් ලියවෙන්නට ගිය යමක් මම ඔහුගෙන් වැළැක්වීමි. එනිසා ශුද්ධ බයිබලයයේ සඳහන් නො වූ දෙයක් දැන් සිදු වෙමින් තිබේ. මාගේ උත්තරීතර සංඝය තෝරා ගෙන, එහි එඬේරා හා ශ්‍රාවකයින් තෝරා ගෙන, එහි දාස දාසින් තෝරා ගෙන මාගේ දෙ වන පැමිණීම සඳහා මා සිදු කරන මෙම ක්‍රියාවලිය ගැන සටහන් කරන්නට මම දිවැසිවරයාට ඉඩ නො දුන්නෙමි. ඊට හේතුව මෙය යි. දරුවෙනි, මෙම ක්‍රියාවලිය ශුද්ධ ලියවිල්ලේ සටහන් වී නම් නුඹලාගේ ගමන ද පහසු වෙනවා ඇත; එය සිදු වන විට නුඹලාට ජනතාවගේ ගෞරවය ලැබෙනු ඇත. මා මහිමයට පත්වීම සඳහා වන මෙම ක්‍රියාවලිය සිදු විය යුත්තේ ද මා ගැළවීම උදා කළ මගේ කල්වාරි ගමනේ ම සමගාමි ගමනක් වශයෙනි. එනිස යි, මා එය සටහන් වීම වැළැක්වූයේ. ශුද්ධ ලියවිල්ලේ සටහන් වූ වැකිය තුළ දාස දාසින් යනුවෙන් මා විශේෂයෙන් අදහස් කළේ මාගේ ප්‍රථම දාසිය, ළාබාල දාසිය හා දාසයා පිළිබඳ ව යි, ඔවුන් උපයෝගි කර ගනිමින් මා සිදු කර ගන්නා සුවිශේෂ අනාවරණ රටාව පිළිබඳ ව යි. අද නුඹලා අතර සිදු වන මෙම ක්‍රියාවලිය මා විසින් එවන යම් චරිතයක් විසින් ඉදිරියේ දී ශුද්ධ බයිබලයේ අග හිස් පිටුවේ සිට සටහන් කරනු ඇත."

"මා එදා මිනිසාගේ යහපත උදෙසා ප්‍රේමයෙන් මැවූ මිහිතලය දැන් ඔවුන්ගේ ම යහපත උදෙසා විනාශ කරන්නට මට සිදු වී ඇත. මම අධික වේදනාවෙන් වුව ද සියල්ලට ඉඩ දී බලා සිටිමි. මන්ද, මගේ කාර්යය සියල්ලට ඉඩ දීම යි. ඉදිරි කාලය අති බිහිසුණු යි; මුහුණ දෙන්නට ඉතා අපහසු යි. එනිස යි, මාගේ දරුවෙනි යාච්ඤාවෙන් මොරගසමින් එයට සූදානම් වන්නට යැයි මා නුඹලාට ප්‍රකාශ කරන්නේ. නොයෙක් ආකාර විනාශයන් මම ඇති වන්නට සලස්වමි. ඇන්තනි, පවසන්නට එපා මට දැන් ඒ කිසිදු විනාශයක් නතර කරන ලෙස. වේදනාවෙන් වුවත් ඉඩ දී ඇත, නොයෙක් ආකාර විනාශයන් සිදු වන්නට. වතිකානයේ සිටින මාගේ දාසයා වුනත් දැන් මට පවසන්නේ නොමැත, ඒ විනාශයන් නවත්වන ලෙස. ඔහු ද දැන් මට ආයාචනා කරන්නේ එසේ කරමින් හෝ ජනතාව නිසි මං ගන්වන ලෙස යි; ගැළවීම කරා ගෙන යන ලෙස යි. එනිසා ඒ සියල්ල එසේ ම සිදු වන්නට මම සලස්වමි."

**2003 සැප්තැම්බර් 17**

"විනාශයේ ලකුණු ඉක්මනින් ම නුඹලාගේ දෑස්වලට පෙනේවි, දෙ කන්වලට ඇසේවි. එවිට දැන ගනිල්ලා, බොහෝ කාලයක් තුළ මා අනාවරණය කළ සියල්ල සිදු වන හෝරාව පැමිණ ඇති බව. අධික වේදනාවෙන් මම ද සියල්ල දෙස බලා සිටිමි. නුඹලා නොසිතන ආකාරයේ බොහෝ දේ සිදු වන්නට නියමිත යි. එනිසා මාගේ ප්‍රේමාන්විත දරුවෙනි, නුඹලා වඩවඩාත් ඇතුලාන්තයෙන් ම මොරගසමින් ඉදිරියට ම යා යුතුයි, මා සමග. මම විගස එමි; සියලු දුෂ්ටකම් පුළුස්සා දමන්නට එමි; මාගේ පිපාසිත ජනතාවගේ දුබල හදවත් සැනසීම පිණිස එමි."

**2003 ඔක්තෝබර් 19**

"නුඹලා නුඹලාගේ දු-දරුවන්ට දක්වන ආදරය ම යි, මා මැවූ මේ මිහිතලයට මා ද දක්වන්නේ. විනාශයට ගොදුරු වෙමින් විනාශය දක්වා ම මා මැවූ ජනතාව යන හැටි වේදනාවෙන් වුව ද බලා සිටීමට මට සිදු වී ඇත. ආධ්‍යාත්මිකත්වයෙන් මුළුමනින් ම ඉවත් ව භෞතික දේ මත ම සිටිමින් ලෞකික දේ පමණක් ම රැස්කර ගන්නේ ද සැණෙකින් ඒ සියල්ල ඔවුන්ගෙන් ගිලිහී යනු ඇත. මාගේ ශ්‍රාවකයෙනි, නුඹලාට දැන් ගිලිහී යන්නට දෙයක් නොමැත. නුඹලා සියල්ල මා උදෙසා පූජා කරමින් සිටින්නහුය. ඉදිරියේ දීත් නුඹලා සතු සියල්ල ලබා දෙන්න, මා හට. මන්ද, නුඹලා සියල්ල මා හට ලබා දෙන කල ස්වර්ගයේ දෑ නුඹලා රැස් කර ගන්නහුය. කාලය ආසන්න යි, පළමුවැනි හෝරාව එළඹෙන බව පවසන හොරණෑ හඬ නික්මෙනු ඇත. විනාශයේ චණ්ඩ මාරුතය සිව් දිශාවෙන් ම හඹා යන්නට මා අණ කර ඇත. අහෝ ! එය කාට නම් වළකා ලීමට හැකි ද?"

"මගේ මහා සැලැස්ම උදෙසා මා විසින් තෝරා ගත් මාගේ ශ්‍රාවකයිනි, කඳුළු සඟවා ගෙන විටෙක සියල්ලන් ඉදිරියේ සිනාසෙන නුඹලා මට සැනසීමකි. කුරුසියේ මෙම ශුද්ධ වූ ගමන් මඟ කාට නම් තේරුම් ගත හැකි ද? මා විසින් අද නුඹලා ගෙන යමින් සිටින කුරුසියේ ගමන නිසා බොහෝ දෙනා නුඹලා නින්දාවට ලක් කරති. නුඹලා ගමන් කරන මේ උතුම් මාර්ගයට දිනෙක දණ නමස්කාර කර වඳින මොහොතක් එළඹනු ඇත. මා නුඹලා ගෙන යන ගමනේ ඇති ගැඹුරු භාවය, එහි කඩුර භාවය ගැන සග ලොව වැසියෝ ද වැළපෙති. එය සග ලොව වැසියන්ට ද ඔරොත්තු නොදෙන ගමනකි. මන් ද, ඔවුන් බොහෝ දෙනකු ඒ රාජ්‍යය උරුම කර ගත්තේ මීට වඩා පහසු මඟක් ඔස්සේ යි. නුඹලා සියල්ල විඳ දරා ගනිමින් සාතන් සමග සටන් වදිමින් බැරි භාවය තුළ, වේදනාව තුළ වැළපෙමින් හෝ එන මේ ගමන මට අති ප්‍රසන්න යි දරුවෙනි."

**2003 නොවැම්බර් 05**

"ජේසුස් වන මාගේ උත්තරීතර නාමය නුඹලාගේ ඇතුලත මාලිගාවේ හදවත නමැති ඒ සිංහාසනය මත තබා ගෙන ගමන් කරන්න. දරුවෙනි බලන්න, මාගේ සමානකමට මැවූ මගේ ජනතාව අද තිරිසන් ලෙස හැසිරෙන අයුරු: එකිනෙකා ඇනකොටා ගන්නා අයුරු. දේවත්වය හෙලා දකිමින් තමන් ගැන මානයෙන් දැපෙමින් අභිමාන සාදා ගනිමින් සැනෙකින් විනාශ වන ජීවිතය ලෞකික දෑ තුළින් සරසා ගන්නට වෙහෙසෙන කාලයක්, මේ. ජේසුස් වන මම හිරු දස දහසකටත් වඩා අධික ව දීප්තිමත් ව නැවතත් මේ දුබල මිහිතලයට වඩින්නෙමි. ගැළවීම ලබා ගන්නෝ මාගේ ස්වර්ග රාජ්‍යය ලබා ගනිති. උඩඟුවෙන්, වෛරයෙන්, කුරිරුකමින් පිරී සිටින සියල්ලන් මගේ උදහස පානය කරනවා ඇත. මාගේ ශ්‍රාවකයිනි, නුඹලාගේ ගමන අමාරු යි. එහෙත් නුඹලා ගමන් කළ යුතුයි, නුඹලාගේ ගැළවීම පිණිස නො ව මිනිස් සංහතියේ ම ගැළවීම පිණිස. ස්වාමින් වහන්සේගේ උදහසේ දවස පැමිණෙමින් ඇත. කිසිවකුට නො හැකියි, එයින් පලා යන්නට."

## 40

## "නුඹලා තුවාල වන විට, තුවාල පෑරෙමින් රුධිරය ගලා යන විට ප්‍රේමය ගලා එන්නට සලස් වන්න."

**2003 නොවැම්බර් 29**

(සංඝය දින තුනක විශේෂ යැදුමකට යොමු කරමින් මුලසුනේ දී ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ.) "මෙන්න, අහසටත් පොළොවටත් අධිපති වූ ශුද්ධ වූ තැනැන් වහන්සේ නුඹලා අමතා මෙසේ පවසන සේක. තව දින ස්වල්පයකි ඇත්තේ, මේ වසර අවසන් වන්නට. ලහිලහියේ ම අනුවණ ජනතාව දැන් සිට ම සූදානම් වෙමින් සිටිති, උදා වන නව වසරට පා තබන්නට. ඔවුහු ලෞකික දෑ තුළින් මනස පුරවා ගෙන ඉදිරියේ වෙන්නට යන්නා වූ මහා විනාශය නොදැක ජීවත් වෙති. ප්‍රේමාන්විත දරුවෙනි, නොබිය ව ප්‍රකාශ කරපල්ලා, උදා වන වසර සුබ නව වසරක් නො වන බව: එය සමිඳාණන් වහන්සේගේ උදහසේ ගින්න ඇවිලෙන උදාවක් බව නොබිය ව ප්‍රකාශ කරපල්ලා. මා විසින් මවන ලද මිහිතලය පුරා නොයෙක් විපර්යාස සිදු වන කල මොරගසා කියාපල්ලා, ස්වාමින් වහන්සේගේ උදහස් වීමේ අඳියර උදා වූ බව. එවිට නුඹලා සිතාපල්ලා, ස්වාමින් වන මා යම් කාල වකවානුවක් තුළ නොයෙක් දෙනා උපයෝගි කර ගනිමින් අනාවරණ දෙමින් නුඹලා ගෙන ආ ඒ සන්ධිස්ථානය උදා වී ඇති බව. සොබා දහම පවා වෙනස් වන විට නොයෙක් විපර්යාස සිදු වන විට දරුවෙනි, මැවුම්කරුවාණන් වහන්සේ කෙබඳු දැයි උන්වහන්සේගේ ශුද්ධ වූ ගින්න කෙබඳු දැයි නුඹලා වටහා ගනිවි."

"වසර ගණනාවක් පුරා නොයෙක් චරිත උපයෝගි කර ගනිමින් අනාවරණ දෙමින් මම ක්‍රියා කළෙමි. එහෙත් ඉතා ස්වල්ප දෙන යි ඊට විවෘත වූයේ. නුඹලා හැර කවුරු ද, සියල්ල වටහා ගත්තේ? මාගේ ශ්‍රාවකයිනි, නුඹලා දැන් උස් කඳු මුදුන තරණය කරමින් සිටින්නහුය. ඉදිරියේ දි කඳු මුදුනේ සිට ආපසු හැරී බලාපල්ලා, නුඹලා පසු කළ අත්දැකීම් දෙස. සියලු විඳවීම් නින්දා අපහාස තුළ මනුෂ්‍ය ජීවිතයේ කැප කරන්නට බැරි දෑ කැපකර ගනිමින් සියල්ල බෙදා ගනිමින් මා සමග මාගේ කඩුර වූ දුක්ප්‍රාප්තිය සමග නුඹලාගේ සියලු විඳවීම් ඒ හා එක් කරමින් නුඹලා වැටි වැටී නැවත නැගිටිමින් මේ ආ ගමන නුඹලා ඉදිරියේ දී වටහා ගන්නවා ඇත. දරුවෙනි, අද ලෝ දස අත සිසාරා බලාපල්ලා, විනාශය ම නො වේද, දැකිය හැක්කේ? දැහැමි ජනතාවක් සිටිත් ද? තම ඇතුලාන්තයට තම හෘද සාක්ෂියට අනුව ජීවත් වන ජනතාවක් සිටිත් ද? තමාගේ යහපත වෙනුවෙන් පමණක් ම සියල්ල සිදු කරන අධර්මිෂ්ඨ ජනතාවක් අද මිහිතලයේ සිටින්නේ. විශ්ව මැවුම්කරු හැටියට සියල්ලන්ගේ ම අයිතිකරු පියාණන් හැටියට ඔවුන්ගේ ජීවිතවලට සිදු වන්නට යන්නා වූ විනාශය ඇත්තෙන් ම මට ද වේදනාවකි. එනිසා යි, නුඹලා වුනත් මා පැවසූ සියල්ල සිදු වන්නේ නැද්දැ යි මගෙන් ප්‍රශ්න කරන විට නිහඬ ව සිටිමින්

ඔවුන්ට තව තවත් මේ අනගි සැලැස්ම තේරුම් ගන්නට ඉඩ දී නිහඬ ව සිටියේ. එහෙත් පලක් ඇද්ද, වටහා ගන්නෙක් නොමැත."

"ඉදිරියේ සිදු වන මහා කැළඹීම් තුළ මහා විනාශයන් තුළ කලකිරීම් නුඹලාට අනවශ්‍ය යි. මන්ද, ඒ සියල්ල සිදු වන්නට නියමිත යි, ශුද්ධ ලියවිල්ල ඉටු වන පිණිස, මාගේ මහා සැලැස්ම ඉටු වන පිණිස. මාගේ ශ්‍රාවකයිනි, ඉදිරියේ දී වුනත් නුඹලාට ගරු බුහුමන් ලැබේවි යැයි සිතන්නට එපා, ලැබෙන්නේ නින්දාව ම යි. එහෙත් දිනක සියල්ල තේරුම් ගන්නා විට ප්‍රේමාන්විත දරුවෙනි, නුඹලා මා සමග යි. මගේ ඉරණම ද එය ම විය. නුඹලාත් මගේ අත්දැකීම පසු කරන්නේ නම් දරුවෙනි, නුඹලාටත් අත්වන්නේ මා ලැබූ ඒ සියල්ල පමණ යි. කෙනෙක් මේ සැලැස්මෙන් පලා යන්නේ ද ඇත්තෙන් ම ඔහු අනුවණයෙකි, දින වූ මනුෂ්‍යයෙකි. දරුවෙනි, ඉදිරි මහා සැලැස්ම උදෙසා මොරගසාපල්ලා. මගේ ශ්‍රාවකයින් වන නුඹලාගේ මොරගැසීමට මම ද සවන් දෙමින් ඒ සියල්ල දෝතින් ම රැගෙන පියාණන් වහන්සේට භාර කරමි. ---- මා ස්වර්ග රාජ්‍යය තුළ අසුන් අරා නොමැත. මම දුක් විඳින මනුෂ්‍යයින් තුළ දුක් විඳිමින් ඔවුන් සමග ම වැඩසිටිමි. පුද සත්කාර මට අනවශ්‍ය යි. මා කැඳවූ ශ්‍රාවකයින් වන නුඹලා විඳින දුක යි, නුඹලා පසු කරන කටුක වූ අත්දැකීම යි, දරුවෙනි, මගේ සැනසීම. සියල්ල සිදු වන්නේ ජේසුස් වන මාගේ අනුදැනුම උඩ යි. එනිසා නොකැළඹී මා කැඳවන ගමන යන්නට සියල්ලෝ වෙර දරත්වා. නුඹලාගේ ගමන කිසිවකුට බැහැ වළක්වන්නට. මන්ද, නුඹලා ගෙන යන්නෝ අහසටත් පොළවටත් අධිපති වූ තැනැන් වහන්සේ වන මම ම වෙමි. ඉදිරියේ දී මා දෙසූ දහම හා අනෙක් ආගම් අතර ඇති වන්නා වූ ගැටුම්වලින් නුඹලාට වැටහේවි, මේ දේශයේ පාලකයන්ගේ මේ දේශයේ වෙසෙන්නන්ගේ කුරිරු භාවය. පිටස්තරයෙන් සුදු හුණු තවරා ගනිමින් ඇතුලාන්තය කිළිටිව පාපධාරී ව දිවි ගෙවන ඒ ජීවිත තුළ ඇති දුබලකම් නුඹලා දකිවී, මාගේ දරුවෙනි."

**2004 ජනවාරි 01**

"ලැබුවා වූ වසර මාගේ දරුවෙනි, බලාපල්ලා සතර දිශාවෙන්, විනාශය හැර කුමක් ද පෙනෙන්නට ඇත්තේ? මිනිස්සු කමින් බොමින් ප්‍රීති වෙමින් තවමත් ජීවත් වෙති. විනාශයේ සුළි සුළඟ ඔවුන් පසු පස හඹා එන විට කෙසේ ද, ඔවුන් බේරෙන්නේ? මා පවසා ඇති සියල්ල ඉටු වන මොහොත යි, මේ. අධෛර්යය වීම් කලකිරීම් ඉදිරියේ දී අත්වන්නේ ම ය. ඉදිරියේ සිදු වන සියල්ල දැක නුඹලා ද අධෛර්යය වෙනවා මා දැක හමාර යි. එනිස යි, නැවත නැවතත් මා පවසන්නේ, මගේ ශ්‍රාවකයින් වන නුඹලා ශක්තිමත් ව සිටිය යුතු බව. මේ සියලු සිදු වීම් මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් වන මගේ සැලැස්ම උදෙසා යි. එනිසා ප්‍රේමාන්විත දරුවෙනි, මේ මිහිතලය උදෙසාත් මේ ජනතාව උදෙසාත් මොරගසාපල්ලා; ඔවුන්ගේ ගැළවීම උදෙසා අවසානය දක්වා ම මොරගසාපල්ලා; එය යි, සිදු විය යුත්තේ. මාගේ ශ්‍රාවකයින් වන නුඹලා දවසින් දවස හිස් වෙමින් මගෙන් පිරෙමින් සිටින ජනතාවක් වන්නට අවශ්‍ය යි. මන්ද, එවිට යි මේ ගමනේ ඇති මහ ගැඹුර තවෙකෙක්ට හඬ නඟා ප්‍රකාශ කරන්නට නුඹලාට හැකි වන්නේ. පාපිෂ්ඨ ජෙරිකෝව වනසමින් නව ජෙරුසලම ගොඩනගන්නට ප්‍රේමාන්විත මාගේ දරුවෙනි, දැන් සැරසියල්ලා. නුඹලා සියල්ලන් ව ම මම ආශිර්වාද කරමින් ආලේප කරමි, ඉදිරි මහා ගමන උදෙසා."

**2004 ජනවාරි 18**

"අන්ධකාරයේ දූතයා දැන් වියරු වැටෙමින් ඇත. නොයෙකුත් පරීක්ෂාවන් තුළින් ඔහු නුඹලාගේ අභ්‍යන්තරයට ම ගොඩවදින්නට මාන බලමින් ඇත. ශුද්ධ ලියවිල්ල පරිදි නැණ නුවණ අවශ්‍ය වන්නේ මෙන්න මෙතැන දී යි. බලන්න, හැසිරෙන ආකාරයෙන්, උකහා ගන්න, ඒ මනුෂ්‍යයා තුළ ක්‍රියා කරන බලවේගය කුමක් ද කියා. දුටු සැනින් හඳුනා ගනිල්ලා, හඳුනා ගෙන මනුෂ්‍යයාට ප්‍රේම කරමින් ඔහු තුළ සිටින බලවේගය මාගේ නාමයෙන් ඉවත් කරපන්න. නැතිනම් නුඹලාගේ ගමන නුඹලා නාස්ති කර ගන්නවා ඇත. කෙසේ නුඹලා ඔහුට හසු කර ගන්නට ඔහු තැත් කළත් ස්වාමීන් වන මා නුඹලා සමග යි. එදා කුරුසියේ බර දරා ගන්නට බැරි ව තනි ව ම මා වැටුණා. නමුත් නුඹලා වැටෙන්න වැටෙන්න ඔසොවන්නට මා සිටිනවා; ඔමෙගා දක්වා නුඹලා ගෙන යන්නට පුල පුලා බලා සිටින පියාණන් වහන්සේ සිටිනවා. බලන්න මේ දේශය, ජල තලයක තැබූ කුඩා ගොඩබිමකි. බලන්න, එහි සිදු වන විනාශය. මෙ වැනි කුඩා දේශයකට ඉපැරණි දහම් දිවයිනට මෙසේ වන්නට මා ඉඩ දෙන්නේ නම් කෙතරම් විනාශ නොයෙක් දේශයන් හරහා හඹා යයි ද? කෙතරම් විශාල වුවත් ධනයෙන් බලයෙන් පිරී ඉතිරී ගියත් ස්වාමීන් වහන්සේගේ උදහස් වීමේ දවස පැමිණි කළ සියල්ල සුනු විසුනු වන්නේ ම ය. දරුවෙනි. බලා සිටපල්ලා, මා සියල්ල කළඹවන හැටි. තවද, අවදියෙන් සිටපල්ලා. සාතන් වනාහී විජ්ජාකාරයෙකි. මොහොතකට සියල්ල සැනසීමක් මෙන් පෙනුන ද ඔහුගේ සියල්ල විනාශයක් ම ය; එහි අවසාන ප්‍රතිපලය විනාශය ම යි. එහෙත් මැවුම්කරුවාණන් වූ සැබෑ එක ම දෙවියන් වහන්සේගේ ප්‍රතිපලය සදාකාලික සැනසීම යි. නිතර ම මාගේ විමුක්තිදායක රුධිරයෙන් පෙහෙමින් යාච්ඤාවෙන් සන්නද්ධ වෙමින් ජේසුස්

යන නාමය තුළ සිටපල්ලා. මන්ද, අව් අරා සිටියත් මහා මන්දිරවල සිර වී සිටියත් මේ විනාශයෙන් බැහැ බේරෙන්නට. නුඹලා ගැළවී සිටින්නේ නම් ඒ මාගේ නාමය නිසා ය.''

**2004 ජනවාරි 29**

''මාගේ ශ්‍රාවකයිනි, නුඹලා මේ යන ගමන තුළ නුඹලාට කැඩෙන්නට බැරි අමාරු ම දෙය යි, මා නුඹලාගෙන් ඉල්ලා සිටින්නේ. එය ඇතුලාන්තයට වේදනාවකි. එලෙස අමාරු දේ ඔබ මට දෙන විට මා සමග නුඹලා යන ගමන කඩාකප්පල් කරන්නට සාතන් මගෙන් අවසර ලබා ඇත. ඔහු වනාහි මුලාවේ අධිපතියා ය. දරුවෙනි, නැණ නුවණ අවශ්‍ය වන්නේ මෙතැන දී ය.''

**2004 පෙබරවාරි 01**

''යාච්ඤාවෙන් නුඹලා කරන මොරගැසීම නැති නම් දරුවෙනි, එක් පියවරක් වත් තබන්නට නුඹලාට නො හැකිය. මාගේ ශ්‍රාවකයින් වන නුඹලා දෙ දෙනෙක් හෝ තුන් දෙනෙක් එක්රැස් ව යමක් ගැන කතා කරන විට එය නිම වූ පසු සිටි ස්ථානයේ ම සිට මොරගසාපල්ලා. එවැනි මොරගැසීම් අවශ්‍ය යි, මේ ගමන යන්නට. ඒ නිසයි, වඩවඩාත් නැවත නැවතත් නුඹලා ලුහුබඳිමින් මෙය පවසන්නේ.''

**2004 මාර්තු 03**

''සියල්ල නිර්මාණය කරමින් සියල්ල මෙහෙය වන තැනැන් වහන්සේ මම වෙමි. මා විසින් මවන ලද මිනිස් ජනතාව අද සතා සිපාවටත් වඩා අධික ව තිරිසන් වෙමින් සිටින අයුරු වේදනාවෙන් වුවත් මම දකිමි. මැවුම්කරු වශයෙන් මැවීම දෙස දැන් බලන කල වේදනාවේ, කෙඳිරිගෑමේ සියල්ල පිරිහීමේ සැටි පමණයි, මා දකින්නේ: වියළි යාම් පමණ යි මා දකින්නේ: දළු දමමින් ශක්තිමත් ව සිටිනවා මම නො දකිමි. ඒ සියල්ල මට වේදනාවක් වී ඇත. යමෙක් ස්වකීය කැමැත්තෙන් ම තම ජීවිතය මට දෙන්නේ නම්, තම ඇතුළු කුටියේ දොරටු ව මට විවෘත කර දෙන්නේ නම් ඔහු හෝ ඇය තුළ මගේ රජදහන, ස්වර්ගය මම පිහිටුවා ගනිමි. නමුත් උඩු සිතින් පමණක් කැමති ව යටි සිත, ඇතුළු කුටිය මට නොදෙන්නේ නම් ඒ පාපි වංචාව මම පිළිකුල් කරමි.''

''යමෙක් මා සමග ගමන් කරන්නේ ද සියල්ල මා සමග බෙදා ගත යුතුයි. එවිට මා පවසන්නේ කුමක් ද, එය කළ යුතුයි: මා සමග නතර විය යුතුයි: මා සමග ගමන් කළ යුතුයි. අද බොහෝ දෙනා මා සමග ගමන් කරන බව ලෝකයාට පෙන්වමින් අභිමාන සාදා ගනිති. එහෙත් සත්‍යය එය නො වේ. සත්‍යය වසන් කරමින් වංචාව ඉස්මතු කරමින් අද බොහෝ දෙනෙක් මා සොයති: නොයෙක් තැන් හරහා මා සොයති. එහෙත් ඒ කිසිවක් තුළ ප්‍රේමයේ උත්තරීතර මැවීමේ මැවුම්කරු ඔවුන්ට සම්භ නො වෙනවා ඇත. මගේ ප්‍රේමාන්විත දරුවෙනි, නුඹලා සොයා ගෙන ඇත්තේ මේ ලෝ තලය වෙනුවෙන් තවමත් අධික ලෙස විඳවන්නා වූ ස්වාමින් වන මා ය. නුඹලා ගමන් කරන්නේ මාගේ මාර්ගයේ ය. අඳුරු වලාව මාගේ ප්‍රේමයේ මැවිල්ල කෙමෙන් ඩැහැගනිමින් ඇත. දැන් මොහොත ආසන්න වී ඇත, මා දෙස හැරිය යුතු. මම ලුහුබඳින ප්‍රේමය නිසා බොහෝ දේ ඉවසමින් බොහෝ කල් බලා සිටියෙමි.''

**2004 අප්‍රේල් 15**

(අපගේ වර්ධනය සඳහා සමිඳුන් විසින් ම කළ ඔරොත්තු නො දෙන තරම් වියවුලකින් පසු එතුමන් මා අමතමින්) ''ඇන්තනි කෙසේ ද, සියල්ල තුළ සියල්ල යහපත් ද? සියල්ල දැන් නිරවුල් ද? නිවහල් ද? පුත්‍රය, පෙර වූ සියල්ල දැන් අනවශ්‍ය යි. අපි දැන් සිතමු පුතණුව, මා සමග යන නුඹලාගේ ඉදිරි ගමන ගැන. පුත්‍රය, ඇතුලාන්තයෙන් තවත් කුඩා වෙයන්. එවිට නුඹ තුළ මා වැඩෙන්නම්, විශාල වෙන්නම්, මහත් දේ කරන්නම්. මේ වසර මුල දී මා නුඹට පැවසුවා, ඉදිරි ගමන නුඹටත් නොවැටහෙන බව. මතක ද, ඇන්තනි? එසේ නම් පුත්‍රය, නොවැටහෙන දේ මා උගන්වන තෙක් වියවුල් නො වී සිටපන්. වියවුල ඇති කරන්නට අඳුරේ පුරාතන සර්පයා හෙවත් අන්ධකාරයේ දූතයා මගෙන් අවසර ලබා ඇත. ගසේ මුල යි ශක්තිමත් විය යුත්තේ. ඇන්තනි නුඹ බලා සිටි කාලය උදා වී හමාර යි. පුත්‍රය, කැඳවාගෙන යමි, නුඹ අපේක්ෂා කළ දේ ලැබෙන තුරාවට ම. එනිසා ශක්තිමත් ව සිටපන්. මෙය මනුෂ්‍ය බුද්ධියට ගෝචර නො වන ගමනක්, ශුද්ධ වූ ප්‍රේමයේ ගමනක්. ඇන්තනි, සියල්ල නිදහස් නිවහල් සමිඳුන් වන මා තුළ මෙනෙහි කරපන්, මනසට බොහෝ දේ නො ගනින්, මනස සහමුලින් ම මාගේ රුධිරයෙන් පොඟවමින් සියල්ල කරපන්.''

''ඇන්තනි, මේ ගමන යන විට පුත්‍රය, සිදුරු වේවි, වණ කැළැල් ඇති වේවි, පැරේවි, වේදනාව දැනේවි. පුත්‍රය, සියල්ල දරා ගෙන වරෙන්. එසේ එන්නට මේ රැළට තවත් පහදා දීපන්. මගේ වණ කැළැල් පැරෙන විට යි, රුධිරය වඩවඩා වැගිරෙන්නේ. නුඹලා තුවාල වන විට තුවාල පැරෙමින් රුධිරය ගලා යන විට ප්‍රේමය ගලා එන්නට සලස්වන්න. එය යි, සංඝයේ සියලු

ශ්‍රාවකයිගෙන් මා බලාපොරොත්තු වන්නේ. ගමන අමාරු වුනත් නොවැටී සිටපන්. ස්වර්ගයේ ප්‍රේමයේ රැස් දහර නිතර ම නුඹලා සමග යි. කුරුසියේ ගමන වනාහි තමා තුළ තමා දිය වීම යි: තමා තුළ තමා නැති වීම යි."

**2004 අප්‍රේල් 28**

"ප්‍රේමාන්විත දරුවෙනි, නිමක් නොමැති මාගේ ප්‍රේමය මනුෂ්‍යයකුට තේරුම් ගැනීමට නො හැකියි. ප්‍රේමය වනාහි තමන් තුළ තමන් නැති වීම යි. මෙය යි, නුඹලා තදින් අල්ලා ගත යුත්තේ: බොහෝ දේවල් නො වේ. එදත් අදත් මා පියාණන් වහන්සේගෙන් ඉගෙන ගත් දේ එය යි. ප්‍රේමය වනාහි තමන් තුළ තමන් නැති වීම යි. අද ප්‍රේමයට බොහෝ නිදසුන් ඉදිරිපත් කරමින් ප්‍රේමය වනාහි කුමක් දැයි තේරුම් කර දීමට බොහෝ දෙනා වෙහෙසෙති. ප්‍රේමය, මා නුඹලාට දක්වන ප්‍රේමය, පියාණන් වහන්සේ මට දක්වන ප්‍රේමය, මා උන්වහන්සේට දක්වන ප්‍රේමය, මුළු මිනිස් සංහතිය වෙනුවෙන් උන්වහන්සේ ද මා ද දක්වන ප්‍රේමය තමා තුළ තමා නැති වීම යි. බොහෝ දෙනා මගේ කුරුසියේ ගමනේ දුක් ගාවිනාව නරඹති. කදුර වූ ඒ දුක් පාත්‍රය මා දරා ගත්තා වූ ඒ හෝරාවන් තුළ තමා සිටියේ නම් මා සමග කුරුසිය දරා ගන්නට සූදානම් බව සමහරු මට පවසති. දරුවෙනි, ඊට වඩා යෝග්‍ය යි, යුතුයි, හැම ජීවිතයක් පසුපස සිට ඒ දුක් ගාවිනාව ම අදත් සියලු ජීවිත උදෙසා මා විඳින බව සිහියට නගා ගන්නවා නම්. එහෙත් කවරෙක් ද, ඒ සියල්ල සිතන්නේ? ඒ සත්‍යය සිතනවා නම් මෙ තරම් මේ සමාජය දූෂ්‍ය නො වෙනවා ඇත."

**2004 ජුනි 03**

"සියල්ල නොසිතන ආකාරයෙන් සිදු කරන නුඹලාගේ පියාණන් වහන්සේ මම වෙමි. ප්‍රේමයේ වගාව කොතෙක් යැයි කියා නිම කළ නොහැක. මන්ද, ප්‍රේමය ඇරඹෙන්නේ ස්වාමින් වන මා තුළින්, එහි අවසානය ද මා තුළ ම වන්නේය. නිතර ම ප්‍රඥාවන්ත ව අවදි ව සිටපල්ලා. මේ ලෝ තලය අඳුරට ඇදී යමින් සිටින කාලය යි. පාපය නමැති අඳුරු වලාව මේ ලෝ තලය කෙමෙන් ගිල ගන්නා කාලය යි. පියාණන් වහන්සේගේ ශුද්ධ වූ සැලැස්ම ඉටු වීම පිණිස එසේ සිදු විය යුතුයි. එවිට යි, නුඹලා අතර සැඟවී තිබෙන රාජකීය ඔටුන්නේ ආලෝකය බැබලෙන්න සැලැස්වෙන්නේ. සියල්ල අති සරල ලෙසත් අති ප්‍රබල ලෙසත් විටින් විට සිදු වේවි. අවශ්‍ය වන්නේ විශ්වාසය තුළ බලාපොරොත්තුව තුළ ආ ගමනේ උපරිමය ලබා ගැනීම යි. තවමත් මේ ජනතාව අඳුර ඔවුන් ව ගිල ගන්නවා කිසිවකු හඳුනා ගෙන නොමැත. මන්ද, පාපය නමැති පටලයෙන් දැස් වැසී ඇත: ආලෝකය හඳුනා ගන්නට නොහැකි වී ඇත. මාගේ ප්‍රේමාන්විත ශ්‍රාවක දරුවෙනි, ඇදපල්ලා, දුක් සෝ සුසුම් මැද මේ කඳු ගැටය තරණය කරපල්ලා, මන්ද, ආලෝකයේ මුදුන නුඹලා හිමි කර ගත යුතුයි. එවිට යි, ශිඛරයේ මුදුනේ සිට නුඹලා බැබලෙන්නේ. එවිට යි, එම ආලෝකයෙන් ශිඛරයේ පහළ, නැති නම් මුළු ලෝ තලය ම බැබලෙන්නේ. සියල්ල දරා ගෙන සියල්ල මෙනෙහි කරමින් වරක් වැටෙන විට දෙ වරක් මාගේ නාමය තුළ නැගිටපල්ලා. මන්ද, වඩවඩා රිදෙන විට ප්‍රේමය ම ගලා යන්නට සලස්වාපල්ලා."

**2004 ජුනි 20 (සංඝයේ ශ්‍රාවකයෙක් වන ජෙරාඩ් අමතා)**

"ප්‍රේමාන්විත පුතණුව, ඇතුලාන්තයෙන් ම නුඹ පැමිණියෙහිය, ඇතුලාන්තයෙන් ම සිත් හි සිතුවෙහිය, මාගෙන් වදනක් නුඹ. පුත්‍රය, මා කැඳවන ගමන වෙහෙස කරයි, පිපාස යි, වේදනාබරිත යි. නුඹට දැන් දැනෙනවා වෙහෙසකාරී මේ අත්දැකීම තුළ සිටින විට මගේ කුරුසියේ ගමන් මඟ. මනුෂ්‍යයන් යන්නට අකමැති, නමුත් මිනිසත් බව ගත් දෙවි ස්වාමින් වහන්සේ ගිය, නුඹලා ද ගෙන යන ගමන: එහි ඇති කදුර භාවය දැන් දැනෙනවා, පුත්‍රය. අනෙක් කෙනා දෙස බලන විට ඔහුට වඩා නුඹට අපහසු ද ගමන, එසේ නම් සිතපන්, ස්වාමින් වහන්සේ නුඹට ඉතා ආසන්න බව, උන්වහන්සේගේ මාර්ගයේ නුඹ ව ගෙන යන බව. නුඹලා විඳින විට මා ද විඳිනවා. පුත්‍රය, ජීවිතය වනාහි පිදීමක්, අයිතිකාර තැනැන් වහන්සේට පිදීමක්, තවද විඳවීමක්, දරාගැනීමක්, මුහුණදීමක්, බලාපොරොත්තුවක්. ජීවිතය යනු එය යි, පුතණුව. ජේසුස් යන උත්තරීතර නාමයෙන් සියලු බාධක අභියෝග පරාජය කරපන්. සියල්ල එඩිතර ව දරා ගනිමින් නුඹ යන ගමනේ ඇති උත්තරීතර භාවය පෙන්වාපන්: ස්වාමින් වහන්සේට විඳින්නට සිදු වූ මහා දුක් ගාවිනාව සිහි කරපන්, පුත්‍රය. එවිට ඔබේ ඇතුලාන්තයෙන් ම හඬක් ඒවි, ඒ හඬ මෙය යි, නොනැවතී ඉදිරියට ම යන්න."

**2004 අගෝස්තු 28**

"මාගේ ශ්‍රාවක දරුවෙනි, විවිධ ප්‍රශ්න දුක් කම්කටොළු මැද දැන් නුඹලා සිර වී ඇති ආකාරය දකිමි. කිසි විටෙකත් නොසිතූ දේ ජීවිතයේ දී බලාපොරොත්තු නො වූ දේ දැන් ජීවිතය හමුවේ සිදු වන විට අපහසු යි, ගමන යන්න. ඒ අපහසුතාවය කියා නිම කළ නො හැක. සිහිනෙකින් පවා නොසිතූ දේ සිදු වන විට දරා ගැනීමට අපහසු යි. එදා මව් කුස පිළිසිඳ ගත් දා සිට කුරුසියේ දුක් විඳීම මම දුටුවෙමි. නිතර ම එය මට සිහිපත් විය. එනිසා විටින් විට පිළිතුරු සොයන්නට වෙහෙස නො වීමි. ප්‍රේමාන්විත දරුවෙනි, මහා පිළිතුර නුඹලා දැන හමාර යි. එසේ නම් දැන් මේ සිටින අත්දැකීම තුළ පිළිතුරු සෙවීම අනවශ්‍ය යි. නුඹලා දැන් දන්නවා නුඹලාගේ ඉදිරි මහා ගමන පිළිබඳව. එසේ නම් පිළිතුරු සෙවීම අනවශ්‍ය යි. කිසිවකු සදා පවතින දෙයක් දැතින් ම මුළු ආත්මයෙන් ම තදින් අල්ලා ගන්නේ නම් ඔහු මෙ ලොව ජීවිතය ගෙවන තාක් කල් ද මරණයෙන් පසු සදාතන ජීවිතය ගෙවන තාක් ම ඒ දේ උරුම කර ගන්නවා ඇත. යමෙක් සදා පවතින කිසිවකට ලොල් නො වන්නේ නම්, නොපවතින දේ තදින් අල්ලා ගන්නේ නම් අවසාන මොහොතේ දී හඬා වැළපෙනු ඇත. මනුෂ්‍ය ජීවිතය, මනුෂ්‍ය සදාචාරය, සිතිවිලි හැඟීම් ආශා යහපතින් දුරස් වන අයුරු දැකපල්ලා. ඒවා දකින විට සිතාපල්ලා, මේ ලෝකය තුළ, මේ නැති වී යන සම්පත් තුළ නො වෙයි, මේ ගමන ඇත්තේ, සදා නොවෙනස් වන විශ්වයීය පිළිතුර තුළ යි, මේ ගමන ඇත්තේ. ප්‍රේමාන්විත දරුවෙනි, ජීවිත ගමන තව තවත් හරවන්න, ස්වාමින් වන මා වෙතට, දුක් විඳින සේවකයාණන් වෙතට, නපුරා පරාජය කරන දිව්‍ය රජාණන් වෙතට. එවිට සදා ආලෝකය නුඹලා තුළ බබලනවා ඇත."

**2004 සැප්තැම්බර් 06**

"විශ්ව මැවුම්කරුවාණෝ මම වෙමි. මේ මිහිතලය එදා මා විසින් නිර්මාණය කරන ලද්දේ මනුෂ්‍යයන්ගේ යහපත උදෙසා ම ය. මා මනුෂ්‍යයා මවා, ඔහුට පැවරුවා සියල්ල ලබා ගෙන එය වැඩි වර්ධනය කරමින් සශ්‍රීක කර පූර්ණත්වය දක්වා ගෙන යන්නට. ස්වාමින් වහන්සේ අති ප්‍රේමයෙන් මැවූ මේ ලෝකය, මනුෂ්‍යයන්ගේ යහපත උදෙසා ම මැවූ මේ විශ්වය අද බලන්න, මනුෂ්‍යයාගේ ගරා වැටීම උදෙසා ම මනුෂ්‍යයා මේ ලෝ තලය උපයෝගි කර ගෙන ඇති ආකාරය. මේ නම් ආධ්‍යාත්මික යෝධයෙක් තමා තුළ ගොඩනගා ගන්නට අපහසු පසුබිමකැ යි ඔබට සිතෙනු ඇත. ශුද්ධ ලියවිල්ලේ ලියා ඇති පරිදි නැණ නුවණ අවශ්‍ය වන්නේ මෙතැන දී යි. ආධ්‍යාත්මික යෝධයෙක් බිහිවන්නට නම් මෙ වැනි සමාජයක් අවශ්‍ය යි; විනාශය කරා යන සමාජයක් අවශ්‍ය යි. එවිට යි, විනාශය කරා ඇදෙන මිනිස් පවුලේ විමුක්තිය උදෙසා තමා කැපකර ගනිමින් තමා තුළ ඇති මමත්වය අභිමාන කඩා බිඳ ගැනීමට පහසු වන්නේ. එහෙත් කිසිදු මනුෂ්‍යයකුට නො හැකියි, තමන් තුළින් ම තම ශක්තියෙන් පමණක් ම එය ලබා ගන්නට. ඒ තත්ත්වය තමා තුළ ජනිත කළ හැක්කේ මැවුම්කරුවාණන් වන එක ම දෙවියන් වහන්සේට පමණ යි. එනිසා කිසි විටෙකත් නො සිතපල්ලා, තමා යහපත් යැයි, තමා පූර්ණ යැයි. එසේ සිතන්නට සිතන්නට නුඹලා නුඹලා තුළ ම අභාවයට පත් වෙනවා ඇත. මාගේ ශ්‍රාවක දරුවෙනි, මේ ශුද්ධ වූ ගමනේ ශුද්ධ වූ පලය නුඹලා නරඹන්නට නම් මා විසින් නුඹලා තව තවත් දියකර හරින්නට අවශ්‍ය යි."

"ප්‍රේමාන්විත දරුවෙනි, මනුෂ්‍යයාගේ යහපත උදෙසා මම ශුද්ධ වූ සභාව ස්ථාපිත කළෙමි. එය මගේ ශරීරයට සමාන කළෙමි. අද එය කෙලෙස ද? එය පිටස්තරයෙන් පමණක් ඔප යි; තව තවත් ඔප වන්නට උත්සාහ කරනවා. එනිසා මාගේ ශ්‍රාවක දරුවෙනි, මුල් සුදු සබය දෙ වන වරට ද ඉදි වනු සඳහා නුඹලාට යන්නට සිදු වන ගමන අතිශයින් කටුක වූවකි; එහෙත් ඇතුලාන්ත ප්‍රීතිය නිසැක ව ම හිමි වන ගමනකි. මන්ද, නුඹලාට යන්නට සිදු වන ගමන තුළ සදාකාලයෙන් සදාකාලයට ම සමිඳාණන් වහන්සේ වන මම වැඩසිටිමි. පිරිහෙමින් ඇති මාගේ සභාව සිහි කරපල්ලා. විනාශය කරා යන මගේ උතුම් මැවිල්ල වන මිනිස් සංහතිය සිහි කරපල්ලා. ඒ සියල්ල නුඹලාගේ මනසින් මගේ කුරුසිය පා මුලට ගෙනෙන්න, දරුවෙනි; මාගේ අමිල වූ ශ්‍රී රුධිරයෙන් පොඟවා හරිමින් මොරගසන්න, දරුවෙනි. තව ද අධර්මය අවසන් කරමින් දැහැමි යුගයක උදාව උදෙසා මගේ පියාණන් විසින් සකසා ඇති මහා සැලැස්ම, නපුරා විසින් කඩාකප්පල් කරන්නට බලා සිටින මහා සැලැස්ම උදෙසා ද මොරගසාපල්ලා, දරුවෙනි. ඒ මහා සැලැස්ම උදෙසා යි, මා විසින් නුඹලා තෝරා පත් කර ගෙන ඇත්තේ."

**2004 ඔක්තෝබර් 25**

'දහම් නවෝදය' සංඝය එක්රැස් වූ මොහොතේ විගස එහි එන්නැ යි ජේසු සමිඳාණෝ ළාබාල දාසිය මගින් මට දැන්වූහ. මම එහි ගියෙමි. එවිට ජේසු සමිඳාණෝ මා අමතා මෙ ලෙස පැවසූහ.) "ඈන්තනි, යමක් කීමට මට ඇත. ස්වාමින් වහන්සේ සියල්ල ප්‍රේමය උදෙසා ම සිදු කරන බව නුඹ දන්නෙහිය. කරුණාවන්ත දෙවි පියාණන් තම දූ දරුවන්ගේ යහපත උදෙසා යි, සියල්ල සිදු කරන්නේ. විටෙක දරුවන්ට රිදෙන්නට පුළුවන. එහෙත් ඔවුන්ගේ යහපත උදෙසා එසේ කරන්නට නියමිත යි. කාලය ඉතා ම අල්ප යි. බලන්න, මගේ සමානකමට මවන ලද

මිනිස් සංහතිය අද විනාශ වෙමින් යන ආකාරය: සොබා දහම විනාශ වන ආකාරය. ඒ සියල්ල මට වේදනාවක් ම යි. නුඹලා ප්‍රේමයෙන් ඇතිදැඩි කරනවා නුඹලාගේ දු-දරුවන් ව. ඔවුන් යහපත් ලෙස ජීවිතය ගෙන යන විට නුඹලා සතුටු වෙනවා: එලෙස ම යි, මා ද. මුළු මිනිස් සමාජය ම මගේ දු-දරුවන්. ඔවුන් විනාශ වන්නට යන කල් හී එය මට දැරිය නොහැකි වේදනාවක්."

"මගේ ජීවිත ගමන නම් සදාකාලික කුරුසියේ ගමන යි. කෙනෙක් මට ඉඩ දී මා සමග ගමන් කරන්නේ ද ඔහු හෝ ඇය මුළු ජීවිතයේ ම කුරුසිය අත්දකිනවා ඇත. සැනසීමක් ලැබෙන්නේ මෙ ලොවින් තුරන් වී ගොස් මාගේ රාජ්‍යයේ අසුන් ගත්තාට පසු ව යි. මම සියල්ලන්ට ම ඇති ප්‍රේමය නිසා බොහෝ කාලයක් බොහෝ වේදනා දැ ඉවසා සිටියෙමි. අදත් එසේ ම යි. දැන් ඇරඹෙන්නට යන සැලැස්ම මින් වසර කීපයකට පෙර සිදු වීමට නියමිත ව තිබූ දෙයකි. මගේ කන්නලව්ව උදෙසා පියාණන් වහන්සේ සැලැස්ම පමා කරමින් සියල්ලන්ට කාලය ලබා දුන් සේක. මා පියාණන්ට එලෙස කන්නලව් කරමින් මනුෂ්‍යයා මනස්ස්ථාපනය තුළින් හැරී එන තෙක් බලා සිටියෙමි. නමුත් කවරෙක් ද, එසේ වූයේ? පියාණන් වහන්සේගෙන් ඒ ගැන තවත් අයැද සිටින්නට මට නො හැකිය. පියාණන් වහන්සේ සැලැස්ම කඩිනම් කළ සේක. කදුර වූ විනාශයේ ම කාල පරිච්ඡේදයක් දැන් හඹා එමින් ඇත."

**2004 නොවැම්බර් 19**

"බුද්ධියෙන් පමණක් නො ව තම ඇතුලාන්තයෙන් ම සියල්ල මෙනෙහි කරමින් හරවත් සියල්ල පමණක් තෝරා-බේරා ගෙන ජීවිතය පුරාවට ගමන් කරන්නේ නම් ඒ මනුෂ්‍ය තෙමේ කිනම් ආගමක හෝ වේවා, කිනම් ජාතියක හෝ වේවා, කිනම් දර්ශනයක හෝ වේවා හෙතෙම පල දරනු නියත යි."

## 41

## "සියල්ල සිදු වෙමින් ඇත, සියල්ල සැකසෙමින් ඇත, ස්වාමින් වහන්සේගේ දවස උදෙසා."

**2004 දෙසැම්බර් 26 ඉරිදා සවස 4. 00 ට**

(උදම් රළ පෙළින් - **Tsunami** - අප දේශය ද ආසියාවේ රටවල් ගණනාවක් ද මහත් ව්‍යසනයකට පත් වී ලෝකය ම තිගැස්මට පත් වූ දිනයකි, එය. ජේසු සමිඳාණෝ මුලසුනේ සිට ළාබාල දාසිය මගින් සංඝය අමතා මෙසේ ප්‍රකාශ කළහ.)

"විශ්ව මැවුම්කරුවාණන් වන සැබෑ එක ම දෙවිඳාණෝ මම වෙමි. දරුවෙනි, මොහොතක් මනස එක්තැන් කොට ආධ්‍යාත්මය නිරවුල් ව තබා ගනිල්ලා. අද මා හට විශේෂිත වූ දිනයක් නො වන්නේ ම ය. ප්‍රේමය වනාහි දුබල මනුෂ්‍යයන් අත්නොහැරීම ය. දරුවෙනි, ආධ්‍යාත්මය මනස අවුල් කර ගැනීම අනවශ්‍ය වූ ක්‍රියාවකි. බොහෝ දේ සිදු වේවි. පෙර සිට ම මා පැවසුවා. විටෙක ඒ සියල්ල සිදු නො වූ කල සියල්ලන්ට ම, නුඹලාට පවා එය ගැටළුවක් වූ අයුරු මම දුටු වෙමි. ඒ සියල්ල සිදු නො වන කල නුඹලා තුළ වුනත් මා පැගෙද්දී පොඩි වෙද්දී ප්‍රේමය උදෙසා යි, මා සියල්ල දරා ගෙන සිටියේ. මේ සියල්ල පසු ගිය වසර ගණනාවකට ඉහත දී සිදු වීමට නියමිත වූ දේවල් ය. නමුත් ප්‍රේමය නිසා බලා සිටියෙමි. දැන් වේලාව ගත වී හමාර යි. නොයෙක් ව්‍යසනයන් අත ළඟ ඇති බව වටහා ගනිල්ලා. නොයෙක් දැ අවුල් වියවුල් කර මේ ස්ථානයට යි, මා සංඝයක් ලෙස නුඹලා ව ගෙනාවේ. දැන් මනුෂ්‍යයා අවුල් වියවුල් ව ඇත. නුඹලා වියවුල් නො වන්නාහුය. ඉදිරියේ සිදු වන සියල්ල දකින කල මේ සිදු වීම් අංශු මාත්‍රයක් තරම් ය. තව බොහෝ දේ සිදු වීමට නියමිත යි. ව්‍යසනය පැමිණෙන්නේ කිසිවකු නොසිතන මොහොතක ය. ස්වාමින් වහන්සේට එක් මොහොතක් ඇත, විශ්වය ම චංචල කරන්නට."

"නුඹලා මේ රැඳී සිටින්නේ විශ්වය ම චංචල කරන තැනැත් වහන්සේ මධ්‍යයේ යි. නුඹලා මිත්‍රකමක් ගොඩනගා ගෙන ඇත්තේ මේ විශ්වය ම දෝංකාර දෙන දෙදරන ස්වාමින් වහන්සේ සමග යි. නුඹලාගේ පියාණන් වහන්සේ යැයි නුඹලා අමතන තැනැත් වහන්සේ කවුරුන් ද? ශුද්ධ වූ ව්‍යසනය ඇති කරන තැනැත් වහන්සේ ම ය. සියල්ලන්ගේ අවධානය තවමත් බෙත්ලෙහෙම් ඒ ගව මඩුව වෙතට යි. ඉදිරියේ ලෝකය තුළ සිදු වන කිසිවක් ගැන සොයා බැලීමට ජනතාවට අවශ්‍යතාවයක් නැත. එදා බෙත්ලෙහෙමෙන් ආ සියල්ල කුරුසියෙන් නිමා විය. නමුදු කුරුසියෙන් පටන් ගැන්ම නිමා වී නොමැත. දරුවෙනි, බොහෝ දේ දකිමි: නමුත් බොහෝ දේ නො කියමි. සියල්ල සිදු වන විට හොඳින් මෙනෙහි කරපල්ලා, ස්වාමින් වහන්සේ පැවසූ වදන්. කා බී ප්‍රීති වීමට කාලයක් ඇත. නමුත් මේ ඒ කාලය නො ව දුක් විඳින වේදනාවට පත් ව අසරණ ව සිටින

මනුෂ්‍යයා උදෙසා මොරගැසිය යුතු කාලය යි. මෙය යි, නුඹලාගේ දූත මෙහෙවර ඉදිරිටත්. මේ හරහා යි, නුඹලාට යෑමට සිදු වී ඇත්තේ."

"ඉදිරියට සිදු වන්නේ ද සුබ දායක දේ නො වේ. මන්ද, අසුබ දේ සිදු වීමට අසුබ දේට අධිපති වූ තැනැත්තාට ජනතාව හඬගසා හමාර යි. එනිසා ඒ තැනැන්තේ ඒ සියල්ලට වගකියන්නේ ම ය. ශුද්ධ වූ තැනැන් වහන්සේ ශුද්ධ වූ දෙයට හිමිකම් කියනවා ඇත. මෙ තැනින් මෙය කොතෙක් දුරට යා හැකි දැයි කාට නම් කිව හැකි ද? හැකි අය සියල්ලෙන් නිදොස් ව සිටපල්ලා. ඊ ළඟ ව්‍යසනය ද නුඹලා නොසිතන ආකාරයෙන් එක් තත්ත්පරයක දී සියල්ල සිදු වේවි. සියල්ල සුන්බුන් වන්නේ ම ය. නමුත් සමිඳාණන් වහන්සේ උන්වහන්සේගේ දෑ කරණකොට ගෙන ඒ සියල්ලට වග කියන්නාහ. සියල්ල උදෙසා මොරගසාපල්ලා. දුක් විඳින මනුෂ්‍යයා දැකපල්ලා. නිරතුරු ව ම තම තමාගේ ආධ්‍යාත්මය ඉතා නිවැරදි දේ කොතැනක ද එතැන තබා ගනිල්ලා. ස්වාමින් වහන්සේ පවසන දේ එලෙසාකාරයෙන් ම සිදු වනු නියතය."

**2005 ජනවාරි 02**

"ශුද්ධ වූ තැනැන් වහන්සේ මම වෙමි. මා විසින් ප්‍රේමයෙන් නිම වූ සියල්ල දකින කල්හි මේ වකවානුව තුළ මට වේදනාවක් ඇත. වසර ගණනාවක් පුරා මා විසින් පැවසූ වදන් නැවත නැවත ද එකින් එක එක් වචනයක් පාසා ම මෙනෙහි කර බලාපල්ලා. එදා නිනිවය මතක් කරපල්ලා. එදා උන්වහන්සේ විනාශය සඳහා තෝරා ගත් දේශය යි, එය. ඒ එක් දේශයක් පමණ යි. එහෙත් මේ වකවානුව වන විට මා මැවූ මුළු ලෝ තලය ද එහි වැසි සියල්ලන් ද සිටින්නේ එදා නිනිවය මෙන් ය. ඇස් ඇර බැලුවත් වැඩක් නොමැත: වැළපුනත් වැඩක් නොමැත. කිසිවෙක් ඇතුලාන්තයෙන් ම එසේ නො කරති. ඊ ළඟට සිදු වන්නේ තමා සමග සිටින සෙවනැල්ලට වත් නොදැනෙන විනාශයක් ම ය. ප්‍රේමය නිසා බොහෝ දේ ඉවසුවෙමි. ප්‍රේමය නිසා ම දැන් සියල්ල සිදු වෙමින් ඇත. දරුවෙනි, යමෙක් වපුරන දෙය යි, කපා ගන්නේ. එය පමණක් මනසෙහි තබා ගනිල්ලා. අද බොහෝ දේ තිබුණාට එහි ඇති නිෂ්පලත්වය නුඹලා දුටුවහු ද? එනිසා වපුරපල්ලා, සදාකාලයට ම නෙලා ගන්නට හැකි දෑ පමණක්. දරුවෙනි, සිදු වන දෙයින් සියල්ල උකහා ගනිල්ලා. සිදු වන සියල්ල උදෙසා පියාණන් වහන්සේ ඉදිරියෙහි මම වේදනාවෙන් මොරගසමින් සිටිමි. වඩවඩාත් අවශ්‍ය වන්නේ සියල්ලන්ගේ ගැළවීම උදෙසා මොරගැසීම යි."

**2005 ජනවාරි 07**

"මම අති ශුද්ධ වූ තැනැන් වහන්සේ වෙමි. මාගේ මිත්‍රවරුනි, මොහොතකට දෑස් පියාගෙන ඇතුලාන්තය නිරවුල් ව තබා ගනිල්ලා. මෙසේ සිටින විට දී ම මා පවසන සියල්ල ඇතුලාන්තයෙන් ම සවන් දිපල්ලා. වර්ෂාව ආසන්න වන විට දී කුහුඹුවා අවශ්‍ය ම දේ රැස්කර ගන්නේය. මන්ද, වර්ෂාව ඔහුට දැනෙන හෙයිනි: පරිසරයේ වෙනස්කම හඳුනන බැවිනි. නුඹලා ගත කරන මේ කාල සමයේ සියල්ල සිදු වෙමින් ඇත. එහෙත් කිසිවෙක් තමාට අවශ්‍ය ම දේ කුමක් ද එය තවමත් එක්රැස් කොට ගෙන නොමැත. එසේ හෙයින් උන්වහන්සේගේ ශුද්ධ වූ ප්‍රේමය උදෙසා සියල්ල සිදු වීමට පටන් ගෙන ඇත. සිදු වූ සියල්ලෙන් වත් කිසිවකු උකහා ගෙන නොමැත. ඊ ළඟ මොහොත බිහිසුණු බැවින් නුඹලා අවශ්‍ය ම දේ කුමක්දැ යි දන්නහුය. සිදු වූ සියල්ලෙන් බොහෝ දෙනෙක් ජීවිතය පුරාවට වැපුරූ දේ එක් මොහොතකින් නැති කර ගත්හ. වඩා සුදුසු දේ වපුරා ගනිල්ලා, එවිට එය නුඹලා යන තැනට නුඹලා කෙරෙහි සාක්ෂි දරනවා ඇත."

"මාගේ මිත්‍රවරුනි, මා නුඹලාට දී ඇති කුරුසියේ අත්දැකීම ඉතා අපහසු බව මම දකිමි. ඔබට අවශ්‍ය ද එයින් මිදෙන්නට? නුඹලා කෙඳිරි ගාන්නේ ඒ කුරුසියේ බරෙන් නිදහස් වීම පිණිස යි. එහෙත් නුඹලාට දී ඇති කුරුසියේ අත්දැකීම මා ඉවත් කරන්නේ නම් නුඹලා ද නාස්ති වෙනවා ඇත: පල දරන ගමන නොයනවා ඇත: වපුරන දේ නිෂ්පල වෙනවා ඇත. අද බලන්න, මනුෂ්‍යයෝ පල නොදරන දෙයට ලොල් ව ඇලුම් ව සිටිති. මොහොතකින් සියල්ල සුං විය. ඉදිරියට ද සිදු වන්නේ මෙ වැනි දෙය යි. එනිසා මාගේ ශ්‍රාවකයිනි, හැකි තාක් නිදොස් ව සිටපල්ලා. මන්ද, නුඹලා නිදොස් වන තරමට යි, සියල්ල පැහැදිළි වන්නේ: නුඹලා නිදොස් වන තරමට යි, මේ ගමන තේරෙන්නේ: නුඹලා නිදොස් වන තරමට යි, නුඹලා කවරෙක් දැ යි සියල්ලන් දැන ගන්නේ. මොරගසාපල්ලා, වචනවලින් නො ව ආධ්‍යාත්මයෙන් ම. මන්ද, ඊ ළඟ දෙය වඩා බිහිසුණු වෙනවා නියත යි. නොසිතන ආකාරයෙන් සියල්ල අවුල් වියවුල් වන්නට උන්වහන්සේ සලස්වා ඇත. මැවුම්කරුවාණන් වහන්සේ උන්වහන්සේගේ තෝරා ගත් ජනතාව ඉදිරියේ සියල්ල ප්‍රකාශ කර ඇති බැවින් කිසිවක් නොපැවසූ බව කිසිවකුට කීමට නුපුළුවන."

"ස්වර්ගයේ දෙවියෝ මිනිස් බව ගෙන මෙ ලොවට පැමිණ සියල්ල විඳ දරා ගත්හ. එසේ නම් මනුෂ්‍යයාට දැනෙන දේ උන්වහන්සේට දැනෙනවා ඇත; මනුෂ්‍යයාට අවශ්‍ය දේ උන්වහන්සේට දැනෙනවා ඇත; මනුෂ්‍යයාට බැරි දේ උන්වහන්සේ හඳුනනවා ඇත. බැරි දේ උන්වහන්සේ නො ඉල්ලති. හැකි සියල්ල යි, එකිනෙකාගෙන් ඉල්ලන්නේ. සියලු උවදුරු කඩා වැටෙන්නේ ම ය. බිය වී කිසිවක් ඉගෙන ගන්නවාට වඩා ඇතුලාන්තයෙන් ම අනෙකාගේ දුක දැක ඉගෙන ගැනීම යහපත් ය. ජනතාව තවමත් පොරකන්නේ දමා යන දෙයට යි. එබැවින් දරුවෙනි, සදාකාලයට ම ගෙන යාමට හැකි දේ උදෙසා සටන් වැදපල්ලා. එවිට එය මනුෂ්‍ය සංහතියේ ම ජයග්‍රහණය වනු ඇත. ඉදිරිය බිහිසුණු යි. දරුවෙනි, එහෙත් නොබිය ව සිටින්න. උන්වහන්සේ සදාකාලයට ම දුබල වූ මාගේ දරුවන් උදෙසා ඔවුන්ගේ ඉදිරි පසින් ද පසු පසින් ද වන සේක."

**2005 ජනවාරි 19**

"මම විශ්ව මැවුම්කරු වෙමි. ප්‍රේමය මාගේ විරාගත ගුණය වන්නේ ය. අත්හැර දමන්නට අවශ්‍ය දේ අත්හැර දමාපල්ලා. අත්හැර දමන තරමට සියල්ල ලැබෙනු ඇත. ප්‍රඥාව පාවිච්චි කරපල්ලා; ප්‍රඥාවට ප්‍රේම කරපල්ලා; එය අයැද සිටපල්ලා; ප්‍රඥාව තම හිස මුදුනේ ආභරණය කර ගනිල්ලා. රැස්කර ගනිල්ලා, මහෝත්තමයාණන්ගේ මහා ප්‍රේමය. මම සඳහට ම ප්‍රේමය වන්නෙමි. එහෙත් උදහස ද මා වෙත ඇති බව සියල්ලෝ තරයේ දැනගත යුත්තාහ. මාගේ කරුණාව දිව්හිමියෙන් ම ය. එහෙත් ඇසිල්ලකට වුව ද උදහස මා තුළ ඇත්තේය. දරුවෙනි, සියල්ල සිදු වෙමින් ඇත, සියල්ල සැකසෙමින් ඇත, ස්වාමින් වහන්සේගේ දවස උදෙසා. විටෙක ප්‍රේමයත් විටෙක උදහසත් ස්වාමින් වහන්සේ තම ඇතුලාන්තය තුළ මෙහෙයවන සේක. සිදු වන්නට නියමිත දේ එබැවින් සිදු වෙනවා නියත යි. මෙසේ පවසන්නේ ජේසුස් ක්‍රිස්තුස් ස්වාමින් වන මම වෙමි."

**2005 පෙබරවාරි 07**

"ප්‍රේමය වනාහි මහෝත්තමයාණන්ගේ විරාගත ගුණය වන්නේය. උන්වහන්සේ සියල්ල ප්‍රේමය උදෙසා ම සිදු කරන සේක. තම දරුවා ආහාරය සඳහා යමක් තම මවගෙන් හෝ පියාගෙන් ඉල්ලා සිටින විට කිසිදු දෙමාපියෙක් ආහාරය සඳහා නුසුදුසු දෙයක් තම දරුවාට නො දෙනවා ඇත. නුඹලාගේ මැවුම්කරුවාණන් වන දෙවි පියාණන් ද එලෙස ම යි. උන්වහන්සේ අයහපත නො දෙන සේක; යහපත පමණක් දානය කරන සේක. දරුවෙනි, මම බොහෝ දේ නො කියමි. එහෙත් බොහෝ දේ සිදු වනු ඇත. උන්වහන්සේ වසර ගණනාවක් මෙ වැනි අය තුළින් ප්‍රකාශ කළ සියල්ල සිදු වීමට නියමිත යි. සිදු වීමට නියමිත දේ අති භයානක යි. නපුරා වනාහි මායාකාරයෙකි. විටෙක යහපත මෙන් ඔහු පැමිණේ. එහෙත් සදාකාලයට ම ඔහු අයහපත ය. මනුෂ්‍ය ජීවිතය ද සැණෙකින් ශුද්ධවන්ත යි, සැණෙකින් ජරාජීර්ණ යි."

"අද බොහෝ දෙනා මතු පිටින් මා සොයති. මතුපිටින් මා සොයන විට ඇතුළාන්තය තුළ තිබෙන දුර්වලකම් පාපිෂ්ඨ භාවයන් වසා ගන්නට උත්සාහ කරන්නේ නම් එතැන ගැළවුම්කරුවාණන් වන මා නොමැත. අද බොහෝ දෙනා මා සොයා ගන්නට දේවස්ථාන තුළ එහි නොයෙක් දෑ තුළ පොරකති. එහෙත් ඇතුලාන්තය තුළ පාපය එසේ ම යි. කෙනෙක් මතුපිටින් මා සෙව්වාට පලක් නැත; ඇතුලාන්තයෙනු යි, මා සෙවිය යුත්තේ. තම ඇතුළු සිත යි, නිතර ම පිරිසිදු ව තබා ගත යුත්තේ. මනුෂ්‍යයාට නො හැකියි, තම උත්සාහයෙන් පමණක් එය ඉටු කර ගන්නට. මැවුම්කරුවාණන් වන එක ම දෙවියන් වහන්සේට පමණක් හැකියි, මනුෂ්‍ය සිත පිරිසිදු කරන්නට, මනස නිශ්චල කරන්නට. එනිසා මුළුමනින් ම උන්වහන්සේට නතු වෙයල්ලා. කෙනෙක් අදහන්නේ යම් ආගමක් ද යම් දර්ශනයක් ද ඒ තුළ අවංක ව දිවි ගෙවාපල්ලා; මන්ද, ඊ ළඟ මොහොත අති භයානක බැවින්. නුඹලාගේ ඇතුළු සිත තුළ නුඹලාගේ මැවුම්කරුට මුළුමනින් ඉඩ දිපල්ලා. එවිට නුඹලා නොදැනුවත්ව ම නුඹලා තුළ උන්වහන්සේ සියල්ල සිදු කර ගන්නවා ඇත. මැවුම්කරුවාණන් වහන්සේට ඔබ ජීවිතය තුළ මුළුමනින් ඉඩ දෙන්නේ නම් බොහෝ දෙයින් මනස පුරවා ගැනීම අනුවණකමකි. මනුෂ්‍ය ශක්තියෙන් පමණක් සියල්ල සිදු කර ගන්නට හැකි නම් එසේ කිරීම සුදුසු යි. දරුවෙනි, මනුෂ්‍ය ශක්තියෙන් පමණක් නො හැකියි, විමුක්තිය ලබන්නට. එනිසා මැවුම්කරුවාණන් තුළ ම රැඳෙන්න, එතුමන්ගෙන් ම යැපෙන්න."

(**2005 අප්‍රේල් 2 දින** උදැසන ජේසු සමිඳුණෝ ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් මෙසේ පැවසූහ. සංඝයේ ශ්‍රාවකයෙක් ද වන අරවින්ද රංගන ඊට සවන් දී සිටියේය.)

"ශුද්ධ වූ පියාණෙනි, ඔබ වහන්සේ ඔබගේ දයාබර දාසයා වන දෙවන ජුවාම් පාවුලු ගෙන ආ ගමන මට ප්‍රීතියකි. මා නැවත ලොවට වඩින්නට ප්‍රථම ඔහුගෙන් ඔබ ලබා ගත් සියල්ල උදෙසා ඔබ වහන්සේට ස්තුතියි. ඔහු ඔහුගේ කොටස හමාර කරන්නට දැන් වෙර දරමින් සිටී. සතුරා ද මාන බලමින් ඇත. පියාණෙනි, යුහුසුළු වුව මැනවි. ඔහු ඔබ පමණක් ම පතාගෙන ඇත;

ඔබගෙන් ම යැපෙමින් ඇත. පියාණෙනි, මාගේ දෙවන පැමිණීම උදෙසා ඔහුගේ යැම අත්‍යවශ්‍ය ය. ඔබ එය සිදුකර ඇති හෙයින් ඔබට මාගේ ප්‍රණාමය. ඔහු උදෙසා ඔබගේ පුත්‍රයාණෝ මෙසේ ඔබට මොරගසති. පියාණෙනි, මම ඔබ මධ්‍යයේ දැන් පෙනී සිටින්නෙමි. ඔහු මා සමග එක හදවතක ලැගුම් ගෙන ඇත. පියාණෙනි, අණ කරන්න, ඔබ තෝරාගත් මේ සංඝයට එකමුතුව ඔබගේ දාසයා වෙනුවෙන් මොරගසන ලෙස. පියාණෙනි, ඔහු ඔබට කළ සේවය ඉතා හොබනේය: ඔහුගේ එඩිතරකම ඉතා අගනේය: ඔහුගේ විශ්වාසය අවසානය දක්වා ම අති නිර්මලය. ශුද්ධ වූ පියාණෙනි, ඔබට සදාකාලයට ම මහිමය අත්වේ වා!"

"මාගේ සග ලොව වැසියෙනි, අසුන්වලින් නැගිට සිටින්න. මාගේ දාසයා ඔබ වෙත පැමිණෙන මොහොත ළඟා වෙමින් ඇත. ඔහු භාර ගැනීමට තුටු සිතින් පසුවන්න. පියාණෙනි, ඔහුගේ ජීවිත කාලයේ දී ඔහු අතින් දුර්වලකමක් සිදු වූයේ ද එය දන්නේ ඔබත් මාත් පමණකි. එබැවින් ඔහුට ඒ සියල්ල උදෙසා ක්ෂමා කර වදාරනු මැනවි. මේ ඔබගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේ ය. පියාණෙනි, ඔබට සදාකලයට ම මහිමය වේවා! ඇන්තනි ව කැඳවාපන්න. අවට සිටින සංඝයේ ශ්‍රාවකයින් ද කැඳවාපන්න. තව හෝරා බාගයකින් මම ඔහු අමතමි. පුත්‍රය, සූදානම් ව සිටපල්ලා. කාර්යභාරය ආසන්න යි. යාච්ඤාවෙන් පසුවන්න. කරන කාර්යය තුළ වුව ද යාච්ඤාවෙන් පසුවන්න. නුඹලාගේ ගමනේ උත්තරීතර භාවය ළං වෙමින් ඇත. සූදානම් ව සිටපන්න. මම වනාහි අති ශුද්ධ තැනැන් වහන්සේ වෙමි."

(සංඝයේ ශ්‍රාවකයෝ 15 දෙනෙක් විගස රැස්වූහ. ජේසු සමිඳාණෝ ළාබාල දාසියගේ මුවින් **පෙ. ව. 9.53ට** -සම්මත වේලාවෙන්- මෙසේ පැවසූහ.) "දරුවෙනි, මම බොහෝ කාලයක් ඔහු ව මාගේ පියාණන්ගේ රාජ්‍යයට කැඳවා ගැනීමට බලා සිටියෙමි. නුඹලාට ද නොයෙක් දින වකවානු දෙමින් මම ඒ බව පැවසුවෙමි. දරුවෙනි, ඒ මොහොත දන්නේ මාගේ පියාණන් වහන්සේ පමණක් ම ය. එතුමන් විසින් සියල්ල මට භාර කරන ලද්දේය. මම උන්වහන්සේ ඉදිරියෙහි මැදිහත් වෙමින් සියල්ලන් උදෙසා තව තවත් උන්වහන්සේගෙන් කාලය අයැද සිටියෙමි. දැන් වේලාව පැමිණ ඇත. ජුවාම් පාවුලු වනාහී ඇතුලාන්තයෙන් ම මා සමග මුළු ජීවිතය පුරාවට ම කල් ගෙවූ මනුෂ්‍යයෙකි. මාගේ පියාණෝ ජුවාම් පාවුලු ව මෙම දේශයට ද රැගෙන ආහ: එලෙස ගැළවීමේ දේශය ස්පර්ශ කරන්නට ඔහුට අවස්ථාව ලබා දුන්හ. ඔහු මෙතෙක් මාගේ පොරොන්දු මත ම රැඳී සිටියේය. නුඹලාට නම් මා ක්‍රියා කරන දාස දාසිහු සිටියහ. ඔහුගේ මරණයෙන් පසුව සිදු වන්නේ නුඹලා නොසිතන ආකාරයේ සිදු වීම් ය. ඒ සිද්ධීන් මනුෂ්‍යයෝ කෙලෙස නම් දරා ගනිත් ද? ඔවුහු ඒ ප්‍රයෝගයන්ට හසු නො වෙත් ද? අහෝ! සිදු වන විපතක මහත. ප්‍රඥාව පැළඳ ගන්නට ම අවශ්‍ය යි."

"මේ මොහොතේ ද මම ඔහු සමග වෙමි. මන්ද, ලූසිෆර් ම ඔහු අබිමුව ඔහු ගෙළ දෙසට දෑත් දිගුකර සිටින මොහොතකි. මම මාගේ හස්තය ඔහු පිට තබා ඇති මොහොතකි. ඔහු මරණාසන්නව කඳුළු වගුරු වන මොහොතකි. දරුවෙනි, එදා මල් උයනේ මා ගත කළ ඒ හෝරාවන් සිහි කරන්න. එවැනි හෝරාවන් ය, ඔහු දැන් ගත කරමින් සිටින්නේ. මනුෂ්‍යයා කෙලෙස සුදන වුවත් මරණ මොහොතේ දී මනුෂ්‍යයා ඒ භයානක දෙයට මුහුණ දිය යුතුම යි. මරණය අති භයානක යි. එනිසා යි දරුවෙනි, පියාණන් වහන්සේ ඉදිරියේ දී එදා මා ද හඬා වැළපුනේ. මරණය තරම් භයානක දෙයක් මනුෂ්‍යයාට නොමැත. උණුසුම් ව තිබූ මනුෂ්‍ය ශරීරය දැන් සීතල වෙමින් ඇත: දෑත් දෙපා අඩපණ වී ඇත: දෙනෙත්වලින් කඳුළු වැල් ගලා යමින් ඇත. පියාණෙනි, කඩිනම් කළ මැනව, ඔබගේ දාසයා ඔබ වෙත කැඳවා ගන්නට. මරණය අති භයානක යි. පියාණෙනි, ඒ වේදනාව මනුෂ්‍යයාට දැරිය නො හැකිය. උණුසුම් ව තිබූ ශරීරය දැන් ශීතල වෙමින් ඇත. තමාගේ මුළු ජීවිතය ම දැන් සිහි කරමින් ඇත. එවැනි චරිතයක් එසේ සිතනවා නම් මේ දුබල මනුෂ්‍යයින්ට ඒ මොහොත කෙසේ වනු ඇද්ද?"

"පියාණෙනි, ඔහුගේ දෙනෙත්වලින් ගලන කඳුලින් ඔබගේ ප්‍රේමය උණුකර දියකර හරින්නට සැලැස්වුව මැනව. මරණය අබියස මනුෂ්‍යයා අසරණ යි. මනුෂ්‍යයා මරණයට බිය යි. ඒ එසේ ම යි. මරණ බියෙන් මනුෂ්‍යයා මුදන්නේ කවරෙක් ද? නුදුටු තැනකටයි, ඔවුන් ව ඔබ කැඳවන්නේ. පියාණෙනි, මාගේ රැළ සමගයි, මා දැන් සිටින්නේ. කවුරු කෙලෙස සුදන වුවත් මරණයේ දී සියල්ලන් ම සාමාන්‍ය යි. පියාණන් වහන්සේ තම ඒක ජාතක පුත්‍රයාණන් වන මට ද එදා එය එසේ ම වන්නට සැලැස්වූහ. ජුවාම් පාවුලුගේ මේ මොහොතේ අත්දැකීම මට ද වේදනාවකි. ඇන්තනි, එවැනි මොහොතක් නුඹලාට ද ලැබෙනවා නිසැක යි. ඒ මොහොතේ දී මා දැකීම පමණ යි දරුවෙනි, ඇතුලාන්ත ප්‍රීතියට තිබෙන්නේ. මනුෂ්‍යයෝ ඒ කිසිවක් නොසිතමින් ජීවත් වෙති. අහෝ! මේ මනුෂ්‍ය ජාතිය, නුඹලා කෙතරම් අනුවණ ද? පියාණෙනි, මේ දුක් පාත්‍රය ඔහුගෙන් ඉවත් කළ මැනව. ඔබගේ රාජශ්‍රීය ඔහු මත බැබලුව මැනව. දරුවෙනි, ඔහු උදෙසා

මොරගසාපල්ලා. මම ද නුඹලා සමග වන්නෙමි. නුඹලාගේ මොරගැසීම් මධ්‍යයේ මම නැවතත් ක්‍රියාත්මක වෙමි."

**(පෙ. ව. 10. 13ට** නැවත ද ශ්‍රාවකයින් අමතමින් ජේසු සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කළහ.) "මාගේ දාසයා වන නුඹලාගේ සුදු පියා දැන් ගත කරමින් සිටින මෙම දුඃඛිත මොහොතෙන් ඔහු ව එතෙර කරන්නෝ පියාණන් වහන්සේ ම ය. ඒ සඳහා යන්ත්‍රසූත්‍ර අසමත් ය, ඥාන වීර්ය අසමත් ය, විද්‍යාව තාක්ෂණය අසමත් ය, ආධ්‍යාත්මය පමණ යි, සමත් වන්නේ. ජීවිතය පුරා තම ආශාවන් ඉටු කර ගන්නට මනුෂ්‍යයෝ පොරකති: අදට වඩා හෙට යමක් ලබා ගන්නට ලොල් වෙති. එය නිවැරදි ආකාරයෙන් සොයනවා නම් එය කම් නැත. දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයාට දෙන ලද මැවීම දියුණු කිරීම ඔහුගේ යුතුකම යි. දරුවෙනි, පෙර කල එය නිවැරදි ආකාරයෙන් සිදු විය. දැන් එය සිදු කරන්නේ කෙලෙස ද? අන්ත ජරාජීර්ණ පාපයෙන් ම යි, එය අද සිදුකරමින් පවතින්නේ. කෙසේ හෝ තම ආශාව මුදුන්පත් කර ගැනීමට යි, අද මනුෂ්‍යයා වෙර දරන්නේ.
ධනයට, බලයට කෑදර වන ජනතාවකි, අද සිටින්නේ. අනෙකා වේදනා විඳින විට අද ජනතාව සතුටු සාමිචියෙන් ගත කරන්නේ නැද්ද? අනෙකා කුසගින්නෙන් සිටින විට තමන් පමණට වඩා කුස පුරවා ගන්නා ජනතාවක් අද නො සිටිත් ද? එසේ හැසිරෙනවා නම් මරණ මොහොත සඳහා කුමක් ද ඔවුන් එක්රැස් කර ගන්නේ? තම ජීවිතය පුරා ආශාවෙන් එකතු කර ගත් ධනය, බලය මරණයේ දී කුමකට ද උපයෝගි වන්නේ? අද කිසිවකු ඒ ගැන සිතන්නේ නැත."

"ජුවාම් පාවුලු ජීවිතය පුරා ආධ්‍යාත්මිකත්වය යි, එකතු කර ගත්තේ. බොහෝ මනුෂ්‍යයෝ එසේ නො වෙති. ඔවුහු අයහපත ම රැස් කර ගනිමින් සිටිති. අද වතිකානය හොරුන්ගේ ගුහාවක් වෙමින් ඇත. ජුවාම් පාවුලු තව එක තත්පරයක් හෝ ජීවත් වෙනවාට ඔවුහු කැමති නො වෙති. ලුසිෆර් ඔහුගේ ආධිපත්‍යය විහිදුවමින් එහි රජ වන්නට සැලසුම් සකසමින් සිටී. මාගේ මෑණියන් මගින් මා ලබා දුන් මාගේ පණිවුඩය, ඒ දියණිය සටහන් කර දුන් ඒ පණිවුඩය ජුවාම් පාවුලු කියවූයේය. ඉන් පසු එය දරාගත නොහැකි ව ඔහු රෝගාතුර විය. මන්ද, ඔහු ලුසිෆර් ව හඳුනා ගත්තේය: ඔහු සමග එකට හැසිරෙන ඒ මනුෂ්‍යයා ව හඳුනා ගත්තේය. එවිට ඔහු සසල විය. එය දරා ගැනීමට නොහැකි වූ ඔහු රෝගාතුර විය. ඔහු දැන් මරණාසන්නව ඇත. මන්ද, ඔහුට එය උහුලා ගන්නට නොහැකි වූයේ ඔහුගේ මරණයෙන් පසු ලුසිෆර් සිය ආධිපත්‍යය පතුරුවන හෙයිනි. ඉදිරියේ දී ලෝකයේ ප්‍රබල රාජ්‍යයන් ලුසිෆර් තම දෑතට ගන්නේය. එවිට ඔහු ලෝකය ම පාලනය කරන්නට සූදානම් ව සිටී. එවිට මා දුන් සියලු අනාවරණ සිදු වෙයි. එනිසා ඒ සියල්ල අධ්‍යයනය කිරීම සුදුසු යි."

"තවද, කෑමට බීමට යමක් නුඹලාට ද නොලැබෙනවා ඇත. බීමට ජලය වුනත් අල්ප ලෙස යි, ලැබෙන්නේ. තම පවුලේ සිටින සාමාජිකයින් අඩු වන්නටත් පුළුවනි. සංඝයේ සිටින අය වුනත් ගෙවී යන්නට ඉඩ ඇත. ඒ කිසිවක් ගැන නොබියව සිටපල්ලා. මන්ද, ස්වාමින් වහන්සේ උදෙසා දිවි පිදීම තරම් වටිනා දෙයක් මේ ලෝ තලයේ තවත් නොමැත. සියල්ල ගරා වැටෙමින් තිබුණත් මනුෂ්‍යයෝ කමින් බොමින් ප්‍රීතියෙන් ජීවත් වෙති. එය එසේ සිදුකරන්නේ ලුසිෆර් ම ය. ඉදිරියේ දී මේ රට සශ්‍රික වන්නේය. එය සිදුකරන්නේ මා නො ව ඔහු ම යි. මන්ද, මා නුඹලා ව ගෙන යන්නේ කුරුසියේ මාර්ගයේ ම යි. දරුවෙනි, එනිසයි ඒ කාලය භයානක යැයි මා පැවසුවේ. එදා මුල් කිතුනු සභාව මෙන් නුඹලාට හැසිරෙන්නට සිදු වන්නේය. ස්වාමින් වහන්සේ දෙන දෙයක් පමණ යි, නුඹලාට කෑමට ලැබෙන්නේ. එදා ඒ ශ්‍රාවක පිරිස මෙන් තැනින් තැන එකතු වී යැදුමෙන් මොරගැසීමට යි සිදු වන්නේ. ඈන්තනි, සංඝයේ සියලු ශ්‍රාවකයින් සවස එක්රැස් කරපන්න. නුඹලා යන ගමන සමග එක් ව සිටින අනෙක් සියල්ලන් ද කැඳවාපන්න. සියල්ලන් එක් ව මැදියම් රැය පසු වන තුරු මොරගසාපල්ලා. යාච්ඤාවෙන් ගත කරන්නට සුදුසු ස්ථානයක් තෝරා ගන්න. මාගේ මුලසුන වුව ද කම් නැත. මාගේ ළාබාල දාසියා ද මම රාත්‍රියේ ගෙනෙන්නෙමි."

(පස්වරු 3.00ට අපි සංඝයක් ලෙස මුලසුනට එක් ව යැදුමට මුල පිරුවෙමු. ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳාණෝ **රාත්‍රී 10.30ට** සංඝයේ ශ්‍රාවකයින් අමතා මෙසේ පැවසූහ.) "ප්‍රේමාන්විත මිත්‍රවරුනි, මනුෂ්‍යයෝ කා බී සුව සේ නිදි යහනේ සිටිති. සමහරු දවසේ තම කාර්යයන්වල නිරතව සිටිති. මාගේ ශුද්ධවන්ත පුතණුවා කඳුළු සලමින් සිටී. ඒ මරණ මොහොත නිසා ම නො ව ඉදිරියේ දී සිදු වන දේ ඔහු දන්නා බැවිනි. ඉදිරි කාලයේ මනුෂ්‍ය සංහතිය තම දෑතට හසුකර ගන්නා ඒ තැනැත්තේ මිය යන මාගේ පුතණුවා දෙස ප්‍රීතියෙන් බලා සිටී. පියාණන් වහන්සේ උන් වහන්සේගේ ප්‍රේමයේ බැල්මෙන් තම පුතණුවා සරසමින් සිටිති. මනුෂ්‍යයෝ නිර්භයව තම තමන්ගේ එදිනෙදා කාර්යයන්වල නියැලී සිටිති. අන්ධකාරයේ අධිපතියා රාජ්‍යයන් තම අතට හසුකර ගන්නා බව ඔවුහු නො දනිති. දැනගත්තත් ඉන් කිසිදු පලක් නොමැත. දුක් විඳීමට කවුරුන් ද කැමති වන්නේ? කුරුසිය ඔසවා ගෙන යන්නට කවුරුන් ද ප්‍රිය

වන්නේ? නින්දාව දරාගෙන යන්නට කවුරුන් ද රිසි වන්නේ? එනිසා සියල්ල දුටුවත් සශ්‍රිකව ලබා දෙන දෙය ජීවිතයට එකතු කර ගන්නට යි සියල්ලන් සූදානම් ව සිටින්නේ.”

“නුඹලාට අද මේ හෝරාවන් වුවත් යාච්ඤාව තුළ සිටීමට අපහසු යි. එහෙත් නුඹලා එක් ව ගත කරන මේ මොහොත මාගේ පුතණුවාට සවියක් වෙමින් ඇත. නුඹලා මාගේ කාර්යයේ ඉදිරි ජනතාව යි. ඇන්තනි, මතක් කරපන් පුත්‍රය, ගත වූ වර්ෂයන් තුළ නුඹට මා පැවසූ සියල්ල. මා නුඹ කැඳවූ ගමන, මා නුඹට තැබූ නාමය සිහි කරපන්. නිසි මොහොතේ දී ඒ තැනට පැමිණ පුත්‍රය, සියල්ල සිදුකරන්නට නුඹට සිදු වෙනවා ඇත. නුඹලාගේ රැළේ සියල්ලන් ම එකට එකමුතු ව යි, මේ මොහොත ගත කරන්නේ. එහෙත් මාගේ පුතණුවා එදා කුරුසියේ එල්ලී සිටි මා මෙන් පිරිස මැද වුනත් හුදෙකලාව මරණ මොහොත එන තෙක් විඳවමින් සිටී. ඔහුගේ අඩවන් වූ දෙ නෙතින් ගලන කඳුළු හදවතින් ගැලීමට අපහසු යි. එහෙත් ගලා යන්නේ හදවතින් ම යි. මාගේ දරුවෙනි, මරණ මංචකය නම් අති කටුක යි. භයානක යි. එදා කුරුසියේ දී දේව පුත්‍රයාණන් වන මට එලෙස සිදු වුයේ නම් මනුෂ්‍යයාට ඒ අත්දැකීම කෙලෙස වනු ඇද්ද? මුළු ජීවිතය පුරාවට ම පොරකමින් රැස්කර ගත් ධනය බලය, අභිමාන ඒවායින් එකක් හෝ උපයෝගි කරගෙන මේ තත්ත්වයෙන් මිදෙන්නට හැකි නම් එය කෙතරම් හොබනේ දැයි මනුෂ්‍යයින්ට සිතෙනු ඇත. එහෙත් මනුෂ්‍යයෝ මරණ මංචකයේ ඇති මහා ගැඹුර තම ජීවිතයෙන් බැහැර කර ගනිමින් සිටිති. දරුවෙනි, එක් ව ඔහු උදෙසා මොරගසාපල්ලා. නුඹලාගේ එක් සුසුමක් වුවත් ඔහුට මේ මොහොතේ වටින්නේ ම ය.”

“ඇන්තනි, ඔබගේ සොයුරා යි, දැන් මා තුරුලට පැමිණීමට වෙර දරන්නේ. මේ මොහොත ඔහුට අපහසු යි, පුතණුව. ඔහු උදෙසා මොරගසන්න. අවසාන හෝරාවන් ඔහු දැන් ගත කරමින් ඇත. මේ නුඹලාගේ රැළේ ඉදිරි කැඳවීම යි, ඉස්මතු වන්නට දඟලන්නේ. මේ මොහොතේ ඔහු අපහසුවෙන් අදින සුසුම් නුඹලාගේ රැළ වෙනුවෙනි; ඔහු වගුරු වන කඳුළු නුඹලාගේ ජනතාව වෙනුවෙනි; ඔහු උසුලන විඳවීම ස්වාමින් වහන්සේගේ මහිමය උදෙසා ය. ඇන්තනි, ඔහු ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක්, මේ වකවානුව තුළ බිහි වූ ශ්‍රේෂ්ඨතම නායකයෙක්, වීර පුරුෂයෙක්, ආධ්‍යාත්මික යෝධයෙක්, අවසානය දක්වා ම ස්ථිර ව සිටි මනුෂ්‍යයෙක්. එලෙස යි, සැබෑ කිතුනු ගමන. මා කැඳවන ගමන එලෙස යි, අවසානය දක්වා ම ස්ථිරව සිටීම යි. ඔහු තනිව ම ඇතුලාන්ත පොරයෙන් මෙතෙක් කල් පැමිණියේ. තම සිරුරට, මනසට උසුලන්නට බැරි ස්වාමින් වහන්සේගේ මහා ඉදිරි ගමන ඔහු උසුලා ගත්තේය. ඔහු මුළු ජීවිතය පුරාවට ම මා හට සැනසීම දුන් මනුෂ්‍යයෙකි. මුළු මිනිස් ජනතාව වෙනුවෙන් තනිව ම සටනක යෙදෙන ඒ මනුෂ්‍ය තැනට සහාය වීම පිණිස දරුවෙනි, එක් ව මොරගසාපල්ලා, හනික එක් ව අවදිව මොරගසාපල්ලා, ගීතිකාවෙන් ද ප්‍රශංසාවෙන් ද මොරගසන්න. ඔහු බලා සිටී, නුඹලා ඔහු උදෙසා මොරගසන තෙක්. එනිසා එක් ව මොරගසාපල්ලා, දරුවෙනි. නැවත මැය වෙලා ගනිමින් මම නුඹලා අමතන්නෙමි.”

(**මැදියම් රැය පසු වී 12.20ට** සම්මත වේලාවෙන්) “දරුවෙනි, දැන් දොර ජනෙල් වසා දමන්න. විදුලි පහන් නිවා දමන්න. සියල්ලන් අසුන් ගන්න. මම මේ මොහොතේ කුරුසි සිංහාසනය මත වැඩසිටිමි. මගේ පුතණුවා මගේ අමිල වූ රුධිරයෙන් පොහවන්නට යි, මේ සූදානම, නුඹලා ද සමගින්. නුඹලා අද මෙ ලෙස ගත කළත් දරුවෙනි, නුඹලා තුළ ද විවිධ අමාරුකම් තෝරා-බේරා ගන්නට බැරි නොයෙක් ප්‍රශ්න නුඹලාගේ ඇතුලාන්තය තුළ ද තිබෙනවා ඇත. ඒ සියල්ල ද එකට කැටිකර ගනිමින් මගේ පුතණුවා ව මගේ රුධිරයෙන් පොහවන්නට දැන් සූදානම් වෙයල්ලා. රෝගිව යහන මත වැතිරී සිටින මගේ පුතණුවා ව දැන් සිහිකරපල්ලා. මගේ රුධිරය සදාකාලයෙන් සදාකාලයට ම ගලමින් ඇත. ඒ රුධිරය මගේ පුතණුවාට වගුරුවන්නට යි, මේ සූදානම. මගේ පුතණුවාගේ උපතේ සිට මේ දක්වා ඔහුගේ මුළු ජීවිතය පුරාවට ම ඔහු අතින් සිදු වූ සියලු දුබලකම් උදෙසා මාගේ රුධිරය මා වගුරුවන්නට යි, මේ සූදානම. ඔහු ආ ගමන් මඟ උදෙසා ඔහුට ලැබෙන මාගේ මහත් ත්‍යාගය වන මගේ අමිල ශ්‍රී රුධිරය වගුරු වන්නට යි දැන් සූදානම. එතැන ඇති යන්ත්‍රසූත්‍ර පහව යන්නට මාගේ රුධිරය ඔහු තුළ වගුරු වන මොහොතයි, මේ. නුඹලාගේ දෝත දැන් එක් කර ගනිල්ලා. මාගේ රුධිරයෙන් ඔබගේ දෝත පිරෙන්නට යැයි දැන් මොරගසාපල්ලා. මගේ රුධිරයෙන් දෑත සරසා ගනිල්ලා. පුතණුව, නුඹ උදෙසා මා දෙන ජීවනදායක ඖෂධය යි, මේ. මිහිතලයේ දී යි, මනුෂ්‍යයාට එය ලබා ගත හැක්කේ. පුතණුව දැන් ඔබ එය ලබා ගනිත් වා! මාගේ දරුවෙනි, මොරගසාපල්ලා මහා හඬින්, මාගේ පුතණුවාගේ අවසාන මොහොත වෙනුවෙන්.”

“ශුද්ධ වු පියාණෙනි, ඔබගේ පුතණුවා වෙනුවෙන් දැන් ඔබගේ දෑත දිගු කළ මැනව. ප්‍රශංසා වේවා, ඔබ වහන්සේගේ මහා ප්‍රේමය උදෙසා. දරුවෙනි, ඔසවාපල්ලා දෑත් ස්වාමින් වහන්සේට. උන්වහන්සේ සදාකාලයෙන් සදාකාලයට ම වැජඹෙන තැනැන් වහන්සේ ම ය. දරුවෙනි, ජේසුස් වන මම ද නුඹලා සමග මෙසේ රැඳී සිටිමින් මොරගසන්නෙමි.

ජුවාම් පාවුලු දෙස මාගේ දෙ නෙත් යොමු කළෙමි. දැන් ඔහුට හැකියි, සමාදානයෙන් මා පියාණන් තුරුලට එන්නට. දැන් නුඹලාගේ ඉදිරි ගමන උදෙසා මොරගසාපල්ලා. ප්‍රීතියෙන් ගී ගයාපල්ලා. ජුවාම් පාවුලු දැන් මාගේ පියාණන්ගේ තුරුළේ ය.” (එවිට වේලාව **මැදියම් රැය පසු වී 12.45 යි. සම්මත වේලාවෙන්**)

“ජුවාම් පාවුලුගේ දූත මෙහෙය විශිෂ්ඨ යි. මා නුඹලා සමග එක් ව සිදුකරමින් සිටින මේ දූත මෙහෙය අති විශිෂ්ඨ යි. මරණ මංචකයේ ඇති බිහිසුණුකම ගැන අද මම බොහෝ දේ පැවසීමි. ඇන්තනි නුඹ ද සංඝයේ ශ්‍රාවකයින් ද ඒ පිළිබඳ මා පැවසූ සියල්ල දැන් හිස් කළ යුතුයි. සග වැසි සියල්ලන්ට දැන් හැකියි, නැවත අසුන් ගන්නට. අති බිහිසුණු මොහොත පැමිණේ. පුත්‍රය, ඒ මොහොත සඳහා සූදානම් ව සිටපන්. එය ආසන්න යි. සශ්‍රීකත්වය පැමිණෙන්නේ ම ය. එහෙත් එය නපුරාගෙන් ය. එනිසා නුඹලාට එය නොලැබෙනවා ඇත. කෙනෙක් ඒ පසුපස දුවන්නේ ද ඔහුට විනාශය ම යි ලැබෙන්නේ. නුඹලා මා තුළ ස්ථිරව සිටිමින් සදාකාලයට ම වෙනස් නො වන දේ ලබා ගන්නවා ඇත. ඇන්තනි, දැන් මගේ දෑත් මත ඔබේ දෑත් තබන්න. දැන් සංඝයේ සියලු ශ්‍රාවකයින් ම අත් තබමින් සම්බන්ධ වන්න. මාගේ ශුද්ධ භාවයේ ගමන ඇරඹුනේය. ඔවුහු ඔහුගේ (ලුසිෆර්ගේ) සියල්ල සිදුකරමින් සිටිති. සාතන්, මේ නුඹ ව පරාජය කරන රැළ යි. සාතන්, මේ නුඹේ විරුද්ධකාරයින් ය. මම මොවුන් සමග සිටිමි. සාතන්, නුඹ නුඹට අවශ්‍ය දේ සිදු කරපන්න. මම මාගේ සියල්ල සිදුකරන්නෙමි. මහෝත්තමයාණන්ගේ නාමය සුවිශුද්ධ යැයි එක් ව මොරගසමින් මෙම යැදුම නිමාකරන්න, දරුවෙනි. (එවිට වේලාව අප්‍රේල් 03 පෙ.ව 1.15 යි)

# 42
# “කුරුසිය ජීවිතය පුරාවට ම ඔසවා ගෙන යන මනුෂ්‍යයාගේ ගැළවීම ද එය ම වන්නේය.“

**2005 අප්‍රේල් 14**

“මගේ මරණ මොහොතේ දී මරණයේ ඇති භයානකකම අත්දකිමින් ද එදා ජෙත්සමෙනි මල් උයනේ දී මම මාගේ පියාණන් වහන්සේට යාච්ඤා කළෙමි. අද නුඹලාට නො හැකියි, යාච්ඤාවක් නිසි ලෙස ගොඩනගා ගන්නට. ස්වාමින් වහන්සේ වන මාගේ දුක් විඳීමට යාගික වන්නට මොහොතක් නුඹලාට වෙන් කර ගත නො හැකි ද? බාහිර දෙයට කරදර වන්නා අනුවණයෙකි. ආධ්‍යාත්මික දේ සශ්‍රීක කරගන්නා නුවණැත්තෙකි. ඒකාන්තයෙන් ම කියමි, මනුෂ්‍යයෝ දුක් විඳීමට ප්‍රිය නො වෙති. මනුෂ්‍යයෝ සතුටට ප්‍රිය වෙති. දුකෙහි ඇති මහා ගැඹුර, දුකෙහි ඇති ආත්ම ප්‍රීතිය මනුෂ්‍යයෝ නො දනිති. දේව පුත්‍රයාණෝ දේව මහිමය පසෙක ලමින් දුකෙහි ඇති වේදනාවේ ඇති ආත්ම ප්‍රීතිය හැඳින ගත්හ. එබැවින් මනුෂ්‍යයකුට විඳීමට නොහැකි වූ අති තිත්ත දුක් ගාවිනාවක් එතුමෝ විඳ දරා ගත්හ; අදත් විඳිති. ස්වාමින් වහන්සේ කුරුසිය ආසන්නයට නො ව කුරුසි සිංහාසනයට ම ගොඩවැදුනහ. නුඹලා රිසි වන්නේ කුරුසිය ආසන්නයට පමණක් එන්නට යි. එහෙත් ගැළවීම ඇත්තේ කුරුසි සිංහාසනය මත යි. මාගේ උත්තරීතර සංඝයේ ශ්‍රාවකයින් වන නුඹලා සියල්ලෝ එය තරයේ මතක තබා ගත යුත්තාහ. මා තෝරා ගත් උත්තරීතර සංඝයේ ශ්‍රාවක දරුවෙනි, බැරි භාවය තුළ වුව ද මේ මහා විඳවීම විඳවපල්ලා; මේ මහා ගැළවීම අයිතිකර දීපල්ලා. එවිට යි, නුඹලාගේ ආත්මයට සැනසීම ලැබෙන්නේ.”

“මරණ මොහොතේ දී මනුෂ්‍යයා අබියස ස්වාමින් වහන්සේ සිටිත් නම් ඒ මොහොත ඔහුට භාග්‍යවන්ත වන්නේය. මරණයේ ඇති ඒ තිත්ත දුක් ගාවිනාව ඔහුට අමතක වන්නේය. ස්වාමින් වහන්සේ ව ඒ මොහොතට හෝ රැගෙන එකමුතු කර ගන්නට සියල්ලෝ වෙර දරත්වා! බාහිර දෙයින් හිස් වෙයල්ලා. මාගේ ශ්‍රාවකයින් වන නුඹලා කුමකට ද දිරා යන දේ පසුපස ලුහුබඳින්නේ? සියල්ල සරල කර ගනිල්ලා. මන්ද, ඉදිරියේ දී ඒ ලෞකික සියල්ල මනුෂ්‍යයාගෙන් ගිලිහී යන විට මනුෂ්‍යයාට එය දැරීමට නො හැකියි. නිවැරදි දේ තුළ තිබෙන සතුට, අද මනුෂ්‍යයා සොයන්නට උත්සාහ නොකරන සැබෑ සතුට නුඹලා සොයා ගනිල්ලා. මන්ද, අද මනුෂ්‍යයා සොයන සතුට ක්ෂණයකින් විනාශයකි. බාහිර වැඩ කටයුතු, එදිනෙදා කරන දේ වුනත් සරල කර ගනිල්ලා. එවිට කාලය ලැබේවි, ස්වාමින් වහන්සේ සමග ගත කරන්නට.“

“එදා ස්වාමින් වහන්සේට සාතන් ගෙනා ත්‍රිවිධ පරීක්ෂාවන් අද නුඹලා සියල්ලන් මධ්‍යයේ ද එසේ ම තිබෙනවා ඇත. කුඩා තෙරේසා මෙන් තම එදිනෙදා වැඩ කටයුතු, තම ජීවිත අත්දැකීම යාච්ඤාවක් කර ගන්නේ නම් එයට වඩා යහපතක් තවත් නොමැත. නුඹලා ගතකරන්නේ අති භයානක කාලවකවානුවක්. එහිලා ගැඹුර මා කොතෙක් පැවසුවත් නුඹලා තව ම වටහා ගෙන නොමැත. ඉදිරියේ දී ඒ සියල්ල හෙළි වන මොහොතේ දී සියල්ල නුඹලා වටහා ගන්නවා ඇත. මනුෂ්‍යයාට වඩා බලයක් සාතන්ට ඇත. එහෙත් දැන් ඔහුට වඩා බලයක් නුඹලා සතු විය යුතුයි. සාතන් සශ්‍රීක වන විට නුඹලා ද මාගේ මහා ප්‍රේමයෙන් මාගේ මහා බාහු බලයෙන් සශ්‍රීක වන්නට

අවශ්‍ය යි. එවිට යි, ධර්මය හා අධර්මය අතර මහා යුද්ධයේ දී නුඹලා මා අත මෙවලම කරගත හැක්කේ. දරුවෙනි, නිවැරදි දෑ පමණක් තෝරාගෙන එහිලා වැඩි වර්ධනය වෙයල්ලා. මෙසේ පවසන්නේ නුඹලාගේ දෙවි වූ ස්වාමින් වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුස් වන මම වෙමි."

**2005 අප්‍රේල් 25**

"මම දෙවි වූ ස්වාමින් වහන්සේ වෙමි, උත්තම පූජක තැන වෙමි. ප්‍රේමාන්විත සබඳ ඇන්තනි, පියාණන් වහන්සේගේ අනාදියේ වූ මහා සැලැස්ම උදෙසා සියල්ල නිසි ආකාරයෙන් සිදු වෙමින් ඇත. නුඹලා මා සමග මෙතෙක් ආ ගමන ලෝ වැසි සියල්ලෝ යම් දිනක දැක පුදුමයෙන් පුදුමයට පත් ව සියල්ල නිසි ලෙස තේරුම් ගනිති. මේ කුරුසියේ ගමන් මඟ නම්, අවසානයත් කුරුසියෙන් ම යි, නිමාවන්නේ. ඇන්තනි, රාජකීය ඔටුනු, රාජකීය ඇඳුම්-පැළඳුම්, ආසන, වත්පිළිවෙත්, සැපසම්පත් ගෞරව තාන්න-මාන්න නුඹලාට අයිති නැත. ජීවිතය පුරා කුරුසියේ ගමන් මඟ යමෙක් පැමිණියොත් එය නිමා වන්නෙත් කුරුසියෙන් ම යි. එහෙත් සදාතන ජීවිතය ස්වර්ගයෙන් ඇරඹෙනවා ඇත."

"ඇන්තනි, සියලු ගමන දැන් නිවැරදි යි, නො වේද, පුත්‍රය? කිසිවක් ගැන නො සිතපන්, මනස එක්තැන් ව තබා ගනින්, සැම විටම ජේසුස් තුළ. නුඹගේ ඇතුලාන්තය වේදනා කරවන බොහෝ සිදු වීම් සිදු වේවි: බොහෝ දේ නුඹ දකීවි. පුත්‍රය, අපහසු වෙයි නුඹට දරා ගන්නට. කෙසේ හෝ දරා ගනින්, පුත්‍රය. ප්‍රඥාවන්තව සියල්ල සිදුකරපන්. මනුෂ්‍යයාට අපහසු යි, දෙවියන් වහන්සේට සියල්ල හැකියි. එය නිරතුරුව මතක තබා ගනින්. මනුෂ්‍යයාට සමාව දෙන්නට දෙන්නට මනුෂ්‍යයා එයින් යමක් ඉගෙන ගන්නේ නැති නම් එය නැවත නැවතත් කිරීම අපහසු යි. එහෙත් මගේ ප්‍රේමාන්විත පියාණෝ එලෙස ම සිදුකරති. නුඹගේ සංඝයේ බොහෝ අය කුරුසි සිංහාසනය මධ්‍යයට එන්නට නො හැකිව අද නොයෙක් තැන් හරහා සිරගත වෙමින් සිටිති. අවශ්‍ය දේ බොහෝ කාලයක් තිස්සේ මම ප්‍රේමයෙන් පහදා දුනිමි. පරීක්ෂාකාර තැනැත්තේ නුඹලා ව පරීක්ෂාවට හෙලන්නට මගෙන් අවසර ලබා ගෙන ඇත. එබැවින් සියල්ලෙන් ගැළවී සිටීම නුඹලා සතු යි. නුඹලා සියලු වහල් භාවයන්ගෙන් ගැළවී එන තෙක් මම බලා සිටිමි. මම ප්‍රේමයෙන් ගොයම වැපුරුවෙමි, ඒ පලය නෙලා ගන්නට කැමැත්තෙමි. එහෙත් පලය මාගේ දෑ කැත්තට හසු වන්නට අකැමැති ව සිටී. නොයෙක් උවදුරුවලට යට වන්නට ප්‍රිය කරයි. ඇන්තනි, තවතවත් මේ සංඝය ගොඩනගාපන්න."

**2005 මැයි 02**

"ප්‍රතාපවත් මහිමය සඟවා ගෙන මිනිස් වෙසින් නුඹලා ජීවත් වන මේ කාලයේ පෙනී සිටින දෙවි වූ ස්වාමින් වහන්සේ මම වෙමි. මනුෂ්‍යයන් මේ ගත කරමින් සිටින්නේ බොහෝ ම අල්ප කාලයක්: නුඹලාගේ මුළු ජීවිත කාලයක් මට කොපමණ ද, ඇන්තනි? මතක් කරපන්, ප්‍රථම දාසිය මගින් මා නුඹලාට පැවසුවා. එසේ නම් මගේ ඒ එක දිනය හෝ එක හෝරාව යි, මනුෂ්‍යයින් ජීවිතය පුරාවට ම ගත කරන්නේ. ඒ කෙටි කාලය පසු කරමින් ජීවිතය පුරාවට ම රැස්කර ගත් දේ පොදි බැඳගෙන මගේ විනිශ්චය වෙත සියල්ලෝ පැමිණිය යුත්තාහ. එවිට මම මනුෂ්‍යයින් කොතරම් දේ මා වෙත ගෙනවිත් ඇද්දැ යි කිරා මැන බලා සෝදිසි කරමි. මා ඉදිරියේ අගනා දේ මම මා සන්තකයේ තබා ගනිමි. මට අනවශ්‍ය දේ මම නිරයට හෙලා දමමි."

"මනුෂ්‍යයෙක් ආහාරයට යමක් ලැබෙන කල එයින් කුස පුරවා ගනී. ඊ ළඟ වේලට කුමක් ලැබේවි දැයි බලා සිටී. ඒ මුළු මිනිස් සංහතියේ ම ස්වභාවය යි. අද මනුෂ්‍යයින් පමණක් නො ව පුරාතන මනුෂ්‍යයින් ද එලෙස ම යි. මනුෂ්‍යයෝ කිසිවකින් සෑහීමට පත් නො වෙති. පුරාතන මනුෂ්‍යයා කළ සියල්ල ම වර්තමානයේ දිත් මනුෂ්‍යයා එලෙස ම සිදුකරනවා ඇත. එය අති අනුවණකමකි. විනාශය අත ළගට ම ආවත්, මරුවා ගෙළ මිරිකාගෙන සිටියත්, භුස්ම යන්නට ඔන්න මෙන්න කියා තිබියදිත් මනුෂ්‍යයෝ අදට වඩා හෙට තවත් යමක් උපයාගෙන ප්‍රීතියෙන් ජීවත් වීමට ප්‍රිය වෙති. බොහෝ දේ පවසමින් නොයෙක් සිදු වීම් තුළින් මේ තත්ත්වයෙන් මාගේ සංඝයේ ශ්‍රාවකයින් මුදවා ගන්නට මම වෙර දැරුවෙමි. එහෙත් සමහරු නොයෙක් සීමා තැන්වල සිරගත වෙමින් සිටිති. මා ඉදිරියේ එක හෝරාවක් වන මේ කෙටි කාලය යි නුඹලාට පසුකර යන්නට ඇත්තේ සදාතන ජීවනය සොයා ගෙන. ඉදිරිය පිළිබඳ පැවසූ සියල්ල එලෙසාකාරයෙන් ම සිදු වන්නේය. වතිකානයෙන් ඇරඹෙන්නේය. ---- ඉදිරියේ දී ආගම් භේද ඇති වෙනවා ඇත: දර්ශනවාදයන් අතර ගැටුම් ඇති වෙනවා ඇත, ලේ ගංගා ගලා යනවා ඇත. මළ සිරුරු මහ මඟ ගොඩගැසෙනවා ඇත, ඒවා කුණු වී ගලා යනවා ඇත, වෛරය ක්‍රෝධය රජ වෙනවා ඇත, කාමය වැගිරෙනවා ඇත. එනිසා යි, සැම ජීවිතයක් තුළට ම මා ළං කර ගන්න යැයි නැවත නැවතත් මා පවසන්නේ."

**2005 මැයි 28**

"අති අමිල වූ දුක් පාත්‍රයක් මනුෂ්‍ය සංහතියේ ගැළවීම උදෙසා ත්‍යාගයක් ලෙස පානය කළ දැනුත් සඳහටත් පානය කරන නුඹලාගේ දෙවි වූ ස්වාමින් වහන්සේ මම වෙමි. මනුෂ්‍ය පුත්‍රයාණන්ට උන්වහන්සේගේ නිමක් නොමැති ආදරය ප්‍රේමය උදෙසා සදාකාලිකව ම මනුෂ්‍ය සංහතියේ දාසයකු වීමට සිදු වී ඇත. මනුෂ්‍යයෝ වීරත්වයෙන් පිදුම් ලබති; පෞරුෂත්වයෙන් වැජඹෙති; බලයෙන් ධනයෙන් සැරසී සිටිති. මනුෂ්‍ය පුත්‍රයාණෝ අදත් ඒ හැම ජීවිතයක් තුළින් ම පැගෙමින් සිටිති. ඒ හැම ජීවිතයක් උදෙසා ම මනුෂ්‍ය පුත්‍රයාණෝ දාසයකු වී සිටිති. මනුෂ්‍ය පුත්‍රයාණෝ එලෙස දාසකම ම උරුම කරගෙන සිටිති."

"පියාණන් වහන්සේගේ සැලැස්ම උදෙසා සියල්ල සිදු වෙමින් යන ආකාරය දෙස මම බලා සිටිමි. ඒවා මට ප්‍රිය නො වේ. ඒ ක්‍රියාවන් දැකීම නැරඹීම ඇසීම මට අප්‍රියජනක ය. එහෙත් ඒ සියල්ල මම ඉතා ඕනෑකමින් බලා සිටිමි. මන්ද, පියාණන් වහන්සේගේ සැලැස්ම ඉටුවීම උදෙසා මාගේ කොටස කරන්නට ඒ සියල්ල මට සියලු දොරගුළු විවෘත කර දෙයි. මේ සියල්ල ප්‍රේමය උදෙසා ඉවසන්නට ද ප්‍රේමය උදෙසා උදහස් වන්නට ද එබැවින් මට සිදු වී ඇත. එනිසා යි, ඇන්තනි, මේ සැලැස්ම මෙ ලෙස යැයි අවබෝධ කර ගැනීමට ඔබට ද නොහැකි වන්නේ. දරුවකු නොමඟ යන විට, ප්‍රේමයෙන් එය පහදා දෙන විට ඔහු අසන්නේ නැති නම් නුඹලා ගන්නා දෙ වන පියවර වන්නේ උදහස් වීමෙන් තරවටු කිරීම යි. මම ද එසේ ම වෙමි."

"ඇන්තනි, ශුද්ධ ලියවිල්ලේ තිබෙනවා නිශ්චල දිය වෙත මා නුඹලා ගෙන යන බව. ඇයි, චංචල දිය මත මා නුඹලා ගෙන නො යන්නේ? පුත්‍රය, වෙනස මෙ තැන යි. නිතර ම චංචල වන දේ භයානක නොමැත. නිතර ම නිශ්චලව තිබෙන දේ අති භයානක යි. එවැනි මඟක යි නුඹ ඇතුළු නුඹගේ රැළ මා ගෙන යන්නේ. එනිසා යි, ඒ සියල්ල ඔරොත්තු නො දෙන්නේ. බිය නො වන්න. ස්වාමින් වහන්සේ නුඹලා සමග වැඩසිටින සේක. සියල්ල මෙසේ ම ගලා යාවි. උන්වහන්සේ උන්වහන්සේගේ කොටස, නුඹලා කිසි දිනෙක කළ නොහැකි යැයි කියන සියල්ල උන්වහන්සේ ක්ෂණයකින් සිදුකරන සේක. බොහෝ දේ සිදු වේවි. සිත චංචල වන දේ නිරන්තරයෙන් සිදු වේවි. අසාධාරණයට මුහුණ දෙන්නට සිදු වේවි. එහෙත් උන්වහන්සේ ගැන ස්ථිර විශ්වාසයෙන් සිටීම යි අවශ්‍ය වන්නේ. නුඹලාට වඩා සාතන් යුහුසුළු වෙමින් ඇත. එනිසා ඉතා ප්‍රඥාවන්ත වීම සියල්ලන්ට ම සුදුසු යි. හැම කුඩා සිද්ධියක් තුළින් ම ප්‍රඥාවන්ත වීම නුවණට උචිත වන්නේය. දරුවෙනි, නුඹලා සියල්ලන්ගේ ම කඳුළු වූ අත්දැකීම් සියල්ල මම දකිමි. ඒවා ගැන මට වේදනාවක් ඇත. දරුවෙනි, ඉවසා දරා ගන්න. උන්වහන්සේ සනසන පිණිස නුඹලා විසින් ඒ සියල්ල සිදු කළ යුතු ම යි. මෙසේ පවසන්නේ නුඹලාගේ ස්වාමින් වහන්සේ වන මම වෙමි."

**2005 මැයි 31**

"දරුවෙනි, ප්‍රේමය ඔබ තුළ ජ්වලිත වන්නට අවශ්‍ය යි; කරුණාව ඔබ තුළින් ගලා යන්නට අවශ්‍ය යි. මා සකල මැවිල්ල මිනිසාට භාර දුන්නේ ජ්වලිත වූ කරුණාව, ප්‍රේමය පෙරදැරි කරගෙන යි. දරුවෙනි, නුඹලා සිනාසෙන විට මම සිනාසෙමි. නුඹලා හඬන විට මම වැළපෙමි. නුඹලා විඳින විට මම විඳිමි. නුඹලා පුදන විට මම ඒ සියල්ල පියාණන්ට භාර කරමි. නුඹලා එක් පියවරක් මා සමග තබන විට නුඹලාගේ ඇතුලාන්තයේ මම පියවර දහයක් තබමි. නොකැළැල් බැටළු පැටවාණෝ සිය රාජශ්‍රීය නුඹලා මධ්‍යයෙහි ගලා යාමට සලස්වති. මාගේ ශ්‍රාවක දරුවෙනි, නුඹලා එකිනෙකා විවිධ දෑ තුළින් එකිනෙකාට පරස්පර වූ චරිත ලෙස මම ගොඩනගා ඇත්තෙමි. එහෙත් දරුවෙනි, ඒ සියල්ල එක ස්ථානයකට පැමිණිය යුතුයි. ස්වාමින් වහන්සේ කෙරෙහි ඇති මහා ඇදහිල්ලේ, මහා ප්‍රේමයේ මධ්‍යයට පැමිණිය යුතුයි. බලන්න, ගංගා ඇළදොළ විවිධාකාර යි. එහෙත් ඒ සියල්ල එකට එකතු වන තැනක් ඇත. ඒ මහා සාගරය යි. දරුවෙනි, නුඹලාගේ රැළේ ඇති විවිධ චරිත හැපි හැපී කැඩෙමින් බිඳෙමින් ගලා ඇවිත් මහෝත්තමයාණන් නමැති ඒ මහා ජලස්කන්ධයට එක් විය යුතුයි. එවිට යි, නුඹලාගේ ගමන ශක්තිමත් වන්නේ; බාධක දොරගුළු බිඳගෙන යන්නට ශක්තිය ලැබෙන්නේ. ජේසුස් යන ශ්‍රී නාමය ඔබගේ ඇතුලාන්තයේ රාජාතිරජිඳාණන් කර ගන්න. එවිට සියල්ල නිවැරදි ඉලක්කය කරා ගමන් කරාවි."

**2005 ජූනි 02**

"මගේ ශ්‍රාවක දරුවෙනි මා දුන් කාලය දැන් ප්‍රමාණවත්. නැඟී සිටපල්ලා, ස්වාමින් වහන්සේ වෙනුවෙන්. එවිට උන්වහන්සේ නුඹලාගේ ඇතුලාන්තය සොලවන සේක; එය නිසි තැනට පමුණුවන සේක. එවිට නැවත නුඹලා නොසොලවන සේක. මෙසේ පවසන්නේ අති අමිල වූ නුඹලාගේ දෙවි වූ ස්වාමින් වහන්සේ වන මම වෙමි. නුඹලා අවංක ව උත්සාහ දරනවා නම්, මීට වඩා සුළු කලක දී නුඹලා ඔසොවා තබන්නට මට ඉඩ තිබිණි. තවමත් නුඹලා සිටින්නේ නීති-රීති හා සම්ප්‍රදායික දේ තුළ යි. එනිසා යි, එය අපහසු වන්නේ. ස්වාමින් වහන්සේ පවසන යම් දෙයක් ඇද්ද, උන්වහන්සේ ගෙන යන යම් රටාවක් ඇද්ද ඒ දෙසට ම පියවර තබන්න. එය යි, අවශ්‍ය වන්නේ."

**2005 නොවැම්බර් 03**

"දුක් විඳින මනුෂ්‍ය වර්ගයා උදෙසා දුක වේදනාව රසයක් කරගත් මනුෂ්‍ය පුත්‍රයාණෝ අදත් කල්වාරි කුරුසිය මත සිංහාසනාරූඪව සිටිති. ඒ සිංහාසනයේ රාජකීය ඔටුන්න මනුෂ්‍ය සංහතිය උදෙසා මම දායාද කළෙමි. දුකෙහි ඇති වේදනාව රසයක් කර ගනිමින් සියල්ලන් උදෙසා සැනසීම වගුරුවන මනුෂ්‍ය පුත්‍රයාණෝ අදත් කුරුසිය මත යාගික වෙමින් සිටිති. එතුමාණෝ සෑම මොහොතක් ම මනුෂ්‍යයාගේ යහපත උදෙසා ගත කරන්නට, විඳවීමේ ඒ අමාරු ම තත්පරය ගත කරන්නට වඩවඩාත් ගත කරන්නට, සූදානම් වී සිටිති. නුඹලාගේ දුක වේදනාව නුඹලාට ම අයිති නැත. මන්ද, ඒ උදෙසා මනුෂ්‍ය පුත්‍රයාණෝ අදත් මිලය ගෙවමින් සිටිති. මා කී දෑ බොහෝ ම යි. සිදු වන්නට නියමිත දේ දෙ ගුණ තෙ ගුණ ආකාරයෙන් සිදු වනු ඇත. බිය නො වන්න. විනාශයේ චණ්ඩ මාරුතය නුඹලා අවට හමා යන මොහොතක් ය. ප්‍රඥාව පැළඳ ගන්න: ස්වාමින් වහන්සේගේ ආසිරි මධ්‍යයේ එය පළඳවා ගන්න. ජීවිතය නම් කුරුසිය යි. කුරුසිය සිරස් රේඛාවෙන් හා තිරස් රේඛාවෙන් එකිනෙකට ඡේදනය වුවත් ජීවිත කුරුසිය එසේ නො වේ: එය විවිධාකාර යි. එහෙත් ජීවිතයේ උත්තරීතර වූ රසය ඇත්තේ එතැන ම යි. එය යි, නුඹලා වටහා ගත යුත්තේ. ජීවිත අත්දැකීමට මුහුණ දෙමින් ඒ අරගලය තුළ ම කුරුසි සිංහාසනය මධ්‍යයට පැමිණෙන්න, දරුවෙනි."

**2005 නොවැම්බර් 17**

"කාලය සීඝ්‍රයෙන් ගෙවී යමින් ඇත. ස්වාමින් වහන්සේ තෝරාගත් අය හට උන්වහන්සේගේ මහඟු රැකවරණය ද නපුරා තෝරාගත් අය හට ඔහුගේ මහා සැප සම්පත් සමග ඒ ලෞකික දේ තුළ සැඟවී තිබෙන විනාශය ද ඇති වන කාලය දැන් උදා වෙමින් ඇත. ලෞකික සියල්ලේ නිෂ්පලත්වය මනුෂ්‍යයින් දකින මොහොත ආසන්න ය. දරුවෙනි, තැලෙන පොඩිවන ජීවිත යි, කුරුසිය ගෙන යන්නේ. තැලෙන පොඩිවන විට සිහි කරන්න, මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් වන මා නුඹලා උදෙසා තැලෙන පොඩිවන බව. ---- ඉදිරියේ දී දැත දෙ පයින් කරන රැකියා පමණ යි, ඉතිරි වන්නේ. සියලු තාක්ෂණය විද්‍යාව සුණු විසුණු වන කාලය ආසන්න යි. එදා මුල් යුගයේ දී මෙන් දැත දෙ පයේ රැකියා පමණ යි ඉතිරි වන්නේ. සියල්ල කෙසේ වෙනස් වුනත් නොබියව සිටින්න. දරුවෙනි, සියල්ල උන්වහන්සේගේ සැලැස්මට අනුව සිදු වන බව පමණක් සිතෙහි ධාරණය කර ගන්න. උන්වහන්සේගේ ක්‍රියා අවසානය දක්වා ම නරඹන්න, දරුවෙනි."

**2006 ජනවාරි 22**

"දරුවෙනි, කුරුසිය ජීවිතය පුරාවට ම ඔසොවා ගෙන යන මනුෂ්‍යයාගේ ගැළවීම ද එය ම වන්නේය. දුක් විඳින මනුෂ්‍යයාගේ, තැලෙන පොඩිවන මනුෂ්‍යයාගේ, බලාපොරොත්තු ප්‍රාර්ථනාවත් සුණු විසුණු වී යන මනුෂ්‍යයාගේ, සත්‍යය බොරුවට යට කරන සමාජයක ඒ ගැන ද විඳවන මනුෂ්‍යයාගේ ජීවිතයේ පරම සත්‍යය විය යුත්තේ උන්වහන්සේගේ දුක් විඳීමෙන් ලද ගැළවීමේ ජයග්‍රහණය යි. ශුද්ධ වූ සැලැස්ම උදෙසා ශුද්ධ වූ වගකීම උදෙසා නුඹලා ව මා ගෙන යන ගමන් මාර්ගය මෙලෙසාකාරයෙන් ම ගෙන යන්නට මම සිතුවෙමි. මන්ද, මෙය කිසිදු න්‍යායකට හසු නො වෙනවා ඇත: කිසිදු දර්ශනයකට හසු නො වෙනවා ඇත. මා නුඹලා ව ගෙන යන ගමන පැටලුන නූල් බෝලයක් මෙන් ය. එහෙත් එහි නිරවුල නුඹලා අතරේ තබමින් දෙවි වූ ස්වාමින් වහන්සේ සියල්ල එකිනෙක නිරවුල් කර ගන්නා ආකාරය නුඹලාට කියා දෙමින් සිටිති. මේ පරම සත්‍යය උදෙසා යන ගමනකි: පරම සත්‍යය ම සොයා යන ගමනකි. මෙය මුළු මිනිස් ජනතාවගේ ගැළවීම උදෙසා නුඹලා මගේ අතේ අතකොළුවක් වෙමින් යන ගමනකි: මාගේ දෑතේ නිර්මාණය කරන පිරිසකි. නුඹලා සියල්ලන් මාගේ ම දෑතින් නිර්මාණය කරන නිසා නුඹලාට ඒ කිසිවක් නොපැහැදිලි වන්නට නො හැකියි. ඒ පරම සත්‍යය උදෙසා මාගේ පියාණන් වහන්සේ කැඳවා ගත් ගමනකි. එහි අවසානය ද පරම සත්‍යය පිහිටුවීම පමණ යි."

"දුක් විඳින මනුෂ්‍යයකු කොතැනක ඇද්ද, තැලෙන පොඩිවෙන දහඩිය කඳුළු වගුරුවන කෙනකු කොතැන ද එතැන මම ම වෙමි. ඔහු කුමන තරාතිරමක පුද්ගලයෙක්, අන්ත දුබලයෙක් වුවාට මට කම් නැත. එතැන මම ම වෙමි. යමෙක් සමාජයෙන් නිතර ම ප්‍රශංසාව හොඳ නම බලාපොරොත්තු වන්නේ ද ඒ සඳහා ම වෙහෙසෙන්නේ ද ඔහු හිස් තැනැත්තෙකි, බොල් මනුෂ්‍යයෙකි. ජීව බල, එඩි බල ඔහු තුළ නොමැත. මාගේ උත්තරීතර සංඝයේ ශ්‍රාවකයන් ලෙස නුඹලා යන මේ ගමන කිතුනු ගමනේ පරම සත්‍ය යි. එනිසා දරුවෙනි ආපසු හැරෙන්නට උත්සාහ නො කරන්න. මනුෂ්‍යයින් කවර කලෙක වත් නොයන ගමනක්, මෙය. එනිසා බාධක, දුක් කම්කටොළු, නින්දා අපහාස ආවා වේ. දරුවෙනි, නුඹලාට ඔසවන්නට බැරි බර ඔසවන්නට නුඹලා තුළ ම කෙනෙක් සිටිති. නුඹලාගේ විඳවීම තුළ විඳවන නමුත් ඇතුලාන්ත ප්‍රීතියේ උපරිමය තුළ වැජඹෙන නුඹලාගේ දෙවි වූ ස්වාමින් වහන්සේ නුඹලාගේ අභ්‍යන්තරයේ නිතර ම ජීවත් වෙති. නුඹලාගේ දිළිඳුකම ලෝකය දකිනු ඇත. එය නුඹලා ලද ශාපයක් යැයි ඔවුහු සිතති.

එහෙත් එය නුඹලා ලද භාග්‍යයකි. නුඹලා දිළිඳු යැයි පිටස්තරයෙන් මනුෂ්‍යයන්ට තීරණය කළ හැකියි. එහෙත් නුඹලාගේ ඇතුලාන්ත සැබෑ පොහොසත් බව මනුෂ්‍යයින්ට හසු නො වෙනවා ඇත."

"මාගේ උත්තරීතර සංඝයේ ශ්‍රාවකයින් වන නුඹලා මහා ආශිර්වාදයෙන් හුස්ම ගන්නා ජනතාවකි. නුඹලාගේ දෑත දෙ පය විරිය නුඹලාගේ ලේ කඳුළු දහඩිය උන්වහන්සේට දවන පූජාවලට වඩා වටිනවා ඇත. දරුවෙනි, නුඹලා මේ දැල ඔසවා ගෙන එන තෙක් මම බලා සිටිමි. එදා ජේසුස් නමින් මිහිතලයට පැමිණි දේව පුත්‍රයාණෝ සමාජයේ කිසිදු ප්‍රශංසාවකට කීර්තියකට අයිති නො වූහ· අදත් එලෙස ම යි. නුඹලා ද එසේ ම විය යුතුයි, සැබෑ කිතුනු ගමන යනවා නම්. මේ කිතුනු දැවැන්ත යෝධ ගමනේ නුඹලා ඉදිරියට ම යා යුතුයි. මම බලා සිටිමි."

**2006 පෙරවාරි 12**

"ඇන්තනි, ඇද මාවතක ගමන අපහසු යි. නුඹ සංඝයේ ශ්‍රාවකයින් එකිනෙකා කැඳවාගෙන යන ගමනේ දි එක් කෙනකු ඇද යි· තව කෙනකු ඊට විරුද්ධ යි· සියල්ල නිරන්තරයෙන් පරස්පර යි, සමාන නො වෙනවා ඇත. මා දුර ගමනක් කැඳවාගෙන ආ චරිත ශුද්ධ ලියවිල්ලේ වුව ද එකිනෙකට පරස්පර යි· සමාන චරිත නොමැත. ඇන්තනි, සංඝයක් ලෙස මා නුඹට තෝරා දුන්නේ එවැනි චරිත යි. ඒ චරිත එකට එකමුතු කර ගනිමින් එක් අරමුණක් උදෙසා එක් මාවතක ගෙන යාම අපහසු යි. ඇන්තනි, කෙලෙස හෝ ඇදගෙන යන්න, ප්‍රේමය වගුරුවාපන්න, නිරන්තරයෙන්."

**2006 පෙබරවාරි 19**

"විශ්ව නිර්මාතෘවරයාණන් වන මම මනුෂ්‍යයාගේ ඇතුලාන්තය නිරන්තරයෙන් විමසා බලමි. බාහිර දේ මට ප්‍රිය නො වේ. නුඹලාගේ චේතනා අවංක නම් ස්වාමින් වහන්සේ වන මම එතැන ලැගුම් ගනිමි. කිසියම් මනුෂ්‍යයෙක් මාගේ කුරුසියේ අත්දැකීමෙහි සිටී ද ඔහු හෝ ඇය තුළ තිබෙන දුබලකම් අඩුපාඩු දෙස මම ප්‍රේමයේ දෙ නෙතින් ම බලමි. මනුෂ්‍යයාට හැකියි, පිටස්තරයෙන් නුඹ දෙස බලා නුඹ කෙබඳු කෙනෙකු දැයි තීරණය කරන්නට. එය නිවැරදි තීරණයක් නො වෙනවා ඇත. මම මිනිස් සංහතිය දෙස එලෙසාකාරයෙන් බලන්නෙමි නම් අද මට ප්‍රේම කරන්නට කිසි කෙනකු මේ මිහිතලයේ නොසිටිනවා විය හැකියි. ජීවිතයක් තුළ මට ඉඩ ලැබෙන්නේ කොතැන ද, මම එතැන රැඳෙමි. එනිසා එකිනෙකා දෙස පිටාතරයෙන් බලා රැස්කර ගත් සියල්ල හිස් කරන්න."

"නුඹලාගේ ඇතුලාන්තය පිරිසිදු වන තරමට යි, නුඹලාගේ ආත්මයට සැනසීම ලැබෙන්නේ. එවිට යි, ස්වාමින් වහන්සේ තුළ කුරුසියේ ගමනේ මේ උදාර අත්දැකීම ඔස්සේ ම ගමන් කරන්නට හැකි වන්නේ. මාගේ ශ්‍රාවකයිනි, නුඹලා මාගේ කුරුසිය මඟ ඔස්සේ ම ගමන් කරමින් සිටින්නහුය. නුඹලා කොතැන සිටියත් කුරුසියේ අත්දැකීම තුළයි, සිටින්නට අවශ්‍ය වන්නේ. එතැනින් දශමයක් හෝ වෙනස් වන්නේ නම් එතැන දි සිතන්න, නුඹලා සිටින්නේ නිවැරදි තැන ද කියා. මාගේ කුරුසියේ ගමනට මිල-මුදල් බාධාවක් ම වන්නේය. සරල ජීවිතයක්, මොහොතේ ජීවිතයක් පමණ යි, ඒ ගමනට අවශ්‍ය වන්නේ. නුඹලා ස්වාමින් වහන්සේ වන මා සමග මෙ තෙක් ගොඩනගා ගත් කුරුසියේ ගමන් මඟ නිරන්තරයෙන් නුඹලාගේ ඇතුලාන්තයේ තබා ගනිල්ලා. නිතර ම ස්වාමින් වහන්සේගේ දෑතින් අල්ලා ගෙන ඒ ජීවිතය ගෙන යන්නට උත්සාහ කරපල්ලා. ජේසුස් වන මා නුඹගේ දුක වේදනාව බෙදා ගන්නට සිටින කළණ මිතුරා ලෙස අත්දැකීමෙන් ම අවබෝධ කර ගනිල්ලා."

## 43

## "ශුද්ධ වූ පියාණෙනි, මොවුන් ආශිර්වාද කළ මැනවි, අප දෙදෙනා පමණක් දන්නා වූ ඉදිරි මහා ගමන උදෙසා."

**2006 අප්‍රේල් හා මැයි පණිවුඩවලින් උපුටා ගත් වැකි කිපයකි, මේ.**

"සියල්ලන්ගේ බර කරට ගෙන සියල්ලන්ගේ පාප උදෙසා යාගික වන අයෙක් සිටිති. රහසින් වැඩසිටිමින් සියල්ලන් උදෙසා මිලයක් වන අයෙක් සිටිති. එතුමාණෝ නුඹලා අබියස දැන් ජීවමානව අසුන්ගෙන සිටිති. මුළු පොළොව මට එක දේශයකි. මා මැවූ මුළු මිනිස් සංහතිය ම මට එක ම ජනතාවකි. එය මාගේ උරුමය යි. ඔවුහු මාගේ දරුවෝ වෙති. ජාති භේද, ආගම් භේද, කුළ භේද ආදි කිසිවකින් මම ඔවුන් බෙදා වෙන් නො කළෙමි. ඒ සියල්ල මිනිසාගේ ක්‍රියාවන් පමණි. යමෙක් ඇතුලාන්ත මහා පිපාසයකින්, ඇතුලාන්ත මහා කුසගින්නකින් යුතුව මිනිස් සංහතියේ ගැළවීම උදෙසා සදාතනික දෙයක් මගෙන් ඉල්ලන්නේ ද දෙ වරක් නොසිතා එය දානය

කිරීමට මම සූදානම් ව සිටිමි. මට අවශ්‍ය වන්නේ මනුෂ්‍යයාගේ ඇතුලාන්තයේ ඇති ප්‍රියතාවය යි, අවංක භාවය යි."

"මාගේ දරුවෙනි, නුඹලාගේ දරුවන් වේදනා විඳීම නුඹලාට වේදනාවකි. එවැනි ම වේදනාවකි, මා සැම දා විඳින්නේ. එනිස යි, මා නුඹලා ව කැඳවන ගමන අඩාල කර ගනිමින් නුඹලා නොයෙක් තැන හිරවෙද්දි මා වේදනාවෙන් නුඹලා අමතන්නේ. නුඹලාට දැනෙන දරු සෙනෙහස මට ඒකාන්තයෙන් ම දැනෙනවා ඇත. නුඹලා ස්වල්ප කලකට යි, නුඹලාගේ දූ-දරුවන්ට පියෙක්, මවක් වන්නේ. මම සදාකාලයට ම සියල්ලන්ගේ පියාණෝ වෙමි: මෑණියෝ වෙමි: සහෝදරයා වෙමි: ප්‍රේමවන්ත මිතුරා වෙමි. මාගේ ශ්‍රාවක දරුවෙනි, නුඹලා යහපත දෙසට ම පියවර නොතබන විට මට ද මහා වේදනාවක් දැනේ. නුඹලා වෛද්‍යවරුන් සොයා ගොස් නුඹලාගේ වේදනා සුව කර ගන්නහුය. මට එසේ ද කළ නො හැකිය. සියල්ලන් උදෙසා පියාණන් වහන්සේ අබියස මම දැනුදු යාගික වෙමි. මාගේ දරු සෙනෙහස උතුරා ගලා යමින් ඇත. කිසිවකු එය හැඳින නොගැනීම මගේ වේදනාව දෙගුණ තෙගුණ කරයි. නුඹලාගේ දරුවන් වෙනුවෙන් නුඹලා වේදනා විඳින විට නුඹලා දන්නහුය, ඔවුන් උදෙසා නුඹලා විඳින වේදනාව ඔබේ දරුවන් ද දන්නා බව. ඒ සැනසීම වත් මට නොමැත, දරුවෙනි."

**2006 මැයි 29**

"මාගේ දරුවෙනි, වසර දහයක් මාගේ අනාවරණයන් ඔස්සේ මා නුඹලා ගෙන ආ ගමන දෙස ආපසු හැරී බලන්න. දැන් ගමන ගැඹුරු බව දකින්න. මෙය පටු මාවතේ ගැඹුරු අගාධ ඔස්සේ ගමනකි. නොතේරෙන බව වියවුල් බව ඒ මහා ගැඹුරෙහි ඇත. මෙය කැඳවීමේ ඇති ගැඹුර විවර වන මොහොතකි. මාගේ ශ්‍රාවක දරුවෙනි, නුඹලාගේ තැළුණු බිඳුණු සිත් තුළ මම වැඩසිටිමි. ස්වාමීන් වහන්සේ කෙරෙහි දැවැන්ත පිපාසයක්, කුසගින්නක් ඇතිකර ගන්න. සත්‍යය සැඟවිය නො හැකිය. ප්‍රේමය කිසි දා නාස්ති නො වේ. නුඹලා ප්‍රේමයෙන් යමක් සිදු කරන්නෙහු ද එය නැවත ප්‍රේමයෙන් ම නුඹලා පසුපස එනවා නිසැක ය. දරුවෙනි, ස්වාමීන් වහන්සේගේ ආයිත්තම්වලින් සැරසෙන්න, ජීවිත දෝරගලා යන්නට නම්. මිථ්‍යාව සදාකාලික නො වේ. සත්‍යය සඟවන්නට නො හැකිය. සත්‍ය හෙළිවන්නේ ම ය. පියාණෙනි, මේ මාගේ උත්තරීතර සංඝය යි: මේ මාගේ ඉහළින් වඩින සංඝය යි. මාගේ සැනසීම යි, මේ. මාගේ විශ්වාසය යි, මාගේ බලාපොරොත්තුව යි, මාගේ ජයග්‍රහණය යි මේ. ප්‍රීතිවෙමි. ශුද්ධ වූ පියාණෙනි, මොවුන් ආශිර්වාද කළ මැනවි, අප දෙදෙනා පමණක් දන්නා වූ ඉදිරි මහා ගමන උදෙසා."

**2006 ජූලි 02**

"අහෝ ! ඇවිල දැවෙන ගිනි ජාලාව. දිය බිඳක් හෝ ඉසින්නට සූදානම් නොමැත, මා. ඒ මන්ද? ඇවිලෙන ගින්නට දමා බලනවා මා, මා තෝරාගත් මාගේ ලෝහයන්. ඇවිලෙන ගින්නට එය දමන කල්හි දැවී දැවී මුවහත් වෙමින් පන්නරය ලබනවා දැයි දැන ගැනීමට මේ කාලය තුළ මම සූදානම් ව සිටිමි. මාගේ ශ්‍රාවකයිනි, ඔබ එකිනෙකාගේ ජීවිත අත්දැකීම තුළ මා නිහඬ නැත. ඔබගේ ජීවිත අත්දැකීම තුළ වැළපෙමින් මාංශය ඉරා ගනිමින් හදවත තැවෙන දුක් සුසුම් මැද වුව ද බිය නො වන්න. නුඹලා කැඳවන ගමන සඳහා උන්වහන්සේ යුහුසුළු වෙමින් සිටිති. ගැළවීමේ මහා ගමන උදෙසා තෝරාගත් මාගේ ශ්‍රාවකයින් වන නුඹලා මගේ සැලැස්ම පසෙක ලා මා දුන් කැඳවීමෙන් ගිලිහී ගොස් පාපය මුළු ජීවිතය කර ගනිමින් වර්තමානය, අනාගතය පාපයට පුද දුන් විට මාගේ සෝ සුසුම් මැද මම යුහුසුළු වන්නෙමි. මාගේ ශ්‍රාවක දරුවෙනි, පරාජයේ මුදුනකට නො වෙයි, නුඹලා මේ යන්නේ. මනුෂ්‍ය සංහතියේ ගැළවීම උදෙසා උත්තරීතර වූ පරම පිවිතුරු ගමනකට යි, මා නුඹලා කැඳවා ඇත්තේ. පාපය අමිහිරි යි කියා කෑ ගසන ගමනකට යි, මා නුඹලා කැඳවා ඇත්තේ. මාගේ ප්‍රේමාන්විත දරුවෙනි, යන ගමන එසේ ම ගමන් කරන්න, ඔබ එකිනෙකාගේ ජීවිත අත්දැකීම තුළ."

ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳුන්ගේ අනාවරණයන් දීම දැනට අවසන් ව ඇත. සැබවින් ම ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් සිදු වූ ක්‍රියාකාරීත්වය නිම වූයේ ද මහා වියවුලකිනි: එමගින් අප සංඝයට නින්දාවේ වස්ත්‍රය ඇඟලා ගන්නට සලස්වමිනි. 2004 අප්‍රේල් 15 වන දින ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳාණෝ මෙ ලෙස මා ඇමතූහ. "මේ වසර මුල දී මා නුඹට පැවසුවා, ඉදිරි ගමන නුඹටත් නොවැටහෙන බව. මතක ද ඇන්තනි? එසේ නම් පුත්‍රය නොවැටහෙන දේ මා උගන්වන තෙක් වියවුල් නො වී සිටපන්. වියවුල ඇති කරන්නට පුරාතන සර්පයා හෙවත් අන්ධකාරයේ දූතයා මගෙන් අවසර ලබා ඇත." එනිසා 2004 වසරේ මුල සිට 2006 ජුනි 04 දක්වා සියලු කටයුතු කරන්නට මට සිදු වූයේ යම් අවිනිශ්චිත තත්ත්වයක් යටතේ ය. මට නොවැටහෙන දේ තේරුම් කර දෙන්නට ජේසු සමිඳුන් ක්‍රියා කළේ 2006 මැයි 29 සිට ජුනි 04 දක්වා කාලයේ දී ය. එසේ කළේ වචනවලින් නො ව සිදු වීම් ඔස්සේ ය. එහි ප්‍රතිපලයක් ලෙස අපි ඒ පරිසරයෙන් ද ඉවත්ව ජේසු සමිඳුන්ගේ මුලසුනට

එක්වීමු. එය එදා නික්මයාමේ ගමනේ දී වලාකුළ හා ගිනි ටැඹ නොපෙනී ගිය විට නැවත එය මතු වන තුරු කඳවුරු බැඳ ගැනීමක් වැනි ය. එම තීරණය ගන්නට අපට වඩාත් පහසු වූයේ 2006 මැයි 25 වන දින ජේසු සමිඳුන් ළාබාල දාසියගේ මුවින් මෙ ලෙස ප්‍රකාශ කර තිබීම ය. "සංඝයේ ඉදිරි සියලු එකතු හා යැදුම් පැවැත්විය යුත්තේ මාගේ මුලසුනේ ය." ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් වසර තුනහමාරක් පමණ කාලය තුළ සිදු වූ සියල්ල ගැන 2006 සැප්තැම්බර් මාසයේ ජේසු සමිඳාණෝ (ප්‍රථම දාසිය) උපයෝගි කර ගනිමින් අපට පැහැදිළි කළහ.

මෙම ප්‍රකාශනයේ 17 වන අංකය යටතේ මම මෙ ලෙස සටහන් කළෙමි. "දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර සිය දාසිය හා සිය ශ්‍රාවකයින් කෙරෙහි කලින් උදා කරමින් සිදු වූ පෙරහුරුවකි, මෙය." ළාබාල දාසිය උපයෝගි කර ගනිමින් සිදු වූ සියල්ල ද එම පෙරහුරුව ම බව අපට අවබෝධ වූයේ ප්‍රථම දාසිය මගින් ජේසු සමිඳුන් අපට සියල්ල පැහැදිලි කළ පසුව යි. එය නව යුගයක උදාව උදෙසා වන ශුද්ධ භාවයේ අති බිහිසුණු අදියර ජේසු සමිඳුන් විසින් පළමුවෙන් සංඝයට උදා කරමින් ඒ තත්ත්වය සංඝයට ඔරොත්තු දෙනවා දැයි බලන්නට කළ පරීක්ෂණයකි. ඒ සඳහා ළාබාල දාසිය මගින් ජේසු සමිඳුන් කතා කර ඇත; ලුසිෆර් ද කතා කර ඇත; ඇගේ මනසින් ද කතා කර ඇත. ලුසිෆර් කතා කර ඇත්තේ ආලෝකයේ දූතයකු ලෙස අපට හැඟෙන අයුරින් ය. සංඝය ලැබූ මෙම අත්දැකීම නිසා ඒ අති බිහිසුණු යුගයේ දී ජනතාව නොමඟ නොයන පිණිස ඔවුන් දැනුවත් කරන්නට උත්තරීතර සංඝයට දැන් හැකි බව ජේසු සමිඳාණෝ පවසති. මුළු මනුෂ්‍ය සංහතිය මුහුණදිය යුතු අති බිහිසුණු වසර තුනහමාරක් ගැන ශුද්ධ බයිබලයේ එළිදරව් පොත සඳහන් කරයි. අප පසුකළ ඒ පෙරහුරුව ද වසර තුනහමාරක්. එනිසා අප පසුකළ ඒ අත්දැකීම වෙනම පොතක් ලෙස සකසා නිසි මොහොතේ ජනතාව ඉදිරියේ තබන ලෙස ජේසු සමිඳාණෝ අපට පවසති. 2003 අප්‍රේල් 27 ළාබාල දාසියගේ මුවින් ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "ඇන්තනි, මෙම ප්‍රකාශනය නිම කරන්න. එවිට මම එයට මුද්‍රාව තබමි." 2006 ඔක්තෝබර් මාසයේ එය සිදු විය. මෙම ප්‍රකාශනය මුල සිට අග දක්වා සියල්ල ප්‍රථම දාසිය ජේසු සමිඳුන් විසින් වෙලාගෙන සිටින විට අපට කියවන්නට සිදු විය. ජේසු සමිඳාණෝ එතුමන්ගෙන් නො වූ සියල්ල, නපුරාගෙන් හෝ මනුෂ්‍ය මනසින් එක් වූ සියල්ල ඉවත් කරමින් මෙම ප්‍රකාශනය නිවැරදි කළහ.

## 44

## "ඔබ මරියාවන්ට ළං වන තරමට ඔබ ලුසිෆර්ගෙන් ඈත් වනු ඇත."

2006 ජුනි 30 සිකුරාදා මුලසුනේ සිදු වූ යැදුමේ දී ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය වන සුජීවා මගින් දේව ක්‍රියාකාරිත්වයක ලකුණු නැවත දිස් විය. ඉන්පසු අවස්ථා කීපයක් ජේසු සමිඳුන් සුජීවාට දර්ශනය වෙමින් ඇය හා සංවාදයක් සිදු විය. ජේසු සමිඳුන් ඇයට සටහන් කරන්නැ යි මීට පෙර පවසා තිබුණු එහෙත් ඇය අතින් සටහන් නොවූ සිද්ධීන් සටහන් කරන්නට මුල පුරන ලෙස ඇයට පවසා තිබිණ.

අප මුහුණ දුන් අවුල ජේසු සමිඳුන් විසින් නිරවුල් කළ 2006 සැප්තැම්බර් මාසයේ දිනක (සැප්තැම්බර් 7) මුලසුන (අප සිටින නිවස) පවිත්‍ර කිරීමේ කාර්යයෙහි අපි නියැලී සිටියෙමු. ජේසු සමිදාණෝ ප්‍රථම දාසිය තුළට පිවිසෙමින් අප හා එක්ව වැඩ කළහ. "කිසිවෙක් කිසිවෙකුගේ දාසයෝ නොවෙති. රෝගීන් හැර අන් සියලු දෙනා තමන්ගේ වැඩ තමන් විසින් කරගත යුතුයි. මම අදත් වැඩ කරන දෙවියෝ." එලෙස පැවසූහ. ජේසු සමිදාණෝ මුලසුනේ යැදුම් කුටියේ ශුද්ධ වූ බයිබලය දෝතින් ගෙන දෙනෙත් ඉහළට ඔසවා එකවර පිටුවක් පෙරලා ගෞරවයෙන් එහි තබමින් "මෙය ඉටු වී පූර්ණ වන තුරු මෙය මෙලෙස ම තැබිය යුතු යැ"යි පැවසූහ. එය එසෙකියෙල් 34 පරිච්ඡේදය මුල පිරෙන පිටුව යි.

2006 ඔක්තෝබර් මාසයේ මුල් දෙ සතිය "දරුවෙනි. ඕනෑ ම දෙයක් මගෙන් අසන්නැ" යි සුජීවා මගින් ජේසු සමිඳුන් අපට ඇරැයුම් කළ කාලයක් විය. එලෙස ජේසු සමිඳුන්ගෙන් විමසමින් අප අවබෝධ කරගත් කරුණු කිපයක් දැන් මම ඔබ හමුවේ තබමි. පළමුවෙන් ජේසු සමිඳුන්ගේ තිස් තුන් වසරක ජීවිතය ගැන අපි එතුමන්ගෙන් විමසුවෙමු.

“වයස අවුරුදු 12 වන තුරු මව හා සුරැකි පියා සමග මා නිවසේ ගතකළා. හැම මොහොතක්ම පලදායි ලෙස ගතකළා. සුරැකි පියා මේසයක් පුටුවක් සාදමින් සිටින විට මා දුටුවා නම් ඒ වැඩය නිම කරන්නට ලීවලින් සෑදූ ඇණ කීපයක් ඔහුට අවශ්‍යයි කියලා මා පසෙකට වී ඒවා සකස් කර ඔහු අත තැබුවා. පියා හෝ මව හෝ මට යමක් කියන තුරු මා බලා සිටියේ නෑ. වයස අවුරුදු 12-18 අතර කාලයේ දී මා නිවසේ ද සිටිමින් ජෙරුසලෙම් දේවස්ථානයේ ද කාලය ගතකළා. වයස අවුරුදු 18-20 අතර කාලයේ දී මා නිවසේ ද සිටිමින් ජෙරුසලෙමේ හුදෙකලාව කාලය ගතකළා. වයස අවුරුදු 20-24 අතර කාලයේ දී මා විශේෂයෙන් මගේ සුරැකි පියා සමගම සිටියා. මට අවුරුදු 24 සම්පූර්ණ වන විට සුරැකි පියාගේ මරණය සිදුවුණා. එවිට ඔහුගේ වයස අවුරුදු අනූ තුනයි. වයස අවුරුදු 25-27 දක්වා මා මගේ මව සමග වැඩියෙන් කාලය ගතකළා.”

“වයස අවුරුදු 28-30 අතර කාලයේ දී මා විටින් විට නිවසේ ද සිටිමින් ලොව පුරා සෑම රටකටම ගියා. දෙවි පියාණන්ගේ පුත්‍රයාණන් හැටියට මට ඒ බලය තිබුණා. ජෙත්සමෙනියේ දී මා සතුරන් අතට පත්වන මොහොතේ විගස එතැනින් පලාගොස් වෙනත් තැනක පෙනී සිටින්නට මට පුළුවන්කම  තිබුණා. එහෙත් ඒ විඳවීම මිනිස් සංහතියේ ගැළවීම උදෙසා පියාණන්ගේ සැලැස්ම බව දැන සිටි නිසා ඊට කැමැත්තෙන්ම මා යටහත් වුණා.”

“මැවුම්කරු තම මැවිල්ල සමග එකමුතු වීමක් හැටියටයි ලොව සෑම රටකටම ගියේ. එය කිසිවෙකුගේ ශ්‍රාවකයෙකු හැටියටවත් අධ්‍යනයක් සඳහාවත් කළ දෙයක් නොවේ. මේ දිවයිනට ද එදා මා පැමිණියා. එදත් මෙය දූපතක්. එකිනෙක රටවල දී ඒ රටේ බසින් මා කීප දෙනෙකු හෝ ඇමතුවා. විශේෂයෙන් මැවුම්කරුවාණන් ගැන ඔවුන් හා කතා කළා. මා පිරිසක් අමතන විට ඔවුන් අතරෙන් දෙවියන් කෙරෙහි පිපාසිත එක් කෙනෙක් දෙන්නෙක් හෝ විශේෂයෙන් ඉලක්ක කරගෙනයි කතා කළේ.” (මැවුම්කරුවාණන් කෙරෙහි වඩා පිපාසිත ජනතාවක් ජේසුට හමුවුණේ කොයි රටවල ද කියා අප විමසුවා.) ”ඉන්දියාව හා ඒ අවට රටවලයි. මා වැඩිම කාලයක් ගතකළේ ඒ රටවලයි.“ (ජේසු ඒ රටවලට පැමිණි බවට මූලාශ්‍ර ඉතිරි වී තිබෙනවා දැ යි අපි විමසුවා) “මූලාශ්‍ර ඉතිරි නොකරන්නට උත්සාහ කළා එහෙත් සමහර තැනක මූලාශ්‍ර ඉතිරි වී තිබෙනවා. මිනිසෙක්ව මා මිහිමත ගතකළ තිස් තුන් වසරක අවසන් වසර තුන ගැන ශුද්ධ ලියවිල්ලේ සටහන්ව තිබෙනවා.”

“මගේ සුරැකි පියා හා මව අතර වයස් පරතරය අවුරුදු විසි පහයි. මගේ ස්වර්ගාරෝහණයෙන් පසු වසර දෙකක් පමණ මගේ මව මිහිමත ජීවත් වුණා. ඉන්පසු ඇයව මිහිතලයෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබුවා. ඇය ජන්ම පාපයෙන් ද නිර්දෝෂ වනිතාවයි. දෙවිපියාණන්ගේ අති සුවිශේෂි මැවීමයි. එනිසා ඇයට මරණය හිමි නැහැ. ඇය ස්වර්ගයට ඔසවා ගනු ලැබුවා. එවිට ඇයගේ වයස අවුරුදු හැත්තෑ අටයි. එනිසා කිසිවෙකුට නොහැකියි මරියාවන් මෙන් වන්නට, මරියාවන්ගෙන් දශමයක් හෝ වන්නට උත්සාහ කරන්න. (ඉන්පසු අපි මරිය තුමිය ගැන තව දුරටත් විමසුවෙමු. මුල් සභාවේ ඇගේ ජීවිතාදර්ශයට තැනක් තිබිණි දැයි විමසුවෙමු. එසේ නම් අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ හා සන්දේශ පත්‍රවල ඒ ගැන සටහන් වී නැත්තේ ඇයි දැයි විමසුවෙමු. එහි දී ජේසු සමිඳුන් පැවසූ අදහස් මම මෙලෙස සටහන් කරමි.)

“එදා මුල් සභාවේ මරියාවන්ගේ ජීවිතාදර්ශයට තැනක් තිබුණා. එහෙත් අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත හෝ සංදේශ පත්‍රවල ඒ ගැන යමක් ලියවී නැති බව ඇත්ත. එය මගේ සියලු ශ්‍රාවකයින් අතින් පැහැර හැරුණු වගකීමක්. ඒ නිසා පළමු සුදු සබය දෙවන වරට ඇති වූ විට අදට වඩා මරියාවන්ගේ ජීවිතාදර්ශයට එහි තැනක් ලැබිය යුතුයි. කෙනෙකුගේ වචන දෙස නොව ඇතුළු සිත දෙසයි මා බලන්නේ. මොන විදියකින් හෝ මරියාවන්ට ළං වන්නට උත්සාහ කරන්න. ඔබ මරියාවන්ට ළං වන තරමට ඔබ ලුසිෆර්ගෙන් ඈත් වනු ඇත. මිනිස් බව ගත් දේව පුත්‍රයාණන් වන මා මරියාවන්ගේ කුසින් බිහිවුණු නිසා ඇය ඇත්තෙන්ම මවක්. එහෙත් ඇය සදහටම කන්‍යාවක්. ඇයට තව එක දරුවෙක් හෝ සිටියා නම් මම ඇයව ජුවාම්ට බාර දෙනවා ද?”

මෙල් ගිබ්සන්ගේ (The Passion of Christ) චිත්‍ර පටිය ගැන  අපි ජේසු සමිඳුන්ගේ අවධානය යොමු කරමින් සමහරු පවසනවා එහි ජේසුගේ දුක් විඳීම අතිශයෝක්තියෙන් ඉදිරිපත් කරනවා කියලා. එහෙත් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පාප් තුමා ඒ චිත්‍රපටිය නරඹලා පැවසුවේ ”මෙය මෙසේ සිදු විය“ කියලයි. ඒ චිත්‍රපටියේ දක්වන තරම් ජේසු දුක්  වින්දා ද යනුවෙන් අපි විමසුවා. එවිට ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය මගින් පැවසූ අදහස් මම මෙලෙස සටහන් කරමි.

“දරුවෙනි. ඊටත් වඩා මම දුක් වින්දා. කුරුසියේ මරණයට පෙර මගේ දුක් විඳීම එක ජාමයකට සීමා වුවක් නොවෙයි. සිකුරාදා දිනට පහන් වෙද්දියි ඔවුන් මා අත්අඩංගුවට ගත්තේ. මාව කුරුසියේ ඇණ ගැසුවේ ඊළඟ සිකුරාදායි. සතියක් පුරා මා වධකාගාරවල දුක් වින්දා. අන්නාස් හා කායපස් වෙතට හෙරෝද් හා පිලාත් වෙතට මා ගෙන ගියා. ඒ හැම වධකාගාරයකම මට මහත් සේ වේදනා දුන්නා. එයින් එක වධකාගාරයක පුටුවක සවි කළ ඇණ ලෑල්ලක හෝරා තුනක් මා වාඩි කර නින්දා අපහාස කළා. ඒ හෝරා තුන ඇතුලත හතර වරක් මා නැගිටුවා නැවත ඒ මත වාඩි වන්නට සැලැස්වුවා. එක අවස්ථාවක පඩි පෙළකින් මා ගෙන එන විට කකුල් දෙක ලණුවකින් බැඳ පඩි පෙළ මත මා ඇදගෙන ආවා. වධකාගාරයක දුක් විඳින කිසිවකුට කිව නොහැකියි ජේසු ඔවුන් විඳින ඒ දුක වින්දේ නැහැ කියලා.”

”මහා බ්‍රහස්පතින්දා මගේ මරණය ගැන ශ්‍රාවකයන්ට කියන්නට පෙර මා ඊට පෙර දිනෙක මගේ මෑණියන් හමු වී ඇයට එය පැවසුවා. කුරුසිය මගේ උරුමය බව මා ජීවිතය පුරා දැන සිටියා.” (අපි මෙසේ ඇසුවෙමු. සමහරු කියනවා ජේසු කුරුසියක් නොවෙයි කර තබාගෙන ආවෙ, එහි හරස්කඩ විතරයි කියලා) “ කල්වාරි ගමනේ දී ඔවුන් එහි අඩක් දුරට මා ලවා පළමුවෙන් හරස්කඩ ගෙන්වා ගත්තා. එය එහි තබා ආපසු ගොස් අනෙක් කොටස ද ගෙනෙන්නට ඔවුන් මට අණ කළා. එතැන දී ඔවුන් එය කුරුසියක් ලෙස සකස් කළා. ඇණයක තුඩ පිටතට මතුවෙන පරිද්දියි ඔවුන් එය සකස් කළේ. ඒ ඇණය කටුවට ඇනීමෙන් මගේ දකුණු උරහිසේ මහා තුවාලයක් ඇති වුණා. සතියක මහා දුක් ගාවිනාව තුළ මගේ මෑණියන් මට පළමු වරට හමු වූයේ මා කුරුසියක් ලෙස එය කර තබාගෙන කල්වාරිය නගින ගමනේදියි. උත්ථානයෙන් පසු මා පළමුවෙන් දර්ශනය වූයේ මගේ මවටයි.”

(අපි මෙසේ කීවෙමු. සිකුරාදා අළුයම ජේසුව අත්අඩංගුවට අරගෙන එදිනම දහවල් දොළහට කුරුසියේ ඇණ ගසන්නට පෙර අන්නාස් හා කායපස් ළඟට හෙරෝද් හා පිලාත් ළඟට ගෙන යන්නටවත් ඒ කාලය මදි බව අපි පිළිගන්නවා. ඒ නිසා ජේසු දැන් අපට පවසන දේ සත්‍යයක්. ඒ සත්‍යය සුවිශේෂ පොත් හතරෙන්ම බැහැර වී තිබෙන්නේ ඇයි?)

“දෙවි පියාණන්ට අවශ්‍ය වුණා ඒ සත්‍යය මුවාකර තබන්නට, දැහැමි යුගය ආසන්නයේ එය මතුකර ගනු සඳහා. පළමු සුදුසබය වඩා කැමති වුණා මහා සිකුරාදා, ආලේලූයියා සෙනසුරාදා හා පාස්කු ඉරිදා එකට ගෙන වසරේ එකම මංගල්ල්‍යය හැටියට පාස්කුව පවත්වන්නට. එනිසා එදා සභාවටත් එය මුවාකරන්නට අවශ්‍ය වුණා. ලුසිෆර්ටත් අවශ්‍යයි, මගේ කල්වාරි ජයග්‍රහණය හැම දා මුවාකර තබන්නට. එහෙත් සංඝයක් ලෙස නුඹලාට යන්නට සිදුවන ගමනේ මහා නින්දාව හා මහා විඳවීම මගිනුයි ලුසිෆර්ගේ ඒ මුවාකර තැබීම අවසන් වන්නේ. මගේ සතියක මහා දුක් ගාවිනාව සුවිශේෂ පොත් හතරේ සඳහන් නොවුවත් ඒ කාලේ ලියවුන එක පොතක එය සටහන්ව තිබෙනවා.”

(2006 ඔක්තෝබර් මාසයේ තවත් දිනක “දරුවෙනි, ඕනෑම දෙයක් මගෙන් අසන්නැ”යි ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් පැවසූ මොහොතක අපි මැවීම හා පරිනාමය ගැන විමසුවෙමු.) “මේ මුළු විශ්වයම මගේ පියාණන්ගෙන් හෙවත් පෞරාණිකයාණන් වහන්සේගෙන් නික්මුණේ. එනිසා විශ්වයේ වයස මෙපමණයි කියල කියන්නට නොහැකියි. “දෙවියන් වහන්සේ ආලෝකය වේවා! යි වදාළ සේක.” ඒ පියාණන්ගේ ළයෙහි වාසය කළ වචනයාණන් හෙවත් පුත්‍රයාණන් පියාණන්ගේ ළයෙන් නික්මීමයි. ඒ මොහොතේ වචනයාණන් හා ආත්මයාණන් එක්ව පාළුව හිස්ව තිබුණු මැවිල්ලට දින හයකින් මිනිසා ඇතුළු සියලු ජීවීන් ද මවමින් පිළිවෙලක් හා සුන්දරත්වයක් ලබා දුන්නා.” (පරිනාම වාදය ගැන ජේසු කතා කළා. එතැන උසස් පෙළ ඉගෙන ගන්නා සිසුන් දෙදෙනෙක් ද සිටියා. ඔවුන් දෙස බලමින්) “ඒවා පාඩම් කරලා විභාගවලට ලියලා ලකුණු ගන්න හොඳයි. එදා සුගති උද්‍යානයේ මා මැවූ මනුෂ්‍යයාම තමයි අදත් සිටින්නේ, සතුන් ද එලෙසමයි. විශ්වයේ තවත් ග්‍රහලෝක කොපමණ තිබුණත් සමහර ග්‍රහලෝකවල සත්ව හා ශාක ජීවීන් සිටියත් මිනිසා වැනි මැවීමක් විශ්වයේ තවත් කිසිම ග්‍රහලොවක නැහැ.”

“නුඹලා ජීවත් වන මේ දේශයයි එදා මා මැවූ සුගති උද්‍යානය, ආදම් හා ඒව සිටි සුගති උද්‍යානය. මුලින්ම මේ දේශයට 'ආදම් උයන' 'පාරාදීසය' යනුවෙන් හැඳින්වූ තැනැත්තා එසේ කළේ දේව අනාවරණයකින්.” (ඒ තැනැත්තා කවුදැයි අපි විමසුවා) “එය පොතපතින් දැන ගන්න. නුඹලාගේ ජාතික ගීතයේ උද්‍යානයක සෞන්දර්යය ද ඇතුලත්ව තිබීම ගැන මා සතුටු වෙනවා”. (අපි මෙසේ ඇසුවෙමු සුජීවාගේ විවාහයේ දී ජේසු පැවසුවා “දෙසැම්බර් 4 ඔවුන් විවාහ වුව ද ඔවුන් ශාරීරිකව එක් විය යුත්තේ දෙසැම්බර් 6 වන දිනය, එය මා සුගති උද්‍යානයේ පැනවූ තහනම වැනිය.” එසේ නම් සුගති උද්‍යානයේ පැනවූයේ එවැනි නියෝගයක් ද? එය කොපමණ කාලයක තහනමක් ද?) “එවැනි නියෝගයක් තමයි මා සුගති උද්‍යානයේ පැනවූයේ. නුඹලාගේ අද

කාලය අනුව හිතුවොත් හය මාසයක තහනමක්.” (එය හුඟාක් අමාරු පරීක්ෂණයක් නේද කියලා අපට කියවුණා.) “ඒත් එයින් විශාල කාලයක් ආදම් සහ ඒව ඒ අභියෝගයට සාර්ථකව මුහුණ දුන්නා. එවිටයි ලූසිෆර් ඔවුන් පරීක්ෂා කිරීමට මගෙන් අවසර ඉල්ලා සිටියේ. ලූසිෆර් මගෙන් අවසර ඉල්ලා සිටියොත් මම අවසර නොදී සිටින්නේ නැහැ. ලූසිෆර්ගේ ඒ පරීක්ෂාවේදී ඔවුන් අසමත් වුණා. ඔවුන් දේව නියෝගයට අකීකරු වුණා.”

('එළිදරව්' පොත ලූසිෆර් 666 වශයෙන් හඳුන්වන්නේ ඇයි කියලා අපි ජේසු සමිඳුන්ගෙන් විමසුවා. එවිට ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් පැවසූ අදහස් මෙලෙස මම ඔබ හමුවේ තබමි.) “මිනිස් සංහතිය දැඩි පරීක්ෂාවට ලක් කරන්නට ලූසිෆර්ට මගෙන් අවසර ලැබෙන වසර තුනහමාර එළඹෙන විට ඔහු දකිනවා, ලෝක ජනගහණය 666 කෝටියක් සිටින බව. ඔහු කියන්නට උත්සාහ කරන්නේ ඒ 666 කෝටියම ඔහුගේ බවයි.” (එයින් අපට හැඟුනේ මෙයයි. දෙවිඳුන් පවසනවා මම නුඹව මගේ අත්ලේ කොටා ගතිමි, නුඹ මගෙයි කියලා. යෙසායා දිවැසිවරයාගේ පොතේ ඒ අදහස සඳහන් වෙනවා. ලූසිෆර් කියන්නේ මම 666 කෝටියම මගේ නළලේ කොටා ගතිමි, නුඹලා සැම මගෙයි කියලයි.)

('දහම් නවෝදය' සංඝයේ ශ්‍රාවකයින් ගැන අප ජේසු සමිඳුන්ගෙන් විමසීමේ දී එතුමන් පැවසුවේ මෙයයි.) “ඇන්තනි, මා නුඹට කීවේ ධර්මිෂ්ඨයින් සියයක් එකතු කරන්න කියලයි. දැනට සහභාගි නොවන ශ්‍රාවකයින් ද නුඹලා සමග එක් වනු ඇත. නුඹලාගේ ගමන් මගේ දී දින හතේ පන්නරය ලැබූ අයගෙන් ද කීප දෙනෙක් මා විසින් ශ්‍රාවකයින් ලෙස තෝරා ගන්නවා. ඇන්තනි, නුඹේ දායකත්වයෙන් කිතු දන පුබුදුව තුළ ගොඩනැගුන දැහැමි ජීවිත තිබෙනවා. ඔවුන්ගෙන් ද කොටසක් නුඹ හා එක් වෙමින් යම් මොහොතක 'දහම් නවෝදය' ශ්‍රාවකයින් සියයක් වනු ඇත. එවිට අති බිහිසුණු අවස්ථාවක නුඹ සමග ශ්‍රාවකයින් ස්වල්පයක් හෝ සිටිනු ඇත.”

(මනුෂ්‍ය සංහතිය මරණයත් සමග මුහුණ දෙන අත්දැකීම ගැන අපි විමසුවෙමු. එවිට ජේසු සමිඳුන් පැවසූ අදහස් මම මෙලෙස ඔබ හමුවේ තබමි.) “මෙලොවින් සමු ගැනීමේදී ඒ විගසම දෙවිඳුන්ගේ තුරුළට පැමිණෙන්නේ ඉතාම කලාතුරකින් කෙනෙක් පමණයි. එවැන්නක් සිදුවීමට නම් ඔහු හෝ ඇය තම ජීවිත ඇතුළු කුටියේ දැනටම ස්වර්ග රාජ්‍යය ගොඩනගා ගෙන තිබිය යුතුයි. අවංකව මනස්ස්ථාපනය වන විට මම සමාව දෙන එක ඇත්ත. එහෙත් සියල්ලන් තම ජීවිත කාලය තුළ තමා අතින් සිදුවූ පාපිෂ්ඨකම් ගැන මෙලොවත් මිලයක් ගෙවන්න ඕනෑ, නිරාදොරටුවලත් මිලයක් ගෙවන්න ඕනෑ.” (ජේසු සමිඳුන් නිරා දොරටු යනුවෙන් හඳුන්වන්නේ පවිත්‍ර කිරීමේ ශුද්ධවූ ගිනි ජාලාවයි, හෙවත් ශුද්ධිකාග්නිස්ථානයයි.) “සමහරු කෙටි කලකට තවත් අය දිගු කලකට ශුද්ධවූ ගිනි ජාලාවේ පවිත්‍ර වීමට සිදු වෙනවා. ශුද්ධවූ ගිනි ජාලාව පසුකර කෙනෙක් ස්වර්ගයට පිවිසෙන මොහොතේ ඔහු හෝ ඇය ඇසුරු කළ ස්වර්ගයේ සිටින ආත්මයන්ට එය දැනගන්න සලස්වනවා. එවිට ඒ සියල්ලෝ ඒ ආත්මය ආදරයෙන් ස්වර්ගයට පිළිගන්නවා. එලෙස තම පුතා ස්වර්ගයට පැමිණි බව තම බිරිඳ ස්වර්ගයට පැමිණි බව ඊට අදාල ආත්ම දැනගන්නවා. එපමණයි, ඉන්පසු ස්වර්ගයේ දී ඒ ගැන කිසිසේත් අවධානය යොමු වන්නේ නැහැ.”

“විවිධ ආගම් තිබුණත් එහි විවිධ ඉගැන්වීම් තිබුණත් ලෝ වැසි සියලු දෙනා මරණයත් සමග තම මැවුම්කරුවාණන් වන මා ඉදිරියේ පෙනී සිටින්නට සිදු වෙනවා. මෙලොව අධික තෘෂ්ණාවෙන් ජීවත් වූ, අධික වෛරයෙන් දැවෙමින් ජීවත් වූ කොඩිවිණ කරමින් මනුෂ්‍යයාට විපත් පැමිණ වූ අය බොහෝ විට ස්වර්ගය බාර ගන්නේත් නැහැ, නිරා දොරටු බාර ගන්නේත් නැහැ. එනිසා ඒ ආත්ම කලකට මෙලොවට එවනවා, භූත ආත්ම ලෙස ප්‍රේත ආත්ම ලෙස. එදා ඔවුන් ඇසුරු කළ අය අතරම ඔවුන් ගැවසෙනවා. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ඒ මනුෂ්‍යයන්ට හිරිහැරයක්. ඔවුන් ඒ ආත්ම උදෙසා යාච්ඤා කරමින් දිව්‍ය පූජා ඔප්පු කරමින් පින් කුසල් රැස් කරමින් ඒ ආත්ම නිදහස් වීමට කටයුතු කරන විට ඒ ආත්ම ශුද්ධවූ ගිනි ජාලාවට කැඳවා ගන්නට මා ක්‍රියා කරනවා.”

(අද සිටින පුංචි දරුවන් මෙතරම් වියවුල්කාරී ලෙස හැසිරෙන්නේ ඇයි දැයි අප විමසූ විට) “පාපයෙන් දුෂ්ටකමින් පිරුණු ලෙයින් පෙඟුන මේ පොළෝතලය ඔවුන්ගේ පුංචි මනස්වලට ඔරොත්තු දෙන්නෙ නැහැ. එනිසා අපි ඉක්මනින් දැහැමි යුගය උදා කරමු.” (දැහැමි යුගයේ දරුවන් ගැන පවසමින්) “දැන් බිහිවන දැනට වසර කීපයකට පෙර සිට බිහිවන දරුවන් මා විසින් මවා ඇත්තේ දැහැමි යුගයේ දරුවන් ලෙසය. ඔවුන් තුළ විශේෂ දේව දීමනා මා විසින් තබා ඇත. මට ඇවැසි මොහොතේ ලොව පුරා විසිරී සිටින දැහැමි යුගයේ දරුවන් තුළ ඒවා ප්‍රකාශ වන්නට මා සලස්වන විට සියල්ලන් මවිත වනු ඇත.” (ජේසු සමිඳුන් ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමින් ඉහත සඳහන් කරුණු විස්තර කිරීමේ දී පැවසුවේ, “දරුවෙනි, අපි සරල වෙමු, සරල බසින්ම කතා කරමු.” කියලයි. එනිසයි මේ සියල්ල මා සරල බසින්ම ලිව්වේ.)

## 45

# "දරුවෙනි, අපි ප්‍රේමය මහිමයට පත් කරමු."

ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමින් සිදු වූ ජේසු සමිඳුන්ගේ ක්‍රියාකාරිත්වය ඔක්තෝබර් 29 වන දින කලකට නිමා කරමින් නැවත ඒ ක්‍රියාකාරිත්වය ඇරඹුනේ 2007 මාර්තු මාසයේ ය. එතැන් සිට මේ දක්වා ප්‍රථම දාසිය මගින් සිදු වන දේව ක්‍රියාකාරිත්වයේ දී ජේසු සමිඳුන් යමෙකු අමතන්නට මුල පුරන්නේ මේ අයුරිනි. "පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද වන මම ඔබ ආශිර්වාද කොට ආරක්ෂා කරමි, පොරොන්දු වෙමි." අවසන් කරන්නේ ඔහු හෝ ඇය හිස මත අත තබා මෙසේ පවසමිනි. "හිසේ සිට දෙපතුල් දක්වා ඇට මස් ලේ නහර කරා හැම ස්නායුවක් මාංශ පේශියක් කරා මා ගෙව්වා වූ මිලය මා වැගිරුවා වූ රුධිරය මම ඔබට දානය කරමි. විශ්වාසයෙන් යුතුව එය අයිති කර ගන්න, මා තුළ ජීවත් වන්න. මම ඔබ සුරකිමි සැම දා."

ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමින් සිදු වූ මෙම ක්‍රියාකාරිත්වය තුළ ජේසු සමිඳුන්ගේ හස්තය දුටු අය දේව මඟ පෙන්වීමක් පතා ඇය වෙත පැමිණියහ. එය 2007 සිට මේ දක්වා දිගට ම පැවති තත්ත්වයක් විය. ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් එකිනෙකා අමතන විට එයට සවන් දීමට අපි උත්සාහ නොකරමු. (එකිනෙකාගේ පෞද්ගලිකත්වයට ගරු කිරීමක් හැටියට) එවැනි මොහොතක වුව ද ජේසු සමිඳුන් ශබ්දනගා පොදු අදහසක් පවසන විට පමණක් ඒ පිළිබඳව අපගේ අවධානය යොමු කරමු. සංඝයේ ශ්‍රාවකයන් හැටියට එකිනෙකා පැමිණ ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීම් බලාපොරොත්තු වන අවස්ථා ඇත. සංඝයක් ලෙස අප අමතන විට පමණක් ඒ පණිවුඩ පටිගත කළෙමු. ඒ කරුණු ඔබ සමග බෙදා ගන්නට අදහස් කරමි.

2007 මාර්තු ක්‍රියාකාරිත්වය ඇරඹීමත් සමග සංඝයේ ශ්‍රාවකයින් දුම් වැටියෙන් හා මත්පැන්වලින් මුළුමනින් ඉවත් විය යුතු බව ප්‍රථම දාසිය මගින් ජේසු සමිඳාණෝ පැවසූහ. එයට ගරු කරමින් ඔවුන්ගේ නිවෙස්වල උත්සව පවා මත්පැන්වලින් තොරව සිදුකරන්නට ඔවුහු යොමු වූහ. දරුවන් ලෝ සම්මතය තුළ අධ්‍යාපන කටයුතු ආදිය සිදු විය යුතු නිසා සුජීවා හා ඇන්ටන් ප්‍රසන්න කතෝලික සභාවේ විවාහ සක්‍රමේන්තුව ලබා ගනිමින් කතෝලික සභාවේ විවාහ අධිකරණය මගින් අනුමැතිය ලබා ගන්නට ජේසු සමිඳාණෝ ප්‍රථම දාසිය මගින් යොමු කළහ.

"මා තෝරාගත් සංඝයේ ශ්‍රාවකයින් වන නුඹලා තිරිඟු මෙන් පොළමින් විසුරුවා දමන්නට නුඹලා යන ගමන කඩාකප්පල් කරන්නට ලුසිෆර් දැන් මගෙන් අවසර ලබා ඇත. එනිසා අවදිව සිටින්න. ලුසිෆර්ගේ පරීක්ෂා හා මගේ පරීක්ෂණවලට මුහුණ දෙමින් ඉදිරි ගමන යන්නට නුඹලාට සිදු වනු ඇත." (2007 මාර්තු 7)

ප්‍රථම දාසිය ජීවත් වන නිවෙස (මුලසුන) අවට සර්පයකු හැසිරෙන බව මාර්තු මුල සිට කීප දෙනෙකු විටින් විට දැක තිබුණත් ඌ පොළඟෙකු බව සමහරු හඳුනා ගෙන තිබුණත් ඌ දුටු විගසම මුවාවීමක් සිදු වූ නිසා ඒ ගැන කිසිවක් කළ නොහැකි විය. "දරුවෙනි, අපි ඌ කොටු කර ගනිමු." යනුවෙන් ජේසු සමිඳාණෝ ප්‍රථම දාසිය මගින් පැවසූහ. මාස තුනකට වඩා වැඩි කලක් පැවති වැසි රහිත තත්ත්වය නිමාවට පත්කරමින් 2007 මාර්තු 15 වන දින රැය පුරා මහා වැසි ලැබිණි. එනිසා අවට පහත් බිම් ජලයෙන් යට විය. පසු දින උදෑසන සම්පත්ට දැක ගන්නට ලැබුණේ ලොකු පොළඟෙකු මරා අවට ඉඩමක කම්බි වැටේ එල්ලා ඇති දසුනකි. "අපි ඌ කොටුකර ගත්තා" යනුවෙන් ඒ ක්‍රියාවට සම්බන්ධ වූ අය ප්‍රීතියෙන් පැවසූ බව ඔහු පැවසිය.

ඉන් පසු ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳාණෝ විටින් විට විවිධ කොටුකර ගැනීම් කරමින් "අපි කොටු කර ගනිමු" යන අදහස වසර දෙකකටත් වඩා ඉදිරියට ගෙන ගියහ. 2007 අප්‍රේල් 25 වන දින උදෑසන ගරු ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු පියතුමා ස්වර්ගස්ථ වීම පිළිබඳ පුවත අපට දැන ගන්නට ලැබිණි. එතුමා තේවත්තේ නේවාසිකව සිටිමින් සුවය හා අශුද්ධාත්ම පිළිබඳ දූත කාර්යයේ නියැලී සිටි ඒ සඳහා කොළඹ අගරදගුරු පදවිය විසින් පත් කරනු ලැබූ පූජාප්‍රසාදී තුමා ය. ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය සුජීවා මගින් සිදු වූ ක්‍රියාවලිය අධ්‍යයනය කර එය ජේසු සමිඳුන්ගේ ක්‍රියාවක් බව හඳුනාගෙන එය ඇයගේ පවුලේ අයට ප්‍රකාශ කළ පළමු පූජක පුත්‍රයා එතුමා නිසා සංඝයක් ලෙස එතුමාගේ අවමංගල කටයුතුවලට සහභාගි වන ලෙස ජේසු සමිඳාණෝ අපට පැවසූහ.

2007 අප්‍රේල් 27 සවස ගරු ගොඩ්ෆ්‍රි පියතුමාගේ භූමදාන කටයුතුවලට සහභාගි වී මුලසුනට පැමිණි විට ජේසු සමිඳාණෝ අප ඇමතූහ. "හෙට (අප්‍රේල් 28) ලෝක කුසලාන අවසන් මහා ක්‍රිකට් තරඟය (ශ්‍රී ලංකාව හා ඔස්ට්‍රේලියාව අතර) පැවැත්වෙන මොහොතේ L.T.T.E ගුවන්

යානා මගින් තෙල් ටැංකි හා ගෑස් ටැංකි කීපයකට පහර දීමක් සිදු වන නිසා එය වළක්වන්නට අපට කළ හැකි දෙයක් කරන්නැ"යි එතුමෝ පැවසූහ. "අපගේ අනන්‍යතාවය හෙළි කරමින් එය කරන්න දැ"යි අප විමසූ විට "දැනට අනන්‍යතාවය හෙළි නොකරන්නැ"යි පැවසූ නිසා ඒ සඳහා අපගෙන් කිසිවක් සිදු නොවීය.

මුලසුනේ රූපවාහිනී යන්ත්‍රයක් නොතිබුන බැවින් ක්‍රිකට් තරඟය නැරඹීම සඳහා සුජීවා හා පවුලේ සැම මුරුතානට ගියහ. කොලොන්නාවේ තෙල් ටැංකි සංකීර්ණයට හා මුතුරාජවෙල ෂෙල් ගෑස් සංකීර්ණයට එවැනි පහර දීමක් සිදු වූ බව ක්‍රිකට් තරඟය අතර මැද රූපවාහිනිය නිවේදනය කරන විට ඔවුහු ක්‍රිකට් තරඟය නැරඹීම නවත්වා සමාව අයදිමින් එක්ව යාච්ඤා කළහ. ජේසු සමිඳුන් පැවරූ කාර්යය ඉටු නොකිරීම ගැන දොස් පවරමින් මින් පසු පවසන දේ ඒ මොහොතේම ඉටු කළ යුතු බව ජේසු සමිඳාණෝ පැවසූහ. මැයි 02 ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "අප්‍රේල් 28 විනාශය මම අවම කළෙමි. බෝම්බ දෙකක් පිපිරෙන්නට ඉඩ නොදුන්නෙමි." එදිනම ජේසු සමිඳාණෝ රටේ ආරක්ෂක තත්ත්වය ගැන කරුණු කීපයක් ප්‍රකාශ කරමින් අපගේ අනන්‍යතාවය ද හෙළි කරමින් ඒ අදහස් ආරක්ෂක අංශය වෙත දන්වන ලෙස පැවසූහ. අපි මැයි 3 එම කාර්යය ඉටු කළෙමු.

සුජීවා දින කීපයක්ම අසාධ්‍ය රෝගී තත්ත්වය තුළ සිටියාය. දෙවි පියාණන් කැමති ඕනෑම මොහොතක ඇය කැඳවා ගන්නට හැකි නිසා ඉන්පසු වෙනත් අයෙකුගෙන් මෙලෙස කතා නොකරන බව පවසමින් නිශ්චලත්වය තුළ ආත්ම විමසීම දියුණු කර ගන්නා ලෙස ජේසු සමිඳාණෝ ශ්‍රාවකයන් අමතා පැවසූහ. (2007 මැයි 09)

2007 මැයි 11 සිකුරාදා අපගේ යැදුම තුළ ජේසු සමිඳාණෝ අප ඇමතූහ. "මා නුඹලා උපයෝගී කර ගනිමින් සිදු වන ඉදිරි ක්‍රියාකාරිත්වය අධික නින්දාවක් ඔස්සේ සිදු වන මහා ගැළවීමේ සැලැස්මකි." එසේ පවසමින් නින්දාවේ ගමනකට අප සූදානම් දැයි විමසමින් ඒ ගමන කොතෙක් කටුක වුව ද ඉදිරියට ම යන බවට ජේසු සමිඳාණෝ අපගෙන් පොරොන්දු ගත්හ: දේව නීතියට, සභා නීතියට, රාජ්‍ය නීතියට ගරු කරන ලෙස ද පැවසූහ.

"දෙවියන් වහන්සේ කිසිවිටක අපොහොසත් නොවෙති. එහෙත් මනුෂ්‍ය ශරීරයක් තුළට පැමිණ ක්‍රියාකරන වියවුලේ දෙවියන් වුව ද අසරණ වන අවස්ථා ඇත, ප්‍රේමය නිසා. එදා මනුෂ්‍යයෙක්ව මා කළ ක්‍රියාකාරිත්වයටත් වඩා අපහසු යි, අද මනුෂ්‍ය ශරීරයක් තුළට පැමිණ කරන මෙම ක්‍රියාකාරිත්වය. එදා මමයි ඒ පිළිබඳ ගැටළුවලට මුහුණ දුන්නේ. අද මෙම ක්‍රියාකාරිත්වය පිළිබඳ ගැටළුවලට මුහුණ දෙන්නට සිදු වන්නේ මැයටත්, නුඹලාටත්. ඒ නිසා මෙම ක්‍රියාකාරිත්වය නිම කරනු සඳහා නිශ්චලතාවය තුළ ආත්ම විමසීම දියුණු කර ගන්න." (2007 ජුනි 4)

"රටේ, සභාවේ ගරාවැටීම ගැන වේදනා විඳිමි, එදා මා ගතකළ පූජක දිවිය නොවෙයි, දැන් ඇත්තේ. පූජක අභිමානයන් වැඩි වෙමින් ඇත, ලෝගුව පවා අභිමානයක් වී ඇත. එනිසා යම් මොහොතක මා මැයව ගෙන යන්නට හැකි යි පූජකයින් වෙතට, රටේ පාලකයන් වෙතට. ඒ වෙනුවෙන් ක්‍රියා කර ජීවිතය පූජා කරන්නට සිදු වුණොත් එය භාග්‍යයක් ලෙස දකින්න. දරුවෙනි, ගාන්ධිගේ ජීවිතයෙන් ආභාෂය ලබන්න." (2007 ජුනි 09)

"කොළඹ නගරය විනාශ කිරීම සඳහා බෝම්බ සවිකර විශේෂයෙන් සකස් කර එවූ ලොරිය රටේ ආරක්ෂක අංශයට හසුකර ගන්නට මම සැළැස්වීමි. දුබල අවංක අය ලවා මම එය ඉටුකර ගතිමි." (2007 ජුනි 11) "සංඝයේ සියලු ශ්‍රාවකයින් යාච්ඤා ජීවිතය දියුණු කර ගන්න. මුළු සිත, ගත, ආත්මය එක්තැන් කර යාච්ඤා කරන්න. එවිට ශුද්ධාත්ම දීමනා ලැබෙනු ඇත."
(2007 ජුනි 12)

"මේ සංඝය සඳහා මා තෝරාගත් ශ්‍රාවකයින් ඇඹීම අගහිඟකම් හා පීඩනයන් තුළ යි සිදු විය යුත්තේ. ඒ නොසැළී නොවැටී සිටින්නට පුහුණු වනු පිණිස යි. ආවේගයෙන් ක්‍රියා කිරීම අවසන් වනු සඳහා මා සංඝයේ ශ්‍රාවකයින්ම යොදා ගන්නට පුළුවන. එය සිදු විය යුතුයි. ----- මාගේ රුධිර අභ්‍යාසය ගැඹුරු ලෙස සිත එක්තැන් කිරීම තුළ සිදු විය යුතුයි. ඒ මෙනෙහි කිරීම කැඩුණොත් නැවත මුල සිට ඇරඹිය යුතුයි. මා ගෙවූ ඒ අමිල මිලයට කිසිවකු අවමය වශයෙන් සහභාගි වෙනවාට මම කැමති නොවෙමි." (2007 ජුනි 19)

(අසල්වැසි නිවැසියන්ගේ ක්‍රියාකාරිත්වය නිසා මානසික වේදනාවට පත් පවුලක් අමතා) "ඔවුන් අශුද්ධ දෙයක් ඔබගේ ගෙවත්තට වීසි කළ විට එය ආසිරි පැන්වලින් පොඟවා ඔවුන්ගේ ගෙවත්තට නැවත දමන්න. (අතේ තවරා නොගනිමින්) එය ඔවුන්ගේ පැත්තට දමන විට එකට

එක කිරීමක් ලෙස එය නොකරන්න. එයින් අපට නොව ඔවුන්ට ද කිසිදු විපතක් නොවේවා ! යි පතන්න. මා වඩා කැමති එයට යි. දරුවෙනි, අපි එලෙස ප්‍රේමය මහිමයට පත් කරමු." (2007 ජුනි 20)

(රට ව්‍යසනයට පත් කළ තිස් වසරක යුද්ධය ගැන කතා කරමින්) "අපි එයට ජය නොදෙමු. අපි ඔවුන් කොටු කරමු, කොටු කර දෙමු. තුනෙන් දෙකේ පවිත්‍රකරණය වෛරයේ යුද්ධයක් තුළ නොවෙයි, ශුද්ධවූ යුද්ධය තුළයි සිදු විය යුත්තේ. එයයි, මගේ පියාණන්ගේ කැමැත්ත." (2007 ජුනි 20) "ඔවුන් දැන් රහසින් කරන ඔවුන්ගේ සියලු ත්‍රස්තවාදි ක්‍රියා මම ආරක්ෂක අංශ අතට හසුකර දෙමින් සිටිමි. නොපෙනෙන බලවේගයක් ඔවුන්ට උපකාරි වෙමින් සිටින බවට දැන් ඔවුන්ට අත්දැකිමක් ඇත. ඕනෑම මොහොතක මැය ගෙන යන්නට හැකියි. සභා ශ්‍රේෂ්ඨයින් වෙතට රටේ පාලකයන් වෙතට." (2007 ජුනි 27)

"මා තෝරාගත් ශ්‍රාවකයින් ගැන මම වේදනා විඳිමි. ශ්‍රාවකයින් එකිනෙකා කඩා බිඳ අලුතෙන් අඹමින් නිසි රුව මතුකර පියාණන්ගේ හස්තයේ තැබීම යි, දේව පුත්‍රයාගේ කැමැත්ත." (2007 ජුලි 7) "මා තෝරාගත් ශ්‍රාවකයින්ට ළංව සිටිමින් එසේ ළංව සිටින බව නොදැනෙන පරිදි ළංව සිටිමින් ඔවුන් දෙස බලා සිටිමි. මගේ උදහස ඔවුන් වෙත යොමු වන්නට ද හැකියි. මගේ පියාණන්ගේ ස්ථාවරය එලෙස ම යි. ප්‍රේමය නිසා මා මෙන් දෝලනය නොවේ. මෝසස්ට මගේ පියාණන්ගේ හෙවත් පෞරාණිකයාණන් වහන්සේගේ හඬ ප්‍රබලව ඇසිණි, එය බිහිසුණු යි. නුඹලාත් මේ ගමන එන්නේ පියාණන් වහන්සේ සමග නම් නුඹලා මොන වගේ අත්දැකීම්වලට මුහුණ දෙන්න තිබිණි ද?" (2007 ජුලි 21)

"පවුලක් එකමුතුව සමගියෙන් සමාදානයෙන් විනෝදයෙන් ගත කරනවා නම් එතැන සැනසිම වාසනාව උතුරනවා ඇත. ඒ සඳහා පුංචි පාපය පවා උදුරා ගලවා දමන්න. --- එකිනෙකාගේ දෙපා ළඟට ඇවිත් ආදරයෙන් මෙලෙස ආයාචනය කරන්නේ ඔබගේ මැවුම්කරුවාණන් වහන්සේ නේද කියල හිතල උන්වහන්සේ දෙස ප්‍රේමාන්විත බැල්මක් හෙලමින් ජිවිතය වෙනස් කර ගන්න. එලෙස මැවුම්කරුට සැනසීමක් දෙන්න. මම බලා සිටිමි.------ එදා ජෝබ්ගේ ඇටසැකිල්ල දක්වා විශ්වාසය පරික්ෂා කළාක් මෙන් සංඝයේ සියලු ශ්‍රාවකයින් ගැන එවැන්නක් තමයි මා දැන් කරමින් සිටින්නේ." (2007 අගෝස්තු 11)

"අග්‍ර දූත මිඛායෙල්ගේ කාර්යය ලුසිෆර් මැඩපැවැත්වීම පමණයි, ඔහු මරන්නට මගෙන් අවසර නැත. දෙවිඳුන් කිසිවෙකු මරන්නේ නැත, ප්‍රේම කරනවා පමණයි. ජන්ම පාපය ඇතුළු සියල්ල තුළින් මරණය සිදු වන්නට ඉඩ තබා ඇත." (2007 අගෝස්තු 15) (දහම් නවෝදය සංඝයේ සති දෙකකට වරක් පැවැත්වෙන එකතුව ගැන සඳහන් කරමින්) "ඔබ නොකියන දෙයක් ඔවුන්ට ඇසෙන්නට හැකිය. ඔවුන් නොකියන දෙයක් ඔබට ඇසෙන්නට හැකිය. එය ලුසිෆර්ගේ ක්‍රියාවකි. එනිසා අවදිව සිටින්න. ඔබට එසේ ඇසුණොත් ඒ ගැන විමසා බලා කතා කරන්න. එකතුව ඇරඹීමට පෙර ඔබගේ ද එහි පැමිණි සියල්ලන්ගේ ද දෙතොල් හා දෙසවන් ජේසුගේ ලෙයින් පොඟවන්නැ යි යාච්ඤා කරන්න. එකතුව පැවැත්වෙන දින සියලු ශ්‍රාවකයින් දිවා ආහාරයෙන් වළකින්න." (2007 සැප්තැම්බර් 16)

"මා විසින් තෝරාගත් සංඝය වන නුඹලා හැම දෙයක් තුළ ම දෙවි පියාණන්ගේ මොහොතට ඉඩ දෙන්න, දෙවි පියාණන්ට අවනත වන්න. සැඟවී නින්දාව විඳින්නට නොවෙයි, ඉදිරියට ගොස් එඩිතරව නින්දාව විඳින්න යි මා සංඝය කැඳවන්නේ. මා තෝරාගත් සංඝය වන නුඹලා විශ්වයිය ප්‍රේමය ප්‍රකාශ කරන්න. ඒ සඳහා හදවත පලාගෙන ඉදිරියට ම යන්න. ඒකයි, නුඹලා සමාජයට දෙන්න තිබෙන පිළිතුර. ඉදිරියට යා යුතු තැනදී ඉදිරියට ම යන්න." (2007 සැප්තැම්බර් 29)

"මේ ක්‍රියාවලිය තුළ වේවා, මා ළඟට එන විට තමා මැවුම්කරු ඉදිරියට යි යන්නේ කියලා කෙනෙකුට හැඟෙන්න ඕනැ, දෙවියන් ඉදිරියේ අවංක වෙන්න ඕනැ, අවංකව මනස්ස්ථාපනයක් ඇති වෙන්න ඕනැ. සියල්ල කියා ගන්න අපහසු වුණත් දෙවියන් ගැන ඇතුලාන්තයේ ගරුබියක් ඇති වුණොත් පෞද්ගලිකව හෝ කතා කර මා ඔහුට සහය වෙනවා. එසේ නොවී තම වැඩය කරගන්න පමණක් නම් මා වෙත එන්නේ එතැන අවුලක් තිබෙනවා. මැවුම්කරුට නොහැකියි යමෙකු අමතා මම ඔබට ශාප කරමියි කියන්නට, එනිසා මම කියන්නේ ආශිර්වාද කරමි කියලයි. එලෙස මා ඉඩ දෙනවා තමා වපුරා ගත් දෙයම කපා ගන්නට. දෙවියන් වහන්සේ සුවිශාලයි. එහෙත් මේ ක්‍රියාකාරිත්වය තුළ මා හුඟාක් මඩ-පුංචිකම්වලට ලක් වෙනවා." (2007 ඔක්තෝබර් 08)

(අද සමහර පූජක ජීවිතවල ඇති පිරිහීම ගැන කතා කරමින්) "දැහැමි පූජක දරුවන්ට ඔවුන් උදෙසා පූජාවක් වන්නට සිදු වනු ඇත." (දේශය මහත් පීඩනයට ලක් කරන යුද්ධය ගැන කතා කරමින්) "දරුවෙනි යුද්ධය අවසන් වීම උදෙසා යාච්ඤා කරන්න. දෙවි පියාණන් ඉදිරියේ ජනතාවගේ මොරගැසීම අධික වන තරමට පියාණන් ක්‍රියා කරනු ඇත. එය ස්වර්ගයේ සියල්ලන් එක්ව කරන මොරගැසීමක් බවට පත්කර ගන්න." (2007 ඔක්තෝබර් 20)

"අද කිතුනු නාමය දරණ සමහරු තම අනුගාමිකයන්ට උපදෙස් දෙති, ඔවුන්ගේ රෝග සඳහා වෛද්‍යවරුන් වෙතට නොයන ලෙස, විශ්වාසයෙන් හා යාච්ඤාවෙන් පමණක් රෝග සුවකර ගන්නා ලෙස. මා කිසිම දිනක කිසිවෙකුට එවැන්නක් පවසා නැත. එනිසා දැනට ම බොහෝ දෙනා ඖෂධ නොමැතිව මියගොස් ඇත. මෙය මහා පාපයකි. වෛද්‍යවරුන් ලොවට දානය කර ඇත්තේ මැවුම්කරුවාණන් වන මා විසින් බව වටහා ගන්න. එනිසා ඔබගේ රෝගවල දී විගස වෛද්‍යවරයා වෙත යොමු වන්න. වෛද්‍යවරයා තුළ දිව්‍ය වෛද්‍යවරයා මා ලෙස දකින්න. ඔබ ප්‍රතිකාර සඳහා වෛද්‍යවරයා වෙත ගිය විට ඔබගේ ඇතුලතින් මට මෙලෙස පවසන්න. දිව්‍ය වෛද්‍යවරයාණෙනි ඔබ මෙම වෛද්‍යවරයා තුළින් පෙනී සිටිමින් මා සුවපත් කළ මැනව."
(2007 ඔක්තෝබර් 22)

(ආගම නිසා භේදභින්න වූ පවුලක් අමතා) "පවුලක ස්වාමි පුරුෂයා හා භාර්යාව එකම ආගමක් ඇදහීම බොහෝ විට පවුලේ සමගිය සඳහා හේතු වේ. ඔහු තම ආගමේ දැඩි ලෙස එල්බ සිටී නම් ඔහුගේ ඒ හැසිරීම පවුලේ සමගියට බාධාවක් වේ නම් භාර්යාව ස්වාමි පුරුෂයාගේ ආගමට සම්බන්ධ වන්න. පවුලක් ලෙස එක්ව ඒ ආගමික කටයුතුවල නියැලෙන්න. ඇය කිතුනු දහම ඇදහූ තැනැත්තියක් නම් ඇයට හැකියි, ඇතුලාන්තයෙන් මා සමග සම්බන්ධතාවය දිගටම තබා ගන්නට. සියල්ලටම වඩා මට වැදගත් වන්නේ පවුලක සමගිය යි, දරුවන්ගේ සුබ සිද්ධිය යි. දෙදෙනා ආගම් දෙකක් අදහමින් පවුලක සමගිය රැකගත් අය ද සිටිති." (2007 නොවැම්බර් 15)

"දරුවෙනි, නුඹලාට වඩා දුක් විඳින අය මේ දේශයේ බොහෝ සිටිනවා. ඔවුන් රෑ වෙද්දී ගෙවල් පාලුවට දාලා කැලෑවට රිංගා ගන්නවා. රෝගී දරුවට කහින්නටවත් දෙමවුපියන්ගෙන් අවසර නැහැ." (එසේ පවසමින් ජේසු සමිඳුන් වැළපුණා.) "දේව සභාව (පියාණන්, පුත්‍රයාණන්, ශුද්ධාත්මයාණන්) තීරණය කරනවා මේ කුරිරු යුද්ධය ඉක්මනින් අවසන් කරන්නට. මනුෂ්‍යයා තම අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා ක්‍රියා කිරීම නිවැරදියි: ඒ සඳහා දෙවියන්ගේ ආශිර්වාදය තිබෙනවා. එහෙත් තම අයිතිවාසිකම් දිනා ගැනීමේදී කිසිවෙකු පමණට වඩා දුෂ්ට නොවිය යුතුයි. ඔහුගේ අති දුෂ්ට ක්‍රියා මාර්ග නිසා මේ දේශයේ අනෙක් ජන කොටස් පමණක් නොව ඔහු නියෝජනය කරන ජනතාව ද මහත් පීඩනයකට ලක්ව තිබෙනවා. අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා ගාන්ධිගේ අහිංසාවාදී අරගලයේ ආභාෂය ලැබුවා නම් පසුගිය වසර පනහක පමණ කාලය තුළ සිදුවූ කිසිදු ලේ වැගිරීමක් මේ දේශයේ සිදු නොවන්නට තිබුණා: අයිතිවාසිකම් ද දිනාගන්නට හැකියාව තිබුණා."

"මට ලෝවැසි සියල්ලෝ එකම ජාතියක් පමණයි. මා සියල්ලන්ට එක සේ ප්‍රේම කරනවා. මැවීමේ අයිතිකරු තම මැවීම දෙස අද බලා සිටින්නේ ඉමහත් වූ වේදනාවකින්. සියල්ලෝ එකමුතුව එකම පවුලක දරුවන් මෙන් එකිනෙකාට ප්‍රේම කිරීමයි, මගේ පැතුම. දැන් දැහැමි යුගයේ උදාව ආසන්න වෙමින් තිබෙනවා. දැහැමි යුගය උදා වූ විට සියළු මනුෂ්‍ය ගැටළු නිරාකරණය වනු ඇත. එනිසා ඔබට විඳින්නට සිදුවී ඇති සියලු අසාධාරණකම් දුක් පීඩා මිනිස් පවුලේ විමුක්තිය උදෙසා දෙවිඳුන් ඉදිරියේ පුදන්න. සියල්ලෝ මැවුම්කරුවාණන් වහන්සේගේ දරුවන් ලෙස එකම සහෝදරත්වයකින් එක් වන මොහොත ආසන්නයි." (2007 නොවැම්බර් 16 සිකුරාදා සවස 7.30 ට)

සංඝයේ දැනට සිටින ශ්‍රාවකයින් ද තවම මට අවැසි තැනට සැකසී නැහැ. ඉන්පසු දැනට ඉවත්ව සිටින සියල්ලන් ද එක් විය යුතුයි. ඊටත් පසුවයි අලුත් ශ්‍රාවකයින් එක්කර ගන්නේ. දැනට සංඝයට සහභාගී නොවන කිසිවෙකු ගැන අඳුරු සිතුවිල්ලක් හෝ තබා නොගන්න. තමාගේ අඩුපාඩුකම් ඇති බව දැක ඔවුන් ද අඩුපාඩුකම් ඇති අය යන පදනම මත ඔවුන් පිළිගන්න." (2007 නොවැම්බර් 21) "ඉදිරියේ දී නුඹලාගේ දූත මෙහෙය ප්‍රේමයේ දහම උදෙසා කැප වීමයි. කවුද මට දොස් පවරන්නේ නැත්තේ? ඒත් මම සියලු දෙනාටම ප්‍රේම කරනවා. සුවිශේෂ පොත් හා සංදේශ පත්‍ර සියල්ල කියවමින්, සීමා මායිම් කොන්දේසි සියල්ල බැහැර කොට කියවමින් මගේ ප්‍රේමය පිළිබඳ සියල්ල රැස්කර ගන්න. නුඹලාගේ ඉදිරි දූත මෙහෙයට ඒවා ප්‍රයෝජනවත් වනු ඇති. ---- සමහරු රූපවාහිනීය යක්ෂයාගේ පෙට්ටිය ලෙස හඳුන්වනවාට මා

එකඟ නැහැ. එහි ඔබ උසස් කරන බොහෝ වැඩසටහන් තිබෙනවා. ඔබ උසස් කරන අර්ථවත් දේ පමණක් තෝරාගන්න." (2007 නොවැම්බර් 22)

(2007 නොවැම්බර් 23 සිකුරාදා රාත්‍රි යැදුම සඳහා ශ්‍රාවකයින් කීප දෙනෙකු පැමිණ සිටියත් සියල්ලන් යාච්ඤා කරන්නට අපහසු තත්ත්වයක සිටින විට) "සූදානමක් ඇතිව ද යාච්ඤා කළේ? එහෙම නැතිව යාච්ඤා කළ යුතු නිසා මොනවා හරි කියමින් සිටියා ද? සූදානමක් ඇතිව යාච්ඤා කරන කෙනෙකුට වචන හිඟ වෙන්නේ නැහැ. හැම වචනයක්ම තමාගේ ගැඹුරු ඇතුලාන්තයෙන් එන්නට ඕනෑ. ඒ සඳහා අවශ්‍ය සූදානම මෙයයි. තමා මේ මොහොතෙ සිටින තත්ත්වය අවංකව දැකල එය අවංකව පිළිගන්න ඕනෑ. ඒ ගැන සැබෑ මනස්ස්ථාපනයක් ඇති වෙන්න ඕනෑ. ඒ සියල්ල වෙනස් කර ගන්න අවංක සූදානමක් ඇතිව එය දෙවියන් වහන්සේට භාර කළ යුතුයි. යාච්ඤාව සඳහා දෙවිඳුන් අබිමුවට එන විට අවංක මනස්ස්ථාපනයක් තිබිය යුතුයි. එවිට මම පෞද්ගලිකව උපකාරී වෙනවා. අවංක මනස්ස්ථාපනයක් නැති විට එලෙසම යන්න ඉඩ දෙනවා, ඒත් ගමනට සීමා තබනවා."

"තමාගේ වරද නොදැක අනෙක් අයගේ වැරදි දකින තත්ත්වය මගේ වණ කැළැල් පෑරීමකි. තමාගේ දුබලකමයි තමා දැකිය යුත්තේ. තමාගේ වරද මුළුමනින් දැක මා ඉදිරියේ පෙනී සිටින මොහොත පැමිණිය යුතුයි, අලුත උපන් දරුවන් මෙන්. නිරන්තරයෙන් තමා තමාව දකින තරමට පුංචිම පාපය පවා ජය ගන්න පුළුවන්." (2007 දෙසැම්බර් 12) "ඔබේ නිවසේ මගේ ප්‍රතිමාව හෝ කුරුසිය ඉදිරියේ ඇති පහන දිනපතා දල්වන්න. ඒ පහන තමාගේ ඇතුලත ද දැල්වෙන්නට අවශ්‍යයි. ඒ පහන් සිළුව විශ්වාසාලෝකය මෙන් දකින්න. එවිට අන්ධකාරයේ සිතුවිලි ජයගන්නට ඔබට හැකිය. නිවසේ සිටින සියල්ලන් ඒ ආලෝකය තුළ තබන්න, ඔබේ මනසින්. ඒ පහන නොදැල්වීම නපුරාට ඉඩ දීමකි." (2007 දෙසැම්බර් 19)

(පවුලක් අමතමින්) "දවසේ අග යාච්ඤා තුළ පවුලේ සියල්ලන් එක්ව දවස දෙස ආපසු හැරී බැලීමක් කරන්න. ගැඹුරින් මෙනෙහි කර පවුල තුළ එය බෙදා ගන්න. අද දවසේ අපි ජේසු සමග ද වැඩියෙන් ඉඳලා තියෙන්නේ ? නපුරාට යට වූ අවස්ථා තිබෙනවා ද? මගෙන් ඔබට මේ වරද, මේ අඩුපාඩුව සිදුවුණා, එනිසා මට සමා වන්න. එලෙස සියල්ල මෙනෙහි කර වරද පිළිගෙන එකිනෙකාගෙන් සමාව ඉල්ලන්න පුරුදු වන්න, දරුවන් පවා ඒ සඳහා යොමුකර ගන්න. එවිට ඔබ මා තුළ ලොකු සාමයක් සැනසීමක් ඇතිවයි නින්දට ඇතුළු වන්නේ, ලොකු ප්‍රබෝධයකිනුයි අලුයම අවදි වන්නේ." (2008 ජනවාරි 04) "දරුවෙනි, ශුද්ධවූ නින්දාවේ ගමනකටයි මා නුඹලා කැඳවන්නේ. නින්දාව ඉදිරියේ මුහුණ සඟවා නොගෙන එඩිතරව එයට මුහුණ දෙන විට මම ළඟම සිටිමින් නුඹලාට උදව් වෙන්නම්. කළකිරීමට යට නොවී නින්දාව විඳ දරා ගැනීමේ රජු මමයි. එමගින් සියල්ල ගළවා ගත් ක්‍රිස්තු රජාණෝ මමයි." (2008 ජනවාරි 06)

(ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය වන සුජීවා තම පුතා සඳහා බලාපොරොත්තු වූ පාසල නොලැබීම නිසා සිත් වේදනාවෙන් සිටින මොහොතේ) "ඒ ගැන ඇය මට දොස් කීවත් මම ඇයට දොස් කියන්නේ නැහැ. ඒ තමයි සාමාන්‍ය මවක්, එහෙත් මරියාවන් නම් එසේ නොවේ. මෙයින් මට අවශ්‍ය වුයේ නුඹලාට කරුණු දෙකක් වටහා දෙන්නටයි. මෙය දැහැමි යුගයේ දරුවන් පාසල් යන වසරයි. ඔවුන්ට බාධක අධිකයි. නුඹලා මගේ සිරකරු යුවලයි, මොවුන් මගේ සිරකරු සංඝයයි. එනිසා මා කියන දේ කරමින් සියල්ලට මුහුණ දිය යුතුයි." (2008 ජනවාරි 28)

## 46

## "ජේසුස් වන මා ඔබේ පිපාසය නිවන දිය උල්පත යි."

**2007 ඔක්තෝබර් 05**

"බාධක අවහිරතා මැදයි, මගේ මේ ගමන. හැම තත්පරයකම දෙවියන්ගේ ශුද්ධවූ බලවේගය හා යක්ෂයාගේ අශුද්ධ බලවේගය අතර ගැටුමක් ඇත. යක්ෂයාගේ බලය අඩුකර නැහැ. මෙය ශුද්ධ භාවයෙන් තව තවත් ශුද්ධ භාවයට එලෙස සුවිශුද්ධ භාවයට යන ගමනක්. පුංචි පිරිසක් මගේ සැලැස්මට හිරකර ගෙන තිබෙනවා. මෙය තේරුම් නොගන්න විශාල ලෝකයක් තිබෙනවා. එනිසා ඔබ සුළු පිරිස හා මා අතර දැඩි සුහදතාවයක් ගොඩනගාගත යුතුයි, නිරන්තරව මැවුම්කරුට අවනත භාවය අවශ්‍යයි. එලෙස පියවරෙන් පියවර යා යුතුයි. අනාවරණ තුළ ද යමක් සඟවා ඇත. මැණිකක් සොයා ගෙන එය ඔපමට්ටම් කරන්නාක් මෙන් මගේ අනාවරණ පිළිබඳව ද ක්‍රියා කරන්න. එවිටයි එහි වටිනාකම දැනෙන්නේ. නුඹලා ද මට මැණිකක්. මා එය ඔපමට්ටම් කරනවා. මා වචනයක් කියනවා එහෙත් යමක් සඟවාගෙන, එනිසා ප්‍රමාද වී

හෝ එහි වටිනාකම සොයා ගැනීමෙන් ජීවිත මැණිකක් සේ ඔපමට්ටම් වෙනවා. එලෙසයි නුඹලාගේ ජීවිත ගමන.”

“මා ජලඟට කියන වචනය වෙනස්. එනිසා මනසට ඔරොත්තු දෙන්නේ නැහැ. එතැනයි දෙවියන් වහන්සේගේ විශාලත්වය. මගේ වචන සඟවා තිබෙනවා, එය වෙහෙස වී සොයාගත යුතුයි. දිනෙන් දින ගමන වඩා අමාරුයි. විශ්වයේ පාපය අති දරුණු වෙලා. විඳවන මේ මනුෂ්‍යයා බලනවා ඔහු දිනෙන් දින ඝනාන්ධකාර වනාන්තරයක එහෙම නැත්නම් කාන්තාරයක අතරමං වෙලා වාගේ. එහෙත් කාන්තාරය තුළත් දිය උල්පතක් තිබෙනවා. ජේසුස් වන මම ඔබේ පිපාසය නිවන දිය උල්පතයි. වචනය හෙවත් වචනයාණන් අයිති කර ගන්න. එවිට ජීවන දිය උල්පත ඔබ සමගයි. එයින් මනුෂ්‍යයා ප්‍රබෝධවත් වෙනවා. එලෙසයි කාන්තාරය පසුකර යා යුත්තේ. එයයි නුඹලාගේ ඉදිරි ගමන.”

“ඔබ වටා ප්‍රශ්න ගැටළු රැසක් තිබෙන්න පුළුවන්. විශ්වාසයෙන් පොරොන්දුව මතම රැඳී සිටින්න. මා පියාණන් ඉදිරියේ මැදිහත් වෙනවා. මැණියන් මා ඉදිරියේ මැදිහත් වෙනවා. ශුද්ධවන්තයින් ද මා ඉදිරියේ මැදිහත් වෙනවා. නුඹලා ද මා ඉදිරියේ මැදිහත් වෙනවා. මා මෙතෙක් නුඹලා සූදානම් කරමින් ආවා. පොරොන්දු මතම රැඳී සිටින්න. දෙවි පියාණන්ගේ කැමැත්ත ඉටු වේවා යි යදින්න. දෙවියන් ඉදිරියේ දේව මැණියන් ඉදිරියේ කන්නලව් කරන්න. නුඹලාට වඩා මරියාවන්ගේ මොරගැසීම ගැඹුරුයි. මීසමේ මැදිහත්කරු ද සම්බන්ධ කර ගන්න. ඔවුන්ට නමස්කාර කරන්නට නොවෙයි, දෙවියන් ඉදිරියේ මැදිහත්කම් කරන්නට පමණයි.”

“මා ගෙවූ මිලයේ ගැඹුර ලෝකයට පෙන්වන්න යන්නේ මේ ඉහළින් වඩින සංඝයයි. මේ සංඝය තුළිනුයි මා එය ඉටුකර ගන්නේ. සියල්ලන් තව තවත් ඔප මට්ටම් කරමින් සූදානම් කරමි. මා ගෙවූ මිලයේ වටිනාකම ලෝකයට පෙන්වන්නට සිටින කණ්ඩායම නුඹලායි. සංඝයේ සියල්ලන් පුංචි දුබලකම පවා හදාගෙන මා දෙසට නෙත් යොමා ඔබ අප කැඳවූයේ මෙයට ද ? අප එයට සූදානම්, ඔබ සැම එසේ කියන්න. මා ගෙවූ මිලයේ ගැඹුර අද ලෝකය දකින්නේ නැහැ. මා උදා කළ ගැළවීම ලෝකය දැකලා ඒ ගැළවීමට සම්බන්ධ වන්නේ මේ සංඝය විඳවමින් යන ගමන නිසයි. නුඹලාට කොතෙක් වේදනා ලැබුණත් මේ ගමන යන්න. සුබැඳි බීජය තුළ ඇරඹීම්, අලුත් දෙයක් මම කරන්නෙමි. නුඹලාගේ කැඳවීම උදෙසා විශාල මිලයක් ගෙවන්නට නුඹලාට සිදු වනු ඇත. මගේ මහා ජයග්‍රහණය ඉදිරියට ගෙන යන්න සිදු වන්නේ නුඹලාටයි, දරුවෙනි. එය පූර්ණ වන්නට තව කාලයක් ගතවනු ඇත.”

**2007 දෙසැම්බර් 29**

“පුංචි දුර්වලකමට පවා සමාව දෙමින් එකිනෙකා ගැන සිත් තුළ කිසිවක් තබා නොගෙන හොඳ දේ පමණක් තබාගෙන ඉදිරි වසරට පා තබන්න. නුඹලා මෙතෙක් ලැබුවා වූ අත්දැකීම් හා නුඹලා ඉදිරියට ලබන්නා වූ අත්දැකීම් තුළින් මාර්ගය පාදා ගෙන ගමන් කළ යුතුයි. මේ පුංචි දරුවන්, ඔවුන් දැහැමි ලෝකයට අවශ්‍ය දරුවන්. එහෙත් යක්ෂයා මේ කාලයේ ඔවුන් තුළින් බොහෝ සේ ඉස්මතු වෙමින් සිටිනවා. එනිසා නුඹලා කැළඹෙන්නට එපා. ඔබ හැම කෙනෙක්ම ප්‍රඥාවන්ත විය යුතුයි, ඒ දරුවන් ප්‍රතික්ෂේප නොකළ යුතුයි. හිරු උදාවත් සමග නිවසේ පහන දල්වා ඒ පහන ඔබ හදවත තුළ ද දල්වා ගෙන දරුවන් ඒ ආලෝකය තුළ තබන්න, ඔබේ මනසින්. මගේ රුධිරයෙන් ඔවුන් පොහවන්න. මෙය නුඹලා තුළින් විය යුතු දෙයක්.”

“නව වසරේ දී තමා තමාව දැකිය යුතුයි, තමා තමා සමග සටන් කළ යුතුයි, තමාව දැකීම පිණිස. එලෙස සටන් කරමින් ඒ තුළ ජයග්‍රහණය ලැබීම අනෙක් අයගේ ගැළවීමයි. තමා තමා තුළින් සටන් කරමින් තමා තමාව නැති කර ගනිමින් තමාව දෙවියන් අතට භාර දීම, එය තමා නව වසරට මා දෙන උතුම් පණිවුඩය. ඔබ ඔබගේ අඩුපාඩුකම් දකිනවා වගේම ඔබගෙන් සිදු වුණු හොඳ ක්‍රියාවන් ද ඔබ දැකිය යුතුය. එකිනෙකා තුළ පෙනෙන්නා වූ හොඳ දේ අයිති කරගෙන ඔවුන්ගේ අඩුපාඩුකම් වළලා දැමිය යුතුයි. දරුවෙනි, මෙය තමා මනස්ස්ථාපනය වෙමින් සමාව ලබා ගනිමින් නව මිනිසත් භාවය කරා යන ජීවිතයක ආරම්භය. ඔබගේ දෙඇස්, දෙසවන, ඔබගේ මුඛය, ඔබගේ දෙඅත් දෙපා, ඔබගේ සිරුර, ඔබගේ මනස මේ හැම දෙයක්ම යහපතට යොමු කරන්න. එවිට සියල්ල ආශිර්වාද ලබනු ඇති. ඔබ ගන්නා තීරණ ඔබ කරන ක්‍රියාවන් මේ හැම දෙයක් තුළම එකමුතු වෙමින් එක්සිත් වෙමින් සියලු දෙනා එක පවුලක දරුවන් සේ අත්වැල් බැඳගෙන නව වසරට මුහුණ දෙන්න. ඉදිරි කාලයේ ඔබ එකිනෙකාට නොයෙක් ආකාරයේ බාධකවලට මුහුණ දෙන්නට සිදු වනු ඇත. ඒ සියල්ල ජේසුස් යන නාමයේ අවිය දරාගෙන ජයග්‍රහණය ලබන්නට සූදානම් වන්න.”

**2007 දෙසැම්බර් 30**

"මේ දේශයේ ජීවත් වන නුඹලා උපයෝගි කර ගනිමින් මා මෙලෙස ක්‍රියා කරන්නේ මුළු විශ්වයිය ජනතාව උදෙසායි. මෙය විශ්වයිය ජනතාව උදෙසා නුඹලා කරන පූජාවකි. එය මා අනුභව කර වැඩෙන්නැයි මා එදා කළ ආරාධනය හා සමානයි. ඔබ ද ඔබ නැති කරගෙන අනෙක් අය උදෙසා පූජා වන්නට සූදානම් වන්න. එහි දී අනෙකාගේ අඩුපාඩුකම් දුර්වලකම් දැකීම නොවෙයි, ඔබගෙන් සිදු විය යුත්තේ. ඔබගේ ජීවිත අනෙක් අය උදෙසා පිදෙන පවිත්‍ර යාගයක් විය යුතුයි. මේ ගමනේ දී ප්‍රතික්ෂේප වීම් කඩා වැටීම් ආවත් මම යට නොවෙමි. මක්නිසාද මෙය ස්වාමින් වහන්සේගේ ජයග්‍රහණයේ මොහොතකි. ඉදිරි ගමනේ දී ඔබ එලෙසයි සිතිය යුත්තේ.

**2008 මාර්තු 08**

"මෙය අසම්මත වු දේව සභාවක්. සම්මතයේ සභාව හැරුණුකොට දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මය තව ආත්මයකට ඇතුල් වෙමින් තෝරා ගන්න ලද ශුද්ධවූ සංඝයක්. ඉහළින් වඩින සංඝයේ තත්ත්වයට ගොඩනැගෙන්න ඕනෑ, නුඹලා ජය ගන්නට ඕනෑ. නපුරා හැම විටම සටනේ යෙදිලා ඉන්නවා. සම්මත සභාවේ එඬේරෙක් ඉන්නවා, ඒ පාප්වරයා. ඒ සභාව එක්රැස් වුණාම එතැන තියෙනවා සභා විනයක්. එතැන කතා කරන දේ ගෞරවාන්විතව ඒ එඬේරා ඉදිරියේ ප්‍රකාශ කරනවා. ඔවුන්ට තිබෙන ගැටළු හැම දෙයක්ම ඔවුන් සාකච්ඡා කරනවා. මා තෝරා ඇති මේ සංඝයටත් එඬේරෙක් දීල තිබෙනවා, ශ්‍රාවකයෝ දීල තිබෙනවා. එතැන දී තමා දකින දේ තමා හිරකරගෙන ඉන්නවට වඩා එළියට දාන එක තමයි පවිත්‍රතාවය. තමා තුළ යම් අඳුරක් ගුලිකරගෙන ඉන්නව නම් ඒකට තමා ඒ මොහොත දීලා තිබෙන්නේ. ඒ කතා කිරීම තුළ රිදෙනව නම් කෙනෙකුට එතකොට සැනෙකින් ඒ කෙනා හිතන්න ඕනෑ, ඇයි මට රිදුනේ ඇයි මම කලබල වුණේ කියල."

"මාව මන්ත්‍රණ සභාවට ගෙන ගියා, කුරුසියේ ඇණ ගසන තුරු නොයෙක් ප්‍රශ්න මගෙන් විමසුවා. මම එඬේරා. පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීම පිණිස මම පැමිණියා. ඔවුන් කියන දේවල්වලට මම විරුද්ධ වුනෙත් නෑ, මා නිවැරදිකරු කියලා පුනපුනා කියන්න ගියෙත් නැහැ. ඒක පියාණන් වහන්සේ විසින් ඔප්පු කරල පෙන්වීම පමණයි, මගේ අරමුණ. පියාණන් වහන්සේ මාව යම් කැඳවීමකට එවලා තිබෙනවා නම් මට ගල්-මුල් නින්දා අපහාස අවමන් ලැබෙනවා. මේ ගමන එලෙසයි."

"සම්මත සභාව ඔවුන්ගේ ප්‍රශ්න ගැටළු ඒ ඉදිරියේ ප්‍රකාශ කළත් එඬේරා ඒක නැවත නැවත එකිනෙකා හා විමසන්නට යන්නේ නැහැ, ඒක භාර දෙනවා දෙවියන්ට. ඒකයි ඔබගේ කාර්යය. ඔවුන් උදෙසා පියාණෙනි, මෙන්න මා කැපකර ගන්නවා. එයයි ඔබගේ කාර්යය විය යුත්තේ. එදා මා ගමන ගියාක් මෙන් ඔබ යා යුතුයි, හැම ශ්‍රාවකයෙක් ගැනම මෙනෙහි කළ යුතුයි. මේ සංඝය එකතු වුණාම එතැන මමත් ඉන්නවා, යක්ෂයාත් ඉන්නවා, මනුෂ්‍යයාත් ඉන්නවා. එය ගොඩාක් අමාරුයි. එනිසා ප්‍රඥාවන්ත විය යුතුයි. සභාව එකතු වෙලා යම් ගැටළුවක් වුණා නම් එතැනින් විසිරිලා යන්නට ඕනෑ ඒක එතැනම නිදොස් කරගෙන, සාකච්ඡා කරල ගැටුම් මධ්‍යයේ හරි ඒකටයි ඒ මොහොත සලසා දීල තිබෙන්නෙ. එතැනින් පිට වන්නට ඕනෑ සුභද සිත්වලින්, පවිත්‍ර සිතුවිලිවලින්. ඉහළින් වඩින සංඝය වන්නට තව දුර යන්නට තිබෙනවා. ඉදිරියේ බාධක වැඩියි. මේ ගමන පවිත්‍ර විය යුතුයි. දරුවෙනි, ඉදිරි ගමන පහසු නැහැ. කුරුසියේ ගමන ජය ඝෝෂා මැද නොවෙයි, විඳවීම් මැදයි. නුඹලා දෙස මා බලා සිටිනවා."

"මේ කාලයේ ඔබ හැම කෙනෙක්ම අමාරු පීඩාකාරි මනසට ඔරොත්තු නොදෙන, මහපොළොවට ඔරොත්තු නොදෙන තැන්වල සිටිනවා. ඒ සියල්ල තුළත් නුඹලා දෙවියන් දකින ආකාරය දෙස මා බලා සිටිනවා. මෙය ශුද්ධවූ ගමනක්.---- කිතුනු සභාවේ එඬේරා කරන්නේ සියල්ල මහෝත්තමයාණන් ඉදිරියේ තබල මොරගහන එක පමණයි, හැම කෙනෙක්ම ප්‍රකාශ කරන්නා වු සියල්ල. එනිසා ඔබත් මේ හැම කෙනෙක්වම එකලෙස දකින්න. යම් අඩුපාඩුවක් නිසා යමක් කියවෙන්නට පුළුවන්, ශ්‍රාවකයින්ගෙන්. එය ඒ මොහොතේම විසඳා පවිත්‍ර කරගෙන ඊට පසුවත් ඔබට පිළිතුරු ආවේ නැත්නම් ඔබට තිබෙන්නේ දෙවියන්ට භාරදීම පමණයි. මේ ශුද්ධවූ ගමන තේරුම් ගත්තේ නැත්නම් මේ යන සුළු පිරිසටත් යන්නට බැරි වෙනවා. මෙය පහසු ගමනක් නොවෙයි. මේ ඔබ හැම කෙනෙකුවම දවල පුළුස්සලා පවිත්‍ර කරන ගමනක්."

"ප්‍රේමවන්ත මාගේ දරුවෙනි, ඔබ හැම මා ඉදිරියේ හිරකරුවන් පමණයි. පවුල ඉදිරියේ, සංඝය ඉදිරියේ, සියල්ලන් ඉදිරියේ ඔබ හැම කෙනෙක්ම හිරකරුවන් පමණයි. ඔබ හැම පැත්තකින්ම හිරවෙලා, ඒ හිරවීම තුළ නිදහස මුළු විශ්වයටම ගෙන එන්නට පූජා වන්නේ ඔබ ස්වල්ප දෙනයි, එනිසා මේ ශ්‍රාවක පිරිස පවිත්‍ර වෙන්නට ඕනෑ සිතුවිල්ලෙන්, ක්‍රියාවෙන්, දෙඇස්වලින්, මුවින්, දෑත් දෙපාවලින්, හැම දෙයකින්ම. තමා තමා දෙසම බලන්න. කවුද තමා

දෙස හරියටම බැලුවේ? කිසිම කෙනෙක් තවම ගැඹුරින් තමාව දැකල නැහැ, අනෙක් අයවයි දකින්නේ. ඒකයි මට තිබෙන වේදනාව. තමා තමාවයි දකින්න ඕනෑ, තමාගේ වැරදීමයි කතා කරන්න ඕනෑ. එවිට අනෙකා ඔහුගේ වැරදි දකිමින් ඒකෙන් නිදොස් වෙන්න බලනවා.”

“සංඝයේ ස්වල්ප දෙනා ද එකතු වෙන්නේ, එහෙත් එකතුව ගැඹුරු විය යුතුයි. ගැඹුරින් මා පිළිබඳව මනුෂ්‍යයා පිළිබඳව ලෝකය පිළිබඳව මෙනෙහි කරන්න. එකතුවේදි ප්‍රේමණීයව අදහස් ප්‍රකාශ කරන්න. එකතුව ආරම්භයේ දී යාච්ඤාව විය යුත්තේ මගේ දෙසවන් මගේ දෙතොල් ස්වාමින් වහන්සේගේ ලෙයින් පොඟවලා මේ මොහොතේ මට ශුද්ධවූ සභාව තුළ පෙනී සිටින්නට උදව් වන්න. හැම කෙනෙක්ම කුරුසියේ මා ගෙවූ අමිල මිලයෙන් පෙඟිල පවිත්‍ර වෙලා කතා කරන්න, ඇහුම්කන් දෙන්න, සභාව තුළ. ඔබ හැමටම මේ කාලය අමාරුයි, ඉදිරියේදී ඊටත් වඩා අමාරුම කාලය එනවා. මුදල් තිබෙන අයට හිතෙන්න පුළුවන් අපට මුදල් තිබෙන හින්දා සාගතයට මුහුණ දෙන්න වෙන්නෙ නැහැ කියලා. මුදල් තිබුණත් ආහාර නැති වෙන්න පුළුවන්. එනිසා සියලු දෙනා ජීවන ජලයට (ආසිරි පැන් මිශ්‍ර ජලයට) හුරු වන්න. ජල බඳුනට ආසිරි පැන් බිංදුවක් එක් කරන්න, මහා ගෞරවයෙන්. ඒ ආසිරි පැන් බිඳුව ජේසුගේ ලේ බිඳුවක් ලෙස දකින්න. ඔබට වඩාත් කුසගින්න දැනෙන මොහොතේ ආහාර වේල නොගෙන ජීවන ජලය පමණක් පානය කරන්න, විශ්වාසයෙන්. එය ජේසුගේ ජීවනදායක රුධිරය ලෙස දකින්න. ඉදිරියේ එනවා ආහාර ඉතාම හිඟ යුගයක්, එයට මුහුණ දෙන්නට වෙනවා, හැම කෙනෙකුටම. පුංචි දරුවට පවා මවගේ දෙතනේ කිරි නැති වන්නට පුළුවන්. එවිට තොල් මත ඒ ජීවන ජලය කිරට හරවල දෙන්නට පුළුවන්. ජීවන ජලය මහා ගෞරවයෙන් පානය කරන්න.”

**2008 අප්‍රේල් 14**

“යාගය නම් පූජාවයි. එය අන් අය උදෙසා තමාව නැති කර ගැනීමයි. විශ්වයම වෙනුවෙන් මා කුරුසිය මත දිවි පිදුවා. එසේ නම් ඔබ? කුරුසිය ඉතා ගැඹුරු අර්ථයක් ප්‍රකාශ කරනවා. කුරුසිය නම් ගැළවීමයි. විශේෂයෙන් මා තෝරාගත් සංඝය උදෙසා ශ්‍රාවක පිරිස කුරුසියේ ඇණ ගැහිල ද? ඒ නිසා තමාට වණකැළැල් ඇතිවෙලා තිබෙනවද? මුළු මිනිස් සංහතිය උදෙසා තමා කොයි ආකාරයට ද කුරුසියේ ඇණගැහිල තියෙන්නේ? දරුවන් උදෙසා දෙමාපියන් කුරුසියේ ඇණ ගැහිල නම්, දෙමාපියන් උදෙසා දරුවො කුරුසියේ ඇණගැහිල නම් එය මොන තරම් ආශිර්වාද ලත් පවුලක්ද? එලෙස කුරුසිපත් වීම නිසා මට කොතැනද වේදනා දැනෙන්නේ? ඇයි මට රිදෙන්නේ? කොතැන ද මගේ වණකැළැල් පෑරෙන්නේ? ඒ වේදනා මම කොයි ආකාරයට ද දරා ගන්නේ ?”

“මගේ දරුවෙනි, අති උතුම් වූ යාගයක් කුරුසිපත් වීම කියන්නේ. මා සියල්ලන් ගැළෙව්වා වූ සියල්ලන් උදෙසා මිලයක් ගෙව්වා වූ ඒ මොහොත සිහි කරන්න. කුරුසිය අනුව මම ජීවිතේ හැඩගහගෙන තිබෙනවාද? අද දවසේ මම කුරුසිපත් වුණාද? අද දවසේ මම කැළඹුනාද? කුරුසිපත් වීම තමයි මේ ශුද්ධවූ ගමනේ ඉහළින් වඩින සංඝයේ ජයග්‍රහණය. තමා දිනපතාම මෙනෙහි කළොත් කුරුසියේ ජයග්‍රහණය කවදාවත් පැටලෙන්නේ නැහැ, පාපය අතර නිතර රැඳෙන්නේ නැහැ, කැළඹුන ස්වභාවයක් නැහැ. බලන්න, එදා මම කැළඹුණේ නැහැ, කුරුසිපත් වූ මොහොතේ බොහෝම නිහඬව නිහතමානිව ඒ හැම දෙයක් තුළම පියාණන්ගේ සැලැස්ම ඉටුකළා. මා තෝරාගත් සංඝයේ ශ්‍රාවක පිරිසක් හැටියට නුඹලාට ඇණ වදින්නේ මනසටයි. එය සිතුවිලිවලට හුඟාක් අමාරුයි. ඒ වදින ඇණ බොහෝ විට මනසට ඔරොත්තු නොදෙන්න පුළුවන්.”

”ශ්‍රාවක දරුවෙනි, ඔබ හැම කෙනෙක්ම යන්නේ කොතැන ද ඔබගේ මුඛයට මහා කුරුසිය දමා ගන්න. මා කතා කරන වචනය ශුද්ධාත්මයාණන්ගෙන්ම වේවා! යක්ෂයාගෙන් නොවේවා! මගේ ආත්මාර්ථයෙන් නොවේවා! එවිට යක්ෂයාට බැහැ ඒ මුඛයෙන් ප්‍රයෝජන ගන්නට. එවිට ඔබ කතා කරන දේ පවිත්‍ර වෙනවා, අහන අයට මිහිරක් වෙනවා. හිමිදිරියේ ඔබ අවදි වුණොත් ඔබ හිතා-මතා නොවෙයි, ඔබ නොදැනුවත්ව අවදි වීමක් වුණොත් ඒ මොහොතෙ ඔබ නිහඬව අසුන් ගෙන ස්වාමින් වහන්සෙයි මාව අවදි කළේ, එසේ නම් එය ඔබ හා මා ගත කරන මොහොතක් වේවි. මහා ප්‍රශංසාවක් ලෝකයෙන්, මැවීමෙන් ආරම්භ කරන්න.”

“පියාණන් දැන් බලා සිටිනවා එතුමන්ගේ දැහැමි දහම ලොව පතල කරමින් නගා සිටුවන්නට. දැන් මට ඇත්තේ සියල්ල දෙස බලා සිටින්නට. පියාණන්ට අවශ්‍ය දේ ඉටු වෙනවා, දැන්. එනිසා ප්‍රේමවන්ත දරුවෙනි, නුඹලාට තිබෙන ආදරය නිසාමයි කියන්නේ, දැඩි තෘෂ්ණාවන්ට දැන් කිසිවෙක් යට වෙන්නට එපා. මා කුරුසිය මත ලෝකයට ප්‍රේම කළාක් මෙන් යහපතම දකින්න, යහපතම පතන්න. දැහැමි පරපුරක් උදෙසා ඔබ ද එතැනටයි එන්නට ඕනෑ. ඉදිරි කාල සීමාව පියාණන් වෙන්කරල තියෙන්නේ අධර්මය පහකර හරින්නට. නුඹලා තුළ ප්‍රේමය ඇති නිසා ඒ මරණ ගැන නුඹලාට වේදනාවක් දැනෙන්න පුළුවන්. ජීවිතයක් නැති වෙන්නේ ධනය,බලය,

ජනප්‍රියත්වයේම ඇලී-ගැලී සිටින නිසා නම් ඒ ගැන දුක් වන්නට එපා. ඔවුන්ට ස්වර්ගය ලබා දෙන්න කියලා ඔවුන් උදෙසාත් යදින්න."

## 47

## "මේ විඳවීමේ ප්‍රීතිය යි, ගැළවීමේ ප්‍රීතිය යි, නපුරා පරාජය කිරීමේ ප්‍රීතිය යි."

**2008 ජුනි 18**

"නොයෙක් ප්‍රශ්න කරදර බාධක තමන් අභිබවා යන තරමට පැමිණෙනවා. එය ජය ගන්න එකම ක්‍රමය විශ්වාසයයි. විශ්වාසයේ පලිහ දරාගෙන යාච්ඤාව නමැති කඩුවෙන් සැරසෙන්න, එයයි විසඳුම. යාච්ඤාව තුළ ගැඹුරෙන් මෙනෙහි කරන්න. ඒ මහා යාච්ඤාව තුළ ඔබට ලැබෙන පිළිතුරයි, නියම සත්‍යය. ශ්‍රාවක දරුවෙනි, මා නුඹලා අතර කරමින් සිටින කාර්යයේ ගැඹුර තවම කිසිවෙක් හරියට දැකල නැහැ. ඇත්තනි, මෙහි මහා ගැඹුරක් තිබෙනවා. මේක සැහැල්ලුවක් නොවෙයි, හිසට බරක්. නමුත් ඒක සැහැල්ලුවෙන් මම ඔබ අතර තබලා තියෙනවා. මහා බර වූ පර්වතයක් ඔබට බාරදීල තිබෙන්නෙ. මේ මහා පර්වතය ශ්‍රාවක පිරිස් එක්රැස් වෙලයි ඔසවන්නට ඕනේ. එවිටයි ඒකේ මහ සැහැල්ලු බවක් දැනෙන්නේ. සියලු දෙනාම මේ පර්වතයට අත තැබිය යුතුයි. නුඹලා අතර තබා තිබෙන පර්වතය කුමක් ද? ඒ මහා පර්වතය තමයි, ඉහළින් වඩින සංඝය කියන වචනය. ඔබේ සංඝය ඉදිරියටම ඔසවාගෙන යන්නට නම් මේ සංඝයේ එක්ව සිටින ශ්‍රාවක පිරිස සියල්ලන්ගේ සිතුවිල්ල පවා සම විය යුතුයි. එවිට ඔබ සැමටම පුළුවන් අර පර්වතය ඔසොවා ගෙන යන්නට. මම කියල තිබෙනවා සුළු පිරිසයි ඉතිරි වෙන්නෙ කියල. ඒ පිරිස විසින් මේ මහා පර්වතය ඔසවන්නට දෙඅත් දෙපා ශරීරය මනස ආත්මය ශක්තිමත් විය යුතුයි. එවිට ශුද්ධාත්මයාණන්ට හැකියි, බලගතු ලෙස නුඹලා අතර ක්‍රියාකරන්නට."

"එඬේරෙක් හැටියට ඇත්තනිට තිබෙනවා වගකීමක්. ස්වාමිනි සංඝය ඔබට බාරයි. මා ඔබ ඉදිරියේ දුර්වල වූ මනුෂ්‍යයෙක් පමණයි. ඒ නිසා ඔවුන් ගැන මම කිසිවක් හිතන්නේ නැහැ. මගේ වගකීම නම් ඔවුන්ව ඔබට බාරදීලා කන්නලව් කිරීමයි. ඔබ මට පැවරූ දූත මෙහෙය කුමක්ද, ඔබ විසින් මට පහදල දෙන්න. එවිට මම එය ඉටු කරන්නම්. ශ්‍රාවකයින් හැටියට ඔබට දී තිබෙන දූත මෙහෙවර කුමක්ද? ස්වාමිනි මම ශ්‍රාවකයෙක්, ඔබට මගෙන් විය යුතු සේවය කුමක්ද? ස්වාමිනි, මම දුර්වලයෙක්. එනිසා ඔබට බාරයි මගේ කැඳවීම. මේ කැඳවීම ඔස්සේ ජය ලබන්නට මට උදව් වන්න. හැම කෙනෙක්ම මේ සිතුවිල්ලට එන්න ඕනෑ."

**2008 ජුනි 30**

"සංඝයේ ඉදිරි එකතුවල දී ප්‍රේමාන්විතව ගෞරවාන්විතව විනීතව හැසිරෙන රටාව ගැන මා මීට පෙර ඔබට කියා දුන්නා. තමා නිවැරදියි කියල ඔබ කිසිම කෙනෙක් හිතන්න එපා. හැම කෙනෙක්ම තමා තමාව දකින්න උත්සාහ කරන්න. හැම එකතුවකදීම ඒ එකතුවෙන් ඔබ පිටවෙන්න ඕනෑ හැම දෙයක්ම ප්‍රේමාන්විතව විසඳගෙනයි. තමා තමාව දකිමින් සියල්ල හිස් වන විට සියල්ල යහපතට හැරෙනවා. මේ මොහොතේ යමක් සිදු වුණොත් මේ මොහොතේම එය විසඳා ගන්න. අපි අලුත් දෙයක් කරමින් සිටින්නේ. මා කතා කරන දේ තුළ පවා ඔබ වේදනාවට පත්වෙන්න පුළුවන්, මොනවද මේ ජේසු කියන්නේ කියලා. බොහෝ විට මෙය පරීක්ෂණයක් වන්න පුළුවන්. ඔබ ශක්තිමත් ද මා තුළ යන්න කියන පරීක්ෂණයයි, මෙතැන තිබෙන්නේ. මෙතැන මම කළකිරෙනවද? මා වේදනාවට පත් වෙනවද? මම මගේ ස්වාමින් වහන්සේ තුළ තර්ක කරනවද? විඳවීම් තුළ මාව එපා වන තැනට ඔබත් එයිද? ඇත්තෙන්ම එනවා. තමාට තමාව එපා වෙනවා, දෙවියන්ව එපා වෙනවා. මේ දෙවියෝ මොනවද මේ කියන්නෙ? මෙපමණ දුරක් ගෙනැවිත් දෙවියෝ දැන් අපට මොනවද කියන්නෙ? එවැනි තැනකට මා නුඹලා ගේන්න පුළුවන්, මෙය පරීක්ෂණයක් නිසා. දෙවියෝ මොහොතකට පෙර කියපු දේ නොවෙයි, මේ දැන් කියන්නේ. දරුවෙනි මෙය ජය ගන්නට ඕනෑ. ඔබ හැම කෙනෙක්ම කල්පනාකාරී වන්නට ඕනෑ. ඉහළින් වඩින සංඝය වන්නට නම් සංඝයේ හැම කෙනෙක් තුළම තිබෙන්න ඕනෑ මහා පෞරුෂයක්. දෙවියෝ විශාලයි. ඒ සුවිශාලත්වය තුළ නුඹලා තුළට මගේ වචන මගේ ක්‍රියාකාරකම් මගේ හැසිරීම් මේ හැම දෙයක්ම සම්පූර්ණයෙන් යන්නේ නැහැ."

**2008 අගෝස්තු 18**

"කරදර ලෙඩදුක් මේ හැම දෙයක්ම මා සමග යන අයට බහුලයි. මා සමග යන අයට සැනසීම නොලැබීම තමා එකම සැනසීම. ඒ තුළත් මහා ප්‍රීතියක් තිබෙනවා. ඒ විඳවීමේ ප්‍රීතියයි. ඒ විඳවීම මුල්කරගෙන ගැළවීමේ ප්‍රීතියයි. කටුක භාවය ජය ගැනීම තුළ යක්ෂයා පරාජය කිරීමේ

ප්‍රීතියයි. එකමුතුකමේ ප්‍රීතිය, සමගිවීමේ ප්‍රීතිය, ඒ සමගි වීමට බාධා කරන සටන් කරන විරුද්ධකාරයා පරාජය කිරීමේ ප්‍රීතිය දැන් සංඝයේ සියල්ලන්ට ඒ දේ අදාලයි. කටුක භාවයේ ප්‍රීතිය, ඒ තුළ ද එකමුතුකමේ මහා ප්‍රීතිය ස්වාමින් වහන්සේ ගෙව්වා වූ මිලයේ ප්‍රීතියයි. මෙය තමා ලොකුම සැනසීම. එය නපුරා පරාජය කිරීමේ ප්‍රීතියයි. මේ කාලයේ මා ඉඩදීලා බලා සිටිනවා ධර්මයාණන් හා අධර්මයාණන් අතර සටන දෙස. ඒ සටන ඇත්තේ මනුෂ්‍යයා තුළයි, සිතුවිලි ක්‍රියාකාරකම් හරහා. මෙයයි, තේරුම් ගන්නට ඕනැ."

"ඔබ අවදිව සිටිමින් ධර්මයට ජය දෙන්න. දරුවෙනි, මෙය තමා විඳවීමේ මහා ප්‍රීතිය හා ගැළවීමේ මහා ප්‍රීතිය. ඔබ කොතෙක් මා තුළ ආවත් ඒ සිතුවිලි දෙමින් ඔබ තුළ මහා සටනක් තිබෙනවා. නපුරා සිතුවිලි දෙනවා, පරාජය භාර අරගෙන දැන් සියල්ලෙන් නිදහස් වෙලා මේ ලෝකයෙන් සමුගන්නට. නපුරා ඒ සිතුවිල්ල දෙනවා ශ්‍රාවකයන්ටත්. දැන් ඔලුව උස්සගෙන ඉන්න බැහැ, දැන් මුහුණ දෙන්න බැහැ. මේ ප්‍රශ්න එන්න එන්නම වැඩි වෙද්දි එයා මෙහෙම හිතනවා. මම දැන් තීරණයක් ගත්තා. ජේසු කතා කළත් වැඩක් නැහැ, යාච්ඤා කළත් පළක් නැහැ, මගේ තීරණය මේකයි කියන තැනට ශ්‍රාවකයින්වත් ගේනවා. මා යට වෙන්නේ නැහැ කියන තීරණය තුළ උන්න එවැනි චරිත පවා ඒ තැනට වට්ටනවා. ඒ සිතුවිල්ලත් සමග ඔවුන් මේ මුලසුනට එන්නට මා සලස්වනවා."

"කටුක මාවතේ අප යන මේ ගමන තුළ අපි විඳවීමේ ප්‍රීතියත් ගැළවීමේ ප්‍රීතියත් අත්දකින්නට ඕනැ. මොන ප්‍රශ්න ආවත් මගේ ස්වාමියාණෝ මා සමග සිටිනවා. ඒ නිසා මා සැලෙන්නෙ නැහැ. ඇයි බිය වන්නේ? ඇයි වැළපෙන්නේ? ස්වාමින් වහන්සේ මා සමග සිටින නිසා මා විනාශ කරන්න කිසිවෙකුට බැහැ. ඒ මහා විශ්වාසය තුළ සිටින්න. ඒ විශ්වාසය ජයග්‍රහණය කරාම ඔසවන්න ඕනැ. ගැටළුකාරී තත්ත්වයන් තුළ ඔබ පසුබසින තරමට තමයි ඔබ නපුරාට ඉඩ දෙන්නෙ. අපි ස්වාමින් වහන්සේ තුළම සිටිමු, ප්‍රේමය පලුදු කර නොගනිමු. සංඝයේ එඬේරා ඇතුළු සියලුම ශ්‍රාවකයින්ට මෙය අදාලයි. මම ශ්‍රාවකයින්ට එඬේරා දකින්න සලස්වනවා, එඬේරාට ශ්‍රාවකයින්ව දකින්න සලස්වනවා, ශ්‍රාවකයින්ට ශ්‍රාවකයින් දකින්න සලස්වනවා. මා මේ කාලයේ කරන්නෙ ඒකයි. යම් කෙනෙක් මා පූර්ණයි කීවොතින් අති භයානකයි, විශේෂයෙන් මේ කාලයේ පීඩාකාරී තත්ත්වය තුළ හැම ශ්‍රාවකයෙක්වම මා අඹමින් සිටිනවා. අද දුෂ්ට බලවේග රහසින් ක්‍රියාත්මකයි. ඒ නිසා ඔබ බසයක දුම්රියක යද්දි ඔබ දෙපසින් සිටින දෙදෙනා මගේ ලෙයින් පොඟවන්න, ඔබේ මනසින්. එහි සිටින සියල්ලන් ද මගේ ලෙයින් පොඟවන්න."

**2008 ඔක්තෝබර් 12**

"විශ්වාසය මහා කුළුගෙඩියයි. නගුලට අත තබා ආපසු නොහැරෙන්න. විශ්වාසය යි ඔබේ දෙවියන්. තව තවත් ඒ සැබෑ දෙවියන් අයිති කර ගන්න. ඇයි දෝලනය වන්නේ? තවම මගේ පරීක්ෂණ කාලය යි, මා සුවිශාල යි, ඔබේ විශ්වාසය සෙලවෙන විශ්වාසයක් නොවිය යුතුයි, එය යකඩ කුළුණක් මෙන් ශක්තිමත් විය යුතුයි. ඇයි සැලෙන්නේ? මෙතෙක් ගෙනාවේ මා නොවේද? තමා දුර්වල වෙමින් අනෙක් අය දුර්වල කිරීම පමණයි දැනට මෙම ශ්‍රාවකයින් අතර සිදු වන්නේ. තව ඉදිරියට බොහෝ දේ තුළින් නුඹලා සැලෙන තැන් එනවා. ශ්‍රාවකයින් වන නුඹලා තමා ශක්තිමත් වෙමින් එකිනෙකා ශක්තිමත් කරනවාද කියා පියාණන් බලා සිටිනවා. මා නුඹලා ගෙන යන මේ ගමනේ මහා ගැඹුරක් විශාලත්වයක් තිබෙනවා."

**2008 දෙසැම්බර් 04**

"සංඝයේ ශ්‍රාවකයින් නිසි තැනට වර්ධනය වන තුරු පියාණෝ බලා සිටිනවා. අනෙක් අයව දකින්න නොවෙයි, තමා තමාව ගැඹුරින් දකින්නට අවශ්‍යයි. මෙය නින්දාවේ උදුන කරාම යන ගමනක්. එනිසා ගමන අපහසු බව ඇත්ත. මේ ගමන ආවට වඩා උන්න තැන හිටියා නම් හොඳයි කියල ඔබ කාටත් හැඟෙන්න අවස්ථා පැමිණේවි. ඒත් මේ ගමන වැරදී නැති බව, මෙය ඉතා නිවැරදි ගමනක් බව, නුඹලා කැඳවන මේ ගමන ආශිර්වාද ලත් ගමනක් බව හැම ශ්‍රාවකයෙක්ම දකින මොහොත, ඒ බව නුඹලා විසින් පිළිගන්න මොහොත පැමිණෙන තුරු පියාණෝ බලා සිටිනවා. හැම ශ්‍රාවකයෙක්ම එතැනට තමාව පුබුදු කර ගැනීම අවශ්‍යයි. පියාණන් වහන්සේ වෙනස්, එය උන්වහන්සේගේ ශුද්ධ භාවයයි. එනිසා දැන් කියන දේ පියාණන්ට හැකියි තව මොහොතකින් වෙනස් කරන්නට. පියාණන් පවසන දේ මා නුඹලාට ප්‍රකාශ කරනවා. පියාණන් එය මොහොතකින් වෙනස් කරනවා. මේ කාලයේ එය බහුලව සිදු වෙනවා. එනිසා මේ කාලේ පියාණන් ඉදිරියේ වැඩියෙන්ම පැගෙන්නේ මමයි. එය මට ගැටළුවක් නොවෙයි. එය පියාණන්ගේ අයිතියයි. එයට ගෞරව කිරීම අවනත වීම මගේ කාර්යය යි."

**2009 පෙබරවාරි 03**

"අවංක දෙ ඇස්වලින් අවංක දෙ අත්වලින් අවංක මුවින් මොරගසන්න දරුවෙනි, තමා ගැන නොවෙයි එක් කොටසක් ගැන නොවෙයි මුළු මිහිතලයේම සිටින ජනතාව උදෙසා. පියාණන්ට අවශ්‍ය තැනට ලෝකය එනවා, එය නියතයි. මහා විඳවීම් මැද වේදනාකාරි සිදුවීම් මැද ලෝකය නිවැරදි තැනට නැවත ගෙන ඒමේ ලකුණු පහළ වෙමින් තිබෙනවා. ඒත් වේදනාවයි, මුළු මිහිතලයම. දරුවෙනි, ඔබ සැම විඳවමින් සිටින බව මා දකිනවා. මේ ගමන ඔබ සැමටම බොහෝ අත්දැකීම් මැද එන්නට මම ඇරැයුම් කරනවා. මේ මහා අත්දැකීම් පෙරළිකාර අත්දැකීම් මැද එකිනෙකා ඔපමට්ටම් වෙලා වරෙල්ලා, දරුවෙනි. අපි නිහඬව බලා සිටිමු. ඔබ කොටසක් දෙස නොව මුළු මිහිතලයම වැළපෙන ආකාරය දෙස බලා සිටිමු. මා යම් පොරොන්දුවක් දී ඇද්ද, ඒ පොරොන්දුව යම් මොහොතක ඉටුවෙනවා ඇත. දරුවෙනි, හැම කෙනෙක්ම අවදි වව්, තමා තමාව පුබුදුවා ගනිව්. මා ප්‍රේමාන්විතව අයැද සිටිනවා ඔබ කරන කියන දේ පිරිසිඳු සිතින් කරන්න, එවිට යහපත් පල ලැබෙයි."

**2009 පෙබරවාරි 27**

"ඔබ ඔබ උදෙසා ස්වප්න නොදකින්න. ඔබ අන් අය උදෙසා ස්වප්න දකින්න. එවිට ඒ ස්වප්නය ජය ලබන්නේය. ඔබ ඔබවම කුරුසියේ ඇණ ගැසිය යුතුයි ඔබ ඔබවම විඳවීමට ලක් කළ යුතුයි. ඔබ විඳවන කල අන් අයගේ ස්වප්න දිනවන්නට උර දෙන්නේය. මගෙන් පිටවන වචනය ගැන මට ද මහා බරක් දැනේ. ඒ බර දැන් වැඩි වී ඇත."

**2009 පෙබරවාරි 28**

"මා වෙනුවෙන් පිරිසිදු පැයක් වෙන් කර ගන්නැයි මා ඔබ සැමගෙන් ඉල්ලා සිටිනවා. යාච්ඥාවේ පිරිසිදු පැයක් කියන්නේ කුමක්ද? පිරිසිදු පැයක් කියන්නේ පැය තුළ කරන යැදුම පමණක් නොවෙයි. ඒ පැයට පෙර තමා මුහුණ දුන් මිහිරි අමිහිරි සිද්ධි මේ හැම දෙයක් තුළින්ම හිස් වන්නට ඕනැ, ඒ පැයට මොහොතකට පෙර තමා කතා කළ දේ තමා කළ ගනුදෙනු මේ හැම දෙයකින්ම හිස් වෙන්නට ඕනැ. ඔබේ මනස හිස්, ස්වාමින් වහන්සේ හා සංවාදයටයි දැන් සූදානම. ඒ පිරිසිදු පැයේ තමාගේ මනස තමාගේ සිතුවිල්ල තමා මුළුමනින්ම ස්වාමින් වහන්සේ අබියස සිටින්නට ඕනැ. ඒ පැයෙන් පසුවත් අර දේම සාකච්ඡා කරනව නම් ඒ පැයේ පවිත්‍රතාවයක් තිබිල නැහැ. සියල්ල හිස් වෙන්නට ඕනැ, තව කෙනෙකුගේ වැරදි කතා කිරීම, මේ හැම දෙයක්ම. එවිට තමා මහා බලගතු පැයක් එතැන සිද්ධ වෙන්නේ. යාච්ඥාවේ පැය තුළ නොයෙක් සිතුවිලි එනවා නම් එතැන පිරිසිදු පැයක් වෙන්නේ නැහැ. එවිට ලුසිෆර් උදම් අනනවා, නුඹලාට ඒ පැය කරන්න දෙන්නේ නැහැ කියල. ඒ ගැන අවදි වෙලා ඒ තත්ත්වයෙන් අප මිදෙන්න ඕනැ. පුංචි දරුවන්ට බල කරන්නට එපා, ඔවුන්ට ඉඩ හරින්න. තමාගේ යාච්ඥාව තමා දෙවියන් හා කරන්න. පීඩාකාරී තත්ත්වයන් තුළ ඔබට යම් මොහොතක සිත එක්තැන් කරගත නොහැකි නම් ඒක ස්වාමින් වහන්සේ දකිනවා. ඒ මොහොත ජේසුනි කිවත් එය ඇති, ඒකත් මුළු හදවතින්ම වන්නට ඕනැ."

"රෝගී තත්ත්වය තුළ මහා විඳවීමක් මැයට (ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසියට) තිබෙනවා. දිනෙක ඇය පූජා වෙනවා සියල්ලන් උදෙසා, මේ ගමන උදෙසා. මේ නින්දාවත් සමග නින්දාව හා පූජා වීමත් සමගම මහා නින්දාව. තේරෙනවාද? තමා තමාගේ ස්වප්නය දැකීම නොව අන් අයගේ ස්වප්නය දකින්න. අන් අයගේ ස්වප්නය දිනවීම උදෙසා තමා කුරුසිය මත ඇණගැසෙන්න, තමාගේ මාංශය ඉරාගෙන. එවිට අනෙක් තැනැත්තා ජය ලබන විට ඒ මහා ජයග්‍රහණය තමා වටාත් ජය ලබන්නේය. ස්වාමිනි, මම කොතෙක් අසරණ වුණත් මම ලෙඩ වුණත් කමක් නැහැ මම මේක දරාගන්නම්, අර කෙනාට ඔබවහන්සේ අත තබන්න, ඒ කෙනාට ආශිර්වාද කරන්න, සුව කරන්න. එවිට ඒ දේ ඉටුවන විට තමන්ගේ දේත් තමන්ට ඉටුවෙලා ඉවරයි. තමා තමා ගැනම හිතමින් තමාගේ දේ ගැනම ලත වෙනව නම් මේ ගමන ජය ගන්නට අපහසුයි."

**2009 මැයි 20**

"මා විසින් සිදුකරන මේ මහා පවිත්‍රකරණය ශ්‍රාවකයන් ලෙස නුඹලා උසස් කරන්නට නේද, ඉහළින් වඩින සංඝය ලෙස කිප දෙනෙක් හෝ පළමුවෙන් නෙලා ගන්නට නේද? ශ්‍රාවක දරුවෙනි, එලෙස සිතන්න."

**2009 මැයි 28**

"තමා ඔසවා සිටින බර පොදියෙන් අඩක් දෙවියන්ට දිල අඩක් තමා අතේ තබා ගත්තොත් එතැන හිස් වීමක් නැහැ. අඩක් දෙවියන්ට දීලා අඩක් තමා අතේ තබා ගෙන දෙවියන් සමග වාද විවාද කරමින් සිටිනව නම් එතැන කිසිවක් සිදු වන්නේ නැහැ. දෙවියන් විශ්වාස කරගෙන තමාව මුළුමනින් දෙවියන්ට දිල මුළු බර දෙවියන් අතේ තබල දෙවියන් ළඟ පුංචිම

බැටළු පැටවකු වගේ සිටිනව නම් මම ඔහු හෝ ඇය වැළඳ ගන්නවා. එවිට මුළුමනින්ම සහනය ලැබෙනු ඇත.”

**2009 ජුනි 05 ශුද්ධාත්ම මංගල යැදුමේ දී**

“පියාණන් ද පුත්‍රයාණන් ද ශුද්ධාත්මයාණන් ද වන මම නුඹලා ආශිර්වාද කොට ආරක්ෂා කරමි, පොරොන්දු වෙමි. ඒ මාගේ පොරොන්දුවයි, මාගේ පොරොන්දුවයි, මාගේ ආශිර්වාද ලත් මහා පොරොන්දුවයි. අද බොහෝ කලකට පසු මා ඔබ සැම අමතන මොහොතයි. මම බොහෝ කාලයක් ඔබ සැම ඉදිරියේ ප්‍රකාශ වෙමින් බොහෝ කාලයක් මම නිහඬව සිටියා. ඔබ සැම ඒ සියල්ල තුළ තෙරපෙමින් ගැටෙමින් ඒ හැම ගැටළුවක් තුළම එයට මුහුණ දෙමින් පිළිතුරු සොයා ගනී යැයි මා බලා සිටියා.”

“ස්ථිර විශ්වාසය තුළ මා අනුව ගමන් කරන්න. මම නුඹලාට බොහෝ විට කියනවා සියල්ලෙන් හිස්ව ස්වාමින් වහන්සේට සියල්ල භාර කරන්න කියල. පූර්ණ හිස් භාවය නම් දරුවෙනි, ඔබ දැන් මේ මොහොතේ මේ තාක් ඔබ අතර තිබෙන හැම ගැටළුවක්ම හැම ප්‍රශ්නයක්ම හැම දෙයක්ම හැම සිදුවීමක්ම හැම අත්දැකීමක්ම මේ මොහොතේ සියල්ල මෙනෙහි කරමින් 'පියාණෙනි, මේ සියල්ල ඔබට භාරයි' කියල මේ රාත්‍රියේ මේ පැයේ දී ඔබ සියල්ල භාර දුන්නොත් ඔබට හිතන්නට කිසි දෙයක් නැති වෙන්නට ඕනෑ. මේ තමා නව ජීවිතයක් පටන් ගැනීමේ මූලාරම්භය. ස්වාමින් වහන්සේ ඔබගේ පියාණෝ, උන්වහන්සේ ඔබ දෙස බලා සිටිනවා. උන්වහන්සේ ප්‍රමාද කරන්න පුළුවන්, ඔබව පරීක්ෂණය කිරීම සඳහා. එහෙත් ඔබ එයින් සමත් වන්නේ මෙය මට විශ්වාසයි, ස්වාමින් වහන්සේ මේ සියල්ලෙන් මාව නිදහස් කරන බව. ඒ තිර විශ්වාසය තුළ රැඳෙන්න. --- මම සංඝයක් හැටියට ශ්‍රාවකයින් තෝරා පත් කළේ අනාදියේ පටන් පියාණන් විසින් ඔබලාගේ නාම ලේඛනය සටහන් කොට තිබෙන නිසයි. ඔබ මොන වරද කළත් මට බැහැ එය මකා දමන්නට. ඒක නුඹලා තෝරාගත් නුඹලාගේ පියාණන්ගේ සැලැස්මයි. එයින් ජය ගන්නට ඔබ හැම කෙනෙක්ම ස්ථිර විය යුතුයි, ඒ තුළ. අප එකිනෙකා මත නොවෙයි, අප නොදකින නමුත් අපට කතා කරන ස්වාමින් වහන්සේ තුළ අපි ගමන් කරමු. ඔබගේ ස්වාමින් වහන්සේ පාපිෂ්ඨයාට ළං වුනා, පව්කාරයාව කොන් කළේ නැහැ. අනෙක් අයගෙන් පමණක් නොව මා තුළින් ද වැරදි සිදු වෙනවා. අපි සැම සමාව දෙන දෙවියන්ගේ දරුවෝ. එසේ නම් අප ද සියල්ලන්ට සමාව දිය යුතුයි, ස්වාමින් වහන්සේ කියනවා මනුෂ්‍යයා පාපිෂ්ඨයි කියලා. එනිසා අප සියලු දෙනාටම ස්වාමින් වහන්සේගේ සමාව තිබෙනවා. එනිසා අපි ස්වාමින් වහන්සේගේ කැඳවීම තුළ උන්වහන්සේ පෙන්වන මඟ ඔස්සේ ගමන් කළ යුතු පිරිසක්.”

“මම අද දින යැදුමට තේමාවක් හැටියට දුන්නේ කුමක් ද? 'ගෘහ ශිල්පීන් ඉවත ලූ ගලම කොණේ ප්‍රධාන ගල වී ඇත. මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි. අපේ ඇස් හමුවෙහි එය විශ්මය ජනකය.' (මතෙව් 21:42, මාර්ක් 12:10,11) ඒ කියන්නේ ඔබව ස්වාමින් වහන්සේ ගෘහයේ මුල්ගල බවට පත් කරන්නට නම්, ඒ විශ්මය දනවන්නට නම් ප්‍රේමයෙන් සාමයෙන් පවිත්‍ර සිතුවිලිවලින් ඉවසීමෙන් පිරුණු අමුද්‍රව්‍ය විය යුතුයි. සියල්ල එක්කොට සාමය ප්‍රේමය සමගිය මේ සියල්ල එකම මිශ්‍රණයක් ලෙස එකම පදමට ඇවිත් ලෝහයක් බඳු මහා ශක්තිමත් ගලක් විය යුතුයි, කිසිවෙකුට කුඩු කරන්නට බැරි. මෙලෙස ඉහළින් වඩින සංඝය විය යුතුයි. --- මේ දේශයේ දිගු කලක් පැවති මහා ව්‍යවුල ගැන මා නුඹලාට කතා කළා. මා පැවසුවා අපි ඔහු කොටුකර ගනිමු, කොටුකර දෙමු කියලා. අසරණ ජනතාව විනාශ වෙමින් ඔවුන්ගේ දුක් වේදනා අධික වූ නිසා පියාණන්ගේ සැලැස්ම ඉක්මන් වුනා. දේශය පිළිබඳව පියාණන් දුන් වචනය එලෙසම ඉටු කළා.”

”දැන් මගේ පියාණන් මට පවසන දේ නුඹලාට කියන්නට මටත් අපහසුවක් දැනෙනවා, බොහෝ සිද්ධීන් නිසා. පියාණන් මට කියනවා මේ දේ ප්‍රකාශ කරන්න කියලා. මම ප්‍රකාශ කරනවා. ඉන්පසු උන්වහන්සේ එය වෙනස් කරනවා. පුත්‍රයාට තියෙන්නේ පියාණන්ට කීකරු වීම පමණයි. පියාණන්ට කීකරු වීම උපරිමයේ මා තුළ තිබෙනවා. ඔබ මෙලෙස කියූ නිසා දැන් එය ඉටු කරනන කියලා පියාණන්ට බල කරන්න මට බැහැ. නුඹලා ද මහා නින්දාවේ ගමනක, මම තවමත් නින්දාවේ කුමාරයා. එදත් පියාණන්ගේ සැලසුම් පියාණන් වෙනස් කළේ නැහැ. මම මනුෂ්‍ය පුත්‍රයෙක් ලෙස ඇවිත් ඒ සියල්ල දැනගත් කල බොහෝ තැන්වල මගෙත් තිබුණා පියාණෙනි, මෙය ඉවත් කරන්න පුළුවන් ද කියලා විමසන තැන්, මේ දුක් පාත්‍රය මගෙන් අහක් කළ හැකිද කියලා විමසන තැන්. එදත් මාගේ පියාණෝ කිසිවක් වෙනස් කළේ නැහැ. ඉතින් මේ සැළැස්මේදිත් පියාණන් එලෙසමයි කටයුතු කරන්නේ. පියාණන් එලෙස මේ දේශය රැක දුන්නා වගේම දේශයේ පවිත්‍ර කිරීමට තව බොහෝ දේ තිබෙනවා. ඒ පවිත්‍ර කිරීමත් බොහෝම ඉක්මනින්ම පියාණන් විසින් සිදුකරනවා. ඒනිසා කිසිවෙක් කිසිවෙකු ගැන කිසිවක් නොදැන නිරන්තරයෙන් ඒ ගැන කතා

කරන්නට එපා. හැම කෙනෙක්ම මනුෂ්‍යයන් මත නොවෙයි  දෙවි පියාණන් හා දේව පුත්‍රයාණන් සමග ගැවසෙන්නට බලන්න."

## 2009 ජූලි 19

"මා ඔබ සැමගෙන් ඉල්ලන්නේ හැම කෙනෙක්ම මට ඉඩ දෙමින් මට මෙලෙස පවසන්න. ජේසුනි, අපි ආසයි සියලු දුබලකම්වලින් මිදෙන්නට, අප පසුපස එන මේ මහා සටනින් ජය ගන්නට, මා වටා භ්‍රමනය වන මා ආක්‍රමණය කරන්නට වෙර දරන ඒ සියල්ලෙන් ජය ගන්නට. ජේසුනි, මට උදව් වන්න. මගේ සිතුවිලි, මගේ ක්‍රියාකාරකම්, මගේ හැසිරීම්, මා දකින මා අසන දේ, ඒ සියල්ලෙන් ගලවන්නට පුළුවන් ඔබට පමණයි. මා සූදානම් ජේසුනි, මාව ඔබට මුළුමනින් අයිති කර දෙන්නට. එවිට මහා ප්‍රේමය ඔබ තුළට පිවිසෙමින් ඒ ප්‍රේමයෙන් ඔබ පුරවමින් ආත්මාර්ථයට යට නොවන මහා බලයෙන් ඔබ සන්නද්ධ කරනු ඇත. ඒ මහා ප්‍රේමයයි ජය ගන්නේ.---- මේ සංඝය දේශයට හා ලෝකයට ප්‍රකාශ වීමේ කාලය දැන් එළඹෙමින් තිබෙනවා. මේ සියල්ල පහදා දීමේ කාලය දැන් ළං වෙමින් තිබෙනවා."

"මෙලෙස මගේ පැමිණීමේ මාගේ ප්‍රකාශ වීමේ මහා පලයක් තිබෙනවා. ඒ පලය ඔබ කිසිවෙක් දකින්නේ නැහැ තවමත්. ඒ මහ පලය මතුවීම උදෙසා බොහෝ විඳවීම් හා බොහෝ වේදනාකාරී අත්දැකීම් තුළ ශාරීරිකව මානසිකව ආත්මිකව මහත් සේ පෙරලෙමින් යා යුතු ගමනක් මෙය. ලෝකය ද මේ කිසිවක් නොදැන ඒ දේ තුළ පෙරලෙමින් යනවා. ලොව පුරා මට මොරගසන ජනතාව ඔවුන් නොදැනුවත්ව මෙයට හවුල් වෙනවා, මේ රැල්ලෙහි ඔවුනුත් යනවා. ගැළවීමේ මොහොතට ඒ සැම ළංවෙමින් තිබෙනවා. එනිසා දැන් නුඹලා මෙලෙස හිතන්න එපා. අපි දැන් රෝගී වෙලා, දෙවියන් අප දෙස බලන්නේ නැද්ද? සියල්ල නතර වෙලාද? දැන් ඔබ රෝගියි කියල දුක් වෙන්න එපා. ඉක්මනින් සියල්ල ආශිර්වාදය ලබයි. ඒ ආශිර්වාදය යාච්ඤාවේ ජයග්‍රහණයක් කරගන්න.------ ස්වාමින් වහන්සේ සියල්ලන් අඹනවා. ඔබ කවුරුන් හෝ වේවා පියාණන් විසින් අඹන්න ගත්තොත් ඒක නතර කරන්න කියලා අපට කන්නලව් කරන්න බැහැ. ඒ මහා පවිත්‍රකරණයට ඉඩ දීලා ඒ දෙස බලා සිටින්න. එවිට ඔබට දැනේවි ඇඹීමේ අවසානයේ දී කොයි තරම් ලස්සන විදිහට ඒ ඇඹීම සිදුවුණා ද කියල. මුල් කාලයේ මහා වේදනාවක් තමයි. ටිකින් ටික ඉඩ දී බලා සිටින්න, හැම කෙනෙකුටම එහෙමයි, අත්දැකීම තුළ. මෙය විඳවීමේ කාලයයි."

"අද දේශයම විඳවනවා. නුඹලා මෙලෙස හෝ සිටියත් අද බොහෝ දෙනා බොහෝ තැන්වල අනාථව අසරණව විඳවනවා. ඒ තැන්වලට ගොස් බලන්න. තමා එතන සිටින ලෙස සිතන්න. ඒ මානසිකත්වයට ඇතුළු වෙලා බලන්න. තමන්ගේ උන්හිටි තැන් නැති වෙලා තමාත් ඒ අත්දැකීමේ සිටිනව නම් ඔබ කොයි විදිහට ද එතැන ඉන්නේ? පියාණෙනි, ඔබ තබන තැන සිටිමින් ඔබ කියන දේ කරමින් මම ඉන්නම් කිවොත් යම් මොහොතක ඔබව මා එතැනට ගිහින් දැම්මොත් ඔබ මොනවද මට මේ කළේ කියල ඔබට අසන්නට බැහැ. පියාණෙනි, මේ ඔබගේ කැමැත්තයි, ඔබට ප්‍රශංසා වේවා! එලෙසයි ඔබ කිව යුත්තේ. ස්වාමිනි, අනෙක් අය උදෙසා ඒ දුක විඳින්නට ඔබ අපව ද ඒ අත්දැකීමට දමනවා නම් අපි සූදානම් ඔබගේ මහිමය උදෙසා. ඒ සිතුවිල්ල නිරන්තරයෙන් හැම කෙනෙක් තුළම පවිත්‍රව ක්‍රියා කරනව නම් නුඹලාට පියාණන්ගේ මහා ආශිර්වාදය ලැබේවි."

"ඔබ මගේ ශ්‍රාවකයෙක් නම් ඔබ හැම තැනදීම හැම දෙනාටම පැගෙන තැනට ඒ ඇඹීමේ දී එන්නට සිදු වෙනවා. ඔබ මුහුකුරා යන ශ්‍රාවකයින් හැටියට ඔබ සියල්ලන් ඉදිරියේ පැගෙන්නට ඕනෑ. ඔබ එඬේරා හැටියට පැගෙන්න ඕනෑ. මමත් පියාණන් ඉදිරියේ පැගෙනවා, හැම කෙනෙක් උදෙසාම හැම කෙනෙකුටම මා පැගෙනවා. දැන් සංඝයත් පැගෙන කාලයයි. මේක නින්දාවේ ගමනක් නම් ඔබ කිසිවෙකුට බැහැ, ඒකෙන් පලා යන්නට. මෙය පාපී නින්දාවක් නොවෙයි, ශුද්ධවූ නින්දාවක්. තමා එතැනට එන්නේ කැමැත්තෙන් නම් ඒ නින්දාව හරහායි එන්නට ඕනෑ. ප්‍රේමාන්විත වූ මාගේ දරුවෙනි, අද දින ඔබ සැම අමතමින් මා කියා සිටින්නේ ඔබ වටා කැරකෙන හැම ගැටළුවකටම පිළිතුර තිබෙනවා, පූර්ණ හිස් භාවය තුළ. දැන් මා නිහඬව සිට නුඹලාට ඉඩ හරිනවා එය විමසන්නට. නුඹලා මෙතැනින් මා ශක්තිමත් කරන්නේ මිනිසුන් මත නොවෙයි දෙවියන් මත පමණක් යන්නට. මාව තෝරාගනු ලැබුවේ දේව සභාවට. දෙවියන්ගේ ශ්‍රාවකයෙකු හැටියට කැඳවනු ලැබූ ආශිර්වාද ලත් මා ඒ මහා ආශිර්වාදය තුළ, ශක්තිය ධෛර්යය ඉල්ලමින් ලෝකය කොතෙක් මා කොන් කරල මාව පාගල දැම්මත්, ප්‍රශ්න කරදර මා පිට කොතෙක් පැමිණියත්, ස්වාමින් වහන්සේ තුළ හිස ඔසවනවයි කියල හැම කෙනෙක්ම ස්ථිර අධිෂ්ඨානය තුළ ගමන් කරනව නම් සියල්ල බොහෝම ඉක්මනින් විසඳේවි."

**2010 ජනවාරි 10**

"දරුවෙනි, ඔබගේ බැල්ම පවා ප්‍රේමණීය බැල්මක් විය යුතුයි. කලබල වූ ස්වභාවයෙන් විරසක වූ විලාශයෙන් කෙනෙක් දෙස බලන්න එපා. ප්‍රේමණීය හැඟීමෙන් ප්‍රේමණීය දෙනෙතින් ප්‍රේමයේ දෙඅත් දෙපාවලින් ප්‍රේමයේ ශරීරයක් විය යුතුමයි, ඔබේ ශරිරය. සියල්ල ප්‍රේමයෙන් කරන්න. එවිට මෙය දුගඳ හමන ශරීරයක් වෙන්නෙ නැහැ. එය මහා සුගන්ධයක් බඳුයි. කරන සේවාව ප්‍රේමයේ සේවාවක් විය යුතුයි. ප්‍රේමයට සීමා නැහැ. ප්‍රේමයේ ශරීරයක් වන විට එහි ජීවිත සිංහාසනය පුෂ්පයක් බඳුයි. ඔබගේ ශරීරය ප්‍රේමයෙන් පුෂ්පයක් ලෙස පවිත්‍ර කර ගන්න. පිටස්තර පවිත්‍ර භාවය තිබෙන්න ඕනැ. පිටස්තර පවිත්‍රභාවයට වඩා ඔබගේ ඇතුළාන්ත පවිත්‍ර භාවය මහා සුවඳක් විහිදුවනවා. ඔබේ ජීවිතය සුවඳ විලවුන් මෙන් තබා ගන්නට සූදානම් වන්න. ඔබගේ ජීවිත අරමුණ ප්‍රේම කිරීමයි. ඔබ මුහුණ දෙන හැම දෙයකදීම ප්‍රේම කිරීම තමයි ඉස්සරහට එන්නේ. මොන ප්‍රශ්න ගැටළු මා වෙත ආවත් ප්‍රේමය මාව හිරකරල තියෙන්නේ, එය මතක තබා ගන්න."

"මේ ප්‍රේමයේ බැම්මෙන් මම නුඹලාව හිර කරල තියෙන්නේ, ඒ නිසා කොයි දේටවත් බැහැ ප්‍රේමයෙන් ඔබව වෙන් කරන්න. මේ ගමනේ අමාරුවත් ඒකමයි. සැනෙකින් යමක් වෙනව, ඒක එතැනින්ම අමතක විය යුතුයි. එවිට ප්‍රේමය තමාව යටකරගෙන තමා තුළින් ඒ ප්‍රේමයම ඉස්මතු වෙනවා. ඔබගේ බැල්ම හැසිරීම ක්‍රියා කිරීම ප්‍රේමයෙන්ම සිදු වන්න ඕනැ. ප්‍රේමයෙන් ජයගත යුතුයි හැම විටම හැම කෙනෙක්ම. තමා තමාව ප්‍රේමයෙන් ජය ගත යුතුයි. මාව කොටුකරල තියෙන්නේ ප්‍රේමයෙන්, එනිසා ප්‍රේමයට කිසිම දෙයක් පටහැනි විය යුතු නැහැ. ප්‍රේමයෙන් ඔබ සැම බැඳ දමා ඇත. ප්‍රේමය නැමැති බැම්මෙන් කොටු කර ඇත. ඇයි මාව ප්‍රේමයේ බැම්මෙන් බැඳලා තිබෙන්නේ? මා අනෙක් අය උදෙසා දෙවියන්ට කැපවෙලා තිබෙන්නේ, ඒක තමා ගැඹුරුම වචනය. බොහෝ අමාරුකම් මැද බොහෝ සිරවීම් මැද බොහෝ නින්දා අපහාස මැද ප්‍රේමයෙන්ම යා යුතු ගමනක් මෙය."

## 48

## "හෝසානා කියමින් ජය ගොස නඟමින් අපි මේ මහා ගමන යමු."

**2010 මාර්තු 30**

"වතාරිකයේ දී නුඹලා සිහි කරන්නේ කුමක්ද? මිනිස් බව ගෙන මෙලොවට වැඩිය දෙවියන් තමා කිසිදු පාපයක් නොකර සියල්ලන්ගේ පාප තමන් කෙරෙහි ගෙන එහි මිලය වන්දිය ගෙවමින් සියල්ල දන්නා දෙවියෝ කිසිවක් නොදන්න කෙනෙකු මෙන් බොහෝ විට නිහඬව සිටිමින්, සියල්ල කළ හැකි දෙවියෝ කිසිවක් කළ නොහැක්කකු ලෙස බලය මුවා කරගෙන සියල්ලන්ට සියල්ල තේරුම් කරදීම පියාණන්ට භාර කරමින් ගෙවූ ජීවිතයයි. මේ ක්‍රියාකාරිත්වයේ දී ද මා නුඹලා අතර ක්‍රියා කළේ එලෙස නොවේද? සියල්ල දන්නා දෙවියෝ කිසිවක් දන්නේ නැහැ වාගෙ නිහඬව සිටීම, සියල්ල කළ හැකි දෙවියෝ කිසිවක් කළ නොහැක්කකු ලෙස සිටීම නොවේද සිදු වූයේ? එපමණක් නොව මා විටෙක නුඹලා අතර පෙනී සිටියේ  අඥානයකු ලෙස නොවේද? මා එලෙස ක්‍රියා කළේ ඇයි ඇන්තනි?" ("අප ද එලෙස ක්‍රියා කරනු සඳහා යැ"යි මම පැවසීමි.) "ඒ ගැන සංඝය දැනුවත් කිරීම මේ මොහොතේ ඔබගේ කාර්යය යි. සියල්ලන්ට ඉතා හොඳින් සවන් දෙන්න. ප්‍රේමය තුළ කිව යුතුම වචනයක් ඇත්නම් එය පවසන්න. ඊට වඩා වැඩි දෙයක් තේරුම් කර දීම දෙවිඳුන්ට බාර දෙන්න. අනවශ්‍ය ලෙස කිසිවෙකු සමග වාද විවාද ඇති කර නොගන්න."

**2010 අප්‍රේල් 14**

"මාගේ රාජ්‍යය යම් දිනෙක නුඹලා දකිනු ඇත. ඔබ සියලු දෙනාම ඉමහත් ගැඹුරු ඇතුලාන්ත යහපත් බවකින් නිහතමානි බවකින් සිත්වල මහා සිසිලසක් දැනෙනා සේ ඔබගේ මනස සිරුර ආත්මය සියල්ලෙන් හිස්ව පවතින කල්හී ඒ ජය ලබන්නට පුළුවන. කාලය මීට වඩා ඉදිරිය භයානකයි. එනිසා ඔබ කොතැන සිටියත් ඔබ දෙවියන් සමග යන දෙවියන්ට අයිති යැයි සිතිය යුක්තන් විය යුතුයි. දැන් නුඹලා ගැබ් අරගෙනයි ඉන්නේ, විළිරුජාව විඳින්නට තවත් කල්

තිබෙනවා. ඒ මහා ප්‍රසව වේදනාවේ දී ඔබට දැනෙයි ඔබ ගත් ගැබ කොයි තරම් බර තිබුණා ද කියලා. නුඹලාගේ ස්නායු හිසේ සිට දෙපතුළ දක්වා දැන් වේදනාවට පත්වෙලා. මේ ලෝකය තුළ දැන් සිදු වන සිද්ධීන් දෙස බලද්දී හැමෝම දැන් කාටද අඬ ගසන්නේ? ඔවුන් අඬ ගසන්නේ දෙවියන්ටයි. ගැබිගත් ස්ත්‍රිය දරුවව එළියට එවන තුරු දෙවියනි කියමින් මහා වේදනාවෙන් කෑගසනවා. එවැනි ප්‍රසව වේදනාවක් දැන් නුඹලා තුළ පමණක් නොවෙයි, මුළු ලෝක ජනතාව තුළම දැනෙමින් තිබෙනවා. උපරිම ප්‍රසව වේදනාව එන්නට ඒකෙ පලය ලබන්නට ඒ පලය ලොවට දෙන්නට තව දුරක් යන්නට ඔබ හැමට සිදු වෙනවා."

"නුඹලා අත්දකින මේ මහා ප්‍රසව වේදනාව ශුද්ධවූ ප්‍රසව වේදනාවක්. අති සුවිශුද්ධවූ බිහිකිරීමක්. ඒ බිහිකිරීම ඔබ සියල්ලන් අතින් සිදු විය යුතුයි. ඔබ ජීවත්වන මේ කාල පරාසය තුළ ඔබ තුළ තිබෙන දුක වේදනාව කලකිරීම සතුට සමගිය අසහනය දැන් මේ සියල්ල මිශ්‍රනයක් වෙලා. විටෙක ඔබ සතුටු වෙනවා, විටෙක ඔබ කල්පනා කරනවා, විටෙක ඔබ ආවේගශීලි වෙනවා, තවත් විටෙක තමාට යන්නට සිදු වී ඇති මේ ගමන ගැන දුක් වෙනවා. ඒත් මේ සියල්ල ඉවර වන මොහොතක් එනවා. දැහැමි ලෝකයේ උදාව, එය බිහිවීමේ මහා කාහල නාදය, ඒකයි ඔබ සැම එක්ව බිහිකරන්නට යන්නේ, ඒකයි උදා කරල දෙන්නට යන්නේ. දැහැමි යුගය බිහිකිරීම සඳහා නුඹලා මහා මිලයක් හෙවත් මහා වේදනාවක් විඳින්නට ඕනැ. ඒ මොහොත වන තුරා මේ සියල්ල අපහසුයි අපට ජය ගන්නට. ඒ ඉලක්කය කරා අප රැගෙන යන්න, අප ඔසවාගෙන යන්න. ඒකයි ඔබ කියන්නට ඕනැ."

**2010 මැයි 07**

"එන්න මා හා ගමන් කරන්න.
මක්නිසා ද මම නුඹලාට පෙරටුව යමි.
එන්න, ලෝකය දකින්න.
එන්න, ලෝකය උදෙසා පූජා වන්න.
පියාණන්ගේ මහිමාලංකාරය දකින මොහොත
ඔබට උදා වන්නේය.
ඒ සඳහා මිලයක් ගෙවමින්
මා හා ගමන් කරන්නට ඔබට සිදු වේ.
ඔබ එක්රැස් කරගත් සියල්ල
ඔබට අහිමි වන්නට පුළුවන.
එවිට මා විසින් රැස්කරගත් සියල්ල
මම නුඹට දෙමි.
වෙවුලන දණහිස් ශක්තිමත් කරන
දෙවිඳාණෝ මම වෙමි.
නුඹලා දේව බලමහිමය සියත දරාගෙන
විජයග්‍රාහි ලීලාවෙන් මා හා ගමන් කරනු ඇත.
නුඹලාගේ විඩාබර දුක්බර මුහුණු
එදිනට උදෑසන පිපුන මල් මෙන් ප්‍රමුදිත වනු ඇත.
එවිට සැබෑ වූ දෙවියන් සමග ගමන් කිරීමේ
භාග්‍ය ගැන නුඹලා උදම් අනන්නහුය.
එදින නුඹලා ප්‍රීති ඝෝෂා පවත්වනු ඇත.
එවිට ලෝකයා මනස්ස්ථාපනය වනු ඇත.
ලෝකයා තවමත් නිසි ලෙස
මනස්ස්ථාපනය වී නැත."

**2010 ජුනි 05, ශුද්ධාත්ම මංගල යැදුමේදී**

"මා කෙරෙහි මහා පිපාසයකින් මා අබියසට පැමිණීම ගැන මම සතුටු වෙමි. මම ද මහත් සේ පිපාසිත වෙමි. ඔබ වැනි ජීවිත ගළවා ගැනීමේ මහා පිපාසයක් මා තුළ ද ඇත. ශුද්ධාත්ම මංගල යැදුමේ දී මා ළාබාල දාසිය මගින් ප්‍රබලව ක්‍රියා කළ අවස්ථාවක් තිබුණා. නැවත ඒ ප්‍රබලතාවය නුඹලාට අත්දැකීමට ලැබෙනවා, තව වසර කීපයක් ඇතුලත. එය මහා ප්‍රබලතාවයක්. එතෙක් විශාල මිලයක් ගෙවමින් දේශයේ ගැළවීම උදෙසා ඔබ සැම වැය වන්න. දේශයේ ලෝකයේ සියල්ලන්ගේ ගැළවීම උදෙසා නුඹලා මහා මිලයකට යටත් වනු ඇත. මේ මොහොත වන විට මා නුඹලාට කිව යුතු බොහෝ දේ ප්‍රකාශ කර ඇත. මේ මොහොතේ මම නැවත මතක් කරනවා ඔබ සැම කෙනෙක්ම දැනුවත් විය යුතු කරුණක් පිළිබඳව. ඉහළින් වඩින සංඝයක් තෝරා ගැනීම පිණිස පියාණන් විසින් මාව මෙලෙස ක්‍රියාවට නංවා තිබෙනවා. මාව ඔබලා

අතරට එවලා මනුෂ්‍ය ශරීරයක් තුළ ක්‍රියා කරන්නට සලස්වල තිබෙනවා. මේක සමාජය තුළ හරිම අසාමාන්‍ය දෙයක්. බොහෝ අයට පිළිගන්න අපහසුම දෙය ජේසු කාන්තාවක් තුළින් ක්‍රියා කිරීමයි. ලෝක මට්ටමින් බැලුවොත් එසේ සිතන එක නිවැරදියි. දේව ආත්මය කොහොමද මනුෂ්‍ය ශරීරයට ඇතුළු වී කතා කරන්නේ? ඒක මෙහෙමයි සිද්ධ වෙන්නෙ. දේව ආත්මය ඒ ශරීරයට ඇතුළු වීමට ප්‍රථම සියලු පාප පුළුස්සා දමනවා."

"මනුෂ්‍යයා තුළ භයානක පාප තිබෙනවා, සුළු පාප තිබෙනවා, නිර්මල පාප තිබෙනවා. බොහෝ පවුල්වල පියා මව දරුවෝ සමගියෙන් ආදරයෙන් සිටිනවා. සමහර පවුල්වල දෙමාපියන්ගේ අඩුපාඩුකම් ගැන දරුවන් තුළ සියුම් වෛරයක් ඇති වෙනවා, එය ඒ මොහොතට පමණයි. පියාගේ වරදක් ගැන දරුවන් තුළ නුරුස්සන ගතියක් ඇති වෙනවා. ඒත් එය බරපතල නැහැ, ක්ෂණයකින් එය ඉවර වෙනවා. පියාණන්ට පුළුවන් මේ පාප ගණය තුළින් නිර්මල පාප තිබෙන තැනැත්තාව එතුමන් කැමති කෙනාව ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ස්පර්ශ කරල ඒ පාප පුළුස්සමින් තෝරාගන්නට. මේ භූමියෙන් මේ පරපුරෙන් පියාණන්ට හසුවුණේ මේ චරිතයයි. පුරුෂයෙක් වුවත් ස්ත්‍රියක් වුවත් පියාණන්ට අවශ්‍ය ශුද්ධවූ ආත්මය ඇතුල් කර ගන්නට හැකි නිර්මල චරිතයක්. එහෙත් ඇයත් පාප ගණයට සම්බන්ධයි. ඇය තුළත් අඩුපාඩුකම් තිබුණා. ඇය පුංචි කාලයේ සිටම දෙවි පියාණන්ගේ සැලැස්ම වුයේ රාත්‍රි අන්ධභාවයෙන් මෙලොවට එවීම. ඒ ගැන ඇය කළකිරීමට කණස්සල්ලට පත්වුණා. ඒකත් සියුම් පාපයක්."

"පියාගේ බේබදු ජීවිතය හා නිවසේ අඬදබර නිසා ඇය ජීවිතය එපා වීමක් අත්දුටුවා: පියා කෙරෙහි අප්‍රසන්නතාවයක් අත්දුටුවා. එහෙත් එය ඒ මොහොතට පමණයි. නැවත ඇය ප්‍රේමනීයයි. පුංචි කාලයේ සිටම වැඩිහිටි ඥාතීන් කෙරෙහි ඇය තුළ ගරුබියක් තිබුණා. ඇය ප්‍රේමනීයයි කියන්නේ හැම දෙයක්ම ඒ මොහොතට පමණයි. ප්‍රේමයෙන් හැම සත්කාරයක්ම ඔවුන්ට කළා. කෙනෙක් ගැන ඇය තුළ ඊර්ෂ්‍යාවක් තිබුණෙ නැහැ. දුක කලකිරීම, මැයගේ ජීවිතය පුරාවට තිබුණා. ඒ සියල්ල තුළ ඇය විඳවනවා. ඒ කිසිවක් කියන්නේ නැහැ. ඥාතියෙක්ගේ වරදක් තිබෙනවා නම් ඒ අයගේ හිත රිදෙන්න කියන්නේ නැහැ. වැඩිහිටි අයෙක් තමාට තරවටු කළත් ඇය එයාගේ මුහුණට දොස් කියන්නෙ නැහැ. ඒක හිතෙන් ඉවත්කර ගන්න තව කෙනෙකු සමගයි කියන්නේ. ඇයගේ මෙම ගති ලක්ෂණ පියාණන්ගේ මහා සැළැස්ම ඉටුවීම උදෙසා මේ ආත්මයට ඇතුළු වන්නට දොරටු විවර කරල දුන්නා."

"1991 වසරේ සිටම තවමත් මම ඇය තුළින් ක්‍රියා කරනවා. මා ආවෙ පියාණන්ගේ කැමැත්ත ඉටු කරන්නටයි, ලෝකය ගිනිලන්නටයි. එහා ඉවුර පිළිබඳ සැලැස්ම කුමක්ද? ගිනිලෑම එතැනට අදාලයි. එහෙනම් එතැනත් මට සැලැස්මක් තිබුණා. මා ආවේ ගිනි ලන්නටයි. හැමෝම මෙයට හසුවෙලා ඉන්නේ. එනිසා තව කෙනෙකුට බැහැ ඒ කෙනෙකුව විවේචනය කරන්නට. මගේ ශුද්ධවූ ක්‍රියාවට පිටින් ගිය ක්‍රියාත් එතැන සිදුවුණා. එය ධර්මය හා අධර්මය අතර මහා සටනයි. ඔබ සැම ලැජ්ජාවට පමුණුවමින් මේ නින්දාව හරහා මා නුඹලා ගෙන යමින් තිබෙනවා." (එහි කියවෙන්නේ 2003 ජනවාරි සිට 2006 ජුනි දක්වා අප පසු කළ වසර තුනහමාරක් පිළිබඳවයි.)

"නින්දාවේ මහා උදුන රත්වන විටයි සියල්ලන්ට දැනෙන්නේ, මුළු ලෝකයටම රහසින් පැමිණි මේ තැනැන් වහන්සේ කවරෙක් ද යන වග. එතුමා කුමක් සඳහා ද පැමිණ සිටින්නේ? මේ උදුන රත්වෙලා ගිනි ගනිමින් සියල්ලෝ මහා පවිත්‍ර කිරීම තව ඉදිරියටයි. එයයි මහා පවිත්‍ර කිරීම. දරුවෙනි, මෙයයි ඉදිරි ගමන. මෙයට හසුව සිටින ඔබ කිසිවෙකුට වැරදිලා නැහැ. මෙය අති සුවිශුද්ධවූ ගමනක්. රත්වෙන විට දැනෙයි ගිනි උදුනේ රහස. සියල්ලන්ගේ සියොළඟම රත්වනු ඇත. එවිට උපහාසයෙන් සිනාසුන අය දණ නමා නමස්කාර කරනු ඇත, ඉහළින් වඩින සංඝයාට. මේ මහා විඳවීම නින්දා අපහාස සියල්ලේ නිර්මල පලය ලබා ඉදිරියට යද්දී අප නිසා යාච්ඤා කළ මැනවයි වැළපෙන ජනතාව බොහෝ යි. ඒ උදෙසා ඔබ හැමටම මහා මිලයක් ගෙවන්නට සිදු වෙනවා. ගමනාන්තය කරා තව ඉදිරියට යද්දී යි ඔබට හැඟෙන්නේ මේක ලේසි ගමනක් නොවෙයි කියන එක. මෙහි විශාල බව දැනෙන්නට ගන්නවා, තව වසර කීපයක් ඉදිරියට යද්දී."

"මා දුන් අනාවරණ සිදු වෙමින් පවතිනවා. දේශය තුළ ලෝකය තුළ ධනය, බලය, ජනප්‍රියත්වය අළුදූවිලි වෙනවා. මේ මහා ගිනි උදුනේ රත්වීම තුළින් ලැබුවා වූ මහා ප්‍රීතිය සියලු දෙනා භුක්ති විඳින දිනයක් එනවා. මේ හැම දෙයක් තුළම සියල්ලන් එක ලෙස දකින එකම ස්වප්නය එයයි. එය සිදු වන්නේ මේ පොළෝතලය තුළ මයි. ඒ මගේ දෙවන පැමිණීමයි. මා වඩින්නේ මහිමාන්විතව යි. අහස ගිගුරුම් දෙමින් පොළොව කම්පා වෙමින් පියාණන්ගේ මහා සැලැස්ම මහිමාන්විතව රාජ කිරීටයෙන් යුතුව පැමිණෙන මොහොත ළං වෙමින් ඇත. සියල්ලෝ

එදින මා දකිති. ඊට පෙර බොහෝ අය භාග්‍ය ලබනවා. ස්වප්නයෙන් හෝ මා දකින්නට. ඔබ හැම දුක වේදනාව කලකිරීම මේ සියල්ලෙන් ඈත්ව මොහොතේ ජීවිතය ප්‍රීතිය භුක්ති විඳින්න. මේ මොහොතේ කළ යුතුව තිබෙන්නේ කුමක්ද, අපි එයට සූදානම් වෙමු. ඉදිරියේ දී ඔබට නිවසක් නැති වන්නට පුළුවන. ගහක් යට ජීවත් වන කාලය ඒවි. සියල්ලන් එකා වගේ එකමුතුව ප්‍රීතියෙන් ජීවත් වන මොහොත එළඹෙනු ඇත. ඒ තමයි දැහැමි යුගයේ උදාව. ඒ සඳහායි අද පුංචි දරුවන්ව කැඳවා ඇත්තේ. ඔවුන්ව දැහැමි ලොවට මඟ පෙන්වන්න තමයි වැඩිහිටි ඔබලාව තෝරල සති දෙකකට වරක් එකතු වෙමින් දින හතලිහකට වරක් දින තුනක යැදුමට යොමු කරමින් පන්නරයක් දෙමින් ගෙන යන්නේ. මේ මහා මඟ ඔස්සේ තමයි යන්නට සිදු වන්නේ. දරුවෙනි, එසේ නම් ඔබ සැමට වැරදී නැහැ. හෝසානා කියමින් ජය ගොස නගමින් අපි මේ මහා ගමන යමු."

**2010 අගෝස්තු 01**

"වසර කීපයක සිට ඔබ හා මා අතර මහා සමීප සම්බන්ධතාවයකින් යුතුව ඔබව ගොඩනගමින් මම මේ තාක් දුර පැමිණ තිබෙනවා. ඉදිරි ගමනට ඔබ සූදානම් කරනු සඳහා දැන් ඔබ අමතමි. ඔබ සියල්ලන් තුළ තිබිය යුතු පළමු ගුණාංගය නම් මේ ගමන යාමට තමා තුළ ඇති කැමැත්තයි. ඔබ හා මා අතර ඇති විශ්වාසය ගැඹුරු විය යුතුයි. විශ්ව මැවුම්කරු නුඹලා අතරට පැමිණෙමින් නුඹලා ගොඩනගමින් නුඹලා තුළ තිබෙන පොදි බැඳගත් මමත්වය සුං කරමින් අප දැන් ගමන් කරමින් සිටිනවා, ඉහළින් වඩින සංඝය හැටියට. මෙය මුළු විශ්වයම මනස්ස්ථාපනය නමැති යදමට ඇතුල් කරන්නට සූදානම් කරන සංඝයක්. ලෝකයා නුඹලා තුළින් දකින්නට ඕනෑ, වැනෙනසුළු පණ නැති සංඝයක් නොවෙයි, කෙවිටක් අතැතිව එඬේරුන් මෙන් ගමන් කරන මහා ශක්තිමත් සංඝයක්. එලෙසයි අපි ඉදිරියට යන්නට සූදානම් වන්නේ. එනිසා මේ මොහොතේ සිට ඔබේ ක්‍රියා හැසිරීම් ඔබෙන් නික්මෙන්නා වූ වදන් ලෝකයට ආලෝකයක් වන්නට අවශ්‍යයයි. දෙවියන් හා සබඳකම් පවත්වන මුහුකුරා ගිය ශ්‍රාවකයින් හැටියට යා යුතු උදාර ගමනක් මෙය. මේ උදාර වූ ගමන යන්නේ කා සමගද?, දේව පුත්‍රයාණන් වන ඔබගේ එඬේරාණන් වන මා පෙන්වන මඟ ඔස්සෙයි. දේව සැලැස්ම ඉටුවීම උදෙසා, ලෝකය ඇඹීම පිණිස, දැහැමි යුගය ඇරඹීම පිණිස යන ගමනක්."

"මිත්‍රවරුනි, මා ඔබ සමගයි, දේව සභාව නුඹලා සමගයි. තමා නිසි ලෙස දකිමින් තමාටම සීමා නොවී ලෝකය උදෙසා දිය වෙමු. සූදානම් ද ඔබ ඒ ගමනට? විශ්ව ජනතාව උදෙසා දියවීමට සූදානම් ද ඔබ? සියල්ලන් උදෙසා දිය කර ගන්නටයි යන්නේ. මෙලෙස මුල පුරමින් වසර ගණනාවක සිට සැඟවී පැවති මෙම රහස, මේ අසම්මතය මගින් ලොව පුරා වචනය දිග හැරෙන මොහොතක් වේවි ඉදිරි ක්‍රියාකාරිත්වය. එය ඔබට නින්දා කළ ඔබව උපහාසයට ලක් කළ සියල්ලන් ඔබ සොයා පැමිණෙන කාලයක් වේවි. අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට ඔබ සැමටම මහා ශක්තියක් තිබිය යුතුයි. සුළු පිරිසයි පියාණන් විසින් තෝරාගන්නේ, ඉහළින් වඩින සංඝය හැටියට. ඒ පිරිස අතර ඔබ සිටිය යුතුයි කියලයි මා කියා සිටින්නේ. ලෝකයට ඇතුළු වී සිටින ප්‍රබල ලෙස දස්කම් විස්කම් කරන යක්ෂයාව අපි පරාජය කරමු. ඔහු දහස් වසරකට බැඳ දමන යුගය යි දැන් ඇරඹෙන්නේ. ඉදිරි යුගයේ දී මේ පුංචි දරුවන්ට අමාරු තැනකට මුහුණ දෙන්නට සිදු වන කාලයක් පැමිණෙනු ඇත. එනිසා ඒ මාර්ගය අපි සූදානම් කර දෙමු. මේ තෝරා ගැනීම ඔබ ලැබූ භාග්‍යයක්. සියල්ල පසෙක ලා ඔබ සංඝයක් ලෙස එක්රුස් වන ඒ පැය කීපය මා වෙනුවෙන් ලෝකයා වෙනුවෙන් තබන්න යැයි මම ඔබ සියල්ලන්ගෙන් ඉල්ලා සිටිමි."

**2001 අගෝස්තු 04**

"එදින (අගෝස්තු 01) මා සංඝය ඇමතීමෙන් පසු ශ්‍රාවකයන් මුහුණ දෙන පරීක්ෂණ හා පරීක්ෂා තවත් වැඩි වනු ඇත. ඒ අභියෝග සියල්ල අභිබවා ජයග්‍රහණය කිරීමයි, සියල්ලන්ගේ ගැළවීම උදෙසා දියවීම කියන්නෙ. ඒ ජයග්‍රහණය කරා යාමට පියාණන්ගේ ස්පර්ශයක් අවශ්‍යයි. යමෙක් මේ පරීක්ෂණ ඉවරයක් නෑ නේද කියල ඒ ගැන කලකිරෙමින් සිටිනව නම් ඔහුට අවශ්‍ය තමාගේ දියුණුව උදෙසා දිය වන්නට පමණයි. මේ පසුබිම තුළ යි ඉහළින් වඩින සංඝය පියාණන් විසින් තෝරාගනු ලබන්නේ. සියල්ලන් එතැනට පැමිණෙනවා දැකීමයි, මගේ කැමැත්ත. මින්පසු ජේසු උදෙසා මේ සියල්ල කරනවා යැයි නොකියන්න, සියල්ලන්ගේ ගැළවීම උදෙසා මෙය කරනවා යැයි කියන්න."

**2011 ජනවාරි 01**

"2010 වසර නුඹලා අමාරුකම් මැද අගහිඟකම් මැද බාධක මැද පසු කළා. පසුගිය වසරට වඩා මේ වසර අපහසු වුණත් අප ඊට සූදානම්, ඔබ එලෙසයි කිව යුත්තේ. මේ මොහොතේ සිට ඔබ හිතට ගන්න ඕනෑ, ඔබ අබියසට එන සියලු ගැටළු තුළ ඔබට පණිවුඩ

දෙන මැය තුළින් දෙවියන් දැකීම පමණක් නොවෙයි, ඔබ තුළ සැබැවින්ම දෙවියන් දකින්නට සූදානම් වෙන්න ඕනැ. ඔබ මුහුණ දෙන ගැටළු තුළ තව කෙනෙකුගෙන් අහනවට වඩා ඔබ තුළම මට ගෘහයක් සාදන්න, ඒ ගෘහය පවිත්‍ර කර ගන්න. ඔබගේ හදවත නමැති කුටියේ ඒ ගවලෙන තුළ අසුන්ගත් ස්වාමින් වහන්සේව එතැනම ජීවමාන කර එතැනම වැඩෙන්නට ඉඩ හරින්න, මේ වසරේ. ඔබගේ යාච්ඤාවේ බලගතු භාවය තුළ, මා සමග ජීවත්වීමේ ප්‍රබලතාවය තුළ, නුඹලාට පුළුවන් සියලු අභියෝග ජය ගන්නට. බොහෝ විට තමා වටා මිස ස්වාමින් වහන්සේ වටා නොවෙයි, ඔබ රැස්වන්නේ. මුදල්ම නම් ජීවිතය ඔහුට බොහෝ උපද්‍රවවලට මුහුණ දෙන්න සිදු වෙනවා. මා අනුවම එන අයටත් ඊටත් වඩා බොහෝ දේවලට මුහුණ දෙන්න සිදු වෙනවා. එහෙත් ඒ අය මහා ජයග්‍රහණයක් ලබනවා. ඉදිරියේ දී ඔබ සියල්ලන්ට පියාණන්ගේ පරික්ෂණයට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ පරික්ෂණයේදී අභිමානයන් සුණුවිසුණු කර ගනිමින් සමාජය ඉදිරියේ ඔබ පෑගෙන්න සූදානම් ද කියන අභියෝගයට මුහුණ දෙන්න සිදු වෙනවා. ඔබ තුළ මානය ඇත්නම් ඔබ කැමැති නැහැ තව කෙනෙකු ඉදිරියේ පහත් වෙන්න, ඔහුගෙන් යමක් ඉල්ලන්න, මේ පරික්ෂණයේ දී ඔබට එලෙස කරන්න සිදු වෙනවා."

**2011 මාර්තු 06**

"මෙවර චතාරිකය ඔබගේ ආත්මයට දැනෙන චතාරිකයක් වනු ඇත. ඇතුලාන්තයේ ඔබට මහා තනිභාවයක් දැනෙනු ඇත. කුමක්ද ඔබ තුළ ඇති අඩුව කියා සොයන්නට ඔබ යොමු වනු ඇත. දැන් පියාණන් මුළු විශ්වයම සොලවා තබා ඇත. එහි ගැබ්ව ඇති සුවිශුද්ධ භාවය තුළ එකිනෙකා පවිත්‍ර කරමින් තෝරාබේරා ගන්න මොහොත පැමිණ ඇත. ලෝක ව්‍යවහාරය අනුව කියනවා නම් ලෝක විනාශය ඇරඹී ඇත. නිස්කලංකව තනිව මහා හුදෙකලා වීමක් තුළ මහා මෙනෙහි කිරීමකට ඇතුලු වන්න. මේ චතාරිකයේදී තමාව මුළුමනින් කඩා බිඳ අලුතින් අඹන්නැයි ඔබ මට පැවසුවොත් ඔබගේ අත්දැකීම කොහෙත්ම පහසු නොවනු ඇත, එහෙත් එය මහත් ආශිර්වාදයක් වනු ඇත. දරුවෙනි, ඔබත් මාත් අතර ගතකරන්නට බොහෝ කාලයක් වෙන්කර ගන්න."

## 49

## "කුරුසියේ ගමන ආදරය ලබන්නට නොවෙයි, ආදරය බෙදන්නට යි."

"නුඹලාගේ යැදුම් සඳහා නුඹලා විශේෂයෙන් සිකුරාදා දිනය යොදා ගන්නේ ඇයි? ඒ මාගේ දුක් විඳීම හා ජයග්‍රහණය පූර්ණත්වයට පත් කළ දිනය නිසයි. එදින මම නපුරා අන්ත පරාජයට පත්කළා. එය නපුරා සදාතනිකව ලැබූ පරාජයක්. නුඹලාට විඳින්නට සිදු වී ඇති සියලු දුක් වේදනා උදෙසා මොරගසන්න. ඒ සියලු දුක් වේදනා මගේ කල්වාරි යාගය හා එක්කොට පුදන්න. නුඹලාට යන්නට සිදු වී ඇති කුරුසියේ මාර්ගය උදෙසා දෙවිදුන් පසසන්න, තමා තුළ සිටින යක්ෂයා සුණුවිසුණු කර දමන්න, මලක් මෙන් පිබිදෙන්න, යුග පුරුෂයෙක් මෙන් නැගී සිටින්න." (2008-03-14)

(2008 මැයි 30-ජුනි 1 දින තුන යැදුම සඳහා අපි ගිනිගත්හේන නිවහනට ගියා. මහා වැසි මැද පස් කන්දෙන් කොටසක් කඩා වැටී බිත්තියක් පුපුරා ජලය නිවස මැදින් ගලා ගියා. භූ විද්‍යා සමීක්ෂණ අංශය ද එතැනින් ඉවත් වන ලෙස උපදෙස් දුන්නා. ඒ උත්තරීතර නිවහනෙහි ජේසු සමිඳුන් කළ කී සියල්ල ගැන ස්තුති කර අපි ආපසු ආවා.)

"රෝගියෙක් වෙනුවෙන් යාච්ඤා කරද්දි සුව කරන්න කියලම යාච්ඤා කරන්න එපා. ඒ රෝගියා ගැන පියාණන්ට සැලැස්මක් තිබෙනවා. රෝගියාගේ ඒ විඳවීම අනෙක් අයගේ මිදීම උදෙසා කරන පිදීමක් වන්න පුළුවන්. ඒ නිසා ඒ රෝගියා පිළිබඳ පියාණන්ගේ කැමැත්ත ඉටු වේවා කියල යාච්ඤා කරන්න. වේදනාව ඉසිලිය නොහැකි තරම් අපහසු නම් ඒ වේදනාව අඩු කරන්න කියල යාච්ඤා කිරීම හෝ ඒ වේදනාව දැරීමට ශක්තිය පතා යාච්ඤා කිරීම හොඳයි." (2009-09-24)

(මහා වැසි නිසා බොහෝ ප්‍රදේශ මහත් විපතට පත්වූ මොහොතක) "දේශයේ පවිත්‍රකරණය දැන් ලහිලහියේ සිදු වේ. එනිසා කිසි දා නොවූ විරූ ලෙස ඉදිරියේ දී සියල්ල සිදු වනු ඇත. දැහැමි යුගයට මංපෙත සලසමින් බොහෝ අයට දිවි පුදන්න සිදු වනු ඇත. පියාණන්ගේ සැලැස්මට ඉඩ දෙමින් දැහැමි අයටත් ජීවිතයෙන් සමු ගන්නට සිදු වනු ඇත.

ඒ අන් අයගේ ගැළවීම උදෙසා ගෙවන මිලයක් හැටියට යි. දේශයේ භයානකම කාලපරාසය ඉදිරියේ ඇරඹෙනු ඇත. සුබ විහරණය තුළ කල් ගෙවන්නෝ දහමට සමීප චරිත පීඩනයට පත්කරනු ඇත. එකිනෙකාගේ කුලල් කා ගැනීම් තුළ සත්‍යය හෙළි වනු ඇත. ඔවුන් ගැන අසන දකින දේ තුළ නොරැඳී ඔවුන් උදෙසා කරුණා කළ මැනව යි මොරගසන්න. ඔවුන් හෙලාතලා කතා කිරීමෙන් ඒ විපත් ඔබ වෙත පෙරලා එනු ඇත. සියල්ලන් දෙස ලස්සන ඇසකින් බලන්න. ලෝකය ලස්සන කරන්න පුළුවන් පවිත්‍ර සිතුවිලිවලින්." (2010-05-21)

(සංඝයේ ශ්‍රාවකයකු අමතා) "මා ඔබ වියවුල් වන ලෙස කතා කළත් ඔබ ඒ තුළ තර්ක කරමින් නොසිට මා දෙවියන් බව විශ්වාස කරගෙන මා කියන දෙයට කීකරු වීමෙන් මගේ ආශිර්වාදය ලබා ගත්තා." (2010-07-08) "මැය මගින් මට කර ගන්නට ඇති කාර්යය අපහසුයි. මැය ස්ත්‍රියක් වීම නිසයි වඩා අපහසු. ඒත් ඒ පියාණන්ගේ සැලැස්මයි. මැය මගින් කර ගන්නට මට බොහෝ දේ තිබෙනවා. එනිසා මැයට යමක් නොකියන ලෙස කීවොත් එයට කීකරු වෙමින් මට සහයෝගය දෙන්න. පියාගේ සැලැස්ම අනුව දැන් පූජකයින්ට කතා කළ යුතු මොහොතයි. මැය මගින් එසේ කරන ලෙස පියාණන් මට පවසනවා. දෙව්මැදුරේ දී අවස්ථා දෙකක දී ඇයට එය දැනුනා. ඇය ඊට විරුද්ධ සිතුවිලි ඇතිකර ගත්තා. ඇය මට කිවා දිව්‍ය පූජාවට සහභාගි වීමට ඇයට ඇති අයිතියට බාධා නොකරන ලෙස. එය බැහැපත් අහිංසක ඉල්ලීමක්. මා ඊට ගරු කරනවා. පියාණන් එලෙස කියනවා, මා ඒ දෙකට මැදිවී සිටිනවා. එහෙත් පියාණන් මට අණ කරන මොහොතේ එයට කීකරු වන්නට මට සිදු වෙනවා." (2010-07-26)

"ස්ත්‍රීන් ආභරණවලට ලොල් බවක් දක්වනවා. ඒ ආශාව මරණය දක්වාම පවතිනවා. එසේ නොවන අය අතලොස්සයි, සිටින්නේ. පැවදි කන්‍යා සොයුරියන් තනතුරු උසස්වීම්වලට ලොල් බවක් දක්වනවා. එසේ නොවන අය අතලොස්සයි සිටින්නේ. ඒ තුළ ඔවුන්ගේ යාච්ඤා සම්ප්‍රදායික වෙලා. එය මට ප්‍රසන්න නැහැ. යාච්ඤා ගැඹුරු හා පුළුල් විය යුතුයි." (2010-07-26) (ශ්‍රාවකයෙක් අමතා) "සියල්ල දෙවියන් වහන්සේ මත තබා විශ්වාසයෙන් මුහුණ දෙන්න. කිසිදු බරක් ඉතිරි කර නොගෙන සියල්ල දෙවියන් වහන්සේ මත තබා උන්වහන්සේගේ ආශිර්වාදයට සහභාගි වන්න, පවිත්‍ර සිතක් ඇතිකර ගන්න. එවිට ඔබ කරන සියල්ල පවිත්‍ර වේ. එය ඔබ ඇසුරු කරන අයට ද බලපායි. ඔවුන් ද උසස් වනු ඇත." (2010-09-03)

"1998 දී මුල පුරන්නට නියමිතව තිබූ මහා විනාශයක් ගැන එකල මා නුඹලාට කතා කළා. එහෙත් පියාණන් එය කල් දමමින් නුඹලාට තවත් කාලයක් දුන්නා. ඉක්මනින් ඒ විනාශයන් මුල පුරනු ඇත. ලෝක විනාශය පිළිබඳව මා දුන් මාගේ මැණියන් දුන් අනාවරණ එලෙසම සිදු වන තුරු බලා සිටින අයට වන විපතක මහත. ඒ සියල්ලේ අරමුණ මනුෂ්‍යයා මනස්ස්ථාපනයට පැමිණ වීම පමණකි. සියල්ලෝ මනස්ස්ථාපනය වෙත් නම් ඒ සියල්ල නිනීවේ මෙන් වන්නට පුළුවන. මගේ හා මගේ මැණියන්ගේ අනාවරණ හා සම්බන්ධ වන සියල්ලන්ට ජෝනාගේ නින්දාව අයිති බව වටහා ගන්න." (2011-01-23)

"මෙය දේවාගමනයේ කාලය යි. එය විශාල පීඩා ගැටළු ඔස්සේ සියල්ල ජය ගනිමින් යන කාලයක් විය යුතුයි. දෙවියන් වහන්සේ රාජ කිරීටයෙන් සැරසී නැවත පොළොවට බසින්නට සූදානම් ව සිටිනවා. පුංචි සරල වචනයක තිබෙන විශාල ගැඹුර ඔබ තුළ වැඩසිටින ප්‍රඥා තොමෝ විසින් ඔබට වටහා දෙනු ඇත. වචනයාණන් ඔස්සේ ගමන් කිරීම තුළ මේ මහා ගමනේ ගැඹුර අත්දකිමින් ඒ හරහා යන්නට සිදු වෙනවා. බොහෝම ආසන්නයි දැන් මා ලොවට පහළ වීමට. එනිසා සැම කෙනෙක්ම තමාගේ ප්‍රශ්නය විසඳන්නට පළමු අන් අයගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්නට පුරුදු වන්න. ඒ ඇහුම්කන් දීම තුළ ඔහුට හෝ ඇයට දෙන පිළිතුර ගැඹුරු පිළිතුරක් විය යුතුයි, ඒ පිළිතුරෙන් බොහෝ අය ගැළවීම ලබනු ඇත. දැන් මේ යන ගමන තුළ ඔබ හිතන්නට එපා ඔබ නිකම් සිටිනවා කියලා. මේ තුළ තිබෙනවා වෙවුලන දණහිස් ශක්තිමත් කරමින් යකඩ කුළුණක් මෙන් ශක්තිමත් කරමින් ඉදිරියට ගෙන යන්නට පුළුවන් ශක්තියක් ඔබ තුළ දෙවිඳුන් විසින් නිර්මාණය කිරීමක්."

"ඒ ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් දේව බලය නමැති මහා කඩුව අත දරාගෙන යා යුතු ගමන ඔබ සැම ආශිර්වාද කරමින් මා ගෙන යනවා. ඉදිරි කාලයේ මාගේ වදන් මේ ආකාරයෙන් පිට නොවන්නට පුළුවන්. නුඹලාගේ ප්‍රඥාව තුළ වචනයාණන්ව පෙරලමින් ඒ වචනයාණන්ගෙන්ම නික්මෙන්නා වූ වචනය ඔස්සේ ඉදිරියට යා යුතු ගමනක් වේවි, මේ ගමන. දේවාගමනයේ කාලය තුළ තමාව නැති කර ගනිමින් බොහෝ ප්‍රශ්ණ ගැටළු පීඩාකාරි අත්දැකීම් මධ්‍යයේ ඉදිරියට යන්න වෙනවා. ඒ ජයග්‍රහණය ලබන්නට නම් තමා තුළ නිරන්තරයෙන් සැරිසරන ප්‍රඥා තොමෝට ඉඩ දෙමින් මේ ගමන යා යුතුයි. පුංචි සරල වදන් තුළ මහා ගැඹුරක් තිබෙනවා. ඒ ගැඹුරු අර්ථය සොයා ගන්න." (2011 ජුනි 05)

(යාච්ඤා ගෘහයේ දෙවන පියවර සංඝයේ කිසිවෙකුගේ හෝ මුදලකින් නොවෙයි එකිනෙකාට අත පෑමෙන් ලබා ගත්තේ. ඒ ගැන ජේසු සමිඳුන් ශ්‍රාවකයින් කීප දෙනෙකු අමතා) "දරුවෙනි, මෙය පාපි නින්දාව නොවෙයි, මෙය ශුද්ධවූ නින්දාවයි. ශුද්ධවූ නින්දාව විඳීමේ ගෞරවය ලබන්න, සියල්ලන්ගේ පයට පෑගීමේ ගෞරවය ලබන්න. මිනිසෙක්ව මා මෙලොවට පැමිණ මා ලැබුවේ ද එයයි, අදත් එලෙසමයි. ශුද්ධවූ නින්දාව ආශිර්වාදය සමගයි එන්නෙ. කකුල් ගෙවෙද්දි පියාණන් කෙනෙකු ස්පර්ශ කරමින් යම් ආශිර්වාදයක් ලබා දෙනු ඇත."
(2011. 07. 21)

"දරුවෙනි, 666 හා ඒ ක්‍රියාකාරිත්වය ගැන අධ්‍යයනය කරන්න." (ඒ ගැන ජේසුම අපට යමක් කියන ලෙස අප පැවසුවා.) "ඒ ගැන එතරම් කතා කරන්න මා කැමති නැහැ. ඒ කිසිවෙකු බියට පත්කරන්නට මා කැමති නැති නිසා. මොන බලවේග ආවත් මා සමග සිටින්න කියලයි මා නුඹලාට පවසන්නේ.---- දැහැමි යුගයේ දරුවන්ට ඔවුන්ට ඉදිරියේ මුහුණ දෙන්නට සිදුවන අරගලය ඔවුන්ගේ අභ්‍යන්තරයට දැනෙමින් ඇත. එනිසා ඔවුහු වියවුල් ලෙස හැසිරෙති. දැන් වියවුල් වී පසුව වියවුල් නොවී ඔවුන් ඒ අභියෝගයට මුහුණ දෙනු ඇත.---- මා කෙසේ කීවත් මා ප්‍රේමය නිසා මගේ දෙවන පැමිණීමට, පෙර සූදානමක් ඇතැයි පූජක පුත්‍ර ගොඩ්ප්‍රි හා පූජක පුත්‍ර බෙනඩික් තුළ විශ්වාසයක් තිබුණා. අද බොහෝ පූජක පුත්‍රයන් තුළ එය නොමැත. ඉහත මා සඳහන් කළ ඒ පූජක පුත්‍රයන් දෙදෙනා දැන සිටියා දෙවන පැමිණීම ගැන මා පැවසූ බොහෝ දේ මගේ තරවටු කිරීමේ ප්‍රේමය පමණක් බව." (2011 නොවැම්බර් 04)

ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය සුජීවා දෙව් පියාණන් විසින් කැඳවා ගැනීමේ මොහොත ළංව ඇති බව පවසමින් ඇය අප අතර තබන්නැ යි ජීවිත වෙනසක් කරගෙන යාච්ඤා කරන ලෙස ජේසු සමිඳුන් පැවසුවා. සුජීවාගේ මව පැමිණ වැළපෙමින් කතා කළ මොහොතේ ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් මෙසේ ප්‍රකාශ කළා. "2001 ජනවාරි මාසයේ මැය මුහුණ දුන් රිය අනතුරේදියි මැය මිය ගියේ. මැය මගින් මගේ කාර්යය නිම නොවූ නිසා මම නැවත ඇයට ප්‍රාණය දී ඇය තුළට ඇතුල්ව මෙලෙස ක්‍රියා කරනවා. එනිසා නුඹලා සතුටු විය යුතුයි. පියාණන්ට සැලැස්මක් ඇත. පියාණන්ගේ මොහොත මට වැළැක්විය නොහැකියි. පියාණෝ අකාරුණික නොවෙති." (2011.11.19)

"පූජකයන්ට ලෝගුව අභිමානයක් වෙලා. ඕනෑම කෙනෙක් මගින් පිළිතුරු ලැබෙන තත්ත්වයට ඔවුන් සූදානම්ව සිටිය යුතුයි. ඔවුන් ඒ සඳහා සූදානම් නැහැ. ලෝගුව මගින්ම විය යුතුයි කියලයි ඔවුන් සිතන්නේ." (2012.02.07) "ඉවසීම දියුණු කර ගන්න, එය ලොකු ධනයක්. එමගින් පමණයි පිළිතුරක් ලැබෙන්නේ. පොරොන්දු ඉටු කරන දෙවියන් සමග නම් ඔබ යන්නේ එය මහා ආශිර්වාදයක්. ---- මා ලෝකයට සියල්ල දානය කළත් ඒවා නිසි ලෙස බෙදී ගොස් නැහැ. ඒ තෘෂ්ණාවේ කඳු අධික නිසා. ලොව පුරා කෝටි සංඛ්‍යාත ජනතාවක් කුසගින්නේ විඳවනවා. එය මට වේදනාවක්. යමෙකුට කුසගිනි වෙද්දි එය පළමුවෙන් දැනෙන්නේ ඔහුගේ පණුවාටයි. ඒ කියන්නේ ඔහුගේ බඩවැල්වලටයි. එවිට මම අණ කරන අවස්ථා එනවා, පණුවාට දුර්වල නොවන ලෙස. එවිට ඔහුට කුසගින්න තරමක් හෝ ඔරොත්තු දෙනවා. එවැන්නෙකුට කලකට පසු ප්‍රණීත ආහාරයක් ලැබුන විට එය පමණට වඩා ගිලදමන අවස්ථා එනවා. එවිට මා ඊට අදාල ඉඳුරන්ට අණ කරනවා ඒ නිසා දුර්වල නොවන ලෙස. ඒ ඇයි? එවැන්නෙකුට කලකට පසු හෝ හොඳ ආහාරයක් ලැබීම මට ද සතුටක් නිසා." (2012.02.27)

(2012 අළු බදාදට පෙර දින ශ්‍රාවකයින් අමතමින්) "දැන් උදා වී ඇත්තේ සියල්ලන් බරපතල ලෙස පීඩාවට පත් කරන හෙම්බත් කරන බිහිසුණු කාලයක්, අවදිව සිටිය යුතු කාලයක්, ජේසු ගැන මහා පිපාසයක් ඇතිකර ගත යුතු කාලයක්. ඔබ ශ්‍රාවකයන් ලෙස මා බලන්නේ ඔබගේ කීකරුකම. මා යන්න කිවොත් යන්න, නවතින්න කිවොත් නවතින්න. කුරුසයේ ගමන මහා විඳවීමක්, එය ආදරය ලබන්නට නොවෙයි ආදරය බෙදන්නටයි. මහා කුරුසිය කර දරාගෙන ලෝකය උදෙසා දිය වන්නට කැඳවීමක්. දැන් සියල්ලෙන් හිස් වන්න, ලෝකය උදෙසා කැප වන්න. එවිට ස්වාමින් වහන්සේ ඔබ පිළිබඳ සියල්ල සපල කරනු ඇති. පියාණන් ලෝකයම මහා පරික්ෂණයක තබා තිබෙනවා, උන්වහන්සේගේ මනාලිය (මිනිස් සංහතිය) දෙස බලා සිටිනවා. කඩා වැටෙන්නට නොවෙයි, සියල්ලන් ශක්තිමත් කරගෙන යන්න ඕනැ, ලොකු ජවයක් තිබෙන්න ඕනැ. ඔබ මට මෙසේ කියන්න. මම ලෝකයට බරක් වෙන්නේ නැහැ, ඔබගේ සුරතටම බරක් වෙන්නම්. මගේ උත්ථානයේ මංගල්ලය දක්වා නැවත කතා නොකරමි. එතෙක්, විශ්වාසයේ කිරුළ හිස දරාගෙන, ජේසුස් යන නාමය මුවග දරාගෙන, ඇතුළු කුටිය පවිත්‍රව එහි ස්වාමින් වහන්සේ දරාගෙන සිටින්න. එවිට ඔබගේ ප්‍රශ්නය විශාල බව දැනුනත් ආපසු බලද්දි විසඳිලා තියේවි."

**50**

# “බලන්න, කිසිවෙකුට වැසිය නොහැකි විවෘත දොරක් මම ඔබ ඉදිරියෙහි තැබුවෙමි.”

2012 අප්‍රේල් 08 පාස්කු ඉරිදා ජේසු සමිඳාණෝ ප්‍රථම දාසිය මගින් සංඝයේ කිප දෙනෙකු අමතා **(ශුද්ධ බයිබලයේ එළිදරව් 3:7,8,10,11)** කියවා මෙනෙහි කරන්නට අප යොමු කළහ. **“ශුද්ධ වූ සත්‍ය වූ දාවිත්ගේ යතුර ඇත්තා වූ ද කිසිවෙකු නොපියන ලෙස දොර අරින්නා වූ ද කිසිවෙකු නාරින ලෙස එය පියන්නා වූ ද තැනැන් වහන්සේ මෙසේ වදාරන සේක. මම ඔබේ ක්‍රියා දනිමි. බලන්න, කිසිවෙකුට වැසිය නොහැකි විවෘත දොරක් මම ඔබ ඉදිරියෙහි තැබුවෙමි. ඔබට ඇති ශක්තිය ස්වල්ප වූ නමුත් ඔබ මාගේ වචනය පිළිපැද්දහුය: මගේ නාමය ප්‍රතික්ෂේප නොකළහුය. ඉවසීමෙන් සිටින්නැයි මා කළ නියමය ඔබ රක්ෂා කළ බැවින් ලෝකවාසීන් පරීක්ෂා කිරීමට මුළු ලෝකය පිට පැමිණෙන්නට තිබෙන පරීක්ෂාවේ පැයෙන් මමත් ඔබ ආරක්ෂා කරන්නෙමි. මම වහාම එමි. ඔබේ කිරුළ කිසිවෙකු විසින් පැහැර නොගන්නා ලෙස ඔබ සතු දෙය තදින් අල්ලා ගන්න.”** “මගේ දාස දාසින් උපයෝගි කර ගනිමින් මා කරමින් සිටින මෙම ක්‍රියාවලිය ගැන යි මෙහි සඳහන් වන්නේ. මෙය කිසිවෙකු විසින් වැසිය නොහැකි දොරටුවකි.”

16වන බෙනඩික් පාප් තුමා ඉල්ලා අස්වී ෆ්‍රැන්සිස් පාප් තුමා පත්වූ පසු 2013 සැප්තැම්බර් 15 අපි ජේසු සමිඳුන්ගෙන් මෙලෙස විමසුවා. දෙවන ජුවාම් පාවුලු පාප් තුමා මෙම සභා ව්‍යුහයේ අවසන් පත්වීම කියලා ජේසු අපට පැවසුවේ ඇයි? එය සත්‍යයක්ද? “මා පැවසූ දෙය සත්‍යයක්. දෙවන ජුවාම් පාවුලුගේ මරණය ගැන නොවෙයි මා පැවසුවේ, ඔහු ඉවත් කරන මොහොත සමීප බවයි. එතැනත් රහසක් තිබෙනවා. අධර්ම බලවේගය කරලියට පැමිණීම වළක්වන්නා ඒ මරණය මගින් ඉවත් කරනු ලැබුවා. එනිසා දෙවන ජුවාම් පාවුලුගෙන් පසු පත්වීම් දෙකම මගෙන් නොවෙයි. කරලියට පැමිණෙමින් සිටින අධර්ම බලවේගය ඔවුන්ට මුල පිරීමට තව කාලය ඇති බැවින් ඔවුන්ගේ කැමැත්ත ඔහුට දෙන්නට තීරණය කළා. ඔහු ඊට එකඟ වුණා. එලෙසයි, ඔහු පත් වුනේ. ඔහු පත් වුනේ ඔවුන්ගේ කොන්දේසි යටතේ. එයින් එකක් හෝ උල්ලංඝනය වන විට ඔහුට ඉල්ලා අස්වීමට ඔවුන් බල කළා. එහෙත් ඔහු එලෙස ආවෙ මට සේවය කරන්නයි. මේ පත්වීම සිදු වුණොත් එලෙසමයි. එනිසා අවදිව සිටින්න.”

“සවන් දීම වැඩිකර ගන්න. කතා කිරීම අඩුකර ගන්න. කෝප වීම අවසන් කර ගන්න. ඔබේ කිරුළ දෙවියන් වහන්සේ ගැන විශ්වාසය පමණක් නොව බිරිඳ දරුවන් ආදින් කෙරෙහි ද විශ්වාසයයි.” (2012-05-15) “දැනටම ලොව පුරා චණ්ඩ මාරුතයක් හමාගෙන එනවා. අති බිහිසුණුයි. මේ තිබෙන සහනය සැනසීමත් අවසන් වෙයි. එකම පිළිතුර ජේසු සමග සිටීමයි.” (2012-06-25) “ශ්‍රාවකයින්ගේ අත ඇති දේ ද පියාණන් රැගෙන දැන් මොහොතේ ජීවිතය උගන්වමින් සිටිනවා. ඉන්පසු ඇවැසි දේ පියාණන් විසින් සපයනු ඇත. පසුව ලෝකයේ සියල්ලන් සමග ද මෙය සිදු වනු ඇත. මේ සියල්ල දැහැමි ලොවක් උදා කරනු සඳහායි.” (2012-07-22) “ඉදිරියේදී ප්‍රශ්න ගැටළු රැසක් පැන නගිනු ඇත. කෑම වේල බෙහෙත් ටික පවා සොයා ගන්නට අපහසු තත්ත්වයක් ඒවි. දැන් එකිනෙකා අතර ගැටුම්, ඊළඟට ජාතියක් ජාතියක් අතර ගැටුම්, රාජ්‍යයක් රාජ්‍යයක් අතර ගැටුම්, ආගමක් ආගමක් අතර ගැටුම්, ඊළඟට සොබාදහමේ එකිනෙක දේ අතර ද ගැටුම්, අවසානයේ හිරු සඳු හා තරු තරු අතර ද ගැටුම් පැනනගිනු ඇත.” (2012-09-11) “දින තුනක අඳුර පැමිණෙනු ඇත. බොහෝ දෙනා ලෝකයෙන් සමුගනු ඇත. ඉන්පසු තවත් ආපදා දෙකක් පැමිණේ. ඒ ආපදා තුන අග ඉතිරි වන අය සමග දැහැමි යුගය උදා කරමි.” (2012-10-28)

"පවුලේ සියල්ලන්ට උදෑසන පානය සඳහා ප්‍රමාණවත් ජලය බඳුනකට රැස් කරන්න. පූජක සක්‍රමේන්තුවෙන් ආසිරි ගැන්වූ ලුණු කුඩු ස්වල්පයක් ඇඟිලි දෙකට ගෙන කුරුසියේ ලකුණ තුන් වරක් සටහන් කරමින් ඒ ලුණු කුඩු ජලයට එක් කරන්න. එලෙසම කුරුසියේ ලකුණ තුන් වරක් සටහන් කරමින් ආසිරි පැන් බිඳු කීපයක් ද ජලයට එක් කරන්න. ඉන්පසු ජල බඳුන ශුද්ධ බයිබලයෙන් වසා තබන්න. සියලු දෙනා එය හිස්බඩම පානය කරන්න, මෙය ගෞරවයෙන් කරන්න. එය ඔබට දිව්‍ය ඖෂධයක් වනු ඇත." (2012-10-30) "මම විටෙක මැවුම්කරුවාණන් වන එකම දෙවියන් වහන්සේ ලෙස ද විටෙක නුඹලා ගේ මිතුරෙකු ලෙස ද සහෝදරයෙකු ලෙස ද විටෙක කුඩා දරුවෙකු ලෙස ද නුඹලාට කතා කළෙමි. විටෙක අඥානයකු ලෙස ද කතා කළෙමි. එලෙස මම ප්‍රබලව ද දුබලව ද නුඹලාට කතා කළෙමි." (2012-11-15)

(එළිදරව් පොත ගැන අපි ජේසු සමිඳුගෙන් විමසූ මොහොතක) "යුගාන්තයේ සිදුවීම් ගැන දර්ශන කීපයක් මා ප්‍රවාමිට පෙන්වූ විට ලුසිෆර් මගෙන් ඉල්ලා සිටියා ඔහුට ද දර්ශන කීපයක් පෙන්වන්නට අවසර දෙන ලෙස. මගෙන් ඔහුට ඒ අවසරය ලැබුණා. එළිදරව් පොතට ඒ සියල්ල එක්ව තිබෙනවා. ඔහු ආලෝකයේ දූතයෙක් මෙන් හැසිරෙමින් පෙන්වූ එක දර්ශනයක් තමයි නුඹලා එහා ඉවුරෙදි අල්ලා ගත්තේ. තවත් එවැනි එක දර්ශනයක් එහි තිබෙනවා." (2013-09-22)

ජේසු සමිඳුන්ගෙන් මඟ පෙන්වීමක් පතා මුලසුනට පැමිණෙන අය අමතා වසරකට පෙර ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් පැවසුවා දින තුනක අඳුරක් ගැන, ඊට පසු පැවසුවා පැය විසි හතරක අන්ධකාරයක් ගැන. ඊටත් පසු ජේසු සමිඳුන් මෙලෙස පැවසුවා. "පියාණන් පමණක් දන්නා දෙයක් විශ්වය තුළ සිදු වෙමින් පවතී. ඒ ගැන කිසිම අනාවරණයක පවා සටහන්ව නැත. ඒ සිදු වන දේ තාක්ෂණයට ද හසු නොවේ. එය සොබා දහම සම්බන්ධ කරගෙන සිදු වන දෙයක් වන්න පුළුවන්. බොහෝ ජීවිත මෙලොවින් සමුගනු ඇත. විශ්ව මාතාව ඒ උදෙසා මහත් සේ මොර ගසන්නීය." (2013-11-20)

ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමක් පතා මුලසුනට පැමිණෙන අය අමතා ජේසු සමිඳුන් තුනෙන් දෙකේ විනාශයක් ගැන හා තුනෙන් එකේ පවිත්‍රකරණයක් ගැන පැවසුවා. එයින් අදහස් කරන්නේ මෙය යි. ජේසු සමිඳුන්ගේ මහිමාන්විත දෙවන පැමිණීම වන විට මිහිමත ඉතිරි වන්නේ දැනට සිටින ජනතාවගෙන් තුනෙන් එකක් පමණී. ඉතිරි තුනෙන් දෙකක් මිහිතලයෙන් සමු ගන්නට සිදු වනු ඇත. ජේසු සමිඳුන් වෙනුවෙන් බොහෝ දෙනෙකුට දිවි පිදීමට සිදු වනු ඇත. ඉතිරි වන තුනෙන් එක දැඩි පවිත්‍රකරණයට ලක්කරනු ඇත.

(2014-අප්‍රේල් 20 පාස්කු ඉරිදා ජේසු සමිඳුන් ශ්‍රාවකයින් කීප දෙනෙකු අමතමින්) "සභාව ජන වන්දනා රටාව තුළ චතාරිකය හා පාස්කුව අදින් අවසන් කරනවා. එහෙත් මගේ ක්‍රියාකාරිත්වය තුළ චතාරිකය හා පාස්කුව කිසි දා අවසන් නොවේ. මිහිපිට පුංචි දරුවා සිට මහල්ලා දක්වා සියල්ලන් මා විසින් පවිත්‍රකරණයට ලක් කරන්නේ චතාරිකය හා පාස්කුව අත්දැකීම තුළ යි.")

ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමක් පතා මුලසුනට පැමිණෙන සියල්ලන් ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි කරවීමට ජේසු සමිඳුන් ප්‍රථම දාසිය උපයෝගි කරගනිමින් ක්‍රියා කළා. දිව්‍ය පූජාවට සහභාගි වීම ගැන මෙලෙස ද පැවසුවා. "අද සමහරක් ස්ත්‍රීන් දෙව්මැදුරට පැමිණෙන විට අඳින ඇඳුම් ලුසිෆර්ගේ ජයග්‍රහණයක් වී ඇත. වෙන කිසිම ආගමක මෙවැනි දූෂිත තත්ත්වයක් දැකගත නොහැක. එය මට මහත් වේදනාවකි. එනිසා විනීත ඇඳුමකින් සැරසී දෙව්මැදුරට යන්න. දිව්‍ය පූජාවට යාමට සූදානම් වන මොහොතේ සිටම හිත එක්තැන් කරගෙන ඒ සඳහා ගෞරවයෙන් සූදානම් වන්න. දිව්‍ය පූජාවට ගිය විට ළඟ ඉන්න කෙනා කවුද කියලවත් අවධානය යොමු නොවන තරමට සිටින්න. දිව්‍ය පූජාවෙන් පසු ජේසුව හද කුටියේ තබාගෙන ඒ ගැන අවදියෙන් යුතුව මගදිගට ඇති පරීක්ෂාවන්ට යට නොවී ජේසු සමිඳුන් සමගම නිවසට පැමිණෙන්න. නිවසේ දී ආවේගශීලි නොවී ඔබ තුළ ජේසු සමිඳුන් ජීවත් කරවීමට ක්‍රියා කරන්න."

පසුගිය වසර දහය පුරා ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමක් පතා මුලසුනට පැමිණෙන බොහෝ දෙනා මාරවිල සුසාන භූමියේ ඇති ශ්‍රී කුරුසියේ දේවස්ථානයට යොමු කිරීමක් සිදු විය. "පිරිසිදු කඩදාසියක් ගෙන එහි මෙලෙස සටහන් කරන්න. පියාණෙනි, අසරණ දාසයාගේ/දාසියගේ/ අපගේ/යැදුමට සවන් දුන මැනව. ඔබගේ බැල්ම අප වෙත යොමුකළ මැනව. ඔබගේ වරප්‍රසාදයෙන් අප පිරෙව්ව මැනව. ඉන්පසු ඔබගේ ප්‍රශ්න ගැටළු එහි සඳහන් කරන්න. ඉන්පසු මෙසේ ලියන්න. ස්තුතියි පියාණෙනි, සියල්ල ඔබට බාරයි, ආමෙන්. ඉන්පසු ඒ කොළය නවා පිරිසිදු රෙදි කැබැල්ලක් මැද තබා ගැට ගසන්න. එය රැගෙන පළමුවෙන් සිකුරාදා දිනක මහා කුරුස ප්‍රතිමාව ඉදිරියට යන්න. ඔබ ලියා ගැටගැසූ ඔබගේ ගැටළු කුරුසිය ඉදිරියේ තබාගෙන එය නැවත සිතින් මෙනෙහි කර ඒ සියල්ල උන්වහන්සේට බාර කරන්න. ඉන්පසු බාර ගැටගැසීම

සඳහා ඇති කුරුසියේ එය ගැට ගසන්න. සතියකට දින එක බැගින් දින හතක් හෝ දෙව්මැදුරට පැමිණ යාච්ඤා කරන්නට පොරොන්දු වන්න. බාරය ඉටු වූ පසු ඒ දෙව්මැදුරට ගොස් ඉටිපන්දම් හතක් දල්වා එය අවසන් කරන්න. මෙය ඔබගේ ගැටළු කුරුසියට දීමකි. එතැනට අත තබන්නට ලූසිෆර්ට නොහැකිය."

2015.04.24 වන දින ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳාණෝ වචනයෙන් වචනය පවසමින් එය සටහන් කරගන්නට සැලැස්වූහ. මෙයයි, ඒ පණිවුඩය.

"ලොව මැවුම්කරු වන මගේ දෙනෙත් මත විශ්ව කදම්භයක් වැනි ලෝක පරිපථයක බුර බුරා නැගෙන ලෝභයන් ගිනි ජාලාවක මේ මොහොතෙත් දැවෙමින් දැවෙමින් ඇත. එය විටෙක නිහඬය, විටෙක රළු බවින් යුතුය. වෙස්වලා පැමිණෙන ඔබගේ මැවුම්කරුව ඔබ තවමත් නොහඳුනයි. එහෙත් මුළු විශ්ව තලයම මගේ දෙනෙත් මත රඳවා ගෙන ඇත්තෙමි. හැම ජීවයක්ම මවිසින් අඹමින් නිර්මාණය කරන ලෝභයන්ගෙන් තනන ලද පිළිරුවක් වැනිය. එහි අරුත නිෂ්පල යැයි නොසිතන්න. මෙහි ගැඹුරක් ඇත. මුළු විශ්ව කදම්භයම දැන් ඒකාලෝක කරමින් ඇත. එය ඇරඹී ඇත. ඒ ඔබේ දෙවි මහෝත්තමයාණන්ගේ ලෝකය යි. ඒ පිටාතරින් පෙනෙන දෑ නිශ්පල වුවත් ඇතුලතින් තිබෙන දෑ දවාලමින් දවාලමින් ඇත. මිනිසා පිටාතරින් නිහඬ බවින් පෙනුනත් ඇතුලත කලහකාරිය. මක්නිසාද ස්වාමින් හා බැඳී ඇති හෘදයසාක්ෂිය නිසාවෙනි."

"නිශ්චලව තමා තුළට ඇතුළු වන්න. ඇතුලතින් ලෝකය අභ්‍යන්තරය දකින්න, ගැඹුර දකින්න. ඇන්තනි පුත්‍රය, මා කී වදන් තුළ ඔබ ද ඔබගේ ඇතුලටම යා යුතු කාලය යි, යන්න, ඇතුලටම. එකිනෙක ගෙන මෙනෙහි කරන්න. මෙය ගැඹුරට සාකච්ජා කර ගලපන්න උත්සාහ කරන්න. අධර්මයට බැහැ කිසිවක් කරන්නට. ධර්මය ජය ගෙන ඇත. මිනිසා තුළ රට තුළ ලොව තුළ වියරුව හට ගනිමින් ඇත, කළ යුතු කුමක්ද කියා තෝරාගත නොහැකිව කලහකාරී වී ඇත. ගැඹුරින් ගැඹුරට මෙනෙහි කරමින් දැන් සිටින ශ්‍රාවකයින් මින් ඉදිරියට කිසිවෙක් ගිලිහී යන්නට ඉඩ නොදී එකිනෙකා යදම්වලින් බැඳ ගන්නා ආකාරයට ක්‍රියා කරන්න. මෙයයි පුත්‍රය, ඔබේ වගකීම. විටෙක ඔබ නිදි වර්ජිතව සිටින මොහොතක ඔබ හැම කෙනෙක්ම උවමනාවෙන් ස්වාමින් වහන්සේ ගැන අවධානයෙන් සිටියොත් ස්වාමින්ගේ මුහුණ ඔබගේ මුහුණට උඩින් සිටිනා අයුරු දැනුනොත් ඔබගේ මුහුණට රස්නයක් හා ඔබ සමග සංවාදයකට සූදානමක්. උත්සාහ කර බලන්න. එලෙස සිදු වෙයි, බොහෝ අයට මා දකින්නට බලාපොරොත්තුවෙන් සිටින අයට, අවධානයෙන් සිටියොත්."

(තම නැන්දම්මා නිසා අධික පීඩනයට පත් ලේලියක් අමතන මොහොතක) "දියණිය, ඔබ පළමුවෙන් ඔබවම දකින්න. ඇය කෙලෙස හැසිරුනත් ඔබ සැබැවින්ම ඇයට ප්‍රේම කරන්න. සියල්ල දරා ගන්න, තර්කයට නොයන්න. ප්‍රේමයේ සියලු ආයුධ ඇය වෙනුවෙන් භාවිත කරන්න. එලෙස ඇය දිනා ගන්න. ඔබ නැවත මෙහි පැමිණෙන විට ඔබ ලැබූ ජයග්‍රහණය මා සමග බෙදා ගන්න." (2015 නොවැම්බර් 30)

**2015 දෙසැම්බර් 15**

" ඇන්තනි, ඔබේ ගුරු පූජක පුත්‍ර ඔස්කා අතින් ලියවුන ඒ ගීතය ඉහළින් වඩින සංඝය ලෙස මා නුඹලා උපයෝගි කර ගනිමින් ඉදිරියේ සිදුකරන ක්‍රියාකාරීත්වය ගැන අනාවරණයකි. එය මගේ ශුද්ධාත්මානුභාවයෙන් සිදු වූවකි. 'ඇවිත් බලන්න... මුදල්, පන්ති, පූජ්‍ය, පූජක බලමුළු වැටෙනා සැටි දෙදරා' ඒ අදහස පූජක පුත්‍රයෙක් ලෙස ඔහු අතින් සටහන් වෙද්දී ඔහු තිගැස්සී සිටියත් එය එලෙසම තබන්නට මම ඔහු මෙහෙය වීමි."

ජේසු සමිඳුන්ගේ දාස දාසින් මගින් එතුමන් සිදුකර ගන්නා මේ ක්‍රියාවලියේ දී ජේසු සමිඳුන් බලය බිඳක් හෝ රැගෙන එන්නෙ නැහැ, ප්‍රේමය පමණයි රැගෙන එන්නේ. ඊට හේතුව බලය රැගෙන පැමිණීම මිනිස් සිරුරකට ඔරොත්තු නොදෙන නිසයි. මෙම වසර 12 තුළ ප්‍රථම දාසිය උපයෝගි කර ගනිමින් ජේසු සමිඳුන් රෝගියෙකු ආසිරි ගන්වා සුදුසු වෛද්‍යවරයෙකු වෙත යොමු කිරීමයි, සිදු වුයේ. අශුද්ධ බලපෑම්, ළය විරේකයන් සඳහා නම් ඒ වෙනුවෙන් ක්‍රියා කරන පූජාප්‍රසාදිවරයෙකු වෙත යොමු කිරීමයි, සිදු වුයේ. දැනට වසර පහක පමණ සිට ජේසු සමිඳුන් මුලසුනට පැමිණෙන අයගේ නිවෙස් සැලසුම් පරීක්ෂා කර කොඩිවිණ ඇත්නම් ඒ ස්ථාන ලකුණු කර දින 21ක් තුළ ශුද්ධවූ පැය 21ක් කරන්නට යොමු කළා. ඉන්පසු ජේසු සමිඳුන් විසින්ම කුරුසියක් ආසිරි ගන්වා සංඝයේ ශ්‍රාවකයෙක් වන ප්‍රින්ස් නිහාල්ට එය බාර දී කොඩිවිණ ඉවත්

කරන්නට බලය දුන්නා. (මෙම ක්‍රියාවලියේදී සමහර අවස්ථාවල ප්‍රබල සුවකිරීම් සිදු වුයේ ප්‍රථම දාසියගේ දින හතේ නිරාහාරයේ බලයෙනි.)

අප්‍රේල් 14 වන දින ජේසු සමිඳුන් කුරුසිය මත දිවි පිදූ දිනය නිසා 1998 දී ජේසු සමිඳුන් අපට පැවසුවා සැම වසරකම අප්‍රේල් 14 වන දින සංඝයක් ලෙස එක්ව දවල් 12.00 සිට සවස 3.32 දක්වා මහා යාච්ඤාවක යෙදෙන ලෙස. 2019 අප්‍රේල් 14 වන දින අපි සංඝයක් ලෙස එක්ව විසි වන වරටත් එම යාච්ඤාවේ යෙදුණා.

2006 වසරේමයි ජේසු සමිඳුන් අප අමතා මෙලෙස පැවසුවේ. “මනුෂ්‍ය දරුවෙක්ව මෙලොවට උපදින සැම දෙනාම දෙවියන් වහන්සේගේ දරුවන්. ඉපදුනාට පසුවයි, සමහරු ලුසිෆර්ට සේවය කරන්නේ. ඔවුන් ද නැවත දෙවියන් වෙතට හැරී එනවාටයි, දෙවියන් කැමැති වන්නේ. ලුසිෆර් මට වෛර කරන බව මා දන්නවා. එහෙත් මා ලුසිෆර්ටත් වෛර කරන්නේ නැහැ. මැවුම්කරු සියල්ලන්ටම ප්‍රේමයයි.” ජේසු සමිඳුන් ලුසිෆර් ගැන පැවසීමේ දී තෝ, ඌ, උගේ වැනි වචන කවදාවත් යොදා ගත්තේ නැහැ. ඒ ගැන විමසීමේදී ජේසු සමිඳුන් පැවසුවේ එවැනි වචන උන්වහන්සේගේ ශබ්දකෝෂයේ නැති බවයි. එනිසා ඔහු, හෙතෙම, ඒ තැනැත්තා වැනි වචනයි එතුමන් ඒ සඳහා යොදා ගත්තේ. 2006 සිට ප්‍රථම දාසිය මගින් සිදු වන මෙම ක්‍රියාවලිය උන්වහන්සේගේ ප්‍රේමයේ ගැඹුර අපට අවබෝධ කර දුන් කාලයකි. ප්‍රේමය තුවාළ කරමින් දිනන්නට උන්වහන්සේට කිසිසේත් අවශ්‍ය නැති බවත් ඒ තත්ත්වය තුළ කෙනෙකුගේ තාර්කවිතර්ක හමුවේ උන්වහන්සේ ඔහුගේ පයට පෑගෙන්නට ද සූදානම් බවත් අපට ප්‍රයෝගිකව ඉගැන් වූ අවස්ථාවක් විය. එය 2010 අප්‍රේල් 23-25 ඇන්තනි මේරි සොයුරියගේ ඥාතින් අතරට, නුවරඑළියට ගිය ගමන යි.)

(2017 ජුනි මස 4 වන දින අපගේ ශුද්ධාත්ම මංගල යැදුමේ දී ජේසු සමිඳුන්ගෙන් ලැබුණු පණිවුඩයෙන් උපුටා ගත් කොටස් කීපයක් දැන් ඔබ ඉදිරියේ තබමි.) “ස්වාමින් වහන්සේට ඔබ තුළ ඉඩදීම තුළ ස්වාමින් වහන්සේ තුළ ඔබ ජිවත්වීම තුළ ඔබට ජීවිතය ජය ගන්න පුළුවන්. ස්වාමින් වහන්සේ සමග පමණක් නොවෙයි, ස්වාමින් වහන්සේ තුළ සිටීමෙන් සියල්ල ජය ගන්නට පුළුවන්. කුමක්ද ස්වාමින් වහන්සේ තුළ හා සමග කියන එකේ තේරුම? ස්වාමින් වහන්සේ තුළ ස්වාමින් වහන්සේගේ ඇතුලත තමා ජිවත් වීම තුළ තමාව ආරක්ෂා කර ගන්න පුළුවන්. එවිට මොනම බලවේගයකටවත් බැහැ අශුද්ධවූ අධර්මිෂ්ඨවූ බලවේගයකටවත් බැහැ ඔබව මගෙන් ඈත් කරන්නට. මක්නිසාද මම මුළු විශ්වයීය ජනතාව උදෙසා පියාණන්ගේ ඒ මහා සැලැස්මට ආමෙන් කියමින් අවනත වෙමින් යාගික වූ බැටළු පැටවාණෝ. මහා වණ කැළලක් විශ්වයීය ජනතාව උදෙසා ඇතිකර ගත්තා වූ තැනැන්වහන්සේගේ ඒ හෘදය තුළ ඇති මහා වණ කැළල තුළ ඔබ ජිවත් වන්න. ඒ තුළ ඔබ සැඟව සිටින්න. මම ඔබ ඒ තුළ රඳවා ගන්නෙමි. ඒ තුළ සිටින කිසිවකුට බැහැ මගෙන් දුරස් වන්නට. එනිසා ස්වාමින් වහන්සේ තුළ පවතින්න.”

“මා එදා ශ්‍රාවකයින්ට ඉගැන්වුවා යාච්ඤාවක්. අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව යනුවෙන් ද එහි සඳහන් වෙනවා. මා එයින් අදහස් කළේ එදිනෙදා ජිවිතයට අවශ්‍ය ශාරීරික භෝජනය ගැන පමණක් නොවේ. එදිනෙදා ජිවිතයට අවශ්‍ය ආත්මික භෝජනය ද මා එයින් අදහස් කළා. ආත්මික භෝජනය කියන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, දේව වචනය මෙනෙහි කිරීම හා යාච්ඤා ජිවිතයයි. ශාරීරික භෝජනය ලැබුනම මනුෂ්‍යයා ශාරීරිකව වර්ධනය වෙනවා. ආත්මික භෝජනය ලැබුනම මනුෂ්‍යයාගේ අධ්‍යාත්මික ජිවිතය වර්ධනය වෙනවා. එනිසා වඩාත් ලංකර ගතයුත්තේ ආත්මික භෝජනයයි. ආත්මික භෝජනය ලබා ගන්න තැනැත්තා කිසිදා විනාශ වන්නේ නැහැ. ඒ තමා ප්‍රබලම ආහාරය. ශාරීරික භෝජනය අවශ්‍යයි, එහෙත් එය පමණක් ප්‍රමාණවත් නැහැ. ස්වාමින් වහන්සේගේ වචනය ආහාරය කර ගැනීමෙනුත් මනුෂ්‍යයා ජිවත් වෙනවා.”

“අද මා ප්‍රේමයේ කඳුළු වගුරමින් මේ මොහොතෙත් උදහසේ ගින්න දවාලමින් තිබෙනවා, මුළු විශ්වය පුරාම. මම කඳුළු වගුරනවා, විශ්ව ප්‍රේමයෙන්. මැවුම්කරු වන මම මාගේ මැවීම විනාශ වෙනවා බලා සිටින්නේ ඇයි? සමාව දීම ඉවරයක් නැහැ, පාපය එන්ඩ එන්ඩම දරුණු වෙනවා. දැන් තුනෙන් දෙකේ පවිත්‍ර කිරීම වේගවත් වෙලා. මම වේදනාවෙන් ප්‍රේමයේ කඳුළු වගුරනවා, ඒ සමගම උදහසේ ගින්නෙන් ලොව පවිත්‍ර කිරීම ආරම්භ වෙලා. ඒ ගැන මා සතුටු වන්නේ නැහැ. දැහැමි ජනතාව බේරා ගන්නට නම් අධර්මය පරාජය කරන්නට නම් මට ඒ දේ කරන්නටම සිදු වෙනවා, මහා පවිත්‍ර කිරීමක් කරන්නට සිදුවෙනවා. දැන් එය සිදුවෙමින් පවතිනවා. ඉතින් ඔබ කරන්න ඕනේ ඔබගේ යැදුම් තුළ තමා වෙනුවෙන් නොවෙයි, ලෝකයේ සියලු ජනතාව උදෙසා කන්නලව් කරන එක. එතැනයි, ඔබේ ජිවිතයේ සාර්ථකත්වය. ඔබ උදෙසා නොව අන් අය

උදෙසා මොරගසන්න. ඒ වේදනාව තමන්ගේ වේදනාව කරගන්නා විට සියලු දෙනා ගළවනු ලබයි. පියාණන් වහන්සේට සියල්ල කළ හැකියි.”

“නුඹලාගේ දේශයේ නුඹලාගේ යාච්ඤාව ආරම්භයේම කරන යාච්ඤාව කුමක්ද? දැන් ශබ්දනගා කියන්න.” (සාන්ත කුරුසේ අඩයාලමෙන් අපේ සතුරන්ගෙන් අප ගළවා දේවා අපගේ දෙවි ස්වාමිනී පිතාගෙත් පුත්‍රයාගෙත් ස්ප්‍රිතු සාන්තුගෙත් නාමෙන් ආමෙන් ජේසු.) “එතැන අප කියන වචනය තුන් වරක් කියනවා, කුරුස ලකුණු හතරක් වැටෙනවා. ඒ හතර ගැඹුරින් හිතට ගන්න. මින්පසු මේ යාච්ඤාව බොහෝම ගෞරවයෙන් උච්චාරණය කරන්න. ඒ යාච්ඤාවෙ මහා බලයක් තියෙනවා. එතැන යක්ෂයාට ඉඩක් නැහැ. ඒ යාච්ඤාව ආරම්භයේ ඒ මහා කුරුසිය ලකුණ කොතෙන්ට ද දාන්නේ? ඒ යාච්ඤාව පළමු කුරුස ලකුණ අඳින්නේ ඔබේ නලල්තලය මතයි. එතැනයි ප්‍රඥාවේ නිවාසය විය යුත්තේ. සියලු පාප පරික්ෂා, වැරදි ආකල්ප, කළකිරීම්, කඩාවැටීම් සියල්ල පරාජය කිරීමට එය උපකාරි වෙනවා. ඊළගට කුරුස ලකුණ දාන්නේ කටට. ඒ තමා මහා කුරුසිය, ඒක තමා භයානකම තැන. එතැන අපේ සතුරන්ගෙන් අප ගළවා දේවා කියන්නේ යක්ෂයාගෙන් අප ගළවා ගන්න කියන එකයි. ඊළගට කුරුස ලකුණ දාන්නේ ඔබේ ළයට. එතැනයි, ඔබ තුළ මගේ නිවහන විය යුත්තේ. අශුද්ධ බලවේගයන්ට එතැන ඉඩක් නොලැබෙන්නටයි, එතැන කුරුස සටහන තබන්නේ. ඊළගට කුරුස සටහන හිසට හා උරහිස් දෙකටයි. අපගේ ශරීරය මුළුමනින්ම නතු කරලා අවයවයන් ඉන්ද්‍රියන් ඒ හැම දෙයටම සරිලන්න තමයි, එලෙස කුරුස ලකුණ දාන්නේ. එතකොට මුළු ශරීරයම ස්වාමින් වහන්සේට නතු වේවා! සියලු පාප පරික්ෂාවලින් අප ගළවා දේවා! කියලයි අප පතන්නේ. ඒ කුරුස ලකුණු හතරට තේරුම් හතරක් තිබෙනවා. අප කියන වචනය තුන් වරක්ම උච්චාරණය කිරීමෙන් ඒ යැදුම විශ්වයටම සම්බන්ධ වෙනවා. එනිසා එය විශ්ව ප්‍රේමයේ ගැඹුරුම යැදුමක්. ඔබගේ යැදුම් අවසානයට පමණක් නොවෙයි, ආරම්භයටත් ඒ යැදුම උපයෝගි කර ගන්න.”

51

## “දහමින් පෝෂණය ලබා සියලු බැම් කඩාගෙන මහත් ජවයකින් යුතුව ඔබ සැම ඉස්මතු වන තුරු මම බලා සිටිමි.”

කුරුසියේ ගමන් මඟ තම අයිතිවාසිකම්වලට, තම කැමැත්තට, තම ආශාවන්ට මරණයක් අත්දකිමින් යන්නට සිදු වන ගමනකි. එහි දී වැරදි ආශාවන්ට පමණක් නොව හොඳ යැයි තමාට හැඟෙන ආශාවන්ට ද මරණයක් අත්දකින්නට සිදු වේ. මහළු වියට පත්වෙමින් සිටින අයෙකු හැටියට වගකීම් දේව මඟ පෙන්වීමෙන් සුදුසු අයකුට පවරා දෙන්නට මම කැමැත්තෙමි. ජේසු සමිඳුන්ගෙන් ඊට අනුමැතියක් ඇතැයි මට නොපෙනේ. ඒ තත්ත්වය මගේ මනසට පීඩාකාරි වූ මොහොතක 2014 මැයි 28 ජේසු සමිඳුන්ගෙන් මඟ පෙන්වීමක් පතා මම මුලසුනට ගියෙමි. එහි දී ජේසු සමිඳාණෝ ප්‍රථම දාසිය මගින් මා අමතා මෙලෙස පැවසූහ. “මාගේ මේ ඉදිරි කාර්යය සඳහා මා විසින් තෝරාගත් නුඹලාගෙන් කෙනෙකු මා වෙතට පැමිණෙන විට මම ඔබගේ මේ මොහොතේ ගැටළුව ගැන කිසිවක් නොදන්නාක් මෙන් සිටිමින් ආදරයෙන් වචන ස්වල්පයක් ඔබට පවසමි. ඊට හේතුව මෙයයි. නුඹලාගේ ශ්‍රාවකත්වයේ වර්ධනයට අවශ්‍ය සියලු ඉගැන්වීම් මා දැන් නුඹලාට දී හමාරයි. ඒ සියල්ලෙන් පෝෂණය ලබා සියලු බැම් කඩාගෙන මහත් ජවයකින් යුතුව ඔබ සැම ඉස්මතු වන තුරු මම බලා සිටිමි, විශ්වාසයේ මිනිසා ජය ගන්න අයුරු බලා සිටිමි. මා තෝරාගත් මනුෂ්‍යයාට මේ සියල්ලටම මුහුණ දී ජයගත හැකි බව මම දනිමි.” එහෙත් මම නැවත ද මෙසේ පැවසීමි. ”ජේසු මා දැනට යමින් සිටින මෙම අධ්‍යාත්මික ගමන කඩින්කඩ දිවීමේ ක්‍රීඩාවක් වාගේ කරන්න. ජේසු පවසන අයෙකුට මා යෂ්ටිය බාර දෙන්නම්.” ”ඇන්තනි, මට ඔබෙන් කරගන්නට තවත් යමක් ඉතිරිව ඇත. එය අවසන් වූ විට මෙය කඩින්කඩ දිවීමේ තරගයක් මෙන් වනු ඇත.”

සුජීවාගේ දරුවෙකුගේ පාදයේ අස්ථි බිඳීමක් සිදු වී කලකට එක්තැන් වන්නට සිදු වූ නිසා එයට ඉඩ සලසා දෙමින් ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමෙන් මම 2016 නොවැම්බර් 17 ආපසු නිවසට පැමිණියෙමි. මුලසුනේ වසර 12ක් රැඳී සිටින කාලයේ දී ද සතියට දවසක් හෝ නිවසට පැමිණ උදේ සිට සවස දක්වා වත්තේ වැඩවල යෙදුනෙමි. මා නිවසට පැමිණීමෙන් පසු මා කෙමෙන් රෝගි වන්නට විය, මා තුළ පැවැති ශක්තිය කෙමෙන් ගිලිහී යන්නට විය.

දකුණු කනේ තුලනය පිළිබඳ ගැටළුවකින් මම දිගු කලක් විටින් විට පීඩා වින්දෙමි. ඒ තත්ත්වය නිතර නිතර ඇති වීමෙන් මා බලවත් ලෙස පීඩාවට පත් විය.

2017 පෙබරවාරි 19 වන දින ඉරිදා අපගේ සංඝයේ එකතුවේ දී ශ්‍රාවකයෙක් මෙවැනි ප්‍රශ්නයක් මතු කළේය. "1996 ජුනි හතෙන් පසු දෙවියන් වහන්සේ ඇන්තනි අයියව නිහඬ කළාද? ඇන්තනි අයියම නිහඬ වුණාද?" ඒ පිළිබඳ පසුබිම මෙලෙසයි. 1996 ජුනි 07 සුජීවා මගින් ජේසු සමිඳුන් මා ඇමතීමෙන් පසු එතෙක් මා විඳි කරදර නිම වෙමින් පහසුවක් සැලසෙනු ඇතැ යි මට සිතිණි. එහෙත් සිදු වූයේ ඒ පීඩාකාරි තත්ත්වය තව කිහිප ගුණයකින් අධික වීම යි. ජේසු සමිඳුන් ස්ත්‍රියක මගින් මෙලෙස කතා කිරීම දැඩි අසම්මත තත්ත්වයක් බව මම දැන සිටියෙමි. එනිසා මේ තත්ත්වය වසන්කර දහම් කටයුතුවල යෙදීම නුසුදුසු යැයි මට සිතිණි. එවැනි සේවාවක් යමෙක් මගෙන් බලාපොරොත්තු වන විට මේ තත්ත්වය ඔහුට හෙළි කරන්නට යාමෙන් සිදු වූයේ එතෙක් මා කරමින් සිටි සියලු දේශන අවසන් වීම යි. මේ ක්‍රියාවලිය නිසා කතෝලික සභාවට ගැටළුවක් වීමට මම මෙතෙක් ඉඩ නොදුන්නෙමි, ඒ ගැන සතුටු වෙමි. සුජීවාගේ විවාහය පිළිබඳ ක්‍රියාවලියේ දී එය සභාවට ගැටළුවක් වූ බව මම දනිමි. එය, මේ සභා ව්‍යුහයෙන් බැහැරව උන්වහන්සේට ක්‍රියා කරන්නට යම් මොහොතක සිදු වන බවට ඉඟියකි.

2017 අළු බදාදා ආසන්න වන විට (මාර්තු 01) මගේ රෝගී තත්ත්වය උත්සන්න විය, කටහඬ ද අඩු විය, මනස ද දැඩි ලෙස පීඩාකාරී විය. තද හිසරදයක් ද දින දෙක තුන නින්ද නොයාම නිසා ද මම අධික පීඩාවට පත්ව සිටියෙමි. ඒ පසුබිම තුළ මාර්තු 02 ජේසු සමිඳුන්ගේ මඟ පෙන්වීමක් පතා මම මුලසුනට පැමිණියෙමි. එවිට ප්‍රථම දාසිය මගින් ජේසු සමිඳාණෝ මෙලෙස පැවසූහ. "පියාණන් පැවසූ සැනින් ඔබ කැඳවාගෙන යාමට ඇන්තනි, මම එන්නම්. ඔබ දැනට කළ යුතු වැඩ කොටස නිමා කරන්න." ඒ ප්‍රකාශය මට ගැටළුවක් නොවීය. මා අත්දකිමින් සිටි තත්ත්වයට වඩා එසේ සිදු වීම යහපත් යැයි මට සිතිණි. දින හතලිහකට වරක් පැවැත්වෙන දින 03 යැදුමට එක දිගට අවස්ථා තුනක්ම සහභාගි වන්නට මට නොහැකි විය, මගේ රෝගී තත්ත්වය නිසා. 2018 පෙබරවාරි 16-18 දින තුන යැදුමට මා සහභාගි විය යුතු යැයි ජේසු සමිඳාණෝ සුජීවා මගින් පැවසූහ. එනිසා මම අපහසුවෙන් හෝ එයට සහභාගි වීමි. එය පැවැත්වූයේ නාත්තන්ඩිය මීසමේ පහළගම දේවස්ථානය අසල ඇති අපේ යැදුම් ශාලාවේ ය.

පෙබරවාරි 17 සෙනසුරාදා උදේ දේවස්ථානය අසල ඇති වැසිකිළියට ගොස් එහි වාඩි වන්න උත්සාහ කරන විටයි මට අවබෝධ වුයේ, මගේ රෝගී තත්ත්වය නිසා මට එවැනි ඉරියව්වකින් වාඩි විය නොහැකි බව. මා වැසිකිළි පෝච්චිය තුළට වැටිණි. කකුල් දෙක මඳක් ඉහළට එසවී ඇත, හිස බිත්තියට හේත්තු වී ඇත. මා බිම ඉඳගත් විට කෙනෙකුගේ අත දීමකින් තොරව මට නැගිට සිටින්නට නොහැකි තත්ත්වයක දී යි මෙය සිදු වූයේ. මට කළ හැකි එකම දෙය වූයේ මගේ වැළමිටි දෙක වැසිකිළි පෝච්චියේ දාරයට තදකොට තෙරපීමක් පමණි. තුන් වන වරට එවැනි තෙරපීමක් කරන විට මා මව්තයට පත්කරමින් ඉතා පහසුවෙන් නැගිට සිටීමට මට හැකි විය. එය නැගිට සිටීමට වඩා ඔසවා තැබීමකි. ජේසු සමිඳුන්ගේ හෝ එතුමන්ගේ දූතයෙක්ගේ අත දීමකින් මිස එවැන්නක් සිදු විය නොහැකිය. ඒ සමගම ශු. බයිබලයේ සඳහන් අදහසක් මා තුළට පතිත විය. "ස්වාමීන් වහන්සේ වළපල්ලට හෙලන සේක. උන්වහන්සේ අගාධයෙන් ගොඩගන්නා සේක." මා වසරක පමණ කාලයක් පුරා අත්දුටුවේ එවැන්නක් බව මට ඒ මොහොතේ අවබෝධ විය. මෙය අගාධයෙන් ගොඩගැනීමේ සළකුණකි. එය දෙවියන් වහන්සේගේ ප්‍රේමය නිසා සිදු වන මහා පවිත්‍රකරණයකි. මට මහත් සතුටක් ඇති විය.

මම සෝදා පවිත්‍ර වී සංඝයේ යැදුමට සහභාගි වීමි. එය පැය දෙකක යැදුමකි. සංඝයේ එක ශ්‍රාවකයෙකුගේ යැදුම දෙසට මගේ සිත යොමු විය. ඔහු ශබ්දනගා කළ ඒ යැදුමට සම්බන්ධ වෙමින් මම ද සිදු වූ සියල්ල ගැන සමිඳුන්ට තුති දුනිමි. ඔහු තුළින් පැය දෙකක් එක දිගට ගොඩනැගුන ඒ යැදුම මනුෂ්‍ය බුද්ධියෙන් පමණක් කළ නොහැකිය. එය ශුද්ධාත්මයාණන් කරනකොටගෙන සිදු වූ යැදුමකි. එය, මට ද ඒ යාච්ඤා රටාව ගොඩනගා ගන්නා ලෙසට කළ ඇරැයුමක් වැනිය. සිදු වූ සියල්ල ගැන මම මහත් සේ ප්‍රීති වීමි.

2017 ජුනි 04 වන දින අපගේ ශුද්ධාත්ම මංගල යැදුමේ දී ජේසු සමිඳුන්ගෙන් ලැබුණ පණිවුඩයෙන් උපුටා ගත් කොටස් කීපයක් 50 අංකය යටතේ මම සටහන් කළෙමි. එම දේශනයේ අවසන් ජේදය දැන් මම ඔබ හමුවේ තබමි. (ජේසු සමිඳුන් සංඝයේ ශ්‍රාවකයන් කීප දෙනෙකුගේ නම් සඳහන් කරමින් මා නැවත ක්‍රියාවට නැගීමේ වගකීමක් ඔවුන්ට පවරමින්) "ඇන්තනි, වියැකී යන පරඬලක් වෙන්න නොවෙයි, ඔබව තබල තියෙන්නේ. තව බොහෝ වටින දේවල් ඔබ තුළ ගැබ්වෙලා තියනවා එළියට ගන්නට, එමගින් තරුණ ජීවිත පෝෂණය කරන්නට. ඔබ හිතන්න

එපා, ඔබගේ කාර්යය දැන් නිමයි කියලා. මම ඔබට ජවය දෙනවා. මේ අය සූදානම් කරනව නම් කොතැන හරි කංඩායම්, ඔවුන්ට වචන කීපයක් හරි කමක් නැහැ කතා කරන්න. රෝගී තත්ත්වය තුළ මා ඔබව එක්තැන් කරල නැහැ. ඔබෙන් මට ගතයුත්තක් තිබෙනවා, තේරුණා ද පුතේ මං කියන දේ.? සැඟවෙච්ච මැණික ගල්පර හා ගැටෙමින් තව ඔපමට්ටම් කරන්න දේවල් තියෙනවා. අද පිරිහෙමින් යනවා තරුණ ජීවිත, ශිෂ්‍ය ජීවිත, ළමා ජීවිත. කුඩා කංඩායම් එකතු කරල කතා කරන්න."

2006 සිට ප්‍රථම දාසිය මගින් සිදු වන ජේසු සමිඳුන්ගේ මෙම ක්‍රියාවෙන් උපරිම ප්‍රයෝජන නෙලා ගත් තැනැත්තියකි, ශ්‍රින්ති කුරේරා සොයුරිය. ඇය හා සිය පවුලේ අය මුහුණ දුන් මනුෂ්‍ය බුද්ධියකින් නිරාකරණය කරගත නොහැකි පැටලුන නූල් බෝලයක් වැනි ගැටළු ජාලය මුළුමනින් නිරාකරණය කර ගැනීමට ඇය සමත් වූවාය. ඇය ඒ සඳහා දහස් වාරයකටත් වඩා මුලසුනට පැමිණෙන්නට ඇත. ජේසු සමිඳුන් ඇයට පවසන සියල්ලටම ඇය ඉතා නිහතමානිව කීකරු වූවාය. ඇයගේ එම ක්‍රියාකාරිත්වය අගයමින් ජේසු සමිඳුන් ඇයට පැවසූ සියල්ල සංඝයේ ශ්‍රාවකයන් හා බෙදාගන්නට ජේසු සමිඳාණෝ ඇය යොමු කළහ. දින තුන යැදුමේ දී 2018 මැයි 13 ඇය ඒ සියල්ල අප හා බෙදා ගත්තාය. ඒ පණිවුඩය මෙය යි.

"ඔබ ආ ගමන තුළ තමයි ජේසු බලාපොරොත්තු වන දේ තිබුණේ. කාට රිදුනත් කමක් නැහැ පුතේ, මේක කියන්න. හැම දෙයක්ම පවසල විමසල ජේසු කියන දේ කරමින් පිළිතුරු ලැබෙන තෙක් බලා සිටින මේ ගමන මා තෝරාගත් සමහර ශ්‍රාවකයින්ට එන්න බැරි වුණේ ඇයි? ජේසුස් කියන මැණික ඔබ ඇතුලේ තියෙනවා. ඒක සොයා ගන්න. තමා තමා දෙසම බලමින් තමා තුළටම ගොස් හැම සිද්ධියක් දෙස ඉවසීමෙන් මෙනෙහි කරන්න, ක්ෂණිකව නෙවි, ඉවසීම බලනවා. ජේසු මොනව හරි කරයි කියන එක ඇතුලේ තියෙනවා. ඔබ සොයාගත් ආකාරයට අනෙක් අයත් එකිනෙකා විවිධ වූ ජීවිත සිද්ධි තුළින් ජේසුව සොයාගෙන එන්න කියලා කියන්න. ජේසුව යම් කෙනෙක් පරීක්ෂා කරන්න ආවොත්, ජේසු දෙන්නේ පරීක්ෂණයක්මයි, පිළිතුරක් නොවෙයි. ඉවසීම කීකරුකම තුළ සැබෑ පිළිතුර එනවා. කීකරුකම අත්‍යවශ්‍යයි."

"මම මැය තුළින් කරන මෙම ක්‍රියාව ඔබ මේ තරම් විශ්වාස කළේ කොහොමද පුතේ? ඔබ දිනා ගත්තා, දිනා ගත්තා. කෙනෙක් ජීවිතයෙන් පසුව දිනා ගන්නා දේ ඔබ ජීවත් වෙලා ඉද්දීම දිනා ගත්තා. ජේසු ප්‍රසන්න ලොකුම දේ ඔබ අත්දුටු මේ හැම දේකටම හේතුව ඇයි මට මෙහෙම වුණේ කියල ඔබ අහපු නැති එක. ජේසුට අපි ඉඩ දෙනව නම් ඇතුලත නිශ්චල නම් උත්තරය ලැබෙනවා. ශ්‍රාවකයන් ලෙස මා කැඳවන මේ ප්‍රාණපරිත්‍යාගී ගමන ඔවුන් තේරුම් අරන් තියෙනවා ප්‍රමාදයි, එනිසා ගමන ඇවිත් තියෙනවා ප්‍රමාදයි."

"මා තෝරාගත් මේ සංඝයේ ප්‍රධාන දේ අත්තිවාරමයි. දැනට එයයි, සිදු වෙමින් පවතින්නේ. ඉදිරියේ දි ඒ අත්තිවාරම මත ගොඩනැගිල්ල සෑදෙනවා. එවිට කාගේත් අවධානය යොමු වන්නේ ගොඩනැගිල්ලේ අලංකාරය වෙතටයි. එවිට බොහෝ දෙනෙකුට අත්තිවාරම ගැන මතකයක් නැහැ. මේ සංඝය දැනට යමින් සිටින ගමනේ පේන්න වැඩ ගොඩක් නැහැ."

**2018 ජුනි 04 ශුද්ධාත්ම මංගල යැදුමේ දී**

"විශ්ව මැවුම්කරු විශ්වය දෙස නෙත් යොමා බලා සිටි මොහොතක්, මේ. මේ මොහොතේ ඔබ සැම මෙතැන එක්ව දෙවිඳුන් යදින විට ලොව පුරා තව විශාල ජනකායක් ඒ අය සිටින තැන සිට මොරගසන ආකාරය මා දුටුවා. මනුෂ්‍යයාට දෙවියන් වහන්සේ පිළිබඳව උන්වහන්සේගේ ක්‍රියාවලිය පිළිබඳව පූර්ණව විස්තර කරන්න අපහසුයි. ඒ ක්‍රියාකාරිත්වය සුවිශාලයි, මුළුමනින් තේරුම් ගන්නට නොහැකියි, මනුෂ්‍යයාට දී තිබෙන දශමයක ප්‍රඥාව තුළින්. ස්වාමින් වහන්සේට ඉඩ දීම කියන්නේ තමා තමාව නැතිකර ගනිමින් පූර්ණ හිස් භාවය තුළ ස්වාමිනී, මෙන්න මම, මගෙන් ඕනෑම දෙයක් ඔබ කරගන්න. මුළු ලෝකය පුරාම හැම කෙනෙකුටම මම තලෙන්තු දීලා තියෙනවා. ඒවා බලාපොරොත්තු නොවන අවස්ථාවල ඉදිරියට එනවා. සැඟවුණු කුසලතා තියෙනවා ඔබ හැම කෙනෙක් තුළම. අද මේ මොහොත වෙද්දී මුළු විශ්වයම ගවේෂණාත්මක තැනකයි මා තබලා තියෙන්නේ. එහෙත් කිසිවෙකුගේ නිදහස් කැමැත්තට අත තියලා නැහැ."

"එනිසා මා ප්‍රේමවන්ත දරුවෙනි, ප්‍රවේශම් වන්න, බිහිසුණු තැනකයි මේ මොහොතේත් ලෝකය පවතින්නේ. ඒ භයානක තැනින් එතෙර වන්නට ඔබ නිරන්තරයෙන් ස්වාමින් වහන්සේ සමග ජීවත් වන්න. ලෞකික ආශාවන්ගෙන් ඈත් වන්න. උන්වහන්සේ ඔබව මේ ලෝකයට එව්ව නම් උන්වහන්සේට ඕනෑ දේ කර ගන්නැයි කියලා ප්‍රාර්ථනා කරන්න. සැබවින්ම මා ඔබ සැමගෙන්

බොහෝ දේ කර ගන්නවා. මහා නිහතමානිකම තුළ තමයි ලෝකයේ ඉදිරි සැලැස්ම ගෙන යන්නට හැකි වන්නේ."

"ඉදිරියේ තව තවත් ගැටළු ප්‍රශ්න පැනනගිනවා. දෙවියන් සමග ගමන් කරනවායි කියලා දෙවියන් හා සම්පයි කියලා හැම දෙයක්ම අත ළඟටම ලැබෙන්නේ නැහැ. කටු පඳුරු අස්සෙන් බේරිලා මඟ සොයාගෙන යන්න සිදු වෙනවා. ඒක ලේසි වෙන්නේ නැහැ. ජීවිතයෙහි සියලු හැල හැප්පීම් මැද මේ ගමන යමු. මම ඔබ සමගම සිටිනවා. ඉදිරිය මීට වඩා භයානකයි. මේ දේශය පමණක් නොවෙයි, මේ මොහොතේ සිට මුළු විශ්වයම තියෙන්නේ පියාණන්ගේ මහා භයානක අඩිතාලමක. එනිසා මුළු ස්වර්ගයේම ජනතාව ශුද්ධවන්තයින් මේ පාපධාරී ජනතාව වෙනුවෙන් මුළු මැවීම වෙනුවෙන් පියාණන් ඉදිරියේ මේ මොහොතේ මහා මැදිහත්කමකින් යදිමින් සිටිනවා. මේ පොළොව මත සිටිමින් නුඹලාත් තිරන්තර යැදීමට සම්බන්ධ වෙන්න, ඇතුලාන්ත නිශ්චල තාවය තුළ.

(2018 ඔක්තෝබර් 20) "මනුෂයෙකු ලෙස මෙලොවට උපදින හැම ජීවිතයක්ම මගේ මැවීමක්. මමයි සියල්ලන්ගේ මැවුම්කරු. එනිසා මැවුම්කරුවාණන් පිළිබඳ විශ්වාසයේ සේයාවක් හෝ හැම ජීවිතයක් තුළම තිබෙනවා. එවැන්නක් නැතැ යි කියන්නේ පුහු අභිමානය නිසයි. ජීවිතයක උපරිම විඳවීමක දී හෝ බලාපොරොත්තු මුළුමනින් බිඳ වැටීමක දී හෝ ඔවුන් ඇතුලතින් මට මොරගසනවා."

**2019 ජනවාරි 10**

"ජේසුගේ ජිවිතයේ අත්තිවාරම දේව අම්මයි, ජේසුගේ ජිවිතයේ පරමාදර්ශය දේව මෑණියොයි" සිංහල කතෝලික පත්තරයෙන් මට කියවන්නට ලැබුන එවැනි අදහස් ගැන මා ජේසු සමිඳුන්ගෙන් විමසුවා. එවිට ජේසු සමිඳුන් ප්‍රථම දාසිය උපයෝගි කරගනිමින් මෙලෙස පැවසුවා. "ඇන්තනි, ඔවුන් එලෙස අගය කරන්නේ මාගේ මෑණියන්වයි. මගේ මෑණියන්ව අගය කිරීම ගැන මා සතුටු වෙනවා. පුත්‍රය, මගේ නිවැරදි දහම ලෝ වැසි සියල්ලන් සමග බෙදා ගන්න."

'දහම් නවෝදය' සංඝය සහභාගි කර ගනිමින් දැනට වසර විසි තුනකට ආසන්න කාලයක් පුරා ජේසු සමිඳුන් සිය දාස දාසින් මගින් සිදුකළ ක්‍රියාව ලොවට ප්‍රකාශ කිරීමේ පළමු සංඥාව නිකුත් කිරීමේ මොහොත ආසන්නව ඇත. එය නුදුරේදීම සිදු වනු ඇත. අපගේ හතරවන ප්‍රකාශනය, 'ශුද්ධාත්ම පිය සටහන්' (පළමු වන කොටස) නිම කිරීමේ මොහොත දැන් පැමිණ ඇත. මෙම ප්‍රකාශනය නිම කරන්නට පෙර මා විසින් ඔබට කිවයුතු කරුණු කිහිපයක් ඇත. එයින් පළමු වැන්න මෙය යි.

මෙම ප්‍රකාශනයේ සඳහන් ජේසු සමිඳුන්ගේ අනාවරණයන් එලෙසම ඉටු වන විට ශ්‍රිලංකා කතෝලික සභාව මෙවැනි ප්‍රශ්නයක් නගනු ඇත. 'දහම් නවෝදය' සංඝය මෙවලම කරගෙන ජේසු සමිඳුන් කරන කාර්යයන් කතෝලික සභාවෙන් සඟවා තැබීමට එතුමන්ට අවැසි වී ද? එලෙස කියන්නට මට නොහැකිය. 1996 සිට ම අප අතර සිදු වූ ක්‍රියාවන් මම අති ගරු නික්ලස් මාකස් ප්‍රනාන්දු අගරදගුරු තුමාට විටින් විට දැන්වීමි. එතුමාගෙන් ඒ ගැන කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. "පූජක පිය නික්ලස් හමු වන්නට යන්නැ"යි ජේසු සමිඳුන් අපට පවසන සැම විටම මා එතුමාට එය දන්වමින් ඒ සඳහා දිනයක් ඉල්ලා සිටියත් එතුමාගෙන් එයට ද කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. "මාගේ ලාබාළ දාසිය සමග පූජක පිය නික්ලස් හමු වන්නට යන්න. ඇය උපයෝගි කර ගනිමින් මගේ ඉදිරි සැලසුම් මම ඔහුට දන්වන්නෙමි"යි ජේසු සමිඳාණෝ පැවසූහ. මා එය එතුමාට දන්වා ඒ සඳහා දිනයක් ඉල්ලා සිටියත් එයට ද කිසිදු ප්‍රතිචාරයක් නොවීය. එතුමා අගරදගුරු පදවියෙන් විශ්‍රාම ගත් පසු "පූජක පිය නික්ලස් විගස හමු වී මා කළ සියල්ල ඔහුට පවසන්නැ"යි ජේසු සමිඳුන් ළාබාල දාසිය මගින් මට පැවසූ බැවින් කලින් නොදන්වා 2003 අගෝස්තු 25 වන දින මම 'එම්මාවුස්' නිවසට ගියෙමි. එහෙත් එතුමා මේ කිසිවකට සවන් දීමට කැමැති නොවීය. අලුත් එඬේරකු පත් වී සිටින නිසා තමා එසේ කිරීම නුසුදුසු ක්‍රියාවක් ලෙස එතුමෝ දුටහ.

නපුරාට ප්‍රබලව ක්‍රියා කරන්නට මහෝත්තමයාණන්ගෙන් අවසරය ලැබෙන වසර තුනහමාරක් ගැන පැහැදිලි කිරීමක් කළ යුතු යැයි සිතමි. ඒ සඳහා 'ඥානාර්ථ ප්‍රදීපය' 1996 ජුනි 09 ගරු පී. කේ. එන්. අධිකාරි පිය තුමා ලියා ඇති ලිපියෙන් කොටසක් උපුටා දක්වන්නට කැමැත්තෙමි. "---- 1884 ඔක්තෝබර් 13 වන දින 13වන ලියෝ සශුද්ධියුරාණන් දර්ශනයක් මගින් ශ්‍රවනය කළේ යක්ෂයා සහ ඔහුගේ දූතයන් විසින් දෙවියන් වහන්සේ හා කළ

සාකච්ජාවයි. යක්ෂයා හා ඔහුගේ දූතයෝ දේව විශ්වාසය ලොවින් තුරන් කරන බවට ද පාතාල ලෝකයේ බලය ලොව පුරා තහවුරු කරන බවට ද වහසි බස් දෙඩූහ. දෙවියන් වහන්සේ පුරාණ ගිවිසුමේ ජෝබ් පරික්ෂා කිරීමට ඉඩ සැලසූ ලෙස ලෝකය ම පරික්ෂා කිරීමට ඉඩ දෙන ලෙස ද ඔවුහු ඉල්ලා සිටියෝය. යක්ෂයාට දෙවියන් වහන්සේගේ අවසරය ලැබිණි. විද්‍යාවෙන් හා ශිල්ප ක්‍රමයෙන් මානවයා දියුණු වූ සමයක් වන විසි වන සියවස ඔහු ඒ සඳහා යොදා ගත්තේය. මේ දර්ශනයෙන් පසු ලියෝ පාප් තුමා 'අති දූත මිඛායෙල් තුමෙනි සටනේ දී අප ආරක්ෂා කළ මැනව' යන යාච්ඤාව ලොව පුරා කියන ලෙස ඉල්ලා සිටියේය. ඉන්පසු ලූසිෆර් හා ඔහුගේ දූතයෝ තමන් හට කැප වූ ලෝ වැසියන් සිය ග්‍රහණයට ගෙන ඔහුගේ ජයග්‍රහණය ඉෂ්ඨ කර ගැනීම සඳහා මං යෙදූහ. අරගල, භූචලන, ජල ගැලීම්, සුළි සුළං, රුධිරය සිඳ හෙළීම් ආදි ක්‍රියා නොමැති රටක් අද නැති තරම්ය. ලක්දිවට ද සතුරා අත තබා ඇත."

"---- සතුරා බලසම්පන්න වූ තරමට දෙවියන් වහන්සේ ද ඊට සරිලන ලෙස විශ්වාසය සුරකින ආත්මයන් ලොව බිහි කළ සේක. එම සටන දේව දරුවන්ගේ හා සතුරු දරුවන්ගේ සටනක් බව මැජගෝරයේ දර්ශන දුටු දරු සය දෙනා පවසති. සතුරා හට ලොව පෙළීමට අවසර ලැබුණ ද ඔහු නොදන්නා කරුණු තුනක් ගැන දෙව් මවුන් සඳහන් කළ බව මැජගෝරයේ මිර්ජානා පවසයි. ඉන් පළමු වැන්න, දෙව් පියාණන් තම විශ්වාසකයන් රැක ගැනීමට හා ඔවුන්ට සතුරු අනතුරු ඇඟවීමට දේව පොරොන්දුවේ ස්ත්‍රිය වන දෙව් මවුන් විවිධ දර්ශන මගින් මෙ ලොවට එවා වදාරා ඇති බව ය. දෙ වැන්න වනුයේ, මෙතෙක් ලොවට දානය නොකළ තරම් වරප්‍රසාද රාශියක් දෙවියන් වහන්සේ විසින් ලොව පුරා වගුරුවා තිබීම ය. තෙ වැන්න වනුයේ, කලට ඔබින විශ්වාසික ආත්මයන් මෙ ලොවට යහමින් එවමින් සතුරා ගෙනෙන මොන යම් ආපදාවක දී පවා නොසැළී සිටීමට ඔවුන්ට වරප්‍රසාද දානය කරන බව ය. යක්ෂයාගේ බලය තහවුරු වන විගස ම ඔහුගේ පරාජය හා දේව ජයග්‍රහණය ඇති වනු නියත ය."

සංඝයේ එඬේරා හැටියට මෙය ද ලොකු වගකීමකින් යුතුව මා ඔබට පැවසිය යුතුය. වසර 25ක් පුරා ජේසු සමිඳුන්ගේ දාස දාසින් උපයෝගි කර ගනිමින් සිදුවූ මෙම ක්‍රියාවලියේ දී ජේසු සමිඳුන්ගේ මග පෙන්වීමක් පතා පැමිණෙන කිසිවෙකුගෙන් ඒ සඳහා කිසිදු මුදලක් හෝ පඬුරක් ලබා නොගතිමු. "මගේ දහම නොමිලයේ දෙන්න, නොමිලයේ ලබන්න." පමණක් ම සිදු විය. මෙම ක්‍රියාවලිය පුරා ජේසු සමිඳුන් අපට තැබුවේ ද සරල භාවය හා දුගී භාවය තුළ ය. වැඩියෙන් ලැබෙන අවස්ථා පැමිණෙන්නට හැකි බව ද එවිට දැනට ගතකරන සරල ජීවිතය ම ගතකරමින් ඉතිරි සියල්ලෙන් දුගීන් ගැන බලා ගන්නා ලෙස ද එතුමෝ පැවසූහ. මෙතෙක් ද එවැනි අවස්ථාවක් උදා නොවිය. "දුගී භාවයේ ධනයෙන් පිරී ඉතිරේවා!" යන්න අප ගැන ජේසු සමිඳුන්ගේ පැතුම යි.

'ශුද්ධාත්ම පිය සටහන්' (පළමු වන කොටස) ගැන මෙසේ පවසමි. ජේසු සමිඳුන් මේ සියලු අනාවරණයන් ප්‍රකාශ කළේ සිංහල භාෂාවෙනි. ජේසු සමිඳුන් සිංහල භාෂාව උපයෝගි කර ගැනීමේ දී යොදා ගත් භාෂා ශෛලිය එලෙසම රැක ගැනීමට මම ක්‍රියා කළෙමි. ජේසු සමිඳුන්ගේ දාස දාසින්ගේ මුවින් නික්මුණු කලාත්මක සුන්දර වැකි රැසක් මෙහි ඇත. ඒ සියල්ල සමිඳාණන් වහන්සේගෙන් ම ය. ඒවා අලංකාර කරන්නට මම කිසිවක් නොකළෙමි. 'දහම් නවෝදය' සංඝයේ එඬේරික වගකීම පැවරී ඇති ජී. ජේ ඇන්තනි වන මම මෙම ප්‍රකාශනය ලෝකයට දීම පිළිබඳ ජේසු සමිඳුන් මට පැවරූ වගකීම ඉටු කිරීමේ දී අවංකව හා සත්‍යවාදිව ක්‍රියා කළෙමි.

# 52 "මාගේ රහස් නැණවතුන් ද බලවතුන් ද ලජ්ජා වන පිණිස බාලයන් තුළින් අනාවරණය කරමි."

ශුද්ධාත්ම පිය සටහන් පළමු වන කොටසට **ඌණ පූරණයක්** වශයෙන් මෙම පරිච්ජේදය සකසන්නට මම අදහස් කළෙමි. ඊට හේතු වූ කරුණු තුනක් ඇත. සියල්ල නැවත අධ්‍යයනය කිරීමේ දී මා අතින් මග හැරුණු කොටස් කිපයක් ඇත. මා සටහන් කළත් ප්‍රමාණවත් ලෙස විස්තර නොවූ තැන් කිපයක් ඇත. මෙලෙස ඌණ පූරණයක් ලෙස දෙනු පිණිස මා සිතා-මතා ම පමා කළ කරුණු කිපයක් ඇත.

**1996 ජුනි 27**

"1991 සිට මම මැය තුළින් කළ කී සියල්ල ශුද්ධාත්ම පිය සටහන් යනුවෙන් නම් කරමි. නුඹලා කනින් ඇසූ ඇසින් දුටු සත්‍යය පමණක් ජනතාවට ප්‍රකාශ කරන්න."

**1997 ජූලි 12**

"මා ප්‍රේමවන්ත දරුවෙනි, මිල මුදලින් නොව යහපත, කරුණාව, කීකරුකම, පිරිසිදු සිත, ප්‍රේමයේ ජීවිතය, දයාව, සමගිය මේ සියල්ලකින් ම පිරිපුන් වන්නා නියම ධනවතෙකි. යම් කෙනෙක් මිල මුදලින් මා ධනවතෙක් යැයි සිතමින් උදම් අනන්නේ නම් ඔහු කෙටි දුරකින් විනාශය උදා කර ගනී. අසරණයන්ගේ සරණය වන්නා භාග්‍යවන්ත වන්නේය."

**1997 ජූලි 14**

"දරුවෙනි, අද ධනයට තණ්හාව නිසා මගේ ජනතාව නොමගට ගොස් ඔවුන්ගේ ඇස් අන්ධ ව ඇත. අද තම මව්පියන් අමතක කරන දරුවෝ ද වෙති. නුඹලාට මම මව්පියන් තෝරා දුනිමි. එහෙත් ධන තණ්හාව නිසා ඇස් අන්ධව සිටින දරුවෝ තම මව්පියන් නොහඳුනති. මම බලා සිටිමි. මව්පියවරුන් මංමාවත්වල අසරණ වී සිටින ආකාරය. දරුවෙනි, නුඹලාට දුන් මව්පියන්ට එලෙස නොකරන්න. නුඹලා නුඹලාගේ මව්පියන්ට සලකන ආකාරය දෙස මම බලා සිටිමි. නුඹලාගේ උතුම් ගුණාංගයක් වන්නේ නුඹලාගේ මව්පියන් රැක බලා ගැනීම යි. --- මම නුඹලාගේ දරුවන්ට අතිශයින් ආදරය වෙමි. නුඹලා ද නුඹලාගේ දරුවන්ට ආදරය කරන්නාක් මෙන් අන් දරුවන්ට ද ආදරය කරන්න."

**1997 දෙසැම්බර් 01 සවස 6.45 ට**

ජේසු මගෙන් (සුජීවාගෙන්) ඇසුවා නුඹට විඳවන්න අමාරු වේදනාවක් මා දුන්නොත් ඒ ගැන නුඹ මොකද කියන්නෙ කියලා. මා කීවා කමක් නැහැ, මොන වේදනාවක් දුන්නත් මම බාර ගන්න කැමතියි. මම සතුටින් බාර ගන්නම් කියලා. ඉන්පසු ජේසු කියනවා, එකක් නොවෙයි ගොඩාක් රෝග දුන්නොත් කියලා. එවැනි රෝගවලින් පෙලෙන බොහෝ දෙනෙක් ලොව සිටිනවා. කමක් නෑ ජේසු, මම බාර ගන්නව කියල මම කීවා. නුඹගේ මවට ඒ රෝග සියල්ලම දුන්නොත්? ජේසු එසේ ඇසුවා. මා කීවා අනේ ජේසු ඒක නම් කරන්න එපා, ඒ රෝග සියල්ලම මට දෙන්න, ඒ සියල්ලම මම සතුටින් බාර ගන්නම් කියලා.

**1997 දෙසැම්බර් 04 උදේ 5.55 ට**

මම ඇසුවා අපේ භාෂාවෙන් ශුද්ධ කියන වචනය ජේසු එදා කතා කළ භාෂාවෙන් කොහොමද කියන්නේ කියලා. ජේසු කීවා කාදෝෂ් කියලා. දෙවියනි කියන්නේ එලොයි කියලත් මට කියලා දුන්නා. ජේසු නැවත මගෙන් ඇසුවා නුඹට රෝගයක් දුන්නොත් නුඹ මොකද කරන්නේ කියලා. ඔබ දෙන දේ මම බාර ගන්නම් කියලා මා කීවා. මා නුඹට භයානක රෝගයක් දුන්නොත්? මා එලෙස කියද්දි නුඹ බය වුණා නේද කියලා මගෙන් ඇසුවා. ජේසු කීවා බොහෝ අසනීපවලින් ලෝකයේ හුඟ දෙනෙක් විඳවනවා. නුඹත් ඒ හැම දෙනා වෙනුවෙන් මා දෙන රෝග බාර ගැනීම අවශ්‍යයි කියලා. මා කීවා මුළු ලෝකය වෙනුවෙන් මම ඒ සියල්ල බාර ගෙන එදා ජේසු කුරුසිය මත වේදනා වින්ද වගේ මමත් විඳවන්න කැමතියි කියලා.

(ඊට පසු අවස්ථාවක මේ පිළිබඳව ජේසු සමිඳුන් කතා කිරීමේ දී පැවසුවා, සුජීවා එලෙස තම කැමැත්ත ප්‍රකාශ කළ මොහොතේ ජේසු සමිඳුන් මනුෂ්‍යයින් විඳින සියළුම රෝගවලින්

දශමයක් බැගින් ඇය තුළ තැබූ බව, එනිසා ඇය ජීවත් වන තුරාම රෝග වලින් මහත් පීඩාවක් විඳින බව.)

(මා ශුද්ධාත්ම පිය සටහන් පළමු වන කොටසේ දී ඥානකාන්තිය යන වචනය නැවත නැවත යෙදුවත් ජේසු සමිඳුන් අපගේ තුන්වන ඥානකාන්තියේ දී ප්‍රකාශ කළේ "මගේ සහභාගි වීමේ සභාව" යනුවෙනි. පස් වන සහභාගි වීමේ සභාවේ දී බව්තිස්මය අලුත් කරන්නට ජේසු සමිඳුන් දුන් පාඨය නම් කළේ "අභිෂේක වාක්‍යය" යනුවෙනි.)

**1998 ජනවාරි 26**

"මහා ජාතිය මහා ආගම කියමින් උදම් අනන මහා මානය නිසා නුඹලාගේ දේශය වියවුල් ව ඇත. නුඹලාගේ මහා ජාතියේ තෘෂ්ණාව දේශය වියවුල් කර ඇත. ගෞතම බුදුන් එවැනි විෂම අදහස් ලොවට දේශනා කළේ නැත."

**1998 ජනවාරි 30**

"මගේ කුරුසියේ ගමන් මඟ මුල් කරගෙන ඔබ මෙනෙහි කරන ස්ථාන 14 ප්‍රතිමා අබියස පමණක් ම නොව ඔබගේ ඇතුළු ගෙට වැද ඒ ස්ථාන ඔබගේ සිතෙහි මවා ගෙන රහසින් කරපන්න. රහසින් ඔබ කරන දෙය දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට විපාක දෙන සේක."

**1998 පෙබරවාරි 26 අළු බදාදා**

(මෙය අපගේ පස් වන සහභාගි වීමේ සභාවේ දී සිදු වූවකි. ආසිරි ගැන්වූ පරණ ගොබ් කුරුස සොයාගත නොහැකි පසුබිමක ජේසු සමිඳාණෝ ඩිල්ෂාන්ගේ මුවින් මෙලෙස පැවසූහ.)
"ගසක වියලි කොළ ස්වල්පයක් රැගෙන එය දවා එහි අළු පුංචි බඳුනකට රැස්කර ගන්න. ආසිරි පැන් බිඳක් ඊට මුසු කරන්න. අළු බඳුන මේසය මත තබන්න. මොවුන්ට පවසන්න තමාට මනස්ස්ථාපනයක් අවශ්‍යයි කියා පිළිගන්නා අය පැමිණ අළු ස්වල්පයකින් නලලේ කුරුසිය සලකුණු කර ගන්නා ලෙස ඉන්පසු සියල්ලන් එක්ව අඩ හෝරාවක් මගේ ජේත්සමෙනි යාච්ඤාවට සහභාගි වන්න. ඉන්පසු විගස අළු සෝදා හරින්න. රහසින් දකින පියාණන් වහන්සේ විපාක දෙන සේක."

**1998 පෙබරවාරි 28**

"මගේ කුරුසියේ වේදනාව මා පොරොන්දු වූ පරිදි මා තෝරාගත් මගේ සොයුරු සොයුරියන්ට මම විවෘත කරන්නෙමි. එය මගේ ජනතාව රැස් කිරීමේ හා ඔවුන් මනස්ස්ථාපනයට පැමිණ වීමේ බල ශක්තියක් බවට ප්‍රකාශ කිරීමට කටයුතු කරන්නට මම කැමැත්තෙමි. දැන් ඇතුලෙන් සිදුරු වී ඇති මගේ වණ කැළැල් නුදුරු දිනක නුඹලාට පෙනෙන පරිදි ඒවා නැවත විවර වන්නේය. 'දහම් නවෝදය' තුළ සැම දෙනා වේදනාවෙන් ප්‍රතිකාර කිරීමට සැරසෙනු ඇත. එවිට ඔවුන්ට දැනුම් දෙන්න කිසිවෙකුට ලොවේ නිෂ්පාදිත කිසි ම ඖෂධයක් මගින් එය වළක්වා ගත නොහැකි බව."

"විපතට පත්ව සියල්ල අහිමි වී අනාථ කඳවුරු තුළ දුක් විඳින ඔවුන් වෙනුවෙන් ඔබේ සේවය ඉටු කරන්න. එබැවින් මගේ නවෝදයේ දරුවෙනි, නුඹලා හැකි අයුරින් ඔවුන්ගේ සැප දුක් බැලීමට ද මගේ නාමය ඔවුන්ට ප්‍රකාශ කිරීමට ද නුඹලා යා යුතු කාලය පැමිණ ඇත. ඒ යන කල මුදල් වත් ඇඳුම් වත් රැගෙන යාම ගැන කරදර නොවන්න. නුඹලාට ද ඒවා නැති බව මම දනිමි. ඔවුන්ට ලැබෙන කෑම අනුභව කරමින් ද ඔවුන් සමග ඔවුන් ලෙස ම පැදුරු කබලක නිදා ගනිමින් ද කාලය ගත කිරීමේ අවශ්‍යතාවය පැමිණ ඇත්තේය. මන්ද, මා වඩින්නේ එවන් ජීවිත රස්තියාදුවේ ළත වෙන ජීවිත තුළට ය. එබැවින් ඔබ එහි යන විට නුඹලාගේ සොයුරු ජෙරාඩ්ට දර්ශනය වූ ආකාරයෙන් නැවතත් මම ලොව පුරා ක්‍රියා කරන්නෙමි. එමගින් සත්‍යය අවබෝධ කර, විශ්වාසයේ ජනතාවට මගේ උත්ථානය සනාථ කිරීමේ කාර්යය නැවතත් මා හට සිදුකිරීමේ කාලය එළඹ ඇති බැවින් ඔබ ගොස් මගේ නාමයෙන් දුක් විඳින ඔවුන්ගේ දුක සැප බලා මගේ නාමය ඔවුන්ට පවසන්න."

**1998 මාර්තු 22**

"මේ ගමන අද ඇරඹෙන හෙට නිමා වන ගමනක් නොවන බව මම නුඹලාට ප්‍රකාශ කරමි. මෙය ක්‍රි.ව. 1974 සිට ඇරඹෙන ගමනකි. ----- මගේ සංඝයේ මගේ ප්‍රධාන මිත්‍රයා වූ පේදුරුට මම එදින පැවසීමි. මට සතුරුකම් කරන්නන් අතට මා පත් වූ විට ඔහු ද මා ප්‍රතික්ෂේප කරන බව. එය එසේ ම සිදු වූ බව ඔබ ද පවසනු ඇත. එහෙත් එය යහපත නමැති ප්‍රතික්ෂේපය යැයි මම ඔබට පවසමි. ජේසුස් මගේ ගුරු දේවයාණන් යැයි එදා ඔහු පැවසුවේ නම් ඔහුත් මා සමග කුරුසියේ දිවි පුදන්නට නියම වී තිබිණි. ඇරඹෙන මගේ සභාවට එඬේරික

වගකීම ඉටු කිරීමට ද මගේ දහම ප්‍රකාශ කිරීමට ද මගේ නාමයට සාක්ෂි දැරීමට ද ජේදුරු ජීවත් විය යුතු ම ය. එය මගේ පියාණන්ගේ කැමැත්ත යි. එනිසා එදා සිදු වුයේ යහපත නමැති ප්‍රතික්ෂේපය යැයි මම ඔබට පවසමි.

"කවුරු ප්‍රතික්ෂේප කරතත් මගේ නවෝදයේ අවසානය දක්වා මා මෙය ස්පර්ශ කරමින් මගේ ශුද්ධාත්මානුභාවයෙන් මේ කටයුතු දිගට ම කරන බව මම ප්‍රකාශ කරමි. එමෙන්ම මා මෙලෙස ප්‍රකාශ කළ සෑම දෙයකට ම නුඹලා සාක්ෂි දැරිය යුතුය. එබැවින් මා ප්‍රකාශ කළ සත්‍යය උදෙසා පූජා වීම මහත් භාග්‍යයකැ යි නුඹට සතුරුකම් කරන්නා ඉදිරියේ ප්‍රකාශ කරපන්න. එවිට නුඹට සතුරුකම් කරන්නා ද නුඹ ද දෙවි සමිඳාණන් වෙත හැරී උන්වහන්සේට ප්‍රශංසා ගී ගයන මොහොතේ මම නුඹලා ආසිරි ගන්වමි."

**1999 අප්‍රේල් 19**

"මගේ වචන උගතුන්ගෙන් ද සමතුන්ගෙන් ද සඟවා බාලයන්ට අනාවරණය වන කාලය ආරම්භ වුයේ ක්‍රි.ව. 1900 ආසන්නයේ සිට ය. මගේ වචන මෙලෙස නික්මෙන කාලය ආරම්භ වුයේ 1991 වර්ෂයේ සිට ය."

**1999 අප්‍රේල් 20**

"මා පත් කළ මෙම සංඝය එකතු වන විට නිසි මොහොතේ එකතු විය යුතුයි. එඬේරාට කීකරු විය යුතුයි. ඔහු නුඹලාගේ එඬේරා ලෙස පත් කළේ මම යි. එහෙත් ඔහු තුළිනුත් දුර්වලකම් දකින්නේ නම් නැගී සිටින්න, එතැනම. එය සමතයකට එන තුරු වාද කරන්න. එදා මගේ සබයේත් එවැනි වාද තිබුණා."

"මගේ පූජක පුතණුවන් අතරින් කවුද, ජරාජීර්ණ මුඩුක්කුවට ගොස් ඔවුන්ට නිසි අවබෝධය ලබා දීමට කටයුතු කළේ? කවුද, දුප්පතුන්ට අත දීමට කටයුතු කළ පූජකවරයා? කවුද මාවතේ **<u>අතරමං</u>** වී සිටින යාචකයාට නිසි මග පෙන්වූ පූජකවරයා? අද කෑමට යමක් නොමැතිව නිරාහාරව සිටින ජනතාව කොතෙක්ද? කුසගින්නෙන් වැළපෙන දරුවන්ට ආහාරයක් ලබා දෙන්නට නොහැකිව ළතැවෙන මව් පියවරුන් කොතෙක්ද? අද මගේ බොහෝ පූජක පුතණුවන් සුඛෝපභෝගී ලෙස ජීවිත ගතකරනවා. මේකද කතෝලික සභාව තුළ තිබිය යුතු ගුණාංගය? අද නොයෙක් කෑම ජාති සමග නොයෙක් බීම ජාති සමග භෝජන සංග්‍රහය ඔවුන් භුක්ති විඳිනවා. දරුවෙනි, ඒ නිසයි මම බොහෝ පූජක පුත්‍රයින් ගැන වේදනාවෙන් කතා කරන්නේ. එසේ නොමැතිව මා ගොඩනැගූ මේ සභාවට මා නිග්‍රහ කරනවා නොවෙයි."

**1999 අප්‍රේල් 22**

"පළමුවෙන් තමා තමාව දකින්න. තමා තමාගේ පාපයෙන් මිදීම තමයි තමාව ආරක්ෂා කර ගැනීම. එසේ නම් තවත් කෙනෙකුගේ වැරදි ගැන සොයන්නට කලින් තම දෙඇස් යොමුකර ගත යුත්තේ තමා දෙසයි. පළමුව තමා දෙස යි බැලිය යුත්තේ. ඉන් පසුව යි අන් අය දෙස බැලිය යුත්තේ. මා තෝරා ගත් සංඝයේ සිටින ඔබ තුළ මේ තත්ත්වය අනිවාර්යයෙන්ම පැවතිය යුතුයි. මා එන්න පුළුවන් සිඟන වෙසින්, වැරහැලි ඇඳගෙන, පිටතින් බලද්දී දුගඳ හමන තත්ත්වයෙන්, ඔබ අබියසට මා එලෙස එන්න පුළුවන්. කවුද මාව ප්‍රතික්ෂේප කරන්නේ කියා මා බලන්න පුළුවන්. මා නැණවතෙකු ලෙස, පුංචි දරුවකු ලෙස, ධනවතෙකු ලෙස, අනාථයෙක් ලෙස එන්නට පුළුවන්. මට නොයෙක් විදියට වෙස් ගන්න පුළුවන්, මිනිස් චරිත තුළින්. එලෙස මම ඔබ සියල්ලන් පරීක්ෂණය කරනවා."

"මා මැය තුළින් මෙලෙස ක්‍රියා කිරීම අරඹා දැන් වසර නවයක් පමණ වෙනවා. මැයව පරීක්ෂණය කොට මේ ක්‍රියාව කාගෙද කියල නිවැරදිව අවබෝධ කරගත් සමහරුන් දැන් නැවත මෙය ප්‍රතික්ෂේප කරනවා. ඔවුන් දකින්නේ මෙවැනි දේ විය යුත්තෙ ඔවුන් සිතන පතන තැන්වලින් කියලා. එය වැරදියි. මගේ රහස් නැණවතුන් ද බලවතුන් ද ලජ්ජා වන පිණිස බාලයන් තුළින් අනාවරණය කරමි. අන්ත මෝඩයින් තුළින් පවා ක්‍රියා කරන්නට මට හැකියි. ඉදිරියේ ඔබට දකින්න පුළුවන් වෙයි, මා යාචකයින් තුළින් පවා ක්‍රියා කරන බව, අන්ත පව්කාරයින් තුළින් පවා මා ක්‍රියා කරන බව. එදා තිබූ පරිසි වාදයමයි, අදත් මේ යුගයේත් එය අඩු වී නැහැ."

**1999 අප්‍රේල් 23**

"මේ කාලයේ නපුරා වියරු වැටිලයි සිටින්නේ. එනිසා ඔබ හැම කෙනෙක්ම හැම මොහොතකදීම වචනයක් පවසද්දී හැම වචනයකටම සවන් දෙද්දී හැම ක්‍රියාවක යෙදෙද්දී කල්පනාකාරී වන්න, එඩිතර වන්න. මා වෙනුවෙන් යන මේ ගමන තුළ ඔබ ඝාතනය වුණත් ශුද්ධ භාවය අත්දකිනවා. ඔබ බිය වන්නට එපා. ඔබට ගල් ගසන්නට පුළුවන්; ඔබට නින්දා අවමන්

කරන්නට පුළුවන්. ඔබ මැරුණත් ඒ මරණයෙනුත් එලෙස මැරුණු තැනිනුත් ශුද්ධ භාවය අත්දකිනවා.''

**1999 අප්‍රේල් 25**

"දිව්‍ය සත්ප්‍රසාදය තුළ මා ජීවමානයි. දිව්‍ය සත්ප්‍රසාදය පවිත්‍රව පැමිණෙන අයට පමණක් නොවෙයි, අද මං මාවත්වල අසරණව සිටින දුගී යාචකයාට පවා ඔබ අතින් ලබා දිය යුතුයි. ඔවුන් අතරට ගොස් ඒ සඳහා ඔවුන් සූදානම් කළ යුතුයි. ඔවුන් වැළපෙමින් මනස්ථාපනය වනු ඇත. ඒක තමා ඔබ මට කරන උතුම්ම සේවය. එය තමයි නියම පූජකවරය. අද බොහෝ පූජකවරු එදා යුගයෙ වගේමයි. අද කාසිපනම් කානික්කාවල බොහෝ පූජක ජීවිත තුරුල් වෙලා. බොහෝ අල්ප දෙනයි මේ දුගී දුප්පත් ජනතාවට මිල මුදලෙන් ආධාරයක් කරන්නේ. ශුද්ධ භූමි ගොඩනැගීම නොවෙයි මට අවශ්‍ය වන්නේ. මට අවශ්‍ය වන්නේ මේ දුගී ජීවිත ගොඩනැගීමයි. තමා අතට ලැබෙන දෙයින් ඒ දුගීන් ජීවත් කරවනවා නම් ඒකයි නියම පූජකවරය.''

**1999 ජූලි 26**

"මා තෝරාගත් එඬේරාත් සංඝයේ ශ්‍රාවක පිරිසකුත් බිහි කරන්නට මා මීට වසර විසි හයකට පමණ පෙර උපයෝගි කරගත් පුබුදු සංඝය අද ඔබ නොමැතිව ළත වන්නේය. මොන අයුරකින් හෝ ඔබ ව ඒ තුළ රඳවා ගැනීමටත් ඔබගේ දේශන ඔබගේ ක්‍රියාකාරීත්වය ඔබගේ ප්‍රේමය ඔවුහු ඉතා ඕනෑකමින් පතති. ඔවුන්ගේ පාපය ඔවුහු පිළිගනිති. ඔබ ඔවුන්ට සමාව පතන්න. මන්ද ඔබත් ඔවුනුත් එක ම ජනතාවක් බැවිනි. ඔබගේ යාච්ඤාව තුළ ඔබ ඔවුන් ව නිදහස් කරන්න. ඇනුම් පදයෙන් යුතුව ඔබට විරුද්ධව අත් එසවූ අය අද එය ඔබට ආදරයේ දෑතක් කර ඇත්තේය. මා පෙර ප්‍රකාශ කළාක් මෙන් ඔබ සිටිය යුත්තේ එහි ය. එහෙත් මා ඔබ ගෙන ආ ගමනේ නිවැරදි භාවය ඔවුන් පිළිගන්නා තුරු ඔබ ඔවුන්ගෙන් ප්‍රවේශම් වන්න. ඔබ පර්වතයක් මෙන් නොසැලී සිටින්න. මන්ද ලෝකය මොන ආකාරයේ වෙතත් ඔබගේ ගමන් මඟ නිවැරදි බැවිනි.''

**2001 ජුනි 02**

(එම දිනය යටතේ ඇති සටහනට මේ වැකිය ද එක් විය යුතුය.) "ධර්මය අධර්මය අතර යුද්ධයේ මූලාරම්භය නුඹලාගේ දේශයෙන් ය.''

**2001 ඔක්තෝබර් 31**

(එම දිනය යටතේ ඇති සටහනට මෙය ද එක්විය යුතුය.) "ලෝකයේ උසස් ම රට යැයි ධනවත්ම රාජ්‍ය යැයි උඩඟු ලත් ඒ රාජ්‍යය බිඳ වැටෙන මොහොත ළංව ඇත. ඉන්පසු වතිකානය මුළුමනින් සෙලවෙනු ඇත. රාජ්‍ය නායකයින් රැසක් ඝාතනය වනු ඇත.

**2006 මාර්තු 09**

"කුඩා ගම්මානයකින් ආරම්භ කරමින් නොගැළපෙන චරිත දෙකක් එකට එකතු කරමින් ඒ දෙමව්පියන් උපයෝගි කරගෙන මහා එලයක් මේ දේශයට මම සඟවා දුන්නෙමි. ඒ ඇන්තනි නම් මනුෂ්‍යයෙක් ය. ඔහු මහා වෘක්ෂයක් වැව්වේය. ඒ වෘක්ෂයේ මුදුන ඔහු තරණය කරමින් සිටී. ස්වාමීන් වහන්සේ වන මම මෙසේ පවසමි. මේ සරුවපිත්තල ලෝකයක්ය, ගෞතමගේ දර්ශනයෙන් පෝෂණය නොලබන දේශයක් ය, ගාන්ධි වැනි ප්‍රබල චරිත උදුරා දැමූ ලෝකයක් ය. අහෝ ! මේ ලෝකය ශාපයක් ම ය. ඒ ශාපයේ අඳුරු වලාව මැද කුඩා ආලෝකයක් මම දකිමි. ඒ ආලෝකය මැද ඇන්තනි නම් මනුෂ්‍යයකු ද ඔහු වටා සුළු පිරිසක් ද මම දකිමි. මගේ ශ්‍රාවක දරුවෙනි, ඔබ මෙලෙස යදින්න. දයාබර පියාණෙනි, ඔබගේ ප්‍රේමයට කොන්දේසි නොමැත. එය පව්කාරයා ගැළවීම දක්වා ගෙන යන ප්‍රේමයක් ම ය. ඔබ සැම මා අබියස මෙසේ පවසන්න. ස්වාමිනි අපි පාපි මනුෂ්‍යයෝ වෙමු. අපට නිසි මඟ පෙන්වුව මැනව. ඔබගේ විරුද්ධකාරයාගේ භයානක උවදුරුවලින් අප මුදා ගත මැනව. මේ ලෝකයේ ඇති කුරිරු බිහිසුණු බව අපට පෙන්වා වදාළ මැනව. අහෝ! මරියාවෙනි, අප සඳහා මැදිහත් වුව මැනව. ස්වාමීන් වහන්සේගේ අපෝස්තුළු වරුනි, අප උදෙසා යාච්ඤා කළ මැනව. අහෝ! අග්‍ර දූත මිඛායෙල් හා රෆායෙල්වරුනි, අපගේ සහයට වැඩිය මැනව.''

**2008 ජනවාරි 07**

" යාච්ඤාව කඩුවක්. පළමුවෙන් එයින් තමාටම කොටා ගන්න. එවිට යි එහි මුවහත දකින්නේ. ඒ කඩුවෙන් කොටා ගනිමින් තමකම නැති කර ගත යුතුයි. තමාගේ වැරදි මුළුමනින් දැක මා ඉදිරියේ පෙනී සිටින මොහොත පැමිණිය යුතුයි. අලුත උපන් දරුවන් මෙන්.''

**2008 ජුනි 05**

"මා නුඹලා ගෙන යන මේ ගමනෙ තේරුමක් තියෙනව ද, ගමන තවමත් පටන් ගත්ත තැන ම ද ඉන්නෙ කියල ඔබට හැඟෙන්න පුළුවන්. දරුවෙනි, මේ ගමන මහා ගැඹුරක් ඇති ගමනක්. ගමන කෙතරම් අපහසු වුවත් මෙලෙස පැමිණෙමින් සිටින ජේසුව අත්නොහරින්න."

**2008 ජුනි 25**

"ලෙඩ රෝග මුළු පොළොව මත වගුරුවලයි තියෙන්නෙ. වෛද්‍යවරුන් පවා මවිත වන අයුරින්. ඒ අතින් ලෝක විනාශය ඇරඹී ඇත. දරුවෙනි, හොඳ කාලගුණයක් පොරොන්දු වෙන්න මට අපහසුයි. පියාණන්ගෙ උදහසයි මේ, මුළු විශ්වය කෙරෙහිම."

1996 ඔක්තෝබර් 14 ගරු සුනන්ද වනසිංහ පිය තුමා අප නිවසට පැමිණි අවසන් අවස්ථාව යි. එය මා පුබුදුවෙන් ගිලිහී ගොස් වසර 11ක් සපිරෙන මොහොත යි. ඒ නිමිත්තෙන් එතුමාගේ 'යාගය' පිටුවක් සැරසීම සඳහා මා වෙත ප්‍රශ්න 10ක් ඉදිරිපත් කිරීම යි, එතුමාගේ පැමිණීමේ අරමුණ වුයේ. මම එයින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරා ගෙන ඊට පිළිතුරු සැපයීමි. මා අනෙක් ප්‍රශ්න ඉවත් කළේ පුබුදුවට මදි-පුංචිකමක් කරන්නට මට අවශ්‍ය නො වූ බැවිනි. 'යාගය' 1997 ජනවාරි කලාපයේ එම ලිපිය පළ විය. එය ඔබ හමුවේ තබන්නට මම කැමැත්තෙමි.

**ප්‍රශ්නය:**

කිතු දන පුබුදුව ජාතික කතෝලික මණ්ඩපයේ නව පිබිදීමක් ඇති කිරීමට ඉවහල් විනැ යි මතයක් තිබෙනවා. ඔබත් ඊට එකඟ වෙනවා ද?

**පිළිතුර:**

මම ඒ අදහස හා එකඟ වෙනවා. පුබුදුව ශුද්ධ බයිබලය හෙවත් දේව වචනය කතෝලිකයන්ගේ ජීවිතයට සමීප කරන්නට විශාල වැඩ කොටසක් ඉටු කළා. කටපාඩම් කරගත් හෝ ලිඛිත යාච්ඤාවලට සීමා නො වී තමන්ගේ වචනයෙන් යාච්ඤා කරන්නට, සමිඳුන් පසසන්නට පුබුදුව අතදීමක් කළා. මූලධර්මවාදි කිතුනු නිකායන් දෙසට ඇදෙන්නට තිබුණු බොහෝ ජීවිත කතෝලික සභාව තුළ ම රඳවා ගන්නට කිතු දන පුබුදුව නිසා හැකි වුණා. දේශන කීපයක් තුළින් මුළු කිතුනු ධාර්මික පදනම ඉදිරිපත් කරමින් ඒ ඔස්සේ ක්‍රිස්තුස් වහන්සේ තම ගැළවුම්කරුවාණන් හා ස්වාමියාණන් ලෙස පිළිගත් ජනතාවක් ඇති කරන්නට පුබුදුව කටයුතු කළා. එවැනි පෝෂණයක් ලැබූ ජනතාව පුබුදුව අතින් ගිලිහී ගියත් ඔවුන් කතෝලික සභාව සතු සම්පතක් ලෙස හඳුන් වන්න පුළුවන්. ඔවුන් කොහේ විසිරී සිටියත් අනාගතයේ යම් දවසක දී ක්‍රිස්තුස් වහන්සේ මුල් කර ගත් ප්‍රබල පැයක දී ඒකරාශි වීමේ පහසු ප්‍රවනතාවයක් තිබෙනවා. ගිහි ජනතාව දේව රාජ්‍යයේ වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස උපයෝගී කර ගැනීම පිළිබඳ ව පුබුදුව සභාවට ප්‍රබල පූර්වාදර්ශයක් සපයා දී තිබෙනවා. පුබුදුවකින් විය යුතු ලොකු ම සේවාව නම් දෙවිඳුන්ට මුළුමනින් ම යටහත් වන හෙවත් සමිඳුන් රිසි ලෙස කඩන්නට අඹන්නට අග දක්වා ම ඉඩ දෙන එක ජීවිතයක් හෝ මතු කර ගැනීම යි. එය පහසු කාර්යයක් නො වෙයි. සමිඳුන්ට මුළුමනින් ම යටහත් වූ ජීවිතයක් තුළින් පමණ යි, එතුමන්ට මුළුමනින් ම ප්‍රකාශ වන්නට හැකි වන්නේ. එවැන්නෙක් දෙවිඳුන්ට ලැබිය යුතු මහිමය තමා බිඳකින් හෝ සොරා ගන්නෙක් නො වෙයි. සියල්ලේ මුළු මහිමය සමිඳුන්ට දී තමා මුළු මැවිල්ලේ ඉතාමත් ම අල්ප වූ තැනැත්තා ලෙස දැකීමට හා පිළිගැනීමට එවැන්නකුට හැකියාව තිබෙනවා. පුබුදුව එවැනි එක් අයකු හෝ ගොඩනගන්නට දායක වී තිබෙන්න පුළුවන්. එවිට පුබුදුව නමැති සංවිධානය නො වෙයි, පිබිදීම නොනැවතී අග දක්වා ම පෙරට ම ඇදී යනු නියත යි.

**ප්‍රශ්නය:**

කිතු දන පුබුදුව පිළිබඳව අප ඔබ ඉදිරියේ තැබූ අනෙක් ප්‍රශ්නවලට ඇයි ඔබ පිළිතුරු නො දෙන්නේ?

**පිළිතුර:**

එයින් එක ප්‍රශ්නයකට මම පසු ව පිළිතුරු දෙන්නම්. ඔබ පුබුදුව පිළිබඳව මා ඉදිරියේ තැබූ අනෙක් ප්‍රශ්න සියල්ල දෙස බලද්දී මා ඔබ හා බෙදා ගත යුතු වචනයක් ද මා පුබුදුවට කිව යුතු වචනයක් ද ඇතැ යි මට හැඟෙනවා. මැවුම්කරුවාණන් හෙවත් ධර්මයාණන් අත්දැකීම පරම සත්‍යය පිළිබඳ ගවේෂණයක්. එය විරුද්ධාභාෂී (Paradoxical) ආකාරයෙන් අවබෝධ කර ගත යුත්තක්. එය තර්කයට ගෝචර වන්නේ නැහැ. එය තර්ක බුද්ධියෙන් ඔබ්බට යන දෙයක්. විරුද්ධාභාෂී යනු පරස්පර විරෝධී සේ පෙනුනත් නියත වශයෙන් ම සත්‍යය වූ දෙය ලෙස හඳුන් වන්න පුළුවන්. කිතුනු බසින් කියනවා නම් විරුද්ධාභාෂී දෙය අවබෝධ කර ගන්නට අපට

ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකය අවශ්‍ය ම යි. කතෝලික සභාව ගැන වේවා, කිතු දන පුබුදුව ගැන වේවා, දෙවිඳුන් විසින් ම මෙහෙය වන මනුෂ්‍යයකු ගැන වේවා මේ සියල්ල පරම සත්‍යය හා ඉතා සමීප ව බැඳුන දෙයක් නිසා විරුද්ධාභාෂී ලෙස යි, අවබෝධ කර ගත යුත්තේ. මේ සියල්ල දෙස තර්ක ඥානයෙන් පමණක් බලා කරන විග්‍රහයන් නිසා අද ලොකු අවුලක් දකින්නට ලැබෙනවා. අප කිසිවකුට හෝ කිසිදු සංවිධානයකට හෝ බැහැ සියල්ල වන්නට. සමිඳුන් මුල පුරන යම් සංවිධානයක් තුළින් එතුමන්ට අවශ්‍ය දෙය නිමාවට පත් වූ විට ඒ සංවිධානය තුළ උන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය අවසන් වන්නට පුළුවන්. ඉන් පසු අප කොතෙක් වෙහෙසුනත් එය පෙර පැවති තත්ත්වයට නැවත ගොඩනගන්නට බැහැ. ඒ නිසා යම් මොහොතක පුබුදුව නමැති සංවිධානය බල රහිත වී ඇතැ යි ඔබට පෙනුනත් එය අවතක්සේරුවට ලක් කරන්නට ඉක්මන් නො වන්න. මා එලෙස කියන්නේ එය තුළින් සමිඳුන් බලාපොරොත්තු වූ කාර්යය දැනට මත් සාර්ථක ව නිමාවට පත් වී ඇති නිස යි. ඉන් පසු පුබුදුව නමැති සංවිධානය නො ව ඒ තුළින් පරිනත භාවයට පැමිණි ආධ්‍යාත්මිකත්වය හෙවත් සැබෑ පිබිදීම පෙරට ම යනු නියත යි. එනිසා තමා තුළින් ම සියල්ල විය යුතු යැයි කිසි විටෙක නොසිතන්නටත් සමිඳුන් ඕනෑ ම සංවිධානයක් උපයෝගි කරගෙන දේව රාජ්‍යය පිළිබඳ කාර්යයන් ඉටු කර ගන්නා විට අවංක ව ඒ ගැන සතුටු වන්නටත් අපි ඉගෙන ගනිමු.

**ප්‍රශ්නය:**
කිතු දන පුබුදුව හා බැඳුන ඔබගේ ගමන් මඟ පිළිබඳව අපට යමක් කිව හැකි ද? අද ඔබ මුහුණ දෙන නිහඬතාවය තුළ ඔබේ ක්‍රියාකාරීත්වය කුමක් ද?

**පිළිතුර:**
ගරු සිරි ඔස්කා අබයරත්න පිය තුමා මගින් කතෝලික ධාර්මික පදනම ශුද්ධ බයිබලය ඇසුරෙන් ඉතා ගැඹුරින් අධ්‍යයනය කරන්නට මට වාසනාව ලැබුණා. මා ලැබූ ඒ දහම දිවයින පුරා බොහෝ තැන්වල බොහෝ අය සමග වසර 10ක් පුරා බෙදා ගන්නට පුබුදුව තුළින් මට අවස්ථාව ලැබුණා. (1975-1985) මා ලැබූ හා මා දෙසූ ඒ දහම න්‍යායික දෙයකට සීමා නො වී පුබුදුවෙන් හා සියලු සේවාවලින් ද ඉවත් ව ඒ දහම ප්‍රායෝගික යථාර්ථයක් කර ගන්නට පුබුදුව මට දැනට වසර එකොළහක් ම ලබා දී තිබෙනවා. (1985-1996) මා එය සලකන්නේ පුබුදුව මට දුන් දඬුවමක් හැටියට නො ව මගේ වර්ධනය සඳහා මට දුන් කදිම අවස්ථාවක් හැටියට යි. මගේ ජීවිත ගමන දේව මඟ පෙන්වීම ඔස්සේ මගේ නිදහස් කැමැත්ත තුළ මට යන්නට සිදු වන ගමනක්. එනිසා ඒ ගමන දෙස ආපසු හැරී පුබුදුවට හෝ කිසිවකුට හෝ කිසිදු චෝදනාවක් නගන්නට මට නො හැකි යි. ඒ ගමනේ මුළු වගකීම සමිඳුන් තුළ මා භාර ගන්නට සූදානම්.

පුබුදුව තුළින් යමෙක් හිතාමතා ම මා අපහසු තත්ත්වයට පත් කරන්නට ක්‍රියා කළා නම් ඔවුන් දෙස බලා මට කියන්නට ඇත්තේ එදා ජෝශප් තම සහෝදරයන්ට කී වචන ම යි. "ඔබ මට නපුර කරන්නට අදහස් කළෙහු ය. එහෙත් දෙවියන් වහන්සේ එය අප සැමගේ යහපතට අදහස් කළ සේක." දේව මඟ පෙන්වීම තුළ තම නිදහස් කැමැත්තෙන් ද තීරණ ගෙන ඒ තීරණ නිසා තමා කොයි තරම් බිහිසුණු තත්ත්වයකට ඇද වැටුණත් සමිඳුන් ඒ තත්ත්වයෙන් තමා ජයග්‍රාහී ලෙස එතෙර කරන බව විශ්වාස කර ගෙන යා යුතු විශ්වාසයේ ගමනක් එය. එනිසා ම එය වීර චාරිකාවක්. මේ එකොළොස් වසර තුළ ආත්ම ගවේශණයක හා සමාජ ගවේශණයක නියැලීමට මට විශේෂයෙන් අවස්ථාව ලැබුණා. තමා තුළ ගැඹුරට යෑම පමණක් නො වෙයි, සමාජ ගවේශණය තුළින් රැස්කර ගන්නා සියල්ල ධර්මයාණන් අබියස හලා පොලා හරවත් දේ පමණක් රැස් කර ගැනීම යි, මා දකින සැබෑ ආත්ම ගවේශණය. එමගින් ලොකු ප්‍රඥාවක් රැස්කර ගන්නට හැකි වුණා. එය අනාගත දූත මෙහෙය සඳහා පලදායි වනු නියත යි.

පුබුදුව හා මා අතර පුද්ගල ගැටුමක් නැහැ. ඇත්තේ මත ගැටුමක් පමණ යි. මත ගැටුම් අවශ්‍ය යි, මිනිස් පවුලේ මුහුකුරා යෑම සඳහා. දහම් නවෝදයෙන් කෙරෙන්නේ එකිනෙකා සිටින තැන ම ඔවුන්ගේ පිබිදීමට අත දීමක් පමණ යි. සංවිධානයක් ලෙස ඔවුන් ව අපට කොටු කර ගන්නේ නැහැ. අපේ අරමුණ සියල්ලන් නිදහස් කිරීම යි. කිතු දනගේ පිබිදීමක් සඳහා පමණක් නො ව සියල්ලන්ගේ නවෝදයක් සඳහා යි, අප කැපවෙන්නේ. ඒ සඳහා සමිඳුන් අප ව තබන තැන සිටීමත් අපගෙන් ඉල්ලන කොටස කිරීමත් අපගේ කාර්යය යි. අනාගතයේ දෙවිඳුන් අප තුළින් යම් පලදායි සේවාවක් ඉටු කර ගන්නවා නම් ඒ පිළිබඳ ගෞරවය පළමුවෙන් දෙවිඳුන්ටත් ඉන් පසු ඔස්කා පිය තුමා හා එතුමන් තුළින් සමිඳුන් මුල පිරූ පුබුදුවටත් හිමිකර දීම යි, අපගේ අරමුණ. එදා **කාර්ලෝ කරෙත්තෝ** සහා මාතාව පැසසූයේ පහත සඳහන් වදන්වලිනි. එම වදන් වැල තුළින් ම මම කිතු දන පුබුදුව මෙ ලෙස පසසමි. "මෑණියනි, මා ඔබට කෙතරම් අවලාද කිව යුතු ද? එහෙත් මම ඔබට බොහෝ සේ ආදරය කරමි. අන් කිසිවකුට වඩා ඔබ මට වේදනා ගෙන

දි ඇත. එහෙත් අන් කිසිවකුට වඩා මම ඔබට සදා ණය ගැති වෙමි. ඔබ මා ඉමහත් අපකීර්තියට පත් කර ඇත. එහෙත් ශුද්ධවත් බව වටහා ගන්නට මට ඔබ හැර සහාය වූයේ වෙන කවුරුන් ද?"

'යාගය' සඳහා එදා මා ලියූ සටහන එලෙස අවසන් කළෙමි. මේ මොහොතේ එයට අලුතින් ඡේදයක් එක් කරන්නට මම කැමැත්තෙමි. "මම ඔබ සමග වැඩසිටිමි. මම ඔබට ප්‍රේම කරමි." දෙවිඳුන්ගේ ඒ මහා පොරොන්දුව මම විශ්වාස කරමි. එම ආලෝකයෙන් ජීවිතයේ සැම සිදුවීමක් දෙස විශේෂයෙන් අමිහිරි සිද්ධීන් දෙස විවේකී මනසකින් පූර්ණ ව බලන්නට මම උත්සුක වෙමි. භාග්‍ය අටට ඇඹෙන්නට රිසි වෙමි. එනිසා ඒ සිද්ධීන් මගේ පවිත්‍රකරණය සඳහා උපයෝගී වන අයුරු මෙනෙහි කරමි. එවිට ඒ සිදු වීම් තුළින් යම් ප්‍රඥාවක් මා තුළ ඉතිරි වේ. ඒ ප්‍රඥාව ලබා ගන්නට දායක වූ සියල්ලන් මගේ මිතුරන් ලෙස මගේ ගුරුවරුන් ලෙස මට පෙනේ. ඒ සිද්ධීන් හා බැඳුන අමිහිරි සියල්ල අවසන් වේ. එනිසා කිසිවකු සමග කිසිදු අහිතක් මා තුළ නැත. මා විඳි කටුක අත්දැකීම් රැසක් මගේ කටු සටහන් අතර දින වකවානු සමග සටහන් ව ඇත. මේ ප්‍රකාශනය ලෝකයට යාමත් සමග ඒ සියල්ල සුං කර දැමීමට මම කැමැත්තෙමි. ඉන් පසු ඒවා ගැන කතා කරන්නට ජීවිතයේ විනාඩියක් හෝ අපතේ නො දමමි. "පසු ගිය දේ දෙස නොබලා ඉදිරියෙහි තිබෙන දේ දෙස ම නෙත් යොමා" සමිඳුන්ගෙන් මට පැවරෙන දූත මෙහෙය ඔස්සේ පෙරට ම යමි.

# 53 "මෙය, කිතුනු නාමය දරන හැම කෙනෙක්ම යාච්ඤාවෙන් සන්නද්ධ විය යුතු කාලයක්."

**2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා.**

"2019 වසර භයානක බව මම නුඹලාට ඉඟි කළා. ඒ සමගම මා ප්‍රකාශ කළා, ජාති ආගම්, කුල භේද ඉදිරියට මතු වන බව. දැන් ආගම් භේදය හරහා එය පැමිණෙමින් තිබෙනවා. දිවයිනේ විශාල කිතුනු, ජනතාවක් සිටින්නේ මීගමු ප්‍රදේශයේ හා ඒ අවට ප්‍රදේශවල. දැන් මේ ප්‍රදේශ ඔවුන්ගේ විශාල ඉලක්කය වෙලා තිබෙනවා. දැන් මගේ නාමය දරන මගේ දරුවන්ට ජීවත් වීමට ඉඩක් නැති තැනට විශාල විපත්ති පැමිණෙමින් තිබෙනවා. මේ ප්‍රදේශවල විශේෂයෙන් සෝදිසි මෙහෙයුමක් අරඹන්නට අවශ්‍යයි. දිවයින පුරාම ඒ සෝදිසි මෙහෙයුම අරඹන්නට අවශ්‍යයි. ඔවුන් සැම තැනම සැඟවී සිටිනවා. පුපුරන ද්‍රව්‍ය නොයෙක් තැන්වල සඟවා තිබෙනවා. ඒ නිසා භයානක සැලැස්මක් රට තුළ සිදුවෙමින් තිබෙනවා.

"දැන් බිහිසුණු ඛේදවාචකයක් රට තුළ සිදුවෙමින් පවතින්නේ. මේ පටන් ගැන්ම පමණයි. දිවයිනේ සියලු කතෝලික හා කිතුනු දේවස්ථාන විනාශ කර දැමීම ඔවුන්ගේ ප්‍රධාන අරමුණයි. කතෝලික හා කිතුනු දේවස්ථානවලට පහර එල්ල කිරීම පමණක් නොවෙයි, සියලු බැතිමතුන් විනාශ කිරීමේ ඔවුන්ගේ සියලුම ආගමික ස්ථාන විනාශ කිරීමේ, ප්‍රේමයේ දහමේ නියැලෙන සියලු දෙන විනාශ කිරීමේ මහා සටනක් මේ වෙද්දි ඇරඹෙමින් තිබෙනවා. ඒ නිසා ඒ සියලු ආගමික ස්ථාන හා ඒ අවට දැඩි සෝදිසියකට ලක් කරන්න. දිවයිනේ රෝහල් පිළිඳව ද විශේෂ ආරක්ෂිත මෙහෙයුමක් ඉතාම අවශ්‍යයි. ඔවුන්ගේ ප්‍රහාරවලින් තුවාල ලැබූ කිසිවකු නැවත සුවය ලබා ආපසු එනවා දකින්නට ඔවුන් කොහෙත්ම කැමති නැති නිසා. ඊළඟට පාසැල්වලට හා පාසැල් දරුවන්ට පහර එල්ල කිරීමේ සැලැස්මක් ඔවුන්ට තිබෙනවා. ඒ නිසා ආරක්ෂක අංශ ඒ පිළිබඳව ද දැඩි අවධානය යොමු කළ යුතුයි. මෙය හැම තැනකම සෝදිසි මෙහෙයුම් දියත් කළ යුතු මොහොතක්. මේ දේශයේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල මේ ගැටළු මතු වෙමින් තිබෙනවා. රටේ රාජ්‍ය නායකයො කුළල් කා ගන්නා මොහොතක මේ සියලු විනාශකාරී ක්‍රියා පහසු වී තිබෙනවා. ජාතියක් ජාතියකට විරුද්ධව ද රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධව ද, ආගමක් ආගමකට විරුද්ධව ද, නැගී සිටින කාලය දැන් ඇවිල්ලා. ඒ නිසා ජන දරුවෙනි, අවදි වන්න. අවදිව සිට දහම හා දෙවිඳුන් හා ගමන් කරන්න."

"ශ්‍රී ලංකා පුරවැසියෙක් හැටියට, ලෝක පුරවැසියෙක් හැටියට මේ බිහිසුණු මොහොතේ තමන්ගෙන් විය යුතු කොටස කුමක්දැයි මගේ ජන දරුවෙනි, ඔබ සැම කෙනෙක්ම මෙනෙහි කරන්න. සැක කටයුතු දෙයක් දැනුනොත් බිය නොවී, දැනුම් දිය යුතු තැන්වලට එය දැනුම් දෙන්න. මේ බිහිසුණු කාලයේ ඉතාමත් ප්‍රවේශම් වන්න. දෙවි පියාණන්ගේ බැල්ම මේ මොහොතෙත් මුළු විශ්වය වෙතම යොමුවෙලයි තියෙන්නේ. එදා මනාලයායි (ජේසු සමිඳුන්) මනාලිය (මිනිස්

සංහතිය) වෙනුවෙන් දිවි පිදුවෙ. මගේ උත්ථානයේ මංගල දින දිව්‍ය පූජාව තුළ දෙව්මැදුරු තුනක මනාලිය මා වෙනුවෙන් දිවි පිදුවා. එය අන් සියලු දෙනාගේ පාපයන් ඔවුන් පිට වැගුරුවා ගැනීමක්. මා විගස ඒ සියලු ආත්මයන් මා වෙත කැඳවා ගත්තා. එදින දිවි පිදූ අනෙකුත් සියලු දෙනා වෙත ද මගේ දයා කරුණාව නිසැකව හිමිවනු ඇත. කිතුනු නාමය දරන හැම කෙනෙක්ම යාච්ඤාවෙන් සන්නද්ධ විය යුතු කාලයක් මෙය. තමා උදෙසාම නොවෙයි දේශයේ "ලෝකයේ සියලු ජනතාව උදෙසා යාච්ඤා කරන්න." (මෙය පත්‍රිකාවක් වශයෙන් සකසා එය බෙදා හරිමින් වගකිවයුතු සියල්ලන් දැනුවත් කරන්නැ යි ජේසු සමිඳුන් පැවසූ නිසා අපි එසේ කළෙමු. එදින පණිවුඩයේ පහත සඳහන් අදහස් ද ඇතුලත් විය.)

"පියාණන් මහා සැලැස්මක් තුළ සියල්ල හසුරුවමින් මගේ දෙවන පැමිණීමට මොහොත සූදානම් කරමින් සිටිනවා. දෙව් මව් විශ්ව මාතාව ලෙස නොයෙක් තැන්වල දර්ශනය වෙමින් ඉදිරි සිදුවීම්වල භයානකකම අඟවමින් සියලු පාපයන්ගෙන් ගැළවී දෙවියන් වෙත නැඹුරු වන ලෙස ජන දරුවන්ට ආයාචනා කරනවා. ---- සංඝයක් හැටියට මූලික විය යුත්තේ සියලු දෙනා එක්ව එකිනෙකා මත නොවැටී දැන්වත් අවදිව තමා තමාව දකිමින් ලෝකය උදෙසා තමාගෙන් විය යුත්තේ කුමක් ද තමා පූජා විය යුත්තේ කොතැන ද කියන තැන සිටින්න ඕනැ. සංඝයක් හැටියට පූජා වෙන්ඩ වුණොත් සූදානම් වන්න ඕනැ. දෙවියන් වහන්සේ එතැනටයි සංඝය සූදානම් කරල තියෙන්නේ. මම දැන් අණ දෙනවා නම් මෙය කරන්න කියලා දිවි පුදල හරි ඒ දේට සූදානම් වීම තමා මේ සංඝය සූදානම් කිරීමේ භයානකකම. මේ මොහොත අර දේශපාලකයාට මේ නායකයට දෝෂාරෝපණය කිරීම නොවෙයි, තමා තමාව දැකීමයි සිදුවිය යුත්තේ.

**2019 අප්‍රේල් 24**

"මෙවර පාස්කු ඉරිදා සිදුවුණේ මුළු විශ්වයම කම්පා වන දෙයක්. මිනිස් ජීවිත රැසක් කුඩා දරුවන් පවා එකම තැන මිය යාමක්. ඒ සිදුවීම් මිනිස් සිත කොයි ආකාරයෙන් ද අයිති කර ගන්නෙ කියල දෙව් පියාණන් බලා සිටිනවා. මේ තුළ ලොකු පණිවුඩයක් තිබෙනවා. එකම ලෙයක බැඳුණු ජනතාවක් හැටියට ඔබට එය දැනෙන්නේ කොයි ආකාරයෙන් ද ඔබගේ ආත්මයට රිදුම් දෙන්නේ කොයි ආකාරයෙන් ද කියන එක වැදගත්. මේ සිදුවීම් නිසා, ඉදිරි සිදුවීම් නිසා දේවස්ථාන හිස් වන තැනට එනවා. නමුත් එය එලෙසම වන්නට ඉඩ නොතබමින් ඒ තුළත් එඩිතර භාවයක් ඇති කරමින් මම ජනතාව සූදානම් කරනවා. ඔවුන් ආරම්භ කළාට අවසාන කරල නැහැ. එනිසා දැන් මේ වෙද්දී ලොකු සැලැස්මක් ලෝකය පුරා සැළසුම් වෙමින් තිබෙනවා. පුංචි දෙයින් ආරම්භ කරමින් ඊළගට ලොකුම දේ කරන්නට ඔවුන් සැලසුම් සකසමින් සිටිනවා. ක්‍රිස්තු විරෝධියා වතිකානයේ මහා තැනට පහර එල්ල කරමින් ඒ සියල්ල සුණුවිසුණු කරන්නට දැන් සියල්ල සකසමින් තිබෙනවා. මා මේ අණතුරු ඇඟවීම කරනවා. ඒ ගැන සියල්ලන් අවදි විය යුතුයි. ඒ සියලු උවදුරු වෙනුවෙන් සියල්ලෝ සියල්ලන් උදෙසා යාච්ඤාවෙන් මැදිහත් වන්න. මරියාවන් නිරන්තරයෙන් මැදිහත් වෙනවා. එතුමිය ඇගේ ලෙය කඳුලට හරවමින් මේ සිදුවීම් පිළිබඳව ඉදිරි සිදුවීම් පිළබඳව ශෝකය තමයි ලොවට ප්‍රකාශ කරන්නේ."

"ප්‍රභාකරන් මිය ගියත් ඔහුගෙ කීප දෙනෙක් නැවත නිහඬව සූදානම් වෙමින් සිටිනවා. ඉතින් මේ සියල්ල මම කොටු කරන්නටයි යන්නේ. ඒකට ඔබලගේ කැපවීම මොරගැසීම අවශ්‍යයි. මහා ගැඹුරු සැලැස්මක්, මේ වර්ෂයේ සිට. එනිසා ඔබ සැමගේ විශාල කැපවීමක් අවශ්‍යයි. එකතු වෙමින් කරන යාච්ඤා විතරක් නොවෙයි. තනිව තමා ඉන්න තැන නිදහසේ ඉන්න විට හැම මොහොතකම ප්‍රබල ලෙස ගැඹුරින් ගැඹුරට කරන යාච්ඤා ඉහළින් අසා සිටින තැනැන්වහන්සේ ඒ දෙස බලා මේවා තුළ මහා ආශිර්වාදය, රැකවරණය හා බලය ඔබලට දෙනවා, ක්‍රියා කළ යුතු තැන්වල දී ක්‍රියා කරන්නට. සංඝයක් ලෙස එකිනෙකාගෙ අඩුපාඩු දෙස බලමින් නොවෙයි, දැන්වත් අවදි වන්න. මීට වඩා ජවයකින් කියන සැනින් යමක් කරන්නට ක්ෂණික බලයක් මම ඔයාලට දෙනවා. ඒ තුළ තීන්දු තීරණ අරගෙන බිය නොවී පූජා වෙන්ඩ වුණත් ඊට සූදානම් වන්න. මම ඒ සඳහායි ඔබලව තෝරාගෙන තියෙන්නේ. දෙවියෝ සියල්ල බලා ගනියි. දෙවියන් වහන්සේ මට වගකීමක් පැවරුවා නම් මා එය එලෙසම ඉටු කරනවා යැයි දැඩි අධිෂ්ඨානයෙන් තීරණ කරමින් ඉදිරියට යා යුතුයි."

"මුළු මිනිස් ජනතාවම ඔබගේ පවුලයි. මම මගේ දරුවො මගේ සහෝදරයො, මගේ ඥාතින්, මගේ සංඝය නොවෙයි, මුළු මිනිස් ජනතාවක් උදෙසායි සුළු පිරිසක් තෝරල වගකීම් පවරල තියෙන්නේ. එනිසා සියලු වාද විවාදවලින් තොරව අප සියල්ලෝ මේ මොහොතෙ දෙවියන් ඉදිරියේ පෙනී සිටින්නට ඕනේ. දෙවියන් වහන්සේ විශ්වයේම සියල්ල අප පිට පවරල තිබෙනවා. පොඩි දෙයක් නොවෙයි මම බාරදීල තියෙන්නේ. මුළු ලෝ වැසි ජනතාවගේම සියල්ල ඔබලට බාර දීල තියෙන්නේ. මේක බැරෑරුම් වගකීමක්. එතකොට මේකෙදි කිසිවකුට සමාවක් නැහැ. අරයගෙ අඩුව මෙයාගේ අඩුව ප්‍රකාශ කරමින් ඔයාල පසුබසිනව නම් ඒකෙදි ඔයාලට කිසි සමාවක් නැහැ.

පොඩි දරුවො නොවෙයි. මුහුකුරා ගිය අය, පන්නරය ලබමින් එන අය. ඉතින් මහා වගකීමක් මම ඔයාලට පවරල තිබෙනවා. දෙවියන් වහනසේ ඔයලාට උදව් වෙනවා. නිතරම ඔයාල ළඟ ඉන්නවා.''

''ඒ හැම දෙයක් තුළම පියාණන්ගේ සැලැස්ම, නම් ඉටුවන්නේ ඒක නවත්වන්න කාටවත් බැහැ. බොහෝ අයට ප්‍රශ්නයක් වෙන්ඩ පුළුවන් දෙවියන්ව අදහන්ඩ ගිහිල්ලා දෙවියන්ව ළංකර ගන්න ගිහිල්ලා ඇයි මේ මිනිසුන්ට මෙහෙම වුණේ කියල. ඒක කිසි කෙනෙකුට ප්‍රශ්න කරන්න බැහැ. මනුෂ්‍යයාට නොතේරෙන කොටසක් ඒක. පියාණන්ගේ සැලැස්ම ඒක නම් එය සිදුවිය යුතුයි. ජේසුව කුරුසියේ ඇණ ගැසීම පියාණන්ගේ සැලැස්මක්. එනිසයි පුත්‍රයාව පූජා වීමට ඉඩදීම සඳහා කුරුසිය තෝරා ගත්තේ. ජේසු දැන සිටියා මේ මොහොතෙ පියාණන්ගේ සැලැස්ම මේකයි කියලා. මරියාවන් දැන සිටියා වාද කරන්න ගියෙ නැහැ. එයට කැමැත්තෙන් ඉඩ දුන්නා. මේ සිදුවීම්වලදීත් කිසිවෙකුට කිසිවක් කිව නොහැකියි. පියාණන්ගෙ සැලැස්ම ඒක නම් ඒකට මුහුණ දෙන්න ඕනෑ. මනුෂ්‍යයා දැනගෙන ඒකට මුහුණ දුන්න නම් මනුෂ්‍යයා බියට පත්වෙනවා. එවිට විය යුතු කොටස සිදුවන්නෙ නැහැ. තව ඉදිරියට බොහෝ දේවල්වලට මුහුණ දෙන්න සිදුවෙනවා. ---- දහම් නවෝදය ගැන සභාව දන්නවා නේ නිහඬව වගේ සිටියා. දැන් නැවත ඉදිරියට යන්න මොහොත ඇවිල්ලා.''

**2019 මැයි 30**

''දෙවියන් වහන්සේ මනුෂ්‍ය ජාතිය මැව්වා. මනුෂ්‍යයා මනුෂ්‍ය ජාතිය ජාතින් බවට වෙනකර ගත්තා: එලෙස ජාති ආගම් කුල භේද වෙන් කර ගත්තා. ඒ බෙදීම් තුළ මනුෂ්‍යයා මනුෂ්‍යයාට ප්‍රේම කරන්න බැරිව විඳවනවා. ඒ භේද තුළ මනුෂ්‍යයා කුලල් කා ගන්නවා. එලෙස හදා ගත් එක ජාතියක් මුල්කරගෙන තවත් කණ්ඩායමක් සම්බන්ධ වෙමින් තමයි මේක සිදුවන්නේ. ඒ කණ්ඩායමෙත් තිබෙනවා කොටස් කිපයක්. ඒ එක කොටසක් යමක් කළාම හැම කොටසක්ම තමන්ගේ පැතිවලට ලකුණු දා ගැනීමේ ක්‍රමවේදයක් මේ තුළ තිබෙනවා. ඔවුන් හිතනවා අපි මේච්චර ජීවිත ගණනක් විනාශ කෙරුවොත් අපට ස්වර්ගයේ තැනැක් ලැබෙනවා කියලා: අපට මේ මේ දේවල් උරුමකම් ලැබෙනව කියල. පාපයට අධිපති, ඒ අයට අනාවරණය කරන්නේ එලෙසයි. ඉතින් දැන් ඒවා තමා මේ සිදුවෙමින් තිබෙන්නේ. යක්ෂයාගේ මහා සැලැස්ම ආරම්භ වෙලයි තියෙන්නේ.''

''මගේ දෙවන පැමිණීම ආසන්නයි. ඒ මහිමාන්විත පැමිණීම උදෙසා මහා පවිත්‍රකරණයක් මේ සිදුවන්නේ. මහා මන්දිර කඩා වැටෙනවා. මේ ආරම්භයක් පමණයි. ඒක සිදුවුණේ ඔබට අමතක නොවන දිනයක. ඒ මගේ උත්ථානයේ ජයග්‍රහණය සමරන දිනය යි: එනිසා එය මනාලයාගේ ජයග්‍රහණය සමරන දිනයයි. ඇයි එය එදාටම තෝරා ගත්තේ? එය මනාලියගේ ජයග්‍රහණය ද මුල පිරෙන දිනයයි. මක්නිසාද සියලු අපවිත්‍ර දෑ පවිත්‍ර කිරීම ආරම්භ වන්නේ එතැනින්. ඉදිරියට වෙන්න තිබෙන දේවල් අති භයානකයි. තවම දේවස්ථාන සම්පූර්ණයෙන් පාළුවට ගියේ නැහැ. ඉදිරියේ දී එය සිදුවෙනවා. තම කුටියේ සිට යාච්ඤා කරන්න කාලය එනවා. පිරිසක් රැස්ව කරන යාච්ඤා නොවෙයි, තනි තනිව තමා ඉන්න තැන්වල සිට යාච්ඤා කළ යුතු මොහොත ඉදිරියට එනවා. එනිසා සුපරික්ෂාකාරිව බුද්ධිමත්ව කටයුතු කරන්න. මා ලෝකයට යම් සංඥාවක් යම් පණිවුඩයක් දෙන බව පැවසුවා. දීර්ඝ ලොකුම පණිවුඩය කෙටි කරල ඒක ගොනු කරල මා යම් මොහොතක ලෝකයට දෙන්නම්. ඉන්පසු මගේ සියලු ප්‍රකාශන ලෝකයට දෙන්නට නුඹලාට සිදුවනු ඇති. මනාලියගේ ජයග්‍රහණය පරිපූර්ණ වන්නට නම්, සම්පූර්ණයෙන් පවිත්‍ර කරල අවසන් වන්නට ඕනෑ.''

''රාජ්‍යයන් කඩා වැටෙන තැනට එනවා. සැබැවින්ම දෙවි පියාණන් ඒක එලෙසම කරනවා. ඒක අනිවාර්යයෙන්ම ඉදිරියේ දී සිදුවෙනවා. ජනතාවට කිසිම රාජ්‍ය නායකයෙක් අවශ්‍ය වෙන්නේ නැති තැනක් එනවා. ඔවුන්ට ඔවුන්මයි නායකයො වන්නේ. එහෙම තැනක් එනවා ඉදිරියේදී. මා කලිනුත් සඳහන් කරල තියෙනවා, හෙරෝද්, පිලාත් වැන්නන්, පූජ්‍ය පූජක බලමුළු, ධනය බලය සියල්ල කඩා වැටෙන බව. ඉතින් ඒ තැන තමයි දැන් ආරම්භ වෙලා තියෙන්නෙ. පාස්කු ඉරිදා සිදුවුයේ එහි ඇරඹුමක් පමණයි. පොඩි ඉඟි කිරීමක් පමණයි. ඔය හැම දේම ඉදිරියේ සිදුවෙනවා. එයයි, මනාලියගේ (මිනිස් සංහතියේ) ජයග්‍රහණය. එනිසා ඒ අනාවරණයන් ගණන් නොගෙන සිටින්න එපා. ඒ අනාවරණයන් සත්‍යයයි. ඒ අනාවරණයන් ගණන් නොගෙන සිටීම ගැනයි මරියාවන් වේදනා විඳිමින් කඳුළු සලන්නේ. එදා ආදම් ඒව කළ පාපයට වඩා ඉතා ගැඹුරු පාපයක් අද ලොව සිදුවන්නේ. ඒ පිළිබඳ පියාණනගේ උදහසයි, මේ.''

**2019 ජුනි 04 ශුද්ධාත්ම මංගල දින යැදුම**

"නුඹලා මෙතෙක් ශුද්ධාත්ම මංගල දිනය හැටියට ශුද්ධාත්මයාණන්ගේ ජයග්‍රහණය සැමරීමට වඩා මනාලයාගේ (ජේසු සමිඳුන්ගේ) ජයග්‍රහණය සැමරීමයි සිදුකළේ. අද මනාලියගේ (මිනිස් සංහතියේ) ජයග්‍රහණය සැමරීමයි නුඹලා සිදුකරන්නේ. ඒ පාස්කු ඉරු දින තම ජිවිතයෙන් මිලයක් ගෙවූ ජනතාව වෙනුවෙන්, ඒ මහා ජයග්‍රහණය වෙනුවෙන්. අද බොහෝ අයට ප්‍රශ්නයක් කතෝලික, කිතුනු දේවස්ථාන තුළ දෙවියන් අදහන්න ගිහිල්ල දිවි පුදන්නට සිදුවීම. පියාණන්ගේ සැලසුම් කිසිවකුට වෙනස් කළ නොහැකියි. එදා ජුදාස් මා පාවා දෙන බව දෙවි පියාණන් දැන සිටියා. ජේසුස් වන මා ද එය දැන සිටියා. ඒ කිසිත් නොදන්නා සේ සිටිමින් එසේ වීමට ඉඩ හැරියා. මක්නිසාද පියාණන්ගේ සැලැස්ම අනුව එසේ විය යුතුව තිබුණ නිසා, මා කුරුසපත් වීම එලෙසම සිදුවිය යුතුව තිබුණ නිසා. ජුදාස් මනස්ථාපනය වෙලා වැළපිලා සිය දිවි නසා ගත්තත් දෙවි පියාණන් ඔහුගේ ආත්මය ස්වර්ගයට කැඳවා ගනු ලැබුවා. ඔහු උපයෝගි වුයේ පියාණන්ගේ සැලැස්ම ඉටු වීමට නිසා. මා සමිපයේ හිටපු කෙනා ඇයි මෙලෙස පාවා දුන්නෙ කියල එදා ඔහු ගැන ඔවුන් තුළ වෛරයක් තිබුණා. අදත් ඒ දේ එලෙසම පවතිනවා. පියාණන්ගේ සැලැස්ම ඉටුවීමට නම් ඒ බෝම්බකරුවන් උපයෝගි වුයේ ඔවුන්ට පියාණන්ගේ සමාව තිබෙනවා. තුනෙන් දෙකේ පවිත්‍රකරණය පියාණන් කුමන ආකාරයකින් හෝ සිදු කරනවා.එය ආරම්භයක් පමණයි. තව ඉදිරියට බොහෝ දේ සිදුවෙනවා."

"අද විශාල මුදලක් වැය කරල විශාල ලෙස දේවස්ථාන ගොඩනැගෙනවා. නමුත් ඒ පූජක ධූරයන් තුළ කැපවීම් තුළ මිනිස් ජිවිත ගොඩනැගිම සිදුවෙනවා හුඟාක් ප්‍රමාදයි. එනිසා ස්වාමින් වහන්සේ ඔබලට පවසනවා මේ දේවස්ථානය දැන් ඔබේ කරගන්න කියලා, ඔබගේ හදවතේ දෙවියන්ට අයිති ගෘහය ශක්තිමත්ව ගොඩනගා ගන්න කියල. එවිට කිසිවෙකුට එය විනාශ කළ නොහැකියි. ඒ නිසා ස්වාමින් වහන්සේට හිමි තැන ස්වාමින් වහන්සේට දෙන්න. මා ප්‍රේමවන්ත දරුවෙනි, මේ සියල්ල තුළ දෙවියන් වහන්සේ ඔබ සමග සිටින නිසා කිසි දේකට බිය වන්නට එපා. දෙවියන් වහන්සේ ඔබට ප්‍රේම කරනවා. දෙවියන් වහන්සේට ජාති, කුල ආගම් භේද නොමැත. දෙවියන් වහන්සේට ජාතියක් වුයේ මනුෂ්‍ය වර්ගයා පමණයි. මා මැවූ ඒ එකම ජනතාව තමා අද කුළල් කා ගන්නේ. මේ සියල්ල තුළ මට ඔනෑ දේ දැන් සිදුවෙමින් පවතිනවා. තරුණ ළමා පරපුර විනාශ වන ආකාරය මා වේදනාවෙන් බලා සිටියා. මේ සිදුවීම් නිසා අද බොහෝ ජිවිත බොහෝ අශෝභන දේවල්වලින් වැලකෙමින් සිටිනවා. මනුෂ්‍යයා තුළ දැන් හිතිය ඇතිවෙලා. දැන් දෙවියන් සොයන්න පිපාසයක් ඇති වෙමින් තිබෙනවා. ලස්සන ලෝකයක් නැවත නිර්මාණය වෙනවා විශාල ජිවිත පූජාවිම් තුළින්. ඒ සඳහා වන සියල්ලම පූජාවිම් හැටියටයි, ස්වර්ගය භාර ගන්නේ. එනිසා දරුවෙනි, දෙවියන් වහන්සේට හිමි තැන දෙවියන් වහන්සේට දෙන්න. ඒ තුළ සියල්ල ජය ගන්නට පුළුවන්. ඒ සැම සියලු දේ තුළම ස්වාමින් වහන්සේ ඔබ සමග සිටිනවා. ඔබලා සුරක්ෂිත කරනවා. ඒ මගේ පොරොන්දුවයි."

"මේ බිහිසුනු සිදුවීම් අතර අද විවිධ ආගමික නායකයන් පූජ්‍ය පූජක, පක්ෂය එකමුතු වෙමින් සිටිනවා. යක්ෂයා අනෙක් අයව භේද කරමින් වෙනත් විකල්ප සොයමින් දුව-පැන ඇවිදිනවා, ලෝකය ගිනිලන්නට. එනිසා හැම කෙනෙක්ම අවදිව සිටින්න. ඔබ ස්වාමින් වහන්සේගෙන් යහපත් දේ පමණක් ඉල්ලන්න. ඒ දේ ඔබට ලැබෙනු ඇති. ඔබ කරන දේ හොඳ හිතින් කරන්න. ඒ දේ ආශිර්වාදය වනු ඇති. ඔබ ළඟට මා එනු ඇති. බොහෝ විට අසරණයෙක් විලසින් සිඟන්නෙක් විලසින් ධනපතියෙක් විලසින්. මේ කාලයේ මා එලෙස ඔබලව පරීක්ෂණයට නතු කරනවා. මරියාවන් පවා ඔබලා අතරට පැමිණෙනවා නොයෙක් වෙස් ගෙන. ඔබලගෙ සැලකුම් කෙලෙසදැයි පියාණන් දෑස් අයා බලා සිටිනු ඇත. මේ තමා දැන් ඔබලට තිබෙන පරීක්ෂණය. එනිසා අවදිව සිටින්න. පවුලක් ලෙස මරියාවන් ළං කරගෙන පවුලක් ලෙස එකමුතුව භාර්යාවට දිය යුතු ගෞරවය ආදරය එලෙසම දෙන්න. දරුවන්ට දිය යුතු තැන දරුවන්ට දෙන්න. සමාජයේ වෙසෙන අයට දිය යුතු ගෞරවය ඒ ආකාරයෙන්ම දෙමින් දෙවියන්ට හිමි තැන දෙවියන්ට දෙමින් ජයග්‍රාහි ලෙස ඉදිරියට යන්න. මම ඔබ අත් නොහරිමි, කිසි දා."

**2019 ජුලි 19**

"ප්‍රේමවන්ත දරුවෙනි, මුළු විශ්වයම මේ මොහොතෙ කැළඹිලයි තියෙන්නේ. එය පියාණන්ගේ පරීක්ෂණයේ කොටසක්. මේ මොහොතෙ හැම මනුෂ්‍යයෙක්ගෙන්ම පියාණන් බලාපොරොත්තු වන්නේ මහා ප්‍රේමයයි, විශ්ව ප්‍රේමයයි. ප්‍රේමයාණන්ගේ විශ්වයිය ප්‍රේමය සමග ඒකරාශි වීමයි, සියල්ලන්ගේන් බලාපොරොත්තු වන්නේ. පියාණන් ඔබ සැමට ඇරැයුම් කරනවා ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දක්වමින් ඒ ප්‍රේමය හා ඒකරාශි වෙමින් එකිනෙකා වෙනුවෙන් පැගෙමින් අනෙකාගේ සේවකයෙක් දාසයෙක් වෙමින් ක්‍රියා කරන ලෙස. මූලිකයා කියන වචනය ඉවත් කර සේවකයා කියන තත්ත්වයට ඇතුළු වී හැම කෙනෙක්ම එකිනෙකාට යටහත් පහත්ව ප්‍රේම කළොත් ලෝකය ජයග්‍රහණය කරන්න බොහෝ කල් යන්නෙ නැහැ. අපි හැමදාම දුක් විඳින මනුෂ්‍යයෝ.

අපි හැමදාම දෙවියන්ට කන්නලව් කෙරුවත් අපි හැමදාම එතැනමයි, කියන තැන නොවෙයි ඔබ සිටිය යුත්තේ. දුගී භාවය තුළ දෙවියන් සමග සමීප බවක් තියෙනවා. ඒ දුගී කෙනා එක්ක දෙවියන් වහන්සේ තුළ තියෙනවා විශාල බැඳීමක්. ඒ මහා බැඳීම ඔබ හා මා අතර තියෙනවා. ඒක විශාල බැඳීමක්. කිසිවෙකුට බැහැ කිසිම බලපෑමකට බැහැ එය විනාශ කරන්නට."

"දෙව් පියාණෙනි, ඔබයි මගේ මැවුම්කරු, එනිසා මට මා අයිති නැහැ, ඔබටයි මා මුළුමනින් අයිති. ඔබයි මගේ අයිතිකරු. එනිසා ඔබට ඕනෑ දේ මා තුළ කරන්න, ඔබට ඕනෑ දේ මා තුළින් කර ගන්න. එය වචනයෙන් පමණක් කියල මදි. ඔබගේ හද පත්ලෙන් එයට ඉඩ දෙනවා නම් කිසිම මොහොතක කණස්සල්ලට පත් වෙන්න එපා. දෙව් පියාණන්ගේ ප්‍රේමයේ ආශිර්වාදයේ මහා වර්ෂාව ඔබට ලැබෙනු ඇත. එනිසා අත්වැල් අල්ලාගෙන සංඝයේ සියලු දෙනා ඉදිරි කාර්යය ඉටු කරනු ඇත. එලෙස අපි යක්ෂයා පරාජය කරමු. ස්වාමින් වහන්සේ තුළ ජීවත් වීම තුළ උන්වහන්සේ ඔබව කිසි දා අත්නොහරිනු ඇත. සැම වේදනාවකදීම ඔබ හා බැඳෙනු ඇත. ඔබ මට මෙලෙස පවසන්න. මෙන්න ස්වාමිනි ඔබ වහන්සේ මැව්ව මම. මාව අයිති ඔබටයි, ඔබට ඕනෑ දේ මා තුළ කරල මාව ඔබ යන අතට ගෙන යන්න, පූර්ණ හිස් බවකින් යුතුව."

ස්වාමින් වහන්සේගේ මහා පණිවුඩය තුළ ලෝකයම වෙනස් වන මොහොතක් එනවා. එදාට සභාව පවා මෙය අවබෝධ කර ගන්නවා. සැඟවුණු දේ එළියට මතුවෙලා ඇවිල්ලා තියෙනවා. එනිසා පිපාසයක් ඇති වෙයි. ඒ ගැන සොයමින් ප්‍රශංසා කරන්නට. ඒ සඳහා බොහෝ දෙනා ඒකරාශි වනු ඇත. බොහෝ අශිර්වාදයේ වර්ෂා ඔබලාට ලැබෙනු ඇත. මා හා ගමනේ යෙදෙන්න. හැම දෙනෙකුටම. ඔබට වෛර කරන්නාට ඔබට ගරහන්නාට පවා ප්‍රේම කරන්න. ප්‍රේමයෙන් සියල්ල ජය ගන්න පුළුවන්. ලෝකය පෙරලන්න පුළුවන්, ප්‍රේමයේ ජයග්‍රහණය තුළ. නිහඬ වීම තුළ බොහෝ ගැටළුවලට පිළිතුර ඔබට ලැබේවි. නිහඬ යැදුම තුළ ඇතුලාන්ත ප්‍රීතිය අත්දකින්න පුළුවන්. අසරණ භාවය තුළ බැරි භාවය තුළ සිටිමින් ගැඹුරින් යාච්ඤා කර ගන්න බැරි වුණා කියල ලත වෙන්න එපා. එවිට මගේ නාමය ඔබගේ හද පත්ලෙන්ම ඇමතුවත් ඇති. මරියාවන් ලංකර ගන්න, එතුමියගේ මැදිහත් භාවය පතන්න.

**2020 අගෝස්තු 23**
(අගෝස්තු 18-22 සුජීවා පසුකළ දින පහක නිරාහාරයෙන් පසු)

"පියාණන් පැවසූ පරිදි දින පහක නිරාහාරයක් මගේ ආශිර්වාදය තුළ මැය සාර්ථකව අවසන් කළා. මැය පියාණන් පවසන මා පවසන ඕනෑම දෙයක් නොපැකිලව ඉටු කරන චරිතයක්. මම මැයට තුති පුදමි. ඒ නිසා ඇයට දීර්ඝායුෂ දෙන්නට පියාණන් තීරණය කළා. මෙය දරුවන්ට ද පවසන්න. තව තවත් ජීවිත වෙනස් කර ගනිමින් යැදුමෙන් සිටින්නැයි ඔවුන්ට පවසන්න. සුජීවා පියාණන්ගේ කැමැත්ත ඉටු කරන්නට සූදානම් නිහතමානි චරිතයක්, වාද විවාද නොකොට දේව වචනයට කීකරු වන චරිතයක්, දේව හඬ කිසි දා විකෘති නොකරන චරිතයක්, දේව ගරුබිය ඇති දියණියක්. මෙම නිරාහාරය තුළ මැය යැදුමෙන් මොරගැසූ අය වෙත ගැළවීම පැමිණෙනු ඇත, සංඝයේ සියල්ලන්ට ද මහා ආශිර්වාදයක් ලැබෙනු ඇත. සංඝයේ සියල්ලන් අනෙකාව නොව එකිනෙකා තම තමාව දකිමින් තමාව නිවැරදිව ගොඩනගා ගන්නා තරමට අනෙක් සියල්ලන් වෙනස් වෙනු ඇත, එවිට මේ ගමන සියල්ලන්ට පහසු වනු ඇත, සියල්ලන් ජය ගනු ඇත."

"මා ඉහළින් වඩින සංඝයට කැඳවා ගත්තා සංඝයේ පියාව. සංඝයට තව ආරාධනා තිබෙනවා. කුල්ලෙන් පොළා බේරෙන අයව ඒ සඳහා තෝරා ගන්නවා. තමාව දිය කරන්න ස්වාමින් වහන්සේට ඉඩ දෙන්න." (ජේසු සමිඳුන් සංඝයේ පියා ලෙස නම් කළ ලයනල් සොයුරා ජුලි මස 2 දින මරණයට පත්විය.) "දැන් මේ දේශයට ද Chip එකක් එන්න ළඟයි. එන්නතක් එන්න තියෙනවා, කොරෝනා මුවාවෙන්. ඉදිරියේදී කුණාටුවක් හමනවා විශව කදම්භයම වලනය කරමින්. එයින් දශම ගණනක් මේ දේශයට ද බලපානවා. අළු තවරා ගෙන මනස්ස්ථාපනය වන කාලයක් ඉදිරියේ එනවා. දේව හඬක් නැති මග පෙන්වීමක් නැති අසරණ චරිත ගළවා ගන්න පුළුවන් නම් කැඳවීමේ මහා ඵලය ඔබට ලබන්න පුළුවන්. අශුද්ධ බලවේග දිව්‍ය සත්ප්‍රසාදයේ මගේ වැඩසිටීම ඒ සත්‍යතාවය නවත්වන්න උත්සාහ කරමින් සිටිනවා. මා නුඹලා කැඳවන මේ ගමන ලේසි නැහැ. මෙය ලෝකය නොපිළිගන්නනින්දා අපහාස මැද යන ගමනක්. පියාණන් විසින් නියම කර තිබෙන දේ පසුකර යා යුතු නම් ඒ තුළ යන්න සිදුවෙනවා. කටුක අම්හිරි අත්දැකීම් ඔස්සේ මහා ආලෝකයක් වෙමින් පාපය සෝදා මගේ ශ්‍රී රුධිරයෙන් ලොවම පොහොවමින් යමු. ප්‍රබල අත්දැකීමක් වෙයි, ඔබගේ ජීවිත මින්පසු. මෙතෙක් සැඟවී තිබූ උතුම් දේ ඔබ තුළ මතුවනු ඇත. 666 ලකුණු දැන් මේ දේශයටත් පැමිණ ඇත."

(2019 පාස්කු ඉරිදා සිදුවීමෙන් පසු මේ දක්වා ජේසු සමිඳුන්ගේ මග පෙන්වීමක් පතා මුලසුනට පැමිණෙන ජනතාව අමතමින් ජේසු සමිඳුන් පවසන වදන් ද උපයෝගි කරගෙන මම මෙලෙස පවසමි. විශ්ව මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ මිනිස් බව ගෙන ජේසුස් නමින් උපත ලැබුවේ පාපිෂ්ඨ ලෝකයක ය. මරණය ජයගෙන උත්ථාන වූ ජේසු සමිඳුන් මහිමාන්විතව නැවත වඩින්නේ පවිත්‍රකරණයට පත්කළ ලෝකයකට ය. තම ඒක ජාතක පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත මෙලොවට එවන්නට සියල්ල සකසන්නෝ දෙවි පියාණන් වහන්සේ ය. එනිසා මෙය දෙවිපියාණන් වහන්සේ විසින් ම සිදුකරන මහා පවිත්‍රකරණයකි. දෙවි පියාණන් වහන්සේ ඒ මහා පවිත්‍රකරණය මුල පිරුවේ, 2019 පාස්කු ඉරුදින අපගේ දේශයේ ය. ඒ මහා පවිත්‍රකරණය දෙවි පියාණන් විසින් ලොව පුරා සිදුකරනු ඇත. දැනට පැතිරී යන කොරෝනා වෛරසය පවා ඒ සඳහා ය. ලොව පුරා සියලු රාජ්‍යයන් කඩා වැටෙනු ඇත. අහංකාරයේ මහා කඳු සමතලා වනු ඇත. ජේසු සමිඳුන් නැවත මහිමාන්විතව මෙලොවට වඩින විට දැනට සිටින මිනිස් සංහතියෙන් තුනෙන් දෙකක් මෙලොවින් සමුගත යුතුය. ඉතිරි තුනෙන් එක දැඩි පවිත්‍රකරණයට ලක් විය යුතුය. එය ඒ පිළිබඳ දේව සැලැස්ම යි. ඒ මුළු පවිත්‍රකරණය සිදුකරන්නේ දෙවි පියාණන් විසිනි. මෙය මුළු මිනිස් සංහතිය අත්දැකිය යුතු පොදු සංසිද්ධියකි.

මේ සියලු ව්‍යසනයන්ගෙන් ජයාන්විතව ගැළවෙන්නට ජේසු සමිඳුන් ඉල්ලන්නේ ලෞකික සියල්ලෙන් හිස් වී දෙවි පියාණන්ට ළං වෙන ලෙස ය. සියලු ආගමික ශාස්තෘවරුන් විසින් දේශනා කළ නිවැරදි දහම් මගට පිවිසෙන ලෙස ය. තමා උදෙසා නොව ලෝ වැසි සියලු ජනතාවගේ ගැළවීම උදෙසා යාච්ඤාවෙන් මොරගසන ලෙස ය. ජේසු සමිඳුන් එලෙස පැවසූ තවත් අදහසක් මම ඔබ ඉදිරියේ තබන්නට කැමැත්තෙමි. "කෙනෙක්ගේ මරණයෙන් පසු ඒ ආත්මය පිළිබඳ මගේ පවිත්‍රකරණය සිදු වන්නේ ශුද්ධ වූ ගිනි ජාලාව තුළ ය. එයට ඇතුළු වන්නේ ආත්මයක් පමණක් නම් වේදනා දැනෙන්නේ කෙසේ දැයි ඔබට හැඟෙනු ඇත. ශුද්ධ වූ ගිනි ජාලාවේ දී ආත්මය පවිත්‍රකරණය සඳහා ඇතුළු කිරීමේ දී තාවකාලික ශරීරයක් තුළ යි ඒ ආත්මය තබන්නේ. අති දුෂ්ඨ අති පාපිෂ්ඨ මනුෂ්‍යයකු වුවත් මා ඉතා දිගු කලක් හෝ ශුද්ධ වූ ගිනි ජාලාව තුළ පවිත්‍ර කිරීමෙන් පසු ඒ ආත්මය මගේ රාජ්‍යයට කැඳවා ගනිමි.")

(ජේසු සමිඳුන් සංඝයක් ලෙස අප අමතන සමහර අවස්ථාවල "මම නුඹලා මගේ ශුද්ධාත්ම බලයෙන් පුරවමි." යනුවෙන් සඳහන් කළා. ජේසු සමිඳුන්ගේ මග පෙන්වීමක් පතා එතුමන් වෙතට පැමිණි සමහරුන්ට ද ජේසු සමිඳුන් එසේ පැවසුවා. එහෙත් අප තුළ එවැන්නක් ප්‍රබලව දිස් වන්නේ නැහැ. එනිසා සුජීවා මගින් ජේසු සමිඳුන් මා ඇමතූ මොහොතක මම ඒ ගැන ජේසු සමිඳුන්ගෙන් විමසුවා. "මා පැවසූ ඒ වචනය සත්‍යයක්. එය බාහිරව ප්‍රකාශ වීම මා දැනට අත්හිටුවා තිබෙනවා. මගේ කැමැත්ත වන්නේ මට අවශ්‍ය මොහොතේ ඔබ සියල්ලන් තුළ එය එකවර ප්‍රකාශ වීමයි."

**2021 පෙබරවාරි 24**

එදින මා මුලසුනට ගොස් 2019 අප්‍රේල් 21 සිට ජේසු සමිඳුන් පැවසූ වදන්වලින් මට ද ගැටළුවක් ලෙස හැඟෙන තැන් පමණක් ජේසු සමිඳුන්ගෙන් විමසීමි. ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය මගින් එතුමාණෝ මෙලෙස පැවසූහ. "මා පැවසූ ඒ සියල්ල සත්‍යයි. එනිසා එය එලෙසම තබන්න. 2019 පාස්කු ඉරිදා සිදුවීම් පිළිබඳ දැන් මේ දේශය තුළ මගේ සභාව තුළ සිදුවන බොහෝ දේ දෙස මම වේදනාවෙන් බලා සිටිනවා. පසුගිය ඒ සිදුවීම්, ඉදිරි සිදුවීම් කෙතරම් බිහිසුණු වුව ද කිතුනු නාමය දරන මගේ ජනතාවගෙන් මා බලාපොරොත්තු වන්නේ සමාව දීම පමණයි. මේ සියල්ල දෙවි පියාණන්ගේ සාධාරණත්වයට භාර දෙන්නට ඔබට මගෙන් අවසර තිබෙනවා. මේ සඳහා වැරදිකරුවන් සොයමින් ඔවුන්ට දඬුවම් ලබා දීමට කටයුතු කිරීම කිතුනු නාමය දරන කිසිවෙකුගෙන් මා බලාපොරොත්තු වන්නේ නැහැ."

# 54. "ඔබගේ නාමය ශුද්ධ වේවා !"

**1.** 2021 මාර්තු 12 වන සිකුරාදා අප සංඝයේ යැදුම සඳහා මම ජේසු සමිඳුන්ගේ මුලසුනට ගියා. එය, ජේසු සමිඳුන් ප්‍රථම දාසිය සුපිවා මගින් කෙනෙක් අමතමින් සිටි මොහොතක්. ඒ නිසා මටත් අවස්ථාව ලැබුණා ජේසු සමිඳුන් සමග වචන කිපයක් හෝ කතා කරන්නට. පාස්කු බෝම්බ සිද්ධිය මුල් කරගෙන පෙබරවාරි 24 වන දින ජේසු සමිඳුන් මට පැවසු වදන් මා නැවත සිහිපත් කළා "එයට වැරදිකරුවන් සොයමින් ඔවුන්ට දඬුවම් ලබා දීමට කටයුතු කිරීම කිතුනු නාමය දරන කිසිවකුගෙන් මා බලාපොරොත්තු වන්නේ නැහැ." මා කීවා, ඒ ගැන දන්වා මාර්තු අට වන දින මා අගරදගුරු තුමාට ලිපියක් යැවූ බව. මම ඉන්පසු මෙසේ ද කීවා. "ජේසු, පාස්කු බෝම්බ සිද්ධිය මුල්කරගෙන අපේ රටේ සමහර සභා ශ්‍රේෂ්ඨයින් හා සමහර කතෝලික ජනතාව තුළ තිබෙන වියවුලට හේතුව මට තේරුම් ගන්න පුළුවන්. ඒ පාස්කු ඉරිදා දේවස්ථාන තුනක් මුහුණ දුන් සිදුවීම දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයේ ප්‍රකාශනයක්. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය පිළිබඳව කතෝලික සභාවෙත් අනෙක් කිතුනු නිකායන් තුළත් ඇති අවබෝධය ප්‍රමාණවත් නැහැ. පරණ ගිවිසුමේ ජනතාව ඒ පිළිබඳව තිබූ අත්දැකීමවත් අද කිතුනු ජනතාවට නැහැ. කතෝලික සභා ධර්මෝපදේශය පොතේ ද ඒ පිළිබඳ ඉගැන්වීම් ප්‍රමාණවත් නැහැ." එවිට ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් මෙසේ පැවසුවා. "ඇන්තනි, දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය පිළිබඳව ජනතාව දැනුවත් කරන්නට කටයුතු කරන්න."

ජේසු සමිඳුන් අප සංඝයේ ශ්‍රාවකයින් අමතා මෙසේ පවසා තිබෙනවා. "මෙය ශුද්ධභාවයෙන් තව තවත් ශුද්ධභාවයට එලෙස සුවිශුද්ධභාවය කරාම ගෙන යන ගමනක්. පුංචි පිරිසක් මගේ සැලැස්මට හිරකර ගෙන තිබෙනවා. මෙය තේරුම් නොගන්න විශාල ලෝකයක් තිබෙනවා. එනිසා ඔබ සුලු පිරිස හා මා අතර දැඩි සුහදතාවයක් ගොඩනගාගත යුතුයි. නිරන්තරව මැවුම්කරුට අවනත භාවය අවශ්‍යයි. "මෙය ශුද්ධභාවයෙන් සුවිශුද්ධභාවය කරාම යන ගමනක් නම් එය මනුෂ්‍ය සංහතියට අතිශයින් බිහිසුණුයි, එහෙත් මනුෂ්‍ය වර්ගයාගේ ආධ්‍යාත්මික ප්‍රගතියට එය ඉතාම හිතකරයි. "ධර්ම අධර්ම යුද්ධය ඇරඹෙන්නේ මෙම දේශයෙනි." මෙම අනාවරණයන් තුළ ජේසු සමිඳුන් එසේ පවසා තිබෙනවා. එයයි, 2019 පාස්කු ඉරිදා ඇරඹුනේ. ඇයි, එය මේ දේශයෙන් ඇරඹුනේ කියල ඔබට හිතෙන්න පුළුවන්. අධර්මයේ මහා ක්‍රියාවලියට එරෙහිව ධර්මයේ මහා ක්‍රියාකාරිත්වය මේ දේශයෙන් සිදුවන්නේ. එය ඒ පිළිබඳ දේව සැලැස්මයි. ඒ පාස්කු බෝම්බයෙන් ඇරඹුන ක්‍රියාවලිය දැහැමි යුගයේ උදාව දක්වාම ඇදී යනවා. මේ සියලු විඳවීම් දැහැමි යුගයේ උදාව උදෙසා මහා ප්‍රසව වේදනාවක්. ජේසු සමිඳුන්ගෙන් හා දේවමෑණියන්ගෙන් මේ පිළිබඳව ලැබෙන අනාවරණ හා අනතුරු ඇඟවීම් ලොව බොහෝ තැන්වලින් සිදුවෙමින් පවතිනවා. අප දේශයේ සිදුවන්නෙ ඒ පිළිබඳ අනාවරණ හා අනතුරු ඇඟවීම් පමණක් නොවෙයි, අධර්මයට එරෙහිව උන්වහන්සේගේ මහා ක්‍රියාවලිය මේ දේශයෙන් සිදුවන්නේ.

ජේසු සමිඳුන් උදා වී ඇති මේ අඳියර ගැනයි, මෙසේ පවසා තිබෙන්නේ. "ලෝකයේ පටන්ගැන්මේ සිට මේ දක්වා නොවූ විරූ මතු ද සිදු නොවන විරූ දරුණු පීඩාවක් එකල්හි සිදුවන්නේ ය. මේ කාලය කෙටි නොකරන ලද්දේ නම් කිසිවෙක්වත් නොගැළවෙන්නේ ය. එහෙත් තෝරාගත්තවුන් උදෙසා ඒ කාලය කෙටි කරනු ලබන්නේය." (මතෙව් 24: 21, 22) දෙව් පියාණන්ගේ මේ මහා පවිත්‍රකරණයේ දී ලෝක ජනගහණයෙන් තුනෙන් දෙකක් මෙලොවින් සමුගන්නා බවත් තුනෙන් එකක් ඉතිරි වන බවත් ඒ කොටස දැඩි පවිත්‍රකරණයට ලක් කරන බවත් එවිට ජේසු සමිඳුන්ගේ මහිමාන්විත දෙවන පැමිණීම සිදුවන බවත් අප සංඝය හා බැඳුන අනාවරණයන් තුළ සටහන්ව ඇත. මෙය තම පුතණුවන් මහිමාන්විතව ලොවට එවන්නට දෙව්පියාණන් වහන්සේ විසින් ම කරන, පවිත්‍රකරණයකි. මේ මහා පවිත්‍රකරණයට එඩිතරව මුහුණ දෙනු සඳහා දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන අවබෝධයෙන් හා අත්දැකීමෙන් අප පෝෂණය වන්නට ඕනැ.

**2.** දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය පිළිබඳව කිතු දන පුබුදුවේ බයිබල් ඥානකාන්තියෙන් මා ලැබූ අවබෝධය ඔබ ඉදිරියේ තබන්නට මා කැමතියි. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන බයිබල් ඥානකාන්තියේ දී කතා කළේ 11, 12, දේශනාවලින්. ඊට පෙර දේශන කීපයකින් දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ එක පැතිකඩක් ගැන කතා කළා. දෙවියන් වහන්සේගේ ප්‍රේමය විශ්වාසය දිනා ගන්නා ප්‍රේමයක්, උසස් කිරීමේ ප්‍රේමයක්, පොරොන්දු මතක් කරමින් දිරි ගැන්වීමේ ප්‍රේමයක්, දෙවියන් වහන්සේගෙන් පමණක් යැපෙන්නට සලස්වන ප්‍රේමයක්. සුරක්ෂිතභාවය ලබා දීමේ ප්‍රේමයක්, සමාව දීමේ ප්‍රේමයක්, ලුහුබඳින ප්‍රේමයක් ආදි වශයෙන් දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ලක්ෂණ රැසක් ඊට ඇතුලත් වුණා. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ඒ පැතිකඩ ගැන කතෝලික සභාවට හා අනෙකුත් කිතුනු නිකායන්ට හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ ඔස්සේ සුව මෙහෙයන් සංවිධානය වෙනවා. ජනතාව ඒ සඳහා එක්රැස් වෙනවා. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ඒ ගුණාංග ප්‍රකාශ කරන බයිබල් පාඨ හා ඒ පිළිබඳ දෙවියන් වහන්සේගේ පොරොන්දු ජීවිතවලට සමීප වී තිබෙනවා. ඒත් දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ අනෙක් පැතිකඩ ගැන ඇත්තේ ලොකු අනවබෝධයක්.

අප මෙතෙක් දුටු දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ලක්ෂණ අනුව සමාව දීම, නැවත නැවත ද සමාව දෙමින් පසුපස ලුහුබැඳ යාම දුර්වලකමක් ප්‍රකාශ කරන දෙයක් කියලා කෙනෙකුට හැඟෙන්න පුළුවන්. සැබෑ ප්‍රේමය අනෙක් තැනැත්තාට හානියක් වන පරිදි ප්‍රේම කරන්නේ නැහැ. එනිසා අපි දැන් දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ අනෙක් පැතිකඩ, උන්වහන්සේගේ ශුද්ධභාවය ගැන කතා කරමු.

**නික්මයාම 3 : 1-6**

(මෙහි සඳහන් සියලුම බයිබල් පාඨ ඔබම කියවා අවබෝධ කර ගන්න.) එහි ඇත්තේ මෝසස්ම සිය දූතමෙහෙය සඳහා කැඳවූ මොහොතයි. ගිනිජාලාව තුළින් දෙවියන් වහන්සේගේ හඬ නික්මෙනවා, එය ශුද්ධයි, මෙයත් දෙවියන් වහන්සේගේ ප්‍රේමයට සම්බන්ධ පැතිකඩක්. කලින් අප කතා කළ දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ලක්ෂණ තුළින් “මා වෙත එන්න” කියලයි කීවෙ. මෙහි පවසන්නේ “මෙතැනට ළං නොවන්න” කියලයි. දෙවියන් වහන්සේගේ ප්‍රේමය ළං වෙනවා පමණක් නොවෙයි, ඈත් වෙනවා. ළං වෙනවා පමණක් නම් එතැන සිදුවන්නේ තමා ලාබ වීමක්, තමා ලාබ වන විට ගෞරවය නැති වෙනවා. සැබෑ ප්‍රේමයට ගෞරවයක් තිබිය යුතුයි. ළං වෙද්දී ඈත් වීමක්, ඒ නිසා ලාබ නැහැ. ශුද්ධයි. උන්වහන්සේගේ හඬ ප්‍රකාශ වන තැන ශුද්ධ නම් උන්වහන්සේ කෙසේ විය යුතුද? ප්‍රේමය ළං කරනවා, ශුද්ධභාවය ඈත් කරනවා, පූර්ණ ප්‍රේමයට ළං වීමත් ඈත් වීමත් අවශ්‍යයි.

**යෙසායා 6 : 1-8**

ස්වර්ගීය දර්ශනයක් පමණයි ඔහු දුටුවෙ. එසේ නම් උන්වහන්සේ කෙසේ විය යුතුද? ඒ අත්දැකීම ඉදිරියේ යෙසායාගේ මුවින් නික්මුණේ “මට විනාශය විය” කියලයි.

**2 සාමුවෙල් 6 : 1-10**

ගිවිසුම් පෙට්ටිය තුළ දස පණත සටහන් කළ ගල් පුවරු දෙකයි තිබුණෙ. එදා ගිවිසුම් පෙට්ටිය දෙවියන් වහන්සේගේ වැඩසිටීමේ මහා ප්‍රකාශනය වුණා. ආරොන්ගේ වංශයෙන් පැවතෙන පූජකවරයාට පමණයි එයට අත තබන්නට අවසර තිබුණෙ, ඒත් පාප පූජාවකින් පසු. ගිවිසුම් පෙට්ටියට අත තැබූ පසු උග්ගාට එවැන්නක් නොවී නම් අනෙක් අයත් එය ස්පර්ශ කරන්නට බිය වන්නේ නැහැ. එවිට උන්වහන්සේ ලාබ වෙනවා. උදුනකට වියලි කොළයක් වැටෙද්දීම එය දැවී යනවා. එය ගින්න කොළයෙන් පළි ගැනීමක් නොවෙයි. එය ගින්නේ ස්වභාවයයි. දෙවියන් වහන්සේ ශුද්ධයි, ළං වෙන්නට බැහැ, එය උන්වහන්සේගේ ස්වභාවයයි. හොඳ අදහසකින් හෝ ගිනිමැලයකට ළං වන එක භයානකයි.

**නික්මයාම 19 : 1-25**

“සමිඳාණන් වහන්සේ ගිනිජාලාවකින් කන්ද මත බැස වදාළ බැවින් එය සම්පූර්ණයෙන්ම දුමින් වැසී තිබිණි. මුළු කන්දම වේගවත් ලෙස දෙදරන්නට විය. මෝසස් කතා කළ විට දෙවියන් වහන්සේ ගිගුරුම් හඬකින් උත්තර දුන් සේක.” මේ මුළු සිද්ධියම ප්‍රකාශ කරන්නේ දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයයි. දෙවියන් වහන්සේ සහ මිනිසා අතර විශාල පරතරයක් තිබෙනවා.

ශුද්ධභාවය යනු ඒ පරතරය ප්‍රකාශ කරන වචනයයි. ශුද්ධ යන වචනය යෙදිය හැක්කේ දෙවියන් වහන්සෙට පමණයි. ශුද්ධවූ දෙවියන් වහන්සේට ළං විය නොහැකියි, උන්වහන්සේම ළංකර ගත්තොත් මිස. ශුද්ධවූ දෙවියන් වහන්සෙට කැප කළ, වෙන් කළ දේ ශුද්ධ යි, කැප කළ අය ශුද්ධයි. දෙවියන් වහන්සේ සඳහා වෙන් කිරීමේ ලකුණ ආලේප කිරීමයි. ප්‍රසාද ස්නාපනය මගින් අප උන්වහන්සේට වෙන් කරනවා, කැප කරනවා.

හොඳ ගතිගුණ නොවෙයි, ශුද්ධවන්තභාවයේ පදනම දෙවියන් වහන්සේට ළං වන එකයි. ශුද්ධවන්තකම රැඳී ඇත්තේ හොඳ ගතිගුණ අනුව නොවෙයි, බැරිභාවය පිළිගෙන දෙවියන් වහන්සේට මොර ගසන තරමටයි. ශුද්ධවන්තකම තුළින් හොඳ ගතිගුණ ඇතිවිය හැකිය. එහෙත් හොඳ ගතිගුණ පමණක් ශුද්ධවන්තකම නොවේ. ඒ නිසා අපට කිසිවකු විනිශ්චය කළ නොහැකිය. ශුද්ධවූ දෙවියන් වහන්සේගෙන් පිරීම ශුද්ධවන්තකමයි. ශුද්ධවන්තභාවය දෙවියන් වහන්සේගේ කාර්යයක්. වැඩ ගොඩක් නොවෙයි ශුද්ධවන්තකම, දෙවියන් වහන්සේ කැඳවූ තත්ත්වය තුළ පැවතිමයි ශුද්ධවන්තකම. අපි දෙවියන් වහන්සෙගේ ශුද්ධභාවය ගැන තව දුරටත් කතා කරමු.

**ද්වීතිය** 4 : 24

"මක්නිසාද නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේ විනාශ කරන ගින්නක් වන ස්වකීය ගෞරවය රක්ෂා කරන්නා වූ දෙවි කෙනෙක්ය."

**හෙබ්‍රෙව්** 12 : 28, 29

"එහෙයින් සොලවන්නට බැරි රාජ්‍යයක් ලබන්නා වූ අපි ගෞරවයෙන් ද දේව භයින් ද දෙවියන් වහන්සේට ප්‍රසන්න වන ලෙස සේවය කරන පිණිස අනුග්‍රහය ඇතිව සිටිමු. මක්නිසාද අපගේ දෙවියන් වහන්සේ විනාශ කරන ගින්නක්ය." මේ සියල්ල දෙවියන් වහන්සෙගේ ශුද්ධභාවය ගැනයි ප්‍රකාශ කරන්නේ.

**එසකියල්** 1 : 1-28

එය එකම අවුලක් මෙන් ඔබට හැඟෙන්න පුළුවන්. එය වචනයෙන් ප්‍රකාශ කරන්න බැරි දෙයක් ප්‍රකාශ කරන්නට උත්සාහ කිරීමක්. ඒ දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයයි.

**එළිදරව්** 1 : 12-18

ජේසු සමිඳුන්ගේ ප්‍රේමවන්ත ගෝලයා වන ජුවාම් තුමාට, අන්තිම රාත්‍රි භෝජනයේ දී ජේසු සමිඳුන්ගේ ළයට හාන්සි වී සිටි ජුවාම් තුමාට, පැට්මොස් නම් දිවයිනේ දී උත්ථාන වූ ජේසු සමිඳුන් ශුද්ධභාවයෙන් ප්‍රකාශ වෙනවා. "උන්වහන්සේ දුටු කල මම මළ තැනැත්තෙකු මෙන් උන්වහන්සේගේ පාමුල වැටුණෙමි." දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය වටහා ගන්නට මෙය අනගි නිදසුනක්.

අපි දැන් දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය තුළට කිඳා බැසීමක් කරන්නට උත්සාහ කරමු. දෙවියන් වහන්සේ ශුද්ධවූ ප්‍රේමයයි. ශුද්ධ නිසා ළං විය නොහැකියි. ප්‍රේමය නිසා ළං විය යුතුයි. ශුද්ධවූ දෙවියන් වහන්සේ ගින්නක්, විනාශ කරන හෝ පවිත්‍ර කරන ගින්නක්. ගින්න නැති කරනවා. ශුද්ධවූ දෙවියන් වහන්සේ ප්‍රේමය නිසා පරඬැලක් හෝ නැති වන්නට ඉඩ හරින්නෙ නැහැ. ප්‍රේමය අනෙක් කෙනාව නැති කරන්නේ නැහැ. ඇති කරනවා. දෙවියන් වහන්සේ පූර්ණ ශුද්ධභාවය නිසා මුළුමනින් නැති කළ යුතුයි. උන්වහන්සේ පූර්ණ ප්‍රේමය නිසා නැති නොකර වෙනස් කරනවා, පවිත්‍ර කරනවා.

දෙවියන් වහන්සේගේ ප්‍රේමය ශුද්ධ නිසා පහත සඳහන් කරන සියලු ලක්ෂණ එහි ගැබ්ව තිබෙනවා. (ළං වීම හා ඈත් වීම, අනාවරණය වීම, හා අභිරහස්මක වීම, පොදු වීම හා විශේෂ වීම) දෙවියන් වහන්සේ ප්‍රේමය නිසා අපට ළං වෙනවා. ළං වෙද්දී ඈත් වෙනවා. උන්වහන්සේ අපට ළං වන විට උන්වහන්සේ අපට අණාවරනය වෙනවා. ඈත් වන නිසා අභිරහස්මක වෙනවා. නිරන්තර අභිරහස්මක ගතියක් නැත්නම් නිරන්තර අනාවරණයක් නැහැ. එනිසා උන්වහන්සේ පරණ වන්නේ නැහැ, නිරන්තරයෙන් නැවුම්. දෙවියන් වහන්සේගේ ප්‍රේමය සියල්ල පොදු කරන්න බලනවා. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය සියල්ල විශේෂ කරන්න බලනවා. මනුෂ්‍ය ජාතිය දෙස බලන්න. දෙවියන් වහන්සේගේ ප්‍රේමය සියල්ලන් පොදු කරනවා. ශුද්ධභාවය කෙනෙකුගෙන් අනෙකා

වෙනස් කරනවා, විශේෂ කරනවා. එනිසා එක සමාන පිටපත් නැහැ. දෙවියන් වහන්සේ මට ළං වෙද්දි මම මම වෙනවා. ප්‍රේමය ශුද්ධ නිසා මම විශේෂ වෙනවා. එය වෙනත් ආකාරයකින් කියනවා නම් මම මට අවශ්‍ය මා නොවෙයි, මැවුම්කරුට අවශ්‍ය මා නිර්මාණය වෙනවා. එයයි, උසස් පෞරුෂයක රහස.

ශුද්ධවූ ප්‍රේමයේ දෙවියන් වහන්සේ හා ගැඹුරින් බැඳෙන මනුෂ්‍යයා තුළ උන්වහන්සේ මේ පරස්පර විරෝධි යැයි පෙනෙන ඉහත සඳහන් ගුණාංග ගොඩනැගෙන්නට සලස්වනවා. උදාහරණයක් ගනිමු. ස්වාමි පුරුෂයා සහ භාර්යාව පවුලේ සිරස හා හදවත හැටියට ශුද්ධවූ ප්‍රේමය වන දෙවියන් වහන්සේ හා ගැඹුරින් සම්බන්ධ වන තරමට ඔවුන් තුළත් අනාවරණය වීම හා අභිරහස්මක වීම සිදුවෙනවා. එකිනෙකා අනාවරණය වෙලා අවසන් වන්නේ නැහැ. එය නිරන්තර අනාවරණයක්, නිරන්තර අභිරහස්මකභාවයක්, එනිසා නිරන්තර නැවුම්භාවයක්. එනිසා මරණය දක්වා එකිනෙකාට ප්‍රේම කරමින් එකට ජීවත් වීමට බලයක්. එහෙම නොවුනොත් කීප වරක් කියවා පසෙකට දමන නව කතාවක් වාගෙ වෙනවා, අනෙකාගේ ජීවිතය. කොතෙක් රසවත් වුණත් එකම නව කතාවක් මැරෙන තුරු කියවන්න බැහැ.

දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ප්‍රකාශ කිරීමත් උන්වහන්සේගේ ප්‍රේමයේ ප්‍රකාශනයක්. ශුද්ධවූ දෙවියන් වහන්සේ අපට ළං වීමයි, සැබෑ ප්‍රේමය. ළං වෙන්නට බැරි ශුද්ධවූ දෙවියන් වහන්සේ අපව ළං කර ගැනීමයි ප්‍රේමය, ශුද්ධවූ දෙවියන් වහන්සේ දුබල අප ලුහුබඳිමින් අපට සමාව දෙමින් නැවත නැවත ද සමාව දෙමින් අපව උසස් කිරීමයි සැබෑ ප්‍රේමය.

මේ මුළු ඉගැන්වීම කැටිකරල මමත් අදහස් ස්වල්පයක් එකතු කරන්න කැමතියි. මුළු විශ්වයම දෙවියන් වහන්සේගේ මැවීමක්. අප ජීවත් වන මේ පෘථිවියේ සිට අපට පෙනෙන පුංචි සීමාව දෙස බලමු. මේ සූර්යයා මැව්වේ මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ විසින්. සූර්යයා මහා ගිනිජාලාවක්. එය මැවූ දෙවියන් වහන්සේ ඊටත් වඩා ගිනිජාලාවක්. සූර්යයා අපෙන් කි.මී. කෝටි ගණනක් ඈතින් සිටින්නේ. ඒත් අපට දැනෙන උණුසුම ගැන සිතන්න. කිසිවකුට නොහැකියි, මහා දවාලේ හිස ඔසවා හිරු දෙස බලා සිටින්නට. හිරුගේ මහා තේජසක් ප්‍රකාශ වෙනවා. කිසිවකුට නොහැකියි සූර්යයාට ළං වන්නට, ළං වන්නටත් පෙර අළුවී යනවා. දෙවියන් වහන්සේ ඊටත් වඩා ගිනිජාලාවක්. ඒ උන්වහන්සේගේ ශුද්ධභාවයයි. ශුද්ධවූ ගිනිජාලාවක් වන දෙවියන් වහන්සේ අසීමිත ප්‍රේමයයි. අප මෙනෙහි කළ නික්මයාම 19 : 1-25 අනුව ස්වාමින් වහන්සේ ගිනිජාලාවක් මෙන් කන්ද මතට වඩිනවා. දෙවියන් වහන්සේ මෝසස්ට එන්න කියනවා. එනිසා ඔහුට උන්වහන්සේ වෙතට යන්නට පුළුවන්. වෙනත් කෙනෙක් ඒ මොහොතේ ඒ කන්දෙ හැපුනොත් අළු වී යනවා. ජේසු සමිඳුන් සියල්ලන්ගේ පාප උදෙසා කල්වාරි කඳු මත ගෙවූ අමිල මිලයෙන් පසු ශුද්ධවූ දෙවියන් වහන්සේ සියල්ලන්ට කියන්නෙ උන්වහන්සේ වෙත එන්න කියලයි. ජේසු සමිඳුන් තම ගැළවුම්කරුවාණන් ලෙස පිළිගනිමින් සියල්ලන්ට හැකියි, ශුද්ධවූ ප්‍රේමයේ දෙවිඳුන් වෙත පිවිසෙන්නට. උන්වහන්සේට ජාති ආගම් කුල භේද කිසිවක් නැහැ. මුළු මිනිස් ජාතියම උන්වහන්සේගේ දරුවෝ. එනිසා දෙවියන් වහන්සේ සියල්ලන්ට උන්වහන්සේ වෙත එන්න කියනවා. එලෙස අප ළං වන්නේ ශුද්ධවූ ප්‍රේමයේ දෙවිඳුන් වෙතට බව අප අවබෝධ කර ගන්නට ඕනැ.

විශ්වාසයේ ජනතාවගේ පියා හැටියට ආබ්‍රහම් තුමාට ඒ අවබෝධය තිබුණා. “අළු දූවිලි පමණක් වන මම ඔබට කතා කරමි. උදහස් නොවන සේක්වා.” (උත්පත්ති 18 බලන්න) ශුද්ධවූ ප්‍රේමයේ දෙවිඳුන් වෙතට අපි පිවිසෙමු, ගරුබියක් හා භක්ති ප්‍රේමයක් ඇතිව. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය අප ආදරයෙන් වැළඳ ගන්නවා. ඒ වැළඳ ගැනීම තුළම දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අප කඩමින්, අඹමින් පවිත්‍රකරණයට ලක් කරනවා. (එසේ වන්නේ අප නිදහස් කැමැත්තෙන් ඉඩ දෙනවා නම් පමණයි.) ශුද්ධවූ ප්‍රේමය වන දෙවිඳුන් වෙත පිවිසෙන අපි උන්වහන්සේගේ ඒ ද්විත්ව ක්‍රියාකාරීත්වයම ගෞරවයෙන් බාර ගන්න ඕනැ. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ එක පැති කඩක් ගැන පමණයි, අද බොහෝ කිතුනුවන්ගේ අවධානය යොමු වී ඇත්තේ. ඒ පැතිකඩ ඔස්සේ සුව මෙහෙයන් පැවැත්වෙනවා. ඒ සුව මෙහෙයේදි අප එකිනෙකා බාර ගත යුතු කුරුසියත් හැකි නම් ඉවත් කර ගන්නටයි උත්සාහ කරන්නෙ. ඇමෙරිකන් ජාතික ගරු ජෝර්ජ් කොසිකි පියතුමා මෙසේ පවසනවා. “සැබෑ සුවය කුරුසිය මාර්ගය බාර ගන්නට බැරිකමට සුවයයි.” සුව මෙහෙයේ දී තම ගැටළු මුල්කරගෙන පමණක් නම් යාච්ඤා කරන්නෙ එය ලොකු

ආත්මාර්ථයක්. සමිඳුන් පවසන්නේ ලෝ වැසි සියල්ලන් උදෙසා යැදුමෙන් මොරගසන ලෙසයි. එවිට ඔබගේ සියලු ගැටළු ගැන උන්වහන්සේ බලාගන්නා බවට පොරොන්දු වෙනවා. එළිදරව් 4 පරිච්ඡේදය බලන්න. ඒ පුංචි පරිච්ඡේදයේ සිංහාසනය යන වචනය 14 වරක් සඳහන් වෙනවා. ඒ සිංහාසනයෙහි වැඩසිටින මහෝත්තමයාණන්ගේ තේජශ්‍රීය ගැන එහි සඳහන් වෙනවා. සිංහාසනය අබියස සිටින ජීවමාන සත්වයන් හතර දෙනාගෙන් නිරන්තරයෙන් නික්මෙන වදන් සග ලොව සිසාරා රැව්පිළිරැව් දෙනවා. කුමක්ද, ඔවුන්ගෙන් නික්මෙන වදන්? "සිටියා වූ සිටින්නා වූ මතු සිටින්නා වූ සර්වපරාක්‍රම ස්වාමි වූ දෙවියන් වහන්සේ ශුද්ධය, ශුද්ධය, සුවිශුද්ධය." අපිදු ස්වර්ගයේ දේව නමස්කාරය හා එක් වෙමින් ශුද්ධවූ ප්‍රේමයේ දෙවියන් වහන්සේ අබියස ගරුබියෙන් මහත් බැතිපෙමින් එතුමන් නමඳිමු.

3. 1981 වසරේ දී "ඔබගේ නාමය ශුද්ධ වේවා" තේමාව යටතේ පැවැත්වූ ශුද්ධාත්ම මංගල උළෙල පසුබිම් කරගෙන මා ලැබූ ශුද්ධභාවයේ අත්දැකීම මා ඔබ සමග බෙදා ගන්නට කැමතියි. හැම වසරකම ශුද්ධාත්ම මංගල උළෙලේ තේමා දේශනය පැවැත්වූයේ ගරු සිරි ඔස්කා අබයරත්න පියතුමා විසින්. මෙවර තේමා දේශනය පැවැත්වීම මට පවරල, ඒ ඔස්කා පියතුමා විසින්මයි. ඒ මංගල උළෙලට පෙර සූදානම් වීමේ දින 9 තුළ මට වෙන වැඩක් යෙදී තිබුණේ නැහැ. ඒ දින 9 දේව ආශිර්වාදයෙන් පිරුණු කාලයක් වුණා. හරිම සාර්ථකයි. එය දෙවිඳුන්ගේ තෑග්ගක්. එනිසා මට හිතුනා තේමා දේශනය හොඳින්ම සිදුවෙයි කියල. පුබුදුවේ ගිහි මූලික සොයුරා මගෙන් ඇසුවා, දේශනයට පැය කීයක් වෙන් කරන්නද කියල. දින 9 සූදානම තුළ මා අත්දුටු ප්‍රබලත්වය නිසා මා කිවා දේශනය මෙනෙහි කිරීමට හා යැදුමට පැය තුනක් වෙන් කරන ලෙස.

ශුද්ධාත්ම මංගල උළෙල පවත්වන දිනය උදා වුණා. ඒ 1981 ජුනි හය වන දින. දින 9 තුළ මෙතෙක් පැවති සාර්ථකත්වය මගෙන් මුළුමනින් ගිලිහී ගිය ගතියක්. දෙවිඳුන්ගෙ සමීප බවක් දැනෙන්නේම නැහැ. සියල්ල පාළුව හිස්ව ගැඹුරු පිට අන්ධකාරය පමණයි, ඇත්තේ. ඒ සියලු අසාර්ථකත්වය මැද වුවද බයිබල් ඥානකාන්තියේ 11, 12 දේශන ඔස්සේ මට පැය දෙකක් හෝ කතා කරන්න පුළුවන්. බයිබල් ඥානකාන්ති කීපයක මා එලෙස කතා කර තිබෙනවා. ඒකම ආයේ කියන්න නොවෙයි නේ තේමා දේශනය මට පැවරුනේ. සමිඳුන් අමතා මා මෙසේ පැවසුවා. "ඔස්කා පියතුමා උපයෝගි කර ගනිමින් තේමා දේශනය මට පැවරුවේ ඔබ වහන්සේයි. එනිසා දේශනය සඳහා ඔබ මට යමක් දිය යුතුයි. මෙතෙක් ඒ සඳහා මට කිසිවක් ලැබුණේ නැහැ."

ශුද්ධාත්ම උළෙලේ ප්‍රශංසා මෙහෙය ඇරඹුනා. ඒ සමග තද කුණාටු සමග තද වැසි ඇද හැලුනා, පැය කීපයක්ම. ඒ යැදුම තුළ මගෙ හිත සමිඳුන් වෙත මෙලෙස ගලා ගියා. "ජේසු, ඔබ දන්නවා, මේ උළෙලට එන සියළු දෙනාම මෙතැනින් අර්ථවත් යමක් රැගෙන යනවා දකින්නට මා කැමතියි කියල. මට අවශ්‍ය වුණේ නැහැ ඒ දේශනය මා විසින්ම කරන්නට. එහෙත් එය මට පැවරී තිබෙනවා. දේශනය සඳහා අදහසක් මෙතෙක් ඔබ මට දුන්නේ නැහැ. ඔබට මගෙන් යමක් කර ගන්නට ඇති. ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් මගෙන් කර ගන්න. එය කිසිදු කොන්දේසියක් නැතිව මා දෙවිඳුන්ට ඉඩ දුන් පළමු අවස්ථාවයි.

දේශනය ඇරඹුනා. එය මගේ සුපුරුදු කටහඬ මගේ දේශන රටාව නොවෙයි. "මෙවර අපේ තේමාව ඔබගේ නාමය ශුද්ධ වේවා ! එක පුංචි ළමයෙක් සිප්පි කටුවකින් මුහුදේ වතුර පුංචි වළකට දාල මුහුද හිස් කරන්න කළ උත්සාහය වගේ දෙයක් තමයි මා දැන් කරන්න යන්නෙ. "ඉන්පසු මා අයිවෝ ඩෙනිස් සොයුරාට පැවසුවා, "එන්න මේ මයික් එක ළඟට. තනියම ගායනා කරන්න මේ ගීතය." ගීයක් මා ඔහුට යෝජනා කළා. "ශුද්ධාත්මයාණෙනි, // දිව්‍ය එළිය හදට දී, ඔබේ බලය මුදුන් වී, ජීවය දී අප සුදුකර නැණැස හොඳින් පහදවා, වඩිනු මැනවි ශුද්ධාත්මයාණෙනි // " ඔහු ගිය ගායනා කළ පසු මා දේශනය ඇරඹුවා. "මේ දෙවියන් වහන්සේ ගැන අපි කොහොම කතා කරන්නද?" එවිටම මට හැඟුණා තව මොහොතකින් මා සිහිසුන්ව ඇද වැටෙන බව. සිදුවිය හැකි හානිය අඩුකර ගන්නට මා විගස බිම වාඩි වන්නට උත්සාහ කළා. සිහිය ලැබෙද්දියි මට මතක් වුණේ මා දේශනයක් දෙමින් නේද සිටියෙ කියල. විසි දහසක් පමණ ජනතාවකගෙ යාච්ඤා හඬ ඇසුණා. ඕඩිකොලොන් සුවඳ තදින් දැනුනා. මගේ දෙඅත්ල, යටි පතුල්, හිස රත්වෙලා, ඔවුන් තදින් ඒවා පිරිමදිමින් යාච්ඤා කරමින් සිටි නිසා. මා අවට රැස්ව සිටි

අයගේ යාච්ඤාව වුයේ "අනේ ජේසු ඇන්තනි අයියව නැගිටුවන්න." "මෙය ජනතාවක් උදෙසා එක් අයෙක් ලබන ආලේපයකි." යන අදහස මා තුළට පතිත වුණා. (මා සිහිසුන් වී නැවත සිහිය ලැබුණේ මිනිත්තු විසි හතරකට පසුව බව මා මෑතකදීයි දැන ගත්තෙ. ඒ මිනිත්තු 24 තුළ පුබුදුවේ තරුණයින් 38 දෙනෙක් පමණ සිහිසුන්ව ඇද වැටුන බව මට පසුව දැනගන්නට ලැබුණා. එහි රහස මා තවමත් දන්නේ නැහැ. ඒ මහා වැසි කුණාටු තත්ත්වය තුළ ද මහලු, රෝගි, ළමා ඒ කිසිවෙක් වත් වැටිල නැහැ.)

ඔස්කා පියතුමා පැමිණ මගෙන් ඇසුවා අපි දැන් මොනවද කරන්නෙ කියල. මා කිව්වා දෙවියන් වහන්සේ මට ශක්තිය දුන්නොත් මා නැවත කතා කරන බව. තවත් අඩ හෝරාවක් පමණ ගීතිකා ගැයීම තුළ කාලය ගතවුණා. ඉන්පසු මා කීවා ඒ සඳහා මට කොහෙත්ම ශක්තිය නැති බව. පහන් වන තුරු මා ප්‍රථමාධාර අංශයේ යහනක වැතිර සිටියා. රිංචන් හා ඉඳුනිල් මා එහි කැඳවාගෙන ගොස් පහන් වන තුරු මා ළඟ සිටියා. සිදුවූ සියල්ල ගැන මා තුළ කිසි ගැටළුවක් කිසිදු කළකිරීමක් ඇතිවුයේ නැහැ. උළෙල අවසන්ව අලුත් දිනයක අරුණළු පැතිරෙද්දී පුබුදුවේ මහළු මවකගේ උස් හඬක් මට ඇසුණා. "නුවාන නවයවත් හරියට කරන්න නැතිව ඇති. නැත්නම් ඔහොම වැටෙනවද?" පුබුදුවේ මූලික එකතුවේ සොයුරෙක් පැමිණ මට කීවා "ඇන්තනි, සස්ටජන් එකක් අරගෙන බොන්න" කියල. ඒ සියල්ල මට සිනහවකින් බාර ගන්න හැකි වුණා. පුබුදු මූලික එකතුවේ තවත් සොයුරෙක් පැමිණ මට මෙසේ කීවා. "ඇන්තනි දේශනය දෙන්න ගිය එක වැරදියි. දේශනය දිය යුතු තිබුණේ ඔස්කා පියතුමයි. ඇන්තනිට වුණේ එදා උග්ශාට වූ දෙයයි." එය ඇසෙද්දී මගේ අභ්‍යාන්තරයේ කුණාටුවක් නිර්මාණය වන බව මා දුටුවා. මට මෙලෙස සිතුනා. "මට අවශ්‍ය වුණේ නැහැ දේශනය දෙන්නට. මට එසේ කරන්නැ යි පැවසුවෙ ඔස්කා පියතුමයි. දෙවියන් වහන්සේ ගහනව නම් එයාට නේ ගහන්න ඕනේ." ඔහු පැවසූ ඒ අදහස මට දවස පුරා වද දුන්නා. පසු දින රාත්‍රි ආහාරයෙන් පසු මට අවශ්‍ය වුණා, එදා මා වැටුණාට පසු ඔස්කා පියතුමා පැවැත්වූ දේශනය අසන්නට. "ඇන්තනීට යක්ෂයා ගැහුවා වැටෙන්ඩම." එය මට ඉතා තදින් බලපෑවා. දේශනයෙ වෙන කිසිම දෙයක් මගෙ ඔලුවට ගියේ නැහැ. ඒ සියල්ල එක්ව කුණාටු පමණක් නොවෙයි විදුලිකෙටීම්, අහස් ගිගුරුම් ඒ සියල්ල මා තුළ ඇරඹුනා.

මම මගෙ කුඩා කුටියට පිවිස දොර වසා ගත්තා. මම මහා අරගලයකට මැදිවී සිටියා. එය දෙවිඳුන් හා පොරබැදීමක්. ඔබ දැසම නොපියා නොනිදා මා සුරකින මගේ එඬේරාණන් ද? එසේ නැති නම් දේව රාජ්‍යය සඳහා යම් කාර්යයක් ඔබ විසින් පවරා ඔබට යදිමින් ඔබෙන්ම යැපෙමින් ඒ කාර්යය ඉටුකරන විට වැටෙන්ඩම ගහන්නට යක්ෂයාට ඉඩ දී නිදා ගන්න දෙවි කෙනෙක්ද ඔබ? මේ දෙකෙන් එකක් ඉල්ලා අස්කර ගන්නා තුරු මා නැවත ඔබට යාච්ඤා කරන්නෙ නැහැ. මෙයයි ඒ මහා පොරබැදීම. පසු දින උදේ හා දවල් ආහාරය සඳහාවත් මා කාමරයෙන් පිටතට ගියෙ නැහැ. "ඇන්තනි අයියේ, කාමරයේ දොර අරිනවද? මම වහලෙන් කාමරේට බහින්නද?" සවස නොයෙල් ලලිත් සොයුරා මගෙන් ඇසුවා. මම නැගිට දොර ඇරියා. මට තදින් උණ සෑදී තිබුණා. බෙහෙත් ගැනීම සඳහා ඔවුන් මා කැඳවාගෙන ගියා. ඉන්පසු දින දෙක ආහාරය සඳහා පමණයි, මා පිටතට ගියේ. ආහාරය අවශ්‍ය නිසා නොවෙයි, ඒ සඳහා නොආවොත් අනෙක් අයට ගැටළුවක් නිසා. කෑමට රුචියක් නැහැ. පිටතට ආ විට හෝ කිසිවෙක් සමග කතා කරන්නට හිතෙන්නෙ නැහැ. ඔවුන් මා දෙස බලන්නෙ බියෙන් වාගෙ. මා කීවා උඹල එක්ක නොවෙයි මා තරහ කියලා. මා තරහ කා එක්කද කියලා කිවේ නැහැ. ඇතුලත අරගලය දිගටම, ඒ අරගලය දෙවියන් සමග. "කරුණාකරල දෙකෙන් එක්ක ඉල්ලා අස්කර ගන්න."

තුන් වන දිනටත් එලෙසම, දිගටම නින්දක් නැහැ. එදින මැදියම් රැය වන විට මගේ ජීවිත පොළොවට ජලධාරා ගලා ඇවිත්, සශ්‍රීකත්වයක ලකුණු මතුවුණා. දෙවියන් වහන්සේ මට එලෙසයි. මාස ගණන් වියළි කාලයක්, පොළව ඉරීතලල, නොසිතූ විටෙක ජලධාරා ගලා ඒමක්, සශ්‍රීකත්වයක්. එවිට පසුකළ සියල්ල ආත්මයට තේරෙනවා. යා යුතු ඊළඟ අඩිය දැනෙනවා. දැන් ඒ සශ්‍රීකත්වය මා වෙත ගලා ඇවිත්. මා පැදුරෙ වාඩිවුණා. එය සංවාදයකට ඇරයුමක් කනට යමක් ඇසෙනවා නොවෙයි, ආත්මයට තදින් දැනෙනවා. සමිඳාණෝ මගෙන් යමක් විමසන බව දැනුනා. "දේශනවලදී ඔබ නිතර පවසනව නේද ජේසු කුරුසියෙ මරණය දක්වා කීකරු වූ බව. දැන් ඔබට වැටහෙනව ද මට කීකරු වීමේ ඇති අපහසුව? මට අවශ්‍ය ඕනෑම දෙයක් ඔබගෙන් කර ගන්නැයි ඔබ මට පැවසුවා නොවේද? මට අවශ්‍ය දෙය මා ඉටුකර ගත්තා. ඇයි ඔබට එය

බාර ගන්නට නොහැකි? මහා පිරිසක් ඉදිරියේ සිහිසුන්ව ඇද වැටෙන එක මදිපුංචිකමක් කියලා ඔබට හැඟෙනව ඇති. ඒත් එය මගේ කුරුසිය මරණය ඉදිරියේ කොපමණ අල්ප දෙයක්ද?" මම පැදුරේ දණ ගැසුවා. "ස්වාමිනී ඔබ වහන්සේ නිවැරදියි, මා වැරදියි, මට සමා වන්න. ඔබගේ සැලැස්ම අනුව මෙය මගෙ මරණය සිදුවන මොහොත නම් මා එයට සූදානම්." ශුද්ධභාවයේ කටුක අත්දැකීමක් අග පිතෘක ආදරය විඳිද්දි එතෙක් අත්දුටු අරගලය අවසන් වුණා. මහත් සොම්නසකින් ජීවිතය පිරී ගියා. එය පීඩාකාරි හේමන්තය එකවර අවසන්ව වසන්තය උදා වුණා වාගෙ. ඒ අත්දැකීම සමගම සමිඳුන් අබිමුව හද පත්ලෙන්ම නිරායාසයෙන්ම කියවෙන්නේ ඔබ මා ගෙන යන ඊළඟ පියවර කොයි තරම් අමාරු වුණත් කමක් නැහැ සමිඳුනි, ඔබගේ සැලැස්ම ඔස්සේම මා ගෙන යන්න. එනිසා ශුද්ධභාවයේ අත්දැකීම දෙවියන් වහන්සේ වඩාත් ගැඹුරින් අත්දැකීමට කැඳවීමක්. ඒ සියල්ල එලෙස සිදුවුණේ දෙවියන් වහන්සේ මටත් සියල්ලන්ටත් ඇති ආදරය නිසා මට වැටහුනා.

"ඇන්තනි, කුමක්ද මේ සිදුවිම? කුමක්ද ඒ පිළිබඳ ඔබගේ අත්දැකීම?" ඒ ප්‍රශ්නය පුබුදු නායකත්වය පමණක් නොවෙයි, පුබුදුවේ කිසිවකු මගෙන් ඇසුවේ නැහැ මේ දක්වා ද අසා නැහැ. ඒත් ඒ සිදුවීම පිළිබඳ හැම දෙනාටම තමන්ගේ විග්‍රහයක් තිබුණා. ඔවුන් ඒ විග්‍රහයන් තුළ පමණක්ම සිටියා. ඒත් ඒ සියලු දුබලකම් අතර දෙවියන් වහන්සේගේ ප්‍රබල ක්‍රියාවක් සිදුවුණා. ශුද්ධාත්ම මංගල උළෙලේ තේමාව ඔස්සේ වසරක් පුරා සතිපතා දේශන දීම කිසි දා සිදුවී නැහැ. ඒත් මෙවර එය සිදුවුණා. ඔස්කා පියතුමා "ඔබගේ නාමය ශුද්ධ වේවා" තේමාව ඔස්සේ වසර පුරාම සඳුදා දිනවල මූලස්ථානයේ යැදුමේ දී දේශනයක් පැවැත්වූවා. එවිට මා 'නව මිනිසා' සඟරාවේ සංස්කාරක. මා තුළ ප්‍රබල මෙහෙයවීමක් සිදුවුණා. ඒ දේශනාවල හරය උකහාගෙන 'නව මිනිසා' වෙනුවෙන් ලිපි හයක් සකසන්නට. එයින් උපුටා ගත් කරුණු 4වන අංකයෙන් ඔබ ඉදිරියේ තබන්නට මා අදහස් කරනවා.

# 55. “ඔබගේ නාමය ශුද්ධ වේවා !”

**(දෙවන කොටස)**

**4.** ජේසු සමිඳුන් එක් තැනක යාච්ඤා කරමින් සිට නිම වූ පසු උන්වහන්සේගේ ගෝලයන්ගෙන් එක් කෙනෙක් කතා කොට “ස්වාමිනි, ජුවාම් තමාගේ ගෝලයන්ට ඉගැන්වූවාක් මෙන් අපට ද යාච්ඤා කරන්නට ඉගැන්වුව මැනව”යි කීවේය. උන්වහන්සේ ඔවුන්ට කියන සේක් “නුඹලා යාච්ඤා කරන කල පියාණෙනි, ඔබගේ නාමය ශුද්ධ වේවා ! ---- යනුවෙන් යාච්ඤා කරන්නැ යි කී සේක.” (ලූක් 11:1-4) අපටත් යාච්ඤා කරන්න උගන්වන්න කියලයි, ශ්‍රාවකයින් ජේසු සමිඳුන්ගෙන් ඉල්ලා සිටියෙ. යාච්ඤා කිරීම ජුදා ජනතාවට අලුත් දෙයක් නොවෙ යි. පුරාණ ගිවිසුමේ පවා ජුදා ජනතාව යහවේ දෙවියන් වහන්සේට යාච්ඤා කළා. එසේ නම් ඇයි, යාච්ඤා කරන්න අපට උගන්වන්න කියල ශ්‍රාවකයින් ජේසු සමිඳුන්ගෙන් ඉල්ලා සිටියේ? නිසැකවම ජේසු සමිඳුන්ගේ යාච්ඤාවේ ඔවුන් ලොකු වෙනසක් දකින්න ඇති. ඔවුන් ඒ වෙනස අගය කළ නිසයි, එලෙස යාච්ඤා කරන්න අපටත් උගන්වන්න කියල ජේසු සමිඳුන්ගෙන් ඉල්ලා සිටියෙ.

ජේසු සමිඳුන්ගේ යාච්ඤාව තුළ ඔවුන් දුටු ඒ වෙනසට හේතුව කුමක්ද? පැරණි ගිවිසුම් යුගයේ ජනතාවට දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන යම් අවබෝධයක් අත්දැකීමක් තිබුණා. එනිසා ඔවුන්ගේ යාච්ඤාව තුළ යම් ගරුබියක් තිබුණා. ශුද්ධවූ දෙවියන් වහන්සේ තමාගේ ප්‍රේමවන්ත පියා හැටියට ප්‍රබල අත්දැකීමක් ඔවුන්ට තිබුනෙ නැහැ. මහෝත්තම දෙවියන් වහන්සේව අබ්බා (තාත්තා) ලෙස අමතන්නට ඉගැන්වීම ජේසු සමිඳුන් යාච්ඤාව පිළිබඳව කළ මහා විප්ලවයක්. ජේසු සමිඳුන්ගේ යාච්ඤාවේ මහත් ගරුබියක් මෙන්ම මහත් භක්ති ප්‍රේමයක් එකට මුසු වී තිබුණා. “පියාණෙනි, ඔබගේ නාමය ශුද්ධ වේවා” ජේසු සමිඳුන් එලෙස යාච්ඤා කරන්න කියලයි සිය ශ්‍රාවකයින්ට උපදෙස් දුන්නේ. එහි මූලික අරුත කුමක්ද? ඔබගේ නාමය හෙවත් ස්වභාවය අපටත් සකල මිනිස් සංහතියටත් ශුද්ධ වේවා ! ඔබ ශුද්ධ බව අපට අත්දකින්නට ලැබේවා ! එය අපගේ මූලික පරම අත්දැකීම වේවා ! යනු එහි අරුතයි.

දෙවියන් වහන්සේව අත්දැකීම පිළිබඳව උදාර ආදර්ශය ජේසු සමිඳුන් වශයෙන් නිසැකවම හඳුන්වන්න පුළුවන්. ජේසු සමිඳුන්ගේ අත්දැකීම දෙවියන් වහන්සේ පිළිබඳව මූලිකවම උන්වහන්සේගේ පිතෘකභාවය හා ශුද්ධභාවය පිළිබඳවයි. මෙවර ශුද්ධාත්ම රැලියේ දී දෙවියන් වහන්සේ එතුමන්ගේ ශුද්ධභාවය පිළිබඳව අපට අත්දැකීමක් දුන්නා. අප ඒ ඉදිරියේ ව්‍යාකූල වන්නට ඇති. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දැකීම ඉදිරියේ ව්‍යාකූල වීම අනිවාර්යෙන්ම සිදුවන දෙයක්. දෙවියන් වහන්සේ අපගේ පියා. උන්වහන්සේ ප්‍රේමයයි. උන්වහන්සේගේ ප්‍රේමය ශුද්ධයි. උන්වහන්සේගේ ප්‍රේමය එකමුතු ලක්ෂණයේ හා ශුද්ධභාවයේ ලක්ෂණයේ සංකලනයක්. ශුද්ධභාවය යනු දෙවියන් වහන්සේගේ භයානකභාවය අන්‍යභාවය ප්‍රකාශ කිරීමක්. උන්වහන්සේ සම්පූර්ණයෙන්ම අන්‍යයෙක්, එයයි ශුද්ධභාවය. සමතාවයක් ඇත්නම් හඳුනා ගන්න පුළුවන්. දෙවියන් වහන්සේ පූර්ණ අන්‍යභාවයයි. යමෙකුව හඳුනාගැනීමේදී ඔහු මෙවැනි කෙනෙක් කියල අප තුළ චිත්‍රයක් ඇඳෙනවා. එහෙත් දෙවියන් වහන්සේ අනාවරණය වීමේ දී උන්වහන්සේ පිළිබඳ අප තුළ ඇඳෙන චිත්‍රය කඩා වැටෙනවා. අප ව්‍යාකූල වන්නෙ ඒ නිසයි. උන්වහන්සේ අපට කියන්නෙ මා අන්‍යයෙක්, පූර්ණ අන්‍යභාවය මම යිඃ කියලයි. එයයි, භයානකකම. එනිසා ශුද්ධභාවයේ මුළු අත්දැකීමම තේරෙන්නෙ නැහැ, ව්‍යාකූලයි. මනුෂ්‍යයා උසස් කරන්නට දෙවියන් වහන්සේ දෙන කැඳවීමේ මූලිකම අත්දැකීමක්, උන්වහන්සේගේ ශුද්ධභාවය අත්දැකීමට දෙන කැඳවීම. ඒ අත්දැකීම භයානක ව්‍යාකූල අත්දැකීමක් කියන්නේ ඇයි? එය අපව ශූන්‍යභාවයට ගෙන යන අත්දැකීමක් නිසයි, එය දරන්න අමාරු කැඩෙන්නට සිදුවන අත්දැකීමක් නිසයි. දෙවියන් වහන්සේගේ අන්‍යභාවය දරන්න බැරි නිසා අප වෙවුලනවා, වැටෙනවා, ආවරණ සොයනවා. එනිසා දෙවියන් වහන්සේ, දෙවියන් වහන්සේ හැටියට හමුවීමේ දී නිතරම භයක් ඇත.

ආවරණයක් සොයන්නට අප පෙළඹෙනවා. මුහුණ දෙන්න බැහැ, අපට එය බරපතල වැඩියි. අපගේ ස්වභාවය තල්ලු කරනවා ඒ අත්දැකීමෙන් පැනල යන්න, හැංගෙන්න. දෙවියන් වහන්සේ ඒ අත්දැකීමට අප කැඳවා ඉවරයි. අපට ඇත්තේ ඒ කැඳවීමට අනුකූලව ඉදිරියට ගමන් කරන එකයි.

දෙවියන් වහන්සේව දෙවියන්වහන්සේ ලෙස අත්දැකීමේදී, උන්වහන්සේගේ අන්‍යයභාවය අත්දැකීමේදී අප වියවුල් වෙනවා, හැංගෙනවා. එහෙත් සමිඳුන් අපට කියනවා “භය නොවන්න, මා ඔබේ ආදරණීය පියා” කියල. අන්‍යභාවය අත්දැකීම ඉදිරියේ අපගේ මුවින් පිටවන්නේ “මට විනාශය විය” කියල. එහෙත් එයම මගේ පූර්ණත්වය සලසන අත්දැකීමක්. ප්‍රේමය නිසාම අනාවරණය වෙනවා. මට ළං වෙනවා. ප්‍රේමය නිසාම මා ළං වෙන්නෙ අන්‍යභාවයටයි. එනිසා ළං වෙන්නට ළං වෙන්නට ඈත්වෙනවා. ඒ දුරස්තරභාවය අත්දකින්නට අත්දකින්ට ළං වෙනවා. දෙවියන් වහන්සේගේ මූලික පරම ලක්ෂණය “මම මමයි” “I am who I am” සම කරන්න බැහැ, එයමයි භයානකකම. මේ මහා අත්දැකීමටයි, සමිඳුන් අපව කැඳවන්නෙ. මෙය බැලූ බැල්මට පරස්පරවිරෝධි නිසා ඥානික අදහස් ගොඩකින් තේරුම් ගන්න බැහැ. එය ශුද්ධාත්මයාණන් විසින්ම අපගේ ආත්මය තුළ අනාවරණය කළ යුතු දෙයක්. එනිසා අප දැනගතයුතු පළමුවන දේ තමයි දෙවියන් වහන්සේ හා අප අතර ඇති මහා පරතරය. පරිශුද්ධ අසමසම අන්‍යයාණෝ දෙවියන් වහන්සේයි. මෝසස් පිඩා 10 තුළින් දිගටම අත්දැක්කෙ දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයයි. දෙවියන් වහන්සේ දෙවියන් වහන්සේ බව පාරාවෝ මිනිසෙක් පමණක් බව, ඊජිප්තු දෙවිවරුන් මිනිසා විසින් සාදාගත් දෙවිවරුන් පමණක් බව මෝසස් අවබෝධ කර ගත්තා. මේ මහා අත්දැකීමයි මුල් වුණේ පාරාවෝ ළඟට අභීතව යන්නට. එනිසා දෙවියන් අත්දකිමින් අප යන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දැකීමට සමිඳුන්ගෙන් ලැබෙන ඇරැයුම.

දෙව් පියාණන්ගේ ප්‍රේමයත් ශුද්ධභාවයත් පූර්ණව අත්දැකීමේ පරමාදර්ශය ජේසුයි. කුරුසියක එල්ලෙන, කටුවලින් සිදුරු වී ලේ වැගිරෙන ජේසුගේ ශ්‍රී මුහුණ දෙස බලන්න. ජේසු සමිඳුන් දෙව් පියාණන්ගේ ශුද්ධභාවය භයානකබව ගැඹුරුම ලෙස අත්දුටු අවස්ථාව එය නොවේද? දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දැකීම ඉදිරියේ ජොහාන්, සාවුල් බිම වැටුණා. මෙන්න කුරුසියක් මත ජේසු සමිඳුන් ඒ අත්දැකීමට පූර්ණව මුහුණ දෙන අයුරු. අමුත්තක් නැතිද, දෙවියන් වහන්සේගේ මේ ක්‍රියාකාරීත්වයේ? “මම මම වෙමි, මම ශුද්ධයි, මා පූර්ණ අන්‍යභාවයයි.” ඒ සියල්ලම එහි ගැබ්ව තිබෙනවා. ජේසු සමිඳුන් කුරුසිය මත දෙව් පියාණන්ගේ ශුද්ධභාවයත් පිතෘක ප්‍රේමයත් අත්දකිනවා. “මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද?” එය ශුද්ධභාවය අත්දැකීම තුළින් මතුවන මොරගැසීමක්. “පියාණෙනි ඔබගේ හස්තයට මගේ ආත්මය භාර කරමි.” එය පිතෘක ආදරය අත්දැකීමේ ප්‍රකාශනයක්. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දැක්ක හැටියෙ අපට අත්දැකීමට ලැබෙන ලක්ෂණ තුනක් හැටියට හඳුන්වන්න පුළුවන්. දිළිඳුකම, වෘතශුද්ධිය හා කීකරුකම. එය ජේසු සමිඳුන්ගේ කුරුසියේ මරණය තුළ පූර්ණවම දිස් වෙනවා. මෙන්න, කෙනෙක් දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ඉදිරිපිට කුරුසිය මත පූර්ණව පෙනී සිටිනවා, ආවරණ සොයාගෙන නැහැ. දෙවියන් වහන්සෙගේ ශුද්ධභාවය නිසා උන්වහන්සේට සම්පූර්ණයෙන් පහරක් වදිනවා. මේ අත්දැකීම තුළින් තම අයිතිවාසිකම්වලට මරණයක් අත්දුටුවා. එය දෙවියන් වහන්සේ ඉදිරිපිට ගැඹුරුම දිළිඳුකමයි. දුගින්ගෙන් දුගියෙක් වශයෙන් එතුමන් පෙනී සිටියා. ශුද්ධභාවයේ අත්දැකීම ඉදිරියේ තම ආශාවන්ට මරණයක් අත්දුටුවා, මාංශික ආශාවන්ට පමණක් නොවෙයි මාංශයටත් මරණයක්. එය වෘතශුද්ධිය හෙවත් පිරිසිදුකමයි. උන්වහන්සේ තම කැමැත්තට මරණයක් අත්දැක්කා, එය පූර්ණ කීකරුකම යි. දිළිඳුකම, වෘතශුද්ධිය හා කීකරුකම, එය ජේසු සමිඳුන්ගේ කුරුසියේ උත්තම පූජාව තුළින් නික්මෙන ත්‍රිවිධ මරණයක්. ක්‍රිස්තුස් වහන්සේ කුරුසිය මත අත්දුටු දේව ශුද්ධභාවයේ අත්දැකීම එමගින් අප හා බෙදා ගන්නවා.

මේ ත්‍රිවිධ මරණයට සම්බන්ධවෙමින් ගමන් කරන්නට අපට සිදුවෙනවා. දෙවිඳුන්ගේ ශුද්ධභාවය තුළ එතුමන්ගේ පිතෘක ආදරය ගැඹුරින් අත්දකින තරමට ඔබගේ කැමැත්ත සිදුවේවා කියලා අපට හදවතින්ම කියන්න පුළුවන් වෙනවා. දෙවියන් වහන්සේ ආදරය කරන්නෙ මනුෂ්‍ය

අපි බලාපොරොත්තු වන විදිහට නොවෙයි. උන්වහන්සේ ආදරය කරන්නේ ශුද්ධභාවය අත්දැකීමට සැලැස්වීමෙන්. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දැකීම ඉදිරියේ මනුෂ්‍ය ආදරයෙන් නොයැපෙන ගමනකට ඇතුලු වන්න සිදුවෙනවා. දෙවිඳුන්ගෙ ආදරය අත්දැකීම තියෙන්නෙ මේ ශුද්ධභාවය තුළ ත්‍රිවිධ මරණය අත්දැකීම මත බව අප අමතක කළ විට අප එකිනෙකාගේ ආදරය බලාපොරොත්තු වන්න පුළුවන්. අප ශුද්ධභාවය අත්දැකීම තුළ ත්‍රිවිධ මරණය අත්දකින පිරිසක් ලෙස ගමන් කළ යුතුයි. වැඩ ගොඩක් කිරීමට වඩා මේ අත්දැකීම තුළ ගමන් කිරීමයි දෙවිඳුන්ට අවශ්‍ය වන්නේ. ඒ අත්දැකීමයි ලෝකය පුබුදු වන්නේ. මේ අත්දැකීමත් ඒ හා බැඳුන භාවනාව හා යාච්ඤාව අපට අවශ්‍යයි. එනිසා දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දැකීම අප මුහුකුරා ගිය තත්ත්වයට ගෙන එන සන්ධිස්ථානයක්. මනුෂ්‍ය මට්ටමින් අප සම්පූර්ණයෙන් පවිත්‍රව සිටියත් ශුද්ධවූ දෙවියන් වහන්සේ ඉදිරිපිට අපවිත්‍රයි. ශුද්ධවූ දෙවියන් වහන්සේ දුබල අප ස්පර්ශ කිරීමයි, ශුද්ධවන්තකම. අවශ්‍ය වන්නේ ශුද්ධවූ දෙවියන් වහන්සේ ඉදිරියේ ගැඹුරෙන් පෙනී සිටීමයි. එතුමන්ගේ ස්පර්ශයට ඉඩ දීමයි. එය ව්‍යවස්ථාවෙන් ලැබෙන ධර්මිෂ්ඨකම නොවෙයි, එය දෙවියන් වහන්සේගෙන් ලැබෙන ධර්මිෂ්ඨකමයි. ශුද්ධභාවය අප අත්දැකිය යුත්තේ. කුරුසිය මාර්ගය තුළින්, එසේම ශුද්ධභාවයේ අත්දැකීම අප කුරුසියේ මාර්ගයට ගෙන යාමක්. සුවිශේෂයේ සඳහන් පරස්පරවිරෝධි කියමන් දෙවියන් වහන්සේ වෙනස් බවට ඉඟියක්. මේවා සමථයට පත්වන්නේ මිනිස් බුද්ධියෙන් නොවෙයි. එය නිරාකරණය වන්නේ ශුද්ධාත්මයාණන් තුළයි. “මා පූර්ණ අන්‍යභාවයයි එනිසා මා වෙනස් මගේ ක්‍රියාකාරීත්වය වෙනස්.” සමිඳුන් අපට එලෙස පවසනවා. එනිසා මගේ බලාපොරොත්තු සුන්වන විට, මා බියෙන් වෙවුලන විට ඔබ වෙනස් බව මට අවබෝධ කර දෙන්න. ඔබ පූර්ණ අන්‍යභාවයයි. එනිසා මගේ සිතුම් පැතුම් මගේ සැළසුම් අනුව ඔබ වෙනස් නොවන්න. ඔබ ඔබම වෙන්න මට ආදරය කරන අන් අය වගේ නොවන්න. මක්නිසාද මිනිස් ආදරය හැසිම්වලට බර නිසා, එය මා කොටු කරන නිසා, එය මමත්වයෙන් කිළිටි වී ඇති නිසා, එය මගේ පෞරුෂය පූර්ණව වර්ධනය නොකරන නිසා. එනිසා මගේ ජීවිතයේ සෑම ප්‍රදේශයක් පිළිබඳවම ඔබ ඔබම වෙන්න. මා හිතන පතන ලෙස ඔබ වෙනස් නොවන්න. මා ඉල්ලා මොරගැසුවත් ඔබ එලෙස වෙනස් නොවන්න. ඔබගේ සිතුම් පැතුම් අනුව මා වෙනස් කරන්න. ඒ අදහසම අපට ඇති සමිඳුන් පා මුල නැවතී සිටින්නට, ගැඹුරු යාච්ඤා ජීවිතයක් තුළ රැදෙන්නට. මේ අදහසම අපේ ආකල්ප අපේ ජීවිත ක්‍රම වෙනස් කරනු ඇත. අපේ යාච්ඤාව සරල කරනු ඇත. දෙවි පියාණෙනි, ඔබයි පරිපූර්ණ අසමසම අන්‍යභාවය. එනිසා යාච්ඤා ජීවිතයක් සඳහා මා ඔබ පාමුලට එන්නම්. ඔබ පාමුල රැදෙන්නම් එවිට ඔබට අවශ්‍ය ලෙස මා වෙනස් කරන්න.

අප දේව ජනතාවක් නම් අපගේ විශේෂ ලක්ෂණය විය යුත්තේ දෙවියන් වහන්සේ අපට කතා කරන වචනයට විවෘතව සිටීමයි, ඒ වචනයට කීකරු වීමට උනන්දු වීමයි. “මා ශුද්ධයි, මා වෙනස්, මා පූර්ණ අන්‍යභාවයයි.” උන්වහන්සේ අපට මෙලෙස ද පවසනවා නියතයි. “මා ප්‍රේමයයි. ඒත් මගේ ප්‍රේමය වෙනස්. ඔබ හොඳයි කියන දේ නෙවි මා හොඳ වශයෙන් සලකන්නෙ. ඔබ නරකයි කියන දේ නෙවි මම නරක වශයෙන් සලකන්නෙ. ඔබ ප්‍රතික්ෂේප කරන දේ මා ආදරයෙන් වැළඳ ගන්නව. ඔබ උතුම් ලෙස සලකන දේ, ඔබේ වටිනාකම් මට කුණු කසළ. මා වෙනස්. මා ආදරය ප්‍රකාශ කරන්නෙ නුඹලා ප්‍රකාශ කරන අන්දමට නෙවි. මා පූර්ණ අන්‍යභාවයයි. “මේ වචනය අපව සම්පූර්ණයෙන් අලුත් තත්ත්වයකට පත් කරන්නට යනවා. අප තුළ අභ්‍යාන්තර පෙරළියක් ඇති කරන්න යනවා, ඒ මගින් අලුත් ජනතාවක් ගොඩනගන්නට යනවා. උන්වහන්සේ ගොඩනගන්නට යන්නේ රාජකීය ජනතාවක්. අප හිතන අයුරු රාජකීය ජනතාවක් නෙවි. රාජකීය කියද්දි අපට හැඟෙන්නෙ ඔටුන්නක් පැළඳ සිහසුන මත වැජඹෙමින් ලොකු තේජසක් ඇතිව යටත් වැසියන් පාලනය කරන කෙනෙක්. දෙවියන් වහන්සේ කියනවා “මා වෙනස්. මගේ රාජකීය භාවය කුමක්ද කියා දකින්න නම් කටු ඔටුන්නක් පැළඳ කුරුසියක එල්ලී සිටින මගෙ පුතා දෙස බලන්න.” උන්වහන්සේගේ රාජකීයභාවය කුරුසියක එල්ලී කටු ඔටුන්නක් පැළඳ ගෙන රජකම් කිරීමක්. මේ මහා සත්‍යතාවය අපේ සිතුම් පැතුම් අපේ බලාපොරොත්තු සියල්ල වෙනස් කරනවා නිසැකයි.

මේ අනාවරණ තුළ අප දැන් කරන යාච්ඤා වෙනස් විය යුතු නැද්ද? උන්වහන්සේ අපට මෙසේ පවසනවා නිසැකයි. “මාව වෙනස් කරන්න නුඹලාට බැහැ. මගේ කැමැත්ත අනුව නුඹලා

වෙනස් විය යුතුයි" ජේසු සමිඳුන් අපට පවසනවා. ඉල්ලන්න සොයන්න තට්ටු කරන්න කියලා. එය අපට දෙන බවට පොරොන්දු වෙනවා. එහෙත් කුමක්ද ඉල්ලන්න කියන්නෙ? "නුඹලාගේ ස්වර්ගිය පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙන සේක්ද?" (ලූක් 11: 9-13) උන්වහන්සේගේ ලොකුම ආශාව ශුද්ධාත්මයාණන් දානය කිරීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේටයි හැකි අපට දෙවියන් වහන්සේව නිසි ලෙස හඳුන්වා දෙන්නට. "ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා." කියලයි පිලිප්පි 2:5 සඳහන් කරන්නෙ. ජේසු සමිඳුන් කෙසේද දේව ආදරය අත්දැක්කේ? මිනිස් ලොවේ ආදරවන්ත පුතෙක් ආදරණීය තාත්තා කෙනෙකුගේ ආදරය අත්දකිනවා වාගෙ නොවෙයි, ජේසු සමිඳුන් දේව තාත්තගෙ ආදරය අත්දැක්කෙ. එය වෙනස්. අමුතු පිළිවෙලකට දේව ආදරය අත්දැකල එයින් අලුත් වූ සිතක් ජේසු සමිඳුන්ට තිබුණා. ජේසු සමිඳුන් දෙවියන් වහන්සේගේ පිතෘකභාවය හා ශුද්ධභාවය පිළිබඳව පූර්ණ අත්දැකීමක් තිබුන නිසයි වේදනා මැද කළකිරීල යන ගමන අඩාල කර නොගත්තෙ. උන්වහන්සේ ජයග්‍රහණය දක්වාම ගියා, "සම්පූර්ණයි" කියන තුරු ගමනෙ යෙදුනා. පියාණන් වහන්සේ ප්‍රේමය බව, ඒ ප්‍රේමය ශුද්ධ බව, එය පූර්ණ අනන්‍යභාවය බව ජේසු සමිඳුන් අවබෝධ කරගෙන තිබුණා. එනිසා ගැඹුරුම ප්‍රතික්ෂේප කිරීම් මැද හෝ ආත්ම අනුකම්පාවට වෛරයට එතුමා තුළ ඉඩක් තිබුනෙ නැහැ. අසාර්ථකත්වයේ වේදනා මැද අප කළකිරෙනවා. සියල්ල හොඳින් සිදුවෙනවා නම් දෙවිඳුන් අඳහන්න පහසුයි. අපේ බලාපොරොත්තු කඩවෙද්දී අප කඩාවැටෙනවා. ඊට හේතුව දෙවියන් වහන්සේ ක්‍රියා කරන්නේ අමුතුම පිළිවෙලකට බව අප අවබෝධ කරගෙන නැති නිසයි. උන්වහන්සේ වෙනස්. එය අවබෝධ කරගන්නා තරමට අපට ප්‍රශ්න මැද සාමය, වේදනා මැද ප්‍රීතිය, දුබලකම් මැද බලය, කුරුස ගසක් මත ජයග්‍රහණය අත්දකින්න ලැබෙනවා.

අපටත් යාච්ඤා කරන්න උගන්වන්න කියල ශ්‍රාවකයින් ජේසු සමිඳුන්ගෙන් අයැදින විට එතුමාගෙන් ලැබුනෙ ලංවීමේ වචනයක් හා දුරස්තර වීමේ වචනයක්. අපටත් හැකිද අර්ථවත්ව එලෙස යාච්ඤා කරන්න? දෙවිඳුන් මට ඉතා සමීප බව මට ඉතා දුරස්තර බව අත්දැකීමක් කරගෙන යාච්ඤා කරන්න ඔබටත් හැකිද? එක විට ලංවන්නත් දුරස්තරව සිටින්නත් පුළුවන්ද? යාච්ඤා කිරීමේදී පළමුවෙන්ම මේ සත්‍යතාවය පිළිගන්නා ලෙසයි, ජේසු සමිඳුන් අපට පවසන්නේ. දේව තේජස හිස් කරගෙන මිනිසකු වශයෙන් මෙලොවට පැමිණි ජේසු සමිඳුන් මෙලොව මාංශවත්ව ගතකළ දිවියේදී උරුම කරගත් ඒ මහා අත්දැකීමයි. "පියාණෙනි ඔබගේ නාමය ශුද්ධ වේවා" යන වැකිය ප්‍රකාශ කළේ. දෙව් පියාණන් පිළිබඳව උරුම කරගත් මේ අත්දැකීම් සම්භාරය නිසයි, ජේසු සමිඳුන්ගේ යාච්ඤාවේ වෙනසක් ගෝලයින් දුටුවෙ. දෙවිඳුන්ගේ දුරස්තරභාවය, භයානකභාවය හා අනන්‍යභාවය තුළ ඇති පිතෘකභාවය එදිනෙදා ජිවිතයේ සිදුවීම් තුළ අප ආත්මයට දැනෙන පරිදි අවබෝධ කර දෙන්නට පුළුවන් ශුද්ධාත්මයාණන් වහන්සේට පමණයි. දෙවිඳුන් අත්දැකීමයි, අප දිවියේ ලොකුම පොහොසත්කම. දෙවිඳුන් කැමති රුව මා තුළ මතුවීම තරම් වෙනත් යහපතක් මට නැහැ. දෙවිඳුන් කැමති රුව මා තුළ මතුවීමට ඉඩ දීමයි, සමාජයට මා තුළින් විය යුතු ලොකුම සේවාව. සමිඳුන් කැමති පරිදි මා වෙනස් කරන්නට ඉඩදෙන විටයි, සමිඳුන් කැමති රුව මා තුළ මතුවන්නේ. එනිසා "පියාණෙනි, ඔබගේ නාමය ශුද්ධ වේවා !" එය අපගේ පරම යැදුම කර ගනිමු. ඒ මහා නිධානයට උල්පතට කිඳාබසිමින් ඔබගේ නාමය ශුද්ධ වේවා කියල අර්ථවත්ව යාච්ඤා කරන්න අපට හැකි නම් යැදුමක් වශයෙන් එයම සෑහෙනවා.

"සිතේ උතුරන දේ කටින් පිට වෙනවා" කියලයි, ජේසු සමිඳුන් පැවසුවෙ. ජේසු සමිඳුන්ගේ සිතේ පිරී ඉතිරෙමින් පැවති අත්දැකීම් සම්භාරයයි, ප්‍රසිද්ධ ජිවිතයේ එතුමා කළ කී දේ තුළින් පිටාරා ගලා ගියෙ. එනිසා 18 වසරක සමිඳු අත්දැකීම් දෙස කිඳා බැසීම කිතුනු අපගේ යුතුකමක්. ඒ සඳහා අපට සහය වන්නට සුවිශේෂයේ එකම සිද්ධියයි. සටහන්ව ඇත්තේ (ලූක් 2:40-52) එය ජේසු සමිඳුන්ගේ දොළොස් හැවිරිදි වියේදී සිදුවූ සිද්ධියක්. ජුදා ජනතාව වයස 12 වැදගත් වශයෙන් සැලකුවා. ළමා වියේ සිට තරුණ වියට පා තබන කාලය එය වශයෙන් සැලකීමයි, ඊට හේතුව. මේ සිද්ධිය තුළින් සුවිශේෂකවරයා සඳහන් කරන්නේ ජේසු සමිඳුන් තුරුණු වියට පා තැබීම සමගම දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය අත්දුටු බවයි. සුරැකි පියාට, මවට නොදන්වා දින තුනක් ජෙරුසලෙම් දෙව්මැදුරේ නැවතී සිටි ළමා ජේසු සමිඳුන් ගැන සිතන්න. එතුමා නිසැකවම වගකීම් හඳුනන කෙනෙක්. සුරැකි පියා හා මව තමා සොයමින් වෙහෙසෙන බව එතුමා දන්නවා. දේව තාත්තා මට කියනවා මෙලෙස ක්‍රියා කරන්න කියල. මෙලෙස ජේසු සමිඳුන්ගේ

ඇතුලාන්තයේ ඝට්ටනයක් තියෙන්ට ඇති. මෙලෙස කිරීම අබ්බා පියාණන්ගේ කැමැත්තයි. එනිසා මා එය කළ යුතුයි. ඒ නිසැකකමක් උන්වහන්සේ තුළ තියෙන්න ඇති. "නුඹලා මා සෙව්වේ මක්නිසාද? පියාගේ ගෘහයේ මා සිටිය යුතු බව නුඹලා නොදැන සිටියෙහුද?" මෙයින් පෙනී යනවා මවට, සුරැකි පියාට තමා තුළ ඇති වගකීමක් ඉක්මවා යන මහා වගකීමක් දෙවි පියාණන් කෙරෙහි තමාට ඇති බව ළමා ජේසු සමිඳුන් අවබෝධ කරගෙන සිටි බව.

මේ සිද්ධියෙන් ජේසු සමිඳුන් දේව තාත්තා පිළිබඳ ලැබූ අත්දැකීම කුමක්ද? මනුෂ්‍ය ප්‍රඥාවත් දේව ප්‍රඥාවත් අතර ලොකු වෙනසක් ඇති බව, දේව ප්‍රඥාව උතුම් බව එතුමා වටහා ගන්න ඇති, මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය, දේව ක්‍රියාකාරිත්වය අතර ඇති පරතරය අවබෝධ කර ගන්න ඇති. මනුෂ්‍ය අප හොඳයි කියන දේ නෙවි, දෙවියන් වහන්සේ හොඳයි කියන්නේ. එයත් වටහා ගන්න ඇති. එය දේව තාත්තා වෙනස් බව ශුද්ධ බව වයස අවුරුදු 12 දීම ගැඹුරු ලෙස අත්දැකීමක්. තමා ඊට එකඟ විය යුතු බව ජේසු සමිඳුන් වටහා ගත්තා. මේ අත්දැකීමේ උතුම්කම ඉදිරියේ ජේසු සමිඳුන් "පියාණෙනි ඔබගේ නාමය ශුද්ධ වේවා !" කියල අර්ථවත්ව කියන්න ඇති. එනිසා කවුරු මොනවා හිතුවත් මේ වෙනස් භාවයට කීකරු වන්න ජේසු සමිඳුන් තීරණය කළා. ජේසු සමිඳුන් වසය අවුරුදු 30 වන තුරු අප්‍රසිද්ධ ජීවිතයක් ගත කළේ. ඒ වසර 18 පුරා ජේසු සමිඳුන් දොළොස් හැවිරිදි වියේදී දේව ශුද්ධභාවය පිළිබඳව ලැබූ අත්දැකීමට විවෘත වෙමින් දෙවිඳුන්ගේ වෙනස්බව හා ඒ තුළ ඇති පිතෘකභාවය ගැඹුරින් අත්දුටුවා. ඒ තුලින් දේව ප්‍රඥාවයි, එතුමා අයිති කර ගත්තේ.

අප කිතුනු දිවිය තුළ සමිඳුන්ට කැපවුණු විගස ලොකු පරීක්ෂාවක් අපට තියෙනවා, වැඩ ගොඩක් කරන්නට. එවිට දෙවියන් වහන්සේ ශුද්ධබව වෙනස්බව මතක් කර ගන්න. නිශ්චලතාවය මැද පුංචි දේ කරමින් ගතකළ ජේසු සමිඳුන්ගේ වසර 30 ගැන එවිට මෙනෙහි කරන්න. දෙවිඳුන් අත්දකින ජනතාවගේ පුංචි වැඩ තුළිනුයි දෙවිඳුන් බොහෝ විට ලොකු වැඩ කරගෙන තිබෙන්නේ. ඒ දෙවියන් වහන්සේ වෙනස් නිසයි, බොහෝ කිතුනු ජීවිත අවුල් කර ගන්නෙ ජේසු සමිඳුන්ගේ වසර 18 ක අත්දැකීම බිඳක් හෝ නොලබා වැඩ ගොඩක් කරන්නට පෙළඹෙන නිසයි. ජේසු සමිඳුන් එදා ශ්‍රාවකයින් කැඳවන විට කීවෙ "මා අනුව එන්න" කියලයි. අද අපට කියන්නෙත් එයමයි. කුමක්ද, මා අනුව යාම කියන්නෙ? දේව තාත්තා පිළිබඳව මා ලැබූ අත්දැකීම ඔබත් ලබා ගන්න. එදා මොසස් දාවිත් පවා දෙවියන් වහන්සේව අත්දැක්කා. ජේසු සමිඳුන් ඊට වඩා වැඩි දෙයක් කියන්නයි මෙලොවට වැඩියෙ. මා දේව තාත්තාව අත්දැක්කේ කෙසේද, එලෙසම ඔබත් මා තුළින් දේව තාත්තාව අත්දකින්න. මෙය අති උදාර කැඳවීමක්. එනිසා ක්‍රිස්තියානිය සුචරිතවාදයක් නොවෙයි. එය ඊට වඩා ගැඹුරු යථාර්ථයක්. ජේසු සමිඳුන් අපේ යොමුව කරගෙන එතුමන් අත්දුටු අයුරින් දෙවි පියාණන් අත්දකින්නට කැඳවීමක්. මෙම කැඳවීමට පිළිතුරු දෙන තරමට අපගේ ජීවිත තුළ ඇතිවන වෙනස අපට දැකගන්න පුළුවන්. එනිසා ක්‍රිස්තියානිය හොඳ ගතිගුණ වගාකර ගන්නට පොර බැදීමක් නොවෙයි. දෙවියන් වහන්සේ පිළිබඳ අපගේ අත්දැකීම ගැඹුරු වන තරමට උතුම් ගතිගුණ අප තුළ නිරායාසයෙන් ඇතිවනු නියතයි. එයයි දෙවියන් වහන්සේගෙන් ලැබෙන ධර්මිෂ්ඨකම. ජේසු සමිඳුන් යහවේ දෙවියන් වහන්සේව කිසිවෙක් අත්නුදුටු තරම් ගැඹුරු අන්දමින් අත්දැක්කා. එහි ප්‍රතිපලය තමා තුළ කොටුකරල තියාගන්න බැහැ. එය පිටාරා ගලා ගියා. එයයි කිතු සමිඳුන්ගේ තුන් අවුරුදු ප්‍රසිද්ධ ජීවිතය.

විදුලිය, ගිගුරුම් හඬ, කුණාටුව, වලාකුළු ආදිය පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය හා සම්බන්ධ සංකේත. ඒවා භයානකකමක් ප්‍රකාශ කරනවා. ජේසු සමිඳුන් දේව ශුද්ධභාවය අත්දැකීමේදී භයානකකම අත්දැක්කෙ නැද්ද? පුරාණ ගිවිසුමේ බොහෝ දුරට තිබුනෙ භයානකකම පිළිබඳ බාහිර සංකේත. බාහිර සංකේත. හොඳයි මේ අත්දැකීමට මුල පුරන අයට. ජේසු සමිඳුන් විදුලිය, ගෙරවීම්, කුණාටුව වලාකුළු තමාගේ ජීවිතයේ අභ්‍යන්තරයේ අත්දැක්කා. ඒ තුළින් දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය, වෙනස්භාවය, භයානකභාවය, අත්දැක්කා. කුමක්ද භයානකකම? අප කුමටද භය වන්නේ? අපට හුරුපුරුදු නැති අමුතු දෙයක් හදිසියේ දුටුවොත්

අප භය වෙනවා. එයට හුරුවෙද්දි භය නැතිව යනවා. දෙවියන් වහන්සේ පිළිබඳ අපට හුරු වෙන්න පුළුවන්ද? දෙවියන් වහන්සේ අසීමිත නිසා කොයි තරම් ළං වුණත් තවත් උන්වහන්සේව අත්දකින්න තියෙනව නම් අපට කවදාවත් උන්වහන්සේ හුරු කරගන්න පුළුවන්කමක් නැහැ. දෙවියන් වහන්සේ තුළ හැම විටම අමුත්තක් තිබිය යුතු නැද්ද? අන්‍යභාවයක් තිබිය යුතු නැද්ද? දෙවියන් වහන්සේ පූර්ණ අන්‍යභාවය නිසා අපට කවදාවත් හුරු වන්න බැහැ. උන්වහන්සේට ළංවන තරමට තවත් අලුත් දේ දකිනව නම්, ළංවන තරමට තවත් අමුතු නම් උන්වහන්සේට හුරු වන්න බැහැ. හුරු වන්න බැරි නිසා මනුෂ්‍යයින් හැටියට අප තුළ හැම විටම දැනෙන්න ඕනැ උන්වහන්සේගේ භයානක බව. එනිසා දෙවියන් වහන්සේ නිතරම අලුත්, එකාකාරි නැහැ. ජේසු සමිඳුන් මෙය අත්දැක්කා. "මගේ තාත්තා අමුතුයි නේද? ඊළඟට කුමක්ද?" ඊළඟ පියවරට ජේසු සමිඳුන් නිතරම විවෘතව සිටියා, කුමන දෙයක් ආවත් එය පිළිගන්න සූදානම්ව සිටියා. ඊට හේතුව දෙවියන් වහන්සේගේ වෙනස්බව පිළිගෙන එය අත්දැක තිබීමයි.

අප හැම එය අත්දැකිය යුතුයි. මට හුරුපුරුදු නැති අත්දැකීම් තුළින් දෙවියන් වහන්සේ මා ගෙන යනවා. මා ගෙන යන තැන සමිඳුන් දන්නවා. අපට ඇත්තේ විශ්වාසයෙන් ගමන යන්නට. එලෙස ජේසු සමිඳුන්ව කුරුසියේ වේදනාත්මක මරණයට ගෙන ගියා, උත්ථානයට ගෙන ගියා. ස්වර්ගීය සිංහාසනයට ගෙන ගියා, එනිසා මේ භයානකකමට අප භය විය යුතු නැහැ. අප එයට ගෞරව කළ යුතුයි. දෙවියන් වහන්සේට අප එකිනෙකා පිළිබඳ ශුද්ධවූ සැලැස්මක් තිබෙනවා. හැම මොහොතක් පාසාම, හැම සිද්ධියක් තුළින්ම උන්වහන්සේ මට ළංවෙලා එය අනාවරණය කරනවා. අප එයට විවෘත විය යුතුයි. මට නොතේරෙන මගේ බලාපොරොත්තු ඉක්මවා යන ඒ උදාර සැලැස්ම මා තුළ ඉටුකරන්නට සමිඳුන් සූදානම්ව සිටිනවා. මා ඊට බාධා නොකර ඉඩ දිය යුතුයි. මෙය ශුද්ධවූ ගමනක්, එනිසා එය වෙනස් ගමනක්. කරදර අමාරුකම් මැද දුෂ්කර ගමනක යෙදුනත් නිතරම අලුත් දෙයක් අත්දකිමින් යන නිසා එය ප්‍රීතිමත් ගමනක්. එනිසා එය නිතරම නැවුම්. ශීත කාලවලදී වෙනත් රටවල කුරුල්ලන් අප රටට එනවා. උන් එන්නේ කෙසේද? ඒ කුරුල්ලො තටු විදහගෙන සුළං තරංගයට ඉඩ දෙනවා තමාව ගෙන යන්නට. එය අමුතු ගමනක්. අප පියාපත් දිගහැර ඉඩ දෙන්න ඕනැ, ශුද්ධාත්ම තරංගයට අපව ගෙන යන්නට. දේව ශුද්ධභාවය පිළිබඳ අත්දැකීමක් ලැබුනොත් ඒ බලය ඉදිරියේ වෙන ප්‍රශ්නයක් අහන්න දෙයක් නැහැ, පියාපත් දිගහැර ඉඩදෙනවා මිස. යක්ෂයා, ලෝකය හා මාංශය මට පහර ගසන විට ද ඒවා තුළ ද දෙවියන් වහන්සේ මට ප්‍රේම කරමින් මා ගෙනයනවා. වෙන තාත්තෙක් නම් ඒවායින් මා බේරගන්න උත්සාහ කරාවි. දේව තාත්තා වෙනස්. ඒවා සියල්ල තුළිනුයි, සමිඳුන් මා සැලැස්ම කරා ගෙන යන්නේ. ඒ නිසා මා කලකිරෙන්න අවශ්‍ය නැහැ. මට තියෙන්නේ තටු විදහා ගෙන ඒ සැලැස්මට අනුව මා ගෙන යන්නට ඉඩ දෙන එක විතරයි.

මේ මොහොතෙ ඔබ පාපිෂ්ඨයි කියල ඔබට හිතෙන්න පුළුවන්. එය ඔබට ලොකු වේදනාවක් වේවි. එවිට සැනසිලිදායක වචනයක් ගලා එනවා. එය කුමක්ද? මා වෙනස්. ඔබගේ සුදුසු නුසුදුසුකම මා ඉදිරියේ වෙනස්. එනිසා දෙවියන් වහන්සේගේ වෙනස් භාවය ගැඹුරින් අත්දැකීම වැදගත්. මට මා ගැන ඉවසන්නට, අන් අය ඉවසන්නට ඔවුන් විනිශ්චය නොකරන්නට එය ඉතා වැදගත්. දෙවියන් වහන්සේ සම්පූර්ණයෙන්ම වෙනස්. මේ මහා සම්බන්ධතාවයට ගැඹුරින් පිවිසුනොත් අපේ ආකල්ප වෙනසක් ඇතිවනු නියතයි. එනිසා වැදගත්ම දෙය හොඳ වීම, බලගතු වීම, වැඩ ගොඩක් කිරීම නොවෙයි, පූර්ණ ආකල්ප වෙනසක් ඇති වීමයි වැදගත්. එහි ප්‍රතිපලය ජීවිත පරිවර්තනයක් ඇති වීමයි. මෝසස්, යෙසායා වැනි අය ද දේව ශුද්ධභාවය අත්දුටුවා. ඒ අත්දැකීම් සියල්ල එකට කැටිකරල ගත්තත් ඊටත් වඩා ගැඹුරු අන්දමින් ජේසු සමිඳුන් දේව ශුද්ධභාවය අත්දුටුවා, පූර්ණව අත්දුටුවා. එනිසා ජේසු සමිඳුන්ගේ ක්‍රියාකාරීත්වය එදා සමාජයට තේරුම් ගන්න අපහසු වුණා. එය දේව ප්‍රඥාවයි. ශු බයිබලයේ අනාවරණය වන සකල දේව ප්‍රඥාවේ හරය "ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වාමියාණෝය" යන ප්‍රකාශනයේ අන්තර්ගතවී තිබෙනවා. හැම දිවසක්ම ජේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ ලෙස ප්‍රකාශ කළ යුතු බව, හැම දණක්ම ජේසු සමිඳුන්ගේ ස්වාමිත්වය ඉදිරියේ නැමිය යුතු බව දේව නියමයයි. එයයි, දෙවි පියාණන්ගේ මහිමයට කරන ප්‍රශංසාව. කිතු සමිඳුන්ගේ ස්වාමිත්වය භාරගෙන තම ජීවිතයේ හැම ප්‍රදේශයක්ම එතුමන්ගේ ස්වාමිත්වයට යට කිරීමයි සැබෑ පිබිදීම.

දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය, වෙනස්භාවය නිසා උන්වහන්සේ අසමසම අනන්‍යයාණන් වශයෙන් හඳුන්වන්න පුළුවන්. එනිසා අපගේ පරම පැතුම නම් ඔබ වහන්සේ ඔබ වහන්සේම වේවා හෙවත් මා පිළිබඳව අප පිළිබඳව සියල්ලන් පිළිබඳව ඔබ වහන්සේගේ අසමසම අනන්‍යභාවය ඉටුවේවා යන්නය. මෙලෙස "ඔබගේ නාමය ශුද්ධ වේවා" යනුවෙන් අබ්බා පියාණන්ට යාච්ඤා කරමින් අප කුමක්ද ප්‍රකාශ කරන්නේ? මෙය උන්වහන්සේව අගය කිරීමක්, ප්‍රශංසා කිරීමක් නොවේද? මෙන්න අමාරු දෙයක්. සැම විටම සැම දෙයකටම සමිඳුන්ට ප්‍රශංසා කිරීම කොහෙත්ම පහසු නැහැ. මෙය මනුෂ්‍ය ස්වභාවයට එකඟ නැති මනුෂ්‍ය ඥානයට අනුකූල නැති ඉතා අමාරු දෙයක්. දුක්ගැහැටවලටත්, ශාරීරික මානසික ආත්මික වේදනාවන්ටත් සුංවුණු බලාපොරොත්තුවලටත් කඩාවැටුණු සැලසුම්වලටත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට අපට හැකිද? "ඔබගේ නාමය ශුද්ධ වේවා" යන කෙටි එහෙත් භාවපූර්ණ යැදුම අපගේ එදිනෙදා ජීවිතයේදී හුඟක් ප්‍රායෝගික වන්නේ මෙන්න මෙවැනි අවස්ථාවලදීය.

"ඔබගේ නාමය ශුද්ධ වේවා" යනු කෙටි වැකියක්. එහෙත් එහි අන්තර්ගත වී ඇති නිධානය අසීමිත යථාර්තයක්. එනිසා මේ මහා නිධානයට යාච්ඤා ජීවිතයක් තුළ අප කිඳාබැසිය යුතුයි. එවිට අපට හදවතින්ම මෙලෙස කියන්නට හැකි වේවි. "පියාණෙනි, මා පිළිබඳව ඔබට ඇත්තේ අභිරහස්මක අනුපමේය සැලැස්මක්. ඔබගේ සැලැස්මට අනුව මා ගෙන යන්න. වේදනා හා අසාර්ථකත්වය මැදින් මා ගෙන යන විට ගමන් විඩාව නිසා හදපත්ලෙන් මා ඔබට මොරගැසුවත් මා පිළිබඳ ඔබගේ සැලැස්ම වෙනස් නොකරන්න. "ජේසු සමිඳුන් දෙව් පියාණන්ගේ ශුද්ධභාවයේ අභ්‍යන්තරයට කිඳා බැස එහි සුන්දරත්වය, ප්‍රේමය අත්දකින තරමට උන්වහන්සේගේ හද පත්ලෙන් මතු වූ පැතුම කුමක් වන්නට ඇද්ද? "පියාණෙනි, ඔබ වහන්සේ වෙනස් නොවන්න. ඔබ වහන්සේ ඔබ වහන්සේම වන්න. ඔබගේ නාමය ශුද්ධ වේවා." ජේසු සමිඳුන් ඒ අත්දැකීම අප හා බෙදා ගන්නට ආශාවෙන් සිටිනවා. ප්‍රතාපවත් කිතු සමිඳුන්ගේ අනුග්‍රහය ලබා මේ අසමසම යථාර්ථය අත්දකිනන්ට අප යොමු වන තරමට අප ජීවිත නවතාවයට පත්වනු නියතයි. "ඔබ වහන්සේ ඔබ වහන්සේම වන්න. ඔබගේ සැලැස්ම එසේම කරන්න. එසේ කීමම සැබෑ අගය කිරීමක් නොවේද? අපගේ කැමැත්තට වඩා දේව කැමැත්ත අගය කිරීමක් නොවේද? අපගේ කැමැත්ත දේව කැමැත්තට යට කිරීමක් නොවේද? එය නොවේද දෙවිඳුන්ට අපගෙන් පිදෙන උතුම්ම ප්‍රශංසාව. සැබැවින්ම එය දෙවියන් වහන්සේගේ ස්වභාවය අගය කිරීමක්. එනිසා පියාණෙනි, ඔබට ප්‍රශංසා වේවා කියනවාට වඩා ඔබගේ නාමය ශුද්ධ වේවා කීම වඩාත් අර්ථපූර්ණ නැද්ද? නිතරම සැම දෙයකදීම දෙවිඳුන්ගේ සැලැස්මට සිය කැමැත්තෙන් යට වී එතුමන්ගේ කැමැත්ත එලෙසම ඉටු වේවා කියා පතන සැම මොහොතකම අපි දෙවිඳුන්ට නිසි ලෙස ප්‍රශංසා කරමු. යෙසායා 55: 8-11 බලන්න. මනුෂ්‍යයින්ගේ යෝජනා හා මාර්ග දෙවියන් වහන්සේගේ යෝජනා හා මාර්ගවලට වඩා මුළුමනින්ම වෙනස්, අහසට පොළොව වාගෙ වෙනස්. උන්වහන්සේගේ යෝජනා හා මාර්ග අහස මට්ටමේ. එනිසා අපි වඩා අර්ථවත්ව "පියාණෙනි ඔබගේ නාමය ශුද්ධ වේවා !" යනුවෙන් යාච්ඤා කරමු.

5. දෙවියන් වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමය ගැන **මහත්මා ගාන්ධි තුමා** මෙසේ පවසයි.

"ඔහු පාරිශුද්ධතම සාරය වේ. විශ්වාසය ඇති අයට හුදෙක්ම ඔහු දෙවියන්ය. සියලුම අයට ඔහු සියලුම දේ වේ. ඔහු අප තුළ සිටින නමුත් අප පසුකොට හා ඉක්මවා සිටී. ඔහු දීර්ඝ දුක්ප්‍රාප්තිය වේ. ඔහු ඉවසන නමුත් භයානකද වේ. ඔහු නිතරම අපට පසුතැවිලි වීමට අවස්ථාව දෙන බැවින් ඔහු සදාකාලිකවම සමාව දෙයි. හොඳ හා නරක අතර අපේම තෝරා ගැනීම කිරීමට අප නිදහස්ව තබන බැවින් ලෝකයා දන්නා උතුම්ම ප්‍රජාතන්ත්‍රවාදියා ඔහුය. ස්වතන්ත්‍රභාවය නමින් සම්පූර්ණයෙන්ම ප්‍රමාණවත් නොවන ඉඩ ප්‍රමාණයක් අපට සලසන ඔහු අපේ දෙතොලින් බඳුන ඇද දමන බැවින් කවදා හෝ ලෝකයා දැන සිටි දරුණුම ඒකාධිපතියා ද ඔහු වෙයි."

(ශ්‍රී ක්‍රිෂ්ණා ක්‍රිපලානිගේ "All Men Are Brothers" "එක මවකගේ දරුවෝ" ඇසුරෙනි.)

ලෙබනන් ජාතික කවියකු හා දාර්ශනිකයකු වන **ඛලිල් ජිබ්රාන්ගේ** **The Prophet** (දිවැසිවරයා) පොතේ ප්‍රේමය පිළිබඳ අනගි නිර්මාණයක් දක්නට ඇත. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයත් ඒ ප්‍රේමයෙහි ඇති ශුද්ධභාවයත් පිළිබඳ කිතුනු දැක්ම එහි කදිමට නිරූපනය වේ.

''එසේ නම් ප්‍රේමය ගැන කියන්නැ'' යි අල්මිත්‍රා කීවාය. එකල්හි හෙතෙම හිස ඔසවා ජනයා දෙස නෙත් හෙළා බැලුවේය. නිශ්චලතාවයක් ඔවුන් වෙත පතිත විය. අනතුරුව මහා හඬකින් හේ මෙසේ කීවේය.

''ඔහුගේ මාර්ග දුෂ්කර ප්‍රපාත සහිත ඒවා වන නමුත් ප්‍රේමය ඔබට අත වනන විට ඔහු පසුපස යන්න. ඔහුගේ පියාපත් තුළ සැඟ වී ඇති කඩුවෙන් ඔබට තුවාල සිදු විය හැකි නමුත් ඔහුගේ පියාපත් තුළට ඔබ ගනු ලබන කල ඔහුට අවනත වන්න. උතුරු සුළඟ උද්‍යානය ආලපාළු කරන්නාක් මෙන් ඔහුගේ කටහඬින් ඔබගේ සිහින සිඳි වැනසී යා හැකි නමුත් ඔහු කතා කරන කල ඔහු කෙරෙහි විශ්වාසය තබන්න. මන්දයත්, ප්‍රේමය ඔබට ඔටුනු පළඳවන්නාක් මෙන් ම ඔහු ඔබ කුරුසියක ඇණ ගසනු ද ඇත. ඔහු ඔබගේ වැඩීම සඳහා වන්නාක් මෙන් ම ඔබගේ පාහිනු ලැබීම සඳහා ද වන්නේය. ඔහු ඔබගේ උස් ම තැනට ආරෝහණය වී හිරු එළියේ සැලෙන ලෙලෙන ළපටි ම අතු වැළඳ ගෙන සුරතල් කරන්නාක් මෙන් ම ඔබගේ මුල් වෙත ද අවරෝහණය වී ඒවා පොළොව බදාගෙන සිටීමෙන් සොලවා කම්පනය කොට දමන්නේය.

ධාන්‍ය කරල් එකතු කර ගන්නාක් මෙන් ඔහු ඔබ තමන් වෙතට එකතු කර ගන්නේය. ඔබ නග්න කරනු පිණිස ඔහු ඔබ පාහින්නේය. ඔබ දහයියා පොතුවලින් නිදහස් කරන පිණිස කුල්ලෙන් පොළන්නේය. ඔබ සුදෝ සුදු වන තෙක් ඔහු ඔබ අඹරන්නේය. ඔබ පහසුවෙන් නැමෙනසුලු කරන්නට හික්මවන්නට ඔහු ඔබ මනා ලෙස අනන්නේය. ඉන් අනතුරුව ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධ මංගල්‍ය භෝජනයේ ශුද්ධ පූපය වන පිණිස ඔබ ඔහුගේ ශුද්ධ අග්නියට කැප කරනු ලබන්නේය. ඔබ ඔබගේ හදවතේ රහස් දැනගනු පිණිසත්, ඒ දැනුම කරණකොට ගෙන ජීවිතයාගේ හෘදයේ කුඩා කැබැල්ලක් වන පිණිසත් ප්‍රේමය මේ සියලු දෙය නියත වශයෙන් ම ඔබට කරන්නේය. ඔබගේ බියපත් බව නිසා ඔබ ප්‍රේමයේ සාමය හා ආනන්දය පමණක් ම සොයන්නේ නම් ඔබ ඔබගේ නග්නත්වය වසාගෙන ධාන්‍ය පාහින කමතෙන් ඉවත් වී, සිනාසෙන නමුත් මුළු සිනාවම සෙන්නට නොහැකි, හඬා වැලපෙන නමුත් සියළුම කඳුළු සලන්නට නොහැකි ඒ සෘතු භේදයෙන් තොර ලෝකයට පලායන්න.

ප්‍රේමය අන් කිසිවක් දානය නොකරන්නේයඃ දානය කරන්නේ එය ම ය. එය කිසිවක් නොගන්නේයඃ ගන්නේ ද එයින් ම ය. ප්‍රේමය කිසිවක් හිමිකර ගන්නේ නැතඃ එය හිමිකර ගන්නට ද නොහැකිය. මන්දයත් ප්‍රේමය, ප්‍රේමය තුළම සෑහීමට පත්වන්නේය. ප්‍රේමයේ ගමන් මඟ මෙහෙය වන්නට ඔබට පුළුවනැ යි නොසිතන්න. මන්දයත්, ඔබ සුදුසු යැයි යෝග්‍ය යැයි දැන හැඳින ගතහොත් එය ඔබගේ ගමන් මඟ මෙහෙය වන බැවිනි. එය ම පූර්ණත්වයට පත්කර ගැනීමෙන් තොර අන් ආශාවක් එයට නැත්තේය. එහෙත් ඔබ ප්‍රේම කරන අතර ආශාවන් ද රැක ගන්නට උවමනා නම් මේවා ඔබේ ඒ ආශාවන් කර ගන්න. දිය වී රෑ අඳුරට තම ගීය ගයන ගලා බස්නා දොල පහරක් වීමට, අතිශය මෘදු භාවයේ වේදනාව දැන ගැනීමට, ප්‍රේමය පිළිබඳ ඔබගේ ම අවබෝධයෙන් තුවාල ලැබීමට, කැමැත්තෙන් හා ප්‍රීතියෙන් යුතුව රුධිර දානයට, හිමිදිරි පාන්දර පියාපත් විදහා ගත් හදවතකින් යුතුව අවදිව ප්‍රේමයේ තවත් දවසක් ගැන ස්තුති කියන්නට, ඉර මුදුන් වූ මද්දහන් පැයේ විශ්‍රාම ගෙන ප්‍රේමයේ අභිනන්දනය ගැන මෙනෙහි කිරීමට, සැඳෑ සමයේ ගොම්මන් වේලාවේ කෘතඥතා පූර්ණ හැඟීමෙන් පෙරළා ගෙදර බලා එන්නට, අනතුරුව ප්‍රේමවන්තයා වෙනුවෙන් ඔබගේ හද තුළ යැදුමක් හා තොල මත ප්‍රශංසා ගීයක් ඇතිව නිදා සැනසෙන්නට.'' (මෙය සිංහලට පරිවර්තනය කළේ සිරිල් බී. පෙරේරා සූරීන් ය.)

# 56

## "මගේ දෙවන පැමිණීම ආසන්නයි. ඒ මහිමාන්විත පැමිණීම උදෙසා මහා පවිත්‍රකරණයක් මේ සිදුවන්නේ."

**1.** දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය පිළිබඳව 1981 ජුනි 6 වන දින මා ලැබූ අත්දැකීම "ශුද්ධාත්ම පිය සටහන්" 54 වන පරිච්ඡේදයේ සටහන්ව තිබෙනවා. මා ඒ අත්දැකීම ලබා දැන් (2021) වසර 40ක් සම්පූර්ණ වෙනවා. මේ වසර 40 පුරා ජේසු සමිඳුන් ඉගැන්වූ යාච්ඤාව උච්චාරණය කිරීමේදී මා මුවින් නික්මුණේ "ඔබගේ නාමය ශුද්ධ වේවා ! යන වදන්. ශුද්ධභාවයේ අත්දැකීම ඉදිරියේ වියවුල් වෙලා, කඩා වැටිල, ඒ තුළ උපරිමව විඳවල ඒ අත්දැකීම තුළ ගැබ්ව ඇති පිතෘක ආදරයේ රසය විඳගත්තට පස්සෙ "ඔබගේ නාමය ශුද්ධ වේවා !" යන්න ලඝු කරන්න මට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. මා ලැබූ දේව ශුද්ධභාවයේ පළමුවන අත්දැකීමෙන් පසු මේ දක්වා වසර 40ක් පුරා උන්වහන්සේ මට ප්‍රකාශ වන්නේ ශුද්ධභාවයේ අත්දැකීම් රැසක් ඔස්සේමයි. ඒත් මා ලැබූ දේව ශුද්ධභාවයේ පළමුවන අත්දැකීමේදී වාගෙ ඒවා තුළ මා කඩා වැටෙන්නෙ නැහැ. ඊට හේතුව මා අත්දුටු දේව ශුද්ධභාවයේ පළමුවන අත්දැකීමේ ගැබ්වූ පිතෘක ආදරය මා රස වින්ද නිසා. එනිසා නැවත නැවත සිදුවන ශුද්ධභාවයේ අත්දැකීම් කොතෙක් අපහසු වුණත් ඒ තුළ ඇත්තේ බලාපොරොත්තුවක්. ඒ බලාපොරොත්තුව නිසා ඒ සියල්ල ඔරොත්තු දෙනවා. එනිසා අපට අත්දකින්නට සිදුවන දේව ශුද්ධභාවයේ පළමුවන අත්දැකීමේදී වියවුල් වෙලා, කඩාවැටිල, උපරිමව විඳවල ඒ අත් දැකීමේ ගැබ්වන පිතෘක ආදරය විඳගන්න එක ඉතා වැදගත්.

කිතුනු ජනතාවගේ වසරේ උතුම්ම මංගල්ලය වන ජේසු සමිඳුන්ගේ උත්ථානයේ මංගල දින දෙව්මැදුරු තුනක දේව මෙහෙය තුළ සිදුවූ බිහිසුණු බෝම්බ පිපිරීම් මේ දේශය මුහුණ දුන් දේව ශුද්ධභාවයේ පළමුවන අත්දැකීමයි. කොරෝනා වෛරසය නිසා ලෝකයම මුහුණ දෙන ව්‍යසනය අද ලෝකය මුහුණ දෙන දේව ශුද්ධභාවයේ පළමුවන අත්දැකීමයි. කොරෝනා ව්‍යසනය මගින් මනුෂ්‍යයාගේ අධ්‍යාත්මිකත්වය නැවත ගොඩනැගීම සඳහා සිදුවන සාධනීය ලක්ෂණ යම් තරමකින් හෝ ලෝකය අවබෝධ කරගනිමින් සිටිනවා. ඒත් 2019 අප්‍රේල් 21 මේ දේශය මුහුණ දුන් දේව ශුද්ධභාවයේ අත්දැකීමේ ගැබ්වන පිතෘක ආදරය අවබෝධ කර ගන්නට මේ දේශය තවමත් අපොහොසත්ව සිටිනවා. මේ සිදුවීම් තුළ ගැබ්ව ඇති පිතෘක ආදරය අපට අවබෝධ කර දෙන්නටයි, ජේසු සමිඳුන් මේ වදන් අපට පවසන්නේ. ජේසු සමිඳුන්ගේ ඒ වදන් ඔබම ගැඹුරින් අධ්‍යයනය කර අවබෝධ කර ගන්න.

(උපුටා ගැනීම - 'ශුද්ධාත්ම පිය සටහන්' 53 පරිච්ඡේදයෙන්)

**2019 අප්‍රේල් 21 - පාස්කු ඉරිදා**

"---- එදා මනාලයයි (ජේසු සමිඳුන්) මනාලිය (මිනිස් සංහතිය) වෙනුවෙන් දිවි පිදුවෙ. මගේ උත්ථානයේ මංගල දින දිව්‍ය පූජාව තුළ දෙව්මැදුරු තුනක මනාලිය මා වෙනුවෙන් දිවි පිදුවා. ---- පියාණන් මහා සැලැස්මක් තුළ සියල්ල හසුරුවමින් මගේ දෙවන පැමිණීමට මොහොත සූදානම් කරමින් සිටිනවා. --- මේ මොහොතෙ අර දේශපාලකයට මේ නායකයට දෝෂාරෝපණය කිරීම නොවෙයි, තමා තමාව දැකීමයි සිදුවිය යුත්තේ."

**2019 අප්‍රේල් 24**

"---- ඒ සියලු උවදුරු වෙනුවෙන් සියල්ලෝ සියල්ලන් උදෙසා යාච්ඤාවෙන් මැදිහත් වන්න. ---- මහා ගැඹුරු සැලැස්මක් මේ වර්ෂයේ සිට. ---- ඒ හැම දෙයක් තුළම පියාණන්ගේ සැලැස්ම නම් ඉටුවන්නේ ඒක නවත්වන්න කාටවත් බැහැ. බොහෝ අයට ප්‍රශ්නයක් වෙන්ඩ පුළුවන්. දෙවියන්ව අදහන්ඩ ගිහිල්ල ඇයි මේ මිනිසුන්ට මෙහෙම වුණේ කියල. ඒක කිසි කෙනෙකුට ප්‍රශ්න කරන්න බැහැ. මනුෂ්‍යයාට නොතේරෙන කොටසක් ඒක. පියාණන්ගෙ සැලැස්ම ඒක නම් එය සිදුවිය යුතුයි. ජේසුව කුරුසියේ ඇණගැසීම පියාණන්ගේ සැලැස්මක්. එනිසයි පුත්‍රයාව පූජා වීමට ඉඩදීම සඳහා කුරුසිය තෝරාගත්තේ. ජේසු දැන සිටියා, මේ මොහොතෙ පියාණන්ගෙ සැලැස්ම මේකයි කියලා. මරියාවන් දැන සිටියා, වාද කරන්න ගියෙ නැහැ, එයට කැමැත්තෙන් ඉඩ දුන්නා. මේ සිදුවීම්වලදීත් කිසිවකුට කිසිවක් කිව නොහැකියි. පියාණන්ගෙ

සැලැස්ම ඒක නම් ඒකට මුහුණ දෙන්න ඕනැ. මනුෂ්‍යයා දැනගෙන ඒකට මුහුණ දුන්නා නම් මනුෂ්‍යයා බියට පත්වෙනවා, එවිට විය යුතු කොටස සිදුවන්නෙ නැහැ.

**2019 මැයි 30**

"දෙවියන් වහන්සේ මනුෂ්‍ය ජාතිය මැව්වා. මනුෂ්‍යයා මනුෂ්‍ය ජාතිය ජාතීන් බවට වෙන් කර ගත්තා, එලෙස ජාති ආගම් කුල භේද වෙන්කර ගත්තා. ඒ බෙදීම් තුළ මනුෂ්‍යයා මනුෂ්‍යයාට ප්‍රේම කරන්න බැරිව විඳවනවා. ඒ භේද තුළ මනුෂ්‍යයා කුලල් කා ගන්නවා. එලෙස හදාගත් එක ජාතියක් මුල්කරගෙන තවත් කණ්ඩායමක් සම්බන්ධ වෙමින් තමයි මේක සිදුවන්නේ. ඒ කණ්ඩායමෙත් තිබෙනවා කොටස් කීපයක්. ඒ එක කොටසක් යමක් කළාම හැම කොටසක්ම තමන්ගේ පැතිවලට ලකුණු දා ගැනීමේ ක්‍රමවේදයක් මේ තුළ තිබෙනවා. ඔවුන් හිතනවා අපි මෙච්චර ජීවිත ගණනක් විනාශ කෙරුවොත් අපට ස්වර්ගයේ තැනක් ලැබෙනවා කියලා, අපට මේ මේ දේවල් උරුමකම් ලැබෙනවා කියල. පාපයට අධිපති ඒ අයට අනාවරණය කරන්නේ එලෙසයි. ඉතින් දැන් ඒවා තමා මේ සිදුවෙමින් තිබෙන්නේ. යක්ෂයාගේ මහා සැලැස්ම ආරම්භ වෙලයි තියෙන්නේ. මගේ දෙවන පැමිණීම ආසන්නයි. ඒ මහිමාන්විත පැමිණීම උදෙසා මහා පවිත්‍රකරණයක් මේ සිදුවන්නේ. මහා මන්දිර කඩාවැටෙනවා. මේ ආරම්භයක් පමණයි. ඒක සිදුවුණේ ඔබට අමතක නොවන දිනයක. ඒ මගේ උත්ථානයේ ජයග්‍රහණය සමරන දිනයයි. ඇයි, එය එදාටම තෝරාගත්තේ. එය මනාලියගේ ජයග්‍රහණය ද මුල පිරෙන දිනයයි. මක්නිසාද සියලු අපවිත්‍ර දෑ පවිත්‍ර කිරීම ආරම්භ වන්නේ එතැනින්. ---- මනාලියගෙ ජයග්‍රහණය පරිපූර්ණ වන්නට නම් සම්පූර්ණයෙන් පවිත්‍ර කරල අවසන් වන්නට ඕනැ. ---- පාස්කු ඉරිදා සිදුවූයේ එහි ඇරඹුමක් පමණයි, පොඩි ඉඟිකිරීමක් පමණයි. ඔය හැම දේම ඉදිරියේ සිදුවෙනවා. එයයි, මනාලියගේ (මිනිස් සංහතියේ) ජයග්‍රහණය. එනිසා ඒ අනාවරණයන් ගණන් නොගෙන සිටින්න එපා. ඒ අනාවරණයන් සත්‍යයි. ඒ අනාවරණයන් ගණන් නොගෙන සිටීම ගැනයි, මරියාවන් වේදනා විඳිමින් කඳුළු සලන්නේ."

**2019 ජුනි 04 අප සංඝයේ ශුද්ධාත්ම මංගල දින යැදුමේ දී**

"නුඹලා මෙතෙක් ශුද්ධාත්ම මංගල දිනය හැටියට ශුද්ධාත්මයාණන්ගේ ජයග්‍රහණය සැමරීමට වඩා මනාලයාගේ (ජේසු සමිඳුන්ගේ) ජයග්‍රහණය සැමරීමයි සිදුකළේ. අද මනාලියගේ (මිනිස් සංහතියේ) ජයග්‍රහණය සැමරීමයි, නුඹලා සිදුකරන්නේ. ඒ පාස්කු ඉරුදින තම ජීවිතයෙන් මිලයක් ගෙවූ ජනතාව වෙනුවෙන්, **<u>ඒ මහා ජයග්‍රහණය වෙනුවෙන්.</u>** අද බොහෝ අයට ප්‍රශ්නයක් කතෝලික කිතුනු දේවස්ථාන තුළ දෙවිඳුන් අදහන්න ගිහිල්ලා දිවි පුදන්නට සිදුවීම. පියාණන්ගේ සැලසුම් කිසිවකුට වෙනස් කළ නොහැකියි. එදා ජුදාස් මා පාවා දෙන බව දෙවි පියාණන් දැන සිටියා. ජේසුස් වන මා ද එය දැන සිටියා. ඒ කිසිත් නොදන්නා සේ සිටිමින් එසේ වීමට ඉඩ හැරියා. මක්නිසාද පියාණන්ගේ සැලැස්ම අනුව එසේ විය යුතුව තිබුන නිසා, මා කුරුසපත්වීම එලෙසම සිදුවිය යුතුව තිබුන නිසා. ජුදාස් මනස්ථාපනය වෙලා වැලපිලා සිය දිවි නසා ගත්තත් දෙවිපියාණන් ඔහුගේ ආත්මය ස්වර්ගයට කැඳවා ගනු ලැබුවා, ඔහු උපයෝගි වූයේ පියාණන්ගේ සැලැස්ම ඉටුවීමට නිසා. තමා සමීපයේ හිටපු කෙනා ඇයි මෙලෙස පාවා දුන්නෙ කියල එදා ඔහු ගැන ඔවුන් තුළ වෛරයක් තිබුණා, අදත් ඒ දේ එලෙසම පවතිනවා. පියාණන්ගේ සැලැස්ම ඉටුවීමට නම් බෝම්බකරුවන් උපයෝගි වූයේ ඔවුන්ට පියාණන්ගේ සමාව තිබෙනවා. තුනෙන් දෙකේ පවිත්‍රකරණය පියාණන් කුමන ආකාරයකින් හෝ සිදුකරනවා. එය ආරම්භයක් පමණයි. තව ඉදිරියේ බොහෝ දේ සිදුවෙනවා. ---- ලස්සන ලෝකයක් නැවත නිර්මාණය වෙනවා. විශාල ජීවිත පූජාවීම් තුළින්. ඒ සඳහා වන සියල්ලම පූජාවීම් හැටියටයි ස්වර්ගය භාර ගන්නේ."

**2019 ජුලි 19**

"ප්‍රේමවන්ත දරුවෙනි, මුළු විශ්වයම මේ මොහොතෙ කැළඹිලයි තියෙන්නේ. එය පියාණන්ගේ පරීක්ෂණයේ කොටසක්. මේ මොහොතෙ හැම මනුෂ්‍යයෙක්ගෙන්ම පියාණන් බලාපොරොත්තු වන්නේ මහා ප්‍රේමයයි, විශ්ව ප්‍රේමයයි. ප්‍රේමයාණන්ගේ විශ්වීය ප්‍රේමය සමග ඒකරාශි වීමයි, සියල්ලන්ගෙන් බලාපොරොත්තු වන්නේ."

**2.** 2019 අප්‍රේල් 21 දේව ශුද්ධභාවයේ අත්දැකීමේ ගැබ්වූ, එතැනින් ඇරඹෙන දේව ශුද්ධභාවයේ මහා ක්‍රියාවලියේ ගැබ්වන පිතෘක ආදරය අපි තව දුරටත් ගැඹුරින් අවබෝධ කර ගන්න ඕනැ. මා කැමතියි, 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයේ පරිච්ඡේද කිපයක සටහන් වූ කරුණු සමහරක් නැවත ඔබ ඉදිරියේ තැබීමට. ඒ අවබෝධය වැදගත්, මේ මෙහෙහි කිරීම සඳහා.

**i** ජේසු සමිඳුන් 'දහම් නවෝදය' සංඝයේ ශ්‍රාවකයින් අමතා මෙසේ පවසා තිබෙනවා. "මෙය ශුද්ධභාවයෙන් තව තවත් ශුද්ධභාවයට එලෙස සුවිශුද්ධභාවය කරාම ගෙන යන ගමනක්. පුංචි පිරිසක් මගේ සැලැස්මට හිරකර ගෙන තිබෙනවා. මෙය තේරුම් නොගන්න විශාල ලෝකයක් තිබෙනවා. එනිසා ඔබ සුළු පිරිස හා මා අතර දැඩි සුහදතාවයක් ගොඩනගාගත යුතුයි. නිරන්තරව මැවුම්කරුට අවනතභාවය අවශ්‍යයි." (46) මෙය ශුද්ධභාවයෙන් සුවිශුද්ධභාවය කරාම ගෙන යන ගමනක් නම් එය මනුෂ්‍ය සංහතියට අතිශයින් බිහිසුණුයි, එහෙත් මනුෂ්‍ය වර්ගයාගේ අධ්‍යාත්මික ප්‍රගතියට එය ඉතාම හිතකරයි. "ධර්ම අධර්ම යුද්ධය ඇරඹෙන්නේ මෙම දේශයෙනි." මෙම අනාවරණයන් තුළ ජේසු සමිඳුන් එසේ පවසා තිබෙනවා. එයයි 2019 පාස්කු ඉරිදා ඇරඹුනේ. ඇයි, එය මේ දේශයෙන් ඇරඹුනේ කියල ඔබට හිතෙන්න පුළුවන්. අධර්මයේ මහා ක්‍රියාවලියට එරෙහිව ධර්මයේ මහා ක්‍රියාකාරිත්වය මේ දේශයෙන් සිදුවන්නේ. එය ඒ පිළිබඳ දේව සැලැස්මයි. ඒ පාස්කු බෝම්බයෙන් ඇරඹුන ක්‍රියාවලිය දැහැමි යුගයේ උදාව දක්වාම ඇදී යනවා. මේ සියලු විඳවීම් දැහැමි යුගයේ උදාව උදෙසා මහා ප්‍රසව වේදනාවක්. ජේසු සමිඳුන්ගෙන් හා දේවමෑණියන්ගෙන් මේ පිළිබඳව ලැබෙන අනාවරණ හා අනතුරු ඇඟවීම් ලොව බොහෝ තැන්වලින් සිදුවෙමින් පවතිනවා. අප දේශයේ සිදුවන්නෙ ඒ පිළිබඳ අනාවරණ හා අනතුරු ඇඟවීම් පමණක් නොවෙයි, අධර්මයට එරෙහිව උන්වහන්සේගේ මහා ක්‍රියාවලිය මේ දේශයෙන් සිදුවන්නේ. ජේසු සමිඳුන් උදාවී ඇති මේ අඳියර ගැනයි, මෙසේ පවසා තිබෙන්නේ. "ලෝකයේ පටන්ගැන්මේ සිට මේ දක්වා නොවූ විරූ මතු ද සිදුනොවන විරූ දරුණු පීඩාවක් එකල්හි සිදුවන්නේය. මේ කාලය කෙටි නොකරන ලද්දේ නම් කිසිවෙක්වත් නොගැළවෙන්නේය. එහෙත් තෝරා ගත්තවුන් උදෙසා ඒ කාලය කෙටි කරනු ලබන්නේය." (මතෙව් 24: 21, 22) (54)

**ii** විශ්ව මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ මිනිස් බව ගෙන ජේසුස් නමින් උපත ලැබුවේ පාපිෂ්ඨ ලෝකයක ය. මරණය ජයගෙන උත්ථාන වූ ජේසු සමිඳුන් මහිමාන්විතව නැවත වඩින්නේ පවිත්‍රකරණයට පත් කළ ලෝකයකට ය. තම ඒක ජාතක පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත මෙලොවට එවන්නට සියල්ල සකසන්නෝ දෙවි පියාණන් වහන්සේ ය. එනිසා මෙය දෙවි පියාණන් වහන්සේ විසින්ම සිදුකරන මහා පවිත්‍රකරණයකි. දෙවි පියාණන් වහන්සේ ඒ පවිත්‍රකරණය මුලපිරුවේ 2019 පාස්කු ඉරුදින අපගේ දේශයේ ය. ඒ මහා පවිත්‍රකරණය දෙවි පියාණන් විසින් ලොව පුරා සිදුකරනු ඇත. දැනට පැතිරී යන කොරෝනා වෛරසය පවා ඒ සඳහා ය. ලොව පුරා සියලු රාජ්‍යයන් කඩාවැටෙනු ඇත, අහංකාරයේ මහා කඳු සමතලා වනු ඇත. ජේසු සමිඳුන් නැවත මහිමාන්විතව මෙලොවට වඩින විට දැනට සිටින මිනිස් සංහතියෙන් තුනෙන් දෙකක් මෙලොවින් සමුගත යුතුය. ඉතිරි තුනෙන් එක දැඩි පවිත්‍රකරණයට ලක් විය යුතුය. එය ඒ පිළිබඳ දේව සැලැස්මයි. ඒ මුළු පවිත්‍රකරණය සිදුකරන්නේ දෙවිපියාණන් විසිනි. මෙය මුළු මිනිස් සංහතිය අත්දැකිය යුතු පොදු සංසිද්ධියකි. මේ සියලු ව්‍යසනයන්ගෙන් ගැළවෙන්නට ජේසු සමිඳුන් ඉල්ලන්නේ ලෞකික සියල්ලෙන් හිස් වී දෙවිපියාණන්ට ළං වෙන ලෙස ය, සියලු ආගමික ශාස්තෘවරුන් විසින් දේශනා කළ නිවැරදි දහම් මගට පිවිසෙන ලෙස ය, තමා උදෙසාම නොව ලෝ වැසි සියලු ජනතාවගේ ගැළවීම උදෙසා යාච්ඤාවෙන් මොරගසන ලෙස ය. (53)

**iii** නපුරාට ප්‍රබලව ක්‍රියා කරන්නට මහෝත්තමයාණන්ගෙන් අවසරය ලැබෙන වසර තුන හමාරක් ගැන පැහැදිලි කිරීමක් කළ යුතු යැයි සිතමි. ඒ සඳහා 'ඥානාර්ථ ප්‍රදීපය' 1996 ජුනි 09 ගරු පී.කේ.එන් අධිකාරි පියතුමා ලියා ඇති ලිපියෙන් කොටසක් උපුටා දක්වන්නට කැමැත්තෙමි. "---- 1884 ඔක්තෝබර් 13 වන දින 13 වන ලියෝ සසුනිසුරාණන් දර්ශනයක් මගින් ශ්‍රවණය කළේ යක්ෂයා හා ඔහුගේ දූතයින් විසින් දෙවියන් වහන්සේ හා කළ සාකච්ඡාව යි. යක්ෂයා හා ඔහුගේ දූතයෝ දේව විශ්වාසය ලොවින් තුරන් කරන බවට ද පාතාල ලෝකයේ බලය ලොව පුරා තහවුරු කරන බවට ද වහසි බස් දෙඩූහ. දෙවියන් වහන්සේ පුරාණ ගිවිසුමේ ජෝබ් පරීක්ෂා කිරීමට ඉඩ සැලසූ ලෙස ලෝකයම පරීක්ෂා කිරීමට ඉඩ දෙන ලෙස ද ඔවුහු ඉල්ලා සිටියෝය. යක්ෂයාට දෙවියන් වහන්සේගේ අවසරය ලැබිණි. විද්‍යාවෙන් හා ශිල්ප ක්‍රමයෙන් මානවයා දියුණු වූ සමයක් වන විසිවන සියවස ඔහු ඒ සඳහා යොදා ගත්තේය. මේ දර්ශනයෙන් පසු ලියෝ පාප් තුමා "අතිදූත මිකායෙල් තුමෙනි, සටනේ දී අප ආරක්ෂා කළ මැනව." යන

යාච්ඤාව ලොව පුරා කියන ලෙස ඉල්ලා සිටියේය. ඉන්පසු ලුසිෆර් හා ඔහුගේ දූතයෝ තමන් හට කැප වූ ලෝ වැසියන් සිය ග්‍රහණයට ගෙන ඔහුගේ ජයග්‍රහණය ඉෂ්ඨ කර ගැනීම සඳහා මං යෙදූහ. අරගල, භූචලන, ජලගැලීම්, සුළි සුළං, රුධිරය සිඳ හෙලීම් ආදි ක්‍රියා නොමැති රටක් අද නැති තරම් ය. ලක්දිවට ද සතුරා අත තබා ඇත. ---- සතුරා බලසම්පන්න වූ තරමට දෙවියන් වහන්සේ ද ඊට සරිලන ලෙස විශ්වාසය සුරකින ආත්මයන් ලොව බිහිකළ සේක. එම සටන දේව දරුවන්ගේ හා සතුරු දරුවන්ගේ සටනක් බව මැජගෝරයේ දර්ශන දුටු දරු සය දෙනා පවසති. සතුරා හට ලොව පෙළීමට අවසර ලැබුණ ද ඔහු නොදන්නා කරුණු තුනක් ගැන දෙව් මවුන් සඳහන් කළ බව මැජගෝරයේ මිර්ජානා පවසයි.

- ❖ ඉන් පළමු වැන්න, දෙව් පියාණන් තම විශ්වාසකයන් රැක ගැනීමට හා ඔවුන්ට සතුරු අනතුරු ඇඟවීමට දේව පොරොන්දුවේ ස්ත්‍රිය වන දෙව් මවුන් විවිධ දර්ශන මගින් මෙලොවට එවා වදාරා ඇති බව ය.
- ❖ දෙවැන්න වනුයේ, මෙතෙක් ලොවට දානය නොකළ තරම් වරප්‍රසාද රාශියක් දෙවියන් වහන්සේ විසින් ලොව පුරා වගුරුවා තිබීම ය.
- ❖ තෙවැන්න වනුයේ, කලට ඔබින විශ්වාසික ආත්මයන් මෙලොවට යහමින් එවමින් සතුරා ගෙනෙන මොන යම් ආපදාවක දී පවා නොසැලී සිටීමට ඔවුන්ට වරප්‍රසාද දානය කරන බව ය. යක්ෂයාගේ බලය තහවුරු වන විගස ම ඔහුගේ පරාජය හා දේව ජයග්‍රහණය ඇති වනු නියත ය.” (51)

**iv** ජේසු සමිඳුන්ගේ මහිමාන්විත දෙවන පැමිණීම සඳහා ලෝකය සූදානම් කිරීම, ඒ සඳහා දෙව් පියාණන් විසින්ම සිදු කරන මහා පවිත්‍රකරණය ගැන ශුද්ධවූ සුවිශේෂය පොත් හතරේ කිසිම තැනක සඳහන් වී නැතැයි ඔබ කියන්නට පුළුවන. ඔබගේ ඒ අදහස ඉතාම නිවැරදිය. ජේසු සමිඳුන් මෙලෙස පවසනවා. “මා කෙසේ කීවත් මා ප්‍රේමය නිසා මගේ දෙවන පැමිණීමට පෙර සූදානමක් ඇතැයි පූජක පුත්‍ර ගොඩ්ෆ්‍රි හා පූජක පුත්‍ර බෙනඩික් තුළ විශ්වාසයක් තිබුණා. අද බොහෝ පූජක පුත්‍රයන් තුළ එය නොමැත. ඒ පූජක පුත්‍රයන් දෙදෙනා දැන සිටියා මගේ දෙවන පැමිණීම ගැන මා පැවසූ බොහෝ දේ මගේ තරවටු කිරීමේ ප්‍රේමය පමණක් බව.” (49) ජේසු සමිඳුන්ගේ දෙවන පැමිණීමට පෙර සූදානම ගැන ශුද්ධ බයිබලයේ කිසිවක් සටහන් නොකළේ ඇයි? ජේසු සමිඳුන් එය මෙසේ පැහැදිලි කරනවා. “මගේ දරුවෙනි, මගේ මෙම ක්‍රියාවලිය අසම්මතවූ ක්‍රියාවලියක් ලෙස ලෝ සම්මතය තුළ සිටින සියල්ලෝ දකිති. එහෙත් මෙම අසම්මත දෙය ලොව සම්මත වන මොහොත ඉතා ආසන්නය. ---- මගේ මෙම අභිරහස්මක ක්‍රියාවලිය ශුද්ධ ලියවිල්ලේ සඳහන්ව නොමැත. මේ පිළිබඳ දිවැසි වැකිය සටහන් කිරීමට සිටි ඔහු මම ඒ මොහොතේ වැළැක්වීමි. මක්නිසාද, එය සඳහන්ව තිබුණේ නම් මගේ මෙම ක්‍රියාවලිය බොහෝ ගරු බුහුමන් මැද ජනතාව විසින් පිළිගනු ඇත. මෙම අදියර නින්දා අපහාස වේදනා මැද ඉටුවීමය, මගේ පියාණන්ගේ සැලැස්ම. මගේ දෙවන පැමිණීමට ලෝකය සූදානම් කරන්නට මම මෙආකාරයෙන් ක්‍රියා කරන බව ශුද්ධ ලියවිල්ලේ සඳහන් වී නොමැත. එහෙත් එයින් දශමයක් සඳහන් ව ඇත. එනම් උගතුන්ගෙන් හා සමතුන්ගෙන් සඟවා බාලයන් තුළින් මගේ අනාවරණයන් ප්‍රකාශ කරන බව ය.” (36)

“දරුවෙනි, මෙන්න මේ කාලය ගැනයි, ජොවෙල් දිවැසිවරයා සඳහන් කර ඇත්තේ. මහෝත්මයාණන් වන මම ඒ සඳහා ඔහුව යොමු කළෙමි. එහෙත් ඉතා ස්වල්ප දෙයයි, ඔහුට පවසන්නට මා ඉඩ තැබුවේ. පැවසූ ස්වල්ප දේ තුළ සිදුවන බොහෝ දේ අන්තර්ගත වන්නට මම සැළැස්වීමි. දිවැසිවරයාගේ අතින් ලියවෙන්නට ගිය යමක් මම ඔහුගෙන් වැළැක්වීමි. ඒ නිසා ශුද්ධ බයිබලයේ සඳහන් නොවූ දෙයක් දැන් සිදුවෙමින් තිබේ. මගේ උත්තරීතර සංඝය තෝරාගෙන, එහි එඬේරා හා ශ්‍රාවකයින් තෝරාගෙන, එහි දාස දාසින් තෝරාගෙන මගේ දෙවන පැමිණීම සඳහා මා සිදු කරන මෙම ක්‍රියාවලිය ගැන සටහන් කරන්නට මම දිවැසිවරයාට ඉඩ නොදුන්නෙමි. ඊට හේතුව මෙයයි. දරුවෙනි, මෙම ක්‍රියාවලිය ශුද්ධ ලියවිල්ලේ සටහන් වී නම් නුඹලාගේ ගමන ද පහසු වෙනවා ඇත. එය සිදු වන විට නුඹලාට ජනතාවගේ ගෞරවය ලැබෙනු ඇත. මා මහිමයට පත්වීම සඳහා වන මෙම ක්‍රියාවලිය සිදු විය යුත්තේ ද මා ගැළවීම උදාකළ මගේ කල්වාරි ගමනේම සමගාමී ගමනක් වශයෙනි. ඒ නිසයි, මා එය සටහන් වීම වැළක්වූයේ. ශුද්ධ ලියවිල්ලේ සටහන් වූ වැකිය තුළ දාස දාසින් යනුවෙන් මා විශේෂයෙන් අදහස් කළේ මගේ ප්‍රථම දාසිය, ළාබාල දාසිය හා දාසයා පිළිබඳවයි, ඔවුන් උපයෝගි කර ගනිමින් මා සිදු කර ගන්නා සුවිශේෂ අනාවරණ රටාව පිළිබඳවයි. අද නුඹලා අතර සිදුවන මෙම ක්‍රියාවලිය මා විසින්

එවන යම් චරිතයක් විසින් ඉදිරියේ දී ශුද්ධ බයිබලයේ අග හිස් පිටුවේ සිට සටහන් කරනු ඇත.” (39)

**3.** 2019 පාස්කු බෝම්බ සිද්ධියෙන් හා කොරෝනා වෛරස උවදුරෙන් දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර මේ දේශයට හා මුළු ලෝකයට උදා වුණා. එහෙත් ඒ අති බිහිසුණු අදියර මුල පුරන්නට නියමිතව තිබුනේ ඊට වසර විස්සකට පමණ පෙර දී ය. සමිඳාණන් වහන්සේයි, ඒ මුල පිරීම වසර විස්සකින් පමණ පමා කළේ. එය 1999 අගෝස්තු 20 මෙලෙස සටහන්ව තිබෙනවා. “මගේ බැටළු රැළ උදෙසා මා තව තවත් ඉවසන්නේ මාගේ කාරුණිකභාවය ඉතා මහත් බැවිනි. එනිසා තව තවත් මගේ බැටළු රැළ වෙනුවෙන් මගේ අනුකම්පාවේ කාලය මම තබා ඇත්තෙමි.” (23) 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයේ ජේසු සමිඳුන් පැවසූ බොහෝ වදන් අදාළ වන්නේ මේ අදියර පිළිබඳවයි. මීට වසර විස්සකට පමණ පෙර 2001 වර්ෂයේ දී දෙවියන් වහන්සේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය හා සංඝයේ ශ්‍රාවකයින් මත උදා කරමින් උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වයක් සිදුවුණා. 2019 එළඹෙන දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර පිළිබඳව එය පෙරහුරුවක් ලෙස හඳුන්වන්න පුළුවන්. දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියරේ දේව ක්‍රියාකාරිත්වයේ සුලක්ෂණ උන්වහන්සේ එයින් පැහැදිලි කරනවා. 'ශුද්ධාත්ම පිය සටහන්' 25-29 පරිච්ඡේද කියවා එය අවබෝධ කර ගන්න ඔබට පුළුවන්. මෙම අදියරේ දේව ශුද්ධභාවයේ ඒ සුලක්ෂණ මා දැන් ඔබ ඉදිරියේ තබන්නට කැමතියි.

1 ලොව පුරා මුළු මිනිස් සංහතිය වසාගෙන ඇති නපුරාගේ පාපධාරි ගින්න දවාලන දෙවියන් වහන්සේගේ ශුද්ධවූ ගින්න පැමිණේ. එය අතිශයින් බිහිසුණුයි.

2 ඒ සිදුවීමත් සමග මනුෂ්‍යයන් මනස්ස්ථාපනයට පමුණුවන්නට, දැහැමි ජිවිත ගොඩනගන්නට දෙවියන් වහන්සේගේ මහා ක්‍රියාකාරිත්වයක් ඇරඹෙනවා.

3 ඒ සඳහා දෙවියන් වහන්සේගේ අතට දැනටමත් තම කැමැත්තෙන් නතු වී සිටින අයගෙන් උන්වහන්සේ යම් කාර්යයක් ඉටුකර ගන්නවා.

4 එහිදී දෙවියන් වහන්සේට කීකරු වීමේ ආනිශංසත් අකීකරු වීමේ ආදීනවත් අත්දකින්නට සිදුවෙනවා.

5 උන්වහන්සේ ඒ සඳහා ඉල්ලන දෙයට අකීකරු වන්නේ නම් උන්වහන්සේගේ උදහස වගුරුවා හෝ උන්වහන්සේ ඒ කාර්යය ඉටුකර ගන්නවා.

6 උන්වහන්සේ ඉල්ලන දෙයට කීකරු වන්නට කැමති ඒත් අපහසු, ඒ සඳහා අවංකව පොරබදන අයට උන්වහන්සේගේ අතදීමේදීත්, උන්වහන්සේ පවසන දෙයට අකීකරුවන්නන් සඳහා උදහස වැගිරවීමේදීත්, ශු. බයිබලයේ පුරාණ ගිවිසුමේ සිදුවූ ප්‍රබල ක්‍රියා, නික්මයාමේ ගමනේ සිදුවූ ප්‍රබල ක්‍රියා, ශුද්ධාත්ම බෞතිස්මයෙන් පසු මුල් කිතුනු සංඝයේ සිදුවූ ප්‍රබල ක්‍රියා නැවත සිදුවන්නට මුල පුරනවා. පොළොව මත ගිනිලෑම (ලූක් 12 : 49-53) බලගතුව සිදුවන අවදියක් මෙය. 'ශුද්ධාත්ම පිය සටහන්' 28 පරිච්ඡේදයේ ඊට අදාල කොටස මා මෙහි සටහන් කර ඇත.

7 ලොව සියලු රාජ්‍යයන් කඩා වැටෙනවා, ආර්ථිකය, උසස් තානාන්තර කඩා වැටෙනවා.

'ශුද්ධාත්ම පිය සටහන්' 25-29 පරිච්ඡේදවලින් උපුටා ගත් කොටස් කීපයක් දැන් මා ඔබ ඉදිරියේ තබන්නම්.

“666, මකරා, මෘගයා මේ සියල්ල දැන් ඉදිරියට එමින් පවතින කාලය යි, බිහිසුණු කාලය යි. ජනතාව මහා නින්දක, සම්මත සභාව අවදි විය යුතු කාලය යි.” (25)

“ඉදිරිය ධර්මය අධර්මය අතර යුද්ධය යි. ඔබ හැම කෙනෙක්ම මගේ නාමයේ අවිය දරමින් ජයග්‍රහණය ලබන්න.” (26)

“මගේ පැමිණීමේ කාලය ළං වෙමින් ඇත. සියල්ල කඩාවැටීමේ කාලය ළං වෙමින් ඇත. මා හා ගමන් කරව්. යහපත් පල දරන සියල්ලන් මම සූදානම් කරමින් සිටිමි, මගේ රාජ්‍යය ගොඩනගන්නට. ---- මහා ගිනි මැද ගමන් කරන මොහොත එළඹී ඇත. තව නොබෝ කලකින් සියලු රාජ්‍යයන්, සියලු බලාපොරොත්තු බිඳවැටෙන කාලය ළංව ඇත. ඒ මොහොත ඉතා ආසන්නය. දේව රාජ්‍යයේ බලාපොරොත්තු තුළ ගොඩනැගෙන්න. ---- මම ප්‍රේමයේ දෙවිඳාණෝ වෙමි. ප්‍රේමය මෙන්ම මගේ උදහස ද එලෙසයි. මගේ අණට පිටුපාන යම් කෙනෙක් ඇද්ද මගේ උදහස ඔහු ලුහුබඳී. මගේ අණට කීකරු වන යම් කෙනෙක් ඇද්ද මගේ ප්‍රේමය ඔහු ලුහුබඳී.” (27)

“මේ තමයි විප්‍රවාසය. මෙය මෑත යුගයේ මා විසින් අරඹන සිද්ධියකි. එදා යුගයේ සිදුවූ ශුද්ධවූ දේ නැවත සිදුවෙමින් ඇත. ---- මගේ ප්‍රේමය ලුහුබඳින බව මම සඳහන් කළෙමි. සියල්ල අත්හැර එන්නට මා හඬගසන විට එයට කීකරු නොවන්නේ ද ඒ සියල්ල අත්හරින්නට මම සලස්වමි. මා තවත් අයට එලෙස ප්‍රකාශ කරන මොහොත ළංව ඇත. ඉදිරි කාලය අති බිහිසුණු යි. ගිනි මැද ඇවිදීමේ කාලය එළඹෙමින් ඇත. මා සුරතට හසුවූ කිසිවකුට මගෙන් පලායාමට නොහැක.” (28)

“මම ලුහුබඳින ප්‍රේමය ද ලුහුබඳින ශුද්ධභාවය ද වෙමි. අද මිනිසාට ප්‍රේම කරන්නට නොහැකි තත්ත්වයක් උදාවී තිබෙන බව මම දකිමි. අද ලෝකයම එකම ධාවනයකයි යෙදී සිටින්නේ. කිසිවකු හිස් වන්නට කැමති නොවන ලෝකයක් අද මම දකිමි. ---- මගේ දරුවෙනි, මම ශුද්ධභාවය වෙමි. මා අතට හසුවූ කිසිවකුට මගෙන් පලා යා නොහැක. මගේ වැඩ බොහෝ ය. ඒ සියල්ලම ඔවුන් ලවා ඉටුකර ගන්නෙමි. මම ලුහුබඳින ප්‍රේමය වෙමි. ---- මගේ හස්තයට හසුවූ කිසිවෙක් හෝ මට පිටුපාන්නේ ද එවිට මගේ උදහස ඔහු ලුහුබඳිනු ඇත. මම ලුහුබඳින ප්‍රේමය ද ලුහුබඳින උදහසද වන්නෙමි. මා මේ සියල්ල කරන්නේ මගේ පියාණන්ගේ ආඥාව පරිදිය. මා නුඹලා සමග පියාණන් ඉදිරියේ පෙනී සිටිය යුතු මොහොත එන තෙක් පියාණන්ගේ කැමැත්ත ඉටුකිරීමයි, මගේ කැමැත්ත විය යුත්තේ. මගේ කැමැත්ත ඉටු කිරීමයි, නුඹලාගේ කැමැත්ත විය යුත්තේ.” (29)

පොළොව මත ගිනිලෑම, ලූක් 12: 49-53 “දෙවි පියාණන්ගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර පොළොව මත ගිනිලෑමයි, එය ශුද්ධාත්ම ගින්න යි. එකිනෙකා අතර ප්‍රේමය නැති වීමෙන් භේදභින්න වූ ලෝකය පවිත්‍ර කරන මොහොත යි. එය මාතෘ ප්‍රේමය, පිතෘ ප්‍රේමය, දාරක ප්‍රේමය, යුවතිපති ප්‍රේමය, ජාති ප්‍රේමය, දේශ ප්‍රේමය ආදිය තුළින් පටු වී කොටු වී ඇති මිනිස් වර්ගයා විශ්ව ප්‍රේමයට ඔසවන මොහොත යි, විශ්ව ප්‍රේමයෙන් ලොව ගිනිලන මොහොත යි. විශ්ව ප්‍රේමය යනු තම පියාට මවට දක්වන ආදරය, තම දරුවන්ට දක්වන ආදරය මුළු මිනිස් වර්ගයා කෙරෙහි දැක්වීමයි. යමෙක් විශ්ව ප්‍රේමයට එසවෙන විට ප්‍රේමයේ ඊට අඩු මට්ටම් තුළ, ප්‍රේමයේ ඊට අඩු මට්ටම් අතර ගැටුම් ඇතිවීම වැළැක්විය නොහැකිය. එහි දී භාරකරු (පියා,මව) ඉක්මවා අයිතිකරු හෙවත් මැවුම්කරුවාණන්ගේ කැමැත්තට නතු වන්නට සිදුවනු ඇත.” (28)

**4.** දැන් උදා වී ඇති දෙවි පියාණන්ගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර ගැන යි, ළාබාල දාසිය මගින් ද ජේසු සමිඳුන් අපට ප්‍රකාශ කළේ. 'ශුද්ධාත්ම පිය සටහන්' 38-42 පරිච්ඡේද කියවා ඔබම එය අවබෝධ කර ගන්න. ඒ පරිච්ඡේද තුළින් උපුටාගත් කොටස් කිපයක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි.

“මගේ නැවත පැමිණීම උදෙසා සියල්ලෝ මිලයක් ගෙවිය යුත්තාහ. එදා මගේ උපතේ දී දහස් ගණනක් දරුවෝ මිලයක් වූහ. ලෝ වැසි සියල්ලන් වෙනුවෙන් පාප රහිත සමිඳාණෝ මිලයක් වූහ. ---- ඔබගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ මහිමාන්විතව හැසිරෙන මොහොත ළංව ඇත. නික්මයාමේ ගමන මෙන් මම නැවත ද මගේ ප්‍රබල බාහු බලය පාන්නෙමි. එනිසා එය ඉතා බිහිසුණු වූ ද ඉතා වාසනාවන්ත වූ ද කාලයකි. මැවුම්කරුවාණන් වන මා හැර අන් දෙවි කෙනෙකු නොමැති බව ලෝ වැසි සියල්ලන්ට මම පෙන්වමි. ---- මම ඉක්මනින් සියල්ල කළඹවමි. මිහිතලය පුරා කැළඹීම දෙගුණ තෙගුණ කරමි. කළඹනවා පමණක් නොව පිළිතුරු ද දෙමි. දැන් පිළිතුරු අවශ්‍යයි. ---- මගේ මැවීමේ මුදුන්මල්කඩ වන මනුෂ්‍යයා නැවත ගොඩනගමි. මම ප්‍රේමය නිසා අති බිහිසුණු ලෙස හෝ ගොඩනගමි. දැන් එය සිදුවිය යුතුමයි. දරුවෙනි, මගේ ප්‍රේමයට කොන්දේසි නොමැත. මගේ උදහසටත් කොන්දේසි නොමැත.” (38)

මගේ උත්තරීතර සංඝය වන නුඹලාව මම එලෙස මගේ සැලැස්ම කරා ගෙන යමි. ඒ සඳහා වන සියල්ල මම ම කරමි. මා නුඹලාට කියන දේ පමණක් නුඹලා කළ යුතුයි. මේ දේශයෙන් ලෝකයෙන් දහස් ගණනක් හෝ තෝරාගෙන ඔවුන්ට මගේ දර්ශන දකින්නට සලස්වමින් ඔවුන් පූජකයන් වෙත යවමි, එමගින් සභාව වියවුල් කරමි, දේශය කළඹවමි. මගේ මෙම ක්‍රියාව මගේ දූතයන් මගින් ද එකිනෙකාට ප්‍රකාශ කරමි. මගේ හස්තය නැවැත්වීමට කිසිවකුට නොහැකිය. මන්ද, මම මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ වෙමි. ශුද්ධාත්මානුභාවයෙන් මගේ දර්ශන දකින්නන් කාට නම් හැකි ද, නැවැත්වීමට? මැවුම්කරුවාණන් වන මට හැකියි, පූජකයන්ට ද දර්ශන මගින් කතා කිරීමට. මම එය ද කරමි." (39)

"බලන්න මේ දේශය. එය ජලතලයක තැබූ කුඩා ගොඩබිමකි. බලන්න, එහි සිදුවන විනාශය. මෙවැනි කුඩා දේශයකට, ඉපැරණි දහම් දිවයිනට මෙසේ වන්නට මා ඉඩදෙන්නේ නම් කොතරම් විනාශයන් නොයෙක් දේශයන් හරහා හඹා යයි ද? කෙතරම් විශාල වුවත් ධනයෙන් බලයෙන් පිරී ඉතිරී ගියත් ස්වාමින් වහන්සේගේ උදහස් වීමේ දවස පැමිණි කල සියල්ල සුණුවිසුණු වන්නේමය. දරුවෙනි, බලාසිටපල්ලා, මා සියල්ල කළඹවන හැටි." (40)

(සුනාමි ව්‍යසනයේ දී ජේසු සමිඳුන් මෙසේ පැවසුවා.) "---- ඉදිරියේ සිදුවන සියල්ල දකින කල මේ සිදුවීම් අංගුමාත්‍රයක් තරම් ය. තව බොහෝ දේ සිදුවීමට නියමිතයි. ව්‍යසනය පැමිණෙන්නේ කිසිවකු නොසිතන මොහොතක ය. ස්වාමින් වහන්සේට එක් මොහොතක් ඇත, විශ්වයම චංචල කරන්නට. නුඹලා මේ රැඳී සිටින්නේ විශ්වයම චංචල කරන තැනැන්වහන්සේ මධ්‍යයේයි. නුඹලා මිත්‍රකමක් ගොඩනගාගෙන ඇත්තේ මේ විශ්වයම දෝංකාර දෙන දෙදරන ස්වාමින් වහන්සේ සමග යි. නුඹලාගේ පියාණන් වහන්සේ යැයි නුඹලා අමතන තැනැන්වහන්සේ කවුරුන්ද? ශුද්ධවූ ව්‍යසනය ඇති කරන තැනැන්වහන්සේ ම ය. ---- සියල්ල සිදුවන විට හොඳින් මෙනෙහි කරපල්ලා, ස්වාමින් වහන්සේ පැවසූ වදන්. කා බී ප්‍රීති වීමට කාලයක් ඇත. නමුත් මේ ඒ කාලය නොව වේදනාවට පත්ව අසරණව සිටින මනුෂ්‍යයා උදෙසා මොරගැසිය යුතු කාලය යි. මෙය යි, නුඹලාගේ දූත මෙහෙය ඉදිරියටත්. ඉදිරියට සිදුවන්නේ ද සුබදායක දේ නොවේ. මන්ද අසුබ දේ සිදුවීමට අසුබ දේට අධිපති වූ තැනැත්තාට ජනතාව හඬගසා හමාරයි. එනිසා ඒ තැනැත්තේ ඒ සියල්ලට වග කියන්නේය. ශුද්ධවූ තැනැන්වහන්සේ ශුද්ධවූ දෙයට හිමිකම් කියනවා ඇත. ඊළඟ ව්‍යසනය ද නුඹලා නොසිතන ආකාරයෙන් එක් තත්පරයක දී සිදුවේවි. සියල්ල සුන්බුන් වන්නේමය. නමුත් සමිඳාණන් වහන්සේ උන්වහන්සේගේ දෑ කරණකොටගෙන ඒ සියල්ලට වග කියන්නාහ. ---- එදා නිනිවය සිහි කරපල්ලා. එදා උන්වහන්සේ විනාශය සඳහා තෝරාගත් දේශය යි, එය. ඒ එක් දේශයක් පමණයි. එහෙත් මේ වකවානුව වන විට මා මැවූ මුළු ලෝතලය ද එහි වැසි සියල්ලන් ද සිටින්නේ එදා නිනිවය මෙන් ය. ඇස් ඇර බැලුවත් වැඩක් නොමැත. කිසිවෙක් ඇතුලාන්තයෙන්ම එසේ නොකරති. ඊළඟට සිදුවන්නේ තමා සමග සිටින සෙවනැල්ලටවත් නොදැනෙන විනාශයක්මය. ප්‍රේමය නිසා බොහෝ දේ ඉවසුවෙමි. ප්‍රේමය නිසාම දැන් සියල්ල සිදුවෙමින් ඇත. එසේ හෙයින් උන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමය උදෙසා සියල්ල සිදුවීමට පටන්ගෙන ඇත. ---- මොරගසාපල්ලා වචනවලින් නොව අධ්‍යාත්මයෙන්ම, මන්ද, ඊළඟ දෙය වඩා බිහිසුණු වෙනවා. ඇත. නොසිතන ආකාරයෙන් සියල්ල අවුල් වියවුල් වන්න උන්වහන්සේ සලස්වා ඇත. මැවුම්කරුවාණන් වහන්සේ උන්වහන්සේගේ තෝරාගත් ජනතාව ඉදිරියේ සියල්ල ප්‍රකාශ කර ඇති බැවින් කිසිවක් නොපැවසූ බව කිසිවකුට කීමට නුපුළුවන. ---- සියල්ල සිදුවෙමින් ඇත, සියල්ල සැකසෙමින් ඇත, ස්වාමින් වහන්සේගේ දවස උදෙසා. විටෙක ප්‍රේමයත් විටෙක උදහසත් ස්වාමින් වහන්සේ තම ඇතුලාන්තය තුළ මෙහෙයවන සේක. සිදුවන්නට නියමිත දේ එබැවින් සිදුවෙනවා නියතයි. ---- කෙනෙක් අදහන්නේ යම් ආගමක් ද යම් දර්ශනයක් ද ඒ තුළ අවංකව දිවි ගෙවාපල්ලා. මන්ද, ඊළඟ මොහොත අති භයානක බැවින්. නුඹලාගේ ඇතුළු සිත තුළ නුඹලාගේ මැවුම්කරුට මුළුමනින් ඉඩ දීපල්ලා. එවිට නුඹලා නොදැනුවත්වම නුඹලා තුළ උන්වහන්සේ සියල්ල සිදුකර ගන්නවා ඇත." (41)

"සියල්ල සරල කර ගනිල්ලා. මන්ද, ඉදිරියේ දී ඒ ලෞකික සියල්ල මනුෂ්‍යයාගෙන් ගිලිහී යන විට මනුෂ්‍යයාට එය දැරීමට නොහැකියි. නිවැරදි දේ තුළ තිබෙන සතුට, අද මනුෂ්‍යයා සොයන්නට උත්සාහ නොකරන සැබෑ සතුට නුඹලා සොයා ගනිල්ලා. මන්ද, අද මනුෂ්‍යයා සොයන සතුට ක්ෂණයකින් විනාශයකි. ---- උන්වහන්සේ උන්වහන්සේගේ කොටස, නුඹලා කිසි දිනෙක කළ නොහැකි යැයි කියන සියල්ල උන්වහන්සේ ක්ෂණයකින් සිදුකරන සේක. බොහෝ දේ සිදුවේවි. චංචල වන දේ නිරන්තරයෙන් සිදුවේවි. එහෙත් උන්වහන්සේ ගැන ස්ථිර විශ්වාසයෙන් සිටීමයි අවශ්‍ය වන්නේ." (42)

**5.** බුදු සමයේ මෛත්‍රී සංකල්පය යන තේමාව යටතේ, පේරාදෙණි විශ්ව විද්‍යාලයේ දර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ගුණපාල ධර්මසිරි, 1988 ඔක්තෝබර් 'තුලණ' සඳහා සපයා තිබූ ලිපියකින් උපුටා ගත් ඉතා අර්ථවත් කොටස් කීපයක් මෙලෙස ඔබ ඉදිරියේ තබන්නට මා කැමතියි. මා එසේ කරන්නේ අප මෙතෙක් කතා කරමින් සිටින තේමාවට මෙය ඉතා අදාල නිසයි. “නූතන යුගයේ ප්‍රධාන ලක්ෂණය නම් මනුෂ්‍ය සදාචාරයේ පිරිහීම ඉතාමත් උච්චාවස්ථාවට පැමිණ තිබීමයි. මෙය කලියුගයකියි සමහරුන් කියන්නේ එබැවිනි. කෙටියෙන් කියතොත් ධර්මය අධර්මය බවට පත් වී ඇති අතර අධර්මය ධර්මය බවට පත් වී තිබේ. මේ යුගයේ පහළ වී ඇති සදාචාර පරිහානිය කෙබඳු දැයි කිවහොත් එය මීට වඩා පිරිහෙන්නට ඉඩක් නැත. ෂාර්ඩෑන් පියතුමා මනුෂ්‍ය වර්ගයාගේ මානසික ස්තරය ඉතා තියුණු අන්දමින් ඉහළ ස්තරයකට මාරු වීමට නියමිත බව සඳහන් කර ඇත. මෙම අධිමානසික විපර්යාසය සිදුවීම සඳහා ව්‍යසනය හා මරණයට මුහුණ දී සිටින සමාජ පසුබිමක් අත්‍යවශ්‍ය බැව් සමහරුන්ගේ මතයයි. ධර්මය ප්‍රතිෂ්ඨාපනය (ධර්මය නැවත පිහිටුවීම) සිදුවන්නේ එවැනි පසුබිමක් තුළ ය. එම නිසා මෙම යුගයේ එක් පරමාර්ථයක් නම් පුද්ගලයන්ට ධර්මය ඉගැන්වීම ය. උදාහරණයක් වශයෙන් ගතහොත් කලියුගයේ උච්චාවස්ථාව වශයෙන් සැලකෙන මෙම අවදියේ දී අප සැම දෙනා තුළම නිරන්තරවම ප්‍රබලව පවතින අසහනකාරී හැඟීම නම් මරණය පිළිබඳ බිය ය.”

“ධර්මය අනුව සිතතොත් ඇත්තෙන්ම මරණයට වඩා කල්පනා කළ යුතු වෙන කිසිවක් නැත. මක්නිසාද එය කොයි මොහොතේ දී වුව ද සිදුවීමට ඉඩ ඇති දෙයක් වන නිසාය. 11 වන සියවසේ තිබ්බතයේ විසූ ගම්පෝපා නම් ආචාර්ය තුමා මෝක්ෂමාණික්‍යාභරණය නම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් කර ඇත. "පළමුවෙන් එන්නේ හෙට ද එසේ නැතහොත් පරලොව ද යන කරුණ ඉතා අවිනිශ්චිත නිසා අපි හෙට සඳහා උත්සාහ නොකොට පරලොව සඳහා සූදානම් විය යුතුය.” මෙවැනි යුගයන් ගැන කතා කරන සැම දෙනාම කියා සිටින්නේ මෙම යුගය සම්බන්ධව ඇති එකම ආරක්ෂාව සහ විසඳුම වන්නේ සදාචාරාත්මක හැසිරීම බව යි. සැම කලියුග උපද්‍රවයකින්ම ආරක්ෂා වීමටත් පසුව කලියුගය පවා වෙනස් කර උතුම් යුගයක් උදාකර ගැනීමටත් උපකාරී වන්නා වූ එකම දෙය ලෙස උගන්වා ඇත්තේ සදාචාරයට ගරු කරමින් ජීවත් වීමයි. සදාචාරයේ කේන්ද්‍රීය සංකල්පය වන්නේ මෛත්‍රිය යි. සදාචාරය ස්වභාව ධර්මයේ ද ස්වභාවය යි. ස්වභාව ධර්මය නම් ශක්තිය යි. එම නිසා නියම ශක්තිය ජනනය කළ හැකි වන්නේත්, ස්වභාව ධර්මය සමග එකමුතුකමට පැමිණිය හැක්කේත් සදාචාර ඇගයුම් ප්‍රගුණ කිරීමෙනි. ධර්ම ශක්තිය ඉදිරියේ සියලු ලෞකික ශක්ති අනිවාර්යයෙන්ම පරාජය වන්නේය.”

ගුණපාල ධර්මසිරි මහාචාර්ය තුමා එම ලිපියේ මෙසේ ද පවසනවා. “පුද්ගලයා යනු විශ්වමය සමස්තයේ අංශුවකි. සමස්තය අංශුව කෙරෙහි බලපාන්නා වූ ආකාරයටම අංශුවට ද සමස්තය කෙරෙහි බලපෑ හැකිය.” එසේ කළ හැක්කේ මෛත්‍රිය ජනනය කිරීමෙන් බව එතුමා මෙලෙස පවසනවා. “ලංකාවට පමණක් නොව මුළු මහත් ලෝකයටම අද අවශ්‍යව ඇත්තා වූ වැදගත්ම දෙය හැටියට මෛත්‍රිය හැඳින්විය හැකිය. මක්නිසාද සමකාලීන ලෝකයේ උද්ගතව ඇත්තා වූ භීෂණ සමයට මුහුණ දීම සහ එම තත්ත්වය දුරුකරලීමට සමත් වූ යම් දෙයක් වේ නම් ඒ මෛත්‍රිය යි. කලියුගයේ සියලු ප්‍රශ්නවලට එකම පිළිතුර වන්නේ මෛත්‍රිය යි. මක්නිසාද කලියුගය පරදා ජයගත හැකි ධර්ම ශක්තිය ජනනය කළ හැක්කේ එම මෛත්‍රියට පමණක් වන නිසාය.” මෛත්‍රිය සතු බලය ගැන එතුමා මෙලෙස පවසනවා. “මෛත්‍රියෙන් ලැබෙන ආරක්ෂාව පිළිබඳව අංගුත්තර නිකාය අට්ඨකතාවෙහි සිත්ගන්නාසුලු උදාහරණයක් එයි. දිනක් එළදෙනක් තම පැටියාට සිටගෙන කිරි දෙමින් සිටියාය. ඒ දුටු හෙල්ලයක් අතින් ගත් දඩයක්කරුවෙක් මෙසේ සිතීය. මම අර එළදෙනට පහර දෙන්නෙමි. ඔහු ඇයට හෙල්ලයෙන් දමා ගැසූ විට එය ඇගේ ඇඟේ වැදී තල් කොළයක් මෙන් ආපසු විසිවිය. ඒ එසේ වූයේ එම අවස්ථාවේ දී ඇය තුළ තම පැටවාගේ යහපත පිණිස පැතුරුණු බලවත් මනසක් (මෛත්‍රියක්) තිබූ හෙයිනි. මේ ආකාරයෙන් මෛත්‍රිය සතු ශක්තිය ඉමහත්ය.”

මෛත්‍රිය (ප්‍රේමය) සතු ඉමහත් ශක්තිය ගැන ස්වාමි විවේකානන්දයෝ මෙසේ පවසති. “දරුණු සැහැසියකු කෙරෙහි වුව ඉමහත් තමස් පටලයකින් වැසී සිටිය ද ඔහු ද පරමේශ්වරයාගේ මූර්තියක් මැයැ යන අවබෝධය ඇති වූ විටැ ඔහු ද ප්‍රේමණීය වනු නියතයි. යම් කෙනෙකුගේ ක්ෂුද්‍ර ජීවාත්මය තිබුණු තැන මහත් ජගදාත්මය පහළ වූ විටැ ඔහු ජගත් කම්පනයෙහි පවා පොහොසත් මහා පුරුෂයෙකු වනු නියතයි. ---- මෙන්න මේ තමා පරමාර්ථ

සාධනයෙන්, තත්ත්වාවබෝධයෙන්, ආගම ප්‍රත්‍යක්ෂයෙන් ලොවට සිදුවන ඉමහත් යහපත. සකල මනුෂ්‍ය වර්ගයාම එම සත්‍යයෙන් බිඳක් හෝ අවබෝධ කැරැ ගත්තොත් මේ අඬදබර කලහ කෝලහාල වෙනුවට සාම යුගයක් උදා වනු නියතයි. එයයි, පරමාර්ථ සාධනයේ විශිෂ්ඨ බලය. ---- තථ්‍ය ප්‍රේමය කොතරම් බලවත් වේ ද කියතොත් එයට පසු මනුෂ්‍ය වර්ගයා හරි මඟ යවන්නට කසයක් වුවමනා නොවේ. මෙලොව වසන ස්ත්‍රී පුරුෂයන් කෙරෙන් දශ ලක්ෂයකට එක් කෙනෙකු හෝ සකස් වැ හිඳ ගෙනැ "ඔබ හැම පරමේශ්වරයාගේ මූර්තිහු වෙති, මනුෂ්‍යයෙනි, ඔබ හැම එකැමැ පරමේශ්වරයාගේ මූර්තිහු වෙති" මිනිත්තු කිහිපයක් පමණ වේලා හෝ කියුවහොත් මෙලොව වෙනස් වනු ඇති. ---- මේ සිතුවිලි ලොව පුරා වැපිරෙන කාලය නුදුරේ එයි. එවිට ධර්මය හැමගේ සාධාරණ ධනය වනු ඇත. එවිට අප ආශ්වාස කරන මේ වාතය පවා හුස්මක් හුස්මක් පාසා ඒ ඔබ වෙති යි කියනු ඇති."

( 'විවේකානන්ද දේශනාවලිය' - ශ්‍රී චාල්ස් ද සිල්වා සූරින්)

මේ සියලු අදහස් අගය කරමින් කිතුනු දැක්ම තුළ මා මෙසේ කියන්නට කැමතියි. ජේසු සමිඳුන් පවසන ප්‍රේමය, එතුමන් දැක්වූ ප්‍රේමය මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා ද ඉක්මවා යන දෙයක්. කුරුසිය මත යාගික වන ජේසු සමිඳුන් දෙස බැලීමෙන් ඒ ප්‍රේමය අවබෝධ කර ගන්න පුළුවන්. කිතුනු නාමය දරන සියල්ලන් මුළු හෘදයෙන් මුළු ආත්මයෙන් මුළු වීර්යයෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නට ඇති ආශාවෙන් දැවෙමින් ලෝ වැසි සියලු දෙනා වෙනුවෙන් දෙවිඳුන් අබියස යාච්ඤාවේ යෙදීම යි අවශ්‍ය වන්නේ. එවිට කිසිදු විපතකට ඔබට ළං විය නොහැකියි. මා මෙතෙක් උත්සාහ කළේ පාස්කු ඉරිදා බෝම්බයෙන් හා කොරෝනා උවදුරෙන් මුලපිරෙන දෙවි පියාණන්ගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර තුළ ගැබ්ව ඇති දෙවි පියාණන්ගේ පිතෘක ප්‍රේමය ඔබට අවබෝධකර දෙන්නටයි.

**6.** ජේසු සමිඳුන් මහිමාන්විතව නැවත වඩින්නේ පවිත්‍ර කළ ලෝකයකටයි. ඒ පවිත්‍ර කිරීම කරන්නේ පියාණන් වහන්සේ විසින්මයි. ඒ පවිත්‍රකරණයයි, දැන් ඇරඹී තිබෙන්නේ. ඒ පවිත්‍රකරණයේ දී ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් මෙලොවින් සමුගනු ඇත. ඉතිරි තුනෙන් එක දැඩි පවිත්‍රකරණයට ලක් කරනු ඇත. එය දෙවිපියාණන්ගේ කැමැත්තයි. උන්වහන්සේගේ කැමැත්තට අවනත වන්නට ජේසු සමිඳුන්ගේ මෙම වදන් ද ඔබට සවියක් වේවා !

"නපුරා කෙතරම් සූක්ෂ්ම වුව ද ඔබගේ ස්වාමින් වහන්සේ අති සූක්ෂ්ම බව දැන ගනුව. නපුරාගේ අයහපත තුළින් මගේ යහපත, මගේ සැළැස්ම ඉටුවන බව මම පවසමි." (23)

"සභාව දෙදරීමේ කාලය ළංව ඇත. මට අවංකව කැපවී සේවය කරන පහළ සිටින පූජක දරුවෙනි, උසස් තැන්වල සිටින්නන්ගෙන් නික්මෙන හැම වදනක් ගැනම නුඹලා ප්‍රවේශම් වන්න, විශේෂයෙන් මේ කාලය තුළ." (31)

"දරුවෙනි, බොහෝ බිහිසුණු කාලය පැමිණෙමින් ඇත. මරියාවන් මගින් කළ අනාවරණයන් ද මාගෙන් ප්‍රකාශ වූ අනාවරණයන් ද ඉටුවන මොහොත ළංවී ඇත. දැන් එයට කාලයයි. දැන් සියල්ලන්ට නිදහස දී හමාරයි. දැන් සියල්ලන් මනස්ස්ථාපනය අත්දැකිය යුතු මොහොතයි. මම ප්‍රේමයාණෝ වෙමි. මම උදහස් වූ තැනැන්වහන්සේ ද වෙමි එනමුත් මා ප්‍රේමයයි, ප්‍රේමයයි, ප්‍රේමයයි දරුවෙනි," (37)

"මගේ දරුවෙනි, නුදුරේදී මගේ ශුද්ධවූ ගින්න පැමිණීමට ප්‍රථම අශුද්ධවූ ගින්න ඇවිලීමට දැන් මා ඉඩ දී ඇත. දෙවි වූ ස්වාමින් වහන්සේ වන මාගේ අනුදැනුම උඩ ඒ සියල්ල සිදුවන නිසා බිය නොවන්න." (39)

"පියාණන් දැන් බලා සිටිනවා, එතුමන්ගේ දැහැමි දහම ලොව පතල කරමින් නගා සිටුවන්නට. දැන් මට ඇත්තේ සියල්ල දෙස බලා සිටින්නට. දැන් පියාණන්ට අවශ්‍ය දේ ඉටු වෙනවා. ඒ නිසා ප්‍රේමවන්ත දරුවෙනි, නුඹලාට තිබෙන ආදරය නිසයි කියන්නෙ, දැඩි තෘෂ්ණාවන්ට දැන් කිසිවෙක් යට වෙන්නට එපා. මා කුරුසිය මත ලෝකයට ප්‍රේම කළාක් මෙන් යහපතම දකින්න, යහපතම පතන්න. දැහැමි පරපුරක් උදෙසා ඔබ ද එතැනටයි එන්නට ඕනේ. ඉදිරි කාල සීමාව පියාණන් වෙන් කරලා තියෙන්නේ අධර්මය පහකර හරින්නට. නුඹලා තුළ ප්‍රේමය ඇති නිසා ඒ මරණ ගැන නුඹලාට වේදනාවක් දැනෙන්න පුළුවන්. ජීවිතයක් නැති වෙන්නේ ධනය, බලය, ජනප්‍රියත්වයේම

ඇළිගැලි සිටින නිසා නම් ඒ ගැන දුක් වෙන්නට එපා. ඔවුන්ට ස්වර්ගය ලබා දෙන්න කියලා ඔවුන් උදෙසාත් යදින්න." (46)

"දේශයේ පවිත්‍රකරණය දැන් ලහිලහියේ සිදුවේ. එනිසා කිසි දා නොවූ විරූ ලෙස ඉදිරියේ දී සියල්ල සිදුවනු ඇත. දැහැමි යුගයට මංපෙත් සලසමින් බොහෝ අයට දිවි පුදන්නට සිදුවනු ඇත. පියාණන්ගේ සැළැස්මට ඉඩ දෙමින් දැහැමි අයටත් ජිවිතයෙන් සමුගන්නට සිදුවනු ඇත. ඒ අන් අයගේ ගැළවීම උදෙසා ගෙවන මිලයක් හැටියටයි. දේශයේ භයානකම කාලපරාසය ඉදිරියේ ඇරඹෙනු ඇත. සුඛවිහරණය තුළ කල් ගෙවන්නෝ දහමට සම්ප චරිත පීඩනයට පත්කරනු ඇත. එකිනෙකාගේ කුලල් කා ගැනිම් තුළ සත්‍යය හෙළිවනු ඇත. ඔවුන් ගැන අසන දකින දේ තුළ නො රැඳී ඔවුන් උදෙසා කරුණා කළ මැනව යි මොරගසන්න. ඔවුන් හෙළාතළා කතා කිරීමෙන් ඒ විපත් ඔබ වෙත පෙරලා එනු ඇත. සියල්ලන් දෙස ලස්සන ඇසකින් බලන්න. ලෝකය ලස්සන කරන්න පුළුවන්, පවිත්‍ර සිතුවිලිවලින්." (49)

"ශ්‍රාවකයින් වන ඔබගේ අත තිබූ දේ පියාණන් රැගෙන දැන් මොහොතේ ජිවිතය උගන්වමින් සිටිනවා. ඉන්පසු ඇවැසි දේ පියාණන් විසින් සපයනු ඇත. පසුව ලෝකයේ සියල්ලන් සමග ද මෙය සිදුවනු ඇත. මේ සියල්ල දැහැමි ලොවක් උදා කරනු සඳහා යි." (50)

**<u>ශු. බයිබලයෙන්</u>**

"තවද මුළු දේශයෙහි තුනෙන් දෙකොටසක් සිඳ දමනු ලැබ මැරෙනවා ඇත. නමුත් තුන් වෙනි කොටස එහි ඉතිරි වේ යයි ස්වාමින් වහන්සේ කියන සේක. තුන් වෙනි කොටස මම ගින්නට පමුණුවා, රිදී පවිත්‍ර කරන්නාක් මෙන් ඔවුන් පවිත්‍ර කරන්නෙමි, රන් පරීක්ෂා කරන්නාක් මෙන් ඔවුන් පරීක්ෂා කරන්නෙමි. ඔව්හු මාගේ නාමය කියා යාච්ඤා කරන්නෝය. මම ඔවුන්ට උත්තර දෙන්නෙමි. ඔව්හු මාගේ සෙනග යයි කියන්නෙමි. ඔවුන්ද ස්වාමින් වහන්සේ මාගේ දෙවියන් වහන්සේ යයි කියනවා ඇත." (සෙකරියා 13: 8,9)

# 57

# “මගේ දෙවන පැමිණීම ආසන්නයි. ඒ මහිමාන්විත පැමිණීම උදෙසා මහා පවිත්‍රකරණයක් මේ සිදුවන්නේ.”

**දෙවන කොටස**

**7.** දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර අරඹමින් නපුරාගේ පාපධාරී ගින්න දවාලන දෙවියන් වහන්සේගේ ශුද්ධවූ ගින්න දෙව්මැදුරු තුනක් මතට කඩා වැටුණෙ ඇයි කියල කිතුනු නාමය දරන අප ගැඹුරින් මෙනෙහි කරන්න ඕනැ. මුළු ලොව වසාගෙන ඇති නපුරාගේ පාපධාරී ගින්න දෙවියන් වහන්සේගේ ශුද්ධවූ ගින්න විසින් දැවීමේදී, උන්වහන්සේගේ නාමය දරන උන්වහන්සේගේ සභාව වසාගෙන ඇති නපුරාගේ පාපධාරී ගින්න දැවීමෙන් එයට මුලපිරීම ඉතාම නිවැරදියි කියල මට හිතෙනවා. 2019 ජනවාරි 20 කටුවපිටිය දේවස්ථානයේ පැවැත්වූයේ 150 වන ජුබිලියයි. එනිසා එය Mega Show එකක් වුණා. කොඩිගස එසවීමේදී එයට ගුවනින් මල් ඉසීමෙන් ඇරඹුණේ. මංගල්ලය පැවැත්වූයේ ජනවාරි 20 වන දින. හරියටම මාස තුනයි ගත වුණේ, අප්‍රේල් 21 සියල්ල සුණුවිසුණු වුණා. මුනිවරුන් Mega Show තව දුරටත් ඉවසයිද කියල හිතල බලන එක වැදගත්. මෙවැනි මංගල්ල ඝෝෂාවන් නිසා ශු. සෙබස්තියන් මුනිතුමා සගලොව සිට කරන මොරගැසීම ’ශුද්ධාත්ම පිය සටහන්’ 17 වන පරිච්ඡේදයේ මෙලෙස සටහන්ව තිබෙනවා.

(ඒ අසල දේවස්ථානයක ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ මංගල්ලය උත්සව ශ්‍රීයෙන් පැවැත්විණ. ජේසු සමිඳාණෝ තම දාසයාගේ මුවින් මෙලෙස පැවසූහ. “පෙරදින දෙක තුළ නුඹලාගේ බැතියෙන් පිදුම් ලද තැනැත්තා සග ලොව සිට කරන මොරගැසීම මම දැන් නුඹලාට මෙලෙස ඇසෙන්නට සලස්වමි.” (යාච්ඤාවක ස්වරූපයෙන් තාලයට ගයමින්)

“මා දිවි ගමනේ දී වේදනාවෙන් ද ජීවිත පූජාවෙන්ද දෙව් සමිඳුනි, මම ඔබ වෙතට පැමිණියෙමි. මගේ තරුණ වියේ දී මගේ ජීවිත පූජාවෙන් මම ඔබ වැළඳ ගත්තෙමි. අනේ ! ජේසුනි, ඔබගේ නාමයට සාක්ෂි දරන්නට ගොස් මා මියැදුන විට ඔබ වහන්සේ ඔබගේ ශුද්ධවූ බල හස්තයෙන් මා ඔබ වෙතට කැඳවා ගත් සේක. අන්‍ය ජාතිකයන් ද අන්‍ය ආගමිකයන් ද මධ්‍යයේ මම ඔබ වහන්සේගේ නාමය මහත් පුරසාරමින් අගයමින් ද ඔබගේ නාමයට සාක්ෂි දරමින් ද ඔබගේ නාමය මාගේ ස්වාමින් වහන්සේ ලෙස ප්‍රකාශ කරමින් ද අබ්බා ඒලි යනුවෙන් මොරගසමින් ද මම මරණය වැළඳ ගත්තෙමි. මගේ ජීවිත පූජාව තුළින් ඔබ වහන්සේ මට දුන්නා වූ උතුම් ස්ථානයෙන් මා පහකර එම ස්ථානයට ශුද්ධවූ පියාණෙනි, ඔබ වහන්සේ වැඩම කරන මෙන් මම බැගෑපත්ව අයැද සිටිමි. මගේ නම ද ගම ද කටුගා දමමින් මා අමතක කරමින් ඔබ තුළ මා සඟවා ගත මැනව. ඔබගේ මහිමාන්විත පැමිණීමේ දී මා පූර්ණත්වය ලබන බව සත්‍යයකි. එතෙක් මා අසම්පූර්ණ නිසා සුවඳ දුමින් මගේ ප්‍රතිමා ආසිරි නොගන්වන ලෙස ඔබගේ පූජක පුතණුවන්ට අනාවරණය වුව මැනව. ඔවුන් කරන මෙම උපහාරයන් සුං කර අබ්බා පියාණෙනි, මා ද සුණුවිසුණු කර මා නැවතත් ඔබ වහන්සේගේ පව්කාරයන්ගේ මධ්‍යයට ගෙන යන මෙන් මම ඔබ වහන්සේට මොරගසමි. ඔවුන් ඔබ වහන්සේ ඉදිරියෙහි ඔබගේ පාපිස්නක් වෙමින් ඔබ අබියස ඔවුන් වේදනාවෙන් තැවෙමින් පොඩිවෙමින් ඔවුන්ගේ ඕනෑ එපාකම් ඔබ වහන්සේගෙන් පමණක් ම ඉල්ලන්නට සැලැස්වුව මැනව. පියාණෙනි, ඔබගේ දූතයන්ගේ ශුද්ධවූ ගීත රාවයෙන් ද මා නෙරපා දැමුව මැනව. අබ්බා පියාණෙනි, විශ්ව මැවීමේ අධිපතියාණෙනි, ඔබගේ වහන් පටි ලිහන්නටවත් නුසුදුසු මා ඔබ අබියස සිටින්නටවත් ඉඩ නොසැලසුව මැනව. මැවුම්කරුවාණන් වන ඔබ තුළින්ම විනා ඔබ මැවූ විශ්වයේ කිසිදු මැවීමක් තුළින් ඔවුන්ට කිසි රැකවරණයක් නොමැති බව ඔවුන්ට ඒත්තු ගැන්වුව මැනව.”

(මෙම ප්‍රකාශනය ගැන නැවත අවධානය යොමු කළ මොහොතේ ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. “ශුද්ධවන්තයාගේ මංගල්ලය දවසේ සිදුවන දහම් විරෝධි පුහු මංගල ඝෝෂාව ඔහුට දකින්නට සලස්වමි. මගේ උත්ථානයේ මංගල දින ඇති උත්සව ශ්‍රීයෙන් තොර ඇල්මැරුණු බව ද

පෙන්වමි. එවිට ශුද්ධවන්තයෝ සග ලොව සිට මෙලෙස මොරගසති. එනිසා ඔවුහු මට අතිශයින් ප්‍රසන්න වෙති.)

මේ පිලිබඳව ළාබාල දාසිය මගින් ජේසු සමිඳුන් පැවසූ අදහසක් මට සිහිපත් වෙනවා. “ඉදිරි කාලය අති බිහිසුණුයි, මුහුණ දෙන්නට ඉතා අපහසුයි. එනිසයි මගේ දරුවෙනි, යාච්ඤාවෙන් මොරගසමින් එයට සූදානම් වන්නට යැයි මා නුඹලාට ප්‍රකාශ කරන්නේ. නොයෙක් ආකාර විනාශයන් මම ඇතිවන්නට සලස්වමි. ඇන්තනි, පවසන්නට එපා මට දැන්, ඒ සියලු විනාශයන් නතර කරන ලෙස. වේදනාවෙන් වුවත් ඉඩ දී ඇත, නොයෙක් ආකාර විනාශයන් සිදුවන්නට. වතිකානයේ සිටින මගේ දාසයා වුණත් (2 වන පුවාමි පාවුලු ශුද්ධෝත්තම පාප් තුමා) දැන් මට පවසන්නේ නොමැත. ඒ විනාශයන් නවත්වන ලෙස. ඔහු ද දැන් මට ආයාචනා කරන්නේ එසේ කරමින් හෝ ජනතාව නිසි මං ගන්වන ලෙසයි, ගැළවීම කරා ගෙන යන ලෙසයි. එනිසා ඒ සියල්ල එසේම සිදුවන්නට මම සලස්වමි.” (2003. 09. 15) (39) එසේ නම් මුනිවරුන් ඊට වඩා අඩු දෙයක් මේ මොහොතේ දෙවිඳුන් ඉදිරියේ පවසයි ද කියා සිතා බලන්න. සියලු ශුද්ධවන්තයින්ගේ පැතුමයි, ශු. ස්නාවක පුවාමි මුනි තුමා මෙලෙස වචනයට නැගුවේ. “උන්වහන්සේගේ නැගීමත් මගේ බැසීමත් සිදුවිය යුතුයි.” (ජොහාන් 3:20) උන්වහන්සේ වැඩි වන්නට අවශ්‍ය බව තමා අඩු වන්නට අවශ්‍ය බව යි එතුමා පවසන්නේ. ජේසු සමිඳුන් ඔබ තුළ වැඩි වන විට දේව මෑණියන් ඔබට සමීපයි, හැම ශුද්ධවන්තයෙක්ම ඔබට සමීපයි. හැම ශුද්ධවන්තයෙක්ම දන්නවා, ජේසු සමිඳුන් ඔබගේ පිවිතයේ අත්තිවාරම වුණොත් පමණයි, ඉදිරි අති බිහිසුණු සිදුවීම්වලට සාර්ථකව මුහුණ දෙන්නට ඔබට හැකි වන්නේ කියල. පහන් තරුව ඉතා අලුයම නැගෙනහිර අහසේ බැබලෙමින් හිරු උදාව ආසන්න බව ප්‍රකාශ කරමින් උදාවන හිරු ඉදිරියේ කෙමෙන් මැකී යන්නාක් මෙන් දිව්‍ය සූර්යයාණන් වන ජේසු සමිඳුන් පිවිත මත උදා කරමින් තමා මැකී යාමයි, හැම ශුද්ධවන්තයෙකුගේම පැතුම. එනිසා ඔබගේ ආමිස පූජාවලින් ශුද්ධවන්තයින්ට තව දුරටත් දුක නොදෙන්න.

කොළඹ, කොච්චිකඩේ දෙව්මැදුරේ වාර්ෂික මංගල්ලයත් Mega Show එකක්. මඩකලපුවේ සියොන් දේවස්ථානය ගැනත් එසේ කිව හැකිද? කිතුනු නිකායන් තුළ Mega Show අඩුයි. එය අගය කළ යුතු දෙයක්. එසේ නම් මඩකලපුව දෙව්මැදුරේ ඇයි, එවැන්නක් සිදුවන්නට දෙවිඳුන් ඉඩ දුන්නේ? කතෝලික දෙව්මැදුරු දෙකක පමණක් එවැන්නක් සිදුවී නම් ජේසු සමිඳුන් විසින්ම මුලපිරූ උන්වහන්සේගේ ප්‍රමුඛ සභාව වන කතෝලික සභාව අනෙක් බොහෝ කිතුනු නිකායන් ඉදිරියේ මොනතරම් මදිපුංචිකම්වලට ලක්වීමට ඉඩ තිබුණද? එවැන්නක් වළක්වන්නට උන්වහන්සේට අවශ්‍ය වූ බව පැහැදිලියි. සමහර කිතුනු නිකායන් Mega Show ලෙස පවත්වන්නේ හාස්කම් සහිත සුව මෙහෙයන්. එවැන්නක් ජේසු සමිඳුන් අනුමත කරනු ඇද්දැයි ඔබම සිතා බලන්න. “රෝගී ජනතාව වෙත ගොස් සුවය පතා යදින්න. ප්‍රසිද්ධියේවත් ප්‍රචාරයටවත් එය නොකරන්න. රහසින් එය දකින පියාණන් වහන්සේ සුව කරන සේක.” (16) “රෝගියෙක් වෙනුවෙන් යාච්ඤා කරද්දි සුව කරන්න කියලම යාච්ඤා කරන්න එපා. ඒ රෝගියා ගැන පියාණන්ට සැලැස්මක් තිබෙනවා. රෝගියාගේ ඒ විඳවීම අනෙක් අයගේ මිදීම උදෙසා කරන පිදීමක් වන්න පුළුවන්. එනිසා ඒ රෝගියා පිළිබඳ පියාණන්ගේ සැලැස්ම ඉටු වේවා කියල යාච්ඤා කරන්න. වේදනාව ඉසිලිය නොහැකි තරම් අපහසු නම් ඒ වේදනාව අඩු කරන්න කියල යාච්ඤා කිරීම හෝ ඒ වේදනාව දැරීමට ශක්තිය පතා යාච්ඤා කිරීම හොඳයි.” (49)

2019 අප්‍රේල් 21 විශේෂයෙන් දෙව්මැදුරු තුනක, දේව මෙහෙය මොහොතේ බෝම්බ පුපුරා යාම ගැන සිතා බලන්න. කවුද, ඒ පසුපස සිටි මහා අපරාධකරු? කවුද, ඒ කුමන්ත්‍රණයේ මහා මොළකරු? එය සිතා බලන්නට උපකාරී වන ශුද්ධවූ වචන රැසක් තිබෙනවා. ජේසු සමිඳුන්ගේ ශ්‍රාවකයෝ මෙලෙස විමසා සිටියා. “ඔබේ පුනරාගමනය හා කල්පාන්තය පිළිබඳ පෙර ලකුණු මොනවාද කියා අපට කිව මැනව යි කීහ.” (මතෙව් 24:3) “ලෝකයේ පටන්ගැන්මේ සිට මේ දක්වා නොවූ විරූ මතු ද සිදු නොවන විරූ මහා පීඩාවක් එකල්හි පැමිණෙන්නේය.” (මතෙව් 24:21) පාස්කු බෝම්බ සිද්ධින් පසුපස සිටින මහා මොළකරු සෙවීමේදී පහත සඳහන් මේ වචන ද ඔබගේ අවධානයට යොමු විය යුතුයි. “යක්ෂයා සහ ඔහුගේ දූතයෝ දේව විශ්වාසය මෙලොවින් තුරන් කරන බවට ද පාතාල ලෝකයේ බලය ලොවපුරා තහවුරු කරන බවට ද වහසිබස් දෙඩූහ. දෙවියන් වහන්සේ පුරාණ ගිවිසුමේ ජෝබ් පරීක්ෂා කිරීමට ඉඩ සැලසූ ලෙස ලෝ වැසි සකල ජනතාවම පරීක්ෂා කරන්නට ඉඩ දෙන ලෙස ද ඔවුහු ඉල්ලා සිටියෝය. යක්ෂයාට ඒ සඳහා දෙවියන් වහන්සේගේ අවසරය ලැබිණි.” “මෙය තම පුතණුවන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මහිමාන්විතව මෙලොවට එවන්නට දෙව්පියාණන් විසින්ම සිදුකරන මහා පවිත්‍රකරණයකි.”

දෙවි පියාණන් වහන්සේ ඒ මහා පවිත්‍රකරණය මුල පිරුවේ 2019 පාස්කු ඉරුදින අපගේ දේශයේ ය. "ධර්ම අධර්ම යුද්ධය ඇරඹෙන්නේ මෙම දේශයෙනි." මෙය දෙවියන් වහන්සේගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අඳියරේ ඇරඹුමයි, නපුරාගේ පාපධාරී ගින්න දවාලන දෙවියන් වහන්සේගේ ශුද්ධවූ ගින්නේ සම්ප්‍රාප්තියයි. එදා තෙසලෝනිකවරුන් තම ජීවිකාවෘත්තිය පවා අඩාල කර ගනිමින් ජේසු සමිඳුන්ගේ මහිමාන්විත පැමිණීම බලා සිටි පසුබිමක ශු. පාවුලු තුමාට යුගාන්තයේ සලකුණු ගැන කතා කරන්නට සිදුවුණා. තෙසලෝනිකවරුන් වෙත ශු. පාවුලු තුමා යැවූ දෙවන හසුන හඳුන්වා දෙමින් සිංහල බයිබලයේ නව අනුවාදයේ මෙලෙස සටහන් කර තිබෙනවා. "ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනයට කලින් උන්වහන්සේට විරෝධී වූ දාමරිකයා, නම් ලත් අභිරහස් පුද්ගලයෙකු යටතේ නපුරත් දූෂණයත් උපරීම තත්ත්වයට පිවිසෙන බව පෙන්වා දෙයි" මෙහි මෙතෙක් කතා කළ කරුණු ඔස්සේ දැන් පැහැදිලියි, පාස්කු බෝම්බ සිද්ධියේ මහා මොළකරු කවරෙක් ද යන වග. ඒ දාමරිකයා, මෘගයා හෙවත් සාතන් ය. අධර්මය මහිමයට පැමිණවීම සඳහා සිදුවන මහා අරගලයේ මහා මොළකරු අධර්මාධිපතිමයි. ඒ විනාශයන් සඳහා දායක වූ, දායක වන සියල්ලන් අධර්මාධිපති අත මෙවලම් පමණයි.

මෙලෙස මුලපිරුණු ධර්ම අධර්ම යුද්ධය ගැන 'කතෝලික සභා ධර්මෝපදේශය' මෙලෙස පවසනවා. එහි අංක 675 බලන්න. "ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමට පෙර ශුද්ධවූ සභාව අවසාන විනිශ්චයකට භාජනය වන්නේ බොහෝ විශ්වාසිකයන්ගේ ශ්‍රද්ධාව සසල කරමින්ය. මෙලොව වන්දනා ගමනක නිරතව සිටින්නන්ට බොහෝ හිංසා පීඩා ඇතිවීම මගින් අනාවරණය කරන අභිරහස්මය දුෂ්ඨකමක් ආගමික රැවටීමක ස්වරූපයෙන් මිනිසුන්ගේ ගැටළුවලට විසඳීම් ඉදිරිපත් කරමින් ඔවුන්ගේ විශ්වාසය ත්‍යාජ කිරීමට පොළොඹවනු ලබන්නේය. ඊටත් වඩා භයානක රැවටීම වන්නේ අන්ත ක්‍රිස්තු නම් ක්‍රිස්තු විරෝධියාගේ පැමිණීම ය. මේ බොරු ක්‍රිස්තුවරයා පැමිණ ව්‍යාජ මෙසියානිකවාදයක් ඉදිරිපත් කරමින් දෙවියන් වහන්සේ වෙනුවට එතැනට තමාවම මහිමයට පමුණුවා ගන්නා බවත් තමාගේ මෙසියස් පැමිණෙන්නේ මාංශිකව බවත් පවසන්නේය." මෙහි යෙදී ඇති පහත සඳහන් වචන දෙව්මැදුරු තුනක පාස්කු ඉරිදා සිදුවූ බෝම්බ පිපිරීම් මුල්කරගෙන ඒ සිදුවූ දෙයට කෙතරම් අනුකූල දැයි සිතා බලන්න. "බොහෝ විශ්වාසිකයන්ගේ ශ්‍රද්ධාව සසල කරමින් ය." "බොහෝ හිංසා පීඩා ඇතිවීම මගින්" "අනාවරණය කරන අභිරහස්මය දුෂ්ඨකමක්" "ආගමික රැවටීමක ස්වරූපයෙන්" ('කතෝලික සභා ධර්මෝපදේශය' 668 - 682 දක්වා අධ්‍යයනය කරන්න)

'දහම් නවෝදය' පළමු වන ප්‍රකාශනය 'නිතරම යාච්ඤාවෙන් අවදිව සිටින්න.' මේ සිදුවන දේ පිළිබඳව මෙලෙස සටහන්ව ඇත. "මොවුන් විසින් සභාවේ සත්‍ය විශ්වාසය හා ධර්මය ද ඉගැන්වීම් ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය සම්බන්ධය ද ව්‍යාකූල කරමින් ව්‍යාජ සභාවක් ව්‍යාජ පාප්වරයෙක් හා ව්‍යාජ ක්‍රිස්තුවරයෙකු (මෛත්‍රී නමින් ව්‍යාජ ගැළවුම්කරුවකු ඉදිරිපත් කරනු ඇත." මා පහත සඳහන් කරන මෙම වචන ද මා ඉහත සඳහන් කළ ඒ අදහස අනුමත කිරීමකි. " ඊළඟට පත්වන නායකයා දේව අනුග්‍රහයෙන් තොර අයෙකි. එවිට මගේ සභාව ද ලෝකය ද පත්වන බියකරු තත්ත්වය ඔබට වැටහේද? වතිකානයේ ඇතිවන සිද්ධිය මත මුළු ලෝකයේම රටවල සහ මිනිසුන්ගේ සියලු ම දෛනික කටයුතුවල පෙරලියක් ඇතිවෙයි. පේදුරුගේ පදවියට බොරු පාප්වරයා පත්වූ විට සිදුවන දේ හඳුනා ගන්න. එපමණක් නොව ඔහුගේ මිත්‍රයා වන මෛත්‍රී ලෙසින් පෙනී සිටින තැනැත්තා තුළ ඇත්තේ ලුසිෆර්ගේ හමුදාවයි." (M.J. ඉවන් - 1998 නොවැම්බර් 01) එදා ශ්‍රාවකයින් යුගාන්තයේ සලකුනු ජේසු සමිඳුන්ගෙන් විමසීමේදී උන්වහන්සේ පැවසූ අදහසක් සුවිශේෂකවරුන් දෙදෙනෙක් පමණක් මෙලෙස සටහන් කර තිබෙනවා. "එබැවින් දානියෙල් දිවැසිවරයා සඳහන් කළ, බිහිසුණු දූෂිතය, ශුද්ධස්ථානයෙහි තිබෙනු ඔබ යම් කලක දකින්නහුද, (පාඨකයා තේරුම් ගනීවා)" (මතෙව් 24:15) "තවද බිහිසුණු දූෂිතය එයට නොහිමි තැන සිටිනු ඔබ යම් කලෙක දකින්නහු ද (පාඨකයා තේරුම් ගනීවා)" (මාක් 13:14) පාඨකයන් විසින් එය වටහා ගන්නට අවශ්‍ය අනාවරණයන් දැන් ලොවට ලැබී ඇත. ඉහතින් මා සඳහන් කළේ ද ඒ පිළිබඳවයි.

8. "දෙවියන් වහන්සේ පිළිබඳ විශ්වාසය මුළුමනින් නැති කරන බවට වහසි බස් දොඩමින් ඒ සඳහා එදා ජෝබ්ගේ විශ්වාසය ඇට සැකිල්ල දක්වා පරීක්ෂා කරන්නට දෙවියන් වහන්සේ අවසර දුන්නාක් මෙන් මුළු මනුෂ්‍ය සංහතියේ විශ්වාසය ඇටසැකිල්ල දක්වා පරීක්ෂා කරන්නට ලුසිෆර් අවසර ඉල්ලා ඇත. දෙවියන් වහන්සේ ඒ සඳහා ඔහුට අවසර දී ඇත." මෙය මනුෂ්‍යයින් උදෙසා දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ අනාවරණයක්. එහෙත් එය අනාදියේ සිට දෙවියන් වහන්සේගේ ශුද්ධවූ සැලැස්මේ කොටසක්. අධර්මාධිපතිට අධර්මය මහිමයට පත්කිරීම සඳහා උපරිමය කරන්නට, ධර්මාධිපතිට (දෙවියන් වහන්සේට) ධර්මය මහිමයට පත්කිරීම සඳහා උපරිමය කරන්නට යුගාන්තයේ අවස්ථාව උදා කිරීමයි, ඒ සැලැස්ම. එනිසා 'Tale of two Cities' නව කතාවට මුල පුරමින් චාල්ස් ඩිකන්ස් ලියූ මුල් වැකිය වඩාත් අදාල වන්නේ උදා වූ, මේ අදියරටයි. "මෙය කාලයේ නරකම කාලයයි. මෙය කාලයේ හොඳම කාලයයි." අධර්මාධිපති බොහෝ මනුෂ්‍යයින් මෙවලම් කර ගනිමින් ඒ සඳහා සූදානම් වෙමින් සිටිනවා. කතෝලික ලෙස, කිතුනු ලෙස පෙනී සිටිමින් එහෙත් අධර්මය මහිමයට පත්කිරීම සඳහා දැනුවත්වම ක්‍රියා කරන අය ඒ මෙවලම් අතර මුල් තැනක් ගන්නවා. ඒත් තවමත් බොහෝ දෙනෙකට ඔහුගේ (අධර්මාධිපතිගේ) බිහිසුණු ක්‍රියා පෙනුනත් ඒ ඔහුගේ හස්තය බව අවබෝධ වී නැහැ. එනිසා තවමත් බොහෝ දෙනෙකුට එය අදිසි (නොපෙනෙන) හස්තයක්. ඒත් ලෝකයේ ප්‍රබල දේශපාලකයින්ට, ජාත්‍යන්තර සංවිධානවලට, මහා ව්‍යවසායකයින්ට, බොහෝ සංනිවේදන ආයතනවලට එය දිසි (පෙනෙන) හස්තයක්. ඒත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඒ හස්තය නිසි ලෙස හඳුනාගෙන නොතිබෙන්නට පුළුවන්. අධර්මාධිපති ඔහුගේ ඉදිරි කාර්යය සඳහා පැමිණෙමින් සිටින්නේ ආලෝකයේ දූතයෙක් ලෙස නිසා.

බොහෝ කතෝලිකයන්ට, බොහෝ සභා ශ්‍රේෂ්ඨයින්ට තවමත් මෙය අදිසි හස්තයක්. දිගු කලක සිට ජේසු සමිඳුන්, දේව මෑණියන් මේ පිළිබඳ අනාවරණ දෙමින් සිටියත් ඔවුන්ගෙන් බොහෝ දෙනා ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නැහැ. ඊට හේතුව 'කතෝලික සභා ධර්මෝපදේශය' 65 - 67 විග්‍රහය වන්නට පුළුවන්. ජේසු සමිඳුන් ලෝකයට පැවසිය යුතු සියල්ල දැනටම පවසා අවසන් බවත්, උන්වහන්සේට පවසන්නට වෙනත් කිසිවක් නැති බවත්, එනිසා එලෙස ලැබෙන අනාවරණ සියල්ල ඊනියා අනාවරණ පමණක් බවත් එයින් පැවසෙනවා. කිතුනු නිකායන්වල බොහෝ අයට ද තවම මෙය අදිසි හස්තයක් වන්නට පුළුවන්. ඊට හේතුව මේ පිළිබඳ බොහෝ අනාවරණයන් දේව මෑණියන්ගෙන් නිසා ඔවුන් එය බැහැර කරනවා. ඒත් සංනිවේදන මාධ්‍ය හසුරුවන බොහෝ අයට ඔහු (අධර්මාධිපති) දිසි හස්තයක්. ඔවුන් ඔහුට අවශ්‍ය දේ දිගු කලක සිට ඉටුකරමින් සිටිනවා. මිනිසා උසස් කරන උත්තම කලාවට අයත් ගීත නිර්මාණ සියල්ල බැහැර කරමින් සිටිනවා. මනුෂ්‍යයා කෙළෙසන අවර ගණයේ ගීත සුලබ කරමින් සිටිනවා. කාමය පෙරටු කරගත් නිරන්තර සැණකෙලි තත්ත්වයක් ගොඩනගමින් සිටිනවා. ආගමික උත්සවවල ද පෙරමුණ ගෙන එහි අධ්‍යාත්මිකත්වය බැහැර කර ඒවා ද සැණකෙලි තත්ත්වයට පත්කරමින් ඒවා ද කෙලෙසමින් සිටිනවා. මා මෙහි සටහන් කළේ ශ්‍රී ලංකාවේ බොහෝ රූපවාහිනී හා බොහෝ ගුවන් විදුලි නාලිකා පිළිබඳ මගේ නිරීක්ෂණයයි. ලෝකයේ බොහෝ රාජ්‍ය නායකයින්ට ඔහු (අධර්මාධිපති) දිසි හස්තයක්. ඔහු ඉදිරියේ රට සශ්‍රීක කරදෙන බවට පොරොන්දු වෙමින් ඔහුට අවශ්‍ය දේ රාජ්‍ය පාලකයන් මගින් ඉටුකර ගනිමින් සිටිනවා.

අධර්මාධිපති, අන්ත ක්‍රිස්තු හෙවත් ක්‍රිස්තු විරෝධියා ලෙස පැමිණෙමින් සිටින්නේ මෛත්‍රී නමින්. ඒත් ඒ නාමය my – tray – ah යනුවෙන් උච්චාරණය කරන ලෙස ඔවුන් පවසනවා. (25) මගේ බඳුන පිරිල උතුරනවා, ඒ ගැන ප්‍රීතිය හා විස්මය ප්‍රකාශ කිරීමක් නොවේද, එය ? අධර්මාධිපති එන්නේ ලෞකික ප්‍රතිලාභ යහමින් ලබා දෙන්නට පොරොන්දු වෙමින්. එනිසා ඔහු කරලියට එන විට ජනතාව විසින් ඔහුව උණුසුම් ලෙස පිළිගැනීමට නම් දුගී ජනතාව තව තවත් ආර්ථිකව දිළිඳු කළ යුතුයි. ඔහු එය ද රාජ්‍ය පාලකයන් උපයෝගි කර ගනිමින් ඉටුකර ගනිමින් සිටිනවා. දෙවියන් වහන්සේගේ මේ මහා පවිත්‍රකරණයේ උන්වහන්සේ ද ධනය, බලය, ජනප්‍රියත්වය (මැමෝනා) සුන් කරමින් සිටිනවා, දේව මෑණියන්ගේ උදාන ගීතයේ සඳහන් ඒ උත්තම පොරොන්දුව ඉටුකරමින් සිටිනවා. "උන්වහන්සේ බැහැපත් වුවන් උසස් කළ සේක. උඩඟු සිතැති සියලු දෙන සිය සිතුවිලි සමග විසිර වූ සේක. බලවතුන් සිය සිහසුන්වලින් පහත හෙළා පහත් වුවන් උසස් කළ සේක. සාගින්නෙන් පෙළෙන්නන් හොඳ දෙයින් පෝෂණය කළ සේක. ධනවතුන් හිස් අතින් යාමට සැලසූ සේක." එනිසා දෙවියන් වහන්සේගේ ක්‍රියා සහ ලුසිෆර්ගේ ක්‍රියා වෙන වෙනම හඳුනාගන්නට ඔබ සමත් විය යුතුයි. ලුසිෆර් කරලියට පැමිණෙමින් සිටින්නේ සියල්ලන්ට ලෞකික ප්‍රතිලාභ යහමින් දෙන බවට පොරොන්දු වෙමින් බව මා පැවසුවා. යාච්ඤා කරමින් දෙවියන්

වහන්සේගෙන් ලෞකික ප්‍රතිලාභ පමණක් ඉල්ලමින් සිටින සියල්ලෝ නපුරාගේ ඒ පරීක්ෂාවට පහසුවෙන්ම යට වන්නට පුළුවන්. ඒ පරීක්ෂාවට යට නොවන්නේ නිවැරදි කිතු දහම වන කුරුසියේ මාර්ගය වැළඳ ගත් අය පමණයි.

2019 පාස්කු බෝම්බ සිද්ධියේ මහා මොළකරු හඳුනාගෙන ඔහු අධිකරණ ක්‍රියාමාර්ගයට යොමු කරන්නට සමහරුන් උත්සාහ කරන්නේ නැවත එවැන්නක් සිදුනොවනු සඳහා යි. එහෙත් එය මේ මොහොතේ මේ දේශය පිළිබඳ යථාර්ථයද? මා පහත සඳහන් කරන අදහස් කියවා ඔබම එය අවබෝධ කර ගන්න. 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයේ මෙවැනි අදහස් සටහන්ව තිබෙනවා. ධර්ම අධර්ම යුද්ධය ඇරඹෙන්නේ මෙම දේශයෙනි. එයයි, 2019 පාස්කු බෝම්බයෙන් මුලපිරුනේ. අධර්මයේ මහා ක්‍රියාවලියට එරෙහිව ධර්මය මහිමයට පත්වීම උදෙසා දැහැමි යුගයේ උදාව දක්වාම වන ක්‍රියාවලිය සිදුවන්නේ මේ දේශයෙන්. එය දේව සැලැස්මයි, එනිසා මෙය ගැළවීමේ දේශයයි. එසේ නම් ධර්මය මහිමයට පත් වීමට එරෙහිව අධර්මාධිපතිගේ ක්‍රියාකාරිත්වයන් ස්ථානගත වන්නේ මේ දේශයේම නොවේද? ලෝකයේ බොහෝ රටවලට ස්වාභාවික විපත් ආපදා බහුලයි. එහෙත් මේ දේශයට වැඩියෙන් ධර්ම අධර්ම යුද්ධයයි. ලෝකයේ බොහෝ රටවලට ධර්ම අධර්ම යුද්ධය කොහෙත්ම නැති බවක් හෝ මේ දේශයට ස්වභාවික විපත් කොහෙත්ම නැති බවක් ඉන් අදහස් කරන්නෙ නැහැ. මේ සියල්ල මා සටහන් කළේ ඉදිරි සිදුවීම්වලදී ඔබ සැම අවදිව සිටින පිණිසයි.

මහාචාර්ය ඇලෝසියස් පීරිස් (ජේ.නි.) පියතුමාගේ "පරිසරයට ගරු කරන දේව ධර්මයක්" ලිපියේ අග ඡේදය දැන් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි. මෙවැනි යුගයක ඒ ලිපිය ඔබගේ අධ්‍යයනයට ඉතාම සුදුසුයි.

"දේවධර්මය වනාහි විමුක්ති මාර්ගයක් පිළිබඳ ප්‍රායෝගික තීරණයකි. දේව විරෝධි ධර්ම විරෝධි ප්‍රවාහයට එරෙහිව ක්‍රියාකාරී වීමකි. මා මෙහි ඉදිරිපත් කළේ එම අරගලයට අවශ්‍ය බුද්ධිමය ආයුධයක් පමණි. ගෝලියකරණය නමැති ධන වන්දනා ගමනක නිරත වී ඇති සංවිධානාත්මක ජන කොටස් විසින් තාක්ෂණතන්ත්‍රය හරහා දියත් කරන මත්ස්‍ය න්‍යාය හෙවත් පොඩි මසුන් ලොකු මසුන් විසින් ගොදුරු කර ගැනීමේ ප්‍රතිපත්තිය දේවධර්මය හදාරන්නන් විසින් හඳුනාගත යුතු දේව විරෝධි හා ධර්ම විරෝධි ප්‍රවාහයකි. දිව තෙත් කරන දිය, පයගහන පස, හුස්මට අහුවන වාතය පවා විකුණන වාණිජ සමාගම්, ගේ දොර අහිමිව අවතැන් වුවන් සඳහටම කඳවුරුගත කරන පරිසර දූෂක හා ජීවනාශක යුද්ධවලට ආයුධ සපයන්නන් ද දුගී රටවල සශ්‍රීක කෙත්වතු රසායනික ආක්‍රමණයන් මගින් සූරාකන තාක්ෂණිකයන් ද යන මොවුන් සියල්ලන්ම දියත් කරන ගෝලියකරණය හෙවත් විශ්වීය මෘගිකරණය ආගම හා දහම සමග අත්වැල් බැඳගන්නට තැත් කරන බව අවධාරණයෙන් ප්‍රකාශ කිරීම අප සතු පරම වගකීමකි. අප මුලින් විමසුමට ලක් කළ පුද්ගලවාදය හා උපකරණවාදය ආගම දහමට ඇතුළුවීමෙන් ඔවුන් එම දුෂ්ට ප්‍රයත්නය සාර්ථක කරන්නට ක්‍රියා කරනු නිසැකය. "මා සහ මගේ අධ්‍යාත්මය" "මා සහ මගේ දෙවියෝ" යන පුද්ගලවාදි ඇදහිලි ක්‍රමය ද "සාර්ථකත්වයේ ශුභාරංචිය" (Prosperity Gospel) නමැති මූලධර්මවාදි ක්‍රිස්තියානිය (හෙවත් යාච්ඤා මාර්ගය ධනය බලය රැස්කළ හැකි වන්දනා ක්‍රමයක් ප්‍රචාරය කරන කුරුසයක් නොදන්නා ව්‍යාජ ක්‍රිස්තුස් වහන්සේ කෙනෙකුන් කෙරෙහි විශ්වාසයක් ගොඩනගන ධනවාදි ක්‍රිස්තියානිය) මෘගිකරණයත් සමග ව්‍යාප්ත බිහිසුණු ආගමික බලවේගයක්ය. ඒවා බටහිර ධනේශ්වර ප්‍රදේශවලින් ආසියාවට ආනයනය වූ විෂ බීජයකි. මෙවැනි ප්‍රවාහයකට එරෙහිව නැගී සිටීමට ශක්තියක් ඇති ක්‍රිස්තියානි ප්‍රතිපදාවක් පැහැදිලිව ප්‍රකාශ කිරීමට ඇවැසි චින්තන රාමුවයි, මා මෙහි ඉදිරිපත් කළේ. එම චින්තනය අනුව ක්‍රියා කිරීමෙන් පමණක් එය දේවධර්මයක් බවට පත්වෙතැයි යෝජනා කරමි. මන්ද, දේව ධර්මය හුදු දර්ශනයක් නොව ප්‍රතිපදාවකි. හුදු කල්පනයක් නොව තීරණාත්මක සටන් වැදීමකි."

**9.** ජේසු සමිඳුන් මෙලෙස පවසන්නේ සිදුවෙමින් පවතින ධර්ම අධර්ම යුද්ධය ඔබ ද නිවැරදිව අවබෝධ කරගනු සඳහාය.

"මගේ රුධිර පූජාසනය කඩා බිඳ දමා වෙනත් ආකාරයේ පූජාසනයන් ඉදිකරන්නට මේ මොහොතේ සැරසෙමින් නපුරා අද වෙහෙසට පත් වන්නේය. නපුරා ද යම් කලෙක ජීවමාන ස්වාමීන් වහන්සේ අතනය, ජීවමාන ස්වාමීන් වහන්සේ මෙතැනය කියමින් ජනතාව රැස් කරන්නේය. නපුරා නුඹලා ඉදිරියෙන් යමින් ඔහුගේ නියම ස්වරූපයෙන් නොව ආලෝකයේ දූතයෙක් මෙන්

ව්‍යාජ රංගනයක යෙදෙමින් මඟ දිලෙන මුර ටැඹක් මෙන් ද ආකාශයේ නොයෙක් ආකාරයේ ප්‍රදර්ශන දක්වමින් ලොව සිසාරා ගිනිලන්නට ඔහු සැරසෙන්නේය. ---- නුඹ නොබියව නුඹගේ ආලේප ලත් මුඛයේ ඇත්තා වූ මී බිඳුව වන ජේසුස් යන නාමය ප්‍රකාශයට පත් කරපන්න. ---- මා සක්‍රමේන්තු ආකාරයෙන් ජීවමානව වැඩ සිටින සියලු සත්ප්‍රසාද මණ්ඩප තුළින් මම එහි නොයෙක් ආකාරයේ ක්‍රියාවන්වල යෙදෙමින් මනුෂ්‍යයා සූදානම් කිරීමේ කටයුතුවල යෙදෙන්නෙමි.” (18)

“විනෝදකාමි, ලෞකික සල්ලාලකමේ ජීවිතය ආකර්ෂණීය නව මුහුණුවරකට පත්කරන්නට සාතන් ලහි ලහියේ ක්‍රියා කරන්නේය. ඒ සියල්ල ඉදිරියෙහි ඔබ දෙවියන් විසින් තෝරාගත් සංඝයක් බැවින් ඔවුන් උදෙසා යාච්ඤා කරන්න. ඔබ ඔබගේ කාර්යය සත්‍යය ජය ගන්නා මොහොත තාක් නිහඬතාවයෙන් නිසි ලෙස කරගෙන යන්න. ඔබව විනාශ කරන්නට ඔවුන්ගේ සියලු උපායන් ඔබට විරුද්ධව සාතන් අවුළුවා ලන්නේය. යක්ෂයාගේ මහා ගිනිසිළුව දැල්වෙමින් පවතින්නේය. ලෝකයේ අති බිහිසුණු දුෂ්ට පාලනයට මුලපිරෙන මොහොත එළඹෙනු ඇත. ---- ඔබ නිරන්තරයෙන් යැදුමෙන් ගැයුමෙන් පිදුමෙන් කරන්නා වූ ප්‍රශංසාව ස්වර්ගීය මහා දුම් පූජාවට යොමු කරපන්න. ඒ මහිමාන්විත සුවඳ දුම් යාගය තුළ ලෝකයේ පාපය දැවෙමින් යන්නේය. ලෝකයේ පාපය උදෙසා ඔබ විඳින්නා වූ දුක වෙහෙස මහන්සිය සියල්ල දෙවි මහෝත්තමයාණන් වහන්සේට පූජා කරපන්න. ---- මුළු විශ්වයම මහා වේදනාවකට, කෙඳිරිගෑමකට, මනුෂ්‍ය මට්ටමින් ඉසිලිය නොහැකි මහා බරකට, ගිනිජාලාවකට, මහා ප්‍රපාතයකට ඇදගෙන යාමේ කාලය සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතින්නේය. ---- මේ සියල්ල තුළ මේ විශ්වයට නව අරුණළු උදාවීම සඳහා වන විඳවීමේ උච්චතම අවස්ථාව එළඹෙමින් ඇත්තේය. මා ඔබට ප්‍රකාශ කළ පරිදි විඳවීම, විඳවීම, විඳවීම, ප්‍රේමය තුළ විඳවීම මගින් සියල්ල ජය ගන්නා බව මම ඔබට පවසමි.” (24)

“අධර්මය පරාජය කරමින් ධර්මය රජයන මොහොත ළංව ඇත. අධර්මාධිපති මගේ නාමය දරමින් ඉදිරියට එන්නේය. ලෝ වැසි ජනතාවගෙන් විශාල කොටසක් ඔහුට රැවටෙති. මේ සියල්ල දැනගෙන එයින් ගැළවෙන්නෝ භාග්‍යවන්තයෝය. ---- ශුද්ධවූ ගමන ආරම්භ වී ඇත. දැන් පළමු පියවර තබා ඇත, ගිනි මැදින් යන්නට. නුඹලාගේ යටි පතුලේ සිට හිස මුදුන දක්වා මුළු ඇතුලාන්තයම දැවෙනු ඇත. බියෙන් තැති ගනු ඇත, එහෙත් එහි ගැඹුරක් ඇත. ඒ ගැඹුර නුඹලාට නොපෙනේ. තව ළංව යා යුතුයි, ඒ ගැඹුර දකින්නට. ---- දාමරිකයා මගේ නාමය දරමින් ලෝ වැසි ජනතාව මුලා කරන මොහොත පැමිණෙන්නේය. දුක් විඳින ජනතාව ඔහු පෙන්වන සැපසම්පත තෝරාගන්නට පෙළඹෙනු ඇත. එය විනාශකාරිය. ස්වල්ප දෙනෙකි මා හා රැඳී සිටින්නේ. ---- දැන් දාමරිකයා සියල්ල කරමින් ඇත. නොයෙක් තැන්වල ජනතාව ඒකරාශි කරමින් ඔහුගේ දේශන දෙමින් ඇත. ජනතාව ඔහු වෙත ඇදීයනු පෙනේ. දාමරිකයා සියල්ල සූක්ෂ්ම ලෙස කරමින් යයි. සුවවීම් තුළ සැප සම්පත් ලැබීම තුළ ජනතාව ඔහුට මුලාවී ඇත. ---- ලෝකයා තවම අවදි වී නොමැත. මේ සියල්ල ඉක්මනින් හෙළිවනු ඇත. මගේ දරුවෙනී, ඉදිරිය බිහිසුණුයි, අති බිහිසුණුයි. ---- දාමරිකයා දැන් පැමිණෙමින් ඇත, මගේ දරුවන් රැවටීමේ කාලය ඔහු වෙත ඇදගන්නා වූ කාලය ළංව ඇත. ඒ සඳහා මම ඔහුට නිදහස දී ඇත්තෙමි. අවසානයේ මගේ මුඛයෙන් නික්මෙන හුස්මෙන් මම ඔහු වනසා ලන්නෙමි.” (27)

“මගේ දරුවෙනී, සියල්ල පවිත්‍ර කිරීමේ මොහොත ඇරඹෙමින් ඇත. සියල්ල කඩා වැටෙමින් ඇත. දෙවියන් කොහේ දැයි අසන අයට පිළිතුරු දිය යුත්තේ අන්න එලෙසයි. ඉදිරියේ දී සාගතය පැමිණෙන්නේය, වසංගත පිරී ඉතිරෙන්නේය. මගේ දරුවෙනී, මා හා රැඳෙන්න, මා හා විශ්වාසයෙන් ගමන් කරන්න. මගේ වචන අසා ඒ වචනය තුළ ජීවත් වන්නෝ රැකෙති, ඔවුන්ගේ දරුවෝද ගැළවෙති. ---- “මුළු විශ්වය පුරා මගේ උදහස ඇවිලෙමින් ඇත. සියල්ල කඩාබිඳ දමමින් මුළු විශ්වයම පවිත්‍ර කරමින් මා තනන මා තබන ස්ථානයේ සිටින්නට කැමති වන තෙක් මම සියල්ලන් පවිත්‍ර කරන්නෙමි. ---- මම පවිත්‍ර කිරීමේ ප්‍රේමාන්විත වූ ශුද්ධභාවය වෙමි. මම නුඹලාගෙන් ඉල්ලන්නේ දුගීභාවයේ ධනයෙන් පිරෙන්නටයි. ධන සම්භාරයෙන් නොපිරෙන්නටයි. මගේ ශ්‍රාවකයිනී, නුඹලා විශ්වාසයේ බලාපොරොත්තුවේ ධනයෙන් පිරී ඉතිරේවා ! මිල මුදල පිළිබඳ ධනයෙන් පිරෙන්නට මා හා ගමන් කරන ලෙස මම කිසිවකුට ඇරැයුම් නොකරමි. ඒ තුළ අධිපතියා සාතන් ය. මගේ ශ්‍රාවකයින් වන නුඹලාගේ සියලු ආදායම් මාර්ග කඩා ඉහිරවමින් මම නුඹලාව දිළිඳුභාවය කරා ගෙන යන්නෙමි. මා හා ගමන් කරන විට මිලමුදල් ලැබේය යන සිතුවිල්ල පවා මගෙ ශ්‍රාවකයෙක් තුළ නොතිබිය යුතුයි. ---- මුළු ලෝකය පවිත්‍රකිරීම ඇරඹෙමින් ඇත. බොහෝ ජීවිත මිහිතලයෙන් සමුගනු ඇත, මගේ පවිත්‍ර කිරීම තුළ. මට මොහොතකින් සියල්ල වෙනස් කළ හැකියි. ---- මගේ දරුවෙනී, ඉදිරි කාලය අති බිහිසුණුයි. මේ ශුද්ධභාවයේ පවිත්‍ර කිරීමේ මොහොතයි. මුළු ලෝකයම මට එක දේශයකි. එහි අද විනාශ විය යුතු තැන්

විනාශ වෙමින් ඇත. පෞරාණිකයාණන් වන මාගේ ශුද්ධභාවයේ පවිත්‍රකරණය තුළ ජනතාවගෙන් තුනෙන් දෙකොටසක් මිය යනු ඇත. තුනෙන් එක කොටසකි, ඉතිරි වන්නේ. ඒ යහපත කරා ගමන් කරන ජනතාවයි. ඉතිරි වන ඒ කොටස මගේ ශුද්ධභාවයේ ගින්නෙන් පවිත්‍ර කරමින් දැහැමි යුගය කරා ගෙන යන්නෙමි." (30)

"අද ලෝ සම්මත කිතුනු සභාව තුළ අභිරහස්මක වූ වියවුලක් හට ගෙන ඇත. එය යම් දිනෙක හෙළිවනු ඇත. එය ද මගේ ක්‍රියාවලිය මෙන් මා නුඹලා මුවාකර ගනිමින් ගෙන යන්නාක් මෙන් ඔවුන්ගේ ලෝ සම්මත කිතුනු සභාව තුළ රහසිගතව ඉදිරියට ගෙනයමින් ඇත. ඒවා හෙළිකරන මොහොත ළංව ඇත.  එය මහා වියවුලකි. මහා බල තණ්හාවකි. මහා කාරුණික දෙවිඳාණෝ මම වෙමි. ඉතාමත් උදහස් වන දෙවිඳාණෝ මම වෙමි. ---- මගේ දරුවෙනි, ජරාවාස වූ අපවිත්‍ර වූ ලෝකය පවිත්‍ර කිරීමට මම මෙලෙස ක්‍රියා කරමි. මගේ මුල් මැවීම මෙන් නැවත ලස්සන ලොවක් මවන්නට මම සූදානම්ව සිටිමි. එවිට සියල්ලෝම ප්‍රීති ප්‍රමුදිත වන්නෝය. ---- මගේ පවිත්‍ර කිරීම දැනටමත් මුළු විශ්වය පුරා පැතිර ඇත. මගේ උදහසට හසු නොවන්න. උඩඟුකමේ පාපයෙන් ගොඩනැගී ඇති සියල්ල බිඳ හෙළන මොහොත ළංව ඇත." (31)

"මගේ දරුවෙනි, මම කඳු හෙල් සමතලා කරමි. සියලු පවිටු ගොඩනැගිලි බිඳ හෙළමි. නැවත විශ්වයම පළමු මැවිල්ල මෙන් ආලෝකවත් කරන මොහොත ළංව ඇත. අපවිත්‍ර වූ සියල්ල පවිත්‍ර කිරීමට ඒ මොහොත එන තෙක් මම බලා සිටිමි. ---- ලෝ සම්මත සභා තුළ පවා සිටිති, එන්නට සිටින සාතන්ගේ ඒ අඩවියට යටවන බොහෝ අය. ---- කාලය සීඝ්‍රයෙන් ගෙවී යමින් ඇත. ස්වාමින් වහන්සේ තෝරාගත් අය හට උන්වහන්සේගේ මහඟු රැකවරණය ද නපුරා තෝරාගත් අය හට ඔහුගේ මහා සැප සම්පත් සමග ඒ ලෞකික දේ තුළ සැඟවී තිබෙන විනාශය ද ඇතිවන කාලය දැන් උදා වෙමින් ඇත. ලෞකික සියල්ලේ නිෂ්පලත්වය මනුෂ්‍යයින් දකින මොහොත ආසන්නයි." (32)

ඉදිරියේදී ලෝකයේ ප්‍රබල රාජ්‍යයන් ලුසිෆර් තම දෑතට ගන්නේය. එවිට ඔහු ලෝකයම පාලනය කරන්නට සූදානම්ව සිටී. "ඉදිරියේදී මේ රට සශ්‍රීක වන්නේය. එය සිදුකරන්නේ මා නොව ලුසිෆර්මයි. ---- සශ්‍රීකත්වය පැමිණෙන්නේමය. එහෙත් එය නපුරාගෙන්ය. එනිසා නුඹලාට එය නොලැබෙනවා ඇත. මන්ද මා නුඹලාව ගෙන යන්නේ කුරුසියේ මාර්ගයේමයි. දරුවෙනි. එනිසයි, ඒ කාලය භයානක යැයි මා පැවසුවේ. එදා මුල් කිතුනු සභාවට මෙන් නුඹලාට හැසිරීමට සිදුවන්නේය. ස්වාමින් වහන්සේ දෙන දෙයක් පමණයි, නුඹලාට කෑමට ලැබෙන්නේ." (41)

'එළිදරව් පොත' ලුසිෆර් 666 වශයෙන් හඳුන්වන්නෙ ඇයි කියල අපි ජේසු සමිඳුන්ගෙන් විමසුවා. එවිට ජේසු සමිඳුන් ප්‍රථම දාසිය මගින් පැවසූ අදහස මෙලෙස මම ඔබ හමුවේ තබමි. "මිනිස් සංහතිය දැඩි පරීක්ෂාවට ලක් කරන්නට ලුසිෆර්ට මගෙන් අවසර ලැබෙන වසර තුනහමාර එළඹෙන විට ඔහු දකිනවා ලෝක ජනගහණය 666 කෝටියක් සිටින බව. ඔහු කියන්න උත්සාහ කරන්නේ ඒ 666 කෝටියම ඔහුගේ බව යි." (එයින් අපට හැඟුනේ මෙයයි. දෙවිඳුන් පවසනවා මම නුඹව මගේ අත්ලේ කොටාගතිමි, නුඹ මගෙයි කියල. යෙසායා දිවැසිවරයාගෙ පොතේ ඒ අදහස සඳහන් වෙනවා. ලුසිෆර් කියන්නේ මම 666 කෝටියම මගේ නළලේ කොටාගතිමි. නුඹලා සැම මගෙයි කියලයි) (44)

"අද මා ප්‍රේමයේ කඳුළු වගුරමින් මේ මොහොතෙත් උදහසේ ගින්න දවාලමින් තිබෙනවා, මුළු විශ්වය පුරාම. මම කඳුළු වගුරනවා. විශ්ව ප්‍රේමයෙන්. මැවුම්කරු වන මම මගේ මැවීම විනාශ වෙනවා බලා සිටින්නේ ඇයි? සමාව දීම ඉවරයක් නැහැ. පාපය එන්ඩ එන්ඩම දරුණු වෙනවා. දැන් තුනෙන් දෙකේ පවිත්‍ර කිරීම වේගවත් වෙලා. මම වේදනාවෙන් කඳුළු වගුරනවා, ඒ සමගම උදහසේ ගින්නෙන් ලොව පවිත්‍ර කිරීම ආරම්භ වෙලා. ඒ ගැන මා සතුටු වන්නෙ නැහැ. දැහැමි ජනතාව බේරාගන්නට නම් අධර්මය පරාජය කරන්නට නම් මට ඒ දේ කරන්නටම සිදුවෙනවා, මහා පවිත්‍ර කිරීමක් කරන්නටම සිදුවෙනවා. දැන් එය සිදුවෙමින් පවතිනවා." (50)

"ඉදිරිය මීට වඩා භයානකයි. මේ දේශය පමණක් නොවෙයි, මේ මොහොතෙ සිට මුළු විශ්වයම තියෙන්නෙ පියාණන්ගෙ මහා භයානක අඬිතාලමක. එනිසා මුළු ස්වර්ගයේ ම ජනතාව ශුද්ධවන්තයින් මේ පාපධාරී ජනතාව වෙනුවෙන් මුළු මැවීම වෙනුවෙන් පියාණන් ඉදිරියේ මේ මොහොතෙ මහා මැදිහත්කමකින් යදිමින් සිටිනවා. මේ පොළොව මත සිටිමින් නුඹලාත් නිරන්තර යැදුමට සම්බන්ධ වෙන්න, ඇතුලාන්ත නිශ්චලතාවය තුළ." (51)

10. ජේසු සමිඳුන් සිය ප්‍රථම දාසිය මගින් කළ මෙම අනාවරණයන් ද උදාවී ඇති අති බිහිසුණු අඳියරට අප සැම සූදානම් කරනු සඳහායි.

**2020 මැයි 27**

"ඔබගේ පියාණන් වහන්සේ මුළු ලෝකය සමග ප්‍රේමණීය ක්‍රීඩාවකයි, දැන් යෙදිල ඉන්නෙ. පියාණන්ට අවශ්‍ය වුණා, ලෝකය පවිත්‍ර කිරීම අරඹන්නට. මේ දක්වා ජනතාව සිටියෙ තරඟකාරී ලෝකයක. දෙවි පියාණන් ඒ දෙස බලා සිටියා. එය තව තවත් වැඩි වෙනවා මිස ධාර්මික ජීවිත ගොඩනැගීමක් නැහැ. එනිසා පියාණන්ට අවශ්‍ය වුණා, මේ ක්‍රීඩාව අරඹන්නට. ඒ තුළ පියාණන්ට පුංචි හෝ සතුටක් දැනෙන දෙයක් සිදුවෙමින් පවතිනවා. අදහන ආගම කුමක් වුවත් සියල්ලන් නිවෙස්වලට කොටු කරල ප්‍රේමයට හුරු කෙරුවා, දුරස්ව සිටි පවුල් බැඳීම්, නැවත ඇති කළා, වැරදි ගමන් මග ගිය අයව නිවෙසට කොටුකරල අලුතින් සිතන්නට යොමු කළා. ධනයට හෝ බලයට ඒ සඳහා කිසිවක් කළ නොහැකි බව දැන් අවබෝධ වෙමින් තිබෙනවා. ධනයට බලයට කළ නොහැකි මහා ප්‍රබල දෙයක් දැන් ලෝකයේ සිදුවන බව රාජ්‍ය නායකයින්ට පවා අවබෝධ වෙමින් තිබෙනවා. පියාණන් විසින් මුලපිරූ මේ ක්‍රීඩාව ජයග්‍රහණය කරලම තමා නතර කරන්නේ. ලෝකය පවිත්‍ර කිරීම නුඹලා ද පැතුවා, ඒ සඳහා යාච්ඤා කළා. ඒ සඳහා පියාණන්ගෙ මොහොත දැන් ආරම්භ වෙලා, ක්‍රීඩාව පටන් අරගෙන. පියාණන් ප්‍රේමණීයයි, රෞද්‍රයි, භයානකයි. මේ ක්‍රීඩාව තවම පටන්ගැන්ම විතරයි, ඉදිරිය මීට වඩා භයානකයි."

"ලෝකයම පෙරලුනත් එය දෙවියන් වහන්සේගෙ සැලැස්ම නම් මම සැලෙන්නෙ නැහැ. දෙවියන් වහන්සෙයි මෙය කරන්නේ. එලෙස දෙවියන් වහන්සේ තුළ ස්ථිරව ඉන්න. දෙවියන් වහන්සේ තුළ ස්ථිර වීමයි සැබෑ නායකත්වය. පොඩි දරුවන් වාගෙ පුංචි දෙයිනුත් කඩා වැටෙනව නම් එතැන සැබෑ නායකත්වයක් නැහැ. මේ පරීක්ෂණ ඔබලාමයි ඉල්ලුවෙ. පියාණෙනි, දැන් පැමිණෙන්න, මේ පාපි ලෝකය පවිත්‍ර කරන්න කියල ඔබලම නේද මට මොරගැසුවෙ? දැන් එය ඇරඹී තිබෙනවා. සියල්ලෙන් හිස්ව ස්ථිර වීමයි අවශ්‍ය. ලෝකයම පෙරලුනත් මේක දෙවියන්ගෙ කැමැත්ත. දෙවියන් වහන්සේ යමක් පවිත්‍ර කරන්න පැමිණුනා නම් එය සිදුවන්නටම ඕනැ. අපි එතැන ස්ථිර වන්න ඕනැ. මනුෂ්‍යයින් අතර බැඳීම් තිබෙනවා. ඒවා අවශ්‍යයි, ඊට වඩා බැඳීමක් තිබෙන්න ඕනැ මැවුම්කරුවාණන් සමග. පියාණෙනි, ලෝකයම කඩාවැටුණත් මගෙ ආත්මය බැඳෙන්නෙ ඔබ සමගයි. ඒ විශ්වාසයේ ගමන මම යනවා. එතැනයි, ඔබ ඉන්න ඕනෙ. මොන භයානක දේ සිදුවුණත්, කුසට ආහාරයක් නැති තැනට ආවත්, ප්‍රශ්න කන්දක් කඩා වැටුනත් ස්වාමිනි, මාව ඒ ප්‍රශ්නවලින් යට කරන්න බැහැ, මම ඔබ තුළ ස්ථිරයි. මන්ද, මේ ලෝකය මැව්ව තැනැන්වහන්සේ ඔබයි, මේ ලෝකය අයිති ඔබටයි. දෙවි පියාණන් අරඹා තිබෙන මේ ප්‍රේමයේ ක්‍රීඩාව මුළු මිනිස් ජනතාවටම පොදුයි. දරුවෙනි, මේ යථාර්තය අවබෝධ කර ගන්න."

**2021 අප්‍රේල් 05**

"මගේ පූජක පුතණුවන්ගෙන් මා මේ මොහොතෙ විශේෂ ඉල්ලීමක් කරන්න කැමතියි. හැම මාසයකම එක් දිනක් ඔබේ සහා ශ්‍රේෂ්ඨයින් උදෙසා දිව්‍ය පූජාව පවත්වන්න. මොකද, මේ මොහොත වෙද්දී ඒ අයව මුවාකරල තිබෙන මේ අඳුරු පටලය ඉවත් කර සැබෑ දහම් නායකයින් මෙන් ජනතාව, දෙස බලන්නටත් මුළු විශ්වයේ ජාති කුල ආගම් භේද නොමැතිව බොහොම සාමකාමීව ජනතාව වෙත මේ එඬේරිකත්වය ඉදිරියට ගෙන යාම පිණිස. මුල් කිතුනු සභාව ගත්තත් එදා සහ අද අතර ලොකු වෙනසක් තියනවා. එදා තිබුණෙ පව්කාරයාට ළංවෙලා පව්කාරයන්ට ආදරය කරපු සමාව දීපු ක්‍රමයක්. අද ඊට වඩා හාත්පසින්ම වෙනස්, අද මොකක්ද වෙනස? අද දඬුවම් තමයි ඉල්ලන්නේ. අන්නස් කායපස්ල වගේ අය බිහි වෙන්න යනවා. වැරදිකරුවාව ඉදිරියට ගෙනල්ලා, ජුදා සමාජය මාව ඉදිරියට ගෙන ගියා වගේ, ඇණ ගසනු කියනවා වගේ ඒ මට්ටමටයි මේ අය එන්නට යන්නේ. එදා නිරපරාදෙ නිවැරදි කෙනෙක්වයි, ඇණ ගැසුවෙ. එය පියාණන්ගේ සැලැස්මක්. මේ සැලැස්මේ දී සභාවෙන් විය යුත්තෙ සියලු දෙනාම මේ සිදු වූ දේ හිස් කරලා, පියාණන් වහන්සේට භාර කරල සියලු දෙනාම එකමුතු වීම."

"බොහොම නිශ්චලයි වගේ පෙනුනට වැඩ සිදුවෙමින් යනවා, බිහිසුණු දෙයක් වෙනවා. ඒ එක්කම රාජ්‍ය නායකයින්ගේ අඩුපාඩුකම් එළියට එමින් තිබෙනවා. නිවැරදි රාජ්‍ය පාලනයක් මේ දේශයේ තවම නැහැ. එකිනෙකා එකිනෙකාගෙ අඩුපාඩු සඟවා ගත්තාට සඟවා ගන්නට බැරි තැනට එනවා. නායකත්වය උදෙසාත් සටන් වදින මොහොතක් එනවා. දැන් ලොකු යුද්ධයකට සූදානම් වෙමින් තියෙන්නේ. ඒ සමගම ජාතියක් ජාතියකට විරුද්ධව සටන් වදින මොහොතකුත් ආරම්භ වෙනවා. පියවරෙන් පියවර යද්දි බයිබලයේ සඳහන් වන වසංගත උවදුරු සියල්ල පොළොවට පැමිණෙනවා. සැම තත්පරයක්ම බිහිසුණු වෙනවා කියන්නේ, මනුෂ්‍යයාට අමාරු යුගයක් බවට පත්වෙනවා."

“සභා ව්‍යුහය ඉහළම නායකත්වය ගත්තොත් අද එදා තිබූ තැන, වත්පිළිවෙත් ඇතුළු බොහෝ දේවල් වෙනස් කරමින් යන පැත්ත දැන් ආරම්භ වී තිබෙනවා. විරුද්ධවාදියාගේ වැඩ දැන් ඇරඹී ඉවරයි. ඒ අයට නොදැනීම ඒ අයගෙන් වචනයක් පිටවෙනවා, රහස්‍යමය තොරතුරු එලෙස එළියට එනවා. පියාණන් විසින් එක් එක්කෙනාව පාවිච්චි කරල අනාවරණයන් තුළින් මේ සඟවා තිබෙන රහස් එළියට දෙනවා. මගේ පූජක පුතණුවන්ට මම නැවත ද කියනවා, හැම මාසයකම එක් දිනක් ඔබේ ශ්‍රේෂ්ඨයින් උදෙසා දිව්‍ය පූජාව පවත්වන්න. එය සියලු දෙනාගේම අවදි වීම පිණිසත් සුරක්ෂිතභාවය පිණිසත් වැදගත්. සභා නායකයින් වැරදි පියවරක් තැබුවහොත් එය මුළු ජනතාවටම බලපානවා. බොහොම නම්‍යශීලිව, ඉවසිලිවන්තව මේ පියවර වෙතට ආ යුතුයි. බොහෝ පූජකවරු ඉන්නවා මේ යන ක්‍රමය අනුමත නොකරන, හදවතින් වැළපෙන අය ඉන්නවා. මේ නායකයින් කරන දේ තුළ ඔවුන් භීතියෙන් ඉන්නේ. ඔවුන් හදවතින් මොරගහනවා. ඉතින් ඒ අයත් අවදි වෙයි, ඒ අයට සැනසීම උදෙසාත් මෙය කරන්න.”

**2021 අප්‍රේල් 14**

“මා ප්‍රේමවන්ත දරුවෙනි, ලෝකය පුරා දැන් නපුරාගේ ක්‍රියාකාරකම් ව්‍යාප්ත වෙමින් තිබෙනවා. නපුරා පරාජය කරන්නට ස්වර්ගීය සේනාවත් දැන් මිහිතලයට එවලයි තිබෙන්නේ. ඒ නිසා ඔබ හැම කෙනෙක්ම අවබෝධ කරගත යුතු දෙයක් තිබෙනවා. තම කැමැත්තට මරණය, තම ආශාවට මරණය, තම අයිතිවාසිකම්වලට මරණය - ඒ ත්‍රිවිධ මරණය සියල්ලන් විසින් අත්දැකිය යුතු මොහොතයි, දැන් උදා වී තිබෙන්නේ. අද නපුරාගේ ක්‍රියාකාරකම් මගේ සභාව යට කරමින් තිබෙනවා. සමහර සභා ශ්‍රේෂ්ඨයින් වසාගෙන ඇති අඳුරු පටලය දුරු කරමින් ඔවුන් ආලෝකයට ගෙන ඒම පිණිස සෑම මාසයකම එක් දිනක් සභා ශ්‍රේෂ්ඨයින් වෙනුවෙන් දිව්‍ය පූජාවක් පවත්වන ලෙස මම මගේ පූජක පුත්‍රයන්ගෙන් ඉල්ලා සිටියා. මම දැන් ඔබ සැමගෙන් ඉල්ලීමක් කරනවා. බොහෝ දෙනා තම අවශ්‍යතා ඉටුවීම උදෙසා මුදලක් ගෙවා හෝ දිව්‍ය පූජාවක් ඉල්ලා සිටින පුරුද්දක් තිබෙනවා. එලෙසම දැන් සභා ශ්‍රේෂ්ඨයින් උදෙසා දිව්‍ය පූජාවක් මගේ පූජක පුත්‍රයන්ගෙන් ඉල්ලා සිටින්න. එසේ කරන්නට වැඩිවැඩියෙන් ජනතාව යොමු කරන්න. එසේ නොවුනොතින් නපුරාගේ ක්‍රියා භයානක ලෙස ව්‍යාප්ත වනු ඇත, ධර්ම අධර්ම යුද්ධය වඩාත් බිහිසුණු වනු ඇත. එසේ වන්නට ඉඩ නොදී මේ සඳහා ඔබ සැම ඇපකැප වී එලෙස පැවැත්වෙන දිව්‍ය පූජාව සඳහා ජනතාවට ආරාධනා කරමින් ඔවුන් සැම එක්රැස් කරන්න. සභා නායකත්වය නපුරට යට වන්නට ඉඩ නොදී, ඒ එඬේරිකත්වය නැවත පණ ගන්වන්නට බලය ඉල්ලා ඒ දිව්‍ය පූජාව තුළ දෙවිඳුන් යදින්න.”

**2021 මැයි 16**

“ඔයාලගෙ ප්‍රශ්න ලෙඩ-දුක් කරදර මොන ප්‍රශ්නයක හරි ඔයාලා හිරවෙලා ඉන්නව නම් ඔයාලා කියන්න, මෙලෙස. බිළිඳු ජේසුනි, මා තුළට එන්න. මා ගන්නා වූ සුසුමක් තුළින් ඔබ ඒ සුසුම වී මා තුළට ඇතුල් වෙන්න. මාව මුළුමනින්ම ස්පර්ශ කරන්න. මගේ රෝගී තත්ත්වයන්, මගේ දැවෙන ප්‍රශ්න, මගේ පාපී ස්වභාවයන් මගේ අනවශ්‍ය සෑම සියලු දේ අරගෙන පිට කරනා සුසුමක් විලස පිට කරන්න. මිදෙන්න බැරි වහල්කම් ඇබ්බැහිවීම් මා තුළ තියෙනවා, මට මේක හිස් කරගන්න ඕනෑ, මාව සුවකර ගන්න ඕනෑ. බිළිඳු ජේසුනී මගේ සුසුම වී මා තුළට එන්න. අනවශ්‍ය සියල්ල රැගෙන පිටකරනා සුසුමක් විලස ඔබ එය ඉවත් කරන්න, එලෙස මා පවිත්‍ර කරන්න. මෙයයි, ඔබ අයිති කර ගත යුතු අලුත්ම පණිවුඩය. මොකද, එයාට දැන් ලෝකය බාර දීලා තියනවා, නැවත මනුෂ්‍යයන් ඇතුළට යන්න පුළුවන්, එයාට. ඔබගේ ස්වාමි පුරුෂයා වෙනුවෙන් බිළිඳු ජේසුව කැඳවන්න, ඔහුව බාර දෙන්න, බිළිඳු ජේසුට. ඔබගේ දරුවෙක් රෝගි වෙන්න පුළුවන්. එවිට ද බිළිඳු ජේසුගේ ඒ මිත්‍රශීලි සහායෝගය ලබා ගන්න.” (දැනට වසර කීපයක සිට ජේසු සමිඳුන්ගේ ප්‍රථම දාසිය මගින් ජේසු සමිඳුන් යමෙක් ඇමතීමෙන් පසු එය අවසන් කරන්නේ මෙසේය.) “සුදතුන්ගේ ශුද්ධාත්ම වරම් තුළ මම ඔබ රඳවන්නෙමි. දෙවි මහෝත්තමයාණන්ගේ මහා බලසම්පන්න බල මහිමය තුළ මම ඔබ රඳවන්නෙමි. පියාණන්ගේ බැල්ම තුළ මම ඔබ රඳවන්නෙමි. පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද යන ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ බැල්ම තුළ මම ඔබ රඳවන්නෙමි. සියලු සුරදූතයන්ගේ රැකවරණය තුළ මම ඔබ රඳවන්නෙමි. සියලු ශුද්ධවන්තයන්ගේ මධ්‍යස්ථභාවය තුළ මම ඔබ රඳවන්නෙමි.

මරිමවුන්ගේ මැදිහත්භාවය තුළ මම ඔබ රඳවන්නෙමි. ජේසු බිළිඳුන්ගේ මිත්‍රශීලි ස්වභාවයට මම ඔබලා බාර කරමි. මේ පොළෝතලය තුළ ජීවත් වන තුරා යහපත්ව ජීවත් වෙමින් ස්වාමින් වහන්සේට ප්‍රසන්න දිවි පෙවෙතක් ගත කරමින් ස්වර්ගය දිනා ගන්නට වරම් ලැබේවා ! ආමෙන්.”

# 58

# “මගේ දෙවන පැමිණීම ආසන්නයි. ඒ මහිමාන්විත පැමිණීම උදෙසා මහා පවිත්‍රකරණයක් මේ සිදුවන්නේ.”

**තෙවන කොටස**

**11.** ඔබ මෙහි 3 හා 4 අංක යටතේ සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කළා නම් පාස්කු බෝම්බ සිද්ධිය හා කොරෝනා වෛරස උවදුර ඔස්සේ දැන් උදාවී ඇති දේව ශුද්ධභාවයේ අති බිහිසුණු අදියරේ දේව ක්‍රියාකාරිත්වයේ සුලක්ෂණ ඔබ හොඳින් අවබෝධ කරගන්නට ඇති. උදාවී ඇති මේ අදියරේදී දෙවිඳුන්ගේ අතට කැමැත්තෙන් නතුවී සිටින ගිහි, පැවදි, පූජක සියල්ලන්ගෙන් උන්වහන්සේට අවශ්‍ය කාර්යය උන්වහන්සේ ඉටුකර ගන්නවා නිසැකයි. එතැන නිදහස් කැමැත්ත ගැන ගැටළුවක් නැහැ. උන්වහන්සේ ඉල්ලන දේ කොතෙක් අසම්මත වුවත් එය ඉටුකරන්නට සිදුවෙනවා. උන්වහන්සේ ඒ සඳහා ක්‍රියාකරන එක විදිහක් දැනටම පවසා තිබෙනවා. ”ඔබට දරන්නට නොහැකි තරම් විඳවීම්වලින් හා ඉසිලිය නොහැකි තරම් ඕක් සුවඳින් ඔබ වසා ගන්නා විට දැනගන්න, ඔබව ද ඒ සඳහා මා විසින් කැඳවන බව.” (28) (ජේසු සමිඳුන්ව එදා ඇණගැසුවේ ඕක් ලී කඳකයි.) උන්වහන්සේගේ ඒ ක්‍රියාකාරිත්වයේ අරමුණ සියල්ලන් මනස්ස්ටාපනයට පැමිණවීමයි. “ලෝක විනාශය පිළිබඳව මා දුන් මගේ මැණියන් දුන් අනාවරණ එලෙසම සිදුවන තුරු බලා සිටින අයට වන විපතක මහත. ඒ සියල්ලේ අරමුණ මනුෂ්‍යයා මනස්ස්ටාපනයට පැමිණවීම පමණයි. සියල්ලෝ මනස්ස්ටාපනය වෙත් නම් ඒ සියල්ල නිනීවේ මෙන් වන්නට පුළුවන. මගේ හා මගේ මැණියන්ගේ අනාවරණ හා සම්බන්ධ වන සියල්ලන්ට ජෝනාගේ නින්දාව අයිති බව වටහා ගන්න.” (49) සියල්ලෝ මනස්ස්ටාපනයට පැමිණෙත් නම් විනාශය පිළිබඳ උන්වහන්සේ පැවසූ සියල්ල විගස වෙනස් කරන්නට උන්වහන්සේට හැකියි. එනිසයි දෙව් පියාණෝම මෙලෙස ප්‍රකාශ කළේ. “මා මහත් සේ නුඹලාට මොරගසමින් කියන්නේ මා පෙර දැන්වූ සියලුම අනාවරණයන් සැනෙකින් අහක්කර ගැනීමේ මොහොත උදෙසා, ලොවේ ධර්මිෂ්ඨයින් සංඛ්‍යාව වැඩිවීම උදෙසා නුඹලා අද සිට ක්‍රියා කරපන්න.” (19)

උන්වහන්සේ තම ප්‍රමුඛ සභාව වන කතෝලික සභාවේ පමණක් නොව බෙදීගිය කිතුනු නිකායන් තුළ ද ඒ කාර්යය ඉටුකර ගන්නවා නිසැකයි. සභාව නිකායන් වශයෙන් බෙදීයාම ගැන උන්වහන්සේගේ ප්‍රමුඛ සභාව වන කතෝලික සභාවට ඒ වගකීමෙන් පලායන්නට නොහැකියි. දරුවෙක් පවසන දෙය සත්‍යය නම් එය පිළිනොගන්නට තරම් පියෙක් මුරණ්ඩු විය යුතු නැහැ. පියාගේ අඩුපාඩුකම් නිසා පවුල කඩාගෙන යන්නට තරම් දරුවො මුරණ්ඩු විය යුතු නැහැ. සභා ඉතිහාසය තුළ ඒ වරද සිදුවී තිබෙනවා. එනිසා කිතුනු නිකායන් ගැන ඇති වාදවිවාද දැන් අවසන් විය යුතුයි. දැන් ඔවුන් දෙස ද සුබවාදිව බැලිය යුතුයි. මෙම අනාවරණ තුළ ජේසු සමිඳුන් මෙසේ පවසා තිබෙනවා. “මගේ අසරණ බැටළුවන්ට මෙය ද පවසන්න. මා දමා ඇති ඒ අත්තිවාරම මත මා පිහිටෙව්වා වූ මගේම සභාව තුළ හෙවත් මගේ ප්‍රමුඛ සභාව වන කතෝලික සභාව තුළ පමණක් රැඳී සිටින්න. මාගේ නාමයෙන් ඇත්වන මාගේ ආනුභාවයෙන් ඈත් වී ඇති නොයෙක් ආකාරයේ ව්‍යාජ සභාවන් තුළ ගැළවීම සොයන්නට නොයන්න.” (23) එපමණක් නොව උන්වහන්සේ මෙලෙස ද පවසා තිබෙනවා. “මාගේ සත්‍යය සොයා ගිය පුංචි සභාවන් තුළට ද ගමන් කරන්න. ඔවුන් මාගේ වචනයට මොන තරම් ආදරය කරන්නේ ද ඔවුන් මාගේ ආත්මයට මොන තරම් ආදරය කරන්නේ දැයි දකින්න. දුක සැප දෙවේලේ මා තුළ ඔවුහු ජීවත්වී මට ප්‍රශංසා කරති. ඔවුන් කවුරු නෙරපුවත් කවුරු තෙරපුවත් මා ඔවුන් තුළ ද වැඩවසන වග මගේ ධර්මිෂ්ඨයා දන්නේය. ඔවුන් ඇසුරු කරන්න, ඔවුන් සමග ආහාර වළඳින්න.” (19)

ශුද්ධභාවයේ අති බිහිසුණු අදියරේ දේව ක්‍රියාකාරිත්වය තුළ උන්වහන්සේ මූලධර්මවාදි කිතුනු නිකායන් තුළ ද හැසිරෙමින් සියල්ල නිවැරදි කරන්නට, බෙදීගිය සියල්ලන් ඒකරාශි කරන්නට කටයුතු කරනු නියතයි. එනිසයි මා පැවසුවෙ සියලු වාදභේද අමතක කරමු කියලා. බෙදීගිය සියලු කිතුනු නිකායන් ඒකරාශි වීම ගැන 'දහම් නවෝදය' තෙවන ප්‍රකාශනය වන 'පරම උල්පත හා මුදුන' මා කරුණු 11ක් සටහන් කර තිබෙනවා. මූලධර්මවාදි කිතුනු නිකායන්

මුල්කරගෙනයි, අද සභාව තුළ ගැටළු රැසක් පැනනැගී ඇත්තේ. සමහර මූලධර්මවාදී කිතුනු නිකායන්ට සැඟවුණු අරමුණු තිබෙන්නට ද පුළුවන්. "---- සාර්ථකත්වයේ ශුභාරංචිය (Prosperity Gospel) නමැති මූලධර්මවාදී ක්‍රිස්තියානිය (හෙවත් යාච්ඤා මාර්ගය ධනය, බලය රැස්කළ හැකි වන්දනා ක්‍රමයක් ප්‍රචාරය කරන කුරුසයක් නොදන්නා ව්‍යාජ ක්‍රිස්තුස් වහන්සේ කෙනෙකුන් කෙරෙහි විශ්වාසයක් ගොඩනගන ධනවාදී ක්‍රිස්තියානිය) මෘගිකරණයත් සමග ව්‍යාප්ත බිහිසුණු ආගමික බලවේගයක්ය." එය සත්‍යයක් නම් කරලියට පැමිණෙන ක්‍රිස්තු විරෝධියා සමග ඔවුන් නිසි මොහොතේ එක්වනු ඇත. ධර්මය හා සම්පව බැඳුණු අනෙකුත් ආගමිකයන් ද ඒකරාශී කරමින් ධර්මයාණෝ සියල්ල නවතාවයට පමුණුවන්නට ක්‍රියා කරනු ඇත.

අධර්මාධිපතිට උපරිමව ක්‍රියා කරන්නට දෙවිඳුන්ගෙන් අවසර ලැබෙන මාස 42 තුළ ලුසිෆර් ජේසුස් ලෙස පෙනීසිටිමින් නොයෙක් හාස්කම් ප්‍රාතිහාර්ය සිදුකරනු ඇත. නපුරාට කළ නොහැකි ප්‍රාතිහාර්යයන් දෙකයි ඇත්තේ. මනුෂ්‍යයා මනස්ස්ථාපනයට පමුණුවන්නට ඔහුට නොහැකියි. එකිනෙකාට අගපේ ප්‍රේමයෙන් ප්‍රේම කරන්නට ඒ සඳහා මනුෂ්‍යයා යොමුකරන්නට ඔහුට නොහැකියි. කරලියට පැමිණෙන නපුරා විද්‍යාවෙන් හා තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ගනු ඇත. ඒ ක්‍රියාකාරිත්වයේ දී ජේසු සමිඳුන්ගේ විවිධ හැඩරුවින් ක්‍රිස්තු විරෝධියා පෙනී සිටිනු ඇත. ජේසු සමිඳුන් අප සංඝය සමග කළ පෙරහුරුවේ දී පැවසුවේ එවිට ඔබ ඔහුට මෙලෙස අභියෝග කරන ලෙසයි. "ඔබ ජේසුස් නම් කුරුසියේ ඇණගැසුන ජේසුස් ලෙස පෙනී සිටින්න." ඔහුට එය කිසිසේත් කළ නොහැකි බව ජේසු සමිඳුන් පැවසුවා. මේ මහා ධර්ම අධර්ම යුද්ධය තුළ කතෝලික සභාව මොන තරම් අභියෝගයන්ට මුහුණ දුන්නත් බිය නොවන්න. ජේසු සමිඳුන් එදා පැවසූ ලෙස නිරාදොරටු උන්වහන්සේගේ සභාවට එරෙහිව කිසිසේත් ජය නොගනු ඇත. ජේසු සමිඳුන් වසර 25ක් තුළ අප සංඝය හා කළ ක්‍රියාකාරිත්වයේ දී එතුමන් පැවසූ මෙම වදන් 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයේ සටහන්ව ඇත. "මුල් කිතුනු සභාව දෙවන වරට ඇතිවන්නේය. එය ශුද්ධාත්මයාණන් විසින්ම මෙහෙයවන තත්ත්වයට මම පත්කරන්නෙමි." නපුරාට උපරිමව ක්‍රියා කරන්නට දෙවිඳුන්ගෙන් අවසර ලැබෙන ඒ කාලවකවානුව තුළ දෙවියන් වහන්සේ ද මහත් බලයෙන් ප්‍රකාශ වනු ඇත. එනිසා එදා නික්මයාමේ ගමනේ දී සිදුවූ ප්‍රබල ක්‍රියාවන්ටත් වඩා ප්‍රබල ක්‍රියා සිදුවනු ඇත. ශුද්ධාත්ම බෞතිස්මයෙන් පසු මුල් සභාවේ සිදුවූ ප්‍රබල ක්‍රියාවන්ටත් වඩා ප්‍රබල ක්‍රියා සිදුවනු ඇත. පාස්කු බෝම්බ සිද්ධියෙන් හා කොරෝනා උවදුරෙන් අද ජනතාව කම්පිතව වියවුල්ව සිටියත් ධර්ම අධර්ම යුද්ධයේ ඉදිරි අති බිහිසුණු සිදුවීම් තුළ මහෝත්තමයාණන්ගේ ප්‍රබල බාහු බලය දිස්වන විට ජනතාව දෙවිඳුන් කෙරෙහි තම විශ්වාසය ප්‍රබල කරගනිමින් ඉදිරි සිදුවීම්වලට අභීතව මුහුණ දෙනු ඇත. පාස්කු බෝම්බ සිද්ධියේ හා කොරෝනා උවදුරෙන් ප්‍රකාශ වූ දේව ශුද්ධභාවයේ මෙතෙක් සැඟවී තිබුණු පිතෘක ආදරය යහමින් විඳගනු ඇත. ඒ සියල්ල ගැන සමිඳුන් පසසනු ඇත.

**12.** ජෝබ් තුළ දෙවියන් වහන්සේ පිළිබඳ පැවති විශ්වාසය පරීක්ෂා කිරීමට එදා ඉඩ සැලසූ ලෙසම ලෝ වැසි සියල්ලන්ගේ විශ්වාසය පරීක්ෂා කිරීමට අධර්මාධිපති දෙවියන් වහන්සේගෙන් අවසර ඉල්ලා ඇත; දෙවියන් වහන්සේ ඒ සඳහා ඔහුට අවසර දී ඇත. 2019 පාස්කු ඉරිදා දෙව්මැදුරු තුනක බෝම්බ පිපිරීමෙන් මුලපිරුවේ එය නොවේද? ශු. බයිබලයේ ජෝබ් පොත කියවා බලන්න. ජෝබ්ගේ පුතුන් හත්දෙනා හා දියණියන් තිදෙනා ඇතුළු ඔහු සතු සියලු සම්පත් එකවර අහිමි වූ මොහොතේ ජෝබ් වැළපෙමින් හෝ දෙවිඳුන් ඉදිරියේ මෙසේ පැවසුවා. "මම කිසිත් නැතිව මව්කුසින් ආවෙමි, කිසිත් නැතිව ආපසු යන්නෙමි. සමිඳාණෝ දුන් සේක. සමිඳාණෝ ගත් සේක. සමිඳුන් නමට ගරු පැසසුම් වේවා.!" ජෝබ් මුහුණදුන් ඒ මහා පරීක්ෂාවෙන් පවා දෙවියන් වහන්සේ පිළිබඳ ඔහුගේ විශ්වාසය සසල කරන්නට අධර්මාධිපතිට හැකි වූයේ නැහැ. ජෝබ්ට විඳදරා ගන්නට වඩාත් අපහසු වූයේ ඔහුගේ විඳවීමේ දෙවන අදියරයි. එය හිස මුදුනේ සිට යටිපතුල් දක්වාම මුළු සිරුර පුරා පැතිරීගිය දරුණු කුෂ්ඨයක් නිසා එක්තැන්ව ඔහු විඳි අපමණ වේදනාවයි. ඒත් දෙවිඳුන් කෙරෙහි වූ ජෝබ්ගේ විශ්වාසය ඒ සියල්ල අභිබවා ජයග්‍රහණය කළා. එතැනත් නපුරාට කිසිදු ජයක් ලැබුනෙ නැහැ.

පාස්කු බෝම්බ සිද්ධිවලින් තම ආදරණීයයන්ගෙන් වෙන්වීමේ වේදනාව අත්දකිමින් සිටින බොහෝ දෙනෙකුට එදා ජෝබ් මුහුණදුන් ආකාරයට සාර්ථකව මුහුණ දෙමින් ඒ සිදුවීම් උදෙසා සමිඳුන් පසසන්නට තවමත් නොහැකිව තිබෙනවා. ඒ බෝම්බ පිපිරීම් නිසා ආබාධිතව එක්තැන්ව අපමණ දුක් විඳින සියල්ලන් අත්දකින්නේ ජෝබ් විඳි දෙවන අත්දැකීමයි. මේ අති කටුක

අත්දැකීම්වලට මුහුණ දෙමින් ඒ සියල්ල අභිබවා ජයග්‍රහණය කරන්නට නම් ලිසියහි සාන්ත තෙරේසා තුමිය තම ජිවිතය පුරා ක්‍රියාවට නැගූ විඳුම, පිදුම, මිදුම ප්‍රබලව ක්‍රියාවට නගන්නට ඉගෙනගත යුතු වෙනවා. ඒ තමාට විඳින්නට සිදුවී ඇති සියල්ල දෙවිඳුන්ට තුති දෙමින් සතුටින් භාරගන්නටත් ඒ සියල්ල සියල්ලන්ගේ ගැළවීම උදෙසා ජේසු සමිඳුන්ගේ කටුක වූ දුක්පාත්‍රය හා එක්කරමින් සමිඳුන්ට පුදන්නටත් ඉගෙනගත යුතු වෙනවා. ආබාධිතව එක්තැන්ව සිට එලෙස දේව රාජ්‍ය උදෙසා මහා කාර්යයක් කරන්නට තමාට හැකි බව අත්දැකීමෙන් අවබෝධ වූ විට ඔවුන් ප්‍රීතියෙන් ඉපිලෙනු ඇත. ඒ ප්‍රීතිය අනෙක් සියල්ලන්ට අභියෝගයක් වනු ඇත. ජෝබ් අත්දුටු ඒ විඳවීමේ පියවර දෙක මේ ධර්ම අධර්ම යුද්ධයේ දී නපුරාගේ පරීක්ෂා හා දෙවියන් වහන්සේගේ පරීක්ෂණ ලෙස අත්දකින්නට මනුෂ්‍යයාට සිදුවනු ඇත. ජෝබ් දෙවිඳුන් කෙරෙහි වූ තම විශ්වාසය පලුදු කර නොගෙන සියලු අභියෝගයන්ට සාර්ථකව මුහුණ දුන්නාක් මෙන් ඔබ විසින් ද ඒ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඔබට උපකාරී වන කරුණු දෙකක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි.

එළිදරව් 4 පරිච්ඡේදය වෙත මා ඔබගේ අවධානය යොමුකරන්නට කැමතියි. එය, ස්වර්ගීය සිංහාසනයෙහි වැඩසිටින තැනැන්වහන්සේ වෙත ඔබගේ අවධානය යොමුකරනවා. ඒ කෙටි පරිච්ඡේදයේ සිංහාසනය යන වචනය 14 වරක් යොදා තිබෙනවා. ස්වර්ගීය සිංහාසනය අබියස සිටින ජීවමාන සත්වයන් හතර දෙනා ගැන එහි සඳහන් වෙනවා. “ඔවුහු සිටින්නා වූ සිටියා වූ මතු සිටින්නා වූ සර්වබලධාරී වූ ස්වාමින් වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධයයි රෑ දවල් නොනැවතී කියති.” “වැඩිමහල්ලන් 24 දෙනා ද සිංහාසනයෙහි වැඩසිටින තැනැන්වහන්සේ ඉදිරියෙහි වැඳවැටී සදාකල් ම ජීවත් වන්නා වූ තැනැන්වහන්සේට නමස්කාර කර තමන්ගේ ඔටුනු සිංහාසනය ඉදිරියෙහි හෙළා, අපගේ ස්වාමින් වහන්ස, අපගේ දෙවියන් වහන්ස, ඔබ ප්‍රශංසාවත් ගෞරවයත් බලයත් ලබන්නට වටින තැනැන්වහන්සේය. මක්නිසාද ඔබවහන්සේ සියලු දේ මැවූ සේක. ඔබගේ කැමැත්ත නිසා ඒවා මවන ලද්දේ යැයි කියති.” සගලොව සිට වැඩිමහල්ලන් 24 දෙනාගේ මුවින් නිරන්තරයෙන් නික්මෙන මහා දේව ප්‍රකාශනය මෙයයි. ජීවමාන සත්වයන් හතර දෙනා ද වැඩිමහල්ලන් 24 දෙනා ද එකම වචන ස්වල්පයක් නිරන්තරයෙන් කියද්දි එය නිරස නැද්ද, එය එපා වෙන්නෙ නැද්ද කියල ඔබටත් හිතෙන්න පුළුවන්. කිසිසේත්ම එවැන්නක් සිදුවන්නෙ නැහැ. මක්නිසාද ඔවුන්ගේ ඒ හැම වචනයක්ම ප්‍රකාශ කරන්නේ දෙවියන් වහන්සේගේ ශුද්ධවූ අභිමුඛයේ නිසා.

ස්වර්ගයේ වැඩිමහල්ලන් 24 දෙනා පවසන ඒ අවසන් වාක්‍ය දෙක දෙසට මා ඔබගේ අවධානය නැවත යොමුකරන්න කැමතියි. “ඔබවහන්සේ සියලු දේ මැවූ සේක **ඔබගේ කැමැත්ත නිසා ඒවා මවන ලද්දේය.** එනිසා පියාණන් වහන්සේගේ කැමැත්ත සමග කිසිවකුට වාද විවාද කළ නොහැකියි. මුළු මැවිල්ල උන්වහන්සේගේ කැමැත්තට මුළුමනින් අවනත වීමයි, සිදුවිය යුත්තේ. මිනිසා හැර මුළු මැවිල්ලම දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්. දෙවිඳුන්ගෙන් නිදහස් කැමැත්ත ලැබූ මිනිස් වර්ගයා තුළ ද මෙය සිදුවිය යුතුයි. ධර්ම අධර්ම යුද්ධයේ ඉදිරි සිදුවීම් අතිශයින් බිහිසුණු වන්නට වන්නට ඒ සියල්ල මැද සැනසීමක්, සංහිඳියාවක් ලබන්නට නම් ඔබ ද එතැනට පැමිණිය යුතුයි. මගේ කැමැත්ත නොව පියාණෙනි, ඔබගේ කැමැත්ත සිදුවේවා යි, හදපත්ලෙන් ම කියමින් ඔබ ඒ උතුම් අත්දැකීමට පිවිසෙනවා නම් ඉදිරි අති බිහිසුණු සිදුවීම්වලට මුහුණ දීමට ඔබට අපහසු වන්නෙ නැහැ. ස්වර්ගයේ නිරන්තරයෙන් සිදුවන ඒ මහා දේව නමස්කාරයට සමාන දේව නමස්කාරයක් මිහිමත සිටින අපට කිසිදා කළ නොහැකියි. එහෙත් මගේ කැමැත්ත නොව පියාණෙනි, ඔබගේ කැමැත්ත ලෙස සියල්ල සිදුවේවා යි හද පත්ලෙන්ම පවසමින් ඒ අත්දැකීමට පිවිසීම, ස්වර්ගයේ දේව නමස්කාරය හා සමාන දේව නමස්කාරයක්.

මැවුම්කරුවාණන් මෙලෙස පවසනවා. “මමයි සියල්ල මැව්වෙ. එනිසා මමයි සියල්ලේ අයිතිකරු. සියල්ල මගේ කැමැත්ත ලෙසයි සිදුවිය යුත්තේ.” එය මුළුමනින් පිළිගනිමින් ඔබත් මමත් සමිඳුන් අබියස මෙලෙස පවසමු. පියාණෙනි, ඔබයි මා මෙලොවට ජනිත කළේ, ඒ ඔබ කැමති මොහොතේ. එනිසා ඔබ කැමති මොහොතේ මා කැඳවා ගැනීමේ අයිතිය ඔබ සතුයි. ඔබගේ කැමැත්තට මා මුළුමනින් අවනත වෙනවා. එනිසා තවදුරටත් සුබ මරණයක් ඉල්ලමින් මා සිටින්නේ නැහැ. ඔබ කැමති ඕනෑම මොහොතක ඔබ කැමති ඕනෑම අයුරකින් මා මෙලොවින් සමුගන්නට සූදානම්. ඔබයි මගෙ දරුවන් මට දුන්නේ. එනිසා ඔබයි ඔවුන්ගෙ අයිතිකරු මා භාරකරු පමණයි. එනිසා ඔබ කැමති ඕනෑම මොහොතක ඔබ කැමති ඕනෑම අයුරකින් ඒ දරුවා සග ලොව වෙත කැඳවා ගැනීමේ අයිතිය ඔබ සතුයි. ඔබගේ ඒ අයිතියට මම ගරු කරනවා. එනිසා මා තුති දෙමින් ඒ දරුවා ඔබ අතටම පවරනවා. ඔබ ඒ අත්දැකීමට පැමිණෙනවා නම් එදා ජෝබ්

අධර්මාධිපතිගේ ඒ මහා පරීක්ෂාවට, දෙවියන් වහන්සේගේ ඒ මහා පරීක්ෂණයට සාර්ථකව මුහුණ දුන්නාක් මෙන් ඔබටත් සාර්ථකව මුහුණ දෙන්නට පුළුවන්. තත්ත්වය වඩ වඩාත් බිහිසුණු වන්නට වන්නට ඔබටත් ඒ පරම අත්දැකීමට පිවිසෙන්නට සිදුවෙනවා. එය හැර වෙන සාර්ථක පිළිතුරක් කිසිවකුට නැහැ. පියාණෙනි, ඔබගේ කැමැත්ත යි, ඔබගේ මහා ප්‍රඥාව. එනිසා අප අත ඇති සියල්ල හා සියල්ලන් සමිඳුන් සුරතේ තබා ඒ පිළිබඳ අයිතියට මුළුමනින් හිස් වෙමින් පියාණෙනි, මා පිළිබඳව, අප පිළිබඳව සියල්ලන් පිළිබඳව ඔබගේ කැමැත්ත සිදුවේවා යි පවසමු.

මා ඔබ ඉදිරියේ තබන්නට අදහස් කරන දෙවන කරුණ මෙයයි. දැහැමි යුගයේ උදාව ඉතා ආසන්නයි. ඒ මහා ප්‍රසවය උදෙසා මහා ගාබිනාවක් දැන් සිදුවන්නේ. දැහැමි යුගයේ උදාව දක්වා ඒ ප්‍රසව වේදනාව සිදුවනු ඇති. මහා ප්‍රසව වේදනාව ඉදිරියටයි. ඒ මහා ගාබිනාව සතුටින් විඳින්නට අපට මහත් ශක්තියක් අවශ්‍යයි. යෙසායා සිට මලාකි දක්වා දිවැසිවරුන්ගේ පොත්වල දැහැමි යුගය පිළිබඳ සඳහන් දේව පොරොන්දු එක්රැස් කර ගන්න. ඒ දේව පොරොන්දු උදාවී ඇති මේ කඩුක අවදිය සාර්ථකව පසුකරන්නට අපට මහත් ශක්තියක් ලබා දෙනවා නිසැකයි. දැහැමි යුගය පිළිබඳ දේව පොරොන්දු සියල්ල එක්ව අප තුළ මහා සිහිනයක් ගොඩනැගෙන්නට අවශ්‍යයි. එය නිසැකවම සැබෑ වන සිහිනයක්. ඇමෙරිකා එක්සත් ජනපදයේ නීග්‍රෝ ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ නායකයාව සිටි මාටින් ලූතර් කිං විසින් 1963, වොෂිංටන් නුවර දී පැවැත්වූ ඒ ඓතිහාසික දේශනය හැඳින්වෙන්නේ “I have a dream” ලෙසයි. මාටින් ලූතර් කිං, මහත්මා ගාන්ධි තුමාගේ අහිංසා දැක්මෙන් සන්නද්ධ වූවා පමණක් නොව දැහැමි යුගයේ උදාව පිළිබඳ දේව පොරොන්දුවලින් ද සන්නද්ධව සිටියා. ඒ දේශනයෙන් උපුටාගත් මේ වදන් ඊට උදාහරණයක්.

“ඔබ නිර්මාණශීලිව වදවේදනා දැරීමේ ප්‍රවීනයෝ වන්න. ලාබ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොරව දුක් වේදනා දැරීම විමුක්තියට හේතු වන බව සිහියේ තබා ගනිමින් ඔබ ඇරඹූ ගමන පෙරට ම යන්න. බලාපොරොත්තු සුන්වීම් නමැති මිටියාවතේ ලැගීම අපි කිසි දා නොකළ යුතු වෙමු. සැම මිටියාවතක්ම දෙනියක්ම නැඟී සිටිනු ඇත. සැම කන්දක්ම කඳු පර්වතයක්ම පහත් වනු ඇත. ඇද පලුදු වූ ස්ථානයන්හි ඇදපලුදු අහෝසි වන්නේය. දෙවියන් වහන්සේගේ තේජස ප්‍රකාශ වන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව හිඳ ඒ තේජස දකිනු ඇත. මේ වනාහී අපගේ බලාපොරොත්තුව යි. බලාපොරොත්තු භංගත්වය නමැති ගල්පර්වතයේ බලාපොරොත්තුව නමැති මැණික ඔපමට්ටම්, කර ගැනීමට මේ විශ්වාසයේ උපකාරයෙන් අපි සමත් වන්නෙමු. මේ විශ්වාසයේ පිහිටෙන් නොකන්කළු නාද රටාව සහෝදරත්වය නමැති සොඳුරු සංධ්වනියක් බවට පරිවර්තනය කර ගැනීමට අපි පොහොසත් වන්නෙමු.” (ජේසු සමිඳුන්ගේ මහිමාන්විත නැවත පැමිණීමෙන් පසු උදාවන දැහැමි යුගය පිළිබඳ දිවැසිවරුන්ගේ පොත්වල සඳහන් දේව පොරොන්දුවලින් සන්නද්ධ වන තරමට “මට සිහිනයක් තිබේ” යනුවෙන් පවසමින් අපට ද මහත් පීඩා මැද පෙරටම යන්නට හැකි වනු ඇත.)

**13.** සම්ප්‍රදායික සුව මෙහෙයන් නොවෙයි, දැන් වඩාත් අවශ්‍ය වන්නේ. දැන් අවශ්‍ය වන්නේ මැදිහත්කමේ යාච්ඤා මෙහෙයන්. ඒ ගැන ජේසු සමිඳුන් මෙසේ පවසනවා.

“මහා කුරුසිය කර දරාගෙන ලෝකය උදෙසා දියවන්නට කැඳවීමක්. දැන් සියල්ලෙන් හිස් වන්න, ලෝකය උදෙසා කැපවන්න. එවිට <u>ස්වාමින් වහන්සේ ඔබ පිළිබඳ සියල්ල සපල කරන සේක.</u>” (49)

“බාධක අභියෝග අභිබවා ජයග්‍රහණය කිරීමයි, සියල්ලන්ගේ ගැළවීම උදෙසා දියවීම කියන්නේ. ඒ සඳහා පියාණන්ගේ ස්පර්ශයක් අවශ්‍යයි.” (48)

“ශාරීරිකව, මානසිකව, ආත්මිකව නුඹලා විඳින්නාවූ දුක වේදනාව ඒ මහා විඳවීම අද ලෝකයේ අවශ්‍යතාවය බැවින් දුක් විඳින ඔබ සැම ඉතා භාග්‍යවන්තය. නුඹලාගෙන් මා පතන එකම දේ නම් ලෝ වැසි සියල්ලන් උදෙසා මොරගැසීමත් ලෝකය උදෙසා ඔබගේ ජීවිතය කැපකර ගැනීමත්ය.” (23)

“ඉතින් ඔබ කරන්න ඕනැ ඔබගේ යැදුම් තුළ තමා වෙනුවෙන් නොවෙයි, ලෝකයේ සියලුම ජනතාව උදෙසා කන්නලව් කරන එකයි. එතැනයි ඔබේ ජීවිතයේ සාර්ථකත්වය. ඔවුන්ගේ ඒ වේදනාව

ඔබගේ වේදනාව කරගන්නා විට සියලු දෙනා ගළවනු ලබයි. පියාණන් වහන්සේට සියල්ල කළ හැකිය.” (50)

ජේසු සමිඳුන් අප සංඝය අමතා පැවසූ ඉහත සඳහන් හැම වදනක්ම අපට සිහිපත් කරන්නේ මේ අති උතුම්, අති කටුක අවදියේ ලෝ වැසි සියල්ලන් උදෙසා මැදිහත්කමේ යාච්ඤාවේ අවශ්‍යතාවයයි. ජේසු සමිඳාණෝ මුළු මිනිස් සංහතිය උදෙසා දෙව් පියාණන් ඉදිරියේ මහා මැදිහත්කරුයි. දේව මෑණියෝ මුළු මිනිස් සංහතිය උදෙසා ජේසු සමිඳුන් ඉදිරියේ මහා මැදිහත්කාරියයි. අපිත් ජේසු සමිඳුන් ඉදිරියේ මුළු මිනිස් සංහතිය උදෙසා මහා යාච්ඤාවකට පිවිසෙන්න අවශ්‍යයි. “මා නුඹලාගෙන් පතන එකම දේ නම් ලෝ වැසි සියල්ලන් උදෙසා මොරගැසීමත් ලෝකය උදෙසා ඔබගේ ජීවිතය කැපකර ගැනීමත්ය.” එවිට ඔබ පිළිබඳ සියල්ල සපල කරන්නට උන්වහන්සේ පොරොන්දු වෙනවා. එයයි මැදිහත්කමේ යාච්ඤාවේ පදනම. සුව මෙහෙයන් තුළ බොහෝ විට සිදුවන්නේ තම අවශ්‍යතා පිළිබඳව දෙවිඳුන්ට මොරගැසීමක්. ජේසු සමිඳුන් පැවසුවේ “තමකම නසා කුරුසිය දරා මා අනුව එන්න” කියලයි. බොහෝ සුව මෙහෙයන්වල තමා විසින් භාරගතයුතු කුරුසියත් හැකි නම් ඉවත්කර ගන්නටයි, උත්සාහ කරන්නේ.

මැදිහත්කමේ යාච්ඤා සඳහා ඔබට පන්නරයක් ලැබෙන්නේ මා පහත සඳහන් කරන කරුණු පිළිබඳව ඔබගේ අවබෝධය වැඩිවන තරමටයි. “නුඹලා බෝවී වැඩි වෙමින් පොළොව පූර්ණ කොට එය යටත්කර ගන්න.” (උත්පත්ති 1:28) එය සැබවින්ම දෙවියන් වහන්සේ තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදාගැනීමකි. එය උන්වහන්සේ තම බලය විමධ්‍යගත කිරීමකි. උන්වහන්සේ ඒ විමධ්‍යගත කිරීමට උපරිමව ගරු කරනවා. ඉන් බැහැරව උන්වහන්සේ ක්‍රියා කරන්නෙ නැහැ. උන්වහන්සේ තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදාගත් නිසා ඒ මොහොතේ සිට උන්වහන්සේ ක්‍රියා කරන්නේ මනුෂ්‍යයා මෙවලමක් කර ගනිමින්. නපුරාගේ සැළසුම් මුදුන්පත් කිරීම සඳහා ඔහු අත මෙවලමක් වන්නට බහුතරයක් ජනතාව සිටිනවා. දෙවිඳුන්ගේ මහිමය උදෙසා වැය වන්නට දැනට සිටින්නේ සුළුතරයක් පමණයි. බලය විමධ්‍යගත කිරීම තුළින් උන්වහන්සේ කළේ තම බලයට සීමා පමුණුවා ගැනීමක්. එනිසා සියල්ල වෙනස් කරනු සඳහා මනුෂ්‍යයෙක් උන්වහන්සේගේ අත මෙවලමක් වන තුරු උන්වහන්සේ බලා සිටිනවා. මා මෙහි විග්‍රහ කළ තත්ත්වය උන්වහන්සේ තම බලය විමධ්‍යගත කළ මොහොතේ සිට (මිනිසා මැවීමේ සිට) 2019 පාස්කු බෝම්බ සිද්ධියෙන් උන්වහන්සේගේ ශුද්ධභාවයේ අති බිහිසුණු අදියර උදාවන මොහොත දක්වා ක්‍රියාත්මක වූ තත්ත්වයයි. දැන් එහි ලොකු වෙනසක් සිදුවන්නට යනවා. (මෙහි 3,4 අංක යටතේ ඇති සටහන් නැවත අධ්‍යනය කරන්න.) ඉන්පසු “මා සනසන්නකු බලා සිටි නමුත් කිසිවෙක් සම්බ නුණේය.” කියමින් උන්වහන්සේ තවදුරටත් මොරගසමින් සිටින්නෙ නැහැ. උන්වහන්සේගේ අතට කැමැත්තෙන් නතුවී සිටින සියල්ලන්ගෙන් උන්වහන්සේට අවශ්‍ය කාර්යය උන්වහන්සේ ඉටුකර ගන්නවා. උන්වහන්සේගේ අතට කැමැත්තෙන් නතුවී සිටින කිසිවකුට ඉන් පලා යා නොහැකියි. උන්වහන්සේගේ මේ නව ක්‍රියාවලිය මනුෂ්‍ය සංහතියේ පවිත්‍රකරණය සඳහායි.

උදාවී ඇති මේ අදියරේ දී මැදිහත්කමේ යාච්ඤා මෙන්ම යාච්ඤා බලකොටු ද වැදගත්. එයින් අදහස් කරන්නේ නපුරාගේ දුෂ්ට ක්‍රියාකාරීත්වයට එරෙහිව ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වෙමින් කරන මහා මොරගැසීමක්. මුළු මිනිස් සංහතිය ජේසු සමිඳුන්ගේ ශ්‍රී ලෙයට යට කරමින් කරන මොරගැසීමක්. “ජෙරිකෝව වනසන්නට” ඉන් අදහස් කරන්නේ නපුරා පිළිබඳ සියල්ල සුං වන්නට, “නව ජෙරුසලම ගොඩනගන්නට” එයින් අදහස් කරන්නේ දෙවිඳුන් මහිමයට පත්වීම සඳහා ඇවැසි සියල්ල ඉටුවන්නට කරන මොරගැසීමක්. සත්‍යය නොදකින සේ නොඇසෙන සේ නපුරා විසින් අන්ධ කළ හැම දෙනෙතක්ම, බිහිරි කළ හැම දෙසවනක්ම විවර වන්නට නපුරාගේ බලයට අභියෝග කරමින් දෙවිඳුන් අබියස කරන මොරගැසීමක්. දැනට නපුරාට සේවය කරන සියල්ලන් නැවත දෙවිඳුන් වෙත හැරී ඒම උන්වහන්සේගේ කැමැත්ත නිසා ඔවුන් කෙරෙහි වන නපුරාගේ සියලු බැමි සුණුවිසුණු වී ඔවුන් සැම නිදහස් වන පිණිස දෙවිඳුන් අබියස සිට කරන කන්නලව්වක්. ජේසු සමිඳුන්ගේ කල්වාරි යාගය නිසා නපුරා පරාජිත බව නපුරාට සිහිපත් කරමින්, ඒ පරාජය සදාතනික පරාජයක් බව සිහිපත් කරමින්, මොනතරම් ආකර්ෂණීය ක්‍රම උපයෝගි කරගනිමින් කරලියට පැමිණියත් අධර්මාධිපති පරාජිත බවත්, ඔහු දහස් වසරකට බැඳ දමන බවත්, දැහැමි යුගයක උදාව වලක්වන්නට ඔහුට කිසිසේත් නොහැකි බවත් ප්‍රකාශ කරමින් නපුරාට කරන අභියෝගයක්.

ශුද්ධ බයිබලය නිමාවට පත්වන්නේ ජේසු සමිඳුන් හා මනුෂ්‍යයා අතර දෙබසකින්, සංවාදයකින්. "මේ කාරණා ගැන සාක්ෂි දරන තැනැන්වහන්සේ සැබවින්ම මම ඉක්මනින් එමි යි වදාරන සේක. ආමෙන් ජේසුස් වහන්ස, වැඩිය මැනව. ජේසුස් ස්වාමින් වහන්සේගේ කරුණාව සියල්ලන් සමග වේවා !" (එළිදරව් 22:20) මෙය මනාලයා හා මනාලිය අතර දෙබසක්. මනාලයා ජේසු සමිඳුන්. මනාලිය මිනිස් සංහතියයි. මනාලයා පවසනවා, "මම විගස එමි" කියලා. "ජේසුස් වහන්ස, වැඩිය මැනව" ඒ මනාලියගේ පිළිතුරයි. මනාලිය පා තබා සිටින තැන වැඩි වැඩියෙන් රත්වන තරමටයි, බිහිසුණු වන තරමටයි, ඇයගේ මුවින් "ජේසුස් වහන්ස, වැඩිය මැනව" යන වදන් නොනැවති නික්මෙන්නේ, එය මහා මොරගැසීමක් දක්වා වැඩිදියුණු වන්නේ. පාස්කු බෝම්බ සිද්ධියෙන් හා කොරෝනා උවදුරෙන් මුලපිරෙන දේව ශුද්ධභාවයේ අති බිහිසුණු අඳියර එහි උපරිමයට ළං වෙද්දි, ධර්ම අධර්ම යුද්ධය එහි උපරිමයට ළං වෙද්දි "ජේසුස් වහන්ස, වැඩිය මැනව" යන වදන් සියල්ලන්ගේ මුවින් නික්මෙනු ඇත. ඒ වදන් ලොව පුරා රාව ප්‍රතිරාව නංවනු ඇත. උපත සිදුවන මොහොතයි, ප්‍රසව වේදනාවේ උපරිමය. ජේසු සමිඳුන් මහිමාන්විතව නැවත පැමිණීම හා දැහැමි යුගයේ උදාවයි. ඒ මහා උපත. "මේ දේ සිදුවන්නට පටන්ගන්නා කල ඔබේ විමුක්තිය ළංවේගෙන එන බැවින් නැගී සිට හිස් ඔසවන්න." (ලූක් 21:28) මහත් ගාවිනාවක් මැද මහත් බලාපොරොත්තුවක් ඇතිව විඳවන මනාලිය අමතා ජේසු සමිඳුන් එලෙස පවසනවා. එනිසා කඩාවැටෙන්නට නොවෙයි, නැගී සිටින්නටයි දැන් අවශ්‍ය වන්නේ, ජයග්‍රාහිව හිස ඔසවන්නටයි, දැන් අවශ්‍ය වන්නේ. "වඩිනු දෙව් මෙසියා" ගීතය (එහි කෝරස් එක පමණක්) 365 දිනයේම ඔබගේ තොල් මත තබා ගන්න, එය හදවතට ආත්මයට සමීප කර ගන්න. "නසා'ප පව් දොසා උදා කරන් ඔබේ වරම් රැසා" එලෙස ගයමින්, ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වෙමින් මේ මහා වීර චාරිකාව අපි සාර්ථකව සමාප්තියට පත්කරමු.

**14.** 2021 මාර්තු 12, "ඇන්තනි දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය පිළිබඳව ජනතාව දැනුවත් කරන්නට කටයුතු කරන්නැ"යි ජේසු සමිඳුන් සිය ප්‍රථම දාසිය සුජීවා මගින් මට පැවරූ කාර්යය මම උපරිම මෙනෙහි කිරීමකින්, උපරිම වගකීමකින්, ඉමහත් දේව අනුග්‍රහය තුළ ඉටුකළෙමි. ජේසු සමිඳුන්ගේ එම වචන ස්වල්පය 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයට පරිච්ඡේද පහක්ම එක් කිරීමට හේතු විය. (54 - 58) දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය එදා ජේසු සමිඳුන් කතා කළ ඇරමයික් බසින් කාදෝෂ් පිළිබඳව අපි ගැඹුරින් මෙනෙහි කළෙමු. දෙවියන් වහන්සේ ප්‍රේමයේ උපරිමය, බලයේ උපරිමය පමණක් නොව ශුද්ධභාවයේ උපරිමය ලෙස දකින විට උන්වහන්සේගේ ක්‍රියා වඩාත් නිවැරදිව, වඩාත් ගැඹුරින් අවබෝධ කරගන්නට ඔබ සමත් වනු ඇත. දැන් අපි දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය (කාදෝෂ්) පිළිබඳ මෙනෙහි කිරීම අවසන් කරමු. විශ්වයේම ස්වාමින් වහන්සේ ද මුළු මිනිස් සංහතියේ ගැළවුම්කරුවාණන් ද එඬේරාණන් ද වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව මෙනෙහි කිරීමකට පිවිසෙමු. ඒ සඳහා "කුරුසිය මත" ("මහා සිකුරාදා ලියන ලදී") යනුවෙන් නම් කර ඇති ලෙබනන් ජාතික කවියෙකු හා දාර්ශනිකයෙකු වන ඛලිල් ජිබ්රාන්ගේ ශ්‍රේෂ්ඨ නිර්මාණයෙන් උපුටා ගත් කොටස් කීපයක් මා දැන් ඔබ ඉදිරියේ තබන්නට කැමතියි.

"අදත් සෑම අවුරුද්දකම අද වැනි දිනකත්, දැඩි නිද්‍රාවෙන් අවදි වන මිනිසා යුගවල අවතාර ඉදිරියේ නැඟී සිටිමින් කුරුසියේ ඇණගසනු ලැබූ නාසරෙත්හි ජේසුස් දැකීමට කඳුළු පිරි දෙනෙතින් කල්වාරි කන්ද දෙස බලා සිටී, ---- එහෙත් දවස ගෙවී ගොස් සැඳෑ කල එළඹි විට මනුෂ්‍ය වර්ගයා පෙරළා ගොස් සෑම කඳුගැටයක්, සෑම තණතලාවක් හා සෑම අටුකොටුවක් මත ඉදිකොට ඇති ලෞකිකත්වයේ ප්‍රතිමා ඉදිරියේ දණින් වැටී යාච්ඤා කරති.

අද ක්‍රිස්තියානි ආත්මයෝ පියාපත් මත ජෙරුසලෙමට පියාසර කරති. එතැනට පියාසරන ඔවුහු කටු ඔටුන්නක් හිස ඇතිව ස්වර්ගය ඉදිරියෙහි දෑත් විහිදුවා මරණයේ කඩතුරාව පසුපස සිට ජීවිතයේ ගැඹුර දෙස බලන උන්වහන්සේ දෙස දෑතින් ළය පෙළමින් රැස්කකා බලා සිටිති. ---- එහෙත් දවස නමැති වේදිකාව මත රාත්‍රියේ තිරය වැටී ඒ කෙටි නාටකය අවසන් වූ කෙනෙහි ක්‍රිස්තියානිහු කාණ්ඩ වශයෙන් ආපසු ගොස් විස්මෘතියේ (සම්පූර්ණයෙන් මතක නැති වීමේ) සෙවනැල්ල තුළ අවිද්‍යාවේ හා අලසකමේ ඇතිරිලි මැද නිදා ගනිති.

සෑම අවුරුද්දකම අද වැනි දිනක දර්ශනවාදීන් තම අඳුරු ලෙන්වලින් ද, චින්තකයන් තම සිත කුටිවලින් ද, කවියන් තම මනඃකල්පිත ලතා මණ්ඩපවලින් ද එළියට අවුත් අර නිහඬ කන්ද මත ගෞරව පූර්වකව නැඟී සිට තරුණයකු තම වධකයන් අමතා මෙසේ කියනු ඔවුහු අසා සිටිති. "පියාණෙනි, ඔවුන් කරන දෙය ඔවුන් නොදැන කරන බැවින් ඔවුන් කමා කළ මැනවි." එහෙත් අඳුරු නිශ්ශබ්දතාවය ආලෝකයේ කටහඬ නිහඬ කරන කල දර්ශනවාදියෝ, චින්තකයෝ, කවියෝ තම පටු විවර තුළට පෙරළා පැමිණ නිරර්ථක ලිපි ලේඛනාදියෙන් සිය ආත්මයන් වසා ගනිති.

චණ්ඩමාරුතයකට හසුවූ මුදු මොළොක් රිකිල්ලක් මෙන් කුරුසිය අබියස දුකින් පීඩිතව සිටින ස්ත්‍රිය බලන්නට ජීවිත ශෝභාවේ ඇලි-ගැලී සිටින ස්ත්‍රීහු අවුරුද්දේ අද සුව පහස් දෙන තම අසුන්වලින් නැඟී සිටිති. ඔවුන් ඇය අසලට පැමිණෙන කල ගැඹුරු වේදනාත්මක වැළපීමක් ඔවුන්ට ඇසේ. අහසත් පොළොවත් අතර එල්ලී සිටින ශාන්ත ශුද්ධ මනුෂ්‍යයකුගේ දෙපයින් ගලන රුධිරය තම කඳුලෙන් සෝදන තරුණ මග්දලාහි මරියාවන් දෙස ආපසු හැරී බලන්නට නූතන ශිෂ්ටාචාරයේ ප්‍රවාහය සමග තරඟයට දුවන තරුණ තරුණියෝ අද මඳකට නැවතෙති. එම දර්ශනයෙන් ඔවුන්ගේ නොගැඹුරු දෑස් වෙහෙසට පත්වූ කල ඔවුන් එතැනින් ඉක්මනින් ඉවතට ගොස් මඳකින් සිනාසෙති.

සෑම අවුරුද්දකම අද අවදිවන වසන්තයත් සමග මනුෂ්‍ය වර්ගයා අවදි වී දුක් වේදනා විඳින නසරීන ජාතිකයා අබියස සිටගෙන හඬා වැළපෙති. ඉන් අනතුරුව ඇස් වසාගෙන සැප නින්දක හෙවෙති. එහෙත් වසන්තය අවදිව සිනාසෙමින් සුවඳවත් රන්වන් වස්ත්‍රයෙන් සැරසුණු ග්‍රීස්ම ඍතුව හා එක්වන තුරු රැඳී සිටී. ඉකුත් යුගවල මතකයන් හා වීරයන් ගැන වැළපීමෙන් විනෝද වින්දනයක් ලබන්නෙකි, මනුෂ්‍ය වර්ගයා. ---- මනුෂ්‍ය වර්ගයාට අවබෝධයේ දායාදය තිබිණි නම් ඔවුන්ගේ ජය හා මහිමය ගැන මහත් සේ ප්‍රීතිවනු ඇත. මනුෂ්‍ය වර්ගය වනාහි තුවාල ලත් මෘගයකු අසල සන්තෝෂයෙන් බලා සිටින ළාබාලයෙකු වැනිය. ගස්වල වියලි රිකිලි විස්මෘතියේ නිදන් කරන්නට සමත් ශක්තිය හා නොබැඳි සියල්ල නිසැකවම පිසදමාගෙන යා හැකි බලයෙන් වැඩෙන ප්‍රවාහය ඉදිරියේ මනුෂ්‍ය වර්ගයා සිනාසෙති. ---- ඉතින් මනුෂ්‍ය වර්ගයා උන්වහන්සේට පුද කරන එකම දෙය නම් හැඬීම් වැළපීම් හා ළතෝනි ය. ගැළවුම්කරුවාණන්ගේ නාමයෙන් සියවස් ගණනක් තිස්සේ මනුෂ්‍ය වර්ගයා කළේ දුර්වලකමට වන්දනාමාන කිරීමය, පූජෝපහාර පැවැත්වීමය. මේ නසරීන ජාතිකයා දුර්වලයෙක් නොවන්නේය. උන්වහන්සේ ශක්තිමත්ව ප්‍රබලව සිටි සේක, දැනුදු සිටින සේක. ශක්තියේ නියම අරුත තේරුම් ගැනීම මිනිස්සු ප්‍රතික්ෂේප කරති.

ජේසුස් බියෙන් යුතු ජීවිතයක් ගත නොකළේය. උන්වහන්සේ කළකිරෙමින් හෝ චෝදනා කරමින් හෝ නොමළ සේක. උන්වහන්සේ නායකයකු ලෙස ජීවත් වූ සේක. උන්වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබුවේ ශුද්ධ යුද්ධ භටයකු ලෙසය, උන්වහන්සේ මියගියේ තම වධකයන් බිය ගැන්වීමට සමත් වූ වීරෝදාරත්වයකින් යුතුවය. ජේසුස් තටු සිඳී ගිය කුරුල්ලෙක් නොවීය. උන්වහන්සේ වංක කුටිල අත්තටු සිඳ බිඳ දැමූ ප්‍රචණ්ඩ මාරුතයක් වූ සේක. තමන්ට හිංසා පීඩා කළවුන්ට හෝ තම සතුරන්ට හෝ උන්වහන්සේ කිසිසේත් බිය නොවූ සේක. උන්වහන්සේ නිර්දෝෂව, නිර්භීතව, ධෛර්ය සම්පන්නව සිටි සේක. උන්වහන්සේ සියලුම සාහසිකයන්ට හා පීඩකයන්ට තර්ජනයක් වූ සේක. බෝවෙන සැරව ඇති ගඩුගෙඩි උන්වහන්සේ ඡේදනය කොට දැමූ සේක. උන්වහන්සේ නපුර නිහඬ කළ සේක, මුසාවාදය මුලිනුපුටා දැමූ සේක, ද්‍රෝහිකම් දුරු කළ සේක.

ආලෝක චක්‍රයේ හදවතින් උන්වහන්සේ පැමිණියේ නිවාස වනසා ඒවායේ නෂ්ඨාවශේෂ මත කන්‍යාරාම, තාපසාරාම ගොඩනගන්නට නොවේ. එහෙත් උන්වහන්සේ මෙම පෘථිවියට පැමිණියේ කපාල හා ඇටකටු මත ගොඩනංවන ලද ඕනෑම රාජ්‍යයක අඩිතාලම ද සුණුවිසුණු කිරීමට සමත් නව අධ්‍යාත්මික බලවේගයක් මුදවා හැරීමටය. ---- උන්වහන්සේ මෙහි පැමිණියේ දුර්වලයන්ගේ මිනිවලවල් මත ගොඩනංවන ලද මහා මාලිගා බිඳ දැමීමටය, දුප්පතුන්ගේ සිරුරු මත ගොඩනංවන ලද ප්‍රතිමා සුණුවිසුණු කිරීමටය. ජේසුස් මෙහි එවන ලද්දේ අඳුරු පැල්පත් අතර අලංකාර දේවස්ථාන සාදන්නට යැයි මිනිසුන්ට ඉගැන්වීමට නොවේ. උන්වහන්සේ පැමිණියේ මිනිස් හදවත දේවස්ථානයක් ද ආත්මය අල්තාරයක් (පූජාසනයක්) ද මනස පූජකයෙකු ද කරනු සඳහායි. නසරීන ජාතික ජේසුස්ගේ දූත මෙහෙය වූයේ මේවා ය. උන්වහන්සේ කුරුසියේ ඇණ

ගසන ලද්දේ මෙම ඉගැන්වීම් නිසාය. ඉතින් මනුෂ්‍ය වර්ගයා ප්‍රඥාවන්ත නම් අද නැගී සිට අධර්මය පරාජය කිරීමේ ගීතයත් ජයග්‍රහණයේ ස්තෝත්‍රයත් මහ හඬින් ගයනු ඇත.

කල්වාරි කන්දේ සිට ඛේදයජනක යුග පෙරහැර දෙස බලා සිටින දුෂ්ඨ ජාතින්ගේ මහත් ඝෝෂාවට සවන් දී සිටින අනන්ත කාලයේ සිහින තේරුම් ගන්නා, කුරුසියේ ඇණගසනු ලැබූ ජේසුනි, කුරුසියේ එල්ලී සිටින ඔබ දහසක් අධිරාජ්‍යවල දහසක් සිංහාසන මත සිටින දහසක් රජවරුන්ට වඩා තේජස් සම්පන්නය, අනුභාව සම්පන්නය. මරණ වේදනාවෙන් පසුවන්නා වූ ඔබ දහසක් යුද්ධවල දහසක් සේනාධිපතින්ට වඩා බලවත්ය. ඔබගේ වේදනා සමග ඔබ මලින් බර වසන්තයට වඩා ප්‍රීති ජනකය. ඔබට කසපහර දුන්නන් ඉදිරියේ ඔබ මහා පර්වතයකට වඩා නොසෙල්වෙන ගුණයෙන් යුක්තය. ඔබගේ කටුඔටුන්න බහ්රාම්ගේ ඔටුන්නට වඩා බ්‍රාජමානය, (දීප්තිමත්ය), අති උදාරය. ඔබගේ අත් සිදුරුකළ ඇණ ජුපිටර්ගේ රාජ සෙංකෝලයට වඩා අලංකාරය. ඔබගේ දෙපා මත විසිරුණු ලේ ඉෂ්තාර්ගේ ගෙල පළඳනාවට වඩා දීප්තිමත්ය.

අද ඔබ වෙනුවෙන් ළතෝනි කියන දුර්වලයන් කමා කරන්න. මක්නිසාද ඔවුන් තමන් ගැනම ළතෝනි කියන්නට නොදන්නා බැවිනි. ඔවුන් කමා කරන්න. මක්නිසාද ඔබ මරණයෙන් මරණය ජයගෙන මළවුන් වෙත ජීවනය දානය කළ බව ඔවුහු නොදන්නාහ. ඔවුන් කමා කරන්න. මක්නිසාද ඔබගේ ශක්තිය හා බලය ඔවුන් වෙනුවෙන් තවමත් ජේවී තිබෙන බව ඔවුහු නොදන්නාහ. ඔවුන් කමා කරන්න. මක්නිසාද හැම දවසක්ම ඔබගේ දවසක් බව ඔවුහු නොදන්නාහ.” (මෙය සිංහලට පරිවර්තනය කළේ සිරිල් බී. පෙරේරා සූරින් ය.)

ජේසු සමිඳුන්ගේ මරණය ගැන ළතෝනි කීම අතීතයට තබමු. උන්වහන්සේගේ ජීවිත පූජාවෙන් උදාකළ විමුක්තිය ගැන ප්‍රීතියෙන් තුති ගී ගයමු. උන්වහන්සේගේ මරණය හා උත්ථානය මගින් දානය කළ අනුග්‍රහය (වරප්‍රසාදය) තුළ නිරන්තරයෙන් පවතිමු. කුරුසිය මත සිදුවූ ජේසු සමිඳුන්ගේ ජීවිත පූජාව සියලු මනුෂ්‍යයින් උදෙසායි. උන්වහන්සේ තම ජීවිත පූජාවෙන් මුළු මිනිස් සංහතියම සදාතන දඬුවමින් නිදහස් කළහ. ඉතිරි වී ඇත්තේ කාලින දඬුවම පමණයි. එය මෙලොවත් ගෙවමින් පවිත්‍ර කිරීමේ ශුද්ධවූ ගිනිජාලාව තුළ ද ගෙවමින් සදාතන ජීවිතයට පිවිසීමේ මඟ එතුමෝ සියල්ලන් උදෙසා විවර කළහ. ජේසුගේ දුක් විඳීම, මරණය හා උත්ථානය උන්වහන්සේගේ පාස්කුවයි. දැන් සිදුවිය යුත්තේ ඔබෙත් මගෙත් පාස්කුවයි. ඒ සඳහා අප වෙනුවෙන් දිවි පිදූ මරණයෙන් උත්ථාන වූ ප්‍රතාපවත් මානවයා වන ජේසු සමිඳුන් සමග අප සබඳතාවයක් ගොඩනගා ගත යුතුයි. එයට මෙලෙස පිවිසෙමු. ඔබ පාපිෂ්ඨ මනුෂ්‍යයෙක් බව දකින්න, තමාගේ ශක්තියෙන් පමණක් පාපය ජයගත නොහැකි බව (විශේෂයෙන් මුල් අගුන පාපය ජයගත නොහැකි බව) පිළිගන්න, ජේසු සමිඳුන් අපගේ පාපය උදෙසා ගෙවූ මහා මිලය දකින්න, ජේසු සමිඳුන් ඔබගේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගන්න. එවිට ඔබ මුළුමනින් නිදහස් වනු ඇත. ඒ පදනම තුළ ඔබ ජේසු සමිඳුන් සමග සමීප සබඳතාවයක් ගොඩනගා ගන්න. එයයි, ඔබේ පාස්කුව.

දෙවි පියාණන්ට පාපය උදෙසා වන්දිය ලෙස තම පුතණුවන්ගේ ලෙය වැගිරවීම අවශ්‍ය නොවූ බවත් ජේසුගේ දුක් විඳීම හා මරණය මුළුමනින්ම මනුෂ්‍යයාගේ ක්‍රියාවක් පමණක් බවත් පැවසෙන ඉගැන්වීම් විශේෂයෙන් දේවධර්මශාස්ත්‍රය ගැඹුරින් අධ්‍යයනය කළ සමහර උගතුන් අතර පැතිරෙමින් පවතිනවා. මෙය කොරෝනාවලටත් වඩා භයානක වෛරසයක්. මෙය විනාශ කරන්නේ කිතුනු අධ්‍යාත්මයයි. එනිසා අප ඒ ගැන ගැඹුරින් මෙනෙහි කළ යුතු වෙනවා. දෙවියන් වහන්සේ මැවූ මුළු විශ්වයම මුළුමනින් ම පවිත්‍රයි. ඒ පරම පවිත්‍ර මැවීමට පාපය (ආත්මාර්ථය) ඇතුළු වූ ඒ මොහොත ගැන සිතන්න. පාපය ඇතලු වූ ඒ මොහොත මුළු මැවීම අති ප්‍රබල කම්පනයකට ලක්වූ මොහොතක්, පොළොව මිනිසාට එරෙහිව වල්පැල, කටුපඳුරු උපදවන සමහර සතුන් පවා මිනිසාට එරෙහිව නැගීසිටින තත්ත්වයක්. ඒ තත්ත්වය අවසන් කරන්නට ඒ සඳහා සුදුසු මිලය ගෙවන්නට කාට හැකිද? ඒ සඳහා සිල්ලර මිලයක් ප්‍රමාණවත් නැහැ. කිසිම මනුෂ්‍යයකුගේ කිසිම උතුම් ක්‍රියාවකින් ඒ මිලය ගෙවන්න බැහැ. ඒ සඳහා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ම මිනිසෙක්ව මෙලොවට පැමිණිය යුතු වුණා. මිනිසත්බව ගෙන මෙලොවට පැමිණි දේව පුත්‍රයාණන්ගේම ලේ ඒ සඳහා අවශ්‍ය වුණා. 33 වසරක් ජීවත් වෙමින් කිසිදු පාපයක් නොකළ මනුෂ්‍ය පුත්‍රයාගේ ලේ ඒ සඳහා අවශ්‍ය වුණා. එය පමණයි, දෙවියන් වහන්සේගේ පරම පවිත්‍ර මැවීමට පාපය ඇතුළු වීම උදෙසා ගෙවිය යුතු සුදුසු එකම මිලය, එය අමිල මිලයක්. එනිසයි, පියාණන් වහන්සේ ගැළවීමේ කාර්යය මුල පුරමින් එය ජයග්‍රාහි මුදුන කරාම ගෙන ගියේ.

මිනිසාගේ මැවීම සිදුවුයේ සුගති උද්‍යානයේ, මිනිසාගේ වැටීම සිදුවුයේ සුගති උද්‍යානයේ, දෙවියන් වහන්සේ ගැළවීමේ පොරොන්දුව දුන්නේ සුගති උද්‍යානයේ. (උත්පත්ති 3:15) දෙවියන් වහන්සේගේ ගැළවීමේ මහා කාර්යයේ පළමු පියවර ඇරඹුනෙත් සුගති උද්‍යානයේමයි. කුමක්ද, සුගති උද්‍යානයේ ඇරඹුන ගැළවීමේ මහා කාර්යයේ පළමු පියවර? එතෙක් පැළඳ සිටි දේව දරුකමේ මංගල වස්ත්‍රය ආදි මව්පියන්ට අහිමි වුණා, ඔවුන්ගේ පාපය නිසා. එනිසා ඔවුන් තම නග්නභාවය දැක්කා. ඔවුන් කොළ අතු දවටා ගනිමින් ඔවුන්ගේ නග්නභාවය වසා ගන්නට ක්‍රියා කළා. දෙවියන් වහන්සේ සතකුගේ හමකින් සකස් කළ ඇඳුම් දෙකක් දෙදෙනාට දී කොළ අතු ඉවත් කර ඒ ඇඳුම්වලින් නග්නභාවය වසා ගන්නට ඔවුන්ට අවස්ථාව දුන්නා. මෙය ගැළවීමේ කාර්යයේ මුල් පියවර වුණත් දෙවියන් වහන්සේ එය අවසන් පියවරේ (කල්වාරි ජයග්‍රහණයේ) සංකේතයක් කළා. සතකුගේ හමක් මනුෂ්‍යයාට ඇඳුමක් වන්නට නම් ඒ සතා දිවි පිදිය යුතුයි. මිය යා යුතුයි. ජේසු සමිඳුන් තම උත්තම පූජක දිවි පිදීමෙන් පාපය නිසා මිනිසාට අහිමි වූ දේව දරුකමේ මංගල වස්ත්‍රය නැවත උරුම කළා. ඒ සඳහා දෙව් පියාණන් තම පුතණුවන්ට කුරුසියක් සූදානම් කර දුන්නා. එනිසයි ශු පාවුලු තුමා "කුරුසිය දෙවියන් වහන්සේගේ ප්‍රඥාවයි" යනුවෙන් සඳහන් කරන්නේ. ජේසු සමිඳුන්ගේ ජිවිත පූජාව මුළුමනින්ම දෙව් පියාණන්ගේ සැලැස්ම බව දැන් පැහැදිලි විය යුතුයි.

ජේසු සමිඳුන්ගේ ජිවිත පූජාවෙන් පසු දෙවියන් වහන්සේගේ ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දෙන්නට අපට ක්‍රම විධි රැසක් තිබෙනවා. ඒත් එදා ජනතාවට ඒ සඳහා එකම ක්‍රමයයි තිබුණේ. ඒ යාග පූජා හා දවන පූජා පමණයි. ගොවියෙක් නම් තම අස්වැන්නෙන් කොටසක්, එඬේරෙක් නම් තම පට්ටියේ සතෙක් දවන පූජා, යාග පූජා ලෙස ඔප්පු කළා. දෙවියන් වහන්සේට යාග පූජා දවන පූජා අවශ්‍ය නොවූ බව ශු. බයිබලය පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒත් ඔවුන්ට දෙවියන් වහන්සේගේ ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දක්වන්නට තිබුණේ ඒ ක්‍රමය පමණක් නිසා උන්වහන්සේට එය භාර ගන්නට සිදුවුණා. උන්වහන්සේ එය ද ගැළවීමේ ක්‍රියාවලියේ පුරා පැතුරුන ප්‍රබල අවස්ථාවක් කරගත්තා. උන්වහන්සේ නියෝග කළා යාග පූජාව සඳහා තෝරා ගන්නා බැටළුවා, එළුවා, ගවයා තරුණ, පිරිමි, නොකැළැල් සතෙක් විය යුතු බව. එය මිනිස් පාපය උදෙසා පිදෙන්න නියමිත ජේසුස්ගේ සංකේතයයි. උන්වහන්සේ නොකැළැල්, එයින් අදහස් කරන්නේ කිසිදු පාපයක් නොකළ තැනැන්වහන්සේ බව යි. තරුණ පිරිමි නොකැළැල් සතෙක් නිසා ඒ සතාගේ ලෙය මිනිසාගේ පාප විමුක්තිය සඳහා උන්වහන්සේ උපයෝගි කර ගත්තා. එයින් උන්වහන්සේ සිදුකළේ කුමක්ද? එය කල්වාරි ජිවිත පූජාවේ ප්‍රතිපලය අතිතයට ද ගෙන යාමක්. උන්වහන්සේ මෙලෙස ගැළවීමේ කාර්යය පියවරෙන් පියවර ඉදිරියට ගෙන ගියා. ශු. බයිබලයේ සඳහන් පාපධාරි එළුවා ගැන සිතන්න. තරුණ, පිරිමි, නොකැළැල් එළුවෙක් තෝරා ගෙන මුළු ඊශ්‍රායෙල්ගේ පාපය එළුවාට පවරමින් ඌ නගරයෙන් පිට පාළුකරයට පලවා හැරියා. ඒ එළුවාගේ දුක් විඳීම හා මරණය ඊශ්‍රායෙල්ගේ පාප විමුක්තිය ලෙස සැලකුවා. මෙය කල්වාරි ජිවිත පූජාවේ සංකේතයක්. කාන්තාර ගමනේදී උස රිටක දවටන ලද මැරුණු සර්පයකුගේ ලෝහමය රූපය ද කල්වාරි යාගයේ සංකේතයක්. සර්පයෙක් දෂ්ට කළ යමෙක් ඒ උස රිටක දවටන ලද මියගිය සර්ප රුව දෙස බලන විට සර්ප විෂ ඉවත් වුණා. එය කල්වාරි ජිවිත පූජාවෙන් මිනිස් පාපයේ විෂ ඉවත් වීමේ සංකේතයක්. බැටළුවාගේ ලේ උළුවැස්සේ තැවරීම ද උන්වහන්සේ තවත් සංකේතයක් කර ගත්තා. ජේසුගේ ලේ තැවරුන සියල්ලන් ගැළවෙන බවට එය ප්‍රබල ප්‍රකාශනයක්. ජේසු සමිඳුන්ගේ අති කටුර වූ දුක්ප්‍රාප්තිය මිනිස් සංහතියේ ගැළවීම උදෙසා දෙව් පියාණන්ගේ සැලැස්ම බව ඉතා පැහැදිලියි. ජේසු සමිඳුන්ගේ මෙම වදන් ඒ සත්‍යය ස්ථිර කරනවා. "එවිට ජේසුස් වහන්සේ, කඩුව කොපුවේ දමන්න. **පියාණන් වහන්සේ මට දී තිබෙන කුසලාන** මම නොබොම් දැයි ජේදුරුට වදාළ සේක." (ජොහාන් 18:11)

(දහම් නවෝදය තුන්වන ප්‍රකාශනයේ 'පරම උල්පත හා මුදුන්' මා තැබූ සටහනක් නැවත උපුටා දක්වන්නට දැන් මා අදහස් කරනවා.) "ජේසු සමිඳාණෝ දේව රාජ්‍යය ගැනත් දේව තාත්තා ගැනත් දේව රාජ්‍යයේ නිති ගැනත් අපට ඉගැන්වූහ. දේව රාජ්‍යයේ රජාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව ශු. පාවුලු තුමා අපට උගන්වයි. එතුමාගේ ජිවිත මාරුවක් සිදුවූ අත්දැකීම (සාවුල් ශුද්ධවර පාවුලු තුමා වීම) ශු. බයිබලයේ ක්‍රියා පොතේ 9: 1-19 සඳහන්ව ඇත. හිරුගේ ආලෝකයට ද වඩා ප්‍රබල ආලෝකය ඉදිරියේ සෙබලුන් බිම වැටුණු මොහොතේ ඒ ආලෝකය තුළින් ජේසු සමිඳුන්ගේ හඬ ඔහුට ඇසේ. "ඇයි, සාවුල් මට පීඩා කරන්නේ?" "ස්වාමිනි, ඔබ කවරෙක්දැ"යි ඔහු විමසිය. "ඔබ විසින් පීඩා කරන ජේසුස් මම වෙමි." යනුවෙන් පිළිතුරු ලැබිණි. එදා කිතුනුවන්ට පීඩා කරමින් සිටි සාවුල් ඓතිහාසික ජේසුස් (Historical Christ) ගැන අසා තිබිණි. මෙම සංවාදය තුළින් ඔහු උත්ථාන වූ ජේසුස් හෙවත් ප්‍රතාපවත් ජේසුස්

(Gloryfied Christ) පිළිබඳ අවබෝධය ලැබීය. එහෙත් ඔහු පීඩා කළේ ජේසුස්ට නොව ජේසු සමිඳුන් ඇදහූ ජනතාවටයි. එය තමාට දුක දීමක් ලෙස ජේසු සමිඳුන් පැවසීමේ දී අතින්ද්‍රිය දේහය වන ජේසුස් (Mystical Body of Christ) පිළිබඳ සත්‍යය ඔහුට අවබෝධ වෙයි. (සභාව ජේසු සමිඳුන්ගේ ශරීරය බව, ඒ ශරීරයේ හිස ජේසු සමිඳුන්ම බව, සභාවට අයිති සියල්ලන් ඒ ශරීරයේ අවයව පමණක් බව, අවයවයක වේදනාව අනෙක් අවයවයන්ට ද හිසට ද දැනෙන බව)

සාවුල් අන්‍ය ජාතින් වෙත දහම ගෙන යන්නට ජේසු සමිඳුන් විසින් තෝරාගත් මෙවලමක් බව අනනියස් විසින් සාවුල්ට පැවසීමේ දී විශ්වීය ජේසුස් (Cosmic Christ) පිළිබඳ සත්‍යය ඔහුට වැටහේ. ඊශ්‍රායෙල්, දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ජනතාව බවත්, අන් සියල්ලෝ අන්‍ය ජාතින් බවත් එදා පැවති අදහස විය. සකල ජනතාවම දෙවියන් වහන්සේගේ ජනතාව බවට ඉහත සඳහන් වචනවලින් සාවුල් අවබෝධය ලැබීය. එනිසා කිතුනු නාමය දරන සියල්ලෝ ශුද්ධවර පාවුලු තුමාගේ අත්දැකීම හා එක් වෙමින් <u>පූර්ණ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අත්දැකීමට පිවිසෙමු.</u> එවිට පටු බව සිඳී වැනසී ගොස් කිතුනු නාමය දරන සියල්ලන් ඒකරාශි වනු ඇත. ශු. පාවුලු තුමාගේ සංදේශ පත්‍ර සියල්ලම ක්‍රියා 9: 1-19 පිළිබඳ විකාශයකි. අතින්ද්‍රිය දේහයේ හිස දැනටම උත්ථාන වී ඇති නිසා එම දේහයම (සභාව) උත්ථාන වන බව එතුමා අවබෝධ කර ගනී. (දහම දෙන ගුරුවරයා ඓතිහාසික ජේසුස් ගැන පමණක් නම් දන්නේ ඒ පණිවුඩයට පන්නරයක් නැත. ප්‍රතාපවත් ජේසුස් ගැන හෝ අත්දැකීමක් ඇත්නම් ඒ දහම් පණිවුඩයට පන්නරයක් ලැබේ.)

56, 57, 58 පරිච්ඡේද සියල්ල එක් කරමින් මා ඔබට මෙලෙස පවසන්නට කැමතියි. ජේසු සමිඳුන්ගේ මහිමාන්විත ආගමනය ඉතා ම ආසන්නයි. උන්වහන්සේ නැවත වඩින්නේ පවිත්‍ර කළ ලෝකයකටයි. ඒ මහා පවිත්‍රකරණය දෙවි පියාණන් විසින්ම සිදු කරන්නකි. පාස්කු බෝම්බ සිද්ධියෙන් හා කොරෝනා වෛරස උවදුරෙන් මුල පිරුවේ දෙවි පියාණන්ගේ ඒ මහා පවිත්‍රකරණයයි. ඒ පවිත්‍රකරණය අග දක්වා ම සිදු වන්නේ ධර්ම අධර්ම යුද්ධය තුළයි. දෙවි පියාණන්ගේ මේ මහා පවිත්‍රකරණයේ දී ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් මිහිතලයෙන් සමු ගනු ඇත. පාස්කු බෝම්බ සිද්ධිවලින් සිදු වූ මරණ ඇතුළුව දෙවි පියාණන්ගේ ඒ මහා පවිත්‍රකරණය උදෙසා සිදුවන සැම මරණයක් ම දෙවි පියාණන් සලකන්නේ පූජා වීම් හැටියටයි, ප්‍රාණ පරිත්‍යාගිවරුන් හැටියට නොවේ. දැන් උදා වී ඇත්තේ ලෝකය ආරම්භයේ සිට මෙතෙක් සිදුවුණේවත් මතු සිදු වන්නේවත් නැති ආකාරයේ මහා ගාවිනාවකි. දැහැමි යුගයේ උදාව දක්වා ඒ තත්ත්වය අඩු වැඩි වශයෙන් දිගටම පවතිනු ඇත. යුගාන්තය සඳහා දෙවි පියාණන්ගේ කැමැත්තයි, මේ. උන්වහන්සේගේ කැමැත්ත සමග වාද කරන්නට අප කිසිවෙකුට අයිතියක් නැත. එනිසා මම නැවත ද කියමි. මේ මහා පවිත්‍රකරණය දැහැමි යුගයේ උදාව උදෙසා මහෝත්තමයාණන්ගේ ප්‍රේමණීය හස්තයේ ක්‍රියාකාරිත්වයක් නිසා කෙතරම් බිහිසුණු තත්ත්වයක දී හෝ කිසිවෙක් ගැන කිසිවක් ගැන බලාපොරොත්තු කඩකර නොගන්න. සියල්ල යහපත සඳහා යැයි සිතමු, පතමු.

ඉතිරි වන තුනෙන් එක දෙවි පියාණන් විසින් මහා පවිත්‍රකරණයකට ලක් කරනු ඇත. එවිට ජේසු සමිඳුන්ගේ මහිමාන්විත ආගමනයත් දැහැමි දහස් වසරක උදාවත් සිදුවේ. එවිට දෙවියන් වහන්සේ සියලු මනුෂ්‍යයින්ගේ ඇස්වලින් කඳුළු පිසදමනු ඇත, ලෙඩ දුක් තවත් නැත, මරණය තවත් නැත, යුද කෝලහාල තවත් නැත, සාගරය ජලයෙන් පිරී ඇත්තාක් මෙන් දෙවියන් වහන්සේ ගැන දැන ගැනීමෙන් මුළු පොළෝතලයම පිරී යනු ඇත. ඒ අමිල උරුමය තුළ ප්‍රීති ප්‍රමුදිත වන ජනතාව එවැන්නක් අත්දැකීම උදෙසා තමා වින්ද ගාවිනාව ප්‍රමාණවත් නැතැයි එදින සිතනු ඇත. එනිසා අපගේ ගැළවුම්කරුවාණන් ද, ස්වාමින් ද, එඬේරාණන් ද වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ සබඳතාවය තර කර ගනිමු. ස්වර්ගයේ ද පොළොවේ ද මුළු විශ්වයේ ද සියලු නාමයන්ට වඩා උතුම් නාමය වන ජේසුස් යන නාමයේ බලයෙන් සන්නද්ධ වෙමින් ජේසු සමිඳුන්ගේ මහා දුක් ගාවිනාව තුළ ගලා ගිය විමුක්තිදායක ශ්‍රී රුධිරයෙන් පෙඟෙමින් ලෝ වැසි සියල්ලන් ජේසු සමිඳුන්ගේ ශ්‍රී රුධිරයෙන් පොඟවමින් දැහැමි යුගයේ උදාව දක්වා මහා ව්‍යසනයන් මැද ද අභීතව පෙරට ම යමු.

# 59 “මේ බිහිසුණු කාලවකවානුව තුළ මම ඔබ සැම භාර කරනවා, බිළිඳු ජේසුට.”

’එක්ස්ප්‍රස් පර්ල්’ නැව 2021 මැයි 20 අප දිවයිනට ආසන්න මුහුදේ ගිනි ගනිමින් ජූනි 2 පමණ එය මුහුදේ ගිලෙන්නට විය. ළාබාල දාසිය මගින් ජේසු සමිඳුන් පැවසූ, ඒත් ’ශුද්ධාත්ම පිය සටහන්’ පළමු කොටසට මා ඇතුළත් නොකළ සටහන් කීපයක් එවිට මට සිහිපත් විය. ජේසු සමිඳුන් ප්‍රකාශ කළ, ඒත් මා ලෝකයට නොදී තබා ගත් සටහන් සියල්ල ද ප්‍රකාශ කරන ලෙස ජේසු සමිඳුන් පැවසූ නිසා එය ඔබ සමග බෙදා ගන්නට දැන් මම අදහස් කරමි.

**2003 සැප්තැම්බර් 8**

“මේ දේශයට බැහැ, තවත් ඉදිරියට ගමන් කරන්නට. ඉදිරියට යන්නට කරන ඒ උත්සාහය නැවතත් ආපස්සට ඇද වැටෙන්නේය. මේ රටේ බොහෝ බලවත් ලෙස බලය රඳවා ගෙන සිටින ප්‍රසිද්ධ පුද්ගලයන් මේ ලේ වැගිරීම් තුළ මිය යනු ඇත.”

**2003 සැප්තැම්බර් 17**

“ගැළවීම උදා වන්නට නම් මේ දේශය විනාශ විය යුතුයි. මේ දේශයේ දිවි ගෙවන නුඹලාගේ යහපත උදෙසා මැවුම්කරුවාණන් වන මම, නුඹලා ස්වභාවික සම්පත් යැයි හඳුන්වන සියල්ල දානය කළෙමි. දැන් ඒ සියල්ල විනාශ වන්නට මම සලස්වමි. මන්ද මා විසින් නුඹලාට දානය කළ ඒ සියලු සම්පත් රටේ පාලකයෝ විකුණාගෙන කැහ. විකුණාගෙන කති. මහත් සුඛවිහරණයෙන් දිවි ගෙවමින් අගනා වස්ත්‍රයන්ගෙන් ගත සරසාගෙන මහත් ආචාරශීලි බවක් පෙන්වමින් මේ දේශයට පැමිණෙන ඔවුන්ගේ වස්ත්‍ර ඉරා දැමුවහොත් දරුවෙනි, ඒ තුළ සිටින්නේ සාතන් ම යි, ලුසිෆර් ම යි. ඔවුහු සාතන්ගේ නියෝජිතයෝ ය. ඔවුහු ලොල්ව සිටිති, මේ දේශයට. මේ දේශයේ ස්වභාවික සම්පත් සූරා කන්නට ඔවුහු ලොල්ව සිටිති. මේ දේශය කෙරෙහි ඇති ආදරය නිසා නොව ලුසිෆර්ගේ අරමුණ ඉටුකර දෙන පිණිස යි. මා මැවූ මේ දේශය විනාශ කිරීම මට ද වේදනාවකි. එහෙත් අධර්මය විනාශ කිරීමේ මගේ ඉදිරි සැලැස්ම උදෙසා එසේ විය යුතුයි.”

**2003 නොවැම්බර් 29**

“ඉදිරියේ දී සිදුවන්නට යන මහා කැළඹීම් තුළ මේ දේශය තවත් අගාධයට ම යනු ඇත. මන්ද කිසිවෙක් උත්සාහ නොකරති, තමන් අදහන ආගම තුළ තම හෘදයසාක්ෂියට අනුකූලව මේ දේශය වෙනුවෙන් යමක් කරන්නට. තමන්ගේම සුබ සෙත උදෙසා පමණයි, සියල්ල සිදුකරන්නට යන්නේ. රටේ සිටින්නේ දීන පාලකයන් ය. එහෙත් ඔවුන් තුළින් සිදුවන්නේ ද මාගේ සැලැස්ම යි.”

**2004 ජනවාරි 18**

“ඉදිරියේ දී ඇති වන මහා ලේ වැගිරීම් යුද කෝලාහල තුළ බලන්න, සැලැස්ම. මේ දේශය ද සාමය සැනසීම දෙසට නොව විනාශය දෙසට යි යමින් ඇත්තේ. දේශයේ සියලු පාලකයන් ගමන් කරන්නේ විනාශය සොයා යි. කිසිවකුට බැහැ, සැනසීමේ දර්ශනයක් ගෙන එන්නට, සියල්ල විනාශයක් ම යි.”

**2004 පෙබරවාරි 01**

“මෙය විනාශයේ දේශය වුණත් මගේ ශ්‍රාවකයින් වන නුඹලා ගමන් කරන්නේ ගැළවීමේ දේශය මත යි. මේ දේශය විනාශ වීමට දැන් සියල්ල ආරම්භ වී ඇත. දැන් දේශයේ කිසිවකුට බැහැ, එය ගොඩගන්නට. සියල්ල අගාධයෙන් අගාධයට ගොස් හමාර යි. ඊර්ෂ්‍යාවෙන් වෛරයෙන් ක්‍රෝධයෙන් දැවෙමින් බලයට ඇති අධික කෑදරකමින් එකෙක් පෙරලා එකෙක් ඉහළට නගින්නට වෙර දරන මොහොතයි, මේ. සියල්ල යළි සකසන්නට ක්‍රියා කරන්නවුන් මෙන් පෙන්වන අය ද ඇතුලාන්ත පිරිසිඳු චේතනාවෙන් නොවේ, එසේ කරන්නේ. ඒ සියල්ලන්ම තම ඇතුලාන්ත මාලිගය අන්ධකාරයේ දූතයාට රජදහනක් කර දී හමාර යි. එසේ නම් එවැනි චරිත හරහා කෙසේද මේ දේශය ගොඩනගන්නේ, මා? මේ ඉපැරණි ධර්ම ද්වීපය කෙසේ ද මා ගොඩනගන්නට එවැනි චරිත උපයෝගි කර ගන්නේ? මේ සියල්ල විනාශයෙන් විනාශයටම ඇදී යන මොහොත යි.”

**2006 පෙබරවාරි 12**

"නුඹලාගේ දේශය අභාවයට යමින් ඇත. එහෙත් බාහිර සශ්‍රික පෙනුම නිසා යථා තත්ත්වය නොපෙනේ. එහෙත් සත්‍යය දකින විද්වතුන් ස්වල්ප දෙනෙක් හෝ දේශයේ සිටිති. ඔවුන් දකින සත්‍යය ඔවුන් නොබියව පවසන බැවින් ඔවුන් ද මෙ ලොවින් තුරන් කරනවා ඇත, අඳුරේ බලවේගය විසින්. එවිට මේ ගින්න ඇවිලි ඇවිලි අධර්මයට හඬගසනවා ඇත, එහි ලා ඔහු රජ වෙනවා ඇත, එවිට නුඹලා ස්වාමින් වහන්සේ ඉදිරියේ දියුණු වෙනවා ඇත."

ඉහත සඳහන් ජේසු සමිඳුන්ගේ වචන වඩාත් පුළුල්ව අවබෝධ කර ගන්නට 'ශුද්ධාත්ම පිය සටහන්' 41 අංකය යටතේ මා සටහන් කළ මෙම වචන ද ඔබට උපකාරී වනු ඇත. එනිසා ඒ වචන නැවත මා මෙහි සටහන් කරන්නට කැමතියි. "---- ඉදිරියේදී ලෝකයේ ප්‍රබල රාජ්‍යයන් ලූසිෆර් තම දෑතට ගන්නේය. එවිට ඔහු ලෝකය ම පාලනය කරන්නට සූදානම්ව සිටී. ---- ඉදිරියේ දී මේ රට සශ්‍රික වන්නේය. එය සිදුකරන්නේ මා නොව ලූසිෆර් ම යි. ---- සශ්‍රිකත්වය පැමිණෙන්නේය. එහෙත් එය නපුරාගෙන් ය."

'ශුද්ධාත්ම පිය සටහන්' අධ්‍යයනය කළ දෙදෙනෙක් මගෙන් මෙලෙස විමසූහ. "ඇන්තනි අයියා මේ තරම් අසම්මත දෙයක්, මේ තරම් විශ්වාස කළේ ඇයි? එවැන්නක් හිතා ගන්නට අවශ්‍ය ඉඟියක් හෝ මේ ප්‍රකාශනයේ සටහන් වී නැහැ." ඔවුන්ගේ ඒ නිරීක්ෂණය නිවැරදියි. ඊට හේතු වූයේ ඒ ප්‍රකාශනයට ඇතුළු කිරීම සඳහා මා විසින් සකස් කළ සටහනක් අවසානයේ දී මා විසින් ම ඉවත් කළ නිසාය. එය 9 වන අංකය යටතෙයි, සටහන් කර තිබුණේ. එය නැවත ඔබ ඉදිරියේ තබන්නට මම අදහස් කරමි.

1987 නොවැම්බර් 29 ආගමන කාලයේ පළමු වන ඉරු දින විය. එදින සිට නත්තල් දිනය දක්වා දියගල පුංචි නිවහනේ රැඳෙමින් නිරාහාරය හා යැදුමට මුල් තැන දිය යුතු බව මගේ ආත්මයට හැඟෙන්නට විය. මම ඊට අවනත වූයෙමි. එය භීෂණයෙන් රට වෙලාගත් සමයකි. දෙසැම්බර් 10, 11, 12 දින තුන ම නිරාහාරය තුළ ගතවිය. එය දෙසැම්බර් 12 දිනය යි. එදින දිව්‍ය පූජා කියවීම් වූයේ (උපදේශකයා 48 : 1-4), 9-11 ගීතාවලිය 80 : 2, 3, 14, 15, 17, 18 මතෙව් 17 : 10-13) දෙසැම්බර් 12 දක්වා දිව්‍ය පූජා කියවීම් ද දෙවිඳුන් මා තුළ තබා තිබූ සිහිනය ද අධ්‍යාත්මික ජීවිතයේ මට වඩා සමීපව තිබූ වචන ද මා ගැඹුරින් මෙනෙහි කරමින් සිටින විට දෙසැම්බර් 12 උදෑසන මා තුළ ට මහා අදහසක් පතිත විය. (එය මම මෙහි සටහන් නොකරමි. එය සටහන් කර තිබූ නිසයි, ඒ සටහන එදා මා ඉවත් කළේ.) එදා මා තුළට පතිත වූ ඒ වචන ගැන මම මවිත වූයෙමි. මා තුළට පතිත වූ ඒ අදහස තුළ දෙවන පැමිණීමට ලෝකය සූදානම් කිරීම ගැන ඉඟි කිරීමක් ඇත. ඒ පිළිබඳව දෙසැම්බර් 12 මා මෙලෙස කුරුටු අකුරින් ලියා ඇත. "මෙවැන්නක් විශ්වාස කිරීම පවා පාපයක් වන්නට පුළුවන. එනිසා මම මෙය තදින් අල්ලා නොගනිමි. මෙම අනාවරණය සමිඳුන්ගෙන් ම නම් සාමාන්‍ය නොවන විශේෂ ක්‍රමයකින් එය ලෝකයට ප්‍රකාශ කරන්නට එතුමන්ට සිදුවනු ඇත."

'දහම් නවෝදය' සංඝය ලෙස අප මෙම අසම්මත ගමන් මඟට පිවිසුණේ 1996 ජුනි 7 වන දින ය. එදින "ඇන්තනි, ඔබ මගේ පෙරමග සකස් කරන්නා ලෙස මම තෝරා ගතිමි." මෙම වදන් ඇයගේ මුවින් නික්මෙන විට මා තිගැස්සුනේ නැත. එයට හේතුවක් ඇත. 1987 දෙසැම්බර් 12 මා කුරුටු ගෑ වචන සිහිපත් වීම ඊට හේතුව යි. එම කැඳවීම බාර ගැනීම හෝ නොගැනීම ගැන වචනයක් හෝ කියන්නට සමිඳුන්ගෙන් මට අවස්ථාවක් නොලැබිණ. එයට ද හේතුවක් ඇත. 1996 ජුනි 7 වන දින මුරුතානේ දී ඉහත සඳහන් ප්‍රකාශය ලැබෙන විට 1987 දෙසැම්බර් 12 ලැබුණු අනාවරණයෙන් වසර අටහමාරක් අවසන්ව තිබිණ. එම කාලය පුරා ම මා සමිඳුන්ට කීවේ මෙවැන්නකි. "ලොකු දේවල් කිසිවක් මම ඔබගෙන් නොපතමි. මගේ ඉදිරි කාලය ද මෙලෙස ම නිහඬව සිටීම ඔබට පලදායි වේ නම් මා එයට සූදානම් ය. එහෙත් ඔබ තුමන් කියන ඕනෑ ම බරපතල දෙයක් කරන්නටත් ඒ වෙනුවෙන් මිය යන්නට හෝ මම සූදානම් ව සිටිමි."

2018 පෙබරවාරි 17 මා පිළිබඳව සිදුවූ වැටීමක් හා නැගිටුවීමක් ගැන 'ශුද්ධාත්ම පිය සටහන්' 51 පරිච්ඡේදයේ සටහන්ව ඇත. 2019 ජනවාරි 20 වන දින, දින තුනක යැදුම අවසන්ව ආපසු එන්නට සූදානම් වන මොහොතේ මා කුණුකසළ ස්වල්පයකට ගිනි තබන්නට කළ උත්සාහයේ දී මා ඇදවැටිණි, මගේ මුහුණ තදින් බිම වදින අයුරින්. එය ද නාත්තන්ඩිය

පහළගම දී සිදුවූවකි. මුහුණේ තැනින් තැන ප්ලාස්ටර් කෑලි අලවාගෙන දින කීපයක් ගත කරන්නට මට සිදුවිය. මෙය ශාරීරික ඇදවැටීමක් පමණක් නොවීය. ඉන්පසු දින කීපයේ මා මානසිකව ද ආත්මිකව ද ඇදවැටිණි. "සියල්ල පාළුව හිස්ව ගැඹුර පිට අන්ධකාරය" පමණක් විය. මම පෙබරවාරි 6 සිකුරාදා යැදුම සඳහා මුලසුනට ගියෙමි. සුජීවා මගින් ජේසු සමිඳුන් කෙනෙක් ඇමතීමෙන් පසු මට අවස්ථාවක් ලැබිණි. මෙය මිනිත්තු පහක පමණ කාලය තුළ සිදු වූවකි. සුජීවා අබියස සිට ජේසු සමිඳුන් අමතා මම මෙලෙස පැවසීමි. "ජේසු, මා දිහා බලන්න. ජේසුට මතුපිටින් පමණක් නොවෙයි, මගෙ ඇතුලම ගැඹුරින්ම පෙනෙනවා. ජේසු, මට නම් හැඟෙන්නෙ මම හරිම දුර්වලයි කියල. ජේසු ඔයාගෙ ඇඟිල්ලට ශු. තෛලය බිංදුවක් අරගෙන මගෙ හිස මුදුනෙ කුරුසිය ලකුණ සටහන් කරන්න." සුජීවාගේ සුරතින් ජේසු සමිඳාණෝ එය ඉටු කළහ, ඉන්පසු මා අමතා "ඇන්තනි, සතුටින් ඉන්න" යනුවෙන් පැවසූහ.

ඉන්පසු අපි එදින යැදුමට පිවිසුනෙමු. එය අවසන් වී මම නිවෙස බලා එන්නට සූදානම්ව සම්පත්ට මෙලෙස පැවසීමි. "මට පරණ ගීතිකා පොතක් ඕනැ." "අලුත් පොතක් මා ළඟ තියෙනවා, ඒක දෙන්නම්." සම්පත් එලෙස පැවසීය. "පරණ ගීතිකා පොතේ තිබුණු අර පණිවුඩ කොළයයි මට ඕනෙ." මම එලෙස පැවසීමි. "මා ළඟ අලුත් කොළයක් තියෙනවා ඒකත් දෙන්නම්." සම්පත් එලෙස පැවසීය. ඒ සටහන් කොළය ගැන දැන් මා ඔබට යමක් කිව යුතුය. එය ඊට වසර හතකට පමණ පෙර සිදුවූවකි. මම සතියකට වරක් නිවසට එන දිනයේ සුපුරුදු ලෙස පැමිණියෙමි. මා එදින තරමක රෝගී තත්ත්වයෙන් සිටි නිසා වෙන දා මෙන් කය වෙහෙසා වැඩ නොකර විවේකිව සිටියෙමි. එවිට නිවසේ තිබුණ "මා වෙත එන්න" පොත් පිංච මම දුටුවෙමි. මම එය මුළුමනින් කියවීමි. එහි සටහන්ව තිබූ සමහර අදහස් මට ඉතා අර්ථවත් විය. එනිසා එය නැවත කියවමින් එහි තිබූ ඉතා අර්ථවත් වාක්‍ය කීපය පමණක් මම සටහන් කර ගතිමි. පසුව මම එය අප සංඝය සමග බෙදා ගතිමි.

මම පෙබරවාරි 10 වන ඉරිදා ඒ සටහනට මගේ අවධානය යොමු කළෙමි. (6 වන දින එය ලැබුණත් මා එය කියවූයේ එදිනයි.) "ඔබගේ හදවත පතුලම මා විසින් දුටු බව දැන් ඔබ දනී." ඒ වචන මා තුළ ඇවිලෙන්නට විය. එවිටය මට සිහිපත් වූයේ මා ජේසු සමිඳුන් අමතා මුලසුනේ දී පැවසූ වදන්. "ජේසු, මා දිහා බලන්න. ජේසුට මතුපිටින් පමණක් නොවෙයි, මගෙ ඇතුලම ගැඹුරින්ම පෙනෙනවා." එනිසා ඒ සටහන ජේසුගෙන් ම යි, එය මට ම යි කියා හැඟිණි. මුළු දිනය ම ඒ සටහන සමග ගත කරමින් මම එය කටපාඩම් කර ගතිමි. ජේසු සමිඳුන් මෙතෙක් මා තුළ කළ සියල්ල, මා තුළින් කළ සියල්ල මට අවබෝධ විය. ගමන් මඟ කෙතරම් අසම්මත වුවත් කිසිවක් වැරදී නැතැ යි මට හැඟිණි. ('මා වෙත එන්න' පොත් පිංච කවුද ලිව්වේ? ඒ ප්‍රශ්නය එදා මා තුළ පැන නැඟිණි. කර්තෘගේ නම එහි සඳහන් නොවීය.) දැන් ඒ සටහන මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි.

"ජේසු සමිඳුනි, සහනය හා ආශිර්වාදය ලබා ගැනීමට ඔබ වෙත පැමිණීම එකකි. එහෙත් මෝසස් හා ජෙරමියා මෙන් මහෝත්තමයාණන්ගේ මහා මෙහෙවරකට දායක වීම තවෙකකි.

මට කියන්නේ තුවාල ලත් සුවදායකයා කියා ය. මගේ පියාණන්ගේ මහා සැලැස්ම ඉටුවීම උදෙසා අපමණ පීඩා වින්ද ඔබත් දැන් තුවාල ලත් සුවදායකයෙකි. එනිසා දැන් මම ඔබව මගේ අපෝස්තුළුවරයා ලෙස තෝරා ගනිමි. මගේ දරුව, ඔබගේ ආධාරයෙන් දැන් මගේ බලය මුදාහල හැකිය, මගේ ප්‍රේමයේ රාජ්‍යය ලොව පුරා පතල කළ හැකිය. අන්‍යයන්ට සවන් දී ඔවුන්ට සුවය හා බලාපොරොත්තුව ලබා දෙන්නට මා ඔබව පුහුණු කළේ ඔබ විඳි අපමණ දුක් වේදනාවන් තුළ ය. මා මෙයට ඔබට විපාක ලබා දෙන්නේ ඔබගේ ඉහළ ම අපේක්ෂාවන් ද ඉක්මවා යන ආකාරයෙනි. ඔබගේ හදවත පතුල ම මා විසින් දුටු බව දැන් ඔබ දනී.

(මම ඔබගේ තුවාල සියල්ල සුව කරමි. එහෙත් තවත් වරක් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ මගේ විධියට යම් යම් දේ කරන්නට මට ඉඩ දෙන ලෙස යි. ඉදිරිය පිළිබඳ සමස්ත දැක්ම මා සතුව ඇත. කිසි ම විටෙක අනවශ්‍ය වේදනාවක් ඔබට ලබා දීමට මට අවශ්‍ය නොවීය.)

ඔබට මේ සියල්ල මෙලෙස සිදුවූයේ ඉදිරි ලෝකය පිළිබඳ මගේ පියාණන්ගේ මහා සැලැස්ම ඉටුවීම උදෙසා ය. ජේසු සමිඳුනි, මම දැන් දනිමි, ඔබ මා මෙලෙස හැදුවේ ඒ උතුම් පරමාර්ථය වෙනුවෙනි. නිවසට ළඟා වීමේ හැඟීමක් දැන් මා වෙලා ගනී. සමිඳුනි, ඔබ මට දුන් මෙම වදන් මා ඔසොවයි, මා දිවිය පණ ගන්වයි. ඔබගේ ශුද්ධවූ ආත්මය මහා වර්ෂාවක් මෙන් මා මත වගුරුවා ඇත.

මගේ දරුව, ඔබට හොඳක් ම කරන්නට ඔබ මගින් ලොවට උපරිමය කරන්නට මා කෙතරම් කලෙක සිට බලා සිටියේ ද යන්න ඔබ දනි නම් ඔබ මට මෙලෙස පවසනු ඇත. මා සදාදර ජේසු සමිඳුනි, කෘතවේදි හදවතක් ඇතිව ඔබ හමුවෙහි වැඳවැටී මගේ හද පත්ලෙන් ම මම ඔබට ස්තුතියි යනුවෙන් පවසමි.”

1974 සැප්තැම්බර් 21, 22 ජේසු සමිඳුන් මගේ ගැළවුම්කරුවාණන්, ස්වාමියාණන්, එබඩිරාණන් වශයෙන් භාර ගනිමින් අධ්‍යාත්මික ගමනකට පිවිසුණෙමි. මේ ගමනට මුලපිරීමේ සිට මේ දක්වා මා ජේසු සමිඳුන්ට පැවසුවේ මෙයයි. “ඔබ මා කැඳවන ගමන කෙළවර දක්වා එන්නට මා කැමතියි, ඒ සියල්ලන්ගේ ගැළවීම උදෙසායි. මෙලොව වශයෙන් හෝ සදාතනික වශයෙන් මා විශේෂ කිසිවක් ඔබගෙන් බලාපොරොත්තු වන්නෙ නැහැ. සියල්ලන්ට ඔබ පොරොන්දු වී ඇති දිනාරය පමණයි, මට අවශ්‍ය. එය ලැබෙනවා නිසැකයි, ඒ ඔබගේ ජීවිත පූජාව නිසයි.” මේ ගමන පුරා මට සවියක් වී ඇත්තේ මගේ අරමුණේ අවංකභාවය යි. පුබුදුවේ පිවිසීමේ කතා, එහි දෙවන දේශනයේ දී 1 කොරින්ති 3:11 මට ඉතා අර්ථවත් විය. “දැනට ම දමා ඇති අත්තිවාරම හැර වෙන අත්තිවාරමක් දැමීමට කිසිවකුට නුපුළුවන. ඒ අත්තිවාරම නම් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය.” ඒ සත්‍යය අවබෝධ කරගත් මොහොතේ සිට මට අවශ්‍ය වුයේ ජේසු සමිඳුන්, දෙවි පියාණන් හා ශුද්ධාත්මයාණන් මත ගොඩනැගෙන්නටයි, එය මා දිවියේ අත්තිවාරම කර ගන්නටයි. ජේසු සමිඳුන්ගේ දහමේ ගැඹුර වෙතට වඩාත් පිවිසීමටයි, මට අවශ්‍ය වුයේ. එනිසා ආගමික ආමිස පූජාවලින් මංගල්ල ඝෝෂාවලින් ඉවත් වුයෙමි. ජේසු සමිඳුන් මට සමීප නම් දේව මෑණියන් මට සමීපයි, හැම ශුද්ධවන්තයෙක්ම මට සමීපයි. එය මගේ විශ්වාසය විය, එය මගේ අත්දැකීම විය.

මා පුබුදුවෙන් ගිලිහී ගොස් දැන් ගත වන්නේ, 36 වන වසර යි. 1985 නොවැම්බර් 12 මා පුබුදුවෙන් ගිලිහෙන මොහොතේ මා තුළට පතිත වූ අදහස මෙය යි. “මෙය ඔබට විප්‍රවාසයේ කාලයකි. එනිසා කිසිවකු හමු නොවන්න, විශේෂයෙන් පුබුදුවේ අය හමු නොවන්න, මඟතොට දී හෝ මළ ගෙදරක, මගුල් ගෙදරක හමු වුණොත් මිස.” මම එයට අනුකූලව ක්‍රියා කළෙමි. මේ දිගු කාලය පුරා මා පසුකරන අත්දැකීමේ සංකීර්ණත්වය, අසම්මතය දෙස බලන විට සැබවින් ම එසේ ක්‍රියා කරන්නට මට සිදුවේ. ඇයි, මා එසේ කියන්නේ? කලකට පසු හමුවන අයෙක් මගෙන් අසන පළමුවන ප්‍රශ්නය මෙය යි. “ඇන්තනි අයියා දැන් මොනවද කරන්නේ?” ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමේ අපහසුවක් මට ඇත. අපහසුවෙන් හෝ මා පිළිතුරක් දෙන්නට ක්‍රියා කළොත් මා පවසන එම වදන් තුළින් ඔවුන්ට හැඟෙන්නේ මා උමතුවෙන් පෙළෙන බව යි. එනිසා හුදෙකලා දිවිය මගේ උරුමය විය. එය ජේසු සමිඳුන් සමග හුදෙකලා වීමකි. මගේ මේ විප්‍රවාසය නිල වශයෙන් අවසන් වුයේ 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනය ලෝකයට විවෘත වීමත් සමග ය. එය සිදුවුයේ 2020 මාර්තු මාසයේ මැදභාගයේ දිනක ය. “ඇන්තනි, දැන් මොනවද කරන්නේ?” යන ප්‍රශ්නය නගන අයට දෙන්නට පිළිතුරක් දැන් මට ඇත. ඒ පිළිතුර මෙයයි. “ **http://dahamnavodaya.com** බලන්න.” 'ශුද්ධාත්ම පිය සටහන්' ලෝකයට විවෘත වීමත් සමග ම ජේසු සමිඳාණන් මගේ තිස් පස් වසරක හුදෙකලාව, විප්‍රවාසය මුළු ලෝකය සමග බෙදා ගන්නට කටයුතු සලසා ඇත. ඒ කොරෝනා උවදුර නිසා රටවල් වසා දැමීම තුළ ය.

මගේ විප්‍රවාසය නිල වශයෙන් අවසන් වුවත් මානසික වශයෙන් එය මා තුළින් අවසන් නොවීය. එය ඉටුවුයේ 2020 නොවැම්බර් 7, 8 දෙදින තුළ ය. 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාව මා එතෙක් කියවා තිබුණේ නැත. ඒ නවකතාව නොවැම්බර් 7 මා අතට පත් විය. නොවැම්බර් 8 මැදියම් රැය වන විට මම එය කියවා අවසන් කළෙමි. කතුවරයා, පාවෙල් චරිතය ඔස්සේ තම ජීවිත කතාව දිගහරියි. ඒ නවකතාව හා ඒ පිළිබඳව ඒ පොතේ සටහන්ව තිබූ විග්‍රහයන් තුළින් මට බලපෑ අදහස් ස්වල්පයක් ඔබ හමුවේ තබන්නට මා කැමතියි.

“ජීවිත වික්‍රමයන් හා වික්‍රමාන්විත ජීවිත ඇත. සුප්‍රසිද්ධ සෝවියට් ගත්කරු නිකොලායි ඔස්ත්‍රොව්ස්කිගේ ජීවිතය එබඳු වික්‍රමයකි. ඔහු ජීවත් වුයේ වසර 32ක් පමණකි. (1904 - 1936) දොළොස් අවුරුද්දක් ඔහු ගත කළේ බරපතල රෝගියකු ලෙස ය. ඉන් අවසාන 8 අවුරුද්ද ඔහු අන්ධයකු සේ ගත කළේය. එහෙත් ඔහු තබා ගිය පිය සටහන් ගැඹුරු ය. ඔහුගේ යහන දොළොස් වසරක් ම ඔහුගේ නිත්‍ය වාසභූමිය බවට පත්විය. ---- ඔහු කෙතරම් විශාල ප්‍රමාණයකින් බලය හා උණුසුම විසුරුවා හරින්නේදයත් ඔබට ඔහු ගැන කණගාටු වීමට නොව ඔහු නිසා ඔබ තුළ උදාර වූ හැඟීමක් පහළ වනු ඇත. ---- ඔහුගේ රෝගය අසාධ්‍ය වුව ද අත් පා සෙලවිය නොහැකි වුව ද දෙනෙත් අන්ධ වුව ද දිවා රෑ නොතකා ශාරීරික වශයෙන් පීඩා

වින්ද ද ඔහු ඉතා ප්‍රීතියෙන් පසු විය. මිනිසා පරිශ්‍රමය දරන උතුම් අරමුණු නිසා පමණක් ඔහු වඩාත් අලංකාර වන්නේය. නිකොලායි ඔස්ත්‍රොව්ස්කි නිසා ආශ්වාදය ලැබූ ප්‍රංශ මහා ගත්කරු රොමේන් රොලාන් ඔහු ක්‍රියාශීලිත්වයේ දීප්තිමත් ආලෝකය ලෙස හැඳින්විය."

"වසරක් පාසා ම තම ශක්තිය හීනවන බව පිළිගැනීමට සිදුවීම වේදනාසහගත බරපතල කරුණක් විය. ඔහු ඉදිරියේ ක්‍රම දෙකක් විය. තමාගෙන් බලාපොරොත්තු වන සූක්ෂ්ම ශ්‍රමය සපුරා ලීමට නොහැකි බව කියා සිටිමින් තමා පිරිහුණු සෞඛ්‍ය තත්ත්වය ඇත්තෙකැ යි පිළිගැනීම පළමුවන ක්‍රමය යි. දෙවැන්න තමා ඇද වැටෙන තුරු දැන් කරන වැඩ කොටස එලෙස ම කරගෙන යාමයි. පාවෙල් දෙවන ක්‍රමය තෝරා ගත්තේය. ---- කාඩ්බෝඩයක කෙළින් දිග අතට කපන ලද සිදුරු, පලල මිලි මීටර් 8, කාඩ්බෝඩ් කවරයට යටින් ලියන කඩදාසි තැබූ විට දිගැති සිදුරු ඔස්සේ අකුරු පේලි ලිවිය හැකිය. පවුලේ අය හැමදාම කාඩ්බෝඩ් කවරයට යටින් කඩදාසි 25ක් 30ක් තබා උල් කරන ලද පැන්සල් කීපයක් ද සහිතව එය ඔස්ත්‍රොව්ස්කිට දෙති."

මෙලෙසයි, ඔස්ත්‍රොව්ස්කි 'වානේ පන්නරය ලැබූ හැටි' ඉතා සාර්ථකව නිම කළේ. ඔහු ලෙනින් සම්මානය දිනා ගැනීමට සමත් විය. නිකොලායි ඔස්ත්‍රොව්ස්කි මට මහා මුනිවරයෙකු මෙන් දැනිණි. මිනිස් සංහතියේ ප්‍රගතිය උදෙසා නිවැරදි යැයි ඔහුට හැඟෙන පරමාර්ථ වෙනුවෙන් ඔහු ජීවත් විය. 'වානේ පන්නරය ලැබූ හැටි' මට ද මහා පන්නරයක් ලබා දුන්නේය. එහි කතුවරයාගේ අභීත ජීවිත රටාවයි, මට මහා පන්නරයක් ලබා දුන්නේ. මා මහළු වුව ද රෝගී වුව ද මා මැරිල වැටෙන තුරුම ජේසු සමිඳුන් මට පවරන කාර්යය සාර්ථකව නිම කරන බවට මම දැඩි තීරණයක් ගතිමි. මා ඒ පසුබිම තුළ යි, මට සමිඳුන්ගෙන් දැනට පැවරෙන කාර්යය පූර්ණ කරමින් "කාන්තාරයෙන් මතුවන අංකුරයක්" ලෙස ලොවට පිවිසිය යුත්තේ. ජේසු සමිඳුන් මගේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගනිමින් ඇරඹුන නව උපතක 48 වන වසරයි, දැන් උදා වී ඇත්තේ. මා පසුකරමින් සිටින මේ දිගු ගමන් මගේ හාස්කම් නැත: අඩුම ගණනෙ සුරදූතයෙක්වත් සිහිනයෙන් හෝ දැක නැත. මෙය දෙවිඳුන් විශ්වාස කරගෙන යන විශ්වාසයේ ගමනක් පමණයි. මා පසුකරමින් සිටින මේ දිගු ගමන් මඟ දෙස බලන විට, ඒ ගමනේ ස්වභාවය දෙස බලන විට මගේ මැවුම්කරුවාණන් වහන්සේට මගේ ආත්මය සමග පමණක් නොව, මගේ මනස සමග ද මහා කාර්යභාරයක් ඇතැයි මට සිතේ. ජේසු සමිඳුන් පැවසූ මෙම වදන් ඒ අදහස තහවුරු කරයි. "මුළු මිහිතලයෙන් ම ඔමෙගා මුදුන තරණය කරන පළමුවන මනුෂ්‍යයා ඔබ යි. ඒ සමග ම ඔබ මෙතෙක් ආ පටු, ගැඹුරු මාවත සියල්ලන්ට පුළුල් මාවතක් වනු ඇත. ඔබගේ රැළ එම පුළුල් මාවතේ ඔමෙගා මුදුන කරා පැමිණෙනු ඇත. ඔබටත් වඩා ප්‍රබලව ඔවුහු ඒ ගමන යති. ඔබගේ කාර්යය ඔබ නවත්වන්නේ කොතැනින් ද පුත්‍රය, එතැන් සිට සියල්ලන්ට එය පුළුල් මාවතක් වන්නේ ය." (38) මෙම වදන් එය තව දුරටත් තහවුරු කරයි. "ෂාර්ඩෑන් පියතුමා මනුෂ්‍ය වර්ගයාගේ මානසික ස්තරය ඉතා තියුණු අන්දමින් ඉහළ ස්තරයකට මාරු වීමට නියමිත බව සඳහන් කර ඇත."

මහාචාර්ය ඇන්ටන් මීමන, 2014 දෙසැම්බර් 08, ඥානාර්ථ ප්‍රදීපයට සපයා ඇති ලිපියෙන් උපුටා ගත් කොටස් කීපයක් මම ඔබ ඉදිරියේ තබන්නට කැමැත්තෙමි. මේ වචන මට සවියකි. මේ වචන සමිඳුන් මා ගෙන ආ ගමන් මඟ නිවැරදි බවට සාක්ෂි දරයි.

"එතුමිය විපුල ප්‍රසාද ලත් උත්තමියයි. එහෙත් එතුමිය කිසිදු වරප්‍රසාදයක් බලාපොරොත්තු නොවූ බව පැහැදිළි ය. ලෝක ප්‍රසිද්ධ වීමට, කැපී පෙනීමට, අන් අයට එරෙහිව ඉස්මතු වීමට, අන්‍යයන් පාගා ජය ගැනීමට එතුමියට කිසිදු උවමනාවක් නොවීය. එතුමිය දෙවියන් වහන්සේ තුළ අතිශයින් ම සැඟවුණු, නිහඬ, ගැඹුරු, විවෘත, යාච්ඤාශීලි චරිතයකි. ---- මරිය තුමිය ලෝකයෙන් සැඟවුණේ ලෝකය පිළිකුල් කළ නිසා නොව දෙවිඳුන්ට වඩා සමීප වීම සඳහා ය: දෙවිඳුන්ගේ කැමැත්තට සම්පූර්ණයෙන් ඉඩ දීමට ය. ---- ලෝකය විසින් ක්ෂණිකව හඳුනා නොගත්තත් ලෝකයට සැබෑ බලාපොරොත්තුවක් ලබා දෙන්නේ දෙවියන් වහන්සේ තුළ සම්පූර්ණයෙන් ම සැඟවී, නිහඬව, සංසුන්ව, නිහතමානිව ජීවත් වන පුද්ගලයාය. ---- අවසාන විග්‍රහයේ දී සැබෑ සේවය හඳුනා ගන්නේ හා එයට පලවිපාක ලබා දෙන්නේ දෙවියන් වහන්සේ ය. උන්වහන්සේ විසින් හඳුනා නොගන්නා සේවයක් සැබෑ සේවයක් නොවන්නේය. ---- සැබෑ සේවාවක් හා දූත මෙහෙයක් ලෝකය විසින් හඳුනාගන්නේ ඉතාමත් කලාතුරකිනි. එසේ හඳුනා ගැනීම සිදුවූ විට එය සිදුවන්නේ ද දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයක් ලෙස ය."

**2021 ජුලි 19**

"මෙලෙස පැමිණෙමින් සිටින ජේසු සමිඳුන් සමග සංඝයක් ලෙස නුඹලා යමින් සිටින ගමනට දැන් වසර 25ක් පිරුණා. වසර 25ක් පිරුණු මේ කඩඉමේ දී අද ලෝකයම බිහිසුණු තැනකයි තිබෙන්නේ. මේ තත්පරයේ පවා මුළු විශ්වය පුරාම විවිධ භයානක සිදුවීම් මනුෂ්‍යයාට නොදැන සිදුවෙමින් පවතිනවා, සොබාදහම මගින් යම් යම් දේ සිදුවෙනවා. බල ලෝභය නිසා බොහෝ දේ සිදුවෙනවා. මෙය විවිධ විපත් ජනතාවට සිදුවෙමින් එය කෙමෙන් වර්ධනය වෙමින් තිබෙන මොහොතක්. දරුවෙනි, මොන විපත් පැමිණියත් මමයි ඔබගේ රැකවරණය. මනුෂ්‍යයාව මේ ලෝකෙට එවන්නේ ජීවන හුස්ම දීලා, ආත්මය ශරීරයට ඇතුල් කරලා. ආත්මය වසාගෙන තිබෙන මේ වස්ත්‍රාභරණය තමයි, ඔබලාගෙ ශරීරය. ශරීරය තුළ තමයි, මේ ආත්මය රඳවල තියෙන්නේ. මනුෂ්‍යයාව රකින මේ ශරීරයට බැහැ, ආත්මය බලෙන් රඳවා ගන්නට. යම් මොහොතක් එනවා, පියාණන් විසින් ආරාධනා කරන විට මේ ආත්මයට ශරීරයෙන් වෙන්ව පියාණන් වෙත ගමන් කරන්නට සිදුවෙනවා. මේ ලෝකය තුළ ජිවත් වන විට මේ ශරීරය සතුටු කරන්නට මනුෂ්‍යයා බොහෝ දේ කරනවා. ඒ තුළයි, පාපය බහුල වෙමින් තිබෙන්නේ. මනුෂ්‍යයා වෛර දරනවා, යහපත තමා තුළ පවත්වා ගන්නට. ඔහු ආසයි, දෙවියන්ගෙ අණට කීකරුව උන්වහන්සේගේ ස්වභාවයට හැඩගැසෙන්නට. එහෙත් පාපය තමාටත් නොදැනී තමාව යට කරගෙන විවිධ සිතුවිලි තුළ රඳවාගෙන තියෙනවා."

"මගේ දරුවෙනි, මේ පාප කිළිට නමැති වස්ත්‍රය හෙවත් මේ ශරීරය යම් මොහොතක දමා යන්නට සියල්ලන්ට සිදුවෙනවා. ඔබ අඳින වස්ත්‍රයක අරින්න බැරි පැල්ලම් තිබෙනවා නම් ඔබ උත්සාහ කරනවා, මොනවා හරි කරල එය යවා ගන්නට. මොන දේ කළත් යවා ගන්න බැරි නම් ඒ වස්ත්‍රය අයින් කරනවා. ඒ වගේ මනුෂ්‍යයා තුළත් තියනවා අයින් කරන්නට බැරි පාපයන්. කොතෙක් අයින් කරන්න උත්සාහ කළත් ඒක මනුෂ්‍යයාව අල්ලගෙන ඉන්නෙ. ඒ අයින් කරන්න බැහැයි කියන පාපය තුළත් ස්වාමින් වහන්සේට සියල්ල කළ හැකියි. ජේසු ගෙව්ව මිලයට, උන්වහන්සේගේ රුධිරයට සියල්ල කළ හැකියි. ඒ සත්‍යය කෙරෙහි ගැඹුරුම විශ්වාසයෙන් පිරෙමින් ඒ විශ්වාසයේ බලයෙන් පාපය මුළුමනින් අවසන් කර පියාණන්ගේ සැලැස්මට අනුකූලව, නිර්දෝෂිව ගමන් කරන්නට තීරණය කළ යුතුයි. එතැනදී නපුරා මුළුමනින් පරාජය කරන්නට ඔබට පුළුවන්. ඊළඟ මොහොත පවා අති බිහිසුණු ලෙස ලෝකයටම බොහෝ අත්දැකීම්වලට මුහුණ දෙන්නට සිදුවෙනවා. මේ තත්ත්වය තුළ මනුෂ්‍යයාගේ මනස එහෙ මෙහෙ දුවනව වැඩියි, මනස එක තැන තබා ගන්නට අපහසුවක් තිබෙනවා. දැන් මනුෂ්‍යයා සූදානම් වන්නට ඕනැ, දෙවියන් වහන්සේ සමග ගත කරන මොහොතේදී මනස එක්තැන්ව තබාගෙන දෙවියන් වහන්සේ හා ගතකරන්නට. මෙවැනි කාලයක ඒ සඳහා ලොකු සටනක් දෙන්නට සිදුවෙනවා.

"මේ බිහිසුණු කාලවකවානුව තුළ මම ඔබ සැම භාර කරනවා බිළිඳු ජේසුට. ඔබ හැම කෙනෙක්ම බිළිඳු ජේසුට ආරාධනා කරන්න, මා ළඟට පැමිණෙන්න මගේ සුසුම වී මා තුළට ඇතුළු වන්න. මේ කාලයේ ලෝකයේ හැම රටකම මේ වෛරසය නිසා එන්නතක් ලබා ගන්න සිදුවී තිබෙනවා. මා මීට පෙර කියලා තිබෙනවා මේ එන්නතට හසු වෙන්න එපා, එය මඟ හරින්න කියල. එනිසා රැකියාවල නියැලෙන අය ඇතුළු බොහෝ දෙනෙක් අසරණව මගෙන් විමසනවා, ජේසු අපි දැන් මොකද කරන්නේ කියලා. යක්ෂයාව පරාජය කරන්නට මේ මොහොතේ මා ඔබට කරන යෝජනාව මෙයයි. ඔබට එවැනි මොහොතක් උදා වුණොත් (එන්නත ලබා ගන්නට සිදුවුණොත්) ඔබ කළ යුත්තේ ඒ මොහොතෙදී බිළිඳු ජේසුට ආරාධනා කරන්න. මෙලෙස පවසන්න. බිළිඳු ජේසු, දැන් ඔයා මගේ සුසුම වී මා ගන්න හුස්මත් සමග මා තුළට ඇතුල්වන්න. මේ දැන් ලබාදෙන එන්නත තුළ මට විරුද්ධව, ඔබට විරුද්ධව යම් දෙයක් ඇද්ද, බිළිඳු ජේසුනි, ඔබ මා ශරීරය තුළ සිටිමින් ඒ සියල්ල එකතු කරල පිටකරන සුසුමත් සමග පිටකරන්න. හොඳින් මතක තබා ගන්න, මගේ ඒ ගැඹුරු පණිවුඩය. පළමුවෙන් මනුෂ්‍යයා දේව නීතියට කීකරු වන්න ඕනැ, දෙවනුව රාජ්‍ය නීතියට කීකරු වන්න ඕනැ. එනිසා දැනට මේ එන්නත ලබා ගැනීමේදී බිය වන්නට එපා. ඔබට දැනේවි, බිළිඳු ජේසු ඔබ තුළ සිටින නිසා එහි අහිතකර බලපෑමක් ඔබට ඇති වන්නෙ නැහැ කියල.

"පළමු පියවරේ දි ඒ එන්නත ලබා ගත්තම ඔබට කාඩ්පතක් දෙනවා නේ? එය ලබාගන්න. ඊළඟට එනවා භයානකම එන්නත. එතැනදි ඒක මග හරින්න පුළුවන්. ඔබ ලබාගත් කාඩ්පත ළඟ තබා ගන්නට නේ අවශ්‍ය. ඊළඟට එන ඒ එන්නත ලුසිෆර්ගෙන්, මේක තමයි සැලැස්ම, ඒක

කුමන්ත්‍රණයක්. ඔවුන් ඒකට ජනතාව යොමුකර ගන්නට උත්සාහ කරනවා. ඒක ඇමෙරිකාවෙන් ඇරඹෙන්නේ. ඒ සමගම දැන් 666, එය මනුෂ්‍යයාට ඇතුළු කරන්නට Chip එක දැන් සූදානම්. දැන් ලුසිෆර්ගේ පොත විවෘත වෙමින් තිබෙනවා. එනිසා හැම කෙනෙක්ම අවදිව සිටිය යුතුයි. මා මේ මොහොතෙ උදක්ම පැමිණියෙ මේ ගැඹුරු පණිවුඩය මගේ දරුවන්ට ලබා දීම සඳහායි. ඔබගේ ශරීරය තුළ භයානක රෝගි තත්ත්වයක් ඔබට දැනෙනවා නම් එතැනදීත් ඔබට පුළුවන් බිළිඳු ජේසුට ආරාධනා කරන්න. ඔබ මගෙ සුසුම වී මා තුළට ඇතුල් වන්න. මගෙ ශරීරයේ රෝගි තැන් තියෙනවා. ඔබට සියල්ල පෙනෙනවා. ඔබගෙ පුංචි ඇඟිලි තුඩුවලින් මගෙ සිරුරේ රෝගි ස්ථානය ස්පර්ශ කරන්න. ඔබ විශ්වාසයේ ගැඹුරුම පත්ලට ගිය විට ඔබ ඒ තුළ ආත්මගත වෙද්දි ඔබට දැනේවි, ඇතුලත ස්පර්ශ කරන තැන්වල දි පුංචි කිතිකැවීමක්, යම් වෙනසක්. එනිසා කිසිම මොහොතක ඔබ ශරීරය ගැන භය නොවන්න, දුක් නොවන්න. මෙයයි ඔබගේ සුවයට මඟ. පහසුයි, ඔබට විශ්වාසයෙන් ළමා ජේසුට ආරාධනා කරල ඒ සුවය ලබන්නට. බිළිඳු ජේසුට පුළුවන්, පියාණන්ගේ ඒ මහා බලය තුළින් ඔබ ගන්න සුසුම වී ඔබ තුළට ඇතුල් වන්නට.”

“මා ඔබට පැවසුවා, ලුසිෆර්ගේ පොත දැන් විවෘත වෙලා තියෙන්නෙ කියල. මේ වෛරසය නිසා අද අධ්‍යාපනයත් online වෙලා. එනිසා ෆෝන් එක දරුවන් අතට යනවා. ඒකෙනුත් අති භයානක දේ ළමයින් අතර නිර්මාණය වෙනවා. ළමයින්ට නොදී ඉන්නට දෙමව්පියන් තීරණය කරපු දේ දැන් දෙන්නට සිදුවෙලා. ඉදිරියේදි තව තවත් ඊට වඩා දේවල් ද සිදුවෙනවා. පියාණන්ගේ මොහොතේ දි, තව ටික කාලයක් තුළ අධ්‍යාපනය කරගෙන යන්නට මම ආශිර්වාද කරන්නම්. නැව ගිනිගනිමින් විෂ ද්‍රව්‍ය සාගරයට එක්වෙමින් මේ දේශයේ විශාල ආපදාවක් සිදුවුණා. දැන් දෙවි පියාණන් විසින් මුහුදු පතුල ස්පර්ශ කරමින් ආශිර්වාද කරමින් තිබෙනවා. තව මාසයකින් පමණ මසුන් ආහාරයට ගන්නට සුදුසුයි. මා කලින් කීව දේ ඔයාල කරගෙන යන්න. ඔයාලගෙ සිරුර බිළිඳු ජේසුටම භාර කරන්න. දවසකට දෙතුන් සැරයක් හරි බිළිඳු ජේසුගේ ඒ පුංචි ඇඟිලිතුඩුවලින් ඔබගේ රෝගි ස්ථාන ස්පර්ශ කරවා ගන්න. ඒක වඩා ආරක්ෂිතයි. ආහාර හිඟය ඉදිරියට මීට වඩා වේගවත්ව පැමිණෙනවා. වගා කරන අයට වගා කරගන්න බැරි තත්ත්වයක් දැන් උදාවෙලා. මේ දේශයේ පමණක් නොව පිට දේශවලත් එවැනි ගැටළු තිබෙනවා. අසරණ ජන ජීවිත තව තවත් අසරණ වෙමින් පවතිනවා. නමුත් දෙවියන් වහන්සේට සියල්ල කළ හැකියි.”

“අවසානයට තමයි, ලුසිෆර්ගෙ එන්නත එන්නේ. එනිසයි මා කීවෙ දැනට මේ එන්නත ලබා ගන්න කියල. ඒක ගත්තම දැන් අතුරු ආබාධ ඇතිවන්නෙ නැහැ, නමුත් පසුවට එනවා. ඒ අයගෙ සැලැස්මත් ඒකයි. දැන් ඒක ලෝකයෙම ප්‍රසිද්ධ වෙලා තියෙනවා, අනාවරණයන් මගින්. ඔවුන් ඒක දන්නවා. ඉතින් ඔවුනුත් සූක්ෂ්මයි, දෙවියන් වහන්සේ අති සූක්ෂ්මයි. එන්නත ලබා නොගත්තොත් රාජ්‍ය නීතියට එය පටහැනියි. කාඩ්පත නැත්නම් රෝහලට භාර ගන්නෙ නැහැ, ආහාරපාන ගන්ඩ බැහැ. ළමයින්ට රෝගයක් වුණාම ප්‍රතිකාර ගන්ඩ බැහැ. ඒකට කාඩ්පත පෙන්වන්න ඕනැ. ඉදිරියේ දි ඕවා එනවා. ඉතින් මුල් අවස්ථාවෙදි මම අවසරය දෙන්නෙ ඒකයි. එතැනදිත් ඔයාල අර දේ කරගෙන (බිළිඳු ජේසුගේ සේවාව ලබාගෙන) ඔයාල එන්නත ලබා ගන්න. ඒක ගැටළුවක් වෙන්නෙ නැහැ. ඉතින් කාඩ්පත නේ ඕනැ වෙන්නෙ, පළමුවෙන්. අවසාන හරියේ දි ඒක නොගහ මගහරින්න පුළුවන්. කාඩ්පත තිබෙන නිසා බිය විය යුතු නැහැ. කතෝලික සභාව ආරම්භයේ දී තිබුණෙ පීඩා කාලයක්. බොහෝ අයට දහමේ නාමයෙන් දිවි පුදන්නට සිදුවුණා. ඒ හැම දෙයක් තුළම එහි ධනාත්මක පැත්තෙන් ඒ අය පූජා වීම නිසා එහි ආරක්ෂිත පැත්තකුත් සිදුවුණා. කොටසක් බිළි වෙනවා, ඔවුන්ගේ අණට කීකරු නොවී, කොටසක් භයට ඔවුන්ට යටත් වෙනවා. නමුත් පූජා වූ අය උදෙසා සියල්ලන් ගැළවීම ලැබුවා. ඉදිරියේ දි ඊට වඩා වැඩි යුද්ධයක් ඇරඹෙනවා. එය ටිකෙන් ටික තමයි ඇරඹෙමින් තිබෙන්නේ.”

“ඉතින් මේ කාලයේ දී පියාණන් විසින් බොහෝ වයස්ගත අය, ඔවුන් තම යුතුකම් දරුවන් උදෙසා ඉටුකරල ඒ අය නිදහසේ ඉඳලා ගතකරන්න ඕනැ මොහොතෙදි ඒ අයත් මේ දුක් විඳීමට හසු නොවන්නට සලස්වමින් පියාණන් විසින් බොහොම වේගවත්ව බොහෝ ජීවිත කැඳවාගනු ලබනවා.”

(එසේ පැවසීමත් සමගම මා සමග මෙවැනි සංවාදයක් ඇතිවුණා.)
“තේරුනා නේද, ඇන්තනි? දැන් සූදානම අඬගැසුවොත් යන්ඩ නේ.?

“ඉතින් දැන් වයස කීයද?”

“අවුරුදු 81ක් ඉවර වුණා.”

“හොඳයි, ඉතින් තව කොච්චර කාලයක් මේ අය එක්ක ඉන්ඩ ආසද?”

“එහෙම ආසාවක් නැහැ, ජේසු.”

“ආසාව නැහැ, යන්ඩමයි ආසා?”

“නැහැ, යන්ඩ ආසත් නැහැ. මා ගැන දෙවියන් වහන්සේගේ සැලැස්ම ඉටු වෙන්න ඕනැ”

“ඒක ඉටුවෙනකම් පියාණන් ගෙනියන්නෙත් නැහැ. හැබැයි, කණස්සලු වෙන්න එපා. එක එක විවිධ දේවල්වලට, තමාගේ බැඳීම් තුළ පවා දේවල්වලට තව තවත් මුහුණ දෙන්න වෙනවා, ඇන්තනි. එවිට ඒවායින් හිස්ව දෙවියන් කෙරෙහි විශ්වාසයෙන් බලාපොරොත්තුවෙන් ජය ගන්නට ඕනැ.”

# 60. “දෙවියන් වහන්සේගේ ප්‍රඥාව හා ඥානය කෙතරම් ගැඹුරුද? උන්වහන්සේගේ ක්‍රියාමාර්ග කෙතරම් වර්ණනාවිෂයාතික්‍රාන්තද?”

**1.** 56, 57, 58 පරිච්ඡේදවලට ඌණපූරණයක් හා පසු වදනක් හැටියට මෙම පරිච්ඡේදය සකසන්නට මම අදහස් කරනවා. ඒ සඳහා කිවයුතු අවශ්‍යම දේ පමණක් ඉතා කෙටියෙන් ඔබ ඉදිරියේ තබන්නටයි, මා අදහස් කරන්නේ. ඔබ 56-58 පරිච්ඡේද හොඳින් අධ්‍යයනය කළා නම් යුගාන්තය පිළිබඳ මහෝත්තමයාණන්ගේ උතුම් සැලසුම් ඔබ දැනටමත් යම් තරමකට හෝ අවබෝධ කර ගනිමින් ඇති. දැහැමි යුගයේ උදාව සිදුවන්නේ අධර්මාධිපති දහස් වසරකට බැඳ දැමීමෙන්. මනුෂ්‍යයාගේ වැටීමේ සිට උල්පත් දෙකකින් සිතුවිලි මනුෂ්‍යයා වෙත ගලා එනවා. එය දෙවියන් වහන්සේගෙන් හා නපුරාගෙන්. “නපුරා දහස් වසරකට බැඳ දැමීම” කියන්නෙ ඒ උල්පතෙන් ගලා එන සියල්ල නැවතීමයි. එවිට සියල්ලන් වෙත සිතුවිලි ගලා එන්නේ දෙවියන් වහන්සේ නමැති උල්පතෙන් පමණයි. එලෙසයි, සාගරය ජලයෙන් පිරී ඇත්තාක් මෙන් දෙවියන් වහන්සේ ගැන දැනගැනීමෙන් මුළු පොළොව පිරී යන්නේ. ඒ තත්ත්වය උන්වහන්සෙයි, උදා කරන්නේ. එයට පෙර දෙවියන් වහන්සේගේ අතට කැමැත්තෙන් නතු වූ ජීවිත උපයෝගි කර ගනිමින් ලෝකය යහපත් තැනක් බවට පත් කරන්නට උන්වහන්සේ ක්‍රියා කරනවා. දැන් උදා වී ඇත්තේ ඒ අදියරයි. “ඇයි දෙවියනී, ඔබ දුෂ්ටකම්වලට අසාධාරණයට ඉඩ දී බලා සිටින්නේ? පෙර කල ඔබ ප්‍රබලව ක්‍රියා කළ බව අප අසා තිබෙනවා. ඇයි, ඔබ අද එලෙස ක්‍රියා නොකරන්නේ.?” මේ මොරගැසීම, මේ යාදින්න දිවැසිවරුන්ගේ පොත්වල දැක ගන්න ලැබෙනවා. අසාධාරණයට හා පීඩාවට මුහුණ දෙන සියල්ලන් තුළින් මේ යාදින්න ඉහළට නැගී තිබෙනවා. ’ශුද්ධාත්ම පිය සටහන්’ එහි මුල්ම පිටුවක මෙලෙස සටහන්ව තිබෙනවා. “අයුක්තිය සුළඟක් සේ හැම තැනම හැම විටම වාගේ පැතිර සිටී. යුක්තිය වේදිකාවට එන්නේ පමා වී බර අඩි තබමිනි.” පාස්කු බෝම්බයෙන් හා කොරෝනා වෛරස උවදුරෙන් මුල පිරුවේ මහෝත්තමයාණන් මෙම යුගාන්තයේ දී බර අඩි තබමින් පැමිණීමේ ඇරඹුමයි. එය දෙව් පියාණන්ගේ පවිත්‍රකරණයයි, දේව ජනතාව පැතූ දේ ඉටුවන මොහොතයි. මානව සංහතිය උදෙසා මැවුම්කරුවාණන් වහන්සේගේ සැලසුම් කොපමණ අනර්ඝද? අපි දැන් මනුෂ්‍යයා මැවීමේ සිට උන්වහන්සේගේ උතුම් සැලැස්ම පියවරෙන් පියවර ක්‍රියාවට නැගුන ආකාරය ගැන සිතා බලමු.

මනුෂ්‍යයා මැවීමේදී දෙවියන් වහන්සේ ඔහුට/ඇයට භෞතික ලෝකයට එකමුතු වන්නට පසිඳුරන් සහිත ශරීරයක් දුන්නා, සියල්ල නිසි කළමනාකරණයෙහි යොදවන්නට ඔහුට මනසක් හා බුද්ධියක් දුන්නා, පෙනෙන සොබාදහම ඉක්මවා මනසට බුද්ධියට හසු නොවන උත්තරීතර අරමුණක් කරා ගමන් කරන්නට ඔහුට ආත්මයක් දුන්නා, හොඳ නරක අවබෝධ කර ගන්නට ඔහුට හෘදයසාක්ෂියක් දුන්නා, ඉන්පසු ඔහුට දූතමෙහෙයක් වගකීමක් පැවරුවා, ඊට කීකරු වන්නට හෝ අකීකරු වන්නට ඔහුට නිදහස් කැමැත්ත දුන්නා. ඇයි, මැවුම්කරුවාණන් මනුෂ්‍යයාට නිදහස් කැමැත්ත දුන්නේ? දෙවියන් වහන්සෙ මනුෂ්‍යයා මැව්වෙ උන්වහන්සේගේ ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දෙන මැවීමක් හැටියටයි. එය ප්‍රේමයේ ජීවිතයට කැඳවීමක්. ප්‍රේමයේ ජීවිතයකට නිදහස් කැමැත්ත නිදහස් තෝරා ගැනීම තිබෙන්නටම ඕනැ. එය නැත්නම් එතැන ඇත්තේ වහල්භාවයයි. පැවරුන දූත මෙහෙයට අකීකරු වීමෙන් මුළු මැවිල්ල අන්ත තත්ත්වයට ඇදදමන්නට මනුෂ්‍යයාට හැකියි. මනුෂ්‍යයා දෙවියන් වහන්සේට අකීකරු වීමෙන් එය සිදුවුණා. දෙවියන් වහන්සේගේ පරම පවිත්‍ර මැවීමට ආත්මාර්ථය, පාපය, දුක වේදනාව ඇතුල් වුණා. ආත්මාර්ථය, පාපය, දුක වේදනාව දෙවියන් වහන්සේගේ මැවීමක් නොවෙයි, එය දෙවියන් වහන්සේට අකීකරු වූ මිනිසාගේ මැවීමක්. දෙවියන් වහන්සේට අකීකරු වීමෙන් මිනිසා දේව සබඳතාවය අහිමි කර ගත්තා. කාලයාගේ ඇවෑමෙන් මනුෂ්‍යයා ඒ නැති වූ උරුමයට නැවත පිපාස වෙනවා, නැති වූ උරුමය වන දේව සබඳතාවය නැවත සොයනවා. බාබෙල් කොත ඉදිකිරීමට කළ උත්සාහය තුළ ඒ සත්‍යයත් ගැබ්ව තිබෙනවා. එය නැති වූ උරුමය ස්ව උත්සාහයෙන් නැවත සොයන්නට කළ ක්‍රියාකාරිත්වයක්. ස්ව උත්සාහයෙන් පමණක් එය සොයාගත නොහැකියි. එනිසා එය කඩා වැටෙනවා. ඒත් දෙවියන් කෙරෙහි පිපාස වීම, දෙවියන් සෙවීම

අපතෙ යන්නෙ නැහැ. මනුෂ්‍යයා පිපාසයෙන් දෙවියන් සොයන විට එතුමන් මිනිසා සොයා පැමිණෙනවා, දෙවියන් වහන්සේ ආබ්‍රහම් සොයා පැමිණෙනවා.

එලෙස දෙවියන් වහන්සේ ගැළවීමේ ඉතිහාසය මුල පුරනවා. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයයි, මිනිසාව මැව්වේ. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයට පමණයි, වැටුණු මිනිසා නැවත මවන්නට හැක්කේ. එනිසා දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය නැවත හඳුන්වා දීමේ ඉතිහාසය හෙවත් ගැළවීමේ ඉතිහාසය දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගෙන් මුල පිරුවා. ඇයි, ජනතාවක් පිපාසයෙන් දෙවියන් සොයද්දි දෙවියන් වහන්සේ එක් අයෙක් පමණක් සොයා පැමිණියේ? "දෙවියන් වහන්සේ අල්ෆා සහ ඔමෙගා ය." (එළිදරව් 1: 3) (ආරම්භය සහ පරම අවසානය, මුල අකුර හා අග අකුර) දෙවියන් වහන්සේගේ අරමුණ වූයේ සකල මනුෂ්‍ය වර්ගයාටම උන්වහන්සේගේ අසීමිත ආදරය හඳුන්වා දීමයි. උන්වහන්සේ එයට මුල පිරුවේ අල්ෆා මට්ටමින්, එක මිනිසකුගේ දෙවියන් වහන්සේ වශයෙන්, ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ වශයෙන්. ඉන්පසු ඊසාක්ගේ ඉන්පසු ජාකොබ්ගේ දෙවියන් වහන්සේ වශයෙන් උන්වහන්සේ ක්‍රියා කළා. ඉන්පසු උන්වහන්සේ ජාකොබ්ගේ නම වෙනස් කරනවා, ඊශ්‍රායෙල් හැටියට. ඔහුගේ පුතුන් 12ස් දෙනා ගෝත්‍ර 12ක නායකයින් හැටියට උන්වහන්සේ ඊශ්‍රායෙල් ජාතිය ගොඩනගනවා. එය දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය හඳුන්වා දීමේ ඉතිහාසයේ දෙවන පියවරයි. ඊශ්‍රායල් ළදරු විය පසුකරමින් ළමා වියට එළඹෙනවා. ළමා වියේ දී හැම දෙයක් ගැනම නිතරම අවවාද අනුශාසනා අවශ්‍යයි. එනිසා ශු. බයිබලයේ මුල් පොත් 5 (පංච පුස්තකය) තුළ අවවාද අනුශාසනා බහුලයි. විවිධ අත්දැකීම් ඔස්සේ වැඩෙමින් ජයග්‍රහණයන් පරාජයන් අතරින්, අකීකරු වීම් හා දඬුවම් මැද ද බැබිලෝනියන් විප්‍රවාසයෙන් ද පන්නරය ලබමින් ඊශ්‍රායල් තුරුණු වියට එළඹෙනවා. දෙවියන් වහන්සේ හා ඊශ්‍රායල් අතර මිත්‍රත්වය මිනිස් සම්බන්ධකම් අනුව බලන විට විවාහ ජීවිතයට පැමිණිය යුතුයි. ශු. බයිබලයේ 'සලමොන්ගේ ගීතිකාව හෙවත් ගීතිකාවන්ගෙන් උතුම් ගීතිකාව' දෙවියන් වහන්සේ හා ඊශ්‍රායල්ගේ මිත්‍රත්වය විවාහ ගිවිස ගැනීමේ අත්දැකීමට පිවිසීමයි. දෙවියන් වහන්සේ පෙම්වතා හැටියට, ඊශ්‍රායල් පෙම්වතිය හැටියට එහි ප්‍රකාශ වෙනවා. දැන් දෙදෙනා එකිනෙකාගේ හොඳ පමණයි දකින්නේ. එයයි, විවාහ ගිවිස ගැනීමේ අත්දැකීම කියන්නේ. දෙදෙනා එකිනෙකාව උපරිමව අගය කරනවා. එය වරද නොදැක හොඳ පමණක් දැකීමේ ප්‍රේමයයි. දෙවියන් වහන්සේ සමාව දුන්නට පස්සෙ උන්වහන්සේ එලෙසයි ක්‍රියා කරන්නේ.

විවාහ ගිවිස ගැනීමේ අත්දැකීමට පිවිසි දෙවියන් වහන්සේගේ හා ඊශ්‍රායල්ගේ මිත්‍රත්වය නැවත මහා කඩාවැටීමකට මුහුණ දෙනවා. කිතුනු දැක්මෙන් බලද්දි ආගම ඇදහීම කියන්නෙ දෙවිඳුන් හා ගැඹුරු සබඳතාවයක් ගොඩනගා ගැනීමක්, එය දෙවිඳුන් සමග මහා ප්‍රේම සම්බන්ධකමක්. කිතුනු දැක්මෙන් බලද්දි පාපය කියන්නේ වේශ්‍යාකමක්, තම ආදරවන්තයා අතහැර අන් අය අනෙක් දේ පසුපස යාමක්. ඊශ්‍රායල් වේශ්‍යා තත්ත්වයට ඇද වැටෙනවා. ඒ මහා කඩාවැටීම යෙසායා දිවැසිවරයා මෙලෙසයි, නිවේදනය කරන්නේ. "ස්වර්ගය අසන්න, පෘථිවිය කන් දීපන්න. මක්නිසාද ස්වාමින් වහන්සේ කතා කරන සේක. මම දරුවන් පෝෂණය කොට ඇතිදැඩි කළෙමි. එහෙත් ඔවුහු මට විරුද්ධව කැරලි ගැසුවෝය. ගොනා උගේ අයිතිකාරයා ද කොටළුවා උගේ ස්වාමියාගේ පට්ටිය ද දනියි. එහෙත් ඊශ්‍රායල් දන්නේ නැත. මගේ සෙනග කල්පනා කරන්නේ නැතැයි ස්වාමින් වහන්සේ කියන සේක. අනේ ! පාපිෂ්ඨ ජාතියක්ය, අයුතුකමෙන් බර වූ සෙනගක්ය, නපුරුකම් කරන වංශයක්ය, දූෂ්‍ය ලෙස ක්‍රියා කරන දරුවෝය. ඔවුහු ස්වාමින් වහන්සේ අත්හැර ඊශ්‍රායල්ගේ ශුද්ධ තැනැන්වහන්සේව එපාකොට වෙන් වී පස්සට හැරී ගියෝය." (යෙසායා 1: 2-4) අසීමිත ප්‍රේමය වන, කොන්දේසි විරහිත ප්‍රේමය වන, දෙවියන් වහන්සේ සැබෑම ප්‍රේමවන්තයෙක්. ඇයගේ (ඊශ්‍රායල්ගේ) කොපමණ අඩුපාඩු තිබුණත් ඇයව හදාගෙන ඇය හා විවාහ ජීවිතයට එළඹෙනවාමයි, අග දක්වාම විවාහ ජීවිතය තුළ පවතිනවාමයි. ඇයව (ඊශ්‍රායල්ව) නැවත දේව සබඳතාවයට පමුණුවන්නටයි, එලෙස විවාහයට සූදානම් කරන්නටයි, දෙවියන් වහන්සේ දිවැසිවරුන් 16 දෙනෙක් එව්වේ. එලෙස දෙවි-මිනිස් විවාහයේ මොහොත පැමිණුනා. එය 'සලමොන්ගේ ප්‍රඥාව' පොත මෙලෙස සටහන් කර තිබෙනවා. "සියල්ල සාන්ත නිසලතාවය තුළ ගිලී සිටිය දී මැදියම් රැය පැමිණි කල ස්වාමිනී, ඔබවහන්සේගේ බලසම්පන්න වචනයාණෝ ස්වර්ගීය රාජ සිංහාසනයෙන් බැස වදාළහ." (18: 14,15) (ශු. බයිබලය සිංහල නව අනුවාදය මුද්‍රණය වන්නට පෙර පුබුදු ඉගැන්වීම් සඳහා ගරු ඔස්කා පියතුමා එය සිංහලයට පරිවර්තනය කර තිබුනේ එලෙසයි. එය වඩා සජීවී නිසා මා කැමතියි, එය එලෙසම මෙහි සටහන් කරන්නට.)

දෙවි-මිනිස් විවාහයේ මොහොත පැමිණුනා. මාංශගත වීම කියන්නෙ එයයි. ලෝක ඉතිහාසය දෙකඩ කළ සිද්ධිය එයයි, දේවත්වය මනුෂ්‍යත්වය හා ඒකාබද්ධ වුණා. අසීමිත දේ සීමිත දේ සමග, නිත්‍ය දේ අනිත්‍ය දේ සමග, ශුද්ධවූ දේ ලෞකික දේ සමග ඒකාබද්ධ වුණා. මැවුම්කරුවාණන් අදහන තව ආගම් තිබෙනවා. ඒත් ඒ එකක් වත් දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙක් වූ බව පිළිගන්නෙ නැහැ. එවිට එතැන ඇත්තේ දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය ගැන සීමිත අවබෝධයක් පමණයි. දෙවි පියාණන්ට අවශ්‍ය වුණා, උන්වහන්සේගේ පුත්‍රයාණන් හා මිනිස් සංහතිය අතර සිදුවූ විවාහය මතුපිටින් පමණක් සිදුවූ විවාහයක් නොව සැබෑ විවාහයක් බවට පත් කරන්නට. මතුපිටින් පමණක් සිදුවූ විවාහයක් කියන්නෙ වාසනාවන්ත කල්හි හා සුව සැපේ දී පමණක් එක්ව සිටීමයි, අවාසනාවන්ත කල්හි හා ලෙඩදුකේ දී එකිනෙකා මගහැර යාමයි. මාංශගත වීම සැබෑ විවාහයක් කරන්නට දෙවි පියාණන්ට අවශ්‍ය වූ නිසයි, ජේසු සමිඳුන් දුක් විඳින මිනිසෙක් වුණේ. එය සැබෑ විවාහයක් නිසා මනාලිය (මිනිස් සංහතිය) අත්දකින සෑම තත්ත්වයකටම එකාබද්ධ වීමට මනාලයාට සිදුවුණා. මාංශගත වීමෙන් දෙවියන් වහන්සේ සැබෑම මනුෂ්‍යයෙක් වුණා. දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරන්නට ඊටත් වඩා දුරක් යන්න පුළුවන්ද? දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ලොකුම අවස්ථාව මාංශගත වීම නොවෙයි. දෙවියන් වහන්සේ තීරණය කළා මනුෂ්‍යයාගේ සෑම වේදනාවකටම එකමුතු වන්නට, එය සැබෑම විවාහයක් නිසා. උන්වහන්සේ මිනිසා සමග එකමුතු වුණේ මහිමය ඉවත්කර. හිස්භාවයේ පදනම එයයි. උන්වහන්සේ පාපයක් නොකර පාපයේ විපාකය කරට ගත් මිනිසා වුණා. (2 කොරින්ති 5: 21) උන්වහන්සේ මොරගසන මිනිසෙක් වුණා. (හෙබ්‍රෙව් 5:7) ශුද්ධවූ දෙවියන් වහන්සේ හා මොරගසන මනුෂ්‍යයා අතර ඇති පරතරය ගැන සිතන්න. උන්වහන්සේ ඒ අත්දැකීමට පැමිණීමෙන් ඒ පරතරයත් නැති කළා. ශාපයේ ලකුණ වන කුරුසිය මත නින්දිත මරණය දක්වා ගමන් කළා. (ගලාති 3:13) මනුෂ්‍යයාට අත්දකින්නට සිදුවන ගැඹුරුම වේදනාව වන තනිභාවය ගැඹුරෙන් අත්දකින මනුෂ්‍යයා වුණා. “මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද?” (මතෙව් 27:46) මනුෂ්‍යයා හා ඒකත්වයක් වනු සඳහා මනුෂ්‍යයාගේ ආහාරය වීම දක්වාම ගමන් කළා. එය දිව්‍ය සත්ප්‍රසාදයයි. එය දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ගමන් මගේ මුදුනයි එය, මාව කාල ඔබ වැඩෙන්න, ඔබව කාල වැඩෙන්නට අනෙක් අයට ඉඩ දෙන්නැයි කරන ආරාධනයක්.

මගේ වේදනාව ඔබට තේරෙන්නෙ නැහැ කියන්නට උන්වහන්සේ කිසිවෙකුට ඉඩ තැබුවෙ නැහැ. ව්‍යවස්ථාව ප්‍රකාශ කළේ සීමිත ප්‍රේමයක්. මිනිසා ගළවා ගැනීමට අසීමිත ප්‍රේමයම අවශ්‍ය වුණා. උන්වහන්සේ පාපය අවසන් කිරීමක් නොවෙයි සිදුකළේ, සියල්ලන්ගේ ගැළවීම උදෙසා පාපයේ මිලය ගෙවීමයි සිදුකළේ. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ම ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩියත් ලෝකය පූර්ණ කරන්නට උන්වහන්සේට ද නොහැකි වී දැයි කෙනෙක් අසන්නට පුළුවන්. ලෝකය පූර්ණ කිරීම සඳහා අල්ෆා මට්ටමේ ක්‍රියාවක් පමණයි, උන්වහන්සේ සිදුකළේ. එය ඔමේගා මුදුන දක්වාම යාමට අවශ්‍ය සියල්ල උන්වහන්සේ සම්පාදනය කළා. උන්වහන්සේ එකවර ලෝකය පූර්ණ කළා නම් ඔබටත් මටත් ඒ සඳහා කරන්නට දූතමෙහෙයක් ඉතිරි නොවනු ඇත. එය ප්‍රේමයේ දහමට පටහැනියි. අන්තිම මිනිසාටත් කරන්නට දූතමෙහෙයක් තිබිය යුතුයි. ජේසු සමිඳුන් මරණයෙන් උත්ථාන වෙමින් ශුද්ධාත්ම ආගමනය සඳහා ශ්‍රාවකයින් සූදානම් කරමින් ස්වර්ගාරෝහණය වුණා. ශුද්ධාත්ම වැගිරවීම තුළින් උන්වහන්සේ සභාව ගොඩනැගුවා. උන්වහන්සේගේ සභාවයි, උන්වහන්සේගේ මනාලිය. (මුළු මිනිස් සංහතියම උන්වහන්සේගේ මනාලිය යි. ඒත් ජේසු සමිඳුන් මනාලයා හැටියට මනාලයාට ලැබිය යුතු නිසි පිළිතුර දිය යුත්තේ උන්වහන්සේගේ සභාවයි.) මනාලිය වන උන්වහන්සේගේ සභාව මනාලයා හා විවාහ ජීවිතය තුළ දිගටම පැවතිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය අත දීමයි, ශු. සුවිශේෂ පොත්, ක්‍රියා පොත හා සංදේශ පත්‍ර තුළින් සිදුවන්නේ. මනාලිය ස්වර්ගීය භෝජන සංග්‍රහය සඳහා කැඳවාගෙන යන්නට ජේසු සමිඳුන් පොරොන්දු වුණා. ශුද්ධාත්මයාණන් “කැමති තැනට හමන සුළඟක් සේ” හැසිරෙමින් ඒ සඳහා මනාලිය සූදානම් කිරීමක නිරන්තරයෙන් යෙදී සිටිනවා. “මම ඉක්මනින් එමි”යි මනාලයා පවසනවා. “ආමෙන් ජේසුස් වහන්ස, වැඩිය මැනව”යි මනාලිය ඊට පිළිතුරු දෙනවා. එලෙසයි, ශු. බයිබලය නිමාවට පත් වන්නේ.

මනුෂ්‍යයා පිළිබඳ දෙවියන් වහන්සේගේ ශුද්ධවූ සැලැස්ම තුළ ඇත්තේ අප මවිතයට පත් කරන පිරිපුන් බවක්. එයින් උද්දාම වෙමින් ශු. පාවුලු තුමා මෙසේ පවසනවා. “දෙවියන් වහන්සේගේ වරප්‍රසාද සම්භාරය කෙතරම් විශාල ද? උන්වහන්සේගේ ප්‍රඥාව හා ඥානය කෙතරම් ගැඹුරු ද? උන්වහන්සේගේ විනිශ්චයන් කෙතරම් අචින්ත්‍යද? උන්වහන්සේගේ ක්‍රියාමාර්ග කෙතරම් වර්ණනාවිෂයාතික්‍රාන්තද?” (රෝම 11:33) ආචාර්ය සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන්ගේ ‘Religion and Culture’ පොතේ මෙලෙස සඳහන්ව තිබෙනවා. “භෞතික සුරක්ෂිත භාවය පිණිස

කරන අරගලයෙන් නිදහස් වූ කල මිනිසා කුඩා මැවුම්කරුවෙකු වනු ඇත. **ලෝකය මෙසේ විය යුතු යැයි අප මැවූ සැම සිහිනයකට ම වඩා ලෝකය චමත්කාරජනක බව පෙනී ගිය කල අවබෝධයේ නව බිම් වෙත අපට මඟ හෙළි වනු ඇති අතර ඉරණම ගැන යථාවබෝධයක් ලැබෙනු ඇත.** මිනිසාට නව දැනුම අභියෝගයක් මෙන්ම අවස්ථාවක් ද වේ. ඔහු ඉක්මන් නොවී හා පමා නොවී මනුෂ්‍යත්වයේ උසස් බවට ළඟා වීමට පරිශ්‍රම ගත යුතුය. මනුෂ්‍ය වර්ගයා අධ්‍යාත්මික අවබෝධය හා මානව දයාව පිළිබඳ නියමයන් වටහා ගත් විට සියලු කණ්ඩායම් ජය ගන්නා හා කිසිදු කණ්ඩායමක් පරාජය නොවන විශිෂ්ඨ සමගි සන්ධානය ලෝක ජනතාව අතර ඇති වනු ඇත.” (35)

**2.** දැන් මුල පුරමින් ඇති යුගාන්තයේ සිදුවීම්වලට සාර්ථකව මුහුණ දෙනු සඳහා ජේසු සමිඳුන් අපව මෙලෙස සූදානම් කරනවා.

“මගේ දරුවෙනී, ඉදිරිය අති බිහිසුණුය. මගේ නම කියන මගේ නාමයට සාක්ෂි දරන ජනතාවට මගේ නාමයෙන් තම ජීවිතය පූජා කරන්නට සිදු වන්නේය. එහෙත් කිසි තැනක කිසි විටෙක මගේ දහම පරාජයට පත් නොවන්නේය. බාහිර ආටෝපයෙන් බාහිර ප්‍රකාශනවලින් ඔවුන් (නපුරා හා සම්බන්ධ බලවේග) ජය ලබා ඇතත් ඔවුන්ගේ කාලය සීඝ්‍රයෙන් නිමාවට පත් වන්නේය. ඔවුන් ඒ සියල්ල කෙටි කාලයක් තුළ සම්පූර්ණත්වයට පත් කරමින් විනාශ වී සදාකාලයටම දෙවියන් විසින් මවන ලද විශ්වයෙන් සමු දෙන කාලය ආසන්නය. එය අති බිහිසුණුය. මගේ ගෝලයන්ට ද මා තෝරා ගත්තා වූ මගේ දැහැමි වූ ජීවිත පැවැත්ම දරන සියල්ලන්ට ද එය අති බිහිසුණු කාල පරිච්ජේදයක් වන්නේමය. බාහිරව පෙනෙන්නට පමණක් සියල්ල සාමයෙන් හා ප්‍රේමයෙන් ආරම්භ කරමින් සියල්ල තුළ එක්සත් බව ඇති කරමින් ඔවුන් යන ගමන තුළ අභ්‍යාන්තර දර්ශනය එය නොවන්නේය. ඔවුන් එක්සිත් වන්නේ ද එක්සත් වන්නේ ද නපුරාගේ ක්‍රියාකාරකම්වලට සියල්ල උරා දීමටය. එබැවින් ඔබ කල්පනාකාරීව මා ඔබට නිරන්තරයෙන් ප්‍රකාශ කරන පරිදි අහිංසක භාවයෙන් හා නුවණශීලීව ක්‍රියා කිරීමට කාලය එළඹ ඇත්තේය. පිරිසිදු සත්‍යය ඇත්තා වූ සැම තැනකටම නපුරාගේ ප්‍රහාරය ලහිලහියේ එල්ල වන්නේය. ඔබ බිය විය යුතු නැත. මගේ වචනය ඔබ තුළ ඇත්තේය.” (24)

“එදා මෝසෙස් මගේ ජනතාව ගෙන ගිය ආකාරය මෙනෙහි කරන්න. ජනතාව මෝසෙස්ව හෙළා දකිමින් තම මැවුම්කරුවාණන් ප්‍රතික්ෂේප කළ ආකාරය ද ඔවුන් ලැබූ දඬුවම් ද මෙනෙහි කරන්න. මේ තමයි මගේ ඉදිරි ගමන. --- “අද අභිරහස්මක ක්‍රියාවලියක් ලෝකයේ පුංචි දේශයක සිදුවෙමින් පවතී. ඒ දේශය මෙයයි. මේ දේශයෙන් මා සුලු පිරිසක් තෝරා ගෙන ලොවට අසම්මත ක්‍රියාවලියක් තුළ මම මගේ සැලසුම් ඉටුකරමින් සිටිමි. ලොවට අසම්මත ක්‍රියාවලිය සම්මත වන මොහොත ළංව ඇත. බලන්න, අද ලෝ පුරා ඇවිලෙන නපුරාගේ පාපධාරී ගින්න. මගේ පවිත්‍රකරණයේ ක්‍රියාවලිය ඇරඹී ඇත. ඉතිරි වන ජනතාව මගේ ශුද්ධවූ ගින්නේ දමා පවිත්‍ර කරන්නෙමි. සම්මත සභාව ඉක්මනින් කඩාවැටෙනු ඇත. මගේ අසම්මත සභාව ගොඩනැගෙන මොහොතක් එනු ඇත. --- මගේ පූජක පුත්‍රයින්ගෙන් සුළු පිරිසකි, ඔවුන් මට දී ඇති පොරොන්දුව අනුව කැපවී මට සේවය කරන්නේ. ඔවුන්ව ද යටපත් කරන්නට ඉක්මනින් වෙනත් ලෝක නායකයකු පත් කිරීමට අද සියලු සැලසුම් සකස් වෙමින් ඇත. එය ශුද්ධ ලියවිල්ලේ ලියා ඇත. එය ඉටුවිය යුතුමය. ඔබ හැම කෙනෙක්ම මේ කාලය තුළ ජේසුස් යන නාමයේ අවිය දරා ගමන් කරන්න. ඒ අවියෙන් ඔබ විසින් මහා සටනක් කළ යුතුව ඇත.” (35)

“මගේ දරුවෙනී, දුගීභාවය තුළ දුක වේදනාව තුළ ජීවත් වන්න. එයයි, මගේ කුරුසියේ මග. ඔබ දූ පුතුන්ට ඒ දුක් විඳීමේ අගය කියා දෙන්න. ඔබ ඔබගේ දරුවන්ට නපුරාගේ මන්දිරය වන ලෞකික සියල්ල පරම සැපත ලෙස පෙන්වූ විට ඔවුහු විනාශ වෙති. දුක වේදනාව නොහඳුනන ඔවුහු සැප සතුට තුළම විනාශය කරා ඇදෙති. එනිසා දරුවෙනී, ඔබගේ දරුවන්ට පවා දුක වේදනාව දැනෙන්නට සලස්වන්න. දුක වේදනාව තුළ ඔවුන් පුහුණු කරන්න. ඒ සියල්ල දිනෙක ඔවුන් උසස් කරනු ඇත, ධර්මිෂ්ඨ කරනු ඇත. දැහැමි යුගයට අවශ්‍ය ආකාරයට දරුවන් හැඩගස්වන්න.” (37)

“ඉදිරියේදී දෑත දෙපයින් කරන රැකියා පමණයි, ඉතිරි වන්නේ. සියලු තාක්ෂණය සුනු විසුනු වන කාලය ආසන්නයි. එදා මුල් යුගයේ මෙන් දෑත දෙපයේ රැකියා පමණයි, ඉතිරි වන්නේ. සියල්ල කෙසේ වෙනස් වුණත් නොබියව සිටින්න. දරුවෙනී, සියල්ල උන්වහන්සේගේ සැලැස්මට අනුව සිදුවන බව පමණක් සිතෙහි ධාරණය කර ගන්න. උන්වහන්සේගේ ක්‍රියා අවසානය දක්වාම නරඹන්න, දරුවෙනි.” (42)

“ඔබ හැමටම මේ කාලය අමාරුයි. ඉදිරියේදී මීටත් වඩා අමාරුම කාලය එනවා. මුදල් තිබෙන අයට හිතෙන්න පුළුවන් අපට මුදල් තිබෙන නිසා සාගතයට මුහුණ දෙන්න වෙන්නෙ නැහැ කියලා. මුදල් තිබුණත් ආහාර නැති වෙන්න පුළුවන්. එනිසා සියලු දෙනා ජීවන ජලයට (ආසිරි පැන් මිශ්‍ර ජලයට) හුරු වන්න. ජල බඳුනට ආසිරි පැන් බිඳුවක් එක් කරන්න, මහා ගෞරවයෙන්. ඒ ආසිරි පැන් බිඳුව ජේසුගේ ලේ බිඳුවක් ලෙස දකින්න. ඔබට වඩාත් කුසගින්න දැනෙන මොහොතේ ආහාර වේල නොගෙන ජීවන ජලය පමණක් පානය කරන්න, විශ්වාසයෙන්. එය ජේසුගේ ජීවනදායක රුධිරය ලෙස දකින්න. ඉදිරියේ එනවා ආහාර ඉතාම හිඟ යුගයක්. එයට මුහුණ දෙන්න වෙනවා, හැම කෙනෙකුටම. පුංචි දරුවට පවා මවගේ දෙතණේ කිරි නැති වන්නට පුළුවන්. එවිට තොල් මත ඒ ජීවන ජලය කිරට හරවල දෙන්නට පුළුවන්. ජීවන ජලය මහා ගෞරවයෙන් පානය කරන්න.” (46)

“කරදර ලෙඩදුක් මේ හැම දෙයක්ම මා සමග යන අයට බහුලයි. මා සමග යන අයට සැනසීම නොලැබීම තමා එකම සැනසීම. ඒ තුළත් මහා ප්‍රීතියක් තිබෙනවා. ඒ විඳවීමේ ප්‍රීතියයි, ඒ විඳවීම මුල්කරගෙන ගැළවීමේ ප්‍රීතියයි, කටුකභාවය ජය ගැනීම තුළ නපුරා පරාජය කිරීමේ ප්‍රීතියයි. --- දේශය පවිත්‍ර කිරීමත් බොහෝම ඉක්මනින් පියාණන් වහන්සේ විසින් සිදුකරනවා. එනිසා කිසිවෙක් කිසිවකු ගැන කිසිවක් නොදැන නිරන්තරයෙන්ම ඒ ගැන කතා කරන්න එපා. හැම කෙනෙක්ම මනුෂ්‍යයන් මත නොවෙයි, දෙවි පියාණන් හා දේව පුත්‍රයාණන් සමග ගැවසෙන්නට බලන්න. (47)

“දැහැමි යුගයේ දරුවන්ට ඔවුන්ට ඉදිරියේ මුහුණ දෙන්නට සිදුවන අරගලය ඔවුන්ගේ අභ්‍යාන්තරයට දැනෙමින් ඇත. එනිසා ඔවුහු වියවුල් ලෙස හැසිරෙති. දැන් වියවුල් වී පසුව වියවුල් නොවී ඔවුන් ඒ අභියෝගයට මුහුණ දෙනු ඇත. --- දැන් උදා වී ඇත්තේ සියල්ලන් බරපතල ලෙස පීඩාවට පත් කරන හෙම්බත් කරන බිහිසුණු කාලයක්, අවදිව සිටිය යුතු කාලයක්, ජේසු ගැන මහා පිපාසයක් ඇතිකරගත යුතු කාලයක්. --- පියාණන් ලෝකයම මහා පරීක්ෂණයක තබා තිබෙනවා. උන්වහන්සේගේ මනාලිය දෙස (මිනිස් සංහතිය දෙස) බලා සිටිනවා. කඩා වැටෙන්නට නොවෙයි, සියල්ලන් ශක්තිමත් කරගෙන යන්න ඕනැ, ලොකු ජවයක් තිබෙන්න ඕනැ.” (49)

“ඉදිරියේ දී ප්‍රශ්න ගැටළු රැසක් පැනනගිනු ඇත. කෑම වේල බෙහෙත් ටික පවා සොයා ගන්නට අපහසු තත්ත්වයක් ඒවි. --- දැන් එකිනෙකා අතර ගැටුම්, ඊළඟට ජාතියක් ජාතියක් අතර ගැටුම්, රාජ්‍යයක් රාජ්‍යයක් අතර ගැටුම්, ආගමක් ආගමක් අතර ගැටුම්, ඊළඟට සොබාදහමේ එකිනෙක දේ අතර ද ගැටුම්, අවසානයේ හිරු සඳු හා තරු තරු අතර ගැටුම් පැනනගිනු ඇත.” (50)

(මෙහි 24 පරිච්ඡේදයෙන් උපුටා ගත් ඉහත සඳහන් පාඨය අවබෝධ කර ගන්නට ’ශුද්ධාත්ම පිය සටහන්’ 25 පරිච්ඡේදයේ සඳහන් මෙම වචන ඔබට උපකාරි වනු ඇත. ගරු ෂාර්ඩෑන් පියතුමා මෙලෙස පවසයි. “මානව වර්ගයාගේ විමුක්තියත් පූර්ණත්වයත් නියත වශයෙන්ම රඳා පවතින්නේ වැඩි වැඩියෙන් එකමුතු වීම මත ය. මෙසේ එකමුතු විය යුත්තේ මිනිසාට ඔබින මානව පිළිවෙලකිනි. එනම් බාහිර වශයෙන් නොව අභ්‍යන්තරයෙන් ද ද්‍රව්‍යමය වශයෙන් නොව අධ්‍යාත්මික වශයෙන් ද බලහත්කාරයෙන් නොව නිදහස් කැමැත්තෙන් ද විය යුතු වේ.” දෙවි පියාණන්ගේ මහිමයේ ප්‍රශංසාව උදෙසා ජේසු ක්‍රිස්තුස් සමිඳාණෝ මුළු මැවිල්ල ඒකරාශි කරති. අභ්‍යාන්තරයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද නිදහස් කැමැත්ත තුළ ද එතුමෝ එය පූර්ණ කරති. කරළියට පැමිණෙන දුෂ්ට බලවේග බාහිර වශයෙන් ද ද්‍රව්‍යමය වශයෙන් ද බලහත්කාරයෙන් ද එය ඉටුකිරීමට තැත් කරනු ඇත.) (25)

**3.** කොරෝනා වෛරස උවදුර නිසා රටම ලෝකයම එක දිගට මාස ගණනක් වසා තැබීම නිසා තම ආගමික ස්ථාන වෙත යන්නට, එහි වත්පිළිවෙත් ආදියට සම්බන්ධ වන්නට බොහෝ අයට නොහැකි වුණා. එය අධ්‍යාත්මික කඩා වැටීමකට හේතු වූ බව සමහරු කියන්නට පුළුවන්. එහෙත් එය එසේ නොවිය යුතුයි. එහි රහස අපි ඒබ්‍රහම් ලින්කන් තුමාගෙන් ඉගෙන ගනිමු. මා ඒ සඳහා සහාය කර ගන්නේ ඩේල් කානගීගේ ‘Lincoln the unknown’ පොතයි. (’නොහඳුනන ලින්කන්’ යනුවෙන් එය සිංහලෙන් පළ වී තිබෙනවා.) ඔහුගේ අති කටුක ළමා විය ඔබ මවිතයට පත් කරනු ඇත. ඔහු කිතුනු නිකායක බෞතිස්ම කළත් ළමා විය අවසන් වන තුරු ද ඔහු දේවස්ථානයකට ගියේ නැහැ. ඊට හේතුව ඒ සඳහා සුදුසු ඇඳුමක් නොතිබුන නිසයි. ඉන්පසු ද ඔහු දේවස්ථානයකට ගියේ නැහැ. ඔහු කීවෙ එතැනට ගොස් හැසිරිය යුතු ආකාරය

තමා නොදන්නා බව යි. ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වීමේ දී ඔහුට ආගමක් නැතැයි චෝදනාවක් එල්ල වුණා. ඒත් ඔහුට ආගමක් තිබුණා, ආගමික පෙනුමක් නොවෙයි, ආගමික ජීවිත පැවැත්මක් තිබුණා. ඔහු ඇ. එ. ජනපදයේ 16 වන ජනාධිපතිවරයා වශයෙන් පත් වූ මොහොතේ ඔහු විසූ ඉලිනොයිස් ප්‍රාන්තයේ ස්ප්‍රින්ෆීල්ඩ් දුම්රිය නැවතුම් පළෙනුයි වොෂිංටනයට යාමට පිටත් වූයේ. සමුගැනීම සඳහා දුම්රිය පළට පැමිණි හිතවතුන් අමතා කඳුළු පිරි දෙනෙතින් යුතුව ඔහු කළ කතාව මෙයයි.

"මගේ මිත්‍රවරුනි, මගේ තත්ත්වයේ නොසිටින කිසි කෙනෙකුට මේ සමුගන්නා මොහොතේ ඇති වන ශෝකය වටහාගත නොහැකි වනු ඇත. මේ පලාතට මේ මිනිසුන්ගේ කරුණාවට මේ හැම දේට ම මා ණයගැතියි. මෙහි මම සියවස් කාලක් ජීවත් වූයෙමි. තුරුණු වියේ සිට මහලු මිනිසකු වන තෙක් ගමන් කළෙමි. මෙහි මගේ දරුවන් උපත ලැබීය. එකෙකු මෙහි වළ දැමීය. කවදා කෙලෙස මා මෙහි පැමිණියේ දැයි නොදැන මම දැන් පිටත් වෙමි. **<u>වොෂිංටනයේ ඊට වඩා විශාල අරමුණක් මා ඉදිරියේ වෙයි. දිව්‍යමය බලයේ ආධාරය නොමැතිව නිතිපතාම එතුමන් වෙත ගොස් මිස මට ජයග්‍රහණය ලැබිය නොහැකිය. ඒ උපකාරය සමග මට පරාජය විය නොහැක.</u>** උන්වහන්සේ ගැන විශ්වාස කරමින් මා සමග යා හැකි අය සහ ඔබ සමග නවතින අය සෑම තැනම යහපත සොයන උදවියට සියලු යහපත උදා වේවා යි විශ්වසනීයව බලාපොරොත්තු වෙමි. ඔබගේ යාච්ඤාවලින් ඔබ මා රැකබලා ගත්තා සේ උන්වහන්සේ ඔබ දයාවෙන් රැකබලා ගනු ඇති. මම හෘදයාංගමව ඔබෙන් සමුගනිමි."

ලින්කන් වොෂිංටනයට යන්නේ සුදු ජාතිකයන්ට සමාන අයිතිවාසිකම්, කළු නිග්‍රෝ වහලුන්ටත් දීමේ අරමුණින්. ඔහු එය ඊට පෙර එඩිතරව ප්‍රකාශ කර තිබුණා. එනිසා ඔහු ජනාධිපති වශයෙන් පත් වූ මොහොතේ සිටම තිබුණේ ඔහුව ඝාතනය කරන සැලැස්මක්. "මේ ජාතියේ අඩකට නිදහසේ සිටීමට සහ අඩකට වහලුන් වී සිටීමට සිදුවීම විඳිය නොහැකි බව මම ඔබට පවසමි." ලින්කන් එසේ පවසා තිබුණා. පලමුවෙන් වහල් වෙළඳාමක් දුටු මොහොතේ තමා සමග සිටි හිතවතුන්ට ඔහු මෙසේ පැවසුවා. "දෙවියන්ගේ නාමයෙන් දරුවෙනි, අපි මෙතැනින් ඉවත් වෙමු. කෙදිනක හෝ වහල් වෙළඳාමට පහර ගැසීමට මට සිදුවුවහොත් මා ඊට එල්ල කරන්නේ දැඩි ප්‍රහාරයකුයි." ලින්කන් මෙසේ ද පැවසුවා. "වහල් වෙළෙන්දාට පාද බිම තියා ගන්න බැරි තරමට මම මේ පොළොව රත් කරනවාමයි." සමාන අයිතිවාසිකම් දීමේ ඒ පණත අකුලාගන්නා ලෙස දකුණු ජනපද ඔහුට බල කළා. එසේ නොකළොත් දකුණු ජනපද වෙනම රාජ්‍යයක් වනු සඳහා සිවිල් යුද්ධයකට යන බව පැවසුවා. ඒ පණත අස්කර නොගන්නා බවත් ඇ. එ. ජනපදය රාජ්‍ය දෙකකට බෙදෙන්නට ඉඩ නොතබන බවත් ලින්කන් තරයේ පැවසුවා. ජනරාල් ලී ගේ නායකත්වයෙන් දකුණු ජනපද විශාල අරගලයකට මුල පිරුවා. ඔහුගේ අවුරුදු හතරක පාලන කාලයෙන් වසර තුනකටත් වඩා ගෙවී ගියේ සිවිල් යුද්ධය තුළයි. ඔහු හරිහැටි කෑමක් ද නොගෙන බයිබලය අතට ගෙන මැදියම් රැය පසුවන තුරු ද යාච්ඤා කළා. "පුරුෂයෙක් මෙන් දැන් නුඹේ ඉඟටිය බැඳ ගන්න. මා නුඹ සඳහා ඉල්ලන අතර මා හරහා පිළිතුරු දෙමි." ධවල මංදිරයේ සක්මන් කරමින් උස් හඬින් එසේ පවසමින් ඔහු යාච්ඤා කළා. මිය යන සෑම සෙබලෙක් වෙනුවෙන් ඔවුන්ගේ බිරින්දෑවරුන් හා දරුවන් වෙනුවෙන් කඳුළු වගුරුවමින් යාච්ඤා කළා. යුද්ධය අවසන් වන විට ඔහුගේ බර රාත්තල් හතලිහකින් අඩු වී තිබුණා.

සිවිල් යුද්ධයේ උග්‍රම මොහොතක ලින්කන්ගේ මුවින් නික්මුන මෙම වදන් මා මවිතයට පත් කරනවා. "මම කැමැත්තේ මේ පරිපාලන කටයුතු මෙහෙයවද්දී අවසානයේ දී බලය හැසිරවීම නැති විටකදී පවා මිහිතලයේ සිටින සියලුම මිතුරන් මට නැති වුව ද **<u>අඩු තරමේ එක මිතුරෙකු මට ඉතිරිව සිටිය දී ඒ මිතුරා මගේ ගැඹුරින්ම සිටිය දී පවා මා ජය ගැනීමට බැඳී නැත.</u>** එහෙත් මා සත්‍යයට බැඳී ඇත. මා ජයග්‍රහණයට බැඳී නැත. එහෙත් මා සතුව ඇති ආලෝකයට බැඳී ජීවත් වෙමි." එය මුළුමනින්ම "පියාණෙනි, මගේ කැමැත්ත ලෙස නොව ඔබගේ කැමැත්ත ලෙස සිදුවේවා ! යි පැවසීමක්. ඒබ්‍රහම් ලින්කන්ගේ ක්‍රියාකාරිත්වයේ තවත් පැතිකඩක් ද මා මවිතයට පත් කරනවා. ඔහු ජනාධිපති වූ විට ඔහු ඇමතිවරුන් හා රාජ්‍ය නිලධාරීන් වශයෙන් තෝරාගත් බොහෝ දෙනෙක් ඔහු ජනාධිපති වීමට පෙර ජීවිතයේ ඔහුව හෙලා දුටු ඔහු ප්‍රසිද්ධියේ අගෞරවයට පත් කළ චරිතයි. ඔවුන් සමග ලින්කන්ගේ ක්‍රියාකාරිත්වය මුළුමනින්ම කන්ද උඩ දේශනය ක්‍රියාවට නැගීමක්. ඔවුන්ව උසස් තනතුරුවලට පත් කළ පසු ද ලින්කන් ජනාධිපති තුමාව අගෞරවයට පීඩාවට පත් කළ චරිත අතර කැපී පෙනෙනවා, ස්ටැන්ටන්, බේට්ස්, චේස් හා ස්වෝඩ්. 'ස්ටැන්ටන් ඔහුගේ මිතුරකුට වරක් මෙසේ පැවසුවා. "චාලි, උඹ හරි මෝඩයෙක්.

ගෝරිල්ලො බලන්න මොකටද අප්‍රිකාවට ගියේ? නියම ගෝරිල්ලා ධවල මන්දිරයේ පුටුවක ඉඳගෙන කස කස ඉන්නවා නේ." වෙඩි වැදුණු ලින්කන් වෝඩ් නෘත්‍ය ශාලාව ඉදිරිපස නිවෙසක මරණාසන්නව වැතිර සිටින විට 'වේදනාත්මක මුග්ධයා' යැයි ඔහුට වරක් පරිභව කළ ස්ටැන්ටන් ලින්කන් ගැන ප්‍රකාශ කළේ මෙසේය. "ලෝකය සදාකාලයටම දැක ඇති ඉමහත් පරිපූර්ණ ලෙස මිනිසුන් පාලනය කළ තැනැත්තා මෙහි වැතිර සිටී."

කැබිනට් මණ්ඩලය සමගත් තම බිරිඳ වන මාරි ටොඩ් සමගත් ක්‍රියා කිරීමේදී ලින්කන් ක්‍රිස්තුවරයෙකු මෙන් ක්‍රියා කළ බව ඒ පොතේ කතුවරයා සටහන් කර තිබෙනවා. පුංචි දෙයටත් දික්කසාද වන අයට ලින්කන් තම මරණය දක්වාම මාරි ටොඩ් වැනි බිරිඳක සමග ගතකළ ජීවිතය අභියෝගයක්. සමාජ හා දේශපාලන ක්‍රියාකාරීත්වයන් තුළ ද කන්ද උඩ දේශනාව ප්‍රබලව ක්‍රියාවට නැගූ ඒ අධ්‍යාත්මික දැවන්තයින් දෙදෙනාට - මහත්මා ගාන්ධි හා ඒබ්‍රහම් ලින්කන්- කරන ගෞරවයක් හැටියට 'ලුවී ෆිෂර්ගේ මහත්මා ගාන්ධි' පොතෙන් උපුටා ගත් මේ වචන ස්වල්පය සටහන් කරන්නට මා කැමතියි. "1948 නොවැම්බර් 10, එක්සත් ජනපද හමුදාවේ මාණ්ඩලික ප්‍රධානි ජනරාල් ඕමාර් N. බ්‍රැඩ්ලි බොස්ටන්හි දී මෙසේ පැවසිය. අපට විද්‍යාවේ මිනිසුන් ඕනෑවටත් වඩා සිටිති. එහෙත් දෙවියන්ගේ මිනිසුන් සිටින්නේ ටික දෙනෙකි. අපි පරමාණුවේ රහස බදා ගතිමු. කන්ද උඩ දේශනාව ඉවත දැමුවෙමු. ලෝකය විසින් ප්‍රඥාවෙන් තොර විශිෂ්ඨත්වයත් හෘදයසාක්ෂියෙන් තොර බලයත් දිනාගෙන ඇත්තේය. අපේ ලෝකය වූකලි න්‍යෂ්ටික යෝධයන්ගේ ද ගුණධාර්මික ළදරුවන්ගේ ද ලෝකයකි. අපි සාමය ගැන දන්නවාට වඩා යුද්ධය ගැන දනිමු. ජීවත් වෙනවාට වඩා ඝාතනය කිරීම ගැන දනිමු. ගාන්ධි පරමාණුව ඉවත දමා කන්ද උඩ දේශනාව බදා ගත්තේය. ඔහු න්‍යෂ්ටික ළදරුවෙක් ද ගුණධාර්මික යෝධයෙක් ද වූයේය."

දැනට උදා වී ඇති ධර්ම අධර්ම මහා අරගලයේදී ආගමික වන්දනා ස්ථාන වසර ගණන් එක දිගට වැසී යන අවස්ථා පැමිණේවි. ඇතුළු ගෙට වැදී යාච්ඤා කළ යුතු කාලය පැමිණේවි. ඒ තුළ ද අප අධ්‍යාත්මිකව වැඩි වර්ධනය විය යුතුයි. ඒ සඳහා ඒබ්‍රහම් ලින්කන් තුමාගේ ජීවිත පැවැත්මෙන් ලැබෙන පිටිවහල විශාලයි. ඔහුගේ ජීවිතයේ අරමුණේ අවංකභාවයයි, මුල් තැන ගත්තේ. ඊට පසුවයි, ශු. බයිබලය හා යාච්ඤා ජීවිතය. අරමුණේ අවංකභාවය ඇත්නම් පමණයි, ශු. බයිබලය නිසි ලෙස අවබෝධ වන්නේ, ශුද්ධාත්මයාණන් එය නිසි ලෙස අවබෝධ කර දෙන්නේ. අරමුණේ අවංකභාවය ඇත්නම් ශු. බයිබලය ඔහුට ගැළවීමේ මගක්. අරමුණේ අවංකභාවය නැත්නම් දේව වචනය වුනත් ඔහුට පැකිලීමේ ගලක්. අනෙකුත් ආගම් හා ආගමික ශුද්ධ ග්‍රන්ථ ගැනත් මට කියන්නට ඇත්තේ එයයි. ධම්ම හෙවත් ධර්මයාණන් හා සමීප ඇසුරක් පවත්වා ගනිමු. "මම ඔබ සමග සිටිමි. මම ඔබට ප්‍රේම කරමි. බිය නොවන්න, නොකැළඹෙන්න." ධර්මයාණන් එසේ පවසනවා. එය තරයේ අදහමින් ජේසු සමිඳුන් හා (ධර්මයාණන් හා) සමීප සබඳතාවයක් ඇතිකර ගනිමු. එය ආදරණීය ප්‍රීතිමත්, සුන්දර අත්දැකීමක් වනු නිසැකයි. "අඩු තරමේ එක මිතුරකු මට ඉතිරිව සිටියදී ඒ මිතුරා මා තුළ ගැඹුරින්ම සිටියදී ---" එය ඒබ්‍රහම් ලින්කන් තුමාගේ අත්දැකීමයි. එතුමා ප්‍රසිද්ධිය හෝ මනුෂ්‍ය ගෞරවය ලැබීම උදෙසා කිසිසේත් ක්‍රියා කළේ නැහැ. එතුමා මෙසේ ද පවසනවා. "මම කිසිවක් කිසිවෙකුට නොපැවසුවෙමි. එහෙත් මම මට සහ මගේ නිර්මාතෘවරයාණන්ට පොරොන්දු වී ඇත්තෙමි."

**4.** කෙටි කාලපරාසයක් තුළ ලෝක ජනගහණයෙන් තුනෙන් දෙකක් මිහිතලයෙන් සමුගන්නට සිදුවීම මනුෂ්‍ය මනස්වලට ඔරොත්තු නොදෙනු ඇත. ඒත් 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයේ 56-60 පරිච්ඡේදවල මා සටහන් කළ ජේසු සමිඳුන්ගේ වදන් නිසැකවම ඔබට ඒ සියල්ලට මුහුණදීම සඳහා අවැසි පන්නරය සපයනු ඇත. ජේසු සමිඳුන්ගේ නාමයෙන් ලොව පුරා දිවි පුදන්නට සිදුවන විශාල ජනතාව ද මිහිතලයෙන් සමුගන්නා ඒ පිරිසට ඇතුලත් වනු ඇත. දෙවි සමිඳුන්ගේ ඉදිරි ප්‍රබල ක්‍රියාවන්, උන්වහන්සේගේ ප්‍රබල බාහු බලය දකින විට කිතුනු නාමය දරන ජනතාව විශ්වාසයෙන් වඩාත් සවිමත් වෙමින් ජේසු සමිඳුන්ගේ නාමයෙන් දිවි පුදන්නට එඩිතර වනු ඇත. මුල් සභා යුගයේ සිදුවූ ඒ දෙය නැවත ද සිදුවනු ඇත. දේවස්ථාන සියල්ල වැසී ගියත් අසල්වැසි පවුල් කීපය දැනට ඇති සියලු භේද අවසන් කොට කුඩා කිතුනු ඒකක ලෙස ස්ව කැමැත්තෙන්ම එක්රැස් වනු ඇත, ජේසු සමිඳුන් තුළ එක්සිත් වනු ඇත. එය පීඩන සමයක එක්ව යාච්ඤා කරන්නට සවියකි, ජේසු සමිඳුන්ගේ නාමයෙන් එක්ව දිවි පුදන්නට සවියකි. ඔවුන් තමා සතු සියල්ල පොදුවේ තබා ගනු ඇත, එකිනෙකා හා බෙදා ගනු ඇත. මේ සියලු පීඩා මැද මුල් කිතුනු සභාව මෙන් ජේසු සමිඳුන් තුළ පමණක්ම ඔවුන් යැපෙනු ඇත. බලවතුන්, දේශපාලකයන් මත ඔවුන් කිසිසේත්ම නොයැපෙනු ඇත. ක්‍රියා 2: 42-47, 4: 32-37 යුගාන්තයේ සිදුවන එම ක්‍රියාවන්ට පෙරහුරුවක් වනු ඇත.

කුඩා දරුවන් දැහැමි යුගයට සුදුසු පරිදි හැඩගස්වන්න. දුගී සරල ජීවිතයක් අත්දකින්නට ඔවුන් යොමු කරන්න. අන්ත දුගී දරුවන් විඳින දුක ඔබේ දරුවන්ට දකින්නට සලස්වන්න. එවිට ඔබේ දරුවා ඔහුගේ සෙල්ලම් බඩු හා ඔහුට ලැබෙන රසකැවිලි ආදිය ඔවුන් සමග බෙදා ගන්නට උත්සුක වනු ඇත. මිනිසා රැස්කරගෙන තිබෙන ලෞකික ධනය තව දුරටත් පලදායි නොවන මොහොතක් පැමිණෙනු ඇත. එනිසා ඒවා දුගීන් හා බෙදා ගන්න. එලෙස දීමේ ප්‍රීතිය අත්දකින්න. පැරණි ගිවිසුම් යුගයේ පැවති සබත් වසර හා ජුබිලි වසර මුල්කරගත් ප්‍රතිපදාවන් හා කෘෂිකර්මයට අදාලව පැවති සම්ප්‍රදායන් (අස්වනු නෙලීමේදී වැටුණු කරල් අහුලන්නෙ නැහැ එය දුගීන් වෙනුවෙන් ඉතිරි කරනවා. අස්වනු නෙලීමේදී වැටමායිමේ සියලුම කරල් කපා නොගෙන එයින් කොටසක් දුගීන් වෙනුවෙන් ඉතිරි කිරීම) ඒ තත්ත්වය නව ගිවිසුම් යුගයට ඇතුලු නොවීම ලොකු පාඩුවක්. එය එදා උපකාරි වුණා, සමාජයේ ආර්ථික විෂමතාවයන් අඩු කරන්නට. එනිසා එළඹ ඇති මෙම යුගාන්තයේ දී වත් එදා ජුබිලි වසරේ සිදුවූවාක් මෙන් ණය හා පොලි මුදල් තුළ සිරවී සිටින සියලු පීඩිතයන් ඔබගේ ස්ව කැමැත්තෙන්ම නිදහස් කරමින් උදාවන ක්‍රිස්තු පුනරාගමනයට සූදානම් වන්න. (මුදල් පොලියට දෙන්නට පැරණි ගිවිසුම් යුගයේවත් දේව ජනතාවට දෙවිඳුන්ගෙන් අවසරයක් තිබුණෙ නැහැ.)

දෙවි පියාණන්ගේ මහා පවිත්‍රකරණය උදෙසා සිදුවන බොහෝ කඩාවැටීම් ඉදිරියේ ඔබ සැලෙන්නට පුළුවන්. ඒත් දෙවිඳුන් නාස්ති කිරීමක් නොවෙයි, ගොඩනැගීමක් කරමින් සිටින්නේ. එනිසා අද ඔබගේ දරුවන්ගේ අධ්‍යාපනයේ කඩාවැටීම් ගැන බිය නොවන්න. ඉක්මනින්ම දරුවන් ඉගෙනගත යුතුම දේ හොඳින් ඉගෙනගනු ඇත. රතු ඉන්දියානු ජනතාවගේ නායකයාව සිටි සියැටල් එදා සිය දෙසුමේ පැවසූ පුරාතන දහම ඔවුන් හෙට ජීවත් කරවනු ඇත. ලියෝ ටෝල්ස්ටෝයි විසින් ලියන ලද අවසන් පොතයි, ‘What is Art’ (එය 'කලාව යනු කුමක්ද' නමින් සිංහලෙන් ද පළ වී තිබෙනවා.) එය සියල්ලන්ගේ අධ්‍යයනයට ඉතාම සුදුසුයි. එතුමා එය ලියන්නේ තුන් කල් දන්නා මුනිවරයෙකු හැටියටයි. අවසානයේ ඉතිරි වන්නේ ක්‍රිස්තියානි ආගමික සංජානනය පමණක් බව ඔහු එහි පවසනවා. කුමක්ද, ක්‍රිස්තියානි ආගමික සංජානනය? එතුමා එය මෙලෙස සටහන් කර තිබෙනවා. “දෙවියන් වහන්සේ අපගේ පියාණෝය. අප සැම උන්වහන්සේගේ දරුවෝය. එනිසා ලෝ වැසි අප සියලු දෙනා සහෝදර සහෝදරියෝ ය.” ලියෝ ටෝල්ස්ටෝයි උදා වන නව යුගය ගැන ඉතා අර්ථවත් කරුණු රැසක් එහි සටහන් කර තිබෙනවා. එදා තෙසලෝනිකවරුන්ගෙන් සමහරෙක් සියලු වැඩකටයුතු නවත්වා ක්‍රිස්තු පුනරාගමනය බලා සිටියාක් මෙන් නොසිට අග දක්වාම ඔබ විසින් කළ යුතු සියලු වැඩකටයුතු නිසි ලෙස ඉටුකරන්න. ඔබ සඳහා දැන් ඉදිකරමින් සිටින නිවෙස හොඳින් නිම කරන්න. මා එසේ කියන්නේ ඇයි? නපුරා දහස් වසරකට බැඳ දමමින් දැහැමි දහස් වසර උදා වන්නේ මේ පොළොව මතමයි, දහස් වසරකින් පසු නපුරා නැවත ලිහා දැමීමක් සිදුවන්නේ මේ පොළොව මතමයි. ඉන් පසුවයි, නව අහසක නව පොළොවක උදාව සිදුවන්නේ. එළිදරව් පොත අනුව එය පැහැදිලියි. දිවැසිවරුන් දැහැමි යුගය ගැන කතා කිරීමේදී අදහස් කළේ නව අහසත් නව පොළොවත් තුළ ස්වර්ගීය ජීවිතය ගැන නම් ඔවුන් මෙතරම් පොරොන්දු රැසක් දිය යුතු නැත. “ඉන්පසු ඔවුහු මහෝත්තමයාණන් සමග පරමානන්දයෙහි වෙසෙති.” යනුවෙන් ඔවුන්ට ලියන්නට හැකිව තිබුණා.

දැහැමි යුගය ගැන පොරොන්දු සියල්ල ඉටුවනුයේ මේ පොළොව මතමයි. මනුෂ්‍යයාගේ වැටීම නිසා සිදුවූ විපත් සියල්ල දෙවියන් වහන්සේ පොළොවෙන් දුරු කරනු ඇත; සියලු වස විෂ පොළොවෙන් බැහැර කරනු ඇත; සශ්‍රීකත්වය පොළොව මත වගුරුවනු ඇත; භූමිය සියල්ලන් සතු පොදු උරුමය වනු ඇත; සියල්ලන් තම දෑත දෙපයින් වැඩ කරනු ඇත; උපයන දේ එකිනෙකා අතර හුවමාරු කර ගනු ඇත; අඟහිඟ ඇති කිසිවෙක් නොසිටිනු ඇත; එකිනෙකා ඉක්මවා යන්නට තිබුණු තරඟය මුළුමනින් අවසන් වනු ඇත. “කුඩා දරුවා නයාගේ තුඹස මත සෙල්ලම් කරනු ඇත කිසිදු විපතක් තවත් නැත. මනුෂ්‍යයා තම අත්තික්කා ගස යට මිදිවැල යට ප්‍රීතියෙන් වෙසෙනු ඇත..“ දිවැසිවරු එසේ පවසා ඇත. එවිට සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන් තුමා පැවසූ මෙම තත්ත්වය උදාවනු ඇත. “භෞතික සුරක්ෂිතභාවය පිණිස කරන අරගලයෙන් නිදහස් වූ කල මිනිසා කුඩා මැවුම්කරුවෙකු වනු ඇත.” එවිට අනාගත කලාව ගැන කතා කරමින් ලියෝ ටෝල්ස්ටෝයි පැවසූ දේ ඉටුවනු ඇත. අනාගත කලාකරුවන් තම නිර්මාණ මගින් දෙවිඳුන් හා ගැඹුරු සුසංයෝගයක් ඇතිව දිවි ගෙවන්නට ද දෙවිඳුන් තුළ සියලු මනුෂ්‍යයන් සුසංගමයට පමුණුවන්නට ද ක්‍රියා කරනු ඇත. ඒ උතුම් උදාවට පෙර පවතින මහා ධර්ම අධර්ම යුද්ධය තුළයි, අද අප දිවි ගෙවන්නේ. එනිසා, “අවදිව සිටින්න ඔබට කියන දේ හැමටම කියමි. අවදිව සිටින්න.” (මාක් 13: 37) ජේසු සමිඳුන් එදා ශ්‍රාවකයන් අමතා පැවසූ ඒ අවවාදයෙහි සියල්ලන්

දැඩි ලෙසම පිහිටා සිටිය යුතු අවදියයි, මේ. මැවුම්කරුවාණන් වන සැබෑ එකම දෙවියන් වහන්සේ ප්‍රඥාවේ පරිපූර්ණත්වයයි. එනිසා දැහැමි යුගයක උදාව උදෙසා සිදුවන උන්වහන්සේගේ මහා පවිත්‍රකරණය කෙතරම් දුෂ්කර වුව ද අපි එය ස්තුතියෙන් ප්‍රශංසාවෙන් යුතුව භාර ගනිමු. එය, "පියාණෙනි, ඔබගේ නාමය ශුද්ධ වේවා !" යි පැවසීමක්. යුගාන්තය උදෙසා දෙවි පියාණන්ගේ මහා පවිත්‍රකරණය ගැන මා විසින් කිව යුතුව තිබුණු සියල්ල 56-60 පරිච්ඡේද තුළින් ඔබ ඉදිරියේ තබන්නට මා ක්‍රියා කළා. එහි යම් ඌණතාවයක් වී නම් මේ උපුටා ගැනීම එය ද සපුරනු ඇත. මරියා ඩිවයින් මර්සි තුමිය මගින් ජේසු සමිඳුන් මෙසේ පවසනවා. "මගේ ශරීරය කුරුසිය මත ඇණගසා මරා දමනු ලැබුවත් මගේ මරණය ඔබට ජීවනය ලබා දුන්නේය. මගේ දෙවන පැමිණීම සඳහා වන මෙම කාලයේදී ද මගේ ශරීරයට එම වදගාවිනා දරන්නට සිදුවේ. මේ අවස්ථාවේ එය සිදුවන්නේ මගේ අභිරහස්මය ශරීරය වන මගේ සභාවට ය." (2013 මාර්තු 27)

**5.** 2021 නොවැම්බර් 4 වන දින කිතු දන පුබුදු අධ්‍යක්ෂ ගරු සිරි ඔස්කා අබයරත්න පියතුමා වසර 89ක් ආයු වළඳා සග සැපත් වුණා. එතුමා මගේ ගුරු ය. -අද, 2021 නොවැම්බර් 12 වන සිකුරාදා- මා පුබුදුවෙන් ගිලිහී ගොස් අද වසර 36ක් සම්පූර්ණ වෙනවා. එය මා අත්දුටු වසර 36ක සත්‍යග්‍රහයක්. එය කිසිවකු පරාජය නොවන සියල්ලන් ජය ගන්නා උතුම් තත්ත්වයකින් නිමා වීම ගැන මා සතුටු වෙනවා. 'ශුද්ධාත්ම පිය සටහන්' 11 පරිච්ඡේදයේ මා තැබූ සටහනක් මේ මොහොතේ නැවත උපුටා දක්වන්නට මා කැමතියි. "මා සමිඳුන් සුරතේ සියලු කැඩීම් හා ඇඹිම්වලට නතු වුයේ එතුමන්ගේ මෙහෙය වීමට මෙතෙක් ද අවනත වුයේ මගේ පෞද්ගලික විමුක්තිය සඳහා නොවේ, මගේ ආත්ම තෘප්තිය සඳහා ද නොවේ, මිනිස් සංහතියේ විමුක්තිය උදෙසාය. ඒ සඳහා ජේසු සමිඳුන්ගේ දෙවන පැමිණීම කඩිනම් කරනු සඳහා ය. පූර්ණ අර්බුදයකට මුහුණ දී සිටින මිනිස් සංහතියට සැනසීම උදා වන්නේ ජේසු සමිඳුන්ගේ දෙවන පැමිණීමෙන් පමණි. සමිඳුන් පෙන්වන මාවතේ පියවරෙන් පියවර පැමිණ එනිසා ලොකු වියවුලක, ලොකු අගාධයක වැටුණොත් ඒ තුළ ද සමිඳාණන් වහන්සේට විශාල සැලැස්මක් ඇති බව තේරුම් ගෙන එතුමන්ට අවැසි මොහොතේ එතුමන් විසින්ම මා අගාධයෙන් ඔසවන්නට ඉඩ දී බලා සිටියොත් එතුමන්ට මා වෙනුවෙන් සුළැඟිල්ලක් හෝ සොලවන්නට සිදුවනු ඇත. එයින් ඇරඹෙන ක්‍රියාවලිය තුළින් විශ්වයම සෙලවෙනු ඇත. සමිඳුන් අත ගත් ගමනක් මා පැමිණියේ ඒ සඳහාය. ඊට අඩු දෙයක් සඳහා නොවේ. එය මහෝත්තමයාණන් මා තුළ තබා තිබෙන මහා සිහිනයයි." ඒ සිහිනය අද සැබෑවක් වෙමින් තිබීම ගැන මා සතුටු වෙනවා.

1996 ජුනි 7 සිට මා යෙදී සිටින ගමන අසම්මතයක්. එනිසා මේ අසම්මතය සම්මත වන තුරුම සියල්ල අසම්මත ලෙස සිදුවනු ඇත. යම් මොහොතක අසම්මතය සම්මතයක් කරන්නේ ජේසු සමිඳුන් විසින්මයි. ජේසු සමිඳුන් මෙසේ පවසා තිබෙනවා. "සියලු කඳුහෙල් සමතලා කරමින් මා තෝරා ගත් සංඝය වන නුඹලා මම පෙරටම ගෙන යන්නෙමි. ඒ සඳහා වන සියල්ල මම ම කරමි. මා කියන දේ පමණක් නුඹලා කළ යුතුයි." 'දහම් නවෝදය' සංඝය ලෙස අපට යන්නට සිදුවන කටුක බිහිසුණු ඉදිරි ගමන් මග පුරාම ගරු ඔස්කා පියතුමා ජේසු සමිඳුන් අබියස අප වෙනුවෙන් යාච්ඤාවෙන් මැදිහත් වන බව මා නිසැකවම දන්නවා. 'මා සෙවූ දෙය මට හමු විය' නිර්මාණයේදී කාර්ලෝ කරෙත්තෝ සහා මාතාව පැසසුවේ පහත සඳහන් වදන්වලිනි. එම වදන්වලින්ම මගේ ආදරණීය ගුරු, ගරු සිරි ඔස්කා අබයරත්න පියතුමා මම මෙලෙස පසසනවා. (කාර්ලෝ කරෙත්තෝ යෙදූ මෑණියෙනි වචනය වෙනුවට මම පියාණෙනි වචනය යොදා ගන්නවා.)

"පියාණෙනි, මා ඔබට කෙතරම් අවලාද කිව යුතුද?
එහෙත් මම ඔබට බොහෝ සේ ආදරය කරමි.
අන් කිසිවෙකුට වඩා ඔබ මට වේදනා ගෙන දී ඇත.
එහෙත් අන් කිසිවෙකුට වඩා මම ඔබට සදා ණයගැති වෙමි.
ඔබ මා ඉමහත් අපකීර්තියට පත්කර ඇත.
එහෙත් ශුද්ධවත් බව වටහා ගන්නට ඔබ හැර මට සහාය වුයේ වෙන කවුරුන්ද?"

## 61.

### මේ බිහිසුණු තත්ත්වය ජය ගන්න නම් යාච්ඤාවේ ප්‍රබලම තැන ඔබ ඉන්න ඕනෑ. යාච්ඤාවේ ප්‍රබලත්වය දිස් වන්න ඕනෑ. ඒ ගැඹුරු යාච්ඤාව තුළ තමයි, පියාණන් සියල්ල ස්පර්ශ කරල ජයග්‍රහණය උදා කරන්නේ."

'ශුද්ධාත්ම පිය සටහන්' 56-60 පරිච්ඡේදවලින් මා ඇමතුවේ කතෝලික, කිතුනු ජනතාවට පමණක් නොව ඕනෑම ආගමක් අදහන හෝ කිසිදු ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන්ටයි. ලෝ වැසි සියල්ලන් දැන් මුහුණ දෙමින් සිටින්නේ ධර්ම අධර්ම මහා යුද්ධයටයි, ඒ සඳහා දෙවි පියාණන්ගේ මහා පවිත්‍රකරණයටයි. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ඉදිරියේ සිදුවන මහා කැළඹීම් තුළ මහා විනාශයන් තුළ කළකිරීම් නුඹලාට අනවශ්‍යයි. මන්ද, ඒ සියල්ල සිදුවන්නට නියමිතයි, ශුද්ධ ලියවිල්ල ඉටුවන පිණිස, මගේ මහා සැලැස්ම ඉටුවීම පිණිස." ('ශුද්ධාත්ම පිය සටහන්' 40 පරිච්ඡෙදය) දැන් සිදුවෙමින් තිබෙන්නේ දැහැමි යුගයේ උදාව උදෙසා මහා ප්‍රසව වේදනාවයි. පොත් දෙකක් පාදක කර ගනිමින් අප සමාජයේ පවතින අසාධාරණකම්වල පැතිකඩක් විග්‍රහ කරන ලිපියක ප්‍රවීන ලේඛිකා කැත්ලීන් ජයවර්ධන මහත්මිය මෙසේ පවසන්නීය. ('අනිද්දා' ඉරු දින පුවත්පතකි. 2022.05.08) මෙය ඒ ලිපියේ අවසන් ජේදයයි.

"සියලු වාර්ගිකයන්ට ජීවත්වීමේ සමාන අයිතියක් ඇති බව අද දවසේ දී පිළිගන්නේ දියුණු මිනිසුන්ය. මේ පිළිගැනීම, මේ වැටහීම වඩාත් දියුණු ඉසව්වක් කරා ප්‍රසාරණය වන මතු යම් දිනෙක මානව දයාව (මානව වර්ගයා) අසල නැංගුරම් ලෑම වෙනුවට සකලවිධ සත්ත්ව ප්‍රභේද කෙරෙහි දයාන්විත වීමට මිනිසා යොමුවනු ඇතැයි අපි සිතමු. එහිදී මිනිස් වර්ගයා කෙරෙහි මෙන්ම සමස්ත ජීවින් කෙරෙහි ද ඒ සමානාත්මතා ගුණය පැතිර වීමට මිනිසාට හැකිවනු ඇතැයි අපි විශ්වාස කරමු. සියලු වර්ගභේද, වර්ගවාද සහමුලින්ම ඉවත හෙළීමක් සර්වප්‍රකාරයෙන්ම පිරිපහදු වීමක් ලෙස අපට පෙනී යන්නේ එයයි. එහෙත් ඒ සඳහා මනුෂ්‍යයාට තව බොහෝ කාලයක් ගත කිරීමට සිදුවෙයි."

එහි අවසන් වැකිය ගැන ලොකු වගකීමකින් මම මෙලෙස පවසමි. ඒ සඳහා තව බොහෝ කාලයක් බලා සිටින්නට සිදුනොවේ. එය නුදුරේදී සිදුවෙයි. එය සමාජ අසාධාරණකම් තුළ විඳවන සියල්ලන්ට ශුභාරංචියකි. එය දැහැමි යුගයේ උදාවයි. ඒ සඳහායි, දෙවි පියාණන්ගේ මේ මහා පවිත්‍රකරණය, මේ මහා පිරිපහදුව. ජේසු සමිඳාණෝ මෙසේ ද පවසති.

**2022 අප්‍රේල් 27**

"ඉතින් කොහොමද, දරුවනේ? මේ යන ක්‍රමය හොඳයිද? පියාණන්ගේ පවිත්‍රකරණය වේගයෙන් සිදුවෙනවා. මීටත් වඩා අති බිහිසුණු තත්ත්වයක් උදා වෙනවා, මුළු ලෝකයටම. තුනෙන් දෙකේ පවිත්‍රකරණය ප්‍රකාශයට පත්කරල තියෙන්නෙ. දැන් තමයි ඒක වේගවත් වෙමින් තියෙන්නේ. ඉතින් හැම දේශයක්ම මේ මහා පවිත්‍රකරණයට ලක් වෙලා. නමුත් මා මීට කලකට පෙර ප්‍රකාශ කළා, අහෝ ! මේ දේශයට සිදුවන විපතක මහත කියල. අද ඒ විපත් පැමිණෙමින් තිබෙනවා. මා මීට කලින් විශේෂ පණිවුඩ කීපයක් නිකුත් කළානේ. ඒ පණිවුඩ තුළින් මා විශේෂයෙන් ඇමතුවා දේශය පාලනය කරන රාජ්‍ය නායකයින්ට. ජනතාව උදෙසා ඒ රාජ්‍ය නායකයින් කුමක්ද කළේ, ඒ රාජ්‍ය නායකයින්ව විශ්වාසයට ගෙන ජනතාව ඔවුන් උදෙසා කුමක්ද කළේ, කියන දේ ඔවුන්ට හිතන්නට මම ඉඩ හැරියා. ජනතාවට පොරොන්දු දීලා ඒ පොරොන්දු එලෙස ඉටුනොකළොත් ඔවුන්ට කුමක්ද සිදුවන්නෙ? දැන් දෙවි පියාණන් ඔවුන් මුළුමනින් නෙරපා දමන්නට සූදානම්ව සිටිනවා. එනිසා මහා කැළඹීමක් ජනතාව අතර ඇති කරමින් යුක්තිය උදෙසා කතා කරන්නට පියාණන් ඒ හැම දෙනෙක්වම පොළඹවමින් සිටිනවා. මෙය පියාණන් විසින් ආරම්භ කරන ලද මහා පවිත්‍රකරණයක්. මේ දේශය පවිත්‍ර කරන්නට දේශයේ විනාශයට හේතු වී ඇති සියල්ල වෙනස් විය යුතුයි. එයයි, දැන් සිදුවෙමින් යන්නෙ. එනිසා මා ප්‍රේමණීය දරුවෙනි, වැඩිහිටි බාල මහළු සියලු දෙනා මේ සටන උදෙසා කෙටි කාලයක් දුක් විඳින්නට සිදුවෙනවා.

ඉතින් ඔබ හැම කෙනෙක්ම මොන තරම් අභියෝග ඔබ මධ්‍යයට ආවත් ඔබ දෙවිඳුන් සමග නම් සිටින්නෙ එතුමන් ඔබව සුරකිනවා. ධර්මය තුළ ජීවත් වන්නා ධර්මය විසින් සුරකිනවා. මොන තරම් භයානක තත්ත්වයක් ආවත් දෙවිඳුන්ගේ සුළැඟිල්ලේ එල්ලී හෝ ගමනේ යන්නට ඔබ ඔබවම පවිත්‍ර කර ගන්න. අන් අය දෙසට ඇඟිල්ල දිගු කරන්නට නොවෙයි, තමා දෙසට නෙත් යොමු කරමින් ඔබගේ ඇතුලාන්තය පරීක්ෂා කර බලන්න. ඔබගේ දුබලතාවයන් ගැන පියාණන්ගේ සමාව ලබා ගන්න. තමා තමාව සූදානම් කර ගැනීම තුළ තමා දෙවියන් වහන්සේගේ කැමැත්තට

ආමෙන් කියන තැනට එන්න ඕනැ. තව නොබෝ දිනකින් මීටත් වඩා ඉතා බිහිසුණු තත්ත්වයක් එනවා. මා බොහෝ කලකට පෙර කිවා ආහාර හිඟයකට ද මුහුණ දෙන්නට සිදුවන බව.

මේ මොහොතෙ පියාණන්ගේ අඩවන් දෙනෙත් විවර වෙමින් තියෙන්නෙ. එනිසයි, මෙවැනි ආකාරයේ මහා පරික්ෂණයක ලෝකය තබල තියෙන්නෙ. දෙනෙත් පූර්ණව විවර වෙමින් තමයි පියාණන්ගේ පාද ස්පර්ශය පොළොවට වදින්නෙ. ඒ මොහොත දැන් ආසන්නයි. පියාණන්ගෙ පාද ස්පර්ශය පොළොවට (පෘථිවියට) වදිනකොට මිනිත්තු කිපයකට මුළු පොළෝතලයම සෙලවෙනු ඇත. එනිසා දෙවියන් වහන්සේ සමගම සිටින්න. ඔබගේ හුස්ම රඳා පවතින්නේ ස්වාමින් වහන්සෙගෙ සුරතේ. බොහෝ කෙටි කාලයකදී මහා බිහිසුණු තත්ත්වයක් මේ දේශය තුළ හටගන්නවා. එනිසා වැඩි වැඩියෙන් යාච්ඤාවට යොමු වන්න. ගැඹුරු යාච්ඤාවකට දැන් ජනතාව යොමු වෙමින් සිටිනවා. ජනතාවගේ ඒ යාච්ඤාවලට සවන් දෙමින් පියාණන්ගේ දයාව දැන් දේශය වෙත යොමුවෙලයි තියෙන්නෙ. මහා පවිත්‍රකරණයක් ඉතා වේගයෙන් සිදුකරල ජනතාවට යහපතක් උදාකර දීමයි, දැන් සිදුවෙමින් තිබෙන්නෙ. විශේෂයෙන් මේ දේශයේ සාධාරණය මම බොහොම ඉක්මනින් ඉටුකරල දෙනවා. මේ වර්ෂයත් මේ ආකාරයෙන් මහා පරික්ෂණයකට දාලයි තියෙන්නෙ. පවිත්‍ර වූ රාජ්‍යයක් පිහිටුවල ඒ හැම දෙයක්ම ඉක්මනින් මම සිදුකරනවා. එතකොට නිදහසේ ඔයාලගෙ දූ දරුවන්ගේ කටයුතු සිදුකර ගන්න පුළුවන්. එතෙක් මේ වර්ෂය තුළ අති භයානක තත්ත්වයක් තව ඉදිරියට තියෙන්නෙ.

ක්‍රිස්තු විරෝධියාගේ (Anti Christ) වැඩ දැන් ආරම්භ වෙලයි තියෙන්නෙ. එයින් කොටසක් තමයි මේ දේශපාලනයට ඇතුල් වෙලා තියෙන්නෙ. එයාගෙ සගයො ටික තමයි මේකෙ ඉන්නෙ. ඒක නිසයි බය නැතිව ඒ අයගෙ සහයෝගයෙන් මේ අය මෙතැන වැඩේ කරන්නට යන්නෙ. ඉතින් ඒ නිසා තමයි පියාණන් එදා දාවිත්ව ගොලියත් වෙතට යැව්වා වගේ දැන් කටයුතු කරමින් තිබෙන්නෙ. එදා දාවිත් දේව වචනයත් සමගයි එතැනට ගියෙ, එතැනට ගොස් ඔහු පැවසුවෙත් දේව වචනයයි. ඒ දේ තමා දැන් සිදුවන්නට යන්නෙ. පියාණන් දැන් ජනතාව කළඹවල තියෙන්නෙ. ඔබ ශුද්ධ බයිබලය කියවනව ඇතිනේ. ඒකෙ තිබෙන දේවල් තමයි, දැන් මේ දේශය තුළ සිදුවන්නෙ. යම් මොහොතක ජාති කුල ආගම් භේද වියැකෙමින් සියල්ලන් එකට එකතු වන තැනට දැන් පැමිණෙමින් තිබෙනවා. ඒ සියල්ලන් එකතු වෙලා මේ යක්ෂයා පරාජය කරන්නයි දැන් සූදානම් වන්නෙ. දැන් ජාති ආගම් කුල භේද සටන නොවෙයි, සියල්ලන් එකතු වෙලා යක්ෂයා පරාජය කරන්නට දැන් ඔවුන්ව ලුහුබඳිමින් ඉන්නවා. දැන් ජනතාව වියරුවැටිලා, ඒ හැම දේ තුළම අයහපත තුළ යහපත සිදුවන්නට යනවා. ජනතාව මෙතෙක් නොදුටු දේ දැන් දකිමින් තිබෙනවා. දැන් තමයි ජනතාවගේ ඇස් හොඳින් ඇරිල තියෙන්නෙ. එකිනෙක පක්ෂ පාට තෝරා ගෙන ජනතාව භේද වෙලා හිටියා. දැන් තමයි තේරුණේ ඒ කිසිම කෙනෙක්ගෙන් ඔවුන්ට සහනයක් නැහැ කියලා. ජනතාව දුක් විඳිනවා. පමණයි, ඒ දුක් විඳින දෙයින්වත් ඵලයක් ලබා ගන්න බැහැ, වෙනත් අය තමයි ඒකෙන් ඵලය භුක්ති විඳින්නේ. ඒ නිසා පියාණන්ගේ මහා පවිත්‍රකරණය ඇරඹිලා. ඒ මහා පවිත්‍රකරණය තමයි මේ සිදුවන්නෙ. සියලු රාජ්‍ය නායකයින්ටත් සියලු ජනතාවටත් පියාණන්ගෙ ප්‍රළඟ පණිවුඩය මම ළඟදීම චතුරංගට ලබා දෙනවා. ඒ වෙබ් අඩවියට දාන්න කියලා."

**2022 මැයි 19**

"දරුවෙනි, පියාණන්ගේ පරික්ෂණය හා පවිත්‍රකරණය හොඳින් සිදුවෙමින් පවතින බව ජේනවද? මේ දේශය ගැන පියාණන් බොහෝ සේ බලා සිටියා, දේශවාසි ජනතාව දෙස බලා සිටියා. මැවුම්කරුවාණන් තම මුළු මැවීම දෙස බලා සිටියා. මැවීමේ ප්‍රධානම දේ තමයි මනුෂ්‍යයා. මනුෂ්‍යයා අත්දකින මේ මහා පීඩනය, ඔහු අත්දකින ප්‍රෝඩාවන් නිසා මනුෂ්‍යයා බොහෝ සේ වේදනා විඳින ආකාරය දෙස පියාණන් ඉතා වේදනාවෙන් බලා සිටිනවා. ජනතාව පාලකයන් තෝරා ගන්නවා. ඔවුන් දුන් පොරොන්දු ඔවුන් ඉටුකරයි කියල ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒත් ඒ පාලකයන් ජනතාවගේ මාර්ගයෙන් ඉස්සරහට ගියා මිසක් තම තමන් උදෙසා යමක් කර ගත්තා මිසක් ජනතාව ගැන බැලුවෙ නැහැ. ඔවුන් ජනතාව තලා පෙලා දාන්න පටන් ගත්තා. පියාණන් දැන් මහා බිහිසුණු තත්ත්වයක් ඇති කරල මුළු දේශයම පවිත්‍ර කිරීම ආරම්භ කළා. එක් කෙනෙක් දෙන්නෙක්ව නොවෙයි, පාර්ලිමේන්තුවට අයිති සියල්ලන් එයින් එළියට දාන තුරුම පියාණන් මේ කාර්යය කරගෙන යනවා. ඒ සඳහා හෙට රට බාරගන්න සිටින තරුණ ජනතාව පියාණන් විසින් දැඩි කරලයි තියෙන්නෙ. අද තරුණ ජනතාව හුඟක් දැනුවත්. කවුද ඇත්ත කරන්නේ කවුද බොරුව කරන්නේ කියන එක ඔවුන්ට පැහැදිළියි. ඉදිරියේ උදාවන දැහැමි යුගය උදෙසා පියාණන් මේ තරුණ ජනතාව මෙවලමක් කර ගනිමින් සිටින්නෙ. යුක්තිය උදෙසා පෙනී සිටින්නට මේ තරුණ ජනතාව දැඩි කරල තියෙන්නෙ, දෙවි පියාණන් විසින්. මොන පීඩනයක් ආවත් මොන බිහිසුණු තත්ත්වයක් උදා වුණත් ජීවිත පරිත්‍යාගී කරමින් හෝ පෙරටම යන්නට ඔවුන්ට ආත්ම

ශක්තිය ධෛර්යය දීලා තියෙන්නෙ, දෙවි පියාණන්. ඒ දරුවන්ව ඉදිරියටම යවන්නට ඒ දෙමාපියන්ව ශක්තිමත් කරලයි තියෙන්නෙ, දෙවි පියාණන්.

මේ අරගලය මෙතැනින් නිමා වන්නෙ නැහැ. රටේ නායකත්වය සඳහා දෙවි පියාණන්ට සුදුසු කෙනා ඉස්මතු වන තුරුම මේ අරගලය මේ අය ඉදිරියටම ගෙන යනවා. ඒ සඳහා පියාණන් මහා පවිත්‍රකරණයක් සිදුකරනවා. එතෙක් මීට ද වඩා විනාශයන් සිදුවෙනවා, ලේ ගැලීම් සිදුවෙනවා, මහා ඛේදවාචකයක් බවට පත්වෙනවා. එහෙත් අවසානයේ දී පියාණන්ගේ සැලැස්ම ජයග්‍රහණය කරනවාමයි. යක්ෂයා අධර්මයේ ජයග්‍රහණය උදෙසා ඔහුගේ කොටස කරමින් සිටිනවා. මා ඊට කලින් රාජ්‍ය පාලනය ගැන පවසා තිබුණා, ජනතාවට දුන් පොරොන්දු නිසියාකාරව ඉටු නොකළොත් අහෝ ! ඔවුන්ට සිදුවන විපතක මහත කියල. ඒ විපත තමයි මේ සිදුවෙමින් පවතින්නෙ. දැන් ප්‍රෝඩාවන් ද සිදුවෙමින් තිබෙනවා. ඔවුන්ගේ නිවහන් ගිනි තැබීම් ඒ අය අතරින්මයි සිදුවන්නෙ. ඒ අය ඒවා නැවත ලැබෙනු ඇතැයි විශ්වාසයෙන් ඒවා සිදුවන්නෙ. අරගලයේ යෙදී සිටින තරුණයන් ඒවාට වැරදිකරුවන් කිරීම තමයි ඔවුන්ගේ සැලැස්ම. නමුත් මම ඒ සැලැස්ම පරාජය කරනවා. ඒ නිසා තමයි, රටේ නීති පද්ධතියම මම ජනතාවගේ පැත්තට නැඹුරු කෙරුවෙ. නීතිඥයින් කණ්ඩායම සාධාරණයේ අරගලය පැත්තට දැන් මා නැඹුරු කරලයි තියෙන්නෙ. ඒ අයගෙ ශක්තිය ඉදිරියේදීත් ඔවුන්ට ලැබෙනවා. සාධාරණය උදෙසා අරගලයක යෙදෙන මොවුන්ට පැරදුමක් ලබන්නට මා ඉඩ තබන්නෙ නැහැ. අසාධාරණකම් නිසා දැන් ජනතාව වියරුවැටිල කිවත් හරි, ඒක වියරුවක්ම නොවෙයි, ඒක තමයි ඒ අයගේ අයිතිය. තම අයිතිය උදෙසා ඔවුන් සටන් කරනවා.

මා මීට කලින් ප්‍රකාශ කළා වූ දේ නැවත ද ප්‍රකාශ කරනවා, රාජ්‍ය නායකයින්ට. ඒ රාජ්‍ය නායකයින් ද දෙවි පියාණන් වහන්සේගේ මැවීමක්. මොන ආගමක සිටියත් මේ සියල්ලෝම එකම ජනතාවක්. ඉතින් ඔවුනුත් සිදුවන්නට යන මහා විපතින් ආරක්ෂා වන්නට නම් එකිනෙකා තමා ගැන ගැඹුරින් මෙනෙහි කරමින් තම පාපි ස්වභාවය දකිමින් තමා යුක්තිසහගතව ද ක්‍රියා කළේ, අයුක්තිසහගතව ද ක්‍රියා කළේ එය ද ගැඹුරින් මෙනෙහි කරමින් දැන් සාධාරණත්වය උදෙසා අරගලයේ යෙදී සිටින ජනතාව අතට දීල ඒ අය පසුබැසිය යුතු මොහොතයි, දැන් උදා වී ඇත්තෙ. දැන් සාධාරණත්වය උදෙසා අරගලයක යෙදී සිටින තරුණ ජවයට ඉඩ දිය යුතු මොහොතයි. මා මැවුම්කරුවාණන් හැටියට ඔබ සැම මැවුම්කරුවාණන්ගේ පුත්‍රයන් හැටියට මා දේශයේ පාලකයන්ගෙන් ඉල්ලා සිටින්නෙ දැන් නිහතමානි වෙලා පහුබැහැල සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින තරුණ ජනතාවට දීල ඒ ගෞරවයත් රැගෙන මෙතැනින් ඉවත් වන්න කියන එකයි. එසේ නොවුණොතින් තත්ත්වය මීට ද වඩා බිහිසුණු වෙනවා. අවි ගත්තෝ අවියෙන් නසිති කියන්නෙ ඒකයි. ඒ දේ තමයි ඉදිරියේ සිදුවන්නට යන්නෙ. භීෂණය බොරුව හොරකම නිසා ලෝකයම හෙලා දකින තැනට මේ දේශය පත්වෙලා. මේ දේශයේ නායකයින් ගැන දැනටමත් ලෝකයේ බොහෝ අය දැනගෙන ඉවරයි. ඉතින් ඒ නිසා තව දුරටත් බොරුවට ඉඩ නැහැ.

දරුවෙනි, දැන් මම ඔබ සැම දෙනාගෙන්ම ඉල්ලන්නෙ යාච්ඤාවයි. ඒ යාච්ඤාවේදී ඔබ ආත්මගත වෙන්න ඕනැ, ඒ තරුණ ජනතාව සමග. ඔවුන් යුක්තිය උදෙසායි සටන් වදින්නෙ, තමන් උදෙසා නොවෙයි. මුළු මහත් ජනතාව උදෙසායි ඔවුන් සටන් වදින්නෙ. මා තෝරාගත් සංඝයේ ශ්‍රාවකයින් හැටියට ඔබගේ යාච්ඤාව මීට වඩා බලගතු කරගන්න ඕනැ. මේ මොහොතෙ ඔබ පිරිසක් සමග එක්ව යාච්ඤා කරද්දී හෝ තනියම යාච්ඤා කරද්දි ඔබ ආත්මගත වෙන්න ඕනැ, අර තරුණ දරුවන් එක්ක. ඒ අය එතැන සාධාරණය උදෙසා සටන් කරද්දී ඒ අය සමග යාච්ඤාවෙන් සම්බන්ධ වෙන්න ඕනැ. ඒකයි, මේ මොහොතෙ මා ඔබගෙන් බලාපොරොත්තු වන්නෙ. මොකද එන්න එන්නම රටේ තත්ත්වය බිහිසුණුයි . ඉදිරියෙදී කෑමට දෙයක් නැතිව මීට ද වඩා භයානක තැනට එනවා. මේ බිහිසුණු තත්ත්වය ජය ගන්න නම් යාච්ඤාවේ ප්‍රබලම තැන ඔබ ඉන්න ඕනැ, යාච්ඤාවේ ප්‍රබලත්වය දිස් වන්න ඕනැ. ඒ ගැඹුරු යාච්ඤාව තුළ තමයි, පියාණන් සියල්ල ස්පර්ශ කරල ජයග්‍රහණය උදා කරන්නෙ. මා මීට පෙර ඔබට කියල තියෙනවා ඔබ වෙහෙස මහන්සි වෙලා නම් ඉන්නෙ ගොඩාක් යාච්ඤා අවශ්‍ය නැහැ, ජේසුනී කියල ගැඹුරින් කීවත් ඇති කියල. මේ මොහොතෙ මගේ ශ්‍රාවකයින් වන ඔබට මා එසේ කියන්නෙ නැහැ. දරුවෙනි, දැන් තමයි යාච්ඤාව ප්‍රබලවම අවශ්‍ය මොහොත.

සාධාරණය උදෙසා අරගලයක යෙදෙන ඒ දරුවන්ට ආරක්ෂාව පතා සියලු ශුද්ධවන්තයින්ව ඔබගේ යාච්ඤාව තුළ ඒ පිට්ටනියට යවන්න, ඔබගේ මනසින්. සාධාරණය උදෙසා අරගලයක යෙදෙන ඒ දරුවන්ට සවියක් වන්නට අග්‍ර දූතයින් ඒ අරගල භූමියට කැඳවන්න, ඔබගේ යාච්ඤාව තුළ. අග්‍ර දූතයින් ඔවුන්ගේ ශරීරයට ආත්මානුභාවයෙන් ඇතුළු වෙලා හරි ඒ ප්‍රබල බලය අරගෙන අසාධාරණයට විරුද්ධව සටන් කරන්නට සාධාරණය ජය ගන්නට අග්‍ර දූතයින්ගේ ඒ බල මහිමය ඒ අයට ඉල්ලල දෙන්න, ඔබගේ යාච්ඤාව තුළ. සියලු සුර දූත

සේනාවට ආරාධනා කරල කියන්න මේ දරුවන්ට ඇතුල් වෙලා ඔවුන් මහත් ජවයකින් පුරවමින් සත්‍යයේ සාධාරණයේ කොඩිය ජය කනුව කරාම ගෙන යන්නට උපකාරී වනු ලෙස. එසේම සමිඳාණන් වහන්සේ ඉදිරියේ බලගතුව මොරගසන්න, දේශය ඔසවන, ජනතාවට සෙත සලසන කෙනාව ඔවුන් අතර තබමින් තෝරා ගනිමින් ස්ථිර කරන්න කියල. දේශයේ ලෝකයේ පාලකයින් ආගමික නායකයින් ඇතුළු සියල්ලන් උදෙසා මා දුන් පණිවුඩ එකට ගොනු කරල සකස් කරල මා ළඟදී දෙන පණිවුඩය ද ඇතුලත් කරල ඔවුන් වෙත විගස යවන්න, දැන්වත් ඔවුන්ට වෙනස් වීම පිණිස. මැවුම්කරුවාණන් වහන්සේගේ පණිවුඩයක් ලෙස එය ඔවුන් අතට පත්කරන්න.

## ආපසු හැරී බැලීමක්

ජේසු සමිඳුන්ගේ මෙම ක්‍රියාකාරීත්වයට 'දහම් නවෝදය' සංඝය ලෙස අප සහභාගී කරගෙන 2022 ජුනි 7, වසර 26ක් සම්පූර්ණ විය. මෙම ක්‍රියාකාරීත්වය මුලපුරා ඇත්තේ 1991 අගෝස්තු මාසයේදිය. මෙම අනාවරණ සඳහා ජේසු සමිඳුන්ගේ දාසියන් ලෙස දෙදෙනෙක් ද ජේසු සමිඳුන්ගේ දාසයා ලෙස එක් අයෙක් ද උන්වහන්සේ උපයෝගී කර ගත්හ. මෙය දේව අනාවරණ රටාවන් තුළ මෙතෙක් සිදුනොවූ සුවිශේෂී අනාවරණ රටාවකි. ඇයගේ හෝ ඔහුගේ හෝ ආත්මය දෙවි පියාණන්ගේ සුරතේ තබා ජේසු සමිඳුන්ම එතුමාණන්ගේ ආත්මයාණන්ම ඇතුල්ව සිදුකරන අනාවරණ රටාවකි, මෙය. එනිසා ඒ මොහොතේ ඇයගේ මුවින් නික්මෙන කිසිම වචනයක් ඇයගෙන් නොවේ. ඒ කිසිම වචනයක් ගැන ඇය තුළ කිසිදු මතකයක් නැත. මෙය සුවිශේෂී අනාවරණ රටාවක් නිසා මනුෂ්‍ය වර්ගයා උදෙසා මෙහි සුවිශේෂී අස්වැන්නක් තිබිය යුතුය. මෙවැනි අසම්මත සුවිශේෂී අනාවරණ රටාවක් ඔස්සේ මෙතෙක් එන්නට අපට හැකිවීම ගැන අද සංඝයේ එඬේරා හැටියට මමත් සංඝයේ ශ්‍රාවකයින් හැටියට අපිත් මහත් සේ සතුටු වන්නෙමු. එහෙත් අප වසර 26ක් පුරා මේ දක්වා පැමිණි අසම්මත ගමන මිනිස් මනස්වලට ඔරොත්තු දෙන්නක් නොවේ. සමහර අනාවරණයන් සංඝයේ සමහර ශ්‍රාවකයින්ගේ පැකිලීමට හේතු වන විට සංඝයේ එඬේරා හැටියට මට මෙලෙස කියන්නට සිදුවූ අවස්ථා ඇත. "අපි පොඩි ජේසු මත නොවෙයි, බයිබලයේ සඳහන්ව ඇති ලොකු ජේසු මත සිටිමු." ජේසු සමිඳාණෝ 2012.11.15 සුජීවා උපයෝගී කර ගනිමින් මෙලෙස පැවසූහ. "මම විටෙක මැවුම්කරුවාණන් වන එකම දෙවියන් වහන්සේ ලෙස ද විටෙක නුඹලාගේ මිතුරකු ලෙස ද විටෙක සහෝදරයකු ලෙස ද විටෙක කුඩා දරුවකු ලෙස ද නුඹලාට කතා කළෙමි, විටෙක අඥානයකු ලෙස ද කතා කළෙමි. එලෙස මම ප්‍රබලවද දුබලවද කතා කළෙමි." ජේසු සමිඳුන් අපට එලෙස පැවසීමෙන් පසු මෙම සමහර අනාවරණ ගැන සංඝයේ ශ්‍රාවකයින් නොපැකිලෙනු පිණිස මහා ජේසු, කුඩා ජේසු යන දුර්වල යෙදුම් උපයෝගී කර ගැනීමට මට සිදු නොවීය.

ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් එම වදන් සංඝයේ ශ්‍රාවකයින් සමග ගැඹුරු විමසීමකට මම යොමු කළෙමි. දෙවි පියාණන්ගේ වචනයාණන් වන පුත්‍රයාණන් වන ජේසු සමිඳුන් මාංශවත්ව සිටි ඒ වසර 33 පුරා දෙවි පියාණන් තම පුත්‍රයාණන්ට අනාවරණය වූයේ දෙවි පියාණන් හැටියට පමණි. ඒත් ජේසු සමිඳුන් විසින් තෝරා ගත් මෙම සංඝය ඉදිරියේ දෙවියන් වහන්සේ ලෙස පමණක් නොව මිතුරෙක්, සහෝදරයෙක්, කුඩා දරුවෙක්, අඥානයෙක් ලෙස ජේසු සමිඳුන්ට පෙනී සිටීමට සිදුවූයේ ඇයි? ජේසු සමිඳුන්ගේ ශුද්ධවූ උපත තුළ ජේසු සමිඳුන්ගේ කිසිදු ආත්මාර්ථයක්, පාපයක් නොවීය. උන්වහන්සේ තුළ කඩමින් අඹන්නට කිසිදු ඌණතාවයක් නොවීය. එහෙත් සංඝයක් ලෙස අප ජන්ම පාපයෙන් යුතු ආත්මාර්ථයෙන් කිළිටි වූ මිනිස් කැළක් පමණි. අප තුළ කඩමින් ඇඹිය යුතු බොහෝ දේ ඇත. එනිසයි, ජේසු සමිඳුන් දෙවියන් ලෙස පමණක් නොව එහි සඳහන්ව ඇති අනෙක් සියලු ක්‍රම උපයෝගී කර ගත්තේ. 'ශුද්ධාත්ම පිය සටහන්' 1-61 පරිච්ඡේද තුළින් මා ලෝකයට දුන්නේ උන්වහන්සේ දෙවියන් වහන්සේ ලෙස අපට අනාවරණය කළ දේ පමණි. 'ශුද්ධාත්ම පිය සටහන්' 44 පරිච්ඡේදයේ මෙලෙස සටහන්ව ඇත. ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "නුඹලා ජීවත් වන මේ දේශයයි, එදා මා මැවූ සුගති උද්‍යානය, ආදම් සහ ඒව සිටි සුගති උද්‍යානය. මුලින්ම මේ දේශයට 'ආදම් උයන' , 'පාරාදීසය' යනුවෙන් හැඳින්වූ තැනැත්තා එසේ කළේ දේව අනාවරණයකින්." (ඒ තැනැත්තා කවුදැයි අපි විමසුවා.) "එය පොත-පතින් දැන ගන්න. නුඹලාගේ ජාතික ගීතයේ උද්‍යානයක සෞන්දර්යය ද ඇතුලත්ව තිබීම ගැන මා සතුටු වෙනවා." පසුව 'ධර්මද්වීපය' නමින් හැඳින් වූයේ ද මේ දේශයයි. එදා මෙය 'පෙරදිග ධාන්‍යාගාරය' ද විය. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ධර්ම අධර්ම යුද්ධයේ මූලාරම්භය මෙම දේශයෙන්ය. මෙයයි, ගැළවීමේ දේශය." ධර්ම අධර්ම යුද්ධය අවසානයේ ධර්මය ජයග්‍රහණය කරමින් දැහැමි යුගයේ උදාව සිදුවනු ඇත. ලෝකයට ගැළවීම උදාවීම උදෙසා අද මේ දේශය මහා ප්‍රසව වේදනාවක යෙදී සිටී. එය ධර්ම අධර්ම මහා යුද්ධයයි. මිනිස් මනසට ඔරොත්තු නොදෙන මේ සිදුවීම් තුළ හැකි බොහෝ දෙනා රට හැර යනු ඇත. මේ ප්‍රසව වේදනාව තුළින් උදාවන මහා

එලය යම් දිනක දකින විට ඔවුන් මහා ප්‍රීතියකින් මේ පුණ්‍ය භූමිය වෙත ආපසු පැමිණෙනු ඇත, මේ දේශය ගැන දෙවි සමිඳුන් පසසනු ඇත.

## ශ්‍රී ලංකාව නමැති දේශය උදෙසා දෙවි වූ ස්වාමින් වහන්සේ විසින් දෙන ලද පණිවුඩය මෙයයි.

<u>23-ජූලි-2022</u>

"මේ දේව ආඥාවයි. ශ්‍රී ලංකාව නමැති දේශය උදෙසා දෙවි වූ ස්වාමින් වහන්සේ විසින් දෙන ලද පණිවුඩය මෙයයි. සියලුම නායකයින් වෙතටයි. ඔබගේ නායකත්වය කොතැනද? ඒ නායකත්වය දරන්නා වූ සැවොම දැනගත යුතු අනාවරණය මෙයයි. ඔබ මේ මොහොතේ රාජ්‍යතන්ත්‍රයේ සේවය කරන්නෙක් නම් ඔබ මෙය ගැඹුරින් අයිති කර ගත යුතුයි. එය මෙසේය. රාජ්‍ය නායකයිනි, නුඹලාගේ විනාශය දැන් නුඹලා පසුපස හඹාගෙන එන ලැව්ගින්නක් මෙන්ය. දේශය පවිත්‍ර කිරීම මම මෙලෙස සිදුකරන්නෙමි. විටෙක ලැව්ගින්නක් ලෙස ද විටෙක තද කුණාටුවක් ලෙස ද එය පැමිණෙනු ඇත. ආදරණීය දරුවෙනි, මම නුඹලාට ප්‍රේම කරමි. එනමුත් දෙවිඳුන්ගේ මහා ඉවසීම තුළ නුඹලා කෙරෙන් දේව ගරුබියක් මම නොදකිමි. ආත්මාර්ථයේ බල තණ්හාවෙන් පිරී සිටින නුඹලාට වන විපතක මහත. දැන් එකා පිට එකා සටන් වදිනු ඇත, එය නොනවතිනු ඇත. ජනතාව විසින් දෙවිඳුන්ගේ නීති නියෝග අණපනත් කඩකරන ලද බැවින් පොළොව අපවිත්‍ර වී දූෂණය වී ඇත. එනිසා දේශය පවිත්‍ර කිරීම පිණිස දෙවි වූ ස්වාමින් වහන්සේ වන මම සියලු තරුණ දූ පුතුන් වැඩිහිටියන් සියලූ ජනතාව දැඩි කරමින් පවිත්‍ර වූ ධර්මිෂ්ඨ රාජ්‍යයක් ගොඩනැගීම පිණිස මෙය සිදුකරන්නෙමි."

"සියලු රාජ්‍ය නායකයිනි, නිලය බලය හා ආත්මාර්ථය ආභරණයක් කරගත් ඔබට වන විපතක මහත. ජීවත්ව සිටින සෙනග කෙමෙන් අඩු වනු ඇත. මක්නිසාද ඔවුහු යුක්තිය උදෙසා දිවි පුදන්නෝය. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. දේශයේ සතුට සැනසුම පහව ගොස් ඇත. එය නැවත ඇතිකර ගැනීමට බොහෝ සේ සටන් කළ යුතුය. පොළොව පාපයෙන් බර වී ඇත. පොළොව කම්පා වී දෙදරා සුනු විසුනු වන්නට තරම් පාපයේ බර අධික වී ඇත. පාපයේ බර කොතෙක්දයත් ඉහළ අහසේ බලමණ්ඩල පහළ පොළොවේ සිටින පාලකයන්ට දඬුවම් කරන කාලය පැමිණ ඇත්තේය. දෙවියන් වහන්සේගේ ඉවසීමට සීමාවක් ඇත්තේය. දෙවියන් වහන්සේ ප්‍රේමය මෙන්ම උදහස ද වන සේක. පියාණන්ගේ බැල්ම මේ දේශය වෙත යොමුව ඇත. අනාදියේ ආදම් සහ ඒව පිළිබඳ සැලසුම් ආරම්භ වූයේ ද මේ දේශයෙනි. අධර්මිෂ්ඨ බලපෑම් නිසා දූෂ්‍ය වී ඇති මේ දේශය පවිත්‍ර කිරීමේ වගකීම ද දෙවියන් වහන්සේට පැවරී ඇත. එය දෙවියන් සතු කාර්යයකි. ඒ සඳහා දෙවියන් වහන්සේගේ වැඩ ඇරඹීමේ කාලයයි, දැන් පැමිණ ඇත්තේ. දරුවෙනි, දැන් නුඹලා දැහැමිව ජීවත් විය යුතුයි. විටින් විට මගේ ධර්මිෂ්ඨභාවයේ පාඩම කියා දීමයි, මගේ කාර්යය වන්නේ. මුහුද විටෙක නිශ්චල වන්නාක් මෙන්ම විටෙක දැඩි වනු ඇත. එලෙසයි, දේව උදහසත්. බොහොම නිශ්චලව සියල්ල දෙස මුළු මැවිල්ල දෙස බලා සිටිමින් එය අකීකරුකම් පාන කල, මුහුද මහා ඝෝෂා නගමින් තද කුණාටුවක් ලෙස රළ පිට රළ ගසමින් සියල්ල පවිත්‍ර කරන්නාක් මෙන් මැවුම්කරුවාණන් වන මා ද සියල්ලන් පවිත්‍ර කිරීමයි, දැන් සිදුවෙමින් පවතින්නේ."

"අරගල භූමියේ සිටින දරුවෙනි, මම නුඹලා අමතමි. සියලු ජනතාව උදෙසා නුඹලා සියල්ල අත්හැර සියලු ආශාවන් අත්හැර සියලූ අයිතිවාසිකම් අත්හැර යුක්තිය උදෙසා සටන් කරන ඔබ සියල්ලන් මම ආශිර්වාද කරමි. බිය නොවන්න. නුඹලා ජය ගනු ඇත. සියලු අසත්‍ය පරාජය කරමින් සත්‍යය ජය ගනු ඇත. එකා පිට එකා වැටී තම ලේ හලමින් ඒ ලෙයින් පාපය තෙත් කරමින් මේ දේශයේ ධර්මිෂ්ඨ රාජ්‍ය නායකයා ගෙනෙන තුරු නුඹලා සටන් වදිනු ඇත. නුඹලා අතරින්ම ඒ නායකයා මම ස්ථාපිත කරමි. බොරුවෙන් වංචාවෙන් දූෂ්‍ය වී පිරී ඉතිරෙමින් තිබෙන මෙවැනි මොහොතක සියල්ලන්වම දැඩි කිරීම පිණිස සියලු තරුණ දූ පුතුන් දැඩි කිරීම පිණිස මම මගේ රාජ්‍යයේ සගයන් නුඹලා වෙත එවා ඇත. මගේ බලගතු දූත පිරිස නුඹලා වටකොට ඇත. මම නුඹලාව ඒ ග්‍රහණය තුළ රඳවා ගෙන සිටිමි. මම නුඹලාව දේශය පවිත්‍ර කිරීම පිණිස අවියක් කර ගනිමි. සියලු ජනයෙනි, අවදි වන්න. තමා උදෙසා නොව සියල්ලන් උදෙසා අවදිව එළියට බසින්න, එක්රුස් වන්න, එකමුතු වන්න, එක්සිත් වන්න. මක්නිසාද නුඹලාගේ අයිතිවාසිකම් උදෙසායි, ඔවුන් සටන් වදින්නේ. "

“සියලු ආගමික නායකවරුනි, දැන් එකමුතු විය යුතු කාලයයි. ජාති කුල ආගම් භේද බැලිය යුතු කාලයක් නොවෙයි, දැන් උදා වී ඇත්තේ. සියල්ලන් එකා මෙන් ඒකරාශි වෙමින් එක මවකගේ දරුවන් මෙන් එකට එකතු වූ කල සියලු බාධක පරාජය කළ හැකිය. අපි අත්වැල් බැඳ ගනිමු. මම නුඹලාට මහා බලසම්පන්න ආසිරි වැසි වස්වමි. එක්රැස් වන්න, එකමුතු වන්න, බිය නොවන්න, ඉදිරියටම එන්න. ජීවිතය පූජා කරන්නට සිදුවුණොත් නුඹලාට මගේ රාජ්‍යයේ තැනක් ලැබෙනු ඇත. අන් අය උදෙසා අනාගත දරු පරපුර උදෙසා දැහැමි යුගය ආරම්භ කිරීම උදෙසා යුක්තිය ඉල්ලා සටන් වදින සියල්ලෙනි, අවදිවව්. මම නුඹලාව දැඩි කොට ඇත්තෙමි. ධර්මිෂ්ඨ වූ රාජ්‍යයක් ගොඩනැගීම පිණිස තම ලේ වගුරුවමින් කුසට ආහාරයක් නොමැතිව පිපාසයට ජලය නොමැතිව දුක බෙදා ගනිමින් සියල්ල කැපකර ගනිමින් එකට ඒකාරාශි වෙමින් කරන්නාවූ මේ සටන මෙතැනින් නිමා නොවනු ඇත. සැබෑ ධර්මිෂ්ඨ රාජ්‍යය ගොඩනැගෙන තෙක් අපි සටන් වදිමු. එය ඉක්මනින් ජයග්‍රහණය කරා එළඹෙනු ඇත. එලෙස නව රාජ්‍යයක් පිහිටුවනු ලබයි. මේ දේශයෙන් මුළු ලෝකයට පණිවුඩයක් දෙමු. ලෝ වැසි සියලු රාජ්‍ය නායකයින්ට මෙය මරු පහරක් වනු ඇත. ලෝ වැසී සියල්ලන් මහත් ගෞරවයෙන් යුතුව මේ දෙස බලනු ඇත. ලෝකයට ආලෝකයක් වන්නාවූ මේ පුංචි දේශය ගැන ලෝක වාසින් යම් දිනෙක කතා කරනු ඇත.”

“රාජ්‍ය නායකයිනී, තවත් පමා නොවන්න. වෙනස් වන්නට හැරී එන්නට මනස්තාප වන්නට තවම කාලය තිබේ. දූෂිත වූ සියල්ල අධර්මයයි, එය යක්ෂ බලවේගයයි. එයට ගොදුරු නොවන්න. මනස්තාප වී සියල්ල තරුණ දූ පුතුන්ට භාර දී දැන් එය කරගෙන යාමට ඉඩ දී ඔබ පසු බසින්න. මම තවත් ඔබට කාලය දෙමි. ඔබ අද මහත් සැප වින්දත් දිනෙක විශාල වැලපීමකට මොරගැසීමකට ඔබ ඇතුළු වනු ඇත. එනිසා පාලකයිනී, අවදි වන්න, සියල්ලන් වෙත කරුණා නෙත් යොමන්න. ඔබ මෙතෙක් රැස් කළා වූ අධර්මයේ දේ නවතාලමින් මෙය ඔබගේ ජීවිතයේ හැරවුම්ලක්ෂ්‍යයක් කර ගනිමින් සියල්ල භාර දී නිහඬ වන්න. එසේ නොමැති වුවහොත් අහෝ ! ඔබට වන විපතක මහත. දේව උදහස ලැව් ගින්නක් මෙන් පසුපස ලුහුබඳිනු ඇත, විටෙක තද කුණාටුවක් මෙන් ඔබ වටා පැමිණෙනු ඇත. ඔබගේ පාපයේ භයානකකම තවම ඔබ නොදනී. එය ඔබගේ හෘද සාක්ෂියට දැනෙන්නට සලසනු ඇත. මෙයයි, මගෙන් ලද භයානක පණිවුඩය. දැන්වත් අවදි වන්න. උද්ඝෝෂණයේ යෙදී සිටින සියලු දරුවෙනි, මම නුඹලා ආශිර්වාද කරමි. දේව රාජ්‍යයේ සිටින මගේ සියලු සගයෝ ඔබට සහය වෙති. මගේ ස්වර්ගීය දූත පිරිස ඔබ වටා රැස්ව ඇත, ඔබව මහත් සේ රකිමින් බලසම්පන්න කරමින් ඔවුන් ඔබට අවියක් වනු ඇත. මක්නිසාද දෙවි වූ ස්වාමින් වහන්සේ ඔබව එතුමන් සුරතේ අවියක් කර ගනිමින් මේ දේශය පවිත්‍ර කිරීම පිණිස ගෙන යනු ලබන සේක. ආමෙන්.”

**මා,**
**ඔබගේ, ගැළවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුස්.**

## 62.

### "අති බිහිසුණු දේ සිදුවුවත් මගේ සභාව ක්‍රියා විරහිත වන්නේ නැත. මන්ද, මම ඒ සමග සිටිමි. නමුත් මගේ දුක්ප්‍රාප්තිය මෙන් සභාව ද හිෂණයට හා අඳුරු පැයට මුහුණ දිය යුතුය."

මා ද උපත ලැබූ 20වන සියවසේ 4වන දශකයේදී ඉතාලියේ නේපල්ස්හි මරියා වැල්ටෝර්ටා තුමියට ජේසු සමිඳුන් දුන් අනාවරණයන්ගෙන් උපුටා ගත් වැකි කීපයකි, පහත සඳහන් වන්නේ. එය 'The End Times' 'කාලයේ අවසානය හා ක්‍රිස්තු පුනරාගමනය' ඇසුරෙනි. සිංහල පරිවර්තනය, ඒ. ඩී. එස් විජේතුංග.

"අති බිහිසුණු දේ සිදුවුවත් මගේ සභාව ක්‍රියා විරහිත වන්නේ නැත. මන්ද, මම ඒ සමග සිටිමි. නමුත් මගේ දුක්ප්‍රාප්තිය මෙන් සභාව ද හිෂණයට හා අඳුරු පැයට මුහුණ දිය යුතුය."

"මුල් වකවානුවේදී ශුද්ධවූ සභාව පීඩාවට පත්කරනු ලැබූ නමුත් සභාවේ උතුම් දරුවන්ගේ ආත්මානුභාවයෙන් එය පෝෂණය කර නැවත නැගිටුවන ලදී. අවසාන කාලයේදී ද නැවතත් එවැනි දරුවන්ම සභාව සමග සිටිනු ඇත. එම දරුවන් විසින් අන්ත ක්‍රිස්තුගේ දූතයන්ගේ ග්‍රහණයෙන් සභාව ආරක්ෂා කරගෙන පෝෂණය කර පවත්වා ගෙන යනු ලබයි."

"ජාතීන්ගේ කෝපය විද්‍යමාන වීම මගේ කෝපය පිළිබඳව අණතුරු ඇඟවීමයි. මේ පැය වේදනාකාරී එකකි. මගේ සියලු දරුවන් ද මේ වේදනාකාරී තත්ත්වයන් තුළින් ගමන් කළ යුතුය, එය මඟ හැරිය නොහැකිය. මන්ද, සියලු දෙයක්ම සම්පූර්ණ විය යුතු බැවිනි."

"එහෙයින් මේ සියලු දුෂ්ඨ බලවේගවල කූට ක්‍රියාකාරකම් අභිබවා යා හැකි බලයක් ජනතාවට අවශ්‍ය වී ඇත. එනිසා ධර්මය අවශ්‍ය අයට මගේ ආලෝකය ලබා ධර්මය තුළ වඩාත් හොඳ පන්නරයක් ලබා ගැනීම තෙක් ඔවුන් ආරක්ෂා කිරීමට අවශ්‍ය ආවරණ ජාලයක් මම ඔවුන්ට ලබා දෙන්නෙමි."

"මගේ ප්‍රතාපවත් නැවත පැමිණීම නව ක්‍රමවේදයක් හා නව බලයක් ඇතිව වර්තමානයට යෝග්‍ය අයුරින් ප්‍රකාශ වෙයි."

"ඔවුන්ගේ සම්පූර්ණත්වය සඳහා නව අපෝස්තලිකත්වයක් තුළින් අවසාන ඉගැන්වීම ඔවුන්ට ලබා දෙමි. මා ඔබට මුලින් දුන් සුභාරංචිය වෙනස් නොවේ. එහෙත් එය නව බලයක් ද සහිතව එය ඔබට පහසුවෙන් තේරුම් ගත හැකි වනු ඇත. අද ඔබට තේරුම් ගත නොහැකි දේ ද ඔබට තේරුම් යනු ඇත."

"මුළුමනින්ම යක්ෂාත්මයට අවනත වීමට දෙනු ලබන ඉගැන්වීම් තුළින් කරනු ලබන ව්‍යාජ තාවකාලික ආශ්චර්යයන් නිසා මුලා වී යන අය මගින් දෙවියන් වහන්සේට අභියෝග කිරීමට මොවුහු (මකරා සහ මෘගයා) ඉදිරිපත් වෙති. මෙම මොහොතේ දී එම පාතාලයේ ක්‍රියාව ස්වර්ගයේ නිර්මාණයක් ලෙස පෙන්වා ඔබව මුලා කිරීමට නපුරා ක්‍රියාත්මක වන බැවින් එම අවස්ථාවේ දී මනුෂ්‍යයා අතිශයින් ප්‍රවේශම් විය යුතුය."

"අන්ත ක්‍රිස්තුව වරක් පරාජය කර කෙටි සාම කාලයක් මනුෂ්‍යයාට ලැබෙයි. ---- ක්‍රිස්තු විරෝධීන් අවසන් වරට ප්‍රකාශයට පත් වෙමින් සිය දුෂ්ඨකම් හා හිංසන ක්‍රියා උච්චාවස්ථාවටම ගෙන එයි. එය සාතන්ගේ අවසාන වාරයයි."

"මම පොරොන්දු ඉටු කරන බැවින් මා පොරොන්දු වී ඇති ලෙස මගේ සාම රාජ්‍යය පැමිණීමට නියමිත වේලාවේදී පැමිණෙන්නේය."

"මන්ද, අන්ත ක්‍රිස්තුගේ පැයේ සිට ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම අතර යම් කාල සීමාවකට පමණක් පවතින සටන් විරාමය කෙටි එකකි. ඇත්තෙන්ම තෝරා ගත් අය වෙනුවෙන් අවසාන පීඩා කාලය කෙටි කරනු ලබන්නේය. නව ජවයකින් සාතන්ට එරෙහි සටනට සූදානම් වීම සඳහා නව ජවයක් ලබා ගැනීම පිණිස කෙටි සාම කාලයක් ඔබට දෙනු ලබන්නේය."

“විනාශයේ පළමු අදියර අන්ත ක්‍රිස්තුගේ (Anti-Christ) පෙර ගමන්කරුවන් අතින් සිදුවෙයි. ඉන්පසු මගේ පෙර ගමන්කරුවන් විසින් මගේ පැමිණීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලබයි. සාතන්ගේ පෙර ගමන්කරුවෝ මනුෂ්‍යයින්ගේ ගරු නම්බු තනතුරු සහ මහේශාක්‍යභාවය ඇතිව පෙනී සිටිති. දේව පුත්‍රයාගේ පෙර ගමන්කරුවෝ ඔවුන්ගේ රජාණන් ලෙසම එම ඔටුන්න ලබා ගනිති. ඔවුන්ගේ ඔටුන්න නම් අන් අය වෙනුවෙන් දුක් පීඩා විඳීමයි.”

2022 මැයි 19 අප සංඝය අමතා ජේසු සමිඳුන් දුන් පණිවුඩය මා 'ශුද්ධාත්ම පිය සටහන්' 61 පරිච්ඡේදයේ සටහන් කර ඇත. ඒ පණිවුඩයේ ජේසු සමිඳාණෝ තව දුරටත් මෙසේ පැවසූහ. “ඉදිරිය මීට ද වඩා තත්ත්වය බිහිසුණු වෙනවා. ජනතාවට බොහෝ පීඩා විඳින්න සිදුවෙනවා. ඒ සියලු පීඩා තාවකාලිකව හෝ නිමා වෙමින් ඊළඟට උදා වන්නේ ප්‍රිතිමත් කාලයක්, සශ්‍රීක කාලයක්. (ජේසු, එය දැහැමි යුගයේ උදාවද? ඊට පෙර සිදුවන දෙයක්ද? මම ජේසු සමිඳුන්ගෙන් එලෙස විමසීමි.) “එය ඊට පෙර සිදුවන දෙයක්. සියල්ලන් වින්ද පීඩනයට හරි යන්න ප්‍රිතිමත් කාලයක් දෙනවා. එයින් කලකට පසු තව තවත් දේවල් සිද්ධ වෙන්න තියෙනවා. දැන් එළිදරව් පොතේ සඳහන් ඒ මුද්‍රා හතෙන් තුනක් මේ වෙද්දි එළිදක්වල ඉවරයි. මේ 4වන එක කීවොත් හරි. දැන් ඒක තමයි, මේ ආරම්භ වෙමින් තිබෙන්නේ. ඒකට අයිති ඊට වඩා බිහිසුණු දේවල් ඉස්සරහට සිදුවන්න තියෙනවා.”

මා ඉහත සඳහන් කළ ජේසු සමිඳුන්ගේ සියලු වදන් ද මෙහි 61 පරිච්ඡේදයේ මා සටහන් කළ 2022 අප්‍රේල් 27 හා 2022 මැයි 19 සටහන් ද උපයෝගි කර ගනිමින් ධර්ම අධර්ම යුද්ධයේ ඉදිරි ක්‍රියාකාරිත්වය පිළිබඳව මෙනෙහි කිරීමකට පිවිසෙන්නට මම අදහස් කරමි. “ධර්ම අධර්ම යුද්ධයේ මූලාරම්භය මෙම දේශයෙන්ය.” එයයි, දැන් මේ දේශය තුළ ඇරඹී ඇත්තේ. විශ්ව මැවුම්කරුවාණන් වන සැබෑ වූ එකම දෙවියන් වහන්සේ මේ දේශයේ සාධාරණය උදෙසා සිදුවන අරගලයට උන්වහන්සේගේ සර්වබලධාරී හස්තය තබා ඇත. එනිසා සාධාරණත්වය උදෙසා සිදුවන මේ ජන අරගලය ජයග්‍රහණය කරනු නියතයි. අප දේශය තුළ බලගතු ලෙස විකුම් පාමින් සිටින අධර්මාධිපතිගේ පරාජය සිදුවනු නියතයි. ධනය, බලය, ජනප්‍රියත්වය (මැමෝනා) තම එකම අරමුණ කරගත් පිරිසකි, අධර්මයේ ජයග්‍රහණය උදෙසා අධර්මාධිපති (ලුසිෆර්, සාතන්, යක්ෂයා, නපුරා, ක්‍රිස්තු විරෝධියා, අන්ත ක්‍රිස්තු, මෘගයා, දාමරිකයා) අත මෙවලම් වන්නේ. 2022 අප්‍රේල් 9 ගාලු මුවදොර දී සාධාරණය උදෙසා මුල පිරුණු තරුණ අරගලය සියලු බාධක අභියෝග තර්ජන ගර්ජන මැද දිනෙන් දින වැඩෙමින් එය මුළු රට පුරා ව්‍යාප්ත වෙමින් සිදුවන නිරායුධ මහා ජන අරගලයක් දක්වා වර්ධනය වනු ඇත. අධර්මාධිපතිගේ අරමුණු ඉටු කිරීම උදෙසා සාධාරණයේ අරගලය පරාජය කරන්නට අධර්මාධිපති අත මෙවලමක් වෙමින් ක්‍රියා කරන්නෝ තම මුළු දේශපාලන බලය හා ධන බලය යෙදුවත් ඒ සියලු උත්සාහයන් පරාජය වෙමින් අධර්මාධිපති අන්ත පරාජයක් ලබනු ඇත. ඒ පරාජය ඔහු බරපතල ලෙස තුවාල වීමකි. ඒ තුවාලය සුව වීම සඳහා ඔහුට සටන් විරාමයක් අවශ්‍ය වනු ඇත. ඊට හේතුව මෙයයි. ඒ පරාජයේ තුවාලය නිසා වඩාත් වියරු වැටෙන මෘගයා ඉන්පසු 'තුවාලය සුව වූ මෘගයා' හැටියට ලෝක කරලියට බලගතුව පිවිසෙනු සඳහාය. ඒ ඔහුගේ අවසාන අති බිහිසුණු සටන උදෙසාය. “ඔහු ඒ සඳහා දෙවියන් වහන්සේගේ අවසර ඉල්ලා ඇත. උන්වහන්සේ ඒ සඳහා ඔහුට අවසර දී ඇත.”

අප දේශයේ ඇරඹී ඇති ධර්ම අධර්ම යුද්ධයේ පළමු සටනින් නපුරා පරාජය වීමත් සමග ඇරඹෙන්නේ සටන් විරාමයක් වැනි කාලයකි. එවැන්නක් පරාජය නිසා තුවාල වූ මෘගයාට ද අවශ්‍ය බව මම පැවසීමි. එවැනි සටන් විරාමයක් දෙවියන් වහන්සේට ද අවශ්‍යය. එය ප්‍රධාන කරුණු දෙකක් නිසාය. එය දිගු කාලයක් අන්ත කටුක පීඩාකාරී අත්දැකීම් රැසකට මුහුණ දුන් අප දේශයේ ජනතාවට යම් කාල සීමාවකට හෝ ප්‍රිතිමත් සශ්‍රීක ජීවිතයක් ලබා දීම සඳහාය. ඒ සඳහා දෙවන කරුණ මෙයයි. අධර්මාධිපතිගේ අති බිහිසුණු අවසාන සටන ඇරඹෙන්නට පෙර ධර්ම ප්‍රතිෂ්ඨාපනය හෙවත් ධර්මය නැවත පිහිටුවීම සඳහා අවස්ථාව උදා කිරීමය. එය සියලුම ආගමික ශාස්තෘවරුන් දෙසූ නිවැරදි දහම ජනතාව වෙත ප්‍රබලව ගෙන යමින් නපුරාගේ ඉදිරි මහා සටනට අභීතව මුහුණ දෙනු සඳහා ලබා දෙන පන්නරයකි. ඒ සටන් විරාමයෙන් පසු තුවාලය සුව වූ මෘගයාගේ අවසන් මහා සටන ඇරඹේ. එය වසර තුනහමාරක හෙවත් මාස 42ක අති බිහිසුණු කාලයක් බව ශු. බයිබලයේ දානියෙල්ගේ පොත හා එළිදරව් පොත සාක්ෂි දරයි. මැවුම්කරුවාණන් වහන්සේ පිළිබඳව විශ්වාසය මනුෂ්‍යයා තුළින් මුළුමනින් නැති කර දමන්නට අධර්මාධිපති උපරිමය කරනු ඇත. ඒ සඳහා ඔහුගේ උපරිම බලය ප්‍රකාශ කරනු ඇත. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ සඳහන්ව ඇති මැවුම්කරුවාණන් වහන්සේගේ සියලු ප්‍රබල ක්‍රියාවන්ටත් වඩා ප්‍රබල ක්‍රියා මගින් උන්වහන්සේ ද සාක්ෂි දරනු ඇත. ඒ අවසන් සටනින් ද නපුරා අන්ත පරාජයට පත් වී ඉන්පසු ඔහු දහස් වසරකට බැඳ දමමින් ජේසු සමිඳුන්ගේ පුනරාගමනය හා දැහැමි යුගයක උදාව සිදුවේ. දැනට අප දේශය තුළ මුලපුරා ඇති ධර්ම

අධර්ම යුද්ධයේ මෙම පළමු සටනින් සාධාරණය උදෙසා අරගලයක යෙදෙන ජනතාවට ජය අත්කර දෙමින් මැවුම්කරුවාණන් මේ දේශය උදෙසා තෝරා ගන්නා නව දැහැමි නායකත්වය අධර්මාධිපතිගේ ඉදිරි ක්‍රියාකාරිත්වයට අප දේශය තුළ කිසිසේත් ඉඩ නොදෙන නායකත්වයක් වේවා ! යි පතමු. එවිට ඉදිරි ලෝකයටම “මෙයයි, ගැළවීමේ දේශය” (“මැවුම්කරුවාණන් මේ දේශය උදෙසා තෝරා ගන්නා නව දැහැමි නායකත්වය” ගැන මා වචන ස්වල්පයක් පැවසිය යුතු යැයි මට හැඟේ. “සියලු දෙනාටම ආගමක් ඇත. නමුත් ආගමක් නැත්තේ දෙවියන් වහන්සේට පමණි.” ඒ ගරු මර්සලින් ජයකොඩි පියතුමාගේ වචන ස්වල්පයකි. එය සත්‍යයකි. මැවුම්කරුවාණන් වහන්සෙයි, සියලු ආගමික ශාස්තෘවරුන් මෙලොවට එවා වදාළේ. උන්වහන්සේයි, ධර්මයාණෝ. උන්වහන්සේගේ දහම අඩු වැඩි වශයෙන් ඒ සැම ආගමක් සමග බෙදී ගොස් ඇත. උන්වහන්සේට ජාති භේද ආගම් භේද කිසිවක් නැත. ලෝ වැසි සියල්ලෝ උන්වහන්සේගේ දරුවෝ වෙති.)

'ශුද්ධාත්ම පිය සටහන්' 61 පරිච්ඡේදයේ දී අපගේ ගමන් මග පිළිබඳව ආපසු හැරී බැලීමකට මම පිවිසුණෙමි. ඒ ඔස්සේ ඔබට කිය යුතු තවත් කරුණු කීපයක් ඇත. “දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන ජනතාව දැනුවත් කරන්නැ”යි ජේසු සමිඳුන් සුජීවා මගින් මට පැවසූ බැවින් මම ඒ සඳහා 'ශුද්ධාත්ම පිය සටහන්' 54, 55 පරිච්ඡේද සැකසීමි. ඒ කාර්යය තුළයි මට සිහිපත් වූයේ, දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන මා අත්දැකීමක් ලබා වසර 40ක් සපිරෙන බව. 'ශුද්ධාත්ම පිය සටහන්' 56-60 පරිච්ඡේද සකසන ලෙස මේ අනාවරණ රටාව තුළ ජේසු සමිඳුන් මට පැවසුවේ නැත. මා තුළ ඇති ජේසු සමිඳුන්ගේ සියුම් හඬ තව තවත් වර්ධනය කර ගන්නා ලෙස මේ ක්‍රියාවලිය තුළ ජේසු සමිඳුන් මට නැවත නැවතත් පවසා ඇත. මා තුළ ඇති ජේසු සමිඳුන්ගේ සියුම් හඬේ මග පෙන්වීම අනුවයි, මා ඒ පරිච්ඡේද පහ සැකසුවේ.

ජේසු සමිඳුන් උන්වහන්සේගේ මෙම අනාවරණයන් දීම සඳහා උපයෝගි කර ගන්නා උන්වහන්සේගේ ප්‍රථම දාසිය වන සුජීවා ජයලත් සොයුරිය ගැන මා කෙටියෙන් හෝ සටහන් කළ යුතුය. ඇය දැන් වසර 50ක් සපිරෙන මවකි. මෙම ක්‍රියාවලිය ආරම්භයේ සිටම මේ දක්වා ඇය රෝගී තත්ත්වය තුළ අපමණ වේදනා විඳිමින් ජේසු සමිඳුන්ට තමා මගින් ක්‍රියා කිරීමට ඉඩ දෙන්නීය. ඒ ගැන ජේසු සමිඳාණෝ මෙසේ පවසති. “මට ක්‍රියා කිරීමට ඉඩ දුන්නා වූ මගේ දියණිය, මගේ හැම ඉල්ලීමකටම ආමෙන් කී ආකාරය මම දිටිමි. පුංචි දරුවන් රණ්ඩු වෙමින් නැවත යහළු වන්නාක් මෙන් ඇය මා හා ගත කරන්නීය, ඇය වැළපෙන්නීය නැවත මට ඉඩ දෙන්නීය. මගේ ක්‍රියා කිරීම තුළ ඇයගේ දෙනෙතින් මොන තරම් කඳුළු ගලා යන්නට ඇත්ද? ඇයටත් මනුෂ්‍ය ආශා මනුෂ්‍ය සිතුවිලි තිබේ. එහෙත් ඇය මට ගෞරවාන්විතව ආදරය කරන්නීය. ඈ මට කීකරු වන්නීය. මා ඇයට දුන් එඬේරාට ද නිහතමානිව කීකරු වන්නීය. මම බලා සිටිමි. ඇය විටෙක කුඩා දරුවකු මෙන් වැළපෙන ආකාරය. ඔබ හැම ද කුඩා දරුවන් මෙන් වන්න. එයයි, සැබෑ ජීවිතය.” (33 පරිච්ඡේදය)

ස්ත්‍රියක් මගින් ජේසු සමිඳුන් අප අමතන නිසා මෙය ලාබ සිල්ලර දෙයක් ලෙස කෙනෙක් දකින්නට පුළුවන. එය කිසිසේත් එසේ නොවේ. එය සංකීර්ණ දෙයකි, ශුද්ධවූ දෙයකි. ඒ සඳහා උදාහරණ දෙකක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි. සංඝයක් ලෙස ජේසු සමිඳුන් අප ගෙන යන මේ ගමන මනසට පමණක් නොවෙයි මහා පොළොවට ද ඔරොත්තු නොදෙන බව ජේසු සමිඳාණෝ පවසති. ගමන් විඩාවෙන් හෙම්බත් වෙමින් අප අතර මේ සිදුවන්නේ කුමක් දැයි ජේසු සමිඳුන්ගෙන් මග පෙන්වීමක් පැතුවත් අපට ඒ සඳහා එතුමන්ගෙන් වචනයක් හෝ නොලැබිණි. උන්වහන්සේ අවසානයේ ඒ ගැන වචනයක් දුන්නේ සංඝයේ ශ්‍රාවකයෙක් ද නොවන ග්‍රින්ති කුරේරා සොයුරියටයි. (ඇය, ප්‍රවීන නාට්‍යාචාර්ය වික්ටර් කුරේරා මහත්මාගේ වැඩුමහල් දියණියයි.) ඒ පණිවුඩය මෙයයි. “මා තෝරාගත් මේ සංඝයේ ප්‍රධාන දේ අත්තිවාරමයි. දැනට එයයි, සිදුවෙමින් පවතින්නේ. ඉදිරියේදී ඒ අත්තිවාරම මත ගොඩනැගිල්ල සෑදෙනවා. එවිට කාගෙත් අවධානය යොමු වන්නේ ගොඩනැගිල්ලේ අලංකාරය වෙතටයි. එවිට බොහෝ දෙනෙකුට අත්තිවාරම ගැන මතකයක් නැහැ. මේ සංඝය දැනට යමින් සිටින ගමනේ ජේන්න වැඩ ගොඩක් නැහැ.” (51 පරිච්ඡේදය) ජේසු සමිඳාණෝ ඒ පණිඩුඩය ඇයට දෙමින් ඇයට පැවසූහ, අපගේ දින තුන යැදුමට ගොස් ඒ පණිවුඩය සංඝයේ එඬේරා හා ශ්‍රාවකයින්ට පවසන ලෙස. ඇය 2018 මැයි 13 එය අපට ප්‍රකාශ කළාය. ඒ වන විට වසර 22ක් සපිරෙමින් තිබුණු අපගේ මේ අසම්මත ගමන තුළ විඳවමින් මැරෙමින් සිටි අපට එය උත්ථානයක පණිවුඩයක් විය. එය, මරණයෙන් උත්ථාන වූ ජේසු සමිඳුන් ඒ උත්ථානයේ පණිවුඩය තම ශ්‍රාවකයන්ට පවසන්නැයි මග්දලාහී මරියාට පැවසුවාක් මෙනි. මා එයින් ඉඟි කළේ මේ අනාවරණ රටාවේ සංකීර්ණත්වය ගැන යි. එහි ඇති ශුද්ධභාවය ගැන ද මා වචනයක් කිව යුතුය. ශ්‍රාවකයෙක් නොසැලකිල්ලෙන් අනවශ්‍ය දෙයක් ජේසු සමිඳුන්ගෙන් විමසුවොත් ජේසු සමිඳාණෝ මිනිත්තුවක් පමණ වේලාවක් ඇය මගින් ශබ්දනගා සිනාසෙති. ඊළඟ මිනිත්තුවේ ඒ මුහුණ බලන්නට බැරි තරම් රෞද්‍ර පෙනුමක් ගනී. මා එවැනි අවස්ථා තුනක් අත්දැක ඇත. මේ තත්ත්වය අත්දුටු පසු ගරුබියක් ඇතිවයි, මේ ක්‍රියාවලිය තුළ

ශ්‍රාවකයින් හැසිරෙන්නේ. ජේසු සමිඳුන් ක්‍රියා කරන මොහොතේ හැර අනෙකුත් සෑම අවස්ථාවකම ඇය සාමාන්‍ය ස්ත්‍රියක් පමණක් බවත් ඇයට විශේෂ ගෞරවයක් හිමි නැති බවත් ජේසු සමිඳාණෝ පවසති. ඇය උපයෝගි වෙමින් සිදුවන මෙම ක්‍රියාව පරික්ෂා කරන්නට පැමිණෙන අයෙකුට ජේසු සමිඳුන්ගෙන් ලැබෙන්නේ ද පිළිතුරක් නොව පරික්ෂණයක් පමණක් බව ජේසු සමිඳාණෝ පවසති.

'දහම් නවෝදය' සංඝය ගැන ද මා ඔබට කතා කළ යුතුයි.

'දහම් නවෝදය'
අධර්මයේ මහා අරගලයට එරෙහිව
'කිසිවෙකුට වැසිය නොහැකි විවෘත දොරක්.'

අපගේ වෙබ් අඩවිය ආරම්භයේම එලෙස සටහන්ව ඇත. එය ජේසු සමිඳුන් විසින්ම 'දහම් නවෝදය' දූත මෙහෙයට දෙන තේමාවයි. මේ සංඝයේ දැනට සිටින ශ්‍රාවකයින් ගණන කියන්නට එක අතක ඇඟිලි ගණන සෑහේ. එහෙත් එය අපට ගැටළුවක් නොවේ. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ඇන්තනි, ඔබ සමග සිටින සියල්ලන් ඔබ අත්හැර ගියත් ඔබ තනිවම හෝ මේ ගමන එන්න. එවිට මම සියල්ල සිදුකරමි." දහම් නවෝදය සංඝයේ ශ්‍රාවකයන් ලෙස තවත් අය අප සමග සිටියහ. මේ ගමනේ ඇති කටුකබව හා අසම්මතය නිසා ඔවුහු විසිර ගොස් සිටිති. මේ සංඝයේ ගමනේ ස්වභාවය පිළිබඳව ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ශුද්ධවූ සැලැස්ම උදෙසා ශුද්ධවූ වගකීම උදෙසා නුඹලාව මා ගෙන යන ගමන් මාර්ගය මෙලෙසාකාරයෙන්ම ගෙන යන්නට මම සිතුවෙමි. මන්ද, මෙය කිසිදු න්‍යායකට හසු නොවෙනවා ඇත. කිසිදු දර්ශනයකට හසු නොවෙනවා ඇත. මා නුඹලාව ගෙන යන ගමන පැටලුන නූල් බෝලයක් මෙන්ය. එහෙත් එහි නිරවුල නුඹලා අතරේ තබමින් දෙවි වූ ස්වාමින් වහන්සේ සියල්ල එකිනෙක නිරවුල් කර ගන්නා ආකාරය නුඹලාට කියා දෙමින් සිටිති. මේ පරම සත්‍යය උදෙසා යන ගමනකි. පරම සත්‍යයම සොයා යන ගමනකි. මෙය මුළු මිනිස් ජනතාවගේ ගැළවීම උදෙසා නුඹලා මගේ අතේ අතකොළුවක් වෙමින් යන ගමනකි." (42 පරිච්ඡේදය) දහම් නවෝදයට මූලස්ථානයක් නැත, කාර්යාල පහසුකම් නැත, යාන-වාහන නැත, මිල මුදල් නැත, "දුගීභාවයේ ධනයෙන් පිරී ඉතිරේවා" යන්න අප ගැන ජේසු සමිඳුන්ගේ පැතුමයි. මෙය, එකිනෙකා තමා සිටින නිවෙස තුළ සිටිමින් සිදුවන ක්‍රියාවකි. මෙය, සියල්ල සමිඳුන් සුරතේ තබා උන්වහන්සේගේ කැමැත්තට නතු වෙමින් ගත කරන මොහොතේ ජීවිතයකි. සංඝයේ එඩේරා හැටියට මා විසින් දැනට කිව යුතු සියල්ල සත්‍යවාදීව පැහැදිලිව සරලව ඔබ ඉදිරියේ තබා ඇත. ('ශුද්ධාත්ම පිය සටහන්' 1-62) මේ මොහොතේ ඔබට කියන්නට තවත් කිසිවක් මට නැත. මින්පසු කුමක් දැයි ඔබ අපෙන් විමසන්නට පුළුවන. ජේසු සමිඳුන් අපට පවසන දේ කොතරම් අසම්මත වුවත් අපි කරන්නෙමු. දැහැමි යුගයේ උදාව දක්වා 'දහම් නවෝදය' ගමන් මගේ රිද්මය එයයි. එමගින් ජේසු සමිඳුන් බොහෝ දේ සිදුකරගනු ඇත.

"අද ලෝකය අරගලවලින් ගහණ වී ඇත්තේ කිසිවකු ආගමට මුල් තැන නොදෙන නිසාය. ---- ආගම යනුවෙන් මා අදහස් කළේ මමත්වය නැති කර ගැනීමේ සම්‍යක් දෘෂ්ටියයි. පුද්ගලයාත් ඒ අනුව සමාජයත් ඇතුලතින් සැපවත් වීමේ හරි ජීවිතයයි. ආගමට මුල් තැන දෙන මිනිහා නම් සත්‍යය මතු කරන්නට උත්සාහ කරන සම්‍යක් දෘෂ්ටියාය. හෙතෙම තමා ද නොරැවටී ලෝකය ද රැවටිල්ලෙන් මුදන්නට රැකුල් දෙන්නෙකි. ---- සිත එක අරමුණක යෙදීමේ කවර ක්‍රමයකින් වුවත් තාවකාලික ප්‍රයෝජනයක් හෝ ආශ්වාදයක් හෝ ලැබෙනු විනා 'මම' යන මායා බුබුල පුපුරුවා සදා සුවය මතු කරන සත්‍යය අවබෝධ කර ගන්නට නොහැකිය. හරි භාවනාව කවරේදැයි පුද්ගලයෙකුට දෙන්නෙකුට වැටහී ගොස් ඒ ක්‍රියාත්මක කළහොත් ඔවුන්ට ද ඔවුන්ගේ පරිසරයෙන් සෙස්සන්ට ද වන්නේ මහත් වැඩෙකි. ---- අවබෝධය ලත් මිනිසා සමාජයේ සෙස්සන් ද සුවපත් කරනු සඳහා සමාජයම බෙජෙනු විනා ඉන් පිටමං නොවන්නේය. ලෝකය වෙනස් කරන්නට එකකුට දෙන්නෙකුට පුළුවන. ඉතිහාසය දෙස බැලුවහොත් ලෝකයේ අද්භූත විපර්යාසයන් කර තිබෙන්නේ මහා ජනතාව නොව එකකු දෙන්නකු බව ඔබට පෙනී යා යුතුය." ('සුදර්ශනය', අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල.)

## 63. “ඔබේ විශ්වාසය ස්ථිර නම් එතැනයි දෙවියන් ප්‍රකාශ වන්නේ.”

### 2022 නොවැම්බර් 19

“මේ තමා පරීක්ෂණයේ අමාරුම පියවරවල් ආරම්භ වී තිබෙන මොහොත. අති විශාල බේදවාචකයක් ඉදිරියේ පෙනෙන්නට තිබෙනවා, මේ දේශය තුළ. බොහෝ ප්‍රබල දේ ඉදිරියේදී සිදුවෙනවා, අති භයානක දේ සිදුවෙනවා. නිහඬයි වගේ තිබුණට ඉදිරියේදී ඉතා බිහිසුණු තත්ත්වයට මේ දේශය පත්වෙනවා. මේ දේශය පමණක් නොවෙයි මුළු ලෝකයම මුළු විශ්වයම සොලවන තැන පැමිණෙනවා, ලබන වර්ෂය වෙනකොට, විවිධ පැතිකඩවල්වලින්. දෙවියන් වහන්සේ දෙවියන් වහන්සේමයි. මම මම වෙමි. I AM WHO I AM. අද පිළිගැනීම් ලබන්න බොහෝ අය කැමතියි. පිළිනොගන්නා තැනට කිසිවෙක් එන්නෙ නැහැ. එහෙත් දෙවියන් වහන්සෙ තෝරා ගන්නෙ පිළිගැනීම් තුළ නොවෙයි, ප්‍රතික්ෂේපය තුළයි. සර්වබලධාරී වූ දෙවියන් එක්ක යන ගමන ප්‍රසිද්ධ නැහැ. එය අප්‍රසිද්ධියේ යන ගමනක්. නමුත් දිනෙක ලෝකයාම දකිනවා මෙහි ගැඹුර. එසේ නම් මෙය සරල පුංචි දරුවකු මෙන් යා යුතු ගමන් මගක්. දෙවියන්ට ඉඩ දීලා දෙවියන්ව අදහාගෙන විශ්වාසයෙන් පියවර මැන්නොත් මම ඔබව ඊළඟ පියවරට ගෙන යනවා. තමා තුළ විශ්වාසය තමයි දෙවියො. ඒ විශ්වාසය සෙලවෙනවා නම් කෙළින් යන්න අපහසුයි, වැටෙනවා. ඔබේ විශ්වාසය ස්ථිර නම් එතැනයි දෙවියන් ප්‍රකාශ වන්නේ. එවිට ශක්තිමත්ව ජවසම්පන්නව ඒ ගමන් මග අවසානය තෙක් යන්න පුළුවන්. එදා ඇටසැකිල්ල දක්වාම විශ්වාසය පරීක්ෂා කළේ කාගෙද? එලෙස පරීක්ෂා කළේ ජෝබ්ගෙ විශ්වාසයයි. ඔහුගේ විශ්වාසය ජය ගත්තනේ. ඒ වාගෙ ගමනක් ඔබලටත් යන්න වෙනවා. අවසානයේ එතැනටත් එනවා, කිසි දෙයක් නැහැ වාගේ. නොසැලෙන විශ්වාසය තියෙනව නම් සියල්ල ජය ගන්නට පුළුවන්.”

“මේ තමා නින්දාවේ ගමන. හැම දෙයක් තුළම පිළිගැනීම් නැහැ, බොහෝ විට අපහාසයන් ප්‍රතික්ෂේප වීම් පමණයි. තම අයිතිවාසිකම්වලට මරණය, තම ආශාවන්ට මරණය, තම කැමැත්තට මරණය අත්දකිමින් යා යුතු ගමනක්, මෙය. ඒ සඳහා සියල්ලෙන් හිස් වෙන්නට ඕනැ. දැන් දේව උදහස පැමිණෙමින් තිබෙන්නේ. ලේසි නැහැ, එය. දැන් භයානක පියවරවල්වලට පියාණන්ගේ උදහසේ දෙඇස් යොමු වෙමින් තියෙනවා. හැම කෙනෙකු කරාම, නිවෙස් කරා, ග්‍රාමය කරා, දේශය කරා ලෝකය කරා දේව උදහස ගමන් කරමින් තිබෙනවා. එයට කාව හසු වෙයිද? කාව කොටු වෙයිද? එනිසා අවදිව සිටින්න, අවදිව සිටින්න. භයානක නිමේෂයයි දැන් පැමිණෙමින් තිබෙන්නේ. අති බිහිසුණු මොහොතක් නිමේෂයකින් පැමිණෙනවා, ඔබ හැම දෙනා කරාම. මෙලොවින් සමුගත්තාට පසුව පැමිණෙන ඒ නඩු තීන්දුවට වඩා මෙලොවදීම භයානක නඩු තීන්දුවලට මුහුණ දෙන්නට ඔබට සිදුවන්න පුළුවන්. කෙනෙකුට හිතෙන්න පුළුවන් එහෙ ගියාට පස්සෙ නේ ඒක වෙන්නෙ කියලා. නැහැ, දැන් දේව විනිශ්චය මෙලොවෙදීම සිදුවෙන්න පුළුවන්. දෙවි පියාණන් මනුෂ්‍යයාගේ හිස කෙස් ගහේ සිට සැම සියලු දේම දන්නවා. ඔබේ සැම සිතුවිල්ලක්ම දෙවි පියාණන් දන්නවා. ඔබේ යැම්-ඊම්, හිඳුම් හිටුම් මේ හැම දෙයක්ම දෙවි පියාණන් දන්නවා. දෙවි පියාණන්ට හොරා කිසිවක් කරන්න ඔබට බැහැ. ඔබේ සිතුවිලි, ආශාවන්, බලාපොරොත්තු, ඔබ මේ තත්පරයේ හිතන දේ, මේ හැම දෙයක්ම දෙස දෙවි පියාණන් බලාගෙන ඉන්නවා. මට තියෙන්නෙ පියාණන් විසින් පුත්‍රයාණන්ට දී තිබෙන පණිවුඩය ලෝකයට එළිදැක්වීම පමණයි, අනාවරණය කිරීම පමණයි. ඒ දේ කරන්න ඒ සඳහා මෙවලමක් කර ගන්න ලෝකය පුරා විවිධ ප්‍රදේශවලින් සුදුසු අයව තෝරල තියෙනවා. දෙවි පියාණන් විසින්. ප්‍රබලව යමක් කරන්නට මැයව ආලේප කරල තියෙනවා, දෙවි පියාණන්. සුළු වේලාවක් ඇය තුළට මා පැමිණ මගේ ආත්මානුභාවයෙන් ප්‍රකාශ කරන වදන් තමයි, මේ. එය අයිති කරගෙන ගමන් කිරීම ඔබ සතු කාර්යයක්.”

“තෘෂ්ණාවට දැන් ඉඩක් නැහැ. අයිතිවාසිකම්වලින් මිදිලා පූර්ණ නිස්භාවයකින් යුතුව මෙලෙස පවසන්න. ස්වාමිනි, මෙන්න මම. ඔබ මාව මේ ලෝකයට ගෙනාවා, ඇඳිවතත් නැතිවයි ඔබ මාව එව්වෙ. අද මම බොහෝ දේවල්වලින් පිරිලා. ඉතින් ඒවා මට දැන් බිම තියන්න බැරි තරම්. අනේ ! පියාණෙනි, එලෙස සරලව මා ගෙනාපු ඔබ මා නැවත කැඳවන විටත් ඒ සරල සැහැල්ලුභාවයෙන් යන්න මාව සූදානම් කර ආලේප කරන්න. මට දැන් බර වැඩියි මගේ වස්ත්‍රාභරණ, ඇතුලත ආශාවන් හා බොහෝ දේවල් නිසා මට ගමන් කරන්න අපහසු වෙලා. ඒ බර වූ වස්ත්‍රය බිම තබලා සැහැල්ලු වස්ත්‍රයකින් මා අලංකාර කර ස්වර්ගය කරා යන මොහොතට මාව මෙතැන් පටන් සූදානම් කරන්න. මම ඒ සරල, ඔබ එව්ව මා හැටියට, එන්නට කැමතියි. කිසිත් නොදන්න පුංචි ළදරුවෙක් මම එදා. එම ළදරුවා ලෙසින්ම මම ඔබ වෙත එන්නට සූදානම් වන්නට කැමතියි. ඔන්න ඔය දේ තමයි අද නුඹලා තුළ වෙන්නට ඕනැ. හොඳට මෙනෙහි කරන්න,

බැඳීම්වලින් හෙම්බත් වෙලා, ඔටුනු පළන්දල, ඒවා එකිනෙක ගළවා ගන්න බැරි තරම් බර වෙලා. ඒ බරින් මාව මුදවා ගන්න. ඒ පාපධාරි වස්ත්‍රයන්ගෙන් ගළවා ගන්න. ඒ සරල පුංචි ළදරුවා වෙන්නට මා කැමතියි. වස්ත්‍රයක්වත් නැතිවයි මාව එව්වෙ ඔබ. එතැන් පටන් දිනෙන් දින වැඩෙන්න වැඩෙන්න මගේ ශරීරයට බර වැඩි වුණා. ලෝක ආශාවල්වලින් මම පිරුණා. පාපයේ බරින් මා හෙම්බත් වෙලා. පියාණෙනි, ඒ පුංචි ළදරුවා කොට මාව ගෙන යන්න, සරල භාවයෙන් සරල වස්ත්‍රයකින්. මෙච්චරයි ඔබ ඉල්ලන්න තියෙන්නේ. බොහෝ දේවල්වලින් ඔබට මිදෙන්න බැහැ, ඔබල පිරිල ඉන්නෙ, බිම තියන්න බැහැ, අත්හරින්න හිතෙන්නෙම නැහැ. ඒ තරම් ආශාවක් ඇතිවෙලා, තෘෂ්ණාවක් ඇතිවෙලා. ඒ මගේ කියන ආත්මාර්ථය මා වටා මාව බැඳ දමලා. පියාණෙනි, මෙයින් අපව මුදවා ගන්න, මිනිස් පරපුර ගළවා ගන්න. මේ ලෝකයේ පාප කිළිටි නමැති වස්ත්‍රය මගෙන් ඉවත් කරන්න කියලා යදින්න, සැම දින. ඒ සඳහා මොරගසන්න, මෙනෙහි කරන්න, පියවරෙන් පියවර මොහොතින් මොහොත, ඇයි ඔබ ආවේගශීලි වන්නේ, ගැටෙන්නේ, අනෙකා හා උරණ වන්නේ, විලාප නගන්නේ. මේවා අත්හැර යන්නට වෙනවා, මේවා අරගෙන යන්නට බැහැ, කවදාවත්. අරගෙන යන්නට වෙන්නේ නිරයට මිස ස්වර්ගයට නොවේ. එම නිසා මා ප්‍රේමවන්ත දරුවෙනි, අවදි වන්න, අවදි වන්න. කාලය පැමිණ ඇත.''

ජේසු සමිඳුන්ගේ මෙම වදන්වලට අවධානය යොමු කරන විට මට අවබෝධ වන්නේ 'ශුද්ධාත්ම පිය සටහන්' 56 පරිච්ඡේදයේ 3, 4 අංකවලින් හා 58 පරිච්ඡේදය 11 අංකයෙන් මා විස්තර කළ තත්ත්වය දැන් ලොවට උදාවන්නට සූදානම් බවයි. එනිසා එම සටහන් නැවත අධ්‍යයනය කිරීම මේ මොහොතේ ඉතා සුදුසුයි. මේ සියල්ල අධ්‍යයනය කරමින් උදාවන මේ අති උතුම් අති බිහිසුණු අදියරට සූදානම් වීම මේ දේශයේ හා ලෝකයේ සියලු දෙනාගේම වගකීමයි. ඒ සඳහා ජේසු සමිඳුන් අපට පවසන්නේ සියලුම ආගමික ශාස්තෘවරුන් දෙසූ නිවැරදි දහම් මගට පිවිසෙන ලෙසයි. ආගමික මූලධර්මවාදයෙන් හා ආගමික අන්තවාදයෙන් බැහැර විය යුතුමයි. ආගමික ශාස්තෘවරුන් දෙසූ නිවැරදි දහම විකෘති කිරීම් තුළ කිසිදු විමුක්තියක් නැත. මේ තීරණාත්මක මොහොතේ අවශ්‍ය වැදගත්ම දෙය සියල්ලන් තුළ යහපත දෙසට සිත් පෙරලියක්, ජීවිත මාරුවක් ඇති වීමයි, සැබෑ පසුතැවිල්ලක් මනස්තාපයක් ඇති වීමයි. මැවුම්කරුවාණන් වන සැබෑ වූ එකම දෙවියන් වහන්සේ හැම මනුෂ්‍ය ජීවිතයකම අයිතිකරු වෙති. එතුමෝ පාපය ප්‍රතික්ෂේප කරති, එහෙත් කිසි විටෙක පව්කරුවා ප්‍රතික්ෂේප නොකරති. අන්ත ජරාජීර්ණ තත්ත්වයක සිටියත් උන්වහන්සේ ඔහු ප්‍රතික්ෂේප නොකරති. අයහපත දුරලා හැරී එන්නැයි එතුමෝ සියල්ලන්ට ඇරැයුම් කරති. අවංකව හැරී එන සියල්ලන් එතුමෝ ආදරයෙන් වැළඳ ගනිති. දැන් දේව උදහස ලුහුබඳින මොහොතයි. යමෙක් එතුමන්ගේ කාරුණික ඇරැයුම ඉදිරියේ අන්ධයන් බිහිරන් මෙන් හැසිරේ නම් දේව උදහසට මුහුණ දීමට සිදුවනු ඇත.

මේ පරිච්ඡේදය ආරම්භයේ මා සටහන් කළ 2022 නොවැම්බර් 19 ජේසු සමිඳුන්ගේ පණිවුඩය එතුමන් අප වෙනුවෙන් දුන්නේ සුනිමල් චතුරංග සොයුරාටයි. ඒ පණිවුඩයේ අතින් ලියන ලද සටහනක පිටපතක් ඔහු මට දුන්නේ දෙසැම්බර් 12ස් වන දිනයි. ඒ දිගු පණිවුඩය ආරම්භයේම ඇති වැකි කීපය දෙසට මගේ අවධානය වැඩියෙන් යොමු විය. "නමුත් මට එක කණගාටුවක් තියෙනව පුතා. තවම ඇන්තනි මගේ මේ ක්‍රියාවලිය පිළිබඳව ගැඹුරු විශ්වාසයේ ගැඹුරුම තැනට ඇවිත් නැහැ. දෙවියන්ගෙ සැලැස්ම ලෝකයා දකින්න කලින් මේ අය දැකල ඉවරයි පුතා." ඇයි, ජේසු සමිඳුන් එලෙස පවසන්නේ? දින ගණනාවක් මා ඒ ගැන මෙනෙහි කළත් මට නිසි පිළිතුර නොලැබිණි. දැනට වසර 27ක් පමණ සංඝයක් ලෙස අප මුහුණ දෙන මේ අසම්මත ක්‍රියාවලිය මම මුළුමනින් විශ්වාස කරමි. "සියලු කඳු හෙල් සමතලා කරමින් සංඝයට පෙරට යන්නට මම ගමන් මග සකසමි. ඒ සියල්ල මම ම කරමි. නුඹලා මා කියන දේ පමණක් කළ යුතුයි." අප අමතා ජේසු සමිඳුන් පැවසූ එම වදන් මම මුළුමනින් විශ්වාස කරමි. "මේ අසම්මතය සම්මතයක් කරන්නේ ජේසු සමිඳුන් විසින්මයි." උන්වහන්සේ අප අමතා පැවසූ එම වදන් ද මම මුළුමනින් විශ්වාස කරමි. එසේ නම් ජේසු සමිඳුන් මා පිළිබඳව එලෙස පැවසුවේ ඇයි? එය මම දින ගණනාවක්ම මෙනෙහි කළත් ඊට නිසි පිළිතුර මට ලැබුණේ දෙසැම්බර් 24 උදෑසන යැදුම තුළයි, ජේසු සමිඳුන් මෙම ක්‍රියාවලිය තුළ අපට පැවසූ අදහසක් මට එදින සිහිපත් විය. "කෝටි සංඛ්‍යාත ජනතාවක් අතරින් නුඹලා ස්වල්ප දෙනෙක් තෝරාගෙන මා කරමින් සිටින මෙම ක්‍රියාවලිය ගැන නුඹලා කොපමණ ප්‍රීති විය යුතුද?" ජේසු සමිඳුන්ගේ මේ ක්‍රියාවලිය පිළිබඳ ගැඹුරු විශ්වාසයේ ගැඹුරුම තැන එයින් මට අවබෝධ විය. මා සමිඳුන් තුළ ඉමහත් ප්‍රීතියෙන්, ස්තුතියෙන් දැල්වෙන්නට අවශ්‍යයි. මේ ක්‍රියාවලිය පිළිබඳව සමිඳුන් තුළ ප්‍රීති වීමේ අඩුවක්, තුති දීමේ අඩුවක් මා තුළ ඇත. එනිසා ජේසු සමිඳුන් නොවැම්බර් 19 පැවසූ ඒ අදහස නිවැරදියි.

විටෙක කලකිරීම්, කණස්සල්ල මා වසා ගනී. එය ඇටමිදුළු දක්වාම ඇතුලු වී ඇතැයි මට සිතේ. විටෙක ජීවිතය මලක් මෙන් විකසිත වෙයි. ඊත් මොහොතකින් එය මැළවී යයි. එසේ වන්නේ

ඇයි? සමිඳුන් තුළ මට එන්නට සිදුවූ දිගු කටුක ගමන් මග, අත්දුටු සියලු ප්‍රතික්ෂේප වීම්, වසර 38ක විප්‍රවාසය හා හුදෙකලාව ඒ සඳහා හේතුවක් වන්නට ඇත. ජේසු සමිඳුන් තුළ නව දිවියක් මුල පුරා දැන් ගතවන්නේ 49 වන වසරයි. පුබුදුවෙන් ගිලිහී ගොස් විප්‍රවාසයක අත්දැකීමක් තුළ මේ 38 වන වසරයි. ඒ 38න් අවුරුදු 27ක්ම ජේසු සමිඳුන්ගේ මේ අසම්මතය තුළයි ගතවූයේ. එය වඩාත් කටුක විප්‍රවාසයක් විය. ගීතාවලිය 31: 11, 12, 14, 15 මගේ ඒ අත්දැකීම කදිමට නිරූපනය කරයි. "මට සතුරුකම් කරන්නන් නිසා මම අසල්වැසියන් අතර නින්දාවක් ව සිටිමි. මගේ මිතුරන්ට මම භීතියක්ව සිටිමි. වීදියේ මා දක්නා අය මා වෙතින් පලා යන්නෝය. මා සියල්ලන්ගේ මතකයෙන් ඉවත ගිය මියගිය කෙනෙකු මෙන් වී සිටිමි. මා බිඳුණු බඳුනක් මෙන් පසෙක දමා ඇත. එහෙත් සමිඳුනි, මා විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහිය. මගේ දෙවියෝ ඔබ යැයි කියමි. මගේ කාලයන් ඔබ අතේය." වසර 49ක් පුරා අරමුණ කරා මා දිරි ගන්වන, දහමේ උතුම්ම හරයන් සටහන් කරගෙන, ඒ සියල්ල නැවත නැවත මෙනෙහි කරමින් මා යටපත් කරන්නට තැත් කරන කලකිරීමට යට නොවී, එය අභිබවා ජය ගන්නට නොනැවතී තැත් කළ පුංචි අසරණ ආත්මයක් පමණකි, මා. මේ අසම්මතය ඔස්සේ සමිඳුන් අප ගෙන ආ ගමනක වැදගත් අදියරක් දැන් මුල පිරෙන්නට සූදානම්ව ඇත. එය මහෝත්තමයාණන්ගේ බලගතු බාහු බලය දේශය මත ලෝකය මත දිස්වන මොහොතයි. දැන් උදාවන්නට සූදානම්ව ඇති ඒ පියවරේදී මෙම අසම්මතය සම්මතයක් වීමේ කාර්යය ද සපිරෙනු ඇත. එවිටයි, අප මුහුණ දෙන විප්‍රවාසය, අසම්මතය ප්‍රායෝගිකව අවසන් වන්නේ. ඒ සලකුණු දිස් වන විට අප සංඝයක් ලෙස සමිඳුන් තුළ සොම්නසින් ඉපිලෙන බව, මුව පුරා හද පුරා සමිඳුන් පසසන බව මම දනිමි. එලෙස මෙම ක්‍රියාවලිය පිළිබඳ ගැඹුරු විශ්වාසයේ ගැඹුරුම තැනට මා පිවිසෙන බව මම දනිමි. දැන්ම විශ්වාසය තුළ ඒ ඉලක්කය වෙත පිවිසෙන්නට මා ක්‍රියා කළ යුතුය.

2020දියි ජේසු සමිඳුන්ගේ මෙම ක්‍රියාවලිය වෙබ් අඩවියක් මගින් ලෝකයට විවර කළේ. මෑතකදී 'ශුද්ධාත්ම පිය සටහන්' 56-62 දක්වා සටහන් අපි උනන්දුවෙන් බෙදා හැරියෙමු. එසේ කරන ලෙස ජේසු සමිඳාණෝ අපට පැවසූහ. බොහෝ අය වෙත ඒවා තැපැල් කළත් ඒවා ලැබුණ බවවත් ඔවුහු නොපැවසූහ. හමුවෙන කිසිවෙක් ඒවා කියවූ බවවත් පැවසුවේ නැත. එසේ වූයේ මේ අසම්මතය තුළ මා සිටින බව ඔවුන් දන්නා බැවිනි. සභා ශ්‍රේෂ්ඨයින් හා පූජාප්‍රසාදිවරුන් වෙත ඒවා යැව්වත් ඔවුහු නිහඬවම සිටිති. 'කතෝලික සභා ධර්මෝපදේශය' 65-67 සීමා තුළ ඔවුන් පැවතීම ඊට හේතුව වන්නට පුළුවන. කීප දෙනෙකුට හෝ මේ සටහන් මා අතින්ම දීමේදී මා පැවසුවේ මෙයයි, "මෙය කියවන්න. එසේ නොකළත් මෙය පරිස්සම් කර තබා ගන්න. ඔබ කවදා හෝ මෙය කියවන බව මම දන්නවා." මම වසර 10ක් 'කිතු දන පුබුදුව' තුළ සිටියෙමි. ඔවුන්ට මේ සටහන් ලැබුණත් බොහෝ අය ඒවා නොබලන්නට ඉඩ ඇත. ඊට හේතුව මෙයයි, පුබුදුව මා පිළිබඳ සියල්ල නිමා කළේ මෙවැනි මතවාදයක් පුබුදුව පුරා ව්‍යාප්ත කරමිනි. "ඇන්තනි, ඇන්තනි මේරි, සම්පත් ඔවුන් විශේෂ පුද්ගලයන් යැයි ඔවුහු සිතා සිටිති. ඒ ස්ථාවරය ඔවුහු කිසිසේත් වෙනස් නොකරති. එනිසා මෙය අශුද්ධ ආත්මයකි. එය අධි ආධ්‍යාත්මික අශුද්ධ ආත්මයයි. කාමුක අශුද්ධාත්මය, තෘෂ්ණාවේ අශුද්ධාත්මය යාච්ඤාවේ බලයෙන් පලවා හැරිය හැකිය. අධි අධ්‍යාත්මික අශුද්ධ ආත්මය යාච්ඤාව තුළින්වත් පලවා හැරිය නොහැකිය. ඔවුන් ඇසුරු කරන්නන්ටත් එය පැතිරේ." ඒ මතයෙහි දැඩිව එල්බ සිටින්නන් කිසිසේත්ම මෙම සටහන් නොකියවනු ඇත.

අප අතර සිදුවන ජේසු සමිඳුන්ගේ මෙම ක්‍රියාවලිය දැහැමි යුගයක උදාව සඳහා සිදුවන ප්‍රසව වේදනාවකි. සමහරුන් ඒ අදහසට පවා කැමති නොවන්නට ඉඩ ඇත. එය ඔවුන්ට වධයක් මෙන් පෙනෙනු ඇත. අධර්ම බලවේගයන්ට දැනුවත්වම සේවය කරන්නන් දෙවිඳුන්ගේ මෙම ක්‍රියාවලිය ගැන කොහෙත්ම ප්‍රසන්න නොවනු ඇත, එනිසා ඔවුන් මෙහි මහා මොළකරු සොයනු ඇත. මැවුම්කරුවාණන් වහන්සේමයි, මෙහි මහා මොළකරු. මේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රධාන වගකිවයුත්තා කවරෙක් දැයි ඔවුන් සොයනු ඇත. ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "මගේ මෙම ක්‍රියාවලිය ඇරඹුනේ 1974 වසරේදීය." 1974 සැප්තැම්බර් 21, 22 ජේසු සමිඳුන් මගේ ගැළවුම්කරුවාණන්, ස්වාමියාණන් හා එඬේරාණන් ලෙස පිළිගනිමින් පිබිදුණු දිවියට පිවිසුණෙමි. මම ජේසු සමිඳුන් අබියස මෙසේ පැවසීමි. "සමිඳුනි, ඔබ මා ගෙන යන ගමනට මම දිගටම ඉඩ දෙන්නම්. ඔබ ගෙන යන ගමනට එක් අයෙක් හෝ මුළුමනින් ඉඩදීම මනුෂ්‍ය වර්ගයාගේ ඉදිරිය සඳහා හිතකරයි. ඒ උදෙසා මෙලොව වශයෙන් හෝ සදාතනික වශයෙන් මම ඔබගෙන් කිසිවක් බලාපොරොත්තු නොවෙමි. ඔබ සියල්ලන්ට දෙන්නට පොරොන්දු වන දිනාරය පමණක් මට සෑහේ. නියතවම එය මට ලැබෙනු ඇත. ඒ මගේ කිසිම සුදුසුකමක් නිසා නොව ඔබගේ ජීවිත පූජාව නිසාය." 49 වන වසරටත් සමිඳාණෝ මා ගෙන යමින් සිටිති. අපගේ නිවසේ හෝ ඥාතීන්, අසල්වැසියන්, මිතුරන් අතර කිසිවෙකු මේ ක්‍රියාවලිය ගැන වගකිව යුතු නැත. මන්ද, කිසිවෙකු මෙවැනි අසම්මත ගමනක් සඳහා වචනයකින් හෝ මා දිරි ගන්වා නැත. ඒ සඳහා මා අධෛර්යය කිරීමක් පමණයි ඔවුන්ගෙන් සිදුවූයේ. 'දහම් නවෝදය' සංඝයේ 40ක් පමණ සිටියහ. ඔවුන්ගෙන්

බහුතරය මේ ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කර එයින් බැහැර වූහ. එක අතක ඇඟිලිවලින් ගණන් කළ හැකි තරම් ශ්‍රාවක පිරිසකි, දැන් අප අතර සිටින්නේ. ඔවුහු මේ අසම්මත ගමන සඳහා නිරන්තරයෙන් මා දිරි ගැන්වූහ. එනිසා මෙම ක්‍රියාවලිය ගැන මමත් ඔවුන් ස්වල්ප දෙනාත් පමණකි, වගකිව යුත්තේ. පිරිසක් අතර හුදකලා වූ මනුෂ්‍යයාගේ අත්දැකීමයි, මා බොහෝ කලක සිට විඳිමින් සිටින්නේ. මා හමුවූ විට බොහෝ දෙනෙකුට මා හා කතා කරන්නට ඇත්තේ එදිනෙදා කාලගුණ තත්ත්වය ගැන පමණකි. එසේ වන්නේ මහා අසම්මතයක් තුළ මා සිටින බව ඔවුන් දන්නා බැවිනි.

දේව දිළින්දාගේ හා දුක් විඳින දේව සේවකයාගේ අත්දැකීම මා තුළ පූර්ණත්වයට පත්වන ජීවිතයක් උදෙසා දෙවි සමිඳුන් මා තෝරාගෙන ඇත. ඒ පැතිකඩ පිළිබඳ ගැඹුරු අවබෝධයක් මුළු ජීවිතය පුරා මා ඇසූ කිසිම දේශනයකින් මට ලැබී නැත. එය මට ගැඹුරින්ම ලැබුණේ ආචාර්ය, ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමාගේ 'විමුක්තියේ පිය සටහන්' පොතෙනි. මේ එයින් උපුටා ගත් වැකි කිපයකි. “දේව දිළින්දා (අනව්ම්) එහි සාමාන්‍ය අරුත අවමන් කරනු ලැබූ තැනැත්තා, පහත් කළ තැනැත්තා යනුයි. දෙවිඳුන් වෙත සමීප වීමට මිනිසාට ඇති හොඳම මාර්ගය ආධ්‍යාත්මික දිළිඳුකමයි. මෙවන් දිළිඳු මිනිසා තමාගේ බලාපොරොත්තුව හා ශක්තිය දෙවිඳුන් මත පිහිටන්නේය. දිළිඳු සිත් ඇත්තන්ට හා පීඩා විඳින්නන්ට දෙවියන් වහන්සේ නිතරම සවන් දෙන බව බයිබලය පවසයි. ඔවුන්ට උන්වහන්සේ ප්‍රකාශ වන්නේ කරුණාවේ ස්වාමින් වහන්සේ වශයෙනි. මේ දිළිඳු බව ආධ්‍යාත්මික වශයෙන් දේව සේවයෙහි නිරතව සිටීමට ඔහුට අවස්ථාව සලසා දෙන්නේය. දෙවියන් වහන්සේගේ නාමයෙන් දේව දිළිඳුකම සෑම අංශයකින්ම පිළිගන්නා තැනැත්තා දේව සේවකයා වේ. ඔහුගේ දේව දිළිඳුකම දෙවියන් තුළ ඉතා බලසම්පන්න වන්නේය. ලෝකයාගෙන් නොව දෙවියන් වහන්සේගෙන් තමාට යුක්තිය ඉටුවන බව ඔහු විශ්වාස කරයි. දේව සේවකයා සෑම දේකටම මැදහත් සිතින් මුහුණ දුන්නෙත් සෑම දෙයක්ම ඉවසුවෙත් ජනතාව වෙනුවෙනි. ඔහු තම ජීවිතය ජනතාව වෙනුවෙන් පිදූ පාප පූජාවක් ලෙස සැලකීය. දේව සේවකයාගේ දිළිඳුකමින් මහත් යැදුමක් ඔහු දෙවියන් ඉදිරියේ කරන්නේය. දේව සේවකයාගේ දුක් විඳීම අහම්බෙන් වන සිදුවීමක්වත් හුදෙක් මිනිසුන් විසින් කරන ලද්දක්වත් නොවේ. එය පාප පූජාවකි. දෙවියන් වහන්සේ තම රාජ්‍යය පිහිටුවනුයේ සේවකයාගේ දුක් විඳීම්වල මාර්ගයෙනි. එය සිය කැමැත්තෙන් ඔප්පු කරනු ලබන යාග පූජාවකි. දේව සේවකයා පරාජයේ මාර්ගයේ ගමන් කර ජයග්‍රහණය කරා පැමිණෙයි. ඔහුගේ පිළිවෙල සාමාන්‍ය පිළිවෙලට වෙනස් ය.”

උදාවන්නට නියමිත දේව සැලැස්මේ මෙම පියවර පිළිබඳව 2005 වසරේදී ළාබාල දාසියගේ මුවින් ජේසු සමිඳුන් පැවසූ අදහසක් මට සිහිපත් විය. මොහොමඩ් කන්ද ළඟට යනවා නොව කන්ද මොහොමඩ් දෙසට පැමිණීමක් ගැන ඇති කතාව ගැන අපි කතා කරමින් සිටියෙමු. එවිට ඇයගේ මුවින් ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. “මොහොමඩ් කන්ද ළඟට පැමිණීමක් නොවේ, කන්ද මොහොමඩ් ළඟට පැන පැන එන්නට පටන් ගැනීමක් වාගේ දෙයක් තමයි ඉදිරියේ සිදුවන්නට යන්නේ. ඒ සඳහා සංඝයක් ලෙස නුඹලා විශාල මිලයක් ගෙවිය යුතුයි. දෙවියන් වහන්සේ ව්‍යවස්ථාව නොව ප්‍රේමයයි. අද මගේ සභාව ප්‍රේමය නොව ව්‍යවස්ථාව වෙමින් ඇත. ඒ ගැන ජේදුරු සග ලොව සිට වැළපෙයි.” (විශාල මිලයක් යනුවෙන් අදහස් කරන්නේ මහා කැපවීමක්, වැය වීමක්, විඳවීමක්, පූජා වීමක් ගැනයි.) “අයුක්තිය සුළඟක් සේ හැම තැනම හැම විටම වාගේ පැතිර සිටී. යුක්තිය වේදිකාවට එන්නේ පමා වී බර අඩි තබමිනි.” 'ශුද්ධාත්ම පිය සටහන්' දෙවන පිටුවේ එය සටහන්ව ඇත. ඊශ්‍රායෙල් ජනතාව මිසර දේශයේ අමානුෂික වහල්භාවය තුළ අන්ත කටුක පීඩනයකට යට වී සිටින පසුබිමක ඒ මහා පීඩනයෙන් ඔවුන් මුදාගන්නැයි දෙවිඳුන්ට මොරගසන මොහොතේ, ඒ මොරගැසීමේ උපරිමයේදී මහොත්තමයාණෝ බර අඩි තබමින් පැමිණියහ. (ශු. බයිබලය- නික්මයාම පොත) උත්ථාන වූ ජේසු සමිඳුන් තම සභාව ආරම්භ කරමින් එය තහවුරු කරන මොහොතේ මහෝත්තමයාණෝ බර අඩි තබමින් පැමිණියහ. (ශු. බයිබලය- ක්‍රියා පොත) යුගාන්තයේ සිදුවන දැහැමි යුගයේ උදාව උදෙසා, ඒ සඳහා සිදුවන මහා පවිත්‍රකරණය උදෙසා දැන් විශ්ව මැවුම්කරුවාණන් වහන්සේ බර අඩි තබමින් පැමිණෙන්නට සූදානම්ව සිටිති. සංඝයේ එඬේරා ලෙස මා ද සංඝයේ ශ්‍රාවකයින් ද ජේසු සමිඳුන්ගේ මෙම අසම්මත ක්‍රියාවලිය පිළිබඳ සොම්නසින් ඉපිලෙමින් හද පුරා සමිඳුන් පැසසිය යුතු මොහොත පැමිණෙමින් ඇත. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. “මම සියල්ල කරන්නම්. ඒකට ඔබලාගෙ කැපවීම මොරගැසීම අවශ්‍යයි. එකතු වෙමින් කරන යාච්ඤා විතරක් නොවෙයි, තනිව තමා ඉන්න තැන නිදහසේ ඉන්න විට හැම මොහොතකම ප්‍රබල ලෙස ගැඹුරින් ගැඹුරට කරන යාච්ඤා අවශ්‍යයි. එවිට ඉහළින් අසා සිටින තැනැන් වහන්සේ ඒ දෙස බලා මේ තුළ මහා ආශිර්වාදය රැකවරණය බලය ඔබලට දෙනවා ක්‍රියා කළ යුතු තැන්වලදී ක්‍රියා කරන්නට. දෙවියන් වහන්සේ මට වගකීමක් පැවරුවා නම් මා එය එලෙසම ඉටු කරනවා යැයි දැඩි අධිෂ්ඨානයකින් තීරණය කරමින් ඉදිරියට යා යුතුයි.” ('ශුද්ධාත්ම පිය සටහන්' 53 පරිච්ඡේදය)

# 64.
# “දැන් තමා ධර්මය හා අධර්මය අතර සටන තීව්‍ර වෙමින් පවතින කාලය. එනිසා ගොඩක් ගැඹුරින් ගැඹුරටම මැවුම්කරුවාණන් වහන්සේ තුළ පවතින්න.”

**1. 2023 මැයි 13**
(ජේසු සමිඳුන්ගේ මුලසුනේදී ප්‍රථම දාසිය මගින් සුනිමල් චතුරංග සොයුරා අමතමින්)

“දැන් තමා ධර්මය හා අධර්මය අතර සටන තීව්‍ර වෙමින් පවතින කාලය. එනිසා ගොඩක් ගැඹුරින් ගැඹුරටම මැවුම්කරුවාණන් වහන්සේ තුළ පවතින්න. උන්වහන්සේගේ අතේ එල්ලිගෙන ඒ දකුණු මහා බාහු බලයෙන් සන්නද්ධ වෙමින් පෙරටම ගමන් කළ යුතුයි. දැන් පරදින්නට බැහැ. නමුත් නපුරා පරද්දන්න බලාගෙන ඉන්නවා. එනිසා ප්‍රබල යමක් ඉදිරියේ සිදුවෙන්නට තිබෙනවා, මේ දේශයටත් මුළු ලෝකයටත්. විවිධ පැතිකඩවල්වලින් මුළු විශ්වයම සොලවන මොහොතක් පැමිණෙනවා. බොහෝ විට මට දකින්නට ලැබෙනවා මැය (සුජීවා) උදෑසන යාච්ඤා කරනවා. ඇයගෙ මුවින් නික්මෙන මෙවැනි වදන් මා අසා සිටිනවා. පොළොව ඇතුළෙ තියෙන දේ මම දන්නෙ නැහැ, ජේසු. ඔබවහන්සේ ඒවා පාලනය කරන්න. අහසෙ සිදුවන දේ මුහුද ඇතුළෙ සිදුවන දේ මම දන්නෙ නැහැ. ඔබවහන්සේ ඒවා පාලනය කරන්න. මේ සියල්ල සම්බන්ධ වෙලා තමයි දෙවි පියාණන්ගේ පවිත්‍ර කිරීම ආරම්භ වන්නේ. දැන් ඒ භයානක මොහොත පැමිණෙමින් තිබෙනවා. සභාව තුළත් දැන් නොදැනුවත්ව බොහෝ දේ වෙනස් වෙමින් තිබෙනවා. සභාවට මේ අනාවරණයන් විගස දෙන්නට කියල මා කීවෙ ඒ නිසයි. දැන් එයාලට මේවා වැටහෙන්න ඕනැ. එහෙම වැටහෙන කීප දෙනෙකුත් ඒ අය අතර ඉන්නවා. මේ ප්‍රකාශන උනන්දුවෙන් බලන අයත් ඉන්නවා. ඔබගේ කර්තව්‍යය තමා ජාත්‍යන්තරයට ඉංග්‍රිසි මාධ්‍යයෙන් මේ පණිවුඩ යැවීම. ඔබගේ මිතුරන් ද ඒ සඳහා උපයෝගි කර ගන්නට පුළුවන්. ඔයාට ඒකට ලොකු වෙහෙසක් දරන්න සිදුවෙනවා. ඔයා ඔයාව පරෙස්සම් කර ගන්නත් ඕනැ. ඔයාගෙ තරුණ වයසෙදි ඔයාගෙන් මට ලොකු සේවාවක් වෙනවා. මගෙ මේ තෝරා ගැනීමත් එක්ක තමයි ඔයාට නපුරාගෙ පහරදීම් වැඩි වෙමින් තියෙන්නෙ. ඒකයි, අවබෝධ කරගන්න ඕනෙ. දෙවියන් වහන්සේ එක්ක යනකොට කුරුසිය කරට ගන්න ඕනැ. එහි බර දිනෙන් දින වැඩි වෙනවා, බිම ඇද වැටෙනවා. නැවත නැගිටිමින් ඉදිරියට යන්නට ස්වාමින් වහන්සේ අත දෙනවා. අද මනුෂ්‍යයාට මොන තරම් දේ ලබා දුන්නත් සෑහීමට පත්වන්නෙ නැහැ. ඒකත් පාපිෂ්ඨ තත්ත්වයක්. යම් දිනෙක ආලෝකය නැතිවී ඝන අඳුරක මුළු ලෝකයම තබන මොහොතක් එනවා. ඉතින් ඒ හැම දෙයක්ම ඉස්සරහට සිදු වෙනවා. දැන් නිහඬයි වගේ තිබුණට බොහොම භයානක සිදුවීම් රැසක් ඉදිරියේ වෙන්නට තියෙනවා. බොහෝ වේලාවට පොළොව නිශ්චල වන්නෙත් නැහැ. අහස, සමුදුර නිශ්චල වන්නෙත් නැහැ. දෙවි පියාණන් උදහස පාන්නෙ ඒ ආකාරයෙන්. හරිම කල්පනාවෙන් ඔයාලගෙ ප්‍රකාශන කටයුතු සේරම කරගෙන යන්න.

භයානකම දේ සිදුවෙනවා, රාජ්‍ය නායකයින්ට සහ සභා ශ්‍රේෂ්ඨයින්ට. ඔවුන් දැන් අඳුරේ අතපත ගානවනෙ. දැන් සභාවත් සියල්ල වෙනස් වෙමින් පවතිනවා. මරියාවන් ගැන සිතන්න. ඇය දන්නවා තමාගේ එකම පුත්‍රයාව කුරුසියේ ඇණගසනවා කියල, නින්දා අපහාස විඳින්න වෙනවා කියල, මහා ගාවිනාවක් විඳින්න වෙනව කියලා. නමුත් එයා කවදාවත් සොල්දාදුවන්ට ශාප කළේ නැහැ. වරදකරුවන්ව උසාවියට ගේන්න කීවෙ නැහැ. තම පුත්‍රයාණන් මරණයෙන් ජය අරගෙන ආවා කියල ලොකු ආඩම්බරයකින් සිටියෙ නැහැ. ඒ සියල්ල සිත්හී නිදන් කරගෙන සියල්ලන්ට ප්‍රේම කළා. ඇයගෙ ඒ උතුම් ජීවිතාදර්ශය මත ගොඩනැගුණු මගෙ සියලු අපෝස්තුළුවරු ආයෙ කවදාවත් ආපස්සට වැටුණෙ නැහැ. මුල් කිතුනු සභාව ගැන සිතන්න. අපෝස්තුළුවරුන් තුළින් දිස් වූ ඒ උතුම් ජීවිතාදර්ශය මුල් සභාව ආදරයෙන් වැළඳ ගත්තා, ඉතා දිගු කාලයක් මහා පීඩනයන්ට මුහුණ දුන්නා, කටුක මරණයට මුහුණ දුන්නා, කිසිවකුට ශාප කළේ නැහැ. තමාට විඳින්නට සිදුව ඇති සියලු වේදනා සියලු අසාධාරණකම් දෙවියන්ට පමණක් කීවා, දෙවියන්ගෙන් පමණක් සාධාරණත්වය බලාපොරොත්තු වුණා, කිසිම පාලකයෙක්ට තම දුක් ගැනවිලි කීවෙ නැහැ, ඔවුන්ගෙන් පිළිසරණක් පැතුවෙ නැහැ. ඒත් ඔවුන් ජය ගත්තනෙ. නමුත් අද මොකක් ද සභාවෙ වෙන්නෙ? එදා මම ජේදුරුට සමාව දුන්නා, ජුදස්ටත් සමාව දුන්නා. ඇයි සභාවට අද සමාව දෙන්නට බැරි? ඇයි, වැරදිකරුවන් සොය සොයා ජනතාව රැස් කරන්නෙ? දැන් සභාව කරන්නෙ ඒකනෙ, පුතේ. දැන් ඔය බෝම්බ ප්‍රහාරය ගන්නකෝ, ඒ ගැන මිනිසුන්ගෙ ඇතුලෙ පැසවන තුවාල සුව වේගෙන යනකොට ආයෙ වසරකින් එය නැවත එළියට ගන්නවා, ඒ තුවාල පාරනවා. එය සභාව කරන ලොකු වරදක්නෙ, සමාව දීමේ ක්‍රියාවලියක් නොවෙයිනෙ. මේ තත්ත්වය තුළ මගේ

පූජක සක්‍රමේන්තුව ගැන මොකක්ද ලෝකයා දකින්නෙ? මේ තත්ත්වය තුළ කිතුනු සභාව ගැන අද ලෝකයා මොකක්ද කතා වෙන්නෙ? එසේ නම් ලෝකයාත් මගෙ සභාවත් සමානයිනෙ. එම නිසා හැම දෙයක් තුළටම බිහිසුණු ලෙස යක්ෂයා දැන් ඇතුළු වෙලා, මේ රටට සභාවට හා රාජ්‍ය පරිපාලනයට ඇතුළු වෙලා ලොකු දෙයක් කරන්නට යනවා, ලොකු යුද්ධයක් ඉස්සරහට තියෙනවා. මගේ උත්ථානය සමරන මංගල දින කතෝලික, කිතුනු දෙව්මැදුරු තුනක දේව මෙහෙය තුළ මෙවැන්නක් සිදුවන්නට දෙවි පියාණන් ඉඩ දුන්නෙ ඇයි කියන එක සභාව තවමත් හිතන්නට මුල පුරලවත් නැහැ. ඉතින් ඔයාලට කරන්න තියෙන්නෙ මේ පණිවුඩ විගස ලෝකයට ලබා දීමයි. හැම දෙයක්ම කල්පනාකාරීව කරගෙන යන්න. මම ඔබ ළඟ නිරතුරු රැඳී සිටිනවා.

සුනිමල් චතුරංග සොයුරා ජේසු සමිඳුන් විසින් මෙම කාර්යය සඳහා කැඳවාගත් මුල් අදියරේම **2019 සැප්තැම්බර් මාසයේදී** ජේසු සමිඳාණෝ ඔහු අමතා මෙසේ පැවසූහ. “ලෝකයේ මැවුම්කරු, නිර්මාතෘ එඬේරෙකුව තෝරල කියනවා, දැන් නුඹ මා තෝරා දෙන බැටළුවන්ව රැගෙන එන්ඩ ඕනැ. නුඹ මේ බැටළු රැළ පෝෂණය කරන එඬේරෙක්. මේ ශ්‍රාවකයො ටිකත් එක්ක එකතුවෙලා මනාලියව (මිනිස් සංහතිය) ගේන්න ඕනැ මනාලයා (ජේසු සමිඳුන්) වෙතට. මෙහි තිබෙනවා මහා ගැඹුරක්. අනෙකාගේ අඩුපාඩු දෙස බලමින් හැරී හැරී බලමින් යන ගමනක් නොවෙයි, මෙය. සියලු දේවල්වලින් හිස්ව දෙවියන් වහන්සේට අවනත වීම තුළ පූර්ණ හිස්භාවයකින් යුතුව යා යුතු ගමනක්, මෙය. උන්වහන්සේගේ හඬ ඇසෙන තරමට එඬේරා හිස් වන්නට ඕනැ. උන්වහන්සේගේ සියුම් හඬ තමා ඉදිරියේ දිස්වන තරමට තමාට දෝංකාර දෙන තරමට හිස්වීම තුළ ඔබගේ ගමන පහසු වෙනවා. ලෝකයේ දේවල් එක්ක පිරුණොත් ඒ ඔස්සේ ගියොත් හැම දාම එකම තැන තමා, ඉදිරියක් නැහැ. මනාලිය සූදානම් කරන්න නම් මනාලයා වෙතට දෙන්ඩ නම් මේ කණ්ඩායම පූර්ණව හිස් වන්නට ඕනැ. එකා මෙන් එකමුතු වන්නට ඕනැ. ඒ තරමට බැඳීමක්. ලෝකයෙන්ම කීප දෙනයි මේ උතුම් කාර්යය සඳහා තෝරල තියෙන්නේ. ස්වාමින් වහන්සේගේ උතුම් වූ ආදරය ලබල මේ වරප්‍රසාදය ලබා ගන්න කෝටි ප්‍රකෝටි ගණනක් අතරින් තෝරාගනු ලැබූවන් කෙතරම් ප්‍රීති වන්න ඕනැද, මේ ශ්‍රාවක කැඳවීම තුළ. ජනතාව රැඳෙනවා ධනය බලය තියෙන තැන්වල. ඒ නිසා මම දුගියා තුළින් තමයි සියල්ල උසස් කොට ගෙන යනු ලබන්නෙ. දිව්‍ය රුධිරයේ බලය ලබා ගන්නා තැනැත්තා හැමදාම දෙවියන් තුළ පෝෂණය වෙමින් මහා බලයක් අත්දකිනවා. එයාගේ ඇතුළාන්තය පිවිතුරුයි, ආත්මය පිවිතුරුයි. ඔබ මට මෙලෙස පවසන්න, මෙන්න ස්වාමිනී, ඔබ වහන්සේ මැව්ව මම. එනිසා මාව අයිති ඔබටයි. ඔබට ඕනැ දේ මා තුළ කරල මාව ඔබ යන අතට ගෙන යන්න, පූර්ණ හිස්භාවයකින් යුතුව.”

**2022 නොවැම්බර්** 19 ජේසු සමිඳුන් දුන් පණිවුඩය 'ශුද්ධාත්ම පිය සටහන්' 63 පරිච්ඡේදයේ සටහන්ව ඇත. එදින දුන් එම පණිවුඩයේම මෙම අදහස් ද ඇතුළත්ව ඇත. එය ඔබ ඉදිරියේ තැබීම 'දහම් නවෝදය' සංඝයේ එඬේරා හැටියට මට පැවරී ඇති වගකීමක් යැයි සිතමි. ජේසු සමිඳුන් මෙම වදන් පැවසුවේ සුනිමල් චතුරංග සොයුරා අමතමිනි. “මව් කුසේ පටන් පියාණන් විසින් ඔබව යම් ප්‍රබල තලෙන්තු සමග ගෙනැවිත් තිබෙනවා. අධර්මය ඔබව ලුහුබඳිනවා. ඒ ගැන හොඳට කල්පනාකාරී වන්නට ඕනැ. ප්‍රබල දෙයක් දෙවි පියාණන් විසින් ඔබ තුළින් කර ගන්න යනවා. ඔබ දෙවි පියාණන්ට කීකරුව උන්වහන්සේගේ දාසයෙක් වෙමින් බියගුල්ලකු නොවී ඉදිරියට යමින් තිබෙන බව පේනවා. නමුත් දිනෙක ඔබවත් යටපත් කරන්නට අධර්මාධිපති පැමිණෙනවා. එනිසා ජවසම්පන්න විය යුතුයි. ඔබ වට කරන්නට එනවා මහා සේනාවක්. එය පරාජය කරන්නට අග්‍ර මිඛායෙල්ව සම්බන්ධ කර ගන්නට ඕනැ. ප්‍රබල දෙයක් සඳහා මම ඔබව තෝරා ගෙන තිබෙන්නේ. දැනට ඔබට අවස්ථාවක් ලැබෙන මොහොතක පමණක් සංඝයේ එකතුවලට සහභාගි වන්න. එහි දී ඔබ දකින ඒ අයගේ අඩුපාඩු බිය නොවී කතා කළ යුතුයි, ඒ සියල්ල සාදා ගත යුතුයි. ශ්‍රාවකයින්ගේ හෝ එඬේරාගේ හෝ වරදක් දුටුවොත් ඔබ ඒ අයව ගොඩනගන්නට ඕනැ. බාලයින් තුළින් වැඩිහිටියන් හදන්න පුළුවන්. මේ අනාවරණයන් ලොව වෙත විදහා පාමින් කතා කරන්නට දෙමුහත් කඩුවක් කර ගන්න, ඔබේ මුව. සංඝයේ දුබල ශ්‍රාවකයින් ද අවදි කරමින් දිරිමත් කරමින් ඉදිරියට ගෙන යාමේ බලය ද ඔබ සතු කරගත යුතුයි. සියල්ලන් එකමුතු කරගෙන ඒ අය සමග කතා කරගෙන දූත මෙහෙයක් කරගෙන යාමට ඔබට පැවරී තිබෙනවා. පියාණන්ගේ කැමැත්ත මතයි ඒ මහා දූත මෙහෙවරට ඔබගේ ජීවිතය තෝරා ගෙන තිබෙන්නේ. ඉතින් කතා කරන්න ඇන්තනි සමග, මඟ පෙන්වන්න, ඔහුව ශක්තිමත් කරන්න. 'මම මම වෙමි.' ‘I am who I am.’ මේ මහා ප්‍රබල බාහු බලය පාමින් සියල්ල විදහාපාන්නට සර්වබලධාරී පියාණන් විසින් සක්‍රමේන්තු බලය තුළ ආලේප කරමින් තමා ඔබව සඟවල තිබිලා ඉදිරියට දුන්නේ. එනිසා දැන් ඔබට සිදු වෙනවා මුළු ග්‍රාමයත් මුළු දේශයත් ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙල, දූත මෙහෙවර. ඒ සමගම මුළු ලෝකයටම මේ අනාවරණ ප්‍රචලිත කරමින් ඉදිරියට ගෙන යන්නට ඔබට සිදුවෙනවා. ප්‍රබල ගමනකටයි ඔබව ආලේප කර තිබෙන්නේ. බොහෝ තැන්වලින් ඔබව සඟවමින් තිබෙනවා. බොහෝ තැන්වල ඔබව ඉදිරියට ගෙන යමින් තිබෙනවා. බොහෝ අය ඔබ කෙරෙහි ආකර්ෂණය වෙමින් තිබෙනවා. බොහෝ අය ඔබගේ හඬ ශබ්දය

අහන්න කැමති වෙනවා, ඒ සඳහා පිපාසය ඇති වෙලා තිබෙනවා. ඉතින් තව ඉදිරියට මීට වඩා පිපාසිත ජනතාවක් ඔබ වටා පැමිණේවි.''

**2023 මැයි 21** මුලසුනේදී ප්‍රථම දාසියගේ දූ පුතුන් හා සංඝයේ ශ්‍රාවකයින් කිප දෙනෙකු අමතා ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "අද මනුෂ්‍යයාගේ ජිවිතය මනුෂ්‍යයාට බරයි. ඇයි? බැඳීම්වලින් බර වැඩි වෙලා. බැඳීම් වැඩි වුණාම ඒවා බිම තියන්න බැහැ. ඔබට දෙවියන් හා ගමන් කරන්නත් ඕනෑ, නමුත් ඊළඟ අඩිය තියන්න බැහැ, ඒ බර පස්සට අදිනවා. නමුත් ඒක සැහැල්ලු කර ගන්න පියාණන්ට ආරාධනා කළාම ඒ බර සැහැල්ලු කරමින් ඔයාලගෙ ගමන පියාණන් ඔසවාගෙන යනවා. මේ බිහිසුණු කාලයේදී ඔබ හැම කෙනෙක්ම ඉල්ලන්නට ඕනෑ දෙව් පියාණන්ගේ වරප්‍රසාද රැගෙන අග්‍ර මිබායෙල් තුමෙනි, අප වෙත පැමිණෙන්න කියල. අග්‍ර මිබායෙල් තුමෙනි, ඔබ මරි මව් සමග සම්බන්ධ වී නපුර පරාජය කළාක් මෙන්, ඔබ අප සමග එකතුවී මේ ලෝකය තුළ ජීවත් වන තුරා මගේ සිතට මුරකරු, මගේ කයට මුරකරු වන්න, මගේ නිවසට මුරකරු, සේවා ස්ථානයට, මා යන මගතොට, මගේ භූමිය ග්‍රාමය දේශයට මුරකරු වන්න. මේ සියලු ජනතාවට සුරක්ෂිතභාවය දෙන්නට නපුර පරාජය කරන්නට අප හා බැඳෙන්න. එලෙස එයා එක්ක ගමන ආරම්භ කරන්න. ඊළඟට බිළිඳු ජේසුට ආරාධනා කරන්න. ඔයාලගේ ජීවිතයේ බොහෝ ප්‍රශ්න අනෙක් අය හා කතා කරන්න බැරි දේවල්වලදී ඔබේ වයස් මට්ටම අනුව ජේසුට ආරාධනා කරන්න. ජේසු මගේ වයස මෙපමණයි, ඒ වයසේ ජේසු ලෙස මා වෙත පැමිණ මගේ මිතුරා වී මා ගෙන යනු මැනව. මා තුළට ඔබගේ ආත්මානුභාවයෙන් මා ගන්නාවූ සුසුමක් එක්ක ඇතුල් වන්න. මාව මුළුමනින්ම ඔබගෙන් වසා ගන්න. මගේ දුබලතාවයන් මට අපහසු පීඩාකාරී තත්ත්වයන් ඔබ හඳුනනවා. ඔබගේ හොඳම මිතුරා සමග එකතු වී සාකච්ඡා කරනවා වාගෙ මා සමග හැසිරෙන්න. බොහොම නිහඬ පරිසරයක් තුළ ඔයාට එයා එක්ක සංවාදයේ යෙදෙන්න පුළුවන්. එයා ඇහුම්කන් දෙනවා, කතා කරනවා. මේ අත්දැකීම මගෙන් අනිවාර්යයෙන්ම ඔයාලාට ලැබෙනවා. ජේසු මට එලෙස සමීපව සිටින්නාක් මෙන් මා වටා සිටින සියල්ලන්ටත් උදව් වන්න, අප හැමෝම එකම සහෝදර කැළක් නිසා. එයා බිළිඳු කාලෙ පමණක් නොව කෙමෙන් කෙමෙන් වැඩෙන කාලෙ සිහි කරල ඔබගේ වයස් මට්ටමට එයාව ගන්න. ඔන්න ඔය මිත්‍රත්වය සැමදා ඔබව ආරක්ෂා කරනවා. මේ ජීවිතයේ මොන ප්‍රශ්න ආවත් ඔබ නාස්ති වෙන්නෙ නැහැ, දේව පුත්‍රයා ඔබ ළඟ සිටින නිසා.

දිව්‍ය පූජාවට සහභාගි වෙලා මදි. කිසිවෙක් විවේචනය නොකර තමා තමාවම ගැඹුරින් දකිමින් අඩුපාඩු සාදාගෙන දිව්‍ය පූජාව තමා තුළ ජයග්‍රහණය කරන්නට ඕනෑ. මේ කාලේ ඒ දේ අත්‍යවශ්‍යයි. මොකද ඉදිරිය අති භයානකයි. දිව්‍ය පූජාව කියන්නේ ස්වාමින් වහන්සේගේ මාංශය, රුධිරය ඒ සියල්ල ඔබව පෝෂණය කරන්නට ඔබට ආහාරයක් කොට ලබා දෙන මොහොතක්. පූජය තුළින් ස්වාමින් වහන්සේ ඔබ තුළට ජීවමානව පැමිණෙන්නේ උන්වහන්සේගේ වචනයට සවන්දීලා ඒක ඔයාල තුළ ප්‍රබලව අත්දකින්නට අවැසි බලයක් රැගෙනයි. ස්වාමින් වහන්සේගේ මාංශයේ රුධිරයේ රසය ඔබගේ දිවගට දැනෙන්නට ඕනෑ. ඒ තරම් ගැඹුරක් ඔබ තුළ ඇති වන්නට ඕනෑ. ඔබ යම් රෝගයකින් පෙළෙනව නම් මහත් ගෞරවයකින් ගැඹුරු විශ්වාසයකින් ස්වාමින් වහන්සේව ලබා ගත්තොත් ඒ රෝග සම්පූර්ණයෙන්ම සුවවෙන ප්‍රාතිහාර්යය ඉදිරියේදී සිදුවෙනවා. ----''

**2023 ජූනි 04 ඉරිදා** ශුද්ධාත්ම මංගල්‍යය මුල්කර අපි යාච්ඤාව සඳහා රැස්වූයෙමු. අප හා ඇසුරු කරන 25 දෙනෙක් පමණ එදින පැමිණ සිටියහ. සුජීවා උපයෝගි කර ගනිමින් ජේසු සමිඳාණෝ පැමිණි සියල්ලන් සමග සුහද සංවාදයක යෙදී සිටියහ. එදින ජේසු සමිඳාණෝ මෙසේ ද පැවසූහ. "දරුවෙනි, මම නැවත නැවතත් මෙය පවසන්නේ මහත් වූ වේදනාවකින්. මෙවැනි ජරාජීර්ණ තත්ත්වයක් වෙන කිසිදු ආගමක දකින්නට ලැබෙන්නේ නැහැ. ඔවුන් ආගමික ස්ථානයකට යන්නේ එතැනට සුදුසු ශීලාචාර සරල ඇඳුමකින් සැරසිලයි. පූජකයා කියන්නෙත් මනුෂ්‍යයෙක්. මගේ නාමය දරන මගෙ සභාවෙ සමහර කාන්තාවන්ගේ ඇඳුම් පූජකයාගෙ මනසත් දූෂ්‍ය කරනවා. එසේ නම් අනෙක් අය ගැන කුමක් කියන්නද?''

**2.** යුගාන්තය, ක්‍රිස්තු පුනරාගමනය හා දැහැමි යුගයක උදාව සඳහා සිදුවන්නට නියමිත දෙව් පියාණන්ගේ මහා පවිත්‍රකරණය ගැන 'ශුද්ධාත්ම පිය සටහන්' 56 පරිච්ඡේදයේ සිට පරිච්ඡේද ගණනාවකින් මම විස්තර කළෙමි. දැහැමි යුගයක උදාව සඳහා සිදුවන්නට නියමිත දෙව් පියාණන්ගේ මහා පවිත්‍රකරණය යනු මනුෂ්‍යයා දෙවියන් වහන්සේට අකීකරු වීම නිසා අහිමි කරගත් පාරාදීසය නැවත මනුෂ්‍යයා ද දායක කරගනිමින් ඒ පාරාදීසය නැවත නිර්මාණය කිරීමකි. එනිසා දෙව්පියාණන්ගේ පවිත්‍රකරණයේ අති බිහිසුණු අදියර ද මිනිස් පවුලේ යහපත උදෙසා ය.

මා ඉහත සඳහන් කළ ඒ දිගු මෙනෙහි කිරීම මම දැනට මෙලෙස අවසන් කරන්නට කැමැත්තෙමි. කලියුගය ගැන නැවත මෙනෙහි කරමින් අපි ඒ සංවාදයට පිවිසෙමු. 'බුදු සමයේ මෛත්‍රී සංකල්පය' තේමාව යටතේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශන අංශයේ මහාචාර්ය ගුණපාල ධර්මසිරි විසින් රචිත ලිපියෙන් උපුටා ගත් කොටස් කීපයක් 'ශුද්ධාත්ම පිය සටහන්' 56 පරිච්ඡේදයේ දී ඔබ හමුවේ තැබුවෙමි. එහි සටහන් වූ හා සටහන් නොවූ අදහස් කීපයක් නැවත ඔබ හමුවේ තබන්නට කැමැත්තෙමි.

"ලංකාවට පමණක් නොව මුළු මහත් ලෝකයටම අද අවශ්‍යව ඇත්තාවූ වැදගත්ම දෙය හැටියට මෛත්‍රිය හැඳින්විය හැකිය. මක්නිසාද සමකාලීන ලෝකයේ උද්ගතව ඇත්තා වූ භීෂණ සමයට මුහුණ දීම සහ එම තත්ත්වය දුරු කර ලීමට සමත් වූ යම් දෙයක් වේ නම් ඒ මෛත්‍රිය හැර වෙන කිසිවක් නොවේ. ---- මේ යුගයේ දක්නට ලැබෙන ප්‍රධානම ලක්ෂණය නම් මනුෂ්‍ය සදාචාරයේ පිරිහීම ඉතාමත් උච්චාවස්ථාවට පැමිණ තිබීමයි. කෙටියෙන් කියතොත් ධර්මය අධර්මය බවට පත්වී ඇති අතර අධර්මය ධර්මය බවට පත්වී තිබේ. ---- මේ යුගයේ පහළ වී ඇති සදාචාර පරිහානිය කෙබඳු දැයි කිවහොත් එය මීට වඩා පිරිහෙන්නට ඉඩක් නැත. සදාචාරමය වශයෙන් අන්තයටම පිරිහී ගිය එබඳු යුගයන් පිළිබඳව බුද්ධ දේශනාවල සඳහන් වී ඇත. කොසොල් රජු දුටු සිහින 16ක් පිළිබඳව සංකේතාත්මක විග්‍රහයක් තුළින් මහා සුපින ජාතකයේදී එම අනාගත වාක්‍ය දේශනා කොට ඇත. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ලෝකයේ චක්‍ර ක්‍රියාවලියේ එක් අවස්ථාවක යුද්ධය, දුෂ්ට බව හා මරණය රජ කරන්නාවූ යුගයක් පැමිණෙන බව සඳහන් වේ.

ශ්‍රී ඖරොබින්දු නම් යෝගී දාර්ශනිකයා ද ෂාර්ඩයින් පියතුමා ද මෙම යුගයේ දී මනුෂ්‍ය වර්ගයාගේ මානසික ස්තරය ඉතා තියුණු අන්දමින් ඉහළ ස්තරයකට මාරු වීමට නියමිතව ඇති බව සඳහන් කර ඇත. මෙම මතය සඳහා ඖරොබින්දු තුමා සමාජමය සාධක ඉදිරිපත් කරන අතර විද්‍යාඥයකු වූ ෂාර්ඩයින් පියතුමා ජීව විද්‍යාත්මක සාධක ඉදිරිපත් කරයි. මෙම අධි මානසික විපර්යාසය වීම සඳහා ව්‍යසනය හා මරණයට මුහුණ දී සිටීම අත්‍යවශ්‍ය බැව් සමහරුන්ගේ මතයයි. ---- කලියුගයන් ලොව පහළ වන්නේ ඉතා වැදගත් කරුණක් සඳහාය. ධර්මය සමාජයේ පිරිහෙන සමයන්හි ලෝකයේ නැවත ධර්ම සංස්ථාපනය කරනු සඳහා කලියුගයන් වැනි යුගයන් වරින් වර ලොව පහළ වන බව භගවත් ගීතාවෙහි සඳහන් වෙයි. එම නිසා මෙම යුගයේ එක් පරමාර්ථයක් නම් පුද්ගලයන්ට ධර්මය ඉගැන්වීමය. ---- එම නිසා උදාව ඇති මෙම යුගය අපේ භාග්‍යයක් කොට සැලකිය යුතුය. එය භාග්‍යයක් වන්නේ එයින් නියම ප්‍රයෝජන ගැනීමට උත්සුක වුවහොත් පමණි. ---- කලියුගයේ සියලු ප්‍රශ්නවලට එකම පිළිතුර වන්නේ මෙම මෛත්‍රිය ය. මක්නිසාද කලියුගය පරදා ජයගත හැකි ධර්ම ශක්තිය ජනනය කළ හැක්කේ එම මෛත්‍රියෙන් පමණක් වන නිසාය. ලෝකයේ වෙනත් ආගම්වල ද මෙම යුගය ගැන අනාගත වාක්‍යයන් ඇත. මෙවැනි යුගයන් ගැන කතා කරන මේ සෑම දෙනාම කියා සිටින්නේ මෙම යුගයන් සම්බන්ධව ඇති එකම ආරක්ෂාව සහ විසඳුම වන්නේ සදාචාරාත්මක හැසිරීම බව යි. සෑම කලියුග උපද්‍රවයකින්ම ආරක්ෂා වීමටත් පසුව කලියුගය පවා වෙනස් කර උතුම් යුගයක් උදා කර ගැනීමටත් උපකාරී වන්නාවූ එකම දෙය ලෙස උගන්වා ඇත්තේ සදාචාරයට ගරු කරමින් ජීවත් වීමයි. සදාචාරයේ කේන්ද්‍රිය සංකල්පය වන්නේ මෛත්‍රියයි. ධර්ම ශක්තිය ඉදිරියේ සියලු ලෞකික ශක්ති විශේෂයන් අනිවාර්යයෙන්ම පරාජයට පත් වන්නේය. ---- පුද්ගලයා යනු විශ්වමය සමස්තයේ අංශුවකි. සමස්තය අංශුව කෙරෙහි බලපාන්නාවූ ආකාරයටම අංශුවට ද සමස්තය කෙරෙහි බලපෑ හැකිය."

මේ වන විට ලොව සෑම රටක්ම අඩු වැඩි වශයෙන් කලියුගයක තත්ත්වයට මුහුණ දී සිටී. පහත පළ වන්නේ අප ජීවත් වන මේ දේශය ශ්‍රී ලංකාව මුහුණ දෙන කලියුගය පිළිබඳ කෙටි විග්‍රහයකි. (කේ. ජයතිලක සූරින්ගේ 'දියණිය ආපසු යයි.' කෙටි කතා සංග්‍රහයට ඔහු සැපයූ සංඥාපනය ඇසුරිනි.) "---- රාජ්‍ය තන්ත්‍රයේ පාලනයක් මෙහි කැලම නැති. විනෝද පළකට යන අය මෙන් සිතූ සිතූ වේලාවට කාර්යාලවලට පැමිණෙන රාජ්‍ය සේවකයෝ රාජකාරිය ද අමතක කොට ඉහළ තැන් වල පවත්නා දූෂණ ගැන දවස මුළුල්ලේ සාකච්ඡා කරමින් සිට තමන්ට ද ඊට අවස්ථාව ලැබුන විට වහා පැන එය බදා ගනිති. සාමාන්‍ය දුප්පත් ගොවියා පවා විශ්වාසය තබා සිටින්නේ තම ශ්‍රමයෙන් ලබා ගන්නා සම්පත් කෙරෙහි නොව නොමිලයේ දෙනු ලබන දෙයක් කෙරෙහිය. සෑම දෙයක්ම කණපිට පෙරළී ඇත. මෙවන් මහා කුණාටුවක් රට හරහා හමා යමින් පවතී. මෙය නූතන ලෝකය පුරා දක්නට ඇති ප්‍රපංචයක් විය හැකි නමුත් මේ දිවයින තරම් ඉන් පරිපීඩනයට පත් වෙනත් රටක් කොතැනකවත් ඇතැයි නොසිතේ. මේ සියලු ව්‍යසනයන් මධ්‍යයේ අපි අගාධයක කොටු වූ පණ කැළතක් මෙන් එකට පැටලී එකිනෙකාගේ සෝබර මුහුණු දෙස සානුකම්පිකව බලමින් අසරණව සිටිමු. අපි කුමක් කරමුද?

අහස ගුගුරුවා පොළොව වෙවුලුවා හමන චණ්ඩ මාරුතයෙන් නැගී ගලන මේ මහෝඝයට එරෙහිව තනි තනි පුද්ගලයන් හැටියට අපට කළ හැකි කිසිවක් නැත. එසේ දරන ප්‍රයත්නයකදී අප ද ඊටම ගොදුරු වී ඒ තුළම ගැලී යනු ඇත. ආයතන හා සංවිධාන වුව ද එසේමය. ---- රෝගග්‍රස්ත මේ සියලු බලවේගවලට වඩා ප්‍රබල යමක් ගැන සිතා ගැනීමට අපට පුළුවන්කම තිබේද? ඇත්තෙන්ම ඔව්. වරින් වර මෙවැනි දුර්දාන්ත බලවේගයන් ලෝකයේ ක්‍රියාත්මක වූ හැටි අපට ලෝක ඉතිහාසය උගන්වාලයි. ---- අජානීය වූ බලවේගය වනුයේ කාලයයි. දැනට උඩු යටිකුරු වී ඇති බුද්ධි මහිමය කිසියම් අවස්ථාවකදී තමන්ට හිමි උර්ධව ස්ථානයට පත්වනු ඇත. මිනිසා අනාදිමත් කාලයක සිට එක්රැස් කරගත් බුද්ධි බලය, ප්‍රඥාව සදහටම යටපත් කර තැබිය නොහැකිය. ---- මේ උදාර මොහොත එළඹෙන තුරු අපට කළ හැකි දේ ඉතාමත් අල්පය. අප ලේඛකයන් හැටියට ඔළුවෙන් හිටගෙන කියන දෙයක්වත් ඇසීමට අද සමාජය සූදානම් නැත. ගෝලීයකරණය, නවීකරණය, නවීන තාක්ෂණය යන මායාවන්ගෙන් ඇස් අන්ධ වී කන් බිහිරි වී පවතී. දැනට අපට කළ හැක්කේ අපේ අතීත දායාදය නමැති අචල පර්වතය මත නැගී ලෝකාවලෝකනයෙන් අපට පෙනෙන දේ අනාගතය සඳහා වාර්තා කර තැබීමය. ---- මෙය පොරෝ පහරක් ලැබිය යුතු පිළිලයක් අතින් ස්පර්ශ කර පැන යාමක් හැටියට කෙනෙකු චෝදනා කළ හැකිය. ඒ වනාහි මගේ කවර නිර්මාණයකට වුව ද සාධාරණ චෝදනාවකැයි මට සිතේ. මක්නිසාදයත් ඒ හැම එකකින්ම කෙරෙනුයේ රෝගය ඇති තැනට ඇඟිල්ල දික් කොට පෙන්වීමක් විනා ඊට ප්‍රතිකාර කිරීමක් නොවන බැවිනි. රෝගයට ප්‍රතිකාර කිරීම යථා කාලයේදී සුදුසුකම් ලත් වෛද්‍යවරුන් විසින් කළ යුත්තකි. මගේ යුතුකම වනුයේ මා දන්නා තරමින් රෝග නිධානය පෙන්වීම පමණි.” (1999.08.11, 'දිවයින')

1999 සැප්තැම්බර් 15 'රාවය' පුවත්පත එහි මුල් පිටුවේ අග්‍ර විනිශ්චයකාර තුමාගේ දිවුරුම් දීමේ ඡායාරූපය උඩු යටිකුරු කර පළ කරමින් මෙසේ ද සටහන් කර තිබිණි. “මෙය අධිකරණයේ ස්වාධීනත්වය හා සත් චරිතය ගැන තකන සියලු මිනිසුන්ගේ තීරණාත්මක දිනය වනු ඇත.” එදින එම පුවත්පතේ පළ වූ සටහනක් අධ්‍යාත්මිකත්වය ගරා වැටෙමින් ආර්ථිකව සංවර්ධිත දේශයන් මුහුණ දෙන කලියුගයක අත්දැකීම වටහා ගන්නට මට උපකාරී විය. ඇමෙරිකාව විනාශය කරා ළඟා වන්නේ දැයි නැගූ ප්‍රශ්නයට රොබට් බෝක්ගේ පිළිතුර මෙසේය. “අනාගත වක්තෘ කෙනෙකු වැනි වූ ඩබ්ලියු. යේට්ස් නමැති කවියා 1919 දී කී දෙයක් දැන් සත්‍යයක් බවට පත් වෙමින් ඇත. ඇමෙරිකානු සමාජයම පරිහානිය නමැති යක්ෂයාගේ මුඛයට සීග්‍රයෙන් යමින් පවතී. මෙයට හේතු වී ඇත්තේ අපේ ගතානුගතික සදාචාරය වෙනස් මඟකට යාම හේතුවෙනි. අප විසින් ජීවිත පූජාවෙන් ආරක්ෂා කරන ලද අපේ ආගම ද ආගමේ සඳහන් සදාචාරයේ හර සම්ප්‍රදායන් ද මෙම රකුසා විසින් ගිලගෙන ඇත. අද ජාතියක් වශයෙන් අප සෙමින් එහෙත් නොනැවතී ඇදෙන්නේ බෙත්ලෙහෙම් පුරවරයට නොව පාපකාරී ජීවන රටාව නිසා දෙවියන් වහන්සේ විසින් විනාශ කරන ලද ගොමෝරා නමැති පව්කාරයන්ගේ ගමට ය.” එහි මෙසේ ද සටහන්ව තිබිණි. “ඔහු හැම විටම කියා සිටියේ බටහිර දියුණුව මෙතරම් වේගවත් වූයේ පවුල කේන්ද්‍රිය කොට සදාචාරය ඔපවත් කළ ක්‍රිස්තියානි ධර්මයේ අත්තිවාරම මත ගොඩනැගුන නිසා බවය.” ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කිරීම සඳහා යෝජනා කරන ලද එහෙත් පත් නොකළ රොබට් බෝක් මහතා ගැන ද එසේ පත් නොකිරීමට හේතුව මෙවැනි දේශනා බව ද එහි සටහන්ව තිබිණි. රොබට් බෝක් මහත්මාගේ ඉහත සඳහන් අදහස ඇමෙරිකාවට පමණක් නොව අධ්‍යාත්මිකත්වය ගරා වැටෙමින් ආර්ථිකව පමණක් සංවර්ධිත සෑම දේශයකටම ද ආර්ථිකව සංවර්ධනය නොවූ රටක දහම මුළුමනින් බැහැර කර ධනයට බලයට වන්දනා කරන සියල්ලන්ට ද අදාළ යැයි මට සිතේ.

ශ්‍රී ලංකාව සෑම පැතිකඩකින්ම සියයට සියයක්ම කලියුගයක අත්දැකීමට පැමිණ ඇත. මේ වන විට ලෝකයේ සෑම රටකම කලියුගයක ලක්ෂණ දක්නට ලැබුණත් ඒ කිසිම රටක් ශ්‍රී ලංකාව මෙන් පූර්ණ කලියුගයක අත්දැකීමට පිවිස නැත. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් අප දේශයේ ප්‍රජාතන්ත්‍රවාදය මුළුමනින්ම අර්බුදයට ලක් විය. බලයට පත්වන දේශපාලන පක්ෂයට රට අනුභව කිරීමේ ඉඩකඩ විවර විය. විවෘත ආර්ථිකය මගින් සියලු සාරධර්ම සෝදාපාළුවට ලක් විය. මේ තත්ත්වය උදා වූයේ ධර්මිෂ්ඨ සමාජයක් උදා කරන බවට දුන් ප්‍රතිඥාවක් ද සමගය. 1978 සිට මේ වන විට වසර 44ක් තුළ මේ දේශය මුළුමනින්ම කලියුගයක අත්දැකීමට පිවිස ඇත. මේ කටුක තත්ත්වය දෙස ද ප්‍රඥාවන්තව හා උපෙක්ෂාවෙන් බැලීමට අපට හැකිද? දැන් මා ඔබ ඉදිරියේ තබන කරුණු සියල්ල ගැඹුරින් අවබෝධ කර ගන්නේ නම් එලෙස කරන්නට ඔබට හැකිය. අප ජීවත් වන මේ දේශයයි, එදා ආදම් ඒව සිටි සුගති උද්‍යානය. ('ශුද්ධාත්ම පිය සටහන්' 44 පරිච්ඡේදය) එයයි, පසුකාලීන ධර්ම ද්වීපය වූයේ. එයයි මේ වන විට මුළුමනින්ම කලියුගයක අත්දැකීමට මුහුණ දෙන දේශය. කලියුගයක උදාව ධර්ම ප්‍රතිෂ්ඨාපනයක (ධර්මය නැවත පිහිටුවීමේ) සංඥාවකි. පූර්ණ කලියුගයක අත්දැකීමට මුහුණ දීම පූර්ණ ධර්ම ප්‍රතිෂ්ඨාපනයක සංඥාවකි. මැවුම්කරුවාණන් වහන්සේමයි, කලියුගය නිම කර ධර්ම ප්‍රතිෂ්ඨාපනය

සිදුකරනුයේ. එය මිනිස් අතකින් පමණක් කිසිසේත් කළ නොහැක්කකි. ඒ සඳහා සර්වබලධාරී හස්තයම අවශ්‍ය වනු ඇත. අප ජීවත් වන මේ දේශයයි, පූර්ණව ධර්මය ප්‍රතිෂ්ඨාපනය වීමෙන් උදා වන නව ධර්ම ද්වීපය. ඉන්පසු අප ජීවත් වන මේ දේශයයි, "මුළු ලෝකයටම ගැළවීමේ දේශය." එයයි, එදා සුගති උද්‍යානය වූ මේ දේශය පිළිබඳ මැවුම්කරුවාණන් වහන්සේගේ සැලැස්ම. එනිසා නියතවම එය එසේම සිදුවනු ඇත. මනුෂ්‍යයා කළ නොහැකි යැයි සිතන සියල්ල මැවුම්කරුවාණන් වහන්සේට ක්ෂණයකින් කළ හැකිය. "මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනය මා වෙතට හිස්ව හැරී නැවිත් මා කැමති දෙය සිදුකොට මා නියම කළ කාරණය සඵල කරනවා ඇත." (යෙසායා 55: 11) එසේ නම් මේ අඳුරු පැයේදී ද මේ පුණ්‍ය භූමිය ගැන අපි ප්‍රීති විය යුතු නොවෙමුද? නව උදාවක් උදෙසා අප දේශයේ සිදුවන ධර්ම අධර්ම යුද්ධයේදී ධර්මයේ ජයග්‍රහණය උදෙසා අපි කැපවෙමු. වැය වෙමු. එය සම්පූර්ණයෙන්ම මෛත්‍රියෙන්, ප්‍රේමයෙන් පමණක් සිදුවන ක්‍රියාවලියක් විය යුතුය.

අප දේශය තුළ සිදුවන ජේසු සමිඳුන්ගේ මෙම සුවිශේෂී අනාවරණ රටාව තුළ උන්වහන්සේ පැවසූ අදහස් ස්වල්පයක් වෙතට මම ඔබගේ අවධානය යොමු කරන්නට කැමැත්තෙමි.

"දෙවි පියාණන් මහා සැලැස්මක් තුළ සියල්ල හසුරුවමින් මගේ දෙවන පැමිණීමට මොහොත සූදානම් කරමින් සිටිනවා. ---- **මේ මොහොතෙ අර දේශපාලකයට මේ නායකයාට දෝෂාරෝපණය කිරීම නොවෙයි, තමා තමාව දැකීමයි සිදුවිය යුත්තේ.**" ('ශුද්ධාත්ම පිය සටහන්' 53 පරිච්ඡේදය) (දැන් හැම කෙනෙක්ම ගැඹුරින්ම තමා තමාව දැකීමයි සිදුවිය යුත්තේ. දේශපාලන නායකයින් පමණක් නොව ඊටත් වඩා ආගමික නායකයින් තමා තමාව දැකීම සිදුවිය යුතුමයි. ආගමික ශාස්තෘවරුන් දෙසූ නිවැරදි දහම සැම ආගමක් තුළින්ම දිස් වූයේ නම් රටක දේශපාලනයට මේ තරම් පිරිහෙන්නට ඉඩක් නැත. දැන් උදාවන්නට සූදානම්ව තිබෙන දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ බිහිසුණු අදියර විසින් ආගම් ඇතුළු සියල්ල නිසි ලෙස සකසනු ඇත.)

"දේශයේ පවිත්‍රකරණය දැන් ලහිලහියේ සිදුවේ. එනිසා කිසි දා නොවූ විරූ ලෙස ඉදිරියේදී සියල්ල සිදුවනු ඇත. ---- දේශයේ භයානකම කාල පරාසය ඉදිරියේ ඇරඹෙනු ඇත. සුඛවිහරණය තුළ කල් ගෙවන්නෝ දහමට සමීප චරිත පීඩනයට පත් කරනු ඇත. එකිනෙකාගේ කුළල් කා ගැනීම් තුළ සත්‍යය හෙළි වනු ඇත. **ඔවුන් ගැන අසන දකින දේ තුළ නොරැඳී ඔවුන් උදෙසා කරුණා කළ මැනවයි මොර ගසන්න. ඔවුන් හෙළා-තලා කතා කිරීමෙන් ඒ විපත් ඔබ වෙත පෙරලා එනු ඇත.** සියල්ලන් දෙස ලස්සන ඇසකින් බලන්න. ලෝකය ලස්සන කරන්න පුළුවන් පවිත්‍ර සිතුවිලිවලින්. (49)

"දේශය පවිත්‍ර කිරීමත් බොහෝම ඉක්මනින් පියාණන් විසින් සිදුකරනවා. **එනිසා කිසිවෙක් කිසිවකු ගැන කිසිවක් නිසි ලෙස නොදැන නිරන්තරයෙන් ඒ ගැන කතා කරන්න එපා.** හැම කෙනෙක්ම මනුෂ්‍යයින් මත නොවෙයි, දෙවි පියාණන් හා දේව පුත්‍රයාණන් සමග ගැවසෙන්නට බලන්න. (47)

**3.** ('විරත රත', පරිවර්තක, මහේන්ද්‍ර සේනානායක, 1987 ඒ පොත මා අතට ලැබුන විට එහි ඉංග්‍රිසි පොතේ නම සටහන් කර ගැනීමට මට අමතක විය. මෙය ලියෝ ටෝල්ස්ටෝයි හා මැක්ෂිම් ගෝර්කි අතර සංවාදයකින් කොටසකි.)

**ලියෝ ටෝල්ස්ටෝයි**
"ඇයි ඔබ දෙවියන් කෙරෙහි විශ්වාසය නොතබන්නේ?"

**මැක්ෂිම් ගෝර්කි**
"දෙවියන් කෙරෙහි මට විශ්වාසයක් නෑ ලියෝ."

**ලියෝ ටෝල්ස්ටෝයි**
"ඒක ඇත්තක් නොවෙයි. ස්වභාව ධර්මයට අනුව ඔබ භක්තිමතෙක්. දෙවි පිහිට නැතිව ඔබට ජීවත් වෙන්න බැහැ. බොහොම ඉක්මනට ඔබට ඒක හැඟෙයි. ඔබ මහා ඇට්ටරයෙක්. ඒ නිසයි විශ්වාස කරන්නෙ නැත්තෙ. අනික ඔබට ඕනැ හැටියට ලෝකෙ හැදිල පිහිටල නැති නිසා ඔබේ හිතේ තරහකුත් තියෙනවා. පෙලක් උදවියගෙ ශ්‍රද්ධාව නැත්තෙ ලජ්ජාව නිසා. ---- ප්‍රේමයට භක්තියට නිර්භීතකමක් චිත්ත ධෛර්යයක් අවශ්‍යයි. ---- භක්තිය කියන්නෙ ප්‍රේමයේ උපරිම අවස්ථාව. ඔබ තව ටිකක් වැඩියෙන් ප්‍රේම කරන්න. එතකොට ඒ ප්‍රේමය භක්තියට හැරෙනවා ඇති.

---- භක්තිමතෙක් වශයෙන් උපන්න ඔබ ඔබේම සොබාවික ගතිගුණයට පටහැනිව ගමන් කිරීමට උත්සාහ කිරීම නිෂ්ප්‍රයෝජන දෙයක්. හැම විටම ඔබ අලංකාරය ගැන කතා කරනවා. මොකක් ද අලංකාරය කියන්නේ? මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ තමයි ඉතාම උසස් ශ්‍රේෂ්ඨම සර්ව සම්පූර්ණ අලංකාරය."

**4.** (පවුලෝ කොයියෝ, 'ජීවිත වන්දනා ගමනක සටහන්', ජුවාන් අරියාස්, සිංහල පරිවර්තනය, සුමිත්‍රා රාහුබද්ධ) එයින් උපුටා ගත් වැකි කීපයක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි

"ලේඛකයා අභිබවා ගිය අධ්‍යාත්මවේදියකු යැයි කිව හැකි පවුලෝ කොයියෝ"
"ඒ වන්දනාවෙහි මහඟු පාඩම වුයේ සරල බව අලංකාරය ලෙස වටහාගත හැකි වීමය. මහත්ම අලංකාරය සරල බවයි."
"මා හිතන ආකාරයට ඊළඟ වර්ෂ සියයේදී මනුෂ්‍ය වර්ගයා නැඹුරු වන්නේ අධ්‍යාත්මික ගවේෂණය කෙරෙහිය. පසුගිය ශතවර්ෂයට වඩා මේ ශතවර්ෂයේ දැනටමත් මිනිසා තුළ ඒ නැඹුරුව ඇති බව මම දකිමි."
"ආගම නිර්වින්දනයක් (අබිං) යැයි කියන කියමන සැබෑවක් නොවන බව අපි අවබෝධ කරගනිමින් සිටිමු. විශේෂයෙන්ම එසේ කී අය කිසි විටෙක එය අත්හදා බලා නැති හෙයිනි."

(වරහන තුළ අබිං යන වචනය යෙදුවේ මමයි. ඒ අදහස වඩාත් තිව්‍ර වන පිණිසය.)

**5.** ('ලංකාදීප' සාහිත්‍ය සංග්‍රහයේ මට මේ වදන් හමු විය. ඒ දිනය සටහන් කර ගන්නට මට අමතක විය.) ජ්‍යේෂ්ඨ විද්‍යාඥ අබ්දුල් කලාම් ඔහුගේ ජීවිත කතාව ලිවා 'ගිනි තටු' නමින්. "ඇයි අපි ඉපදිලා ඉන්නේ? අප හැම දෙනාම ඉපදී සිටින්නෙ දිව්‍යමය ගින්නක් සහිතවය. අපගේ ප්‍රයත්නය එම ගින්නට තටු ලබා දී එහි දීප්තියෙන් බොහෝ දෑ ආලෝක කිරීමයි."

**6.** "බොහෝ අය කල්කටාවේ තෙරේසා මව් තුමිය ජීවත්ව සිටි කාලයේ ද එතුමිය දුටුවේ ජීවමාන සාන්තුවරියක ලෙසිනි. 1968 දී බ්‍රිතාන්‍ය ලේඛකයෙකු හා සිනමාකරුවෙකු වූ මැල්කම් මගරිජ් තෙරේසා මව් තුමිය හමුවට ගියේය. ආගම ගැන එතරම් තැකීමක් නොකළ ද මගරිජ් තම චිත්‍රපට කාර්මික ශිල්පින් ද සමග ඇගේ වැඩ කටයුතු රූ ගත කිරීම් කළේය. ඔහු දෙවියන් වහන්සේ ගැන සැක කරන බව දැනගත් එතුමිය 1970 දී මැල්කම්ට ලිපියක් ලියුවාය. "---- ඔබේ හදවතේ ගැඹුරේම දෙවියන් වහන්සේ සිටියද, ඔබ උත්සාහ කරන්නේ එතුමන් ඔබෙන් ඈත් කොට තබන්නටය. දෙවියන් වහන්සේ ඔබට බෙහෙවින් ප්‍රේම කරති. දෙවියන් වහන්සේ ඈත් කර තබන්නට උත්සාහ කරනු වෙනුවට එතුමන් හඳුනාගන්නට උත්සාහ කරන්න." මැල්කම් එසේ කළේය. 1982 වන විට ඔහු දැඩි දේව භක්තිකයකුව සිටියේය. 'Something Beautiful For God' යන නමින් 1969 දී ඔහු තැනූ චිත්‍රපටිය ද 1971 දී ඔහු එනමින් ලියූ ග්‍රන්ථය ද නිසා තෙරේසා මව් තුමිය ජාත්‍යන්තර අවධානයට පාත්‍ර වූවාය." (උදේනි සෙනෙවිරත්න, 'මුතුහර' 2007 ඔක්තෝබර්)



DN